පූර්ව පිටපත A/HRC/30/CRP 2

බෙදා හැරීමඃ සීමිතයි
2015 සැප්තැම්බර්
ඉංග්‍රීසියෙන් පමණයි

මානව අයිතිවාසිකම් මණ්ඩලය
තිස් වැනි සැසිය

න්‍යාය පත්‍ර අංක 2

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිසමේ වාර්ෂික වාර්තාව සහ මහ කොමසාරිස් කාර්යාලයේ සහ මහ ලේකම් කාර්යාලයේ වාර්තා.

ශ්‍රී ලංකාව පිලිබඳව මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් කරන ලද විමර්ශනයේ වාර්තාව.( OISL ) **

* ලැබුණ ආකාරයට ඉදිරිපත් කෙරේ.

** මෙම ලේඛනයේ අඩංගු තොරතුරු කියවිය යුත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය, වගවීම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාවත් සමගය. (A/HRC/30/61)

පටුන

1 කොටස

I. හැඳින්වීම

II ශ්‍රී ලංකාව පිළිබඳව මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) විමර්ශනයක් පිහිටුවීම අධිකාරිය සහ ක්‍රමවේදය

III පසුබිම් සන්දර්භය

IV ආණ්ඩුව එල්ටීටීඊය සහ අනෙකුත් සන්නද්ධ කණ්ඩායම් පිළිබඳ සමස්ත දැක්මක්

V නෛතික රාමුව තේමා අනුව පරිච්ඡේද

2 කොටස තේමා අනුව පරිච්ඡේද

VI නීති විරෝධී මිනී මැරුම්

VII නිදහස අහිමි කිරීමට අදාල ප්‍රචණ්ඩත්වය

VIII බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්

IX වධ හිංසා හෝ අනෙකුත් ආකාරයේ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්

X ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් ප්‍රචණ්ඩත්වය

XI වැඩිහිටියන් පැහැර ගැනීම සහ බලහත්කාරයෙන් සටන් කණ්ඩායම්වලට බඳවා ගැනිම

XII බඳවා ගැනීම් සහ ළමයින් සටන්වලට යොදා ගැනීම

XIII සිවිල් ජනතාවට සහ පොදු ස්ථානවලට සටන්වල බලපෑම

XIV එහා මෙහා යෑම පිළිබඳ සීමා පැනවීම

XV මානුෂීය ආධාර අහිමි කිරීම

XVI විවෘත නොවූ කඳවුරුවල සිටින අභ්‍යන්තරව අවතැන් වූවන් පරික්ෂා කිරීම සහ ඔවුන්ගේ නිදහස අහිමි කිරීම

XVII ශ්‍රී ලංකාව පිළිබඳව මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් ( OISL කරන ලද විමර්ශනයේ ප්‍රධාන සොයා ගැනිම්

XVIII යුක්තිය සහ වගවීම

XIX අවසානය සහ නිර්දේශ

ඇමිනුම්

විෂය නියමයන් ( Terms of reference)

සැළ කිරීම් ඉදිපත් කිරීම

එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් ශ්‍රී ලංකාණ්ඩුවට එවන ලද ලිපිය.

ශ්‍රී ලංකාවේ සිතියම

වචන මාලාව

| | |
|---|---|
| ACF | ඇක්ෂන් කොන්ට්‍රෙ ලේ ෆේයිම් |
| AGA | ආණ්ඩුවේ සහකාර දිසාපති ( රජයේ ප්‍රාදේශීය නිලධාරි) |
| CCHA | මානුෂීය ආධාර පිළිබඳ උපදේශන කමිටුව |
| CCP | අපරාධ නඩු විධාන සංග්‍රහය |
| CDS | ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානි |
| CFA | සටන් විරාම ගිවිසුම |
| CGES | අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් |
| CID | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| CoL | පරීක්ෂණ කොමිසම |
| DIU | අතුරුදහන්වීම් විමර්ශන ඒකකය |
| DMI | හමුදා බුද්ධි අධ්‍යක්ෂක |
| ENDLF | ඊළාම් ජාතික ප්‍රජාතන්ත්‍රීය විමුක්ති පෙරමුණ |
| EPDP | ඊළාම් ජාතික ප්‍රජාතන්ත්‍රීය පක්ෂය |
| EPRLF | ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රීය පක්ෂය |
| EROS | ඊළාම් විප්ලවවාදී ශිෂ්‍ය සංවිධානය |
| FDL | ඉදිරි ආරක්ෂක වළල්ල |
| GA | දිසාපති ( ආණ්ඩුවේ ප්‍රාදේශීය නිලධාරියෙක්) |

| | |
|---|---|
| GoSL | ශ්‍රී ලංකාණ්ඩුව |
| HRC | මානව අයිතිවාසිකම් මණ්ඩලය |
| ICRC | රතු කුරුස අන්තර්ජාතික කොමිටිය |
| IDP | අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් |
| IGP | පොලිස්පති |
| IIGEP | ස්වාධීන අන්තර්ජාතික විද්වතුන්ගේ කණ්ඩායම |
| ILO | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| INGO | අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානය |
| IOM | සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය |
| JOC | ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන මණ්ඩලය |
| JOH | ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය |
| JVP | ජනතා විමුක්ති පෙරමුණ |
| LLRC | උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම |
| LTTE | තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය |
| MOD | ආරක්ෂක අමාත්‍යාංශය |
| MRM | අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය |
| NFZ | ගිනි අවි තහනම් කලාපය |
| NGO | රාජ්‍ය නොවන සංවිධානය |
| NIB | ජාතික බුද්ධි කාර්යංශය |
| OHCHR | මානව අයිතිවාසිකම් සඳහා වූ මහ කොමසාරිස් කාර්යාලය |
| PLOTE | තමිල් ඊළාම් ජනතා විමුක්ති සංවිධානය |
| PTA | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත |
| PTK | පුදුක්කුඉරුප්පු |
| PTOMS | පශ්චාත් සුනාමි මෙහෙයුම් කළමනාකරණ ව්‍යුහය |

| | |
|---|---|
| SFHQ | ආරක්ෂක හමුදා මූලස්ථානය |
| SLA | ශ්‍රී ලංකා හමුදාව |
| SLAF | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| SLMM | ශ්‍රී ලංකා අධීක්ෂණ දූත පිරිස |
| SLN | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| SLP | ශ්‍රී ලංකා පොලිසිය |
| SRSG-CAAC | ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳව මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිත |
| SSP | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී |
| STF | විශේෂ කාර්ය බලකාය (පොලිස්) |
| TELO | තමිල් ඊළාම් විමුක්ති සංවිධානය |
| TED | ත්‍රස්ත විමර්ෂණ කාර්යංශය |
| TJ | සංක්‍රාමීය යුක්තිය |
| TMVP | තමිල් මක්කල් විඩුතලෛ පුලිහල් |
| UAV | මිනිසුන් රහිත ගුවන් යානය |
| UNHCR | සරණාගතයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් |
| UNICEF | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| UNOCHA | එක්සත් ජාතීන්ගේ මානුෂීය කටයුතු සම්බන්ධීකරණය සඳහා වූ කාර්යාලය |
| UNRC/HC | එක්සත් ජාතීන්ගේ නේවාසික සහ මානුෂීය සම්බන්ධීකරණ කාර්යාලය |
| UTHR | මානව අයිතිවාසිකම් සඳහා වූ විශ්ව විද්‍යාල ආචාර්යවරු |
| WFP | ලෝක ආහාර වැඩ සටහන |
| WS | සාක්ෂිකරුගේ ප්‍රකාශය |

## 1. හැඳින්වීම

1. මානව අයිතිවාසිකම් කවුන්සලය 2014 මාර්තු මාසයේ දී සම්මත කළ 25/1 යෝජනාව අනුව මානව අයිතිවාසිකම් සඳහා වූ මහ කොමසාරිස් කාර්ලයෙන් '' උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමෙන්[1] ( LLRC )[1] ආවරණය කරන ලද කාල සීමාව තුළ පාර්ශ්වයන් දෙකම ශ්‍රී ලංකාවේ කරන ලදැයි සැලකෙන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හා අපහරණ හා ඊට අදාල අපරාධ සම්බන්ධයෙන් හා අදාල විශේෂඥයන්ගේ සහ මැන්ඩේට් බලය හිමිකරුවන්ගේ සහාය ඇතිව දඬුවම් නොලැබ සිටීම වැළැක්වීමේ හා වගවීම පැවරීමේ අදහසින් සිදු වූයේයැයි කියන එවැනි උල්ලංඝනය කිරීම් සහ අපරාධ පිළිබඳ සාධක සහ වාතාවරණය තහවුරු කර ගැනීමට පුළුල් විමර්ශනයක් කිරීමට'' ඉල්ලීමක් කෙරිණ.

2. පුළුල් විමර්ශනයක් සඳහා ඉල්ලීම සිදු වූයේ 2009 ගැටුමේ අවසාන කාල සීමාවේ දී ශ්‍රී ලංකාණ්ඩුව සහ තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) යන පාර්ශ්ව දෙක විසින්ම කරන ලදැයි කියන යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ ඇතුළුව විශාල වශයෙන් සිදු වූයේයැයි කියන කෘරකම් පිළිබඳ වගවීම තීරණය කෙරෙන විශ්වාසය රැඳවිය හැකි ජාතික ක්‍රියා පටිපාටියක් නොමැතිවීම ගැන ජාත්‍යන්තර සහ ජාතික අවධානය වැඩි වශයෙන් යොමුවීමෙන් පසුවය. එසේ වුවත් විමර්ශනය සඳශා ලබා දුන් මැන්ඩේට් බලය 2002 පෙබරවාරි සිට 2011 නොවැම්බර් දක්වා කාලය ආවරණය වන නිසා ගැටුමේ අවසාන කාල සීමාවට වඩා පුළුල්ය.

3. මානව අයිතිවාසිකම් කවුන්සලයේ යෝජනාවට තුඩු දුන් ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් අර්බුදය ගැටුමේ අවසාන අදියරට පමණක් අදාල නොවේ. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ ( OISL) මැන්ඩේට් බලයෙන් ආවරණය වන වසර ගණනාවට පමණක් සීමා නොවන එය දශක ගණනාවක් ඈතට දිවෙන ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වලට බලපෑ ගැටුමකි. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියෙන් ආවරණය වන කාල පරිච්ඡේදය ඇරඹෙන 2002 පෙබරවාරි සටන් විරාමය වසර ගණනාවක් පැවති සන්නද්ධ ගැටුමට විරාමයක් වුවද ඉන් සාමය උදා වූයේ හෝ උල්ලංඝනය කිරීම් සහ අපහරණ රටාවේ වෙනසක් වූයේ නැත. එය වෙනස් කොට සැලකීම, ආර්ථිකව කොන් කිරීම සහ අනර්ථකාරී වාර්ගික දේශපාලනය වැනි සන්නද්ධ ගැටුමට මූලික හේතු සාධකවලට විසඳුමක් වූයේ ද නැත.

4. මෙම වාර්තාව නීති විරෝධී මිනිස් ඝාතන, නිදහස අහිමි කිරීමට අදාල උල්ලංඝනය කිරීම්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, වධ හිංසා, ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් ප්‍රචණ්ඩත්වය, වැඩිහිටියන් පැහැර ගැනීම සහ බලහත්කාරයෙන් සටන්වලට යොදා ගැනීම, ළමයින් බඳවා ගැනීම සහ සටන්වලට යොදා ගැනීම යනුවෙන් පරිච්ඡේදවලට වෙන් කර ඇත. අනතුරුව ඇති පරිච්ඡේදවලින් ගැටුමේ අවසාන මාස කීපය තුළ සාමාන්‍ය ජනතාවට සහ පොදු ස්ථානවලට ගැටුම්වලින් ඇති වූ බලපෑම මෙන්ම එහා මෙහා යෑම පාලනය කිරීම සහ මානුෂීය ආධාර වැළැක්වීම ගැනත් ඉන් පසු පරිච්ඡේදයකින් හමුදාවේ පාලනය යටතේ පැවති විවෘත නොවූ කඳවුරු තුළ අභ්‍යන්තරව අවතැන් වූවන් (IDP) පරික්ෂා කිරීම සහ ඔවුන්ගේ නිදහස අහිමි කිරීම පිළිබඳ කරුණු ලේඛන ගත කෙරේ.

5. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය සිදු කරන ලද්දේ මානව අයිතිවාසිකම් විමර්ශනයක් විනා අපරාධ විමර්ශනයක් නොවන බව ආරම්භයේදීම සඳහන් කළ යුතුය. විමර්ශනයෙන්

---

[1] ජනාධිපති මහින්ද රාජපක්ෂ 2010 දී LLRC පත් කරන ලද්දේ ''2002 පෙබරවාරි සිට ක්‍රියාත්මක වූ සටන් විරාම ගිවිසුම (CFA ) අසාර්ථක වීමට තුඩු දුන් කරුණ සහ වාතාවරණයත් ඉන් පසුව 2009 මැයි 19 වැනිදා දක්වා වූ සිදුවීම් මාලාවත් විභාග කොට වාර්තා කිරීම'' සඳහාය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිසමේ වාර්තාව, 2011 නොවැම්බර්. එය 2010 ඔක්තෝබර් මස ජනාධිපතිට අතුරු වාර්තාවක් ඉදිරිපත් කළ අතර 2011 නොවැම්බර් මාසයේ දී අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

ආවරණය වූ කාල සීමාව, උල්ලංඝනය කිරීම්වල පුළුල්බව, ලබා ගත හැකි තොරතුරුවල විශාලත්වය, මෙන්ම ශ්‍රී ලංකාවට පිවිසීමට නොහැකිවීම හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ගැන පැවති අවදානම වැනි බාධක විමර්ශනයට පැවති ඉමහත් අභියෝගයන් විය. කෙසේ වුවත් මෙම විමර්ශන වාර්තාවෙන් සන්නද්ධ ගැටුම් පැවති අවසාන කාල සීමාවේ පමණක් නොව ශ්‍රී ලංකාවේ විමර්ශන වාර්තාවෙන් ආවරණය වූ සම්පූර්ණ කාල පරිච්ඡේදයේත් ඊට පෙරාතුවත් දිගටම පැවති රටාවන් සහ සිදුව ඇති අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සහ මානුෂීය නීති උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීමට උත්සාහයක් ගෙන ඇත.

6. මෙම හැසිරීම් රටා කාලයක් තිස්සේ වූ විවිධ සිදුවීම්වලින් සමන්විතය. ඒ සඳහා සාමාන්‍යයෙන් සැලකිය යුතු ප්‍රමාණයේ සම්පත්, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ සංවිධානයක් අවශ්‍ය වන අතර ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කර ඇත්තේ ධූරාවලියක් ඇති අණ දෙන ව්‍යුහයක් තුළ පුද්ගලයන් ගණනාවක් විසිනි. පද්ධතීන් තුළින් සිදුවන එවැනි ක්‍රියා අධිකරණයකින් තහවුරු වුවහොත් යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ වශයෙන් සැලකිය හැකි අතර අපරාධ පිළිබඳ පුද්ගලික වගකීමක් දැක්විය හැකිය.

7. මෙම වාර්තාවෙන් විස්තර කෙරෙන උල්ලංඝනය කිරීම් සහ අපරාධ ශ්‍රී ලංකාවේ මේ දක්වාම ගැඹුරින්ම පවතින දඬුවම් නොලැබ සිටීමේ ලක්ෂණයි. මෙම වාර්තාවෙන් සියලුම ප්‍රජාවන්ට අයත් වින්දිතයන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට සත්‍යයට, යුක්තියට සහ හානිපූරණයට ඇති අයිතිය ලබා ගැනීම වළක්වන වගවීමට ඇති ප්‍රධාන බාධක ද පරීක්ෂා කෙරේ.

8. මෙම වාර්තාව ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිටිය සිය වැඩ කටයුතු ආරම්භ කළ අවස්ථාවේ පැවති සන්දර්භයට බෙහෙවින් වෙනස් සන්දර්භයක් තුළය. තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන අදියරේදී ( මූලික වශයෙන් 2014 දෙසැම්බර්) විමර්ශකයන්ට ශ්‍රී ලංකාවට පිවිසීමට අවස්ථාවක් ලැබුණේ නැත. විමර්ශනය ප්‍රතික්ෂේප කළ ශ්‍රී ලංකාණ්ඩුව මෙම කාර්යාලය වෘත්තීය නිපුණත්වයක් නැති පක්ෂග්‍රාහීයැයි චෝදනා කෙළේය. ඒ සමගම ආණ්ඩුව මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ වෙනත් අය බියවැද්දීමේ, හිරිහැර කිරීමේ, සෝදිසියෙන් සිටීමේ, රඳවා ගැනීමේ සහ වෙනත් උල්ලංඝනය කිරීම් ව්‍යාපාරයක් දියත් කළ අතර එය පැහැදිලිවම ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිටිය සමග සම්බන්ධවීමට බාධා කිරීමේ අදහසින් කරන ලද්දකි.

9. 2015 ජනවාරි මස පැවැත් වූ ඡන්ද විමසීමෙන් පසු පත් වූ නව ආණ්ඩුව විමර්ශනයට සහයෝගය නොදීමේ ස්ථාවරයේ වෙනසක් සිදු කෙළේ හෝ විමර්ශකයන්ට රටට ඇතුළුවීමට ඉඩ දුන්නේ හෝ නැති වුවද මහ කොමසාරිස් සහ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමග නිර්මාණාත්මකව සම්බන්ධ විය. එම ආණ්ඩුව මානව අයිතිවාසිකම් තත්වය කෙරේ සාධනීය ලෙස බලපාන සමහර වැදගත් පියවර කීපයක් ද ගත්තේය.

10. නව ආණ්ඩුව ගැටුමේ අවසාන මාස කීපය තුළ සිදු වූයේයැයි කියන උල්ලංඝනය කිරීම් සහ සමහර ප්‍රකට සිද්ධීන් පිළිබඳ වගවීමට අදාලව ක්‍රියාකිරීමට පොරොන්දු ලබා දී ඇත. කෙසේ වුවත් මෙම වාර්තාවට ඇතුළත්වන උල්ලංඝනය කිරීම් රටාවත්, ඒවා සිදු කළ අය තවම දඬුවම් නොලැබ සිටිමත් විශේෂයෙන්ම ආරක්ෂක හමුදා සහ අධිකරණ ව්‍යුහයන් සම්බන්ධව පුළුල් ප්‍රතිසංස්කරණ මෙන්ම මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගැඹුරු වෙනස්කම් ඇති කිරීමට සාමුහික දේශපාලන අධිෂ්ඨානයේ අවශ්‍යතාවය ඉස්මතු කරවයි.

11. 2015 අගෝස්තු 17 වැනි දා පවත්වන ලද ඡන්ද විමසීමෙන් බලයට පත් නව ආණ්ඩුවට මානව අයිතිවාසිකම් ගරු කරන නව ස්ථිරසාර සංස්කෘතියක් උදා කිරීමේ සහ වැරදිකරුවන්ට හිතකර සහ සමහර විට වින්දිතයන්ට දඬුවම් පමුණුවන තත්වය ආපසු හරවන ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට සුවිශේෂී සහ ඓතිහාසික අවස්ථාවක් පවතී. එය බරපතළ කාර්යකි. ඒ සඳහා කැපවීම පමණක් නොව යුක්තිය සහ නීතියේ ආධිපත්‍යය කෙරේ ශ්‍රී ලංකාවේ සියලු දෙනාගේ විශ්වාසය නැවත ඇති කළ හැකි තත්වයක් ඇති කිරීම තහවුරු කිරීමට ජාත්‍යන්තර සහාය ද අවශ්‍යය.

12. උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිටියේ (LLRC) අවසාන වාර්තාවේ මෙසේ සඳහන් වේ.'' පොදු අනාගතයක් සඳහා වූ දැක්මක් සංවර්ධනය කිරීමේ දි සමස්ත සමාජයේම සහභාගිත්වය අවශ්‍යය.'' ආරක්ෂක හමුදාව සහ එල්ටීටීඊයේ හිටපු ආධාරකරුවන් ඇතුළු සමාජයේ සියලු කොටස් මෙම වාර්තාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම වෙනුවට පිළිගැනීම සහ වෙනසක් ඇති කිරීම සඳහා නිර්මාණාත්මකව සම්බන්ධවීමේ අවස්ථාවක් සේ දකින ලෙස මහ කොමසාරිස් ඉල්ලා සිටී.

13. මානව අයිතිවාසිකම් සභාවට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහ ජනතාවට මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ දි අව්‍යාජ වගවීමේ සහ ප්‍රතිසංධාන ක්‍රියාවලියකට සහ ඒ සියල්ලට වඩා සත්‍යයට, යුක්තියට සහ හානිපූරණයට බොහෝ වින්දිතයන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට ඇති අයිතිය අවසානයේදී ඉටුවනු ඇතැයි මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන් තමන් විඳින ලද දුක් වේදනා මෙන්ම මුහුණ දුන් බලපෑම් සහ බිය ගැන්වීම් තිබුණ ද ඒ නොසලකා මෙම විමර්ශනයට දායකවීමට ඔවුන් තුළ පැවති ධෛර්යට මහ කොමසාරිස් සිය ගෞරවය පුද කරයි. ඔවුන්ගේ සාකෂිවල සහ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය ඉදිරියට සෘජුවම පැමිණීමට නොහැකි වූ අයගේ සාක්ෂිවල ප්‍රබලත්වය මෙම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ අන්තර්ජාතික ප්‍රජාවට බලපෑමක් වනු ඇත.

## II. මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනයක් (OISL) ස්ථාපිත කිරීම.

14. එවකට මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය වූ නවි පිල්ලේ විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය තුළ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය (OISL) 2014 ජුලි 1 වැනි දා සිට වැඩ කටයුතු ආරම්භ කළ අතර එහි කේන්ද්‍රීය කාර්ය මණ්ඩලයේ සත් දෙනා අගොස්තු මාසයේ මැද සිට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූහ. විමර්ශනය සඳහා (මීට යා කර ඇති) විෂය නිර්දේශය කාල රාමුව, ක්‍රමවේදය, සාධන සම්මතය සහ විමර්ශනයේ අනෙකුත් මූලික ලක්ෂණ ඇතුළත්ව 2014 අගෝස්තු මාසයේ මුලදී මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ ( OHCHR ) වෙබ් අඩවියේ පළකරන ලදී.

15. මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්, පින්ලන්තයේ හිටපු ජනාධිපති මාර්ටි අහ්ටිසාරි, නවසීලන්තයේ හිටපු මහාධිකරණ විනිසුරු ඩේම් සිල්වියා කාට්රයිට් සහ පාකිස්ථානයේ මානව අයිතිවාසිකම් කොමිසමේ හිටපු සභාපතිනිය අස්මා ජහන්ගීර් මෙනෙවිය යන විශිෂ්ට විශේෂඥයන් ( මින් ඉදිරියට විශේෂඥයන් ලෙස හැඳින් වෙන) තිදෙනාට මෙම විමර්ශනයට සහායක සහ උපදේශාත්මක භූමිකාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. විමර්ශන කණ්ඩායම 2014 සැප්තැම්බර් මාසයේදී සහ 2015 ජුනි මාසයේ දී විශේෂඥයන් හමු වූ අතර මුළු කාලය පුරාම ඔවුන් හා සම්බන්ධතාවයක් පවත්වා ගන්නා ලදී.

16. මානව අයිතිවාසිකම් මණ්ඩලයේ විශේෂ ක්‍රියා පටිපාටි මැන්ඩේට් බලය දරන්නන්ගෙන් ද 25/1 යෝජනාව අනුව සහාය ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ අතර ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය සමග සම්බන්ධතා පැවැත්වීම සඳහා කුඩා කොමිටියක් සකසන ලදී. එය පළමු වරට 2014 සැප්තැම්බර් මාසයේ දී රැස්විය. විශේෂ ක්‍රියා පටිපාටියෙන් ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියට ලබා දුන් ලිපි ලේඛන වලින් පැමිණිලිවලට ප්‍රමාණවත්ව ප්‍රතිචාර දැක්වීමට නැවත නැවතත් අපොහොසත්වීම, අන්තර්ජාතික ගිවිසුම්වල අදාලත්වයට අභියෝග කිරීම සහ සංචාර සඳහා කරන ලද බොහෝ ඉල්ලීම්වලට ප්‍රතිචාර නොදැක්වීම හෝ ප්‍රමාද කිරීම වැනි කරුණු තුළින් කලින් ආණ්ඩු විසින් සහයෝගයක් නොදැක්වීම ඉස්මතු කෙරිණ. 2015 ජනවාරි මාසයේ ආණ්ඩුව වෙනස්වීමත් සමග සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදු නොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු 2015 මාර්තු මාසයේ දී තාක්ෂණ කරුණු පිළිබඳව ශ්‍රී ලංකාවට පැමිණි අතර බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම දිගු කලක් තිස්සේ අපේක්ෂා කළ සංචාරයකට දින නියම කර ගන්නා ලදී. ශ්‍රී ලංකාව

පිළිබඳ මැන්ඩේට් බලයෙන් ආවරණය වන කාල පරිච්ඡේදයට අදාල මැන්ඩේට් බලය දරන්නන්ගේ කටයුතු ගැන වාර්තාව පුරාම සඳහන් කර ඇත.

**මැන්ඩේට් බලය**

17. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ෂණ කමිටුවට මැන්ඩේට් බලයක් පැවරෙන මානව අයිතිවාසිකම් මණ්ඩලයේ 25/1 යෝජනාව අනුව ''උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමෙන් (LLRC) ආවරණය වන කාල සීමාව ඇතුළත පාර්ශ්වයන් දෙකම සිදු කළේයැයි කියන බරපතළ උල්ලංඝනය කිරීම් සහ මානව අයිතිවාසිකම් කඩකිරීම් සහ ඊට අදාල අපරාධ පිළිබඳව පුළුල් පරීක්ෂණයක් සිදු කිරීමට සහ අදාල විශේෂඥයන්ගේ සහ විශේෂ ක්‍රියා පටිපාටි පිළිබඳ මැන්ඩේට් බලය දරන්නන් ගේ සහාය ඇතිව දඬුවම් නොලැබ සිටීම වැළැක්වීමේ සහ වගවීම තහවුරු කිරීම සහතික කිරීමේ අදහසින් සිදු කෙළේයැයි කියන එවැනි උල්ලංඝනය කිරීම් සහ සිදු කරන ලද අපරාධ පිළිබඳ සාධක සහ වාතාවරණය ස්ථාපිත කරන ලෙස'' මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලා සිටී.

18. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය පාර්ශ්වයන් දෙකම යන්නෙන් තේරුම් ගන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානයයි. (LTTE) සන්නද්ධ කණ්ඩායම් නිල ආරක්ෂක බලකා සමග හෝ එල්ටීටීඊය සමග සම්බන්ධව සිටීම අනුව විමර්ශනයේ මැන්ඩේට් බලයට ඇතුළත් වන්නේයැයි සලකන ලදී.

19. විමර්ශනයේ කාල රාමුව සම්බන්ධයෙන් යෝජනා අංක 25/1 න් සඳහන් වන්නේ උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ කාල සීමාවයි. උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ මුල් කාල සීමාවෙන් ආවරණය වන්නේ 2002 පෙබරවාරි 21 සිට 2009 මැයි දක්වායි. එසේ නමුත් 2011 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති වරයාට භාර දුන් වාර්තාවේ 2011 ඔක්තෝබර් තරම් මෑතක තොරතුරු ද ඇතුළත්ය. මෙම වාර්තාවද ඊට අනුකූල වන සේ දීර්ඝ කරන ලද කාල සීමාවම යොදා ගන්නා ලදී. මෙම වාර්තාව මෙම කාල සීමාවෙන් බැහැර එහෙත් සිද්ධීන් වඩාත් හොඳින් අවබෝධ කර ගැනිමට හේතුවන සන්දර්භ සහ අදාල අනෙකුත් තොරතුරුද සැලකිල්ලට ගෙන ඇත.

**ක්‍රමවේදය**

20. ශ්‍රී ලංකාව පිළිබඳ නිරීක්ෂණ කොමිටිය විසින් ආවරණය කරන කාල පරිච්ඡේදයට අදාලව පවතින විශාල ලිපි ලේඛන ප්‍රමාණය නිසා කණ්ඩායම, රජයේ ප්‍රකාශන, අන්තර්ජාතික සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන/ සිවිල් සමාජ වාර්තා, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ සහ වෙනත් කොමිසම් වාර්තා. ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු සහ චන්ද්‍රිකා ඡායාරූප. එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි සහ ගිවිසුම් අනුව පිහිටුවන පද ආයතනවල වාර්තා ඇතුළුව පවතින වාර්තා පිළිබඳ කාර්යාලීය අධ්‍යයනයක් කරන ලදී.

21. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය සිය කාර්ය ඉටු කිරීමේ දී ගැටුමේ පාර්ශ්වයන් මෙන්ම එක්සත් ජාතීන්ගේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්, සිවිල් සමාජ සංවිධාන, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් හා වෙනත් වෘත්තිකයන් ඇතුළුව ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් සිද්ධීන් සහ ගැටලු ගැන දැනුමක් ඇති බොහෝ මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම සහ රැස් කිරීම සිදු විය. UNOSAT ආයතනය චන්ද්‍රිකා ඡයාරූප පිළිබඳව අගනා විශ්ලේෂණයක් ලබා දුන්නේය.

22. යස්මින් සූකා සහ ස්ටීවන් රට්නර් වැනි විශේෂඥයන් සමග මර්සුකි දරුස්මාන්ගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ විශේෂඥ මණ්ඩලය ද තවත් මූලික තොරතුරු මූලාශ්‍රයක් විය. 2009 මැයි මාසයේ දී එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ජනාධිපති විසින් වගවීම පිළිබඳව දුන් පොරොන්දු ක්‍රියාත්මක කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ට උපදෙස් දීමට එම මණ්ඩලය 2010 දී පත් කරන ලදී. ලේඛනාරක්ෂණාගාරයේ භාරකරු වශයෙන් මහ කොමසාරිස් ශ්‍රී ලංකාව පිළිබඳ නිරීක්ෂණ

කොමිටියට, රහස්‍ය භාවය පිළිබඳ මග පෙන්වීම් දැඩිව පිළිපදිමින් ලේඛණාරක්ෂණාගාරයේ ඇති ලිපි ලේඛන පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දුන්නේය. එම ලිපි ලේඛන ගැටුමේ අවසාන කාල සීමාවට අදාල සිද්ධීන් විමර්ශනය කිරීමට තුඩු දෙන කරුණු හැඳින ගැනීමට වැදගත් මූලාශ්‍රයක් විය. විශේෂඥයන්ගේ මණ්ඩලය මූලික වශයෙන් අවධානය යොමු කෙළේ වගවීමට අදාල කරුණු පිළිබඳව මහ ලේකම්ට උපදෙස් දීමට වුවත් එය අන්තර්ජාතික නීතිය යටතේ දැක්වෙන උල්ලංඝනය කිරීම්වල ස්වභාවය සහ විෂය පථය ගැන තක්සේරුවක් ද කරන ලදී. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කණ්ඩායම එම විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් කීප දෙනකු හමු වූ අතර ඔවුන්ගෙන් ලැබුණු අදහස් අගය කරයි.

23. මෙම විමර්ශනයට 2002 සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීමට (2002 සිට 2007 දක්වා) ශ්‍රී ලංකාවේ රැඳී සිටි ශ්‍රී ලංකාවේ අධීක්ෂණ දූත මෙහෙයේ (SLMM ) ලිපි ලේඛන ගැඹුරින් අධ්‍යයනය කිරීමට අවස්ථාවක් ලැබීම බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ශ්‍රී ලංකාවේ අධීක්ෂණ දූත මෙහෙයට පැහැදිලිව මානව අයිතිවාසිකම් කඩ කිරීම් අධීක්ෂණය කිරීමේ මැන්ඩේට් බලයක් හිමි නොවූ නමුත් ගැටුමට අදාල නිති විරෝධී මිනී මැරීම්, පැහැර ගෙන යෑම් සහ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම් ඇතුළත් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අපහරණ ලෙස ගැනෙන සිද්ධීන් ද සටන් විරාම ගිවිසුම කඩ කිරීම්වලට ඇතුළත් විය. මහ කොමසාරිස් මෙම තොරතුරු ලබා ගැනීම පහසුකරවීම් සම්බන්ධයෙන් අදාල ආණ්ඩුවලට සිය කෘතඥතාවය පුද කරනු කැමැත්තේය.

**රහස්‍යභාවය**

24. රහස්‍ය භාවය සම්බන්ධයෙන්, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන සහ ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිටියේ ලේඛනාරක්ෂණාගාරයේ තබා ඇති වෙනත් රහස්‍ය තොරතුරු එක්සත් ජාතීන්ගේ ආරක්ෂාව සහ ලේඛනාරක්ෂණගාර ගත කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව අතිශය රහස්‍ය සේ වර්ග කර ඇති බව අවධාරණය කිරීමට මහ කොමසාරිස් කැමැත්තේය.[2]

25. වින්දිතයන්, සාක්ෂිකරුවන් හා ඔවුන්ගේ පවුල් හඳුනා ගැනීමට නොහැකි වන ආකාරයට මෙම වාර්තාවේ සඳහන් වන සිද්ධීන් බොහොමයක් පිළිබඳ නම්, දින හා ස්ථාන සඳහන් කෙළේ නැත.

**සම්මුඛ සාකච්ඡා/ සාක්ෂි**

26. සාක්ෂිකරුවන් සහ වෙනත් ඇසුදුටු සාක්ෂි විය හැකි මූලාශ්‍ර හැඳින ගැනීම සහ ආරක්ෂා කිරීම සංකීර්ණ කටයුත්තකි. ශ්‍රී ලංකාවට යෑමට අවස්ථාවක් නොමැතිවීම හා බැඳුණු ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳ ගැටලු, පළි ගැනීමට ලක්වීමේ අනතුර සාක්ෂිකරුවන් විය හැකි අය සම්බන්ධ කර ගැනීමේ අවස්ථාව දැඩි ලෙස සීමා කරවීය. සිදු වූයේයැයි කියන උල්ලංඝනය කිරීම් සහ අපහරණ අවම වශයෙන් වසර තුනකට පෙර සහ සමහර සිද්ධීන් වසර 12 කට පෙරවීම නිසා විශේෂයෙන්ම පැරණි සිද්ධීන් සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් සොයා ගැනීම අභියෝගයක් විය.

27. මෙම අභියෝග තිබුණත් ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය හැකි අවස්ථාවන්හි සම්මුඛ සාකච්ඡා, නැතිනම් ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය මාර්ගයෙන් ඍජුවම සාක්ෂි ලබා ගැනීමට ප්‍රමුඛතාවය දෙන ලදී. කෙසේ වුවත් ශ්‍රී ලංකාවට පැමිණීමට අවස්ථාවක් ලබා නොදුන් නිසා සහ ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳව පැවති තත්වය නිසා ශ්‍රී ලංකාව තුළ සම්මුඛ සාකච්ඡා පැවැත් වූයේ නැත.

28. දැඩි රහස්‍යභාවය තුළින් විශ්වාසය ගොඩ නැගිම සහ ප්‍රමාණවත් රැකවරණ පියවර තහවුරු කිරීම සාක්ෂිකරුවන්ට තම අත්දැකීම් පැවසීමට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට

[2] ලිපි ලේඛන ආරක්ෂා කිරීමේ සහ වර්ගීයකරණය පිළිබඳ එ ජා ප්‍රතිපත්තිය ST/SGB/2007/6 හි දැකිය හැකිය.

අතිශයෙන් වැදගත්ය. සම්මුඛ සාකච්ඡා කළ බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාවේ නොසිටියත් ඔවුන්ගේ සහ/හෝ තම පවුලවල ආරක්ෂාව ගැන සැක පහළ කළහ.

29. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියට සාක්ෂිකරුවන් සිය කැමැත්තෙන් සවිස්තරාත්මක ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වූ වෙනත් මූලාශ්‍ර ගණනාවක් තිබිණ. පසුව සමහර අවස්ථාවල සුදුසු තත්වයක් පැවතියේ නම් ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටිය මෙම සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැති වීය. මෙම තීරණය ගැනීමේ දි ආතතියක් ඇතිවීමේ තත්වයද සැලකිල්ලට ගන්නා ලදී.

**සැලකිරීම් කැඳවීම**

30. 2014 අගෝස්තු 4 වැනි දා සැලකිරීම් සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් කරන ලදී. එය මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවියේ ද පළ කෙරිණ. විද්‍යුත් තැපෑලෙන් සැලකිරීම් 1985 ක් ලැබුණ අතර ඉන් 45 ක් ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ මැන්ඩේට් බල සීමාවට අයත් වන්නේ නැත. තැපෑලෙන් 1197 ක් ලැබුණ අතර ඉන් 100 ක් මැන්ඩේට් බලයට ගැනෙන්නේ නැත. ( සමහර අය සැලකිරීම් විද්‍යුත් තැපෑලෙන් සහ සාමාන්‍ය තැපෑල යන දෙකින්ම එවා තිබිණ.) තැපෑලෙන් ලැබුණ සැලකිරීම් වලින් 329 ක් ශ්‍රී ලංකාවේ සිට එවන ලද අතර ඉන් බොහොමයක් එල්ටීටීඊ අපහරණයන් ගැනය.

31. ලැබී තිබුණ කාලයත්, ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩ නොලැබීමත් නිසා පුද්ගල සැලකිරීම් පිළිබඳව සොයා බැලීමට ඉඩ ලැබුණේ සීමිත සංඛ්‍යාවක් ගැන පමණි. එසේ ලැබුණු සමහර ඒවා වෙනත් මූලාශ්‍රවලින් ලැබුණු තොරතුරු සමග ගැලපිණ. කෙසේ වුවත් ඉන් සැලකිරීම්වල අගය අඩුවීමක් සිදු වන්නේ නැත. ඒවා ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ රහස්‍ය ලේඛනාරක්ෂණගාරයේ වාර්තා කර ඇත. ඒවා තමන්ගේ හෝ තම පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් අපහරණයට ලක් වූයේයැයි සිතන බොහෝ දෙනකුගේ සාක්ෂි වාර්තා කිරීමට සහ තක්සේරු කිරීමට මැන්ඩේට් බලය, කාලය සහ සම්පත් සහිත සුදුසු යාන්ත්‍රණයක අවශ්‍යතාවය පිළිබඳ දර්ශකයක් ලෙස සැලකිය යුතුය.

32. 2014 ඔක්තෝබර් අග කාලයේ දී මෙම කොමිටියට බොරු සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා හිස් ආකෘති පත්‍රවලට අත්සන් ලබා ගත්තේයැයි සැක කරන පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ දි අත් අඩංගුවට ගෙන තිබිණ. මෙය එවකට පැවති ආණ්ඩුව අප කොමිටිය අපකීර්තියට ලක් කිරීමට යොදා ගන්නා ලදී. සිදු වූයේයැයි කියන එම සිද්ධිය හා මෙම කොමිටිය අතර කිසිම ආකාරයකින් සම්බන්ධයක් නැති බවත් එවැනි කිසිම තොරතුරක් මෙම විමර්ශනයට හෝ නිගමනවලට යොදා නොගත්බවත් දැනුම් දිමට මහ කොමසාරිස් වරයා කැමැත්තේය.[3]

**තොරතුරු ප්‍රත්‍යක්ෂණය සහ ඇගයීම.**

33. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ මැන්ඩේට් බලය වූයේ මානව අයිතිවාසිකම් විමර්ශනයක් සිදු කිරීමය. මෙය අපරාධ විමර්ශනයක් නොවන නිසා මෙම කොමිටිය සිය සොයා ගැනීම් පදනම් කරන ලද්දේ ''විශ්වාස කිරීමට සාධාරණ හේතු'' පවතින්නේය යන ප්‍රමිතිය මතය. රැස්කර ගත් තොරතුරක් ප්‍රමාණවත්ව විශ්වාස කළ ගැකි නම් හා සනාථ කර ඇත්නම් නම්, ඉන් සමහර ඒවා අපරාධ ලෙස සැලකෙන්නේ නම් සිද්ධියක් හෝ උල්ලංඝනය කිරීමේ රටාවක් ''විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු'' පවතී. සිදුවීම් වූ දින නිශ්චිතවම සඳහන් කිරීම අභියෝගයක් වන්නේ, විශේෂයෙන්ම ගැටුමේ අවසාන සති කීපය තුළ පැවති කටුක තත්වයන් නිසා සිද්ධීන් පිළිබඳව හැම විට නිවැරදිව දිනය සිහිපත් කළ නොහැකි හෙයිනි.

[3] මෙම වාර්තාව ලියන අවස්ථාවේ එම පුද්ගලයා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු විභාගයක් නොමැතිව රිමාන්ඩ් සිර භාරයේ සිටී. විමර්ශනයට අගතියක් විය හැකි කිසියම් ක්‍රියාවක් අදහස් නොකරමින් සහ ඉදිරිපත්ව ඇති චෝදනාවල සත්‍යාසත්‍ය භාවය ගැන ස්ථාවරයක් නොගනිමින් මෙම කරුණ වහාම පුනරීක්ෂණය කොට නීතිය යටතේ වරදක් කර ඇත්නම් චෝදනා ඉදිරිපත් කිරීම හෝ නැතිනම් නිදහස් කළ යුතුයැයි ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය විශ්වාස කරයි.

34. නිශ්චිත උල්ලංඝනය කිරීම් හෝ සමහර අවස්ථාවල අපහරණ හෝ අපහරණ රටාවන් සිදු කෙළේයැයි චෝදනා කෙරෙන පුද්ගලයන්ගේ නම් අප කොමිටියට ලැබිණ. බොහෝ සිද්ධීන් ගැන මෙන්ම විස්තර කරන ලද සිද්ධීන් රටා ගැන ද අපරාධය ගැන එම පුද්ගලයන්ගේ වගකීම තක්සේරු කිරීමට සහ ඔවුන් ක්‍රියාවෙන් හෝ එසේ නොකිරීමෙන් සෘජුවම වගකීම හෝ අණදීමේ වගකිම පැවරෙන්නේ ද යන්න තහවුරු කිරීම සඳහා අපරාධ විමර්ශනයක් කිරීමට ප්‍රමාණවත් තොරතුරු පවතී.

35. මෙම කොමිටියට 1980 ගණන්වල සහ 1990 ගණන්වල බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිදු කළ පුද්ගලයන් ගැන රහස්‍ය නාම ලේඛන ලැබිණ. මෙම නාම ලේඛන පිළිබඳ වැඩි විස්තර බලහත්කාරයෙන් කරන ලද අතුරුදහන්වීම් පිළිබඳ VIII පරිච්ඡේදයේ සඳහන් වේ. එවැනි බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් පිළිබඳ සිද්ධීන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් පුද්ගලයන් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රකාශයට අනුකූලව සිදුවෙමින් පවතින උල්ලංඝනය කිරීම් ලෙස කොමිටියේ මැන්ඩේට් බලයට ඇතුළත් කර ගන්නා ලදී. වගවීම පිළිබඳව පවතින බාධක නිසා වාර්තාවන ආකාරයට එවැනි සිද්ධීන් ගැන අභිචෝදනා ඉදිරිපත් කර ඇත්තේ අතළොස්සක් ගැන පමණි. අතුරුදහන් කිරීමේ රටාව පිළිබඳ වගකීම ගැන කෙරෙන පුළුල් විමර්ශනයක දී මෙම චෝදනා පදනම් වූ තොරතුරු සමග නාම ලැයිස්තු පුනරීක්ෂණය කළ යුතුයැයි කොමිටිය විශ්වාස කරයි.

**අභියෝග සහ බාධක**

**ශ්‍රී ලංකාණ්ඩුව**

36. ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ වැඩකටයුතුවලට තිබූ විශාලම බාධකය වූයේ කලින් පැවති ආණ්ඩුවෙන් සහයෝගය නොදීම සහ විමර්ශනය අඩාල කිරීමේ උත්සාහයයි. ආරම්භයේ දිම එය මානව අයිකිවාසිකම් මණ්ඩලයේ මැන්ඩේට් බලයෙන් කරන විමර්ශනයක් ''සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප'' කෙළේය. එය එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමසාරිස් සහයෝගය ලබා දෙන ලෙස නැවත නැවතත් කරන ලද ඉල්ලීම් දිගින් දිගටම ප්‍රතික්ෂේප කෙළේය. 2014 ජුලි මාසයේ ශ්‍රී ලංකාවේ ජිනිවා එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත හමුවිමට ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියේ සම්බන්ධීකාරක සහ පසුව එහි විශේෂඥයන්ගෙන් කෙනෙකු වන ඩේම් සිල්වියා කාර්ට්රයිට් කළ ඉල්ලීම ද පිළිගත්තේ නැත. එසේ වුවත් මහ කොමසාරිස් 2014 සැප්තැම්බර් මාසයේ දී නිව්යෝර්ක් නගරයේ දි විදේශ ඇමති වරයා හමු වූයේය. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය 2014 දෙසැම්බර් 4 සම්පූර්ණ විස්තර ඉල්ලා ආණ්ඩුවට යවන ලද ලිපියට ද ( එම ලිපිය අමුණා ඇත.) ප්‍රතිචාර දැක්විමට අපොහොසත් විය.

37. ඒ වෙනුවට ආණ්ඩුව හැම විටම විමර්ශනයේ වාස්තවිකත්වය, වෘත්තීය භාවය සහ අවංකත්වය ප්‍රශ්න කරමින් එය යටපත් කිරීමට උත්සාහ ගත්තේය. ආණ්ඩුව 2014 නොවැම්බර් 4 සහ දෙසැම්බර් 2 අතර කාලයේ දී පුවත් නිවේදන ගණනාවක් නිකුත් කර කොළඹ සිටින තානාපතිවරුන් රැස්විම් තුනකට කැඳවා එක්සත් ජාතික්ගේ කොළඹ නේවාසික නියෝජිත හරහා රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශන දෙකක් නිකුත් කොට මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ගෞරවය, අවංක භාවය සහ කණගාටුදායක මට්ටමක පවතින වෘත්තීය නොවන තත්වය ප්‍රශ්න කරමින් මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ පවතින ''බරපතළ නොගැලපීම් සහ ප්‍රතිවිරෝධ ගණනාවක් ගැන'' එම කාර්යාලයට චෝදනා කෙළේය. මෙම චෝදනා එල්ල වූයේ ක්‍රියා පටිපාටිය, විශේෂයෙන්ම මෙම මණ්ඩලය සැලකිරීම් සඳහා නියම කළ අවසාන දිනය සම්බන්ධයෙනි.

38. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් 2014 නොවැම්බර් 7 වැනි දා පුවත් නිවේදනයක් නිකුත් කරමින් ''ක්‍රියා පටිපාටිය ගැන නිරන්තරයෙන් ප්‍රශ්න කරමින් කරුණු අවුල් කිරීම වෙනුවට විමර්ශනයට ලක්ව ඇති ප්‍රධාන කරුණු ගැන අවධානය යොමු කරන'' මෙන් රජයෙන්

ඉල්ලා සිටියේය.[4]මහ කොමසාරිස් වංචා සහගතව ප්‍රකාශ ලබා ගන්නේයැයි හා තොරතුරු ලබා ගැනිමට මුදල් ගෙවන්නේයැයි කර ඇති චෝදනා ද ප්‍රතික්ෂේප කෙළේය. ජිනීවා හි ශ්‍රී ලංකා නියෝජිත මහ කොමසාරිස් හමුවීමෙන් පසුව 2014 දෙසැම්බර් 15 දිනැතිව නිකුත් කළ ලිපියකින් සහයෝගය ලබා නොදීමේ ආණ්ඩුවේ ස්ථාවරය නැවත තහවුරු කෙළේය.

39. 2015 ජනවාරි මස බලයට පත් නව ආණ්ඩුව සහයෝගය සහ සම්බන්ධතාවය පවත්වා ගැනීමට උනන්දු වූ අතර විදේශ ඇමති මංගල සමරවීර, මහ කොමසාරිස් සමග අදහස් හුවමාරු කර ගැනිම් ගණනාවකට සම්බන්ධවිය. කෙසේ වුවත් නව රජය ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කොමිටියට ඍජු සහයෝගයක් ලබා නොදුන් අතර රටට ඇතුළුවීමේ ස්ථාවරයේ වෙනසක් සිදු වූයේ ද නැත. මාර්තු 15 වැනි දින නැවතත් තොරතුරු ලබා ගැනිමට කරන ලද ඉල්ලීමට නිල ප්‍රතිචාරයක් දැක්වූයේ ද නැත.

40. සහයෝගිතාවයක් නොමැති වුවත් අප කොමිටිය, මානව අයිතිවාසිකම් මණ්ඩලයට, මානව අයිතිවාසිකම් කොමිටියට සහ එක්සත් ජාතින්ගේ වෙනත් යාන්ත්‍රණවලට ලබා දී ප්‍රසිද්ධ කර ඇති ලිඛිත සහ වාචික ප්‍රකාශන, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමට රජයේ සහ හමුදාවේ නිලධාරීන් ලබා දී ඇති ප්‍රකාශනවල පිටපත්, ''මානුෂීය මෙහෙයුමේ සැබෑ තත්වය ගැන විශ්ලේෂණයක් 2006 ජුලි - 2009 මාර්තු '' සහ '' ශ්‍රී ලංකාවේ මානුෂීය ප්‍රයත්නය''මෙන්ම රජයේ නිල වෙබ් අඩවි වැනි ප්‍රසිද්ධ කරන ලද ආණ්ඩුවේ ලිපි ලේඛන පරීක්ෂා කරන ලදී. අනතුරුව විමර්ශන කොමිටියට කලින් ප්‍රකාශයට පත් නොකළ නිල ලිපි ලේඛන ගණනාවක්ම ලැබුණ අතර ඒවා සත්‍ය වාර්තා බව තහවුරු කර ගන්නා ලදී.

**එල්ටීටීඊය.**

41. ගැටුම අවසානයේ එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ නායකත්වය මරා දමන ලද නිසා කොමිටියට කණ්ඩායමේ ප්‍රතිපත්ති, මෙහෙයුම් හෝ සිදු කෙළේයැයි කියන අපහරණ ගැන ඍජුවම තොරතුරු ලබා ගැනිමට එල්ටීටීඊ නිලධාරීන් හමුවීමට නොහැකි විය. විමර්ශකයෝ ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් වධ හිංසා සහ වෙනත් බරපතළ උල්ලංඝනය කිරීම්වලට ලක් කරන ලද එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන් ගණනාවක් සමග සම්මුඛ සාකච්ඡා කළහ. එම සම්මුඛ සාකච්ඡාවලදී සමහරු කුරිරුකම් හෝ අපහරණ පිළිබඳ එල්ටීටීඊයේ වගකීම් ගැන තොරතුරු ලබා දුන් නමුත් බොහෝ දෙනා සංවිධානයේ අන්තර්ජාතික නිතියට නොගැලපෙන භාවිතා හෝ ප්‍රතිපත්ති ගැන පිළිගැනීමට හෝ සාකච්ඡා කිරීමට අකමැති වූහ. ඊට අමතරව එල්ටීටීඊයේ නිල ලිපි ලේඛන ලබා ගත නොහැකිවීමෙන් සමහර භාවිතාවන්ට අනුමැතිය ලැබී ඇත්තේ කුමන මට්ටමෙන් ද යන්න නිශ්චය කර ගැනීම දුෂ්කර විය. එසේ වුවත් එල්ටීටීඊයේ වින්දිතයන් ඇතුළු මූලාශ්‍ර ගණනාවකින් ලැබුණු තොරතුරු අනුව කොමිටියට එල්ටීටීඊය විසින් සිදු කරන ලද අපහරණ රටාව ලේඛන ගත කිරීමට හැකි විය.

**පලිගැනීමේ, හිරිහැර කිරීමේ, බිය වැද්දීමේ සහ වෙනත් අපහරණ පිළිබඳ බිය.**

42. කලින් පැවති ආණ්ඩුව විමර්ශනය යටපත් කිරීමට ගත් ප්‍රයත්නයේ බලපෑම, ශ්‍රී ලංකාව තුළ බිය සහ තර්ජනය කිරීමෙන් නිර්මාණය වූයේයි කිව හැකි තත්වයකින් වඩාත් සංකීර්ණ විය. මෙම කොමිටියේ වැඩ කටයුතු පැවති මුළු කාල සීමාවේදීම ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම උතුරේ ආරක්ෂක හමුදා විසින්, ග්‍රාමීය මට්ටමේ ක්‍රියාකාරීන්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ සාක්ෂිකරුවන් විය හැකි අය සෝදිසි කිරීම, තර්ජන කිරීම, බියවැද්දීම හා ප්‍රශ්න කිරීම සිදු කළ බවට නිරන්තරයෙන්ම වාර්තා විය.

43. විමර්ශන කොමිටියට සහයෝගය ලබා දීම හා සම්බන්ධයැයි හැම විටම විශේෂයෙන්ම කිව නොහැකි නමුත් විමර්ශනය නිසා හිරිහැර කිරීම් උත්සන්න වූ බව හැඟවෙන වාර්තා, විශේෂයෙන්ම 2014 ඔක්තෝබර් 30 දක්වා වූ සැලකිරීම්වල අවසාන දිනය ළඟාවෙත්ම වැඩි විය. සහයෝගය ලබා දීමට ඍජුවම බාධා කිරීමට අදහස් කෙළේද නැද්ද යන්න කුමක් වුවත් ශ්‍රී

[4] ශ්‍රී ලංකාව පිළිබඳ එ ජා විමර්ශනය අපකීර්තියට ලක් කිරීමේ අදහසින් දිගටම සිදු කරන සාවද්‍ය තොරතුරු පැතිරවීම සෙයිඩ් හෙළා දකියි.OHCHR 2014 නොවැම්බර් 7

ලංකාව තුළත් සමහර සිද්ධීන්වලදී ඉන් බැහැරවත් උල්ලංඝනය කිරීම් පිළිබඳ තොරතුරු ලබා දීමට සූදානම්ව සිටි අයට එය බලවත් බාධකයක් විය. විමර්ශකයන් ශ්‍රී ලංකාව තුළ තොරතුරු මූලාශ්‍ර විය හැකි අය සමග සන්නිවේදනය කිරීමේ දී එම සම්බන්ධතාවය ඉතාමත් අවම මට්ටමක පවත්වා ගැනිමටත් විද්‍යුත් සෝදිසි කිරීමේ අනතුර සීමා කිරීමේ විශේෂ ආරක්ෂක පියවර පවත්නා අවස්ථාවලට පමණක් සීමා කිරීමටත් අතිශයෙන්ම ප්‍රවේසම් විය. කලින් සඳහන් කළ ආකාරයට විමර්ශන කොමිටිය ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයන්ගෙන් වාචික සාක්ෂි ඍජුවම ලබා ගත්තේ නැත.

44. වැඩි දුරටත් සම්මුඛ සාකච්ඡාවට ලක් වූ පුද්ගලයන් ශ්‍රී ලංකාව තුළ නොසිටියත් එහි සිටින ඔවුන්ගේ පවුලේ අය පලිගැනීමේ අනතුරට ලක්විය හැකි වීමෙන් පෙනී යන්නේ එම පුද්ගලයන් ආරක්ෂා කිරීමට දැඩි පියවර ගැනීමේ අවශ්‍යතාවය යි.

**නැවත මානසික පීඩාවට පත්වීමේ අනතුරු**

45. බොහෝ දෙනකු දිගටම මානසික ආතතියට පත්ව සිටීමද සාක්ෂිකරුවන් සොයා ගැනීම කෙරේ බලපෑය. ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා කිරීමෙන් ඔවුන් නැවත වරක් මානසික ආතතියට පත් නොකිරීමට විමර්ශකයෝ විශේෂයෙන්ම සංවේදි වූහ. සම්මුඛ සාකච්ඡාවලට පෙරාතුව විමර්ශකයෝ මෙම අනතුරු සහ ලබා ගත හැකි උපදේශන සහ මානසික සහායේ ස්වභාවය ගැන තක්සේරුවක් සිදු කළහ. සමහර අවස්ථාවල දී සමහර පුද්ගලයන් හා සම්මුඛ සාකච්ඡා නොපැවැත්වීමට තිරණය කෙරිණ. ඇත්තෙන්ම විමර්ශකයෝ කාලයක් ගතවීමෙන් පසුවද වින්දිතයන් තවමත් පීඩාවට පත් කෙරෙන මානසික ආතතියේ ප්‍රමාණය ගැන දැඩිව කම්පාවට පත් වුහ. සාක්ෂි දිමට ඉදිරිපත් වූ අයගේ ධෛර්ය ගැන ඔවුන්ට කෘතවේදීත්වය පුද කිරීම වැදගත් ය.

46. ඉහතින් සඳහන් සඳහන් කළ බාධක වුවත් විමර්ශන කොමිටිය රැස්කරගත් සහ තහවුරු කරගත් තොරතුරු මානව අයිතිවාසිකම් සහ අන්තර්ජාතික මානුෂීය නිති දීර්ඝ කාලයක් තිස්සේ ගැඹුරටම මුල් බැස ගත් ආකාරයෙන් උල්ලංඝනය හා අපහරණය වන්නේ ද යන්න පිළිබඳ ප්‍රබල සොයා ගැනීම් ය. ඉන් සමහරක් අන්තර්ජාතික අපරාධ සේ ගිණිය හැකිය.

## III පසුබිම් සන්දර්භය

**1948 – 2001: නිදහසේ සිට සටන් විරාම ගිවිසුම දක්වා.**

47. 1948 නිදහසින් පසු ක්‍රියාත්මක කළ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ගණනාවක් සිංහල බහුතරයට හිතකර වුවත් දෙමළ සුළුතරය කොන් කිරිමට හා වෙන් කිරිමට හේතු විය. ආණ්ඩුව මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කෙළේ යටත් විජිත පාලනය යටතේ සිංහලයන් මුහුණ දුන් අවාසි සහගත තත්වයට සහනයක් වශයෙන් වුවත් එය වාර්ගිකව පදනම් වූ බහුතරයේ පාලනයක් විය. 1956 සිට වරින් වර ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ඇතිවිමත්, දෙමළ ප්‍රජාවේ සමහර කොටස් වැඩි වැඩියෙන් රැඩිකල්විමත් දක්නට ලැබිණ. සමහර දෙමළ දේශපාලන පක්ෂ දිගටම පාර්ලිමේන්තු දේශපාලනයේ නිරත වූ අතර සටන්කාමී කණ්ඩායම් දිවයිනේ උතුරේ සහ නැගෙනහිර වෙනම රාජ්‍යයක්, ''තමිල් ඊළාම්'' ඉල්ලා සිටියහ.

48. තමිල් නව කොටි සංවිධානය 1972 දි පිහිටුවන ලද අතර එය 1976 දි තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය විය. ඉන් පසු දශක කීපය තුළ එය අනෙකුත් තරගකාරී දෙමළ පක්ෂ සහ සටන්කාමී සංවිධාන සමග අරගලයක යෙදිණ. 1983 ජුලි මාසයේ දී එල්ටීටීඊ ප්‍රහාරයකින් යාපනයේ දී ආණ්ඩුවේ හමුදා භටයන් 13 දෙනකු මරණයට පත්වීමත් සමග රට පුරාම කළු ජුලිය නමින් හැඳින් වූ ජාතිවාදී කලකෝලාහල හට ගැනිණ. දෙමළ ජාතිකයන් 3000 ක් තරම් සංඛ්‍යාවක් මරා දමන ලද අතර ඔවුන්ගේ දේපොළ හා ව්‍යාපාරික ස්ථාන විනාශ කෙරිණ. බොහෝ දෙනකු සිංහල බහුතර ප්‍රදේශවලින් පලා ගියහ. අනතුරුව සමහරු රට හැර ගියහ. ආණ්ඩුව සහ එල්ටිටීඊය අතර පූර්ණ සන්නද්ධ ගැටුමක් ආරම්භ විය.

49. එල්ටිටීඊය, මුස්ලිම් සහ සිංහල ප්‍රජාවන් පලවා හැර උතුර නැගෙනහිර විශාල භූමි ප්‍රදේශයක් අත්කර ගැනිමට සමත් වූ සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක හමුදා සහ සිවිල් ඉලක්කවලට ප්‍රහාර එල්ල කළ හැකි කුරිරු සහ බලවත් මිලිටරි සංවිධානයක් බවට පත් විය. ඉතාමත් කුරිරු ක්‍රියාවක් වන්නේ 1990 ජුනි මාසයේ මඩකලපුවේ දී එල්ටීටීඊයට යටත් වූ පොලිස් නිලධාරීන් සිය ගණනක් මරා දැමීමයි.[5]එල්ටිටීඊය බලහත්කාරයෙන් බඳවා ගැනිම සහ කප්පන් ගැනිම තුළින් උතුරු නැගෙනහිර මෙන්ම විශාල සංඛ්‍යාවක් වූ දෙමළ ඩයස්පෝරාවේ පාලනයක් සහ සැලකිය යුතු බලපෑමක් හිමි කරගෙන සිටියේය. ආණ්ඩුවේ හමුදා සහ ප්‍රතිවිරුද්ධ දෙමළ සන්නද්ධ කණ්ඩායම් ඊළඟ දශක දෙක තුළ ගැටුමේ විවිධ අදියරවල බරපතළ මානව අයිතිවාසිකම් අපහරණයන්, විශේෂයෙන්ම හිතුවක්කාර ලෙස රඳවා ගැනීම්, වධ හිංසා පැමිණවීම් සහ දහස් ගණන් අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතුය.

50. ඊට වෙනස්ව ශ්‍රී ලංකාව දකුණේ මාක්ස්වාදී ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ කැරැල්ලකට ද මුහුණ දුන්නේය. කෙටි කාලයක් පැවති 1971 කැරැල්ල ඉක්මණින්ම යටපත් කළ නමුත් 1987 දී දෙමළ ගැටුමට ඉන්දියානු මැදිහත්විමට එරෙහිව දියත් කළ දෙවන කැරැල්ල වසර ගණනාවක් පැවතිණ. ජනතා විමුක්ති පෙරමුණ, හමුදාව සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගත් ඝාතන සහ ප්‍රහාර සිදු කෙළේය. නීතියට පරිබාහිරව සිදු කළ මිනී මැරීම් දහස් ගණනකින් සහ බලහත්කාරයෙන් සිදු කළ අතුරුදහන් කිරීම් වලින් ප්‍රචණ්ඩලෙස ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කෙරිණ.

51. මෙම ප්‍රචණ්ඩ ව්‍යාපාරවලට එක් ප්‍රධාන ප්‍රතිචාරයක් වූයේ 1971 මාර්තු මාසයේ දි මහජන ආරක්ෂක පනත යටතේ හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම ය. ඉන් අනතුරුව හදිසි බලතල හඳුන්වාදීම සහ ත්‍රස්තවාදය වැළැක්විම පනත වැනි දරදඬු ආරක්ෂක ව්‍යවස්ථා පැනවීය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුලින්ම 1979 දි වසර තුනක් සඳහා පැන වුවද පසුව එය 1982 දී ස්ථිර ව්‍යවස්ථාවක් බවට පත් කරන ලදී. මෙම ව්‍යවස්ථාවෙන් පුළුල් ලෙස හා හිතුවක්කාර ලෙස රඳවා ගැනීමට, වධ හිංසා පැමිණවීමට සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට අවස්ථාවක් උදාවිය. ඊට අමතරව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ප්‍රබල විධායක ජනාධිපති ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය කෙරේ දීර්ඝ කාලීන බලපෑමක් විය.

52. තවත් බලපෑමක් වූයේ ගැටුමේ විසඳුමක වැදගත් කඩ ඉමක් සනිටුහන් කරමින් 1987 දී ඇති කර ගත් ඉන්දු ලංකා සාම ගිවිසුමේ මූලික ප්‍රතිපාදන ඉන්දියානු සාම සාධක හමුදවේ සහාය ඇතිව හෝ ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීමය. මෙම ගිවිසුම අනුව 1987 නොවැම්බර් මාසයේ දී රට පුරාම පළාත් ආණ්ඩුවලට බලය බෙදා හැරීමට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්නා ලදී. සිංහල ජාතිවාදීන්ගේ විරෝධය මැද දෙමළ ජනතාවගේ අපේක්ෂාව අනුව මුලින්ම උතුරු නැගෙනහිර එකම ඒකකයක් බවට පත් කෙරිණ. ආණ්ඩුව විසින් ඒක පාක්ෂික ස්වාධීනත්වය ප්‍රකාශ කිරීමක් ලෙස හැඳින් වූ යෝජනාවක් පළාත් සභාවට ඉදිරිපත් කිරීමත් සමග ඒකාබද්ධ උතුරු නැගෙනහිර පළාත් සභාව 1990 දී විසුරුවා හරින ලදී.

53. රටේ සෙසු පළාත්වල පළාත් සභා ක්‍රියාත්මක වුවද උතුරු සහ නැගෙනහිර පළාත් කොළඹින් සෘජුවම පාලනය විය.[6] බලය බෙදා හැරීම පිළිබඳ ගැටලු ගැටුමට සහ සාම මුලපිරුම්වලට කේන්ද්‍රීය වූ කරුණක් ලෙස පවතිනු ඇත.

### 2002 - 2005: සටන් විරාමයේ සිට එදිරිවාදුකම් උත්සන්නවීම දක්වා

54. දශක දෙකකට ආසන්න කාලයක් පැවති යුද්ධයෙන් පසුව 2002 පෙබරවාරි මාසයේ දී නෝර්වේ ආණ්ඩුවේ පහසුකරණය යටතේ ශ්‍රී ලංකාණ්ඩුව සහ එල්ටීටීඊය අතර සටන් විරාම

---

[5] http://www.uthr/org/Reports/Report4/chapter2.htm

[6] අවසානයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය 2006 ඔක්තෝබර් මාසයේ දී උතුර සහ නැගෙනහිර පළාත් එකතු කිරීමේ නෛතික බලයක් නැති බව ප්‍රකාශ කිරීම නිසා 2008 දී නැගෙනහිර පළාත් සභාව සඳහා වෙනම ඡන්ද විමසීමක් පැවැත්වීමට ඉඩ ලැබිණ.

ගිවිසුමක් අත්සන් කරන ලදී. සටන් විරාම ගිවිසුම යටතේ හමුදා ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම නතර කිරීම, පාලන බලය අත් කරගෙන තිබුණු ප්‍රදේශ අනුව හමුදා ඈත් කර තැබීම, දෙමළ සන්නද්ධ කණ්ඩායම් නිරායුධ කිරීම සිදු කළ යුතු විය. සටන් විරාම ගිවිසුම යටතේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. සටන් විරාම ගිවිසුමට මානව අයිතිවාසිකම් රාමුවක් ඇතුළත් නොවූ නමුත්[7] අන්තර්ජාතික නීතියට අනුකූලව වධ හිංසා, බිය වැද්දීම, පැහැරගෙන යෑම, කප්පම් ගැනීම සහ හිරිහැර කිරීම වැනි දේ ඇතුළත් සිවිල් ජනතාවට එරෙහි එදිරිවාදුකම්වලින් වැළකී සිටීමට පාර්ශ්වකරුවෝ බැඳී සිටිති. ගිවිසුමෙන් එහා මෙහා යෑමේ නිදහස ඇතුළත්ව සාමාන්‍ය තත්වය ප්‍රතිස්ථාපනය කිරීමේ පියවර ගනු ඇතැයිද අපේක්ෂා කෙරේ. ගිවිසුම අධීක්ෂණය කිරීමට සහ 'කිසියම් කඩකිරීමක් ඇතිනම් පරීක්ෂා කිරීමට' නෝර්ඩික් රටවල් පහක පුද්ගලයන්ගෙන් යුත් කණ්ඩායමක් 'ශ්‍රී ලංකාවේ නිරීක්ෂණ දූත මෙහෙය' (SLMM ) නමින් ස්ථාපනය කරන ලදී.

55. එක් අතකින් සටන් විරාම ගිවිසුම ගැටුමට කල් පවත්නා විසඳුමක් ළඟා කරන්නේයැයි සුභවාදී බලාපොරොත්තුවක්ද ඇති කෙළේය. ආණ්ඩුවේ සහ එල්ටීටීඊයේ නියෝජිතයන් අතර විධිමත් නොවන ආකාරයේ සාකච්ඡා වට කිපයක් ද පැවැත්විණ. අන්තර්ජාතික ප්‍රදානකයෝ ටෝකියෝ හි පැවති මහා සමුළුවක[8] දී සාම ක්‍රියාවලියට සහ පශ්චාත් යුද සමයේ යළි ඉදිකිරීම් සඳහා පුළුල් ලෙස සහාය දීමට පොරොන්දු වූහ.

56. කෙසේ වෙතත් ගිවිසුම දකුණේ සැක සංකා සහ දේශපාලන බෙදීම් ඇති කරවීය. බොහෝ දෙනකු සටන් විරාම ගිවිසුම දුටුවේ රට අනියමින් බෙදීමක් සහ එල්ටීටීඊයට තම ශක්තිය නැවත ගොඩ නගා ගැනිමට ලබා දුන් අවස්ථාවක් සේය. මෙම බිය වඩාත් උග්‍ර වූයේ එල්ටීටීඊය අන්තර්වාර ස්වයං පාලන අධිකාරියක් පිහිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් සහ සටන් විරාම ගිවිසුම යටතේ ඉඩ දී තිබුණ ආකාරයට උතුරු නැගෙනහිර ප්‍රධාන නගරවල තම දේශපාලන කාර්යාල විවාත කිරීමත් සමගය. එල්ටීටීඊය කප්පම් ගැනීම, ඉලක්ක කර ගත් පුද්ගලයන් ඝාතනය කිරීම සහ නොකඩවාම ළමා සොල්දාදුවන් බඳවා ගැනිම සිදු කළ නිසා සටන් විරාම ගිවිසුම දිගින් දිගටම උල්ලංඝනය කරන්නේයැයි චෝදනා එල්ලවිය. සටන් විරාම ගිවිසුම 2008 දී අවසන් වන විට එල්ටීටීඊය විසින් සිදු කළ කඩ කිරීම් 3800 ත් හා ආණ්ඩුවෙන් කළ කඩකිරීම් 350 ක් ශ්‍රී ලංකා නිරීක්ෂණ කණ්ඩායම වාර්තා කර තිබිණ.

57. 2003 නොවැම්බර් මාසයේ දි ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, අගමැති රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවෙන් ආරක්ෂාව, ස්වදේශ කටයුතු සහ ජන සන්නිවේදන වැනි ප්‍රධාන අමාත්‍යාංශ පවරා ගත්තාය. මෙය 2004 අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තු මැතිවරණයකට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද රාජපක්ෂ අගමැති තනතුරට පත් කළ ආණ්ඩු වෙනසකට හේතු විය.

**කරුණාගේ ඉවත්වීම**

58. මේ අතර 2004 මාර්තු මාසයේ දී එල්ටීටීඊයේ නැගෙනහිර ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරියා වන විනයාගමුර්ති මුරලිදරන් නොහොත් කරුණා අම්මාන් ඉවත්වීමෙන් එහි බරපතළ බෙදීමක් වාර්තාවිය. බොහෝ ළමයින් ඇතුළුව කාර්ය ධරයන් දහස් ගණනක් ආපසු සිය නිවෙස්වලට පැමිණි නමුත් බිඳී ගිය ''කරුණා කණ්ඩායම'' පසුගිය කාලයේ දි ආණ්ඩුව සමග එක් වූ ඊළාම් ජනතා විමුක්ති පක්ෂය (EPDP ) වැනි වඩාත් පැරණි දෙමළ සන්නද්ධ කණ්ඩායම් සමග කැපී පෙනෙන නව සන්නද්ධ කණ්ඩායමක්[9] ලෙස ඉස්මතු විය.

---

[7] සාම ක්‍රියාවලියේ පළමු අදියරේ දී මානව අයිතිවාසිකම් සහ මැනුෂීය මූලධර්ම පිළිබඳ පරිපූරණ ආකෘති රාමුවක් සාකච්ඡා කිරීමට ගත් උත්සාහ ව්‍යාර්ථ විය.

[8] 2003 ටෝකියෝ සමුළුවෙන් බැහැර කිරීම නිසා එල්ටීටීඊය තාවකාලිකව සාම ක්‍රියාවලියෙන් ඉවත් විය.

[9] කරුණා කණ්ඩායම 2007 සිට දේශපාලන පක්ෂයක් ලෙස තමිල් මක්කල් විදුතලෙයි පුලිහල් නමින් ලියා පදිංචි විය.

59. කරුණා තමන් සමග වැදගත් බුද්ධි තොරතුරු මෙන්ම හමුදාමය ශක්තියක් ගෙන ආවේය. ඉන්පසු වසර ගණනාවක් මුළුල්ලේම එල්ටීටීඊය සහ සන්නද්ධ කණ්ඩායම් එකිනෙකාට එරෙහිව ඉලක්ක කර ගත් මිනී මැරුම්[102] මෙන්ම සාමාන්‍ය ජනතාව පැහැර ගෙන යෑම් සහ පහරදීම් ගණනාවක් සිදු කළහ. කරුණා කණ්ඩායම ආණ්ඩුව සමග සහයෝගයෙන් කටයුතු කළ බවක් පෙනිණ. යුනිසෙෆ් සංවිධානය ළමා සොල්දාදුවන් බඳවා ගැනිම වැළැක්වීමට සහ ඔවුන් නිදහස් කිරීමට ප්‍රයත්න ගත් නමුත් කණ්ඩායම් දෙකම ළමයින් බඳවා ගැනීම විශාල වශයෙන් කරන ලදී. එල්ටීටීඊය ශ්‍රී ලංකා යුද හමුදාවට සහ පොලිසියට තැන් තැන් වල ප්‍රහාර එල්ල කළ ද ඒවා සුළු අවි සහ ග්‍රෙනේඩ් යොදා ගත් සුළු ප්‍රහාර විය. එල්ටීටීඊය නැගෙනහිර පළාතේ කරුණා ඉවත්වීමෙන් අහිමි වූ භූමි ප්‍රදේශ නැවත අත්පත් කර ගැනිමටත් හමුදා ශක්තිය නැවත තහවුරු කිරීමටත් උතුරේ වන්නියෙන් නැගෙනහිරට බලඇණි යැවීය.

**සුනාමියඃ 2004 දෙසැම්බර්**

60. 2004 දෙසැම්බර් මස ඉන්දියන් සාගරයේ හටගත් සුනාමියෙන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල 40,000 කට අධික සංඛ්‍යාවක් මිය ගිය අතර ගැටුම්වලින් අවතැන් වූ 390,000 ට අමතරව තවත් 500,000 කට අධික පිරිසක් අවතැන් කරවිය. සුනාමි සහන කටයුතු සාම ක්‍රියාවලිය නැවත පණ ගන්වනු ඇතැයි බලාපොරොත්තුවක් තිබුණද – නිදසුනක් වශයෙන් සහන කටයුතු සම්බන්ධීකරණය කිරීමට ඒකාබද්ධ කලමනාකරණ ව්‍යුහයක් ගැන එකඟතාවයක් ඇති කර ගැනිණ.[11] යළි ගොඩනැගීමේ දේශපාලනය ඉක්මණින්ම අවිශ්වාසය සහ විරසකකම් ඇති කෙරිණ. ආධාර වැඩි වශයෙන් දකුණේ සිංහල ජනතාවට ලබා දුන් අතර උතුර හා නැගෙනහිර වැඩියෙන්ම සිටින දෙමළ ජනතාවට ප්‍රමාණවත්ව නොලැබෙන්නේයැයි ප්‍රබල හැඟීමක් දෙමළ ජනතාව තුළ ඇති විය. ගැටුමෙන් අවතැන් වූ උතුරු සහ නැගෙනහිර දෙමළ ජනතාව වැඩි වශයෙන්ම බැහැර කෙරිණැයි හැඟීමක් ඇති විය.[12]

**එදිරිවාදුකම් විවෘතවම නැවත හට ගැනිම**

61. 2005 අගෝස්තු මස ප්‍රමුඛ දෙමළ දේශපාලකයෙක් වූ විදේශ කටයුතු පිළිබඳ ඇමති ලක්ෂ්මන් කදිරගමාර් කොළඹ ඔහුගේ නිවසේදී ඝාතනය කරන ලදී. එය එල්ටීටීඊය විසින් සිදු කරන ලදැයි චෝදනා කෙරිණ. මෙම සිද්ධිය සාම ක්‍රියාවලියට එරෙහි දකුණේ පැවති ආකල්පය වඩාත් දැඩි කළ අතර එල්ටීටීඊය තහනම් කිරීමෙන් ජාත්‍යන්තරව හුදකලා කිරීම වේගවත් විය. ආණ්ඩුව හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කොට ආරක්ෂක ලේකම්ට අත් අඩංගුවට ගැනීමට සහ පරිපාලන වශයෙන් රඳවා ගැනිමටත් හමුදාවට සහ පොලීසියට ඒවා ක්‍රියාත්මක කිරීමටත් පුළුල් බලතල පැවරෙන නව හදිසි නීති රෙගුලාසි හඳුන්වා දෙන ලදී. 2005 නොවැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයෙන් – එල්ටීටීඊය තම බලය පැවති ප්‍රදේශවල ජනාධිපතිවරණය වර්ජනය කෙළේය- සටන් විරාමය විවේචනය කළ සහ ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීමට ප්‍රතිඥා දුන් මහින්ද රාජපක්ෂ ජය ගත්තේය.

62. 2005 දෙසැම්බර් මස එල්ටීටීඊය මූලික වශයෙන් ආරක්ෂක හමුදාව ඉලක්ක කර ගත්[13] නමුත් වැඩියෙන්ම ළමයින් ඇතුළු සිවිල් ජනතාව විපතට පත් ක්ලේමෝර් බිම් බෝම්බ ප්‍රහාර[14] තුළින්

[10] සටන් විරාම ගිවිසුම යටතේ ආයුධ දැරීමට අවසර ලැබුණේ ආණ්ඩුවට සහ එල්ටීටීඊයට පමණි. එහෙත් ඒ තම පාලනය යටතේ පවතින ප්‍රදේශවල පමණි. ආණ්ඩුව අනෙකුත් සන්නද්ධ කණ්ඩායම් නිරායුධ කළ යුතු විය. එහෙත් ආණ්ඩුව එල්ටීටීඊයෙන් බිඳී ගිය පසු කරුණා කණ්ඩායම ඇතුළුව තම පාලන ප්‍රදේශයේ සිටි අතුරු හමුදා කණ්ඩායම් නිරායුධ කිරීමට අපොහොසත් විය. කරුණා කණ්ඩායම සටන් විරාම ගිවිසුමට පාර්ශවයක් නොවූ නමුත් ශ්‍රී ලංකා අධීක්ෂණ කොමිටිය (SLMM) 2005 සිට එහි වැඩ කටයුතු සටන් විරාමය උල්ලංඝනය කිරීම් ලෙස වාර්තා කෙළේය.

[11] ආණ්ඩුව සහ එල්ටීටීඊය ඇතුළත් වන පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරණ පද්ධතියක් (PTOMS) සඳහා වූ එකඟතාවයක් ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග 2005 දී අත්සන් කළ නමුත් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වූ පෙත්සමක් මත එහි සමහර වගන්ති ව්‍යවස්ථාවට පටහැණියැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත් කෙරිණ.

[12] http://www.brookings.edu/reseach/speeches/2010/03/03-natural-disasters-ferris

[13] මානුෂීය මෙහෙයුම් සත්‍ය විග්‍රහයක්. ගොනුවේ සාක්ෂිකරු ප්‍රකාශය (WS) 2006 ජුලි – 2009 මාර්තු ආරක්ෂක අමාත්‍යාංශය(MOD) 2011 ජුලි.

නැවතත් ප්‍රචණ්ඩත්වය මුදා හැරීමේ ව්‍යාපාරයක් අරඹන ලදී. මුලින්ම බිම් බෝම්බ යොදා ගැනීම සිදු වූයේ යාපනය අර්ධද්වීපයේය. පසුව ඉක්මනින්ම වන්නියේ ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට ද ව්‍යාප්ත විය. විශේෂයෙන්ම ප්‍රහාර සිදු වූයේ මන්නාරම සහ වවුනියාවේය.

63. එල්ටීටීඊය සහ ප්‍රති විරුද්ධ සන්නද්ධ කණ්ඩායම් අතරත්, ආණ්ඩුවේ හමුදා බුද්ධි අංශයේ පිරිස් ප්‍රමුඛ දෙමළ පාර්ලිමේන්තු මංත්‍රීවරුන් හා ජනමාධ්‍යවේදීන් ඉලක්ක කර ගත් මිනී මැරුම් වඩාත් උත්සන්න කළහ. ආණ්ඩුවේ හමුදා විසින් සුදු වෑන්වලින් කෙරෙන පැහැර ගැනීම් සහ අතුරුදහන් කිරීම් කොළඹ ඇතුළු අනෙකුත් ප්‍රදේශවල නැවත වරක් වැඩි විය. එල්ටීටීඊයෙන් සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගෙන දුම්රියට සහ බස්වලට ප්‍රහාර එල්ල කෙරිණ. විශේෂයෙන්ම නැගෙනහිර සහ උතුරේ යාපනය සහ මන්නාරම අසළ හමුදාව සමග ගැටුම් වාර්තා විය. කරුණා පාර්ශ්වයෙන් ලත් බුද්ධි තොරතුරු පදනම් කර ගත් ශ්‍රී ලංකා හමුදාවේ දුරදිග විහිදුම් බලකාය එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශය තුළ ද මෙහෙයුම් සිදු කෙළේය. පාර්ශ්වයන් ක්‍රම ක්‍රමයෙන් ''සැඟවුන යුද්ධයක''[15] පැටලී ඇතැයි ශ්‍රීලංකා නිරීක්ෂණ දූත මෙහෙයේ ප්‍රධානි සිය අදහස ප්‍රකාශ කෙළේය.

**2006 – 2008 එදිරිවාදුකම් තවත් උත්සන්නවීම.**

64. 2006 මැද භාගය වන විට සටන් විරාමය සැලකිය යුතු ලෙස බිඳ වැටිණ. සමස්ත ආරක්ෂක තත්වය සීඝ්‍රයෙන් පිරිහීමට පත් වූ අතර 2006 අප්‍රේල් 20 වැනි දා එල්ටීටීඊය පැවැත්වෙමින් තිබූ සාම සාකච්ඡාවලින් ඉවත් වූයේය. ඊට දින කීපයකට පසු එල්ටීටීඊය හමුදා ප්‍රධානි ජනරාල් සරත් පොන්සේකා ඝාතනය කිරීමට තැත් කළ අතර එහිදී ඔහුට බරපතළ තුවාල සිදු විය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඊට පලිගැනීමක් වශයෙන් නැගෙනහිර එල්ටීටීඊ පාලනය යටතේ පැවති සාම්පූර් ප්‍රදේශයට ගුවන් ප්‍රහාර එල්ල කෙළේය.[16] 2006 දෙසැම්බර් මස නැවත වරක් එල්ටීටීඊය කොළඹ දී ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතනය කිරීමට තැත් කෙළේය.

65. 2006 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව ත්‍රිකුණාමලයෙන් දකුණේ මුහුදු බොක්කේ උපාය මාර්ගික වශයෙන් වැදගත් සාම්පූර් දකුණ ප්‍රදේශයට ගුවන් ප්‍රහාර එල්ල කෙළේය. වාර්තා වූ ආකාරයට එල්ටීටීඊ කඳවුරු පිහිටා තිබුණේ සිවිල් ජනතාව සිටි ස්ථාන ආසන්නයේය. මෙම ගුවන් ප්‍රහාර සටන් විරාමය කඩ කිරීමක් ලෙස හැඳින් වූ ශ්‍රී ලංකා නිරීක්ෂණ දූත මෙහෙය ''එල්ටීටීඊය පාසල් සහ පුද්ගලික නිවාස ආසන්නයේ සිවිල් ජනතාව ගැවසෙන තැන්වල තම සටන් කණ්ඩායම් සහ දේශපාලන කාර්යාල පිහිටුවීම සමාව දිය නොහැකි වරදක්යැ''යි හැඳින් වූයේය.[17]

**නැගෙනහිර සටන් ඇවිළයෑම**

66. 2006 ජුලි මාසයේ දී එල්ටීටීඊය ත්‍රිකුණාමලයට නිරිත දිගින් වූ මාවිල් ආරු ප්‍රදේශය අත්පත් කර ගෙන නැගෙනහිර පළාතට ජලය සැපයීමේ කේන්ද්‍රස්ථානයක් වන ජලාශයේ දොරටු වසා දමා ත්‍රිකුණාමලය නාවික කඳවුරට පහර දුන්නේය. ඒ සමගම එල්ටීටීඊය යාපනය අර්ධද්වීපය නැවත අත් කර ගැනීමේ අරමුණෙන්යැයි කිවහැකි උතුරේ පාලන රේඛාව හරහා නැවතත් සටන්

---

[14] ක්ලේමෝර් බෝම්බයක් යනු සැඟව සිට පහර දීමේදී යොදා ගන්නා දුරස්ථ පාලක, එක දිසාවකට පැතිරෙන පුද්ගල නාශක බොම්බයකි. ඇත්තේනම ක්ලේමෝර් යනු එක්සත් ජනපදයේ නිෂ්පාදනය කරන බෝම්බ වර්ගයක සන් නාමයයි. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ එය යෙදෙන්නේ වයරයකින් ඈත සිට පුපුරුවා හරින බෝම්බවලට සහ සටන් කණ්ඩායම් තනා ගන්නා දුරස්ථ පාලක බෝම්බ (IED) වලටය.

[15] http://www.tamilguardian.com/article.asp?articleid=292

[16] http://www.crisisgroup.org/en/regions/asia/south-asia/sri-lanka/124-sri-lanka-the-failure-of-the-peace-process.asps

[17] SLMM public press release, 20 april 2006. http://lankapage.wordpress.com/2006/04/30/slmm-rules-air-strkes-violation-truce

මෙහෙයුමක් දියත් කෙළේය. ශ්‍රී ලංකා යුද හමුදාව ඔපරේෂන් වෝටර්ෂෙඩ් (Operation Watershed) දියත් කළ අතර ඉන් නැගෙනහිර සටන් ඇරඹීම සනිටුහන් විය.

67. කොළඹ ඒකාබද්ධ හමුදා මූලස්ථානයේ පාලනය යටතේ වැලිකන්දේ පිහිටි ආරක්ෂක බලකා මූලස්ථානය- නැගෙනහිර (SFHQ-E ) මෙහෙයුමක් දියත් කෙළේය.[18] 22 හා 23 පාබල හමුදා නැගෙනහිර මූලස්ථානය යටතේ පැවති අතර කොමාන්ඩෝ බලකාය සහ විශේෂ බලකා බ්‍රිගේඩයක්[19] මෙහෙයුම් සඳහා ඊට අනුයුක්ත කර තිබිණ. ශ්‍රී ලංකා යුද හමුදාව සති දෙකක් ඇතුළත මාවිල් ආරු ප්‍රදේශය නැවත අත් කර ගත්තේය. ඉන් පසුව ශ්‍රී ලංකා හමුදාව සීමිත ප්‍රදේශයක් අත්පත් කර ගෙන එය තහවුරු කර ගැනීමෙන් පසුව ඊළඟ ඉලක්කය කරා යෑමේ උපාය මාර්ගයක් ( Bite and holding ) අනුගමනය කෙළේය.

68. ශ්‍රී ලංකා යුද හමුදාව ඊළඟට 2006 දී සාම්පූර්( අගෝස්තු - සැප්තැම්බර්) වාකරේ ( 2006 ඔක්තෝබර්- 2007 ජනවාරි) කන්චිකුඩිච්චාරු ( 2007 ජනවාරි- පෙබරවාරි) මඩකලපුව නැගෙනහිර (2007 පෙබරවාරි- අප්‍රේල්) මඩකලපුව බටහිර ( 2007 අප්‍රේල්- ජුලි) හා එල්ටීටීඊයේ නැගෙනහිර තිබූ අවසාන බලකොටුව තොප්පිගල (2007 ජුලි) අත්පත් කර ගත්තේය. ප්‍රදේශය ගැන කරුණා කණ්ඩායම සතු දැනුම නිසැකයෙන්ම මෙම සටන් මෙහෙයුමට අතිරේක ශක්තියක් වන්නට ඇත.

69. නැගෙනහිර සටන් මෙහෙයුම ශ්‍රී ලංකා යුද හමුදාවට නව ආණ්ඩුව යටතේ මුල පුරන ලද ප්‍රතිසංස්කරණ වලින් හඳුන්වා දුන් නව න්‍යාය, සංවිධානය සහ උපාය මාර්ග අත්හදා බැලීමට අවස්ථාවක් විය. නැගෙනහිර අල්ලා ගැනීමේ දි උගත් පාඩම් පසුව උතුරු සටන් ව්‍යාපාරය හැඩ ගැසීමට ඉවහල් වූ අතර යුද හමුදාවට තම සාර්ථකත්වය ගැන වඩාත් විශ්වාසයක් ඇති කරවිය. උතුරු සටන් ව්‍යාපාරයේදී සඳහන් කළ ආකාරයට නැගෙනහිර සටන් මෙහෙයුම මානුෂීය සටන් මෙහෙයුමක් මෙන්ම සිවිල් ජනතාවට සිදුවන අනතුරු මග හරින ආකාරයට හමුදා සැලසුම් සකස් කළ බව තහවුරු කෙරිණ.[20] කෙසේ වුවත් ආණ්ඩුව එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට ආධාර ලබා දීමේ දි නැවතත් දැඩි සීමා පැනවීය. නිදසුනක් වශයෙන් මානුෂීය ආධාර ආයතනවලට නැගෙනහිර වාකරේ හි සිවිල් ජනතාවට ළඟාවීමට තිබුණේ සීමිත අවස්ථාවකි. ආණ්ඩුව 2007 ආරම්භයේ සිට උතුරේ එල්ටීටීඊයේ පාලනය යටතේ පැවති වන්නියට යවන මානුෂීය ආධාර සම්බන්ධයෙන් පැවති සීමා සැලකිය යුතු ආකාරයෙන් නැවත දැඩි කෙළේය.

70. මෙම කාල සීමාවේ දී සිවිල් ජනතාවට වූ අනතුරු, ගැටුමේ අවසාන මාස කිපය තුළ සිදු වූ ප්‍රමාණයට නොවුවත් නැවත සටන් ඇවිළ යෑම සහ කාල තුවක්කු, රොකට් හා ගුවන් ප්‍රහාර ඇතුළු බර අවි යොදා ගැනීම සිවිල් ජනතාවට බලපෑමක් විය. විමර්ශන කොමිටිය එවැනි අවස්ථා කීපයක් ලේඛන ගත කළ අතර ඒවා යුද අපරාධ වශයෙන් හැඳින්විය හැකි බවට විශ්වාස කිරීමට සැලකිය යුතු හේතු පවතී. ඒවා එදිරිවාදුකම් පිළිබඳව කෙරෙන කඩිනම්, ඵලදායී සහ ස්වාධීන පුළුල් විමර්ශනයක කොටසක් ලෙස පරීක්ෂා කළ යුතුය.

71. නිදසුනක් වශයෙන් 2006 අගෝස්තු 14 දින උදෑසන ශ්‍රී ලංකා ගුවන් හමුදාව මුලතිවු දිස්ත්‍රික්කයේ උතුරේ එල්ටීටීඊ පාලනය යටතේ පවතින වල්ලිපුරම් ගම අසළ කැලෑබද ප්‍රදේශයකට ප්‍රහාරයක් එල්ලකර ඇත.[21] පොකුරු බෝම්බ 14 කට ආසන්න සංඛ්‍යාවක් හෙළා ඇත. එම ප්‍රහාරයෙන් සෙන්චෝලෙයි ගැහැනු ළමා අනාථාගාරයේ ළමයින් 60 ක් පමණ මිය ගිය අතර තවත් 60 කට පමණ තුවාල සිදුවිය. එල්ටීටීඊ උපදේශිකාවන් තිදෙනා හැර මිය ගිය ඉතිරි සියලු ගැහැනු ළමයින් වයස අවුරුදු 16 – 19 අතර අයයි. එම අනාථාගාරය එල්ටීටී හමුදා

[18] වැඩ බලන හමුදාපති මේජර් ජනරාල් නන්ද මල්ලවආරච්චි මෙහෙයුම් අධීක්ෂනය සඳහා පුද්ගලිකවම එහි රැඳී සිටි බව වාර්තා වුවත් ජනරාල් පොන්සේකා අප්‍රේල් මස ඝාතන තැතෙන් තුවාල ලබා සුව වෙමින් සිටින අතර ඔහු තාවකාලිකව කාර්ය මණ්ඩල ප්‍රධානි වශයෙන් පත් කෙරිණ.

[19] කලින් යාපනයේ 53 ඩිවිෂණයේ අණ යටතේ

[20] 2010 අගෝස්තු 17 ගෝඨාභය රාජපක්ෂ LLRC ඉදිරියේ කළ ප්‍රකාශය

[21] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

පුහුණු කඳවුරක්යැයි ආණ්ඩුව පැවසුවත් එදිනම එම ස්ථානයට ගිය අන්තර්ජාතික හමුදා නිරීක්ෂකයන්ට හමුදා ඉදි කිරීම්, නිල ඇඳුම් හෝ ආයුධ කිසිවක් එහි දක්නට ලැබී නැත.

72. සෙන්චෝලෙයි ප්‍රහාරය මෙම කාල සීමාවේ දී සියලු පාර්ශ්වයන් සිදු කරන ලද බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් විශාල සංඛ්‍යාවකින් එකක් වන අතර 2006 දී පත් කරන ලද 2005 අගෝස්තු මාසයේ සිට සිදු වූයේයැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳව විමර්ශනය කොට විභාග කිරීමට පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිසමක ( උදලාගම කොමිසම) විෂය විය. මෙම විමර්ශන කොමිටියට එම කොමිසමේ ප්‍රකාශයට පත් නොකළ වාර්තාවක් ලැබුණ අතර එය මෙම වාර්තාවේ අවසානයේ දි පරික්ෂාවට ලක් වෙනු ඇත.

73. සෙන්චොලෙයි සිද්ධියේ දී අනාථාගාරය හමුදාවේ නිවැරදි ඉලක්කයක් බවත් ගැහැනු ළමයින්ගේ මරණ සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ එල්ටීටීඊය බවත් තීරණය කර ඇත. මෙම විමර්ශන කොමිටියට ලබා ගත හැකි තොරතුරු අනුව හමුදා පහසුකම් තිබිය හැකි ඇත ස්ථානයක එල්ටීටීඊය සංවිධානය කළ පුහුණුවකට මෙම ළමයින් බලහත්කාරයෙන් සහභාගි කරවීමෙන් එල්ටිටීඊය ඔවුන් අනතුරුදායක තත්වයකට පත් කර ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ප්‍රහාරය එල්ල කරන අවස්ථාවේ එහි ළමයින් සිටින බව දන සිටි බවත්, එහෙත් මූලික වශයෙන්ම සිවිල් ජනතාව වෙසෙන ස්ථානයකට අසීමිත ආකාරයේ ප්‍රහාරයක් එල්ල කළ බවටත්, ස්ථිරවම හා ඍජුවම අපේක්ෂා කළ හමුදාමය වාසියට සාපේක්ෂකව පැහැදිලිවම සීමාන්විත වූ ප්‍රහාරයෙන් සිවිල් ජනතාවගේ ජීවිතවලට සිදුවන හානිය වැළැක්විමට හෝ අවම කිරීමට ප්‍රවේසම් නොවූ බවත් විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී.

74. 2006 ඔක්තෝබර් මාසයේ සහ නොවැම්බර් මාසයේ මුල් කාලයේ දී එල්ටීටීඊය සහ ශ්‍රී ලංකා යුද හමුදාව මඩකලපුව නගරයට[22] උතුරෙන් පිහිටි වාකරේ ප්‍රදේශයේ සහ ඒ අවට කාලතුවක්කු වෙඩි හුවමාරු කර ගත්හ. නිදසුනක් වශයෙන් 2006 නොවැම්බර් 8 වැනිදා ශ්‍රී ලංකා යුද හමුදාව සරණාගතයන් 1000 කට අධික සංඛ්‍යාවක් සිටි කතිරවේලි පාසලට කාලතුවක්කු වෙඩි ප්‍රහාර එල්ල කිරීමෙන් මරණ විශාල සංඛ්‍යාවක් සිදු විය. ශ්‍රී ලංකා යුද හමුදාව ශ්‍රී ලංකා නිරීක්ෂණ කණ්ඩායමට එදින අපරභාගය වන තෙක් පාසලට පිවිසිමට අවසර දුන්නේ නැත.[23] ශ්‍රී ලංකා නිරීක්ෂණ කණ්ඩායමට පාසලේ එල්ටීටීඊ හමුදා ඉදි කිරීම් කිසිවක් දක ගැනිමට නොතිබුණත් එල්ටිටීඊය සිවිල් වැසියන් 2000 කට ආසන්න පිරිසකට ආරක්ෂක ස්ථානවලට පලා යෑමට ඉඩ නොදුන් බව වාර්තා කෙළේය.

75. නොවැම්බර් 2 වැනි දා ශ්‍රී ලංකාවේ උතුරේ එල්ටිටීඊ පාලනය යටතේ පැවති කිලිනොච්චි නගරයේ රෝහල අසළට ශ්‍රී ලංකා යුද හමුදාවෙන් බෝම්බ ප්‍රහාරයක් එල්ලවිමෙන් සිවිල් වැසියන් පස් දෙනකු මිය ගිය අතර රෝහලේ මාතෘ වාට්ටුවට හානි සිදු විය.[24]

76. 2006 අවසන් වන විට ශ්‍රී ලංකවේ අඩුම වශයෙන් 520,000 ක් අවතැන්ව සිටියහ. ඉන් 300,000 කට වැඩි සංඛ්‍යාවක් අවතැන් වූයේ නැවත හටගත් ගැටුම් නිසාය. එය සංඛ්‍යාත්මතව මෙන්ම ජන සංඛ්‍යාවේ අනුපාතයක් ලෙස ආසියාවේ විශාලතම අවතැන්විමයි.[25] නැගෙනහිර පළාත හමුදා ආණ්ඩුකාරයෙක් යටතේ පැවතුන නමුත් 1988 න් පසුව පළමු වරට 2008 මැයි මාසයේ දී නැගෙනහිර පළාත් සභාව සඳහා ඡන්ද විමසිමක් පැවැත් වීය.

**උතුරේ සටන් ව්‍යාපාරය**

---

[22] SLMM ලේඛන

[23] SLMM.http://www.hrw.org/reports/2007/srilanka0807/4.htm

[24] http://www.un/org/press/en/2006/iha1240.doc.htm

[25] IDMC/http://www. internal-displacement.org/assets/publications/2007/200709-ap-srilanka-civilians-in-the-way-of-conflict-country-en/pdf

77. 2008 වසර ගෙවී යත්ම ආණ්ඩුව සටන් විරාම ගිවිසුමෙන් ඉල්ලා අස්වන බව ප්‍රකාශ කෙළේය.[26] සටන් විරාමය උල්ලංඝනය කිරීම සාමාන්‍ය දෙයක් වූ නිසා එම අහෝසි කිරීමේ ආසන්න බලපෑම වූයේ ජනවාරි 16 වැනි දා සිට බලපැවැත්වෙන ආකාරයෙන් ශ්‍රී ලංකා නිරීක්ෂණ දූත මෙහෙය අවසන් වීම සහ එල්ටීටීඊය හමුදාමය වශයෙන් පරාජය කිරීමට ඇති ආණ්ඩුවේ අධිෂ්ඨානය පිළිබඳ පැහැදිලි ප්‍රකාශනයක් විමය. සටන් විරාමය අහෝසි කිරීමත් සමග වන්නියේ සහ දකුණේ එල්ටීටීඊ මරාගෙන මැරෙන ප්‍රහාර ඇතුළත් අනාරක්ෂාව සහ ප්‍රචණ්ඩ ක්‍රියා වැඩි විය.

78. මේ වන විට ශ්‍රී ලංකාවේ ආරක්ෂක වැය සියයට 40 කින් වැඩි වූ අතර යුද හමුදාව 100,000 සිට 300,000 දක්වා තුන් ගුණයකින් වැඩි කෙරිණ. ආරක්ෂක ලේකම් පවසන ආකාරයට 2005 සහ 208 අතර කාලයේ දී මාසිකව අතිරේක භටයන් 5000 බැගින් බඳවා ගන්නා ලදී.[27] තම බලශක්තිය හා පාලනය පවත්වා ගැනීමට එල්ටීටීඊය වන්නියේ ජනතාවගේ එහා මෙහා යෑම සීමා කොට වැඩිහිටියන් සහ ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම වඩාත් වැඩි කරන ලදී. මෙය දෙමළ ජනතාව අතර කෝපය වැඩි කිරීමට හේතුවිය.

79. 2007 ඔක්තෝබර් මාසයේ සිට ආණ්ඩුව උතුරේ හමුදා මෙහෙයුම් ආරම්භ කළ අතර 2008 අප්‍රේල් මාසයේ සිට ගැටුම් වඩාත් පැවතියේ බටහිරින් වූ මන්නාරම් දිස්ත්‍රික්කයේය. මේ කාල සීමාවේදීම ශ්‍රී ලංකා නාවික හමුදාව යුද අවි ගෙනෙමින් තිබූ එල්ටීටීඊ මුහුදු කොටින් සතු නැව් ගණනාවක් ගිල්වා දමන ලදී. 2007 නොවැම්බර් මාසයේ කිලිනොච්චියට එල්ල කළ ගුවන් ප්‍රහාරයකින් එල්ටීටීඊ දේශපාලන අංශයේ ප්‍රධානි තමිල් සෙල්වම් මරු මුවට පත් විය.

80. 2008 අප්‍රේල් 24 වැනි දා ශ්‍රී ලංකා යුද හමුදාව එල්ටීටීඊ පාලනයට යටත් ප්‍රදේශවලට ඇතුළු වෙමින් මඩු අත්පත් කර ගත්තේය. ඉන් පසුව අඩම්පන් සහ පෙරියමඩු නගර ද ශ්‍රී ලංකා යුද හමුදාව අතට පත්විය. [28] 2008 ජුලි මාසයේ දී ශ්‍රී ලංකා යුද හමුදාව මුහුදු කොටින්ගේ ප්‍රධාන කඳවුරක් වූ වෙඩිත්තලතියෙ අත්පත් කරගෙන එල්ටීටීඊයේ අගනුවර වශයෙන් හැඳින් වූ කිලිනොච්චිය ආසන්නයට පැමිණි නිසා එල්ටීටීඊයට පසුබැසීමට සිදු විය.

81. 2008 සැප්තැම්බර් 3 වැනිදා ආණ්ඩුව එක්සත් ජාතින්ගේ සියලු සංවිධානවලට සහ මානුෂීය රාජ්‍ය නොවන සංවිධානවලට එල්ටීටීඊ පාලනය යටතේ ඇති ප්‍රදේශවලින් ඉවත්විමට නියෝග කෙළේය. ''මුදා නොගත් ප්‍රදේශවල'' එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ අනෙකුත් මානුෂීය සංවිධානවල කාර්ය මණ්ඩලවල ආරක්ෂාව තවදුරටත් සහතික කළ නොහැකි බවත් ඕමන්තෙයි සිට වන්නියට යෑමට තවදුරටත් අවසර නොදෙන බවත් ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයෙන් නිවේදනය කෙරිණ.[29]

82. අන්තර්ජාතික නිරීක්ෂකයන් වැඩි දෙනෙක් වන්නියෙන් නිකුත්ව යෑමත් සමග වන්නියේ සිවිල් ජනතාවගේ ආරක්ෂාවට තිබූ ප්‍රතිචාර සහ මානුෂීය ආධාර වැඩ සටහන් දුර්වල වූ නිසා එහි ජනතාව ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල සහ එල්ටීටීඊයෙන් කෙරෙන උල්ලංඝනය කිරීම්වලට නිරාවරණය විය. එල්ටීටීඊය එක්සත් ජාතීන්ගේ දේශීය කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් වලට වෙනත් සිවිල් ජනතාවට මෙන් පිටව යෑමට ඉඩ දුන්නේ නැති නිසා ඔවුන්ට පිරිහෙමින් පැවති මානුෂීය තත්වයන් යටතේ තම මානුෂීය වැඩ කටයුතු කරගෙන යෑමට සිදු විය.

**2009 ජනවාරි – මැයි: සන්නද්ධ ගැටුමේ අවසාන අදියර.**

83. 2009 ජනවාරි වන විට ශ්‍රී ලංකා යුද හමුදාව කිලිනොච්චිය සහ අලිමංකඩ අත්පත් කර ගනිමින් යාපනය දිවයිනේ සෙසු ප්‍රදේශ හා යා කෙරෙන ඒ 9 මාර්ගය සම්පූර්ණයෙන්ම සියතට

[26] BBC.Sri LankaTimeline,6 October2010' http://www.bbc.co.uk/news-world-about-asia-1200418l
[27] www.defence.lk/news.asp?fname=20100429_05
[28] Humanitarian Operation Factual Analysis op.cit
[29] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ http://www.island.lk/2008/09/10/news16.html. Ministry of Disaster Management and Human Rights Press release. 3 October2008 http://reliefweb.int/files/resources/AF5DIF3435536F42852574D70063A679.Full.Report.pdf

ගත්තේය.[30] එම ස්ථාන දෙකම සාපේක්ෂ වශයෙන් පහසුවෙන් සහ වැඩි අනතුරු නැතිවම අත්පත් කර ගැනීමෙන් එල්ටීටීඊය යුදමය වශයෙන් කඩා වැටෙමින් පවතින බව පෙනිණ. සංඛ්‍යාව ගැන එකඟතාවයක් නොතිබුණ ද කීප වතාවක් අවතැන් වූ 300,000[31] ක පමණ සිවිල් ජනතාවක් වන්නියේ තවමත් එල්ටීටීඊයේ පාලනය යටතේ පැවති කුඩා ප්‍රදේශයකට කොටු විය.

84. සටන් සහ දෙපාර්ශ්වයෙන්ම පනවන ලද සීමාවන් නිසා මහා මාර්ගයෙන් මානුෂීය ආධාර ලබා දීම කළ නොහැකි වන තෙක් ජනවාරි මැද දක්වා මානුෂීය ආයතනවලට ආධාර කණ්ඩායම් 11 ක් යැවීමට හැකි විය.[32] ආධාර කණ්ඩායම් ආසන්නයේම ෂෙල් වෙඩි වැටීම නිසා අවස්ථා කිපයකදීම ආධාර කණ්ඩායම්වලට ආරක්ෂාව ලබා දීමට ඇති කර ගත් එකඟතාවය බිඳ වැටිණ.

85. අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ (ICRC) 2009 වාර්ෂික වාර්තාව අනුව එම සංවිධානය 2009 පෙබරවාරි සිට මැයි දක්වා ත්‍රිකුණාමලය සිට අවතැන් වුවන් වැඩියෙන්ම ඒකරාශී වී සිටි පුදුමාතලන් දක්වා මානුෂීය ආධාර සිමිත ප්‍රමාණයක් ප්‍රවාහනය කළ අතර හදිසි වෛද්‍ය ආධාර සහ ඔවුන් රැක බලාගන්නන් 12,000 ක් පමණ ගලවා ගන්නා ලදී. ආණ්ඩුව ද ජනවාරි අවසානය වන තෙක් මහා මාර්ගයෙන් මානුෂීය ආධාර සීමිත ප්‍රමාණයක් ප්‍රවාහනය කරන ලදී.

86. 2009 ජනවාරි අවසන් වන විට එල්ටීටීඊය සටන් සංවිධානයක් ලෙස බෙහෙවින් පිරිහීමට පත්ව තිබිණ. එල්ටීටීඊයට බර අවි සහ යුද්ධෝපකරණ නොතිබුණ අතර මනා පුහුණුවක් නැති අලුතින් බඳවා ගත් සටන්කරුවන් මත රැඳීමට සිදු විය. වාර්තා වී ඇති ආකාරයට ශ්‍රී ලංකා යුද හමුදාව මෝර්ටාර්, කාල තුවක්කු, මල්ටි බැරල් රොකට් (MBRL) සහ වෙනත් යුද්ධෝපකරණවලින් වඩාත් ශක්තිමත් විය. ගුවන් බලය සහ ගුවනෙන් ඔත්තු බැලීමේ වාසිය සම්පූර්ණයෙන්ම ආණ්ඩුව සතුවිය. කිලිනොච්චි සහ අලිමංකඩ ආරක්ෂක වළල්ල අහිමි වීමෙන් උතුරෙන්, බටහිරෙන් සහ දකුණෙන් ඉදිරියට එන ශ්‍රී ලංකා හමුදාවට මුහුණ දීමේ ශක්තියක් නොවූ එල්ටීටීඊය පසුබැසීමට සටන් කෙළේ දිනෙන් දින කුඩාවන භූමි ප්‍රමාණයක් රැක ගැනීමට මුහුදට පිටු දීය.

87. 2009 ජනවාරි සිට මැයි දක්වා මාස තුළ ආණ්ඩුව එල්ටීටීඊය සමග එකඟතාවයක් නැතිව එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශවල වරින් වර සටන් මුක්ත කලාප තුනක් (NFZ) ප්‍රකාශයට පත් කරන ලදී. ඉදිරියට එන ශ්‍රී ලංකා හමුදාව ඉදිරියේ පසුබසින එල්ටීටීඊය සතු භූමි ප්‍රමාණය එන්න එන්නම කුඩා වූ නිසා එක් එක් සටන් මුක්ත කලාපය පෙර එකට වඩා කුඩා විය. රජයේ උපක්‍රමය වූයේ එල්ටීටීඊය වෙරළට පසු බැසිමට ඉඩ සලස්වා සිවිල් ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් එල්ටීටීඊ ප්‍රධාන බලකායෙන් වෙන් කිරීම බව පෙනිණ. මෙම කාල පරිච්ඡේදය තුළ සිවිල් ජනතාවට ප්‍රහාර එල්ල කිරීම, මානුෂීය ආධාර සීමා කිරීම, එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් වැඩිහිටියන් සහ ළමයින් සටනට බඳවා ගැනීම සාමාන්‍ය ජනතාව ගැටුම් පැවති ප්‍රදේශවලින් ඉවත්වීම බලහත්කාරයෙන් වැළැක්වීම වැනි බරපතළ මානව අයිතිවාසිකම් කඩකිරීම් සහ අන්තර්ජාතික මානුෂීය නීති කඩකිරීම් බෙහෙවින් සිදු වූයේයැයි වාර්තා විය. ඒවා මෙම වාර්තාවේ අග පරිච්ඡේදවල සවිස්තරව දක්වා ඇත.

88. ජනවාරි අග සහ පෙබරවාරි මුල කාලසීමාවේ ශ්‍රී ලංකා යුද හමුදාව ඒ 35 මාර්ගය ඔස්සේ ඉදිරියට ගමන් කෙළේය. ශ්‍රී ලංකා යුද හමුදාව පුදුකුඩිඉරිප්පු (PTK) රෝහල දෙසට ගමන් කරන විට බරපතළ සටන් ඇවිළිණි. පළමු සටන් මුක්ත කලාපය අවට සහ ඒ තුළට එල්ල වූ ෂෙල් ප්‍රහාර දැඩි වෙත්ම අනතුරු සංඛ්‍යාව වැඩිවීමෙන් සිවිල් ජනතාව ඒ ප්‍රදේශය අත හැර පුදුමාතලන් ගමට දකුණෙන් වූ දූපතට ඒක රාශී වීමට නැගෙනහිර වෙරළ දෙසට ගමන් කළහ.

---

[30] BBC.Sri Lanka Timline,6 October 2010 http://www.bbc.co.uk/news/world-south-asia-12004081

[31] මෙම සංඛ්‍යා ආණ්ඩුව 2009 මුලදී මානුෂීය ආධාර අඩු කිරීමේ දී තරකයක් ලෙස ඉදිරිපත් කළද ගැටුමේ අවසන් අදියරේ දී ගැටුම් පැවති ප්‍රදේශවලින් 300,000 වැනි ජනතාවක් පිටව ගියහ.
[32] Sri Lanka 250,000 People in War Zone Need Food WFP 6 February 2009 http://www.wfp.org/stories/sri-lanka-vanni

89. 2009 පෙබරවාරි 12 දින ආණ්ඩුව නිල වශයෙන් 'සිවිල් ජනතා ආරක්ෂා කලාපය' (CSZ) යනුවෙන් හැඳින් වූ උතුරෙන් පුදුමාතලන් සිට වෙරළ දිගේ දකුණේ වෙල්ලමුලිවයිකාල් දක්වා කි.මි. 15 ක පමණ ප්‍රදේශයක් ආවරණය වන දෙවන සටන් විමුක්ත කලාපයක් ප්‍රකාශ කෙළේය. ලැබී ඇති තොරතුරු අනුව සිවිල් ජනතාවට පළමු සටන් මුක්ත කලාපයෙන් පිටව යෑමට විකල්ප මාර්ග තිබුණේ නැත. ඔවුන්ට එසේ යැමට අවශ්‍යතාවයක් තිබුණත් ෂෙල් වෙඩි පතිත විම සහ එල්ටිටීඊ කඳවුරුවලින් ඇත් වූ ආරක්ෂිත ගමන් මගක් තිබුණේ ද නැත.

90. මෙම කාල සීමාවේ දී ප්‍රහාරය නතර කොට මානුෂීය විරාමයක් ප්‍රකාශයට පත් කරන ලෙස අන්තර්ජාතික මැදිහත්විම් ගණනාවක් රජයට ඉදිරිපත් විය. 2009 මාර්තු 13 වැනි දා මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය නිවේදනයක් නිකුත් කරමින් ගැටුම් පවතින කලාපයේ සිවිල් වැසියන් ගැන සිය කණස්සල්ල පළ කළාය. එමෙන්ම යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සිදු වන්නට ඇතැයි ද පැවසුවාය.[33]

91. අප්‍රේල් 12 වැනි දා ආණ්ඩුව අප්‍රේල් 13 සහ 14 හමුදා මෙහෙයුම් පැය 48 කට නතර කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කෙළේය. අප්‍රේල් 20 වැනි දා ශ්‍රී ලංකා යුද හමුදාව කලපුව හරහා ගොස් එල්ටීටීඊය ඉදි කර තිබු පස් බැම්ම අසළට පැමිණියේය. අප්‍රේල් මාසයේ අවසාන දින 10 ඇතුළත 100,000 ආසන්න සිවිල් වැසියන් සංඛ්‍යාවක් පුදුමතලාන් හි උතුරේ ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශයට පැමිණියහ. අප්‍රේල් 26 වැනි දා එල්ටීටීඊය ඒක පාක්ෂික සටන් විරාමයක් ප්‍රකාශයට පත් කළත් ආණ්ඩුව එය ප්‍රතික්ෂේප කොට යටත්වන ලෙස ඉල්ලා සිටියේය.[34] අප්‍රේල් 27 වැනි දා සටන් මෙහෙයුම් අවසානයට ළඟා වී ඇති නිසා ''බර අවි, ප්‍රහාරක ගුවන් යානා සහ ගුවනින් ප්‍රහාර එල්ල කරන ආයුධ වැනි සිවිල් ජනතාවට අනතුරු විය හැකි අවි භාවිතය නතර කරන ලෙස ආරක්ෂක හමුදාවන්ට ආණ්ඩුවෙන් උපදෙස් නිකුත් කරන ලදි.[35]කෙසේ වුවත් ෂෙල් ප්‍රහාර එල්ල කිරීම නතර වූයේ නැත. සමහර ආරංචි මාර්ග අනුව එම ප්‍රහාර තවත් වැඩි වන්නට ඇත.

92. 2009 මැයි මාසයේ 8 වැනි දින කරයමුලිවයික්කාල් සහ වෙල්ලමුලිවයික්කාල් අතර දෙවන සටන් මුක්ත කලාපයේ මැද කොටසේ ඉතිරිව ඇති කුඩා ප්‍රදේශයක් තෙවන සහ අවසාන සටන් මුක්ත කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. වෙල්ලමුලිවයික්කාල් වලට පහතින් පිහිටි දූපතේ දකුණු කොටස තවමත් එල්ටීටීඊ පාලනය යටතේ පැවති නිසා එය සටන් මුක්ත කලාපයෙන් බැහැර කිරීමෙන් සන්නද්ධ හමුදාවට වෙඩුවකාල් සපත්තු පාලම තරණය කෙට උතුර දෙසට පැමිණිය හැකි විය. ශ්‍රී ලංකා හමුදාව මේ වන විට බර අවි සහ ගුවන් බලය සහිත 50,000 කට අධික භට පිරිසක් එල්ටිටීඊය හා සටනට මෙහෙයවා තිබිණ.

93. මැයි 13 වැනි දා 58 වැනි ඩිවිෂනය එහි සිට දකුණු දෙසින් වෙරළ දෙසට යෑමේ අරමුණෙන් ඉදිරියට ගිය අතර 53 වැනි ඩිවිෂණය ඒ 35 මාර්ගය ඔස්සේ කලපුවට ළඟාවීමට නැගෙනහිරට ගමන් කරමින් සිටියේය. 55 වැනි ඩිවිෂනයේ භටයෝ පුදුමතලාන් හි සිට දකුණට ගමන් කළහ. මේ අවස්ථාවේ දී වර්ග කිලෝමිටර් තුනක පමණ බිම් ප්‍රමාණයක 100,000 කට වඩා සිවිල් වැසියන් සංඛ්‍යාවක් කොටු වූයේයැයි එක්සත් ජාතීන් ගණනය කරයි.

94. මැයි 14 වැනි දා සිට එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ කාර්යධරයන් ගණනාවක්ම ශ්‍රී ලංකාවේ සහ විදේශ අතරමැදියන් බොහෝ දෙනකු සමග යටත්වීමේ අදහස ගැන කතා කළහ. මැයි 15 වැනිදා එල්ටිටීඊය සිය සන්නිවේදන උපකරණ විනාශ කිරීම ඇරඹුවේය. මැයි 16 වැනි දා ශ්‍රී ලංකා යුද හමුදාවේ 58 වැනි හා 59 වැනි ඩිවීෂණ වෙරළ තීරයේ දී හමු වූහ. 53 ඩිවිෂණය නන්දකඩාල් කලපුව ඔස්සේ දකුණට ගමන් කෙළේය. ඉහළ නායකයන් හා දක්ෂ සටන් කරුවන් 250 ක් ඇතුළු එල්ටිටීඊයේ ඉතිරි කොටස වෙල්ලමුලිවයික්කාල් හි වර්ග කි.මී. තුනක පමණ කුඩා ප්‍රදේශයකට කොටු විය. එල්ටිටීඊ සටන්කරුවන්, දේශපාලන කාර්යධරයන් හා ඉතිරි සිවිල් වැසියන් අවසානයේ දි යටත්විම සහ ආණ්ඩුවේ හමුදාවෙන් ඔවුන්ට අත් වු ඉරණම මෙම වාර්තාවේ ඉතිරි පරිච්ඡේදවලින් විස්තර කෙරනු ඇත.

---

33 Navy Pillay: Serious violations of international law commited in Sri Lanka conflict, 13 March 2009

34 http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca200904/20090430no_time_for_ceasefire.president.htm

35 http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca200904/20090427/combat_operations_reach_conclusion.htm

**2009 මැයි – 2011 නොවැම්බර්: පශ්චාත් සන්නද්ධ ගැටුම් කාල සීමාව.**

95. සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේදී දිවි ගලවා ගත් සිය දහස් සිවිල් ජනතාව ආණ්ඩුවේ පාලනය යටතට පත් වූහ. ඔවුන් අතර සිටි එල්ටීටීඊ හිටපු නායකයෝ සහ සටන්කරුවෝ යටත් වූහ. නැතිනම් පරීක්ෂා කිරීමේ දී හඳුනාගෙන ඉවතට ගෙන ගියහ. එල්ටීටීඊයේ හිටපු සටන්කරුවන් දහස් ගණනක් සහ එල්ටීටීඊය හා සම්බන්ධ ජනතාව රහසිගත රැඳවීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළකින් පසුව ක්‍රම ක්‍රමයෙන් නිදහස් කරන ලදි. සමහරු මේ දක්වාම රැඳවුම් කඳවුරුවල සිටිති. තවත් සමහරුන් ගැන විස්තරයක් නැති අතර ඔවුන් නඩු නොමැතිව ඝාතනය කිරීමේ හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වින්දිතයන් විය හැකිය. ඒ ගැන ඉදිරි පරිච්ඡේදයන්හි පරීක්ෂා කෙරේ.

96. අභ්‍යන්තරව අවතැන් වූ සරණාගතයන් 300,000 ක් පමණ වැඩියෙන්ම වවුනියාව අසළ මනික් ෆාම් හි සහ අනෙකුත් ස්ථානවල විවෘත නොවූ කඳවුරුවල රඳවා ගන්නා ලදී. එම කඳවුරුවල තත්වය ද මෙම වාර්තාවෙන් විමර්ශනය කෙරේ. ආණ්ඩුව එහා මෙහා යෑමට තිබූ සීමා ක්‍රම ක්‍රමයෙන් ඉවත් කරන ලද අතර 2009 අග සිට ඔවුන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කෙරිණ. මනික් ෆාම් කඳවුර අවසානයේ දී 2012 සැප්තැම්බර් මාසයේ දි වසා දමන ලදී. නැවත පදිංචි කිරීම පිළිබඳව තවමත් අභියෝග රැසක් පවතින අතර දහස් ගණනකට තවමත් ස්ථිර විසඳුම් ලැබිය යුතුව ඇත.

97. ආණ්ඩුව හමුදා ජයග්‍රහණය වික්‍රමාන්විත ලෙස සමරණ ලදී. ''ජනතාවගේ සියලු පාර්ශ්වයන්ට පිළිගත හැකි ජාතික විසඳුමක්'' ඇති කර ගැනිමට සහ උතුර සහ නැගෙනහිර[36] ආණ්ඩුවේ ව්‍යුහයන්ට බලය පැවරෙන 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ අධිෂ්ඨානය මුලදී ප්‍රකාශ කළ ද ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ අසාර්ථක වූ සර්ව පාක්ෂික සමුළු සහ පාර්ලිමේන්තු කොමිටිවල ප්‍රගතියක් දක්නට වූයේ නැත. 2011 ජුලි මාසයේ දී ප්‍රථම වරට උතුරේ පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් පවත්වන ලදී. මෑතක් වන තුරුම උතුරු පළාතේ ආණ්ඩුකාරයා වශයෙන් හමුදා නිලධාරියෙක් සිටි නමුත් අවසානයේ දි 2012 සැප්තැම්බර් මාසයේ දී උතුරු පළාත් සභාව සඳහා ඡන්ද විමසීම පවත්වන ලදී. එහෙත් මධ්‍යම ආණ්ඩුව සමග පැවතියේ යහපත් සම්බන්ධතාවයක් නොවේ.

98. ආණ්ඩුව උතුර සහ නැගෙනහිර යළි ඉදි කිරීමේ සහ යටිතල පහසුකම් පිළිබඳ වේගවත් වැඩ සටහනක් ප්‍රදේශය සමග සාකච්ඡාවකින් තොරව කොළඹ මධ්‍යගතව පාලනය වන ආකාරයට ක්‍රියාත්මක කෙළේය. එය පාලනය වූයේ ජනාධිපතිගේ සොහොයුරු බැසිල් රාජපක්ෂගේ සභාපතිත්වයෙන් යුත් උතුරු පළාතේ යළි ඉදිකිරීම්, සංවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායෙනි.[37] හමුදාව සෑම තැනකම පාහේ සිටි අතර උතුරු සහ නැගෙනහිර පළාත්වල පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක විය. සාමාන්‍ය ජනතාව සතුව තිබූ ඉඩම් විශාල ප්‍රමාණයක් හමුදාවට පවරා ගෙන තිබීම නැවත පදිංචි කිරීම වඩාත් සංකීර්ණ කරවීය. සිංහලයන් පදිංචියට සහ ව්‍යාපාරික කටයුතුවලට පැමිණීම, බෞද්ධ පන්සල් ව්‍යාප්තවීම සහ ස්ථාන නාම පුවරු යනාදිය සිංහලෙන් වීම නිසා ඇතිවන භාෂා ප්‍රශ්න වැනි තත්වයන්ගෙන් දෙමළ ප්‍රදේශ සිංහලකරණය වීම ගැන ප්‍රාදේශීය ජන කොටස් පැමිණිලි කරති.

99. හමුදා ජයග්‍රහණයේ වාසිය යොදා ගැනීමට අදහස් කළ ජනාධිපති, 2010 ජනවාරි මාසයේ දී ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කෙළේය. විරුද්ධ පක්ෂ 2009 නොවැම්බර් මස තමා කොන් කරන ලදැයි සිතා හමුදා සේවයෙන් විශ්‍රාම ගිය හමුදා ප්‍රධානි ජනරාල් පොන්සේකා විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීමට එකඟ වූහ. ඡන්ද විමසීම ජනාධිපති රාජපක්ෂ

---

36 එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ශ්‍රී ලංකාවේ සංචාරයකින් පසුව ශ්‍රී ලංකාණ්ඩුව සමග එක්සත් ජාතීන්ගේ මහලේකම් නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශය
http://www.un.org/press/en/2009/sg2151.doc.htm

37 http://reliefweb.int/report/sri-lanka/sri-lanka-president-appoints-new-tash-force-rebuid-north

පහසුවෙන් ජය ගෙන ඉන් පසුව 2010 අප්‍රේල් මස පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණයෙන් ඔහුගේ පාලක සභාගය විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගත්තේය. ජනාධිපතිවරණයෙන් පරාජයට පත් වූ ජනරාල් පොන්සේකා දූෂණ චෝදනා මත අත් අඩංගුවට ගෙන නඩු පවරා වසර තුනක සිර දඬුවමක් නියම කෙරිණ.[38]

100. 2010 සැප්තැම්බර් මාසයේ දී ජනාධිපතිවරයෙකුට එම ධුරය සඳහා ඉදිරිපත්විය හැකි වාර ගණන ගැන පැවති සීමාව ඉවත් කරන 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරිණ. ඒ සමගම අභාවයට ගොස් තිබූ ව්‍යවස්ථා සභාව වෙනුවට අධිකරණයට සහ මානව හිමිකම් කොමිසම වැනි ස්වාධීන ආයතනවලට සාමාජිකයන් පත් කිරීම නිර්දේශ කිරීමට ස්වාධීනත්වයෙන් අඩු පාර්ලිමේන්තු ක්‍රියාවලියක් සම්මත කර ගත්තේය.

101. මෙම කාල සීමාවේ දී ශ්‍රී ලංකාවේ පාලනය අමාත්‍යාංශ සහ රජයේ කාර්යන් වැඩි වැඩියෙන් ජනාධිපති සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් අත ඒකරාශීවීමෙන් ඒකාධිපති දිසාවකට ගමන් කරමින් තිබිණ. මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට හිරිහැර කිරීම සහ බිය වැද්දීම, නීතිඥයන්ගේ සහ විනිශ්චයකරුවන්ගේ ස්වාධීනත්වයට බාධා කිරීම, ජනමාධ්‍යවේදීන් සහ නිදහස් මාධ්‍යයට ප්‍රහාර එල්ල කිරීම සමග ප්‍රකාශ කිරීමේ නිදහසට සහ විවේචනාත්මක සංවාදයට ඇති අවකාශය තවත් සීමා විය. පාලනයකින් තොරව සහ රජයේ ප්‍රධානින්ගෙන් අනුග්‍රහය ලැබූ බෞද්ධ බහුතරයේ සමහර කොටස් අතර සිංහල ජාති වාදයේ පිබිදීම සහ ආගමික අන්තවාදය සුළුතර ජන කොටස්වලට එරෙහිව, විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වයේ නැවත ඉස්මතුවීමක් විය.

102. මේ යුද්ධය පැවති සමයේ දෙපාර්ශ්වයම විසින් කරන ලදැයි සැලකෙන බරපතළ උල්ලංඝනය කිරීම් ඇතුළත් වීඩියෝපට සහ වාචික සාක්ෂි සහ ඇසූ දුටු සාක්ෂි මතුවෙමින් පැවති කාලයයි. 2009 මැයි මාසයේ දී මහ ලේකම් සමග ජනාධිපති රාජපක්ෂ නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශයකින් ගැටුමෙන් පැන නගින වගවීම පිළිබඳ ප්‍රශ්න විසඳීම සඳහා පියවර ගැනීමට එකඟවූයේය. මේ පිළිබඳව ප්‍රගතියක් දක්නට නොලැබුණ නිසා මහ ලේකම් 2010 ජුලි මාසයේ දී ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ තත්වය ඉදිරියටගෙන යෑමට තමාට උපදෙස් දීම සඳහා ස්වාධීන විශේෂඥ මණ්ඩලයක් පත් කිරිමට තීරණය කෙළේය. මර්සුකි දරුස්මාන් මහතාගේ සභාපතිත්වයෙන් යුත් එම විශේෂඥ මණ්ඩලයේ වාර්තාව 2011 මාර්තු මාසයේ දී ඉදිරිපත් කරන ලදී.[39]

103. 2010 මැයි මාසයේදී ආණ්ඩුව, ''සටන් විරාම ගිවිසුම අසාර්ථක වීමට තුඩු දුන් හේතු සහ තත්වයන් විමර්ශනය කිරීමට, මෙම සිද්ධීන්ගෙන් ඉගෙන ගත හැකි පාඩම්, මෙවැනි සිද්ධීන් අනාගතයේ දී නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ගත යුතු ආයතනික, පරිපාලන සහ ව්‍යවස්ථා පියවර සහ සියලු ප්‍රජාවන් අතර ජාතික සමගිය සහ ප්‍රතිසංධානය තව දුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා'' උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමක් (LLRC) පත් කෙළේය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව 2011 නොවැම්බර් 15 ජනාධිපති වරයාට භාර දුන් අතර එම කාල සීමාව මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනා අංක 25/1 අනුව මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයේ[4] කාල සීමාවෙන් ද ආවරණය වේ. [40]

## IV ආණ්ඩුව, එල්ටීටීඊය සහ වෙනත් සන්නද්ධ කණ්ඩායම් පිළිබඳ සමස්ත දැක්ම

[38] ජනරාල් පොන්සේකා වසර දෙකකට පසු 2012 මැයි මාසයේ නිදහස් කළ අතර නව ජනාධිපති සිරිසේන 2015 ජනවාරි ඔහුට සමාව දුන්නේය.

[39] http://www.un.org/News/dh/infocus/Sri_Lanka/POE_Report_Full_pdf/ The Government of Sri Lanka did not afford any credence or legitimacy to of the Panel

[40] http://www.priu.gov/lk/news_update/Current_Affairs/ca201112/FINAL%REPORT.pdf

104. මෙම පරිච්ඡේදයෙන් ආරක්ෂක හමුදා, සම්බන්ධිත සන්නද්ධ කණ්ඩායම් සහ එල්ටීටීඊ ව්‍යුහය ගැන කෙටි සටහනක් දක්වේ. අණ දාමය පිළිඳව මෙම වාර්තාවේ සඳහන් වන නම් සිදු වූයේයැයි කියන නිශ්චිත උල්ලංඝනය කිරීම් පිළිබඳව ඍජු වගකීම හෝ අණ යටතේ හෝ උසස් නිලධාරීන් ගේ අණ නිසා හෝ අපරාධ වගකීමක් අදහස් නොවේ. එමෙන්ම මෙම වාර්තාවේ ඉදිරි පරිච්ඡේදවල සඳහන් වන නිශ්චිත උල්ලංඝනය කිරීම්වලට අදාල පුද්ගල නාම ඔවුන්ගේ නිර්දෝෂී භාවය ගැන පූර්වානුමිතයට අගතියක් නොවන ආකාරයට සහ මෙම වාර්තාවේ සඳහන් සිදු වූයේයැයි කියන නිශ්චිත උල්ලංඝනය කිරීමක් පිළිබඳ අපරාධ වගකීම, ඍජු වගකීම හෝ අණ යටතේ හෝ උසස් නිලධාරියෙකුවීම නිසා හෝ වගකීම අදහස් වන්නේ නැත. අපරාධ පිළිබඳ පුද්ගල වගකීම තිරණය කළ හැකි වන්නේ අවශ්‍ය සියලු නිසි ක්‍රියා පටිපාටි තහවුරු කරන අධිකරණයකින් පමණි. මෙම වාර්තාවේ ඇතුළත්වන චෝදනා කඩිනමින්, පූර්ණව සහ ස්වාධීනව විමර්ශනය කොට වගකිව යුතු පුද්ගලයන් අධිකරණය හමුවට ඉදිරිපත් කළ යුතුය.

**ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සහ අදාල ආයතන**

**ජනාධිපති සන්නද්ධ සේවා ප්‍රධාන අණ දෙන නිලධාරී.**

105. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ මැන්ඩේට් බල කාල සීමාව තුළ ජනාධිපතිවරුන් දෙදෙනෙකු සිටියහ. ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග (2005 දක්වා) සහ ජනාධිපති මහින්ද රාජපක්ෂ (2005 නොවැම්බර් සිට) යනුවෙනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපති සන්නද්ධ හමුදාවල සේනාධිනායකයා වන අතර එක් එක් සන්නද්ධ සේවාවල අණදෙන නිලධාරීන් පත් කරයි.

**ආරක්ෂක අමාත්‍යාංශය (MOD )**

106. ආරක්ෂක අමාත්‍යාංශය[41] ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩත්වය සහ ස්වෛරීත්වය ආරක්ෂා කිරීමට සහ රැකවරණය සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.[42] ඒ අනුව ආරක්ෂක හෝ රැකවරණ භූමිකාව ඉටු කරන සියලු රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් වගකිව යුතුය. 2013 වන තෙක් ආරක්ෂක හමුදාවල, පොලීසිය ඇතුළුව සියලු අංශ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබිණ. එහි හමුදා මෙහෙයුම් භූමිකාවට අමතරව 2006 සිට වන්නියේ සිදු කරන සියලු මානුෂීය මෙහෙයුම්වල ඉහළ මට්ටමේ සම්බන්ධීකරණය ද ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සිදු විය.

107. 2005 නොවැම්බර් මාසයේ වැඩ භාර ගැනීමෙන් පසු ජනාධිපති මහින්ද රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යංශය ද පවරා ගත්තේය. ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යටතේ 2001 සිට 2005 දක්වා තිලක් මාරපන ආරක්ෂක ඇමතිවරයා වූයේය.

## ආරක්ෂක ලේකම්.

108. ජනාධිපති විසින් පත් කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨතම ස්ථිර සිවිල් සේවකයා ය. ජනාධිපති ගේ සහෝදරයෙකු වන ගෝඨාභය රාජපක්ෂ 2005 නොවැම්බර් මාසයේ දී ආරක්ෂක ලේකම් ලෙස පත් කරන ලද අතර ඔහු 2015 ජනවාරි වන තෙක් එම තනතුර දැරුවේය. 2005 අගෝස්තු 13 නිකුත් කරන ලද ගැසට් පත්‍රය අනුව මහජන ආරක්ෂක පනතේ (40 පරිච්ඡේදය) හදිසි නිති රෙගුලාසි යටතේ 2006 සිට ඉදිරියට වෙනත් කරුණු අතර ජාතික ආරක්ෂාව සහ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ''ඔහුගේ කැමැත්ත අනුව'' අත් අඩංගුවට ගැනිම අවශ්‍යනම් අත් අඩංගුවට ගැනීමේ සහ රඳවා ගැනීමේ පුළුල්

[41] නිදහසින් පසු අවස්ථා කිපයකදීම ඊට පැවරෙව අනෙකුත් වගකීම් පිළිබිඹු වන සේ නම වෙනස් වුවද ජාතික ආරක්ෂාව සහ ආරක්ෂක කටයුතු පිළිබඳව අමාත්‍යාංශයක් හැම විටම තිබිණ. මෙම වාර්තාවේ සඳහන් වන ආරක්ෂක ආයතන හයක් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණ අතර 2013 දී පොලිසිය ඉන් ඉවත් කර නීති සහ සාමය අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

[42] http://www.defence.lk/main_abt_asp?fname=mission

බලතල ආරක්ෂක ලේකම්ට ලබා දෙන ලදී.[435] 2009 අප්‍රේල් මස ශ්‍රී ලංකාවේ පුවත් පතක් වන බිස්නස් ටුඩේ පොලිස් ප්‍රධානීන් සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ගණනාවක දී සන්නද්ධ සේවා සහ පොලිසිය අතර සම්බන්ධීකරණය සහ විමර්ශන මෙහෙයවීම ආරක්ෂක ලේකම් ගේ භූමිකාව ලෙස විස්තර කර ඇත.[44]

**ජාතික ආරක්ෂක මණ්ඩලය**

109. ජාතික ආරක්ෂක මණ්ඩලය (NSA) යනු ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීම පැවරෙන ආණ්ඩුවේ විධායක ආයතනයයි. එය 1980 ගණන්වල පිහිටුවන ලද්දේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 27 වගන්තියේ ප්‍රතිපාදන අනුවය. එය ආරක්ෂාව සහ හමුදා කටයුතුවලට අදාල ජ්‍යෙෂ්ඨ දේශපාලන සහ හමුදා ප්‍රධානින් ගේ එකතුවකි. ජනාධිපති සේනාධිනායක ලෙස ජාතික ආරක්ෂක මණ්ඩලයේ සභාපති වේ.

2. චිත්‍රයඃ

[43] 2006 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ඇතුළත් වන සේ සංශෝධනය කරන ලද මෙම රෙගුලාසි යටතේ පොලීසියේ සහ හමුදාවල සියලු අංශවලට අත් අඩංගුවට ගැනිමට සහ රඳවා ගැනීමට බලය පවරන ලදී.
[44] 2009 අප්‍රේල් මස බිස්නස් ටුඩේ කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂක, පොලිස්පති, අපරාධ කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පති සහ ත්‍රස්ත විමර්ශන කොට්ඨාහයේ අධ්‍යක්ෂක සමග පැවැත් වූ සාකච්ඡා.




2 චිත්‍රයː ශ්‍රී ලංකාවේ ආරක්ෂක බලකා අණදෙන ව්‍යුහය.

**ශ්‍රී ලංකාවේ ආරක්ෂක බලකාවල ප්‍රධාන අංශ.**

110. ගැටුම් පැවති කාලයේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා ශ්‍රී ලංකා යුද හමුදාව (SLA), ශ්‍රී ලංකා නාවික හමුදාව (SLN) හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව (SLAF) වශයෙන් සන්නද්ධ හමුදා තුනකින් හා ශ්‍රී ලංකා පොලිසිය (SLP), ජාතික බුද්ධි කාර්යාංශය (NIB) (පසුව එය රාජ්‍ය බුද්ධි සේවාව බවට පත් විය.) හා සිවිල් ආරක්ෂක බලකාය (CDF) යනුවෙන් සිවිල් ආයතන තුනකින් සමන්විත විය. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ මැන්ඩේට් බලයෙන් ආවරණය වන කාල සීමාවේ වැඩිම කාලයක් මෙම ආයතන හයම පැවතුනේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේය. 2013 දී ශ්‍රී ලංකා පොලිසිය නීතිය හා සාමය නමින් නව අමාත්‍යාංයක් යටතට පත් කෙරිණ.[45] 2006 දී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලද අතර කලින් පැවති ජාතික පුරවැසි බලකාය එය යටතේ ප්‍රතිසංවිධානය කෙරිණ.

[45] http://www.lawandorder.lk/indexphp?option=com_content&view=article&id=78&Itemid=491&lang=en

**සන්නද්ධ සේවා ආරක්ෂක මණ්ඩල ප්‍රධානි**

111 ආරක්ෂක මණ්ඩල ප්‍රධානි ජ්‍යෙෂ්ඨ වෘත්තීය හමුදා නිලධාරියා වන අතර ඔහු පත් කරන්නේ ජනාධිපති විසිනි. 2009 ට පෙර සන්නද්ධ සේවා ආරක්ෂක මණ්ඩල ප්‍රධානියාට ( එයාර් චීෆ් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා) මූලික වශයෙන් ජනාධිපති සහ ජාතික ආරක්ෂක මණ්ඩලයේ මගපෙන්වීම් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරුණ අතර ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට තමන්ගේම මෙහෙයුම් සැලසුම් කිරීමට අවස්ථාවක් තිබිණ.[46]

**ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය (JOH)**

112. ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය 1985 දී පිහිටුවන ලද්දේ උත්සන්න වෙමින් පැවති ගැටුම් නිසා සන්නද්ධ සේවා සහ පොලීසිය අතර මෙහෙයුම් සම්බන්ධීකරණය සඳහාය.[47] ඊට ජාතික ආරක්ෂක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරිණ. ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ආරක්ෂක මණ්ඩල ප්‍රධානි අණ යටතේ පැවති අතර ඔහු ආරක්ෂක ලේකම්ට වගකිව යුතුය.

ශ්‍රී ලංකා යුද හමුදාව.

113. හමුදාපති හමුදාව තුළ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාය. සේනාධිනායක වශයෙන් ජනාධිපති හමුදාපති පත් කරයි. 2000 අගෝස්තු සිට 2004 ජුලි දක්වා හමුදාපති වූයේ ජනරාල් එල් පී බලගල්ලේය. ඔහුගෙන් පසුව එම තනතුරට පත්වූයේ ජනරාල් එස් එච් එස් කෝට්ටෙගොඩ ය. ජනරාල් සරත් පොන්සේකා හමුදාපති වශයෙන් පත් වූයේ 2005 දෙසැම්බර් 6 වැනිදාය. ඔහුගෙන් පසුව ජනරාල් ජගත් බාලසූරිය 2009 ජුලි මාසයේදී එම තනතුරට පත් විය.[486]

114. මෙහෙයුම් මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨතම හමුදා නිලධාරියා වන මෙහෙයුම් අධ්‍යක්ෂකට සටන් බිමේ කළමනාකරණය පිළිබඳව ඍජු වගකීම පැවරේ. ඔහු සටනේ යෙදී සිටින මෙහෙයුම් ඒකකවල වැඩ කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණයේ දී හමුදාපතිගේ සුපරික්ෂාව යටතේ ක්‍රියා කරයි.

115. ආරක්ෂක බලකා මූලස්ථානය යනු භූගෝලීය ප්‍රදේශයක් අනුව වගකීම පැවරෙන මේජර් ජනරාල් කෙනෙකුගේ අණ යටතේ ක්‍රියාත්මක වන සේනාංක මට්ටමේ බලකායන් ය. ඔහුගේ අණ යටතේ සටන් අංශ සහ සහාය ඒකක ගණනාවක් පවතී. සන්නද්ධ ගැටුමේ අවසාන කාලයේ දී වන්නි ආරක්ෂක බලකා මූලස්ථානයේ ප්‍රධානි වූයේ එවකට මේජර් ජනරාල් වූ ජගත් ජයසූරිය ය. ඔහු විශේෂයෙන්ම ආරක්ෂක කටයුතු පිළිබඳව එක්සත් ජාතීන් සහ අනෙකුත් අන්තර්ජාතික ආයතන සමග සම්බන්ධීකාරකයා ද වේ. 2010 ජනවාරි 7 සිට 2014 ජනවාරි 9 තෙක් යාපනය ආරක්ෂක බලකා මූලස්ථානයයේ ප්‍රධානියා වූයේ මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ ය.

116. අංශයක් යනු සටන් බිමේ ස්වාධීනව මෙහෙයුම් කළ හැකි, භටයන් 10,000 ත් 20,000 ත් අතර සංඛ්‍යාවකින් යුත් ඒකාබද්ධ උපා මාර්ග පෙළ ගැසිමකි. තරු දෙකේ ජනරාල්වරයෙකු ගේ අණ යටතේ ක්‍රියාත්මක වන ඩිවිෂනයක සටන් බ්‍රිගේඩ් ගණනාවක් සහ එහි අණ යටතේ සහායක ඒකක ගණනාවක් පවතී. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබුණු තොරතුරු අනුව සන්නද්ධ ගැටුමේ මුල් අදියරේ දී පහත සඳහන් ඩිවිෂන ආඥාධිපතිවරු සේවය කළහ.[49]

---

[46] 2009 ජුලි මාසයේදී ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානි භූමිකාව සියලු සන්නද්ධ හමුදා සම්බන්ධීකරණය ඇතුළත් වන සේ පුළුල් කරන ලදී. මෙම නව තනතුරුට පළමුවෙන්ම 2009 ජුලි මස පත් කරන ලද්දේ සරත් පොන්සේකා ය. http://www'ocds.lk/history.html

[47] http://www.lk/history.hmtl

[48] www.army.lk

[49] www.defence/lk/new.asp?fname=20090117_01

53 වැනි ඩිවිෂනය        මේජර් ජනරාල් කමල් ගුණරත්න

55 වැනි ඩිවිෂනය        බ්‍රිගේඩියර් ප්‍රසන්න සිල්වා

57 වැනි ඩිවිෂනය        මේජර් ජනරාල් ජගත් ඩයස්

58 වැනි ඩිවිෂනය        බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා

59 වැනි ඩිවිෂනය        බ්‍රිගේඩියර් නන්දන උඩවත්ත සහ අනතුරුව බ්‍රිගේඩියර් චාගි ගාල්ලගේ

117. බ්‍රිගේඩයක් යනු භටයන් 3500 ත් 6000 ත් අතර සංඛ්‍යාවකින් යුත් තරු එකේ මේජර්වරයෙකු (බ්‍රිගේඩියර්) අණ දෙන ප්‍රධාන උපායික පාබල හමුදා පෙළගැසීමකි. ඊට විවිධ සටන් බැටැලියන් ගණනාවක් ඇතුළත් වන අතර වෙනත් සහායක ඒකක ද එම අණ යටතේ පවතී. මෙම අංශයට ඇතුළත් බ්‍රිගේඩ අතර කාලතුවක්කු බ්‍රිගේඩයක් ද වේ.[50] 2009 ජුනි 3 ඩේලි නිවුස් පුවත් පතේ පළ වූ ලිපියක් අනුව සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ කාලතුවක්කු බ්‍රිගේඩයේ ආඥාපති වූයේ බ්‍රිගේඩියර් ප්‍රියන්ත නාපාගොඩ ය. විශේෂ බලකා බ්‍රිගේඩයේ ප්‍රධානියා වූයේ කර්නල් අතුල කොඩිප්පිලි ය.

118. බැටැලියනයක් යනු 650 ක පමණ සංඛ්‍යාවකින් යුත් ලුතිනන් කර්නල්වරයෙකුගේ අණ යටතේ ඇති උපායික පාබල හමුදා පෙළ ගැසීමකි. ඊට සටන් කණ්ඩායම් ගණනාවක් සහ සහායක කණ්ඩායම් ගණනාවක් ඇතුළත් වන අතර ඒ සියල්ල එම බැටැලිනයේ ම කොටස් ය.

119. කාර්ය සාධක බලකායෘ මෙය විශේෂිත කාර්යක් සඳහා වෙනස් වූ අණ පෙළ ගැසීමක් යටතේ එක්රැස් කරන ලද එහෙත් ප්‍රබල බ්‍රිගේඩයක ප්‍රමාණයෙන් යුත් තත් කාර්ය කණ්ඩායමකි.[51] එය පවතින අනෙකුත් බල කණ්ඩායම්වලින් 'ණයට ගත්' ඒකක සහ හමුදාව සීඝ්‍රයෙන් පුළුල් වීමේදී අලුතින් බඳවා ගත් පිරිස්වලින් සකස් කරන නව ඒකකවලින් සමන්විත වන මිශ්‍රිත බලකායකි. ආරක්ෂක අමාත්‍යාංශයෙන් සකස් කරන ලද සිතියම් අනුව ගැටුමේ අවසාන සති කීපය තුළ විශේෂ කාර්ය සාධක බලකා 2. 3. 4, හා 8 විශේෂයෙන්ම සම්බන්ධ වූහ. ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ සඳහන් වන ආකාරයට විශේෂ කාර්ය සාධක බලකා ආඥාපතීන් වූයේ බ්‍රිගේඩියර් රෝහණ බණ්ඩාර, ( කාර්ය සාධක බලකා 2) බ්‍රිගේඩියර් සත්‍යප්‍රිය ලියනගේ ( කාර්ය සාධක බලකා 3) කර්නල් නිශාන්ත වන්නිආරච්චි ( කාර්ය සාධක බලකා 4) කර්නල් ජී වී රවිප්‍රිය  (කාර්ය සාධක බලකා 8)

120. කාර්ය මණ්ඩලයෘ බැටැලියන් මට්ටමේ සිට ඉහළට ඇති සෑම පෙළ ගැසිමකටම සැලසුම් සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ආඥාපතිට සහාය වන වෘත්තීය උපදේශකයන්ගෙන් යුත් 'කාර්ය මණ්ඩලයක්' සිටී.

A/HRC/30/CRP.2

[50] Grand Finale" lankanews.lk.archives

[51] නිත්‍ය අංශයක බ්‍රිගේඩ තුනක් ( එක බ්‍රිගේඩයකට බැටැලියන් තුන බැගින් බැටැලියන් නමයක්) කාර්ය සාධක බලකායට ඇත්තේ බ්‍රිගේඩ දෙකකි. ( බැටැලියන් හයක්)




1. චිත්‍රය වන්නි මෙහෙයුමේ ශ්‍රී ලංකා යුද හමුදාවේ හට කණ්ඩායම් පිළිවෙළ

### ශ්‍රී ලංකා යුද හමුදාවේ හමුදා බුද්ධි බලකාය.

121. ගැටුමට අදාලව බුද්ධි තොරතුරු රැස් කිරීමට අමතරව එය හමුදා මුර කපොළු, පරීක්ෂා කිරීමේ ස්ථාන සහ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු ඇතුළත් එල් ටී ටී ඊ සැකකරුවන් හඳුනා ගැනීමේදී සහ ප්‍රශ්න කිරීමේ දී මූලික භූමිකාවක් ඉටු කරයි. ගැටුම අවසන් සමයේදී එහි ප්‍රධානියා වූයේ මේජර් හෙන්ද්‍රවිතාරණ ය.

### ශ්‍රී ලංකා නාවික හමුදාව

122. ශ්‍රී ලංකා නාවික හමුදාව එල් ටී ටී ඊ මුහුදු කොටි සමග සටන් කිරීමේ දි සහ එල්ටීටීඊ සැපයුම් මාර්ග මෙන්ම එල්ටීටීඊ පාලන ප්‍රදේශවලින් පලා යන සාමාන්‍ය ජනතාව ඇතුළත් වන්නියෙන් පිටව යන බෝට්ටු පරීක්ෂා කිරීමේ දී විශාල කාර්ය භාරයක් ඉටු කෙළේය. නාවික හමුදාව ගොඩබිම් මෙහෙයුම් වලදී නාවික යාත්‍රාවල සිට ප්‍රහාර එල්ල කිරීමෙන් යුද හමුදාවට සහාය විය. එය වන්නියට නැව් මගින් යවන මානුෂීය සැපයුම් පරීක්ෂා කිරීමට, පැටවීමට සහ ගොඩ බෑමට ද සම්බන්ධ විය. ඊට තමන්ගේම බුද්ධි අංශයක් ද තිබිණ.

123. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ මැන්ඩේට් කාල සීමාව තුළ නාවික හමුදාපතීන් වූයේ අද්මිරාල් ඩී ඩබ්ලිව් කේ සඳගිරි, (2001 ජනවාරි සිට 2005 සැප්තැම්බර් දක්වා) අද්මිරාල් වසන්ත කරන්නාගොඩ ( 2005 සැප්තැම්බර් සිට 2009 ජුලි දක්වා) අද්මිරාල් ටී ඇස් ජී සමරසිංහ ( 2009

ජුලි සිට 2011 ජනවාරි දක්වා) අද්මිරාල් ඩී ඩබ්ලිව් ඒ ඇස් දිසානායක ( 2011 ජනවාරි සිට 2012 සැප්තැම්බර් දක්වා)[52]

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

124. සන්නද්ධ හමුදාවලින් කුඩාම හමුදාව ගුවන් හමුදාවයි. ගුවන් හමුදාවට පියාසර බල ගණ 13 ක් සහ ගුවන් තොටුපළ ආරක්ෂාව සඳහා ගොඩබිම් රෙජිමේන්තුවක් ද විය. දිවයින ගුවන් ආරක්ෂක අණ මණ්ඩලයකට හා උතුර, දකුණ, නැගෙනහිර සහ බටහිර වශයෙන් කලාපීය අණ මණ්ඩල හතරකට බෙදා තිබිණ. එක් එක් අණ මණ්ඩලයක් එයාර් වයිස් මාෂල් කෙනෙකු (තරු එක ශ්‍රේණියේ) යටතේ විය. කලාපීය අණ මණ්ඩල සියලුම පියාසර කණ්ඩායම් සහ ගුවන් කඳවුරු පාලනය කරන අතර ගුවන් හමුදා මූලස්ථානයේ මෙහෙයුම් අධිකාරියෙන් තීරණය කරන ගුවන් මෙහෙයුම් සඳහා වගකිව යුතුය. 125. ගුවන් හමුදාව යුද හමුදාවේ සහ නාවික හමුදාවේ මෙහෙයුම්වලට සහාය කාර්යන් ගණනාවක් ඉටු කරයි. ඒ අතරඃ

- වැදගත් ඉලක්ක වලට ( යටිතල පහසුකම් හෝ ඉතා වැදගත් පුද්ගලයන්ට) කලින් සැලසුම් කොට බෝම්බ දැමීම, බොහෝවිට සිදු කරන්නේ අහසේ ඉතා ඉහළ මට්ටමක සිටය.
- පාබල හමුදාවේ හෝ සන්නාහ මෙහෙයුම්වලට ඉදිරියට යෑමට සහාය වීම සඳහා ඉතා පහතින් පියාසර කරන ගුවන් යානාවලින් ප්‍රහාර එල්ල කිරීමෙන් සමීප ගුවන් සහාය ( ගොඩබිම් සහාය ප්‍රහාර යනුවෙන්ද හැඳින් වේ) ලබා දීම.
- මෙහෙයුම් සහ ඉලක්ක තෝරා ගැනීම සඳහා බුද්ධි තොරතුරු සැපයීමට නිශ්චල හෝ වීඩියෝ කැමරා සවි කරන ලද ( නියමුවන් රහිත ගුවන් යානා UAV ඇතුළුව) ඔත්තු බැලීමේ ගුවන් ගමන්.

125. ගැටුම් කාලයේ දී විශේෂයෙන්ම ගුවන් බල ගණ තුනක් ක්‍රියාත්මක විය.

කටුනායක ගුවන් කඳවුරේ සිට ගොඩබිම් ප්‍රහාර මෙහෙය වූ අංක 10 කෆීර් බල ගණය.AFB [53]
කටුනායක ගුවන් කඳවුරේ සිට ගොඩබිම් ප්‍රහාර මෙහෙය වූ අංක 12 මිග් බල ගණය. AFB

වවුනියා ගුවන් කඳවුරේ සිට UAV ඔත්තු බැලීමේ AIA Searcher මෙහෙයුම් කළ අංක 111 බල ගණය.AFB[54]

126. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ මැන්ඩේට් කාල සීමාවේ සිටි ගුවන් හමුදාපතීන්ඃ

එයාර් වයිස් මාෂල් ජී ඩී පෙරේරා. 2002 ජුලි 16 සිට 2006 ජුනි 11 දක්වා) එයාර් වයිස් මාෂල් ඩබ්ලිව් ඩී ආර් ඇම් ජේ ගුණතිලක ( 2006 ජුනි 11 සිට 2011 පෙබරවාරි 27 දක්වා)[55]

**රාජ්‍ය බුද්ධි සේවාව.**

127. රාජ්‍ය බුද්ධි සේවය වාර්තා කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට ය. රාජ්‍ය බුද්ධි සේවය සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ ක්‍රියාත්මක වූ බුද්ධි සේවාවන්ගෙන් එකකි. 2009 අප්‍රේල් මාසයේ දි පොලිස්පති සහ අපරාධ පරීක්ෂණ කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පති බිස්නස්

[52] www.navy.lk

[53] උතුරේ ගැටුම් පවතින ප්‍රදේශයේ සිට ආසන්න වශයෙන් විනාඩි 23 ක පියාසර කාලයක්

[54] ගුවන් හමුදාවට අංක 112 ස්කොඩ්‍රෝනය මෙහෙයවන එම්ට් බිලු හොරයිසන් ඔත්තු බැලීමේ UAV ඇතුළත් විය හැකි දෙවන UAV ස්කොඩ්‍රොනයක් තිබිණ. ඒවා දිවයිනේ දකුණු වෙරළේ වීරවිල ගුවන් හමුදා කඳවුරේ නවතා තිබුණ නිසා පියාසර සීමාවෙන් ඔබ්බේ විය. එහි තිබූ ගුවන් යානා වවුනියාව ගුවන් හමුදා කඳවුරේ සිට මෙහෙයුම් කටයුතු වලට යොදා ගැනීමට යවන්නට ඇත

[55] www.airforce.lk

වුඩේ සමග පැවැත් වූ සාකච්ඡාවේ දී එල්ටීටීඊය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට රාජ්‍ය බුද්ධි සේවය, පොලිස් බුද්ධි ඒකක සහ හමුදාවේ බුද්ධි අධිකාරිය ආරක්ෂක ලේකම් සමග සතිපතා පැවති රැස්වීම් ඇතුළුව සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගත් ආකාරය විස්තර කර ඇත.[56]

**ශ්‍රී ලංකා පොලීසිය.**

128. ශ්‍රී ලංකා පොලීසියට මූලික වශයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට නීතිය හා සාමය පවත්වා ගැනීම, අපරාධ වැළැක්වීම සහ අපරාධ ගැන පරීක්ෂණ පැවැත්වීමේ වගකීම පැවරේ. 2013 අගෝස්තු වන තෙක් පොලීසිය පැවතුණේ ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේය. ඉන් පසුව එය අලුතින් පිහිටුවන ලද නීතිය හා සාමය අමාත්‍යාංශය යටතට පත් කෙරිණ.[57] ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධානියා පොලිස්පති ය. ඔහු පත් කරන්නේ ජනාධිපති විසිනි. පොලිස්පති ජාතික ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකි.

129. හමුදාවට ද ගැසට් පත්‍රයක් මගින් පොලිස් බලතල පවරා තිබිණ. මෙම නියෝගය මාස් පතා අලුත් කරන ලද අතර අවසන් වරට අලුත් කරන ලද්දේ 2015 පෙබරවාරි 2 වන දාය. ඉන් පසුව එය අහෝසි විය. කලින් සඳහන් කළ ආකාරයට හදිසි නීති රෙගුලාසි යටතේ ආරක්ෂක ලේකම්ට ද ජාතික ආරක්ෂාව සහ ත්‍රස්ත විරෝධී කටයුතු වලට අදාලව අත් අඩංගුවට ගැනීමට සෘජුවම නියෝග කිරීමේ අධිකාරියක් ලබා දී තිබිණ.

130. වත්මන් පොලිස්පති ඇන් කේ ඉලංගකෝන් 2011 ජුලි 4 එම තනතුරට පත් කෙරිණ. ඔහුට පෙර සිටි මහින්ද බාලසූරිය එම තනතුරට පත් වූයේ 2009 නොවැම්බර් 3 දාය. ඔහුට පෙර සිටියේ 2008 ජුලි පත් කරන ලද ජයන්ත වික්‍රමරත්නය. ඊට පෙර වික්ටර් පෙරේරා ( 2006 ඔක්තෝබර් සිට) චන්ද්‍රා ප්‍රනාන්දු ( 2004 ඔක්තෝබර් සිට) ඉන්ද්‍රා ද සිල්වා ( 2003 දෙසැම්බර් සිට) සහ ටී ඊ ආනන්දරාජා (2002 සිට)




[56] www.businesstoday.lk.archive April 2009

[57] මෙය LLRC නිර්දේශ අනුව කරන ලද්දකි. දැන් පොලීසිය ආරක්ෂක අමාත්‍යාංශය යටතට නොගැනේ. LLRC වාර්තාව 2011 නොවැම්බර්

3 චිත්‍රය ශ්‍රී ලංකා පොලීසියේ සංවිධාන ව්‍යුහය

131. ශ්‍රී ලංකා පොලීසිය උතුර, දකුණ, නැගෙනහිර, බටහිර සහ කොළඹ වශයෙන් පළාත් පහකට වෙන් කර ඇත. එක් එක් පළාතක කොට්ඨාශ ගණනාවක් පවතින අතර කොට්ඨාශයක් බාරව සිටින්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකි. කොට්ඨාශයක දිස්ත්‍රික් ගණනාවක් පවතින අතර දිස්ත්‍රික්කයක් භාරව සිටින්නේ පොලිස් අධිකාරි වරයෙකි. එක් එක් දිස්ත්‍රික්කයක පොලිස් ස්ථාන දෙකක් හෝ තුනක් පවතින අතර පොලිස් ස්ථානයක් භාරව සිටින්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයෙකි. සමහර පොලිස් ස්ථානවල මහජනයාට ප්‍රදේශයේ පොලීසියට පිවිසීම පහසු කිරීමට කුඩා නගර හෝ දිස්ත්‍රික්කයේ ඈත ප්‍රදේශවල කුඩා පොලිස් මුර පොළ තිබිය හැකිය. භූමි ප්‍රදේශ අනුව වෙන් කරන ලද පළාත්වලට අමතරව කාර්යන් අනුව වෙන් කරන ලද නිශ්චිත කාර්ය ක්ෂේත්‍රයක දිවයින මුළුල්ලේම ක්‍රියාත්මක විය හැකි කාර්ය ක්ෂේත්‍ර ගණනාවක් ඇත. මෙම වාර්තාව සඳහා වැදගත් කාර්ය ක්ෂේත්‍ර වන්නේ විශේෂ කාර්ය බලකාය, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවයි.[58]මෙම මැන්ඩේට් කාල සීමාවේ ආරම්භයේ දී අතුරුදහන් විමර්ශන ඒකකයක් ද විය. (DIU)

## විශේෂ කාර්ය සාධක බලකාය (STF)

132. විශේෂ කාර්ය සාධක බලකාය යනු පොලීසිය තුළ ඇති විශිෂ්ට අතුරු හමුදා ඒකකයකි. එය 1983 දී ජනාධිපති නියෝගයක් අනුව පිහිටුවන ලද්දේ විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ මතු වෙමින් පැවති එල්ටීටීඊ තර්ජනයට මුහුණ දීම සඳහා පොලිසියට අතිරේක සහායක් ලබා දීමටය. කොළ පාට කැප් සහ කැලෑ ඇඳුම් අඳින STF භටයන් වඩාත් සමීප වන්නේ පොලිසියට නොව හමුදාවටය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලු අංශවල පාවිච්චි කරන ඒ කේ 47 ප්‍රාහරක රයිපල්, පාවිච්චි කරන STF ස්නයිපර් රයිපල් RPG , ග්‍රෙනේඩ් ලෝන්චර්, පිස්තෝල සහ AR ප්‍රහාරක රයිපල් වැනි වඩාත් සුවිශේෂී ආයුධ පරිහරණය කරයි. විශේෂ කාර්ය සාධක බලකාය වාර්තා කරන්නේ පොලිස්පතිටය.

133. වත්මන් විශේෂ කාර්ය සාධක බලකායේ අණදෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති ආර් ඩබ්ලිව් ඇම් සී රණවන ය. ( පත් කරන ලද්දේ 2001 මාර්තු 24) ඔහුට පෙර නියෝජ්‍ය පොලිස්පති කේ ඇම් ඇල් සරත්චන්ද්‍ර ( 2003 මාර්තු 24 පත් කරන ලද) නියෝජ්‍ය පොලිස්පති නිමල් ලෙව්කේ ( 2003 සැප්තැම්බර් 10 පත් කරන ලද) නියෝජ්‍ය පොලිස්පති නිමල් ගුණතිලක ( 1998 ජුනි 01 පත් කරන ලද)[597]

## අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවඃ (CID)

134. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරෙන්නේ බරපතළ සහ සංවිධානය වූ අපරාධ විමර්ශනය කිරීම ය. එහෙත් ත්‍රස්ත විරෝධී කටයුතුවලද යෙදී සිටී.[60] අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිල ඇඳුම් අඳින්නේ නැත. එහි සෝදිසි, බුද්ධි සහ විශ්ලේෂණ යනුවෙන් අංශ ඇත. කොළඹ පොලිස් මූලස්ථානයේ 4 වැනි තට්ටුවේ ඇති එහි කාර්යාලය බොහෝ රැඳවියන් ප්‍රශ්න කිරීමට ගෙන එන ස්ථානයක් ලෙස කුප්‍රකටය. (ඉදිරියට ඇති වධ හිංසා පැමිණවීම පරිච්ඡේදය බලන්න.) 2009 අප්‍රේල් මාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වූයේ නියෝජ්‍ය පොලිස්පති සිසිර මැන්ඩිස් ය. 2009 අප්‍රේල් සිට කොළඹ අපරාධ කොට්ඨාශය භාරව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුර සේනානායක ද අපරාධ විමර්ශනයේ සහ ත්‍රස්ත මර්දන කටයුතුවල ප්‍රධාන භූමිකාවක් ඉටු කෙළේය.

---

[58] නියෝජ්‍ය පොලිස්පති වරයෙකුගේ අණ යටතේ.

[59] www.police.lk

[60] 2009 අප්‍රේල් මස බිස්නස් ටුඩේ හි පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත, සහ CID, TID සහ CCD අණ දෙන නිලධාරීන් සමග පැවැත් වූ පුළුල් සාකච්ඡා පළ කෙරිණ. ඉන් මේ අංශ සියල්ලම එල්ටීටීඊයට එරෙහිව ත්‍රස්ත විරෝධී ක්‍රියාකාරකම්වල යෙදුණ බව පැහැදිලිය. දක්ෂතා අනුව කොට්ඨාශවලට වෙන් කිරීමක් පැහැදිලි නැත.

### ත්‍රස්තවාදය විමර්ශන කොට්ඨාශය (TID)

135. 1980 ගණන්වල අග භාගයේ දී පිහිටුවන ලද ත්‍රස්තවාදය විමර්ශන කොට්ඨාශයේ අවධානය යොමු වූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිර්වචනය කළ ආකාරයට ත්‍රස්තවාදී කටයුතු වැළැක්විම සහ විමර්ශනය කෙරේය. සීඅයිඩිය සහ ටීඅයිඩිය අතර වගකීම් නිශ්චිතව බෙදී යන ආකාරය පැහැදිලි නැත. කොළඹ ටීඅයිඩී රැඳවීමේ සහ ප්‍රශ්න කිරීමේ ස්ථානය බොහෝවිට හැඳින්වෙන්නේ 6 වැනි තට්ටුව ලෙසය. 2009 අප්‍රේල් මාසයේ දී ටීඅයිඩී අධ්‍යක්ෂක වූයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සි ඇන් වාකිස්ට ය.[61]

### අතුරුදහන්වීම් විමර්ශන ඒකකය. (DIU)

136. DIU 1997 දි පිහිටුවන ලද්දේ 1990 ගණන්වල[8] සිදු කරන ලද අතුරුදහන් වූ බොහෝ දෙනා පිළිබඳ සිද්ධීන් විමර්ශනය කිරීමට සහ ඊට වගකිව යුතු අය නිතිය ඉදිරියට ගෙන ඒමට පත් කරන ලද කලාපීය පරීක්ෂණ කොමිසම් සභා නිර්දේශ අනුවය[62]. බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් පිළිබඳව VIII පරිච්ඡේදයේ විස්තර කෙරෙන ආකාරයට විශේෂයෙන්ම 2006 න් පසුව DIU වඩ වඩාත් කාර්යක්ෂම භාවයෙන් අඩු වූ අතර අවසානයේ දී එය විසුරුවා හරින ලදී.

### සිවිල් ආරක්ෂා දෙපාර්තමේන්තුව ( CSD)[63]

137. 1980 ගණන්වල මැද භාගයේ දී ශ්‍රී ලංකා ජාතික ග්‍රාමාරක්ෂක සේවය පිහිටුවන ලද්දේ එල්ටිටීඊ තර්ජනයට ලක් වූ මායිම් ප්‍රදේශ සහ ගම් ආරක්ෂා කිරීමේ ස්වේච්ඡා සේවයක් ලෙසිනි. මුලින්ම එය පොලිස් දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය අනුව 2006 දී ජනාධිපති නියෝගයක් අනුව ග්‍රාමාරක්ෂක සේවාව ප්‍රතිව්‍යුහ ගත කොට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. හමුදා නිල ඇඳුම් නිකුත් කොට ස්වේච්ඡා සේවකයන්ට වැටුපක් ද ගෙවන ලදී. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය වූයේ නිතිය හා සාමය රැකීම සහ අනෙකුත් කටයුතුවල දී පොලීසියට සහ හමුදාවට සහාය වීමය. එහි පළමු අධ්‍යක්ෂ ජනරාල් වූයේ 2009 දී පත් කළ රියර් අද්මිරල් සරත් වීරසේකර ය. ඔහුගෙන් පසුව 2009 පෙබරවාරි මස රියර් අද්මිරල් ආනන්ද පීරිස් ය. 2015 පෙබරවාරි මස පත්කළ දැනට සිටින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක සිවිල් පුද්ගලයෙකි.

### අතුරු හමුදා කණ්ඩායම්

138. පහතින් සඳහන් වන්නේ නිරීක්ෂණයට ලක් වෙන කාල සීමාවේ දී ශ්‍රී ලංකා හමුදා සමග ආරක්ෂක මෙහෙයුම්වලට සම්බන්ධයැයි කියන සහ ස්වාධීනව ඔවුන්ගේම ක්‍රියාකාරකම්වල යෙදුණ දෙමළ ප්‍රධාන අතුරු හමුදා කණ්ඩායම් සහ පක්ෂයි. ''අතුරු හමුදා කණ්ඩායම්'' යන්න සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ඉහතින් සඳහන් කළ ග්‍රාමාරක්ෂක සේවාව හැඳින්වීමට ද සමහර විට යොදා ගැනේ. කෙසේ වෙතත් ආරක්ෂක හමුදා සහ ග්‍රාමාරක්ෂකයන් අතර පවතින්නේ නිල සම්බන්ධතාවයකි. පහත සඳහන් වෙන කණ්ඩායම් හා ආණ්ඩුවේ හමුදා සමග ඇති සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කර ඇත.

139. කාලයත් සමග අතුරු හමුදා ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සමග ඇති සම්බන්ධතාවය, ශ්‍රී ලංකා නිරීක්ෂණ මෙහෙය (SLMM), නොයෙකුත් විශේෂ සම්බන්ධීකරකයන් සහ වෙනත් අය වාර්තා කර ඇති ආකාරයට වඩ වඩාත් පැහැදිලි විය. නීතියෙන් පරිබාහිරව සිදු කරන මිනී

---

[61] Interview Business today April 2009. www/businesstoday.lk

[62] Sri Lanka's Fourth Periodic Report to the Human Rights Council, CCPR/C/LKA/2002/4, 18 October 2002.

[63] http://www.csd.lk/index.php?option=com_content^view=article$Itmid-59

මැරීම් ගැන විශේෂ සම්බන්ධීකාරක 2008 මැයි 14 දින ඔහුගේ පසුවිපරම් වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත. '' මෙම පාර්ශ්වයන් තව දුරටත් සැබැවින්ම ස්වාධීන සන්නද්ධ කණ්ඩායම් නොවන බවටත් ආරක්ෂක හමුදාවන්ගෙන් උපදෙස් සහ සහාය ලබන බවටත් ප්‍රබල සාක්ෂි පවතී.''[64] ආණ්ඩුව ( මූලික වශයෙන්ම ආරක්ෂක ලේකම්) හා ආරක්ෂක හමුදා ( විශේෂයෙන්ම යුද හමුදාව සහ පොලිස් STF ) මෙම අතුරු හමුදා කණ්ඩායම් සමග ඇති සම්බන්ධතාවය ශ්‍රී ලංකා නිරීක්ෂණ කොමිටිය සහ වෙනත් අය සාක්ෂිකරුවන් සමග පැවැත් වූ සාකච්ඡාවලදීද ඉස්මතු විය. සාක්ෂිකරුවන් ගණනාවක්ම හමුදා බුද්ධි අංශය සහ කරුණා කණ්ඩායම සහ ඊපීඩීපී යන දෙපාර්ශ්වයම සමග ඇති සමීප සම්බන්ධතා පෙන්වා දුන්හ.

140. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ 2010 අතුරු නිර්දේශවල සඳහන් වන ආකාරයට ''සන්නද්ධ කණ්ඩායම් විසින් දිගටම සිදු කරන කප්පම් ගැනීම්, පැහැර ගැනීම් සහ වෙනත් අපරාධ ජනතාවගේ සිත් තුළ බිය ඇති කරවන නිසා'' එම කණ්ඩායම් නිරායුද කිරීම ''ඉහළම ප්‍රමුඛතාවයෙන් යුත්''[65] කාරණයක් බව අවධාරණය කරයි. අතුරු නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ සිය කණගාටුව ප්‍රකාශ කරන එම කොමිසම 2011 නිකුත් කළ අවසාන වාර්තාවේ මෙසේ සඳහන් කරයි. ''ප්‍රමාණවත් සාක්ෂි සොයා ගත හැකි සිද්ධි සම්බන්ධයෙන් සත්‍යය සොයා ගැනීමේ අදහසින් සහ වැරදි කරුවන්ට එරෙහිව අපරාධ ක්‍රියා පටිපාටි ඇරඹීම සඳහා නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්වලට ඇති චෝදනා සම්බන්ධයෙන් නිසි විමර්ශන ආරම්භ කළ යුතුය.''[66]

**කරුණා කණ්ඩායම/ TMVP**

141. කර්නල් කරුණා අම්මාන් යන නමින් ද හඳුන්වන විනයාගමූර්ති මුරලිදරන් මුලින්ම මඩකලපුව දිස්ත්‍රික්කය පදනම් කර ගත් එල්ටීටීඊ යේ නැගෙනහිර පළාතේ ප්‍රධාන අණදෙන්නාය. කරුණා 2004 දී ඔහුගේ කාර්යධරයන් ගණනාවක් සමග එල්ටීටීඊයෙන් වෙන්ව ගොස් බොහෝ විට කරුණා කණ්ඩායම යනුවෙන් හැඳින් වෙන අතුරු හමුදා කණ්ඩායමක් පිහිටුවා ගත්තේය. 2006 දී සටන් උත්සන්නවීමක් සමග මෙම කණ්ඩායම ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සමග සම්බන්ධ වූයේයැයි පැවසේ.

142. සටන් විරාම ගිවිසුම යටතේ ආණ්ඩුව මෙම කණ්ඩායම නිරායුද කළ යුතුව තිබිණ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ 2010 අගෝස්තු 17 දින පැවති ප්‍රසිද්ධ සාක්ෂි විභාගයේ දී ප්‍රකාශයක් කළ ගෝඨාභය රාජපක්ෂ කරුණා කණ්ඩායම (එමෙන්ම ඊපීඩීපී හා පසුව කරුණා කණ්ඩායමෙන් බිඳී ගිය පිල්ලෙයාන් කණ්ඩායම වැනි වෙනත් අතුරු හමුදා කණ්ඩායම් ද) නිරායුද කළ බව කීවේය. එසේ වුවත් කරුණා කණ්ඩායම ''දීර්ඝ කාලයක් රජයට සහය දුන් බවත්'' ඔවුන්ට '' තම ආරක්ෂාව සඳහා අවි ගෙන යෑමට සිදු වූ බවත්'' පිළිගත්තේය.

143. ඊට වෙනස්ව එල්ටීටීඊයෙන් බිඳී යෑමෙන් පසුව කරුණා කණ්ඩායම බුද්ධි තොරතුරු ලබා දීමේ දී සහ එල්ටීටීඊයට සහ ඒ හා සම්බන්ධතා පවත්වා ගන්නේයැයි සැක කරන අයට එරෙහිව යුද හමුදාව, නාවික හමුදාව සහ විශේෂයෙන්ම පොලිස් විශේෂ කාර්ය සාධක බලකාය සමග එක්ව හෝ ඒ වෙනුවෙන් රහසිගත ක්‍රියාකාරකම්වල යෙදුන බවට තොරතුරු ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලබා ගත හැකි විය. සන්නද්ධ ගැටුම අවසානයට ළඟා වෙමින් පැවති කාලයේ දී සහ එය අවසන් වූ වහාම කරුණා කණ්ඩායමේ සාමාජිකයෝ වන්නියෙන් පිටව යන දහස් ගණන් සිවිල් ජනතාව සමග සිටි අවි බිම තැබූ එල්ටීටීඊ කාර්යධරයන් හඳුනා ගැනීමට ආරක්ෂක හමුදාවලට සහාය වූහ. ඔවුහු අභ්‍යන්තරව අවතැන්වූවන් ගේ කඳවුරු තුළද එැනිම කාර්ය

---

64 A/HRC/C/8/3/Add/3.para50

65 https://Hrclk/files.wordpress.com/2011/02/interim-recommendations.pdf

66 LLRC final report para 9 73, para 9 74
http://www.priu.gov.lk/news_update/current_Affairs/ca200112/FINAL%20LLRC%20REPORT.pdf

භාරයක් ඉටු කළහ. එල්ටීටීඊ නායක ප්‍රභාකරන්ගේ මළ සිරුර හැඳින ගැනීමට නන්දි කඩාල් කලපුවට කරුණා ගෙන ගොස් ඇත.

144. කරුණා කණ්ඩායම තමිල් මක්කල් විඩුතලෙයි පුලිකල් (TMVP) නමින් දේශපාලන පක්ෂයක් පිහිටුවා ගත් අතර එය 2007 දී නිල වශයෙන් ලියා පදිංචි කෙරිණ. එම පක්ෂය 2008 දී නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීමට ඉදිරිපත්ව බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගත්තේය. 2008 මාර්තු මාසයේ දී කරුණා රාජපක්ෂ ආණ්ඩුවේ ජාතික ඒකාබද්ධතා ඇමති වශයෙන් පත් කරනු ලැබිණ.

145. මෙම වාර්තාවේ නීති විරෝධී මිනී මැරීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ XI සහ XIII පරිච්ඡේදවලින් කරුණා කණ්ඩායම නිල ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් කටයුතු කළ බවට ඇති චෝදනා වාර්තා කරයි. මෙම වාර්තාවේ ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ කොටසේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සඳහන් වූ කරුණා කණ්ඩායම/TMVP ළමයින් විශාල වශයෙන් බඳවා ගැනීම පිළිබඳ විස්තර කරයි.

**පිල්ලෙයාන් කණ්ඩායම**

146. ආරම්භයේ දී කරුණාගේ නියෝජ්‍ය නායකයා වූ පිල්ලෙයාන් 2007 දී ඉන් වෙන්ව තමාගේම කණ්ඩායමක් පිහිටුවා ගත්තේය. ඔහු 2008 මැයි මාසයේ දී නැගෙනහිර පළාතේ මහ ඇමති තනතුරට පත් වූයේය.

ඉනිය භාරතී

147. ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් 2011 දී ඉනිය භාරතී යන නමින් ද ප්‍රසිද්ධ කේ පුෂ්පකුමාර් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ සංවිධායක ලෙස පත් කෙළේය. ඉනිය භාරතීගේ කණ්ඩායම ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියා පටිපාටි 1612 අනුව ළමයින් හමුදාවට බඳවා ගැනීම ගැන නම් කරන ලද සංවිධානයකි. [67]

**ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (EPDP)**

148. ඊපීඩීපී දෙමළ කණ්ඩායම් රාශියක් අතුරෙන් 1990 දී බිහි වූ, ඩග්ලස් දේවානන්ද ගේ නායකත්වයෙන් මේ දක්වාම ක්‍රියාත්මක වන පක්ෂයකි. ආණ්ඩුවේ සහාය ඇතිව ඊපීඩීපීය දේශපාලනයට වඩාත් නැඹුරු වී 1994 ඡන්ද විමසීමේ දී පාර්ලිමේන්තු ආසන ගණනාවක් දිනා ගෙන යාපනය දිස්ත්‍රික්කයේ තහවුරු විය. දේවානන්ද අවස්ථා ගණනාවකදීම චන්ද්‍රිකා කුමාරතුංග සහ රාජපක්ෂ යන ජනාධිපතිවරුන් යටතේ ඇමති තනතුරු ද දැරුවේය.

149. ඊපීඩීපීයේ අතුරු හමුදා කණ්ඩායම පලි ගැනීම් සඳහා කළ මිනි මැරුම් සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියාවල සහභාගි වූ බවට තොරතුරු වාර්තා වී ඇත. 2009 ගැටුම අවසානය ළඟා වෙත්ම ඊපීඩීපීය හමුදාවෙන් පාලනය වූ විවෘත නොවූ සරණාගත කඳවුරු තුළ ක්‍රියාත්මක වූ බව නිරන්තරයෙන්ම සඳහන් වේ. කඳවුරු තුළ ඊපීඩීපීයට එහා මෙහා යෑමට තිබූ නිදහස නිසා ඔවුන්ගේ පැමිණීම සහ ක්‍රියාකාරිත්වය අනුව ඔවුන්ට නිල අනුමැතියක් පැවති බව පැහැදිලිය.

**තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE)**

150. එල්ටිටීඊය සටන්කාමී සහ දේශපාලන බලවේගයක් ලෙස මතු වූයේ 1970 ගණන් වලදීය. මුලින්ම එල්ටිටීඊය තමිල් ඊළාම් විමුක්ති සංවිධානය (TELO) විප්ලවවාදී ඊළාම් ශිෂ්‍ය සංවිධානය (EROS) ඊළාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ (EPRLF) සහ තමිල් ඊළාම් ජනතා විමුක්ති සංවිධානය (PLOTE) යන දෙමළ සටන්කාමී සංවිධාන රැසක් අතුරෙන් එකකි. කාලයත් සමග

[67] ඔහු 2012 අප්‍රේල් හිදී එම ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. Report of the Secretary –General on Children and Armed Conflict, 26 April 2012, A/66/782-S/2012/261

ක්‍රම ක්‍රමයෙන් එය දෙමළ ජනතාවගේ ''එකම සහ නිත්‍යානුකූල නියෝජිතයා'' ය යන ඊනියා අධිකාරිය පවරා ගත්තේය.

151. 1980 ගණන් වලදී යුද හමුදාවට පහර දීමෙන් සිය ශක්තිය වැඩි කර ගත් එල්ටීටීඊය දිවයිනේ උතුරේ සිය බලය තහවුරු කර ගැනිමටත් නැගෙනහිර භූමි ප්‍රදේශ පාලනය කිරීමටත් සමත් වූයේය. 2002 සටන් විරාමය අත්සන් කරන විට එය පොලීසිය, උසාවි සහ රැඳවුම් මධ්‍යස්ථාන සහිත ව්‍යාජ රාජ්‍යයක ලක්ෂණ අත් කර ගෙන තිබිණ.

152. පුදුමයකට මෙන් ගැටුම අවසන් වන තෙක්ම කොළඹින් පත් කරන ලද දිසාපතිවරු සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි රජයේ සේවා ලබා දීමට එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සේවය කළහ. ඔවුහු ගැටුමේ අවසාන අදියරේ දී එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට මානුෂීය ආධාර ඇණවුම් කිරීම, ලබා ගැනීම සහ බෙදා හැරීමේ මූලිකයන් වූහ.

153. එල්ටීටීඊ සටන් අංශය කාලයත් සමග නිල ඇඳුම් සහිත නිශ්චිත භූමි ප්‍රදේශ පදනම් වූ භට කණ්ඩායම් ඒකකවලින් යුත් සම්ප්‍රදායික හමුදාවක් ලෙස සංවිධානය කර තිබිණ. එසේ වුවත් එය දිවයින පුරාම පහර දී පලා යෑම සහ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරීම දිගටම සිදු කෙළේය. 2002 සහ 2005 සටන් විරාම කාල සීමාවේ මුල් කාලයේ දී මෙවැනි ප්‍රහාරවල පහත වැටීමක් දක්නට ලැබුණ ද 2009 සන්නද්ධ ගැටුමේ අවසාන අදියර තෙක්ම ප්‍රහාර සිදු විය.

154. ඇමරිකා එක්සත් ජනපදයේ 9/11 ප්‍රහාරයෙන් පසුව එක්සත් ජනපදයේ නායකත්වයෙන් 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' දියත් කිරීමත් සමග අන්තර්ජාතික ප්‍රජාවේ කතාබහ වෙනස්වීමට පටන් ගෙන රාජ්‍යයන් ගණනාවක්ම එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කෙළේය. එසේ වුවත් එල්ටීටීඊය අපරාධ සහ කප්පම් ගැනීමේ නිරත වෙමින් දෙමළ ඩයස්පෝරාවෙන් අරමුදල් රැස්කිරීම දිගටම සිදු විය.[68] තම අරමුණට ද්‍රව්‍යාත්මක සහ ප්‍රචාරාත්මක සහාය ලබා දුන් ලොව පුරා පැතිරි පුළුල් වානිජ සහ මාධ්‍ය ජාලයක් පවත්වා ගැනීමට ද එල්ටීටීඊයට හැකියාව තිබිණ.

155. එල්ටීටීඊයට සටන් අංශයක්, දේශපාලන අංශයක් සහ ජාත්‍යන්තර ලේකම් කාර්යාංශයක් තිබිණ. දේශපාලන අංශය සහ එහි සාම ලේකම් කාර්යාලය ආණ්ඩුව සහ සාම ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමග පැවැත්වෙන දේශපාලන සාකච්ඡාවලට සම්බන්ධ විය. 2007 නොවැම්බර් මාසයේ ආණ්ඩුවේ ගුවන් ප්‍රහාරයකින් මිය යන තෙක් දේශපාලන අංශයේ ප්‍රධානියා වූයේ සුප්පයියා පරම තමිල්සෙල්වම් ය. ඉන් පසුව එහි ප්‍රධානියා වූයේ එල්ටීටීඊයේ පොලිස් ප්‍රධානියාව සිටි බාලසිංහම් නඩේසන් ය. එය සමහර අවස්ථාවල බඳවා ගැනීම්වලට සහ එල්ටීටීඊ පාලන ප්‍රදේශවලින් පිටව යෑමට අවසර දීමට ද සම්බන්ධවී ඇත. කස්ත්‍රෝ යන නමින් ද හඳුන්වන වීරකාති මනිවන්නම් ගේ නායකත්වයෙන් යුත් ජාත්‍යන්තර ලේකම් අංශය ප්‍රචාරක, අරමුදල් රැස් කිරීම සහ පිටරටවලින් අවි ආයුධ මිලදී ගැනීම වැනි ක්‍රියාකාරකම්වලට වගකිව යුතුය. 2009 මැයි මාසයේ දී යුද්ධය අවසන් වන තෙක් සාම කාර්යංශයේ ප්‍රධානියා වූයේ සීවරත්නම් පුලිදේවන් ය.

156. මධ්‍යම පාලන කොමිටියෙන් මෙම ව්‍යුහයන් අධීක්ෂණය කරන ලද අතර එහි ප්‍රධානියා වූයේ එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ය. සටන් අංශයේ ප්‍රධානියා වූයේ ද ඔහුය. 2007 නොවැම්බර් වන තෙක් එල්ටීටීඊ පොලිස් ප්‍රධානියා වූයේ බී නඩේසන් ය. බුද්ධි අංශයේ ප්‍රධානියා පොට්ටු අම්මාන් ය. මුහුදු කොටි නායකයා වූයේ තිල්ලේයිලම්බලම් සිවනේසන් හෙවත් සූසෙයි ය.

157. එල්ටීටීඊයේ සටන්වලට සම්බන්ධ නැති අංශ ගැන සමහර තැන්වල සඳහන් වුවද මෙම කොටස මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ එල්ටීටීඊයේ සටන් අංශය කෙරේය. හැකි අවස්ථාවල එල්ටීටීඊ සටන් කාර්යධරයන් සහ සටන් වලට ඍජුවම සම්බන්ධ නැති එල්ටීටීඊ කාර්යධරයන් වෙනස් කොට හැඳින ගැනිමට මෙම වාර්තාව උත්සාහ ගෙන ඇත. එහි පැවති

[68] ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිටිය නීති විරෝධීව හමුදා උපකරණ අත්පත් කර ගැනීම, කප්පම් ගැනීම හෝ වෙනත් එවැනි කරුණු ගැන අවධානය යොමු කෙළේ නැත. ඒවා වෙනත් පරීක්ෂණවල විෂය වනු ඇත

රහස්‍ය ස්වභාවය නිසා ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට පහල මට්ටමේ අණ දෙන ව්‍යුහයන් ගැන විස්තර ලබා ගත නොහැකිය.

**එල්ටීටීඊ සටන් බලකාය**

158. එල්ටීටීඊ සටන් අංශය, නිත්‍ය බලකාය සහ අතිරේක බලකායකින් සමන්විතය. නිත්‍ය බලකායට ගොඩබිම්, ගුවන්, මුහුදු (මුහුදු කොටි) බුද්ධි අංශයක් සහ විශේෂ බලකාය ඒකකයක් ද තිබිණ. ස්ත්‍රීන්ට බලකායට බැඳී සමස්ත බලකාය ශක්තියේ කැපී පෙනෙන කොටසක් වීමට දිරිමත් කෙරිණ.

159. එල්ටීටීඊ සටන් අංශයේ සම්පූර්ණ ශක්තිය ගැන නිශ්චිත සංඛ්‍යා නොමැති වුවත් වරින් වර කරන ලද ගණන් බැලීම් අනුව භට සංඛ්‍යාව දහස් ගණනක සිට 30,000 දක්වා විය හැකියැයි අනුමාන කළ හැකිය. සන්නද්ධ ගැටුමේ අවසාන මාස කීපයේ දී, විශේෂයෙන්ම අවසාන සති කීපයේ දී මරණ සහ පලායෑම් නිසා භට සංඛ්‍යාව තවත් අඩු වන්නට ඇතැයි සිතිය හැකි නමුත් විශ්වාස කටයුතු සංඛ්‍යා නොමැත. බලහත්කාරයෙන් සහ ස්වේච්ඡා බඳවා ගැනීම් මෙම වාර්තාවේ XI සහ XII පරිච්ඡේදවල විස්තර කෙරෙන අතර ඊට වැඩිහිටියන් බලහත්කාරයෙන් බඳවා ගැනීම සහ ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම ද ඇතුළත්ය.

160. ප්‍රභාකරන් එල්ටීටීඊයේ සමස්ත නායකයා වීමට අමතරව සටන් අංශයේ ප්‍රධාන අණදෙන නිලධාරියා ද විය. මධ්‍යම පාලන කොමිටියට එල්ටීටීඊ බලකායන් කළමනාකරණය සහ සම්බන්ධීකරණය කළ හමුදා ලේකම් කාර්යංශයක් ද තිබිණ. ඊට එල්ටීටීඊයේ සටන් කලාප හතේ ( පසුව එය හයක් විය) අණදෙන නිලධාරීන් ද අයත්විය.

**ගොඩබිම් බලකාය.**

161. එල්ටීටීඊ සටන් අංශයේ විශාලතම කොටස වූයේ ගොඩබිම් බලකායයි. එය අණ කොට්ඨාශ දෙකකින් යුක්තය. උතුර පළාත් කොටසේ අණදෙන්නා වූයේ 2009 අප්‍රේල් මාසයේ දි සටනේ දි මිය ගිය වේලායුදපිල්ලේ බහීරතකුමාර් හෙවත් තීපන් ය. ඒ වෙනුවට පත් වූයේ කර්නල් භානු ය. නැගෙනහිර පළාත් අණදෙන්නා වූයේ තම්බිරාසා තුරෙයිසිංහම් හෙවත් කර්නල් රමේෂ් ය. ( මුලින්ම අණදෙන්නා වූයේ කරුණාය. ඔහු ඉවත්වීමෙන් පසු රමේෂ් එම තනතුරට පත් විය.) මෙම පළාත් ඉන් පසුව යාපනය (උතුරු පෙරමුණ), මන්නාරම, මනල්ආරු, වවුනියා, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර වශයෙන් සටන් කලාප හතකට (කරුණා ඉවත්වීමෙන් පසුව හයක් විය.) වෙන් කර තිබිණ. එක් සටන් කලාපයක් කලාප අණදෙන්නෙක් යටතේ විය. ගොඩබිම් හමුදාව බ්‍රිගේඩ සහ රෙජිමේන්තු ගණනාවකට වෙන් කර තිබුණද එසේ බෙදා තිබූ ආකාරය පැහැදිලි නැත. මෙම පෙළ ගැසීම් හැඳින්වීම සැබැවින්ම පෙළ ගැසීම්වල ප්‍රමාණය දක්වන්නේ ද යන්නත් පැහැදිලි නැත. ඒවානම්:

**විශේෂ බලකායන්**

162. කළු කොටි: කළු කොටි යනු එල්ටීටීඊ විශිෂ්ට බලකායකි. විශේෂ බලකායක් ලෙස පුහුණු කොට හැඳින්වුවද එය ඇත්තෙන්ම මූලික වශයෙන් මරාගෙන මැරෙන බෝම්බකරුවන්ය. වාර්තා වන ආකාරයට කළු කොටි ප්‍රභාකරන්ගේ ඍජු අණ යටතේ වූ අතර ඔහුගේ පුද්ගලික ආරක්ෂාව සැපයූවේ ද මෙම අංශයෙනි. [69] කළු කොටි සම්ප්‍රදායික ගොඩබිම් සහ මුහුදු සටන්වලට හා පුද්ගල ඝාතනයට මෙන්ම ගරිල්ලා ප්‍රහාරවලටද සම්බන්ධ වූහ.

**පාබල ඒකක**

චාල්ස් ඇන්තනි බ්‍රිගේඩය (උතුරු භට කණ්ඩායම)

---

[69] රාධා (ගුවන් යානා නාශක) රෙජිමේන්තුව සමහර විට ජ්‍යෝෂ්ඨ නායකයන්ට ආරක්ෂාව සපයන පුද්ගල ආරක්ෂක ඒකකයක් ලෙසද වාර්තාවේ. එය 1987 දී ආණ්ඩුවේ ගුවන් හමුදා ප්‍රහාරයකින් මිය ගිය ලුතිනන් කර්නල් රාධා සිහි කිරීමට නම් කර ඇත.

ජයන්තන් බ්‍රිගේඩය ( නැගෙනහිර හට කණ්ඩායම)

දිවි බ්‍රිගේඩය (ළමයින්ගෙන් සැදුම් ලත්)

ඉම්රාන් පණ්ඩිකාන් රෙජිමේන්තුව

විනෝදන් රෙජිමේන්තුව

කාන්තා ඒකක

මුලතිවු බ්‍රිගේඩය

සුතියා බ්‍රිගේඩය

අන්බරසි බ්‍රිගේඩය (ගුවන් යානා නාශක ඒකකයක් වශයෙන් යොදා ගන්නා ලද)

සහායක ඒකක

වික්ටර් රෙජිමේන්තුව ( යුද ටැංකි නාශක)

කිට්ටු කාලතුවක්කු බ්‍රිගේඩය

කිට්ටු ශ්‍රී මෝටාර් බ්‍රිගේඩය

පොන්නම්මාන් බිම් බෝම්බ ඒකකය

**බුද්ධි අංශය**

163. කොටි ආරක්ෂක බුද්ධි සේවා සංවිධානය (TOSIS) බුද්ධි තොරතුරු රැස්කිරීම සහ සංවිධානය තුළ බුද්ධි තොරතුරු රැස් කිරීම හිමි වූයේ මෙම අංශයටය. මෙහි අණදෙන්නා වූයේ පොට්ටු අම්මාන් ය. එහි අංශ දෙකක් තිබිණ. ජාතික බුද්ධි තොරතුරු සේවය ( NIS) සහ හමුදා බුද්ධි සේවය (MIS) යනුවෙනි. මේ දෙකින් වඩාත් විශාල වූයේ NIS ය. එහි ක්ෂේත්‍ර ක්‍රියාකාරිකයන් ද විය. කාර්යාලයට සීමා වූ MIS ආණ්ඩුවේ ආරක්ෂක හමුදා තුළ ඔත්තු බැලීමේ ජාලයක් මෙහෙයවීය. එහි යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව වශයෙන් වෙනම දෙපාර්තමේන්තු තිබිණ.

**නාවික අංශය**

164. එල්ටීටීඊ සටන් හැකියාවේ වඩාත් කැපී පෙනෙන හා ප්‍රබල කොටසක් වූයේ සම්පූර්ණ කාලය පුරාම තිල්ලෙයිලම්බලම් සිවනේසන්[70] (හෙවත් සූසෙයි) අණ යටතේ පැවති මුහුදු කොටි ය. මුහුදු කොටි දිවයිනේ ඊසාන දිග වෙරළබඩ කුඩා කඳවුරු සහ පහසුකම් රැසක්ද වයඹ දෙස කීපයක් ද පවත්වා ගත්හ. ඔවුන්ට හමුදාමය සහ වානිජ භූමිකාවක් ද විය.

165. ගොඩබිම් හෝ මුහුදු ඉලක්කවලට පහර දීම සඳහා නොගැඹුරු මුහුදේ ක්‍රියාත්මක වන කුඩා සහ වේගවත් යාත්‍රා සමූහයක් තිබිණ. මෙම යාත්‍රා අතර නාවික හමුදාවේ නැව්වල ගැටී පුපුරුවා හරින පුපුරණ ද්‍රව්‍ය පිරවූ කුඩා බෝට්ටුද අයත්ය.

---

[70] 2009 මැයි 18 වැනි දා අවසන් සටනේ දී ප්‍රභාකරන් සමග මිය ගිය බව වාර්තාවේ.

166. එල්ටීටී පාලන ප්‍රදේශවලට සැපයුම් ප්‍රවාහනය කිරීමේ වගකීම පැවරී තිබුණේ වෙළඳ යාත්‍රාවලටය. ඊට පෝක් සමුද්‍ර සන්ධිය හරහා ඉන්දියාවෙන් හොරබඩු ගෙන එන සහ ගැඹුරු මුහුදේ දී රඳවා තිබෙන විශාල නැව්වලින් බා ගන්නා භාණ්ඩ වෙරළට ගෙන ඒමට යොදා ගන්නා කුඩා බෝට්ටුද අයත්ය. මෙම වෙළඳ නැව් සමූහයට ශ්‍රී ලංකා නාවික හමුදාව මග හැරීමට ඈත මුහුදේ නවතා තිබූ ''පාවෙන ගබඩා'' ද අයත් ය.

167. එල්ටීටීඊයට සටන්කරුවන් මුහුදින් ප්‍රවාහනය කිරීමට ද හැකියාව තිබුණ බවට නිදසුන් වන්නේ ගොඩබිම් සටන්කරුවන්ගේ සහායට මුහුදෙන් පැමිණ ප්‍රහාර එල්ල කිරීමෙනි.

**ගුවන් හමුදාව**

168. ලොව රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අතරින් ගුවන් හමුදාවක් සතුව තිබූ එකම කණ්ඩායම වන්නේ එල්ටීටීඊ යි. එය ගුවන් කොටි යනුවෙන් හැඳින් විණ. ඔවුන්ට බෝම්බ දැමීමට යොදා ගත් චෙක් රටේ නිෂ්පාදිත සැහැල්ලු ගුවන් යානා හයක් තිබිණ. යුදමය වශයෙන් ගුවන් කොටි නොවැදගත් වුවද ඔවුන් සිදු කළ ගුවන් ප්‍රහාර කිපය ඔවුන්ට විශාල ප්‍රචාරාත්මක වාසියක් අත් කර දුන් අතර කොළඹ වෙසෙන සිවිල් ජනතාව තුළ බියක් ඇති කිරීමට සමත් විය.

**සිවිල් ආරක්ෂක බලකාය**

169. සිවිල් ආරක්ෂක බලකායට අංශ දෙකක් තිබිණ.

- ගම්වල ආරක්ෂාව සහ ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රහාර වලින් ආරක්ෂා කිරීම සඳහා ග්‍රාමාරක්ෂකයන්
- ශ්‍රී ලංකා යුද හමුදාව රහසින් ඇතුළුවීම වැළැක්විමට ඉවහල් වූ ග්‍රාමාරක්ෂකයන්

170. ගැටුමේ අවසාන වසරවල වයස්ගත වුවන් ඇතුළුව ගම් පිටින් ජනතාව කෙටි කාලින සිවිල් ආරක්ෂක පුහුණුවට කැඳවන ලදී. සමහර විට ගම්වැසියන් විශාල බංකර් තැනීම සඳහා බිම් කැනීම වැනි කටයුතු සඳහාද යොදවා ඇත. කෙසේ වෙතත් සිවිල් ආරක්ෂක බලකාය සාපේක්ෂ වශයෙන් ලිහිල් ව්‍යුහයක් බව පෙනේ. ගම් වැසියන් සිවිල් ආරක්ෂක පුහුණුවක් ලැබීමත් එල්ටීටීඊය හඳුන්වන ආකාරයට ඔවුන් සිවිල් ආරක්ෂක බලකායක් වීමත් නිසා ඔවුන් සටන්වලට සාජුවම සම්බන්ධ වූයේයැයි සැලකිය නොහැකිය.

## V, නිති රාමුව.

171. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සිය විමර්ශනය පවත්වන ලද්දේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය, අන්තර්ජාතික මානුෂීය නිතිය සහ අන්තර්ජාතික අපරාධ නීතිය යටතේය.

**අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය.**

172. ශ්‍රී ලංකාව මූලික මානව අයිතිවාසිකම් ගිවිසුම් නමයකට අත්සන් කළ රාජ්‍ය පාර්ශ්වයකි. සියලු ආකාරයේ වාර්ගික වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ අන්තර්ජාතික සන්ධානය,( CERD) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානය (ICCPR) සහ එහි පළමු වෛකල්පික මූලපත්‍රය, ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානය (ICESCR) වධ හිංසාව සහ අනෙකුත් අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි සන්ධානය,( CAT) ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකිම් තුරන් කිරීම පිළිබඳ සන්ධානය, (CEDAW) සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිනම් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර්ජාතික සන්ධානය (CMW) සහ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානය (CRC) සහ එහි ළමයින් සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ කර ගැනීම පිළිබඳ සහ ළමයින් වෙළඳාම් කිරීම, ළමා ගණිකා වෘත්තිය, සහ ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ වෛකල්පික මූලපත්‍ර.

ඊට අමතරව ශ්‍රී ලංකාව ආබාධ සහිත පුද්ගලයන් ගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානය ද අත්සන් කළ නමුත් එය අපරානුමත කර නැත.[71]

173. එමෙන්ම ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ප්‍රකාශනය[72] අභ්‍යන්තර අවතැන්වීම් පිලිබඳ මගපෙන්වීමේ මූලධර්ම,[73] නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් බලය සහ ගිනි අවි යොදා ගැනීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති[74] මෙන්ම සටනේ දී දඬුවම් නොලැබ සිටීමේ පියවර තුළින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ මූලධර්ම මාලාව, [75] සමග අන්තර්ජාතික නීතිය යටතේ පවතින බැඳීම්, විශේෂයෙන්ම අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාවිධි, ක්‍රියා පටිපාටි සහ හඳුනා ගන්නා යාන්ත්‍රණ සැලකිල්ලට ගනී. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය බරපතළ උල්ලංඝනය කිරීමේ වින්දිතයන් සඳහා ප්‍රතිකර්ම සහ හානිපූරණය ලබා ගැනීමට ඇති අයිතිය සහ 2005 අන්තර්ජාතික මානුෂීය නිතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම පිළිබඳ මූලධර්ම සහ මග පෙන්වීම් විශේෂයෙන් අදාලයැයි සිහිපත් කරයි.[76]

174. ශ්‍රී ලංකාව තම භූමි ප්‍රදේශයේ සහ තම නීතියට යටත් සියලු පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය සහ තහවුරු කිරීමට බැඳී සිටී. ඊට තම අයිතිවාසිකම් උල්ලංඝනය වූ පුද්ගලයන්ට, ( හානිපූරණ සහ නැවත සිදු නොවීම සහතික කිරීමේ ප්‍රතිපාදන ඇතුළත්ව) ඵලදායී ප්‍රතිකර්ම ලබා දීමේ අයිතිය මෙන්ම නිශ්චිත උල්ලංඝනය කිරීම් විමර්ශනය සහ ඒවා සිදු කළ පුද්ගලයන් නීතිය ඉදිරියට පැමිණවීමේ රජයේ වගකීම ඇතුළත් වේ.[77] සම්ප්‍රදායික අන්තර්ජාතික නිතියේ කොටසක් වන අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතියේ අදාල නියමයන්ගෙන් ද ශ්‍රී ලංකාව බැඳී සිටී.

175. ශ්‍රී ලංකාව 2000 මැයි 30 වැනිදා සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ 9(2)[78] 9(3)[79] 12(1)[80]12(2)[81] 14(3)[82] 17(1)[83] 19(2)[84] 21[85] සහ 22[86] යන වගන්ති මග

---

[71] ශ්‍රී ලංකාව පහත සඳහන් ගිවිසුම්වලට අත්සන් තබා නැත: සියලුම පුද්ගලයන් බලහත්කාරයෙන් ආරක්ෂා කිරීම සඳහා වූ අන්තර්ජාතික සන්ධානය, වධ හිංසා සහ අනෙකුත් කුරිරු අමානුෂිකහෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය, ආර්ථික සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය, මරණ දඬුවම ඉවත් කිරීම පිළිබඳ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ දෙවන වෛකල්පික මූල පත්‍රය, සන්නිවේදන ක්‍රියා පටිපාටියක් පිළිබඳ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය.

[72] බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් පුද්ගලයන් අතුරුදහන් කිරීම පිළිබඳ ප්‍රකාශනය

[73] අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මෙහෙයුම් මූලධර්ම

[74] නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් බලය සහ ගිනි අවි යොදා ගැනීම පිළිබඳ මූලධර්ම

[75] දඬුවම් නොලැබ සිටීමට එරෙහිව පියවර ගැනීම තුළින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා මූලධර්ම මාලාව

[76] 2005 දෙසැම්බර් 16 මහා සභාවේ යෝජනා අංක 60/147 අනුව සම්මත කොට ප්‍රකාශයට පත් කළ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය පුළුල් ලෙස උල්ලංඝනය කිරීමේ සහ මානුෂීය නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමේ වින්දිතයන්ට ප්‍රතිකර්ම සහ හානිපූරණ අයිතිය පිළිබඳ මූලධර්ම සහ මගපෙන්වීම්

[77] සන්ධානයේ ඡේද 15 – 19 අනුව (2004) රාජ්‍ය පාර්ශ්වයන්ට පැනවෙන පොදු නෛතික වගකීම්වල ස්වභාවය පිළිබඳ මානව අයිතිවාසිකම් කොමිටියේ පොදු අදහස් අංක 31 බලන්න. මානව අයිතිවාසිකම් කොමිටියේ පොදු අදහස් අනුව දේශීය නිතිය යටතේ හෝ අන්තර්ජාතික නිතිය යටතේ අපරාධ ලෙස ගැනෙන උල්ලංඝනය කිරීම්, වධ හිංසා පැමිණවීම සහ ඒ සමාන කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකිම්, සංක්ෂෙපණ සහ හිතුවක්කාර මිනී මැරීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිදු කරන්නන් නිතිය ඉදිරියට ගෙන ඒම ආණ්ඩුවේ යුතුකමක් ලෙස සලකයි. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය සහ 2005 දෙසැම්බර් මාසයේ දී මහා මණ්ඩලය සම්මත කළ අන්තර්ජාතික මානුෂීය නීතිය දැඩි ලෙස ලෙස උල්ලංඝනය කිරීමේ වින්දිතයන්ට ප්‍රතිකර්ම සහ හානිපූරණයට ඇති අයිතිය පිළිබඳ මූලධර්ම සහ මගපෙන්වීම් සහ දඬුවම් නොලැබ සිටීමට එරෙහිව පියවර ගැනීම තුළින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය සඳහා වූ යාවත් කාලීන කරන ලද මූලධර්ම මාලාව බලන්න. (ඒවා 2005 එ ජා මානව අයිතිවාසිකම් කොමිසමේ දී ඒකමතික යෝජනාවත් වශයෙන් පිළි ගන්නා ලදී.)

[78] ICCPR හි 9(2) වගන්තියේ මෙසේ සඳහන් වේ: ''අත් අඩංගුවට ගන්නා ඕනෑම අයෙකුට අත් අඩංගුවට ගන්නා අවස්ථාවේ දීම අත් අඩංගුවට ගන්නා හේතුව දැනුම් දිය යුතු අතර ඔහුට විරුද්ධව කිසියම් චෝදනාවක් ඇතිනම් වහාම එය දැන්විය යුතුය.''

[79] ICCPR හි 9(3) වගන්තියේ මෙසේ සඳහන් වේ: අපරාධ චෝදනාවක් යටතේ අත් අඩංගුවට ගන්නා හෝ රඳවා ගන්නා ඕනෑම පුද්ගලයෙකු හැකි ඉක්මණින් විනිශ්චයකරුවෙකු හෝ අධිකරණ බලය යෙදවීමට නීතියෙන් බලය ලත් නිලධාරියෙකු ඉදිරියට පැමිණ විය යුතුය. ඔහුට සාධාරණ කාල සීමාවක් ඇතුළත නඩු පැවරිය යුතුය. නැතිනම් නිදහස් කළ යුතුය. නඩු විභාගයක් පොරොත්තුව සිටින තැනැත්තන් සිර බාරයේ තබා ගැනීම නියමයක් නොවිය යුතුය. එහෙත් නිදහස් කිරීම නඩු විභාගයේ දී හෝ වෙනත් ඕනෑම අවස්ථාවකදී සහ අවශ්‍ය වුවහොත් නඩු තීන්දුව ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී පෙනී සිටින බවට සහතික වීමට යටත්ව සිදු කළ හැකිය.

[80] ICCPR හි 12(1) වගන්තියේ මෙසේ සඳහන් වේ: '' රාජ්‍යයක භූමි ප්‍රදේශයක් ඇතුලත නීත්‍යානුකූලව පදිංචිව සිටින සෑම කෙනෙකුටම රට ඇතුලත එහා මෙහා යැමටත් සිය වාසස්ථානය තෝරා ගැනීමටත් නිදහස තිබිය යුතුය.''

[81] ICCPR හි 12(2) වගන්තියේ මෙසේ සඳහන් වේ: ''ඕනෑම කෙනෙකුට තම රට ඇතුළුව ඕනෑම රටකින් පිටව යෑම නිදහස තිබිය යුතුය.''

[82] ICCPR හි 14(3) වගන්තියේ මෙසේ සඳහන් වේ: ''සාපරාධී චෝදනාව පිළිබඳ විනිශ්චය කිරීමේ දී පූර්ණ සමානත්වයෙන් පහත සඳහක් අවම සහතික ලැබිය යුත්තේය:

(අ) ඔහුට විරුද්ධව ඇති චෝදනාවේ ස්වභාවය සහ නිමිත්ත ඔහුට වැටහෙන භාෂාවකින් නොපමාව සහ සවිස්තරාත්මකව දක්වනු ලැබීම,

(ආ) සිය විත්ති වාචකය සූදානම් කර ගැනිමට තමා ම තෝරා ගන්නා නිතිඥයෙකු සමග අදහස් හුවමාරු කර ගැනිමට ප්‍රමාණවත් කාලය සහ පහසුකම් ලැබීම

(ඇ) අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව නඩු විභාගයට

(ඈ) තමා ඉදිරිපිට නඩු විභාගය කරනු ලැබිමට, තමා විසින්ම හෝ තමා විසින් තෝරා ගනු ලබන නීතිඥයන්ගේ සහාය ඇතිව සිය නිදහසට කරුණු දැක්වීමට නීතිඥ සහාය නැති නම් මෙම අයිතිවාසිකම් ගැන දන්වනු ලැබීමට යුක්තිය වෙනුවෙන් අවශ්‍ය වන්නේ නම් සහායවීම සඳහා නිතිඥයෙකු පත් කරනු ලැබීමට සහ ඒ සඳහා ගෙවීමට ඔහුට හැකියාවක් නැති නම් ඔහුගේ ගෙවීමකින් තොරව එසේ කරනු ලැබීමට,

(ඉ) ඔහුට විරුද්ධ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට සහ කරවීමට සහ ඔහුට විරුද්ධ සාක්ෂිකරුවන්ට හිමි තත්වයන් යටතේම ඔහුගේ සාක්ෂිකරුවන් කැඳවිමට සහ ඔවුන්ගෙන් ප්‍රහ්න කිරීමට

(ඊ) අධිකරණයේ භාවිත භාෂාව තේරුම් ගැනීමට හෝ කතා කිරිමට නොහැකිනම් ගෙවිමක් නැතිව භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලැබීමට

(උ) තමාටම විරුද්ධව සාක්ෂි දීමට හෝ පාපෝච්චාරණය කිරීමට.

[83] ICCPR හි 17(1) වගන්තියේ මෙසේ සඳහන් වේ: '' කිසිම තැනැත්තෙකු ඔහුගේ රහස්‍ය භාවයට, පවුල, නිවස හෝ ලිපි ගනුදෙනු සම්බන්ධව මැදිහත්විමක් නොකළ යුතුය. එමෙන්ම ගෞරවය හා කිර්ති නාමයට හානි නොකළ යුතුය.

[84] ICCPR හි 19(2) වගන්තියේ මෙසේ සඳහන් වේ: සෑම කෙනෙකුටම ප්‍රකාශ කිරීමේ නිදහස ඇත්තේය. දේශ සීමාවන්ගෙන් තොරව තොරතුරු, සෑම ආකාරයකටම වාචිතව, ලිඛිතව හෝ මුද්‍රිතව ද චිත්‍ර ආකාරයෙන් හෝ එසේත් නොමැතිනම් තමාට කැමති වෙනත් ඕනෑම මාධ්‍යයකින් සොයා ගැනීමට, ලැබීමට, සහ දැන්වීමට ඇති නිදහස මෙම අයිතියට ඇතුළත් විය යුතුය.

[85] ICCPR හි 21 වගන්තියේ මෙසේ සඳහන් වේ: ''සාමකාමී රැස්වීමේ නිදහස පිළිගත යුතුය. නීත්‍යානුකූලව පවත්වන්නා වූද ජාතික ආරක්ෂාව, මහජන සාමය සඳහා හෝ මහජන සෞඛ්‍යය, හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා හෝ අනෙකුත් අයගේ අයිතිවාසිකම් හා බහුවිධ නිදහස ආරක්ෂා කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රීය සමාජයකට අවශ්‍ය වන්නාවූද සීමා කිරීම් හැර මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිම සීමාවක් නොපැනවිය යුතුය.''

[86] ICCPR හි 22 වගන්තියේ මෙසේ සඳහන් වේ: ''සෑම කෙනෙකුටම තම වුවමනාවන් ආරක්ෂා කර ගැනිමට වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට සහ ඒවාට බැඳීමට ඇති අයිතිය ඇතුළත්ව අනෙකුත් අය සමග සංගම් පැවැත්වීමේ නිදහසට අයිතියක් තිබිය යුතුය. මෙම අයිතිය භුක්ති විඳීමේ දී ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව, මහජන සාමය (ordre public) මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට හෝ අනෙකුත් අයගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය සහ නීතියෙන් නියමිත ඒවා හැරෙන්න වෙනත් සීමා නොපැනවිය යුතුය. මෙම වගන්තිය සන්නද්ධ සේවාවන්හි සහ පොලීසියේ සාමාජිකයන්ගේ මෙම අයිතිය යෙදවීමේ නිතයානුකූල සීමාවන් පැනවීම වැළැක්විය යුතු නොවේ.

හැරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ බවද ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සැලකිල්ලට ගනී.[87] ලඝු කිරීමට ගනු ලැබූ පියවර නිත්‍යානුකූල වන්නේ ඒවා අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියේ දක්වන කොන්දේසිවලට අනුකූල වන ප්‍රමාණයටය. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ 4 වැනි වගන්තිය අනුව ගිවිසුම යටතේ ඇති සමහර බැඳීම් ''රටක ජන ජීවිතයට බලපාන හදිසි තත්වයක් පවතින විට'' තාවකාලිකව වෙනස් කිරීමේ හැකියාවක් පවතින නමුත් එවැනි පියවර ''පවතින තත්වයේ අවශ්‍යතායන්ට දැඩිව සීමා වන ආකාරයෙන් එම අවශ්‍යතාවය සඳහා පමණි.[88] එමෙන්ම මානව අයිතිවාසිකම්[89] සම්බන්ධයෙන් හිතුවක්කාර ලෙස සහ පමණ ඉක්මවා කෙරෙන මැදිහත්වීම් වැළැක්වීමට ප්‍රමාණවත් ආරක්ෂාවන් සැලසිය යුතු අතර[9] ක්‍රියා පටිපාටි පිළිබඳව ඇති ආරක්ෂාවන් කිසි විටෙකත් ලඝු කළ නොහැකි අයිතිවාසිකම් මගහැරීමට නොහැකි වන ආකාරයට සීමා විය යුතුය. [90]

176. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ 4 වැනි වගන්තිය අනුව සන්ධානයේ ප්‍රතිපාදන ලඝු කිරීමට ගනු ලබන පියවරවලදී එය රාජ්‍ය පාර්ශ්වයට ''අන්තර්ජාතික නිතිය යටතේ ඇති අනෙක් බැඳීම්වලට'' අනුකූල නොවන ආකාරයට කළ නොහැකිය.[91] මේ සම්බන්ධයෙන් ''සන්නද්ධ ගැටුම් සමයක සාධාරණ නඩු විභාගයකට ඇති අයිතියේ සමහර ලක්ෂණ අන්තර්ජාතික මානුෂීය නීතිය යටතේ පැහැදිලිව සහතික කර ඇති අතර හදිසි තත්වයක දී මෙම සහතික කිරීම් ලඝු කිරීමට කිසිම හේතුවක් නොවන බව''[92]මානව අයිතිවාසිකම් කොමිටිය අවධාරණය කරයි. මෙය පවතින වාතාවරණය මත, සාමූහික දඬුවම් දීමක් විය හැකි සහ අන්තර්ජාතික මානුෂීය නීතිය යටතේ තහනම් කරන ලද පියවර සම්බන්ධයෙන් විශේෂයෙන්ම අදාලය.[9310]

177. වැඩි දුරටත් තවත් ක්‍රියා ගණනාවක්ම කුමන තත්වයක් යටතේ හෝ සිදු කිරීම තහනම් කර ඇති නිසා ඒවා නිත්‍යානුකූල ලඝු කිරීමට භාජනය විය නොහැකිය. ඊට ප්‍රාණ ඇපකරුවන් ගැනිම, පැහැර ගැනීම හෝ රහසිගතව රඳවා ගැනීම පිටුවහල් කිරීම හෝ අන්තර්ජාතික නීතිය යටතේ අවසර ලබා දී ඇති හේතු නොමැතිව නිත්‍යානුකූලව ජනතාව ජීවත් වන ප්‍රදේශවලින් ඔවුන් බලයෙන් පිටත් කර යැවීම හෝ යුද්ධය සඳහා ප්‍රචාරණය හෝ වෙනස් කොට සැලකීමට, එදිරිවාදිකම්වලට සහ ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි ජාතික, වාර්ගික හෝ ආගමික වෛරීය දේශනා තහනම් කිරීම ඇතුළත් වේ.[94]

---

[87] 2010 ජුනි 9 වැනි දා ශ්‍රී ලංකාව ICCPR හි පහත සඳහන් ප්‍රතිපාදන ලඝු කිරීම අවසන් කරන බව දනුම් දී ඇතඃ 9(2), 12. 14(3), 17(1), 19(2), 21 සහ 22(1)

[88] මෙම බැඳීම් වලින් පෙන්නුම් කරන්නේ බලතල ලඝු කිරීමට සහ සීමා කිරීමට ඇති පොදු ප්‍රමාණානුකූල භාවයේ මූලධර්මයයි. ගනු ලබන ඕනෑම පියවරක් ව්‍යවස්ථානුකූල සාමය ප්‍රතිස්ථාපනය කිරීම අරමුණු කර ගත්, මානව අයිතිවාසිකම් ගරු කරන සහ පවතින වාතාවරණය අනුව සම්පූර්ණයෙන්ම හේතු යුක්ති කළ හැකි පවතින තත්වයට මුහුණ දීමට ගනු ලබන අව්‍යාජ ප්‍රතිචාර විය යුතුය. එමනිසා නිශ්චිත ප්‍රතිපාදන ලඝු කිරීමේ හේතුව නිසාම උද්ගතව ඇති අවශ්‍යතාවය හේතු යුක්ති කිරීමෙන් ලඝු කිරීමෙන් ගනු ලබන නිශ්චිත පියවරයන්හි අවශ්‍යතාවය පැහැදිලි කිරීම අනවශ්‍ය වන්නේ නැත.

[89] මානව අයිතිවාසිකම් කොමිටියේ සාමාන්‍ය අදහස් අංක.29 ' States of emergency (Article 4) UN Doc. CCPR/C/21/rev.1/Add 11para 4

[90] මෙය කොමිටියේ හදිසි තත්වය පිළිබඳ සාමාන්‍ය අදහස් අංක 29 සහ ජද්ගලයන්ගේ නිදහස හා ආරක්සාව පිළිබඳ සාමාන්‍ය අදහස් අංක35 යන දෙකින්ම අවධාරනය කර ඇත. (9වගන්තිය) UN Doc.CCPR/C/GC/35 හබෙයාස් කෝර්පස් අයිතිය දූර්වල කළ නොහැකි බව කොමිටිය පැහැදිලිවම දක්වා ඇත.(paras 65-67)

[91] මානව අයිතිවාසිකම් කොමිටියේ සාමාන්‍ය අදහස් අංක.29 ' States of emergency (Article 4) UN Doc. CCPR/C/21/rev.1/Add 11para 9.

[92] මානව අයිතිවාසිකම් කොමිටියේ සාමාන්‍ය අදහස් අංක.29 zStated of emergency (Article 4) UN Doc.CCPR/C/21/Rev. 1/Add 11(2001) para16. මෙහිදී මානව අයිතිවාසිකම් කොමිටිය ඊශ්‍රායෙලය පිළිබඳ අවසාන නිරීක්ෂණ ගැන සඳහන් කරයි. (1998 CCPR/C/79/Add.93) එහිදී රාජ්‍ය පාර්ශ්වයකට රඳවා ගැනීම එළදායි අධිකරණ විමර්ෂණයකින් බැහැර විය නොහැකි බව දක්වයි.

[93] Jean Marie Henckaerts and Lousie Doswald – Beck Customary International Humanitarian Law Cambridge CUP 2006.Rule 103 මෙම නියමයන් සහ යාවත් කාලීන කරන ලද අදාල භාවිතාවන් දැන් සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නීතිය යටතේ ICRC දත්ත බැංකුවේ ඇත. මෙම වාර්තාව සඳහන් කරන්නේ එයයි.

[94] මානව අයිතිවාසිකම් කොමිටියේ සාමාන්‍ය අදහස් අංක. 29 para 13

178. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය සාමකාමී කාලයේ දී මෙන්ම සන්නද්ධ ගැටුම් පවතින කාලයේදී ද බලපැවැත් වේ.[95] සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානය සන්නද්ධ ගැටුම් පවතින තත්වයන්හිදි ද යෙදෙන බව සඳහන් කරන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය ''සමහර සන්ධාන අයිතිවාසිකම් සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂීය නීතියේ නිශ්චිත නියමයන් සන්ධාන අයිතිවාසිකම් අර්ථ විග්‍රහය කිරීම සඳහා විශේෂයෙන්ම අදාල විය හැකි නමුත් නීතියේ එම ක්ෂේත්‍ර දෙක එකිනෙකට උන පූරණය වන නමුත් අන්‍යෝන්‍යව බැහැර කරන්නේ නැති[96] බව සඳහන් කරයි.

179. සන්නද්ධ ගැටුම් පවතින තත්වයන් තුළ අන්තර්ජාතික මානුෂීය නිතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය එකවර යෙදීමෙන් අදහස් වන්නේ එම නීති සංග්‍රහ දෙකම එකට කියවිය යුතු බවත් හැකිතාක් දුරට එකට ගැලපිය යුතු බවත්ය.

**අන්තර්ජාතික මානුෂීය නිතිය**

180. අන්තර්ජාතික මානුෂීය නිතිය එදිරිවාදිකම්වල නොයෙදෙන හෝ කලින් යෙදුණත් දැන් තව දුරටත් සෘජුව සන්නද්ධ ක්‍රියාවල නොයෙදෙන අය සන්නද්ධ ගැටුමට පාර්ශ්වයන් වන අයගේ ක්‍රියාකාරිත්වයෙන් ආරක්ෂා කිරීම සඳහා ඔවුන් නියාමනය කිරීමට සහ – සටන් කිරීමේ හේතුව නොසලකා- සතුරාගේ සටන් ශක්තිය දුර්වල කිරීමට පමණක් වූ ගැටුමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට පමණක් සන්නද්ධ බලය යෙදීම[97] සීමා කිරීමට සටනේ ක්‍රම සහ විධි නියාමනය කරයි.

181. සන්නද්ධ ගැටුම් තත්වයන් තුළ දී ගැටුමේ සියලු පාර්ශ්වයන් සම්ප්‍රදායික හෝ ගිවිසුම් පදනම් හෝ අන්තර්ජාතික මානුෂීය නීතියේ අදාල නියමයන්ගෙන් බැඳී සිටී. ශ්‍රී ලංකාව 1949 අගෝස්තු 12 ජිනීවා සන්ධාන හතරේ පාර්ශ්වයකි.[98] ශ්‍රී ලංකාව සංශෝධනය කරන ලද 1 වගන්තිය සහ එහි හඳුනා ගත නොහැකි කැබලි පිළිබඳ I මූල පත්‍රය බිම් බෝම්බ, මර උගුල් සහ වෙනත් බෝම්බ තහනම් කෙරෙන සංශෝධිත II මූල පත්‍රය, ගිනි ඇති කරන අවි තහනම් කෙරෙන III මූල පත්‍රය සහ ඇස් අන්ධකරවන ලේසර් අවි පිළිබඳ IV මූල පත්‍රය ඇතුළත් සමහර සම්ප්‍රදායික අවි තහනම් කරන සන්ධානයට 1980 දී අත්සන් කර ඇත.[99] එය තව දුරටත් හුස්ම හිර කරවන හෝ විෂ වායු සහ බැක්ටීරියා ක්‍රම පිළිබඳ ජිනීවා මූල පත්‍රය සහ ජෛව විද්‍යාත්මක අවි තහනම් කෙරෙන සන්ධානය මෙන්ම සංස්කෘතික දේපොළ ආරක්ෂා කරන හේග් සම්මුතිය ද අපරානුමත කර ඇත.

---

[95] අන්තර්ජාතික අධිකරණය තම න්‍යෂ්ටික අවි උපදේශන මතයේ සන්නද්ධ ගැටුම් පවතින තත්වයන් තුළ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයෙන් ලබා දී ඇති ආරක්ෂාව අවසන් නොවන බව දක්වා ඇත. උසාවිය පසුව මෙය තහවුරු කොට අන්තර්ජාතික මානුෂික නිතිය සහ මානව අයිතිවාසිකම් නිතිය අතර සම්බන්ධතාවය සම්බන්ධයෙන් ඇති විය හැකි තත්වයන් තුනක් හඳුනා ගත්තේය. ''සමහර අයිතිවාසිකම් සමුපූර්ණයෙන්ම අන්තර්ජාතික මානුෂික නිතියට යටත් කරුණුය, වෙනත් සමහර ඒවා සම්පූර්ණයෙන්ම මානව අයිතිවාසිකම් නීතිය පිළිබඳ කරුණුය, තවත් ඒවා අන්තර්ජාතික නිතියේ මෙම අංශ දෙකටම අයත් ඒවා විය හැකිය.'' අල්ලා ගත් පලස්තීන භූමියේ තාප්පයක් ඉදි කිරීමේ නෛතික ආනිශංස, Advisory Opinion,( 9 July 2004 ICJ Reports 2004 para 106

[96] මානව අයිතිවාසිකම් කොමිටියේ සාමාන්‍ය අදහස් අංක. 31, Nature of the general legal Obligation on State Parties to the Convenant, UN dec. CCPR/21 rev./1/Add/13.(2004) para 11

[97] Sassoli M Bouvier, A Quintin (eds) How Does Law Protect in War? (3rd edn.Geneva ICRC 2011) Vol.1.at 1

[98] ශ්‍රී ලංකාව අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වල සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් වල වින්දිතයන්ගේ ආරක්ෂාව පිළිබඳ පිළිවෙළින් අතිරේක සුවිශේෂී සලකුණක් සම්මත කර ගැනීමේ අතිරේක මූල පත්‍රය I,II, හා III අපරානුමත කර නැත.

[99] මෙම ගිවිසුම් 2004 සැප්තැම්බර් 24 අපරානුමත කර ඇත. බලන්නඃ https://www.icrc.org/applic/ihl.nsf/vwTreatiesBycountryselected.xsp?wp_countrySelected=LK

182. අන්තර්ජාතික ස්වභාවයේ නොවන ගැටුම්වලට අදාල ජිනීවා සන්ධාන හතරට පොදු 3 වගන්තිය ශ්‍රී ලංකාවේ තත්වයට යෙදේ. ඒ අනුව සියලු පාර්ශ්වයන් සිවිල් ජනතාව සහ යුද්ධයේ දී තුවාල ලත් පුද්ගලයන්ට සැලකිමට අදාල සහතික ගරු කිරීමට බැඳී සිටී.[100] පොදු 3 වගන්තිය අනුව ගැටුමේ සියලු පාර්ශ්වයන් අවමයක් වශයෙන් එදිරිවාදිකම්වලට සෘජුවම සහභාගි නොවන පුද්ගලයන් මෙන්ම සටනේ දී තුවාල ලත් පුද්ගලයන්ට අහිතකර වෙනස් කිරීමකින් තොරව මානුෂිකව සැලකිය යුතු බව දක්වෙන වගන්තියට ගරු කළ යුතුය.[101]

183. ඊට අමතරව ආණ්ඩුව සහ සන්නද්ධ ගැටුමේ පාර්ශ්වයන් වන සන්නද්ධ කණ්ඩායම් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාල සම්ප්‍රදායික අන්තර්ජාතික නීතියේ අදාල නියමයන්ගෙන් එකසේ බැඳී සිටී.

184. අන්තර්ජාතික මානුෂීය නිතිය එදිරිවාදිකම්වලට සෘජුවම සම්බන්ධ නොවන පුද්ගලයන් මෙන්ම ''ජීවිතයට සහ පුද්ගලයන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය යෙදවීම විශේෂයෙන් සියලු ආකාරයේ ඝාතන, අංග විකල කිරීම්, කුරිරු ලෙස සැලකීම් සහ වධ හිංසා පැමිණවීම'' සහ ''පුද්ගල ගරුත්වය කෙලසීම විශේෂයෙන්ම නින්දා සහගත සහ අවමන් කොට සැලකීම'' තහනම් කරයි.[102] එදිරිවාදිකම්වලදී ගැටුමේ පාර්ශ්වයන්ගේ බැඳීම් වෙනස් කොට හැඳින ගැනීම, ප්‍රමානානුකූලභාවය, ප්‍රවේශම්වීම යන මූලධර්මයන්ගෙන් පාලනය වේ.[103]

185. වෙනස් කොට හඳුනා ගැනීමේ මූලධර්මය අනුව ගැටුමේ පාර්ශ්වයන් එක අතකින් සිවිල් ජනතාව සහ සිවිල් ස්ථාන හා අනෙත් අතට නිත්‍යානුකූල සටන් ඉලක්ක අතර වෙනස හඳුනාගත යුතුය. ප්‍රහාර එල්ල කළ යුත්තේ පසුව සඳහන් ඉලක්ක වලට පමණි.[104] සටන් ඉලක්ක ලෙස නොසැලකෙන සියලු දේ සාමාන්‍ය ජනතාවගේ ලෙස සැලකිය යුතු අතර සෘජු ප්‍රහාර එල්ල කිරීමෙන් වැළකී සිටිය යුතුය. සෘජු ප්‍රහාරවලින් සිවිල් ජනතාව ආරක්ෂා කළ යුතුය. කෙසේ වුවත් ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීමේ ඔවුන්ගේ අයිතිය ඔවුන් එදිරිවාදිකම්වලට සෘජුව සම්බන්ධ වන්නේ නම් සහ එම අවස්ථාවල දී ලැබෙන්නේ නැත.[105]

186. ප්‍රමාණානුකූලතා මූලධර්මයෙන් අනියම් වශයෙන් වන ජීවිත හානිය, සිවිල් ජනතාවට තුවාල සිදුවන, සිවිල් ස්ථානවලට හානි සිදුවිය හැකියැයි අපේක්ෂා කරන ප්‍රහාර සහ ඒවායේ

[100] නිකරගුවාව තුළ සහ ඊට එරෙහිව සිදු වූ හමුදා සහ අතුරු හමුදා ක්‍රියාකාරකම් පිළිබඳව ICJ නඩුවඃ (නිකරගුවාව එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය) ICJ වාර්තා 1986 පිටුව 218 පොදු වගන්ති 3 ඇතුළත් මානව වර්ගයා පිළිබඳ මූලික සැලකීම පිළිබිඹු වන්නේයැයි අන්තර්ජාතික අධිකරණය පිළිගත්තාය.

[101] පොදු වගන්තිය 3 න් ජීවිතයට හා පුද්ගලයාට හිංසනය, විශේෂයෙන්ම සියලු ආකාරයේ මරණ, විකෘති කිරීම, කුරිරු සැලකීම සහ වධ හිංසනය, ප්‍රාණ ඇපකරුවන් ගැනිම, පුද්ගල ගරුත්වයට හානි සිදු කිරීම මෙන්ම දඬුවම් නියම කිරීම සහ විධිමත්ව ස්ථාපනය කරන ලද උසාවියක නිදහස් සහ සාධාරණ සහ නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකොට කලින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දු අනුව ඝාතනය කිරීම් තහනම් කරයි.

[102] ජිනීවා හතර සන්ධානයේ පොදු වගන්ති 3 බලන්න. අන්තර්ජාතික මානුෂීය නීතියේ මූලික පදනම වන සන්නද්ධ ගැටුමේ ප්‍රචණ්ඩත්වය සතුරාගේ සටන් ශක්තිය දුර්වල කිරීමට අවශ්‍ය ප්‍රමාණයට සීමා කිරීමේ අන්තර්ජාතික මානුෂීය නීතියේ උතුම් මූලධර්මය වන්නේ වෙන් කොට හැඳින ගැනීමේ මූලධර්මය යි. මෙම මූලධර්මයෙන් එදිරිවාදිකම්වලට සෘජුවම සම්බන්ධ නොවන පුද්ගලයන් සෘජුවම ඉලක්ක කර ගැනීම මෙන්ම ඉවක් බවක් නැතිව ප්‍රහාර දියත් කිරීම තහනම් කිරීම වැනි වාස්තවික නියමයන් ගණනාවක්ම උකහා ගත හැකිය. වැඩි දුරටත් වෙන් කොට හඳුනා ගැනීමේ මූලධර්මය අනුව සිවිල් ජනතාවට සහ මහජන ස්ථානවලට විය හැකි හානිය සීමා කිරීමට හා එදිරිවාදිකම්වල ප්‍රතිපලයක් වශයෙන් විය හැකි බලපෑමෙන් සිවිල් ජනතාව රැක ගැනීමට ගත හැකි සියලු පියවර ගැනීම ගැටුමේ පාර්ශ්වයන්ගෙන් අපේක්ෂා කෙරේ. මෙය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාල සම්ප්‍රදායික නීතියේ ද පැහැදිලිවම දක්වේ. බලන්න ICRC database on customary interítional humanitarian law Chapter 1 Principle orf Distinction Rules 1-24

[103]

[104] කිසියම් දෙයක් හෝ ගොඩනැගිල්ලක් හමුදාමය ඉලක්කයක් ලෙස සැලකීමේ දී සමුච්චිත නිර්ණායක දෙකක් සපිරිය යුතුය. (1) එහි ස්වභාවය, පිහිටීම කාර්යය හෝ භාවිතය අනුව හමුදා කාර්යකට ප්‍රබල දායකත්වයක් විය යුතුය. (2) එය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් විනාශ කිරීම. අත්පත් කර ගැනීම, හෝ අඩපණ කිරීම එම අවස්ථාවේ පවතින වාතාවරණය අනුව නිශ්චිත හමුදාමය වාසියක් අත් කර දෙන්නක් විය යුතුය.

[105] See ICRC Database on customary internatnionl humanitarian law Rule 9See Article 13(3) Additional Protocl l II and 51(3) of Additional Protocol I ICRC සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නිතිය පිළිබඳ දත්ත බැංකුව නියමය 6

එකතුවක් සහ අපේක්ෂා කරන සෘජු හා නිශ්චිත සටන් වාසියට සාපේක්ෂකව සීමාව ඉක්මවා යන ප්‍රහාර තහනම් කෙරේ.[106]

187. ප්‍රවේශම්වීමේ මූලධර්මය අනුව සියලු පාර්ශ්වයන් අනියමෙන් සිදු විය හැකි සාමාන්‍ය ජීවිත නැතිවීම, සාමාන්‍ය ජනතාවට තුවාල සිදුවීම සහ සිවිල් ස්ථානවලට හානි සිදුවීම කිසියම් ආකාරයෙන් අවම කිරීමට, වැළැක්වීමට ගත හැකි සියලු පියවර ගත යුතුය.[107] ප්‍රහාරවල බලපෑමෙන් ප්‍රවේශම්වීම යන්නට ඇතුළත් වන්නේ, වඩාත් වැදගත්ව හැකිතාක් දුරට අධික ජනගහණයක් ඇති ප්‍රදේශ තුළ හෝ ඒ අසළ හමුදා ස්ථාන පිහිටුවීමෙන් වැළකී සිටීම හා ගැටුමේ පාර්ශ්වයක පාලනය යටතේ සිටින සිවිල් ජනතාව සහ එම ස්ථාන සටන් ඉලක්ක ආසන්නයෙන් ඉවත් කිරීමට ගත හැකි සියලු පියවර ගැනිමට බැඳී සිටීම ය.[108]

188. ගැටුමේ සියලු පාර්ශ්වයන් වෛද්‍ය ඒකක සහ ප්‍රවාහනය මෙන්ම එම පිරිස්වලට ගරු කිරීමේ වගකීමෙන් බැඳී සිටින අතර ඒවා ප්‍රහාරයක ඉලක්ක කර නොගත යුතුය. වෛද්‍ය ඒකක සහ ප්‍රවාහනයට ඇති ආරක්ෂාව ඒවා මානුෂීය කාර්යන්ගෙන් පරිබාහිරව එදිරිවාදිකම් සඳහා යොදා නොගන්නා තෙක් හිමි විය යුතුය. කෙසේ වුවත් අන්තර්ජාතික මානුෂිය නිතිය අනුව එවැනි දේ සඳහා ලබා දී ඇති ආරක්ෂාව අවසන් වන්නේ සුදුසු පරිදි වටා පිටාව අනුව සහ සාධාරණ කාල සීමාවක් ලබා දීමෙන් පසු අවවාද කිරීමෙන් සහ එවැනි අවවාද නොසලකා හරින්නේ නම් ය.[109]

189. අන්තර්ජාතික මානුෂීය නීතිය යටතේ සන්නද්ධ ගැටුමක පාර්ශ්වයකට ඇති කරවන බැඳීම, අන්තර්ජාතික මානුෂීය නිතියට ගරු කිරීමට ඇති වගකීම උභයභාවය මත පදනම් නොවන නිසා විරුද්ධ පාර්ශ්වයේ හැසිරීම මත රැඳෙන්නේ නැත.[110] ගැටුමේ එක් පාර්ශ්වයකට පැවරිය හැකි අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමක් අනෙක පාර්ශ්වය ද එම නීතියට අනුකූලව කටයුතු නොකිරීම හේතු යුක්ති කිරීමට අවස්ථාවක් නොවේ.[111] එමෙන්ම 1949 ජිනීවා සන්ධාන හතරටම පොදු 1 වැනි වගන්තියේ මෙසේ සඳහන් වේ. '' ජිනීවා සන්ධාන හතරට අත්සන් තබන පාර්ශ්වයන් සියලු තත්වයන් යටතේ එහි ප්‍රතිපාදනවලට ගරු කිරීමට සහ ගරු කරන බව තහවුරු කිරීමට බැඳී සිටී.''[112]

**අන්තර්ජාතික අපරාධ නිතිය.**

190. රාජ්‍යයන්ට අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය බරපතළ උල්ලංඝනය කිරීම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය බරපතළ උල්ලංඝනය කිරීම් විශේෂයෙන් අන්තර්ජාතික නීතිය

---

106 බලන්න ICRC සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නිතිය පිළිබඳ දත්ත බැංකුව 14 නියමය. See also Articles 51(5) and 57(2) Additional Protocol I

107 ගැටුමේ පාර්ශ්වයන් ප්‍රහාරයකින් මෙන්ම ප්‍රහාරයකින් විය හැකි බලපෑමෙන් ආරක්ෂා කිරීමට ගත හැකි සියලු පියවර ගැනීමේ යුතුකමක් පවතී. ප්‍රහාරයක ප්‍රවේශම්කාරී බවට ඉලක්කය හමුදාමය ස්ථානයක් බව තහවුරු කර ගැනීම සහ ප්‍රහාරය ප්‍රමාණානුකූල භාවයේ අවශ්‍යතා සපුරණ බව, සිවිල් ජනතාවට සිදු වන හානි වැළැක්වීමේ හෝ මග හැරීමේ අදහසින් ප්‍රහාරය සිදු කරන වේලාව සහ යොදා ගන්නා අවි තෝරා ගැනීම, හැකි අවස්ථාවල කල් ඇතිව අනතුරු හැඟවීම, ප්‍රහාරය ප්‍රමාණානුකූල භාවයේ මූලධර්මයන්ට නොගැලපෙන බව පෙනෙන්නේ නම් එය අත් හිටුවීම ප්‍රහාරයක ප්‍රවේශම්කාරී පියවර වේ.

108 ICRC Database on customary international law. Rules 23-24. See also Article 57 Additional Protocol

109 Articles 9-11 Additional Protocol II ICRC database on customary international humanitarian law, Rules 25-26, 28-30

110 See ICRC database on customary Imternational Humanitarian Law. Rules 140 and 144. See also Article 60(5) Viennna Convention on the law of the treaties.

111 පොදු වගන්ති 3 හි යොදා ඇති වචන අනුව එහි ඇතුළත් වන තහවුරු කිරීම් ''සියලු තත්වයන් යටතේ'' යෙදෙන බව සඳහන් වීමෙන් මෙම යුතුකම් වඩාත් ශක්තිමත් වේ.

112 අන්තර්ජාතික අධිකරණය 'ගරු කිරීමට' ඇති බැඳීම රාජ්‍ය පාර්ශ්වයට පමණක් සීමා නොවන අතර ගැටුමේ සියලු පාර්ශ්වයන් ගේ හැසිරීම අන්තර්ජාතික මානුෂික නිතිය උල්ලංඝනය වන ක්‍රියා දිරිමත් නොකිරීමේ යුතුකම දක්වා පුළුල් වෙන බව සඳහන් කරයි. ජිනීවා සන්ධානය සම්මත කර ගැනීමෙන් පසුව රාජ්‍ය භාවිතය පොදු වගන්ති I යටතේ ඇති බැඳීම් සන්නද්ධ ගැටුමට සම්බන්ධ රාජ්‍යයන්ට පමණක් සීමා නොවන බවත් ''සියලුම රාජ්‍යයන් අන්තර්ජාතික මානුෂීය නිතිය උල්ලංඝනය කිරීම් නතර කිරීමට හැකි පමණ බලයක් යෙදිය යුතු බව'' පැහැදිලි කර ඇත. See ICJ Case Concerning Military and paramilitary Activities in and Against Nicaragua ( Nicaragua v United States of Amarica) ICJ Reports 1986 p.14 para 220

යටතේ අපරාධ වශයෙන් සැලකිය හැකි ඒවා සඳහා වගවීම තහවුරු කිරීමට මූලික බැඳීමක් පවතී.[113]මෙම බැඳීම්වලට අනුකූලවීම සඳහා රාජ්‍යයන් සම්ප්‍රදායික සහ ගිවිසුම් නීතියේ අදාල මූලධර්මවලට අනුකූලව එවැනි අපරාධ පිළිබඳ අධිකරණ බලය නිසි ආකාරයෙන් යෙදවීමට දේශීය උසාවිවලට හැකි කරවීමට අවශ්‍ය කෙරෙන නෛතික පදනම දේශීය ව්‍යවස්ථාවලට ඇතුළත් බව තහවුරු කළ යුතුය.[114] ඇත්තෙන්ම රාජ්‍යයන් අන්තර්ජාතික අපරාධ නීතිය යටතේ අපරාධ සිදු කරන ලදැයි සැක කරන අයට අභිචෝදනා ඉදිරිපත් කොට වැරදිකරු බව ඔප්පුවන්නේ නම් නිසි දඬුවම් ලබා දීම සහතික කිරීමට සුදුසු පියවර ගත යුතුය. [115] රාජ්‍යයන් තව දුරටත් වින්දිතයන්ට ඵලදායි පිළියම් ලැබෙන බවත්, සිදුව ඇති තුවාල සඳහා හානි පූරණයක් සිදු වන බවත්, උල්ලංඝනය පිළිබඳ සත්‍යය දැක ගැනීමට ඇති පැවරිය නොහැකි අයිතිය තහවුරු කිරීමටත් එවැනි උල්ලංඝනය කිරීම් නැවත සිදුවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා බව සහතික කිරීමටත් පියවර ගත යුතුය.[116]

191. පවතින වාතාවරණය අනුව, හමුදාවේ අණදෙන්නන් සහ අනෙකුත් ඉහළ නිලධාරීන් සෘජුවම සිදු කරන ලද, අණ කරන ලද හෝ උසිගන්වන ලද අපරාධ සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ අණ යටතේ හෝ ඔවුන්ගේ නිසි පාලනය යටතේ සිටි අය විසින් සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් එවැනි දේ සිදු කරනවිට හෝ සිදු කිරීමට සූදානම්ව සිටිය දී එවැනි ක්‍රියා වැළැක්වීමට හෝ ඒවාට දඬුවම් දීමට අවශ්‍ය සියලු සහ සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වූ විට ඔවුන්ට අපරාධ පිළිබඳ වගකීම දැරීමට සිදු විය හැකිය.[117]

192. අන්තර්ජාතික අපරාධවලට පහත් සඳහන් දේ ඇතුළත් විය හැකිය.

**යුද අපරාධ**

193. සම්ප්‍රදායික හෝ සම්මුතික නීතිය[118] යටතේ පුද්ගලික අපරාධ වගකීම අත්වෙන යුද්ධයේ නීති සහ සම්ප්‍රදායන් බරපතළ උල්ලංඝනය කිරීම් යුද අපරාධ ලෙස ගැනේ. ඊට වෙනත් කරුණු

---

[113] සමහර අපරාධ යුද අපරාධ, මානව වර්ගයාට එරෙහි අපරාධ, ජන ඝාතන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ වධ හිංසා ඇතුළත් වන බව අදහස් කෙරේ

[114] දඬුවම් නොලැබ සිටීමට එරෙහිවීම සඳහා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ මූලධර්ම මාලාව. 21 වැනි මූලධර්මය.

[115] සීමා පැනවෙන ව්‍යවස්ථා අන්තර්ජාතික නීතිය යටතේ අපරාධ වශයෙන් ගැනෙන අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය පුළුල් ලෙස උල්ලංඝනය කිරීම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය බරපතළ ලෙස කඩ කිරීම්වලට අදාල නොවිය යුතුය. 1968 UN Convention on the Non-Applicability of Statutory Limitations to War Crimesand Crimes Against Humanity: United nations Basic Principles and Guidelines on the right to a Remedy and Reparation para 6

[116] දඬුවම් නොලැබ සිටීමට එරෙහිවීම සඳහා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ මූලධර්ම මාලාව.1 වැනි මූලධර්මය.

[117] වුපර්ටාල් හි එක්සත් රාජධානි හමුදා අධිකරණය,මේජර් කාල් රුවර් සහ තවත් හය දෙනකු ගේ නඩු විභාගය හමුදා විනිශ්චය සභාව න්‍යුරෙම්බර්ග්, එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ කොමිසම IV වෙළුම විනිශ්චය සභාව ලන්ඩන් HMSO 1948, ( para 656) . ඇමරිකා එක්සත් ජනපදය එරෙහිව විලිහෙල්ම් වොන් ලේ සන තවත් අය ( උසස් අණ මණ්ඩල නඩු විභාගය) 1948 ඔක්තෝබර් 27 (para 657) සහ න්‍යුරෙම්බර්ග් හමුදා විනිශ්චය සභාව ඇමරිකා එක්සත් ජනපදය එරෙහිව ලැයිතුව සහ තවත් අය (ප්‍රාණ ඇපකරුවන්ගේ නඩු විභාගය) 1948 පෙබරවාරි 19 (ඡේද 658)එක්සත් ජනපදය ශ්‍රේෂ්ඨාධිකරණය යමෂිටා නඩුව 327 U.S I (1946) 1946 පෙබරවාරි 4 (ඡේද 659) ICC හි රෝම ව්‍යවස්ථාවේ වගන්ති 28 ICTY ව්‍යවස්ථාවේ වගන්ති 7 (2) සහ ICTR ව්‍යවස්ථාවේ වගන්ති6(2).සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නීතියේ 152 නියමය පිළිබඳ ICRC දත්ත බැංකුව.

[118] තඩික අධිකරණ බලය පිළිබඳ අතුරු අභියාචනයසඳහා වූ විත්තියේ මෝසම පිළිබඳ තීරණය Tadic (IT-94-1-AR 72 ) 1995 ඔක්තෝබර් 2 ඡේද 94. බලන්න සාමාන්‍යයෙන් ජී. අබි සාබ් " The Concept of War Crmes" in S Yee and W Tieys (eds) International Law and the Post Cold War- World Essays in Honor of Li Haopei (Routledge 2001) 99, 112. සිවකුමාරන් එස් The law of Non-International Armed Conflicts (Oxford, Oxford Umiversity Press 2012 ) 175-8 බලන්න.

අතර, ජිනීවා සන්ධාන හතරේ[119] පොදු වගන්ති 3 උල්ලංඝනය කිරීම මෙන්ම යුද්ධයේ නීති සහ සම්ප්‍රදායික නීතියේ වෙනත් බරපතළ උල්ලංඝනය කිරීම් ද ඇතුළත් වේ.

194. මෙවැනි ක්‍රියා යුද අපරාධ ලෙස සැලකීමට සන්නද්ධ ගැටුමකට ඇති සම්බන්ධතාවය තහවුරු කළ යුතුය. මෙම සම්බන්ධතාවය අර්ථ ගැන්වෙන්නේ අපරාධය සිදු කිරීම එදිරිවාදිකම්වලට සමීපව බැඳී තිබීමෙනි. එනම් වරද සිදු කළ යුත්තේ ගැටුමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා හෝ ඊට වෙනස්ව ''හමුදා මෙහෙයුමක අවසාන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට හෝ අවම වශයෙන් හමුදා මෙහෙයුමට සමගාමීව ඊට කිසියම් ආකාරයකින් දායකවනු ඇතැයි යන අදහසින් සිදු කළ ඒවා විය යුතුය.''[120]

**මානව වර්ගයාට එරෙහි අපරාධ.**

195. සිරුරට හෝ මනසට හෝ කායික සෞඛ්‍යයට සිතාමතාම බරපතළ වේදනාවක් හෝ බරපතළ තුවාල සිදුවන ආකාරයෙන් සිවිල් ජනතාවට එරෙහිව පුළුල්ව හෝ ක්‍රමානුකූලව සිදු කරන ප්‍රහාරයක කොටසක් වන්නේ නම් එය මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස සැලකේ.

196. මානව වර්ගයාට එරෙහි අපරාධ ''සාමාන්‍යයෙන් අන්තර්ජාතික නිතිය අනුව අවසරයක් නොලැබෙන'' අපරාධවලට අදාල වන හා ලෝකයේ මූලික නෛතික පද්ධතීන්[121] පිළිගත් නිසා එවැනි අපරාධ තහවුරු කිරීම සහ අධිකරණ බලය යෙදවීම ගිවිසුම් බැඳීම්වලින් පරිබාහිරව ඇති බැඳීමකි.

197. මානව වර්ගයාට එරෙහි අපරාධයක් සිදු කිරීමට නම් සිවිල් ජනතාව ''පුළුල් හෝ ක්‍රමානුකූල'' ආකාරයෙන් ප්‍රහාරයක ඉලක්කය විය යුතුය. කොන්දේසිය වන්නේ ප්‍රහාරය මෙහෙයුමේ ඉලක්කය සපුරා ගැනීමට තරම් නොවන්නේය යන්න අදහස් කෙරෙන වියුක්ත භාවයයි. ප්‍රහාරයට ලක් වූ ජනතාව ස්වභාවයෙන් වැඩි වශයෙන්ම සිවිල් වැසියන් නම් ඔවුන් සිවිල් ජනතාව ලෙස සැලකේ. සිවිල් ජනතාව යන නිර්වචනය කිරීමට ඇතුළත් නොවන පුද්ගලයන් ඔවුන් අතර සිටීමෙන් ජනතාවගේ සිවිල් ස්වභාවය වෙනසක් නොවන්නේය.[122]

198. 'පුළුල් '' යන යෙදුමෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ ප්‍රහාරයේ සහ වින්දිතයන්ගේ සංඛ්‍යාවේ මහා පරිමාණ ස්වභාවයයි.[123]කෙසේ වුවත් ප්‍රහාරයක් ''අමානුෂික ක්‍රියා ගණනාවක සාමුහික ප්‍රතිඵලයක් හෝ සුවිශේෂී ප්‍රමාණයක අමානුෂික ක්‍රියාවක ප්‍රතිපලයක්'' පුළුල් ක්‍රියාවක් සේ සැලකිය හැකිය.[124]

---

[119] රුවන්ඩා අන්තර්ජාතික අපරාධ විනිශ්චය සභාවේ ව්‍යවස්ථාවේ 4 වගන්තිය අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ වගන්තය 8 සියාරා ලියොන් විශේෂ අධිකරණයේ ව්‍යවස්ථාවේ 3 වගන්තිය. තදික් අධිකරණ බලය පිළිබඳ අතුරු අභියාචනය සඳහා විත්තියේ මෝසම පිළිබඳ තීරණයත් බලන්න.(IT-94-1-AR 72) 1995 ඔක්තෝබර් 2 Judgement, Delactic, Mucic. Delic and Landzo ( Celebici case) IT-96-21-A 20 February 2001 para 136.

[120] Cassese, The nexus Requirement for War Crimes. J Int. Criminal Justice (2012 ) 10(5) 1395-1417, at 1397.

[121] Elements of Crime of the Rome statute of the International Criminal Court, Art, 7

[122] නඩු තීන්දුව නලෙටිලික් සහ මාර්ටිනොවික් (IT-98-34) විනිශ්චය උසාවිය, 2003 මාර්තු 31 par235, අකෙයෙසු නඩු තීන්දුව (ICTR-96-4) විනිශ්චය උසාවිය 2 සැප්තැම්බර් 1998 ඡේද 582, තීන්දුව Jelisic (IT-95-10-T) විනිශ්චය උසාවිය 14 දෙසැම්බර් 1999 fþo 54

[123] ඔමාර් හසන් අහ්මඩ් අල් බෂර් අත් අඩංගුවට ගැනීමේ නියෝගය පූර්ව විනිශ්චය උසාවිය 1 ICC 02/05-01/09, 4 මාර්තු 2009 ඡේදය 81 කටන්ගා, සැප්තැම්බර් 30, 2008 ඡේද 394-397

[124] Judgement *Blaškić* (IT-95- 14) විනිශ්චය උසාවිය මාර්තු 3 2000, ඡේද 206 නඩු තීන්දුව, කර්ඩික් සහ සර්කෙස් (IT-95-14/2-T) විනිශ්චය උසාවිය පෙබරවාරි 26, 2001 ඡේද 179, නඩු තීන්දුව කර්ඩික් සහ සර්කෙස් (IT-95-14/2-A) අභියාචනා උසාවිය, 17 දෙසැම්බර් 2004 ඡේද 94.

199. 'ක්‍රමානුකූල' ප්‍රහාරයක් යන සංකල්පයෙන් අදහස් කරන්නේ ප්‍රචණ්ඩ ක්‍රියාවක සංවිධිත ස්වභාවය සහ අහම්බෙන් සිදුවිය නොහැකි බවය.[125] මෙය මූලික වශයෙන් විධිමත් රටාවකට පසුව සමාන අපරාධයක් අහම්බයක් නොවන ආකාරයට නැවත සිදුවීමකින් පිළිබිඹු විය හැකිය.[126]

**ජනඝාතන**

200. ශ්‍රී ලංකාව 1948 ජන ඝාතන වැළැක්වීම සහ ඊට දඬුවම් දීම පිළිබඳ සන්ධානයේ පාර්ශ්වයකි. සන්ධානයට අත්සන් තැබූවන් ජන ඝාතන පිළිබඳව වැරදිකරුවන් වූ පුද්ගලයන්ට ප්‍රබල දඬුවම් ලබා දීම සඳහා අවශ්‍ය කරන ව්‍යවස්ථා පැනවීම ඇතුළත්ව සන්ධානය ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගත් පියවර ගණනාවක් ගත යුතුය.[127] ජන ඝාතන පිළිබඳ චෝදනා ලත් පුද්ගලයන් ''විනිශ්චය කළ යුත්තේ එවැනි ක්‍රියාවක් සිදු කළ ප්‍රදේශයේ රාජ්‍යයේ නිසි විනිශ්චය සභාවක් විසින් හෝ අධිකරණ බලය තිබිය හැකි එවැනි අන්තර්ජාතික දණ්ඩන විනිශ්චය සභාවක් විසිනි.[128]

201. සන්ධානය මෙන්ම අදාල වන අන්තර්ජාතික සම්ප්‍රදායික නියමයන් ජන ඝාතන අපරාධය නිර්වචනය කරන්නේ සුවිශේෂී විෂය මූලික සහ මනෝ මූලික ලක්ෂණ අවශ්‍ය වන්නක් සේය.

202. විෂය මූලික ලක්ෂණය දෙයාකාරයඃ පළමු වැන්න තහනම් කරන ලද ක්‍රියාව (actus reus) සම්බන්ධ වරද පහත සඳහන් ආකාරයෙන් විය යුතුයඃ (අ) මරා දැමීම (ආ) බරපතළ ශාරීරික හෝ මානසික හානි සිදු කිරීම (ඇ) කණ්ඩායමක් භෞතිකව විනාශ කිරීම අරමුණු කර ගත් පියවර ගැනීම (ඈ) කණ්ඩායම තුළ උපත් ඇතිවීම වැළැක්වීම අදහස් කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (ඉ) එම කණ්ඩායමේ ළමයින් බලහත්කාරයෙන් වෙනත් කණ්ඩායමකට පැවරීම[129] යනුවෙනි. දෙවන විෂය මූලික ලක්ෂණය වන්නේ තහනම් කරන ලද ක්‍රියාවෙන් ඉලක්ක කර ගත් කණ්ඩායම ජාතික, වාර්ගික, ජන වංශික හෝ ආගමික කණ්ඩායමක් විය යුතුය යන්නයි.

203. එමෙන්ම මනෝ මූලික ලක්ෂණය ද දෙයාකාරය. විශේෂකර දක්වන අපරාධය කිරීමේ අදහසට අමතරව ඉලක්ක කර ගත් කණ්ඩායම සමස්තයක් වශයෙන් හෝ එහි කොටසක් විනාශ කිරීමේ අරමුණ තිබිය යුතුය.

**වධ හිංසා පැමිණවීම**

204. වධ හිංසා සහ වෙනත් කුරිරු අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම් පැමිණවීමට එරෙහි අන්තර්ජාතික සන්ධානයේ ( CAT) සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ ( ICCPR) දක්වන ලද වෙනත් කරුණු අතර මෙන්ම අන්තර්ජාතික නීතියේ වධ හිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම්දීම ඒකාන්තව සහ අනිවාර්යෙන් තහනම් කිරීමත් ඇතුළත් ය.[130]වධ හිංසා

---

[125] ඔමාර් හසන් අහ්මඩ් අත් අඩංගුවට ගැනීමේ නියෝගය I- ICC – 02/05-01/09, 4 මාර්තු 2009 ඡේද 81 Prosecutorv ජර්මේන් කටන්ගා සහ මැතියු න්ගුඩ්ජොලො, චෝදනා තහවුරු කිරීමේ තීරණය පූර්ව විනිශ්චය උසාවිය,I, ICC-01/04/01-07, 30 සැප්තැම්බර් 2008 ඡේද 194-197

[126] ඔමාර් හසන් අහ්මඩ් අත් අඩංගුවට ගැනීමේ නියෝගය I- ICC – 02/05-01/09, 4 මාර්තු 2009 ඡේද 81 චෝදනා තහවුරු කිරීමේ තීන්දුව කටන්ගා ඡේද 394- 398

[127] ජන ඝාතන වැළැක්වීම සහ දඬුවම් කිරීම පිළිබඳ සන්ධානය වගන්තියV

[128] ජන ඝාතන වැළැක්වීම සහ දඬුවම් කිරීම පිළිබඳ සන්ධානය වගන්තිය VI

[129] ජන ඝාතන වැළැක්වීම සහ දඬුවම් කිරීම පිළිබඳ සන්ධානය වගන්තිය II

[130] ඊට ශ්‍රී ලංකාව පිළිවෙලින් 1980 දී සහ 1994 දී අත්සන් කර ඇත.

පැමිණවීමෙන් නිදහස්වීමේ අයිතිය කුමන තත්වයක් යටතේ හෝ සීමා කිරීමට හෝ ලඝු කිරීමට නොහැකිය.[131]

205. CAT සන්ධානය වධ හිංසා පැමිණවීම අන්තර්ජාතික නිතිය යටතේ[132] අභිමතික අපරාධයක් ලෙස නිර්වචනය කරන්නේ මෙසේය:

1) කායික හෝ මානසික දැඩි වේදනාව හෝ පීඩාව සිතා මතාම ඇති කිරීම,

2) කිසියම් නිශ්චිත අරමුණක් සඳහා තොරතුරු හෝ පාපෝච්චාරණයක් ලබා ගැනීම සඳහා හෝ දඬුවමක් වශයෙන් හෝ බිය වැද්දීමට හෝ බල කිරීමට හෝ කිසියම් ආකාරයක වෙනස් කොට සැලකීම

3) රාජ්‍ය නිලධාරියෙකුගේ හෝ නිල මට්ටමෙන් ක්‍රියාකරන වෙනත් පුද්ගලයෙකුගේ හෝ පෙළඹවීම ඇතිව හෝ එකඟතාවය හෝ අනුමැතිය ඇතිව[133]

අන්තර්ජාතික මානුෂීය නීතිය එදිරිවාදිකම්වලට සම්බන්ධයක් නැති හෝ තව දුරටත් එවැනි ක්‍රියාවල යෙදෙන්නේ නැති පුද්ගලයන්ට වධ හිංසා පැමිණවීම හෝ කුරිරු ලෙස සැලකීම පැහැදිලිවම තහනම් කරයි.[134]ගැටුම හා සම්බන්ධයක් තහවුරු කරන්නේ නම් හා එවැනි ක්‍රියා සන්නද්ධ ගැටුමක් සමයේ දී සිදු කරන්නේ නම් යුද අපරාධයක් විය හැකිය. වෙන් වශයෙන් සිවිල් ජනතාවට එරෙහිව එල්ල කරන පුළුල් හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් ලෙස සිදු කරන්නේ නම් මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස ගිණිය හැකිය.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්**

206. ශ්‍රී ලංකාව බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීමේ අන්තර්ජාතික සන්ධානයෙ[135] පාර්ශ්වයක් නොවන නමුත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ පාර්ශ්වයකි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් එහි ප්‍රතිපාදන උල්ලංඝනය වේ.

---

[131] සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානය 4(2) වගන්තිය, වධ හිංසා සහ වෙනත් ආකාරයේ කුරිරු අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි සන්ධානය වගන්ති 2(2)

[132] වධ හිංසාව සන්නද්ධ ගැටුමක දී සිදු කරන්නේ නම් යුද අපරාධයක් ලෙස සැලකිය හැකිය. එමෙන්ම සිවිල් ජනතාවට එරෙහිව පුළුල්ව සහ ක්‍රමානුකූලව සිදු කරන ප්‍රහාරයක කොටසක් වශයෙන් සිදු කරන්නේ නම් මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස ගිණිය හැකිය. වධ හිංසා පැමිණවීමක් යුද අපරාධයක් හෝ මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස වර්ග කිරීමට රාජ්‍ය නිලධාරයෙකුගේ හෝ නිල මට්ටමෙන් ක්‍රියා කරන වෙනත් පුද්ගලයෙකුගේ පෙළඹවීම මත හෝ අනුමැතිය ඇතිව හෝ දැනුවත්කම ඇතිව හෝ සිදු කළ බව දැක්වීම අවශ්‍යතාවයක් නොවේ.

[133] වධ හිංසා සහ අනෙකුත් අමානුෂික, හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම් දීමට එරෙහි සන්ධානයේ වගන්ති 1.1

[134] ජිනීවා සන්ධානයේ පොදු වගන්තිය 3.

[135] සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරිමෙන් ආරක්ෂා කිරීමේ අන්තර්ජාතික සන්ධානයේ 2 වගන්තියේ අතුරුදහන් කිරීම නිර්වචනය කර ඇත්තේ මෙසේය: (1) රජයේ නියෝජිතයන් හෝ රජයේ අධිකාරිය, සහාය හෝ දැනුම ඇතිව ක්‍රියා කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් (2) අත් අඩංගුවට ගැනීම, රඳවා ගැනිම, පැහැර ගෙන යෑම හෝ වෙනත් ආකාරයක නිදහස අහිමි කිරිම මගින් (3) එවැනි පුද්ගලයෙකු නීතියේ රැකවරණයෙන් බැහැර කොට තැබීම සඳහා අතුරුදහන් කළ පුද්ගලයා ගේ නිදහස අහිමි කිරීම හෝ ඔහුගේ ඉරණම හෝ සිටින තැන සැඟවීම සඳහා එය පිළිනොගැනීම.

207. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ නොයෙකුත් අයිතිවාසිකම් නොඩවාම උල්ලංඝනය කිරීම් පෙන්නුම් කරන සුවිශේෂී සහ සංයුක්ත ක්‍රියා දාමයක් වේ. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, ඉන් පීඩාවට පත් පුද්ගලයන් නීතියේ රැකවරණයෙන් පරිබාහිරව තබන නිසාත් ඔවුන් සහ ඔවුන්ගේ පවුල් දැඩි පීඩාවකට පත් කරන නිසාත් මානව ගරුත්වයට එරෙහිව කෙරෙන වරදක් ලෙස සැලකේ.[136] බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට, වෙනත් කරුණු අතර නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීමේ අයිතිය, වධ හිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට ලක් නොවී සිටීමේ අයිතිය, පුද්ගල නිදහසට සහ ආරක්ෂාවට ඇති අයිතිය සහ රඳවා ගැනීමේ නීත්‍යානුකූල භාවය පරීක්ෂා කිරීමට වහාම විනිශ්චයකරුවෙකු හෝ වෙනත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීමේ අයිතිය ඇතුළත් හිතුවක්කාර ලෙස රඳවා ගැනීමෙන් නිදහස, පෞද්ගලික රහස්‍ය භාවය, පවුල, නිවස සහ ලිපි ගනුදෙනු, මෙන්ම සමහර අවස්ථාවල ජීවිතයට ඇති අයිතිය හෝ ජීවිතයට ඇති අයිතිය ආරක්ෂා කිරීමට රජයේ ඇති බැඳීම රැක ගැනීමට අපොහොසත්වීම පවා මානව අයිතිවාසිකම් විවිධාකාරයෙන් උල්ලංඝනය කිරීම්වලට ඇතුළත් විය හැකිය. [137]

208. සම්ප්‍රදායික අන්තර්ජාතික නීතිය අනුව, රාජ්‍යයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් නොකරන බව, ඊට ඉඩ නොදෙන බව සහ එය නොඉවසන බව සහතික කිරීම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සාපරාධී වරදක් බවට පත් කිරීම ඇතුළත් තම අධිකරණ බල ප්‍රදේශයේ කිසියම් තැනක බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීමට සහ අවසන් කිරීමට ප්‍රබල ව්‍යවස්ථා, පරිපාලන, අධිකරණ හෝ වෙනත් පියවර ගත යුතුයැයි දක්වයි.[138]

2 වන කොටස

# VI නීති විරෝධී මිනිස් ඝාතන

## හැඳින්වීම

209. මෙම පරිච්ඡේදයෙන් 2002 සිට 2011[13911] දක්වා කාලය තුළ දෙපාර්ශ්වය විසින් මෙන්ම ආරක්ෂක හමුදාවලට සම්බන්ධිත අතුරු හමුදා විසින් සිදු කරන ලදැයි කියන මිනිස් ඝාතන පුළුල් රටාව ලේඛන ගත කෙරේ. මෙම සමහර මිනී මැරුම් සිදුව ඇත්තේ නීති විරෝධී අත් අඩංගුවට ගැනීමෙන් හෝ පැහැර ගෙන යෑමෙන් පසුවය. තවත් ඒවා නීතියෙන් පරිබාහිරව කරන ලද මිනී මැරුම් හෝ ඝාතනයි. මෙම කාලය තුළදී එල්ටිටීඊය විසින් සිදු කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර නැවතත් ඇරඹිණ. එල්ටිටීඊය හා යුද හමුදාව යන දෙපාර්ශ්වයම ක්ලේමෝර් බෝම්බවලින් සිදු කරන ලද නීති විරෝධි මිනිස් ඝාතන ගැන වගකිව යුතුයැයි පැවසේ. මෙම කොටසේ දැක්වෙන සිද්ධීන් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය, විශේෂයෙන්ම ජීවිතයට ඇති අයිතිය පිළිබඳ ආකෘති රාමුවේ සිට විග්‍රහ කරනු ඇත.

210. සන්නද්ධ ගැටුමට හා සම්බන්ධ සිද්ධීන් වලදී ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය අදාල ගිවිසුම් නියමයන් හා සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නීතිය හා සසඳනු ඇත. ඊට විශේෂයෙන්ම ජීවිතයට හිංසා කිරීම තහනම් කෙරෙන 1949 හතරවැනි ජිනීවා සන්ධානයේ 3 වැනි පොදු වගන්තිය ඇතුළත් වේ. ඉන් විශේෂයෙන්ම එදිරිවාදිකම්වලට ඍජුවම සහභාගිවන පුද්ගලයන් සහ රඳවා ගත් සහ තුවාල ලත් සටන්කරුවන් මැරීම එදිරිවාදිකම්වලට අදාල සම්ප්‍රදායික නියමයන් හා සසඳා බලනු ඇත. එනම් සිවිල් ජනතාවට සහ සිවිල් ජනතාවගේ ස්ථානවලට

---

[136] Declaration on the Protection of all persons from Enforced disappearances A/RES/47/133, 18 December 1992 Article I

[137] බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිවිල් ජනතාවට එරෙහි ප්‍රහාරයක් ලෙස පුළුල්ව සහ ක්‍රමානුකූලව සිදු කරන්නේනම් මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස ගිණිය හැකිය. වැඩි දුරටත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ලක්ෂණ දේශීය නීතිය හා සමහර අවස්ථාවන්හි අන්තර්ජාතික නීතිය යන දෙකම යටතේ අබාධිත පෙනී සිටීම (Freestanding) අපරාධයක් ලෙස අභිචෝදනා ඉදිරිපත් කළ හැකිය.

[138] Declaration on the Protection of all persons from Enforced disappearances Articles 2-4

[139] මෙම පරිච්ඡේදයෙන් එදිරිවාදිකම් පැවැත්වීමේ දි වෙනත් වාතාවරණයන් යටතේ සිදු වූ ඝාතන හෝ මරණ ආවරණය වන්නේ නැත. ඒවා වෙනම පරිච්ඡේදයක මෙන්ම එහා මෙහා යෑම සීමා කිරීම පිළිබඳ පරිච්ඡේදයේ විස්තර කර ඇත.

ගැටුමේ පාර්ශ්වයන් විසින් ඍජු ප්‍රහාර එල්ල කිරීම  තහනම් කිරීම පිළිබඳ වෙන් කොට හඳුනා ගැනීමේ මූලධර්මය යි.

211. මෙම කොටසින් ගැටුමේ අවසාන අදියරේ දී විශේෂයෙන්ම දෙමළ ස්ත්‍රීන්ගේ ලිංගික අවයවයන් ඡේදනය කිරීම සහ කෙලසීම පිළිබඳ චෝදනා විමර්ශනය කෙරේ.

212. අපරාධ පිළිබඳ සාමාන්‍ය සැකකරුවන් අත් අඩංගුවේ දි මිය යෑම මෙම විමර්ශනයෙන් ආවරණය නොවන නමුත් නීතියෙන් පරිබාහිරව, කෙටි විභාගයකින්, හෝ හිතුවක්කාර ලෙස සිදු කරන ඝාතන පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක ඔහුගේ 2006 වාර්තාවේ පොලිස් අත් අඩංගුවේ දී මිය යෑමේ රටාව සහ සාමාන්‍යයෙන් වධ හිංසා පැමිණවීම අතර ඇති සම්බන්ධතාවයක් සඳහන් කර තිබීම වැදගත්ය.[140]

213. නිරීක්ෂණයට ලක් වූ කාල සීමාව තුළ සිදු වූයේයැයි කියන නීති විරෝධී ඝාතන සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය  අවධානය යොමු කෙළේ ජනමාධ්‍යවේදීන්, මානුෂීය සේවකයන් සහ දේශපාලකයන් මෙන්ම මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයන් වැනි පීඩාවට පත් සමහර කණ්ඩායම් නියෝජනය කරන සමහර සංකේතාත්මක සිද්ධීන් ගැන පමණි. මෙම කොටසේ දැක්වෙන සංකේතාත්මක සිද්ධීන් ගණනාවක් වගවීමට ඇති සමහර ප්‍රධාන බාධකයන් දැක්වෙන, විමර්ශනය කිරීමට ඇති හෝ දැනට විමර්ශනය කෙරෙමින් පවතින සිද්ධීන් ය.

214. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සිය විමර්ශනයේ දි සිදු වූයේයැයි කියන මිනි මැරුම් වූ අවස්ථාවේ හෝ ඉන් මද වේලාවකට පසුව එම ස්ථානයට පැමිණි ඇසින් දුටු සාක්ෂිකරුවන් සහ ඉන් පසුව ඇති වූ තත්වයන් ගැන කතා කළ වින්දිතයන්ගේ ඥාතීන් සමග සාකච්ඡා කෙළේය. නීතියෙන් පරිබාහිරව කෙටි විභාගයකින් සහ හිතුවක්කාර ඝාතන ( 2005, 2008, 2011)[141] වැනි විශේෂ වාර්තාකරුවන් සහ වධ හිංසා (2007)[142] ගැන විශේෂ වාර්තාකරුවන් වැනි අයගේ වාර්තා සහ ශ්‍රී ලංකා නිරීක්ෂණ කණ්ඩායම, (SLMM) එල්ටීටීඊය, ආණ්ඩුවේ හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම් විසින් සිදු කරන ලදැයි කියන මිනී මැරුම් රටාව සහ සිද්ධීන් සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සපයයි. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ඡායාරූප මෙන්ම වින්දිතයන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ද ලැබිණ. මෙම කොමිටිය 2005 අගෝස්තු 1 වැනි දා සිට සිදු වූයේයැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කොට විභාග කිරීමට පත් කරන ලද ජනාධිපති කොමිසමේ ප්‍රකාශයට පත් නොකළ වාර්තාව නිරීක්ෂණය කෙළේය. එම කොමිසමේ සභාපති ගේ නමින්, එනම් උදලාගම කොමිසම යනුවෙන් එය හැඳින්වෙන අතර ඔවුන් ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීමට පත් කරන ලද අන්තර්ජාතික විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායමේ (IIGEP) වාර්තාවද මෙම කොමිටියේ නිරීක්ෂණයට ලක් විය.

215. 2009 දී සන්නද්ධ ගැටුම අවසන් වීමෙන් පසුව යුද්ධයේ අවසන් අදියර දැක්වෙන සිත් කම්පා කරන විඩියෝ සහ ඡායාරූප එළිදැකීමට පටන් ගෙන ඇත. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ඡායාරූප සහ වීඩියෝ විශාල ප්‍රමාණයක් ලැබුණ අතර ඒ බොහොමයක් මහජනයාට ලබා ගත නොහැකි ඒවාය. මෙම කොමිටිය ඒවා අධිකරණ වෛද්‍ය විශේෂඥයෙකුගේ සහාය ඇතිව පරික්ෂාවට ලක් කෙළේය. 2011 මානව අයිතිවාසිකම් කවුන්සලයේ 17 වැනි සැසි වාරයට එක්සත් ජාතීන්ගේ නීතියෙන් පරිබාහිරව, කෙටි විභාගයකින් හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරු ක්‍රිස්ටොෆ් හෙයින්ස් ඉදිරිපත් කළ, නීතියට පරිබාහිරව කරන ලද සමහර ඝාතන දැක්වෙන වීඩියෝ පටවල නිරවද්‍යතාවය පිළිබඳ තාක්ෂණ වාර්තාව ද අවධානයට ලක් විය.[143]

---

[140] පිලිප් ඇල්ස්ටන්, ඇමිණුම ශ්‍රී ලංකා දූත මෙහෙය ( 2005 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 6 දක්වා) නීතියෙන් පරිබාහිර නඩු විභාගයන් නොමැතිව හෝ හිතුවක්කාර මිනි මැරුම්, 2006 මාර්තු 27. E/CN 4/2006/53/Add 5

[141] Op cit A/HRC/8/3/(2008) A/HRC/17/28/Add 1 (June 2011)

[142] A/HRC/7/3/Add 1

[143] A/HRC17/28/Add.

**නීති විරෝධී මිනී මැරුම් රටාව 2002 - 2011 -**

216. පොලිසිය, යුද හමුදාව සහ නාවික හමුදාව ඇතුළු ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊය සිදු කරන ලද නීති විරෝධී මිනි මැරුම්, නිරීක්ෂණයට ලක්වෙන කාල සීමාවට පෙර සිටත් 2009 දක්වාත් ඉන් පසුවත් වාර්තාවන අතර ආරක්ෂක හමුදා සිදු කරන ලදැයි සැලකෙන සමහර මිනී මැරීම් ගැටුම අවසන් වීමෙන් පසුව ද වාර්තා විය. මෙම කොමිටියේ මැන්ඩේට් බලය පවතින කාල සීමාව ඇතුළත කරන ලදැයි සැලකෙන මරණ සංඛ්‍යාව ගැන නිවැරදි සහ විශ්වාස කළ හැකි දත්ත ලබා ගත නොහැකිය. ශ්‍රී ලංකාවට පැමිණි නීතියෙන් පරිබාහිරව, විභාගයක් නැතිව හෝ හිතුවක්කාරව කෙරෙන ඝාතන සහ වධ හිංසා පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු දඬුවම් ලැබීමක් කිසිසේත්ම නැතිව ජීවිතයට ඇති අයිතිය නොකඩවාම උල්ලංඝනය කිරීමේ කණගාටුදායක රටාව ගැන සිය වාර්තාවල සඳහන් කළහ. ඊට අමතරව සිවිල් සමාජ සංවිධාන සහ අන්තර්ජාතික රා.නො. සංවිධාන එවැනි සිද්ධීන් සිය ගණනක් ලේඛන ගත කර වාර්තා කර ඇත. SLMM දූත මෙහෙය සටන් විරාමය යටතට ගැනෙන මිනී මැරුම් ගණනාවක් ගැන විභාග කර සිය නිගමන දක්වා ඇත.[144] ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු අනුව SLMM දූත මෙහෙය ක්‍රියාත්මක වූ 2002 සහ 2008 මුල භාගය දක්වා කාලය ඇතුළත ඊට වාර්තා වූ ඝාතනය කිරීම්යැයි සඳහන් සිද්ධීන් දහසකට වඩා පැවති බව දක්වේ. මිනි මැරුම් නතර කරන ලෙස එම දූත මෙහෙය නැවත නැවතත් එම පාර්ශ්වයන්ගෙන් ඉල්ලීම් කර ඇත.[145]

217. ලැබී ඇති තොරතුරු අනුව එවැනි මිනි මැරුම්වල පරිමාණය කලින් කලට වෙනස්ව ඇත. සටන් විරාමයේ මුල් කාල පරිච්ඡේදය තුළ මුළු රටෙන්ම වාර්තා වූයේ එවැනි සිද්ධීන් සුලු ප්‍රමාණයක් පමණි. කෙසේ වුවත් 2004 සිට විශේෂයෙන්ම 2005 අග කාලයේ දේශපාලන චරිත, මානුෂීය සේවකයන් සහ ජනමාධ්‍යවේදීන් ඉලක්ක කර ගත් ඝාතන සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. නීතියෙන් පරිබාහිර ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරු පිලිප් ඇල්ස්ටන් 2005 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 6 දක්වා කළ ඔහුගේ ශ්‍රී ලංකා සංචාරයේ  වාර්තාවේ මෙසේ සඳහන් කරයි. නීති විරෝධි මිනි මැරුම් ''ගැටුම උග්‍ර කරවීමට හේතු වූ සුවිශේෂ කරුණකි.''[146] ''ඉතාමත් විශ්වාස කටයුතු ගණන් බැලීම් අනුව 2005 වර්ෂයේ දී පමණක් සිදු කර ඇති දේශපාලන මිනී මැරුම් සංඛ්‍යාව 300 ට වඩා වැඩියැයි ඔහු වාර්තා කර ඇත.[147]මෙම මිනී මැරුම් බොහොමයක් ගැන සාර්ථක විමර්ශන සිදුව නැති බවත් දඬුවම් නියමකර ඇත්තේ ඉතාමත් සුළු කොටසකට පමණක් බවත් ඔහු වාර්තා කරයි.[148]

218. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් මෙන්ම (උතුරු පළාතේ කලක සිට ක්‍රියාත්මක වූ ඊපීඩීපී වැනි අතුරු හමුදා කණ්ඩායම් සමග) 2004 අප්‍රේල් සිට නැගෙනහිර පළාතේ කරුණා කණ්ඩායම බිහිවීමත් සමග විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල නිති විරෝධී මිනී මැරුම්වල පරිමාණය සහ ස්වභාවය වෙනස් විය. නැගෙනහිර කරුණාගේ වෙන්ව යෑමත් සමග

---

[144] විශේෂයෙන්ම හමුදා මෙහෙයුම් පිලිබඳ 1.2 වගන්තිය සහ සිවිල් ජනතාවට එරෙහි සතුරු ක්‍රියා පිළිබඳ 2.1 වගන්තිය ''1.2 එකද පාර්ශ්වයක් ප්‍රහාරාත්මක හමුදා මෙහෙයුමක නොයෙදිය යුතුයඃ ඒ සඳහා පහත සඳහන් ක්‍රියා වැනි, එහෙත් ඒවාටම සීමා විය යුතු නොවන, සියලු හමුදා මෙහෙයුම් සම්පූර්ණයෙන්ම නතර කළ යුතුය. අ) සිවිල් ජනතාවට හෝ හමුදා දේපොළ වලට ඍජුව හෝ වක්‍රව ගිනි අවි යොදා ගැනීම, අවි රැගෙන කඩා වැදීම්, සැඟව සිට පහරදීම්, ඝාතන, පැහැර ගෙන යෑම්, විනාශ කිරීම. කඩාකප්පල්කාරී ක්‍රියා, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සහ දුර දිග විහිදුම් ඒකක මගින් සිදු කරන ඈත ප්‍රදේශවලට කඩා වැදීම්. ආ) ගුවනින් බෝම්බ දැමීම, ඇ) ප්‍රහාරාත්මක නාවික මෙහෙයුම්. 2.1 පාර්ශ්වයන් ජාත්‍යන්තර නීතියට අනුකූලව සිවිල් ජනතාවට එරෙහිව, වධහිංසා පැමිණවීම, බියවැද්දීම, පැහැර ගැනීම, කප්පන් ගැනීම සහ හිරිහැර කිරීම ඇතුළත් සතුරු ක්‍රියාවලින් වැළකී සිටිය යුතුය.''

[145] පිටුව 105 SLMM අවසාන වාර්තාව. SLMM පුවත් නිවේදන. නිදසුනක් වශයෙන් 2004 මැයි , 2005 මාර්තු සහ 2005 අප්‍රේල් SLMM අවසාන වර්තාවේ උපුටා දක්වා ඇත.

[146] E/CN 4/2006/53/Add 5, March 2006. Extrajudicial summary or arbitrary executions. Report of the Special Rapporteur Philip Alston Addendum, Mission to Sri Lanka ( 28 November to 6 December 2005)

[147] E/CN 4/2006/53/Add.5.Op cit.

[148] E/CN 4/2006/53/Add.5.Op cit.

ඇති වූ ඝාතනවල කුරිරු භාවය නිසාම සාමාන්‍ය ජනතාව තුළ සටන් විරාමය ආරම්භ වීමත් සමග දක්නට නොතිබූ ආකාරයේ බියක් ඇති වූයේයැයි නිරීක්ෂකයෝ සඳහන් කරති.[149] ''බොහෝ දෙනා තුළ විශේෂයෙන්ම දෙමළ සහ මුස්ලිම් ජනතාව තුළ ප්‍රකාශ කිරීම, එහා මෙහා යෑම සහ පොදු කටයුතුවලට සහභාගිවීමේ නිදහස භුක්ති විඳීමේ දී ප්‍රබල මරණ තර්ජනයක් පැවති බව නීතියෙන් පරිබාහිරව සිදු කරන ඝාතන පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක ද සඳහන් කරයි.

219. හමුදාව, අතුරු හමුදා සහ එල්ටීටීඊය මෙම කාල සීමාවේදී මෙහෙයුම් කළ ආකාරයේ සහ අනුගමනය කළ ක්‍රියා පටිපාටියේ පැවති සමානත්වය නිසා නීති විරෝධී සමහර මිනී මැරුම් පිළිබඳ වගකීම තීරණය කිරීම අපහසුය. විමර්ශන කටයුතු සිදු නොවීම හෝ ඒවායේ අඩුපාඩු වලින් පෙනී යන්නේ අපරාධකරුවන් සාමාන්‍යයෙන් හඳුනා ගෙන නැති බවය. සමහර විට විමර්ශන පටන් ගත් නමුත් තොරතුරු ලබා දීමට සාක්ෂිකරුවෝ බිය වූහ. සන්නද්ධ ගැටුමේ පාර්ශ්වයන් දෙකම බොහෝ විට එකිනෙකාට චෝදනා කළහ. එසේ වුවත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබුණු තොරතුරු අනුව බොහෝ ඝාතනවලට ආරක්ෂක හමුදා, ඊට සම්බන්ධිත අතුරු හමුදා කණ්ඩායම් සහ එල්ටීටීඊය ඍජුවම සම්බන්ධ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී.

220. මෙම කාල පරිච්ඡේදයේ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ එල්ටීටීඊය සහ ඉන් බිඳී ගිය විවිධ කණ්ඩායම් අතර සාමාජිකයන්, අනුගාමිකයන් හෝ තොරතුරු ලබා දෙන්නන්යැයි සැක කරන පුද්ගලයන් පලි ගැනීමට ඝාතනය කිරීමය.[150] ''නැගෙනහිර සාමාන්‍ය ජනතාවගෙන් බොහෝ දෙනෙක් එල්ටීටීඊය සහ කරුණා කණ්ඩායම අතර පැවති අඩු තීව්‍රතාවයෙන් යුත් ගැටුමේ ප්‍රතිඵලයක් ලෙය ඝාතනය'' කර ඇතැයි නීතියෙක් පරිබාහිර මිනිස් ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරු තම වාර්තාවෙන් පෙන්වා දී ඇත.[151]

221. එල්ටීටීඊය ආරක්ෂක හමුදා සහ කරුණා කණ්ඩායම සමග සහයෝගයෙන් කටයුතු කරන්නේ යැයි විශ්වාස කළ පුද්ගලයන් මෙන්ම දේශපාලකයන්, රාජ්‍ය නිලධාරින්, ශාස්ත්‍රඥයන් සහ මධ්‍යස්ථයැයි අදහස් කළ පුද්ගලයන් මරා දමා ඇත.[152] ''එල්ටීටීඊය දෙමළ ප්‍රජාව තුළ තම දේශපාලන විරුද්ධවාදීන් 'ද්‍රෝහීන්' ලෙස වර්ග කිරීමත්, මරා දැමීමෙන් අනෙකුත් අයගේ අවනත භාවය ලබා ගැනීමේ උත්සාහයත් මානව අයිතිවාසිකම් මූලික වශයෙන් උල්ලංඝනය කිරීමක් බව විශේෂ සම්බන්ධීකාරක ඔහුගේ 2006 වාර්තාවේ සඳහන් කරයි.[153]

222. මූලික වශයෙන් එල්ටිටීඊයේ බුද්ධි අංශයේ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් 'පිස්තෝල කල්ලිය' මෙවැනි මිනී මැරුම් සඳහා යොදා ගැනීම එල්ටිටීඊ උපාය මාර්ගයකි. ( IV පරිච්ඡෙදය බලන්න) ඔවුන් යොදා ගත්තේ පොලිස්, හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් සහ දෙමළ තොරතුරු ලබා දෙන්නන් සහ විරුද්ධ දෙමළ කණ්ඩායම්වල සාමාජිකයන් මැරීම සඳහා ය.[154] එවැනි ඝාතන බොහෝ විට සිදු කරන ලද්දේ මෝටර් සයිකලයකින් යන පුද්ගලයන් දෙදෙනෙකු විසිනි.

---

[149] SLMM documentation

[150] A/HRC/8/3Add 3 (2008) Special Rapporteur on Extrajudicial summary or arbitrary executions. Follow-up report p.99. ඉලක්ක කර ගත් පුද්ගලයන් මැරීම සඳහා කරන රහසිගත හමුදා මෙහෙයුම් හමුදාවේ සහාය ලබන සන්නද්ධ කණ්ඩායම් සහ එල්ටිටීඊ බුද්ධි අංශය අතර කෙරෙන 'සැඟව කරන යුද්ධයකි.' මෙය බුද්ධි අංශයේ ක්‍රියාකාරීන් පලි ගැනීමේ යුද්ධයක පෙරමුණේ සිටින විට ගැටුම් පවතින ප්‍රදේශය පුරාම වැඩි වෙමින් පවතින රටාවකි.

[151] E/CN 4/2006/53/Add.5.Op cit

[152] Humanitarian Operations Financial Analysis, MOD Op cit

[153] 153 E/CN 4/2006/53/Add.5.Op cit. නීතියෙන් පරිබාහිරව, නඩු විභාගයක් නැතිව හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක මෙසේ සඳහන් කරයිඃ ''අහිංසක සිවිල් ජනතාව භීෂණයට පත් කිරීම සහ සිදුවෙමින් පවතින ඝාතන වලට අරමුදල් ලබා දීමේ ප්‍රමාණය නිසා ඩයස්පෝරාව වෙසෙන රාජ්‍යවල ආණ්ඩු මෙම වාර්තාවේ සොයා ගැනීම් සහ මානව අයිතිවාසිකම් ගරු කිරීම ප්‍රවර්ධනය සඳහා ඔවුන්ට ඇති අවස්ථාව ගැන ඩයස්පෝරාව සමග බරපතළ සංවාදයකට සමග එළඹිය යුතුය.''

[154] SLMM Documentation, EPRLF, TELO, EPDP සහ PLOTE තරගකාරී දෙමළ සංවිධානවලට ඇතුළත වේ.

සයිකලයේ පිටුපස යන තැනැත්තා වෙඩි තැබීම සිදු කර පලා යයි. ආරක්ෂක සහ අතුරු හමුදා සාමාජිකයන් ද අනුගමනය කෙළේ මෙවැනිම උපාය මාර්ගයකි. මෙම ඝාතන මහ දවල් ප්‍රසිද්ධියේම සිදු කරන නමුත් ඝාතකයන් හඳුනා ගැනීමට හෝ ඔවුන්ගේ තොරතුරු පොලීසියට, SLMM දූත මෙහෙයට හෝ වෙනත් අයට ලබා දීමට සිද්ධිය ඇසින් දුටුවන් ඉදිරිපත් වන්නේ නැත. මෙම පිස්තෝල කල්ලියේ සාමාජිකයන් එල්ටීටීඊ පාලන ප්‍රදේශ තුළදීම එල්ටීටීඊ නායකයන් කීප දෙනෙකු මරා දැමූ හමුදාවේ දුර දිග මෙහෙයුම් සංචාරක කණ්ඩායම්වලට තොරතුරු ලබා දුන්නේයැයි සැක කරන දෙමළ වාර්ගිකයන් මරා දමා ඇත. [155]

223. එල්ටීටීඊයේ තවත් සුවිශේෂී සහ හැම විටම ප්‍රතික්ෂේප කළ උපක්‍රමයක් වූයේ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරීම ය. මෙය සටන් විරාමයට පෙර පුළුල්ව සිදු වූ නමුත් ඉන් පසුව නතරව තිබී නැවත 2005 සිට 2009 දක්වා නැවතත් එම ප්‍රහාර එල්ල කෙරිණ. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ කාල පරිච්ඡේදයට අයත් සීමාවේ මෙවැනි ප්‍රහාර වැඩි වශයෙන්ම එල්ල වූයේ ආරක්ෂක හමුදා සාමාජිකයන්ට ය. ඒ අතර සිවිල් ජනතාව ඉලක්ක කර ගත් ප්‍රහාර ද විය. සාමාන්‍ය ජනතාවට හානි සිදු වූ එල්ටීටීඊ විසින් සිදු කෙළේයැයි පැවසෙන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් පිළිබඳ නිදසුනක් වන්නේ 2008 පෙබරවාරි 3 දින කොටුව දුම්රිය ස්ථානයේ සිදු කළ ප්‍රහාරයයි. ඉන් සාමාන්‍ය පුද්ගලයන් වැඩි වශයෙන්ම ශිෂ්‍යයන් 12 ක් මිය ගිය අතර 100 කට අධික පිරිසකට තුවාල සිදු විය.[156] එහා මෙහා යෑම පාලනය කිරීම පිළිබඳ පරිච්ඡේදයේ සඳහන් වන තවත් එවැනි සිද්ධියක් වන්නේ 2009 පෙබරවාරි මස අභ්‍යන්තරව අවතැන් වුවන් ලියා පදිංචි කිරීමේ ස්ථානයක සිදු වූ ප්‍රහාරයයි. එහිදී සිවිල් වැසියන් හා ආරක්ෂක නිලධාරීන් 28 ක් මිය ගියහ.

224. 2005 දෙසැම්බර් මාසයේ සිට එල්ටීටීඊය ආරක්ෂක හමුදා ඉලක්ක කර ගන්නට ඇතැයි සිතිය හැකි වුවද සාමාන්‍ය ජනාතවට, වැඩි වශයෙන්ම ළමයින්ට හානි සිදු වූ ක්ලේමෝර් බිම් බෝම්බ ප්‍රහාර උත්සන්න කෙළේය.[157] මුලින්ම ක්ලේමෝර් බිම් බෝම්බ ප්‍රහාර වැඩි වශයෙන් සිදු වූයේ යාපනය අර්ධද්වීපයේය. පසුව එය වන්නියේ ආණ්ඩුවේ පාලනය යටතේ පැවති විශේෂයෙන්ම වවුනියා සහ මන්නාරම දිස්ත්‍රික්කවලටත් ව්‍යාප්ත විය. මෙම පරිච්ඡේදයේ පසුව විස්තර කෙරෙන එවැනි ප්‍රහාරයක් වන්නේ මගීන් 150 ක් රැගත් බස් රථයකට කැබිතිගොල්ලෑවේ දී එල්ල කළ ක්ලේමෝර් බෝම්බ ප්‍රහාරයයි. ඉන් 64 ක් මිය ගියහ. SLMM දූත මෙහෙය 2006 අප්‍රේල් 1 සිට ජූනි 15 දක්වා මෙම දිස්ත්‍රික්ක තුළ සිදු වූ ක්ලේමෝර් බෝම්බ ප්‍රහාර 20 ක් වාර්තා කර ඇත. ආරක්ෂක හමුදා ද වන්නියේ එල්ටීටීඊය ඉලක්ක කර ගත් ප්‍රහාරවලට ක්ලේමෝර් බිම් බෝම්බ යොදා ගත් බව ද එහි සඳහන් වේ.[158] එවැනි ප්‍රහාර 2007 වසර පුරාම සිදු විය.

225. 2006 වසරේ දී එල්ටීටීඊය යාපනයේ දී සමහර විට 'ජනතා බලකාය' නමින් හැඳින් වූ සිවිල් ජනතාව මෙන් ඇඳුම් ඇඳ ගත් සටන්කරුවන් විශේෂයෙන්ම ආරක්ෂක හමුදා සාමාජිකයන් ඝාතනය කිරීමට යොදා ගත් බව වාර්තාවේ[159]. මෙම චෝදනා සියල්ලම විමර්ශනය කළ යුතුය.

226. 2006 සිට ආණ්ඩුවේ ආරක්ෂක හමුදා අතුරු හමුදා කණ්ඩායම් සමග වැඩි වැඩියෙන් සම්බන්ධවීම පැහැදිලිව දක්නට ලැබුණ ආකාරය SLMM දූත මෙහෙය සහ විශේෂ වාර්තාකරුවන් ලේඛන ගත කර ඇත. නීතියෙන් පරිබාහිර ඝාතන ගැන විශේෂ වාර්තාකරුවන් 2006 මැයි 14 වාර්තාවට එකතු කිරීමක් ලෙස මෙසේ සඳහන් කර ඇත. '' මෙම කණ්ඩායම් සැබැවින්ම ස්වාධීන සන්නද්ධ කණ්ඩායම් නොව ආරක්ෂක හමුදා විසින් මෙහෙයවන හා සහාය දෙන ඒවා බවට බලවත් සාක්ෂි පවතින්නේයේ''ය [160]ආණ්ඩුව ( මූලික වශයෙන් ආරක්ෂක ලේකම්) ආරක්ෂක බලකා (ශ්‍රී ලංකා යුද හමුදාව විශේෂයෙන්ම හමුදා බුද්ධි අංශය, සහ පොලිස්

---

[155] SLMM Documentation
[156] Humanitarian Operation Factual Analysis, MOD Op cit.
[157] SLMM Documentation SLMM Final Report, Humanitarian Operation Factual Analysis, MOD Op cit
[158] SLMM Documentation
[159] SLMM Documentation, E/CN 4/2006/53/Add.5.Op cit
[160] A/HRC/8/3Add 3 Op cit

විශේෂ කාර්ය සාධක හමුදාව) හා අතුරු හමුදා කණ්ඩායම් අතර පැවති බව ආරංචි මාර්ග ගණනාවකින් චෝදනා කෙරේ.[161]

227. නිදසුනක් වශයෙන් ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම් සිදු කරන ලද ඝාතන සම්බන්ධයෙන් විශේෂ වාර්තාකරු 2006 ජනවාරි සිට 2007 නොවැම්බර් දක්වා කරන ලද ''දැනුවත් ගණන් බැලීම් අනුව ආරක්ෂක හමුදා විසින් යාපනයේ නිතියෙන් පරිබාහිර ඝාතන 700 ක් සිදු කර ඇති අතර එම සිද්ධීන් බොහොමයකට ඊපීඩීපීය සම්බන්ධය යි සඳහන් කරයි.[162] ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නිරීක්ෂණය කරන ලද තොරතුරු අනුව සැකකරුවන් සමහර විට හඳුනා ගෙන ඇත්තේ ශ්‍රී ලංකා යුද හමුදා සහ නාවික හමුදා මුර පොළවල දී හෝ හමුදා ප්‍රශ්න කිරීම් වලදී ය. ඉන් පසුව ඊපීඩීපිය විසින් ඔවුන් මරා දැමීමේ අවදානමට ලක්ව ඇත.[163]

228. ශී ලංකා විමර්ශන කොමිටිය රැස්කර ගත් තොරතුරු අනුව නීති විරෝධී ඝාතනවලට ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම් සම්බන්ධ බව විශ්වාස කිරිමට සාධාරණ හේතු පවතින බව පෙන්නුම් කෙරේ. නැගෙනහිර දිස්ත්‍රික්කවල සහ වයඹ දිග වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල පොලිස් මුරපොළ සහ යුද හමුදාවේ කඳවුරු අසළ සාමාන්‍ය ජනතාව ඝාතනය කිරීමේ රටාවක් තිබිණ. එවැනි අවස්ථා කීපයකදීම ඝාතන ගැන වගකිවයුතුයැයි පැවසෙන පුද්ගලයන් පොලීසිය සහ යුද හමුදාව විශාල වශයෙන් ගැවසෙන ස්ථාන හරහා නතර කිරීමක් නැතිව ගමන් කර ඇත.

229. ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම් යොදා ගත් තවත් උපාය මාර්ගයක් වූයේ ''මෝටර් සයිකල් ඝාතනයි'' සිවිල් ඇඳුමෙන් සැරසී මෝටර් සයිකලයකින් පැමිණෙන දෙදෙනෙකු මහ පාරේදීම වින්දිතයාට වෙඩි තැබීමය. අනෙක් ඝාතන සිදු වන්නේ ඊනියා ''සුදු වෑන්'' පැහැර ගැනීම් වලින් පසුව සහ බලහත්කාර අතුරුදහන් කිරීම්වලට හේතු වන නීති විරෝධී අත් අඩංගුවට ගැනීම්වලින් පසුවය. සමහර විට වින්දිතයාගේ නිවසට පැමිණෙන අපරාධකරුවෝ වින්දිතයාට එහිදීම වෙඩි තබා මරා දමති. නැතිනම් ඔහු පැහැර ගෙන ගොස් වෙනත් ස්ථානයකදී මරා දමති. සමහර විට වින්දිතයන් මරා දමන්නේ ඔවුන් වැඩට යන විට හෝ ආපසු පැමිණෙන විට හමුදා කඳවුරු හෝ පොලිස් ස්ථාන අසළ දීය. නිදසුනක් වශයෙන් ලේඛන ගත කර ඇති එක් සිද්ධියකදී අසළ හමුදා කඳවුරක සිට පැමිණි අපරාධකරුවන් වින්දිතයාගේ නිවසට යෑමට පෙර යුද හමුදාවේ සෙබළු සමග කතා කොට ඉන් පසුව ඝාතනය සිදු කර ඇත. බොහෝ වින්දිතයන් ඝාතනය කර ඇත්තේ සමීපයේ සිට හිසට එල්ල කරන ලද වෙඩි පහරකිනි.[164]

230. ආණ්ඩුවේ හමුදා සම්බන්ධයෙන් කලින් වසරවල සඳහන් කරන ලද ඝාතන රටාවට අමතරව යුද්ධයෙන් පසුව අල්ලා ගත් එල්ටීටීඊ කාර්යධරයන් සහ වෙනත් අය නීතියෙන් පරිබාහිරව ඝාතන කිරීම් මාලාවකට ආණ්ඩුවේ හමුදා වගකිව යුතුයැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බව ලැබී ඇති තොරතුරුවලින් පෙන්නුම් කරයි. මෙම සිද්ධීන් මෙම පරිච්ඡේදයේ පසුව පරික්ෂාවට ලක් කෙරේ.

### නීති විරෝධී ඝාතනවල වින්දිතයන්

231. මෙම කොටසෙන් අවධාරණය කරන්නේ නීතියෙන් පරිබාහිරව සිදු කරන ලද ඝාතනවලට ලක් වූ බොහෝ වින්දිතයන්ගේ විවිධ කණ්ඩායම් ය. ඊට විවේචකයන් හෝ එක පාර්ශ්වයක ආධාරකරුවන්යැයි සිතන මානුෂීය සේවකයන්, ජනමාධ්‍යවේදීන් සහ දේශපාලකයන් ඇතුළත් වේ. මෙම ඝාතනවල මූලික අරමුණ බව පෙනෙන්නේ මධ්‍යස්ථ හඬ අධෛර්යට පත් කිරීම මෙන්ම දේශපාලන හෝ උපක්‍රමික වාසි සඳහා ජනතාව මර්දනයට ලක් කිරීම සහබෙදා වෙන් කිරීමය. [165] දේශපාලන ඝාතන කීපයක්ම සිදු කර ඇත්තේ ඔවුන් ආරක්ෂක හමුදා සිදු කරන ලද මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් අවධානයට යොමු කිරීම නිසාය.

---

[161] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[162] A/HRC/8/3Add 5, 27 March 2006. para 5
[163] A/HRC/8/3Add 3 Op cit SLMM Documentation
[164] SLMM Documentation
[165] E/CN 4/2006/53/Add 5, 27, March 2006. para 5

232. ආණ්ඩුවේ පාලනයට යටත් ප්‍රදේශවල හෝ අත්පත් කර ගැනීමට නිතර ගැටුම් පවතින ප්‍රදේශවල සිටින දුප්පත් ජන කොටස් බොහෝවිට ගැටුම්වලට මැදි වේ. පාර්ශ්ව දෙකින් එකකට තොරතුරු ලබා දීම ගැන චෝදනාවට ලක් වෙන ඔවුන් සටන් බිමේදි සිදුවන හානිවලට පලි ගැනීම් වශයෙන් හෝ පවතින්නේයැයි සිතන සම්බන්ධතා නිසා ඝාතනය කෙරේ. විශේෂයෙන්ම කරුණා එල්ටීටීඊයෙන් ඉවත් වීමෙන් පසුව බොහෝ දෙනෙකු වින්දිතයන් වූයේ තොරතුරු ලබා දෙන්නන් සහ එල්ටීටීඊ දේශපාලන අංශයේ කාර්ය ධරයන් වීම නිසාය. ඔවුන්ගේ ඥාතීන්ගේ දේශපාලන සම්බන්ධතා පදනම් කර ගෙන ද සමහර පුද්ගලයන් ඉලක්ක කර ඇත. මේ තත්වය විශේෂයෙන් පැවතියේ නැගෙනහිර සහ වයඹ දිස්ත්‍රික්කවලය.

**මානුෂීය සේවකයන් ඝාතනය**

233. 2013 වන විට ශ්‍රී ලංකාව ලොව මරණයට පත් වූ මානුෂීය සේවකයන්ගේ සංඛ්‍යාව අනුව ඉහළම තැනක් ගත් රටවලින් එකක් විය. මානුෂීය සේවකයන් ඝාතනය කිරීම සහ අතුරුදහන් කිරීම් ලේඛන ගත කරන ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධානයක් 2006 ජනවාරි සිට 2007 දෙසැම්බර් දක්වා කාලය තුළ එවැනි සිද්ධීන් සැලකිය යුතු ආකාරයෙන් වැඩි වූ බව වාර්තා කරයි. ඉන් වැඩිම සංඛ්‍යාවක් සිදු වූයේ උතුරේ සහ නැගෙනහිරය.[166]මානුෂීය සේවයේ යෙදුන පුද්ගලයින්ගෙන් අඩුම වශයෙන් එක පුද්ගලයෙක් සෑම මසකම පාහේ ඝාතනයට හෝ බලහත්කාර අතුරුදහන් කිරීමට ලක් වූ බව සඳහන් කරන එම වාර්තාව නිශ්චිත සිද්ධීන් 60 ක් ගැන තොරතුරු ඉදිරිපත් කරයි. Action Centre la Faim (ACF) , ශ්‍රී ලංකා රතු කුරුසය සහ නෝර්වීජියානු සරණාගත කවුන්සලය (NRC) හා තවත් ඒවා ඊට ලක් වූ සංවිධානයි. සහන සේවකයන්ට එරෙහි ප්‍රධාන ප්‍රචණ්ඩත්ව සිද්ධීන් වාර්තා කරන ගෝලීය ව්‍යාපෘතියක් 2002 සිට 2011 අතර කාල සීමාවේ දී ශ්‍රී ලංකාවේ නීති විරෝධීව මරණයට පත් කළ මානුෂීය සේවකයන් 51 ක් පිළිබඳ සිද්ධීන් 46 ක් සඳහන් කරයි.[167] 2006 දී දැඩි වෙමින් පැවති භීතිය පිළිබඳ වාතාවරණය සියැසින්ම දුටු හා ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් ජාතික මානුෂීය සේවකයන් සහ ඔවුන්ගේ ඥාතීන්ට විවෘතවම තර්ජනය එල්ල කිරීම් ගැන ප්‍රකාශයන් කළ සාක්ෂිකරුවන් ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට හමු විය.[168]

234. ශ්‍රී ලංකාවේ මානුෂීය සේවකයන් මරා දැමීම පිළිබඳ දරුණුම සිද්ධිය වන්නේ මූතුර් හිදී ACF දේශීය කාර්ය මණ්ඩලයේ සේවකයන් 17 ක් ඝාතනය කිරීමය. 2006 අගොස්තු 1 වැනිදා ACF දේශීය කාර්ය මණ්ඩලයේ 17 ක් මුතුර් හි සනීපාරක්ෂක සහ ජලය සැපයීමේ දෛනික වැඩ පිළිවෙළකට ත්‍රිකුණාමලය සිට බෝට්ටුවකින් පිටත්ව ගොස් ඇත. කාර්ය මණ්ඩලයේ 16 ක් දෙමළ වන අතර ඉතිරි තැනැත්තා මුස්ලිම් ය. පස් දෙනෙක් ස්ත්‍රීන්ය. එදිනම එල්ටීටීඊය ප්‍රහාරයක් එල්ල කොට මුතුර් නගරයේ පාලනය අත් කර ගත්තේය. මෙම කාලය තුළ ආරක්ෂක හමුදා පොලිසිය අසළ බංකරය ඇතුළු ස්ථාන කිපයක රැඳී සිටියහ. ආපසු ත්‍රිකුණාමලයට යෑමට නියමිත බෝට්ටු ගමන අවලංගු කළ නිසා ACF කාර්ය මණ්ඩලයට මූතුර්හි රැඳී සිටීමට සිදු විය. ඔවුන් මුදා ගැනීමට වඩා ඔවුන්ගේ කාර්යාලයේම රැඳී සිටීම වඩාත් ආරක්ෂිතයැයි යුද හමුදාවෙන් දැනුම් දී තිබිණ. ත්‍රිකුණාමලය ACF කාර්යාලය මූතුර් සමග පැවැත් වූ ගුවන් විදුලි සම්බන්ධතාවය 2006 අගෝස්තු 4 වැනිදා පෙ.ව. 7.00 ට විසන්ධි වී ඇත. අගෝස්තු 4 සහ 6 අතර කාලය ඇතුළත ත්‍රිකුණාමලය ACF කාර්යාලය SLMM සමග මූතුර්වලට ගොස් තම කාර්ය මණ්ඩලය මුදා ගැනිමට කීප විටක් උත්සාහ කළද යුද හමුදාව ඊට ඉඩ දුන්නේ නැත. තම කාර්ය මණ්ඩලය මරා දමා ඇති බවට නිර්නාමික දුර කතන පණිවිඩයක් අගොස්තු 5 වැනිදා ACF

---

[166] Law and Society Trust, Under Fire Persons in Humanitarian Service, ශ්‍රී ලංකාවේ මානුෂීය සේවයේ යෙදි සිටි පුද්ගලයන්ඝාතනය සහ ඔවුන්ගේ අතුරුදහන්විම පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවක්, 2006 ජනවාරි – 2007, 2008,....... The Aid Worker Security Database (AWSD)
https://aidworkersecurity.org/incidents/report/country. 2006 හා 2009 අතර කාලයේ ශ්‍රී ලංකාවේ මානුෂීය ආධාර සේවකයන් 47 ක් ඝාතනය කර ඇත.

[167] The Aid Worker Security Database (AWSD) https://aidworkersecurity.org/incidents/report/country. 2006 හා 2009 අතර කාලයේ ශ්‍රී ලංකාවේ මානුෂීය ආධාර සේවකයන් 47 ක් ඝාතනය කර ඇත.
[168] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

කාර්යාලයට ලැබිණ. ආරක්ෂක හමුදාවෙන් නිල දැනුම් දීමක් කිසි අවස්ථාවක ලැබුණේ නැත. 2006 අගෝස්තු 7 වැනි දා ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධානයක් ACF කාර්ය මණ්ඩලයේ මළ සිරුරු එම කාර්යාලය තුළම සොයා ගත් බව වාර්තා කෙළේය. මළ සිරුරු පෙළ ගසා තිබුණ අතර සමහර ඒවා මුණින් තලාව වැටී තිබිණ. සියලු දෙනාම මරා ඇත්තේ හිසට වෙඩි තැබීමෙනි. වෙඩි හුවමාරුවක් හෝ ෂෙල් වෙඩි වැටුණ බව දැක්වෙන කිසිදු හානියක් ගොඩනැගිල්ලට සිදුව නැත.

235. 2006 අගෝස්තු 6 වැනිදා ත්‍රිකුණාමලය ACF කාර්යාලයේ කාර්ය මණ්ඩලය නගරයට ගොස් තම සගයන්ගේ මළ සිරුරු බාර ගත්හ. දින ගණනාවක් ගතවූ එම මළ සිරුරු කුණුවී තිබුණ අතර දුර්ගන්ධය ඉතා ඈතට පවා දැනිණ. පොලිසිය හෝ හමුදාව අපරාධය වූ ස්ථානය ආරක්ෂා කිරීමට කිසිදු පියවරක් ගෙන නැත. අගෝස්තු මස මුල් සතියේ මුතූර් නගරයේ පාලනය වරින් වර එල්ටීටීඊය සහ ආරක්ෂක හමුදා අත රැඳී තිබුන නමුත් අගෝස්තු 4 වැනි දා වන විට සම්පූර්ණ නගරයේම පාලනය ආරක්ෂක හමුදා අතට පත්ව තිබුණ නිසා '' මෙම අපරාධය සිදු කරන්නට ඇත්තේ වෙනත් සන්නද්ධ කණ්ඩායමකින් නොව ආරක්ෂක හමුදා විසින් යැයි කිව හැකි'' බව SLMM දූත මෙහෙය 2006 අගෝස්තු 29 වැනිදා නිගමනය කෙළේය.[169]

236. මෙම සිද්ධිය ගැන නිසි විමර්ශනයක් සිදු නොවීමෙන් අපරාධකරුවන් දඬුවම් නොලැබ සිටිම මුල් බැස ගත් ආකාරයත්, ශ්‍රී ලංකාවේ දේශීය මට්ටමෙන් වගවීම තහවුරු කිරීමේ දි මුහුණ දිමට ඇති අභියෝගත් පැහැදිලි කරයි. සාක්ෂි රැස් කර නැත. නොඑසේනම් පොලිස් විමර්ශනයේ දී ඒවා වෙනස් කිරීමට හෝ අතුරුදහන් කිරීමට ලක්ව ඇත. ආරක්ෂක හමුදා ආරම්භයේදීම, අගෝස්තු 7 වැනිදා මෙම අපරාධය සිදු කර ඇත්තේ එල්ටීටීඊයෙන් බව ප්‍රසිද්ධියේම ප්‍රකාශ කිරීමෙන් අපක්ෂපාත විමර්ශනයක ඉඩ අවුරා දැමුවේය. විධායකය විභාගයට මැදිහත් වූයේ එහි අධිකරණ කටයුතු සිංහල ප්‍රදේශයකට මාරු කිරීමෙනි. එම නිසා දෙමළ ජනතාවට ඊට සහභාගිවීම වඩාත් දුෂ්කරවීය. මුලින්ම මෙම විභාගය සඳහා පත් කළ මහෙස්ත්‍රාත්වරයාට තර්ජන එල්ල විය. දෙවන මරණ පරීක්ෂණය නිරීක්ෂණය කිරීම සඳහා පත් කළ අන්තර්ජාතික අධිකරණ ව්‍යාධි විශේෂඥයාට හිරිහැර සිදු වූ අතර වින්දිතයෙකුගේ හිස තුළ තිබූ උණ්ඩයක් විශේෂ කාර්ය සාධක බලකායේ ආයුධයකින් විය හැකියැයි කලින් කළ නිගමනය පසුව ඉල්ලා අස්කර ගත්තේය.

237. මෙම සිද්ධිය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමෙන් සහ උදලාගම කොමිසමෙන් විමර්ශනය කර ඇත. කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් කීප දෙනෙකුටම තර්ජන එල්ල විය. සාක්ෂිකරුවන් රැක ගැනීමක් නොමැති නිසා ඔවුන්ට රට හැර යැමට සිදු විය. කොමිසම IIGEP සහාය ඇතිව විදෙස් ගතව සිටින ප්‍රධාන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වීඩියෝ සම්බන්ධතා තුළින් ලබා ගැනීමට කටයුතු සූදානම් කෙළේය. කෙසේ වුවත් ප්‍රකාශ කීපයක් ලබා ගැනීමෙන් පසුව කොමිසමේ සභාපති, නීතිපතිගේ උපදෙස් අනුව වීඩියෝ සම්බන්ධතා හරහා ප්‍රකාශ සටහන් කිරීම වැළැක්වූයේය. කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් පොලීසිය ACF කාර්ය මණ්ඩලය එහි සිටි බවක් නොදන්නා බව පැවසුවේය. ඔවුන් ලබා දුන් විස්තර එකිනෙකට පරස්පර අසම්පූර්ණ ඒවාය. ''පොලීසිය තුළ ඕනෑ කමින් ඇති කර ගත් අන්ධභාවයේ වසංගතයක් පැතිර ඇතැයි'' එක නිරීක්ෂකයෙකු සඳහන් කෙළේය.

238. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම ACF සිද්ධිය ගැන තව දුරටත් විමර්ශනය කොට වැරදිකරුවන්ට එරෙහිව චෝදනා ගොණු කිරීමට දැඩිව නිර්දේශ කෙළේය. ( 9 120 ඡේදය) විමර්ශනය සිදුවෙමින් පවතින අතර තුර ආරක්ෂක අමාත්‍යාංශය වාර්තාවක් ප්‍රකාශයට පත් කරමින් ආරක්ෂක හමුදාවල සම්බන්ධය ප්‍රතික්ෂේප කොට එහි වගකීම ACF සංවිධානය භාර ගත යුතුයැයි චෝදනා කෙළේය. මෙවැනි සිද්ධීන් ගැන ජාත්‍යන්තර අවධානය යොමුවන සෑම අවස්ථාවකදීම ආරක්ෂක හමුදාව වින්දිතයන්ගේ ඥාතින්ට සහ ACF ආයතනයේ දේශීය කාර්ය මණ්ඩලයට විශාල වශයෙන් හිරිහැර කිරීම් සිදු වේ. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය රැස්කළ

169 http://www.amnesty.usa/pdf/srilanka2009.pdf

තොරතුරු අනුව නීතියෙන් පරිබාහිරව ACF කාර්ය මණ්ඩලය ඝාතනය කිරීම ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් සිදු කළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. ආණ්ඩුව පවසන ආකාරයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව 2015 ජනවාරි සිට හමුදා නිලධාරීන් 18 ක ගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර තවත් 22 ක ගෙන් ප්‍රශ්න කිරීමට නියමිතය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රංශයේ සිටින්නේයැයි විශ්වාස කරන මූලික සාක්ෂිකරුවන් දෙදෙනෙකුගෙන් ප්‍රකාශ ලබා ගැනීමට අදහස් කරන අතර ඊට ප්‍රංශ ආණ්ඩුවේ සහාය ඉල්ලා ඇත. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නිරීක්ෂණය කළ අනෙකුත් සිද්ධීන් පහත සඳහන් ඒවාය.

239. 2006 මැයි 16 වැනි දා NRC කාර්ය මණ්ඩලයේ 22 හැවිරිදි සාමාජිකයෙකු වැඩ නිම කොට ආපසු නිවසට යැමේ දී වවුනියාවේ යුද හමුදා මුරපොළට මීටර් 200 ක් පමණ ආසන්නයේ දී ඔහුගේ හිසට වෙඩි තබා මරණීය තුවාල සිදු කර ඇත. මෙම මුරපොළට යොදවා ඇත්තේ 562 බ්‍රිගේඩයේ හමුදා භටයන් වන අතර මෙම පුද්ගලයා ඝාතනයට පෙර NRC ට්‍රැක්ටරයක් හමුදාවේ සහායට නොදීම නිසා දබරයක් හට ගෙන ඇති අතර එහිදී හමුදාව ඔහුට තර්ජනය කර ඇත. SLMM දූත මෙහෙය සිද්ධිය ගැන විමර්ශනය කොට බොහෝ දුරට යුද හමුදාව මරණයට වගකිව යුතුයැයි නිගමනය කෙළේය. වවුනියාව මහේස්ත්‍රාත් මුලින්ම සිද්ධිය ගැන සැකකරුවන් සිවු දෙනෙකු හඳුනාගත් නමුත් විමර්ශන කටයුතු ඉන් ඉදිරියට ගිය බව විශ්වාස කළ නොහැකිය.[170]

240. 2007 අප්‍රේල් 1 වැනි දා නැගෙනහිර දිස්ත්‍රික්කයක් වූ මඩකලපුවේ මයිලම්පාවෙලි හි පශ්චාත් සුනාමි ඉදි කිරීම් ව්‍යාපෘතියක සේවය කළ සිංහල පුද්ගලයන් හය දෙනෙකු වෙඩි තබා මරා දමා ඇත. ඔවුන් සේවයේ යොදවා තිබුණේ 2004 ඉන්දියන් සාගරයේ සුනාමියෙන් අනාථ වුවන් සඳහා ගෙඩනැගිල්ලක් ඉදි කිරීමේ වැඩ කටයුතුවලය. එම ප්‍රහාරයෙන් එක් සිංහල පුද්ගලයෙකු සහ දෙමළ දෙදෙනෙකු තුවාල ලැබූහ. මෙම ප්‍රහාරය සිදුව ඇත්තේ මඩකලපුව නගරයට කිලොමීටර් අටක් උතුරෙන් පිහිටි මයිලම්පාවෙලි විශේෂ කාර්ය සාධක බලකායේ කඳවුරකට මීටර් 300 ක් පමණ ඈතින් වූ ස්ථානයක ය. ආණ්ඩුව සිද්ධිය ගැන එල්ටීටීඊයට දොස් පැවරුව නමුත් එල්ටීටීඊය චෝදනා කෙළේ කරුණා කණ්ඩායමටය.[171] ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට දැන ගැනීමට ලැබුණ ආකාරයට මෙම සිද්ධිය ගැන විමර්ශනයක් හෝ චෝදනා ගොණු කිරිමක් සිදුව නැත.

**දේශපාලකයන් ඝාතනය කිරීම**

241. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සිය වාර්තා කිරීමේ කාල සීමාව ඇතුළත දේශපාලකයන් ඉලක්ක කර ගත් ඝාතන ගණනාවක් ගැන තොරතුරු ලේඛනගත කර ඇත. පාර්ලිමේන්තු මංත්‍රීවරුන්ට ඇති තර්ජන සහ ඔවුන් ඝාතනය කිරීම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ඇති අන්තර් පාර්ලිමේන්තු සංගමය (IPU) 2004 සැප්තැම්බර් සිට 2008 අගෝස්තු දක්වා ලැබුණු ලැබුණු පැමිණිලි 'සංඛ්‍යාවේ ප්‍රමාණය' ගැනත් 'අදාල කරුණුවල බරපතළකම' ගැනත් බලවත් කණස්සල්ල ප්‍රකාශ කෙළේය.[172] බොහෝ සිද්ධීන්වල වින්දිතයන් වූයේ දෙමළ ජාතිකයන් ය. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය ලබා ගත් තොරතුරු පදනම්ව දේශපාලකයන් ඝාතනය කිරීමේ සමහර සිද්ධීන් එල්ටීටීඊය විසින් සිදු කළ බවටත් තවත් ඒවා ආරක්ෂක හමුදා විසින් හෝ එහි සහාය ඇතිව අතුරුහමුදා කණ්ඩායම් විසින් හෝ අතුරු කණ්ඩායම්වල සහාය ඇතිව හමුදාව විසින් හෝ සිදු කළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී.

**විදේශ ඇමති ලක්ෂ්මන් කදිර්ගමාර්**

---

[170] SLMM documentation. Law and Society Trust Under Fire: Persons in Humanitarian Service

[171] Law and Society Trust Under Fire: Persons in Humanitarian Service, Asian Centre for Human Rights, http://www.achrweb.org/Review/2007/164_07htm

[172] IPU Public Mission report from Sri Lanka July 2013 .p.2

242. විදේශ ඇමති ලක්ෂ්මන් කදිර්ගමාර් ඝාතනයට ලක් වූ දේශපාලකයන්ගෙන් වඩාත් කැපීපෙනෙන පුද්ගලයෙකි. ඔහු 2005 අගොස්තු මාසයේ දී කොළඹ සිය නිවසේ සිටියදී සැඟව සිට වෙඩි තබන්නෙකුගේ වෙඩි පහරකට ලක් විය. ඝතකයා හඳුනා නොගත් නමුත් මූලික පොලිස් විමර්ශනවලින් ඝතනය පිළිබඳව එල්ටිටීඊයට චෝදනා කෙරිණ.[173]2008 මාර්තු මාසයේ දී එල්ටිටීඊ නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් ඇතුළු තවත් පස් දෙනෙකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කරන ලදී.[174] ආණ්ඩුවේ තොරතුරු මාර්ග අනුව කීප දෙනෙකු අත් අඩංගුවට ගෙන කොළඹ මහාධිකරණයේ චෝදනා ගොණු කර ඇත. මෙම නඩුව 2015 සැප්තැම්බර් මාසයේ විභාගයට ගැනීමට නියමිතය.

## දෙමළ පාර්ලිමේන්තු මංත්‍රී ජෝසප් පරරාජසිංහම්

243. දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මංත්‍රී ජෝසප් පරරාජසිංහම්[175] 2005 දෙසැම්බර් 24 මඩකලපුව සාන්ත මේරි පල්ලියේ පැවති මධ්‍යම රාත්‍රී දේව මෙහෙයට සහභාගි වෙමින් සිටියදී වෙඩි තබා මරා දමා ඇත. එහිදී ඔහුගේ බිරිඳ ඇතුළු තවත් අට දෙනෙකුට තුවාල සිදු විය. මෙම පල්ලිය පිහිටා ඇත්තේ හමුදා මුර පොළවල් දෙකක් අතර විශාල භට පිරිසක් නිතර ගැවසෙන අධි ආරක්ෂක කලාපයක් ඇතුළතය. පරරාජසිංහම්ට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ආරක්ෂක භටයන් ලබා දී තිබුණ අතර සිද්ධිය වන අවස්ථාවේ ඔවුන් සිටි නමුත් වෙඩි තැබීම වැළැක්වීමට හෝ ඝාතකයන් අත් අඩංගුවට ගැනීමට කිසිත් කර නැතැයි පැවසේ. ප්‍රහාරයට දින කීපයකට පෙර ඔහුගේ කලින් සිටි ආරක්ෂක භටයන් ඉවත් කොට වෙනත් අය පත් කර ඇත. වින්දිතයාගේ පසු පසට හා පපුවට වෙඩි නමයක් එල්ල කර ඇත්තේ බැතිමතුන්ගෙන් පිරී සහ ඒ දිනවලම සත්ප්‍රසාදය ලත් බිෂොප්වරයෙකු සිටි පල්ලිය තුළය. සාක්ෂිකරුවන් සිවිල් ඇඳුමෙන් සැරසී සිටි පිස්තෝල රැගත් පුද්ගලයන් දෙදෙනෙකු දැක ඇත. ඔවුන් වින්දිතයාට වෙඩි තබා මරා ඇත්තේ බැතිමතුන් බිමට නැමී සිටිය දීය. වහලට වෙඩි තබා මිදුලට පැමිණි ඝාතකයෝ පල්ලිය වටා ඇති තාප්පයෙන් පැන පලා ගියහ. සිද්ධිය වන විට ආරක්ෂක භටයන් ගණනාවක්, පොලිස් නිලධාරීන් සහ පොලිස් කොස්තාපල් වරුන් දෙදෙනෙකු එහි සිටියහ.[176]

244. පල්ලියට පොලිස් ආරක්ෂාව යොදා තිබුණ ද ඝාතකයෝ කිසිදු බාධාවකින් තොරව සුදු වෑන් රථයකින් අසළ ඇති හමුදා කඳවුර දෙසට ගොස් ඇතැයි පැවසේ. කරුණා එල්ටීටීඊයෙන් ඉවත් වූ පසු ජෝසප් පරරාජසිංහම් ඔහුට සහාය ලබා දීම ප්‍රතික්ෂේප කළ අතර ඒ නිසා ඔහු කරුණා කණ්ඩායමේ සාමාජිකයන්ගේ තර්ජනයට ලක්ව සිටියේය. ප්‍රහාරයෙන් පසුව පවුලේ සාමාජිකයන්ට ද තර්ජන එල්ල වූ නිසා ඔවුහු රට හැර ගියහ.[177]
245. ජෝසප් පරරාජසිංහම් ඝාතනය කරන ලද්දේ කරුණා කණ්ඩායම විසින් බවත් ඔවුන්ට ඒ සඳහා ආරක්ෂක හමුදාවල සහ යුද හමුදාවේ ආධාර සහ අනුබලය ලැබී ඇති බවත් විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේයැයි ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය අදහස් කරයි. මූලික පොලිස් පරීක්ෂණ වලදී සන්නද්ධ හමුදා භටයන් දෙදෙනෙකු හඳුනා ගෙන අත් අඩංගුවට ගෙන ඇත.[178] කෙසේ වුවත් සිද්ධිය ඇසින් දුටු බොහෝ දෙනෙකු සිටියත් සාක්ෂි නොමැති නිසා සැකකරුවන් නිදහස් කරන ලදී. මෙම ඝාතනය උදලාගම කොමිසම විසින් විමර්ශනය කළ යුතුව තිබුණ සිද්ධීන්ගෙන් එකකි. ''සාක්ෂිකරුවන් නොමැතිවීම සහ කාලයක් නොමැතිවීම''

---

173 LLRC report p.26 and the Humanitarian Operation Factual analysis MOD Op cit. දෙපාර්ශ්වයම එල්ටිටීඊය වගකිව යුතුයැයි කියන නමුත් එල්ටීටීඊය කිසි විටෙක අපරාධය ගැන වගකීම භාර ගත්තේ නැත. CID පොලිස් වාර්තාවලින්ද පෙන්වන්නේ එල්ටීටීඊය යි.

174 174 http://timesofindia.indiatimes.com/world/south-asia/Arrest-warrants-against-Prabhakaran-Pottu-inkadirgamar-case/articleshow/452407.cms

175 ජෝසප් පරරාජසිංහම් එල්ටීටීඊයට සම්බන්ධිත මානව අයිතිවාසිකම් සඳහා වූ උතුරුනැගෙනහිර මහලේකම් කාර්යාලයේ සාමාජිකයෙක්. (NESOHR)

176 SLMM Documentation

177 පාර්මේතු මංත්‍රීන්ගේ මානව අයිතිවාසි පිළිබඳ කොමිටියඃ 2013 ජුලි 9 – 11 සංචාරයේ නියෝජිතයන්ගේ කොමිටියේ වාර්තාව, අන්තර්පාර්ලිමේන්තු සංගමය 2013 ඔක්තෝබර් 9

178 OISL දුටු සීඅයිඩී පොලිස් රහස්‍ය වාර්තා

නිසා පරරාජසිංහම් ඝාතනය ගැන කොමිසම විමර්ශනය නොකළ බව කොමිසමේ වාර්තාවේ සඳහන් වේ. [179]

246. මෙම ඝාතනය ගැන සොයා බැලීමට 2006 අප්‍රේල් මාසයේ දී විශ්‍රාමික මහාධිකරණ විනිසුරු මහානාම තිලකරත්නගේ මූලිකත්වයෙන් තවත් ජනාධිපති කොමිසමක් පත් කර ඇත. එහි ප්‍රකාශයට පත් නොකළ එහෙත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නිරීක්ෂණය කළ 2007 මාර්තු මස අවසන් වාර්තාවෙන් එය දේශපාලන ඝාතනයක් බව නිගමනය කොට විමර්ශනය ප්‍රමාණවත් නොවන සහ නීතියෙන් ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට පටහැනිව සිදු කිරීම ගැන අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට දොස් පවරයි. දොස් පැවරීමට එක හේතුවක් වන්නේ අත් අඩංගුවට ගත් හමුදා භටයන් දෙදෙනා ගැන සාක්ෂි නොමැතිවීම සහ හඳුනාගැනීමේ පෙරෙට්ටුවක දී එම දෙදෙනා හඳුනා නොගැනීම නිසාය.

247. අන්තර්ජාතික පාර්ලිමේන්තු සංගමය 2013 ජුලි මාසයේ දී ජෝසප් පරරාජසිංහම් ඇතුළු ශ්‍රී ලාංකික දේශපාලකයන් කීප දෙනෙකුගේම ඝාතන ගැන විභාග කිරීමට දූත කණ්ඩායමක් එව්වේය.[180] එහිදී බලධාරීන් කීප දෙනෙකුම මෙම ඝාතනය සම්බන්ධයෙන් කරුණා කණ්ඩායම සම්බන්ධ බව දැක්වෙන සාක්ෂි නොමැති බවත් එම නිසා ඒ ඔස්සේ විමර්ශන නොකළ බවත් පවසා ඇත. අන්තර් පාර්ලිමේන්තු සංගමය සිය වාර්තාවේ මෙසේ සඳහන් කරයි. ''පරරාජසිංහම් මහතාගේ ඝාතකයන් ආරක්ෂක හමුදාවල සහාය නැතිව පලා ගිය බව කිසිසේත් විය නොහැකිය.''

248. 2014 දෙසැම්බර් මස මෙම ඝාතනය ගැන තව දුරටත් විමර්ශනය කිරීමට අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් මඩකලපුවට ගිය බවත් විමර්ශනය ''මෑතකදී නැවත පණ ගන්වා ඇති'' බවත් ආණ්ඩුවේ ආරංචි මාර්ග ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට දැනුම් දුන්නේය.

***මානව අයිතිවාසිකම් නීතිඥයෙකු මෙන්ම දෙමළ පාර්ලිමේන්තු මංත්‍රී නඩරාජා රවිරාජ්***

249. 2006 නොවැම්බර් 10 වැනි දින මානව අයිතිවාසිකම් නීතිඥයෙකු මෙන්ම දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මංත්‍රීවරයෙකු වන නඩරාජා රවිරාජ් කොළඹ ප්‍රධාන මාර්ගයක දී මෝටර් සයිකලයකින් පැමිණි පුද්ගලයෙකු විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී. මෙම ප්‍රහාරය සිදුව ඇත්තේ ආරක්ෂක හමුදා කඳවුරක් අසළ පොලිස් මුරපොළ දෙකක් අතරදීය.[181]

250. නඩරාජ් රවිරාජ් මධ්‍යස්ථ අදහස් ගැනත් විශේෂයෙන්ම ඝාතනයට පෙර සති කීපයක දී එල්ටීටීඊය මෙන්ම ආණ්ඩුව ගැන සිදු කළ විවේචනාත්මක ප්‍රකාශ ගැනත් හොඳින් ප්‍රකට පුද්ගලයෙකි. ඔහු අනෙකුත් පාර්ලිමේන්තු මංත්‍රීන් සමග පුරවැසි අධීක්ෂණ කොමිටියත් පිහිටුවා පැහැර ගැනීම්, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ නීති විරෝධී මිනිස් ඝාතන ගැන ආණ්ඩුව වගකිව යුතුයැයි චෝදනා කෙළේය. ඝාතනයට පෙර දින ඔහු දෙමළ ජාතික සන්ධානයේ අනෙකුත් මංත්‍රීන් සමග යුද හමුදාවෙන් නැගෙනහිර පළාතේ සාමාන්‍ය දෙමළ ජනතාව මැරීම සහ පැහැරගෙන යෑම් සහ නීතියෙන් පරිබාහිරව කෙරෙන ඝාතන ගැන විරෝධය දැක්වීමට කොළඹ එක්සත් ජාතීන්ගේ කාර්යාලය ඉදිරි පිට උද්ඝෝෂණයක් පැවැත් වූයේය.

251. රවිරාජ් සිද්ධිය උදලාගම පරීක්ෂණ කොමිසමේ මැන්ඩේට් බලය යටතට ගැනෙන ප්‍රකට ඝාතනවලින් එකකි. කෙසේ වුවත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලබා ගත හැකි වූ කොමිසමේ ප්‍රකාශයට පත් නොකළ තොරතුරු අනුව කාල වේලාවක් නොතිබූ නිසා කොමිසම රවිරාජ් ඝාතනය ගැන විමර්ශනය කර නැත.[182]අන්තර් පාර්ලිමේන්තු සංගමය පරරාජසිංහම් සහ රවිරාජ් යන ඝාතන දෙකේම විමර්ශන කටයුතුවල ප්‍රගතියක් දක්නට නොලැබීම ගැන සිය බලවත්

---

[179] උදලාගම කොමිසමේ අවසාන වාර්තාව බලන්න.

[180] IPU report Op cit

[181] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ බලන්න http://news.bbc.co.uk/2/hi/south_asia/6155362.stm.University for Teachers for Human Rights (UTHR) special report No. 29

[182] උදලාගම කොමිසමේ අවසාන වාර්තාව බලන්න.

කණස්සල්ල ප්‍රකාශ කර ඇත. ''එම සිද්ධීන් දෙකේදීම ආරම්භයේ සිටම අතුරු හමුදා සම්බන්ධ වන්නට ඇතැයි යන්න පිළිබඳව තොරතුරු තිබිණ.''[183]

252. මුලින්ම පොලිස් විමර්ශනවලින් ප්‍රතිඵලයක් අත් වූයේ නැත. සම්පූර්ණ අවධානය යොමු වූයේ එල්ටීටීඊ සංවිධානයට අයත් සැකකරුවන් කෙරේ වන අතර වන්නියට යෑමට හැකියාවක් නොතිබුණු නිසා එම සැකකරුවන් අත් අඩංගුවට ගැනීමට නොහැකි වූයේයැයි බලධාරීහු කීහ. රජයේ තොරතුරු මාර්ගයක් සඳහන් කරන ආකාරයට මෙම ඝාතනය සම්බන්ධයෙන් 2015 මාර්තු මාසයේ දී නාවික හමුදා නිලධාරීන් තිදෙනෙකු සහ හිටපු පොලිස් නිලධාරියෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත් අඩංගුවට ගෙන වැඩි දුර පරීක්ෂණ සඳහා රිමාන්ඩ් සිර භාරයට පත් කොට ඇත. ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් ඇතැයි විශ්වාස කරන සිවු වැනි සැකකරුවෙකු අත් අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කර ඇත. මෙම සිද්ධිය කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී. තවත් සැකකරුවෙකු 2007 දී නොහඳුනන කණ්ඩායමක් විසින් පැහැර ගෙන ගොස් ඇති අතර ඔහු සිටින ස්ථානයක් නොදන්නා බව ආණ්ඩුවේ ආරංචි මාර්ග පවසයි.

***දෙමළ පාර්ලිමේන්තු මංත්‍රී ත්‍යාගරාජා මහේස්වරන්***

253. එක්සත් ජාතික පක්ෂයේ දෙමළ පාර්ලිමේන්තු මංත්‍රීවරයෙකු වූ ත්‍යාගරාජා මහේස්වරන් 2008 ජනවාරි 1 වැනි දා කොළඹ හින්දු කෝවිලක ආගමික වතාවතකට සහභාගි වෙමින් සිටිය දී වෙඩි තබා මරා ඇත. මරණයට පෙර ඔහු යාපනයේ සිදුවන ඝාතන සම්බන්ධයෙන් ඊපීඩීපිය සහ ආණ්ඩුවේ ඇති සම්බන්ධතාවය පාර්ලිමේන්තුවේ දි හෙළිකරන බව ඔහු පැවසුවේය. මරණයට දින කීපයකට පෙර ඔහුගේ පුද්ගලික ආරක්ෂක භට සංඛ්‍යාව විශාල වශයෙන් අඩු කරන ලදී.

254. මහේස්වරන් මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයෙන් එල්ටීටීඊයේ හිටපු කාර්යධරයෙකුට මරණ දඬුවම නියම කෙරිණ. මරණ දඬුවමට එරෙහිව අභියාචනා පෙත්සමක් 2015 නොවැම්බර් මාසයේ දී විභාගයට ගැනීමට නියමිතය. '' මෙම තීන්දුවෙන් ඝාතනය සිදු කිරීමේ චේතනාව විශේෂයෙන්ම මෙම අපරාධය මහෙස්වරන් මහතා ආණ්ඩුව විවේචනය කිරීම හා සම්බන්ධයක් ඇති බවට කලින් පැවති සැකයත් දේශපාලන ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක ඔහුගේ පෞද්ගලික ආරක්ෂාව හදිසියේම අඩු කළ පසුබිමක සිදුවීමත් තහවුරු වන්නේද යන්න ගැන අන්තර් පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මංත්‍රීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිටිය සිය බලවත් කණස්සල්ල ප්‍රකාශ කරයි.[184]

*ජාතිය ගොඩනැගීමේ අමාත්‍ය සිංහල පාර්ලිමේන්තු මංත්‍රී ඩී ඇම් දසනායක*

255. ජාතිය ගොඩ නැගීමේ අමාත්‍ය සිංහල පාර්ලිමේන්තු මංත්‍රී ඩී ඇම් දසනායක 2008 ජනවාරි 8 වැනි දා ජා ඇල දී පැති බෝම්බයකට අසුවී මිය ගියේය.[185] පසුව පොලිසිය විසින් එල්ටීටීඊයට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත. ඝාතනය සම්බන්ධයෙන් එල්ටීටීඊ සැකකරුවන්ට එරෙහි නඩු විභාගය පැවැත් වෙන අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ඉදිරිපත් කර ඇති එක සැකකරුවෙකුට 2011 නොවැම්බර් මාසයේ දී අත් හිටවූ සිර දඬුවමක් නියම කර ඇත. එහෙත් ඉදිරිපත් කර ඇති නිශ්චිත චෝදනාව කුමක්ද යන්න පැහැදිලි නැත. ආණ්ඩුවේ ආරංචි මාර්ග සඳහන් කරන ආකාරයට අනෙක් සැකකරුවන් දෙදෙනාට එරෙහිව මීගමුව මහාධිකරණයේ නඩු පවරා ඇති අතර එය 2015 සැප්තැම්බර් මාසයේදී විභාගයට ගැනිමට නියමිතය.

***මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තු මංත්‍රී ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ***

[183] IPU පාලන මණ්ඩලයේ යෝජනාව, 2013 ඔක්තෝබර් 9 සම්මත කර ගැනිණ.
[184] 2013 ජනවාරි සැසිය.
[185] IPU case

256. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දෙමළ පාර්ලිමේන්තු මංත්‍රී සහ මහා මාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ 2008 අප්‍රේල් 6 වැනි දා වැලිවේරියේ පැවති මැරතන් ධාවන තරගයකදී මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් මිය ගියේය. එහි වගකීම පැවරුණේ එල්ටීටීඊයටය. ඝාතනය පිළිබඳව විමර්ශනයේ තොරතුරු ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලබා ගත නොහැකි විය. රජයේ ආරංචි මාර්ග සඳහන් කරන ආකාරයට ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරන ලද විමර්ශන වලින් පසුව හිටපු පොලිස් නිලධාරයෙකු ඇතුළත් සැකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත. ඝාතනය සිදු වී වසර හතකට පසුව මෙම නඩුව 2015 නොවැම්බර් 23 ගම්පහ මහාධිකරණයේ දී විභාගයට ගැනීමට නියමිත ය.

***ජනමාධ්‍යවේදීන් ඝාතනය***

257. ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් ඝාතනය කිරීමෙන් ද ශ්‍රී ලංකාව ලොව ඉහළ මට්ටමක සිටී. එය ප්‍රකාශ කිරීමේ නිදහස කෙරේ බලවත් සීමා කිරීමකි. ජනමාධ්‍යවේදීන් රැක ගැනීමේ කොමිටිය ( CPI ) 2004 සහ 2009 අතර කාලයේ දී ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් 13 ක් ඝාතනය කිරීම පිළිබඳව තොරතුරු රැස් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳව දඬුවම් නොලැබ සිටීමේ රටවල් අතරෙන් ඉහළම දහය අතරට පත්වේ.[186]දේශසීමා රහිත වාර්තාකරුවන්ගේ ( Reporters without Borders) සංවිධානයේ පුවත්පත් නිදහස පිළිබඳ වාර්ෂික දර්ශකය අනුව ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටවල් අතුරෙන් නරකම දර්ශකයක් පවතින රටකි. මෙම තත්වය 2005 සිට කැපී පෙනෙන ආකාරයෙන් පිරිහුන බවද එහි සඳහන්ය.[187] මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම නිසා ද්‍රෝහීන් ලෙස නම් කර මරණ තර්ජනවලට ලක්වීමෙන් තමන්ගේ සහ තම පවුල්වල ආරක්ෂාව ගැන බියෙන් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් විශාල සංඛ්‍යාවක් රට හැර ගොස් ඇත.[188]ජනමාධ්‍යවේදීන්ට එල්ල කළ ප්‍රහාර නිසා 2015 ජනවාරි මාසයේ නව ආණ්ඩුවක් පත් වන තෙක් ඔවුන් ස්වයං වාරණයක් පවත්වා ගැනීමේ වාතාවරණයක් පැවතිණ.

258. ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතනවලට එල්ල වූ ප්‍රහාර සැලකිල්ලට ගත් උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම ''වැරදිකරුවන් අප්‍රමාදව අධිකරණය හමුවට ගෙන ඒම සඳහා විමර්ශන කටයුතු කඩිනම් කළ යුතුයැයි'' නිර්දේශ කෙළේය.[189]

259. මරණ තර්ජන ලැබීමෙන් පසුව සහ මරණ තර්ජන ගණනාවක් ලැබීමෙන් පසුව අනෙකුත් ජනමාධ්‍යවේදින් මරා දමනු දැකීමෙන් පසුව රට අතහැර යෑමට සිදු වූ ජනමාධ්‍යවේදීන් කීප දෙනෙකු ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය මුණ ගැසිණ.[190]ආණ්ඩුව විවේචනය කරන්නේයැයි අදහස් කරන ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍යවලට සමහර විට අතුරු හමුදා කණ්ඩායම් සමග එක්ව ප්‍රහාර එල්ල කිරීමෙන්, සාක්ෂිකරුවන්ට සහ ආරක්ෂක හමුදා සමග සමීපයෙන් සිටි අයට පවා තර්ජන එල්ල වීම් පිළිබඳ චෝදනා ගණනාවක්ම ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබිණ.[191] අතුරුදහන් කාටූන් චිත්‍ර ශිල්පි එක්නැලිගොඩ සිද්ධිය සම්බන්ධයෙන් මෑතකදී හමුදා නිලධාරීන් කීප දෙනෙකු අත් අඩංගුවට ගැනීමෙන් වැනි වර්ධනයන්ගෙන් මෙවැනි සිද්ධීන්ට හමුදාවේ සම්බන්ධතාවයක් පවතින බව දැක්වේ. (බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධ පරිච්ඡේදය බලන්න.)

---

186 https://cpj.org/killed/asia/sri-lanka/ https://cpj.orgreports/road_to_justice2014-english.pdf

187 See the annual press freedom index by Reporters without Borders , http://en.rsf.org/press-freedom-index-2006.35.html

188 නිදසුනක් වශයෙන් අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එක්සත් ජාතීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා පලිගැනීම් පිළිබඳ මහලේකම් ගේ වාර්තා බලන්න. A/HRC/14/16 සහ A/HRC/21/18

189 LLRC report, para 3.152-5-156

190 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

191 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

260. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රහාර දීර්ඝ කාලයක් තිස්සේ පුළුල්ව සිදුවන බවත් මෙම කොමිටියේ මැන්ඩේට් බලයෙන් ආවරණය වන කාල පරිච්ඡේදය තුළ සහ ඉන් පසුවත් එවැනි දේ සිදු වූ බව සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ නායකයන් විවේචනය කරන බවට ප්‍රකට නිශ්චිත මාධ්‍යයන්ට නැවත නැවතත් ක්‍රමානුකූලව ප්‍රහාර එල්ල කරන බවත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සඳහන් කරනු කැමැත්තේය. අවස්ථා කීපයකදීම මාධ්‍ය සේවකයන්ට නිතර නිතර ප්‍රහාර එල්ල වුවත් ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දී නොමැති අතර මාධ්‍ය සේවකයන්ගේ ඝාතන ගැන කෙරෙන විමර්ශනවල සැලකිය යුතු ප්‍රගතියක් දක්නට නැති බවත් මෙම කොමිටිය සඳහන් කරයි.

261. පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය ලේඛන ගතකළ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් ගේ ඉලක්ක කර ගත් ඝාතන සිද්ධීන්ය.

***උදයන් පුවත් පත් කාර්යාලයට පහරදීම.***

262. යාපනයේ පළවන උදයන් පුවත් පත් කාර්යාලයට මෑතක් වන තෙක්ම සැලසුම් සහගත ප්‍රහාර ගණනාවක් එල්ල විය.[192] 2006 මැයි 2 වැනි දා යාපනයේ පුවත් පත් කාර්යාලයට ඇතුළු වූ දෙමළ කතා කරන තුවක්කුකරුවෝ එහි සේවකයන් දෙදෙනෙකු වන රංජිත් කුමාර් සහ සුරේස් කුමාර් මරා දැමූහ. තවත් දෙදෙනෙකුට තුවාල සිදු විය. පරිගණක සහ අනෙකුත් උපකරණවලට බරපතළ හානි සිදු කර ඇත. දෙමළ අතුරු හමුදා කණ්ඩායමක් වන ඊපීඩීපී නායක ඩග්ලස් දේවානන්දගේ කාටුන් චිත්‍රයක් ඊට පෙර දින උදයන් පුවත් පතේ පළවිය. කාර්යාලය හමුදා කඳවුරක් අසළම සහ හමුදා මුර පොළවල් අසළ පිහිටියත් ඝාතකයෝ මෝටර් සයිකලයක නැගී පලා යෑමට සමත් වූහ. මෙම ඝාතන සිදු කර ඇත්තේ හමුදාව පටලැවීමට සහ ආණ්ඩුව අපකීර්තියට ලක් කිරීමට බව විමර්ශන වලින් පෙනී යන්නේයැයි ආණ්ඩුව පැවසුවේය.[193] කෙසේ වුවත් යාපනයේ හමුදා බුද්ධි අංශය හා ඊපීඩීපී එකතුවී මෙම ප්‍රහාරය සැලසුම් කර ඇති අතර ප්‍රහාරය සිදු කරන ලද්දේ ඊපීඩීපී සාමාජිකයන් විසින්යැයි කෙරෙන චෝදනා ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇත.[194]

263. ආණ්ඩුවේ ආරංචි මාර්ග අනුව සැකකරුවන් පස් දෙනකු අත් අඩංගුවට ගෙන 2006 මැයි 3 දින යාපනය මහෙස්ත්‍රාත් වෙත ඉදිරිපත් කර ඇත. සාක්ෂි නොමැති නිසා ඔවුන් ඇප මත මුදා හරින ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊපීඩීපී සාමාජිකයෙකුගේ සම්බන්ධතාවයක් ගැන විමර්ශනය කළත් ''මෙම සිද්ධිය ගැන ඔහුට නඩු පැවරීමට තරම් වැදගත් තොරතුරු සොයා ගත නොහැකි විය'' යි පවසයි.

264. 2007 අප්‍රේල් 29 වැනි දා උදයන් පුවත් පතේ වාර්තාකරුවෙකු වන සෙල්වරාජා රජීවරම් සයිකලයකින් ගමන් කරමින් සිටියදී යාපනයේ හමුදා මුරපොළකට මීටර් 800 ක් පමණ දුරින් වූ ස්ථානයකදී වෙඩි තබා මරා දමා ඇත.[195] මෙම සිද්ධියේ විමර්ශන තොරතුරු ගැන නීතියෙන් පරිබාහිර ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරු කරන ලද විමසුම්වලට ආණ්ඩුවෙන් ප්‍රතිචාරයක් ලැබුණේ නැත. 2011 ජූලි 29 වැනි දා උදයන් පුවත් පතේ කර්තෘ ඥානසුන්දරම් කුගනාදන් කාර්යාලයේ සිට ආපසු නිවසට යනවිට බරපතළ ලෙස තුවාල ලැබුවේය. ආණ්ඩුවේ ආරංචි මාර්ග අනුව මෙම සිද්ධිය පිළිබඳව 2011 දී පුද්ගලයන් දෙදෙනකු අත් අඩංගුවට ගෙන නඩු පැවරීමක් නැතිව 2013 පෙබරවාරි 4 වැනි දා නිදහස් කර යවා ඇත.

265. උදයන් පුවත් පතට ප්‍රහාර එල්ල කළ අපරාධකරුවන් හඳුනා නොගත් අතර යොදා ගත් උපා මාර්ගයත් ශ්‍රී ලංකා නිරීක්ෂණ කමිටුවෙන් ලබා ගත් තොරතුරුවලිනුත් පෙන්නුම් කරන්නේ

---

[192] Special Rapporteur on Extrajudicial summary or arbitrary executions, Allegation Letter (Al) August 2007 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

[193] නීතියෙන් පරිබාහිර නඩු නොමැතිව හෝ හිතුවක්කාර ලෙස ඝාතනය කිරීම් පිළිබඳ විශේෂ සම්බන්ධීකාරකගේ ලිපියට ආණ්ඩුවේ පිළිතුර 2007 නොවැම්බර් 21

[194] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

[195] CPJ http://cpj.org/killed/2007/selvarajah-rajeewarnam.php

මෙම ප්‍රහාර ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් ක්‍රියාකරන අතුරු හමුදා කණ්ඩායම් විසින් සිදු කරන ලද බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේය යන්නයි.

***සන්ඩේ ලීඩර් ලසන්ත වික්‍රමතුංග***

266. 2009 ජනවාරි 8 දා ආණ්ඩුව ප්‍රබල ලෙස විවේචනය කරන ජනමාධ්‍යවේදියෙකු වූ සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග උදෑසන සිය කාර්යාලයට යන අතර තුර කොළඹ ප්‍රධාන වීදියක දී වෙඩි තබා ඝාතනය කරන ලදී.[196] මරණයට හේතුව තහවුරු කර නැත. ගුවන් තොටුපොළ අසළ අධි ආරක්ෂක කලාපයේ කාර්ය බහුල මංසන්ධියකදී ඔහුට පහර දී මරා දමන ලදැයි සමහර සාක්ෂිකරුවන් පවසන අතර තවත් අය ඔහුට වෙඩි තැබුවේයැයි කියති. මෙම කතුවරයාට අවස්ථා ගණනාවක දී මරණ තර්ජන එල්ල වී ඇති අතර කලින් ද පහර කෑමට ලක්වූවෙකි. මරණයට පසුව ප්‍රකාශයට පත් කළ කතු වැකියක ඔහු මෙසේ සඳහන් කරයි. '' මිනී මැරීම රජය නිදහස් නිදහස් පුවත් පත් පාලනය කිරීමට යොදා ගැනිමට අදහස් කරන ආයුධයයි......... කිසියම් දිනක මා මැරුවහොත් එසේ කරන්නේ ආණ්ඩුවෙනි.''

267. විමර්ශන කටයුතු ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුවෙන් (TID) ආපසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව ආණ්ඩුවේ ආරංචි මාර්ග පවසන නමුත් විමර්ශන කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන්නේ නැත. මෙම නඩුව 2015 සැප්තැම්බර් 18 නැවත කැඳවීමට නියමිතය. වින්දිතයා සිටින ස්ථානය සොයා ගැනීමට යොදා ගන්නා ලද සිම් කාඩ් ඇතුළුව මූලික සාක්ෂි නිසි ආකාරයට යොදා නොගැනීම ගැන මතුව ඇති චෝදනා මැද හමුදා නිලධාරීන් කීප දෙනෙකු අත් අඩංගුවට ගෙන නිදහස් කර ඇත.

268. වික්‍රමතුංග මහතාගේ ඝාතනයෙන් පසුව 2009 හමුදා මෙහෙයුම්වල අවසාන අදියරේ දී ශ්‍රී ලාංකික හමුදා භටයන් දෙමළ රැඳවුම්කරුවන් ඝාතනය කිරීම පිළිබඳවයැයි පැවසෙන වීඩියෝ පට ගැන ලිපි පළ කිරීමෙන් පසු සන්ඩේ ලීඩර් කර්තෘ මණ්ඩලයේ තවත් දෙදෙනෙකුට මරණ තර්ජන එල්ල විය. රතු තීන්තෙන් අතින් ලියන ලද ලිපිවල මෙසේ සඳහන්ව ඇතැයි පැවසේ. '' ආයිත් ලිව්වොත් උඹ මරා පෙති ගහනවා.'' ලසන්ත වික්‍රමතුංග මහතාට ද මරණයට පෙර මෙවැනිම රතු තීන්තෙන් ලියන ලද ලිපියක් ලැබී ඇත.''[197]

***මුස්ලිම් ආගමිකයන් නීති විරෝධීව ඝාතනය කිරීම***

269. 2002 සටන් විරාමයෙන් පසුව එල්ටීටීඊය නැගෙනහිර තම බලය ස්ථාපිත කර ගැනිමට උත්සාහ කිරීම නිසා මුස්ලිම් හා දෙමළ ජන වර්ග අතර ගැටුම් හට ගැනිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රහාර ගණනාවක් සිදු වූ අතර ඉන් අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල නීති විරෝධී ඝාතන සංඛ්‍යාවේ වැඩි විමක් දක්නට ලැබිණ.[198] 2004 දී කරුණා එල්ටීටීඊයෙන් ඉවත්වීමෙන් පසුව පාලනය ලබා ගැනීමේ බල අරගලය වඩාත් තීව්‍ර විය. මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයන් එල්ටීටීඊය සහ කරුණා කණ්ඩායමේ මෙන්ම සමහරුන් චෝදනා කරන ආකාරයට ආරක්ෂක හමුදාවලද ඝාතන ඉලක්ක බවට පත්විය. පහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට වාර්තා වූ සිද්ධීන්ගෙන් නිදසුන් කීපයකි.

270. 2005 නොවැම්බර් 18 වැනි දින අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තු මුස්ලිම් පල්ලියට උදෑසන යාඥා පැවැත් වෙන විට අත් බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. ඉන් හය දෙනෙකු මිය ගිය අතර තවත් 30 කට තුවාල සිදු විය. ඊට දින කීපයකට පෙර කරුණා කණ්ඩායම සමග සහයෝගයෙන් වැඩ කරන මුස්ලිම් පිරිසක් එල්ටීටීඊ කාර්යධරයන් දෙදෙනෙකු මරා දමන ලදැයි ආරංචියක් තිබිණ. මෙම ප්‍රහාරයේ වගකීම පැහැදිලිව තහවුරු නොවූ නමුත් එය මුස්ලිම් ප්‍රජාවවට එරෙහි එල්ටීටීඊයේ පලි ගැනීමක් විය හැකිය.[199]

---

[196] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[197] Special Rapporteur on Extrajudicial summary or arbitrary executions 6 November 2009
[198] ICG report, Sri Lanka's Muslims Caught in the Crossfire, 29 May 2007.
[199] E/CN 4/2006,Op cit. Report for the HRC Special Rapporteur on Conflict related human rights violations report , March 2006.

271. 2006 සැප්තැම්බර් 17 දින පොතුවිල් STF කඳවුර අසළ දී මුස්ලිම් කම්කරුවන් දහ දෙනෙකු කපා කොටා මරා දමා තිබිණ. මෙම ඝාතනවල වගකීම ගැන මතභේද පවතී. ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව අපරාධකරුවන් විශේෂ කාර්ය සාධක බලකාය විය හැකියැයි සිතන අතර ආණ්ඩුව එය මුස්ලිම් ප්‍රජාව සහ ආරක්ෂක හමුදාව අතර භේදයක් ඇති කිරීමේ අදහසින් එල්ටීටීඊය විසින් සිදු කරන ලදැයි කියයි. [200] මෙම ඝාතනය ද උදලාගම කොමිසම විසින් විමර්ශනය කරන ලද අතර විශේෂ කාර්ය සාධක බලකායට එරෙහි චෝදනා ප්‍රතික්ෂේප කර එල්ටීටීඊය අපරාධකරුවන් ලෙස හඳුනා ගෙන ඇත.

**ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් පස් දෙනෙකු ඝාතනය කිරීම.**

272. 2006 ජනවාරි 2 වැනි දා සවස දෙමළ විශ්ව විද්‍යාල සිසුන් නම දෙනෙකු ත්‍රිකුණාමලය වෙරළ අසළ ගාන්ධි ප්‍රතිමාව නම් ස්ථානයක එකතු වූහ.[201] මෙම ප්‍රදේශය හමුදා, පොලිස් සහ නාවික මුරපොළවලින් වට වූවකි. සවස 7.30 ට පමණ කොළ පැහැති ත්‍රිරෝද රථයකින් පැමිණි පිරිසකගෙන් කෙනෙකු දමා ගසන ලද අත් බෝම්බයකින් සිසුන් පස් දෙනෙකුට තුවාල සිදු විය. බෝම්බය ගැසීමෙන් පසු ත්‍රිරෝද රථය ආරක්ෂක හමුදා මුර පොළක් පසු කොට ශ්‍රී ලංකා යුද හමුදාවේ මූලස්ථානය දෙසට ගොස් ඇත. පසුව පොලිසියේ විශේෂ කාර්ය සාධක බලකාය එහි පැමිණ ඉතා සමීපයේ සිට සිසුන්ට වෙඩි කීපයක් තැබීමට පෙර ඔවුන්ට පහර දුන් බව පැවසේ. සිසුන් පස් දෙනෙකුගේ මළ සිරුරු රෝහලේ මෘතාගාරයට ගෙන යන ලද අතර අනෙක් සිසුන් දිවි ගලවා ගෙන ඇත්තේ මළ බව ඇඟවීමෙනි. ආරක්ෂක මුර පොළක් අසල සිටි පවුල්වල සාමාජිකයන් මෙන්ම මෙම සිද්ධිය දුටු බොහෝ දෙනකු අසල සිටියහ. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය රැස්කර ගත් තොරතුරු මත පදනම්ව සිසුන් පස් දෙනා ඝාතන කරන ලද්දේ විශේෂ කාර්ය සාධක බලකායේ නිලධාරීන් ඇතුළුව ආරක්ෂක හමුදා නිලධාරීන් යැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. මෙම සිද්ධිය නැවත වරක් යුක්තිය සහ වගවීම පරිච්ඡේදයේ වැඩි දුරටත් විස්තර කර ඇති ආකාරයට සිදුව ඇතැයි කියන අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දේශීය මට්ටමෙන් වගවීම සෙවීමේ දී ඇති බාධක පෙන්නම් කරයි.

**එල්ටීටීඊ දේශපාලන අංශයේ කාර්ධරයන් නීති විරෝධීව ඝාතනය කිරීම**

273. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය ලබා ගත් තොරතුරු අනුව 2004 සහ 2006 අතර කාලයේ දී මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල දේශපාලන කාර්යාලවල වැඩ කළ එල්ටීටීඊ දේශපාලන අංශයේ කාර්යධරයන්, කරුණා කණ්ඩායම ආරක්ෂක හමුදාවල අනුදැනුම ඇතිව සහ සමහර අවස්ථාවල ඔවුන් සමග සහයෝගයෙන් ඉලක්ක කර ගත් බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. බොහෝවිට මෝටර් සයිකල්වලින් පැමිණෙන ප්‍රහාරකයන් විසින් හෝ ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලදී ගරිල්ලා ආකාරයේ සැඟව සිට පහරදීමෙන් එල්ටීටීඊ දේශපාලන අංශයේ කාර්යධරයන් මරා දැමීමේ රටාවක් හෙළිවන අතර SLMM දූත මෙහෙය එවැනි සිද්ධීන් බොහොමයක් වාර්තා කර ඇත. එවැනි වඩාත් ප්‍රකට සිද්ධීන් පහත සඳහන් වේඃ

274. 2004 ජුලි 5 වැනි දා මෝටර් සයිකලයකින් පැමිණි නොහඳුනන ප්‍රහාරකයන් දෙදෙනෙකු මඩකලපුව එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක රාමලිංගම් පතමසීලන් හෙවත් සේනාධිරාජාට වෙඩි තැබූහ. තුවාලකරුවා වහාම මඩකලපුව මහ රෝලට ඇතුළත් කළ අතර පසුව මිය ගියේය. මෙම සිද්ධිය නගරයේ ජනාකීර්ණ ස්ථානයක සිදු වූ අතර සිද්ධිය දුටුවන් සිටිය නමුත් අපරාධකරුවන් හඳුනා ගෙන නැත. පොලිස් පරීක්ෂණ කීපයක් සිදු කළද කිසිවෙකු අත් අඩංගුවට ගෙන නැත. සාක්ෂි රැස් කිරීමක් ද සිදුව නැත. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු අනුව මෙම ඝාතනය කර ඇත්තේ කරුණා කණ්ඩායමට සම්බන්ධයැයි පැවසෙන පුද්ගලයන් දෙදෙනෙකු වන අතර ඔවුන් පැමිණ ඇත්තේ මඩකලපුව බන්ධනාගාරයේ

---

[200] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ. SLMM documentation Udalagama Commission report, University Teachers for Human Rights (UTHR) Special Reports 23 and No.25. ICG report Sri Lanka Muslims Caught in the Crossfire 29 may 2007

[201] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ SLMM ලේඛන

සිටය. එමෙන්ම මෙම අපරාධකරුවන් යුද හමුදාවේ බුද්ධි අංශය හා සම්බන්ධයැයි පැවසෙන අතර ඔවුන්ට ආයුධ තබා ගැනීමේ අවසරය වැනි වෙනත් සිරකරුවන්ට නැති වරප්‍රසාද හිමිව තිබිණ.

275. 2006 පෙබරවාරි 7 වැනිදා අම්පාර සහ මඩකලපුව එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක ඊ කෞශල්‍යයන් දෙමළ ජාතික සන්ධානයේ හිටපු පාර්ලිමේන්තු මංත්‍රීවරයෙකු වූ ආරියනායගම් චන්ද්‍රා නේරු සමග ටොයෝටා වෑන් රථයකින් පොළොන්නරුව මඩකලපුව මාර්ගයේ, ඒ 11 මාර්ගයේ ඕමන්තේ එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශයක සිට මඩකලපුව බලා ගමන් කරමින් සිටියේය[202]. ආසන්නයේම පිහිටි හමුදා මුර පොළේ සිට කි.මී. පහක් හෝ හයක් පමණ දුරක දී වෑන් රථයට වෙඩි ප්‍රහාරයක් එල්ල විය. ඔහු එම ප්‍රහාරයෙන් මිය ගිය අතර ආරියනායගම් චන්ද්‍රා නේරු පසුව මිය ගියේය. තවත් එල්ටීටීඊ කාර්යධරයන් සිවු දෙනෙකු ද මිය ගියහ.

**වෙනත් සිවිල් ජනතාව ඝාතනය කිරීම.**

කැබිතිගොල්ලෑවේ දී සිවිල් වැසියන් 64ක් ඝාතනය කිරීම.

276. 2006 ජුනි 15 වැනිදා උදේ 7.30 ට පමණ මගීන් 150 ක් රැගත් බස් රථයක් ආණ්ඩුවේ පාලනය යටතේ පැවති අනුරාධපුරය අසළ නගරයක් වූ කැබිතිගොල්ලෑවේ දී ක්ලේමෝර් බෝම්බ දෙකක ප්‍රහාරයකට ලක්ව ඇත.[203]බස් රථය වැඩට යන ගැමියන්, පාසල් සිසුන් හා අවමගුලකට සහභාගිවීමට යන පිරිසකගෙන් පිරී පැවතිණ. මූලික වශයෙන්ම සිවිල් වැසියන් යොදා ගන්නා එම මාර්ගයේ හමුදා කඳවුරු, හමුදා මුර පොළ, පොලිස් මුර පොළ හෝ ඉලක්ක විය හැකි වෙනත් හමුදා පහසුකම් අසළ තිබුණේ නැත. සියලුම මගීන් සිංහල ය. ප්‍රහාරයෙන් 64 දෙනකු මිය ගිය අතර 70 කට පමණ තුවාල සිදු විය. වින්දිතයන්ගෙන් 14 ක් ළමයින්ය. අපරාධකරුවන් බසය පැමිණෙන බව දැක උපරිම විනාශයක් සිදු කිරීමට සුදුසුම ස්ථානයේ දී බෝම්බ පුපුරුවා හැර ඇතැයි නිරීක්ෂකයෝ විශ්වාස කරති.

277. මෙම සිද්ධියට තමන්ගේ සම්බන්ධයක් නැතැයි පවසන එල්ටීටීඊය එය තමන් අපකීර්තියට ලක් කිරීමට වෙනත් කණ්ඩායමක් විසින් සිදු කරන්නට ඇතැයි සැක පහළ කරයි. සිංහල සිවිල් ජනතාව ඉලක්ක කර ගත් මෙම ප්‍රහාරය සිදු කර ඇත්තේ මෑතක දී උතුරු සහ නැගෙනහිර එල්ටීටීඊ පාලනයට යටත් ප්‍රදේශවල සිවිල් ජනතාව සහ එල්ටීටීඊ කාර්යධරයන් මරා දැමීමට පලි ගැනීමක් වශයෙන්යැයි ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු වලින් පෙන්නුම් කෙරේ. ''මෙම ප්‍රහාරය සිදු කිරීම ඇසින් දුටු සාක්ෂිකරුවන් කිසිවෙකු නොමැති නමුත් සියලු පරිවේශනීය සාධකවලින් ඊට එල්ටීටීඊ සම්බන්ධයක් පවතින බව පෙන්නුම් කරන්නේයැ''යි සිද්ධිය ගැන විමර්ශනය කිරීමට පත් කළ උදලාගම කොමිසම නිගමනය කරයි.

**මූතූර් අසළ වැඩියෙන්ම ගැහැනු ළමයින්ගෙන් යුත් කණ්ඩාමක් ඝාතනය කිරීම**

278. SLMM දූත මෙහෙය වන්නියේ ගිලන් රථවලින් ගමන් කරමින් සිටි සිවිල් වැසියන් ක්ලේමෝර් ප්‍රහාරවලට ලක්වීමේ සිද්ධීන් කීපයක් ගැන විමර්ශනය කර ඇත. 2007 නොවැම්බර් 27 වැනි දා ගිලන් රථයකින් ගමන් කරමින් සිටි 13 දෙනෙකු, ඉන් වැඩි දෙනෙකු වයස අවුරුදු 14 ත් 17 ත් අතරවූ ගැහැනු ළමයින්ය.) මලාවි ගමට කි.මී 7.5 ක් පමණ උතුරෙන් පිහිටි ස්ථානයක දී දුරස්ථ පාලකයකින් පුපුරුවා හරින ලද ක්ලේමෝර් බෝම්බ ප්‍රහාරයකට ලක් වූහ. එම කණ්ඩායම ගමන් කරමින් සිටියේ කිලිනොච්චියේ පැවැත්වෙන උත්සවයකදී ප්‍රථමාධාර ලබා දීමටය. එම ප්‍රහාරයෙන් 11 ක් මිය ගිය අතර ඉන් 8 ක් පාසල් ශිෂ්‍යාවන් ය. ලැබී ඇති තොරතුරු

[202] චන්ද්‍රා නේරු එල්ටීටීඊයට සම්බන්ධිත මානව අයිතිවාසිකම් සඳහා වූ උතුරුනැගෙනහිර මහලේකම් කාර්යාලයේ සාමාජිකයෙකි. (NESOHR)
[203] SLMM ලේඛන

අනුව දුරදිග ඔත්තුබැලීමේ මුර සංචාර මෙහෙයන්හි යෙදෙන යුද හමුදාවේ විශේෂ කාර්ය සාධක බලකායට මෙම ප්‍රහාරයේ වගකීම පැවරෙන්නේයැයි අනුමාන කළ හැකිය.[204]

**ධීවරයන් ඝාතනය කිරීම සහ පේසාලෙයි පල්ලියට පහර දීම:**

279. 2005 අග සහ 2006 වසරේදී යාපනය සහ මන්නාරමේ වයඹ දිග දිස්ත්‍රික්කවල සිවිල් ජනතාව නාවික හමුදාව සහ එල්ටීටීඊය අතර හමුදා මෙහෙයුම් වැඩිවීමෙන් පීඩාවට පත් වූහ.[205] මන්නාරම දිස්ත්‍රික්කයේ පේසාලේ අවට ප්‍රදේශයේ තත්වය පිරිහීම එම ප්‍රදේශයේ නතර කර සිටි නාවික හමුදාව සහ සිවිල් ජනතාව අතර උණුසුම්කාරී තත්වයක් ඇති වීමට හේතු විය. නාවික හමුදා නිලධාරීන් ගම් වටලා ගම් වැසියන් එල්ටීටීඊයට තොරතුරු ලබා දුන්නේදැයි විමසා තර්ජනය කිරීම් සහ පහරදීම් සිදු කළ බව වාර්තාවිය. එක අවස්ථාවක මුහුණු ආවරණය වන සේ කළු පටි බැඳගත් නාවික හමුදා සාමාජිකයෝ නිවෙස්වලට ඇතුළු වී කිසියම් පුද්ගලයන් ගැන විමසූ ආකාරය ඇසින් දුටු සාක්ෂිකරුවෝ පැවසූහ. [206]

280. 2006 ජූනි 17 දින අලුයම පේසාලේ අසළ මුහුදේ නාවික හමුදාව සහ එල්ටීටීඊ මුහුදු කොටි අතර ගැටුම් හට ගැනිණ.[207] මුහුදු කොටි නාවික හමුදාවේ බෝට්ටු තුනක් ගිල්වීම නිසා නාවික භටයන් අනතුරට පත් විය. පැය කීපයක් ඇතුළත පලි ගැනීමේ ක්‍රියාවක් සේ පෙනෙන ප්‍රදේශයේ ධීවරයන් හය දෙනෙකු වෙරළ අසළ සිටින්නේයැයි නාවික හමුදාව සහ පොලීසිය අනතුරු හඟවා ඇත. ඔවුන් වෙරළට පැමිණියේ ආරක්ෂක හමුදාවට පෙනෙන සේ තම හැඳුනුම්පත් ඔසවා ගෙනය. ඔවුන්ගෙන් සිවු දෙනෙකු වැල්ලේ දණ ගස්වා කටට වෙඩි තබා ඇත. මෙම අපරාධය සිදු කරන ලද්දේ නාවික හමුදාවේ දෙදෙනෙකු සහ පොලීසියේ දෙදෙනෙකුයැයි හඳුනා ගෙන ඇත.

281. පලි ගැනීමේ අරමුණෙන් ආරක්ෂක හමුදාවලින් එල්ල විය හැකි ප්‍රහාරවලින් බියට පත් 2000 ක පමණ සිවිල් වැසියන් සංඛ්‍යාවක් පේසාලේ ජයග්‍රහණයේ මෑනියන්ගේ පල්ලියට එක්රැස් වූහ. ලැබුණු තොරතුරු අනුව 08.00 ට එහි පැමිණි පොලිසියේ සහ නාවික හමුදාවේ නිලධාරිහු තාප්පයෙන් පිටත රැකවල් ලා ගත්හ. මේ අවස්ථාවේ පල්ලියේ මිදුලට පැමිණි සිවු දෙනෙකු ( එක් අයෙකු කොට කලිසමක් හා ටී ෂර්ට් එකක් ඇඳ සිටි අතර අනෙක් තිදෙනා කැලෑ නිල ඇඳුම්වලින් සැරසී සිටියහ.) පල්ලියේ බිත්ති, දොර සහ ජනෙල් වලට වෙඩි තැබීමට පටන් ගත්හ. නාවික හමුදා නිලධාරීන් බිම දිගාවී පල්ලියේ දොර සහ බිම අතර ඇති ඉඩ ප්‍රමාණයෙන් වෙඩි තැබීම නිසා පල්ලිය ඇතුළේ බිම වාඩි වී සිටි බොහෝ දෙනෙකුට තුවාල සිදු විය. නාවික හමුදා නිලධාරියෙක් ජනේලයක පියනක් ඇර ඒ තුළින් පල්ලිය ඇතුළට ග්‍රෙනේඩ් දෙකක් විසි කෙළේය. එක බෝම්බයක් ජනේලයේ ග්‍රිල් එකේ වැදී ආපසු විසි වූ අතර අනෙක පල්ලිය තුළට වැටීමෙන් එක් අයෙකු මිය ගිය අතර තවත් 47 කට තුවාල සිදු විය. ඉන් සමහර අයගේ තත්වය බරපතළ ය.

282. තම ප්‍රහාරය එල්ටීටීඊය ඉලක්ක කර ගත් බව නාවික හමුදාව පැවසුවත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු අනුව පල්ලිය තුළ තිබී ආයුධ කිසිවක් සොයා ගෙන නැති අතර තුවාල ලැබූ කිසිවෙකු එල්ටීටීඊ කාරයධරයන් ලෙස හඳුනා ගෙන නැත. තවදුරටත් මෙම කොමිටියට සිද්ධිය ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද විමර්ශනය ගැන තොරතුරුලබා ගැනීමට අවස්ථාවක් ලැබුණ අතර එහි අපක්ෂපාතී බව සහ විශ්වසනීයත්වය ප්‍රශ්න කිරීමට සාධාරණ හේතු පවතී. සිද්ධියවන අවස්ථාවේ ආරක්ෂක හමුදා විශාල සංඛ්‍යාවක් එම ස්ථානයේ සිටියද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එකද නාවික නිලධාරියෙකුගේ

---

[204] SLMM ලේඛන

[205] පහත පේසාලෙයි (මන්නාරම) පල්ලියට පහර දීම බලන්න.

[206] SLMM ලේඛන

[207] SLMM documentation; http://www.defence.lk/new.asp?fname=20060627_03

සම්බන්ධතාවයක් සොයා ගත නොහැකි විය. උදලාගම කොමිසමට මෙම සිද්ධිය ගැන විමර්ශනය කිරීමට බලය පවරා තිබුණ නමුත් ''කාලය නොමැතිවීමෙන් ඒ ගැන විමර්ශනය කිරීමට නොහැකි '' බව එහි අවසාන වාර්තාවේ දැක්වේ.[208]

**කයිට්ස් හි ගැමියන් 11 ක් ඝාතනය කිරීම**

283. 2005 මැයි 13 දින යාපනය අසළ කයිට්ස් දූපතේ අලෙයිපිඩ්ඩි, පුලියන්කුඩාල් සහ වෙන්ගලාඩි යන ගම්වලට ඇතුළු වූ හයත් දහයත් අතර කණ්ඩායමක් ළමයින් දෙදෙනෙකු ඇතුළත් 13 න් දෙනෙකු වෙඩි තබා මරා දැමූහ. මෙම අවස්ථා තුනේදීම නාවික හමුදාව නිවෙස්වලට ඇතුළුවී වෙඩි තබා ඇත. බරපතළම සිද්ධිය වාර්තා වූයේ ළමයින් දෙදෙනෙකු ඇතුළත් නම දෙනෙකු මරා දමන ලද අලෙයිපිඩ්ඩි වලිනි. පුලියන්කුඩාල් හි තවත් තිදෙනෙකු සහ වෙන්ගලාඩි එත් අයෙකු මරා දමා ඇත. තවත් කීප දෙනෙකුට තුවාල සිදුව ඇත. මෙම ප්‍රහාරය සිදුව ඇත්තේ දින දෙකකට පෙර නාවික හමුදා රථ පෙළකට එල්ටීටීඊ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමෙන් නාවික හමුදාවේ 18 දෙනෙකු මිය යෑමෙන් පසුවය. ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු අනුව මෙම ඝාතන නාවික හමුදාව විසින් සිදු කළ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී.[209]

**ඉලයතම්බි දර්ශනීට ලිංගික වධ හිංසා පමුණුවා මරා දැමීම.**

284. 2005 දෙසැම්බර් 16 දින යාපනය දිස්ත්‍රික්කයේ මදුත්තුවෙලි හි ඉලයතම්බි දර්ශනී (වයස 20) දැරිය තම නිවසෙන් මීටර් 300 ක් පමණ ඈතින් පිහිටි තම නැන්දනියගේ නිවසට යන විට චෝදනා කරන ආකාරයට නාවික හමුදාව විසින් පැහැර ගෙන ගොස් දූෂණය කිරීමෙන් පසු මරා දමා ඇත. ඇයගේ මළ සිරුර උරතෙව් මුරුගන් කෝවිල අසළ ළිඳක තිබී සොයා ගැනිමට හැනි විය.[210] පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව ගෙළ මිරිකා මරා දමා ඇති බවත් සිරුරේ ඇති තුවාල වලින් ඇය ලිංගික අපහරණයට ලක්ව ඇති බවත් පෙනේ. කයිට්ස් පොලීසියෙන් කරන ලද මූලික විමර්ශන වලින් පසුව වැඩි දුර පරීක්ෂණ කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත. මෙම නඩුව 2006 දී අවස්ථා කිපයකදීම කැඳවනු ලැබුව ද විභාගයට නොගෙන කල් දමා ඇත. 2006 ජුලි 12 දා පොලිසිය උසාවියට පැමිණියේ නැත.[211] ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ඉන්පසු නඩුව පිළිබඳ තොරතුරු කිසිවක් ලබා ගැනීමට නොහැකි වුවද නඩුව තවමත් පවතින බව ආරංචි මාර්ගවලින් පැවසේ.

**සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ දි නඩු විභාගයෙන් තොරව සිදු කරන ලදැයි පැවසෙන ඝාතන පිළිබඳ චෝදනා.**

285. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සන්නද්ධ ගැටුමේ අවසාන සතියේ දි මැයි 11 සිට 18 දක්වා කාලය තුළ ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් සිදු කෙළේයැයි සිතිය හැකි නීතියෙන් පරිබාහිර ඝාතන ගණනාවක් ගැන තොරතුරු රැස්කර ලේඛන ගත කර ඇත. සන්නද්ධ ගැටුමේ අවසාන මාස කීපය පුරාම එල්ටීටීඊ කාර්යධරයන් ගණනාවක්ම යටත්වීමෙන් පසු අල්ලා ගත් බවත් ඉන් පසුව ඔවුන් රඳවා ගැනීමේ මධ්‍යස්ථානවලට හෝ ''ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට'' පිටත් කළ බවත් ආණ්ඩුව අවධාරණය කරයි. කෙසේ වුවත් ලැබී ඇති තොරතුරු අනුව අවි බිම තැබීමෙන් පසුව සටනෙන් ඉවත් වූයේයැයි (hors de combat ) සැලකෙන සටන් කාර්යධරයන් ගණනාවක්ම අවි නොමැතිව ආරක්ෂක හමුදාවන්ට යටත්වීමෙන් පසුව නීති විරෝධීව මරා දමා ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. එමෙන්ම දේශපාලන අංශයට අයත් සහ ළමයින් ඇතුළුව තව දුරටත් සටන්වලට සෘජුවම

[208] උදලාගම කොමිසන් සභාවේ වාර්තාව
[209] SLMM documentation Amnesty International Op cit.

[210] SLMM documentation
[211] SLMM documentation

සහභාගි නොවන වෙනත් පුද්ගලයන් ද නීතියෙන් පරිබාහිරව ඝාතනයකළ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී.

286. පුද්ගලයන් ආරක්ෂක හමුදාවල අත් අඩංගුවට පත්වීමෙන් පසුව ඔවුන් එල්ටීටීඊ සටන්කරුවන්ද යන්න හෝ සටන්වලට ඍජු සම්බන්ධයක් නැති පුද්ගලයන්ද යනුවෙන් වෙනස් කිරීම අදාල වන්නේ නැත.

287. සන්නද්ධ ගැටුමේ අවසාන දවස්වල ස්ථාන දෙකකදී ඊනියා සුදු කොඩි රැගෙන චිත් යටත්වීම ඇසින් දුටුවන්ගෙන් ලබා ගත් තොරතුරු ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සතුව ඇත. ඉන් එකක් වන්නේ වෙල්ලමුලිවයික්කාල් වලට උතුරේ දී 53 සහ 59 වැනි ඩිවිෂණයට[212] 'භාරවීම ය.'' අනෙක දකුණේ වඩුවක්කාල් පාලම අසල දී 58 වැනි ඩිවිෂණයට භාර වීමය. පහතින් විස්තර වන්නේ ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට සිද්ධිය දුටු අයගෙන් ලැබුණු ප්‍රබල සහ එකිනෙකට ගැලපෙන තොරතුරු මෙන්ම නිශ්චිත පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් සම්බන්ධ ඡායාරූප සහ වීඩියෝ දර්ශන පදනම් සිද්ධීන් ය.

**බාලසිංහම් නඩේසන්, විනීතා නඩේසන් සහ සිවරත්නම් පුලිදේවන්**

288. එල්ටීටීඊය කිසි විටෙක යටත් නොවන බවට ප්‍රසිද්ධ ප්‍රකාශ කර තිබුණ ද[213] එල්ටීටීඊ සාමාජිකයන් ආණ්ඩුව සමග සහ අතර මැදියන් ගණනාවක් සමග දේශපාලන අංශයේ කාර්යධරයන් හා සන්නද්ධ අංශයේ සහ සන්නද්ධ නොවන අංශවල කාර්යධරයන්ගේ එකතුවක්යැයි විශ්වාස කළ හැකි අනෙකුත් අය සහ සටන්වලට ඍජු සම්බන්ධයක් නැති පුද්ගලයන් 'යටත්වීම' සඳහා සාකච්ඡාවල යෙදී ඇත.

289. එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයින්, එල්ටීටීඊ සාම මහ ලේකම් කාර්යාලයේ ප්‍රධානි සීවරත්නම් පුලිදේවන් සහ එල්ටීටීඊ දේශපාලන අංශයේ ප්‍රධානි බාලසිංහම් නඩේසන් 'යටත්වීම' සඳහා වූ තම සැලසුම් ගැන අතරමැදියන්ට දැනුම් දීමට පටන් ගත්හ. [214] යටත්වීමේ විස්තර පිළිබඳව විවෘතව සාකච්ඡා නොවූ නමුත් මැයි 13 වැනි දා සිට කිසියම් සැලසුම් කිරීමක් සහ සන්නිවේදනයක් ගැන නඩේසන්ට සහ පුලිදේවන්ට සමීපයෙන් සිටි සමහර කාර්යධරයන් දැන සිටින්නට ඇතැයි වාර්තාවේ.[215] මේ අවස්ථාව වන විට පුලිදේවන් සහ නඩේසන් වෙල්ලිමුලිවයික්කාල් හි, එල්ටීටීඊ පොලිස් ප්‍රධානි ඉලන්කො( රමේෂ්) නඩේසන්ගේ බිරිඳ විනිතා, නඩේසන්ගේ ආරක්ෂක ප්‍රධානි කන්ගන් සහ දේශපාලන අංශයේ වෙනත් කාර්යධරයන් සහ ඔවුන්ගේ පවුල්වල අය සමග සිටියහ.[216]

290. මැයි 13 වැනි දා සිට ඉදිරියට එල්ටීටීඊයට සම්බන්ධිත කණ්ඩායම් සහ පුද්ගලයන් ගේ 'යටත්වීම' සඳහා කොළඹ සහ විදෙස්වල සිටින අය සමග ඍජුව පැවති සාකච්ඡා සහ සන්නිවේදන දැක්වෙන ඇසින් දුටු අය පවසන විස්තර, එස් එම් එස් වාර්තා හා වෙනත් විස්තර ඇතුළත් තොරතුරු විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සතුව පවතී.

291. සාක්ෂිකරුවන් කීප දෙනෙකුගේ ප්‍රකාශ අනුව මැයි 14 සිට නඩේසන් සහ පුලිදේවන් අවි බිම තබා යටත්වීමට තමනුත් වෙනත් එල්ටීටීඊ කාර්යධරයනුත් අදහස් කරන බව අන්තර්ජාතික මෙන්ම දේශීය අතරමැදියන්ට දැනුම් දී ඇත.[217] මෙම අදහස එදිනම ජනාධිපතිගේ සොහොයුරු බැසිල් රාජපක්ෂට ද දැනුම් දී ඇත.[218] ඊට පසුව එදිනම නඩේසන් සහ පුලිදේවන් සමග

---

212 SLMM documentation

213 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ. http://www.livemint.com/Politics/hDu232kfgm0 Dr 1qvLoee00/LTTE-vows-nosurrender-to-Sri-LankanArmy-html

214 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

215 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

216 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

217 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

218 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

සම්බන්ධතා පවත්වන දෙමළ මංත්‍රීවරුන් එල්ටීටීඊය අවි බිම තබා සටන් නතර කළ බව බැසිල් රාජපක්ෂට දැනුම් දුන් බව පැවසේ.[219] යුද හමුදාව දැනටමත් ඒ ගැන දැනුම්දීම් කරන බවත් ජනතාව සුදු කොඩි ඔසවාගෙන හමුදාව දෙසට පැමිණිය යුතු බව දැක්වෙන පත්‍රිකා ගුවනින් හෙළන බවත් පවසමින් බැසිල් රාජපක්ෂ ඊට ප්‍රතිචාර දක්වූයේය.[220]

292. මැයි 16 හා 18 අතර කාලයේ දී විදෙස් අතරමැදියන් ගණනාවක්ම ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් සමග, මූලික වශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් පාලිත කොහොන, ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශක බැසිල් රාජපක්ෂ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග සන්නිවේදනය පහසු කිරීමට සම්බන්ධව ඇත. මෙම අවස්ථාවේ සන්නිවේදනයට ජ්‍යෙෂ්ඨ එ ජා නිලධාරින් සහ විදේශිය ජනමාධ්‍යවේදීන් වැනි අය ද ඇතුළත් වේ.

293. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අනුව, සැලසුම් කළ යටත්වීමේ ප්‍රදේශයට ස්වාධීන නිරීක්ෂකයන් යැවීමට අතරමැදියන් නොකඩවාම උත්සාහ කළ බවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සාමක්‍රියාවලිය සම්බන්ධීකරණය සඳහා වූ ලේකම් කාර්යංශය (SCOPP)[221] සහ වෙනත් අය ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් සමග විකල්ප කීපයක් ගැන සාකච්ඡා කළ බවත් සඳහන් වේ. වෙඩි තබනු ඇතැයි බියෙන් එල්ටීටීඊය SCOPP නිලධාරීන්ගේ නිරීක්ෂණය ප්‍රතික්ෂේප කළ අතර ස්වාධීන නිරීක්ෂකයන් ගේ නිරීක්ෂණයට කැමති වූයේය. ICRC නියෝජිතයන්ටද 'යටත්වීම' නිරීක්ෂණය කරන ලෙස ඉල්ලා සිටියද එවැනි ඉල්ලීමක් කිසි විටෙකත් කළ බවක් නොපෙනෙන්යැයි නිරීක්ෂකයෝ පවසති.

294. දෙමළ අතරමැදියෝ ද ගැටුම් පවතින ප්‍රදේශවලට ගොස් 'යටත්වීම' නිරීක්ෂණය කිරිමට ඉදිරිපත් වූහ. ආණ්ඩුව ආගමික නායකයන්ට එම ප්‍රදේශයට යැමට කටයුතු යොදා ඇති නිසා ආරක්ෂක හේතු මත ඔවුන් මෙම ප්‍රදේශයට යැම අනවශ්‍යයැයි ප්‍රතික්ෂේප කරන ලදී.[222] මෙම විකල්ප කිසිවක් ක්‍රියාත්මක වූයේ නැත. එල්ටීටීඊ කාර්යධරයන් උපදෙස්වලට අනුකූලව සුදු කොඩි ඔසවා ගෙන ආරක්ෂක හමුදා දෙසට සෙමින් ගමන් කරන්නැයි ආණ්ඩුවේ නිලධාරිහු අතරමැදියන්ට සරලව උපදෙස් දුන්හ.[223]

295. මැයි 16 වැනි දා ජනාධිපති රාජපක්ෂ හමුදා ජයග්‍රහණය ප්‍රකාශයට පත් කරන විට එල්ටීටීඊය ''සිදුවෙමින් පවතින සංහාරය වහාම නතර කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනිමට සූදානම්යැයි'' සඳහන් වන ප්‍රකාශයක් නිකුත් කොට ''මධ්‍යස්ථ අන්තර්ජාතික පාර්ශ්වයන් විසින් පහසුකරණය කරන දේශපාලන ක්‍රියාවලියකට ඇතුළුවීමේ සහ වාර්ගික ගැටලුවට අර්ථාන්විත විසඳුමක් සොයා ගැනීමේ නොසෙල්වන ස්ථාවරය නැවත අවධාරණය කෙරිණ.[224]

296. ඇසින් දුටු සාක්ෂිකරුවෙකු සඳහන් කරන ආකාරයට මැයි 17 වැනි දා ප්‍රාදේශය වේලාවෙන් පැය 06.00 හා 06.30 අතර කාලයේ නඩේසන් කතා කෙළේය. එවිට යටත්විම සඳහා එල්ටීටීඊ කාර්යධරයන් නිශ්චිත මාර්ගයක් ඔස්සේ ඉදිරි ආරක්ෂක වළල්ල දෙසට පැමිණිය යුතුයැයිද[225] සාමාන්‍ය ජනතාව ඔවුන්ගෙන් වෙන්ව ගමන් කළ යුතුයැයිද ඔහුට පවසා ඇත.[226]

297. මුලින්ම සාකච්ඡා යොමු වූයේ එල්ටීටීඊ කාර්යධරයන් සහ සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ගැන වුවත් මැයි 17 හා 18 අතර රාත්‍රි කාලයේ දී පුලිදේවන් දැනුම් දුන්නේ ඉහළ මට්ටමේ

---

219 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

220 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

221 SCOPP closed on 31 July 2009 http://www.peaceinsrilanka.lk/about.scopp

222 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

223 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

224 http://www.tamilnet.com/art.html?catid=13&artid-29381

225 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

226 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

කාර්යධරයන් තිදෙනෙකු, ''සාමාන්‍ය ක්‍රියාධරයන් 40 ක් හා සිවිල් වැසියන් 60 ක්'' යටත්වීමේ අදහසක් ගැනය.[227] ආරක්ෂක හමුදා දිගටම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන නිසා ඔවුන්ට උපදෙස් දුන් ආකාරයට සුදු කොඩි ඔසවා ගෙන පැමිණිය නොහැකි බව පුලිදේවන් සහ නඩේසන් අතරමැදියන්ට කීහ. අවස්ථා කීපයකදීම පුලිදේවන් සහ නඩේසන් සමග දුර කතනයෙන් කතා කරන විට පසුබිමේ කාලතුවක්කු වෙඩි හඬ සහ දරුණු සටන් පවතින බව අතරමැදියන්ට ඇසී ඇත.[228]

298. මැයි 17 සහ 18 රාත්‍රි කාලයේදීත් මැයි 18 අලුයම කාලයේත් අන්තර්ජාතික අතරමැදියන් කීප දෙනෙකු නඩේසන් සහ පුලිදේවන් යටත්විමට සූදානම්යැයි ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ට එස්එම්එස් පණිවුඩ මගින් දන්වා යවා ඇත.[229] මැයි 17 සහ 18 රාත්‍රි කාලයේ දී දේශපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ නායකයින්, විශේෂයෙන්ම නඩේසන් සහ පුලිදේවන් යටත්වීමට ආසන්න බව ආරක්ෂක හමුදාවන්ට සම්බන්ධිත ආරංචි මාර්ග දැන සිටියහ.[230]මැයි 18 වැනි දා අලුයම පුලිදේවන් සමග දුර කතනයෙන් සාකච්ඡා කරන විට පසුබිමෙන් දැඩි වෙඩි හඬ/ෂෙල් වෙඩි හඬ සාක්ෂිකරුවන්ට ඇසිණ.[231] අන්තර්ජාතික අතරමැදියන් අවසන් වරට පුලිදේවන් සමග සම්බන්ධතා පවත්වා ඇත්තේ මැයි 18 වැනි දා ප්‍රාදේශීය වේලාවෙන් 06.00 පමණය. එවිට තමා සිටින්නේ නඩේසන් සමග බවත් ඔවුන් දෙදෙනා බංකරයෙන් එළියට ඒමට සූදානම් බවත් පවසා ඇත.[232]

299. 2009 මැයි 18 වැනි දා ආරක්ෂක අමාත්‍යාංශය, එල්ටීටීඊ නායක ප්‍රභාකරන් ඇතුළු එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ නායකයන් කීප දෙනෙකු සටනේදී මරා දැමීම සහ ශ්‍රී ලංකාණ්ඩුව එල්ටීටීඊය පරාජය කොට ජයග්‍රහණය කිරීම විධිමත්ව ප්‍රකාශයට පත් කෙළේය. එමගින් රටේ මුළු භූමි ප්‍රදේශයේම පාලන බලය තහවුරු කර ගැනීමට හැකි වූ බව ද එහි සඳහන් විය. සන්නද්ධ සේවා නිල වෙබ් අඩවිය අනුව මැයි 18 වැනිදා 58 වැනි ඩිවිෂණය විසින් පුලිදේවන් සහ නඩේසන් ( කර්නල් රමේෂ් සමග) සටනේ දී මරා දමා ඇත.[233] එහෙත් ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සහ වෙනත් අය රැස්කර ගත් තොරතුරු අනුව එම සිදුවීම මීට වඩා වෙනස්ය. ඉහළ මට්ටමේ එල්ටීටීඊ නායකයන්ට සුරක්ෂිතව භාරවිය හැකි බවට ආණ්ඩුවෙන් සහතිකයක් ලබා දුන් නමුත් ඔවුන් වගවිභාගයක් නැතිවම මරා දමා ඇත.

300. නඩේසන් සහ පුලිදේවන් ආයුධ නැතිව ( සිවිල් ඇඳුමෙන්, සමහරු ඔවුන් ඇඳ සිටියේ සුදු කමීස සහ සරම්යැයි සඳහන් කරති.) සුදු රෙදි කැබැල්ලක් ( වේට්ටියක් විය හැකිය) ගැට ගැසූ කෝටුවක් සමග ආරක්ෂක හමුදාවට භාර වූ බව දුටු සාක්ෂිකරුවන් ගණනාවක්ම වෙන වෙනම ලබා දුන් ප්‍රකාශ ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇත. භාර වූ නිශ්චිත ස්ථානය සහ ඒ පිළිබඳ විස්තර එකිනෙකින් තරමක් දුරට වෙනස් වේ. පුලිදේවන් සහ නඩේසන් 2009 මැයි 18 වැනි දා උදෑසන මුල්ලිවයික්කාල් පාලමට මදක් උතුරෙන් වූ ස්ථානයක සිටිනු දුටු බව අඩුම වශයෙන් සාක්ෂිකරුවන් හය දෙනෙකු දැක ඇත. එම ස්ථානය ඒ 35 මාර්ගයේ වඩ්ඩුවකාල් පාලම දෙසට වන බව ඔවුන් සියලු දෙනාම එකසේ පවසති.[234]

301. සාක්ෂිකරුවෝ භාරවීමේ කණ්ඩායම් තුනක් ගැන විස්තර කරති: පළමු කණ්ඩායම පුලිදේවන් සහ නඩේසන්ගේ නායකත්වයෙන් ද, දෙවන කණ්ඩායම එල්ටීටීඊ පොලිස් ප්‍රධානි ඉලන්කො (රමේෂ්, මෙම නම ඉදිරි කොටස්වලදී සඳහන් වන කර්නල් රමේෂ් සමග වරදවා

---

[227] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[228] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[229] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[230] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[231] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[232] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[233] http://www.defence.lk/new.asp?fname=20090518_11
. http://www.defence.lk/new.asp?fname=20090518_09
. http://www.defence.lk/new.asp?fname=20090621_02.TerrList_

[234] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

හඳුනා නොගත යුතුය.) සාක්ෂිකරු සහ තවත් එල්ටීටීඊ කාර්යධරයන් දෙදෙනෙකු ද, තුන්වැනි කණ්ඩායම කාර්යධරයන් සිවු දෙනෙකුගෙන් ද සැදුණි.[235] ඒ සියලු දෙනාම නිරායුධව සුදු කොඩි රැගෙන ගියහ. පළමු කණ්ඩායමේ සුදු කොඩිය රැගෙන ගියේ නඩේසන් ය. දෙවන කණ්ඩායමේ සුදු කොඩිය ගෙන ගියේ ඉලන්කෝ ය( රමේෂ්) එක් එක් කණ්ඩායම අතර මීටර් 20- 25 ක දුර ප්‍රමාණයක් තිබිණ. නඩේසන්, ඔහුගේ බිරිඳ විනිතා, පුලිදේවන් සහ තවත් හඳුනා නොගත් පුද්ගලයෙකු වඩුවකාල් ප්‍රදේශයේ පාලමට උතුරෙන් භාර වනු සාක්ෂිකරුවන් දැක ඇත. ඔවුන් යුද හමුදාවේ නිල ඇඳුමෙන් යුත් හට පිරිසක් විසින් වටලා ගනු ලැබිණ.[236] සාක්ෂිකරුවන් තිදෙනෙකු වෙන් වෙන් වශයෙන් ඔවුන් මැයි 18 වැනි දා පාලමට දකුණෙන් පුලිදේවන්ගේ සහ නඩේසන්ගේ ( එක් සාක්ෂිකරුවෙකු විනිතා නඩේසන්ගේ මළ සිරුර ද ඒ අතර දැක ඇත.) මළ සිරුරු දුටු බව කියති.[237]

302. මළ සිරුරු සමූහයක උසස් විභේදනයකින් යුත් විද්‍යුත් ඡායා රූප ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සතුව පවතී. ඒවායින් පැහැදිලිවම හඳුනාගෙත හැකි පුලිදේවන්, නඩේසන් සහ විනිතා නඩේසන්ගේ මළ සිරුරු මෙන්ම තවත් හඳුනාගත හැකි එහෙත් කාගේදැයි නොදන්නා මළ සිරුරු ගණනාවක් දැකිය හැකිය. තරුණියකගේ මළ සිරුරක් පැහැදිලිව දැකිය හැකි නමුත් ඇගේ මුහුණ ඡයාරූපයට හසුව නැත.[238] අධිකරණ ව්‍යාධි විද්‍යාඥයන් පවසන ආකාරයට වර්ණ සංඛ්‍යාංක ඡායාරූප සියල්ල සිරුරු සමූහ, එක් එක් සිරුරු සහ හිස සහ උරහිස ඇතුළත්වන ආධුනිකයන් විසින් ගත්තේයැයි කිව හැකි ඒවාය. ඒවා ආධුනික ස්වභාවයේ වුවද බොහෝ තුවාල, රුධිරය ගලායෑම් රටාව, ඇඳුම් එහා මෙහා වීම් සහ පශ්චාත් මරණ වෙනස්කම් දක්වෙන ඡයාරූප වේ. මෙම ඡායාරූපවල විභේදනය විශේෂයෙන්ම එකම දර්ශනය විවිධ කෝණවලින් රූගත කිරීම්, වෘත්තීය විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත්ය. කිසිම අවස්ථාවක සිරුරේ සම්පූර්ණ මතුපිට සිරුරේ ඇති තුවාලවල සමස්තයම ආවරණය වන සේ ඡායාරූප ගතකර නැති නිසා එම ඡායාරූප වලින් ලබා ගත හැකි තොරතුරු අනිවාර්යෙන්ම අසම්පූර්ණය. කෙසේ වුවත් ඡායාරූපවල සටහන්ව ඇති තුවාල පැහැදිලිවම දැකිය හැකි අතර ඒවා ප්‍රතික්ෂේප කළ නොහැකිය.

303. මෙම ඡායාරූප පදනම්ව කරන ලද ගණනය කිරීම් අනුව සිරුරු දුසිමක් පමණ පෙළට තබා ඇති බව පෙනේ. ඒ අසළ බිම අතුරා ඇති ප්ලාස්ටික් කොළ වලින් පෙනී යන්නේ මෙය මරණය සිදු වූ ස්ථානය නොව රැස්කර ගත් මළ සිරුරු තාවකාලිකව තැබීමේ ස්ථානයක්ය යන්නයි. එක සිරුරක් (නඩේසන්ගේ) යට ඇති පැදුරෙන් එය එම සිරුර මෙම ස්ථානයට ගෙන ඒමට යොදා ගත් බව පෙනේ. පිරිමි සිරුරු සියල්ලේ තිබුණේ යට ඇඳුම් පමණි. එක සිරුරක් ආසන්නයේ කෘත්‍රිම පාදයක් තිබිණ.[239] දිප්තිමත් පැහැති රෙදි කැබලිවලින් සිරුරු ආවරණය කර තිබුණ අතර සමහර ඒවා සිරුරු වටා ඔතා තිබිණ.

304. ඡායාරූපවලින් මරණය සිදු වූ වේලාව නිවැරදිව තීරණය කිරීමට හෝ මරණයට හේතුව නිගමනය කළ නොහැකි වුවත් නඩේසන් සහ පුලිදේවන්ගේ සිරුරුවලට අදාල වොහාරික නිරීක්ෂණ වලින් පෙන්නුම් කරන නිගමන වන්නේ පහත සඳහන් ඒවාය: නඩේසන්ගේ මරණයට හේතුව ඔහුගේ උඩුකය ඉදිරි පසට වැදුණු වෙඩිල්ලක් හෝ සමහරවිට වෙඩි තුනක් බව ඔහුගේ සිරුරේ ඡායාරූපයෙන් පෙනේ. පුලිදේවන් සම්බන්ධයෙන් ඔහුගේ සිරුරේ උඩු කොටසට පිටු පසින් ඇතුළු වී ඉදිරි පසින් පිට වූ වෙඩි පහරින් සිදු වූ තුවාල රැසක් සහ අත් දෙකටම වෙඩි පහරින් තුවාල සිදුව ඇති බවත් විශ්ලේෂණය කිරීමේ දී හඳුනා ගත හැකිය. උඩුකයට පිටු පසින් ඇතුළුවී ඉදිරි පසින් පිටවූ වෙඩි පහර ගණනාවකින් තුවාල සිදුවීමෙන් හා දකුණු අත කරකවා පිටු පසට කර තැබීමෙන් දකුණු අතට ද එම වෙඩි පහරවලින් තුවාල සිදුව ඇති බව පෙන්නුම් කරයි. වම් අතේ මැණික් කටුව ප්‍රදේශයේ තද රතු පැහැති සීරීම් සලකුණු බැඳ තැබීමෙන් සම මතු පිට ඇති වූ ඒවා විය හැකි බව විශ්ලේෂණයේ දි පෙනී යයි. සමස්තයක් ලෙස ගත් විට තුවාල සිදුව ඇති රටාව විශ්ලේෂණයේ දී අත් පිටු පසට කර තැබීමෙන් පසු වෙඩි ගණනාවක්

235 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

236 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

237 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

238 ඡායාරූපයේ තරුණිය පෙනෙන්නේ අඩ වශයෙනි.

239 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

එල්ල කර ඇති බව දක්වයි. ඡායාරූප වොහාරික විශ්ලේෂණයකින් මෙන්ම වීඩියෝ දර්ශන, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන සහ විවෘත මූලාශ්‍ර අනුව එල්ටීටීඊ ජ්‍යෙෂ්ඨ නායකයන් වන බාලසිංහම් නඩේසන් සහ සීවරත්නම් පුලේන්ද්‍රන් මෙන්ම නඩේසන්ගේ බිරිඳ විනිතා මැයි 18 වැනි දා 06.00 ට පසුව කිසියම් වේලාවක ආරක්ෂක හමුදා විසින් ඝාතනය කරන ලදැයි සැලකීමට සාධාරණ හේතු පවතින බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නිගමනය කරයි.[240] කෙසේ වුවත් සිදු වූයේ කුමක් ද හා ඝාතනවලට වගකිව යුත්තේ කවුද යන්න තීරණය කිරීමට සියලු කරුණු ගැන පූර්ණ විමර්ශනයක් කළ යුතුය.

305. සාක්ෂිකරුවන් පවසන ආකාරයට ආයුධ රහිතව, සිවිල් ඇඳුම් ඇඳ ගෙන සහ සුදු කොඩි වනමින් ආණ්ඩුවේ උපදෙස්වලට අනුකූලව ආරක්ෂක හමුදා දෙසට සෙමින් ගමන් කිරීමෙන් එල්ටීටීඊ දේශපාලන නායකයන්ගේ භාරවීමේ අදහස පැහැදිලිවම පෙන්නුම් කරයි. ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කල් වේලාව ඇතිව සටන් බිමේ හමුදාවන්ට දැනුම් දීම සඳහා එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයන්ගේ භාරවීමේ අදහස පිළිබඳව අවශ්‍ය දැනුම ශ්‍රී ලංකාණ්ඩුව සතුව තිබුණ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය විශ්වාස කරයි. භාරවීම ස්වාධීනව නිරීක්ෂණය කිරීමට ඉඩ සලසන ලෙස කීප අවස්ථාවකම දිගින් දිගටම උත්සාහ ගත් නමුත් ආණ්ඩුව ඒවා ප්‍රතික්ෂේප කෙළේය.

තම්බිරාසා තුරෙයිරාජසිංහම් හෙවත් කර්නල් රමේෂ්

306. එල්ටීටීඊ අණදෙන්නා තම්බිරාසා තුරෙයිරාජසිංහම් හෙවත් කර්නල් රමේෂ් සිවිල් ඇඳුම් ඇඳගෙන ආයුධ රහිතව කුඩා දරුවෙකුත් වඩා ගෙන වඩුවවක්කාල් පාලමට උතුරෙන් පාරේ සිටි බවත් පාලම හරහා ගමන් කරමින් සිටි බවත් විස්තර කරන සාක්ෂිකරුවන් කීප දෙනකුගේ ප්‍රකාශ ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට ලැබී ඇත.[241] මැයි 18 වැනි දා පැය 07.00 ට පමණ කර්නල් රමේෂ් සිය ඥාතීන් සමග වඩුවවක්කාල් පාලමේ දකුණු පැත්තේ ඇති හමුදා මුර කපොළු පසු කොට පාලම හරහා ගොස් වෙනත් සිවිල් ජනතාව දහස් ගණනාවක් රඳවා ඇති ප්‍රදේශයට ගිය බව සාක්ෂිකරුවෝ පවසති.[242]එහිදී යුද හමුදාවට වැඩ කරන, හමුදා බුද්ධි අංශයේ දෙමළ නිලධාරීන් ඔහු හඳුනාගෙන ඔහු වෙත පැමිණ ඇත.[243] සාක්ෂිකරුවන් දෙදෙනෙක් වෙන වෙනම හමුදා බුද්ධි අංශයේ නිලධාරියෙකු ( එල්ටීටීඊයේ සිට පසුව යුද හමුදාවට තොරතුරු සපයන්නෙකු බවට පත්) නමින් හඳුනා ගත්හ.[244] මෙම බුද්ධි අංශයේ නිලධාරියා රමේෂ් සහ පිරබා හොඳින් දන්නා කරුණා පාර්ශ්වයේ කාර්යධරයෙකු මෙන්ම කර්නල් රමේෂ්ගේ කණ්ඩායමත් සමග සිටි නැගෙනහිර එල්ටීටීඊ කාර්යධරයෙකු- බව සාක්ෂිකරුවෙක් හඳුනා ගත්තේය.[245] මෙම බුද්ධි නිලධාරියා පිරබා ගේ කලින් සිටි පෞද්ගලික ආරක්ෂක භටයෙක්යැයි අනෙක් සාක්ෂිකරු කියයි.[246]යුද හමුදා සහ බුද්ධි නිලධාරීන් රමේෂ් සහ පිරබා කැඳවා ගෙන ගිය බව සාක්ෂිකරුවෝ දෙදෙනාම පවසති.[247]පාලම හරහා ගිය ඥාතීන්ට ඉන් පසු කිසි දිනක ඔවුන් දෙදෙනා හමුව නැත.

307. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශනවලට අමතරව කර්නල් රමේෂ් ජීවතුන් අතර සිටි බවත් ඔහු ආරක්ෂක හමුදාවේ ප්‍රශ්න කිරීම්වලට ලක් වූ බවත් දක්වෙන ඡයාරූප සහ වීඩියෝ පට මෙන්ම ඔහු නීතියෙන් පරිබාහිරව මරා දමන ලද බව පැහැදිලිව දක්වෙන මළ සිරුරේ දර්ශන ශ්‍රී ලංකා විමර්ශන කොමිටියේ පරික්ෂාවට ලක් විය. මෙම ඡායාරූප ස්වාධීන වොහාරික විශේෂඥයෙකු විසින්ද නිරීක්ෂණය කරන ලදී.

[240] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[241] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[242] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[243] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[244] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[245] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[246] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ
[247] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

308. ලැබී ඇති තොරතුරු අනුව සිද්ධි මාලාවේ අනුපිළිවෙළ ස්ථිරවම තහවුරු කළ නොහැකි නමුත් ඡායාරූප සහ වීඩියෝ තොරතුරු අනුව සිවිල් ඇඳුමෙන් සිටි කර්නල් රමේෂ් රැඳවුම් ප්‍රදේශයේ දී ඔහුගේ පවුලේ සාමාජිකයන්ගෙන් වෙන් කොට හමුදා වාහනයකින් ගෙන ගොස් කිසියම් අවස්ථාවක දී ඇඳුම් මාරු කිරීමට සැලසූ බව පැහැදිලිය. සමහර ඡායාරූප වල ඔහු කොළ පැහැති හමුදා නිල ඇඳුමකින් සිටි අතර තවත් ඒවායේ පෙනි සිටියේ එල්ටීටීඊ කැලෑ ඇඳුම්වල කලිසමකිනි. එක වීඩියෝ දර්ශනයක ඔහුව ස්ථාන කීපයකදීම ආරක්ෂක හමුදා විසින් දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ප්‍රශ්න කරනු දක්වෙන අතර එක් අවස්ථාවක ඔහුගේ කමිසය ඉවත් කොට උර හිස ප්‍රදේශයේ තුවාලයකට බෙහෙත් දමා බැඳ ඇති ආකාරය දක්වේ.

309. අමතර ඡායාරූපවලින් කොළ පැහැති නිල ඇඳුමකින් සැරසී සිටින කර්නල් රමේෂ්ගේ මළ සිරුරත් ඔහුගේ හිසේ වම්පසින් ඇතුළු වූ උණ්ඩයක් නිසා ගලා යන රුධිරය සහ දකුණු පැත්තෙන් විශාල සිදුරකින් එම උණ්ඩය පිටවූ ආකාරය සහ ඔහුගේ නිල ඇඳුමේ ලේ සහ මස් වැදලි වැටී ආකාරයත් දක්වේ. බිම ලේ තැවරී නොතිබීමෙන් හා සිරුර තිබූ ආකාරයෙන් වෙනත් ස්ථානයකදී වෙඩි තබා මරා ඡායාරූපය ගත් ස්ථානයට ඇදගෙන ඇවිත් තිබෙන බව පෙනේ. ස්වාධීන වොහාරික විශේෂඥයෙකුගේ ප්‍රකාශයක් අනුව මෙම ඡායාරූපවලින් හිසට තැබූ එක වෙඩි පහරකින් මරා ඇති බව පෙන්නුම් කරයි. ඡයාරූපයේ සඳහන් විස්තර අනුව එය ගෙන ඇත්තේ 2009 මැයි 22 වැනි දා ය. කෙසේ වුවත් මෙය විමර්ශනය කොට තහවුරු කළ යුතුය.

310. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සහ ඡායාරූප සහ වීඩියෝ දර්ශන අනුව ටී තුරෙයිරාජසිංහම් නොහොත් එල්ටීටීඊයේ කර්නල් රමේෂ් ජීවතුන් අතර සිටි බවත් සාක්ෂිකරුවන් 2009 මැයි 18 දින ඔහු ආරක්ෂක හමුදා අත් අඩංගුවේ සිටි බව දකීමත්, 2009 මැයි 18 සහ 22 අතර කාලයේ දිනක ඔහු නීතියෙන් පරිබාහිරව මරා දමන තෙක් ආරක්ෂක හමුදා අත් අඩංගුවේ සිටි බවත් විශ්වාස කිරීම තහවුරු කිරීමට ප්‍රමාණවත් නිවැරදි තොරතුරු පවතින බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට පෙනේ.

311. බාලචන්ද්‍රන් ප්‍රභාකරන්

312. වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ 12 හැවිරිදි පුත් බාලචන්ද්‍රන් ප්‍රභාකරන් පණ පිටින් බංකරයක් තුළ වාඩි වී සිටින ආකාරයත් ඔහු ශ්‍රී ලංකා හමුදවේ භට කණ්ඩායමක අත් අඩංගුවේ පසුවන බව මෙන්ම අඩ නිරුවත් මළ සිරුර සමග බාලචන්ද්‍රන්ගේ මළ සිරුර බිම තිබෙන ආකාරයත් දක්වෙන ඡායාරූප සහ වීඩියෝ දර්ශන ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය සතුව ඇත. මෙම ඡායාරූප නිරීක්ෂණය කළ ස්වාධීන වොහාරික ව්‍යවඡේද විශේෂඥයන්ගේ තක්සේරු කිරීම් අනුව බාලචන්ද්‍රන්ගේ පපුවට තබන ලද වෙඩි පහකින් ඔහු මැරී ඇත. දැලි ගැවුණ බව පෙනෙන වෙඩි පහරක තුවාලයකින් වෙඩි තබා ඇත්තේ සෙ.මී. 60 – 90 වැනි දුරකින් තිබූ ආයුධයකින් බව පෙනේ.[248] බාලචන්ද්‍රන් පණ පිටින් සිටි බවත් ඉන් පසු වෙඩි උණ්ඩ සහිත සිරුර දුටු බවත් සාක්ෂිකරුවෙකු දැක ඇත. නමුත් බාලචන්ද්‍රන් මරා දමනු ඔහු දැක නැත.[249]

313. ප්‍රභාකරන්ගේ පුතා මිය ගොස් ඇත්තේ සටන්වලට මැදි වීමෙන්යැයි ශ්‍රී ලංකා අධිකාරීහු පවසති.[250] බාලචන්ද්‍රන් ප්‍රභාකරන් අල්ලා ගෙන හෝ ආරක්ෂක හමුදා අත් අඩංගුවට ගෙන පසුව නීතියෙන් පරිබාහිරව ඝාතනය කළ ආකාරයෙන් මරා දමා ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට පෙනේ.

**ශොබානා ධර්මරාජා නොහොත් ඉසිප්‍රියා**

---

248 http://www.dailymail.co.uk/news/article-2113459/Sri-Änka-government-executed-civilians-war-Tamil-Tigers.html

249 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

250 http://www.defence.lk/new.asp?fname=Balachandran_on_Sale_20130221_09

314. සුප්‍රකට එල්ටීටීඊ ප්‍රවෘත්ති නිවේදිකාවක් වන ඉසිප්‍රියා ඡායාරූප සහ වීඩියෝ දර්ශන ගණනාවකින් ඇය අත් අඩංගුවට ගෙන ඇති බවත් පසුව ඇය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් මරා දමා ඇති බවත් දැකිය හැකිය. සාක්ෂිකරුවන් ඇය මැයි 18 වැනිදාට පෙර සතියේ අවස්ථා කිපයකදී දැක ඇත.[251] ඇය මැයි 18 වැනි දා යුද හමුදාවේ භටයන් විසින් වඩුවකාල් පාලමට උතුරෙන් නන්දිකඩාල් කලපුවේ වගුරු ප්‍රදේශයක දී කලපුවේ නිරායුධව තනිවම සිටියදී පණ පිටින් අත් අඩංගුවට ගැනීම සාක්ෂිකරුවන් දැක ඇත.[252] ආරක්ෂක හමුදා නිල වෙබ් අඩවිය සඳහන් කරන ආකාරයට මැයි 18 වැනි දා ඉසිප්‍රියා 53 වැනි ඩිවිෂණයේ භටයන් විසින් මරා දමා ඇත.[253]

315. ආරක්ෂක හමුදාවෙන් ඉසිප්‍රියා නන්දිකඩාල් කලපුවෙන් ගොඩ ගැනීමත් ඇය ප්‍රභාකරන් ගේ දුවයැයි ඔවුන් රැවටුණ ආකාරයත් දැක්වෙන සාක්ෂිකරුන්ගේ ප්‍රකාශ සමග ගැලපෙන ඡායාරූප සහ වීඩියෝ පට ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නැරඹුවේය.[254] ඉසිප්‍රියා කාකි/කොළ පැහැති කලිසමක් සහ සමේ පාට තනපටයක් ඇඳ සිටි බව වීඩියෝ පටයෙන් දැකිය හැකිය. හමුදා භටයින් ඇයට උඩුකය වසා ගැනීමට සුදු රෙද්දක් දෙන බවත් සාමාන්‍යයෙන් ගරු කටයුතු ලෙස හැසිරෙන බවත් වීඩියෝ පටියෙන් පෙනේ. අනෙක් ඡායාරූපවල ඉසිප්‍රියා සුදු රෙද්දක් ඔතාගෙන වාඩි වී හෝ තවත් තරුණියක් සමග බිම වැතිර සිටිනු දැකිය හැකිය.[255]ඊට හාත් පසින්ම වෙනස්ව වෙනත් දර්ශන. වීඩියෝ පට මෙන්ම ඡායාරූපවල ඉසිප්‍රියාගේ මළ සිරුර පිරිමි සිරුරු රැසක් අතර, (බොහොමයක් නිරුවත්, ඇස් බැඳ අත් පිටු පසට තබා බැඳ ඇති,) දැකිය හැකිය. මෙම වීඩියෝ පටයේ ඉසිප්‍රියාගේ ඉහළ කලවා, ලිංගේන්ද්‍රිය සහ යටි බඩ නිරාවරණය වන ආකාරයට කලිසම පහතට ඇද ඇත. ඇගේ බඩ ප්‍රදේශය දූන් ලේ තැවරුණ සුදු රෙද්දකින් වැසී ඇති අතර ඇගේ පියයුරු නිරාවරණය වන ආකාරයට තන පටය ඕනෑකමින්ම පහතට ඇද දමා ඇත. ඇගේ අත් පිටුපසට කර බැඳ ඇති බවක් පෙනේ. අනෙක් වින්දිතයන්ගේ මෙන් ඇස් වසා බැඳ ඇති රෙදි කැබැල්ලක් ඇගේ සම්පූර්ණ මුහුණම නිරාවරණය වන ආකාරයට ඇද දමා ඇති බවක්ද පෙනේ.

316. ඡායාරූප සහ වීඩියෝ පට ස්වාධීන වොහාරික පරීක්ෂණ වලින් ඉසිප්‍රියාගේ හිසට වෙඩි තබා ඇති බව දැක්වේ. ඡායාරූපයෙන් ඇගේ සිරුර දැක්වෙන ආකාරයට උණ්ඩය නළල් තලයේ වම් පසින් පිටවීමේ තුවාලය පමණක් දැකිය හැකිය. හිස් කබලේ කැබලි සහ එළියට පැන ඇති මොලය ද දැකිය හැකිය. වීඩියෝ පටි, ඡායාරූප සහ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන පදනම්ව ආරක්ෂක හමුදා ඉසිප්‍රියා පණ පිටින් අල්ලා ගත් බවත් ඉන් පසුව ඇයගේ හිසට වෙඩි තබා සාහසික ආකාරයෙන් මරා දමා ඇති බවත් විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටියට පෙනේ. වැඩි දුරටත් ඉසිප්‍රියාගේ මළ සිරුරේ දර්ශන හා අනෙකුත් බොහෝ ගැහැනුන්ගේ මළසිරුරු අනුවත් ඉසිප්‍රියාගේ මළ සිරුර කෙලෙසා ඇති බව ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය විශ්වාස කරයි.

**සිදුවූයේයැයි කියන නීතියෙන් පරිබාහිර අනෙකුත් ඝාතන.**

317. පිරිමින් ගේ සහ ගැහැනුන්ගේ. සමහරුන් එල්ටීටීඊ නිල ඇඳුම් වලින්, සමහරුන් ඇස් බැඳ ඇති හා අත් පිටු පසට කර බැඳ ඇති, සමහරුන් සිවිල් ඇඳුමෙන්, සමහරුන් නිරුවත්ව සිටින මළ සිරුරුවල වීඩියෝ පටි සහ ඡායාරූප ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය නිරීක්ෂණය කර ඇත. සමහර මළ සිරුරු වයසින් අඩු අයගේ බව පෙනේ.

318. ඡායාරූපවල වෝහාරික පරීක්ෂණ අනුව හිසට වෙඩි තැබීමෙන් මරා දමා ඇති බවට සලකුණු දිගටම දක්නට ඇත. පහත සඳහන් සිද්ධීන් තුන නියෝජනාත්මක සිද්ධීන්වලට නිදසුන්

[251] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

[252] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

[253] http://www.defence.lk/new.asp?fname=20090621_02.TerrList_

[254] Presented by Callum Merae and Channel 4 Ispriya capture. No Fire Zone

[255] මූලාශ්‍රය වාර්තාවේ

වශයෙන් ඉදිරිපත් කෙරේ. මෙම සිද්ධීන්වලට අදාල ඡායාරූප සහ වීඩියෝ පටයන්හි වින්දිතයන් ආරක්ෂක හමුදා අත් අඩංගුවේ පසුවන බවත්, වින්දිතයන්ගේ මළ සිරුරු දක්වෙන ඡායාරූප සහ වීඩියෝ පට බොහොමයක ඔවුන් සමග ආරක්ෂක හමුදා සාමාජිකයන් ද දිස්වේ. සමහර වීඩියෝ පටවල ආරක්ෂක හමුදා සාමාජිකයන් වින්දිතයන් නීතියෙන් පරිබාහිරව ඝාතනය කිරීමේ අවස්ථාවද දකිය හැකිය. ඝාතකයන්ගේ මුහුණු ද පැහැදිලිව දකිය හැකි අතර ඔවුන් යුද හමුදාවේ සාමාජිකයන් බවට හඳුනා ගත හැකිය.

319. 1 සිද්ධිය: ඡායාරූප කීපයකම බාලචන්ද්‍රන්ගේ සිරුර අසළ තවත් මළ සිරුරු පහක් ( තිදෙනෙකු යට ඇඳුම්වලින් ද එක් අයෙකු සරමක් හා ටී ෂර්ට් එකක් ඇඳ ගෙන ඇති අතර අනෙකා කොට කලිසමක් ද ඇඳ සිටී) දක්වෙන අතර ඒ මරණ සිදුව ඇත්තේ වෙඩි තැබීමෙන් බව පෙනේ. (සිරුරු යට ලේ පැල්ලම් පෙනෙන නමුත් සිරුරුවලට තුවාල සිදු වූ බවක් නොපෙනේ.) එම මිනිසුන්ගේ අත් පිටු පසට තබා බැඳ ඇති අතර ඡායාරූපය ගැනීමට පෙර බැඳීම ඉවත් කර ඇත. එක සිරුරක මුහුණ වසා ගැට ගැසූ රෙදි කැබැල්ල පහතට ඇද දමා ඇත. සියලුම සිරුර මුණින් අතට වැටී තිබිණ.

320. 2 සිද්ධිය: ඡායාරූප සහ වීඩියෝ දර්ශන ගණනාවක හඳුනා නොගත් යොවුන් අයෙකු ( ඔහුගේ වයස නිශ්චිත නැති වුවත් ලා බාල අයෙකු බව පෙනෙන්නේ එම ඡායාරූප සහ වීඩියෝ දර්ශනවල දක්වෙන අනෙක් පුද්ගලයන්ට වඩා කැපී පෙනෙන ලෙස කුඩා නිසාය.) වැඩිහිටියන් කණ්ඩායමක් සමග දකිය හැකිය. එක ඡායාරූපයක ඔහු උෂාලිනී යනුවෙන් හඳුනාගත් තරුණියක් සහ වැලි වළක වාඩිවී හෝ වැතිර සිටින නිරුවත් පිරිසක් අතර අසළ වාඩි වී සිටී. අනෙක් දර්ශන වලින් දක්වෙන්නේ අත් පිටු පසට කර බැඳ ඇති ඔහුගේ මළ සිරුරයි. හිසට බරපතළ තුවාල සිදුව ඇත. ළමයාගේ දණ හිස තෙක් දිග කොට කලිසමෙන් හා වම් අතේ වැළමිටට මදක් ඉහළින් ඇති නිල් පාට පටියකින් හෝ වෙළුම් පටියකින් පැහැදිලිව හඳුනා ගත හැකිය. ඔහු ගේ සිරුර ගැහැනියකගේ සිරුරක් අසළ තිබෙනු දක්වෙන වෙනත් දර්ශනවලින්ද හඳුනා ගත හැකිය. අත් පිටු පසට බැඳ ඇති ඔහුගේ ඇස් වසා බැඳ ඇති නිල් රෙදි පටිය හිසේ පසු පසට තබන ලද වෙඩි පහරේ කම්පනයෙන් ගැලවී යන්නට ඇතැයි සිතිය හැකිය. අනෙක් දර්ශනවල හඳුනා නොගත් ළමයාගේ විය හැකි සිරුරක් ට්‍රක් රථයකට පටවන ලද නිරුවත් සිරුරු අතර දකිය හැකිය. මෙම දර්ශනවල ඔහු නිරුවත් නමුත් නිල් පාට පටිය යාන්තමින් පෙනේ.

321. 2 සිද්ධිය: සාක්ෂිකරුවන් විසින් එල්ටීටීඊ කර්නල් වසන්තන්[256] විය හැකියැයි හඳුනා ගත් පුද්ගලයෙකු පණ පිටින්, අත් පිටු පසට කර බැඳ නිරුවත්ව සිටිනු දකිය හැකිය. ඔහු ආරක්ෂක හමුදා අත් අඩංගුවේ පසුවන බව පෙනේ. නීතියෙන් පරිබාහිර සිදු කරන ඝාතන පිළිබඳ විශේෂ සම්බන්ධීකාරකගේ ස්වාධීන විශේෂඥයන් විසින් සහතික කරන ලද වීඩියෝ පටයක කර්නල් වසන්තන් විය හැකි හඳුනා නොගත් ලණුවකින් බඳින ලද පුද්ගලයෙකු යුද හමුදවේ කැලෑ නිල ඇඳුමෙන් සිටින භටයෙකු විසින් කැමරාව ඉදිරියෙන් ඝාතනය කරන ලද මිනිසුන් සිටින තැනකට ඇද ගෙන යනු පෙනේ. බිම වාඩි කළ ඔහුගේ හිස පසු පසට ඉතා සමීපයේ සිට හමුදා භටයා ටී 56 ගිනි අවියකින් වෙඩි තබයි. කර්නල් වසන්තන් සමග හඳුනා නොගත් මිනිසුන් නිරුවත්ව, ඇස් බැඳ, අත් පිටු පසට කර බැඳ මරා දැමීමේ දර්ශන දක්වෙන වීඩියෝ පටිවලින් සහ සාක්ෂිකරුවන්ගේ[257] ප්‍රකාශ වලින් එල්ටීටීඊ කාර්යධරයන් ඇතුළු පුද්ගලයන් ගණනාවක්ම සන්නද්ධ ගැටුමේ අවසාන දවස්වල ආරක්ෂක හමුදා විසින් නීතියෙන් පරිබාහිරව මරා දමන ලදැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ලැබේ.[258]

322. හඳුනාගත් සහ හඳුනා නොගත් වින්දිතයන් පිළිබඳ ඉහතින් සඳහන් සියලු සිද්ධීන් ගැන ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය රැස්කර ගත් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, ඡයාරූප, වීඩියෝ පට සහ අනෙකුත් දේවලින් මෙම පුද්ගලයන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් අල්ලා ගෙන රඳවා ගැනීමෙන් පසුව මරා දමන ලද බව දක්වේ. රැස්කර ගත් තොරතුරු අනුව බොහෝ අවස්ථාවල වින්දිතයන්ට වෙඩි තබා ඇත්තේ ඉතා සමිපයේ සිට බවත් මරා දමන විට ඔවුන්ගේ ඇස් බැඳ

---

[256] http://white-flags.org/

[257] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

[258] සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ

අත් පිටුපසට තබා ගැට ගසා ඇති බවත් දක්වේ. මෙම ක්‍රියා නීතියෙන් පරිබාහිරව ඝාතනය කිරීම් සේ ගැනෙන අතර ජීවිතයට ඇති අයිතිය පැහැදිලිවම උල්ලංඝනය කිරීමකි. ඊට අමතරව මෙම ඝාතන විශේෂයෙන්ම සටන්වලට ක්‍රියාත්මකව සම්බන්ධවීමක් නැති පුද්ගලයන් හෝ රඳවා ගැනීමෙන් සටන්වලින් ඉවත් වූවන් බවට පත්වෙන පුද්ගලයන් මරා දැමීම ජීවිතයට එරෙහි ප්‍රචණ්ඩත්වය තහනම් කෙරෙන 1949 ජිනීවා සම්මුතීන් හතරටම පොදු 3 වැනි වගන්තිය යටතට ගැනෙන මිනී මැරීම් ලෙස සැලකිය හැකිය. පවතින වාතාවරණය අනුව උසාවියකින් තහවුරු කරන්නේ නම් මෙවැනි මිනී මැරුම් යුද අපරාධ විය හැකිය.

**ගැටුම් තත්වයන් තුළ සිරුරු ලිංගිකව විකෘති කිරීම/ නිගරු කිරීම**

323. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය ඇඳුම් ඉවත් කිරීමෙන් පසුව හෝ ලැම පෙදෙස සහ/හෝ ප්‍රජනන ඉන්ද්‍රිය නිරාවරණය වන සේ තන පටි ඉහළට ඇද දැමූ සහ කලිසම් සහ යට ඇඳුම් පහතට ඇද දමා ස්ත්‍රී මළ සිරුරුවලට කරනලද නිගරු කිරීම් දක්වෙන හමුදා භටයන් විසින් ගන්නා ලදයි කියන සිත් කම්පා කරන වීඩියෝ පට සහ ඡායාරූප නැරඹුවේය. ඉසිප්‍රියාගේ සිද්ධිය පුද්ගල ගරුත්වයට කරන ලද එවැනි අවමන් සහගත සහ නිගරු කිරීම් පිළිබඳ නිදසුනකි. ශ්‍රී ලංකා විමර්ශන කොමිටිය ඒ හා සමාන ආකාරයේ විකෘති කරන ලද ස්ත්‍රී මළ සිරුරු ඇතුළත් ඡායාරූප සහ වීඩියෝ පට රාශියක් සමාලෝචනය කෙළේය. සමහරක් පැහැදිලිවම අඩ නිල ඇඳුමෙන් හෝ එල්ලා වැටෙන කලිසම් සහ ඉරි වැටුණ පිරිමි කමිස ඇඳ සිටි එල්ටීටීඊ සටන්කරුවන් වන අතර අනෙක් ඒවායේ තිබුණේ සාමාන්‍ය ඇඳුම් ය. ඒ සියල්ලේම ලැම පෙදෙස හා ප්‍රජනන ඉන්ද්‍රියන් නිරාවරණය කර තිබිණ. සමහර මළ සිරුරුවල පා ඈත් කර තිබිණ. තවත් සමහර ඒවායේ අත් පිටු පසට කර බැඳ තිබුණ නිසා ඒවා මරා දැමීමට පෙර රැඳවා ගෙන සිටි බව පෙන්නුම් කෙරිණ. අනෙක් ඒවායේ වෙඩි උණ්ඩ ගණනාවක් ඇතුළු වූ බව පෙන්නුම් කරන තුවාල පපු ප්‍රදේශයේ දැකිය හැකිය. වීඩියෝ පටවල කැමරා ඇස ලිංගේන්ද්‍රියන් කෙරේ යොමුව පවතින අතර නිල ඇඳුමෙන් සිටින හමුදා භටයන් සහ ඔවුන්ගේ කාමුක කතා බහ ද ඇසිය හැකිය. මෙම වීඩියෝ පටවල විස්තර කථනය වඩාත් කම්පාවට පත් කරවයි. හමුදා භටයන් ස්ත්‍රී මළ සිරුරු ගැන ඉතා පහත් ආකාරයේ, කාමුක සහ පිළිකුල දනවන ආකාරයට කරන කතාබහ ද ඇසේ. සමහර වීඩියෝ පටවල ස්ත්‍රීන්ගේ අඩ නිරුවත් මළ සිරුරු කිසිම ගරු සරුවක් නැතිව ලොරියකට පටවනු පෙනේ.

324. එවැනිම වෙනත් වීඩියෝ පටයක දෙමළ ස්ත්‍රියකගේ නිරුවත් මළ සිරුරක ලැම ප්‍රදේශය සහ ලිංගේන්ද්‍රිය හමුදා භටයන් සිනහ වෙමින් විනෝද වෙමින් ඡායාරූප ගත කරනු දැකිය හැකිය. ඉඟටියෙන් පහළ නිරුවත් කර ඇති එක ස්ත්‍රී මළ සිරුරක උදරය මත ආයුධ කීපයක් අලංකාරයට මෙන් තබා ඇත. ''මැය (එල්ටීටීඊයට) අලුතින් බැඳුණ කෙනෙක් වගේ'' ''ඈ කාගේ හරි ලිපිකාරියක් වගේ. බලන්න පෑන් පැන්සල් කියක් තියෙනවද කියා.'' ''ඔබ මෙහි නොසිටින්න මම ඇගෙ තනේ කපා දානවා.'' යනුවෙන් හමුදා භටයන් කියනු ඇසේ.

325. මෙම වීඩියෝ පට සැලකිල්ලට ගත යුත්තේ ඉදිරි පරිච්ඡේදවල විස්තර කෙරෙන ආකාරයට රැඳවියන් ජීවත්ව සිටියදී කෙතරම් නින්දා සහගතව සහ අපහාසාත්මකව ලිංගික අපහරණයට ලක් වූයේද යනුවෙනි. හමුදා භටයන් තම ජංගම දුර කතන නිරුවත් ස්ත්‍රීන්ගේ සහ ගැහැනු ළමයින්ගේ ඡායාරූප ගැනීමට යොදා ගත් ආකාරය රැස්කර ඇති සාක්ෂිකරුවන්ගේ නොයෙකුත් ප්‍රකාශ වලින් පෙනේ. මෙවැනි ක්‍රියා තහවුරු කළ හැකිනම් පුද්ගල ගරුත්වය කෙලෙසීමේ යුද අපරාධයක් ලෙස සැලකිය හැකි වනු ඇත.

## VII නිදහස අහිමි කිරීමට අදාල උල්ලංඝනය කිරීම්

**හැඳින්වීම**

326. ''සිදු වූයේයැයි කියන අත් අඩංගුවට ගැනීම්, බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් සිදු කළ අතුරුදහන් කිරීම් සහ හිතුවක්කාර රඳවා ගැනීම් පිළිබඳව කරන ලද පැමිණිලි විශාල සංඛ්‍යාව

ගැන විශ්මයට පත් වූ බව'' අවසාන LLRC වාර්තාව සඳහන් කරයි.[259] මෙම කොමිටිය සිය විමර්ශනයේ දී ආරක්ෂක හමුදා සහ සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කරන ලද රඳවා ගැනීම්වලට අදාලව විශාල වශයෙන් වූ උල්ලංඝනය කිරීම් සහ අපහරණ ලේඛන ගත කර ඇත.

327. මෙම පරිච්ඡේදයෙන් නීති විරෝධී අත් අඩංගුවට ගැනීම් සහ අපහරණ රටා සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා අනුගමනය කළ ක්‍රියා මාර්ගය සමාලෝචනයට ලක් කෙරේ. කිසියම් පුද්ගලයෙකුගේ නිදහස අහිමි කිරීමට අදාල අන්තර්ජාතික නෛතික ආරක්ෂාවන් පැහැදිලිව උල්ලංඝනය කෙරෙන අර්ධ නෛතික ආකෘති රාමුවක් ලබා දෙන ශ්‍රී ලාංකික නීති ගැන විස්තර කෙරේ. මෙම පරිච්ඡේදයෙන් කොමිටියේ විමර්ශන කාල සීමාවට පෙර, එම කාල සීමාව ඇතුළත සහ ඉන් ඔබ්බට සිදු වූ සහ බොහෝවිට ''සුදු වෑන්'' යනුවෙන් හැඳින්වෙන සිද්ධීන් විශේෂයෙන්ම ඉලක්ක කර ගත් පුද්ගලයන් හෝ කණ්ඩායම් ඉලක්ක කර ගත් ආරක්ෂක මෙහෙයුම් පරික්ෂාවට ලක් කෙරේ. මෙම පරිච්ඡේදයෙන් ගැටුමේ අවසානයේ සිදු වූ මහා පරිමාණයේ රඳවා ගැනිම්වලට අදාල උල්ලංඝනය කිරීම් ද ලේඛන ගත කර ඇත.

328. එල්ටීටීඊය විසින් සිදු කරන ලද පැහැර ගැනීම් සහ වැඩිහිටියන් බලහත්කාරයෙන් බඳවා ගැනීම් සහ සන්නද්ධ කණ්ඩායම් විසින් ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනිම් අනතුරුව ඇති පරිච්ඡේදවල ලේඛන ගත කර ඇත.

**හදිසි නීති රෙගුලාසි සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත.**

329. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අපරාධ ක්‍රියා පටිපාටි සංග්‍රහයේ (CCP) හිතුවක්කාර අත් අඩංගුවට ගැනිමෙන් සහ රඳවා ගැනිමෙන් නිදහස්වීම පිළිබඳ ප්‍රතිපාදන දක්වේ. ඉන් පොලිස් අත් අඩංගුවේ රඳවා ගත හැකි නිත්‍යානුකුල කාල සීමාවත්, කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් වරෙන්තුවක් නැතිව අත් අඩංගුවට ගැනීම මහේස්ත්‍රාත් උසාවියට දැනුම් දිය යුතු බවත් දක්වෙන අතර පුද්ගලයෙකු අත් අඩංගුවට ගන්නා හේතුව ඔහුට දැනුම් දිය යුතු බවත් දක්වේ.[260]

330. කෙසේ වුවත් මෙම ආරක්ෂාවන් මහජන ආරක්ෂක පනත යටතේ නිකුත් කරන හදිසි නිති රෙගුලාසි වලින් සහ කොමිටියේ මැන්ඩේට් බලයෙන් ආවරණය වන කාල සිමාව පුරාම බල පැවැත් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් යටපත් කෙරිණ. හදිසි නිති රෙගුලාසි 2011 දී අවසන් කෙරිණ. ඒවායින් ආරක්ෂක ලේකම්ට අත් අඩංගුවට ගැනීමට සහ රඳවා ගැනිමට නියෝග කිරීමටත් එවැනි අත් අඩංගුවට ගැනීම් සිදු කිරීමට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට පුළුල් බලතලත් පැවරිණ. මෙම ප්‍රතිපාදන සමහරක් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ ප්‍රතිපාදනවලට පටහැනිවේ.

331. 1979 දී ඉදිරිපත් කරන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මේ දක්වාම ක්‍රියාත්මක වේ. ඉන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට '' ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමය පවත්වා ගැනීමට කිසියම් ආකාරයකින් හානි කරවන ආකාරයෙන් ක්‍රියාකරන බවට සැක කරන''[261] හෝ ත්‍රස්තවාදි කටයුතුවල නිරතවන පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් සමග ''කිසියම් ගනුදෙනුවක්''පැවැත් වූ පුද්ගලයන් වරෙන්තුවක් නැතිව අත් අඩංගුවට ගැනීමට සහ අධිකරණයට ඉදිරිපත් නොකර මාස 18 ක් රඳවා ගැනිමටත් බලය පැවරේ.[262]

---

[259] LLRC Report para 5.24

[260] ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වගන්තිය 13. CCP articles 37, 38 & 53

[261] [261] හදිසිනීති ( විවිධ ප්‍රතිපාදන සහ බලතල) EMPP රෙගුලාසි 2005 අංක 1, 2005 අගෝස්තු 13. ඡේද 4 රෙගුලාසි19.

[262] PTA 1971 part II paragraph 6 (1) 9 (1)

332. මෙම පනත යටතේ ආරක්ෂක ඇමතිට පුද්ගලයන් විමර්ශනය සඳහා හෝ වැළැක්වීමේ පියවරක් වශයෙන් රඳවා ගැනිමට නියෝග කළ හැකිය.[263]එසේ රඳවාගත් පුද්ගලයන් ඇමතිවරයා තීරණය කරනු ලබන ස්ථානයක සහ ඔහු විසින් නියම කරන කොන්දේසි යටතේ පළමු වරට මාස තුනකට නොවැඩි කාලයක් රඳවා ගැනිමට නියෝග කළ හැකිය. එවැනි නියෝගයක් වරකට මාස තුනකට නොවැඩි කාලයක් වශයෙන් වරින් වර දීර්ඝ කළ හැකිය. පුද්ගලයන් දීර්ඝ වූ කාලයක් පරිපාලන රඳවා ගැනීමට පත් කිරීමෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත විධිමත් ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් අන්තර්ජාතික ප්‍රමිතීන් බොහොමයක් හා හිතුවක්කාර ලෙස රඳවා ගැනීමෙන් නිදහස්ව සිටීමේ අයිතිය උල්ලංඝනය කරයි. විශේෂයෙන්ම රඳවා ගැනිමේ නිත්‍යානුකූල භාවය අධිකරණමය සමාලෝචනයකට ලක් කිරීමේ අයිතිය සම්බන්ධයෙන් මානව අයිතිවාසිකම් කොමිටියේ ස්ථාවරය මෙසේයඃ

333. අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හීන කළ නොහැකි කරවනු සඳහා රඳවා ගැනීමේ නිත්‍යානුකූල භාවය අප්‍රමාදව තීරණය කිරීමට උසාවියකට අවස්ථාව ලබා දීමට උසාවි ක්‍රියා මාර්ග ගැනීමට ඇති අයිතිය රාජ්‍ය පාර්ශ්වයක් සන්ධානය දුර්වල කිරීමට ගන්නා තිරණයකින් අඩු නොකළ යුතුය.[264]

334. විශේෂයෙන් සැලකිල්ලට ලක්වන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විමර්ශනයක් කරන පොලිස් නිලධාරියෙකුට ''එවැනි පුද්ගලයෙකු වෙත පිවිසීමේ අයිතියක් සහ එවැනි පුද්ගලයෙකු ප්‍රශ්න කිරීම සඳහා සාධාරණ පැය ගණනක් ඇතුළත කුමන තැනකට හෝ ගෙන යෑමට හා විමර්ශන කටයුතු සඳහා තැනින් තැනට ගෙන යෑමට ඇති අයිතිය'' සඳහන් වන පනතේ 7.3a කොටස යි. LLRC සභාව මෙම ප්‍රතිපාදනවල නීති විරෝධී තත්වය පිළිගෙන මෙසේ සඳහන් කරයි. ''රඳවා ගැනීමේ සියලු ස්ථාන බලය ලත් රඳවා ගැනීමේ ස්ථාන ලෙස විධිමත්ව නම් කළ ඒවා විය යුතු අතර කිසිම පුද්ගලයෙකු එවැනි බලය ලත් රඳවා ගැනීමේ ස්ථාන හැර වෙනත් ස්ථානයක රඳවා නොගත යුතුය. පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමේ දී නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් අත් අඩංගුවට ගැනීම පිළිබඳව විධිමත් ලදු පතක් නිකුත් කිරීම සහ රඳවා ගැනීමේ ස්ථානය සඳහන් කිරීම වැනි දැඩි නීති ප්‍රතිපාදන අනුගමනය කළ යුතුය.''

335. හදිසි නීති රෙගුලාසි ඉවත් කරන ලද්දේ 2011 දීය. එහෙත් සමහර ප්‍රතිපාදන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවතින අතර ඒවා ඉවත් කරන ලද රෙගුලාසිවලට සමානය.

336. 2005 අගෝස්තු මස විදේශ ඇමති ලක්ෂ්මන් කදිර්ගමාර් මහතා ඝාතනය කිරීමෙන් පසු මහජන ආරක්ෂක පනත යටතේ 2005 අංක 1 හදිසි නීති රෙගුලාසි ( විවිධ ප්‍රතිපාදන සහ බලතල) යනුවෙන් නව රෙගුලාසි නිකුත් කරන ලදී. ඒ අනුව වෙනත් කරුණු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට ''ඔහුගේ මතය අනුව'' ජාතික ආරක්ෂාවට සහ මහජන සාමය පවත්වා ගැනීමට හානියක් සිදුවීම වැළැක්වීමට අවශ්‍යයැයි හැඟෙන පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට සහ පරිපාලන රඳවා ගැනීමට නියෝග කිරීමට පුළුල් බලතල පැවරිණ.

337. වැඩි දුරටත් හදිසි නීති රෙගුලාසි (20 (1)) යටතේ ''ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට, ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඕනෑම සාමාජිකයෙකුට හෝ ජනාධිපති විසින් බලය පවරන වෙනත් ඕනෑම පුද්ගලයෙකුට වරෙන්තුවක් නැතිව පරීක්ෂා කිරීමට හෝ අත් අඩංගුවට වරෙන්තුවක් නැතිව පරීක්ෂා කිරීමට රඳවා ගැනිමට හැකිය.'' මෙම රෙගුලාසි අනුව ''රැඳවියන් මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියට ගෙන යා යුත්තේ දින 30 ක් ඉකුත් වීමට පෙර ය.''(21(1))

---

[263] එම පනතේ 9(1) කොටස

[264] අංක 29 පොදු අදහස්. (4 වගන්තිය) හදිසි තත්වයක් යටතේ බලතල හින කිරීම UN Doc. CCPR/C/21/Rev.1/Add.11(2001) para16. මානව අයිතිවාසිකම් කොමිටිය ඊශ්‍රායෙලය පිළිබඳ අවසාන නිරීක්ෂනයේ මෙසේ සඳහන් කරයි.( CCPR/C/79/Add.91) රාජ්‍ය පාර්ශ්වයකට රඳවා ගැනීම ඵලදායි අධිකරණ සමාලෝචනයක අවශ්‍යතාවයෙන් බැහැර විය නොහැකිය.

338. හදිසි නීති රෙගුලාසි[265] යටතේ ඊනියා ''භාරවූවන්'' මාස 12 ක කාලයක් සඳහා ''පුනරුත්ථාපන මධ්‍යස්ථානයක'' රඳවා ගත හැකි අතර එම කාලය ''පුනරුත්ථාපන'' කාර්යන් සඳහා චෝදනා ඉදිරිපත් කිරීමක් හෝ නඩු විභාගයක් නැතිව වසර දෙකක් දක්වා දිර්ඝ කළ හැකිය.

339. ඉන් පසුව මහජන ආරක්ෂක පනතේ 5 වැනි ඡේදය යටතේ 2006 දෙසැම්බර් මස නිකුත් කරන ලද හදිසි නීති රෙගුලාසි – හදිසි නිති (ත්‍රස්තවාදය සහ නිශ්චිත කරන ලද ත්‍රස්තවාදි කටයුතු වැළැක්වීමේ සහ තහනම් කිරීමේ) – අංක 7 රෙගුලාසි යටතේ PSO වගන්ති 5 යටතේ - ''ත්‍රස්තවාදී'' වැරදි ඉතාමත් ලිහිල් ආකාරයෙන් නිර්වචනය කිරීමට අමතරව මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ට එරෙහිව අභිචෝදනා ඉදිරිපත් කිරීමේ දී ඉතාමත් පුළුල් මුක්තියක් ලබා දේ.[266]

340. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ( 141 වගන්තිය) හබෙයාස් කෝපුස් සඳහා ඇති අයිතිය තහවුරු කළ ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් සහ හදිසි නීති රෙගුලාසි අනුව මෙම ප්‍රතිපාදන යටතේ අත් අඩංගුවට ගෙන ඇති කිසිවෙකුට රඳවා ගැනීම අධිකරණයක් ඉදිරියේ අභියෝග කිරීමේ අයිතියක් නැත. මෙය සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සංධානයේ 9 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි.[267] හබයාස් කෝපුස් අයිතිය යටපත් කිරීම එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය 1995 දී සැලකිල්ලට ගෙන ඇත. '' ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලබන නිශ්චිත නොකළ නියෝගයක් අනුව රඳවා ගැනීමෙන් සන්ධානය උල්ලංඝනයවීම ගැන කොමිටියේ අවධානය යොමුව ඇත..... මේ තත්වය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් පුද්ගලයන් සම්බන්ධයෙන් හබයාස් කෝපුස් ප්‍රතිකර්මයේ ඇති බලපෑම ගැන කොමිටියේ අවධානය දිගටම යොමුව ඇත.[268] මෙය විශේෂයෙන්ම බරපතළ තත්වයක් වන්නේ බලයෙන් අතුරුදහන් කළ අයගේ ඥාතින් පැහැර ගත් අය සිටින තැන ඉක්මණින්ම තහවුරු කර ගැනීම සඳහා හබෙයාස් කෝපුස් මත විශ්වාසය රැඳවීම නිසායි.

341. මේ අනුව සන්නද්ධ ගැටුමේ අවසානයේ අල්ලා ගත් එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන් ඇතුළුව ආරක්ෂාවට තර්ජනයක්යැයි සැලකෙන පුද්ගලයන් සහ රජය විසින් භාර වූයේයැයි සැලකෙන පුද්ගලයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි නිති රෙගුලාසි යටතේ ආරක්ෂිත පියවරක් වශයෙන් රඳවා ගැනීමටත් හෙළි නොකළ රහසිගත රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා ගැනීමටත් ඉඩක් ලැබුණි. මේ ආකාරයේ ආරක්ෂිත පියවරක් වශයෙන් රඳවා ගැනීම් එක්සත් ජාතීන්ගේ අත්තනෝමතික රඳවා ගැනීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම අනුව ස්වභාවයෙන් අත්තනෝමතික රඳවා ගැනීම් වන අතර ත්‍රස්ත විරෝධී පියවර/ මෙහෙයුම් සන්දර්භයක් තුළ පවා අන්තර්ජාතික සිවිල් සහ දේශපාලන සන්ධානයේ 9 වැනි වගන්තිය කඩ කිරීමකි.[269]

342. 2006 ජුලි 7 වැනි දා ජනාධිපති රාජපක්ෂ අත් අඩංගුවට ගත් සහ/හෝ රඳවා ගත් පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ විධාන නිකුත් කළ අතර ඒවා යුද හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා අණදෙන නිලධාරීන්ටත්, පොලිස්පතිටත් ලබා දෙන ලදී. නීතිය සහ විධිමත් ක්‍රියා පටිපාටියට අනුකූලව හැර කිසිම පුද්ගලයෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ

---

[265] හදිසි නීති රෙගුලාසි 1462/8 2006 අනුව සංශෝධනය කරන ලද හදිසි නිති ප්‍රතිපාදන සහ බලතල රෙගුලාසි අංක 1 2005 හි රෙගුලාසි 22.

[266] Regulation 19 Emergency (Prevention and Prohibition of Terrorism and specified Terrorist Activities) Regulation No. 07 2006 6 December 2006.

[267] PRA 1971 Part II paragraph 10 EMPPR No.1 of 2005 paragraph 19 (10)

[268] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය. 1995. සන්ධානයේ 4 වගන්තිය යටතේ රාජ්‍ය පාර්ශ්වයන් ඉදිරිපත් කරන වාර්තා සැලකිල්ලට ගැනීම. මානව අයිතිවාසිකම් කොමිටියේ අදහස්, ශ්‍රී ලංකාව. CCPR/C79/Add.56 paragraph 17.

[269] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලය, 2009. හිතුවක්කාර රඳවා ගැනීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව. A/HRC/10/21, paragraph 54.

පනත සහ හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම නොකළ යුතු බවත්, ළමයින් සහ ස්ත්‍රී රැඳවියන් සන්නද්ධ හමුදාවල කාන්තා ඒකක භාරයේ තැබිය යුතු බවත්, අත් අඩංගුවට ගැනීමෙන් පැය 48 ක් ඇතුළත ඒ බව ජාතික මානව හිමිකම් කොමිසමට දැනුම් දී ඕනෑම රැඳවුම් මධ්‍යස්ථානයක සිටින රැඳවියන් බැලීමට යෑමට ඉඩ ලබා දිය යුතු බවත් දක්වෙන උපදෙස් ඒවාට ඇතුළත්ය.[270] කෙසේ වුවත් මෙම විධානයන්ට වෙන් වූ නීතිමය බලයක් නැත. ආරක්ෂක හමුදා අනුගමනය කළ බොහෝ ක්‍රියා පටිපාටි අන්තර්ජාතික ප්‍රමිතීන් උල්ලංඝනය කළ අතර ඒවාට අනුකූළ වූ ක්‍රියා පටිපාටි පවා අධිකාරීන් විසින් පුරුද්දක් වශයෙන්ම කඩ කරන ලදී.

**ආරක්ෂක හමුදා සහ ඊට සම්බන්ධිත සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කළ නීති විරෝධී අත් අඩංගුවට ගැනීම් රටාවන්.**

343. ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුමට අදාල විමර්ශන කාල සීමාවේ දී මෙම කොමිටිය නීති විරෝධීව හෝ වෙනත් ආකාරයෙන් අත්තනෝමතික ලෙස තම නිදහස අහිමි කරන ලැබූ පුද්ගලයන් 50 කට අධික සංඛ්‍යාවක් ( ඉන් තුනෙන් එකක් ස්ත්‍රීන් ය.) සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එය ආරක්ෂක හමුදා විසින් නීති විරෝධීව අත් අඩංගුවට ගැනීමෙන් පසුව වූයේයැයි කියන බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් ගණනාවක් ඇතුළුව එවැනි අනෙකුත් සිද්ධීන් ගැනද සමාලෝචනය කරන ලදී. එසේ රැස්කරගත් තොරතුරු අනුව රජය මෙන්ම ආණ්ඩුවට සම්බන්ධ සන්නද්ධ කණ්ඩායම් විසින් හිතුවක්කාර ලෙස සහ නීති විරෝධීව අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම පුළුල් වශයෙන් යොදා ගත් බව පෙනේ.

344. කොමිටිය විසින් ලේඛන ගත කරන ලද සිද්ධීන් අති බහුතරයක අත් අඩංගුවට ගත් ආකාරයත්, සමහර සිද්ධීන්වලදී පැහැර ගැනීම සිදු වූ ආකාරයත් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූළ නොවූ අතර බොහෝවිට පිළිගත්තේ ද නැත. මෙම සියලු අවස්ථාවලදී අත් අඩංගුවට ගැනීමේ දී හෝ පැහැර ගැනීමේ දී ඒ සඳහා වරෙන්තුවක් ඉදිරිපත් නොකරන ලද අතර තමන් අත් අඩංගුවට ගැනීමේ හේතුව සහ ගෙන යන ස්ථානය ගැන රැඳවියන්ට දැනුම් දී ඇත්තේ අතලොස්සකට පමණි. ඔවුන් විනිශ්චයකරුවෙකු වෙත ඉදිරිපත් කිරීමක්, චෝදනා ඉදිරිපත් කිරීමක් හෝ ඔවුන්ට නීති උපදෙස් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දී නැත. මෙවැනි උල්ලංඝනය කිරීම්වල වින්දිතයන් වූයේ එල්ටීටීඊ කාර්යධරයන්යැයි හෝ ඔවුන්ගේ හිතවතුන්යැයි සැක කළ අය මෙන්ම ජනමාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ය. රටින් පිටව යෑමට උත්සාහ කරන හෝ විදේශවල සිට ස්වේච්ඡාවෙන් හෝ පිටරටකදී දේශපාලන රැකවරණය නොලැබීම නිසා ආපසු පැමිණි දෙමළ සම්භවයක් ඇති පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමේ රටාවක් කොමිටිය ලේඛන ගත කර ඇත.[271]

345. *ආරක්ෂක හමුදාවල උපාමාර්ගයඃ ''සුදු වෑන්''වලින් ගොස් අත් අඩංගුවට ගැනීම්*

346. කොමිටිය ලේඛන ගත කර ඇති බොහෝ සිද්ධීන්වලදී නීති විරෝධී සහ අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් සිදු කර ඇත්තේ CID, TID, STF ඇතුළත් ආරක්ෂක බලකා සාමාජිකයන්, ශ්‍රී ලංකා යුද හමුදාවේ ( විශේෂයෙන්ම මිලිටරි බුද්ධි අංශයේ) සහ නාවික හමුදාවේ සාමාජිකයන් විසිනි.

347. මෙම කොමිටියෙන් ලේඛන ගත කර ඇති අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් ශ්‍රී ලංකාව පුරාම සිදු කර ඇති අතර විශේෂයෙන්ම කොළඹ ගුවන් තොටුපළ ඇතුළුව කොළඹදීත්, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ විශේෂයෙන් 2009 පසුව වවුනියාව අවට ප්‍රදේශවලත් සිදුව ඇත.

348. වින්දිතයන් අත් අඩංගුවට ගෙන ඇත්තේ ඔවුන්ගේ නිවෙස් හෝ වැඩ පොළවල් අසලදී හෝ මුර පොළවල් හරහා හෝ රටින් පිටව යෑමට ගුවන් තොටුපොළ හරහා ගමන් කරමින් සිටියදීය. සන්නද්ධව නිල ඇඳුමෙන් හෝ සාමාන්‍ය ඇඳුමෙන් සිටින අපරාධය සිදු කරන්නෝ වින්දිතයන් ''සුදු වෑන්'' යනුවෙන් පොදුවේ හැඳින්වෙන අංක තහඩු නැති වාහනයක පිටු පසට

[270] අත් අඩංගුවට ගත් සහ/හෝ රඳවා ගත් පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳව ජනාධිපති විධාන available at http://www.defence.lk/new.asp?fname=20070425_02

[271] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

දමා ඇස් හා අත්පා බැඳ දමති. ඉන් පසු ඔවුන් බොහෝවිට වින්දිතයා නොදන්නා ස්ථානයක ඇති පළමු රැඳවුම් මධ්‍යස්ථානයට ගෙන යනු ලැබේ. බොහෝවිට වාහනය ධාවනය කරන්නේ වින්දිතයාට තමන් සිටින තැන හඳුනා ගැනිමට නොහැකි වන ආකාරයට වක්‍රකාරවය.[272]

349. වින්දිතයෙක් මෙම කොමිටිය වාර්තා කර ඇති වෙනත් බොහෝ සිද්ධීන්ට සමානව 2009 දී වවුනියාවේ දී ඔහු අත් අඩංගුවට ගත් ආකාරය විස්තර කෙළේ මෙසේය: '' මම අම්මා සහ නංගී සමග ගෙදර සිටියා. රාත්‍රී 8 ට 9 ට විතර බල්ලෝ බුරන සද්දයක් ඇහුණා. හොරුද කියා බලන්න මම එළියට ආවා. මම ටී ෂර්ට් එකක් හා කොට සලිසමක් ඇඳ ගෙන සිටියේ. සෙරෙප්පු දමා ගෙනත් නැහැ. මම දැක්කා තුන් දෙනෙක් ඉන්නවා. දෙදෙනෙක් සිවිල් ඇඳුම් ඇඳගෙන හිටියා. අනෙක් එක්කෙනා කොළපාට හමුදා යුනිෆෝම් එකක් ඇඳ සිටියා. ඔවුන්ගෙන් දෙදෙනෙකු අතේ තුවක්කු තිබුණා. ඉන් එක්කෙනෙක් අම්මටයි නංගිටයි තුවක්කු එල්ල කළා. මම කෑ ගහන්න පටන් ගත්තා. ඒ අය අම්මටයි නංගිටයි කෑගහන්න එපා කිව්වා. මාව විමර්ශනයකට අර ගෙන යන බව කිව්වා. අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් ගැන කව්රුවත් කිව්වේ නැහැ. ඒක ඉතා කෙටි වෙලාවක් තුළ සිදු වුනා. ඒ මිනිස්සු අපේ ගේට්ටුව ළඟ නවතා තිබුණු සුදු වෑන් එකට මාව දා ගත්තා. ඒක සාමාන්‍ය සුදු වෑන් එකක්. හමුදා වාහනයක් නොවෙයි. ඔවුන් මාව ඇද ගෙන ගිහිල්ලා වෑන් එකේ පිටු පසට දැම්මා. ඔවුන් මට ගැහුවා. ඊට පස්සේ මට සිහි නැති වුනා. මට සිහිය ආවට පස්සේ මගේ ඔළුවෙන් සහ පිටෙන් වේදනාවක් දැනුනා. මම හිටියෙ කුඩා කාමරයක. කොණක ටොයිලට් එකකුත් තිබුණා. ඒ කාමරයේ ජනෙල් නැහැ.''[273]

350. සාමාන්‍යයෙන් අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් සිදු වන්නේ සෝදිසියෙන් සිටීමේ කාලයකින් පසුව ඉලක්ක කර ගත් පුද්ගලයන්ය. එමනිසා ඒවා බොහෝ විට කලින් සැලසුම් කළ ඒවාය.[274]නිදසුන් වශයෙන් වින්දිතයන් කීප දෙනෙකුම අත් අඩංගුවට පත්විමට පෙර පාරේ ගමන් කරන විට සැක කටයුතු අය ඔවුන් පසු පස පැමිණි බවත් ඔවුන්ගේ නිවාස හෝ වැඩ පොළ අසළ සැක කටයුතු වාහන නතර කර තිබෙනු දුටු බවත් සඳහන් කළහ.[275] බොහෝ අවස්ථාවල අත් අඩංගුවට ගැනිමට පෙර මෙය සිදු කරන්නෝ වින්දිතයන්ගෙන් ඔවුන්ගේ හැඳුනුම් පත් ඉල්ලා සිටිති එමෙන්ම වින්දිතයන් ගැන ඔවුන් සතු විස්තර ද පවසති.[276] එක වින්දිතයෙක් තමා 2010 දී වවුනියාවේ දි අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීමේ වින්දිතයෙක් වූ ආකාරය කොමිටියට විස්තර කෙළේය. ඔහු නොහඳුනන කිසියම් පුද්ගලයෙකු ඔහු වැඩ කරන ස්ථානයට පැමිණ ඔහු ගැන විමසා පිටව ගොස් ඇත. පසු දින ඔහු කාර්යාලය අසළ සාප්පුවක සිටියදී කිසියම් පුද්ගලයෙක් ඔහුගේ නම කියා කතා කරත්ම තවත් පුද්ගලයෙක් ඔහුගේ හිසට තුවක්කු බඳෙන් පහර දී ඇත. ඔහුට සිහිය ලැබෙන විට සිටියේ අඳුරු කාමරයක නිරුවත්ව ලේ ගලන තැලීම් තුවාල සමගය. හත් දෙනෙකුගේ හෝ අට දෙනෙකුගේ කණ්ඩායමක් ඔහුට පහර දෙමින් ප්‍රශ්න කළහ.[277] ආරක්ෂක හමුදා විසින් ඔහු රඳවා ගෙන සිටි සති හයක පමණ කාලය තුළ දැඩි වධ හිංසා පමුණුවා ලිංගික අපහරණයට ලක් කෙළේයැයි ඔහු පවසයි.

351. බොහෝවිට හිතුවක්කාර අත් අඩංගුවට ගැනීම් සිදු වන්නේ ප්‍රචණ්ඩ ආකාරයෙනි. අත් අඩංගුවට ගෙන රඳවා ගැනීමේ ස්ථානයට ගෙන යන අතර පහර දුන් ආකාරය බොහෝ වින්දිතයෝ විස්තර කළහ. සාක්ෂිකරුවෙක් පවසන ආකාරයට එක සිද්ධියකදී අවි රැගත් හමුදා භටයන් 30 කට අධික සංඛ්‍යාවක් 2006 ජනවාරි මස රාත්‍රී 11.30 ට යාපනයේ නිවසකට පැමිණියහ. ආක්‍රමණකාරී හමුදා භටයෝ නිවැසියන්ට පහර දුන්හ. වින්දිතයාගේ බිරිඳට පුටුවකින් පහර දී ඇත. හමුදා භටයෝ වින්දිතයාගේ ඇස් බැඳ කෑ ගැසීම වැළැක්වීමට කටේ පාන්කඩ ඔබා පාර දිගේ ඇදගෙන ගියහ.[278] මෙම වාර්තාව අවසන් කරන විට ද ඔහු සිටින තැනක් කිසිවෙක් දන්නේ නැත.

---

[272] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[273] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[274] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[275] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[276] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[277] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[278] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

**අපරාධකරුවන්යැයි කියන පිරිස්.**

352. කොමිටිය රැස් කරන ලද තොරතුරු අනුව ශ්‍රී ලංකා ආරක්ෂක බලකාවල විවිධ අංශ නීති විරෝධී සහ හිතුවක්කාර අත් අඩංගුවට ගැනීම් සිදු කිරීමේ දී ඒකාබද්ධ බුද්ධි සහ තොරතුරු හුවමාරු කර ගැනීම්, ප්‍රශ්න කිරීම් මෙන්ම ඒකාබද්ධ සැලසුම් කිරීම්, රඳවා ගැනීම, ප්‍රශ්න කිරීම, වධ හිංසා පැමිණවීම සහ නිදහස් කිරීම හෝ වෙනත් සිර ගෙයකට මාරු කිරීම යන සියලු අවස්ථාවල ඉතා ඉහළ මට්ටමක සම්බන්ධීකරණයක් පවත්වා[279] ගත්හ. හඳුනා ගත් අවස්ථාවල අත් අඩංගුවට ගැනීම් බොහෝවිට සිදු කර ඇත්තේ යුද හමුදාව, CID හෝ TID හා සමහරවිට යුද හමුදාවේ සහාය ඇතිව, විශේෂයෙන්ම හමුදා බුද්ධි අංශයේ සහාය ඇතිවය. තොරතුරු ලබා දෙන්නන්ගෙන්, ලබා ගත් තොරතුරු ආරක්ෂක හමුදා සතුව තිබිණ. ඉන් සමහර අය එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන්ය. තොරතුරු ලබා දෙන්නන් බවට පත්විමට පෙර ඔවුන් රඳවා ගෙන සිටි අතර තොරතුරු ලබා ගෙන ඇත්තේ වධහිංසා පැමිණවීමෙන් හෝ ඒ බවට තර්ජනය කිරීමෙනි.

353. කාලයත් සමග 'සුදු වෑන්වලින්' පැහැර ගැනීමේ දී කරුණා කණ්ඩායම සහ පොලීසියේ විශේෂ කාර්ය සාධක බලකාය සහ හමුදා බුද්ධි අංශය අතර සම්බන්ධතාවය වඩාත් පැහැදිලිය.[280]මුලින්ම කරුණා කණ්ඩායම ආරක්ෂක හමුදාවල පාලනය යටතේ නොවුවත් කාලයත් සමග එවැනි සම්බන්ධතාවයක් වඩාත් පැහැදිලි වූයේ මෙම නීති විරෝධී කටයුතු සිදු කිරීමේ දී ඔවුන්ට හිමි වූ මුක්තිය හා ඒවා තමන්ගේම කැමැත්ත අනුව සෘජුවම හෝ ආණ්ඩුවේ හමුදා සමග හෝ ඔවුන් වෙනුවෙන් සිදු කිරීමෙනි.[281]

354. කරුණා කණ්ඩායමට ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශ තුළ නිදහසේ එහා මෙහා යෑමටත් හමුදා කඳවුරු අසළ තිබූ ඔවුන්ගේ කඳවුරුවල සිට හමුදා මුර පොළවල් හරහා යෑමටත් අවස්ථාවක් තිබිණ. 2006 වන විට කරුණා කණ්ඩායම 'සුදු වෑන්' පැහැර ගැනීම් සහ නීති විරෝධී මිනී මැරුම් සිදු කරමින් වැලිකන්ද හමුදා කඳවුරේ සිට යුද හමුදාවේ සහ නාවික හමුදාවේ බුද්ධි අංශය සමග හෝ ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වූහ.[282] පැහැර ගැනීමෙන් පසුව නොයෙකුත් රාජ්‍ය ආයතන මගින් පාලනය වන රඳවා ගැනීමේ මධ්‍යස්ථානවලට එම වාහන හමුදාවේ පොලිසියේ මුර පොළවල නැවැත්විමක් නැතිව ගමන් කරයි. [283]

**වටකොට පරීක්ෂා කිරීමේ මෙහෙයුම්වලදී ශ්‍රී ලංකා යුද හමුදාව සිදු කළ නීති විරෝධී සහ හිතුවක්කාර අත් අඩංගුවට ගැනීම්.**

355. ශ්‍රී ලංකා යුද හමුදාව දෙමළ ජනතාව වැඩියෙන් ඒක රාශී වී ඇති විශේෂයෙන් කොළඹ වැනි ප්‍රදේශවල සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල ''වටකොට සෝදිසි කිරීමේ'' (Cordon and Search) මෙහෙයුම් කිරීමේ දී බොහෝවිට අත් අඩංගුවට ගැනීම් සිදු කරයි. 2006 හා 2008 වසරවල එවැනි මෙහෙයුම් වැඩි වශයෙන්ම සිදු වූ අතර ගැටුම අවසන් වීමෙන් පසුව ආරක්ෂක හමුදා පලා ගොස් සිටි එල්ටීටීඊ කාර්යධරයන් සොයා ගැනීමට එවැනි මෙහෙයුම් දිගටම සිදු කෙළේය.

356. එවැනි පරීක්ෂා කිරීමේ මෙහෙයුම් සාමාන්‍යයෙන් හැඳින් වූයේ ''SLA රවුන්ඩ් අප්'' නමිනි. ගෙයින් ගෙට ගොස් සෝදිසි කිරීමට පෙර හමුදාව සන්නද්ධ වාහනවලින්, සමහරවිට කළු කරන ලද ජනේල සහිත වෑන්වලින් පැමිණ ගම වටලා ගම් වැසියන්ට පිටව යෑමට නොහැකි ආකාරයෙන් මාර්ග බාධක ඉදි කරයි. එම සෝදිසි මෙහෙයුම් සාමාන්‍යයෙන් සිදු කරන්නේ අසළ ඇති යුද හමුදා කඳවුරුවලිනි. පහතින් දැක්වෙන්නේ 2008 දී වවුනියාවේ මාසිකව සිදු කරන ලද

---

[279] එහිම පොලිස් නිලධාරීන් 2009 අප්‍රේල් බිස්නස් ටුඩේ සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව බලන්න. ත්‍රස්ත විරෝධී විමර්ශන සහ මෙහෙයුම් සැලසුම් කිරීම මනාව සම්බන්ධීකරණය සඳහා ආරක්ෂක ලේකම් සමග සති පතා රැස්වීම් පැවැත් වූ ආකාරය විස්තර කර ඇත.

[280] SLMM documentation

[281] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[282] SLMM documentation

[283] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

වටකොට පරීක්ෂා කිරීම් පිළිබඳව මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් විසින් සකස් කරන ලද විස්තරයකි.

357. ශ්‍රී ලංකා යුද හමුදාව පෙ.ව. 4.00 ට ගම්වලට පැමිණ සියලුම නිවැසියන්ට ක්‍රීඩා පිටියක් වැනි ප්‍රසිද්ධ ස්ථානයකට රැස්වීමට නියෝග කරයි. ඉන් පසු ඔවුන් වයස් අනුව කාණ්ඩවලට වයස අවුරුදු 40 ට වැඩි, අවුරුදු 10 ට අඩු, අවුරුදු 10 – 18 ත් අතර සහ අනෙකුත් අය වශයෙන් වෙන් කරයි. වයස අවුරුදු 40 ට වැඩි සහ 10 ට අඩු අයට පළමුවෙන්ම නිවෙස්වලට යෑමට ඉඩ දී 10 – 18 ත් අතර අය පරීක්ෂාවට ලක් කරයි. අවසානයේ දී 18 – 25 ත් අතර අය පරීක්ෂා කොට සමහරවිට සාමූහිකව වීඩියෝ ගත කර තනි තනිව ඡයාරූප ගත කරයි. පිරිමි සහ ගැහැණු රැස් කරන්නේ වෙනමය. පිරිමින්ට පෙළ ගැසී අඩි කීපයක් ඉදිරියෙන් නවතා ඇති සන්නද්ධ ට්‍රක් රථය දෙසට යන ලෙස කියනු ඇත. එම ට්‍රක් රථයේ අඳුරු කළ ඇතුළත නොපෙනෙන වීදුරු ජනේලයක් ඇත. ට්‍රක් රථයේ වහළ උඩ සිටගත් හමුදා නිලධාරියා එහි ඇති සිදුරකින් අඳුරු කළ ජනේලයෙන් පිටත බලන පුද්ගලයා දෙස බලා සිටී. ඇතුළත සිටින පුද්ගලයා ට්‍රක් රථය දෙසට පෙළ ගැසී යන පිරිස අතරෙන් කිසිවෙකු තව දුරටත් ප්‍රශ්න කිරීමට නතර කර ගත යුතුද යන්න සංඥා කරයි. බොහෝවිට හමුදා භටයන් සමග හිස වසා ගත් අය ද සිටිති.''

358. 2009 දී සන්නද්ධ ගැටුම අවසන්වීමෙන් පසුව ශ්‍රී ලංකා යුද හමුදාව සම්පූර්ණ දවසක්ම මුළු ගමක් වටලා සිටීමක් පිළිබඳ විස්තර මෙම කොමිටියට ලැබී ඇත. නිලධාරීහු ගෙයින් ගෙට ගොස් එල්ටීටීඊ හිතවතුන්යැයි සැක කළ පුද්ගලයන් වරෙන්තු නැතිව අත් අඩංගුවට ගත්හ.[284] ඊට බෙහෙවින් කලින් වූ සිද්ධියකදී 2006 දී උතුරේ ගමකට හමුදා වාහන රැසක් පැමිණ ගම් වැසියන්ට රජයේ ගොඩනැගිල්ලකට රැස්වීමට නියෝග කෙරිණ. හමුදා භටයෝ කිසිවෙකුට පිටව යෑමට නොහැකි වන ආකාරයට ගම වටලා ගත්හ. එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැක කරන පුද්ගලයන් කිප දෙනෙකුම හමුදාව විසින් හඳුනා ගන්නා ලදී. ගැමියන්ගේ විරෝධය නිසා ඔවුන් ගෙන යෑමට නොහැකි වුවද ඔවුන්ට පසු අවස්ථාවක යුද හමුදා කඳවුරට වාර්තා කිරීමට නියෝග කෙරිණ.[285] ප්‍රශ්න කිරීමෙන් පසුව හිරිහැර හෝ තර්ජනය කරනු ඇතැයි බියෙන් තරුණියෝ සහ තනිකඩ ගැහැනු එකට එක්ව හෝ වෙනත් පවුල් අසලින් සිට ගත්හ. මෙය වැඩියෙන්ම සිදු වූයේ යුද හමුදාව රාත්‍රි කාලයේ පැමිණි විටය.

359. වින්දිතයන් රැගෙන ගිය වෑන් රථය පිටුපස හඹා ගිය හොත් තම ඥාතියා සිටින තැනක් දැන ගැනීමට හැකි වනු ඇතැයි සිතූ වින්දිතයන්ගේ පවුලේ සාමාජිකයන් ඊළඟ ගමට යන තෙක් වෑන් රථය පසුපස ගිය බව සාක්ෂිකරුවෝ පවසති.[286] මෙවැනි මෙහෙයුමකින් පසුව ගැමියන් සමග කතා කළ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීහු මධ්‍යම රාත්‍රියේ වට කරනු ලැබීමෙන් සහ තම ආදරණීයන්ට සිදු වූ දෙය නොදන්නා නිසා අත්විඳි භීතිය සහ වේදනාව විස්තර කරති.

**සන්නද්ධ ගැටුමේ අවසන සමූහ වශයෙන් අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම**

360. මෙම වාර්තාවේ XVI පරිච්ඡේදයෙන් ගැටුමේ අවසාන සති කිපය ඇතුළත ආණ්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවලට පැමිණි 300,000 පමණ වන සිවිල් ජනතාව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට ලක් කළ ආකාරය සහ ඔවුන්ගේ නිදහස අහිමි කළ ආකාරය විස්තර කරයි. මෙම කොටසේ දී කොමිටිය අවධානය යොමු කරන්නේ සන්නද්ධ ගැටුමේ අවසානයේ දී ''භාරවූවන්'' ( surrendees හදිසි නීති රෙගුලාසිවල සඳහන් වන ආකාරයට) පරීක්ෂා කිරීමේ ස්ථානවලදී තෝරාගත් ආකාරය සහ හමුදාව සහ පොලිසිය විසින් ''පුනරුත්ථාපනය'' සහ/හෝ එල්ටීටීඊය සමග ඔවුන් සැබැවටම පැවැත් වූ හෝ පැවැත් වූ බවට සැක කළ සම්බන්ධතා නිසා වැඩි දුර විමර්ශනය සඳහා අත් අඩංගුවට ගත් ආකාරය ගැනයි. ''සුදු වෑන්'' මෙහෙයුම් වලින් සරණාගත කඳවුරු තුළදී ද සමහර පුද්ගලයන් අත් අඩංගුවට ගෙන ඇත.

[284] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[285] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[286] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

361. 2005 හදිසි නීති රෙගුලාසි යටතේ[287] ''භාරවූවන්'' මාස 12 ක් පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රඳවා ගත හැකි අතර එය චෝදනාවක් හෝ නඩු විභාගයක් නොමැතිව ''පුනරුත්ථාපන කාර්යන්'' සඳහා තවත් වසර දෙකක් දක්වා දීර්ඝ කළ හැකිය. ආණ්ඩුව පවසන ආකාරයට එල්ටීටීඊය සමග ''නොයෙකුත් මට්ටමෙන් සම්බන්ධ වුවද'' පුද්ගලයන් 11,696 කගේ පමණ නීතිමය තත්වය හැම විටම පැහැදිලි නැත. 2010 සැප්තැම්බර් වන විට ''භාරවූවන් 6500 ක් කෙටි කාලීන පුනරුත්ථානයට යොමු කර ඇති අතර 3500 ක් දිර්ඝ කාලින පුනරුත්ථානයට ලක් කර ඇත. ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වූ බවට සෘජු සාක්ෂි ඇති බවට හඳුනා ගත් දරුණු ගණයේ එල්ටීටීඊ ක්‍රියාකාරින්ගේ සංඛ්‍යාව 1,500 වඩා අඩු අතර ඔවුන්ට එරෙහිව අභිචෝදනා ඉදිරිපත් කරනු ඇත.'' ''අදහස වන්නේ පලිගැනීමට වඩා ප්‍රතිස්ථාපනයයි'' ආණ්ඩුව සඳහන් කරයි. කෙටි කාලින හෝ දිගු කාලින පුනරුත්ථාපනයට යොදා ගත් නීතිමය හෝ ප්‍රතිපත්තිමය පදනමක් ගැන පැහැදිලි කිරීමක් නැත.

362. රැඳවියන් බොහෝ විට අත් අඩංගුවට ගෙන ඇත්තේ වඩ්ඩුවකාල් පාලම, මුලතිවු සහ ඕමන්තෙයි පිහිටි නොයෙකුත් මුර කපොලු සහ පරික්ෂා කිරීමේ මධ්‍යස්ථාන වලදී වන අතර අනෙකුත් අය අත් අඩංගුවට පත්ව ඇත්තේ මනික් ෆාම් හි සරණාගත කඳවුරේ සරණාගතයන් ලෙස ලියා පදිංචි වී සිටිය දීය. මෙම පරිච්ඡේදය මූලික වශයෙන් සනනද්ධ ගැටුම අවසානයේ සමූහ වශයෙන් සිදු කළ රඳවා ගැනීම් ගැන වුවද ඊට පෙර ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලට ඇතුළු වූ අයද රඳවා ගෙන ඇත.

363. සන්නද්ධ ගැටුම අවසානයේ රඳවා ගත් අය නොයෙකුත් ආකාරයෙන් හඳුනා ගෙන ඇත. එක දවසක් හෝ එල්ටීටීඊයට සේවය කළ අයට ඉදිරිපත් වන ලෙස නැවත නැවතත් කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් සමහරු ඒ වහාම හෝ ප්‍රශ්න කිරීමේ දී SLSF භාර වූහ. කොණ්ඩය කොටට කපා සිටි තරුණියන් එල්ටීටීඊ කාර්යධරයන් ලෙස පහසුවෙන් හඳුනාගත හැකි වූ නිසා ඔවුන්ගේ තත්වය විශේෂයෙන්ම අවදානම් සහගත විය. තරුණයන් ප්‍රශ්න කිරීමේ දී ඔවුන් එල්ටීටීඊය සමග තිබූ සම්බන්ධතාවය පිළිනොගත හොත් බරපතළ ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදු වනු ඇතැයි අවවාද කෙරිණ.[288] හමුදා බලධාරීන් පරික්ෂා කිරීමේ ස්ථානවලදී සටන්වලට සහභාගි වූ එල්ටීටීඊ කාර්යධරයන් හා එල්ටීටීඊ හමුදා කාර්යධරයන් නොවූ අය අතර වෙනස් කොට හැඳින ගැනීමක් සිදු වූයේ නැත. ළමා ''භාරවූවන්'' මුලින්ම වැඩිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට ගෙනයන ලද නමුත් පසුව ළමයින් සඳහා වූ විශේෂ පුනරුත්ථාපන කඳවුරුවලට ගෙන යන ලදී. ( සන්නද්ධ කණ්ඩායම් ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ පරිච්ඡේදය බලන්න.)

364. මුලතිවු සහ ඕමන්තේ හි පරික්ෂා කිරීම සිදු වූ රඳවා ගත් ප්‍රදේශ තුනේදීම සන්නද්ධ කණ්ඩායම් සාමාජිකයන් හෝ තොරතුරු සපයන්නන් බවට පත් වූ එල්ටීටීඊ යේ හිටපු කාර්යධරයෝ, එල්ටීටීඊ හමුදා කාර්යධරයන්, එල්ටීටීඊ සාමාජිකයන් හා සහාය කාර්යන්ගෙන් එල්ටීටීඊයට සහාය වූවන් හඳුනා ගැනීමට ( සමහරු සිටියේ මුහුණ වසා ගෙනය.) හමුදා බුද්ධි නිලධාරීන්ට සහාය වූහ.[289] සන්නද්ධ ගැටුම අවසන්වීමට පෙර අල්ලා ගත් හෝ භාර වූ සමහර හිටපු සටන්කරුවෝ හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් විසින් ඔවුන් තම හිටපු කාර්යධරයන් හඳුනා ගැනීමට මුලතිවු කරා ගෙන ගිය බව විමර්ශන කොමිටියට පැවසූහ.[290][291]

365. තොරතුරු සපයන්නෝ එල්ටීටීඊ සාමාජිකයන් හඳුනා ගැනීමට හමුදා බුද්ධි නිලධාරීන් සමග නිරතුරුවම මනික් ෆාම් කඳවුරුවලට ඇතුළු වූහ.[292]ඔවුන් අභ්‍යන්තරව අවතැන් වූවන් අතරට ගොස් හඳුනා ගන්නා පුද්ගලයන් ප්‍රශ්න කිරීමට ගෙන යයි.[293] සමහර අයට ඉවතට ඇද ගෙන ගොස් අභ්‍යන්තරව අවතැන් වූවන් ඉදිරියේම පහරදී ඇත. තවත් සමහරුන් ගෙන ගියේ රාත්‍රීයේ

---

[287] 2006 1462/8 හදිසි නීති රෙගුලාසිවලින් සංශෝධනය කරන ලද EMPP රෙගුලාසි 2005 හි රෙගුලාසි 22.

[288] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[289] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[290] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[291] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[292] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[293] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

දිය.[294] කඳවුරු තුළ සම්පත් සඳහා පැවති ගැටුම් නිසාද සරණාගතයන් එකිනෙකාට විරුද්ධවී අනෙකුත් අය එල්ටීටීඊ සාමාජිකයන් ලෙස හෙළි කළ අතර එසේ හෙළිකරන ලද අය ඉවතට ගෙන යනු ලැබිණ.[295] සමහර අවස්ථාවල දී තමන් වසර ගණනාවකට පෙර එල්ටීටීඊය හැර ගිය බව සමහර පුද්ගලයන් ඕමන්තේ හිදී යුද හමුදාවට පැවසූ නිසා ඒ අවස්ථාවේ දී අත් අඩංගුවට නොගත් නමුත් පසුව මනික් ෆාම්වලට මාරු කිරීමෙන් පසුව අත් අඩංගුවට ගන්නා ලදී.

366. කලින් පරිච්ඡේදයේ සඳහන් කළ ආකාරයට භාර වූ සමහර අය නීතියෙන් පරිබාහිරව ඝාතනය කළ බව පැවසේ. අතුරුදහන් වූ අය සම්බන්ධයෙන් ඔවුන්ගේ ඥාතීහු සත්‍යය දැන ගැනීමේ අපේක්ෂාවෙන් තවමත් පසුවෙති. සමහරු හමුදා කඳවුරු තුළ ඇති රැඳවුම් මධ්‍යස්ථානවලට ගෙන ගියහ. අනෙක් අය සිටින තැනක් දැන ගැනීමට හෝ නිදහස් කිරීමට පෙර මාස ගණනාවක් තොරතුරක් ලබා ගත නොහැකි ආකාරයට හුදකලා කළ ස්ථානවල රඳවා ගත්හ. බොහෝවිට නිදහස් කර ඇත්තේ අල්ලසක් ලබා ගැනීමෙනි. වධ හිංසා සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භේදය පදනම් ප්‍රචණ්ඩත්වය පිළිබඳ IX සහ X පරිච්ඡේදවලින් බොහෝ රැඳවියන්ට සැලකූ ආකාරය විස්තර කෙරේ.

367. බොහෝ අවස්ථාවල නිදහස් කිරීමෙන් පසුව ද රැඳවියන්ට හමුදා කඳවුරු හෝ පොලිස් ස්ථානවලට වාර්තා කිරීමට නියෝග කෙරේ. නිදසුනක් වශයෙන් 2010 දී එක් කාන්තාවකට කිලිනොච්චියේ හමුදා කඳවුරකට වාර්තා කරන ලෙස හමුදාවේ අණදෙන නිලධාරියෙකුගෙන් දුර කතන ඇමතුමක් ලැබිණ. එහිදී ඇයගෙන් ප්‍රශ්න කොට වධහිංසා පැමිණ වූ බව පවසයි.[296]බොහෝ අවස්ථාවල සහ ඔවුන් රඳවා ගැනීමට නීතිමය පදනමක් නැති විට නිතිපතා පොලිසියකට හෝ හමුදා කඳවුරකට වාර්තා කිරීමේ කොන්දේසිය මත - බොහෝවිට සතිපතා, සති දෙකකට වරක්, හෝ මාසයකට වරක් (ප්‍රදේශයේ අණදෙන නිලධාරියා තීරණය කරන ආකාරයට ) රැඳවුම් හෝ පුනරුත්ථාපන කඳවුරෙන් නිදහස් කෙරේ. එහිදි ඔවුන් සමහර විට නැවත අත් අඩංගුවට ගැනිම, වධහිංසා පැමිණවීම සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු විම සිදු විය හැකිය.[297]

**රඳවා ගැනීමේ ස්ථාන.**

368. කොමිටිය රැස්කර ගත් තොරතුරු අනුව ඊනියා ''සුදුවෑන්''වලින් අත් අඩංගුවට ගැනීමේ වින්දිතයන් සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගත් වෙනත් අය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් නොයෙකුත් ස්ථානවල රඳවා ගෙන ඇත. මෙම ස්ථානවලින් සමහරක් බන්ධනාගාර වැනි නිල, ගැසට් කරන ලද ස්ථාන වන අතර අනෙක් ඒවා එසේ නොවේ.

369. කොළඹ බොහෝ දෙමළ අය රඳවා තිබුනේ වැලිකඩ (මැගසින්) බන්ධනාගාරය,[298] මීගමුව බන්ධනාගාරය, කෙසෙල්වත්ත සහ අලුත්කඩේ ඇතුළත් නගරයේ නොයෙකුත් පොලිස් ස්ථාන, කොළඹ TID පහසුකම් (සමහරවිට 6 වැනි තට්ටුව ලෙස හැඳින් වූ) සහ CID මූලස්ථානය ( සමහර විට 4 වැනි තට්ටුව ලෙස හැඳින්වෙන) වැනි ස්ථානවල ය. කොළඹින් දකුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගත් දෙමළ අය සිය ගණනක් රඳවා තබා ගත්තේ කළුතර බන්ධනාගාරය සහ ගාල්ලේ බූස්ස රැඳවුම් මධ්‍යස්ථානය යි.

370. කොමිටියෙන් සම්මුඛ සාකච්ඡා කළ වින්දිතයන් අචේලු, අචුවේලු, කච්චේරි, කොඩිකාමම්, තඩ්ඩාර් තේරු සහ උරේළු ඇතුළුව යුද හමුදාවේ කඳවුරු ගණනාවක රඳාගෙන තිබිණ. සමහරු තමන් නාවික කඳවුරුවල රඳවා ගෙන සිටි බව කීහ. 2015 දී තවමත් ත්‍රිකුණාමලය නාවික කඳවුරේ රහසිගත රැඳවුම් මධ්‍යස්ථානයක සමහරුන් රඳවා ගෙන සිටින බවට චෝදනා ඉදිරිපත්

---

[294] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[295] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[296] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[297] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[298] රිමාන්ඩ් මධ්‍යස්ථානයට ගෙන යන ලද අය මහෙස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කළ සහ නිල වශයෙන් අධිකරණ පාලනය යටතේ රැඳවූවන්ය.

වුවද ඒවා මෙම කොමිටියට තහවුරු කළ නොහැකිය. එහෙත් එය ඉක්මණින්ම විමර්ශනය කළ යුතුය.

371. වවුනියාවේ වන්නිය සඳහා වූ ආරක්ෂක බලකා මූලස්ථානයේ ජෝසප් කඳවුර ඒ දිනවල මේජර් ජනරාල් ජගත් ජයසූරියගේ අණ යටතේ පැවති අතර එය රැඳවියන් ප්‍රශ්න කිරීමට ( සහ බොහෝවිට වධහිංසා පැමිණවීමට) ගෙන යන ප්‍රධාන හමුදා කඳවුරුවලින් එකකි. එහි හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් මෙන්ම වරින් වර CID සහ TID  නිලධාරීහු ද සිටියහ.

372. ගැටුමේ අවසානයේ දී එල්ටීටීඊය හා සම්බන්ධතා පැවැත් වූයේයැයි හැඳින ගත් බොහෝ දෙනෙකු මුලින්ම වැඩියෙන්ම වවුනියාව සහ යාපනයේ පිහිටි ''ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන'' (PARC) වලින් එකකටත් ත්‍රිකුණාමලය අසළ (කණ්ඩකු හමුදා ගොවිපොළ) සහ මඩකලපුව අසළ (ත්‍රිකෝණමඩු ගුවන් හමුදා ගොවිපොළ) ගෙන යනු ලැබිණ. වාර්තාවී ඇති ආකාරයට රඳවා ගැනීමේ තත්වය විවිධය. නමුත් මෙම ස්ථාන බොහොමයක් පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සුළු ප්‍රමාණයක් ඇති හෝ කොහෙත්ම නැති රැඳවුම් මධ්‍යස්ථාන මෙන්යැයි කෙරෙන චෝදනා කොමිටියට ලැබිණ. ඇත්තෙන්ම ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන කඳවුරක නවතා තැබීම භාර වූවන් බොහොමයකට පරිපාලන රඳවා ගැනීමක් මෙන් විය. මෙම කොමිටියට එම ස්ථානවල සිටි රැඳවියන්ගේ විස්තර සමාලෝචනය කිරීම හැර ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල තත්වය හෝ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීමට අවස්ථාවක් ලැබුණේ නැත. කෙසේ වුවත් මෙම රැඳවුම් මධ්‍යස්ථාන කීපයක සිටි රැඳවියන්ට සිදු වූයේයැයි කියන වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා ලැබිණ. භාර වූ බොහෝ දෙනෙකු රහසිගත කඳවුරුවලට හෝ හමුදා කඳවුරු තුළ පිහිටි රැඳවුම් මධ්‍යස්ථාන, නිල රැඳවුම් මධ්‍යස්ථාන හෝ පොලිස් ස්ථානවලට ගෙන යනු ලැබිණ.

373. පාසල් ද ගැටුම අවසානයේ තාවකාලික රැඳවුම් පහසුකම් බවට පත් කළ ස්ථාන විය. 2009 මැයි මාසයේ දී තොරතුරු සපයන්නෙකු විසින් හඳුනාගෙන අත් අඩංගුවට පත් ගැහැනියක් මුලින්ම කලින් කාර්මික පාසලක් වූ පුන්තෝට්ටම පුනරුත්ථාපන කඳවුරේ රඳවා ගත් අතර එහි තවත් ස්ත්‍රීන් දහස් ගණනක් සිටියහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් කලින් එල්ටීටීඊ සටන්කාරියන් ය. ඔවුන් නතර කර සිටියේ විශාල ශාලාවක වුවත් එහි  වැතිර සිටීමට හෝ ඉඩක් තිබුණේ නැත. ඉන් පසු ඇය කලින් කෘෂිකාර්මික විද්‍යාලයක් වූ පොම්පයාමඩු පුනරුත්ථාපන කඳවුරට ගෙන යනු ලැබිණ. එහි ද දැඩි තදබදයක් තිබුණ අතර රැඳවියන් නිදා ගත්තේ කුඩාරම්වලය. CID සහ TID නිලධාරීන් සිටි බවත් ඔවුන් ප්‍රශ්න කිරීම් සිදු කළ බවත් පැවසේ.[299] 2009 මැයි මාසයේ සිට ඇය නිදහස් කළ 2010 අග දක්වා කාලය තුළ ඇය ස්ථාන හතරකට ගෙන ගිය බව පැවසුවාය.[300]

374. මෙම වින්දිතයා මෙන් අනෙකුත් රැඳවියන් ද නොයෙකුත් රැඳවුම් මධ්‍යස්ථාන සහ ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන අතර මාරු කරනු ලැබිණ.[301] මෙසේ මාරුකිරීම් ගණනාවක්[302]සිදු කිරීමෙන් පෙනී යන්නේ ආරක්ෂක හමුදාවල විවිධ අංශ අතර පැවති සමීප සහයෝගිතාවය යි. LLRC ද මෙම ක්‍රියාව නිසා රැඳවියන් සොයා ගැනීමට උත්සාහ කරන ඥාතීන්ට මතු වූ දුෂ්කරතා ගැන සඳහන් කරයි. ''කොමිසම ඉදිරියේ වැඩියෙන්ම මතු කරන ලද කරුණක් වූයේ රැඳවියන් නිරන්තරයෙන්ම කඳවුරෙන් කඳවුරට මාරු කිරීම නිසා පවුලේ සාමාජිකයන් සිටින ස්ථානය ඔවුන් බොහෝ දෙනෙකු නොදැන සිටීම ය.'' නිදසුනක් වශයෙන් 2009 මැයි මාසයේ දී වන්නියේ සිට පැමිණෙමින් සිටි අයෙකු පළමුව දින දෙකක් වවුනියාව පොලිස් ස්ථානයේ රඳවා ගෙන බූස්ස රැඳවුම් කඳවුරේ දින පහක් තබා ගෙන පසුව කොළඹ TID ස්ථානයකට යවා ඇත. ඊට පසුව නැවතත් බූස්සට මාරු කරන ලදී. 2009 අග දී

---

299 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

300 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

301 හදිසි නීති රෙගුලාසි යටතේ රැඳවියෙක් පළමුව මාස 18 ක් රඳවා ගත හැකිය. ඉන් පසුව වසර දෙකකට PARC කට යවනු ලැබේ. පසුව තවත් රැඳවුම් නියෝගයක් මත රැඳවුම් මධ්‍යස්ථානයකට ගෙන යනු ඇත.

302 ගැටුම් අවසන්වීමට පෙර වසරවල නිරන්තරයෙන්ම මාරු කිරීම් සිදුව ඇත

කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට යවන ලද ඔහු වසර හතරකට ආසන්න කාලයකින් පසුව නිදහස් කරන තෙක් වැලිකන්දට යවා ඇත.[303] කෙසේ වුවත් රැඳවියන් තම සම්පූර්ණ රැඳවුම් කාලය තුළ හෝ ඉන් කොටසක තමා රඳවා සිටි ස්ථානය පවා දැන සිටියේ නැත.

375. කෙසේ වුවත් තම ඥාතියා රඳවා ගෙන ඇති ස්ථානය දැන ගන්නා පවුල්වලට රැඳවියන් මාරු කරන බව දැනුම් දෙන්නේ නැති නිසා තම ඥාතියා බැලීමට එම ස්ථානයට ගිය පසුව ඔහු වෙනත් ස්ථානයකට මාරු කර යවා ඇති බව දැන ගැනීමට හැකි වේ.

376. ඉහතින් දක්වන ලද ආකාරයට 2013 ජනවාරි 21 මානව අයිතිවාසිකම් කොමිටියට ඉදිරිපත් කර ඇති පස්වැනි කාලීන වාර්තාවෙන් ''සියලුම කාර්යධරයන් ගේ විස්තර ඇතුළත් දත්ත බැංකුවක් සකස් කොට නිකුත් කර ඇතැයි'' ආණ්ඩුව කියා සිටී. කෙසේ වුවත් විමර්ශන කොමිටියට එවැනි දත්ත බැංකුවක් පැවති බව තහවුරු කළ නොහැකිය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් පිළිබඳව ගොණු කරන ලද හබෙයාස් කෝපුස් ඉල්ලුම් පතක් අනුව තම නිදහස අහිමි කරන ලද පුද්ගලයන් පිලිබඳව තොරතුරු සොයන සමීප ඥාතීන්ට TID කාර්යාලයෙන් විමසිය හැකි බව සඳහන් දැන්වීමක් පුවත් පත්වල පළ විය. කෙසේ වුවත් රඳවා ගත් හෝ අතුරුදහන්ව ඇති අයගේ පවුල්වලට සහායවීමට කිසියම් ආකාරයේ නිල යාන්ත්‍රණයක් පැවති බවක් දැකිය නොහැකිය.

**රැඳවුම් මධ්‍යස්ථානවලට පිවිසිය නොහැකිවීම**

377. ස්වාධීන නිරීක්ෂකයන්ට බොහෝ රැඳවුම් මධ්‍යස්ථානවලට විශේෂයෙන්ම හමුදා කඳවුරු වැනි රඳවා ගැනීමේ නිල නොවන මධ්‍යස්ථානවලට පිවිසීමට ලැබුණේ සුළු විධිමත් නොවූ අවස්ථාවක් පමණි. නැතිනම් ලැබුණේම නැත. නීතිඥයන්ටද රැඳවුම් මධ්‍යස්ථාන බොහොමයකට, විශේෂයෙන්ම රඳවා ගැනීම පිළිනොගත් ස්ථානවලට පිවිසීමට නොහැකි විය.

378. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභා පනත අනුව කොමිසමට '' අධිකරණ නියෝගයකින් හෝ වෙනත් ආකාරයට රඳවා ගෙන ඇති පුද්ගලයන්ගේ සුභ සිද්ධිය නිරීක්ෂණය කිරීම සඳහා ඔවුන් රඳවා ගෙන සිටින ස්ථාන විධිමත්ව පරික්ෂා කිරීමටත් රඳවා ගැනීමේ තත්වයන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමටත් හැකියැයි'' දක්වා ඇත. 2006 ජනාධිපති විධානයන් අනුව මානව හිමිකම් කොමිසමට අත් අඩංගුවට ගැනීම් දැනුම් දීමටත් කොමිසමට එම ස්ථාන පරික්ෂා කිරීමට ඉඩ ලබා දෙන ලෙසත් නියෝග කර ඇත. හදිසි නීති රෙගුලාසි යටතේ සිදු කෙරෙන රඳවා ගැනීම් පිළිබඳව මානව හිමිකම් කොමිසමට විධිමත්ව දැනුම් දුන් බව හෝ රඳවා ගත් ස්ථානවලට, නිදසුනක් වශයෙන් හමුදා කඳවුරුවලට පිවිසීමට හැකි බවක් පිළිබඳ තොරතුරු කොමිටියට ලැබුණේ නැත.

**චෝදනා හෝ නඩු විභාගයක් නැතිව දිගු කාලයක් රඳවා ගැනීම.**

379. රඳවා ගෙන සිටි අය විස්තර කරන ආකාරයට රඳවා ගැනීමේ කාලය දින කීපයක සිට සති ගණන් හෝ වසර කීපයක් දක්වා විය හැකිය. බොහෝවිට අන්තර්ජාතික ප්‍රමිතීන්ට පටහැනි හදිසි නිති රෙගුලාසි යටතේ දක්වා ඇති වසර දෙකේ කාලයද ඉක්මවා යයි. ආණ්ඩුව දක්වන ආකාරයට 2010 සැප්තැම්බර් වන විට රඳවා ගැනීමෙන් මාස 16 කට පසුවත් නවතා ගෙන ඇති සංඛ්‍යාව 7,382 කි.[304] 2011 ජුලි වන විටත් මුලින්ම රඳවා ගත් ආසන්න වශයෙන් 12,000 ක් පමණ වූ භාරවූවන්ගෙන් 5000 ක් පමණ 'පුනරුත්ථාපන මධ්‍යස්ථානවල' තවමත් රඳවා ගෙන ඇතැයි වාර්තාවිය. ඒ බොහෝවිට විනිශ්චයකරුවෙකු හෝ අධිකරණ බලය පාවිච්චි කිරීමට නීතියෙන් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීමක් නොමැතිවය. අද දක්වාම සමහරුන් රඳවා ගෙන සිටින නමුත් කොපමණ සංඛ්‍යාවක් ද, කවුද, සහ ඔවුන් රඳවා ඇත්තේ කොතැනද යන්න පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගත නොහැකිය.

[303] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[304] රාජ්‍ය තාන්ත්‍රික මූලාශ්‍ර ගොණුවේ

380. LLRC 2010 දී ආණ්ඩුවට ඉදිරිපත් කළ අන්තර්වාර නිර්දේශවලින් ''චෝදනා ඉදිරිපත් කිරීමක් නැතිව දීර්ඝ කාලයක් රඳවා ගෙන ඇති පුද්ගලයන්ට අදාලව නිරන්තරයෙන් ලැබෙන පැමිණිලි'' ගැන සඳහන් කොට ''එක් එක් පුද්ගලයා වෙන වෙනම විභාග කොට එක් එක් පුද්ගලයා ගැන ගතයුතු ක්‍රියාමාර්ගය නිර්දේශ කිරීම සඳහා'' විශේෂ යාන්ත්‍රණයක් පිහිටුවීමට නිර්දේශ කර ඇත. රඳවා ගෙන ඇති අයගේ නාම ලැයිස්තුවක් ප්‍රකාශ කිරීමටත්, නිදහස් කරන ලද අය අලුතින් සාක්ෂි ඇත්නම් හැර නැවත අත් අඩංගුවට ගැනීමෙන් වැළැක්වීම සඳහා ඔවුන්ට ''නිදහස්'' කිරීමේ සහතියක් නිකුත් කිරීමටත් LLRC නිර්දේශ කර ඇත. රඳවා ගෙන ඇති පුද්ගලයන් ගැන විභාග කිරීමට විශේෂ යාන්ත්‍රණයක් පිහිටුවීමට LLRC කළ නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක කර නැත.

381. කොමිසම එහි අවසාන වාර්තාවෙන් අත් අඩංගුවට සහ රඳවා ගැනිමට අදාල ආරක්ෂා සම්බන්ධයෙන් ප්‍රබල නිර්දේශ ගණනාවක්ම නිකුක් කර ඇත. රැඳවියන්ගේ ආසන්න ඥාතින්ට ලබා ගත හැකි, රැඳවියන්ගේ නම්. රඳවා ඇති ස්ථානය, මාරු කරන ලද ස්ථාන ඇතුළත් රැඳවියන්ගේ නාම ලැයිස්තුවක්, එම තොරතුරු ඔවුන්ගේ පවුලවලට ලබා ගත හැකි ආකාරයට දත්ත බැංකුවක් පිහිටුවීමත් එම නිර්දේශවලට ඇතුළත් ය. මහජන ආරක්ෂක පනත හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගෙන රඳවා හෝ සිරගත කර ඇති පුද්ගලයන් අධීක්ෂණය සහ විභාග කිරීමට ස්වාධීන උපදේශක කමිටුවක් පිහිටුවීමට ද LLRC නිර්දේශ කර ඇත. (ඡේද 9.53 සිට 9.71)

382. වඩාත් වැදගත්ව LLRC මෙසේ සඳහන් කරයි. '' අත් අඩංගුවට ගැනීමක්, රඳවා ගැනිමක්, සහ මාරු කිරීමක් වාර්තා කිරීමට හෝ පැහැර ගැනිමක් පිළිබඳ පැමිණිල්ලක් වාර්තා කිරිම පොලීසිය විසින් ප්‍රතික්ෂේප කිරීම සහ ඒ ගැන විමර්ශනය කිරීමට අපොහොසත්වීම අපරාධයක් සේ සැලකිය යුතු අතර එවැනි වැරදිකරුවන්ට චෝදනා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.'' (ඡේද 9.55) මෙම LLRC නිර්දේශය ක්‍රියාත්මක වූයේ නැත.

383. ඉහතින් සඳහන් කළ ආකාරයට ''භාර වූවන්''/රැඳවියන් අවසානයේ දී රැඳවුම් භාරයෙන් නිදහස් කිරීමේ නිර්ණායක පැහැදිලි නැත. කොමිටිය විසින් ලේඛන ගත කරන ලද සිද්ධීන් 16 කදී සහ අනෙකුත් අය වාර්තා කර ඇති සිද්ධීන්වලදී ද නිදහස ලබා ගෙන ඇත්තේ රැඳවියාගේ පවුලේ සාමාජිකයෙකු විසින් අතර මැදියෙකු හරහා විශාල අල්ලසක් ලබා දීමෙනි. EPDP ය එවැනි අතරමැදියෙකු වශයෙන් සාමාන්‍යයෙන් හඳුනා ගෙන ඇත.[305] රැඳවියන් නිදහස් කර ගැනිමට මුදල් භාර ගැනීම බහුලව සිදු වු බව පෙනේ. මෙය රඳවා ගත් පුද්ගලයන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නේය යන බලධාරීන්ගේ මතය හා ඍජුවම පරස්පරය.

384. රැඳවියන් නිදහස් කිරීමෙන් පසුව හැම විටම රැඳවීමෙන් නිදහස් බව තහවුරු කරන ලිපි ලේඛන නිකුත් නොකරන නිසා නිතිපතා ආරක්ෂක හමුදාව වෙත වාර්තා කරන ලෙස ඉල්ලා සිටිමටත්. දිගටම සෝදිසියට, හිරිහැර, හා නැවත අත් අඩංගුවට ගැනීමේ තර්ජනයට ලක්විය හැකිය.[306] තමා 2010 දී යුද හමුදාවේ රඳවා ගැනීමෙන් නිදහස් කළ ද නිදහස් කිරීමේ ලිපි ලේඛන නොදුන් නිසා නැවත අත් අඩංගුවට ගැනීමේ බියෙන් දිගටම සිටි බව එක පුද්ගලයෙකු කොමිටියට පැවසුවේය. පසුව ඔහුට 2011 නොවැම්බර් මාසය තෙක් සති පතා CID යට නිතිපතා වාර්තා කිරීමට නියෝග කර ඇත. අවසානයේ දී ඔහු අත් අඩංගුවට ගෙන බරපතළ ලෙස වධහිංසා පැමිණ වූ බව පැවසේ.[307]

385. 2015 ජනවාරි මස වැඩ භාරගත් ආණ්ඩුව ත්‍රස්තවාදය යටතේ රඳවා ගෙන සිටින සියලු දෙනාගේම තත්වය සමාලෝචනය කිරීමට පොරොන්දු විය. ආණ්ඩුව රැඳවියන්ගේ සම්පූර්ණ

---

305 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

306 රාජ්‍ය තාන්ත්‍රික මූලාශ්‍ර ගොනුවේ

307 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ලැයිස්තුවක් තහවුරු කිරීමේ දී අභියෝගවලට මුහුණ දී ඇති බව පෙනේ. ඒ පිළිබඳව ICRC සමග සමීපයෙන් වැඩ කරන බව පවසා ඇත.

## VIII බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්.

### හැඳින්වීම/ සන්දර්භය

386. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සන්නද්ධ ගැටුමේ සියලු අවධීන්වලදී මෙන්ම කලින් ජනතා විමුක්ති පෙරමුණේ කැරලිකාරිත්වය පැවති කාල පරිච්ඡේදයේදි ද ඔවුන්ගේ පවුල්වලට මෙන්ම පුළුල් ප්‍රජාවන්ටද විනාශකාරී ප්‍රතිඵල අත් කර දුන් ශ්‍රී ලාංකිකයන් සිය දහස් ගණනකට බලපෑ සංසිද්ධියකි.

387. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ශ්‍රී ලංකාවේ දිගු කලක සිටම පැවති සුවිශේෂී තත්වයකි. නිදසුනක් වශයෙන් බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) 2014 නිකුත් කළ වාර්තාව අනුව එම වසර තුළ බලහත්කාරයෙන් සිදු කළ අතුරුදහන් කිරීම් 12,536 ක් පිළිබඳ පැමිණිලි ඔවුන්ට ලැබී ඇත. එය ක්‍රියාකාරී කණ්ඩායමේ ලැයිස්තුව අනුව ලොව කිසියම් රටකින් ලැබුණු දෙවන විශාල අතුරුදහන් කිරීම් සංඛ්‍යාව[308] වන අතර එය වඩාත් කැපී පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් කුඩා වීමත් සමග සැසැඳීමේ දීය.[309] 2007 දී ක්‍රියාකාරී කණ්ඩායම අතුරුදහන් කිරීම් පිළිබඳ සිද්ධීන් ගැන ශ්‍රී ලංකා ආණ්ඩුවට 2006 ට වඩා වැඩි හදිසි අභියාචනා සංඛ්‍යාවක් ඉදිරිපත් කළ බව සඳහන් කරයි. එය ලොව කිසියම් රටකට ඉදිරිපත් කළ වැඩිම අභියාචනා ප්‍රමාණයයි.[310]

388. ඉහත පරිච්ඡේදවලින් ශ්‍රී ලංකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පහසුකළ බොහෝ සාධක විස්තර කෙරිණ. මෙම කොටසෙන් කොමිටියේ මැන්ඩේට් බලය ඇති කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද බලහත්කාර අතුරුදහන් කිරීම්, ආරක්ෂක හමුදා මෙහෙයුම් තත්වයන් තුළ, සමහරවිට සන්නද්ධ කණ්ඩායම් සමග එකතු වී සිදු කරන ලද ඉලක්ක කරගත් අතුරුදහන්කිරීම් ඇතුළත්ව දිගටම සිදු කරන ලද බලහත්කාර අතුරුදහන් කිරීම් ගැන විමසා බලනු ඇත. එය සන්නද්ධ ගැටුම අවසානයේ දී තමන් එල්ටීටීඊ කාර්යධරයන් ලෙස හඳුවා ගැනීමෙන් හමුදාවට භාරවීමෙන් පසුව අතුරුදහන් වූ පුද්ගලයන් ගණනාවක් ගැන ද ලේඛන ගත කරනු ඇත. විමර්ශන කොමිටියේ මැන්ඩේට් බල කාල සීමාවෙන් පසුව ද අලුතෙන් බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධීන් වූ බවට චෝදනා ඉදිරිපත්විය.

389. විමර්ශන කොමිටිය එහි මැන්ඩේට් බලය ඇති කාල සීමාවට පෙර කාල සීමාවන් තුළ අතුරුදහන් පුද්ගලයන් ගැන වෙන වෙනම සමාලෝචනය කෙළේ නැත. කෙසේ වුවත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම දිගටම සිදුවන උල්ලංඝනය කිරීමක් වන නිසා අතුරුදහන් වූ තම ආදරණීයන් වෙනුවෙන් තවමත් සත්‍යය සහ යුක්තිය අපේක්ෂාවෙන් සිටින පවුල්වලින් ලැබුණු තොරතුරු ද සමාලෝචනය කෙරිණ. මෙම කොටසෙන් තම ආදරණීයන් සිටින තැන සහ ඔවුන්ගේ ඉරණම ගැන සොයමින් සිටින පවුල් ගැන විශේෂයෙන් සඳහන් වනු ඇත.

390. වඩාත් වැදගත්ව මෙම පරිච්ඡේදයෙන් කොමිටියේ මැන්ඩේට් බල කාල සීමාව තුළ යම් සිද්ධියක් වූයේද නැද්ද නොසලකා බලහත්කාරයෙන් අතුරුදහන් කළ වින්දිතයන්ගේ ඉල්ලීම් පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිචාර ද පරික්ෂා කෙරේ. අතුරුදහන්වීම් දහස් ගණනක් සිදු වුවද, ඒවා ගැන සොයා බැලීමට ජාතික කොමිසන් සභා ගණනාවක් පත් කළද, සිදුව ඇති දේ සම්පූර්ණයෙන් පැහැදිලි කර ගෙන ඇත්තේ ඉතා සුළු සංඛ්‍යාවක පමණි. එමෙන්ම වැරදිකරුවන් ලෙස හඳුනා ගෙන ඇත්තේ සුළු දෙනෙකු පමණි. අතුරුදහන් කිරීම්වලට අදාල කරුණු විසඳීම කිරීම සඳහා ස්ථාපනය කරන ලද යාන්ත්‍රණ බොහොමයක් අතුරුදහන් වූවන්ගේ ඉරණම

308 බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් කරන ලද අතුරුදහන් කිරීම් පිළිබඳ වාර්තාව අගොස්තු 4 , 2014

309 Op cit. p 31

310 A/HRC/10/9, para 306.

පැහැදිලි කිරීමට සහ වැරදිකරුවන් අධිකරණය හමුවට ගෙන ඒමට අර්ථාන්විත ප්‍රතිචාර දක්වා නැත.

391. 'නැතිවූ' පුද්ගලයන් පිළිබඳ සියලු සිද්ධීන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ නිර්වචනයට ගැනෙන්නේ නැත. නිදසුනක් වශයෙන් සටන් කිරීමේ දී සටන් බිමේ දී නැති වූ හමුදා සාමාජිකයන් මෙම නිර්වචනය කිරීමෙන් බැහැර කෙරේ. එසේ වුවත් එවැනි පුද්ගලයන්ගේ ආගිය තැනක් පිළිබඳව සොයා බැලීමට, නැති වූ පුද්ගලයා සොයා ගැනීමට ගන්නා පියවර කිසියම් ප්‍රගතියක් ඇතිනම් ඒ බව ඔවුන්ගේ පවුල්වලට දැනුම් දීමට, ගැලපෙන්නේනම් ඔවුන් තම පවුල් සමග නැවත එකතු කිරීමට හෝ මියගිය බව සහතික වන්නේ නම් මළ සිරුර භාර දීමට සියලු ප්‍රයත්න ගැනීම ආණ්ඩුවේ යුතුකමකි.

392. බලහත්කාරයෙන් බඳවා ගැනීමේ තත්වය ඇතුළත් එල්ටීටීඊ පැහැර ගැනීමේ සිද්ධීන් XI පරිච්ඡේදයේ විස්තර කෙරෙනු ඇත.

393. බලහත්කාර අතුරුදහන් කිරීමේ ස්වභාවය පැහැදිලි කිරීමට නිදහස අහිමි කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ සම්බන්ධතාවය සහ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ අතුරුදහන් කළ පුද්ගලයා සිටින තැන හෝ ඔහුගේ ඉරණම සැඟවීම, පුද්ගලයා නීතියේ ආරක්ෂාවෙන් බැහැර කොට තැබීම ඇතුළත් විවිධ ලක්ෂණ ගෙනහැර දැක්විය යුතුය.

394. කෙසේ වුවත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ මුක්තිය සේ සැලකිය හැකි එකිනෙකට ගැලපෙන තොරතුරු විමර්ශන කොමිටිය රැස්කර ඇත. විමර්ශන කොමිටිය සිය විමර්ශනයේ දී අන්තර්ජාතික සහ ශ්‍රී ලාංකීය රාජ්‍ය නොවන සංවිධාන සහ එවැනි සිද්ධීන් පුළුල් වශයෙන් ලේඛන ගත කර ඇති WGEID වැනි වෙනත් යාන්ත්‍රණ රැස්කර තිබෙන තොරතුරු විශාල ප්‍රමාණයක් සමාලෝචනය කෙළේය.[311] විමර්ශන කොමිටිය අතුරුදහන් කළ අයගේ ඥාතීන් සමග ඍජුවම වැඩ කරන සංවිධාන සාමාජිකයන් හා තවමත් අතුරුදහන්ව සිටින අය අත් අඩංගුවට ගැනීම, රඳවා ගැනීම සහ පැහැර ගැනීම දුටු සාක්ෂිකරුවන් සමග සම්මුඛ සාකච්ඡා කෙළේය. නිදසුන් වශයෙන් කොමිටිය විසින් සාකච්ඡා කළ කලින් රැඳවියන්ව සිටි බොහෝ දෙනෙක් ඔවුන් රැඳවියන්ව සිටිය දී හමුදා අත් අඩංගුවේ සිටි පුද්ගලයන් පසුව අතුරුදහන් වූ බව පැවසූහ. කොමිටියට එවන ලද ලිඛිත කරුණු සමාලෝචනය කිරීමෙන් මෙවැනි විස්තර වඩාත් තහවුරු විය.

395. ඊට අමතරව මෙම කොමිටිය අතුරුදහන් කිරීම් ගැන පරීක්ෂා කිරීමට පත් කරන ලද ශ්‍රී ලංකා කොමිසන් සභා කීපයක ප්‍රකාශයට පත් නොකළ වාර්තා සහ ශ්‍රී ලංකා පොලිසිය සහ ජාතික සහ අන්තර්ජාතික නිසි බලධාරීන් වෙනත් ආයතන වලට කරන ලද පැමිණිලිවල පිටපත් සමාලෝචනය කෙළේය.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ රජයේ ප්‍රතිචාර.**

396. මෙම ගැටලුවේ පරිමාව කෙතරම් වුවද ශ්‍රී ලංකා බලධාරීන් බොහෝ දුරට බලහත්කාර අතුරුදහන් කිරීමේ සංසිද්ධිය ගැන වැඩි අවධානයක් යොමු නොකළ අතර ආරක්ෂක හමුදාවල සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කෙළේය. මීට ව්‍යතිරේකයක් වන්නේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් අවසන් කිරීමේ පොරොන්දුව මත 1994 දි බලයට පත් ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ය. ඇය මෙම ගැටලුව විසඳීමට පියවර කීපයක් ගත් නමුත්, ඉදිරියේ

[311] Human Rights Watch, ශ්‍රී ලංකාවේ ''අතුරුදහන්වීම්'' සහ පැහැර ගැනීම් පිළිබඳ නැවත නැවතත් ඇති බියකරු රාජ්‍ය වගකීම මාර්තු 2008, SLMM ලේඛන, Human Rights Watch, නෛතික පාතාලයඃ ශ්‍රී ලංකාවේ රඳවා ගෙන ඇති එල්ටීටීඊ සැකකරුවන්ගේ අවිනිශ්චිත ඉරණම 2010, Human Rights Watch International Crisis Group , 2007අපරාධයට හවුල්වීම, ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් අර්බුදය, Amnesty International, වධ හිංසා නවතනු, වසර 5 ක් ගතව, සුදු කොඩි සිද්ධිය 2009-2014, 2014.

දී දැක ගැනීමට හැකි ආකාරයට වගවීම නිරාකරණය කිරීමට ගත් ප්‍රයත්න සීමා කෙරෙන බාධා ගණනාවක් තිබිණ.

397. 2005 නොවැම්බර් මාසයේ සිට ජනාධිපති මහින්ද රාජපක්ෂ යටතේ ආණ්ඩුවේ බලධාරීහු බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ කිසියම් වගකීමක් භාර ගැනීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කළහ. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා ''ආණ්ඩුවේ අධිෂ්ඨානය දුර්වල කිරීම සඳහා ඊට බලපෑම් කිරීමේ අදහසින් අන්තර්ජාතිකව අඳුරු චිත්‍රයක් ඇති කිරීම සඳහා උත්සාහ කරන කුරිරු ත්‍රස්තවාදී සංවිධානයක ප්‍රචාරක උපක්‍රමයක ප්‍රතිඵලයක්යැයි'' එවකට මානව අයිතිවාසිකම් සහ ආපදා කළමනාකරණ ඇමති මහින්ද සමරසිංහ පැවසුවේය.[312] ''තම පාලන සමයේ අතුරුදහන්ව වූයේයැයි වාර්තා වී ඇති සමහරුන් තම නිවෙස්වලට නොදන්වා මධු සමය ගත කිරීමට ගොස් ඇතැයි'' ජනාධිපති මහින්ද රාජපක්ෂ 2007 ඔක්තෝබර් මස පැවසුවේය.[313] ''මෙම අතුරුදහන්වීමේ ලැයිස්තු සියල්ල ඉලක්කම් පමණක්යැයි පැවසූ ඔහු අතුරුදහන්වීම් සහ මානව අයිතිවාසිකම් කඩ කිරීමේ සිද්ධීන් නොවූ බවක් තමා නොපවසන අතර ''ඒවාට ආණ්ඩුවේ කිසිම සම්බන්ධයක් නැති බව ස්ථිරවම පවසන්නේයැයි''[314] වැඩි දුරටත් කීවේය.

398. මෙවැනි ප්‍රකාශන 2012 මැයි මස එවකට ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂ ද කෙළේය. අතුරුදහන් බොහෝ දෙනෙක් පිටරට යැමට ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගොස් ඇතැයිද, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ චෝදනා ශ්‍රී ලංකාව ගැන වැරදි චිත්‍රයක් ඇති කිරීමට... වැරදි ප්‍රතිරූපයක් ඇති කිරීමට ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කිරීමට උත්සාහ කරන එල්ටීටීඊයේ නටඹුන්ව ඇති කොටසකගේ උත්සාහයක්යැයි ඔහු කීවේය.[315] 2014 දී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ මානව අයිතිවාසිකම් කොමිටියට ඉදිරිපත් කරන 5 වැනි වාරික වාර්තාව සැලකිල්ලට ගැනීමේ දී ආණ්ඩුව මෙසේ කීවේය: '' අතුරුදහන් කිරීමේ මාර්ගයක් ලෙස ''සුදු වෑන්'' ගැන කෙරෙන සඳහන් යථාර්ථවාදී කරුණු මත පදනම් වීමට වඩා සමහර ජනමාධ්‍යවල පළවූ හැඟීම් අවුස්සන චෝදනාය.'' එමෙන්ම ආණ්ඩුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ දී හමුදාවේ සම්බන්දතාවයක් ඇතැයි නැගෙන චෝදනා ද සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කෙළේය.[316]

399. කෙසේ වුවත් ආණ්ඩුවේ නිලධාරීන් සුළු පිරිසක් අතුරුදහන් කිරීම් පිළිබඳ ආණ්ඩුවේ වගකීම පිළිගත්හ. 2007 පෙබරවාරි මස මුල දී එවකට විදේශ ඇමති වූ මංගල සමරවීර ජනාධිපති වෙත ලිපියක් යවමින් සෑම පැය පහකට වරක් ශ්‍රී ලංකාවේ පැහැර ගැනීමක් සිදු වන්නේයැයිද ''කවුරුන් එය සිදු කළත් ආණ්ඩුවක් ලෙස අප ඊට වගකිව යුතුයැයි'' ද කීවේය.[317]

400. 2010 දී LLRC ජනාධිපති වෙත ඉදිරිපත් කළ අන්තර්වාර වාර්තාවේ 9.47 ඡේදයෙන් බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව කඩිනම් පියවර ගන්නැයි ඉල්ලීමක් කරමින් එවැනි සිද්ධීන් විසඳීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කර ඇත. එහි නඩු විභාගයන් හිදී බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ පැමිණිලි 1000 කට අධික සංඛ්‍යාවක් ලැබෙමින් පවතින බව සඳහන්

---

312 හැම දෙසක්ම සාමාන්‍ය ආකාරයට විය හැකියැයි අපේක්ෂා කළ නොහැකිය" The Nation, 18 March 2008 http://www.nation.lk/2007/03/18/inter 3htm

313 බටහිර ජාතිකයෝ මගේ ප්‍රභූ නොවන නායකත්වය පිළිකුල් කරති- මහින්ද රාජපක්ෂ The Asian Tribune 4 October 2007. http://www.asiantribune.com/node/7650

314 Ibid

315 Gotabaya Rajapaksa Sri Lanka north 'not just for tamils' BBC, 28 May 2012 http://www.bbc.com/news/world-asia-18207198

316 CCPR/C/LKA. මානව අයිතිවාසිකම් කොමිටිය විසින් 2014 ඔක්තෝබර් 7 – 8 ICCPR යටතේ ඉදිරි පත් කළ ශ්‍රී ලංකාවේ වාරික වාර්තාව සලකා බැලීම 'ගැටලු ලැයිස්තුව' ට ශ්‍රී ලංකාණ්ඩුව කලින් දෙන ලද ලිඛිත ප්‍රතිචාරවලට අතිරේකව මානව අයිතිවාසිකම් කොමිටිය මතු කරන ලද ප්‍රශ්නවලට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රතිචාර. 2014 ඔක්තෝබර් 7 ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තානාපති ගරු රවිනාථ පී ආරියසිංහ මහතා ගේ ආරම්භක ප්‍රකාශය

317 විදේශ ඇමති ආණ්ඩුවේ දූෂණ හෙළි කරයි. The Sunday Leader, 28 January 2007. http://www.thesundayleader.lk/archive/20070128news,htm

කරන එම වාර්තාව ''රාජ්‍යයේ වගකීම වන්නේ භාරවීමෙන් හෝ සිරභාරයට පත් කිරීමෙන් ආණ්ඩුවේ අධිකාරීන්ගේ අත් අඩංගුවට පත්වෙන ඕනෑම පුද්ගලයෙකුගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කිරීම''යයි අවධාරණය කරයි.

**බලහත්කාර අතුරුදහන් කිරීමේ රටාව**

401. මෙම කොටසෙන් පැහැදිලි කරන අයුරු මෙතෙක් පැවති සෑම ආණ්ඩුවක්ම, ආණ්ඩුව විවේචනය කරන්නේයැයි සිතන අය හෝ විපක්ෂ ව්‍යාපාරවලට සහයෝගය ලබා දෙන හෝ සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ අය ඉලක්ක කර ගැනීමට බලහත්කාර අතුරුදහන් කිරීම් යොදා ගෙන ඇත. නිදසුනක් වශයෙන් WGEID වාර්තා, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ඒවා දක්වන ආකාරයට 1971 සහ 1987 – 89 ජවිපෙ කැරලි සමයේ දී ශ්‍රී ලාංකිකයන් දහස් ගණනක්, විශේෂයෙන්ම සිංහලයන් ආරක්ෂක හමුදා විසින් අත් අඩංගුවට ගැනීමෙන් පසු අතුරුදහන්ව ඇත. 1996 දී ආණ්ඩුවේ හමුදා යාපනය නැවත එල්ටීටීඊ පාලනයෙන් මුදා ගත් පසු සිරභාරයට පත් දෙමළ ජාතිකයන් සිය ගණනක් අතුරුදහන්ව ඇත. තවත් බොහෝ දෙනෙක්, එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සිතන දෙමළ ජාතිකයන් විශාල සංඛ්‍යාවක් ඉන් පසුව අතුරුදහන්ව ඇත.

402. මෙම කොමිටියේ විමර්ශනයෙන් ආවරණය වන මුළු කාල පරිච්ඡේදය පුරාම බලහත්කාර අතුරුදහන් කිරීම්වල පරිමාණය උච්චාවචනය විය. අඩ වශයෙන් 2002 සටන් විරාම ගිවිසුම නිසා මෙම සංඛ්‍යාවේ පහත වැටීමක් තිබුණ ද විවිධ මූලාශ්‍රවලින් ලැබුණ එකිනෙකට සැසඳෙන වාර්තා අනුව 2005 සිට ඉදිරියට එහි කැපී පෙනෙන වැඩිවීමක් වූ බව පෙන්නුම් කරයි. නීතියෙන් පරිබාහිර, ළඝු හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරුගේ ගේ 2005 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ සංචාරයෙන් පසුව නිකුත් කරන ලද වාර්තාව අනුව අතීතයේ දී ශ්‍රී ලංකාව කැළඹූ බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් කිරීමේ රටාව නැවතත් මතුවීම පිළිබඳ වාර්තාවීමෙන් තමා බෙහෙවින් කලබලයට පත් වූ බව ඔහු සඳහන් කරයි. '' පිරිහෙමින් පවතින ආරක්ෂක තත්වය නැවත වරක් අතීතයේ පැවති අපහරණ භාවිතය කරා යොමු විය හැකි බැවින් අනතුරු හැඟවීමේ සටහන් තැබුවෙමි.''[318] ඉන් පසුව විශේෂ සම්බන්ධීකාරක ''රඳවා ගැනීම් පිළිබඳ අවශ්‍ය කෙරෙන සියලු ආරක්ෂා විධික්‍රම සම්පූර්ණයෙන්ම පිළිපදින ලෙස'' ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.[319]

403. WGEID 2006 දී නිකුත් කළ වාර්තාවෙන් ''දිවයිනේ උතුරු නැගෙනහිර කලාපයේ සටන් නැවත ඇවිළ යෑමත් සමග විශේෂයෙන්ම එම ප්‍රදේශයේ මෑතකදී සිදුවූයේයැයි කියන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ වාර්තා වැඩිවීම ගැන සිය බරපතළ කණස්සල්ල'' දක්වයි.[320] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම 2006 මැද භාගයේ නිකුත් කරන ලද සංඛ්‍යා අනුව 2005 දෙසැම්බර් මාසයෙන් පසුව යාපනය අර්ධද්වීපයේ පුද්ගලයන් 419 ක් අතුරුදහන්ව ඇත.

404. 2007 හා 2009 අතර කාලයේ දී WGIED වෙත වාර්තා වූ බලහත්කාර අතුරුදහන් කිරීම් සංඛ්‍යාව වැඩි වෙමින් පැවතිණ. 2007 දී WGIED රට තුළ මෑතක වාර්තාවූ බලහත්කාර අතුරුදහන් කිරීම් සංඛ්‍යාවේ වැඩිවීම ගැන සිය බරපතළ අවධානය යොමු කරන බව සඳහන් කර ඇත. එම වාර්තාවේ වැඩි දුරටත් මෙසේ සඳහන් වේ. ''යාපනයෙන් වාර්තා වූ සිද්ධීන්වලට අමතරව මෑතකදී කොළඹින් වාර්තා වූ සිද්ධීන් කණගාටුදායක ප්‍රවනතාවයක් පෙන්නුම් කිරීම බරපතළ අවධානයට ලක් විය යුතුය. මේවායින් රට තුළ අතුරුදහන් කිරීමේ පුළුල් රටාවක්

---

[318] E/CN.4/2006/53/Add.5.27 March 2006 paragraph 68

[319] Ibid

[320] බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් කළ අය පිළිබඳව ක්‍රියාකාරි කණ්ඩායමේ වාර්තාව 25 ජනවාරි 2007
A/HRC/4/41. paragraph 396

පැවති බව පෙන්නුම් කෙරේ.''[321] 2007 ඔක්තෝබර් 31 රාජ්‍ය නොවන සංවිධාන තුනක් සවිස්තරාත්මක නොවන බව සඳහන් කරමින් පළ කළ ලැයිස්තුවක් අනුව 2007 ජනවාරි මස සිට අගෝස්තු දක්වා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිද්ධීන් 540 ක් වූ බව[322] සඳහන් කරයි.

405. WGIED 2008 වාර්ෂික වාර්තාවේ ශ්‍රී ලංකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිද්ධීන්[323] සංඛ්‍යාව විශාල ලෙස වැඩිවීම ගැන ''පුදුමයට'' පත්වන බව සඳහන් කරමින් ''තම හදිසි ක්‍රියා පටිපාටිය යටතේ 2008 පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ සිද්ධීන් 43 ක් සන්නිවේදනය කළ බව පෙන්වා දේ.[324] 2012 නිකුත් කරන ලද WGIED වාර්තාවෙන්[325] යාපනය දිස්ත්‍රික්කයේ 2007 ජනවාරි සහ අගොස්තු කාලය ඇතුළත පුද්ගලයන් 500 කට වඩා අතුරුදහන් කිරීම සහ මන්නාරම දිස්ත්‍රික්කයේ 2008 සහ 2009 අතර කාලයේ දී පුද්ගලයන් 100 කට ආසන්න සංඛ්‍යාවක් අතුරුදහන් වූයේයැයි කියන චෝදනා නැවත ඉදිරිපත්ව ඇතැයි සඳහන් කරයි.

406. 2009 දී සන්නද්ධ ගැටුම අවසානයේ දී බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිද්ධීන් පිළිබඳ චෝදනාවල වැඩිවීමක් පිළිබඳ වාර්තා නැවත දැකිය හැකිය. කොමිටියේ මැන්ඩේට් බලයයෙන් ආවරණය වන කාල සීමාව අවසාන වීමෙන් පසුව ද අතුරුදහන්වීමේ සමහර සිද්ධීන් දිගටම වාර්තා වුවද එසේ වාර්තා වූ සිද්ධි සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් පහත වැටිණ.

407. මෙම කොමිටියෙන් සමාලෝචනව කළ බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධීන්, සමහර පළාත්වලට විශේෂයෙන් බලපෑමක් වුවද රට පුරාම සිදු විය. කොමිටියේ මැන්ඩේට් බලය ඇති කාල සීමාව තුළ ලේඛන ගත කළ සිද්ධීන් බොහොමයක් වාර්තා වූයේ , මන්නාරම, යාපනය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක ඇතුළත් උතුරු පළාතෙනි. මේ ප්‍රදේශ සියල්ල හමුදාවේ දැඩි පාලනය යටතේ පැවතිණ. දෙවැනි විශාල බලපෑමක් වූයේ නැගෙනහිර පළාතේය. ඒ විශේෂයෙන් 2006 සහ 2008 අතර ආණ්ඩුවේ හමුදාව එල්ටිටීඊය පරාජය කිරීමෙන් පසුය. කොළඹදී සිදු කරන ලද බලහත්කාර අතුරුදහන් කිරීම් ද කොමිටියෙන් ලේඛනගත කර ඇති අතර ඉන් වින්දිතයන් වූ බොහොමයක් රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල සිට පැමිණි අයයි.[326]

---

321 බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන් කළ අය පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායමේ වාර්තාව 10 ජනවාරි 2008
A/HRC/7/2. paragraph 344

322 Civil Monitoring Mission, Free Media Movement and Law & Society Trust. ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව ජනාධිපති නිමර්ශන කොමිසමට දෙවනවරට කරන ලද සැල කිරීම් ජනවාරි – අගෝස්තු 2007
http://lib.ohchr.org/HRBodies/UPR/Documents/Session2/LK/AFMD_UPR_52_2008anx_LSTreportondisappearancesandlillings.pdf

323 බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායමේ වාර්තාව පෙබරවාරි 25 2009
A/HRC/10/9/ paragraph 366

324 Ibid paragraph 351

325 බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව මාර්තු 2 2012
A/HRC/19/58/Rev.1 para 497

326 1997 බටහිර, දකුණ, සහ සබරගමුව පළාත්වල කැමැත්තෙන් තොරව පුද්ගලයන් ඉවත් කිරීම හෝ අතුරුදහන් කිරීම විභාග කිරීම සඳහා වූ කලාපිය කොමිසමේ අවසාන වාර්තාවේ මෙසේ සඳහන් කරයි: ''කොමිසමට ඉදිරිපත් වූ සාක්ෂි අනුව කොළඹ දෙමළ සම්භවයක් ඇති පුද්ගලයන් කැමැත්තෙන් තොරව ඉවත් කිරීම/ අතුරුදහන් කිරීම ශ්‍රී ලංකාවේ දකුණේ එවැනි සිද්ධීන් සමග සමාන නොකළ යුතුය.'' ඉන් අදහස් වූයේ කොළඹ දෙමළ ජනතාව අතුරුදහන් කිරීමේ දී ඉලක්ක කර ගැනීම තලක සිට පැවති බවය. ( As quoted in A Legacy to Remember: Sri Lanka's Commissions of Inquiry 1063-2002. Ed. Kishali Pinto Jayawadena, Law & Society Trust)

408. කොමිටියේ මැන්ඩේට් බල කාල සීමාව තුළ සිදු වූ බලහත්කාර අතුරුදහන් කිරීම්වල වින්දිතයන්ගෙන් බහුතරය එල්ටීටීඊයට සම්බන්ධයැයි සිතූ පුද්ගලයන් ය. දෙමළ තරුණයෝ එල්ටීටීඊය සමග සම්බන්ධතා තිබුණත් නැතත් ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලදී විශේෂයෙන්ම අවදානමට ලක් වූහ. ආණ්ඩුවේ පාලන ප්‍රදේශවල දී අතුරුදහන් වූ අනෙකුත් අය වන්නේ ආණ්ඩුව විවේචනය කරන්නේයැයි සිතූ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, ජාතික මානුෂීය සේවකයන් සහ ජනමාධ්‍යවේදීන් ය. WGEID 2008 ජූනි 11 නිකුත් කල පුවත් නිවේදනයකින් මානුෂීය සේවකයන් ඉලක්ක කර ගැනීම ගැන සිය කණස්සල්ල ප්‍රකාශ කෙලේය.[327] මෙම සමහර සිද්ධීන් නීති විරෝධී ඝාතන පිළිබඳ පරිච්ඡේදයේ ලේඛන ගත කර ඇත.

409. විස්තර කරන ලද රටාව පැහැදිලි කරන සංකේතාත්මක සිද්ධියක් වන්නේ ලංකා ඊ නිවුස් හි සේවය කළ කාටූන් චිත්‍ර ශිල්පියෙකු වූ ප්‍රගීත් රන්ජන් බණ්ඩාර එක්නැලිගොඩ ගේ අතුරුදහන් කිරීමය. ආණ්ඩුව දැඩිලෙස විවේචනය කළ ඔහු අතු-රුදහන් වූයේ ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරය අතර තුර 2010 ජනවාරි 24 වැනි දාය. විමර්ශන කොමිටියට ලැබුණ තොරතුරු අනුව පළමුවෙන්ම 2009 අගෝස්තු 27 සුදු වෑන් රථයකින් පැමිණි නොහඳුනන පුද්ගලයන් පිරිසක් විසින් පැහැර ගත් ඔහු ඊට පසුවදා නිදහස් කෙරිණ. එසේ වුවත් ඔහුට දිගටම නිර්නාමික දුර කතන ඇමතුම් ලැබුණ අතර තමා ගැන සෝදිසියෙන් සිටින්නේයැයි විශ්වාසයක් ඔහු තුළ තිබිණ. 2010 ජනවාරි 24 දින සවස එක්නැලිගොඩ මහතා තම කාර්යාලයෙන් පිටව ගිය නමුත් තම මිතුරෙකුට ඔහු මුණ ගැසීමට පැමිණෙන්නේයැයි දන් වූ ස්ථානයට පැමිණියේ නැත. එතැන් පටන් ඔහුට සිදු වූ දෙයක් හෝ ඔහු ආගිය තැනක් දැන ගන්නට නැත. එක්නැලිගොඩ අතුරුදහන්වීමෙන් පසුව දින හතරකට පසුව සෝදිසි කිරීමේ අවසර පත්‍රයක් නොමැතිව ලංකා ඊ නිවුස් කාර්යාලයට පැමිණි නොහඳුණන පිරිසක් එම කාර්යාලය පරික්ෂා කරන ලදී.[328]

410. එක්නැලිගොඩ සිද්ධිය ගැන තවත් අය අතර මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්, වධහිංසාවලට එරෙහි කොමිටිය සහ WGEID ආණ්ඩුවෙන් විමසුහ. ඔහු සිටින තැනක් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ගත් ප්‍රයත්න මෙන්ම සිද්ධිය පිළිබඳ අලුත්ම තත්වය පිළිබඳව පහතින් විස්තර කෙරේ.

**ආරක්ෂක හමුදා විසින් අත් අඩංගුවට ගැනීමෙන් පසු අතුරුදහන්වීම්.**

411. වසර ගණනාවක් තිස්සේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්, WGEID සහ එක්සත් ජාතීන්ගේ වෙනත් ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳව ආණ්ඩුවේ, විශේෂයෙන්ම ආරක්ෂක හමුදාවල ඍජු සම්බන්ධතාවය තහවුරු කෙරෙන තොරතුරු අති විශාල ප්‍රමාණයක් රැස් කළහ. 2004 දී කරුණා කණ්ඩායම බිහිවීම සහ 2000 මැද භාගයේ සිට ඊපීඩීපී සන්නද්ධ ක්‍රියාකාරකම් දිගටම පවත්වා ගැනීමත් සමග බලහත්කාර අතුරුදහන් කිරීම් විවිධ කණ්ඩායම් අතර අඩු තීව්‍රතාවයේ සන්නද්ධ මෙහෙයුම්වල කොටසක් විය.

412. WGEID හි 2007, 2008, 2009 හා 2010 වාර්තා ශ්‍රී ලංකා යුද හමුදාව, පොලිසිය (CID, TID, STF ) සහ සන්නද්ධ කණ්ඩායම් බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධීන් බහුතරයකට වගකිව යුතුයැයි පවසයි. ශ්‍රී ලංකා නාවික හමුදාව විශේෂයෙන්ම යාපනය සහ මන්නාරම බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සිද්ධීන්ට වගකිව යුතුය. කෙසේ වුවත් ඒකාබද්ධ මෙහෙයුම්වලදී සහ අත් අඩංගුවට ගැනීම, රඳවා ගැනීම සහ අතුරුදහන්වීමේ විවිධ අදියර තුළ

---

327 2008 ජූනි 11 ප්‍රවෘත්ති නිවේදනයඃ ..United Nations expert group deplores wave of disappearance in Sri Lanka"
http://www.ohchr.org.UN/NewsEvents/Pages/DisplayNews.asds/NewsID-9278&LangID-E

328 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ආරක්ෂක හමුදාවල ඒකක ගණනාවක් එක්වූ විවිධ අංශ අතර එමෙන්ම සන්නද්ධ කණ්ඩායම්වල සහාය ඇතිව) හවුල් පැවති බවටද චෝදනා ඉදිරිපත්ව ඇත.

413. මෙම නිශ්චිත ක්‍රියා පිළිබඳ වගකීම හමුදාවට හෝ ඒකකවලට පැවරීම මෙන්ම එක් එක් අපරාධකරුවන් හඳුනා ගැනීම බොහෝවිට අභියෝගයන් වන්නේ ආරක්ෂක හමුදා, පොලීසිය හෝ හමුදාව, හැම විටම තමන් හඳුනා නොදෙන නිසාත්, පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම ප්‍රතික්ෂේප කරන නිසාත් සහ බොහෝවිට අත් අඩංගුවට ගැනීම පිළිබඳව සාක්ෂිකරුවන් නැති නිසාත්ය. පවුලේ සාමාජිකයන් අපරාධකරුවන්ගේ අනන්‍යතාවය දැන සිටියත් පලිගනු ඇතැයි බිය නිසා ඔවුන්ගේ නම් හෙළි කිරීමට මැලිවන බව කොමිටිය නිරීක්ෂණය කර ඇත.

414. අපරාධකරුවන්ගේ අනන්‍යතාවය හැම විටම පහසුවෙන් හඳුනාගත නොහැකි වුවත් අත් අඩංගුවට ගැනීම සිදු වන්නේ එකම ආකාරයකටය. විමර්ශන කොමිටියට සාක්ෂි ලබා දුන් බොහෝ දෙනෙකු අපරාධකරුවන් විසින් සුදු වෑන් රථයකට බලයෙන්ම නංවාගෙන ගිය බව හෝ බොහෝවිට අංක තහඩු නොමැති එවැනි වෑන්වලින් වෙනත් අය රැගෙන යනු දුටු බවත් කීහ. සිංහල සහ/හෝ දෙමල කතා කරන අපරාධකරුවෝ සාමාන්‍ය ඇඳුම් හෝ නිල ඇඳුම් ඇඳ සිටි අතර සමහරවිට මුහුණු ආවරණය කර ගෙන සිටියහ. අවස්ථා ගණනාවකදීම අපරාධකරුවෝ වින්දිතයා ගෙන යෑමට පෙර තමන් CID හෝ TID බව පැවසූහ. පසුව අතුරුදහන් කර ඇති පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට හෝ පැහැර ගැනීම සිදුවන විට අසළ සිටි ඥාතීන්ට පවසා ඇත්තේ ඔවුන් ප්‍රශ්න කිරීම සඳහා ගෙන යන බවය. කෙසේ වුවත් අපරාධකරුවෝ අත් අඩංගුවට ගැනීම සඳහා විධිමත් බල පත්‍රයක් හෝ වින්දිතයා ගෙන යන තැන පිළිබඳ කිසියම් තොරතුරක් ලබා දීමට පුරුද්දක් වශයෙන්ම අපොහොසත්වූහ. එවැනි සිද්ධීන්වලදී පොලිසිය හෝ ආරක්ෂක හමුදා එම පුද්ගලයන් තම අඩංගුවේ සිටින බවක් පිළිගන්නේ නැත.

415. 2008 දී සිදු වූ නිදර්ශනාත්මක සිද්ධියක් වන්නේ තමන් ත්‍රිකුණාමලය පොලීසියේ සහ සීඅයිඩියේ නිලධාරීන් බව පවසමින් සිවිල් ඇඳුම් ඇඳගත් පස් දෙනෙකු තම නිවසේ සිටියදී මිනිසෙකු අත් අඩංගුවට ගැනීමය.[329] එම නිලධාරීන් අත් අඩංගුවට ගත් පුද්ගලයා ප්‍රශ්න කිරීම සඳහා ගෙන යන බවත් පවුලේ අය උදෑසන පොලිසියට යා යුතු බවත් කීවේයැයි පැවසේ. වින්දිතයා අත් අඩංගුවට ගැනීමෙන් පසුව නාවික මුරපොළක් පසුකර ගොස් ඇති නමුත් නාවික නිලධාරීන් පවුලේ අයට ඒ බව තහවුරු කරන තොරතුරක් ලබා දී නැත. පොලීසිය ද අත් අඩංගුවට ගැනීම ප්‍රතික්ෂේප කරයි.

416. වෙනත් අවස්ථාවල හමුදාව පසුව තම සම්බන්ධතාවයක් නැති බව පැවසුවත් නිල ඇඳුම් වලින් සිටි හමුදා නිලධාරීන් පහසුවෙන් හඳුනා ගත හැකිව ඇත. විමර්ශන කොමිටියට වාර්තා වූ 2006 දී සිදු වූ එක් සිද්ධියක් අනුව සමහරු නිල ඇඳුම්වලින් ද තවත් අය සිවිල් ඇඳුමෙන් ද සිටි සන්නද්ධ කණ්ඩායමක් යාපනයේ දී තම නිවසේ සිටි පුද්ගලයෙකු මැදියම් රාත්‍රියේ දී අත් අඩංගුවට ගෙන ඇත.[330] ඔහුට තිබූ චෝදනාව වූයේ එල්ටීටීඊයට සහාය දීමයි. එම අපරාධකරුවන්යැයි හැඳින්වෙන පිරිස කතා කෙළේ සිංහල සහ කැඩුණු දෙමළ ය. එම පුද්ගලයා අසළ තිබූ හමුදා කඳවුරට ගෙන ගිය බව සාක්ෂිකරුවන් දැක ඇතැයි පැවසේ. එහෙත් ඊට පසුදින හමුදාව වින්දිතයා අත් අඩංගුවට ගැනීම ගැන තමන්ගේ කිසි සම්බන්ධයක් ඇති බව පිළිගත්තේ නැත.[331] පොලීසියට සහ අනෙකුත් සංවිධානවලට පැමිණිලි කළ නමුත් වින්දිතයා සිටින තැනක් පිළිබඳ කිසිම තොරතුරක් ලබා ගත නොහැකි විය.

417. ආණ්ඩුවේ සම්බන්ධතාවය දක්වෙන සාධකවලට අතුරුදහන්වීමට තුඩු දෙන මෙහෙයුම් පරිමාණය සහ ස්වභාවය මෙන්ම අපරාධකරුවන්ට ආණ්ඩුවේ පාලන ප්‍රදේශවල මුක්තියෙන් යුතුව මෙහෙයුම් කිරීමට හැකිවීමේ සාධකයත් ඇතුළත් ය. මෙම තත්වය විශේෂයෙන් දැකිය හැකි වන්නේ ශ්‍රී ලංකා යුද හමුදා හෝ නාවික හමුදා මුර කපොළු හෝ කඳවුරු අසළ ඇඳිරි නීතිය බලපවත්වන කාලය තුළ වූ සිද්ධීන්ගෙන් ය. මෙවැනි සුපුරුදු සිද්ධියක් වන්නේ 2007

[329] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[330] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[331] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

දෙසැම්බර් මස අංක තහඩු නැති සුදු වෑන් රථයකින් හමුදා කඳවුරක් දෙසින් පැමිණි නොහඳුනන පිරිසක් තරුණයෙකු පැහැර ගෙන යෑමයි. ඉන් පසුව වෑන් රථය ආපසු හමුදා කඳවුර දෙසට ගොස් ඇත. එහෙත් එම පුද්ගලයා පැහැර ගෙන යෑම පිළිබඳව කිසිත් නොදන්නා බව හමුදාව කියා සිටී.[332]

418. LLRC ත්‍රිකුණාමලයේ පැවැත් වූ ප්‍රසිද්ධ විභාගයට සාක්ෂිකරුවන් විසින් කරන ලද නියෝජනවල පිටපත්වලින් තමන් නාවික හමුදාවේ නිලධාරීන්යැයි හඳුන්වා ගත් පුද්ගලයන් වැඩි වශයෙන්ම 2007 සහ 2008 වසරවල බොහෝවිට අදාල වින්දිතයා ප්‍රශ්න කිරීමට රැගෙන යන බව කියමින් සිදු කරන ලදයි කියන පැහැර ගැනීම් ගණනාවක්ම ඉස්මතු කර දක්වයි. සමහර සිද්ධීන්වලදී අල්ලසක් දෙන්නේනම් ඔවුන්ගේ ඥාතියා නිදහස් කරන බවට සාක්ෂිකරුවන්ට පවසා ඇති අතර එසේ මුදල් ගෙවීමෙන් පසුව හෝ නිදහස් කිරීම සිදුව නැත.[333]

419. 2005 දී මන්නාරම දිස්ත්‍රික්කයේ ගමක තම ඥාතීන් බැලීමට ගිය පුද්ගලයෙකුට නාවික හමුදාවේ කඳවුරක් අසළින් යෑමට සිදු විය. එදින සවස් කාලයේ මුර සංචාරයේ යෙදෙන නාවික භටයන් සහ ආරක්ෂක භටයන් පාර දෙපස සිටිනු සාක්ෂිකරුවන් දැක ඇත. එදින සවස වින්දිතයා ආපසු නොපැමිණි නිසා පොලීසියට ඒ බව දැනුම් දී නාවික හමුදාව ගැන සැකයක් පවතින බව වාර්තා කෙළේයැයි පැවසේ. මෙම විමර්ශන කොමිටියට ලැබී ඇති තොරතුරු අනුව අතුරුදහන්ව මාස තුනක් ගත වුවද පොලිසිය කිසියම් විමර්ශනයක් කිරීමට උනන්දුවක් නොදක්වා සාක්ෂිකරුවන් ඉදිරිපත් වන තෙක් නිහඬව බලා සිටී.[334]

420. 2006 දී වූ තවත් සිද්ධියකදී උතුරේ ගමක කෝවිලක උත්සවයක් පැවැත්වෙන අතර තුර රාත්‍රිය කෝවිලේ ගත කළ පුද්ගලයන් අට දෙනෙකුගෙන් යුත් පිරිසක් බලහත්කාරයෙන් පැහැර ගැනීමක වින්දිතයන් වූහ. මෙම අතුරුදහන්වීම පිළිබඳ වගකීම යුද හමුදාවට පැවරෙන්නේයැයි තමන් විශ්වාස කරන බව සාක්ෂිකරුවෝ සඳහන් කළහ.[335] එම කෝවිල අසළ ප්‍රදේශයේ යුද හමුදා කඳවුරු තුනක් තිබිණ. ආරංචි මාර්ග කීපයක් අනුව උත්සව අවස්ථාවේ හමුදා භටයන්ද එහි සිට ඇත. මිනිසුන් අතුරුදහන් වූ දින රාත්‍රියේ එම ප්‍රදේශයේ හමුදා වාහන එහා මෙහා ගිය බවත් කෝවිල පැත්තෙන් වෙඩි හඬ ඇසුන බවත් සාක්ෂිකරුවෝ පවසති.[336]

421. පසු දින උදෑසන බිම වැටී තිබුණු පතුරොම් කිපයක් හා සමහර වින්දිතයන්ගේ ඇඳුම් සහ හැඳුණුම් පත් බිම වැටී තිබී සොයා ගෙන ඇත. හමුදා වාහන එදින උදේ පිටව යනු ඔවුන් දැක ඇත. ගම් වැසියන් අසළ ඇති හමුදා කඳවුරට ගොස් විමසූ විට කිසිවෙකු අත් අඩංගුවට නොගත් බව ආරක්ෂක භටයන් පවසා ඇත. ගම් වැසියෝ යාපනය මානව හිමිකම් කාර්යාලයට සහ පොලිසියට මේ බව පැමිණිලි කළහ. පොලීසිය එම අවස්ථාවේ පැවසුවේ සිද්ධිය ගැන විමර්ශනය කරමින් පවතින අතර වැඩිදුර තොරතුරු කිසිත් නැති බවය. සිදු වූයේයැයි කියන මෙම අතුරුදහන්වීම්වලට පසු දින යුද හමුදාව එම ගමේ ගෙවල් පරික්ෂා කර ඇත. WGEID මෙම සිද්ධිය එහි හදිසි ක්‍රියා පටිපාටිය යටතේ ශ්‍රී ලංකාණ්ඩුවට දැනුම් දී ඇති අතර විමර්ශන කටයුතු සිදුවෙමින් පවතින බව එහි ප්‍රතිචාරය විය. [337]

---

[332] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[333] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිසමේ 2010 දෙසැම්බර් 3 ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති ප්‍රසිද්ධ විභාගය. පවුලේ සාමාජිකයන් ගේ ආගිය තැනක් සොයා ගැනීම සඳහා එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් ගත් පියවර සහ මුහුණ දුන් බාධක පිළිබඳ විස්තර ගණනාවක් සාක්ෂිකරුවෝ ඉදිරිපත් කරති. එම විස්තර මෙම කොමිටිය සමාලෝචනය කළ වෙනත් සිද්ධීන් බොහොමයක් සමග ගැලපේ.

[334] SLMM ලේඛන

[335] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[336] SLMM ලේඛන

[337] A/HRC/4-41.para 382 and 384

422. සමහර සිද්ධීන් වලදී ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවල වින්දිතයන් අතුරුදහන් වූයේ ඇඳිරි නීතිය බල පැවැත් වූ කාලය තුළ හෝ ආරක්ෂක හමුදා නිතිපතා සිදු කරන වටලා සෝදිසි කිරීමේ මෙහෙයුම්වලින් පසුව බව සාක්ෂිකරුවන් මෙම කොමිටියට පැවසූ ආකාරය කලින් පරිච්ඡේදයේ විස්තර කර ඇත.[338] 2008 අගෝස්තු මස වවුනියාවේ සිදු කරන ලද එවැනි වටලා සෝදිසි කිරීමකින් පසුව මුලින්ම පුද්ගලයන් 12 ක් අත් අඩංගුවට ගෙන පසුව හයක් නිදහස් කර ඇත. 2008 ඔක්තොබර් වන විටත් ඉතිරි හය දෙනා ආගිය තැනක් දැනගන්නට නැත. ඒ වන විට, 2008 අගෝස්තු මස ආරක්ෂක හමුදා පුද්ගලයන් රඳවා ගැනීමේ ක්‍රමයේ යම් වෙනසක් සිදු කර ඇති බව ද විමර්ශන කොමිටියට දැන ගැනීමට ලැබිණ. වටලා සෝද්සි කිරීමේ දී අත් අඩංගුවට ගැනීම වෙනුවට ඉන් පසුදින රාත්‍රියේ සුදු වෑන්වලින් පැමිණෙන නිලධාරීන් ඔවුන් අත් අඩංගුවට ගනී. 2008 සැප්තැම්බර් මස වවුනියාවේ කරන ලද පරික්ෂා කිරීමේ මෙහෙයුමකින් පසුව රාත්‍රියේ දී පුද්ගලයන් සිවු දෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත.[339]

423. සමහර සිද්ධීන්වලදී අතුරුදහන් කිරීමට පෙර වින්දිතයන් හමුදා කඳවුරුවලට ගෙන ගොස් හෝ බලන්න පැමිණ ප්‍රශ්න කොට, තර්ජනය හෝ හිරිහැර කරයි. 2009 මැයි මස මැද නැගෙනහිර පළාතේ වැඩට ගිය පුද්ගලයෙකු නැවත නොපැමිණි බවට තොරතුරු මෙම කොමිටියට ලැබිණ. ඔහුගේ අතුරුදහන්වීමට පෙර දිනයේ යුද හමුදාව පරික්ෂා කිරීමේ මෙහෙයුමක් සිදු කර ඇති අතර අතුරුදහන්වීමට පෙර සතියේ යුද හමුදාවේ කපිතාන් කෙනෙකු අවස්ථා තුනකදී ඔහුගේ නිවසට පැමිණ ඔහු ගැන විමසා ඇත. මෙම වින්දිතයා යුද හමුදා නිල ඇඳුම් ඇඳගත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් ප්‍රශ්න කළ බවද පැවසේ. ඔහු සොයා ගැනිමට උත්සාහ කළ නමුත් එදිනට පසුව ඔහුට සිදු වූ දෙයක් හෝ සිටින තැනක් සොයා ගැනිමට නොහැකි විය.[340]

**සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධ බලහත්කාර අතුරුදහන් කිරීම්**

424. විශේෂයෙන්ම 2004 සිට ආරක්ෂක හමුදා සන්නද්ධ කණ්ඩායම් සමග සිදු කළ හෝ සන්නද්ධ කණ්ඩායම් ආරක්ෂක හමුදා සමග සිදු කළ මෙහෙයුම්වලින් ද බලහත්කාර අතුරුදහන් කිරීම් සිදුව ඇත. ඇත්තෙන්ම සමහරවිට බලහත්කාර අතුරුදහන් කිරීමකින් අවසන් වන පැහැර ගැනීමේ සහ හිතුවක්කාර ලෙස නිදහස අහිමි කිරීමේ රටාවක් නැවත මතුවීම, කරුණා කණ්ඩායම 2004 දී එල්ටීටීඊයෙන් බිඳීයෑමත් සමග විශේෂයෙන්ම නැගෙනහිර එවැනි සිද්ධීන් ඇති වීමෙන් පෙන්නුම් කරයි.[341] නිදසුනක් වශයෙන් 2008 දී සටන් තියුණුවීමත් සමග මඩකලපුව දිස්ත්‍රික්කයේ කරුණා කණ්ඩායමට අයත් පිරිස් අඩුම වශයෙන් වැඩිහිටියන් 167 ක් පැහැර ගෙන ඇතැයි වාර්තාවේ.

425. අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැක කළ අය පැහැර ගැනීම සමහරවිට සිදුව ඇත්තේ ආරක්ෂක හමුදා සහ කරුණා කණ්ඩායම ඒකාබද්ධවය.[342] විමර්ශන කොමිටියට ලැබුණු තොරතුරු අනුව 2006 ඔක්තෝබර් වන විට මඩකලපුව සහ අම්පාර කරුණා කණ්ඩායම, විශේෂ කාර්ය සාධක බලකාය සහ යුද හමුදාව අතර සහයෝගිතාවය වැඩි වෙමින් පැවතිණ. 2005 සිට 2006 දක්වා මඩකලපුවෙන් ලැබුණු නොයෙකුත් වාර්තා අනුව ප්‍රසිද්ධ ස්ථානවලදී ළමයින් ඇතුළුව පුද්ගලයන් පැහැර ගැනිමට කරුණා කණ්ඩායම සුදු වෑන් යොදා ගැනීම නොකඩවා සිදු කළ බව පෙන්නුම් කෙරේ. හමුදා කඳවුරු හෝ මුර පොළවල් ඉදිරි පිට සිදුවන මෙම පැහැර ගැනිම් සහ පසුව කෙරෙන නිදහස් කිරීම්වලින් අදහස් කරන්නේ අනතුරු හැඟවීමක් සහ ඔවුන්ට ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවල මෙහෙයුම් කිරීමට ඇති ඉඩකඩ විදහා දැක්වීමය.[343] කරුණා කණ්ඩායමේ කඳවුරු ශ්‍රී

---

[338] VII නිදහස අහිමි කිරීමට අදාල උල්ලංඝනය කිරීම්

[339] ගමේ නම ගොනුවේ

[340] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[341] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ. See also Human Rights Watch, අපරාධයට හවුල්ව– කරුණා කණ්ඩායම සිදු කළළමයින් පැහැර ගැනිම සහ සොල්දාදුවන් බඳවා ගැනීමට රාජ්‍ය සම්බන්ධතාවය ජනවාරි 2007

[342] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[343] Op cit

ලංකා යුද හමුදාවේ කඳවුරු අසළ සහ සමහර තැන්වල ඒ තුළ පිහිටුවා තිබිණ. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ 23 වැනි ඩිවිෂණයේ වැලිකන්ද මූලස්ථානය ආසන්නයේ ද කරුණා කණ්ඩායමේ කඳවුරක් තිබිණ. ඉන් පැහැදිලි වන්නේ කරුණා කණ්ඩායමේ සිටීම සහ ඔවුන් විසින් බොහෝවිට දිවා කාලයේ සිදු කරන ලද පැහැර ගැනීම් යුද හමුදාව සම්පූර්ණයෙන්ම දැන සිටිමය.[344] ඒවා යුද හමුදාව නොදැනුවත්ව සිදු වන්නට ඇතැයි කිව නොහැකිය.

426. 2006 දී ලේඛන ගත කරන ලද එක් සිද්ධියක් අනුව යුද හමුදා කඳවුරක් ආසන්නයේදී කරුණා කණ්ඩායමේයැයි විශ්වාස කළ හැකි පුද්ගලයන් තරුණයන් පැහැර ගනු දුටුවේයැයි වාර්තාවේ. එහි සිටි යුද හමුදාව එම පැහැර ගැනීම වැළැක්විමට මැදිහත් වූයේ නැත.[345]

427. තවත් සිද්ධියක දී යුද හමුදාවේ භටයන් පිරිසක් නැගෙනහිර පළාතේ ගමක පාරක දී තරුණයින් කණ්ඩායමක් අත් අඩංගුවට ගෙන අසළ තිබූ යුද හමුදා කඳවුරකට ගෙන ගොස් ඇත. විමර්ශන කොමිටියට ලැබුණු තොරතුරු අනුව හමුදා භටයන් දුර කතන ඇමතුමක් දීමෙන් මද වේලාවකට පසු කරුණා කණ්ඩායමේ කාර්යධරයන් පිරිසක් හමුදා කඳවුරට පැමිණ තරුණයන්ගේ හැඳුනුම් පත් ගෙන එදින හවස් වරුවේ ඔවුන්ට එම ප්‍රදේශයේ TMVP කාර්යාලයට පැමිණීමට උපදෙස් දුන්හ. සිද්ධීන් කීපයකදීම කරුණා කණ්ඩායම විසින් පුද්ගලයන් පැහැර ගෙන සුදු වෑන් රථයකින් ප්‍රවාහනය කිරීමේ දී හමුදා මුර පොළවල් කීපයක්ම පසුකර ගිය ආකාරය වින්දිතයෝ අන්තර්ජාතික නිරීක්ෂකයක්ට පැවසූහ. කරුණා කණ්ඩායමේ කාර්යධරයන් හමුදා භටයන් සමග කතා කිරීමෙන් පසු ඔවුන්ට යෑමට ඉඩ දී ඇත.[346]

428. 2006 ඔක්තෝබර් මස නීතියෙන් පරිබාහිර මිනිස් ඝාතන පිළිබඳ විශේෂ වාර්තාකරු සහ අන්තර්ජාතික නිරීක්ෂකයෝ කරුණා කණ්ඩායම සහ ආරක්ෂක හමුදා, විශේෂයෙන්ම පොලිසියේ විශේෂ කාර්ය සාධක බලකාය අතර ක්‍රම ක්‍රමයෙන් ශක්තිමත්වන සහයෝගිතාවයක ලක්ෂණ නිරීක්ෂණය කළහ. සමහර අවස්ථාවල යුද හමුදා බුද්ධි අංශය හා කරුණා කණ්ඩායම අතරද මෙවැනි සම්බන්ධතා තිබිණ. [347] ලැබී ඇති වාර්තා අනුව කරුණා කණ්ඩායම විසින් පැහැර ගත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වින්දිතයන් TMVP කාර්යාලයක තාවකාලිකව රඳවා ගෙන ඉන් පසුව විශේෂ කාර්ය සාධක බලකායට භාර දෙනු ඇත. 2006 වසරේ වූ සිද්ධියක් අනුව STF විසින් මඩකලපුව නගර මධ්‍යයේදී අත් අඩංගුවට ගත් පුද්ගලයෙකු හමුදා බුද්ධි අංශයට භාර දීමෙන් පසුව එම පුද්ගලයා කරුණා කණ්ඩායම අතට පත් කර ඇත. විශේෂ කාර්ය සාධක බලකාය ඔහු නිදහස් කළ බව පැවසුවත් සාක්ෂිකරුවෝ එය ප්‍රතික්ෂේප කරති.[348]

**සන්නද්ධ ගැටුමේ අවසන සිදු වූ බලහත්කාර අතුරුදහන් කිරීම්**

429. ආණ්ඩුව නිරන්තරයෙන්ම ප්‍රතික්ෂේප[349] කරන නමුත්, සැලකිය යුතු සංඛ්‍යාවක් මූලික වශයෙන්ම තම අවි බිම තැබූ එල්ටීටීඊ සටන්කරුවන්, සටන්වලට සහභාගි නොවූ එල්ටීටීඊ කාර්යධරයන්, ඔවුන්ගේ හවුල්කරුවන් හා පවුලේ සාමාජිකයන් වඩ්ඩුවකාල් පාලම හරහා පැමිණ යුද හමුදාවට[350] භාරවීමෙන් පසු[351] 2009 මැයි 18 අතුරුදහන් වූ බවට කෙරෙන චෝදනා තහවුරු කෙරෙන විශ්වාස කටයුතු තොරතුරු විශාල ප්‍රමාණයක් ඉදිරිපත්ව ඇත.

---

[344]සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[345] SLMM ලේඛන

[346] SLMM ලේඛන

[347] ECN.4/2006/53/Add.5.27,March 2006

[348] SLMM ලේඛන

[349] යුද්ධයේ අවසන ආරක්ෂක හමුදාවන්ට භාර වූ කිසිම එල්ටීටීඊ කාරයධරයෙකු අතුරුදහන් වූයේ නැතැයි එවකට ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂ කීවේය. ඔවුන් සියලු දෙනාම නිසි පුනරුත්ථාපන වැඩ පිළිවෙළකින් පසුව සමාජයට ප්‍රතිඅන්තර්ග්‍රහණය කර ඇතැයි ද කීවේය. Sri Lanka Brief No LTTE surendee went missing Gotabaya Rajapaksa 25 January 2013. Sri Lanka Brief No LTTE surendee went missing Gotabaya Rajapaksa 25 January 2013

[350] භාරවීම'' යන්න යෙදිය හැක්කේ තමා විසින්ම භාර වූ සන්නද්ධ කණ්ඩායමක සාමාජිකයන්ට පමණි. එල්ටීටීඊ කාර්ය ධරයන් කවුද යන්න, හමුදා හෝ දේශපාලන ද යන්න පැහැදිලි නැති වුවත් මෙම යෙදුම භාවිතා කර ඇත.

430. මින් සමහර සිද්ධීන් WGEID වෙත වාර්තා කළ අතර ඒ ගැන 2012 සහ 2014 වාර්ෂික වාර්තාවල සඳහන් කර ඇත.[352] එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන් හෝ සාමාන්‍ය ජනතාව භාරවීම දුටු බවත් ඉන් පසුව ඔවුන් දක්නට නොලැබුණ බවත් පැවසෙන පුද්ගලයන්ගේ සැල කිරීම් ඇතුළත් වෙනත් සාක්ෂි ද කොමිටිය සතුව පවතී.[353] යුද්ධයේ අවසාන දවස්වල 53 ක් වැනි සංඛ්‍යාවක එල්ටීටීඊ කාර්යධරයන් භාරවී ඇතැයි LLRC සඳහන් කරන අතර එම වාර්තාව සකස් කරන විට ද ඔවුන් අතුරුදහන්ව ඇතැයි පැවසෙන බව කියයි.[354] 2015 මැයි මස අන්තර්ජාතික සත්‍යය සහ යුක්තිය ශ්‍රී ලංකා ව්‍යාපාතිය, 2009 මැයි 18 දින හෝ ඒ ආසන්නයේ යුද හමුදාවට භාර වෙනු දැක ඇති පුද්ගලයන් 110 ක ගේ නම් ප්‍රකාශ කර ඇත.[355]

431. මූලික පරීක්ෂණ ක්‍රියාවලියෙන් පසුව මුලතිවු හි කොටු කළ රඳවා ගැනීමේ ප්‍රදේශයේදී තම පවුල්වල සාමාජිකයන් මුණ ගැසුණු යුද හමුදා භටයින් සහ දෙමළ තොරතුරු ලබා දෙන්නන් ඔවුන් ඉවතට ගෙන ගිය බව සාක්ෂිකරුවෝ කොමිටියට පැවසූහ. එල්ටීටීඊය සමග පැවති තම සබඳතා පිළිගත් පුද්ගලයන් ඉවතට ගෙන යෑමට පෙර ඔවුන්ගේ පවුල්වලින් වෙන් කොට වෙනම පෙළ ගැසූ බවද කොමිටියට දැන ගැනිමට ලැබිණ.

432. තමන්ව හෝ තමන්ගෙන් වෙන් කළ අය ගෙන යන ස්ථානය පිළිබඳ තොරතුරු කිසිවක් ආරක්ෂක හමුදා විසින් ලබා නොදුන් බවද සාක්ෂිකරුවෝ කොමිටියට කීහ. වයස අවුරුදු දෙක සහ 10 අතර ළමයින් පස් දෙනෙකු ඇතුළත් තම ආදරණීයන් ගෙන යනු සාක්ෂිකරුවන් ( භාර්යාවන්, මවුවරුන්, මුතුන් මිත්තන්) දැක ඇත.

433. පුළුල් ලෙස සටහන්ව ඇති සිද්ධියක් වන්නේ මැයි 18 දින කතෝලික පූජකවරයෙකු වන ප්‍රැන්සිස් ජෝසප් පියතුමාගේ මෙහෙයවීමෙන් පිරිසක් භාරවිමය. එදින උදයේ ප්‍රැන්සිස් පියතුමා සටනේ දි වඩ්ඩුවක්කාල[356] හිදී යුද හමුදාවට තමන්ව හඳුන්වා දුන් තුවාල ලැබුවන් සහ සටන්වලට සහභාගි නොවු එල්ටීටීඊ කාර්යධරයන් කණ්ඩායමක් සමග[357] රැඳවුම් ප්‍රදේශයක සිටිනු සාක්ෂිකරුවන් දැක ඇත.[358]

434. ඔහු ආරක්ෂක හමුදා සාමාජිකයන්ට එල්ටීටීඊ කාර්යධරයන් ගේ භාරවීමට උදවු වෙමින් සිටියේය. ''දැඩි ආරක්ෂාවක් තිබූ සහ පදක්කම් ගණනාවක් පැළඳ සිටි'' ඉන් එක් අයෙකු ඉහළ ශ්‍රේණියේ හමුදා නිලධාරියෙකු වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

435. ඉන් මද වේලාවකට පසු ප්‍රැන්සිස් පියතුමා ඇතුළු කණ්ඩායම ආරක්ෂක හමුදා විසින් මුලතිවු පරික්ෂා කිරීමේ ස්ථානය අසළ පිහිටි ප්‍රථමාධාර මධ්‍යස්ථානයෙන් වම් පසට ඇති පාර දිගේ සහ දකුණු දෙසට ඇති පාර දිගේ රැගෙන යනු සාක්ෂිකරුවන් දැක ඇත.[359] සමහර සාක්ෂිකරුවෝ ප්‍රැන්සිස් පියතුමා සහ එල්ටීටීඊ කාර්ධරයන් කණ්ඩායම අවසාන රඳවා ගැනීමේ

---

[351] මෙම සිද්ධීන් කලින් පරිච්ඡේදයේ විස්තර කළ නීතිවිරෝධීයැයි සැලකෙන ඝාතනවලට සම්බන්ධවිය හැකිය
[352] බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව 2012 A/HRC/19/58/Rev.1.pages.1.pages11-113
[353] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ. OISL ලිඛිත ප්‍රකාශ ගණනාවක් ද ලැබිණ
[354] LLRC Report para 1-49 පුනරුත්ථාපන කොසමාරිස් ජනරාල් පවසන ආකාරයට භාර වීමෙන් පසුව හෝ වෙනත් ආකාරයකින් අත් අඩංගුවට ගත් එල්ටීටීඊයේ හිටපු සටන්කරුවන් 11,954 ක් පුනරුත්ථාපනය වෙමින් සිටින බව කොමිසමට දැන ගන්නට ඇත.
[355]International truth @Justice project Sri Lanka, Sri lanka. Disappearance in Custody Six Years Ago Today,18 May 2015. http://tamilsforum.co.uk/wp-content/uploads/2015/05/statement-18-May-2015-ITJP-SL-Disappearances.pdf
[356] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[357] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[358] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[359] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ප්‍රදේශයට නැගෙනහිරෙන් වූ බසයකට ගොඩ වෙනු දුටහ.[360] ඉන්පසුව ප්‍රැන්සිස් පියතුමා සහ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන් දැකීමට හෝ ඔවුන් ගැන ඇසීමට ලැබී නැත.

436. ඉන්පසු පුද්ගලයන් 22 ( ළමයින් පස් දෙනෙකු ඇතුළත්) වෙනුවෙන් හබෙයාස් කෝපුස් අයැදුම් පත් ඉදිරිපත් කර ඇත. වවුනියාව මහාධිකරණයේ 13 ක් ( 2013 මාර්තු 20 පහක් ද, 2013 අගෝස්තු 22 හතක් ද, 2014 මැයි 23 එකක් සහ 2015 ජුනි මස මන්නාරම මහාධිකරණයේ එකක් වශයෙනි. එම 22 දෙදෙනා වන්නේ, ප්‍රැන්සිස් ජෝසප් පියතුමා, මුරලිදරන් නඩේසු, ඔහුගේ බිරිඳ මුරලිදරන් ක්‍රිෂ්ණකුමාරි සහ බාල ළමයින් දෙදෙනා, මහාලිංගම් සින්නතම්බි (හෙවත් ඉල්ලම්පරිති) ඔහුගේ බිරිඳ මහාලිංගම් සිවන්ජ්නි සහ ඒ වන විට වයස දහය, අට සහ තුන වූ ළමයින් තිදෙනා, සින්නතුරෙයි සසිදරන් (එලිලාන්) සෙල්ලයියා විශ්වනාදන්, පොන්නම්බලම් කන්දසාමි, උන්තිරම්මූර්ති ක්‍රිෂ්ණකුමාර්, කන්දසාමි තුෂිසන්කර්, ත්‍යාගරාජා දිනේෂ්, නඩේසමූර්ති විෂ්ණුකුමාර්, මහේන්ද්‍රන් මුරුගදාස්, තංගබාලසිංහම් විජයබස්කර්, සිවඥානම් ගෝපාලරත්නම් සහ ඔහුගේ බිරිඳ සිවලිංගම් පද්මලෝෂිණී, කාලිමුත්තු සජීවන් සහ වී බාලකුමාරන් ය.

437. ඉන් දෙදෙනෙකු හැර ඉතිරි අය මැයි 18 මුලතිවු රඳවා ගැනීමේ ප්‍රදේශයේ දී අවසන් වරට දුටු අයයි. එක පුද්ගලයෙකු ගෙන යනු දැක ඇත්තේ මැයි 18 ඕමන්තේ හිදී ය. අනෙක් පුද්ගලයා මුලතිවු රඳවා ගැනීමේ ප්‍රදේශයේ සිට ට්‍රැක්ටරයකින් ගෙන ගොස් ඇත්තේ ඔහු තුවාල ලැබුවෙකු නිසා දින දෙකකට පෙරය. එම පුද්ගලයන් අවසන් වරට ශ්‍රී ලංකා යුද හමුදාවේ 58 වැනි ඩිවිෂණයේ අත් අඩංගුවේ සිටි බව එම පෙත්සම් පත් සියල්ලේම සඳහක් වේ.

438. මෙම පෙත්සම්වලට ප්‍රතිචාර වශයෙන් එම පුද්ගලයන් කිසිවිටෙක අත් අඩංගුවට හෝ රඳවා නොගත් බව ශ්‍රී ලංකා යුද හමුදාව පවසයි. සමහර පෙත්සම් සම්බන්ධයෙන් එය ''නිත්‍යානුකූලව සහ හමුදාව විසින් මුදා ගත් ප්‍රදේශවලට පැමිණි සිවිල් ජනතාවගේ ආරක්ෂාව සහ සුභ සිද්ධිය සඳහා ක්‍රියා කෙළේයැයි''ප්‍රතිචාර දක්වා ඇත. තවත් සමහර පෙත්සම් සම්බන්ධයෙන් ''ශ්‍රී ලංකා සන්නද්ධ බලකා සියලු අවස්ථාවලදී යුද්ධයට අදාල අන්තර්ජාතික නියමයන් පිළිපැදි බව'' කියයි. නැති වූ පුද්ගලයන් බොහෝ දෙනෙකු හමුදාව සමග ඇති වූ ගැටුම්වලින් මිය ගිය අය හෝ නීති විරෝධීව රටින් පිටව ගොස් බටහිර රටවල ජීවත්වන පුද්ගලයන්යැයි ද කියා සිටී.

439. ශ්‍රී ලංකා යුද හමුදාවට විශේෂයෙන්ම ගැටුමේ අවසාන දින වලදී භාර වූ හෝ අත් අඩංගුවට ගත් එල්ටීටීඊ කාර්යධරයන්ගේ සිදු වූයේයයි කියන අතුරුදහන්වීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කළ සිදුවීම් ගණනාවක් ගැන LLRC සිය වාර්තාවෙන් ''බරපතළ කණස්සල්ල'' ප්‍රකාශ කරයි. ''ඔවුන් තම ස්වාමි පුරුෂයන් සමග හමුදාව සිටි ස්ථානයට ගිය විට ස්වාමි පුරුෂයන් විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය බව පවසා ඔවුන් රඳවා ගෙන පවුලේ අනෙක් සාමාජිකයන්ට සරණාගත කඳවුරට යන ලෙස කී බව මෙම කාර්යධරයන්ගේ පවුලවල සාමාජිකයෝ සඳහන් කළහ. සමහර අවස්ථාවල දී තම සැමියන් යුද හමුදාවට භාරවනු ඔවුන්ගේ භාර්යාවන් දැක ඇත. පවුලේ සියලු දෙනා යුද හමුදාවට භාර වූ අවස්ථාද කොමිසමට අසන්නට ලැබී ඇත. මෙම ඉදිරිපත් කිරීම්වලින් මතුවන අඛණ්ඩ තේමාව වන්නේ ''තම සැමියන් යුද හමුදාවේ අත් අඩංගුවට භාරවීම ඔවුන් දැක තිබීම සහ ඉන් පසුව භාරවූවන් ගැන දැක ගැනීමට හෝ ඔවුන්ගේ තොරතුරක් අසා ගැනිමට නොහැකිවීම ය.''

440. ''එවැනි නිශ්චිත චෝදනා පිළිබඳව අවශ්‍ය විමර්ශන පැවැත්වීමටත්, එවැනි විමර්ශනයකින් යුද හමුදාවේ එක් එක් සාමාජිකයෙකු සම්බන්ධයෙන් වගකීමක් ඇති බව හෙළිවන්නේ නම් වැරදිකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට දඬුවම් දීමටත් රාජ්‍යයේ පැහැදිලි යුතුකමක් පවතින බව'' LLRC අවධාරණය කරයි. එමනිසා '' මෙම සිද්ධීන් පිළිබඳව පූර්ණ විමර්ශනයක් පැවැත්වීම අත්‍යාවශ්‍ය කරුණක් බව'' එහි සඳහන් වේ.[361]

441. පැහැර ගෙන යන ලද අයගේ ඉරණම හෝ ඔවුන් ආගිය තැනක් පැහැදිලි කර ගැනීමට මෙම සිද්ධින් ගැන විශ්වාස කටයුතු පූර්ණ සහ ස්වාධීන විමර්ශනයක් ආණ්ඩුව විසින් පැවැත් වූ

---

[360] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[361] LLRC වාර්තාවේ ඡේද 4-318-4-319

බවක් දැන ගන්නට නැත. සමහර සිද්ධීන්වලදී වින්දිතයන් අත් අඩංගුවට ගත් බවට සාක්ෂි පවතින නමුත් ඔවුන් සටන්වලදී මිය ගිය බව ආණ්ඩුව කියයි.

442. සන්නද්ධ ගැටුමේ අවසානයේ දී කොපමණ සංඛ්‍යාවක් මිය ගියේ ද යන්න පැහැදිලි නැත. ගැටුම් පැවති ප්‍රදේශවලින් පිටතට පැමිණෙන අය ලියා පදිංචි කිරීම සඳහා පාරදෘශ්‍ය සහ පැහැදිලි ක්‍රියා පටිපාටියක් නොමැතිවීම හා ඔවුන් කාණ්ඩ අනුව, විශේෂයෙන් එල්ටීටීඊ කාර්යධරයන් සහ සාමාන්‍ය වැසියන් වශයෙන් වෙන් කිරීම අතුරුදහන් කිරීම නිරන්තරයෙන්ම පහසු කළ අතිරේක සාධකයකි. මුලින්ම පරික්ෂා කිරීම සහ ඉන් පසුව රඳවා ගැනීම ස්වාධීනව හා නොකඩවා අධීක්ෂණය කර නැත. එමනිසා සංඛ්‍යාව පැහැදිලි නැති අතර ගැටුමේ අවසාන අදියරේ දී අත් අඩංගුවට ගත් අනෙකුත් ගණනය කිරීම්වලට ඇතුළත් වූයේ ද යන්න නිවැරදිව තීරණය කළ නොහැකිය.

443. විමර්ශන කොමිටියට ලැබුණු තොරතුරු අනුව සන්නද්ධ ගැටුමේ අවසානයේ භාරවූ එල්ටිටීඊ කාර්යධරයන් සැලකිය යුතු සංඛ්‍යාවකට අත් වූ ඉරණම ගැන දැන ගන්නට නැති අතර සාක්ෂිකරුවෝ ගණනාවක්ම තම ආදරණීයයන් තවමත් අතුරුදහන්ව ඇති බව ප්‍රකාශ කළහ. එමනිසා එක් එක් භාර වූවෙකුගේ ඉරණම පැහැදිලි කර ගැනීම සඳහා ''භාරවූවන්'' ලෙස ලියා පදිංචි වූ පුද්ගලයන්ගේ ලැයිස්තු ස්වාධීනව සමාලෝචනය කිරීම අවශයැයි කොමිටිය විශ්වාස කරයි.

**සත්‍යය සෙවීම**

444. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වින්දිතයන් අතුරුදහන් වූවා පමණක් නොව ඔවුන්ගේ පවුලේ සාමාජිකයෝද අතුරුදහන්ව සිටිති. බලහත්කාර අතුරුදහන් කිරීමෙන් අතුරුදහන් වූවන්ගේ පවුල්වලට ''වේදනාවක් සහ ශෝකයක්''[362] ඇති කරන අතර ඔවුන්ගේ පීඩාව වධහිංසා, කු-රිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිමක් විය හැකිය.[363] අන්තර්ජාතික නීතිය යටතේ පවුලේ සාමාජිකයන්ට සත්‍යය දැන ගැනීමේ අයිතියක් ඇති අතර[364] අතුරුදහන් වූවන්ගේ ඉරණම හෝ ඔවුන් සිටින තැන, අතුරුදහන්වීමේ වාතාවරණය සහ අපරාධකරුවන්ගේ අනන්‍යතාවය පැහැදිලි කිරීමට ගතහැකි සියලු පියවර ගැනිමට රාජ්‍යයේ බැඳීමක් පවතී.[365] සත්‍යය දැන ගැනීමට ඇති අයිතිය සීමා කිරීම ඥාතීන් මත ඇති කළ නිරන්තර වේදනාව තවත් වැඩි කිරීමට හා දිග්ගැසීමට හේතුවක් පමණි.[366] රාජ්‍යය විසින් අතුරු දහන් පුද්ගලයාගේ ඉරණම සහ ඔහු සිටින තැන සඟවා සිටින තාක් අතුරුදහන්විම් සිදුවෙමින් පවතින උල්ලංඝනයක් ලෙස සැලකිය හැකිය.[367]

445. අතුරුදහන් කිරීම් ස්ත්‍රීන් කෙරේ ඇති කළ බලපෑම ගැන LLRC සිය වාර්තාවේ විශේෂ අවධානය යොමු කර ඇත. ''නැති වූ පුද්ගලයන්, පැහැර ගැනීම්, හිතුවක්කාර රඳවා ගැනීම්, දීර්ඝ සහ දින නියමයක් නැති රඳවා ගැනීම් සහ අතුරුදහන් කිරීම් ස්ත්‍රීන් කෙරේ සෘජු බලපෑමක් ඇති කරනුයේ වින්දිතයන් බොහෝවිට තම සැමියන්, දරුවන්, පියවරුන් සහ සහෝදරයන් ආදී

---

[362] ප්‍රකාශනයේ 5 වැනි පූර්විකා ඡේදය බලන්න

[363] ප්‍රකාශයේ 1 වගන්තියේ 2 ඡේදය: ''කිසියම් බලහත්කාර අතුරුදහන් කිරීමක්.......... වධහිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික, හෝ අවමන් සහගත සැලකීමෙන් හෝ දඬුවම්වලට ලක් නොවී සිටිමට ඇති අයිතිය (....) සහතික කෙරෙන අන්තර්ජාතික නීතියේ නියමයන් උල්ලංඝනය කිරීමකි.''

[364] ජිනීවා සන්ධානයේ 1 වැනි මූලපත්‍රයේ 32 වගන්තිය. සියලු පුද්ගලයන් බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීමේ අන්තර්ජාතික සන්ධානය 2006 හි 24 වගන්තිය. සියලු පුද්ගලයන් බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීමේ ප්‍රකාශයේ 13 වගන්තිය. බලහත්කාර අතුරුදහන් කිරිම් සම්බන්ධයෙන් සත්‍යයට ඇති අයිතිය පිළිබඳ WGEID පොදු අදහස්.

[365] බලහත්කාර අතුරුදහන් කිරිම් සම්බන්ධයෙන් සත්‍යයට ඇති අයිතිය පිළිබඳ WGEID පොදු අදහස්.

[366] Ibid

[367] සියලු ආකාරයේ බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂාවීමේ ප්‍රකාශයේ 17 වගන්තිය පිළිබඳව WGEID පොදු අදහස්

වශයෙන් වන නිසාත් සම්ප්‍රදායික පවුල තුළ ආදායම් උපයන්නන් මෙන්ම ආරක්ෂාව සපයන්නන් වශයෙන් වූ ඔවුන්ගේ භූමිකාව නිසාත්ය. එමනිසා තම ආදරණීයන් සිටින තැනක් දැන ගැනීමටත්, මේ රටේ සමාන අයිතිවාසිකම් ඇති පුරවැසියන් ලෙස[368] සත්‍යය දැන ගැනීමට හා නෛතික ප්‍රතිකර්ම ලබා ගැනීමට අයිතියක් ඇති බවත් පිළිගනිමින් මෙම ගැටලු ප්‍රමුඛතා කාරණයක් ලෙස විසඳිය යුතුය.

446. තම පවුලේ සාමාජිකයන්ට සිදු වූ දේ කුමක්ද යන්න දැන ගැනීමට ඔවුන් ගත් බොහෝ පියවර සාක්ෂිකරුවෝ කොමිටියට විස්තර කළහ. අතුරුදහන් වූවන්ගේ පවුල් පොලිසිය, යුද හමුදාව, ජාතික මානව හිමිකම් කොමිසම සහ නොයෙකුත් දේශීය පරීක්ෂණ කොමිසන් සභාවලට පැමිණිලි ඉදිරිපත් කළ නමුත් බොහෝවිට ලැබෙන්නේ පැමිණිල්ල ලැබුන බවට ලිපියක් පමණි. වැඩිදුර විස්තරයක් නැත.[369] එසේ නැතිනම් එම පුද්ගලයා රඳවා ගෙන නැති බවය.

447. කොමිටියට ලැබුණු සිද්ධීන් බොහොමයක දී සාක්ෂිකරුවන් ප්‍රදේශයේ පොලීසියට පැමිණිල්ලක් කිරීමේ දී අතුරුදහන් වූ පුද්ගලයා(යන්) ගැන ප්‍රකාශය සටහන් කර ගන්නේ සිංහලෙනි. ඉන්පසු එය අත්සන් කිරීමට ඉල්ලීමක් කරන නිසා අත්සන් කරන නමුත් ලියා ඇති ප්‍රකාශයේ අන්තර්ගතය ගැන අවබෝධයක් තමන්ට නැති බව සාක්ෂිකරුවෝ කීහ.[370] මේ කිසිම අවස්ථාවක ඔවුන්ගේ ප්‍රකාශන ගැන පියවරක් ගෙන නැත.[371]

448. පවුල්වලට තම නැති වූ ඥාතීන් ගේ ඉරණම හෝ සිටින තැනක් ගැන දැන ගැනීමට නොහැකිව තැනින් තැනට යෑමට සිදුව ඇත. මේනිසා ඥාතීන් ගැන සෙවීම මානසිකව මෙන්ම මූල්‍යමය වශයෙන් ද මහත් බරපතළ කාර්යක් වී ඇත. ආණ්ඩුවේ එක් එක් කාර්යාලවලට ගිය විට තමාට භාෂා පරිවර්තකයෙක-ට මුදල් ගෙවීමට සිදුවූ බව සාක්ෂිකාරියක් කීවාය. පවුලේ සාමාජිකයන්ට අතුරුදහන්වීම හෝ එම අපරාධය සිදු කළ අය ගැන තොරතුරක් නැති විට හෝ ඇත්තේ තොරතුරු ස්වල්පයක් වන විට ඔවුහු අවතැන් වූ දෙමළ ජාතිකයන් දහස් ගණනක් ජීවත්වන නොයෙකුත් සරණාගත කඳවුරුවලට යෑමට උත්සාහ කරති.[372]

449. අතුරුදහන් වූවන්ගෙන් පවුල් කීපයක් තොරතුරු ලබා ගැනීම සඳහා හබෙයාස් කෝපුස් රිට් ආඥා අයැදුම් පත් ඉදිරිපත් කර ඇත. එවැනි රිට් ආඥා ලබා ගැනීමට ඉදිරිපත් කරන අයැදුම් පත්, විමර්ශන නොමැතිවීම, ප්‍රමාදයන්, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම ගැන දක්වන නොසැලකිල්ල, සාක්ෂි නොමැතිකම පදනම්ව එවැනි අයැදුම්පත් ඉවත දැමීමට උසාවියට ඇති අභිමතානුකූල බලය වැනි නොයෙකුත් සාධක නිසා සාමාන්‍යයෙන් ප්‍රබල ප්‍රතිකර්මයක් නොවන්නේය. නිදසුනක් වශයෙන් ප්‍රැන්සිස් පියතුමා ඇතුළුව 2009 මැයි මස භාරවනු දුටු කණ්ඩායම අතුරුදහන්වීම සම්බන්ධයෙන් 2013 වවුනියා මහාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සමක් මේ දක්වා තීරණයක් නැතිව පවතී.

450. අතුරුදහන්වීම් ගැන ලැබුණු පැමිණිලි ගණනාවතට ප්‍රතිචාරයක් වශයෙන් පවුල්වලට සහ ඔවුන්ගේ නීතිඥයන්ට පිවිසිය හැකි රැඳවියන් සහ ඔවුන් රඳවා ඇති ස්ථාන ඇතුළත් මධ්‍යම දත්ත බැංකුවක් නිර්මාණය කිරීමට LLRC ය නිර්දේශ කෙළේය. වසර කීපයකට පෙර WGEID ද මෙවැනි නිර්දේශයක් කළ නමුත් ප්‍රතිඵලයක් වූයේ නැත. එක්සත් ජාතීන්ගේ වධ හිංසාවලට එරෙහි කොමිටියට සහ මානව අයිතිවාසිකම් කොමිටියට ආණ්ඩුව ඉදිරිපත් කරන වාරික

---

368 LLRC Report මූලික නිරීක්ෂණ සහ නිර්දේශ සාරාංශය

369 Human Rights Watch ශ්‍රී ලංකාවේ 'අතුරුදහන්වීම්'' සහ පැහැර ගැනීම් පිළිබඳ බියකරු රාජ්‍ය වගකීම 2008

370 ශ්‍රී ලංකා ජාතික මානව හිමිකම් කොමිසමේ අතුරුදහන්කිරීම් පිළිබඳ කොමිටියේ වාර්තාවේ සාරාංශය බලන්න. 2003 ඔක්තෝබර් 28. පිටුව 8.

371 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ. HRW නැවත නැවතත් සිදුවන බියකරු සිදුවීම් Op cit

372 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

වාර්තාවල එවැනි දත්ත බැංකුවක් පවතින බව සඳහන් කරයි. කෙසේ වුවත් මෙම කොමිටියට එම තොරතුරුවල සත්‍යාසත්‍ය භාවය ගැන සහතික කළ නොහැකි අතර කොමිටියට එවැනි දත්ත බැංකුවලට පිවිසීමට අවස්ථාවක් ලබා දුන්නේ හෝ නැත. වර්තමාන ආණ්ඩුවට දැනට රැඳවුම් භාරයේ සිටින අයගේ ලැයිස්තුවක් ගොනු කිරීමේදි දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවීමෙන් මෙම තොරතුරු කලින් කිසියම් ක්‍රමානුකූල සහ පාරදෘශ්‍ය ආකාරයකින් වාර්තා නොකළ බව පෙන්නුම් කරයි.

451. කලින් පෙන්වා දුන් ආකාරයට විශේෂයෙන්ම යුද්ධයේ අවසන් දින කීපය තුළ සමූහ වශයෙන් රඳවා ගැනීමෙන් පසුව සහ ගැටුම අවසන්ව වසර ගණනාවකට පසුව රඳවා ගැනීමේ ස්ථාන පිළිබඳව පාරදෘශ්‍ය භාවයක් නොමැතිවීමෙන් සහ රැඳවියන් පිළිබඳව මූලික ලේඛනයක් නොමැතිවීම බලහත්කාර අතුරුදහන් කිරීම් පහසු කරවීය. එමෙන්ම පවුල්වලට තම ආදරණීයයන් සොයා ගත නොහැකි කරවීය.

452. සමහර අවස්ථාවල අතුරුදහන්ව ඇති අය ගැන තොරතුරක් ලබා ගැනීමට මහත් උනන්දුවෙන් යුත් ඥාතීන් වෙත පැමිණෙන නොහඳුනන පුද්ගලයින් එම ඥාතියා ජීවතුන් අතර සිටින බව පවසා රඳවා ගෙන ඇති ස්ථානය හෙළි කිරීමට මුදල් ඉල්ලා සිටී. කෙසේ වුවත් මුදල් ලබා ගැනීමෙන් පසුව වැඩි විස්තරයක් ලබා ගත නොහැකිය. 2009 වන්නියේ දි තම දියණිය අතුරුදහන් වූ සාක්ෂිකරුවෙකුට ඇය කඳවුරක සිටින බවත් ඇය පෙන්වීමටනම් මුදල් ලබා දෙන ලෙසත් දන්වා නිර්ණාමික දුර කතන ඇමතුමක් ලැබී ඇත. ඔහුගේ දියණිය දැක ගැනීමටත් ඇය සමග කතා කිරීමටත් තවත් මුදල් ඉල්ලා ඇත. මෙම සාක්ෂිකරු විශාල මුදලක් ගෙවූ නමුත් තම දියණිය දැක ගැනීමට අවස්ථාවක් ලැබුණේ නැත.[373]

453. ප්‍රගීත් එක්නැලිගොඩගේ සිද්ධියෙන් නැති වූ තම ආදරණීයයන් ගැන සොයන බොහෝ දෙනකුගේ තත්වය පැහැදිලි කරයි. ඔහු නිවසට නොපැමිණි විට ඒ ගැන පැමිණිල්ලක් භාර ගැනිම මුලින්ම පොලීසිය ප්‍රතික්ෂේප කෙළේය. පොලිස්පතිවරයාගේ නියමයකින් 2010 ජනවාරි 27 මිරිහාන පොලිස් ස්ථානයෙන් විමර්ශන කටයුතු ආරම්භ කෙරිණ. සිද්ධිය පිළිබඳ විමර්ශන කටයුතු 2010 ජනවාරි 30 අපරාධ පරීක්ෂණ අංශයට භාර දෙන ලදී. මෑතක් වන තුරුම පරීක්ෂණයේ ප්‍රතිඵලයක් දක්නට ලැබුණේ නැත.[374]

454. 2010 පෙබරවාරි 19 වැනි දා ඔහුගේ බිරිඳ සන්ධ්‍යා එක්නැලිගොඩ සම්පූර්ණ විමර්ශනයක් වහාම පවත්වන ලෙස ඉල්ලා කොළඹ අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කළාය. කෙසේ වුවත් විමර්ශනයක් පැවැත්වීමට තමන්ට තව තවත් කාලය ලබා ගැනිමට පොලීසිය නඩුව කල් තැබීමට ඉල්ලුම් කෙළේය. වසර ගණනාවක් යන තෙක් පොලීසියෙන් උසාවියට කිසිවක් ඉදිරිපත් කෙළේ නැත. මහෙස්ත්‍රාත්වරයා නිවාඩු ලබා ඇති නිසාද නඩුව නිතර කල් දැමීමට සිදු විය. 2015 පෙබරවාරි 6 වැනි දා විභාගයට නියමිතව තිබුණ ද විනිශ්චයකරු නිවාඩු ගොස් සිටි නිසා මාර්තු 26 ට කල් දැමිණ. එක්නැලිගොඩ සිද්ධිය ගැන WGEID එහි හදිසි පියවර ක්‍රියා පටිපාටිය යටතේ ද කටයුතු කර ඇත.[375]

455. එවකට නීතිපති වූ මොහාන් පීරිස් මහතා 2011 නොවැම්බර් 9 වැනි දින එක්සත් ජාතීන්ගේ වධහිංසාවලට එරෙහි කොමිටිය ඉදිරියේ මෙසේ පැවසුවේය. ''ජනමාධ්‍යවේදී එක්නැලිගොඩ සම්බන්ධයෙන් .......... අපි ඇත්තවශයෙන්ම මෙම කරුණ ගැන පුළුල් පරීක්ෂණ පැවැත් වූයෙමු..... අපගේ වත්මන් ආරංචිය වන්නේ එක්නැලිගොඩ මහතා........... විදේශ රටක

---

373 මූලාශ්‍රය වාර්තාවේ

374 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ.

375 බලහත්කාර හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන් කිරීම් පිළිබඳ වාර්තාව A/HRC/16/48, 26 January 2011

සරණාගතව සිටින බවයි.......[376]මෙම ප්‍රකාශය ලිඛිතව කොමිටියට ලබා දී ඇත. එක්නැලිගොඩ මහත්මිය එය නඩුව විභාග වන කොළඹ උසාවියට එය ඉදිරිපත් කළාය. නීතිපතිට පසුව වධහිංසාවලට එරෙහි කොමිටිය ඉදිරියේ කළ ප්‍රකාශය ඉල්ලා අස්කර ගැනිමට සිදු විය.

456. එතැන් පටන් වැදගත් වර්ධනයන් කීපයක් වූ අතර ඒවා මානව අයිතිවාසිකම් කවුන්සලයට ඉදිරිපත් කළ OHCHR වාර්තාවේ විස්තර කර ඇත.[377] ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මහා මැතිවරණයට පෙර 2015 අගෝස්තු මස ලුතිනන් කර්නල්වරු දෙදෙනෙකු ඇතුළත් හමුදා නිලධාරීන් කීපදෙනෙකු සහ එල්ටිටීඊයේ හිටපු කාර්යධරයන් දෙදෙනෙකු ජනමාධ්‍යවේදී සහ කාටුන් චිත්‍රශිල්පි ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් බව පොලිසියෙන් ප්‍රකාශ කෙරිණ.[378] තහවුරු නොකළ මාධ්‍ය වාර්තා අනුව එක්නැලිගොඩ 2010 ජනවාරි 24 පැහැර ගැනීමෙන් පසුව උතුරු මැද පළාතේ ගිරිතලේ හමුදා කඳවුරට ගෙන ගොස් ඇති බව විමර්ශන කටයුතුවලින් මේ දක්වා හෙළිවේ.[379] මෙය වැදගත් සොයා ගැනීමක් වන අතර මෙම විමර්ශනයෙන් අත් අඩංගුවට ගැනීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ වාතාවරණය පැහැදිලි කිරීම පමණක් නොව අනෙක් සියලු සිද්ධීන් සම්බන්ධයෙන් ද යටපත් කිරීම සහ අණ දීමේ වගකීම් අනුපිළිවෙළ ද හෙළි කළ යුතුය.

**මරණ සහතික නිකුත් කිරීම.**

457. මරණ ලියා පදිංචි කිරීමේ (තාවකාලික ප්‍රතිපාදන) පනතට[380] 2010 දී ගෙන එන ලද සංශෝධන අනුව ''ත්‍රස්තවාදී හෝ කුමන්ත්‍රණකාරී කටයුතු හෝ සිවිල් කැලඹීම් නිසා ශ්‍රී ලංකාවේ සිදු වූ සිවිල් වියවුල් තත්වය යටතේ වසරකට අධික කාලයක් සොයා ගත නොහැකියැයි වාර්තා වූ කිසියම් පුද්ගලයෙකු අභාව ප්‍රාප්ත වූවෙකු ලෙස ලියා පදිංචි කිරීමට පවුල්වලට ඉඩ ලැබේ.''

458. මෙම පනතින් අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට මරණ සහතිකයක් ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණත් ඉන් ආරක්ෂක හමුදා විසින් නීති විරෝධීව සහ හිතුවක්කාරලෙස අත් අඩංගුවට ගැනීමෙන් පසුව වින්දිතයන් අතුරුදහන්වීම පිළිගැනීමක් හෝ තම ආදරණීයන්ගේ ඉරණම පැහැදිලි කිරීමක් වන්නේ නැත. මරණ සහතිකයක් භාර ගැනීම පුද්ගලයෙකුගේ අතුරුදහන්වීම පිළිබඳව පැවැත්වෙන කිසියම් විමර්ශන නතර කිරීමට යොදා ගනු ඇතැයි සාක්ෂිකරුවෝ කණසල්ල ප්‍රකාශ කළහ.

459. මූල්‍යමය වන්දි ගෙවීම් සඳහා මරණ සහතික භාර ගන්නා ලෙස දැනුම් දුන් හෝ භාර ගැනීමට බල කළ අවස්ථා පිළිබඳ ප්‍රකාශ පවුල් සාමාජිකයන්ගෙන් කොමිටියට ලබා දී ඇත.

---

[376] 2012 මැයි 11 මොහාන් පීරිස් උපුටා දක්වමින් වධහිංසාවලට එරෙහි කොමිටියේ සභාපති විසින් කොළඹ උසාවියේ විභාග වන නඩුවකට ලබා දෙන ලද ලිපිය. (දිනය නොදනී)See also the Summary Records, see also CAT/C/SR 1033, 23 May 2012.

[377] A/HRC/30/6/

[378] http://www.dailynews.lk/?q=police-legal/cid-arrests-four-four-army-officers
http://www.dailynews.lk/?q=local/sgt-major-confesses-grilling-ekneligoda

[379] http://www.dailynews.lk/?q=local/sgt-major-confesses-grilling-ekneligoda

[380] ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මරණ ලියා පදිංචි කිරීම (තාවකාලික ප්‍රතිපාදන) 2010 අංක 19 පනත.
http://documents.gov.lk/Acts/2010/registration%20of%20Death%Act%20no%2019%
ආණ්ඩුව 1995 දී මිය ගියා සේ සැලකෙන පුද්ගලයන් සම්බන්ධයෙන් මරණ සහතික නිකුත් කිරිමේ ක්‍රියාවලිය සරල සහ කඩිනම් කිරිමට අංක 2 මරණ ලියාපදිංචි කිරිම (තාවකාලික ප්‍රතිපාදන) පනත සම්මත කෙළේය. මෙම ක්‍රියාවලිය 1998 දී සම්මත කළ අංක 58 මරණ ලියා පදිංචි කිරීම (තාවකාලික ප්‍රතිපාදන) පනතෙන් වඩාත් සරල කෙරිණ.

මෙම කොමිටිය විසින් ලේඛන ගත කර ඇති සිද්ධීන්වලදී මෙවැනි දේ ඥාතීන් විසින් පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී හෝ CID පරීක්ෂණයක් පවත්වන අවස්ථාවේ දී මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයන් ගැන විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම් සභා විභාග පවත්වන තත්වයක් තුළ සිදුව ඇත.[381] මානව අයිතිවාසිකම් නිතියේ පොදු මූලධර්මයක් ලෙස බලහත්කාර අතුරුදහන් කිරීමේ වින්දිතයෙකු ගේ පවුලේ විරෝධයක් පවතින්නේ නම් ඔහු මියගිය සේ නොසැලකිය යුතුය.[382]

460. බොහෝ පවුල් ආර්ථික හේතු නිසා මරණ සහතික බාර ගෙන ඇත. දේපොළ මාරු කිරීම, නැවත විවාහවීම, වන්දි ලබා ගැනීමට අයැදුම් කිරීම සහ සුභ සාධන සහ විශ්‍රාම වැටුප් ලබා ගැනිමට ඉඩ සැලසෙන එකම නිත්‍යානුකූල ලියවිල්ල වන්නේ මෙම මරණ සහතිකය යි. අතීතයේ සමහර අවස්ථාවල ඉන් වන්දි ලබා ගැනිමට ද හැකි විය.[383]

461. කෙසේ වුවත් සාක්ෂි නොමැතිව තම ආදරණියන්ගේ මරණ සහතික භාර ගැනීම ප්‍රතික්ෂේප කළ ඥාතීන්ගේ ප්‍රකාශන ගණනාවක් මෙම කොමිටියට ලැබී ඇත.[384] ඕමන්තේ මුර කපොල්ලේ දී අවසන් වරට සිය දියණිය දැක ඇති මවක් දියණිය මළ බවට සාක්ෂි ලබා දෙන තෙක් සහ මිය ගියේනම් ඇය මිහිදන් කරන තෙක් දියණියගේ මරණ සහතිකය භාර ගැනීම ප්‍රතික්ෂේප කළාය. [385]

462. කෙසේ වුවත් මරණ සහතික නිකුත් කිරීමෙන් සහ වන්දි ගෙවීමෙන් වින්දිතයන්ගේ ඉරණම සහ ඔවුන් සිටින තැනක් පිළිබඳ සත්‍ය තත්වය ලබා දීමට සහ සම්ප්‍රදාය, ආගම හෝ සංස්කෘතිය අනුව මළ සිරුරු පිළිබඳව අවසන් කටයුතු කිරීමට ඒවා පවුල්වලට ලබා දීමට පියවර ගැනීමට ඇති ආණ්ඩුවේ බැඳීම ඉවත් වන්නේ නැත.[386]

463. පුද්ගලයෙක් අතුරුදහන්ව සිටින විට මරණ සහතිකයක් පිළිගැනීම යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා සිටීමට බාධාවක් නොවන බව පැහැදිලිව දක්වෙන නිති පැනවීමට මෙම කොමිටිය නිර්දේශ කරයි. මරණ සහතික පිළිනොගත් අතුරුදහන් වුවන්ගේ ඥාතීහු එම නිසා ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දී සිටිති.

**බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව වැඩ කරන අතුරුදහන් වුවන්ගේ ඥාතීන්ගෙන් සහ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගෙන් පළිගැනීම**

---

381 මූලාශ්‍රය වාර්තාවේ

382 WGEID 19වගන්තිය පිළිබඳ පොදු අදහස් (වන්දි ලබා ගැනීමේ අයිතිය) E/CN/4/1/998/43/prar. බලන්න. A/HRC/22/45 para 50

383 1995 සහ 1999 අතර කාලයේ දී අතුරුදහන් වුවන්ගේ පවුල්වලට මරණ සහතික 15,000 ක් පමණ නිකුත් කර පවුල් දහස් ගණනකට වන්දි ලබා දෙන ලදී. මෙය සිදු වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ආණ්ඩුවෙන් පත් කරන ලද පරීක්ෂණ කොමිසමෙන් මරණ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය සරල කිරීමට කළ නිර්දේශය අනුවය. (පහත බලන්න)

384 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

385 මූලාශ්‍රය ගොණුවේ

386 WGEID General comment on the right of truth para 6: ''ඉරණම සහ ආගිය තැන පිළිබඳව සත්‍යය දැක ගැනීමේ අයිතියට අතුරුදහන් වූ පුද්ගලයා මිය ගිය අවස්ථාව දැන ගැනීම ද ඇතුළත්ය. තම ආදරණීයයාගේ මළ සිරුර ආපසු ලබා ගැනිම සහ තමන්ගේම සම්ප්‍රදාය, ආගම හෝ සංස්කෘතිය අනුව අවසන් කටයුතු කිරීමේ අයිතිය ද ඇතුළත් ය. මළ සිරුර ඩී ඇන් ඒ පරීක්ෂණ ඇතුළත්ව පැහැදිලිව සහ අවිවාදයෙන්ම හැඳින ගත යුතුය. රාජ්‍යය හෝ වෙනත් බලධාරියෙක් පවුලේ පූර්ණ සහභාගිත්වයකින් තොරව සහ එවැනි මළ සිරුරු ගැන මහජනතාව සම්පූර්ණයෙන් දැනුවත් කිරිමකින් තොරව මළ සිරුරු හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සිදු නොකළ යුතුය. රාජ්‍යයන් අන්තර්ජාතික ආධාර සහ සහයෝගිතාවය ලබා ගැනිම ඇතුළත් හඳුනා ගැනීමේ අධිකරණ වෛද්‍ය විශේෂඥතාවය සහ විද්‍යාත්මක ක්‍රමවේද පවතින සම්පත් උපරිම ආකාරයට යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනිමට ක්‍රියා කළ යුතුය.''

464. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන් සත්‍යය, යුක්තිය සහ වගවීම ඉල්ලා සිටීමෙන් වැළැක්වීම අරමුණු කර ගත් නොකඩවා සිදු කෙරෙන තර්ජන, සීමා කිරීම් සහ හිරිහැර කිරීම්වලට ඔවුන් බොහෝවිට ලක් කෙරේ. වසර ගණනාවක් තිස්සේ තම ආදරණීයන් සිටින තැනක් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට පැමිණිලි ඉදිරිපත් කළ හෝ උද්ඝෝෂණය කළ පුද්ගලයන්ගේ එහා මෙහා යෑම් පොලිසිය ( මූලික වශයෙන් CID.TID. STF ) හා යුද හමුදාවෙන් මෙහෙයවන ලදැයි කියන ඒකක නිරීක්ෂණය කිරීම සාමාන්‍ය පුරුද්දක් බවට පත්ව ඇත. විමර්ශන කොමිටිය ලේඛන ගත කළ බොහෝ සිද්ධීන්වල වින්දිතයන්ගේ ඥාතීන් ගේ නිවෙස්වලට ආරක්ෂක හමුදා නිලධාරීන් පැමිණ ප්‍රශ්න කිරීම සහ/හෝ පරීක්ෂණයකට කැඳවා තර්ජනය කර ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගෙන් බහුතරය පුරුෂයන් නිසා බලහත්කාර අතුරුදහන් කිරීම්වලට සත්‍යය සහ යුක්තිය ලබා ගැනීමට ඉල්ලීම් කරන ස්ත්‍රීන් දැඩි අවදානමකට ලක් වේ.[387]

465. අත් අඩංගුවට ගැනීමෙන් පසුව, 1990 ගණන්වල, 2006, 2009 සහ 2010 දී තම සැමියන් අතුරුදහන් වූ ස්ත්‍රීහු තර්ජන කිරීම්වලට සහ හිරිහැර කිරීම්වලට ලක් වූ ආකාරය කොමිටියට විස්තර කළහ. එක සිද්ධියකදී තම ආදරණීයන්ට සිදු වූ දේ ගැන නිරතුරුවම විමසීම නිසා සුදු වෑන් රථයකින් පැහැර ගෙන ගොස් පහර දී ඇත. සමහර සිද්ධීන් වලට යුද හමුදාව ද අනෙක් ඒවාට සී අයි ඩී යද වගකිව යුතුයැයි පැවසේ.[388]

466. අන්තර්ජාතික යාන්ත්‍රණ තුළින් වගවීම ලබා ගැනීමට උත්සාහ කළ පවුල් සාමාජිකයන්ට ශ්‍රී ලංකා බලධාරීන්ගේ හිරිහැර කිරීම්වලට මුහුණ දීමට සිදු විය. සන්ධ්‍යා එක්නැලිගොඩ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලයේ 19 වැනි සැසියේ දි කතා කිරීමෙන් පසු ශ්‍රී ලංකාණ්ඩුවේ දූත පිරිසේ ආධාරකරුවෝ ඇයට තර්ජනය කොට හිරිහැර කළහ. ඔවුහු විදේශ සංවිධානවලින් මුදල් රැගෙන රට පාවා දෙන්නේයැයි චෝදනා කළහ.[389] ජිනීවා හි සිට පැමිණීමෙන් දිනකට පසුව එක්නැලිගොඩ මහත්මිය සිය සැමියා ගේ අතුරුදහන් වීමට අදාලව මහාධිකරණයේ පැවති නඩු විභාගයට ගිය බව පැවසේ. එහිදී නීතිපති ගේ නියෝජිතයා සැමියාගේ අතුරුදහන්වීම පිළිබඳ ව්‍යාතාවරණය ගැන විමසනු වෙනුවට මානව අයිතිවාසිකම් කවුන්සලයට ඇගේ සහභාගිවීම පිළිබඳ කරුණු ගැන පැයකට අධික කාලයක් ප්‍රශ්න කෙළේය.

467. WGEID 2014 නිකුත් කළ අවසන් වාර්ෂික වාර්තාවෙන්, එම වාර්තා කිරීමේ කාලය තුළ බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව වැඩ කරන මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට එරෙහිව සිදු කරන ලදැයි කියන බියවැද්දීම් සහ පළිගැනීම් පිලිබඳව හදිසි අවධානය යොමු කිරීමේ ලිපි හතරක් යැවූ බව කණසල්ලෙන් යුතුව සඳහන් කරයි.[390]

**බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ යුක්තිය සහ වගවීම.**

**බලහත්කාර අතුරුදහන් කිරීම් විමර්ශනය පිළිබඳව මානව හිමිකම් කොමිසමේ භූමිකාව**

468. හදිසි නීති රෙගුලාසි හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇතුළුව කිසියම් රඳවා ගැනීමක් 1996 දී ස්ථාපනය කළ ශ්‍රී ලංකා මානව අයිතිවාසිකම් කොමිසමට දැනුම් දිය යුතු අතර රඳවා ගැනීමේ ඕනෑම ස්ථානයකට යෑමට අයිතියක් ඊට ඇත්තේය.[391]

---

387 බලහත්කාර හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන් වූවන් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම: අතුරුදහන් කිරීම් වලින් පීඩාවට පත් ස්ත්‍රීන් පිළිබඳ පොදු අදහස්. A/HRC/WGEID/98/2.Preamble

388 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ.

389 බලන්න ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාව. සන්ධ්‍යා එක්නැලිගොඩට හිරිහැර කරයි. 2012http://www.humanrights,asis/news/AHRC-STM-092-2012

390 A/HRC/24/49. para94

391 අත් අඩංගුවට ගත් සහ/හෝ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂාව කිරීම පිළිඳව ජනාධිපති විධාන. http://www.defence.lk/new.asp?fname=20070425_02

469. කොමිසම 2006 වන තෙක් අත් අඩංගුවට ගැනීමේ සිද්ධීන් සොයා බැලීමට රඳවා ගැනීමේ බොහෝ ස්ථානවලට ගියේය. 2002 දී කොමිසම යාපනය පළාතේ 1990 සිට 1998 දක්වා අතුරුදහන්වීම් ගැන සොයා බැලීමට හා සහන සහ සහයෝගය විශේෂයෙන් අවශ්‍ය කරන පැමිණිලි හඳුනා ගැනීමට අතුරුදහන්වීම් පිළිබඳ කොමිටියක් පත් කෙළේය. 2003 ඔක්තෝබර් මස අවසන් කරන ලද එම කොමිටියේ වාර්තාවට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ලැයිස්තුවක් මෙන්ම ඒවාට වගකිව යුතුයැයි කියන පුද්ගලයන්ගේ ලැයිස්තුවක්ද ඇතුළත් විය. කෙසේ වුවත් ඒ පිළිබඳව කිසියම් පසුවිපරම් පියවරක් ගත් බවට තොරතුරක් නැත.[392]

470. කොමිසම 2005 දී පාර්ශ්වකරුවන් සමග එක්ව බලහත්කාර අතුරුදහන් කිරීම් සියලු සිද්ධීන් පිළිබඳව කොමිසම හා අනෙකුත් මූලාශ්‍ර එකතු කළ තොරතුරු ගොණු කිරීම සඳහා අතුරුදහන්වීම් පිළිබඳ ජාතික දත්ත බැංකුවක් පිහිටුවීම ආරම්භ කෙළේය. 1998 දී ආණ්ඩුව විසින් බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සිද්ධීන් විමර්ශනය කිරීමට (පහත බලන්න) පත් කළ පරීක්ෂණ කොමිසම් සභා වලින් එකක් වන සමස්ත ලංකා කොමිසමෙන් පැමිණිලි 16,000 කට වැඩි ප්‍රමාණයක් සමාලෝචනය කිරීම සඳහා කොමිසමට ලැබිණ.

471. කොමිසම 2006 ජනවාරි 1 වැනි දා ගැටුම්වලට අදාල මානව අයිතිවාසිකම් විමර්ශනය කිරීමට විශේෂ සම්බන්ධිකාරකයෙක් පත් කෙළේය. ඊට 2006 ජනවාරි මස දෙමළ පුනරුත්ථාපන සංවිධානයේ ( TRO ) කාර්ය මණ්ඩල සාමාජිකයන් පස් දෙනෙකු සහ ඔවුන්ගේ රියැදුරු අතුරුදහන් කිරීමේ සංකේතාත්මක සිද්ධියද ඇතුළත්ය. ඔවුන් 2006 ජනවාරි 29 දින මඩකලපුවේ සිට කිලිනොච්චියට යමින් සිටිය දී මුහුණු ආවරණ පැළඳ ගෙන අවි රැගත් මිනිසුන් විසින් පැහැර ගෙන ඇති බව විමර්ශනයෙන් තහවුරු විය. ඊට පසු දින පැහැරගත් වෙනත් TRO සාමාජිකයන් දෙදෙනෙකු මෙන්ම ඔවුන් මේ දක්වාම අතුරුදහන්ව ඇත. එම දෙදෙනාගේ අතුරුදහන්වීම විශේෂ වාර්තාකරුට විමර්ශනය කිරීමට නොහැකි වූයේයැයි වාර්තා වේ.[393]

472. කෙසේ වුවත් 2006 දී නායකත්වයේ මාරුවීමත් සමග කොමිසම බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව අර්ථාන්විත ආකාරයකින් කටයුතු කර ගෙන ගියේ නැත.[394] නව සභාපති විනිසුරු රාමනාදන් ගත් පළමු පියවරක් වූයේ අතුරුදහන් වූවන් ගේ දත්ත බැංකුව පිළිබඳව වැඩ කළ කාර්ය මණ්ඩලයට ඒවා නතර කිරීමට නියෝග කිරීමය.[395] ආණ්ඩුවේ ඉල්ලීමක් අනුව අතුරුදහන් කිරීමේ සිද්ධීන් ගැන කරන විමර්ශන නතර කිරීම පිළිබඳව 2006 අගොස්තු 11 දිනැතිව WGEID කරන ලද විමසුමට ප්‍රතිචාර වශයෙන් තමන් ස්වාධීන ආයතනයක් බවත් '' ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට සුදුසු පියවර ගැනීමට කරන ඉල්ලීමක් සමග යම්කිසි නියෝජනයක් ඉදිරිපත් කළ හැක්කේ ආණ්ඩුවට පමණක් බව'' කොමිසම සඳහන් කෙළේය.[396]

473. අතුරුදහන් කිරීම් පිළිබඳව කටයුතු කිරීම නතර කිරීමට ගත් තීරණය සහ සභාපති සහ අනෙක් සාමාජිකයන් පත් කළ ආකාරයක් සැලකිල්ලට ගත් මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව සඳහා වූ ජාතික ආයතනවල අන්තර්ජාතික සම්බන්ධීකරණ කොමිටිය 2007 ඔක්තෝබර් මාසයේ දී කොමිසම දැනට සිටින ''බී තත්වයට'' පහත හෙළීමේ තීරණය ගැනීමට

---

392 කොමිසමෙන් ආවරණය වූ කාල සීමාවෙන් යාපනය 1990 සිට 1995 දක්වා එල්ටීටීඊ පාලනය යටතේ පැවති අතර ඉතිරි කාල පරිච්ඡේදය තුළ පැවතියේ ආණ්ඩුවේ පාලනයයි.වාර්තාව අනුව විමර්ශනය කරන ලද සිද්ධීන්ගෙන් 256 ක් දෙමළ ජාතිකයන් පිළිබඳවය. එල්ටීටීඊයෙන් ගනු ලැබූ මුස්ලිම් 25 ක් ද වූහ. ( A Legacy to Remember , Op cit. වාර්තා කරන ආකාරයට.)

393 ගැටුම්වලට අදාල මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව. 2006

394 International Crisis Groupශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් අර්බුදය ආසියා වාර්තාව, අංක. 135 ජූනි 14, 2007 p.19 Human Rights Watch, නැවත නැවතත් සිදුවන බියකරු සිද්ධීන් p 103-107

395 මූලාශ්‍රය වාර්තාවේ

396 A/HRC4/41Ér 382-398

හේතු විය. ඊට හේතු වශයෙන් දක් වූයේ කොමිසම සැබෑවටම ක්‍රියාත්මක වීමේ දී විශේෂයෙන් 2006 ජුලි මස සිදු වූ අතුරුදහන් කිරීමේ සිද්ධීන් 2000 ක් පසුවිපරම් කිරීම, ලේඛන ගත කිරීම සම්බන්ධයෙන් සමබර, විෂය මූලික සහ දේශපාලන නොවී සිටින්නේද යන්න පැහැදිලි නොවීමය.''[397]

474. තමා 1990 ගණන්වල කොමිසමේ වැඩ කිරීමට පටන් ගත් මුල් දිනවල කිසියම් පුද්ගලයෙකු පොලීසියෙන් හෝ හමුදාවෙන් අත් අඩංගුවට ගත්තේනම් තමාට වහාම පොලිස් ස්ථානයට හෝ හමුදා කඳවුරට ගොස් විමසා බැලිමටත් සුදුසුනම් එම පුද්ගලයා නිදහස් කර ගැනීමටත් හැකියාව තිබිණයි කොමිසමේ කාර්ය මණ්ඩලයේ හිටපු සාමාජිකයෙක් විමර්ශන කොමිටියට පැවසුවේය. 2006 දී කොමිසමේ නායකත්වය වෙනස්වීමත් සමග හා රාජපක්ෂ ආණ්ඩුව යටතේ මෙය තවදුරටත් තළ නොහැකි වූයේයැයිද ඔහු පැවසුවේය. දැඩි වශයෙන් හමුදාකරණය වූ වාතාවරණයක් තුළ මෙවැනි සිද්ධීන් මතු කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල ගැන බියෙන් සිය ගණනක් වූ සිවිල් ජනතාව ඉදිරිපත් කළ පැමිණිලි ගැන සොයා බැලීමේ දී කොමිසමේ නිලධාරීන්ට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය.[398]

475. විමර්ශන කොමිසමට අත් අඩංගුවට ගැනිමක් හෝ රඳවා ගැනීමක් පිළිබඳව පැමිණිල්ලක් ලැබුණ විට සිද්ධියට වගකිව යුතුයැයි සැලකෙන ආයතනය තුළ විමර්ශනය භාරව සිටින නිලධාරීන්ට සියලු විස්තර යවන්නේයැයි කියා සිටින විශ්වාස කටයුතු ආරංචි මාර්ග ගණනාවක ප්‍රකාශ කොමිටියට ලැබී ඇත. ආයතන සාමාන්‍යයෙන් කිසියම් ප්‍රතිචාරයක් දක්වන්නේ නැත. නැතිනම් අත් අඩංගුවට ගැනිම සහ රඳවා ගැනීම ගැන කිසිවක් නොදන්නා බව දැනුම් දිමෙන් පසුව ඒ ගැන වැඩි විස්තර විභාගයක් සිදු වන්නේ නැත.[399]

**බලහත්කාර අතුරුදහන් කිරීම් විමර්ශනය සඳහා වූ පරීක්ෂණ කොමිසන් සභා.**

476. 1991 සහ 2013 අතර කාලයේ විවිධ ආණ්ඩු විසින් බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව සොයා බැලිමට විවිධ මැන්ඩේට් බලතල , කාල රාමු සහ නිලධාරීන් සහිත කොමිසන් සභා සැලකිය යුතු සංඛ්‍යාවක් ස්ථාපනය කරන ලදී. ඉන් බොහොමයක ස්වාධීනත්වයක් සහ පාරදෘශ්‍ය භාවයක් නොමැති කමත්. නිර්දේශ ප්‍රසිද්ධියට පත් කළ විට ඒවා කිසි විටෙකත් ක්‍රමානුකූලව ක්‍රියාත්මක නොකිරීම ගැනත් විවේචනය කළහ. සමහර කොමිසන් සභාවලින් අපරාධය සිදු කරන ලද්දේයැයි කියන අයගේ ලැයිස්තු සකස් කර ඇත. කෙසේ වුවත් බොහෝ දුරට ඒවාට වගකිව යුතු අයට දඬුවම් ලබා දීම දක්වා විමර්ශන කටයුතු සිදු වූයේ සිද්ධීන් ඉතා සුළු සංඛ්‍යාවක පමණි.

477. මෙවැනි කොමිසන් සභා සමහරක් මෙම විමර්ශන කොමිටියේ මැන්ඩේට් බලයෙන් ආවරණය වන කාල සිමාවට පෙර පැවති ඒවාය. කෙසේ වුවත් ඒවායේ සොයා ගැනිම්වල වැදගත්කමත්, එම කොමිසන් සභාවල වැඩ කටයුතු තවමත් අතුරුදහන්ව ඇති පුද්ගලයන් හා සම්බන්ධවීමේ හේතුව නිසා සහ ඒවායේ විමර්ශන ප්‍රතිඵල 2002 න් පසුව ක්‍රියාත්මක වන අධිකරණ යාන්ත්‍රණයට යොමු කර තිබීම නිසාත් ඒවායේ වැඩ කටයුතු ගැන සඳහන් කිරීම වැදගත්යැයි විමර්ශන කොමිටිය සිතුවේය. වැඩි දුරටත් ඔවුන් රැස්කළ තොරතුරු අදටත් වැදගත් ය.

**ජනාධිපති කොමිසන් සභා (1991, 1992, 1993)**

---

[397] මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික ආයතන සම්බන්ධීකරණය සඳහා වූ අන්තර්ජාතික කොමිටිය. ප්‍රතීතනය පිළිබඳ අනු කොමිටියේ වාර්තාව සහ නිර්දේශ ජිනීවා 2007 ඔක්තෝබර් 22 සිට 26 දක්වා. 5.3

[398] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ.

[399] UPR ශ්‍රී ලංකාවේ පළමු සමාලෝචනයට, 2008 PEARL ලිඛිත ප්‍රකාශය

478. අතුරුදහන්වීම් පිළිබඳව පරික්ෂා කිරීමට පළමු ජනාධිපති කොමිසම පත් කරන ලද්දේ ජනාධිපති රණසිංහ ප්‍රේමදාස විසිනි.[400] එහි මැන්ඩේට් බලය වූයේ '' 1991 ජනවාරි 11 න් පසුව තම වාසස්ථානයෙන් අකමැත්තෙන් ගෙන යන ලද්දේයැයි පැවසෙන පුද්ගලයන්'' ගැන පරීක්ෂා කිරීමය.[401] 1993 දී එහි ක්‍රියාකාරිත්වය නතර වන විට සිද්ධීන් 140 ක් වැනි සංඛ්‍යාවක් පිළිබඳව විමර්ශන කටයුතු නිම කර තිබිණැයි වාර්තාවේ.[402]

479. ඉන් අනතුරුව 1992 සහ 1993 දී තවත් කොමිසන් සභා දෙකක් පිහිටුවන ලදී. මෙම කොමිසන් සභාවල අධිපත්‍රය ජනාධිපති විජේතුංග 1993 අගෝස්තු 23 අවලංගු කරන ලදැයි වාර්තාවේ. ඉන් පසු කැමැත්තෙන් තොරව ඉවතට ගෙන ගිය පුද්ගලයන් පිළිබඳව පරික්ෂා කිරීමට තවත් කොමිසමක් පත් කෙළේය.[403] එහි මැන්ඩේට් බලය වූයේ අතුරුදහන්වීම් පිලිබඳ ''පැමිණිලිවල විශ්වසනීයත්වය''[404] සොයා බැලීම වන අතර එය 1991 – 1993 කාලයට සීමා විය. ඉන් 1987 සිට 1990 දක්වා පැවති ජවිපෙ කැරැල්ලට සම්බන්ධව විශාල වශයෙන් සිදු වූයේයැයි[405] කියන බලහත්කාර අතුරුදහන් කිරීම් ආවරණය වූයේ නැත. [406] මෙම කොමිසන් සභාවල අවසාන වාර්තා සහ නිර්දේශ කිසි විටෙකත් ප්‍රසිද්ධ කෙළේ නැත.

**කලාපීය කොමිසන් සභා (1994) සහ සමස්ත දිවයින සඳහා පත් කරන ලද කොමිසන් සභා (1998)**

480. ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග 1998 දී කැමැත්තෙන් තොරව හෝ පුද්ගලයන් අතුරුදහන්වීම පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට කලාපීය කොමිසන් සභා තුනක් පත් කළාය. එක් එක් කොමිසමට නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් සඳහා මැන්ඩේට් බලය හිමි විය. ඒ මධ්‍යම, වයඹ, උතුරු මැද සහ ඌව පළාත්, උතුරු සහ නැගෙනහිර පළාත් සහ බටහිර, දකුණ, සහ සබරගමුව පළාත් වශයෙනි. කොමිසම් සභා තුනේ මැන්ඩේට් බලය වූයේ වෙනත් කරුණු අතර ''1988 ජනවාරි 1 න් පසුව කිසියම් පුද්ගලයන් කැමැත්තෙන් තොරව තම වාසස්ථානයෙන් ඉවතට ගෙන යන ලද්දේ හෝ අතුරුදහන් කරන ලද්දේ ද යන්න පරික්ෂා කිරීම ය.කොමිසන් සභාවලින් ආවරණය වන කාල සීමාවෙන් ජවිපෙ කැරැල්ලට අදාලව 1987 දී සිදු වූයේයැයි කියන අතුරුදහන්වීම් නැවත වරක් බැහැර කෙරිණ.[407] කෙසේ වුවත් ඊට කාල සීමාවක් දක්වා නොතිබූ නිසා එය පිහිටුවීමෙන් පසුව සිදු වූ බලහත්කාර පැහැර ගැනීමේ අලුත් සිද්ධීන් විමර්ශනය කිරීම ඇතුළත්ව සැලකිය යුතු පරීක්ෂණ ගණනාවක්ම පැවැත්වීමට හැකි විය.

---

[400] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[401] ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයඃ අංක 644/27 1991 ජනවාරි 11.

[402] 1991 ජනවාරි 11 අති විශේෂ ගැසට් පත්‍රයේ අ ලේඛනය

[403] A Legacy to Remember Sri Lanka's Commissions of Inquiry 1963- 2002 Ed. Kishali Pinto Jayawardena, The Law and Society Trust.

[404] 1993 සැප්තැම්බර් 13 අංක 784/1 දරන ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය. කොමිසන් සභා පිහිටුවන ලද අධිකාරි බලපත්‍රයේ (Warrants) ''කැමැත්තෙන් තොරව පුද්ගලයන් ඉවත් කිරීම'' යන යෙදුම අන්තර්ජාතික නීතියේ බලහත්කාර අතුරුදහන් කිරීම පිළිබඳ නිර්වචනයට සමාන නැත. බලන්න 1991 ජනවාරි 11 අංක 644/27 කොමිසන් සභා අධිකාරි බලපත්‍ර ගැසට් පත්‍රය . 1992 ජනවාරි 13 අංක 697/5 දරන ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය, 1993 ජනවාරි 25 අංක 751/1 ගැසට් පත්‍රය හා 1993 සැප්තැම්බර් 13 අංක 784/1 ගැසට් පත්‍රය යන සියල්ලේම කැමැත්තෙන් තොරව පුද්ගලයන් ඉවත් කිරීම සම්බන්ධයෙන් යොදා ඇත්තේ එකම වචනයි. බලන්න A Legacy to Remember Sri Lanka's Commissions of Inquiry 1963- 2002 Ed. Kishali Pinto Jayawardena, The Law and Society Trust.

[405] A Legacy to Remember Op cit p 22

[406] Amnesty Interítional ' Time for Truth and Justice. Observations and Recommendations regarding the commissions investigating past human rights violations' April 1995.

[407] A Legacy to Remember Sri Lanka's Commissions of Inquiry 1963- 2002 The Law and Society Trust. A reference Guide to Commissions reports with a Tabulated List of Recommendations September 2010 p.20 http://www.lawandsocietytrust.org/PDF/a%20legacy%2-0to%remember%3B%20sn%lanka's%20commissions%20%20inquiry.pdf

481. කලාපීය කොමිසන් සභා පැවති වසර තුනක කාලය තුළ ඒවායින් පැමිණිලි 27,526 ක් විග්‍රහ කොට සිද්ධීන් 16,800 ක් පමණ බලහත්කාර අතුරුදහන් කිරීම් සේ සැලකිය යුතු ඒවා බව තහවුරු කෙරිණ. මෙම කොමිසම් සභා, සිද්ධීන් 1681 ක්[408] සම්බන්ධයෙන් වගකිව යුතුයැයි කියන පුද්ගලයන් දක්වෙන විශ්වාස කටයුතු තොරතුරු සොයා ගත් අතර එම සිද්ධීන්ට වගකිව යුතු යැයි කියන පුද්ගලයන් සිය ගණනකගේ නාම ලැයිස්තුවක් ද සකස් කරන ලදී. ඉන් බොහෝ දෙනෙක් සන්නද්ධ බලකා (යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව) සහ පොලීසියේ අය වන අතර සමහර දේශපාලකයන්ද වූහ. නිදසුනක් වශයෙන් මධ්‍යම, වයඹ, උතුරු මැද සහ ඌව පළාත් සම්බන්ධයෙක් කටයුතු කළ කලාපීය කොමිසම විමර්ශනය කළ එක් එක් පැමිණිල්ලක් වෙනුවෙන් නිශ්චිත සොයා ගැනීම් සහ සාක්ෂි සහ ඒවා සිදු කළ පුද්ගලයන්ද වෙනම ඇමිණුම් ලෙස ඇතුළත් කර ඇත.

482. කලාපීය පරීක්ෂණ කොමිසම් සභා තුනේ වාර්තා 1997 සැප්තැම්බර් මස ජනාධිපතිනියට භාර දෙනු ලැබිණ. ඒවායේ නිරීක්ෂණ සහ නිර්දේශ ප්‍රකාශයට පත් කරන ලද නමුත් ඒවා සිදු කළ පුද්ගලයන්ගේ ලැයිස්තු ප්‍රසිද්ධ කළේ නැත. කෙසේ වුවත් කොමිසමට එම ලැයිස්තු ලබා ගත හැකි විය.

483. 1998 අප්‍රේල් මස ජනාධිපතිනිය, කලාපීය කොමිසම් සභා තුනට[409]ඉදිරිපත් කරන ලද නමුත් විමර්ශනය නොකළ පැමිණිලි 10,136 ක් ගැන පරික්ෂා කිරීමට කැමැත්තෙන් තොරව සහ අතුරුදහන් කළ සමහර පුද්ගලයන් ගැන පරික්ෂා කිරීමේ මුළු දිවයිනටම අදාල පරීක්ෂණ කොමිසමක් ( මුළු දිවයිනම සඳහා වූ කොමිසම යනුවෙන් ද හැඳින්වෙන) පත් කළාය. එය අතුරුදහන්වීමේ පැමිණිල් 4,473 ක් විමර්ශනය කිරීමෙන් පසුව 2001 දී එහි අවසාන වාර්තාව නිම කරන ලදී. සමහර සිද්ධීන් ගැන එහි සොයා ගැනීම් කලාපීය කොමිසන් සභා නිර්දේශ අනුව පිහිටුවන ලද පොලීසියේ නැති වූ පුද්ගලයන්ගේ ඒකකය සහ අතුරුදහන්වීම් විමර්ශනය කිරීමේ ඒකකයට යොමු කරන ලදී. (පහත අපරාධ විමර්ශන බලන්න.) මුළු දිවයින් කොමිසන් සභාවේ නිර්දේශ සහ නිරීක්ෂණ ප්‍රසිද්ධ කළ නමුත් ඒවා සිදු කෙළේයැයි පැවසෙන පුද්ගලයන්ට අදාල තොරතුරු ප්‍රසිද්ධ කෙළේ නැත. කෙසේ වුවත් මෙම කොමිසමට මුළු දිවයිනටම අදාල කොමිසන් සභාවෙන් අපරාධවලට සම්බන්ධයැයි නම් කරන ලද 318 ක ගේ රහස්‍ය වාර්තාවක් ලබා ගත හැකි විය.

484. කොමිසන් සභා අතුරුදහන්වීමේ සිද්ධීන් සියල්ල විසඳීමට හෝ වගකිව යුතු බොහෝ දෙනෙකුට අභිචෝදනා ඉදිරිපත් කිරීමට හේතු නොවූ නමුත් අතුරුදහන්වීම් සිද්ධීන් පිළිබඳ ව්‍යුහයන් සහ පුද්ගලයන් ගැන සවිස්තරාත්මක තොරතුරු රැස් කර ඇත. මෙම කොමිසන් සභා විසින් රැස්කරන ලද සවිස්තරාත්මක තොරතුරු සහ සාක්ෂි සහ අනතුරුව සිදු කරන ලද පොලිස් සහ අධිකරණ විමර්ශන, බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධීන් සහ සියලු රටාවන් ගැන කෙරෙන නව පුළුල් විමර්ශනයක කොටසක් සහ සියලු ආරක්ෂක හමුදා පිළිබඳ පරික්ෂා කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් යොදා ගැනීමට සමාලෝචනය කළ යුතුයැයි විමර්ශන කොමිටිය විශ්වාස කරයි..

**පැහැර ගැනීම්, අතුරුදහන්වීම් සහ මිනී මැරුම් පිළිබඳ ජනාධිපති කොමිසන් සභාව ( 2006 සැප්තැම්බර්) සහ ඉන් පසුව පිහිටුවන ලද කොමිසම ( 2007 මැයි)**

485. 2006 සැප්තැම්බර් මස නැවතත් ඉහළ යමින් තිබූ පැහැර ගැනීම් ගැන විවේචන උත්සන්න වෙත්ම ජනාධිපති රාජපක්ෂ පැහැර ගැනීම්, අතුරුදහන්වීම් සහ මිනී මැරුම් පිළිබඳ ජනාධිපති

---

[408] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය ශ්‍රී ලංකාවේ සිවු වැනි වාරික වාර්තාව CCPR/C/LKA/2002/4, 18/10/2002. para 156

[409] බලන්න බටහිර, දකුණ සහ සබරගමුව පළාත්වල පුද්ගලයන් කැමැත්තෙන් තොරව ඉවත් කිරීම හෝ අතුරුදහන් කිරීම පිළිබඳ කොමිසන් සභාවේ අවසාන වාර්තාව, 1997. උතුරු සහ නැගෙනහිර පළාත්වල පුද්ගලයන් කැමැත්තෙන් තොරව ඉවත් කිරීම හෝ අතුරුදහන් කිරීම පිළිබඳ කොමිසන් සභාවේ අවසාන වාර්තාව, 1997. සමහර පුද්ගලයන් (සමස්ත දිවයින) පුද්ගලයන් කැමැත්තෙන් තොරව ඉවත් කිරීම හෝ අතුරුදහන් කිරීම පිළිබඳ කොමිසන් සභාවේ අවසාන වාර්තාව, 2001

කොමිසමක් හිටපු විනිසුරු මහානාම තිලකරත්නගේ ප්‍රධානත්වයෙන් පත් කෙළේය.[410] ඔහුගේ අවසාන වාර්තාව 2007 මැයි මස භාර දුන් නමුත් ප්‍රසිද්ධ කෙළේ නැත. කෙසේ වුවත් මෙම කොමිටිය ප්‍රකාශ නොකළ වාර්තාවේ පිටපතක් සමාලෝචනය කෙළේය.

486. විමර්ශනය කිරීමට පොලිසිය අපොහොසත්වීම සහ සිද්ධීන් පිටුපස සිටින ''සමහර බලවත් පුද්ගලයන්'' පිලිබඳ සාක්ෂි නොසලකා සිටීම දැඩිව විවේචනයට ලක් කරන මෙම වාර්තාව තුළ, ආරක්ෂක හමුදා සම්බන්ධ අතුරුදහන් කිරීම් පිළිබඳ චෝදනා යටපත් කිරීමට උත්සාහ කිරීමක් දැකිය හැකිය. මෙම සිද්ධීන් අපරාධකරුවන්ගේ, පවුල් ආරවුල්, ''තරුණියන් දිනා ගැනීමට කරන...... පැහැර ගැනීම්'' සහ ''හිරොයින් වලට ඇබ්බැහි වූවන් සම්බන්ධ ආරවුල්'' ලෙස හැඳින්වීමේ උත්සාහයක් පෙනේ.[411] ආරක්ෂක හමුදාවල සම්බන්ධතාවය දැක්වෙන්නේ අඩුවෙනි. ''සමහර අවස්ථාවල හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් පැහැර ගැනීම් සිදු කර ඇති බව හෙළිවිය. ඔවුන් නිති විරෝධී ක්‍රියා සිදු කළ පුද්ගලයන් ලෙස සැලකිය යුතුය.''

487. විනිසුරු තිලකරත්න කර ඇති ප්‍රකාශ වලින් ඔහුගේ කොමිසම ගැඹුරු සහ විශ්වාස කටයුතු විමර්ශනයක් කිරීමට අපොහොසත් වූ බව දැක්වේ. නිදසුනක් වශයෙන් 2007 මැයි මාසයේ දී පැහැර ගැනීම් පිළිබඳව යාපනයේ සහ මඩකලපුවේ කිසියම් ''අදිසි හස්තයක්'' වගකිව යුතුයැයි ද, කිසිවෙකු හමුදාවට සහ පොලීසියට එරෙහිව වචනයක් හෝ නොකීවේයැයිද ඔහු සඳහන් කළ බව පැවසේ. ''පැහැර ගෙන යෑම් බහුතරයක් ඇත්තෙන්ම පැහැර ගැනීම් නොව අදාල පුද්ගලයා පවුලේ අය අතර ඇති කර ගත් ආරවුලක් වැනි සුළු කාරණයක් නිසා තාවකාලිකව පවුලෙන් පිටව යෑම්යැයි'' ඔහු සඳහන් කරයි.[412] කොමිසම රැස්කළ සාක්ෂි අනුව පැහැරගනු ලැබූවන් අවසන් වරට දකින විට ඔවුන් දන්නා පුද්ගලයන් සමග සිය කැමැත්තෙන්ම ගොස් ඇති බවත් ඔහු සඳහන් කරයි.[413] බලහත්කාරයෙන් රැගෙන ගොස් ඇත්තේ ඉතා ටික දෙනෙකු පමණක්යැයිද වාර්තාවේ සඳහන් වේ.

488. මෙම කොමිටියෙන් සමාලෝචනය කළ කොමිසමේ ප්‍රකාශයට පත් නොකළ සොයා ගැනිම්වලින් විමර්ශනයේ විශ්වසනීයත්වයක් සහ ස්වාධීනත්වයක් නැති බව තහවුරු කරයි. අතුරුදහන්වීමේ සිද්ධීන් ආණ්ඩුවට එරෙහිව යොදා ගත් දේශපාලන ප්‍රචාරක උපක්‍රමයක්යැයි පැවසීමෙන් කොමිසම මෙම සිදුවීම් හැල්ලුවට ලක් කරයි. විධිමත් විමර්ශන නොවීමට හේතු ලෙස කොමිසම දක්වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන, හදිසි නීති රෙගුලාසි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැනි නීතිය හා සාමය පවත්වා ගැනිමට අදාල දේශීය නීති ප්‍රතිපාදන ගැන පොලීසියේ ඇති පළපුරුද්දක් නැති කමයි.

489. තිලකරත්න කොමිසමේ අවසාන වාර්තාව භාරදීමෙන් පසුව එම විනිසුරුගේ නායකත්වයෙන්ම 2006 සැප්තැම්බර් 13 න් පසුව ඇරඹෙන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම නොහඳුනන පුද්ගලයන් සිදු කරන ලද පැහැරගෙන යෑම්, අතුරුදහන් කිරීම් සහ මිනි මැරුම් ගැන විමර්ශනය කිරීමට තවත් ඒක පුද්ගල ජනාධිපති කොමිසමක් ජනාධිපති රාජපක්ෂ 2007 ජුනි මස පත් කෙළේය. 2006 සැප්තැම්බර් සිට 2009 නොවැම්බර් දක්වා කාල පරිච්ඡේදය ආවරණය වන එහි අවසාන වාර්තාව 2009 දෙසැම්බර් මස ජනාධිපතිට භාර දී ඇත. ප්‍රකාශයට පත් නොකළ එම වාර්තාවේ පිටපතක් මෙම කොමිසමට ද ලැබිණ.

---

410 2006 අංක 1462/30 ගැසට් පත්‍රය (අති විශේෂ) සහ 2007 අංක 1505/17 ගැසට් පත්‍රය (අති විශේෂ)

411 දිවයින පුරාම මරණ සිදු වූ පැහැර ගෙනයෑම්, අතුරුදහන් කිරීම් සහ සිවිල් ජනතාවට පහරදීම් පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තාව 2007 මැයි. මුල් වාර්තාවේ උපුටා ගත් කොටස්වල නිල නොවන පරිවර්තනය OISL

412 International Crisis Group " ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් අර්බුදය" ආසියා වාර්තාව අංක 135 ජුනි 14 2007

413 Majority of 'abductees' found to have returned https://lrrp.wordpress.com/2007/06/30/majority-of-%E2%80%9Cabductees%E2%80%9D-found-to-have-returned

490. කලින් කොමිසන් සභා මෙන්ම මෙම කොමිසන් සභා වාර්තාව ද මූලික වශයෙන් අරමුණු කර ගෙන ඇත්තේ අතුරුදහන් කිරීම පිලිබඳ චෝදනා රටේ ප්‍රතිරූපය කෙළසීමට යොදා ගන්නා ප්‍රචාරක ව්‍යාපාරයක කොටසක් වශයෙන් යටපත් කිරීම සහ ඉවත දැමීමය. අතුරුදහන්කිරීම දෙමළ ස්ත්‍රීන් දූෂණය කිරීම හා ආරක්ෂක හමුදා විසින් දෙමළ තරුණයන් ඝාතනය කිරීමේ වාර්තා ''පදනම් විරහිත ප්‍රචාරයන්'' ලෙස හඳුන්වන එය ''සුළු සිද්ධීන් සංත්‍රාසය ඇති කිරීමට'' යොදා ගැනීමක් බව පෙන්වයි.[414]

491. වාර්තාවේ නිර්දේශ අතර ඉහළින්ම ඇත්තේ ''ඒ අවස්ථාවේ අදාල පුද්ගලයා සිටින තැන හොඳින්ම දන සිටියදීත් පැහැර ගැනීම හෝ අතුරුදහන් කිරීම ගැන පොලීසියට පැමිණිලි ඉදිරිපත් කරන පුද්ගලයන්''ට එරෙහිව නීතිමය පියවර ගැනීමය. ''පොලීසියෙන් ලබා දී ඇති වාර්තා අනුව (මාධ්‍යයේ) ප්‍රකාශයට පත්ව ඇති අතුරුදහන් කිරීමේ සිද්ධීන් පදනම් විරහිත සහ විශ්වාස කළ නොහැකි කතන්දරය.''යි වාර්තාව සඳහන් කරයි. වාර්තාවී ඇති සිද්ධීන්ගෙන් සියයට 90 ක්ම, පවුල් ආරවුල්, ප්‍රේම සම්බන්ධතා, අත් අඩංගුවට ගැනිමට උසාවියෙන් නිකුත් කර ඇති වරෙන්තු මග හැරීමට, ත්‍රස්තවාදි සංවිධානයකට එකතුවීම වැනි නොයෙකුත් හේතු නිසා පවුල් හැර ගොස් ඇති සිද්ධීන් පිළිබඳව බව කොමිසම පෙන්වා දේ. අතුරුදහන්වීම් පිළිබඳව ලැබී ඇති පැමිණිලි 22,474 කින් පුද්ගලයන් 20,637 ක් ආපසු පැමිණ හෝ සොයා ගෙන ඇති අතර ඉතිරි සිද්ධීන් ගැන විමර්ශනය කළ යුතුය.

**2005 අගෝස්තු 1 වැනි දා සිට සිදු වූයේයැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කොට පරික්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව.**

492. 2006 නොවැම්බර් මස, 2005 අගෝස්තු 1 සිට සිදු වූයේයැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් 16 ක් පිළිබඳව විමර්ශනය කිරීමට උදලාගම කොමිසම යනුවෙන් හැඳින්වෙන ජනාධිපති කොමිසමක් පිහිටුවන ලදී. ඊට ජිම් බ්‍රවුන් පියනම සහ ඔහුගේ සහායක සහ මිසම් සාමාජිකයෙකු වන වෙනිස්ලෝ වී. විමලත ඇතුළත් මහත් ප්‍රසිද්ධියක් ලැබුණු සිද්ධීන් ගණනාවක් ඇතුළත් විය.[415] මෙම කොමිටියට දක ගැනීමට හැකි වූ කොමිසමේ ප්‍රකාශයට පත් නොකළ වාර්තාව අනුව බ්‍රවුන් පියනමගේ අතුරුදහන්වීම ''සාක්ෂි මද කම නිසාත් වඩාත් වැදගත්ව මරණකරුගේයැයි කියන සිරුර සොයා ගැනිමට නොහැකිවීම නිසාත්'' විමර්ශනය කෙළේ නැත.[416]

493. විමර්ශන කොමිටිය රැස්ක ර ගත් තොරතුරු අනුව දෙමළ කතෝලික පූජකයෙකු වන බ්‍රවුන් පියනම 2005 අගෝස්තු මස 12 වැනි දා අල්ලෙයිපිඩ්ඩි හි ආරක්ෂක හමුදා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන විට සිවිල් වැසියන් බොහෝ දෙනෙකුට පල්ලියේ රැකවරණය ලබා දුන්නේය. එහිදී ළමයින් ඇතුළුව බොහෝ දෙනෙකුට තුවාල සිදු වූ අතර සමහරු මිය ගියහ.[417] 2006 අගෝස්තු 20 වැනි දා බ්‍රවුන් පියනම වෙනිස්ලෝ වි විමලත සමග කයිට්ස් දූපතේ සිට යාපනයට මෝටර් සයිකලයකින් ගමන් කරමින් සිටියේය. ඔවුන් අවසන් වරට දක ඇත්තේ අල්ලෙයිපිඩ්ඩි නාවික හමුදා මුර පොළේදීය. අවට ප්‍රදේශය නාවික හමුදා පාලනය යටතේ පැවතිණ. මෙම දෙදෙනාගේ අතුරුදහන්වීම ගැන පොලීසියට පැමිණිල්ලක් කරන ලද අතර කයිට්ස් වැඩ බලන මහෙස්ත්‍රාත්වරිය විමර්ශන කටයුතු ආරම්භ කළාය. ඇය නාවික හමුදා මුර පොළේ ලොග්

414 2006 සැප්තැම්බර් 13 සිට 2006 නොවැම්බර් 25 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවල නොහඳුණන පුද්ගලයන් විසින් සිදු කරන ලද පැහැර ගැනීම්, අතුරුදහන් කිරීම් සහ ඝාතන විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසමේ වාර්තාව. 2009 දෙසැම්බර් උපුටා ගත් කොටස් නිල නොවන පරිවර්තනය OISL

415 2005 අගෝස්තු 1 දින සිට සිදු වූයේයැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය සහ විභාග කිරීමට පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිසන් සභාවේ වාර්තාව පිටුව 8 2009 මැයි.

416 එම

417 On this case see also Human Rights Watch Recurring Nightmare cit. March 2008 p. 66 LLRC ප්‍රසිද්ධ විභාගයේ දී 2010 නොවැම්බර් 12 දින ඒ සන්තියාපිල්ලේ මහතා ගේ ඉදිරිපත් කිරීම බලන්න. 2011 ජනවාරි 8 මන්නාරම කතෝලික දියෝකීසිය LLRC වෙත කළ සැලකිරීම් ද බලන්න.

සටහන් පොත ගෙන්වා ගැනීමට ගත් උත්සාහයට නාවික හමුදාවෙන් බාධා කෙරිණ. ඊට පසුදින ඇයගේ රාජකාරි වෙනත් මහෙස්ත්‍රාත්වරයෙකුට පවරා ඇය යාපනයේ වෙනත් කටයුතු සඳහා මාරු කෙරිණ. බ්වුන් පියනම අතුරුදහන් කිරීම පිළිබඳ ඇයගේ විමර්ශනය ඉන් නතර වූ අතර ඇය ඉවත් වූ පසු කිසිත් සිදු වූයේ නැත.[418]

494. උදලාගම කොමිසමට භාර දී ඇති සීඅයිඩී වාර්තාව අනුව 2006 අගෝස්තු 30 වැනිදා සීඅයිඩිය විමර්ශන කටයුතු භාර ගෙන ඇත. 2006 නොවැම්බර් වන විට ද විමර්ශන කටයුතු සිදු වෙමින් පැවති නමුත් අවධානය යොමුව තිබුණේ අතුරුදහන් වූ වාතාවරණය තහවුරු කර ගැනිම වෙනුවට බ්වුන් පියනම බංකර් කැනීමට එල්ටීටීඊයට උදවු දුන්නේය යන නාවික හමුදා අණදෙන නිලධාරියාගේ චෝදනාව කෙරේය. 2007 මාර්තු මස මළ සිරුරක් වෙරළේ තිබී හමු වූ අතර එය බ්වුන් පියනමගේදැයි දැන ගැනීමට ඩීඇන්ඒ පරීක්ෂණයක් කිරීමට මහෙස්ත්‍රාත් නියෝග කෙළේය. ඩීඇන්ඒ පරීක්ෂණවලින් එම සිරුර පිය නමගේ නොවන බව පෙන්නුම් කරන්නේයැයි ආණ්ඩුව පසුව ප්‍රකාශ කෙළේය.[419]කෙසේ වුවත් එම පරීක්ෂණය සිදු කෙළේද යන්න සහ එසේ වූයේනම් එහි ප්‍රතිඵල කුමක් වූයේද යන්න තහවුරු කර ගැනීමට විමර්ශන කොමිටිය ගත් උත්සාහය අසාර්ථක විය. මෙම අතුරුදහන් කිරීම් දෙක ගැන පරීක්ෂණ දිගටම පැවැත් වූයේද යන්න ගැන තොරතුරු නැත.[420]

495. බ්වුන් පියනම 2006 අගෝස්තු 20 අතුරුදහන්විමට පෙර තම ජීවිතයට තර්ජනයක් ඇතැයි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට පැමැණිලි දෙකක් ඉදිරිපත් කර ඇත.[421] ඔහු එල්ටීටීඑයට සහාය දක්වන්නේයැයි ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් නිතර නිතර තර්ජන එල්ලවී ඇති අතර ඒ තමාට තර්ජනයක් විශේෂයෙන්ම එම ප්‍රදේශයේ නාවික අණ දෙන නිලධාරියාගෙන් ඇති බව ඔහු වෙනත් අයට පවසා ඇත. වාර්තා අනුව මෙම අතුරුදහන් කිරීමට නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරියෙකු සම්බන්ධය.

**අපරාධ විමර්ශනය**

496. ශ්‍රී ලංකාවේ දණ්ඩන නිති සංග්‍රහයේ අතුරුදහන් කිරීම නිශ්චිත වරදක් ලෙස සඳහන් නොවීම බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව වගකිව යුතු අය විමර්ශනය, අභිචෝදනා ඉදිරිපත් කිරීම සහ දඬුවම් දිමට බාධාවකි. LLRC, WGEID, එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය සහ වධහිංසාවට එරෙහි කොමිටිය යන සියල්ලන්ම ශ්‍රී ලංකාව අතුරුදහන් කිරීම අපරාධයක් ලෙස හැඳින්විය යුතුයැයි නිර්දේශ කර ඇත.[422]

497. මානව අයිතිවාසිකම් කොමිටියට ඉදිරිපත් කළ පස්වැනි වාරික වාර්තාවට අදාලව මතු කර ඇති ප්‍රශ්න මාලාවට ප්‍රතිචාර වශයෙන් '' පුද්ගලයන් සඟවා තැබීම, පැහැර ගැනීම සහ අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් ඇති වන ඕනෑම තත්වයක් සඳහා දණ්ඩන නිති සංග්‍රහයේ වගන්ති 350 සිට 360 දක්වා ප්‍රතිපාදනවලින් ප්‍රමාණවත්ව ආවරණය වන්නේයැයි ආණ්ඩුව සඳහන් කර ඇත.[423]කෙසේ වුවත් බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් නඩු පැවරීමට මෙම ප්‍රතිපාදන යොදා ගෙන ඇත්තේ කලාතුරකිනි. ඉන් පෙනී යන්නේ ප්‍රධාන බාධකය වන්නේ

---

418 University Teachers for Human Rights (UTHR) Special Report No0.25, 31 May 2007. OISL විසින් තහවුරු කර නොගත් නමුත් බ්වුන් පියතුමා සහ ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්වරිය නාවික හමුදාවෙන් ඇති කළ බාධක නොතකා තුවාලකරුවන් රෝහලකට ගෙන යැමට ගත් උත්සාහය මෙම වාර්තාවෙන් පැහැදිලි කරයි.

419 'DNA වාර්තාවෙන් සාවද්‍ය තොරතුරු හෙළිවේ කොළඹ' Colombo http://www.defence.lk/new.asp?fname=2007613-07

420 DNA වාර්තාවෙන් සාවද්‍ය තොරතුරු හෙළිවේ කොළඹ http://www.defence.lk/new.asp?fname=2007613-07

421 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

422 E/CN/4/2000/64/Add.l para 63, CCPR/CO/79/LKA.para 10, CAT/C/LKA/CO 3-4 para 9 LLRC Report pata 9-59

423 මානව අයිතිවාසිකම් කොමිටිය ශ්‍රී ලංකාවේ පස්වැනි වාරික වාර්තාවට අදාල ඉදිරිපත් කළ කරුණු ලැයිස්තුව ඇමිණුම – කරුණු ලැයිස්තුවට ශ්‍රී ලංකාවේ පිළිතුරු සැප්තැම්බර් 17 2014 ඡේදය 62

බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවල විය හැකි සම්බන්ධතාවය හෙළි කිරීමට දේශපාලන අධිෂ්ඨානයක් හෝ උනන්දුවක් නොමැතිවීම යන්නයි.

498. 2011 වාර්තාවේ ඡේද 9.46 හි අතුරුදහන් කිරීමේ සිද්ධීන්ට අදාලව LLRC මෙසේ සඳහන් කරයි. ''බොහෝ අවස්ථාවල පොලිසියට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට හා ICRC වෙත විධිමත් පැමිණිලි කර ඇති බව පෙනේ. සමහර සිද්ධීන්වලදී කලින් පැවති පරීක්ෂණ කොමිසන් සභාවලටද ඉදිරිපත් කිරීම් කර ඇති බව පෙනේ. එහෙත් අතුරුදහන් වූ පුද්ගලයන්ගෙන් බොහෝ දෙනෙකු සිටින තැන තවමත් දැන ගැනීමට නොහැකි යැයි ආසන්න ඥාතීහු දිගින් දිගටම පැමිණිලි කරති.......... එමනිසා මෙම චෝදනා නිසි ආකාරයට විමර්ශනය කොට වැරදිකරුවන් අධිකරණය හමුවට ගෙන ඒමට වහාම පියවර ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් යොමු කිරීමට ආණ්ඩුවේ බැඳීමක් පවතී.'' (ඡේදය 9.46)

499. කලාපීය කොමිසන් සභා තුන සහ 1998 මුළු දිවයිනම සඳහා වූ කොමිසම ගැන කටයුතු කිරීම හැරෙන්න ශ්‍රී ලංකාවේ බලහත්කාර අතුරුදහන් කිරීම් අති බහුතරයක් ගැන කිසියම් අපරාධ විමර්ශනයක් කිරීමට අධිකාරීන් සුළු හෝ කිසිදු උත්සාහයක් ගෙන නොමැති බව මෙම කොමිටියට නිරීක්ෂණය විය.

500. ඉහත සඳහන් කරන ලද කලාපීය කොමිසන් සභා තුනේ නිර්දේශ පදනම් කර ගෙන 1997 අග භාගයේ දී ''වැරදිකරුවන්ට එරෙහිව අපරාධ ක්‍රියා පටිපාටි ආරම්භ කිරීමට'' ආණ්ඩුව තීරණය කෙළේය. අපරාධ විමර්ශන කටයුතු පැවැත්වීම සඳහාත් මෙම නඩු උසාවියට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අතිරේක සාක්ෂි රැස් කිරීම සඳහාත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති යටතේ ''අතුරුදහන්වීම් පිළිබඳ විමර්ශන ඒකකය''ක් පිහිටුවන ලදී. එක වාර්තාවක් අනුව පොලිසියේ සහ සන්නද්ධ හමුදාවල අතුරුදහන්වීම් සිදු කෙළේයැයි පැවසෙන 1,560 ක් පිළිබඳව පොලිස් විමර්ශන කටයුතු ආරම්භ කෙරිණ.

501. 1998 ජුලි මස ආණ්ඩුව නීතිපති දෙපාර්තමේන්තුවේ ''අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ ඒකකය'' ( MPU) යනුවෙන් වෙනම ඒකකයක් පිහිටුවේය.[424]1999 ඔක්තෝබර් මාසයේ දි රටට පැමිණි WGEID ට ලබා දුන් තොරතුරු අනුව ඊට පසු වසරේ DIU ඒකකයෙන් MPU වෙත අතුරුදහන්වීමේ සිද්ධීන් 890 ක් ලැබුණ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සිද්ධීන් 270 කට අදාලව පුද්ගලයන් 486 කට එරෙහිව අපරාධ නඩු ආරම්භ කර ඇත.[425]

502. වධහිංසාවලට එරෙහි කොමිටියට ඉදිරිපත් කළ දෙවැනි වාරික වාර්තාවේ[426]DIU සිද්ධීන් 3,615 ක් ගැන විමර්ශන කටයුතු සිදු කර ඉන් 2,462 ක් නිම කර ඇතැයි ආණ්ඩුව 2004 දී පැවසුවේය. මින් බොහොමයක් නීතිපතිගේ උපදෙස් අනුව වසා දමන ලදී. ආණ්ඩුව පවසන ආකාරයට මහාධිකරණයේ නඩු 376 ක් පවරන ලද අතර ඉන් 300 කට ආසන්න ප්‍රමාණයක් පැහැර ගැනීම් සහ නීති විරෝධීව රඳවා ගැනීම් පිළිබඳවය. නඩු එකසිය තිස්පහක් නිම වූඅතර මහාධිකරණයෙන් දඬුවම් නියම වී ඇත්තේ 12 ක පමණි. පළමු දඬුවම නියම වූයේ 1999 සැප්තැම්බර් මාසයේ දීය. එහි දී පැහැර ගෙන යෑමේ අපරාධය පිළිබඳව වැරදිකරු වූ පොලිස් නිලධාරියාට වසර පහක සිර දඬුවමක් නියම විය.

503. කලාපීය සහ මුළු දිවයින සඳහා වූ කොමිසන් සභාවලට සමීප ආරංචි මාර්ග අනුව අධිකරණයට යොමු කරන ලද නඩු බොහොමයක් පොලීසියේ සහ හමුදාවේ පහළ ශ්‍රේණිවලට අයත් වැරදිකරුවන්යැයි පැවසෙන පුද්ගලයන් ය. DIU ඒකකය පොලිස් නිලධාරීන්ගෙන්ම සමන්විත වන නිසා ඔවුන් තම උසස් නිලධාරීන් ගැන විමර්ශන පැවැත්වීමට අකමැතියැයි විශ්වාස කටයුතු ආරංචි මාර්ග කොමිසමට පැවසුවේය.

---

[424] එම

[425] E/CN/4/2000/64/Add l: බලහත්කාර හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන් වූවන් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායමේ සාමාජිකයාගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ වාර්තාව

[426] CAT/C/48/Add.2. 6 August 2004

504. කලාපීය පරීක්ෂණ කොමිසන් සභා විමර්ශන කටයුතු ආරම්භ කිරීමේ දී චක්‍ර ලේඛයක් නිකුත් කළ පොලිස්පති ශ්‍රී ලංකාවේ පැවති භීෂණ සමයේ දී පොලිස් ස්ථානවල පවත්වා ගෙන ආ සියලු පොත් පත් කොමිසමේ විමර්ශන කටයුතු අවසන් වන තෙක් තබා ගන්නා ලෙස සියලු පොලිස් ස්ථාන බාර නිලධාරීන්ට නියෝග කෙළේය. චක්‍ර ලේඛය නොසලකා සමහර පොලිස් ස්ථානවල ස්ථානාධිපතීන් අදාල පොත්පත් විනාශ කළ බව කොමිසන් සභා වාර්තාවල සඳහන් වන්නේයැයි වාර්තාවේ. එසේ කිරීමෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු සමහර පොලිස් නිලධාරීන්ට එරෙහිව ඇති දෝෂාරෝපණාත්මක සාක්ෂි විනාශ කෙරිණ. එවැනි නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමට කොමිසන් සභාවක් කළ නිර්දේශයක් නොසලකා හැර ඇතැයි පැවසේ.

505. වැඩි දුරටත් කලාපීය කොමිසන් සභාවලින් වැරදිකරුවන් විය හැකියැයි නම් කළ අය ඉන් පසුව උසස් කළ බව ද වාර්තාවේ. නිදසුනක් වශයෙන් මධ්‍යම කලාපීය කොමිසමේ හත්වැනි අන්තර්වාර වාර්තාවෙන් ඒ කාලයේ ආනමඩුව පොලිස් ස්ථානයේ විභාග කළ පැමිණිලි ගණනාවක් සම්බන්ධයෙන් නම් කළ කිසියම් පොලිස් නිලධාරියෙක් සිටියේය. මධ්‍යම කලාපීය කොමිසම අනුව ඔහු කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් සමහර සාක්ෂිකරුවන්ට තර්ජනය කළ බවට විශ්වාස කටයුතු කරුණු පවතී. ඔහුව කොමිසන් සභාවේ වාර්තාවේ ප්‍රසිද්ධියේ නම් කර තිබුණ ද ඔහුට එරෙහිව අභිචෝදනා ඉදිරිපත් කිරීමක් සිදු වූයේ නැත. ඔහුට සහකාර පොලිස් අධිකාරි (කොළඹ) සහ පොලිස් අධිකාරි වශයෙන් උසස්වීම් ගණනාවක් ලැබිණ. දැන් ඔහු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකි.

506. වෙනත් සිද්ධියකදී ජනාධිපති රාජපක්ෂ ආණ්ඩුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස පත්කළ පුද්ගලයා දකුණු පළාත් කලාපීය කොමිසමෙන් ඉදිරිපත් කළ අතුරුදහන්වීම් සිදු කෙළේයැයි සැලකෙන වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් අයෙකි.

507. තවත් සිද්ධියකදී 1996 සහ 1997 වසරවල යාපනයේ සිදු වූ අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් ප්‍රධාන වැරදිකරුයැයි ලුතිනන් කර්නල් කෙනෙකුගේ නම ගොණුවේ ඇත. ඔහු එවකට යුද හමුදාවේ කඳවුරක අණදෙන නිලධාරියා යි.[427]1996 දී ගම් වැසියන් කණ්ඩායමක් අතුරුදහන් කිරීම ඇතුළුව අපරාධ විමර්ශන ආරම්භ කරන ලදයි වාර්තාවේ.[428] 2003 – 2006 කාලයේ දී යාපනයේ අතිරේක මහෙස්ත්‍රාත් මෙම සිද්ධිය ඉදිරියට ගෙන යෑමට උත්සාහ කළත් ඇයට තර්ජන එල්ල වූයේයැයි පැවසෙන අතර 2007 දී ඇය කොළඹට මාරු කරන ලදී. බුවුන් පියනම පිළිබඳ සිද්ධිය විභාග කිරීමට උත්සාහ කෙළේ එම මහෙස්ත්‍රාත්වරියයි. වාර්තාවන ආකාරයට මෙම පුද්ගලයා 2015 පෙබරවාරි මස මුලින්ම නැවත යුද හමුදාවට පත් කර යුද හමුදා මූලස්ථානයේ මෙහෙයුම් අධ්‍යක්ෂක ලෙසත් ඉන් පසුව පාබල හමුදා අධ්‍යක්ෂක ලෙසත් පත්කළ බවට තහවුරු නොකළ මාධ්‍ය වාර්තාවලින් කොමිටියට දැන ගන්නට ලැබිණ.[429]

508. සෑහීමට පත්විය හැකි සාක්ෂි නොමැති නිසා පැහැර ගැනීම් චෝදනා යටතේ බලධාරීන්ට එරෙහිව ආරම්භ කර ඇති නඩු විශාල සංඛ්‍යාවක් අවසන් කර නැතැයි එක්සත් ජාතීන්ගේ නොයෙකුත් මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ සඳහන් කර ඇත.[430]ලැබී තිබුණු කාලය අනුව DIU සහ MPU උසාවියට යොමු කරන ලද නඩු පිළිබඳ තොරතුරු රැස් කිරීමට හෝ තක්සේරු කිරීමට කොමිටියට නොහැකි වුවද ඒවා සමාලෝචනය කළ යුතුයැයි කොමිටිය විශ්වාස කරයි.

**උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම**

---

[427] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම 2003 දි යාපනය ප්‍රදේශයේ අතුරුදහන් වූ පුද්ගලයන් ගැන පත්කළ පරීක්ෂණ කොමිටිය ඉදිරිපත් කළ වාර්තාව

[428] Wikileaks. යාපනයේ ගැමියන් 25 ක් අතුරුදහන් කිරීම පිළිබඳ නඩුව ගැන එක්සත් ජනපදය විමසිල්ලෙන් සිටී. Colombo Telegraph 15 October 2012

[429] හමුදාවේ ඉහළ නිලධාරීන් මාරු කිරීමෙන් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර යාන්ත්‍රණය ගැන සැක මතුවේ JDS මාර්තු 4ළ2015 2015.

[430] CCPR/CO/79/LKA 2003 para 9

509. LLRC 2011 නිකුත් කළ වාර්තාවෙන් බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව ඉතා දැඩි ස්ථාවරයක් ගෙන තිබිණ. බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව කලින් කොමිසන් සභා ඉදිරිපත් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම ඉස්මතු කරන එය '' එම නිර්දේශ මෙම බරතළ කරුණ විසඳීමට ඉවහල් වන බැවින් ඒවා වහාම ක්‍රියාත්මක කළ යුතුව ඇතැයි'' සඳහන් කරයි. ''පසුගිය කොමිසන් සභා විසින් ඉදිරිපත් කරන ලද විවේචනාත්මක නිර්දේශ තවමත් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීමෙන් ආණ්ඩුවෙන් පත් කරන කොමිසන් සභා පිළිබඳව පවතින විවේචන සහ සැක සංකා තේරුම් ගත හැකිය. LLRC ද ඉන් නිදහස් නොවේ.''යි එහි වැඩි දුරටත් සඳහන් වේ.

510. LLRC පරීක්ෂණ කොමිසමක් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳව අවධානය යොමු කිරීමට පිහිටුවන ලද්දක් නොවුවත් එහි විභාග කිරීම්වලදී විශේෂයෙන්ම යුද හමුදාව සහ නාවික හමුදාව[431] මෙන්ම සන්නද්ධ කණ්ඩායම් විසින්ද අත් අඩංගුවට ගැනීමෙන් පසුව අතුරුදහන් වූයේයැයි කියන පුද්ගලයන් 1018 ක් පිළිබඳ සිද්ධීන් ගැන පැමිණිලි ලැබිණ.[432] පැමිණිලි සංඛ්‍යාවේ විශාලත්වය නිසාම LLRC ය ''මෙම චෝදනා නිසි පරිදි විමර්ශනය කර වැරදිකරුවන් නීතිය ඉදිරියට පත් කිරීම තහවුරු කරනු සඳහා කඩිනම් පියවර ගැනිමට නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් යොමු කරන ලෙස''[433]ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම තම පවුලේ සාමාජිකයන් ආගිය තැනක් නොදත් නිසා මානසික පීඩාවට පත් අය පිලිබඳව කටයුතු කිරීමට එම පවුල්වලට ආධාර කරන ලෙස LLRC ය ආණ්ඩුවට නිර්දේශ කෙළේය.[434]

511. '' ප්‍රශ්නයේ පවතින සංකීර්ණතාවය සහ විශාලත්වය නිසාත් අතුරුදහන් වූයේයැයි කියන පුද්ගල සංඛ්‍යාව සහ අදාල විමර්ශනයේ ස්වභාවයත් සැලකිල්ලට ගැනීමෙන්......... සිදු වූයේයැයි කියන අතුරුදහන් කිරීම් විමර්ශනයට විශේෂ කොමසාරිස් කෙනෙකු පත් කිරීමට සහ සුදුසු ආකාරයට අපරාධ නඩු ආරම්භ කිරීමට අවශ්‍ය කරුණු නිතිපතිට ලබා දීමටත් LLRC විශේෂයෙන්ම නිර්දේශ කෙළේය. [435]

**අතුරුදහන් වුවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම (2013)**

512. LLRC නිර්දේශවලට සහ වැඩිවෙමින් පැවති අන්තර්ජාතික බලපෑමට ප්‍රතිචාර වශයෙන් ජනාධිපති රාජපක්ෂ 2013 අගෝස්තු 15 අතුරුදහන් වුවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට ජනාධිපති කොමිසමක් පත් කෙළේය. එහි මුල් මැන්ඩේට් බලය වූයේ ''1990 ජුනි 10 සිට 2009 මැයි 19 දක්වා කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල සිටියදී තම වාසස්ථානවලින් පැහැරගත් හෝ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ සිද්ධීන් විමර්ශනය කිරිමය.''[436]විනිසුරු පරාක්‍රම පරණගම සභාපති ලෙස පත්කළ මෙම කොමිසමේ තවත් සාමාජිකයන් දෙදෙනෙකු සිටි අතර පසුව තවත් අතිරේක සාමාජිකයන් දෙදෙනෙකු ද පත් කරන ලදී. මෙම කොමිසමේ මැන්ඩේට් බල කාල සීමාව අවස්ථා දෙකකදී දීර්ඝ කරන ලද අතර 2015 අගෝස්තු 15 වන විට එහි කාර්යය නිම කළ යුතුව තිබිණ.[437]අලුත්ම වාර්තා අනුව එහි මැන්ඩේට් බල කාල සීමාව තව දුරටත් දීර්ඝ කරන ලද නමුත් එය විධිමත්ව ගැසට් පත්‍රයක් මගින් පළ කොට නැත.

---

431 බලන්න LLRC සැසි වාරය නිදසුන් වශයෙන් මුලතිවු සහ ත්‍රිකුණාමලය

432 LLRC වාර්තාවේ ඇමිණුම5.1

433 LLRC වාර්තාව ඡේද 9.46

434 LLRC වාර්තාව ඡේද 9.58

435 LLRC වාර්තාව ඡේද 9.51

436 2013 අංක 1823/42 ගැසට් පත්‍රය (අති විශේෂ)හරිස්චන්ද්‍ර ගුනරත්න' අතුරුදහන්වූවන් පිළිබඳ කොමිසමටකඩිනමෙන් වැඩ කළ නොහැක- සභාපති 27 නොවැම්බර් 2013 The Island http://island.lk/index.php?page_cat=article-detail&page=article-details&code_title=92960 LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ක්‍රියාත්මක සැලැස්ම බලන්න. (2014 නොවැම්බර්)

437 අතුරුදහන් වුවන් ගැන සෙවීමට වැඩිපුර කාලයක් . http://thesundayleader.lk/2015/02/08/more-time-for-probe-on-missing/. 15 පෙබරවාරි 2015

513. මහ කොමසාරිස් නවි පිල්ලේ 2013 දී ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව අතුරුදහන්වීම් පිළිබඳව නව විමර්ශන කොමිසමක් පත් කිරීම සම්බන්ධයෙන් සඳහන් කරමින් කොමිසමේ මැන්ඩේට් බලය පුළුල් කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියාය. ''අවාසනාවකට මෙන් නව කොමිසමෙන් ආවරණය වන්නේ 1990 සහ 2009 අතර කාලයේ උතුර සහ නැගෙනහිර සිදු වූ අතුරුදහන්වීම් පමණි. ඉන් අදහස් වන්නේ කොළඹ සහ දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් මෑත වසරවල වාර්තා වූ ''සුදු වෑන් අතුරුදහන්වීම්'' රාශියක් මෙම විෂය පථයට අයත් නොවීමයි.''[438]WGEID ද මීට සමාන අදහස් ඉදිරිපත් කර ඇත. 2014 දී කොමිසමෙන් ආවරණය වන කාල සීමාව 1990 ජුනි මාසයේ සිට 1983 ජනවාරි 1 සිට 2009 මැයි 19 දක්වා කාලය ඇතුළත් වන සේ පුළුල් කරන ලදී. 2014 ජුලි 15 වැනි දා කොමිසමේ මැන්ඩේට් විෂය පථය LLRC වාර්තාවේ 4.359 ඡේදයේ සඳහන් කරන ලද කරුණු විභාග කොට වාර්තා කිරීම දක්වා දීර්ඝ කරන ලදී. ඊට ප්‍රමාණානුකූල භාවය සහ වෙනස් කොට හැඳින ගැනීමේ මූලධර්මවලට අදාල කරුණු, එල්ටීටීඊයට අන්තර්ජාතික මානුෂීය නීතිය හෝ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය අදාලවීම සහ 2009 මැයි මාසයෙන් අවසන් වූ සන්නද්ධ ගැටුමේ දී එල්ටීටීඊය සිවිල් ජනතාව 'මිනිස් පලිහක්' ලෙස යොදා ගැනීම තුළින් අන්තර්ජාතික මානුෂීය නීතිය හෝ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය කඩ කිරීම ඇතුළත් වේ.[439]මැන්ඩේට් බලය පුළුල් කිරීමෙන් පසු කොමිසමට සහායවීමට අන්තර්ජාතික උපදේශක මණ්ඩලයක්ද පත් කරන ලදී. උපදේශක මණ්ඩලයේ මැන්ඩේට් බලයද මෑතකදී ඉකුත් විය.

514. මෙම කොමිටිය සම්මුඛ සාකච්ඡා කළ බහුතරයක් ජාතික යාන්ත්‍රණයක් ගැන තම අවිශ්වාසය ප්‍රකාශ කිරීම සහ පවුලේ සාමාජිකයන් තුළ බලාපොරොත්තු කඩවීමේ හැඟීමක් තිබුණ නමුත් තවමත් කොමිසමට පැමිණිලි යොමු කරමින් පවතී. කොමිසමේ 2013 අප්‍රේල් අන්තර්වාර වාර්තාව අනුව ( මෙම වාර්තාව ප්‍රසිද්ධ නොකළ නමුත් කොමිටියට එය සමාලෝචනය කිරීමට හැකි විය.) 1983 ජනවාරි සිට 2009 මැයි 19 දක්වා කාලය තුළ සිදු වූයේයැයි කියන අතුරුදහන්වීම් සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක 25 කින් පැමිණිලි 13,378 ක් ලැබී ඇත.[440] පැමිණිලි බහුතරයක් අදාල වන්නේ 2005 සහ 2009 අතර කාලය තුළ මූලික වශයෙන් මඩකලපුව, යාපනය, මුලතිවු, කිලිනොච්චිය, මන්නාරම, ත්‍රිකුණාමලය සහ වවුනියාවේ වූ සිද්ධීන්ට අදාලවය. 2014 නොවැම්බර් වන විට පැමිණිලි 1500 ක පමණ පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බව කොමිසම පැවසුවේය. 2015 අප්‍රේල් වන විට ජනාධිපති කොමිසම කිලිනොච්චිය, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, මඩකලපුව, මුලතිවු, මන්නාරම සහ වවුනියාවේ ප්‍රසිද්ධ විභාග එකොළහක් පවත්වා ඇත.

515. ප්‍රසිද්ධ විභාග වලදී අතුරුදහන්වීම් පිළිබඳව වගකිව යුතුයැයි නම් කරන ලද ආරක්ෂක හමුදා සාමාජිකයන්ට එරෙහිව 'බැලූ බැල්මට සාක්ෂි' පවතින සිද්ධීන් දහයක ලැයිස්තුවක් කොමිසම විසින් හඳුනා ගෙන ඇති අතර ඔවුන්ට එරෙහිව දේශීය නීති පියවර ගැනීමට නිර්දේශ කර ඇත.[441]අධිකරණ පියවර නිර්දේශ කිරීමේ අදහසින් ගැඹුරු විමර්ශනය සඳහා සිද්ධීන් 59 ක් හඳුනා ගෙන ඇතැයිද පැවසුවේය.[442]

516. අතුරුදහන් වීමේ සිද්ධීන් අති බහුතරයක් ඇති වන්නේ වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගැනීමේ පුරුද්ද සහ රැඳවියන් රඳවා ගන්නා ස්ථානය පිළිබඳව දැනුම් දීමක් නොමැතිවීම නිසායැයි ද ජනාධිපති කොමිසම සඳහන් කරයි. ආරක්ෂක අමාත්‍යාංශයට හා අධිකරණ අමාත්‍යාංශයට බන්ධනාගාර, රැඳවුම් කඳවුරු, සරණාගත කඳවුරු සහ පුනරුත්ථාපන

---

[438] මානව අයිතිවාසිකම් කවුන්සලය ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය සඳහා වූ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් ගේ වාචික යාවත්කාලීන කිරීම්. 2013 සැප්තැම්බර් 25. A/HRC/24/CRP.3/Rev.l para 13. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උතුරු සහ නැගෙනහිර පළාත්වල 1990 ජුනි සහ 2009 මැයි අතර කාලයේ දී අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජනාධිපති කොමිසම ගැන විවරණයක් බලන්න. පිටුව 5.

[439] 2014 ජුලි 14 ගැසට් පත්‍රය 1871/14.

[440] අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ඇති පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසමේ අතුරු වාර්තාව 2015 අප්‍රේල්

[441] අතුරු වාර්තාව ඇමිණුම H

[442] එම ඇමිණුම L

මධ්‍යස්ථානවල රඳවා සිටින පුද්ගලයන්ගේ නාම ලැයිස්තුවක් නිකුත් කරන ලෙස කළ ඉල්ලීම ඉටු කිරීමට අපොහොසත් වූ බව ජනාධිපති කොමිසම සඳහන් කරයි. එය විශේෂයෙන්ම වඩ්ඩුවහල්, මුල්ලිවයික්කාල්, ඕමන්තේ හි දී භාරවූ පුද්ගලයන්ගේ විස්තර සහ ප්‍රශ්න කිරීම සඳහා සරණාගත කඳවුරුවලින් අත් අඩංගුවට ගෙන අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සියලු විස්තර සැපයීමට හා ''කිසියම් පුද්ගලයෙකු රැඳවුම් භාරයේ සිටීනම් රඳවා සිටින පුද්ගලයාගේ පවුලට හෝ ඥාතීන්ට රඳවා සිටින ස්ථානය දැනුම් දීමටත් එම පුද්ගලයා රඳවා සිටින රැඳවුම් මධ්‍යස්ථානයට ඔහුගේ ඥාතීන්ට ඔවුන් බැලීමට පැමිණීමට පහසුකම් සැපයීම ඇතුළුව ආරක්ෂක හමුදාවන්ට උපදෙස් දෙන්නැයි යන වැදගත් නිර්දේශය ආණ්ඩුවට කර ඇත.

517. කොමිසමේ නිර්දේශ අනුව 2015 ජූලි මස සමහර සිද්ධීන් පිළිබඳව විමර්ශනය කඩිනම් කිරීම සඳහා විශ්‍රාමික අධිකරණ නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් කණ්ඩායමක් පත් කිරීම ආණ්ඩුවෙන් ප්‍රකාශයට පත් කළද එහි තත්වය දැන ගන්නට නැත.[443]

518. මෙම වැදගත් සොයා ගැනීම් තිබුණ ද කොමිසමේ වැඩ කටයුතු පිළිබඳව සැහෙන කනස්සල්ලක් ද ප්‍රකාශව ඇත. කොමිසම මෙතෙක් සවිස්තරාත්මක, ස්වාධීන සහ පාරදෘශ්‍ය විභාගයක් කිරීමට අපොහොසත්ව ඇතැයි විමර්ශන කොමිටියේ තක්සේරුවයි. පරීක්ෂණ කොමිසමේ මැන්ඩේට් බලය 2014 ජූලි මාසයේ දී ගැටුමේ පුළුල් උල්ලංඝනය කිරීම්ද, විශේෂයෙන් එල්ටීටීඊ අපහරණ කෙරේ අවධානය යොමු කිරීම දක්වා පුළුල් කිරීමෙන් කොමිසමේ මූලික වගකීමඃ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට ආධාර ලබාදීමට ඇති හැකියාව ලඝු කෙරෙන්නේයැයි මානව අයිතිවාසිකම් සංවිධාන සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන් අතර බලවත් කනස්සල්ලක් ඇති කරවයි.[444]

519. කොමිසමට ඉදිරිපත් වූ පවුලේ සාමාජිකයන්ට සාමාන්‍යයෙන් ''අතුරුදහදන්'' වූ පුද්ගලයාගේ විස්තර සහ අතුරුදහන්වීමේ වාතාවරණය ඇතුළත් ආකෘති පත්‍රයක් පිරවිය යුතුයැයි කියයි. ඉන්පසු ඒ ගැන පරික්ෂා කිරීමට කණ්ඩායමක් එවන බව කොමිසම පැවසුවත් බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් එවැනි විමසීමක් මෙතෙක් සිදුව නැත.

520. මෙම කොමිටිය ප්‍රසිද්ධ විභාගවල වැදගත්කම පිළිගන්නා නමුත් එම විභාගවල ගුණාත්මක භාවයට කොමිසමේ මැන්ඩේට් බලය ගැන පවුලේ සාමාජිකයන් ගේ දැනුමක් නොමැතිවීම, විභාග සඳහා වෙන් කර ඇති කාලය ප්‍රමාණවත් නොවීම[445]සහ සමහරවිට පරිවර්තනයේ ගුණාත්මක භාවය වැනි නොයෙකුත් සාධක බලපායි. විශේෂයෙන්ම ස්වාධීන නිරීක්ෂකයන්ගේ වාර්තා අනුව කොමිසම දෙමළ කතා කරන නිල භාෂා පරිවර්තකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබා දී නැති අතර සමහරවිට පරිවර්තනයෙන් ඉදිරිපත් කරන්නේ අසම්පූර්ණ හෝ සාවද්‍ය සාරාංශයක්, පමණි. ප්‍රශ්න සහ උත්තර බොහෝවිට වැරදි ලෙස පරිවර්තනය කරන්නේයැයි පැවසේ.

521. ප්‍රසිද්ධ විභාග සඳහා පැමිණිලි තෝරා ගැනීම පැහැදිලි නිර්ණායක අනුව සිදු නොවන්නේයැයි පැවසේ. තානාපති ආරංචි මාර්ග පවසන ආකාරයට කිලිනොච්චියේ පැවති ප්‍රසිද්ධ විභාගයේද් තෝරාගෙන තිබූ සිද්ධි බොහොමයක සැකකාර වැරදිකරුවන් වූයේ රාජ්‍ය නොවන, වැඩියෙන්ම එල්ටීටීඊ ක්‍රියාකාරීන්ය. අන්තර්වාර වාර්තාව සම්බන්ධයෙන් නිකුත් කළ පුවත් පත් නිවේදනයක උතු-රු පළාතෙන් ලැබී ඇති බලහත්කාර අතුරුදහන් කිරීම් පිලිබඳ

---

[443] http://www.pcicmp.lk/images/NewsEvents/Press%20Release%2024/07/15.pdf

[444] Amnesry International Press Release Sri Lanka Activists petition parliament on Day of the Disappeared. http://www.amnesty.org/en/for-media/press-releases/sri-lanka-activists.petition-parliament-day-disappearedවිකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ පරීක්ෂන කොමිසමේ මැන්ඩේට් බලය පුළුල් කිරීම ගැන අදහස් 2014 ජූලි 25

[445] නිදසුනක් වශයෙන් 2014 පෙබරවාරි යාපනයේ පැවති සැසියේ පළමු දිනයේ දී සිද්ධීන් බොහොමයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට සාමාන්‍යයෙන් ලැබුණේ විනාඩි 20 – 30 අතර කාලයකි. එය අවසාන දිනයේ දි විනාඩි 10 ක් විය.

චෝදනාවලින[446] සියයට 60 ක්ම එල්ලවී ඇත්තේ එල්ටිටීඊයට එරෙහිවයැයි ජනාධිපති කොමිසම පවසයි. කෙසේ වුවත් කොමිසමට ලැබී ඇති පැමිණිලි විශ්ලේෂණයේ දී අතුරුදහන්වීම් වලින් සියයට 19 ක් ආරක්ෂක හමුදා විසින්ද, සියයට 17 ක් එල්ටීටීඊය ද සියයට 50 කට වැඩි ප්‍රමාණයකට වගකිව යුතු වන්නේ පුද්ගලයන් හෝ නොහඳුණන කණ්ඩායම් ය. ඉන් පෙනී යන්නේ එල්ටීටීඊ සිද්ධීන් වැඩි ප්‍රමාණයක් ප්‍රසිද්ධ විභාග සඳහා තෝරා ගෙන තිබීමය. එමනිසා තෝරා ගැනීමේ ක්‍රමය ගැන ප්‍රශ්න මතු කෙරේ.

522. වැඩි දුරටත් අතුරුදහන් වීම්වලට අදාල මූලික කරුණුවල සන්දර්භය පිලිබඳව කොමිසමට දැනුමක් නැති බවත් එමෙන්ම නගන ලද සමහර ප්‍රශ්න නොපැහැදිලි හා අදාල නොවන ස්වභාවයේ ඒවා බවත් සමහර සාක්ෂිකරුවන්ගෙන් කොමිටියට ලැබුණු ප්‍රකාශ වලින් ඉස්මතු කර දක්වයි.[447]

523. ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දීමෙන් පසුව ආරක්ෂක හමුදාවල මැදිහත්වීම්, බිය වැද්දීම් සහ සෝදිසියට ලක්වීමෙන් පීඩාවට පත් අතුරුදහන් වූවන්ගේ පවුල් සම්බන්ධ සිද්ධීන් පිළිබඳ වාර්තා විමර්ශන කොමිටියට ලැබී ඇත. [448] ''ජනමාධ්‍යයේ සමහර කොටස්'' කොමිසම ඉදිරියේ සාක්ෂි දෙන පුද්ගලයන්ට ආරක්ෂක හමුදා සාමාජිකයන්ගෙන් හිරිහැර පැමිණෙන බවට චෝදනා කරන බව සඳහන් කරන ජනාධිපති කොමිසම ''ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් කොමිසම ඉදිරියේ සාක්ෂිදීම නිසා හිරිහැර කළ බවට කිසිදු පුද්ගලයෙකු එකද පැමිණිල්ලක් හෝ කර නැතැයි'' කොමිසම එහි අන්තර්වාර වාර්තාවේ සඳහන් කරයි.[449]

524. කෙසේ වුවත් ආරක්ෂක හමුදා නිලධාරීන් සිවිල් ඇඳුමෙන් සැරසී විභාගවලට සහභාගිවී විභාගයට සහභාගිවන අය පරික්ෂාවෙන් නිරීක්ෂණය කොට පවුල් බියවද්දා විභාගවලට නොපැමිණෙන ලෙස පවසා ඇතැයි විමර්ශන කොමිටියට තොරතුරු ලැබී ඇත.[450] තානාපති ආරංචි මාර්ග සඳහන් කරන ආකාරයට ''TID මැදිහත්වීමේ ස්වභාවය ප්‍රකාශ ගණනාවකින් හෙළිවන නමුත් සභාපති අතුරුදහන්වීම් විමර්ශනය කරන TID, CID වැනි විවිධ ආයතන ගණනාවක් පවතින නිසා පවුල් එම විමර්ශන සමග හැකි අවස්ථාවල ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම දිරිමත් කරයි.''[451]

**අන්තර්ජාතික යාන්ත්‍රණ: බලහත්කාරයෙන් හෝ කැමැත්තකින් තොරව අතුරුදහන් වූවන් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ (WGEID) භූමිකාව**

525. තම ආදරණීයන්ගේ ඉරණම තහවුරු කර ගැනීමේ දී නැවත නැවත් මතු වූ බාධක හමුවේ පවුල් සාමාජිකයෝ සහ ඔවුන්ට සහාය දෙන රාජ්‍ය නොවන සංවිධාන අතුරුදහන් වූවන්ගේ ඉරණම සහ ආගිය තැනක් සොයා ගැනීමේ අපේක්ෂාවෙන් WGEID වෙත සිද්ධීන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කළහ. 1980 දී එය ආරම්භ කිරීමේ සිට ක්‍රියාකාරී කණ්ඩායම මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවති ආණ්ඩුවලට අතුරුදහන්වීමේ සිද්ධීන් 12,536 ක් යවා ඇත. වඩාත් මෑතක

---

446 අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති කොමිසම පුවත් නිවේදනය. අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති කොමිසමේ අතුරු වාර්තාව ඉදිරිපත් කිරීම
http://www.pcicmp.lk/images/press%22release%20Interim%20Report.pdf

447 නිදසුනක් වශයෙන් ප්‍රසිද්ධ සැසිවලදී කොමසාරිස්වරු බොහෝවිට බලහත්කාර අතුරුදහන්වීමට ආදාල නැති, යුද හමුදා කඳවුරු අසළ සිටින පවුල් කරදරයක් නැතිව ජීවත් වන්නේ ද වැනි ප්‍රශ්න ඇසූහ.

448 සාක්ෂිකරු ප්‍රකාශය ගොණුවේ. බලන්න HRC. විශේෂ උපදේශන තත්වය හිමි රාජ්‍ය නොවන සංවිධානයක් වන මානව අයිතිවාසිකම් සහ සංවර්ධනය සඳහා වූ ආසියානු සංසදය ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශ. 2014 සැප්තැම්බර් 5 A/HRC/27/NGO/91

449 අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම. අතුරු වාර්තාව 2015 අප්‍රේල් පිටුව 7

450 මූලාශ්‍රය වාර්තාවේ

451 ප්‍රසිද්ධ සැසි උතුරු පළාත මුලතිවු ( 2014 ජූලි 5 – 8 ) ප්‍රසිද්ධ සැසි උතුරු පළාත මන්නාරම (2014 අගොස්තු 8 – 11 )

සංඛ්‍යා අනුව ක්‍රියාකාරී කණ්ඩායමේ අවසාන වාර්ෂික වාර්තාවේ ශ්‍රී ලංකාවේ නොවිසඳී ඇති සිද්ධීන්වල මුළු සංඛ්‍යාව 5731 කි.[452]

526. ක්‍රියාකාරි කණ්ඩායම බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධීන් පරික්ෂා කිරීමට සහ එවැනි චෝදනා ගැන විමර්ශන පැවැත්වීමට ආණ්ඩුවට බල කිරීමේ දී මූලික භූමිකාවක් ඉටු කෙළේය. එය 1991, 1992 සහ 1999 දී ක්ෂේත්‍ර චාරිකා තුනක් සිදු කෙළේය. ඉන් පසුව නැවත නැවතත් ඉල්ලීම් කර ඒ ගැන විමසීම් කළ ද රටට පැමිණීමට අවසර ලැබුණේ නැත.

527. නව රජය 2015 දී වැඩ භාර ගැනීමත් සමග ඔවුන්ට පැමිණීමට අවසර දීමට එකඟ විය. එම සංචාරය මුලින්ම 2015 අගෝස්තු 3- 12 දිනවලට නියම කර තිබුණද අගෝස්තු 17 පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු ඡන්ද විමසීමට ආසන්නයේ නිසා ආණ්ඩුවේ ඉල්ලිම මත කල් දැමිණ. දැන් එම සංචාරය 2015 නොවැම්බර් මසට යොදා ගෙන ඇත.

528. ක්‍රියාකාරී කණ්ඩායම 1990 ගණන්වල සංචාරවලින් පසු අතුරුදහන්වීම් වැළැක්විම සහ ඒවා ගැන විමර්ශනය කිරීම සඳහා ආණ්ඩුවට නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කෙළේය.[453]එවකට පැවති ආණ්ඩුව ක්‍රියාකාරී කණ්ඩායමට 2002 වන විට[454] සිද්ධීන් 4,390 ක් පැහැදිලි කර ගත්තේයැයි සැලකීමට තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා දුන්නේය.[455]

529. මරණ සහතික නිකුත් කළ බව සහ/හෝ වන්දි ගෙවීම සිදු කළ බව හෝ ඒ පිළිබඳව වැඩ කටයුතු සිදු වෙමින් පවතින බව සිද්ධීන් ගණනාවක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ පිළිතුර විය. ඉතිරි සිද්ධීන් සම්බන්ධයෙන් ආණ්ඩුවේ පිළිතුරු වූයේ ලබා දී ඇති ලිපිනය වැරදි හෝ අපැහැදිලි නිසා අදාල පුද්ගලයා සොයා ගත නොහැකිවීම හෝ පවුල එම ප්‍රදේශයෙන් පිටව ගොස් සිටීම, ලබා දී ඇති ලිපිනයෙන් එවැනි පුද්ගලයෙක් අතුරුදහන්ව නොසිටිම, එම සිද්ධියට අදාල නඩු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පැවතිම, පවුලේ සාමාජිකයන් මරණ සහතික හෝ වන්දි ඉල්ලා නොසිටීම හෝ ප්‍රතික්ෂේප කිරීම, එම පුද්ගලයන් ජීවත්වන්නේයැයි පැවසිම, අතුරුදහන්වීම ආණ්ඩුවේ කිසියම් බලධාරියෙකුට වාර්තා කර නොතිබිම යි.[456]

530. කෙසේ වුවත්, 1995 සිට සිදු වූ අතුරුදහන්වීම් පිලිබඳ සියලු සිද්ධීන් විමර්ශනය කිරීමේ කාර්ය පවරන ලද ස්වාධීන ආයතනයක් පිහිටුවිම, ප්‍රකාශනයේ 10(3) වගන්තියේ සඳහන්වන ආකාරයට රැඳවියන්ගේ මධ්‍යම ලේඛනයක් සකස් කිරීම, බලහත්කාර අතුරුදහන්කිරීම පිළිබඳ තහනමක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම්වලට ඇතුළත් කිරීම වැනි ක්‍රියාකාරි කණ්ඩායම ඉදිරිපත් කළ අතිශය වැදගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව අපොහොසත් විය.

531. විභාග වෙමින් පවතින නඩු සම්බන්ධයෙන් ආණ්ඩුව 2008 සිටම WGEID ට ඉහළ පිළිතුරු සංඛ්‍යාවක් දිගින් දිගටම ලබා දී ඇත. කෙසේ වුවත් ඒ බොහොමයක් සම්බන්ධයෙන් ලබා දී ඇති තොරතුරු එම සිද්ධීන් පැහැදිලි කර ගැනිමට ප්‍රමාණවත් නොවේ.[457]ඊට අමතරව 2006 සිට

---

[452] බලහත්කාර හෝ කැමැත්තෙන් තොරව අතුරුදහන්වීම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායමේ වාර්තාව. 2014 අගොස්තු 4 A/HRC/27/49, page 13

[453] See E/CN/4/1992/18/Add 1, E/CN4/1993/25/Add 1, E/CN4/2000/64/Add 1

[454] බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන්වූවන් පිළිබඳ කුයාකාරි කණ්ඩායමේ වාර්තාව E/CN 4/2002/79 ඡෙද. 286

[455] A/HRC/27/49, para 287. මෙම සිද්ධීන්ගෙන් 6581 ක් WGEID විසින් පැහැදිලි කරන ලදැයි සැලකේ. වින්දිතයන්ගේ ඉරණම අවශ්‍යයෙන්ම පැහැදිලි කර නැති වුවද 1990 ගණන්වල අග දී අතුරුදහන් වූවන්ගේ පවුල්වල ඥාතීන් බොහෝ දෙනෙකුට මරණ සහතික ලැබුණ බව සඳහන් කළ යුතුය. ( ඉහත මරණ සහතික නිකුත් කිරීම බලන්න.)

[456] එම

[457] A/HRC/21/45, para 506, A/HRC/16/48/ para 444, A/HRC/WGEID/99//1 para 126, A/HRC/WGEID/100//1 para 95, A/HRC/WGEID/102 para 139, A/HRC/WGEID/103 para 156, A/HRC/WGEID/104 para 118

2009 දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායමේ විමසීම් විස්තර කෙරෙන පොදු චෝදනාවලට ප්‍රමාණවත් ප්‍රතිචාර ආණ්ඩුවෙන් ලබා දී නැත.[458]

## IX වධහිංසා සහ වෙනත් ආකාරයේ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්.

### හැඳින්වීම.

532. විමර්ශන කොමිටිය වෙත ලැබුණු චෝදනාවල පරිමාණය සහ බරපතළකම නිසාම ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද්දේයැයි කියන වධහිංසා පැමිණවීම් සහ වෙනත් කුරිරු අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම් පැමිණවීම් ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස එහි අවධානය යොමු කෙරිණ. ලැබී තිබුණ කාල සීමාව අනුව කොමිටිය එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැක කළ පුද්ගලයන් ආරක්ෂක හමුදා විසින් රඳවා ගැනීම නොකඩවා සිදු කළ පශ්චාත් ගැටුම් කාල සීමාව ඇතුළත්ව මූලික වශයෙන්ම ගැටුම හා සම්බන්ධ වධහිංසා පැමිණවීමේ සිද්ධීන් ගැන විමර්ශනය කරන ලදී.

533. කෙසේ වුවත් විමර්ශන කොමිටිය ශ්‍රී ලංකාවේ අපරාධ අධිකරණ පද්ධතිය තුළ පුළුල් වශයෙන් දක්නට ලැබෙන වධහිංසා සහ හිංසාකාරී සැලකීම සහ රට පුරාම පොලිස් ස්ථානවලින් සාමාන්‍යයෙන් වාර්තාවන සමහර සිද්ධීන් ගැන සැලකිලිමත්ව සිටී. එසේම සිදු වූයේයැයි කියන සියලු වධහිංසා පැමිණවීම් සන්නද්ධ ගැටුමට අදාල වන්නේ නැත. වධහිංසා පැමිණවීම් පොදුවේ අපරාධ අධිකරණ පද්ධතිය තුළ පුළුල්ව පවතින බව රාජ්‍ය නොවන සංවිධාන වාර්තා කරයි. එක් රාජ්‍ය නොවන සංවිධානයක් 1998 සිට 2011 දක්වා කාලය ඇතුළත පොලීසිය විසින් සිදු කරන ලදැයි කියන වධහිංසා පැමිණවීමේ සිද්ධීන් 1500 ක් ලේඛන ගත කර ඇතැයි වාර්තා කරයි.[459] මේවා සහ සමාන අනෙකුත් චෝදනා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් යොදා ගන්නා වධහිංසා පැමිණවීම්, විමර්ශනය සහ විසඳීමේ පුළුල් ප්‍රයත්නයක කොටසක් විය යුතුය. පමුණුවන ලද වධහිංසාවල කෲරත්වය වින්දිතයන් බොහෝ දෙනෙකු තුළ දීර්ඝ කාලීන බලපෑමෙන් යුතු බවත් ඔවුන් දිගටම කායික සහ මානසික පීඩාවෙන් පෙළෙන බවත් කොමිටිය සමග පැවති සම්මුඛ සාකච්ඡාවලදී පැහැදිලි විය. ඉදිරි පරිච්ඡේදවලදී වධහිංසා පැමිණවීමේදී සිදු කළ ලිංගික ප්‍රචණ්ඩත්වයේ රටාවන් විස්තර කෙරෙන අතර සමහර වින්දිතයන්ට – ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට එය බෙහෙවින් පීඩාකාරී වධහිංසාවක් විය.

534. එල්ටීටීඊය විසින් 2002 සහ 2009 ගැටුමේ අවසානය දක්වා කාලය තුළ රඳවා ගත් පුද්ගලයන් වධහිංසා සහ හිංසාවලට ලක් කළ බවට වාර්තා මෙම කොමිටියට ලැබුණ නමුත් II පරිච්ඡේදයේ දක්වන ලද ක්‍රමවේදී සීමාවන් නිසා ඒවා විමර්ශනයට තිබුණේ සීමිත ඉඩකි.

### ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද වධහිංසා රටාවන්.

535. ආරක්ෂක හමුදා විසින් සිදු කරන වධහිංසා පැමිණවීම් මෙම වාර්තාවෙන් ආවරණය වන කාල පරිච්ඡේදයට පෙරත් ඉන් පසුවත් පැවතිණ. ශ්‍රී ලංකාණ්ඩුව 1998 දී ඉදිරිපත් කරන ලද මුල් වාර්තාව සැලකිල්ලට ගැනීමේ දී වධහිංසාවන්ට එරෙහි කොමිටිය (CAT ) මෙසේ සඳහන් කරයි. ''විශේෂයෙන්ම අතුරුදහන්වීම් සම්බන්ධ වධහිංසාවලදී සන්ධානය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමේ තොරතුරු ගැන බලවත් සේ කම්පාවට පත්වේ'' [460] වධහිංසා පැමිණවීම් පිළිබඳ එක්සත්

---

[458] A/HRC/4/41 para 337-340, A/HRC/19/58/Re v 1 par 495 – 501

[459] Asian Human Rights Commission, 2011පොලිස් වධහිංසා සිද්ධීන් 323 පිළිබඳ වාර්තාවක් http//www.humanrights.asia/news/AHRC-STM-085-2011>

[460] එක්සත් ජාතීන්ගේ වධහිංසාවට එරෙහි කොමිටිය, නිව්යෝර්ක් 1998

ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ 2007 ශ්‍රී ලංකා සංචාරයෙන් පසුව රටතුළ වධහිංසා පැමිණවීම් ''පුළුල්ව භාවිතා කරන බව'' දක්වෙන තොරතුරු ලැබෙමින් පවතින බව වාර්තා කෙළේය.[461] 2014 අගෝස්තු තරම් මෑතක කාලයකදී පවා ශ්‍රී ලංකාවේ දී වධහිංසා වලින් වින්දිතයන් වූ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මෙම කොමිටියට ලැබිණ. [462]

536. විමර්ශන කොමිටිය ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද වධහිංසා සහ වෙනත් ආකාරයේ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්වල වින්දිතයන් වූ ස්ත්‍රීන් 12 ක් ඇතුළුව වයස 23 ත් 58 ත් අතර පුද්ගලයන් සමග දීර්ඝවූත් සවිස්තරාත්මක වූත් සම්මුඛ සාකච්ඡා 48 ක් පවත්වන ලදී. මෙම රහස්‍ය සාකච්ඡා පවත්වන ලද්දේ රටවල් හයක දීය. විවිධ ස්ථානවල දී නිදහස්ව ලබා දුන් සවිස්තරාත්මක ප්‍රකාශ විශාල සංඛ්‍යාවකින් පහතින් දක්වෙන සොයා ගැනීම් තහවුරු කෙරේ.

537. වධහිංසා වින්දිතයන් සමග වැඩ කරන සංවිධාන ඇතුළුව වෙනත් මූලාශ්‍ර සමග කරන ලද සාකච්ඡාවලින් මෙන්ම වින්දිතයන්ගේ වෛද්‍ය වාර්තාවලින් ( තම වෛද්‍ය වාර්තා විමර්ශන කොමිටියට ලබා දීමට වින්දිතයෝ එකඟ වූහ.) අතිරේක තොරතුරු ලබා ගන්නා ලදී. විමර්ශන කොමිටියට ඉදිරිපත් කළ ලිඛිත සැල කිරීම්වලින් සහ වෙනත් වාර්තා සහ ලේඛන සමාලෝචනයෙන් සොයා ගැනීම් තවදුරටත් තහවුරු කර ගන්නා ලදී.

538. වධහිංසාවන්ට ලක්වූ සියලුම වින්දිතයෝ ස්වේඡාවෙන්ම ප්‍රකාශ ලබා දුන්හ. මෙය බොහෝ දෙනෙකුට අප්‍රසන්න වූ මහත් වේදනාකාරී සිදුවීම් නැවත අත්විඳීමක් විය. මෙම හේතුව නිසා සාකච්ඡා විරාමයක් සඳහා අතර මග නතර කළ අතර සමහර අවස්ථාවලදී වින්දිතයන්ගේ අත්දැකීම් ගැඹුරින් සොයා බැලීම් සිදු කෙළේ නැත. විමර්ශකයෝ සම්මුඛ සාකච්ඡාවට ලක්වූවන්ගේ සිරුරේ තුවාල කැළැල් දුටු අතර සහ මානසික කම්පනය හැඳින ගත්හ. විමර්ශන කොමිටියට දැක ගැනීමට ලැබුණු වෛද්‍ය වාර්තා අනුව සහ වෛද්‍යවරුන් සමග පැවැත් වූ සාකච්ඡා අනුව සිරුරේ වසර ගණනාවක් පැවතිය හැකි තුවාල කැළැල් මෙන්ම සිය දිවි නසා ගැනීමේ සිතුවිලි, නිදි නැතිකම, ආගන්තුක සිතුවිලි, සිත එක්තැන් කළ නොහැකිවීම, මානසික කඩා වැටීම සහ වධහිංසා විඳීමෙන් ඇතිවන පශ්චාත් ලක්ෂණ ඇතුළුව මානසික පීඩා කැපී පෙනෙන්ට තිබිණ.[463]

539. වධහිංසාවට ලක්වීමෙන් වින්දිතයන් වූ අය සමග සාකච්ඡා කිරීමේ වසර ගණනාවක අත්දැකීම් ඇති විමර්ශකයෝ විමර්ශන කොමිටියෙන් ලේඛන ගතකළ සිද්ධීන්වල විශේෂයෙන්ම ඇති කෲර භාවය සහ දරුණුකම ගැන සඳහන් කළහ. සාකච්ඡා කළ බොහෝ දෙනෙකු රඳවා ගෙන සිටි කාලය තුළ වෙනත් ආකාරයේ වධහිංසාවන්ට අමතරව ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ ආකාරය විස්තර කළහ. මෙම චෝදනා බොහොමයක් මෙම වාර්තාවේ X පර්ච්ඡේදයේ දක්වා ඇත.

540. ආණ්ඩුවේ හමුදා විසින් ගැටුම්වලට අදාලව පමුණුවන ලද වධහිංසා සහ කොමිටියෙන් ලේඛන ගත කරන ලද වින්දිතයන් සාමාන්‍යයෙන් දෙමළ ජාතිකයන් ය. ඔවුන් බොහෝවිට ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලදී විශේෂයෙන් යාපනයේ දී අත් අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සහ හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා ගත් අයයි.

541. කලින් වූ කාල සීමාවට අදාල සොයා ගැනීම් 2007 ඔක්තෝබර් මාසයේ දී සංචාරය කළ වධහිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාවෙන් තහවුරු වේ. ඔහුගේ සංචාරයේ වාර්තාවේ මෙසේ සඳහන් වේ. ''... හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා ගැනීම් සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම එල්ටීටීඊ සැකකරුවන් සම්බන්ධයෙන් විශේෂ සම්බන්ධීකාරක විසින් සාකච්ඡාකළ සියල්ලන්ගෙන්

---

[461] වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, Manfred Nowak, Mission to Sri Lanka http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G08/11135.pdf/OpenElement

[462] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[463] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

පැහැදිලි බහුතරයක් සමහරක් අතිශයෙන්ම දරුණු වූ වධහිංසා ක්‍රම ගණනාවක් ගැන පැමිණිලි කළහ. බොහෝ සිද්ධීන් සම්බන්ධ චෝදනා අධිකරණ වෛද්‍ය වාර්තා අනුව තහවුරු වන්නේය. TID සහ අනෙකුත් ආරක්ෂක හමුදා විසින් වධහිංසා පමුණුවන ලද බව පැහැදිලිව තහවුරු සිද්ධි සැලකිය යුතු සංඛ්‍යාවක් නිසා පොලීසිය සහ සන්නද්ධ හමුදා විසින් ත්‍රස්ත විරෝධී මෙහෙයුම් සම්බන්ධයෙන් වධහිංසාව යොදා ගැනීම සාමාන්‍ය පුරුද්දක්ව ඇතැයි තීරණය කිරීමට ඔහු පෙළඹී ඇත. [464]

542. සන්නද්ධ ගැටුමේ අවසාන දවස්වල සහ එය අවසන් වූ වහාම සාමාන්‍ය ජනතාව සහ එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන් වන්නියේ සිට ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලට ඇතුළුවීමේදී ආරක්ෂක හමුදා විසින් ඔවුන් සමූහ වශයෙන් රඳවා ගෙන පුළුල්ව, ක්‍රමානුකූලව සහ විශේෂයෙන් කුරිරු වධහිංසාවලට ලක් කළ ආකාරය මෙම කොමිටියෙන් ලේඛන ගත කර ඇත.

543. වින්දිතයන් බොහෝවිට සාමාන්‍යයෙන් සති කීපයක සිට වසර ගණනාවක් විය හැකි රඳවා ගැනීමේ කාල සීමාවක් තුළ නිරන්තරයෙන්ම වධහිංසාවන්ට ලක් කර ඇත. විමර්ශන කාල සීමාව මුළුල්ලේම සිදු කරන ලද වධහිංසා කලින්ම අරමුණු කර ගත් ඒවා වන අතර ඒවා සැලසුම් කර ඇත්තේ විමර්ශනයේ කොටසක් ලෙස අපරාධකරුවා අත් අඩංගුවේ සිටින එල්ටීටීඊ කාර්යධරයන් හෝ ආධාරකරුවන්යැයි සැක කරන අයට කායික සහ/හෝ මානසික වේදනාව හෝ පීඩාව ඇති කිරීමෙන් තොරතුරු හෝ පාපෝච්චාරණ ලබා ගැනීමට ය.

544. වධහිංසා පැමිණවීම සිදු කර ඇත්තේ විශේෂ කාර්ය සාධක බලකාය ( Special Task Force)[465]ඇතුළුව ශ්‍රී ලංකා පොලිසිය [466] අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව(CID),[467] සහ ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුව (TID)[468] ශ්‍රී ලංකා යුද හමුදාව[469], විශේෂයෙන්ම 53, 55 සහ 58 වැනි බ්‍රිගේඩ[470], යුද හමුදා පොලිසිය[471], හමුදා බුද්ධි අංශය[472] සහ ජාතික බුද්ධි කාර්යාංශය වැනි රාජ්‍ය නියෝජිතයන් විසිනි. [473]කරුණා කණ්ඩායමේ සාමාජිකයන් බොහෝවිට ආණ්ඩුවේ නියෝජිතයන් සමග එක්ව 2004 සිට කරන ලද වධහිංසා පැමිණවීම් විමර්ශන කොමිටිය වාර්තා කර ඇත.[474] රජයේ නියෝජිතයන් සමහර විට තමන් TID යට හෝ CID යට වැඩ කරන බවට හඳුන්වා ගෙන ඇත. සමහර අවස්ථාවල නිල ඇඳුම් අනුව හෝ රඳවාගෙන වධහිංසාවට ලක් කළ ස්ථානය අනුව අපරාධය සිදු කරන ලදැයි කියන අය සාක්ෂිකරුවෝ හඳුනා ගත්හ. වින්දිතයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන් වරින් වර ප්‍රශ්න කළ හා වධහිංසා කළ ආරක්ෂක හමුදාවල විවිධ අංශවල නියෝජිතයන් ගේ වධහිංසාවලට ලක්ව ඇත.[475]

545. කොමිටිය හමුදා කඳවුරු, පොලිස් ස්ථාන, ''පුනරුත්ථාපන කඳවුරු'' සහ බන්ධනාගාර ඇතුළු ස්ථාන ගණනාවක දී වධහිංසා පැමිණවීම් ලේඛණ ගත කෙළේය. ගැටුම අවසන් වූ කාලයේ දීම ආරක්ෂක හමුදා විසින් රැඳවුම් මධ්‍යස්ථාන කඩිනමෙන් පිහිටුවන ලදී. නිදසුනක්

---

[464] වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, Manfred Nowak, Mission to Sri Lanka http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G08/11135.pdf/OpenElement

[465]සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[466] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[467] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[468] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[469] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[470] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[471] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[472] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[473] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[474] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[475] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

වශයෙන් පාසල් හෝ විද්‍යාල ගොඩනැගිලිවල. මේ ස්ථානවල පුරුද්දක් වශයෙන්ම වධහිංසා සිදු කෙරිණ. වධහිංසා හෝ හිංසා කිරීම් පහත සඳහන් ස්ථානවල සිදු කෙරිණැයි කොමිටිය ලේඛන ගත කෙළේය.

546. හමුදා කඳවුරුඃ යාපනය අසළ අචුවෙලි – අචේලි යුද හමුදා කඳවුර,[476] ජෝසප් යුද හමුදා කඳවුර වවුනියාව [477]කුරිසුත්ත කැලම් අසළ හමුදා කඳවුර[478] මන්නාරම අසළ නාවික හමුදා කඳවුර[479] පුල්නෙර්ව අසළ යුද හමුදා කඳවුර [480]

547. තාවකාලික රැඳවුම් මධ්‍යස්ථාන ඇතුළු ''පුනරුත්ථාපන මධ්‍යස්ථාන'' කලින් වවුනියාවේ පාසලක් වූ චෙඩ්ඩිකුලම් කඳවුර,[481] කලින් කාර්මික විද්‍යාලයක් වූ වවුනියාවේ නෙල්ලිකුලම් [482] ඕමන්තේ මධ්‍යම මහා විද්‍යාලය,[483] වවුනියාවේ පොම්පමඩු විද්‍යාලය [484] වවුනියාවේ කලින් අධ්‍යාපනික ආයතනයක්වූ පුන්තෝට්ටම් කඳවුර, රාමනාදන් (මැනික් ෆාම්,) [485] වවුනියාව[486] රම්බකුලම් කාන්තා විද්‍යාලය,[487]වවුනියාව ද්විතීය පාසල [488]
548. බන්ධනාගාරඃ ත්‍රිකුණාමලය බන්ධනාගාරය,[489] කොළඹ අසළ වැලිකඩ බන්ධනාගාරය[490]

549. පොලිස් ස්ථානඃ කොළඹ අලුත්කඩේ,[491]කල්මුනේ, කඩවත[492]
550. CID ස්ථානඃ CID දෙපාර්තමේන්තුවේ 4 වැනි තට්ටුව,[493] වෙප්පන්කුලම් CID කඳවුර [494]

551. කොළඹ ගුවන් තොටුපොළ අසළ TID ස්ථානය මෙන්ම වෙනත් TID ස්ථාන [495] ගාල්ල බූස්ස රැඳවුම් මධ්‍යස්ථාන [496]

552. අත් අඩංගුවට ගැනීමෙන් පසු[497] ඇස් බඳින ලද රැඳවියන් තමන් රඳවා ගෙන ස්ථානය සිතා ගැනීමට නොහැකි වන ආකාරයට පැය ගණනක් වාහනයකින් ගෙන යනු ලැබේ. එහෙත් සමහරුන්ට ප්‍රදේශයේ ඇති සලකුණුවලින් හෝ මුදා හැරි ස්ථානය අනුව[498] තමන් රඳවා සිටි ස්ථානය හඳුනා ගැනීමට හැකිය.[499]

476 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
477 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
478 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
479 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
480 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
481 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
482 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
483 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
484 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
485 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
486 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
487 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
488 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
489 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
490 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
491 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
492 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
493 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
494 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
495 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
496 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
497 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
498 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
499 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

553. වවුනියාව ජොසප් හමුදා කඳවුර ( වවුනියාව ආරක්ෂක හමුදා මූලස්ථානය), හා කොළඹ රැඳවුම් මධ්‍යස්ථානයක් වන සී අයි ඩී 'හතරවැනි තට්ටුව' වැනි වඩාත් බහුලව යොදා ගත් මධ්‍යස්ථානවල වධහිංසා පැමිණවීමේ උපකරණ සවි කළ කාමර තිබිණ. ඉන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා ඒකක වධහිංසාව යොදා ගැනීම කලින් සැලසුම්කර සහ ක්‍රමානුකූල ආකාරයෙන් යොදා ගැනීමය. [500] මෙම කාමරවල පහර දීමට යොදා ගන්නා යකඩ පටි සහ පොළු, දියේ ගිල්වීමට වතුර පිර වූ බැරල් සහ වින්දිතයන් එල්ලා තැබීමට කප්පි සහ වෙනත් උපකරණ තිබිණ. මෙම කාමරවල බිත්තිවල සහ බිම ලේ පැල්ලම් දුටු බව වින්දිතයෝ කියති. වධහිංසා පැමිණවීම සඳහා යොදා ගත් විවිධ ස්ථානවල දී වෙනත් පුද්ගලයන්ට වධහිංසා පමුණුවනු දුටු හෝ ඇසුණ බව සාක්ෂිකරුවෝ විස්තර කරති. [501]

554. එක වින්දිතයෙක් 2009 දී සරණාගත කඳවුරක දී අත් අඩංගුවට ගෙන තමා වෑන් රථයකින් ගෙන ගිය ආකාරය විස්තර කෙළේය: ''වාහනය නැවතු පසු මා වැසිකිළියක් සහ වතුර බාල්දියක් ඇති කුඩා කාමරයකට ගෙන යනු ලැබිණ. කාමරයේ සිටියේ මා පමණි. ජනේලයේ පොළුවලට යකඩ පටියකින් තට්ටු කළ සොල්දාදුවන් අපට නිදා ගැනීමට ඉඩ දුන්නේ නැත. මට මිනිසුන් කෑ ගසනු ඇසිණ.'' ඊට පසු දින වින්දිතයා ඔහු සිටි කාමරයෙන් පිටතට ගෙන ගොස් ඇත. ''නිලධාරීන් දෙදෙනෙක් මා ප්‍රශ්න කිරීමට විශාල කාමරයකට ගෙන ගියා. වධහිංසා කිරීමට යොදා ගන්නා උපකරණවලින් කාමරය පිරී තිබුණා. බිත්තිවල ලේ පැල්ලම් සහ වතුරු බැරල් එකක් මම දැක්කා.''[502]

555. කොමිටිය සටහන් කර ගත් ප්‍රකාශ අනුව වධහිංසා පැමිණවීමේ විවිධ ක්‍රම ගණනාවක් පොදුවේ යොදා ගෙන ඇත. බොහෝවිට බැඳ දැමූ වින්දිතයන්ට රයිපල් කඳින්, වැලි හෝ කොන්ක්‍රීට් පිරවූ එස්ලෝන් බට, යකඩ බට සහ ලී පොළුවලින් පහර දේ. [503] වින්දිතයන්ට බොහෝවිට සිහි සුන්වන තෙක් පහර දේ.[504]උඩුයටිකුරු කොට එල්ලා පිටට, හිසට, කකුල්වලට සහ යටි පතුල්වලට පහර දුන් ආකාරය ඔවුහු විස්තර කළහ[505].

556. ජලයේ ගිල්වීම[506], නිතර භාවිතා කළ ක්‍රමයකි. එහිදී උඩියටිකුරු කොට එල්ලා ඇති වින්දිතයන්ගේ හිස වතුර බාල්දියේ ගිල්වයි.[507] පැට්‍රොල් හෝ මිරිස් කුඩු පිරවූ ප්ලාස්ටික් බෑග් හිස මත තබා අඩ වශයෙන් හුස්ම හිර කිරීම[508]මෙන්ම රත් කළ යකඩ පටි වලින් හෝ සිගරට් කොටවලින් පිළිස්සීම[509] හෝ හංවඩු ගැසීම බොහෝ වින්දිතයන් විස්තර කළ තවත් ක්‍රමයකි. අත්වල සහ කකුල්වල නියපොතු අඬුවෙන් ඇද ගැලවීම හෝ නියපොතු අස්සෙන් ඇල්පෙනෙති ගැසීමද සිදුවිය. [510] බොහෝ අවස්ථාවල විවිධ වධ හිංසා ක්‍රම එකවිට යොදා ගත් ආකාරයද සාක්ෂිකරුවෝ විස්තර කළහ. බොහෝ වින්දිතයෝ වධකයන් පැමිණවූ හිංසා විස්තර කළහ. මාස තුනකට වැඩි කාලයක් සිර ගෙයක දී දරුණු වධහිංසාවන්ට සහ ලිංගික ප්‍රහාරවලට ලක් වූ වින්දිතයෙක් එම වේදනාවෙන් මිදීමට තමා මරා දමන ලෙස වධකයන්ගෙන් ඉල්ලා සිටි බව කොමිටියට පැවසුවේය.[511] තවත් වින්දිතයෙක් තමාට කොළඹ සීඅයිඩියේ හතරවැනි තට්ටුවේ දී නිලධාරීන් ක්‍රීඩකයන් 11 දෙනෙකු පා පන්දුවට පහර දෙන ආකාරයට පහරදුන් බව කීවේය.

---

[500] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[501] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[502] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[503] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[504] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[505] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[506] එක්සත් ජාතීන්ගේ වධහිංසාවට එරෙහි කොමිටියේ 36 වැනි සැසියේ දී දියේ ගිල්වීම වැනි ප්‍රශ්න කිරීමේ ක්‍රම වධහිංසා හෝ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවමක් බව සඳහන් කෙරිණ.

[507] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[508] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[509] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[510] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[511] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

මෙම වින්දිතයාට වරින් වර හිසට ඇතුළුව පයින් සහ කෝටු සහ පොළුවලින් පහර දුන් බවත් පැට්‍රොල් පිරවූ ප්ලාස්ටික් බෑගයකින් හිස වසා අඩ වශයෙන් හුස්ම හිර කළ බවද පැවසුවේය.[512]
557. 2009 මැයි මාසයේ දී ඕමන්තේ හරහා ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශයට ඇතුළුවී සරණාගත කඳවුරක සිටි වින්දිතයෙක් ඉන් පිටතට ගෙන වාහනයක නංවා ජොසප් කඳවුරට ගෙන ගොස් දරුණු වධහිංසාවන්ට සහ ලිංගික ප්‍රහාරයන්ට ලක් කළ බව කීවේය. ''ඔවුන් අතට හසු වූ සෑම දෙයකින්ම, බූට්, කෝටු, පොළු වලින් ඇගේ හැම තැනටම පහර දුන්නා. අපිව කැළේට ගෙන ගිහිල්ලා තවත් දරුණු වධ දුන්නා. මාත් සමග තවත් ගෑනුත් පිරිමිත් හිටියා. ඇස් බැඳ තිබුණ නිසා ගණන කියන්න බැහැ.''[513]
558. කොමිටිය ලේඛන ගත කළ තවත් සිද්ධියකදී ශ්‍රී ලංකා බලධාරීන් විසින් එල්ටීටීඊ කාර්යධරයෙක්යැයි සැක කළ පුද්ගලයෙකු 2010 දී වවුනියාවේ ඔහු වැඩ කරන ස්ථානය අසළ දී අත් අඩංගුවට ගෙන වධහිංසා පමුණුවා ඇත. අත් අඩංගුවේ සිටි සති හය ඇතුළත ටීඅයිඩී නිලධාරීහු අවස්ථා ගණනාවකදී ඔහුට වධහිංසා පමුණුවා ප්‍රශ්න කර ඇත. ඔහුට සිමෙන්ති පිරවූ එස්ලෝන් බටවලින් පහර දී කකුල්වලින් එල්ලා හිස වතුර භාජනයත ගිල්වා ඇත. කකුලේ ඇඟිලිවල නියපොතු ගලවා ඇත. ඉන්පසු දින දෙකක් ඔහු රඳවා ඇත්තේ කටු කම්බි ගැසූ කුඩා කුඩුවකය. එහි ඉඳ ගැනීමට හෝ නොහැකිය. පාට්‍රොල් පිරවූ ප්ලාස්ටික් බෑගයකින් හිස වසා ලිංගේන්ද්‍රියේ මිරිස් කුඩු තවරා ඇත. අවස්ථා කීපයකදී ඔහුව දූෂණය කළ බවද කියයි. ඔහුගේ පියා ටීඅයිඩියට අල්ලසක් දීමෙන් පසු ඔහු නිදහස් කර ඇත.[514]

559. වධහිංසා නිසා රැඳවියන් මිය ගිය බවට විශ්වාස කළ හැකි චෝදනා ඉදිරිපත් කළ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ද මෙම කොමිටිය ලේඛන ගත කර ඇත.[515]හමුදා කඳවුරක තමා සිටි කුටියේ අනෙක් සගය නැවත නැවතත් වධහිංසාවන්ට ලක්විම නිසා මරණාසන්නව සිටි ආකාරය එක සාක්ෂිකරුවෙකු විස්තර කෙළේය. ඔහු මළ පසු මල සිරුර ගෙන ගියේ දින තුනකට පසුය.[516]

560. රැඳවියන්ට මුත්‍රා පානය කිරීම, බිම ඇති ලේ දිවෙන් ලෙව කෑම, ඇඟට කෙළ ගැසීම හෝ මුත්‍රා කිරීම 'බල්ලෙකු මෙන්'' ආහාර ගැනීමට බල කිරීම වැනි අවමන් සහගත සැලකීමේ ක්‍රියාවන්ට ලක් කර ඇත.[517] වින්දිතයන් කායික නොවන වධ වේදනා සහ හිංසාවන්ට ලක් කළ අවස්ථා ද කොමිටිය ලේඛන ගත කෙළේය. [518] වින්දිතයන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයනට මරණ තර්ජන ඇතුළත් තර්ජනය කිරීම්, පවුලේ සාමාජිකයන් දූෂණය කරන බවට තර්ජනය කිරීම හෝ වින්දිතයාට අනෙකුත් අයට වධහිංසා පැමිණවීම බලා සිටීමට සැලැස්වීම සහ ඔහුටත් එවැනිම වධහිංසා පමුණුවන බවට තර්ජනය කිරීම වැනි ක්‍රම ඊට අයත්ය. රැඳවියන්ගේ වර්ගය අනුව, 'දෙමළ බල්ලා' වැනි අපහාසාත්මක ලෙස බැණ වැදීම්වලට නිතර ලක්විය.[519]

561. වධහිංසා පැමිණවීම් සාමාන්‍යයෙන් සිදු වන්නේ එල්ටීටීඊ කාර්යධරයන් හෝ ආධාරකරුවන් ප්‍රශ්න කිරීමට ලක් කරන අවස්ථාවේ දිය. තුන් දෙනෙකුගෙන් හෝ සිවු දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ඔවුන් කාමරයකට ගෙන යන බව වින්දිතයෝ පවසති. බොහෝවිට සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණ තමන් සීඅයිඩී හෝ ටීඅයිඩී යනුවෙන් හඳුන්වා ගන්නා, සමහර විට චූදිතයා ගැන ලිපි ගොණුවක් රැගත් කණ්ඩායමේ එක් කෙනෙකු හෝ දෙදෙනෙකු ප්‍රශ්න කරන අතර බොහෝවිට පොලීසියේ හෝ යුද හමුදාවේ නිල ඇඳුම් ඇඳ ගත් අනෙක් අය වධහිංසා පමුණුවති.[520]එවැනි සැසියක් සාමාන්‍යයෙන් විනාඩි 30 ත් පැය දෙකක් අතර කාලයක් පවතින අතර එක් එක් සැසියේදී වෙනස් වධහිංසා ක්‍රම යොදා ගැනේ.

512 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
513 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
514 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
515 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
516 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
517 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
518 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
519 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
520 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

562. වින්දිත රැඳවියාගේ පළමු සති හෝ මාස කීපය පුරා දින පතාම හෝ සතියට කීප වතාවක් මෙම සැසි පැවැත්වේ.[521]සෑම ප්‍රශ්නයකටම පසු පහර දුන් බව එක් සාක්ෂිකරුවෙක් පැවසුවේය.[522] අවසානයේ දී කාලයත් සමග වධහිංසා පැමිණවීමේ පරතරය සහ දරුණුබව අඩුවන බවද සාක්ෂිකරුවෝ පවසති[523]. ප්‍රශ්න කිරීම් සිදු වන්නේ ආයුධ සඟවා ඇති ස්ථාන, අණ දෙන්නන් හෝ විදේශ සහයෝගිතා ජාලය හෝ සැලසුම් කළ ප්‍රහාර වැනි සැක කරන එල්ටීටීඊ ක්‍රියාකාරකම් ගැනය.[524] ඉහළ මට්ටමේ එල්ටීටීඊ කාර්යධරයන්යැයි සැක කරන අය සහ එල්ටීටීඊ මුහුදු කොටි හෝ බුද්ධි සේවා වැනි 'සුපිරි' ඒකකවලට අයත්යැයි සැක කරන අය කුරිරු වධහිංසාවන්ට විශේෂයෙන්ම තෝරා ගැනේ. බොරුකීම හෝ තොරතුරු සැඟවීම පිළිබඳ චෝදනා නිසා වධහිංසා පැමිණවීම් දැඩි කෙරේ. වධහිංසා පැමිණවීම් බොහෝවිට යොදා ගන්නේ වින්දිතයන් ලවා ''පාපොච්චාරණ'' වලට අත්සන් ලබා ගැනීමට ය. එම ලේඛන සකස් කර ඇත්තේ බොහෝ වින්දිතයන්ට නොතේරෙණ සිංහලෙනි.[525] සමහර අවස්ථාවල වින්දිතයන්ගෙන් හිස් කඩදාසිවලට අත්සන් ලබා ගනී.[526]

563. 2008 දී වන්නියේ සිට පිටව යනවිට යුද හමුදා මුර පොළක් පසු කර යෑමේ දී අත් අඩංගුවට ගත් එක් වින්දිතයෙක් ඔහුව ජොසප් කඳවුරට ගෙන ගොස් මද වේලාවකට පසුව වධහිංසාවලට ලක් වූ ආකාරය කොමිටියට විස්තර කෙළේය. තමාට ලබා දුන් කායික වධහිංසා විස්තර කිරීමට පවා ඔහුට දැඩි වේදනාවක් විය. ''මා ප්‍රශ්න කිරීමේ කාමරයට ගෙන ගියා. එහි බිත්තියේ කළු පැල්ලම් සහ යකඩ පොළු සහ ලී පොළු වැනි දේ තිබුණා. මාව කාමරයට දමා පැයක් පමණ කාලයක් දොර වසා තිබුණා. ඊට පසුව හමුදාවේ කලිසම් සහ ටී ෂර්ට් ඇඳගත් තිදෙනෙක් කාමරයට ඇතුළු වුවා. බොරු කිව්වොත් මා මරණ බව ඔවුන් කිව්වා. ඔවුන් මම එල්ටීටීඊ ප්‍රදේශ වලින් පිටව ආවේ ඇයිද යන්න ප්‍රශ්න කළා. ඔවුන් මා නොදන්නා සිංහලෙන් ලියා තිබූ ලේඛනයකට අත්සන් ගත්තා. පැය දෙකකට පසුව ඔවුන් පිටව ගියාම හමුදාවේ නිල කලිසම් සහ සුදු ටී ෂර්ට් ඇඳගත් වෙනත් හතර දෙනෙක් ආවා. ඔවුන් කීවා මම බොරු කියා ඇති බව කිව්වා. මට දරුණු විදියට වද දුන්නා. ඒවා විස්තර කරන්න වචන නැහැ. මට යකඩ බටවලින් පහර දුන්නා. කකුල් දෙකෙන් එල්ලා සමහරවිට මගේ හිස වතුරු බාල්දියක ගිල්වුවා. මට මහත් වේදනාවක් දැනුණා. සෑම ප්‍රශ්නයකටම පස්සේ මේ වැඩේ කළා. ඔවුන් කීවා මම එල්ටීටීඊ හටයෙක් කියා. ඒත් ඒකට සාක්ෂි තිබුණේ නැහැ. ප්‍රශ්නයක් අහන හැම අවස්ථාවේම මට ගැහුවා.''[527]

564. තවත් සිද්ධියකදී අත් අඩංගුවට ගත් පුද්ගලයෙක් වාහනයකින් පැය දෙකක් කළුවරේ නොදන්නා ස්ථානයකට ගෙන ගොස් ඔහු නොදන්නා සිංහලෙන් ලියන ලද ලේඛන තුනකට අත්සන් කරන ලෙස බල කර ඇත. එසේ නොකළ හොත් වධහිංසාවන්ට ලක් කරන බවට තර්ජනය කරන ලදී. ඔහු ප්‍රශ්න කළ පළමු දිනයේදී අත්සන් කළ ලිපිවලින් ඔහුට විරුද්ධව ඇති සියලු චෝදනා පිළිගෙන ඇතැයි පැවසූහ. ප්‍රශ්න කිරීම් යොමු වූයේ එල්ටීටීඊ අණ ව්‍යුහය, එල්ටීටීඊයේ විදේශ සහයෝගිතා ජාලය සහ එල්ටීටීඊයේ අවි සඟවා ඇති තැන් ගැනය. ඔහු රඳවා සිටි මුල් මාස අට ඇතුළත ප්‍රශ්න කිරීම් සහ වධහිංසා පැමිණවීම් දිනපතාම පාහේ සිදු වූ අතර ඒ සෑම සැසියක්ම පැය ගණනක් පැවතිණ. තමා ලක්වූ වධහිංසා පැමිණවීමේ ක්‍රම ගණනාවක්ම ඔහු විස්තර කෙළේය. ''පැට්‍රොල් පෙඟ වූ බෑගයක් මගේ ඔළුවට දැම්මා. ඒකෙන් මට සිහිය නැති වුණා. මාව නිරුවත් කර කකුල් දෙකෙන් සිවිලිමෙන් එල්ලා වමනෙ දාන කං ගැහුවා. මට යකඩ පොළුවලින් ගැහුවා. සිගරට් කොටවලින් හා රත් කළ යකඩවලින් පිළිස්සුවා. මගේ බඩට, පිටට, අත් හා කකුල්වලට තැළුවා. කකුල් දෙකෙන් එල්ලා ඔළුව වතුර බාල්දියකට එබුවා. කකුළේ නිය පොතු ගලවා කකුළ උඩ පුටු කකුළත් තියා ඒක උඩ හමුදා නිලධාරියෙක් වාඩි වෙනවා. හතර දෙනෙකුගේ කණ්ඩායමක් තමයි වද දෙන්නේ. සාමාන්‍ය ඇඳුම් ඇඳගත් එක් කෙනෙක් ප්‍රශ්න අසනවා. නිල ඇඳුමෙන් සිටි තිදෙනා වද දෙනවා.'' මෙම පුද්ගලයා කැලේ තිබූ

---

[521] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[522] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[523] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[524] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[525] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[526] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[527] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

කඳවුරක වසර දෙක හමාරක් රඳවා ගෙන ඇත. 2011 අග ඔහුව රෝහලකට ගෙන ගිය පසු ඔහුගේ ගෙදරට පණිවුඩයක් යවා ඇත. ඉන්පසු පවුලේ අය අල්ලසක් ගෙවීමෙන් පසු නිදහස් කළ බව ඔහු කියයි.[528]

565. තවත් වින්දිතයෙක් 2009 අප්‍රේල් මාසයේ ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශයකට පැමිණීමෙන් පසුව අත් අඩංගුවට ගෙන වාහනයකින් කැලේ ස්ථානයකට ගෙන ගොස් වධහිංසා පැමිණවූ ආකාරය විස්තර කෙළේය. ''අපිව පැය දෙකක් විතර ඝන කැලේ ඇතුළට ගොස් වාහනය නතර කොට එහි තිබූ කුඩා ගොඩනැගිල්ලක් ඇතුළට ගෙන ගියා. පැය භාගයකට විතර පස්සේ හමුදා නිල ඇඳුමෙන් සිටි පුද්ගලයන් පහක් හයක් කාමරය ඇතුළට ඇවිත් ගහන්න පටන් ගත්තා. මට සිහිය නැතිවී බිම වැටුණා. වේදනාව දරා ගන්න බැරුව මම කෑ ගැසුවා. මට විනාඩි තිහක් විතර ගැහුවා. ඔවුන් මගේ බඩත් ලිංගේන්ද්‍රියත් පයින් පෑගුවා. මට වේදනාව දරා ගන්න බැරිවුනා. පස්සෙ දවසෙ ප්‍රශ්න කිරීම ඇරඹුණා. ඔවුන් මගෙන් ඇහුවා එල්ටීටීඊයත් එක්ක මොනවද කෙළේ, මම වැඩ කෙළේ මොන අංශයේ ද, කොච්චර කල් හිටියද කියා......... පළමු දවස් දහයෙම එකම ප්‍රශ්න එකම ආකාරයේ වධහිංසා. ඔවුන් මිනිස්සුන්ට තලන්න යොදා ගත්තේ යකඩ බට. සාමාන්‍යයෙන් එක් කෙනෙක් ප්‍රශ්න අහනවා. අනෙක් දෙන්නෙක් හරි තුන් දෙනෙක් හරි ගහනවා.... මම ඒ කැම්ප් එකේ සිටිය දවස් විස්සෙම ඒ විදියට වධහිංසා කළා.'' ඉන්පසු එම වින්දිතයා වෙනත් කඳවුරකට මාරු කරන ලදුව එහි තවත් මාස හතක් රඳවා ඇත. එහිදී ද දියේ ගිල්වීම, විදුලි වයර්වලින් තැලීම, ගෙල වටා කඹයකින් බැඳ හිස තද බිත්තියේ හැප්පවීම වැනි විවිධ වධහිංසාවලට ලක් කර ඇත. තමා එල්ටීටීඊ කාර්යධරයෙකුයැයි පිළිගත්තේ නම් නිදහස් කරන්නේයැයි ඔහුට පැවසූ බව කියයි.[529]

**එල්ටීටීඊය විසින් සිදු කරන ලදැයි කියන වධහිංසා**

566. මෙම කොමිටිය එල්ටීටීඊය විසින් සිදු කරන ලදැයි කියන වධහිංසා සහ වෙනත් හිංසා ක්‍රියා ලේඛන ගත කෙළේය. එහෙත් ඒවා ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සිදු කරන ලද විශාල පරිමාණයේ තරම් සිද්ධීන් නොවේ. එල්ටීටීඊය තම අධිකාරිය යටතේ පැවති ප්‍රදේශවල දැඩි සමාජ පාලනයක් පවත්වා ගෙන ගියේය. ඊට එල්ටීටීඊ 'පොලීසියේ' කුරිරුකම් ඇතුළත් වුවද ඒවා ප්‍රධාන වශයෙන්ම පමුණුවන ලද්දේ සිදු කෙළේයැයි කියන අපරාධ සම්බන්ධයෙනි. එල්ටීටීඊය විසින් වඩාත් බරපතළ ආකාරයේ වධහිංසා පමුණුවන ලද්දේ විශේෂයෙන්ම ඔවුන් ද්‍රෝහීන් ලෙස සැලකූ අය, ළමයින් හමුදාවට බඳවා ගැනීම ඇතුළුව බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීමට විරුද්ධ වූ අය හෝ සංවිධානය සමග ගැටුම් ඇති කර ගැනීමෙන් පලා ගිය අයටය.[530]

567. රත් කළ යකඩ කම්බිවලින් පිළිස්සීම, පහරදීම් සහ වින්දිතයාට අව්වේ දිගු කාලයක් සිටීමට බලකිරීම ඇතුළුව එල්ටීටීඊය විසින් සිදු කරන ලද වධහිංසා පිළිබඳ සැලකිරීම් සුළු සංඛ්‍යාවක් සහ වෙනත් තොරතුරු ලැබිණ. වින්දිතයන් එල්ටීටීඊ මුර කපොළු, හමුදා කඳවුරු, පොලිස් සහ බුද්ධි කඳවුරු සහ වල්ලිපුරම් හි ''ඇල්පා 2'' සහ ''ඇල්පා 3'' නමින් හැඳින් වූ බන්ධනාගාරවල රඳවා ගෙන වධහිංසා පමුණුවා ඇත.[531]

568. 2005 දී බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් පසුව පලා ගිය පුද්ගලයෙක් නැවත අල්ලා ගෙන වල්ලිපුරම් හි අල්පා 2 බන්ධනාගාරයට ගෙන යන ලදී. ඔහු මාස අටක් රඳවා ගෙන ඇත. ද්‍රෝහියෙක් ලෙස චෝදනා කරන ලද එම පුද්ගලයාට වැලි පිරවූ බටවලින් සහ විදුලි කම්බිවලින් පහර දී ඇත. ඔහු නිදහස් කර ඇත්තේ එල්ටීටීඊ කාර්යධරයෙකු ලෙස සටන් පෙරමුණට යෑමට එකඟ වූ පසුය.[532]

---

528 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
529 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
530 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
531 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

532 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

569. වැඩි වශයෙන්ම ඊනියා වින්දිතයන් හමුවීමට නොහැකිවීමත් වෙනත් සීමාවන් නිසාත් කොමිටියට එල්ටීටීඊය විසින් සිදු කරන ලදැයි කියන වධහිංසා බොහොමයක් තහවුරු කළ නොහැකි විය. එමනිසා එල්ටීටීඊ පාලන ප්‍රදේශවල පැවති වධහිංසා ගැන නිවැරදිව තක්සේරුකළ නොහැකිය. එය වැඩි දුරටත් විමර්ශනය කළ යුතුය.

570. කොමිටිය විසින් රැස්කර ගත් තොරතුරු පදනම්ව එල්ටීටීඊය අත් අඩංගුවේ තබා ගත් පුද්ගලයන්ට වධහිංසා සහ හිංසාපීඩා පැමිණවීමෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝන කිරීම් සිදු කළ බව විශ්වාස කිරීමට සාධක පවතී. කෙසේ වුවත් මෙම ක්‍රියා ක්‍රමාණුකූලව සහ පුළුල් වශයෙන් සිදු වූයේ ද යන්න තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නැත. එමනිසා ඒවා මානව වර්ගයාට එරෙහි අපරාධ වන්නේ ද යන්න තක්සේරුකළ නොහැකිය.

## X . ලිංගික සහ ස්ත්‍රීපුරුෂ භාවීය ප්‍රචණ්ඩත්වය.

### හැඳින්වීම

571. කොමිටියේ විමර්ශනයේ වඩාත්ම කම්පාවට පත් සොයා ගැනීමක් වන්නේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද ස්ත්‍රීන් මෙන්ම පුරුෂයන්ද වින්දිතයන් වූද බොහෝවිට අතිශයෙන් කුරිරු වූද ලිංගික ප්‍රචණ්ඩත්වයේ ප්‍රමාණයයි. බොහෝ විට නැවත නැවතත් දූෂණය කිරීම විශේෂයෙන්ම කම්පා සහගත ය. එල්ටීටීඊය ලිංගික ප්‍රචණ්ඩත්වයට වගකිව යුතු බව දැක්වෙන කිසිදු තොරතුරක් අපට ලැබී නැත. කිසියම් කෙනෙකු ලිංගික අපහරණය හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳව වගකිව යුතුයැයි සොයා ගත හොත් එල්ටීටීඊයෙන් දැඩි දඬුවම් ලබා දීමේ අවදානමක් තිබුණ බව ද විවිධ ආරංචි මාර්ග දක්වති.

572. කොමිටියේ විමර්ශනයට පෙර ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැක කළ පුද්ගලයන්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගන්නා බවට සාක්ෂි රාශියක් එකතුවෙමින් තිබිණ. [533] විමර්ශන කොමිටිය එහි මැන්ඩේට් බලය අනුව මූලික වශයෙන් අවධානය යොමු කෙළේ සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ දී සහ ඉන් පසුව සිදු කරන ලදැයි චෝදනා කෙරෙන ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරේය. පහත ඇති කොටස්වලින් ප්‍රශ්න කිරීමේ සැසිවලදී සිදු කර ඇති ලිංගික වධහිංසා සහ ප්‍රශ්න කිරීමේ සැසිවලින් බැහැරව සිදු කළ බව පෙනෙන දූෂණය කිරීමේ රටාවන් විස්තර කරනු ඇත. මෙම පරිච්ඡේදයෙන් සාමාන්‍ය ජනතාව සහ අවි බිම තබා ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලට පැමිණි එල්ටීටීඊ කාර්යධරයන් පරීක්ෂා කිරීමේ විවිධ ක්‍රියාවලින්ට ලක් කිරීමේ දී සිදුව ඇති ලිංගික අපහරණ පිළිබඳ වාර්තා මෙන්ම මනික් ෆාම් හි තිබූ සරණාගත කඳවුරුවලදී සිදුව ඇති එවැනි අපහරණ ගැන වාර්තා ද විමර්ශනය කෙරෙනු ඇත. අවසාන කොටසකින් ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව යුක්තිය ඉටු කිරීම සහ වගවීම ගැනද පරීක්ෂා කෙරේ.

573. විමර්ශන කොමිටියට එහි මැන්ඩේට් බල කාල සීමාවට ඔබ්බෙන් සිදුව ඇති ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා ඉදිරිපත්ව ඇත. ගැටුමෙන් පසුව සහ මේ දක්වාම පවා, හමුදාකරණය වූ උතුරේ ජීවත් වන ස්ත්‍රීන් හමුදාව විසින් දූෂණයට හා වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ සූරාකෑමට ලක්වීමේ අවදානමක් පවතින බවට නොයෙකුත් චෝදනා පවතී. එවැනි චෝදනා විමර්ශනය සහ ඒවාට විසඳුම් යෝජනා කිරීම විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩක් නොමැතිවීමෙන් සහ එවැනි සිද්ධීන් වාර්තා කෙරෙන ස්ත්‍රීන් පලිගැනීමට

---

[533] නිදසුනක් වශයෙන් 2013 පෙබරවාරි 'අප ඔබට පාඩමක් උගන්වන්නම්' –ශ්‍රී ලංකාවේ හමුදා දෙමළ ජාතිකයන්ට එරෙහිව සිදු කළ ලිංගික ප්‍රචණ්ඩතා HRW " නොනිමි යුද්ධය ශ්‍රී ලංකාවේ වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩත්වය 2009- 2014 Yasmin sooka Bar Human Rights Committee of England and Wales and the international Truth and Justice Project', Sri Lanka March 2014 වධ හිංසාවලින් නිදහස්වීම ශ්‍රී ලංකාව 2014 ඔක්තෝබර් මස මානව අයිතිවාසිකම් කොමිටියට ඉදිරිපත් කළ යාවත්කාලීන කරන ලද 5 වැනි වාරික සමාලෝචනය උතුරු නැගෙනහිර ස්ත්‍රීන්ගේ අනාරක්ෂිත භාවය, ICG 20 දෙසැම්බර් 2011. "වරදට දඬුවම් නොලැබ සිටීමේ දිවයින" International Crimes Evidence Project February 2014 " ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මානව වර්ගයාට එරෙහි අපරාධ" Sri Lanka Campaign for Peace and Justice, 4 March 2014

ලක්වීමේ බරපතළ අවදානමක් පැවතීමෙන් අතිශයෙන් සංවේදී වේ. එවැන්නක් අපරාධකරුවන් හැඳින ගැනීමට සහ ඔවුන්ට දඬුවම් දීමටත් වැළැක්වීමේ පියවර ගැනීමටත් ආරක්ෂක හමුදා විසින් සිදු කෙළේයැයි චෝදනා කරන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුළුල් විමර්ශනයක කොටසක් විය යුතුය.

574. විමර්ශන කොමිටිය 2005 සහ 2008 අතර ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූයේයැයි කියන රැඳවියන්ව සිටි පුද්ගලයන් ගණනාවක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වූයේය. 2004 ට පෙර වධහිංසාවන්ට ලක්වූ වින්දිතයන් අතර වැඩ කළ එක් සාක්ෂිකරුවෙක් ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද පිරිමින්ගේ සහ ස්ත්‍රීන්ගේ ප්‍රජනන ප්‍රදේශ පිළිස්සීම, පිරිමි රැඳවියන්ගේ ශිෂ්නය තුළට සිහින් කම්බි කූරු ඇතුළු කිරීම, ස්ත්‍රී සහ පුරුෂ රැඳවියන්ගේ ගුද මාර්ගයට යම් යම් දේ ඇතුළු කිරීම සහ ස්ත්‍රී රැඳවියන්ගේ යෝනිය තුළට බෝතල් ඇතුළු කිරීම මෙන්ම ප්‍රජනන ඉන්ද්‍රිය තුළට මිරිස් කුඩු ඉසීම හෝ ඇතුළත් කිරීම වැනි ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධීන් ගණනාවක් ලේඛන ගත කළ බව විමර්ශකයන්ට කීවේය. මෙම ක්‍රම සියල්ලම පාහේ විමර්ශන කොමිටිය වඩාත් මෑතකදී පරික්ෂා කොට ලේඛන ගත කළ සිද්ධීන්වලද තිබීමෙන් එවැනි භාවිතා දිගටම පවත්වා ගෙන එන බව දක්වයි.

575. විමර්ශන කොමිටියේ මැන්ඩේට් කාල සීමාවට පෙර වසරවල සිදුවූ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ වාර්තාකරු වැනි එක්සත් ජාතීන්ගේ විශේෂ මැන්ඩේට් බලය හිමි අය විසින් ද ලේඛන ගත කර ඇත. විමර්ශන කොමිටියට ලැබී තිබුණු කාල සීමාව ඇතුළත කලින් පැවති ලිංගික ප්‍රචණ්ඩත්ව රටාවන් විමර්ශනය කිරීමට කාලයක් හෝ ගැටුමට සම්බන්ධයක් නැති රැඳවියන් ද එවැනි හිරිහැරවලට ලක් වූයේද යන්න තක්සේරු කිරීමට හැකියාවක් වූයේ නැත. මෙයද ආරක්ෂක හමුදා විසින් සිදු කර ඇති ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුළුල් විමර්ශනයක කොටසක් විය යුතුය.

576. විමර්ශනයේ දී විමර්ශන කොමිටිය සිය මැන්ඩේට් බල කාල සීමාව ඇතුළත ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ 30 ක් සමග සම්මුඛ සාකච්ඡා කෙළේය. ඉන් දහඅටක් පිරිමින්ය. 12 ක් ගැහැනුය. විමර්ශන කොමිටියට අනෙකුත් මූලාශ්‍රවලින් ද සවිස්තරාත්මක තොරතුරු ලැබිණ. එම තොරතුරු බොහොමයක් විමර්ශන කොමිටිය සිය සාකච්ඡාවලින් රැස්කර ගත් තොරතුරු සමග ගැලපේ. විමර්ශන කොමිටිය ඔවුන් ඒවා දුටු නිසා හෝ එවැනි සිද්ධීන් ලේඛන ගත කිරීමේ තම වැඩ කටයුතු නිසා හෝ ආරක්ෂක හමුදා සමග ඔවුන්ගේ සම්බන්ධතාවයක් ඇති නිසා හෝ එවැනි සිද්ධීන් ගැන ඍජු නොවූ තොරතුරු ඇති වෙනත් මූලාශ්‍ර ගණනාවක් සමග ද සාකච්ඡා කෙළේය. විමර්ශන කොමිටියට ( අදාල වින්දිතයාගේ අනුමැතිය ඇතිව) වෛද්‍ය වාර්තා බැලීමටද අවස්ථාවක් ලැබුණ අතර ඒවායේ තොරතුරු ලිංගික ප්‍රචණ්ඩත්වය ගැන ඇති චෝදනා සමග ගැලපේ.

577. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් ගැන තොරතුරු රැස් කිරීම, එවැනි කරුණු ගැන සාකච්ඡා කිරීමේ දී පවතින තහංචි, කම්පනය සහ වින්දිතයා විසින් අත්විඳින ලද ලැජ්ජාව මෙන්ම සිද්ධියෙන් ඇති කරවන චිත්ත පීඩාව නිසා හැම විටම විශේෂයෙන්ම අභියෝගයකි. විමර්ශන කොමිටිය විසින් සාකච්ඡාවට එක් කර ගත් සාක්ෂිකරුවන් සහ වින්දිතයන් කෙනෙක් නොහැර සියලු දෙනාම එම අත්දැකීමෙන් ගැඹුරින්ම පීඩාවට පත්ව සිටින අතර පශ්චාත් ක්ෂතීය පීඩාව සඳහා ප්‍රතිකාර ලබා ගෙන ඇත. සමහරු ලිංගික අපහරණය විස්තර කරන අවස්ථාවේ දී හඬා වැටුණ අතර නින්දාව, ලැජ්ජාව සහ අවමානය පිළිබඳ හැඟුම් ප්‍රකාශ කළහ. ''ලිංගික වධහිංසාව මානසිකව වඩාත් වේදනාකාරීය. එය පහරදීමටත් වඩා නරකයැ''යි එක් සාක්ෂිකරුවෙක් පැවසුවේය.[534]

578. ''පිරිමි සහ ස්ත්‍රී වින්දිතයන් පවසන ආකාරයට වඩාත්ම දැඩි සහ නිරන්තරයෙන්ම පවතින මානසික හානිය වන්නේ රඳවා ගැනීමේ දී සිදු කරන ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් ඇති කරන අත්දැකීමයැයි'' වධහිංසා වින්දිතයන්ට සහාය ලබා දෙන සංවිධානයක් සඳහා වැඩ කරන විශේෂඥයෙක් කොමිටියට පැවසුවේය. එහි දීර්ඝකාලීන කායික සහ මානසික බලපෑම් ඇතැයිද

[534] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ඔහු අවධාරණය කෙළේය. ''ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් ඇති කරවන හානිය ඔවුන්ගේ දෛනික ජීවිතයේ විශාලතම සහ සියල්ලටම ගලා යන හානියක්''[535] බව පැහැදිලිය.

579. ලිංගික ප්‍රචණ්ඩත්වයේ ක්ෂතීය වඩාත් සංකීර්ණ වන්නේ ශ්‍රී ලංකාවේ සිටින පවුලේ සාමාජිකයන් ගැන ඇති බිය නිසාය. ඔවුන්ගෙන් සමහරෙකුට පසුව තර්ජන සහ හිරිහැර කිරීම් සිදු විය. ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් වූ කීප දෙනෙකුම සිය දිවි නසා ගත්හ. නැතිනම් දිවි නසා ගැනීමට උත්සාහ කළහ.[536]

580. තොරතුරු රැස් කර ගැනීමේ අභියෝග තිබුණ නමුත් පහත ඡේදවලින් සිදු කරන ලද ලිංගික ප්‍රචණ්ඩත්වයේ පුළුල් සහ කුරිරු බව පැහැදිලි කෙරේ.

**ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා ගැන රජයේ ප්‍රතිචාර.**

581. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා පූර්ණ වශයෙන් විමර්ශනය කොට අපරාධකරුවන් අධිකරණය හමුවට ගෙන ඒම තහවුරු කිරීම වෙනුවට ආණ්ඩුව දිගින් දිගටම තම ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද්දේයැයි කියන දූෂණය කිරීම් සහ අනෙකුත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම හෝ එහි බරපතළකම අඩු කිරීමට දිගින් දිගටම උත්සාහ ගත්තේය.[537]ලිංගික අපහරණ චෝදනා පවතින බව පිළිගත් ගත් නමුත් විශාල වශයෙන් අපහරණ කිරීම් ප්‍රතික්ෂේප කර වින්දිතයන් අපකීර්තියට හා අවමන් කිරීමට ලක්විය. ආපදා කළමනාකරණ සහ මානව අයිතිවාසිකම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් රජීව විජේසිංහ 2009 දෙසැම්බර් මස මෙසේ කී බව වාර්තා විය. ''කඳවුරු තුළ බොහෝ ලිංගික ක්‍රියා'' සිදුවන නමුත් වාර්තාවන අපහරණ බොහොමයක් රැඳවියන් විසින්ම සිදු කරන ලද බව ඔහු කියා සිටියේය. ''මම එහි නොසිටි නිසා කිසිත් වූයේ නැතැයි මට කිව නොහැකියි. සමහර හුදකලා සිද්ධීන් විය හැකි නමුත් අපගේ ස්ථාවරය වන්නේ එවැනි සිදු වූයේනම් කරුණාකර අපට කියන්න. අප ඒ ගැන සොයා බලනවා.'' යනුවෙන් ඔහු පැවසුවේය. එක්සත් ජාතීන්ගේ ආයතනයක් ඉදිරිපත් කළ වාර්තාවක් ගැන තමා දන්නා නමුත් ඒ ගැන කරුණු තහවුරු කර ගැනීම ඉතාමත් අපහසු බවද විජේසිංහ කීවේය. ''හමුදා භටයෙක් ප.ව. 11.00 ට කුඩාරමක් තුළට ගොස් පෙ.ව. 3.-00 ට එළියට ආ බවට වාර්තා වෙනවා. ඒ ලිංගිකාස්වාදයට වෙන්න පුළුවන්. කැමැත්ත ඇතිව ලිංගිකාස්වාදය ලබා ගත්තා විය හැකිය. නැතිනම් පරණ ග්‍රීක දර්ශනවාදය ගැන සාකච්ඡා කරන්න වෙන්න පුළුවන්. අපිට කියන්න බැහැ.'' [538]

582. වසර ගණනාවකට පසුව 2013 පෙබරවාරි මස ආරක්ෂක අමාත්‍යාංශය කීවේ මෙවැනි දෙයකි. ''ආණ්ඩුවට තහවුරු කළ හැකි වන්නේ 2009 මැයි 19 සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ස්ත්‍රී දූෂණ සහ ලිංගික අපහරණ සිද්ධීන් 210 කින් පොලීසිය සහ CDS ඇතුළත් ශ්‍රී ලංකා සන්නද්ධ බලකාවල සාමාජිකයන් විසින් සිදු කර ඇති සිද්ධීන් 20 ක් පමණි. ඒ පිළිබඳව පියවර ගෙන ඇති අතර විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී.[539]කෙසේ වුවත් මෙම සංඛ්‍යා ආරක්ෂක අමාත්‍යාංශයෙන් දී ඇති ඒවාට පරස්පරය. [540] එම කාල සීමාව සඳහා ඉදිරිපත් කරන වගුවකින් පෙන්නුම් කරන්නේ අධිකරණ හෝ හමුදාවේ විනය ක්‍රියා මාර්ග ගෙන ඇත්තේ දූෂණ සිද්ධීන් හතරක් සහ ලිංගික අපහරණ සිද්ධියක් ගැන පමණි. ( ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධිකරණ විමර්ශන සඳහා පහත ඇති ඡේදය බලන්න.)

---

[535] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[536] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[537] එක නිදසුනක් මෙසේය: රටේ යුද කලාපයෙන් පලා එන දෙමළ ජාතිකයන් සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති කඳවුරුවල ස්ත්‍රීන් දූෂණය වන බව ස්කයි නිව්ස් ට දැන ගැනීමට ඇත. ආණ්ඩුවෙන් පාලනය වන කඳවුරුවල සිදුවන ලිංගික අතවර ගැන වාර්තා රාශියක් ඇත. තරුණයින් කණ්ඩායම් වශයෙන්ම බැහැර ගෙන යන බවද පැවසේ. http://news.sky.com/story/694545/claims-of-abuse-in-sri-lankan-refugee-camps

[538] http://www.theguardian.com/world/2009/dec/20/tamil-tigers-sri-lanka-refugees

[539] ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවිය. 2013 පෙබරවාරි

[540] Humanitarian Operation Factual Analysis MOD Op cit (p 79)

583. විමර්ශන කොමිටිය ද දුටු යාපනය ආරක්ෂක හමුදා අණදෙන නිලධාරි මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ අල් ජසීරා රූපවාහිනී සේවය සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවේ දී පැහැර ගැනීම්, වධහිංසා පැමිණවීම් සහ දූෂණ පිළිබඳ වාර්තා අවඥාවෙන් බැහැර කෙළේය. '' මම හිතන්නේ මගේ සිනහවෙන් කතාව කියවෙනවා'' ඔහු කීවේය. ''ඔය කතා සියල්ල ගොතපු ඒවා. කිසිම පදනමක් නැහැ. ඒ ගොල්ලන්ට එක්සත් රාජධානියේ ඉන්න ඕන නිසා කී ඒවා. ඒ ගොල්ලන්ට පිටරටවලම ඉන්න ඕන නිසා කියන කතා. ඕවා ඔක්කොම බොරු. ඔක්කොම බොරු.'' [541]

584. ආණ්ඩුව මානව අයිතිවාසිකම් මණ්ඩලයේ 24 වැනි සැසි වාරයට කළ ප්‍රකාශයකින් 2007 – 2012 කාල සීමාව ආවරණය වන ආකාරයට සිදු කළ සමීක්ෂණයකින් උතුරෙන් වාර්තා වන ලිංගික ප්‍රචණ්ඩත්ව සිද්ධීන් අති බහුතරයක් සිදු කර ඇත්තේ සමීප ඥාතීන්/අසල්වැසියන් විසින් බවත් ආරක්ෂක හමුදාවන්ට පැවරිය හැකි වන්නේ ඉතා සුළු සංඛ්‍යාවක් බවත් හෙළිවන්නේයැයි සඳහන් කරයි. ආණ්ඩුව නැවතත් ආරක්ෂක හමුදාවල පුද්ගලයන් සම්බන්ධ සියලු සිද්ධීන් ගැන විනය සහ අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඇතැයි පවසයි. ''හමුදාව මෙම පුද්ගලයන් පිට කිරීමට හෝ දඬුවම් පැමිණවීමට දැඩි පියවර ගෙන ඇත. වැඩි දුරටත් සිවිල් අධිකරණයේ නඩු පවරා ඇති අතර ඒවා අධිකරණයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ විභාග වෙමින් පවතී......'' 20-14 මැයි මාසයේ මානව අයිතිවාසිකම් මණ්ඩලයට මහ කොමසාරිස් ඉදිරිපත් කළ වාර්තාවට ප්‍රතිචාර වශයෙන් ආණ්ඩුව නැවතත් මෙසේ සඳහන් කරයි. '' උතුරේ ලිංගික ප්‍රචණ්ඩත්වයට ස්ත්‍රීන් ලක්වීමේ අවදානමට ආරක්ෂක හමුදා දායකවීම සම්බන්ධයෙන් මහ කොමසාරිස් ප්‍රකාශ කර ඇති කණස්සල්ලට පදනමක් නොපවතී. ආණ්ඩුව ස්ත්‍රීන්ට සහ තරුණියන්ට එරෙහිව සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියා සියල්ල ගැන කණගාටුවන අතර වාර්තා වූ සියලු සිද්ධීන් ගැන වාස්තවික පියවර ගෙන ඇති අතර ඉදිරියටත් එසේ කරනු ඇත.''[542]

585. සරණාගතයන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂ වාර්තාකරු චලෝකා බෙයානි උතුරේ දිගටම සිදු වන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා ගැන මතුකර ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා ''ගැටුමෙන් ශේෂ වූවක් බව''ආණ්ඩුව සඳහන් කරයි. '' ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළත් අභ්‍යන්තරව අවතැන් වූ ස්ත්‍රීන්ගේ මානව අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනයවීම් ගැන වාර්තාවේ ( විශේෂ සම්බන්ධීකාරකගේ) ඇති සඳහන් කිරීම්වල සත්‍යතාවයක් නැති අතර ඒවා සාවද්‍යය. ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහිව දැඩි නීති පියවර ගෙන ඇත. අභ්‍යන්තරව අවතැන් වූ ස්ත්‍රීන්ගේ මානව අයිතිවාසිකම් විශාල වශයෙන් උල්ලංඝනය වූ බවට චෝදනා නැත.''[543]

***විමර්ශන කොමිටිය (OISL) විසින් ලේඛනගත කළ ලිංගික ප්‍රචණ්ඩත්ව රටා.***

***පුද්ගලයන් ඉලක්ක කර ගත් පැහැර ගැනීම් සහ සමූහ වශයෙන් රඳවා ගැනීමෙන් පසුව සිදු වූ ලිංගික ප්‍රචණ්ඩත්වය .***

586. ඉහතින් දැක් වූ ආකාරයට කොමිටිය විසින් වින්දිතයන් සමග කරන ලද ඍජු සාකච්ඡා තුළින් සහ වෙනත් විශ්වාස කටයුතු තොරතුරු මූලාශ්‍රවලින් වධහිංසා හෝ හිරිහැර කිරීමේ ඉතාමත් කුරිරු ආකාරයක් ලෙස සහ සමහර විට සමූහ වශයෙන් දූෂණය කිරීමක් වන ලිංගික සූරාකෑමක ආකාරයෙන් රැඳවියන්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගත් බව දැක්වෙන තොරතුරු අතිවිශාල ප්‍රමාණයක් රැස් කර ගෙන ඇත. පුරුෂ රැඳවියන්ද ස්ත්‍රී රැඳවියන් මෙන්ම ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් විය හැකිය.

587. බොහෝ සිද්ධීන් වලදී අපරාධය සිදු කෙළේයැයි හැඳින්වෙන අයගේ ආකල්පය සාක්ෂිකරුවන් විසින් විස්තර කෙළේ බොහෝවිට වින්දිතයන් 'දෙමළ බල්ලන්' ලෙස හඳුන්වමින් ඔවුන්ට වධහිංසා පැමිණවීමේ සහ අවමන් කිරීමේ පියවරක් සේ ය. අරමුණ වූයේ පුද්ගලයා

---

541 Scars of Sri Lanka, Al Jazeera report, December 2013

542 ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳව මානව අයිතිවාසිකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයෙන් කෙටුම්පත් කළ වාර්තාවට ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත කාර්යාලයෙන් ඉදිරිපත් කළ අදහස් (A/HRC/25/23) para 14

543 A/HRC/26/33/Add.6.විශේෂ වාර්තාකරුගේ වාරිතාව ගැන රජයේ අදහස් ඡේද, 36-37

චෛතසික සහ කායික වශයෙන් දුර්වල කිරීමය. වාර්තා වූ සිද්ධීන් බොහොමයක් සිදුව ඇත්තේ 2009 දී සහ 2010 දීය. 2005 සහ 2008 අතර රැඳවියන්ව සිටි අය ගේ ප්‍රකාශවලින් ද විස්තර කෙරෙන ලිංගික ප්‍රචණ්ඩත්වයේ රටාවන් සහ ක්‍රම පසුව වාර්තා වූ සිද්ධීන් වලදී ද ඒ ආකාරයටම යොදා ගෙන ඇත. අපරාධය සිදු කෙළේයැයි පැවසෙන පුද්ගලයන් බොහෝ දෙනෙකු පුරුෂයන් වුවද ස්ත්‍රී නිලධාරීන් ද ලිංගික අපහරණයේ යෙදුණ බව සාක්ෂිකරුවෝ සඳහන් කළහ.

589. කලින් පරිච්ඡේදයේ වධහිංසා සිදු කළ රැඳවුම් ස්ථානවල ලැයිස්තුවක් සඳහන් විය. ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට නිල වශයෙන් ගැසට් කළ රැඳවුම් මධ්‍යස්ථාන මෙන්ම හමුදා කඳවුරු මෙන් නිල වශයෙන් පිළිනොගත් රැඳවුම් මධ්‍යස්ථානද යොදා ගැනිණ. නිදසුනක් වශයෙන් මේජර් ජනරාල් ජගත් ජයසූරියගේ අණ යටතේ වවුනියාවේ ආරක්ෂක හමුදා මූලස්ථානයේ පැවති ජොසප් කඳවුර ( හමුදා බුද්ධි අංශය පිහිටියේ මෙහි වුවද CID සහ TID වැනි අංශ මෙහි සිදු වූ ප්‍රශ්න කිරීමේ සහ වධහිංසා පැමිණවීමේ අවස්ථාවලට සහභාගි වූයේයැයි වාර්තාවේ.) වඩාත් වැඩියෙන් සඳහන් වන එවැනි ස්ථානයකි. අනෙකුත් ස්ථාන වන්නේ කොළඹ සහ වෙප්පන්කුළම් හි TID සහ CID ස්ථාන, බූස්ස රැඳවුම් කඳවුර, ඕමන්තෙ මධ්‍යම මහා විද්‍යාලය, පුන්තෝට්ටම් කඳවුර, පිලිනෙර්වා කඳවුර සහ වැලිකන්ද පුනරුත්ථාපන කඳවුරයි.

590. සමහර පුද්ගලයන් ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ අනෙකුත් ආකාරයේ වධහිංසාවලට ලක් වූයේ තනියෙන් සුදු වෑන්වලින් අත් අඩංගුවට ගැනීමේ රටාවෙන් පසුවය. අනෙකුත් අය ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූයේ සන්නද්ධ ගැටුමේ අවසානයේ දී සමූහ වශයෙන් රඳවා ගැනීමෙන් පසුව පරීක්ෂා කිරීමේ ස්ථානවලදී වෙන් කර ගැනීමෙන් පසුව හෝ අවතැන් වූවන් සිරගත කළ කඳවුරුවලින් පසුව ඔවුන් ඉවත් කර ගැනීමෙනි. ගැටුමේ අවසානයේ භාරවූ සමහර පුද්ගලයන් පසුව නිදහස් කර නැවත වරක් අත් අඩංගුවට ගැනීමෙන් දෙවන රඳවා ගැනීමේ දී වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් කර ඇත.[544]

591. විමර්ශන කොමිටිය මගින් රැස්කරන ලද සියලු තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් හුදකලා ක්‍රියා නොව ( තොරතුරු ලබා ගැනීම සඳහා තර්ජනය කිරීම, අවමන් කිරීම සහ බිය ඇති කිරීමට) වධහිංසා පැමිණවීමට සිතාමතාම යොදා ගත් ප්‍රතිපත්තියක කොටසකි යන්නයි. රැඳවුම් මධ්‍යස්ථාන විශාල ගණනාවක කාල සීමාවක් තුළ සහ ආරක්ෂක හමුදා සමාන ක්‍රම යොදා ගනිමින් අනුගමනය කළ රටාවන්ගේ එය ආරක්ෂක හමුදා තුළ ආයතනගත වූ ප්‍රතිපත්තියකි යන නිගමනය තහවුරු කරයි.

***ලිංගික ප්‍රචණ්ඩත්වය ප්‍රශ්න කිරීමේ දී වධහිංසා හෝ කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකීමේ හෝ දඬුවම් ආකාරයක් ලෙස.***

592. ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූයේද නැත්ද යන්න කෙසේ වුවත් කොමිටිය සාකච්ඡා කළ හිටපු රැඳවියන් බොහෝ දෙනෙකු සමහරවිට රැඳවුම් මධ්‍යස්ථානවලට පැමිණීමේ දී සහ බොහෝවිට ප්‍රශ්න කරන අවස්ථාවේ දී බලහත්කාරයෙන් සම්පූර්ණයෙන්ම හෝ අඩ වශයෙන් නිරුවත් කිරීමට ලක් කළ ආකාරය විස්තර කළහ. ඇස් බැඳ නිරුවත්ව කැලෑ ප්‍රදේශයක නතර කර සිටි රැඳවියෙක් පැවසූ ආකාරයට '' ගහන්නේ නැතිව මරා දමන්නැයි ගැහැනු බැගෑපත්වනු මට ඇසුණා. මට හිතෙනවා ඒ ගැහැනු ලිංගික ප්‍රහාරයන්ට ලක්වන්න ඇත කියා. මට හිතාගන්න එක් මනුෂ්‍යයෙක් තවත් කෙනෙකුට මෙහෙම කරන්නේ කෙසේද කියා.'' නිරුවත් කොට එල්ලා ලේ වැගිරෙන තෙක් පහර දුන්නේයැයි තවත් පුද්ගලයෙක් කොමිටියට පැවසුවේය.[545]

593. බලහත්කාරයෙන් සම්පූර්ණයෙන්ම හෝ අඩ වශයෙන් නිරුවත් කිරීම නින්දා කිරීමේ සහ අවමන් කිරීමේ සැලකීමක් ලෙස සැලකිය හැකිය. මෙම සැලකීම වඩාත් වැඩි වන්නේ එහි සිටින

---

[544] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ. කලින් රැඳවියන්ව සිටි අය නිතිපතා හමුදා කඳවුරුවලට සීඅයිඩියට හෝ ටීඅයිඩියට වාර්තා කළ යුතු අතර ඔවුන් ගැන සෝදිසියෙන් සිටින ලදී. පොලීසිය සහ බුද්ධි අංශ එල්ටීටීඊ වැඩ කටයුතු හා සම්බන්ධකම් ඇතැයි හෝ ඒ පිළිබඳ තොරතුරු දන්නේයැයි සිතන අය ගැන අවධානයෙන් සිටී.

[545] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ සරදම් වචනවලිනි. මීට අමතරව හමුදාවේ නිලධාරීන් නිරුවත් ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ ඡායාරූප ගත් බවට හෝ වීඩියෝ ගත කළ බවට චෝදනා විමර්ශන කොමිටියට ඉදිරිපත් විය. සමහරු පියයුරු හෝ ජනනේන්ද්‍රිය නුසුදුසු ආකාරයට ස්පර්ශ කළ බව කීහ. තමා නිරුවත් කොට ජනනේන්ද්‍රියන්ට පහර දෙන විට එතැන සිටි අනෙක් අය සිනා සෙමින් සිටි ආකාරය කලින් සිටි රැඳවියෙක් විස්තර කෙළේය. තවත් අයෙකුට නිරුවත්ව පිනුම් ගැසීමටත් අනෙකෙකුට නිරුවත් කොට පුටුවක් හිස තබා නැටීමටත් අණ කළ බව කීහ.[546] නිරුවත් හෝ අඩනිරුවත් ස්ත්‍රී රැඳවියන් වෙනත් ආකාරයේ අපහරණයන්ට ලක් වූවේයැයි සිතිය හැකි බලවත් වේදනාවෙන් සිටිනු දුටු බව කලින් රැඳවියන්ව සිටි ගණනාවක්ම වාර්තා කළහ.

594. ප්‍රශ්න කිරීමේ දී, රැඳවියන්ගේ ලිංගේන්ද්‍රිය පයින් පෑගීම, ලිංගේන්ද්‍රියට සහ කලවාවල ඇතුල් පැත්තට පහරදීම සහ පයින් ගැසීම, ලිංගේන්ද්‍රියට මිරිස් කුඩු ඉසීම, පුරුෂ ලිංගය තුළට යකඩ හෝ කම්බි කූරු යැවීම, පියයුරු පිළිස්සීම, අඬුවලින් පියයුරු මිරිකීම, ගුද මාර්ගයට අයිස් කුට්ටි ඇතුළත් කිරීම, වධහිංසා පමුණුවන්නන් විසින් පුරුෂ ලිංගෙන්ද්‍රිය තදින් මිරිකීම වැනි අතිශය වේදනාව ගෙන දෙන වධහිංසාවලට ලක් වූ බව කලින් රැඳවියන්ව සිටි අය පැවසූහ. කීප දෙනෙක්ම වේදනාව නිසා සිහි නැති වූයේයැයි[547] එක් අයෙකු කීවේය. තම ශිෂ්නය මේසයක ලාච්චුවක් තුළට දමා වැසූ බව තවත් පුද්ගලයෙකු කීවේය.

595. තවත් සාක්ෂිකරුවෙකු මාස ගණනාවක් තිස්සේ තමා ජෝසප් කඳවුරේදී වධහිංසාවලට ලක් වූ ආකාරය විස්තර කෙළේය. '' ඔවුන් මට ඇඳුම් ගලවන්න කියනවා. ඊට පස්සේ මගේ ලිංගේන්ද්‍රිය මේස ලෑල්ල උඩ තියන්න කියා ඊට කෝටුවකින් තලනවා.'' ඔහු කොළඹ හතරවැනි තට්ටුවේ සී අයි ඩී කාර්යාලයට මාරු කර එවීමෙන් පසු නැවතත් ලිංගික අපහරණවලට ලක් වූ බව කීවේය. එල්ටීටීඊයට සම්බන්ධව සිටියේයැයි පාපෝච්චාරණයක් ලබා ගැනීමට වෙනත් ආකාරයේ වධහිංසාවලට ලක් කළ බවද ඔහු සඳහන් කෙළේය.[548]

596. නිරුවත් කොට උඩුකුරුව බිම දිගා කොට වධකයන් දෙදෙනෙකු ඔහු බිමට ඔබා අල්ලා ගෙන සිටිය දී අනෙකෙකු ලිංගේන්ද්‍රිය මිරිකූ ආකාරය තවත් රැඳවියෙකු විස්තර කෙළේය. ඉන් පසුව ඔහු අනෙක් අතට හරවා ඔහුගේ ගුද මාර්ගයට කිසියම් දෙයක් ඇතුළට තල්ලු කොට ආපසු ඉවතට ඇද ගැනීම කළ බවද පැවසුවේය.

597. විවිධ ප්‍රකාශ ගණනාවකින් විස්තර කරන ලද වඩාත්ම්ලේච්ඡ වධහිංසා ක්‍රමයක් වන්නේ බටයක් තුළින් ගුද මාර්ගයට කටු කම්බියක් ඇතුළු කිරීමයි. බටය ආපසු ගැනීමෙන් පසු කටුකම්බිය ආපසු ඇදීම නිසා ගුද මාර්ගයේ ''දරාගත නොහැකි වේදනාවක් සහ ලේ ගැලීමක් සිදු කරයි.''[549]තමා වධකයන් සමග ලිංගික සේවනයේ යෙදීම ප්‍රතික්ෂේප කළ නිසා මෙම වධහිංසාව පැමිණ වූ බව එක් සාක්ෂිකරුවෙකු පැවසුවේය. [550] ''ඔහු කටුකම්බිය සමග බටය නැවතත් ඇතුළට යැව්වා. ඊට පස්සේ කටුකම්බිය තිබියදී බටය ආපසු ගත්ත. මට දරා ගන්න බැරි වේදනාවක් සහ ලේ ගැලීමක් ඇති වුනා.'' ඔහු රඳවා ගෙන සිටි කාලය ඇතුළත මුඛ සංසර්ගයේ යෙදීමටත් අවස්ථා කීපයක දී සමූහ වශයෙන් දූෂණය කරනු ලැබීමට ලක් වූ බවත් ඔහු කීවේය. ජෝසප් කඳවුරේදී සිදු කරන ලදැයි කියන තවත් එවැනි සිද්ධියක් විශ්වාස කටයුතු තොරතුරු මාර්ගයකින් කොමිටියට දැන ගන්නට ලැබිණ. ශ්‍රී ලංකාවෙන් පිටතදී ලබා ගත් අධිකරණ වෛද්‍ය වාර්තාවක් අනුව ලිංගික වධහිංසා පැමිණවීමේ සලකුණක් වශයෙන් ඔහුගේ ගුද මාර්ගයේ ලේ ගැලීම් සහ දිගටම පවතින වේදනාවක් ඇති බව දැක්වේ. මේ නිසා වින්දිතයාගේ බඩවැල එළියට පැමිණීමේ සිද්ධියක් ලේඛන ගත කර ඇති බව තවත් ආරංචි මාර්ගයක් පැවසුවේය. එහෙත් එම පුද්ගලයා මිය ගොස් ඇත.[551]

---

[546] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[547] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[548] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[549] මූලාශ්‍රය වාර්තාවේ
[550] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[551] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

598. මිය ගොස් ඇති සමහරුන්ගේ සහ තවමත් ජීවත්ව සිටින නිරුවත් හෝ අඩ නිරුවත් කළ එල්ටීටීඊ කාර්යධරයන්ගේ වීඩියෝ හෝ ඡායාරූප තමන්ට ආඩම්බරයෙන් පෙන් වූ බව කලින් රැඳවියන්ව සිටි කීප දෙනෙකුම විස්තර කළහ. එක් සාක්ෂිකරුවෙකු තමන්ට නිරුවත් කළ හඬමින් සිටින එල්ටීටීඊ කාර්යධරයන් කණ්ඩායමක වීඩියෝ පටියක් පෙන් වූ බව පැවසුවේය. ඔවුන් ඝාතනය කෙළේයැයි හමුදා භටයෙක් සිනාසෙමින් ඔහුට කියා ඇත. තවත් අවස්ථාවක නිරුවත් පණ පිටින් සිටින ස්ත්‍රීන්ගේ වීඩියෝ පටියක් සහ ඉන් අනතුරුව මිය ගිය දෙමළ ස්ත්‍රීන්ගේ වීඩියෝ දර්ශන පෙන් වූ බව ආරංචි මාර්ගයක් විස්තර කෙළේය.[552] අඩුම වශයෙන් අවස්ථා දෙකක දී කලින් රැඳවියන්ව සිටි අයට ලිංගික අපහරණ වීඩියෝ දර්ශන පෙන්වා ඇත. ඉන් එකක නිරුවත් දෙමළ ස්ත්‍රියක් හමුදා භටයින් විසින් අල්ලා ගෙන සිටියදී දූෂණය කෙරේ. අනෙක් දර්ශනයේ වින්දිතයා අපහරණයට ලක්වේ. තවත් රැඳවියෙක් තමාට ''ලේ තැවරුණ බිම දමා ඇති නිරුවත් ස්ත්‍රී සිරුරු, සමහර ඒවායේ පියයුරු සහ යෝනියේ සමීප දර්ශන සහිත ඡයාරූප පෙන් වූ බව කීවේය. එල්ටීටීඊය සටනේ දී අඳින කලිසම් ඇඳ උඩුකය නිරුවත්ව බිම වාඩිවී සිටින ස්ත්‍රී එල්ටීටීඊ කාර්යධරයන් ගේ ඡායාරූප ද තිබිණ. ඔවුන්ගේ අත් පිටුපසට කර ගැට ගසා තිබිණ.[553]

599. කොමිටියට මෙම වීඩියෝ දර්ශන දක්නට නොලැබුණ නිසා එවැනි දේ පවතින බවට සහතික කළ නොහැකි නමුත් ආරක්ෂක හමුදා නිලධාරීන් එවැනි දර්ශන ගැනීමට ජංගම දුරකතන කැමරා යොදා ගැනීම අවමන් සහගත සැලකිමක් විය හැකිය. තවදුරටත් එවැනි වීඩියෝ සහ ඡායාරූප රැඳවියන්ට පෙන්වීම මානසික වධහිංසා පැමිණවීමක් විය හැකිය.

***පුළුල් වශයෙන් දූෂණය කිරීම පිළිබඳ චෝදනා.***

600. ලිංගික වින්දිතයන් 30 ක ගෙන් දහඅට දෙනකු ( පිරිම අටක් සහ ගැහැනු 10 ක්) සිරුරේ කොටස්වලින් හෝ ගුද මාර්ගයට යම් යම් දේ ඇතුළු කිරීමෙන් දූෂණයට ලක් වූ බව කොමිටියට පැවසූහ. අනෙකුත් මූලාශ්‍රවලින් ලබා ගත් ප්‍රකාශනවලින් රඳවා ගැනීමේ දී දූෂණය බහුල වශයෙන් සිදු කර ඇති බව දක්වේ. විස්තර කරන ලද දූෂණය කිරීම් බොහොමයක් ප්‍රශ්න කරන අවස්ථාවේ දී සිදු වූ බවක් නොපෙනේ. එකිනෙකට ගැලපෙන ප්‍රකාශ ගණනාවක් අනුව ස්ත්‍රී සහ පුරුෂ යන දෙකොටසේම රැඳවියන් තම වධකයන්ට මුඛ සංසර්ගය ලබා දීමට බල කරන ලද අතර ශුක්‍ර ධාතු මුඛයටම හෝ සිරුරට පිට කර ඇත.

601. සමහරවිට රැඳවියන් සති හෝ මාස ගණනාවක් එකම පුද්ගලයෙකුගෙන් දූෂණයට ලක්ව ඇත........ අඩුම වශයෙන් එක සිද්ධියකදී ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරියෙකු විසිනි. ''මා රඳවා සිටි වසර හතර ඇතුළත අවස්ථා කීපයකදී මා දූෂණය කළා. මා දූෂණය කළ අවස්ථා ගණන මට මතක නැහැ. සමහරවිට මාස ගණනාවක් සතියකට හතර පස් වතාවක්. මා තවමත් ඒ වේදනාවට ප්‍රතිකාර ගන්නවා. ඒ සෑම අවස්ථාවකම මාව දූෂණය කෙළේ එකම නිලධාරියා යි..... එම පුද්ගලයා ඇඳ සිටියේ හමුදා නිල ඇඳුම්. මට හිතෙන්නේ එයා තරමක ඉහළ නිලධාරියෙක්. අනෙක් හමුදා භටයන් ඔහුට ආචාර කළා. එය සිදු කෙළේ දරුණු ආකාරයට. මට පණ නැතිව ගියා. මම ඒ දේ ගැන කාටවත් කිව්වේ නැහැ. අනෙක් රැඳවියන් මගෙන් ඇහුවා ඇයි පිටි පස්සෙන් ලේ ගලන්නෙ කියා. මම කිව්වේ මට පොල්ලකින් ගැහුවා කියා. [554]

602. සාකච්ඡා කළ ස්ත්‍රී සහ පුරුෂ රැඳවියෝ තම කුටි තුළදී හෝ රාත්‍රියේ දී වෙනත් කාමරවලට ගෙන ගොස් එක පුද්ගලයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් විසින් නැවත නැවතත් දූෂණයට ලක්වන බව වාර්තා කළහ. සමහර අවස්ථාවල එම පුද්ගලයන්ගෙන් මත්පැන් ගඳ වහනය වූ බව ද පැවසූහ. බොහෝවිට මනික් ෆාම් කඳවුරෙන් තරුණියන් ජෝසප් කඳවුරට ගෙන එන ලෙස තමන්ට උපදෙස් ලැබෙන බවත් එසේ ගෙන එනු ලබන තරුණියන් ජෝසප් කඳවුරේ දී දූෂණය කරන බවත් යුද හමුදාවට සමීප පුද්ගලයෙක් කොමිටියට පැවසුයේය. [555]

[552] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[553] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[554] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[555] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

603. විමර්ශන කොමිටිය සාකච්ඡා කළ අයගෙන් ප්‍රශ්න කිරීමේ දී කිසියම් ආකාරයක ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ කලින් රැඳවියන්ව සිටි අය දූෂණය කර ඇත. බොහෝ අවස්ථාවලදී දූෂණය කිරීමේ සැබෑ අරමුණ වන්නේ සෘජුවම තොරතුරු ලබා ගැනීම නොව වින්දිතයන්ගෙන් ලිංගික ආශ්වාදය ලබා ගැනීම, අවමානයට සහ අපහාසයට ලක් කිරීම සහ අල්ලා ගනු ලැබූ අයගේ ග්‍රහණය යටතේ අත් අඩංගුවේ පසුවන සහ ආරක්ෂාවීමේ බලයක් නැති රැඳවියන් දූෂණය කිරීමෙන් අවමානයට ලක් කිරීම වැනි කරුණු ගණනාවක එකතුවකි. ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු කිරීමේ දී නිරන්තරයෙන්ම 'දෙමළ බල්ලන්'යැයි අපහාස කිරීමෙන් රැඳවියන් අවමානයට ලක් කිරීමේ ලක්ෂණය වඩාත් තහවුරු වේ. දූෂණය කිරීම බොහෝවිට රැඳවියන්ගෙන් තොරතුරු ලබා ගැනිමට සහ/හෝ 'පාපෝච්චාරණ' අත්සන් කිරීමට බල කිරීමේ ක්‍රමයක් ලෙස ද යොදා ගන්නා ලදී.

604. සාකච්ඡාවට සහභාගි වූ තිදෙනෙක් – එක පුරුෂයෙක් සහ ස්ත්‍රීන් දෙදෙනෙක් - රැඳවුම් මධ්‍යස්ථාන තුනකදී අඩුම වශයෙන් අවස්ථා තුනකදී ඔවුන්ට සිහි නැතිව තිබියදී දූෂණයට ලක්ව ඇත. ඔවුන් වෙන් වෙන් වශයෙන් තමන් අවදිවන විට ජනනේද්‍රිය ප්‍රදේශයේ දැඩි වේදනාවක් පැවති බව කීහ. ඔවුන්ගෙන් එක් අයෙකුට සිහි නැතිවන තෙක් මත්පැන් පානය කිරීමට සැලසූ බව කීවේය. ඔහුට සිහි එළඹුන පසු ඇවිදීමට අපහසු තත්වයේ පසුවිය. එක් සාක්ෂිකාරියක් අවදි වන විට ඇගේ ඇඳුම් අඩ වශයෙන් ඉවත් කර තිබූ අතර යෝනියෙන් ලේ ගලමින් තිබූ බවත් පියයුරුවල දත් පහර සටහන්ව තිබූ බවත් පැවසුවාය.

605. ප්‍රශ්න කිරීමේ දී නැවත නැවතත් වධහිංසාවට ලක් වූ සාක්ෂිකාරියක් දිනක් රාත්‍රියේ හමුදා නිල ඇඳුම් ඇඳගත් දෙදෙනෙකු සිටි කාමරයකට ගෙන ගිය බවත් එහිදී පැට්‍රොල් සුවඳ දැනුණ ප්ලාස්ටික් බෑගයක් හිස වටා දැමීමෙන් පසුව සිහි නැති වූ බවත් පැවසුවාය. ඇයට සිහිය ලැබෙනවිට නිරුවත් කොට සිටියාය. යෝනියෙන් ලේ ගලමින් තිබිණ. ''මගේ යෝනි ප්‍රදේශයේ ඇතුළතින් සහ පිටතින් දැඩි වේදනාවක් දැනුණා.'' ඊට මාස කීපයකට පසු නැවතත් රාත්‍රියේ දී හමුදා නිල ඇඳුමෙන් සිටි දෙදෙනෙකු ඇය දූෂණය කළ බවත් එවිට වරින් වර ඇයට සිහි නැති වූ බවත් කිවාය. තුන්වැනි අවස්ථාවේ දී ඇය රාත්‍රියේදී අඩුම වශයෙන් හමුදාවේ තිදෙනෙකු විසින් දූෂණය කිරීමට පෙර කලවා දෙක සිගරට් කොටවලින් තිදෙනා විසින්ම එකෙකුට පසු එකෙක් වශයෙන් පිළිස්සූ බවත් ඒ නිසා ලේ ගැලීමට පටන් ගත් බවත් කීවාය. ඒ සෑම අවස්ථාවකම ඇය ආපසු ඇගේ කුඩාරමට යෑමට පෙර වැසිකිළියට ගොස් සෝදා ගත්තාය. එම ගොඩනැගිල්ලෙන් රාත්‍රියේ එළියට එන අනෙක් ගැහැනුන් ද තම කුඩාරම්වලට යෑමට පෙර වැසිකිළිය දෙසට යනු ඇය දැක ඇත. එම කඳවුරෙන් දූෂණයට ලක්වීමේ තවත් සිද්ධීන් ද කොමිටියට වාර්තා විය.[556]

606. හමුදා කඳවුරකට වාර්තා කිරීමේ දී නැවතත් අත් අඩංගුවට ගත් කලින් සිටි රැඳවියෙක් රහසිගත රැඳවුම් මධ්‍යස්ථනයකට ගෙන යෑමෙන් පසු එහි රඳවා ගත් සති තුන ඇතුළත ඔහුට අවස්ථා ගණනාවක්ම මුඛ සංසර්ගයේ යෙදීමට බල කළ බව කීවේය. [557]සීඅයිඩිය මගින් රඳවා ගෙන සිටි රැඳවියෙක් සිහිපත් කළ නොහැකි තරම් අවස්ථා ගණනකදී දූෂණය කරනු ලැබූ අතර ඒ හැම අවස්ථාවකදීම බැණ වැදිම සහ වාර්ගිකව නින්දා කරනු ලැබූ බවත් කිවේය. ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ වෙනත් ආකාරයේ වධහිංසාවලට ලක් වූ වෙනත් බොහෝ වින්දිතයන් මෙන් ඔහුට ද එම සිද්ධීන් නිතර සිහිපත් වන බව කීවේය. විමර්ශන කොමිටිය සමග පැවති සාකච්ඡාවේ දී ලිංගික ප්‍රචණ්ඩත්වය ගැන සඳහන් කරන විට ඔහු දැඩි කැළඹීමට පත්වන බවත් පෙනිණ. [558]

***මනික් ෆාම් කඳවුර තුළ පරික්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී ලිංගික අතවර සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය.***

[556] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[557] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[558] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

607. ගැටුමේ අවසාන සති කීපය තුළ දෙමළ සාමාන්‍ය ජනතාව මෙන්ම අවි බිම තැබූ එල්ටීටීඊ කාර්යධරයන් සිය දහස් ගණනක් ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලට පැමිණියහ. XVI පරිච්ඡේදයෙන් ඔවුන් වඩ්ඩුකච්චිල් පාලම, මුලතිවු සහ ඕමන්තේ හරහා යෑමේදී පසුකළ පරීක්ෂා කිරීමේ ස්ථාන සහ මුර කපොළු ගණනාවක් ගැන වඩාත් විස්තර සහිතව දක්වා ඇත.

608. එම පරීක්ෂා කිරීමේ ස්ථාන පසුකර යෑමේ දී ඇති වූයේයැයි කියන ලිංගික හිරිහැර කිරීම, අවමන් කිරීම සහ බිය වැද්දීමේ සිද්ධීන් පිළිබඳව චෝදනා විමර්ශන කොමිටියට ලැබී ඇත. ආරක්ෂක හේතූන් නිසා පරීක්ෂා කිරීමේ කාර්ය නීත්‍යානුකූල කටයුත්තක් විය හැකියැයි කොමිටිය පිළිගන්නා නමුත් එය සිදු විය යුත්තේ එම ස්ථාන පසු කරන පුද්ගලයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන ආකාරයටය. 2009 පෙබරවාරි මස සරණාගතයන් ලියා පදිංචි කිරීමේ ස්ථානයකදී එල්ටීටීඊ මරාගෙන මැරෙන බෝම්බකාරියක් බෝම්බයක් පිපිරවීමෙන් පසු ඇඳුම් ඉවත් කර පරීක්ෂා කිරීම සාමාන්‍ය පුරුද්දක් වූ බව වාර්තාවේ. ඇඳුම් ඉවත් කර පරීක්ෂා කිරීම කිසියම් දුරකට යුක්ති සහගත වුවත් විශේෂයෙන්ම ස්ත්‍රීන් නිරුවත් කිරීම හෝ අඩ වශයෙන් නිරුවත් කිරීම ඔවුන් අපහරණයට ලක් කිරීමට බෙහෙවින් ඉඩ ලැබුණ අවස්ථාවක් බව කොමිටිය රැස්කළ තොරතුරු අනුව පෙනේ.

609. සමහර සරණාගතයින් වැලි කොට්ටවලින් [559] ආවරණය වූ ආරක්ෂක කුටිවලට හෝ තල් අතුවලින් ආවරණය වූ ස්ථානවලට ගෙන යන ලද අතර තවත් අයට අනෙකුත් අයට පෙනෙන සේ එළිමහනේම ඇඳුම් ගැලවීමට සිදු විය.පිරිමි හමුදා භටයන් විසින් තමන් පරීක්ෂා කරන ලදැයි ද, ඇඳුම් ගලවන විට පිරිමි හමුදා භටයන් ආවරණයට උඩින් එබී ඔවුන් ඇඳුම් ගලවනු බලා සිටියේයැයි ද, හමුදා භටයින් තම ජංගම දුරකතනවලින් නිරුවත් ගැහැනුන්ගේ ඡායාරූප ගත්තේයැයි ද සමහර ස්ත්‍රී සරණාගතයෝ පැවසුහ.[560] මෙම අපහරණ ශ්‍රී ලංකා යුද හමුදාවට සම්බන්ධ පුද්ගලයන් ද විමර්ශන කොමිටියට පවසා[561] ඇත. විශේෂයෙන්ම ස්ත්‍රීන් සහ තරුණියන් බලහත්කාරයෙන් නිරුවත් කිරීම ආරක්ෂක අවශ්‍යතාවයන්ගෙන් ඔබ්බට ගිය වන්නියෙන් පලා යන සරණාගතයන් ට හිරිහැර කිරීමේ සහ අවමන් කිරීමේ ක්‍රියාවලියේ කොටසකි.

610. හමුදා භටයන් සම්පූර්ණයෙන්ම නිරුවත් හෝ අඩ නිරුවත් ස්ත්‍රීන් සහ තරුණියන් දෙස ගිජු ලෙස බලා සිටියේයැයි ද නොහොබිනා ආකාරයෙන් ස්පර්ශ කෙළේයැයි ද චෝදනා ලැබී ඇත. එක සාක්ෂිකාරියෙක් පරීක්ෂා කිරීමේ කුටියට යෑම ප්‍රතික්ෂේප කළ නිසා හමුදා නිලධාරිනියක් විසින් පහර දී පරීක්ෂා කිරීමේ ස්ථානයට බලයෙන් ගෙන ගොස් ඇගේ ඇඳුම් බලහත්කාරයෙන් ඉවත් කළ ආකාරය විස්තර කළාය. වැලි කොට්ට අතරෙන් තුවක්කු බටය දමූ හමුදා භටයන් එහි අගින් තම පියයුරු අවමන් ආකාරයෙන් ස්පර්ශ කළ බව ද ඇය පැවසුවාය.[562] තවත් ස්ත්‍රියක් තමා නිරුවත් කොට පරීක්ෂා කරන අවස්ථාවේ 'මල මිනියක්' මෙන් වූ ආකාරය විස්තර කළාය.[563]අනෙක් හමුදා භටයන් නිරුවත් ස්ත්‍රීන්ගේ අඟ පසඟ ගැන කාමුක වචන පවසන අතර තම ජංගම දුරකතනයෙන් වීඩියෝ ගත කළ සම්පූර්ණයෙන්ම නිරුවත් ස්ත්‍රීන්ගේ දර්ශන තමාට පෙන්වූ බව සාක්ෂිකරුවෙක් පැවසුවේය. මෙම සිද්ධීන් වූයේ අණදෙන නිලධාරීන් ඉදිරියේ වුවද ඔවුන් ඒවා නැවැත්වීමට කිසිවක් නොකළ බව සාක්ෂිකරුවන් කීප දෙනෙකුම පැවසූහ.

611. ඇඳුම් ගලවා පරීක්ෂා කිරීම පැහැදිලිවම ලැජ්ජාවට, අවමානයට සහ අපහාසයට ලක්වීමේ හැඟීම් ඇති කරවන අතර අවමානයට හෝ අපහාසයට ලක් කිරීමේ වචනද ඒ සමගම යොදා ගැනේ. මෙහි බලපෑම වන්නේ ෂෙල් වෙඩිවලින්, ආහාර සහ නිවහනක් නොමැතිවීමෙන් හා ආරක්ෂක හමුදා කෙරේ බියෙන් චිත්ත පීඩාවට පත් ජනතාවගේ අසරණකම වඩාත් වැඩි වීමය.

---

[559] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[560] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[561] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[562] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[563] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

612. ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලට පිවිසෙත්ම ගැහැනුන් ලිංගික අපහරණය සඳහා 'කැලේ දෙසට' ගෙන යාමක් ගැන සාක්ෂිකරුවන් කීප දෙනෙකුම අදහස් දැක්වූහ. එවිට විලාප නගනු ඇසුණ බව සමහරු කිහ. නිදසුනක් වශයෙන් ගැහැනු කාර්යධරයෙක් හමුදා භටයන් දෙදෙනෙකු විසින් ආරක්ෂක මුර පොළක් පිටුපසට ගෙන ගිය බවත් විනාඩි විස්සකට පමණ පසු ඇය රැගෙන එනවිට කැලඹීමට පත්ව හඬමින් සිටි බවත් එක සාක්ෂිකරුවෙකු විස්තර කෙළේය. තවත් අවස්ථාවක හමුදා භටයන් තරුණ ගැහැනියක් කැලයට ඇද ගෙන ගිය බවත් ඉන් පසුව ඒ දෙසින් විලාප නගන හඬ ඇසුණ බවත් තවත් තොරතුරු මාර්ගයක් විස්තර කෙළේය. ඒ පෙදෙසෙන් වෙඩි හඬ ඇසුණ බවද ඔහු කීවේය. තවත් සාක්ෂිකාරියක් තමා මුරපොළට අසළට පැමිණෙන විට ගැහැනු ළමයින් හතර පස් දෙනෙකු කැලෑව දෙසින් තමන් බේරා ගන්නැයි මහ හඬින් විලාප නගනු ඇසුණ බව විස්තර කළාය. ඔවුන් ලිංගික අතවරයකට ලක්වන්නේයැයි ඇය බිය වූවාය. ඇය ද මුලින්ම ඇඳුම් ගැලවීමට අකමැති වූවාය. [564]
613. රැඳවියන් සම්බන්ධයෙන් වූ ලිංගික ප්‍රචණ්ඩත්වය ලේඛනගතවී ඇති ප්‍රමාණය සහ ගැටුම අවසානයේ දී ලිංගිකව අවමානයට ලක් කිරීම සහ මළ සිරුරු කෙළසීම සැලකිල්ලට ගැනීමේ දී නොයෙකුත් පරීක්ෂා කිරීමේ ස්ථාන සහ මුර කපොළුවලදී ලිංගික හිරිහැර කිරීම් සහ අතවර කිරීමට ඇති හැකියාව සැලකිය යුතු තරම් වන බව කොමිටිය විශ්වාස කරයි. මෙවැනි චෝදනා අපහරණයේ ප්‍රමාණය සහ ස්වභාවය මෙන්ම එහි සිටි කිසියම් අණදෙන නිලධාරීන් ඇතුළත් සියලු දෙනාගේ වගකීම් තහවුරු කිරීමට තවදුරත් විමර්ශනය කළ යුතුය.

614. වඩාත් ක්‍රමානුකූලව ඇඳුම් ගලවා පරීක්ෂා කිරීම හඳුන්වා දීමට පෙර 2009 පෙබරවාරි මස මුල් දිනවල පරීක්ෂා කිරීමට ලක් වූ ස්ත්‍රියක් ඇයට ඇඳුම් ගැලවීමට සිදු වූයේ නැති වුවත් හමුදා නිලධාරිනියක් ඇයගේ පියයුරු අතගා මිරිකු ආකාරයත් ඇගේ කලවා සහ තට්ටම අත ගෑ ආකාරයත් විස්තර කළාය. ඇය මෙම සැලකීම හැඳින් වූයේ අපහාසාත්මක සහ අවමානයට ලක් කිරීමක් ලෙසිනි.[565]

615. සාමාන්‍ය ජනතාව කලින් පසු කළ පරීක්ෂා කිරීමේ ස්ථාන සහ මුර කපොළුවලදී ඔවුන් සතුව අවි හෝ බෝම්බ නැති බව තහවුරු වුවද ඉන් පසුවත් පරීක්ෂා කිරීමේ සහ මුර කපොළු ගණනාවකදීම පරීක්ෂාවට ලක්ව ඇති බව සඳහන් කළ යුතුය. මෙම පරීක්ෂා කිරීමේ අරමුණ වන්නේ අවංකවම ආරක්ෂක වුවමනාවන් නොව බොහෝ අවස්ථාවලදී අවමානයට සහ අපහාසයට ලක් කිරීම සඳහාය යන නිගමනය වඩාත් තහවුරු වේ. පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ දී සිදුවන ලිංගික අවමානයට ලක් කිරීම දැකිය යුතු වන්නේ වාර්ගිකත්වය පදනම් ප්‍රකෝපකාරී සහ අවමන් සහගත වදන් ඇතුළුව සාමාන්‍ය ජනතාව සහ සටනේදී තුවාල ලැබූ එල්ටීටීඊ කාර්යධරයන් සමස්තයක් වශයෙන් අමානුෂික සහ අවමන් සහගතව සැලකීමේ පුළුල් රටාවක් ලෙසිනි.

616. මනික් ෆාම් කඳවුරු තුළ රඳවා සිටි හෝ තම වැඩ කටයුතුවල දී මනික් ෆාම් කඳවුරුවලට ගිය විවිධ තොරතුරු මූලාශ්‍ර ගණනාවකින් මනික් ෆාම් තුළ දී දූෂණයට හෝ ලිංගික අතවරවලට ලක්වීමේ සිද්ධි තමන්ට ඇසීමට ලැබුණ බවට දූසමාන චෝදනා විමර්ශන කොමිටියට ලැබිණ. නිදසුනක් වශයෙන් ස්ත්‍රීන් සහ තරුණියන් දිය නෑමේ දී, දර එකතු කිරීමට ගොස් සිටියදී, ස්ත්‍රීන් අපහරණයට රාත්‍රියේ දි කඳවුරු තුළට හමුදා භටයන් රිංගා ගැනීමෙන් හෝ හමුදා භටයන් විසින් පිටතට ගෙන යනු ලැබූ ස්ත්‍රීන් දැඩි වේදනාවෙන් ආපසු පැමිණීම වැනි අවස්ථාය.[566] දිය නාන ස්ථානය විවෘතවම තිබුණ නිසා ස්ත්‍රීන්ගේ රැකවලට සිටි හමුදා භටයන්ට ඔවුන් පෙනෙන බව පුද්ගලයන් කළ ප්‍රකාශ ගණනාවක සඳහන් විය.

617. ආහාර ගැනීම සඳහා පෝලිමේ සිටින විට කොළ පැහැති නිල ඇඳුමෙන් සිටි පුද්ගලයන් පස් දෙනෙකු තමා කැඳවූ බව මනික් ෆාම් කඳවුරේ රඳවා සිටි ස්ත්‍රියක් කොමිටියට කීවාය. කඳවුරේ කිසියම් ස්ථානයක කාමරයකට ගෙන යනු ලැබූ ඇය දරුණු ලෙස දූෂණය කොට, සපා කා, පයින් පහර දී සූරනු ලැබූ බව කීවාය. ආපසු තම කඳවුරට ඒමට පෙර ඇයගේ සැමියා එල්ටීටීඊයේ සිටියේ ද යන්න ඔවුන් ඇසූ බවද ඇය කීවාය. මෙය කඳවුරේ අනෙක් ගැහැනුන්ටද

564 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
565 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
566 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

සිදු වන්නට ඇතැයි තමා සිතන නමුත් කිසිවෙක් ඒ ගැන කතා නොකළ බව ඇය පැවසුවාය. තවත් ගැහැනුන් දෙදෙනෙකු ඇය ගෙන ගිය ආකාරයටම ගෙන යනු තමන් දුටු බවත් ඔවුන් ආපසු පැමිණෙන විට ඉතා දුක්බිතව සිටි බවත් ඇය කීවාය.

618. විමර්ශන කොමිටියට ලැබී තිබුණු කාලය අනුව මනික් ෆාම් රැඳවුම් මධ්‍යස්ථානය තුළ දී ආරක්ෂක හමුදා විසින් ක්‍රමානුකූලව දූෂණය කිරීම හෝ වෙනත් ආකාරයේ ලිංගික අහරණයට ලක් කිරීමේ සිද්ධීන් පිළිබඳව සෘජු ප්‍රකාශ ලබා ගැනීමේ අවස්ථාවක් තිබුණේ නැත. කෙසේ වුවත් ඒ දිනවල ආරක්ෂක හමුදා විසින් දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු කිරීම බහුලව වූ නිසාත්, මනික් ෆාම් කඳවුර තුළ පැවති හමුදාකරණය වූ ස්වභාවයත්, ආරක්ෂක හමුදා සහ අතුරු හමුදා කඳවුර තුළ නිරන්තරයෙන්ම සිටීම හා අපහරණය කිරීම නිසාත්, කඳවුර තුළ සිටි පවුල් බොහොමයක මූලිකයන් ගැහැනුන් වීම නිසාත් මෙම තත්වය තවදුරටත් බරපතළ ලෙස විමර්ශනය කළ යුතුයැයි කොමිටිය විශ්වාස කරයි.

619. ඇඳිරි වැටීමෙන් පසු මනික් ෆාම් කඳවුරේ විවිධ කොටස් තුළ එක්සත් ජාතින්ගේ කාර්ය මණ්ඩලයේ හෝ රාජ්‍ය නොවන සංවිධානවල කිසිවෙක් නොසිටීම නිසා කිසියම් ආකාරයක ස්වාධීන අධීක්ෂණයක් කිරීමට නොහැකි වූ අතර සරණාගතයින් ලිංගික අපහරණයට ලක්වීමේ අවදානම වැඩි කරවීය.

620. සන්නද්ධ ගැටුම අවසානයේ මනික් ෆාම් හි කඳවුරු තුළ පරික්ෂා කිරීම සහ නිදහස අහිමි කිරීම පිළිබඳව XVI පරිච්ඡේදයේ විස්තර කළ ආකාරයට කඳවුරු තුළ වෛද්‍ය පහසුකම් ලබා ගැනීම දැඩි ලෙස සීමා විය. වැඩි දුරටත් ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට වෛද්‍ය ආධාර ලබා ගත හැකි වූයේ පොලීසියට වාර්තා කිරීමෙන් පසුවයැයිද දැන ගන්නට ලැබිණ. හමුදාව, පොලීසිය සහ අතුරු හමුදා නිරන්තරයෙන්ම කඳවුර තුළ සිටීමත් අපහරණයට ලක්වීමේ මහත් බිය, විශ්වාස කටයුතු යොමු කිරීමේ පද්ධතියක් නොමැතිවීමත්, දිවා කාලයේ දී හෝ රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අය කඳවුර බැලීමට පැමිණියත් සිදු වූයේයැයි කියන එවැනි සිද්ධීන් වාර්තා නොකිරීමට හේතු විය හැකිය. සරණාගතයන් මානුෂීය සේවකයන් සමග රහසිගතව කතා කිරීම ද තහනම් කර තිබිණ. වැඩි දුරටත් සමාජ සේවා අමාත්‍යාංශය සරණාගත කඳවුරු තුළ රාජ්‍ය නොවන සංවිධානවලට මනෝසමාජ සේවා ලබා දීම තහනම් කොට තිබිණ. කාලයත් සමග ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් ප්‍රචණ්ඩත්වයේ (SGBV) වින්දිතයන්ට ආධාර කිරීමට එක්සත් ජාතීන්ගේ සහාය ලත් කිසියම් යාන්ත්‍රණයක් සකස් කළ ද එය ක්‍රියාත්මක වූයේ සැලකිය යුතු සීමාවන් යටතේය.

***ලිංගික ප්‍රචණ්ඩත්වය පිලිබඳ චෝදනා ගැන අධිකරණ විමර්ශන***

621. ලිංගික ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම හෝ ආරක්ෂක හමුදාවලට එල්ල වූ එවැනි චෝදනා ගැන නීතිමය කටයුතු කළ බවට ආණ්ඩුව සහතික වුවද එවැනි සිද්ධීන් ගැන ආණ්ඩුව විසින්ම ලබා දී ඇති තොරතුරු සමාලෝචනය කිරීමේ දී සත්‍යය එය නොවන බවත් වරදකරුවන් නීතිය ඉදිරියට මෙතෙක් පමුණුවා නැති බවත් පෙනේ. 2014 සැප්තැම්බර් මස ආණ්ඩුව මානව අයිතිවාසිකම් කොමිටියට ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වන ආතාරයට ආරක්ෂක හමුදා සම්බන්ධ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් 39 ක් අධිකරණය ඉදිරියේ ඇත. මෙම කොමිටිය පසුව ලබා ගත් තොරතුරු අනුව මෙම සිද්ධීන් බොහොමයක් ළමා ලිංගික අපචාර සම්බන්ධ ඒවාය. කිසියම් ආකාරයකින් හෝ එම සිද්ධීන් පිළිබඳව කටයුතු කිරීම සාධනීය කරුණක් වුවද එවැනි නඩුවලදී පවා ආරක්ෂක හමුදාවේ එකම සාමාජිකයෙකුට හෝ දඬුවම් නියමවී නැත.[567]

622. මෙම කොමිටියට ලබා දී ඇති තොරතුරු අනුව 2015 මැයි මස වන විට උතුරු පළාතේ නඩු 19 ක්ද, නැගෙනහිර පළාතේ නඩු 20 ක්ද අධිකරණය හමුවේ පවතී. තොරතුරු අනුව වින්දිතයන් 40 ක ගෙන් 31 ක් වයස අවුරුදු 18 ට වඩා අඩු අයයි. ඉන් බාලම අයගේ වයස අවුරුදු හතර, හය, අට සහ දහය වශයෙනි. වයස 18 ට වඩා අඩු අනෙක් බොහෝ දෙනා 13 සහ 15 අතර වයස් කාණ්ඩයට අයත් ය. බහුතර වින්දිතයන් සිංහල ය. දෙමළ 12 ක් සහ මුස්ලිම් දෙදෙනෙකු වූහ. 2010 දී වූ සිද්ධියක් වන්නේ ස්ත්‍රියක් නැවත නැවතත් සමූහ වශයෙන් දූෂණය

[567] CCPR/C/LKA/Q/5/Add සැප්තැම්බර් 1, 2 2014

කිරීමක් පිළිබඳවය. එම වරද සිදු කෙළේයැයි කියන අය හඳුනා ගත් නමුත් එම නඩුව අධිකරණයෙන් නැවත නැවතත් කල් දමමින් පවතී.

623. අපරාධය සිදු කෙළේයැයි කියන පනස් අට දෙනෙකු නඩු 39 ක චෝදනා ලැබ සිටිති. ඉන් නඩු පහක චූදිතයන් එක් අයෙකුට වඩා වැඩිය. චෝදනා ඉදිරිපත්ව සිටින අයගෙන් තිස් දෙකක් යුද හමුදාවේ ද, 13 ක් පොලිසියේද ( ඉන් පහක් පසුව නිදොස් කොට නිදහස් කරන ලදී) එක් අයෙක් පොලිස් විශේෂ කාර්ය සාධක බලකායේ ද, එක් අයෙක් නාවික හමුදාවේ ද, 11 ක් (ඉන් නමයක් පසුව නිදොස් කොට නිදහස් කරන ලදී) සිවිල් ආරක්ෂක බලකායේ ද සාමාජිකයෝ වෙති.

624. චූදිතයන් 58 කින් රිමාන්ඩ් භාරයේ සිටින්නේ එක් අයෙකු පමණි. අනෙක් අය නිදොස් කොට නිදහස් කර හෝ ඇප මත නිදහස් කර ඇත. වාර්තාවී ඇති නඩු 39 ක ගෙන් අටක් පමණක් විභාග වන මට්ටමේ පවතින අතර ඒ සියල්ල උතුරු පළාතේය. නැගෙනහිර පළාතෙන් වාර්තාවී ඇති නඩු 20 එකක් හෝ විභාග වන මට්ටමේ නැත. නැගෙනහිර පළාතේ හතරක් ඇතුළු නඩු දහයක චූදිතයන් නිදහස්ව ඇත. ( ඒ සියලු දෙනා සිවිල් ආරක්ෂක බලකායේ හෝ පොලිසියේ ය.) අනෙක් ඒවා නොවිසඳී හෝ විභාග වෙමින් පවතින හෝ වරෙන්තු නිකුත් කළ හෝ නීතිපති කාර්යාලයේ පවතින ඒවාය.

625. සිද්ධීන් 39 න් විසි හයක් සිදුව ඇත්තේ මෙම කොමිටියේ විමර්ශන මැන්ඩේට් බලය ඇති කාල සීමාව තුළය. 2007 දී සිද්ධීන් තුනක් ද, 2008 දී නමයක් ද, 2009 දී දෙකක් ද, 2010 දී 6 ක් ද, 2011 දී හයක් ද වශයෙනි. මින් පැහැදිලි වන්නේ විභාග පැවැත්වීමේ මන්දගාමී ස්වභාවයයි. සිද්ධීන් බොහොමයක් පිළිබඳව මෙම කොමිටියට ලබා දුන් ඒවාට අමතර සවිස්තරාත්මක තොරතුරු නොමැති වුවද, ළමයින් සම්බන්ධයෙන් කරන ලද බරපතළ වැරදි සම්බන්ධයෙන් මෙන්ම ආරක්ෂක හමුදා විසින් ගැහැනුන්ට මෙන්ම පිරිමින්ට කරන ලද ලිංගික ප්‍රචණ්ඩත්වයේ රටාවන් විසඳීමට දැඩි පියවර ගැනීමක් නොමැතිකම නිසාද ආරක්ෂක හමුදා සාමාජිකයන්ට මුක්තියක් හිමි වන්නේය යන නිගමනය මෙම සංඛ්‍යාතිවලින් වඩාත් තහවුරු වේ.

626. 2015 මාර්තු 23 ගැටුමට අදාල ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහලේකම් ගේ වාර්තාවෙන් ඔහු '' ජාතික සන්නද්ධ සහ ආරක්ෂක සේවා ඇතුළුව ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමටත් යුද්ධය නිසා වින්නඹු වූවන් සහ ස්ත්‍රීන් ගෘහ මූලිකාවන් වන පවුල් ඇතුළුව අවදානමට ලක්ව ඇති ස්ත්‍රීන් සඳහා හානිපූරණය සහ ආර්ථිකව බලගැන්වීමේ වැඩ සටහන් ජීවත්වන්නන් සඳහා විවිධ අංශවලින් සේවාවන් ලබාදීමටත් අලුතින් තේරීපත් ශ්‍රී ලංකාණ්ඩුවෙන් ඉල්ලා සිටී.''[568]

627. සාක්ෂිකරුවන්ට පලිගැනීමට ලක් වන්නේයැයි බියෙන් තොරව ප්‍රකාශ කිරීමට හැකි පූර්ණ සහ විස්තීර්ණ විමර්ශනයකින් තොරව රැඳවියන්ට ප්‍රශ්න කිරීමේ සහ වධහිංසා පැමිණවීමේ අවස්ථාවලදී සහ ප්‍රශ්න කිරීමේ අවස්ථාවලින් බැහැරව සිදු කරන ලද දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වයේ පරිමානය ගැන තක්සේරුවක් කළ නොහැකිය. කෙසේ වුවත් ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිගැනීමෙන් ඇතිවන සමාජ කැලැල සහ චිත්තවේදනාව නිසාත් බොහෝ දෙනකු රඳවා ගෙන ඇත්තේ ඒ බවට සඳහනක් නොමැතිව නිසාත්, නීතිඥයන්ට හෝ බාහිර නිරීක්ෂකයන්ට ඔවුන් හමුවීමට අවස්ථාවක් නොතිබීමෙන් පැවති දැඩි අවදානම් තත්වය නිසාත් ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම මෙම කොමිටියට හෝ වෙනත් සංවිධානයකට ලේඛන ගත කිරීමට තරම් නොහැකි මට්ටමකින් පැවති බව අනුමානය කිරීම සාධාරණය. සන්නද්ධ ගැටුමට අදාලව ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම පිළිබඳව එකද පුද්ගලයෙකුට හෝ දඬුවම් කළ බවත් මෙතෙක් දැන ගන්නට නැත.

628. ශ්‍රී ලංකාව 2011 දී ඉදිරිපත් කරන ලද පස්වැනි, හයවැනි සහ හත්වැනි වාරික වාර්තා පිළිබඳව ස්ත්‍රීන්ට එරෙහි වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කොමිටිය මෙසේ සඳහන් කරයි. ''ගැටුමේ අවසාන අදියරේ දී සහ පශ්චාත් ගැටුම් අවධියේ දී ස්ත්‍රීන් ප්‍රචණ්ඩත්වයට සහ

[568] S/2015/203

වෙනස්කොට සැලකීමට ලක් වූයේ නැතැයි රාජ්‍ය පාර්ශ්වය කරන පැහැදිලි කිරීම් සැලකිල්ලට ගන්නා අතර විශේෂයෙන්ම දෙමළ සුළුතර කණ්ඩායමේ අභ්‍යන්තරව අවතැන් වූ ස්ත්‍රීන් සහ හිටපු සටන්කාරියන් ගේ මානව අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය කිරීමේ වාර්තා ගැන කොමිටිය දැඩි සේ කම්පාවට පත්වේ. සන්නද්ධ හමුදා, පොලීසිය සහ සන්නද්ධ කණ්ඩායම් කරන ලදැයි කියන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා ගැන ද කොමිටිය දැඩි අවධානය යොමු කරයි. වෙනත් කරුණු අතර ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් පිළිබඳව වහාම විමර්ශනය කර, නඩු පවරා, දඬුවම් කරන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටි.''[569]

629. වධහිංසාවට එරෙහි කොමිටිය (CAT) 2011 දෙසැම්බර් 8 නිකුත් කළ අවසාන නිරීක්ෂණ වලින් '' යුද්ධ කාලයේ සිදු වූ දූෂණය කිරීමේ සිද්ධි සහ ගැටුමේ අවසාන අදියරේ දි සහ පශ්චාත් ගැටුම් අවධියේ දි සිදු වූ වෙනත් ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ විමර්ශනවල තොරතුරු සහ එවැනි සිද්ධි සම්බන්ධ නඩු විභාගවලින් නියම කරන ලද දඬුවම් සහ වින්දිතයන්ට ලබා දෙන ලද සහන සහ වන්දි ගෙවීම් පිළිබඳ විස්තර ඇතුළත් නඩු විභාගවල ප්‍රතිඵල ගැන තොරතුරු කොමිටියට ලබා දෙන ලෙස''ද ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.[570]

630. ලිංගික ප්‍රචණ්ඩත්වය මෙම කොමිටියට හෝ වෙනත් සංවිධානවලට වාර්තා වූ ප්‍රමාණයට වඩා බෙහෙවින් විස්තීර්ණයැයි විය හැකියැයි විශ්වාස කරන විමර්ශන කොමිටිය ඒ ගැන වඩාත් පුළුල් විමර්ශන කළ යුතුයැයි ද ඊට සම්බන්ධ වූ සහ අපහරණය ගැන දැන සිටි නමුත් ඒ ගැන ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ අපහරණය ගැන දැන සිටියේ නැති නමුත් දැන සිටිය යුතු අණදෙන නිලධාරීන් ඇතුළත් වගකිව යුතු සියලු දෙනා වගඋත්තරකරුවන් කළ යුතුයැයි විමර්ශන කොමිටිය විශ්වාස කරයි.

631. වැඩි දුරටත් අධිකරණමය හෝ සත්‍යය සෙවීමේ ක්‍රියාවලියක හෝ වෙනත් ආකාරයේ කිසියම් විමර්ශනයක් ස්ථාපිත කිරීමේ දී එවැනි සිද්ධීන් ගැන සාක්ෂි දෙනු ලබන ස්ත්‍රී සහ පුරුෂ සියලු දෙනාට ආරක්ෂාව සහ සහාය ලබා දෙන විශේෂ පියවර ගත යුතු අතර එහි දී නැවතත් චිත්ත පීඩාවට පත්වීමේ අවදානම ද සැලකිල්ලට ගත යුතුය. එමෙන්ම මෙවැනි අපහරණවලට ලක් වූ හෝ ලක්වන්නට ඇති ශ්‍රී ලංකාවේ සහ ශ්‍රී ලාංකික සරණාගතයන් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටින විදෙස් රටවලටද මනෝසමාජ වැඩ සටහන් ව්‍යාප්ත කළ යුතුය. මෙම කොමිටියට ළමා අපහරණ පිළිබඳ සවිස්තර ප්‍රකාශ නොලැබුණ නමුත් පිහිටුවනු ලබන විමර්ශනය කිරීමේ කිසියම් යාන්ත්‍රණයකට ළමයින් ආරක්ෂා කිරීමේ ප්‍රබල පියවරද ඇතුළත් විය යුතුය.

## XI වැඩිහිටියන් පැහැර ගෙන යෑම සහ බලහත්කාරයෙන් සටනට බඳවා ගැනීම

**හැඳින්වීම.**

632. මෙම කොටසින් ප්‍රධාන වශයෙන් එල්ටීටීඊ ය තම හමුදා සඳහා ආරක්ෂිත ව්‍යුහයන් ගොඩ නැගීමට මෙන්ම සටන් කිරීම ඇතුළුව නොයෙකුත් හමුදාමය සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා ජනතාව බලහත්කාරයෙන් බඳවා ගැනීමේ අරමුණෙන් සිදු කරන ලද පැහැර ගැනීම් ගැන විමසා බලනු ඇත. එල්ටීටීඊය විසින් සිදු කරන ලද පැහැර ගැනීම් සමහර විට නීති විරෝධී ඝාතනවලින් අවසන් වන අතර ඒවා VI පරිච්ඡේදයෙන් ආවරණය කෙරිණ. එල්ටීටීඊය විසින් සිදු කරන ලද ළමා සොල්දාදුවන් බඳවා ගැනීම XII පරිච්ඡේදයේ වෙනම ආවරණය කර ඇත.

633. මෙම පරිච්ඡේදයෙන් ගැටුමේ අවසාන අදියර කෙරේ අවධානය යොමු වුවද විමර්ශනයට භාජනය වූ මුළු කාල පරිච්ඡේදය පුරාම එල්ටීටීඊ ය විසින් වැඩිහිටියන් බඳවා ගන්නා ලදී. මෙම කොටසින් බඳවා ගැනීම මග හැරීමට හෝ එල්ටීටීඊ හට කණ්ඩායම්වලින් පලා යෑමට උත්සාහ කළ අයට කරන ලද හිරිහැර කිරීම් ද විස්තර කෙරේ. මෙම පරිච්ඡේදයේ ඇති

[569] CEDAW/C/LKA/CO/7 paras 40 and 41
[570] CAT/C/LKA/CO/3-4, 2011 දෙසැම්බර්

තොරතුරුවලට පදනම් වන්නේ හිටපු එල්ටීටීඊ කාර්යධරයන්, පවුලේ සාමාජිකයන් හෝ බලහත්කාරයෙන් බඳවා ගන්නා ලද අයගේ වෙනත් සාක්ෂිකරුවන් සමග පවත්වන ලද සාකච්ඡායි. ඊට SLMM ඇතුළුව බලහත්කාරයෙන් බඳවා ගැනීම ලේඛන ගත කළ වෙනත් මූලාශ්‍රවලින් ලබා ගත් තොරතුරු පදනම් වේ. මෙම කොමිටියට විශේෂයෙන් 2008 සහ 2009 කාලයේ දී එල්ටීටීඊ ය විසින් පැහැර ගත්තේයැයි කියන පුද්ගලයන්ගේ පවුල්වල අයගේ සැල කිරීම් ගණනාවක් ද ලැබිණ. එම වින්දිතයන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාවේ සිටින නිසා මෙම විස්තර තහවුරු කළ නොහැකි විය. එසේ වුවත් ඔවුන් විස්තර කළ සිද්ධීන් වෙනත් මූලාශ්‍රවලින් ලබා ගත් තොරතුරු සමග බොහෝ විට ගැලපේ.

634. එල්ටීටීඊය පවුල්වලට කරන ලද බියවැද්දීම් සහ හිරිහැර නිසාත් පැහැර ගැනීම් සහ බලහත්කාරයෙන් බඳවා ගැනීම් වාර්තා නොකරන ලෙසට අවවාද කර තිබූ නිසාත් කොමිටියෙන් රැස් කරන ලද තොරතුරුවලින් මෙම තත්වයේ පරිමාණය නිවැරදිව ඉදිරිපත් නොවනු ඇත. එමෙන්ම පවුල් සමහරවිට තම ඥාතීන් නිදහස් කර ගැනීමට හෝ ඔවුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ආණ්ඩුවේ හෝ වෙනත් සංවිධානවලට පැමිණිලි කරනු වෙනුවට සෘජුවම එල්ටීටීඊ කාර්යාලවලට ගොස් ඇත.

635. එල්ටීටීඊයෙන් 2004 දී වෙන්වීමෙන් පසුව කරුණා කණ්ඩායම ද විශේෂයෙන්ම ළමයින් පැහැර ගෙන යැම සහ බලහත්කාරයෙන් බඳවා ගැනීම පුළුල් වශයෙන් කෙළේය. මෙම බඳවා ගැනගීම් රටා සහ ළමයින් යොදා ගැනීම පිළිබඳ XII පරිච්ඡේදයේ ලේඛනගත කර ඇත.

***එල්ටීටීඊය විසින් සිදු කරන ලද පැහැරගැනීම් සහ බලහත්කාරයෙන් බඳවා ගැනීමේ රටාවන්***

636. එල්ටීටීඊය ගොඩ නැගීමේ මුල් වසරවල සමහරු දේශපාලන හේතු නිසාද, තවත් අය විශේෂයෙන්ම දෙමළ සුළුතරයට එරෙහිව වෙනස් කොට සැලකීමෙන් කරන ලද උල්ලංඝනය කිරීම්වලින් කෝප වූ නිසාත්, එල්ටීටීඊ ප්‍රචාරය නිසාත් බොහෝ දෙනෙකු ඊට ස්වේච්ඡාවෙන්ම එක් වූහ.[571]

637. 2006 දී එදිරිවාදිකම් නැවත ඇරඹීමත් සමග එල්ටීටීඊයට සම්බන්ධ වූ පිරිස අඩුවීමෙන් සංවිධානයට බලහත්කාරයෙන් බඳවා ගැනීම කෙරේ වැඩියෙන් යොමු වන්නට සිදු විය. සටන් විරාම ගිවිසුමෙන් පැහැදිලිවම සාමාන්‍ය ජනතාව පැහැර ගෙන යැම, හිරිහැර කිරීම සහ තර්ජනය කිරීම තහනම් කර තිබුණද 2002 සහ 2007 අතර කාලයේ දී වැඩිහිටියන් පැහැර ගෙන යැම් පිළිබඳව පැමිණිලි 1,248 ක් SLMM වෙත ලැබිණ. ඒ බොහොමයක් බඳවා ගැනීම් සම්බන්ධයෙනි. බොහෝවිට නැගෙනහිර පළාතෙන් ලැබුණු පැමිණිලිවලින් වැරදිකරුවන් එල්ටීටීඊය ද කරුණා කණ්ඩායමද යන්න පැහැදිලිව වෙන් කොට දක්වා නැතැයි SLMM සඳහන් කරයි. කෙසේ වුවත් 2004 න් පසුව සමහර සිද්ධීන් ඒ වන විට ආණ්ඩුවේ හමුදා සමග සහයෝගයෙන් කටයුතු කළ කරුණා කණ්ඩායම විසින් සිදු කරන්නට ඇතැයි කිව හැකිය.

638. පැහැර ගෙන යැමේ සිද්ධීන් LLRC[572] සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට පත් කළ ජනාධිපති කොමිසමෙන් ද ලේඛන ගත කර ඇත. ජනාධිපති කොමිසම 2015 අප්‍රේල් මස නිකුත් කළ අතුරු වාර්තාව අනුව ලැබී තිබුණ ලිඛිත පැමිණිලි 13,378 කින් සියයට 17 ක් එල්ටීටීඊය විසින් කරන ලද පැහැර ගැනීම් සම්බන්ධයෙනි.

639. එල්ටීටීඊයෙන් සිදු කරන ලද පැහැර ගැනීම් සහ බලහත්කාර බඳවා ගැනීම් එහි පාලනය යටතේ පැවති සියලුම ප්‍රදේශවලත් මෙම කොමිටියෙන් ආවරණය වන කාල සීමාව තුළත් සිදු විය. වාර්තා වූ පැහැර ගැනීම් වැඩි වශයෙන්ම සිදුව ඇත්තේ එල්ටීටීඊ පාලනය යටතේ පැවති භූමි ප්‍රදේශ වන මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වලය. එහෙත් යාපනය, වවුනියාව සහ

---

[571] UTHR Trauma in the Vanni, Human Grist to the Mills of Dual Hypocrisy 8 July 2008

[572] LLRC වෙත ඉදිරිපත් කරන ලද ඉදිරිපත් කිරීම් අනුව එල්ටීටීඊය සම්බන්ධ පැහැර ගැනීමේ සිද්ධීගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වාර්තා වූයේ කොමිසම මඩකලපුව, යාපනය සහ මන්නාරමට ගිය අවස්ථාවලදීය.

මඩකලපුව දිස්ත්‍රික්කවලත් එය සිදු විය. 2004 දී කරුණා ඉවත්වීමෙන් පසුව බලහත්කාරයෙන් බඳවා ගැනීම වඩාත් ප්‍රචණ්ඩ ලෙස සිදු විය. එල්ටීටීඊයෙන් බඳවා ගත් බොහෝ දෙනෙකු කරුණා කණ්ඩායම සමග එල්ටීටීඊයෙන් ඉවත් වූ නිසා, ඔවුන්ගේ සටන් ශක්තිය පවත්වා ගැනීමට හිටපු සටන්කරුවන් නැවත බඳවා ගැනීමට ඉලක්ක කර ගැනීමට එල්ටීටීඊයට සිදු විය.[573]

640. එල්ටීටීඊය තම සේවය සඳහා තරුණ තරුණියන් බලහත්කාරයෙන් සහ හිතුවක්කාර ලෙස බඳවා ගත්තේය. තම පාලනය යටතේ පැවති ප්‍රදේශවල සිටි සෑම පවුලකින්ම එක සාමාජිකයෙකු ලබා දීමේ එක පවුලකින් එක පුද්ගලයෙක් යන ප්‍රතිපත්තිය අනිවාර්ය කෙළේය.[574] පවුල්වලට මෙම 'කෝටා ක්‍රමය' ගැන දැනුම් දුන්නේ වාහනවලින් ප්‍රචාරය කිරීමෙන්, ගෙයින් ගෙට යෑමෙන් සහ බඳවා ගැනීමේ නියෝග සහ එල්ටීටීඊයට වාර්තා කරන ලෙස දැන්වීම් ඇතුළත් ලිපි මගිනි.

641. ගැටුමේ අවසාන අදියරට පෙර වසරවලදී සාමාන්‍ය ජනතාව ඔවුන්ගේ නිවෙස්, පන්සල්, පල්ලි. පාසල්, වැඩ කරන ස්ථාන හා එල්ටීටීඊ මුර කපොළුවලදී පැහැර ගන්නා ලදී. තරුණයන් එල්ටීටීඊ මුර කපොළුවලදී නතර කරගත් විට ඔවුන්ගේ හැඳුනුම් පත් පරික්ෂා කර ඔවුන්ගේ පවුල්වලින් කිසිවෙකු එල්ටීටීඊයට සම්බන්ධ වී ඇත්දැයි විමසනු ඇත. එම තැනැත්තාට ඔහුගේ/ඇයගේ පවුලේ අය එල්ටීටීඊයට සේවය කළ බව සනාථ කළ නොහැකි වුවහොත් ඔවුන් පැහැර ගැනීමේ සහ බලහත්කාරයෙන් බඳවා ගැනීමේ අවදානමට ලක් වේ.[575]

642. බඳවා ගැනීමෙන් පසුව ඔවුන්ට එල්ටීටීඊ කඳවුරක පුහුණුව ලබා දේ. ගැහැනු සඳහා වෙනම කඳවුරු පැවතිණ.[576] එල්ටීටීඊ බලකායට බලහත්කාරයෙන් බඳවා ගත් වින්දිතයන්ට සටන් කිරීම, තුවාල ලත් කාර්යධරයන්ට සාත්තු සේවය/අතුරු වෛද්‍ය සේවය, සැපයුම් සංවිධානය හා පරිපාලන කටයුතු ඇතුළත් විවිධ කාර්යන් පැවරේ. පරිපාලන තනතුරු පැවරුණ හෝ එල්ටීටීඊයට සහාය සඳහා වෙනත් කාර්යවල යෙදී සිටි අය පෙරමුණු සටන්වලට නොයවනු ඇත.[577]හමුදා පුහුණුව විශේෂයෙන්ම සන්නද්ධ ගැටුමේ අවසානයට ආසන්නයේ දී ඉතා කෙටි වූයේයැයි වාර්තාවේ. සමහර අවස්ථාවල අලුතින් බඳවා ගත් අය සටන් බිමට යැවීමට පෙර පුහුණුව ලබා දී ඇත්තේ දින කීපයකදීය.

643. පවුල් තම ඥාතීන් බඳවා ගැනීමෙන් ගලවා ගැනීමට උත්සාහ කෙළේ ඔවුන් දිගු කලක් සඟවා තබා ගැනීමෙනි.[578]ආරම්භයේ දී විවාහකයන් බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් නිදහස් කළ නිසා බොහෝ දෙනා විවාහ වූහ.[579] එහි ප්‍රතිඵලයක් වශයෙන් 2006 අගෝස්තු මාසයෙන් පසු සිදු කරන ලද විවාහ සියල්ල අවලංගු වන බව එල්ටීටීඊය ප්‍රකාශ කෙළේය.[580] පැහැර ගෙන යෑම් වැළැක්වීමට තැත් කළ ඥාතීන්ට හිරිහැර සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදු වූ අතර ඔවුන් එල්ටීටීඊ ප්‍රතිපත්තිවලට අනුකූලතාවය නොදැක්වීම නිසා පැහැර ගෙන යෑමේ සහ ප්‍රචණ්ඩත්වයට ලක් කරන බවට තර්ජනය කෙරිණ. එල්ටීටීඊය ඔවුන් සොයන පුද්ගලයා නොසිටීනම් ඒ වෙනුවට පවුලේ වෙනත් සාමාජිකයෙකු බලහත්කාරයෙන් ගෙන යන ලදී. [581]

---

[573] Human Rights Watch " බියෙන් ජීවත්වීම"ළමා සොල්දාදුවන් සහ ශ්‍රී ලංකාවේ දෙමළ කොටි, 2004 p.37
[574] Norwegian refugee Council/ Displacement Monotoring Centre (NRC/IDMC)ශ්‍රී ලංකාවේ නැගෙනහිරට ආපසු පැමිණීම එහෙත් උතුරේ අවතැන්වීම්, 27 අගෝස්තු 2008 available at http://www.refworld.org/docid/48b5428726.html

[575] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[576] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[577] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[578] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[579] Human Rights Watch: කොටුවූවන් සහ නොසැලකීම. වන්නියේ සිවිල් ජනතාවට එරෙහි අපහරණ 2008 පිටුව
[580] ICG, ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් අර්බුදය පිටුව 12 2006

[581] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

644. ගැලවී පලා යෑමට සමත් වූ අය නැවත වරක් එල්ටීටීඊයෙන් පැහැර ගෙන ගොස් දඬුවම් පමුණුවා ඇත. නිදසුනක් වශයෙන් 2005 දී බලහත්කාරයෙන් බඳවා ගත් පුද්ගලයෙකු පලා යෑමට තැත් කළ නිසා 2007 – 08 වසරවල මාස ගණනක් රඳවා ගෙන ඇත. රඳවාගෙන සිටි කාලයේ දී ඔහුට පහර දුන් බවද වාර්තාවේ. නිදහස් කිරීමෙන් පසුව ඔහුට නැවත වරක් සටන්කරුවෙකු ලෙස බැඳීමට බල කර ඇත.ස්ත්‍රියක් එල්ටීටීඊ ගැහැනු කාර්යධරයන් විසින් බලහත්කාරයෙන් ගෙන ගොස් කඳවුරක දී ප්‍රශ්න කර ඇතැයි වාර්තාවේ. ඉන් පසු ඇය හමුදා පුහුණුවට යවා ඇත. තවත් කණ්ඩායමක් සමග පලා යමින් සිටියදී ඇය නැවත වරක් එල්ටීටීඊ මුර කපොල්ලක්දී අල්ලා ගෙන ඇත.[582] වෙනත් සිද්ධියකදී වින්දිතයෙක් 2009 පෙබරවාරි මස පුහුණු කඳවුරකට ගෙන යෑමට පෙර අලුතින් බඳවා ගන්නා අය රඳවා ගන්නා එල්ටීටීඊ බන්ධනාගාරයක සිටි බව කීවේය. එහි සිටි සමහර අය බඳවා ගැනීමෙන් පසුව පලා යෑමට උත්සාහ කළ බවද වාර්තාවේ. [583] එසේ රඳවා ගත් අය කුඩා කණ්ඩායම් වශයෙන් දම්වැලකින් එකට ගැට ගසා තිබුණ අතර පැමිණිලි කළහොත් පහර දුන් බවද වාර්තාවේ. [584]

645. එල්ටීටීඊය කෙරේ හමුදා පීඩණය වැඩි වෙත්ම 2008 සැප්තැම්බර් මාසයෙන් පසුව 'එක පවුලකින් එක පුද්ගලයෙකු' ප්‍රතිපත්තිය වෙනස් කොට පවුලේ සංඛ්‍යාව අනුව එක පවුලකින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය බව ප්‍රකාශ කෙළේය.[585]එල්ටීටීඊ කාර්ධරයෝ මන්නාරමේ ගෙයින් ගෙට ගොස් තරුණියන්, පුරුෂයන් සහ ළමයින් බලහත්කාරයෙන් බඳවා ගන්නා ගත්හ. [586]

646. එල්ටීටීඊය බලහත්කාරයෙන් බඳවා ගත් අයට එසේ තබා ගන්නා කාලසීමාව හෝ ඔවුන් ගෙන යන ස්ථානයක් දැනුම් දුන්නේ නැත. එසේම පවුල්වලට ද ඒ ගැන දැනුම් දීමක් කෙළේ නැත. පවුල්වලට තම ඥාතීන් සිටින ස්ථානය ගැන කිසියම් තොරතුරක් ලැබුණේ ඔවුන් එල්ටීටීඊයෙන් රඳවා ගෙන සිටිනු දුටු අයගෙනි. පැහැර ගෙන එල්ටීටීඊ පුහුණු කඳවුරකට ගෙන ගිය සමහරුන්ට පැය කීපයක් හෝ දින කීපයක් තම ගෙදරට යෑමට ඉඩ ලබා දී ඇත. තවත් අවස්ථාවල පවුල්වලට එල්ටීටීඊ කඳවුරුවල සිටින තම ඥාතීන් බැලීමට ඉඩ දුන් නමුත් එය හැමවිටම ලබා දුන් අවස්ථාවක් නොවේ.

647. සටනේ දී මිය ගියේයැයි කියන අයගේ සිරුරු බොහෝවිට එල්ටීටීඊ නිලධාරීන් විසින් එම පවුල්වලට භාර දෙනු ලබයි. නිදසුනක් වශයෙන් එක සිද්ධියකදී තරුණයෙකු පාරේ දී පැහැර ගෙන ගොස් ඇත. දින කීපයකට පසු ඔහුගේ මල සිරුර ආපසු ගෙන එන ලදී. ඔහුගේ මව සහ සොහොයුරිය නිවසේ සිටියදී 2008 දී පැහැර ගෙන ගියේයැයි පැවසේ. ඔවුන්ට සිදු වූ දෙයක් දැන ගන්නට නැත.[587]

648. තම ඥාතීන් ගේ පැහැර ගැනීම එම පවුල්වල අය එල්ටීටීඊ කාර්යාලයට මෙන්ම ජාතික මානව හිමිකම් කොමිසමට සහ/හෝ පොලීසියට වාර්තා කළහ. එසේ වුවත් ඔවුන්ට සිදු වූ දෙය හෝ සිටින තැන ගැන පැහැදිලි කිරීමක් ලැබුණේ කලාතුරකිනි.

649. සටනේ අවසාන සතිවලදී එල්ටීටීඊය සටන් මුක්ත කලාපයෙන් ඇතුළුව බලහත්කාරයෙන් බඳවා ගැනීම විශාල වශයෙන් වැඩි කෙළේය.[588]කුඩාරම්වලින් ද මිනිසුන් පැහැර ගෙන ගිය බවට වාර්තා ඇත.[589]යුද හමුදාවේ ෂෙල් වෙඩිවලින් මිය යෑමේ මෙන්ම බලහත්කාරයෙන් බඳවා ගැනීමේ බියෙන්ද පසු වූ බව බොහෝ සාක්ෂිකරුවෝ විස්තර කළහ.

---

582 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
583 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
584 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ HRW කොටුවූවන් සහ නොසැලකීම. වන්නියේ සිවිල් ජනතාවට එරෙහි අපහරණ 2008 පිටුව
585 HRW කොටුවූවන් සහ නොසැලකීම. වන්නියේ සිවිල් ජනතාවට එරෙහි අපහරණ 2008 පිටුව
586 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
587 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
588 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
589 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

650. 2009 මාර්තු මස වෙන් වෙන් වශයෙන් වූ සිද්ධීන්වලදී එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන්නන් තිදෙනෙකු එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් බඳවා ගෙන ඇත. මෙම මානුෂීය සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල අය නිදහස් කරන ලෙස එක්සත් ජාතීන් නැවත නැවතත් ඉල්ලීම් කළ ද එල්ටීටීඊය ඊට ප්‍රතිචාර දක්වූයේ නැත. කෙසේ වුවත් අවසානයේ දී ඔවුන් නිදහස් කළ ද ඒ දිනය හෝ එම වාතාවරණය ගැන විමර්ශන කොමිටියට දැන ගන්නට ලැබුණේ නැත.

651. උතුරු පළාතේ වලයාර්මඩම් හි සාන්ත මේරි පල්ලියේ දී එල්ටීටීඊ කාර්යධරයන්ගේ කණ්ඩායමක් 2009 මාර්තු අග දී තරුණ වැඩිහිටියන් සහ ළමයින් විශාල සංඛ්‍යාවක් පැහැර ගෙන යෑමේ සිද්ධියක් මෙම කොමිටියෙන් ලේඛන ගතකර ඇත.[590]ඒ වන විට සාමාන්‍ය ජනතාව, රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන් සහ ඉහතදී බලහත්කාරයෙන් බඳවා ගෙන පසුව නිදහස් කරන ලද එල්ටීටීඊයේ හිටපු සටන්කරුවන් සමහරුන් ද ඇතුළුව විශාල සංඛ්‍යාවක් යුද හමුදාවේ ෂෙල් වෙඩිවලින් මෙන්ම එල්ටීටීඊ බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් ආරක්ෂා වීමට එහි රැස්ව සිටියහ.[591] පූජකයන් කීප දෙනෙකු ද එහි සිට ඇත.[592]සමහර වාර්තා අනුව එල්ටීටීඊ නායකයන් වන ඉලම්පරිති සහ එලිලාන් යන එල්ටීටීඊ අණදෙන්නන් එහි සිටි සරණාගතයන් භාර දෙන ලෙස පූජකයන්ට බල කළ නමුත් ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. [593]

652. LLRC ට සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ඇති පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසමට කරන ලද ඉදිරිපත් කිරීම් සහ සාක්ෂි සමග ගැලපෙන[594] මෙම කොමිටියෙන් රැස් කරන ලද සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ[595]අනුව එලිලාන් සහ ඉලම්පරිති ගේ නායකත්වයෙන් සන්නද්ධ එල්ටීටීඊ කාර්යධරයන් විශාල සංඛ්‍යාවක් සමග ඇවිද ගෙන සහ වාහනවලින් පල්ලියට පැමිණ ඇත. සමහර වාර්තා අනුව මිනිසුන් පලා යෑම වැළැක්වීමටත් පල්ලියෙන් පිටත සිටි අය ( සමහර අය පල්ලිය තුළ සිටි ළමයින්ගේ දෙමාපියන් ය.) කාර්යධරයන්ට පහරදීමටත්, කෑ ගැසීමට හා විරෝධය දක්වීටත් ඉදිරිපත් වූ නිසා අහසට වෙඩි තබා ඇත.[596] එල්ටීටීඊ කාර්යධරයන් මිනිසුන් පසෙකට කරමින් පල්ලිය ඉදිරියට පැමිණ එහි දොර කඩා දමනු සාක්ෂිකරුවන් දෙදෙනෙකු දැක ඇත.[597]පල්ලිය ඇතුළේ සිටි එල්ටීටීඊයේ හිටපු කාර්යධරයන් සමහරු බලයෙන් ඇතුළු වූ එල්ටීටීඊ කාර්යධරයන්ට විරෝධය පෑමට උත්සාහ කළහ. [598]

653. ළමයින් සහ තරුණ වැඩිහිටියන් සිය ගණනක් බලහත්කාරයෙන් ගෙන යන ලද[599] අතර ඊට විරෝධය පෑ පවුල්වල සාමාජිකයන්ට එල්ටීටීඊයෙන් ශාරීරිකව පහර දී ඇත.[600] මද වේලාවකට පසු පල්ලිය අසළට ආ සාක්ෂිකරුවෙකුට පල්ලි භූමිය දෙසින් වාහනවල ශබ්දය ඇසුණ අතර පල්ලියෙන් පිටව යන වාහන කීපයක් දැක ඇත.[601] ඒවා තරුණ තරුණියන්ගෙන් පිරී පැවතිණ. පල්ලිය තුළ විශාල පිරිසක් සිටි නිසා ඔවුන් ගෙන යෑමට වාහනවලට ගමන් වාර කීපයක් පැමිණීමට සිදු විය. [602] ඔවුන් එදින සවස් කාලයේ පල්ලියට ගිය විට එල්ටීටීඊය විසින්

---

[590] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[591] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[592] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[593] University Teachers for Human Rights, ඔවුන්ට කතා කිරීමට ඉඩ හරින්න., III වැනි කොටස 'මාතලන්'මුහුදේ පලායෑම මරු කැඳවයි. නැවති සිටීම ඊටත් වඩා නරකය , Special Report No. 34 13 December 2009, para 3
[594] LLRC Report, para 5.84
[595] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේඅතුරුදහන්වූවන් පිලිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම අතුරු වාර්තාව ( 2015 අප්‍රේල්)

[596] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[597] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[598] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[599] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[600] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[601] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[602] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

බලහත්කාරයෙන් බඳවා ගැනිම සඳහා තරුණ තරුණියන් සහ ළමයින් සිය ගණනක් ගෙන ගිය බව සාක්ෂිකරුවන් දෙදෙනොට දැන ගන්නට ලැබී ඇත.[603]

654. පැහැර ගත් මිනිසුන් බංකර් කැනීම වැනි කටයුතු සඳහා බලහත්කාරයෙන් වැඩට යොදා ගත් බව විමර්ශන කොමිටියට දැන ගන්නට ලැබී ඇත.[604]බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් මිදීමට හෝ සන්නද්ධ ගැටුමේ අවසාන අදියරවලදී එල්ටිටීඊ පාලන ප්‍රදේශවලින් පිටව යැමට තැත් කළ සාමාන්‍ය ජනතාව හමුදා වැඩ කටයුතුවල බලහත්කාරයෙන් යෙදවීමට හෝ එල්ටීටීඊ පෙරමුණු ප්‍රදේශවල අගල් කැපීමට යොදා ගත් බව දැක්වෙන තොරතුරු මෙම කොමිටියට සාක්ෂිකරුවන්ගෙන් ලැබී ඇත. එසේ යෙදවීමෙන් ඔවුහු ආසන්නයේ සිදුවන ප්‍රහාරවලට මෙන්ම සටන්වල බලපෑමට ද හසු වූහ.

655. ඊට අමතරව බොහෝ විට පවුල්වල අයට තම ඥාතීන් සොයා ගත නෙහැකි වූ නිසා බඳවා ගැනීමට පැහැර ගෙන ගිය බොහෝ දෙනෙකුගේ ආගිය අතක් දැන ගන්නට නැත. වැඩි දුරටත් සන්නද්ධ ගැටුමෙන් දිවි ගලවා ගත් අය 2009 මැයි මාසයේ දී ආණ්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවලට පැමිණි පසු ඔවුන් එල්ටිටීඊයට බලහත්කාරයෙන් බඳවා ගත්තේ දින කීපයකට පෙර වුවත් එල්ටීටීඊ කාර්යධරයන් ලෙසින් සලකන ලදී. එමනිසා ඔවුන් මෙම වාර්තාවේ කලින් විස්තර ආකාරයට නීති විරෝධී සහ හිතුවක්කාර රඳවා ගැනීම, වධහිංසා පැමිණවීම සහ වෙනත් උල්ලංඝනය කිරීම්වලට ලක්වීමේ අවදානමක් තිබිණ.

## XII ළමයින් සටන්වලට බඳවා ගැනිම සහ යොදා ගැනීම

### හැඳින්වීම

656. මෙම පරිච්ඡේදයෙන් මෙම කොමිටියේ මැන්ඩේට් කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ සටන්වලට ළමයින් බඳවා ගැනීම සහ ඔවුන් යොදා ගැනීමේ රටාවන් මෙන්ම ඔවුන් නිදහස් කර ගැනීම සඳහා වූ ක්‍රියාත්මක සැලසුම් ලේඛන ගත කෙරේ.

657. ශ්‍රී ලංකාව 1990 දී අපරානුමත කරන ලද ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානය (CRC) අනුව රාජ්‍ය පාර්ශ්වයන් ''සන්නද්ධ ගැටුමකින් පීඩාවට පත්වන ළමයින්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කිරීමට ගතහැකි සියලු පියවර ගත යුතුය.'' [605]

658. ශ්‍රී ලංකාවද පාර්ශ්වයක් වන සන්නද්ධ ගැටුම්වලදී[606] ළමයින් සම්බන්ධ කර ගැනීම පිළිබඳ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය අනුව රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් විසින් 18 ට අඩු ළමයින් බඳවා ගැනීම හෝ යොදා ගැනිම තහනම් කරයි.[607]රාජ්‍ය සන්නද්ධ හමුදාවලට වයස පිළිබඳ සහතිකයක් සහ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුවන්ගේ අනුමැතිය ඇතුළුව සුදුසු ආරක්ෂාවන් පවතින්නේ නම් වයස අවුරුදු 18 ට වඩා අඩු අය ස්වේච්ඡාවෙන් බඳවා ගත හැකිය. කෙසේ වුවද සටන්වලට සහභාගිවීමේ දී අවම වයස නියමව ඇත්තේ අවුරුදු 18 නි.

659. සන්නද්ධ හමුදාවලට හෝ කණ්ඩායම්වලට වයස අවුරුදු 15 ට වඩා අඩු ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම හෝ ඇතුළත් කර ගැනීම හෝ සටන්වලට[608] ඔවුන් ක්‍රියාත්මකව

---

[603] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[604] HRW. කොටුවූවන් සහ නොසැලකීම. වන්නියේ සිවිල් ජනතාවට එරෙහි අපහරණ 2008 පිටුවපිටුව 11

[605] ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානය 38 (4) වගන්තිය.

[606] ශ්‍රී ලංකාව 2000 සැප්තැම්බර් 8 දින අපරානුමත කරන ලදී. 2002 පෙබරවාරි සිට බලාත්මක විය.

[607] සන්නද්ධ ගැටුම්වලදී ළමයින් සම්බන්ධ කර ගැනීම පිළිබඳ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය 1 වගන්තිය සහ 4(1) වගන්තිය

[608] අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව 2002 8(2)(e)(vii)

යොදා ගැනීම සම්ප්‍රදායික අන්තර්ජාතික අපරාධ නීතිය යටතේ මෙන්ම අන්තර්ජාතික අපරාධ විනිශ්චය සභා නීති දර්ශනයෙන් හෙළිවන ආකාරයට යුද අපරාධයකි.[609]

660. ශ්‍රී ලංකාව 2001 දී අපරානුමත කළ ඉතාමත් නරකම ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සන්ධානය එහි විෂය පථය නිර්වචනය කරන්නේ ''.... ළමයින් සන්නද්ධ ගැටුම්වලදී යොදා ගැනිම සඳහා බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් බඳවා ගැනීම ඇතුළත් බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය වැනි'' වහල් භාවයට සමාන භාවිතා සහ වහල් භාවයේ සියලු ආකාරයන් ඇතුළත් වන ආකාරයෙනි.[610]

661. ශ්‍රී ලංකා බලධාරීන්ට රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් විසින් සටන්වලට ළමයින් යොදා ගැනීම සහ බඳවා ගැනිම නතර කිරීමේ අදහසින් පියවර ගැනීමට බැඳීමක් පවතී. වැඩි දුරටත් එවැනි කණ්ඩායම් විසින් බලහත්කාරයෙන් බඳවා ගත් හෝ යොදා ගත් ළමයින්ට ගැටුම අවසානයේ ආරක්ෂාව සහ ආධාර ලබා දෙන බව තහවුරු කිරීමට ඔවුන් පියවර ගත යුතුය.

662. මෙම කාල සීමාවේ ළමයින් බඳවා ගැනීම ගැන සන්නද්ධ කණ්ඩායම් ගණනාවක් වගකිව යුතු වුවද මෙම වාර්තාවෙන් මූලික වහයෙන් අවධානය යොමු කරන්නේ එල්ටීටීඊ සහ TMVP/කරුණා කණ්ඩායම කෙරේය. ඒ ඔවුන් ළමයින් බඳවා ගත් ප්‍රමාණය නිසාය. ළමයින් බඳවා ගත් සහ එක්සත් ජාතීන්ගේ ළමයින් සහ සන්නද්ධ ගැටුම්[611]පිළිබඳ වාර්තාවේ නම් කරන ලද කණ්ඩයම් වන්නේ ඉනිය භාරතී,)[612] ලියා පදිංචි දේශපාලන පක්ෂ වන ප්ලොට් සහ ඊපීඩීපී සහ කලින් TMVP සාමාජික සහ නැගෙනහිර පළාතේ මහ ඇමති සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් ය. ( පිල්ලෙයාන් නමින් ද හැඳින්වේ.)[613]

663. එල්ටීටීඊය සන්නද්ධ ගැටුම මුළුල්ලේම ළමයින් දහස් ගණනක් බඳවා යොදා ගෙන ඇත. සමහරුන් බඳවා ගෙන ඇත්තේ 2004 අප්‍රේල් මාසයේ දී එල්ටීටීඊයෙන් බිඳී යෑමට පෙර නැගෙනහිර පළාතේ එල්ටීටීඊ අණ දෙන්නාව සිටි කරුණා විසිනි. 2006 වන තෙක් එල්ටීටීඊ පාලනය යටතේ පැවති නැගෙනහිර පළාතේ බඳවා ගැනීම් වඩාත් විශාල වශයෙන් වූ බවත් එසේ බඳවා ගත් අය අනෙක් ප්‍රදේශවලට වඩා වයසින් අඩු බවත් වාර්තාවලින් පෙන්නුම් කෙරේ. එල්ටීටීඊයෙන් බිඳී යෑමෙන් පසුවද කරුණා කණ්ඩායම ළමයින් බඳවා ගැනිම දිගටම සිදු කෙළේය. TMVP/කරුණා කණ්ඩායම ළමයින් බඳවා ගත් රටාව, එල්ටීටීඊ බඳවා ගැනීමෙන් වෙන් කොට සඳහන් කරනු ඇත.

664. විමර්ශනයේ කොටසක් ලෙස මෙම කොමිටිය ළමයින් බඳවා ගැනීමේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සමග ගැඹුරු රහසිගත සාකච්ඡා පවත්වන ලදී. ඊට ළමා වයසේ දී බඳවා ගනු ලැබූ පුද්ගලයන්, බඳවා ගනු ලැබූ ළමයින්ගේ දෙමාපියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයන්, එල්ටීටීඊයේ හිටපු සාමාජිකයන්, මෙම කොමිටියේ මැන්ඩේට් කාල සීමාවේ ශ්‍රී ලංකාවේ වැඩ කළ ළමා ආරක්ෂණ ආයතන කාර්ය මණ්ඩල මෙන්ම ළමයින් බඳවා ගැනීම සහ සටනට යොදා ගැනීම පිළිබඳව තොරතුරු ඇති පුද්ගලයන් සහ කණ්ඩායම් අයත් වේ. තම ළමයින් බඳවා ගත් බවටත් සමහර අය සටන්වලදී මිය ගිය බවටත් චෝදනා කරන දෙමාපියන්ගේ සැල කිරීම්

---

609 Special court for Sierra Leone and International Criminal Court

610 International Labour Organization Worst Forms of Child Labour Convention 182, Article 3(a)

611 එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ශ්‍රී ලංකාවේ ළමයින් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ පළමු වාර්තාව (S/2006/1006) ළමයින් සහ සන්නද්ධගැටුම් පිළිබඳ ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායමට (SCWG-CAAC ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය 2007 පෙබරවාරි 9 මෙම වාර්තාව සැලකිල්ලට ගෙන 2007 ජුනි 13 නිගමන ප්‍රකාශයට පත් කරන ලදී. (S/AC51/2007/9) මෙම කණ්ඩායම මහ ලේකම්ගේ විශේෂ නියෝජිතයාගේ වාර්තාවල සඳහන් කර ඇත.

612 2009 දෙසැම්බර්SRSG-CAAC ගේ ශ්‍රී ලංකා සංචාරයෙන් පසුව ඔහුගේ පළමු වාර්තාවෙන් ඉනිය භාරතී විසින් අම්පාර දිස්ත්‍රික්කයේ ළමයින් බඳවා ගැනීම සහ නැවත බඳවා ගැනීමේ අනතුරු ගැන කණස්සල්ල මතු කෙළේය.

613 අදාල SRSG බලන්න. ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ විශේෂ නියෝජිතයාගේ 2010 පෙබරවාරි 4 ප්‍රකාශය සහ ළමයින් සහසන්නද්ධ ගැටුම් පිළිබඳ OSRSG ට එක්සත් ජාතීන් ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත ඉදිරිපත් කළ ලිපිය.

ගණනාවක් විමර්ශන කොමිටියට ලැබිණ. සමහර අවස්ථාවල මිය ගිය ළමයාගේ සිරුර ආපසු පවුලට ලබා දී ඇත.

665. සාකච්ඡාවට බඳුන් වූ තැනැත්තා 18 ට වඩා අඩු බව, සමහර විට බඳවා ගන්නා විට 15 ටත් වඩා අඩු බව පැහැදිලිවම දක්නට තිබුණත් එල්ටීටීඊ කාර්යධරයන් මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීමට මැලි වූ බව විමර්ශන කොමිටියට පෙනිණ. සමහරු එවැනි භාවිතයක් තිබුණේද යන්න පවා ප්‍රතික්ෂේප කළහ.

666. සමාලෝචනයට ලක් වූ කාල සීමාව තුළ ශ්‍රී ලංකා නිරීක්ෂණ දූත මෙහෙය (SLMM) සහ ආරක්ෂක මණ්ඩලයේ 1612 අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය ( MRM) යුනිසෙෆ් (UNICEF) නායකත්වයෙන් යුත් කාර්ය සාධක බලකාය ඇතුළත් ළමයින් බඳවා ගැනීමේ සහ යොදා ගැනීමේ සිද්ධීන් ලේඛනගත කිරීම අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ ගණනාවක් තිබිණ.

667. 2002 පෙබරවාරි සටන් විරාම ගිවිසුමෙන් (CFA) ''සාමාන්‍ය ජනතාව පැහැර ගැනීම, හිරිහැර කිරීම සහ බියවැද්දීම වැනි ක්‍රියා ඇතුළත් සාමාන්‍ය ජනතාවට එරෙහි එදිරිවාදි ක්‍රියා'' තහනම් කෙළේය. එහි ළමයින් බඳවා ගැනීම නිශ්චිතව සඳහන් නොවන නමුත් SLMM නිර්වචනය කෙළේ එය ආවරණය වන සේය. SLMM සිය මෙහෙයුම් 2002 ආරම්භයේ සිට රටින් පිටව යන තෙක් වයසින් අඩු අය බඳවා ගැනීමේ බොහෝ සිද්ධීන් සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීම් ලෙස නියම කොට ලේඛනගත කෙළේය.

668. 2005 දී ශ්‍රී ලංකාව ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1612 යටතේ එක්සත් ජාතීන්ගේ නායකත්වයෙන් අධීක්ෂණය සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන් තෝරා ගත් නියමු රටවල් හතෙන් එකක් විය.[614] යෝජනා 1612 අනුව සන්නද්ධ ගැටුමක දී ළමයින්ට එරෙහිව සිදු කරන බරපතළ උල්ලංඝනය කිරීම් හයක් පිළිබඳව ආරක්ෂක මණ්ඩලයට වාර්තා කළ යුතු විය. සන්නද්ධ ගැටුම්වලට ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම, ළමයින් මැරීම සහ තුවාල කිරීම, ළමයින්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය, පාසල් සහ රෝහල්වලට පහර දීම, ළමයින් පැහැර ගෙන යෑම, මානුෂීය ආධාර ලබා ගැනීම අහිමි කිරීම යනාදියයි. මෙම පරිච්ඡේදයෙන් ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ යෝජනා 1612 වාර්තා කිරීම ගැන ද සඳහන් වනු ඇත.

669. විමර්ශන කොමිටිය රැස්කර ගත් තොරතුරු අනුව, සටන්වලට ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීමේ සම්පූර්ණ පරිමාණය, විශේෂයෙන්ම ගැටුමේ අවසාන කාලයේ දී, ආණ්ඩුව 2008 සැප්තැම්බර් මාසයේ දී සියලු අන්තර්ජාතික ආයතනවලට වන්නියෙන් ඉවත්වීමට නියෝග කිරීමෙන් පසුව, ඉහත සඳහන් කරන ලද යාන්ත්‍රණ ලේඛන ගත කරන ලද ප්‍රමාණයට වඩා වැඩියැයි විශ්වාස කිරීමට හේතු පවතින බව දක්වේ. ඇත්තෙන්ම මෙම ඉවත් කර ගැනීමෙන් සැබැවින්ම අදහස් වූයේ ළමයින් බඳවා ගැනීම නිරීක්ෂණය කිරීමට ස්වාධීන නිරීක්ෂකයන් නොවීමය. ජාතික කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පිටව යෑමට එල්ටීටීඊය ඉඩ නොදුන් නිසා ඔවුන් රැඳී සිටි නමුත් අධීක්ෂණය කිරීමේ හැකියාව සහ ඒවා එල්ටීටීඊයෙන් ප්‍රශ්න කිරීමේ හැකියාව පලිගැනීමට ලක්විය හැකියැයි වූ බිය නිසා සීමා විය. වැඩි දුරටත් ගැටුමේ අවසාන කාල සීමාවේ දී එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඥාතීන් පවා එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් බඳවා ගත් අය අතර විය. 2009 පෙබරවාරි මස එක්සත් ජාතීන් ගේ

---

[614] ශ්‍රී ලංකාව 2006 ජුලි මස උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් ගොඩ නැගීම හරහා වූ පියවර සකස් කිරීමට අවශ්‍ය MRM කාර්ය සාධක බලකාය ස්ථාපිත කෙළේය. 2006 දී කාර්ය සාධක බලකාය එහි පළමු වාර්ෂික වාර්තාව ළමයින් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ විශේෂ නියෝජිතයාගේ කාර්යාලයට භාර දුන්නේය. (OSRSG-CAAC) යුනිසෙෆ් සමග එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිත/මානුෂීය සම්බන්ධීකාරක සම සභාපති වුවද ලොව අනෙක් තැන්වල මෙන් නොව ශ්‍රී ලංකාවේ MRM කාර්ය සාධක බලකායේ ආණ්ඩුවේ ආයතනද නියෝජනය විය. ප්‍රසිද්ධ කර ඇති වාර්තා අනුව කාර්ය සාධක බලකායේ ජාතික ආණ්ඩුවේ බලධාරීන් සිටීම එහි අපක්ෂපාතිත්වය සහ මධ්‍යස්ථභාවය හැල්ලුවට ලක් කිරීමක් මෙන්ම MRM සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුගේ 16 හැවිරිදි දියණියක් ඇතුළුව එහි කාර්ය මණ්ඩලයේ සමහර අය බලහත්කාරයෙන් බඳවා ගැනීම හෙළා දකිමින් ප්‍රකාශයක් නිකුත් කෙළේය.[615]

670. එල්ටීටීඊය බොහෝවිට අන්තර්ජාතික ප්‍රජාවේ නියෝජිතයන් සමග තර්ක කෙළේ ළමයින්, විශේෂයෙන් වයස අවුරුදු 16 ත් 18 ත් අතර ළමයින්, 'ස්වේච්ඡාවෙන්ම එකතු වූයේය යනුවෙනි. දෙමාපියන් මිය ගොස් සිටීම, පවුල් වෙන්ව යෑම, අවතැන්වීම, ආහාර නොමැතිවීම, ලෙඩ රෝග, දරිද්‍රතාවය, ආණ්ඩුවේ හමුදා විසින් හිරිහැර කිරීම, රඳවා ගැනිම, අධ්‍යාපන සහ රැකියා අවස්ථා නොමැතිවීම, නිවසේ දී අපහරණයට ලක්වීම, එල්ටීටීඊ අරමුණ සමග අනන්‍යවීම හෝ සතුරා කෙරේ වෛරයක් ඇතිවීම වැනි හේතු ගණනාවක් ඉදිරිපත් කෙරිණ.[616] මේවා ස්වාධීන සමීක්ෂකයන් විසින් වෙනත් සන්දර්භයන්[617] තුළ ලේඛන ගත කරන ලද පොදු හේතු වන අතර බොහෝ අවස්ථාවල බඳවා ගැනීමේ සාධක ද විය. කෙසේ වුවත් අන්තර්ජාතික නීතිය යටතේ මෙන්ම ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දී රාජ්‍යයක සන්නද්ධ හමුදාවලින් වෙනස් වූ සන්නද්ධ කණ්ඩායම් විසින් වයස 18 වඩා අඩු ළමයින් ස්වේච්ඡාවෙන් හෝ බලහත්කාරයෙන් සටන්වලට බඳවා ගැනිමේ සහ යොදා ගැනීමේ සියලු කටයුතු තහනම්ය.

671. බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් ළමයින් බොහෝවිට නිවසෙන්, පාසලෙන්, පන්සලෙන් සහ මුර කපොළුවලදී බලහත්කාරයෙන් බඳවා ගත්තේයැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. බොහෝ අවස්ථාවලදී ඔවුන්ට සටන් පුහුණුවක් ලබා දී පෙරමුණු සටන්වලට යවා ඇත. මෙම ළමයින්ගෙන් බොහෝ දෙනකු ආගිය තැනක් තවමත් සොයා ගත නොහැකිය.[618]යුද්ධය අවසානයේ දී ආණ්ඩුවේ පුනරුත්ථාපන සහ නැවත සමාජ ගත කිරීමේ වැඩ සටහන්වලට විධිමත්ව ඇතුළත් කර ගෙන ඇත්තේ එල්ටීටීඊය හා සම්බන්ධ ළමයින් 500 ක් පමණි. අනෙක් බොහෝ දෙනෙකු අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි අය විය හැකිය.

672. ශ්‍රී ලංකාවේ ළමයින් බඳවා ගැනීමේ භාවිතය පුළුල් වශයෙන්, නිදසුනක් වශයෙන් SLMM හා අනෙකුත් අන්තර්ජාතික ආයතන මගින් හෙළා දැක ඇත. එල්ටීටීඊය සහ කරුණා කණ්ඩායම සහ එහි TMVP පක්ෂය වැනි අතුරු හමුදා කණ්ඩායම්වල ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරීන්ට ළමයින්ට එරෙහිව සිදු කරන ප්‍රචණ්ඩත්වය සහ ඔවුන්ට අදාලවන අන්තර්ජාතික බැඳීම් ගැන දැනුවත් කිරීම් සිදු වුවද, සන්නද්ධ කණ්ඩායම්වල ශ්‍රේණීන්ගෙන් ළමයින් නිදහස් කිරීමට හා බඳවා ගැනීම නතර කිරීමට පොරොන්දු වුවද 2009 ගැටුම අවසන් වන තෙක් සහ සමහර අවස්ථාවල ඉන් ඔබ්බටත් මෙම භාවිතාවන් සිදු විය.

## ළමයින් බඳවා ගැනීමේ සහ යොදා ගැනීමේ රටා.

### එල්ටීටීඊයෙන් ළමයින් බඳවාගැනීම සහ යොදා ගැනීම

673. ළමයින් දහස් ගණනක් සටන්කරුවන් හා වෙනත් කාර්යන් සඳහා විස්තීර්ණව සහ ක්‍රමානුකූලව බඳවා ගැනීමේ දීර්ඝ ඉතිහාසයක් එල්ටීටීඊයට තිබිණ. 1990 ගණන්වල එල්ටීටීඊය සටන් කෙළේ සම්පූර්ණයෙන්ම ළමා සටන්කරුවන්ගෙන් සැදුම්ලත් බ්‍රිගේඩ යොදා ගනිමිනි.[619]තම ශ්‍රේණීන් තුළ ළමයින් සිටින බව පිළිගත් එල්ටීටීඊය ළමයින් බඳවා ගැනිම සහ සටන්වලට යොදා ගැනීම අවසන් කිරීමට පොරොන්දු වුවද නැවත නැවතත් එම පොරොන්දු කඩ කෙළේය. 1998 මැයි මාසයේ සන්නද්ධ ගැටුම් තුළ ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ විශේෂ නියෝජිතයා ශ්‍රී ලංකාවේ කළ සංචාරයෙන්

---

[615] එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයා බලහත්කාරයෙන් බඳවා ගනී., Colombo, 16 March 2009,Office of the Resident /Humanitarian Coordinator

[616] Former SLLM staff former UNICEF staff

[617] නිදසුනක් වශයෙන් බලන්න Wessells M (2005) ළමා සොල්දාදුවන් සාමය, අධ්‍යාපනය සහ සාමය සඳහා පශ්චාත් ගැටුම් නියෝජනය

[618] LLRC Chapter 9 para 9.75

[619] Human Rights Watch,2004බියෙන් ජීවත්වීම: ළමා සොල්දාදුවන් සහ ශ්‍රී ලංකාවේ දෙමළ කොටි සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

පසුව සන්නද්ධ ගැටුම්වලදී ළමයින් යොදා නොගැනිමට එල්ටීටීඊය එකග වුවද 2009 ගැටුම අවසන් වන තෙක් මෙම භාවිතය සිදු විය.

674. 2003 දී එල්ටිටීඊය ළමයින්ට හමුදා පුහුණුව ආරම්භ කිරීමට වඩාත් සුදුසු වයස වන්නේ අවුරුදු 15 සහ ඉන් ඉහළට බව SLMM වෙත දැනුම් දුන්නේය.[620] 2006 ඔක්තෝබර් 15 වැනිදා එල්ටිටීඊය බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 17 ලෙස ස්ථාපනය කිරීමේ ප්‍රතිපත්තියක් නියම කෙළේය.[621]2007 ඔක්තෝබර් මාසයේ දී එල්ටීටීඊය සන්නද්ධ ගැටුම් සහ ළමයින් සඳහා වූ මහ ලේකම් ගේ විශේෂ නියෝජිතයා වෙත ලිපියන් යවමින් සන්නද්ධ ගැටුම්වලදී ළමයින් යොදා ගැනීම පිළිබඳ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රයට අනුකූල වෙමින් බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 17 සිට 18 දක්වා වෙනස් කරන බව දැන්වූයේය. කෙසේ වුවත් විමර්ශන කොමිටිය ලබා ගත් තොරතුරු අනුව පොරොන්දුව ඉටු කිරීමට එල්ටීටීඊය අපොහොසත් වූ බව පෙනේ. ළමයින් බඳවා ගැනිමත් සටන්වලට යොදා ගැනිමත් දිගටම සිදු විය.

675. එක්සත් ජාතින් 2006 දී එල්ටීටීඊය විසින් ළමයින් බඳවා ගැනීමේ සාමාන්‍ය වයස අවුරුදු 16 ක් විය හැකියැයි ගණනය කෙළේය.[622]කෙසේ වුවත් එල්ටීටීඊය ඒ කාලයේ දීත් වයස අවුරුදු 15 ට වඩා අඩු සමහර ළමයින්, සමහරවිට අවුරුදු නමයේ ළමයින් පවා බඳවා ගත් බව වාර්තා වේ.[623]එය අධිකරණයකින් සනාථ වුවහොත් යුද අපරාධයක් ලෙස ගිණිය හැකිය.

676. 2002 සිට ගැටුම අවසන් වන තෙක් යුනිසෙප් සංවිධානය ළමයින් බඳවා ගැනීම පිළිබඳව දත් සිද්ධීන් ඇතුළත් දත්ත බැංකුවක් පවත්වා ගෙන ආවේය. එය ගැහැනු ළමයින් 2689 ක් ඇතුළුව එල්ටිටීඊයෙන් බඳවා ගත් ළමයින් 6,905 ක් ලේඛන ගත කර ඇත. SLMM ද එහි මැන්ඩේට් කාල සීමාව තුළ ළමයින් බඳවා ගැනීම පිළිබඳව දෙමාපියන්ගෙන් ලැබුණු පැමිණිලි බොහෝ ලියා පදිංචි කර ඇත. කෙසේ වුවත් කලින් දක් වූ ආකාරයට මෙම සංවිධානවලින් රැස්කළ තොරතුරු, බොහෝ පවුල් බඳවා ගැනීම ගැන වාර්තා කිරීමට අකමැති වූ නිසා පැවති තත්වයේ සම්පූර්ණ පරිමාණය නියෝජනය වන්නේ නැත.

677. ඒ දිනවල ශ්‍රී ලංකාවේ වැඩ කරමින් සිටි අන්තර්ජාතික ළමා ආරක්ෂණ කාර්ය මණ්ඩල සාමාජිකයෝ '' ගැටුමේ අවසාන අදියරේ දි එල්ටිටීඊය විසින් ළමයින් බඳවා ගැනීම අති විශාල ලෙස වැඩි කෙළේයැයි'' සඳහන් කළහ. [624] නොයෙකුත් වාර්තා අනුව ගැටුමේ අවසාන මාස කිපය ඇතුළත එල්ටිටීඊය අවුරුදු 15 ට වඩා අඩු ළමයින් පවා වැඩි වැඩියෙන් බඳවා ගෙන ඇත.[625]

**බඳවා ගැනීමේ ක්‍රියාවලිය**

678. වසර ගණනාවක්ම එල්ටීටීඊය තම පාලනය යටතේ පැවති ප්‍රදේශවල සංවිධානයට සෑම පවුලකින්ම එක ළමයෙක් ලබා දීමේ ප්‍රතිපත්තියක් යථාර්ථයක් වශයෙන්ම ක්‍රියාත්මක කෙළේය. සටන් විරාමය පැවති කාලය මුළුල්ලේම එල්ටිටීඊය ළමයින් බඳවා ගත් අතර 2006 දී සටන්

---

[620] SLMM ලේඛන

[621] S/2007/758/ ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව, 2007 දෙසැම්බර් 21

[622] S/2006/1006, ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව, 2006 දෙසැම්බර් 20

[623] S/2006/1006, ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව, 2006 දෙසැම්බර් 20
S/2009/325 සන්නද්ධ ගැටුම්වල ළමයින් පිළිබඳ මහලේකම් ගේ වාර්තාව 2009 ජුනි 25

[624] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[625] S/2009/325 සන්නද්ධ ගැටුම්වල ළමයින් පිළිබඳ මහලේකම් ගේ වාර්තාව

විරාමය බිඳ වැටීමත් සමග බඳවා ගැනිම වැඩි වූ බවට සලකුණු ඇත. පසුව, විශේෂයෙන්ම 2008 සිට සමහර අවස්ථාවල, සමහර ප්‍රදේශවල පවුලකින් ළමයින් තුන් දෙනෙකු හෝ හතර දෙනෙකු ගත් බව එක් සාක්ෂිකරුවෙකු වාර්තා කෙළේය.[626]බොහෝ අවස්ථාවල පවුල්වලට එල්ටීටීඊයට ළමයින් දීම හැර කළ හැකි වෙනත් දෙයක් තිබුණේ නැත. ප්‍රතික්ෂේප කළ අයට හිරිහැර, ප්‍රචණ්ඩත්වය සහ පවුලේ වෙනත් සාමාජිකයන් පැහැර ගැනීමට මුහුණ දීමට සිදුවන නිසාය.

679. ළමයින් බඳවා ගැනීම එල්ටීටීඊය සිටි සෑම ප්‍රදේශයකම සිදු විය. වැඩි දුරටත් ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලින්ද ළමයින් බඳවා ගෙන වන්නියට ගෙන ගොස් ඇත. ළමයින් බඳවා ගැනීමට විශේෂයෙන්ම සහභාගිවී ඇත්තේ දේශපාලන අංශය, කාන්තා අංශය සහ සමහර අවස්ථාවල බුද්ධි අංශයයි.

680. එල්ටීටීඊයට බැඳීම ප්‍රතික්ෂේප කළ ළමයින් පහර දීමට හෝ ප්‍රචණ්ඩත්වයට ලක් කිරීමේ අනතුරක් තිබිණ. විරෝධය පෑමට ඉදිරිපත් වූ ඥාතීන්ට හෝ භාරකරුවන්ට බොහෝවිට පහර දී ඇත. තම සොහොයුරන් හෝ සොහොයුරියන් බලහත්කාරයෙන් ගෙනයෑම වැළැක්වීම සඳහා එල්ටීටීඊයට 'ස්වේච්ඡාවෙන්ම' බැඳීමට ඉදිරිපත් වූ සිද්ධීන්ද විමර්ශන කොමිටියෙන් ලේඛන ගත කර ඇත.[627] බඳවා ගැනීමට විරුද්ධ වූ නිසා එල්ටීටීඊ කාර්යධරයන් විසින් ළමයින්ට පහර දෙනු දුටු සාක්ෂිකරුවන් සමග මෙම කොමිටිය සාකච්ඡා කර ඇත. මෙවැනි භාවිතා ගැන තවත් වාර්තා ද ලැබිණ.[628]දරුවන් බඳවා ගැනීම වැළැක්වීමට ඉදිරිපත් වූ දෙමාපියන්ට හා භාරකරුවන්ට එල්ටීටීඊයේ පහර දීමට, පිහියෙන් ඇනීමට සහ/හෝ පැහැර ගෙන යෑමට ලක් වූ බව වෙනත් සාක්ෂිකරුවෝ ද කොමිටියට කීහ. [629]
681. නැගෙනහිර දී බඳවා ගත් ළමයින් බඳවා ගැනීමෙන් දින දෙකකටත් වඩා අඩු කාලයකදී වන්නියට යැවූ බවට විශ්වාස කටයුතු වාර්තාවලින් දැක්වේ. වාර්තාවන ආකාරයට එක අවස්ථාවක මඩකලපුවෙන් බඳවා ගෙන වන්නියට රැගෙන ගිය අයගෙන් සියයට 90 ක්ම වයස 18 ට වඩා අඩු ළමයින් බව පෙනෙන්නේයැයි යුද හමුදාව නිරීක්ෂණය කර ඇත.[630]ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශයකින් බඳවා ගත් ළමයෙක් වන්නියේ එල්ටීටීඊ හමුදා ව්‍යුහයට මාරු කර යැවූ පසු ඔහු නිදහස් කර ගැනීමට ඇත්තේ සීමිත අවස්ථාවක් බව SLMM හි හිටපු නිරීක්ෂකයෝ වාර්තා කළහ.[631] ඔවුන් ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවල සිටින විට පවුලේ සාමාජිකයන් විසින් හෝ අන්තර්ජාතික ආයතන විසින් විශේෂයෙන්ම දේශපාලන අංශය සමග සාකච්ඡා කළහොත් ළමයා නිදහස් කර ගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

682. අඩුම වශයෙන් 2003 සිට එල්ටීටීඊය ළමයින් සටනට එක් වීමට පොළඹවා ගැනීමට පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන ගියේය. ඔවුහු පාසල් අසළ ශබ්ද විකාශන යන්ත්‍ර සවි කොට දේශප්‍රේමී ගීත හා 'නරවිරුවන්ගේ' කතා විකාශනය කර ජනතාව සටනට එකතුවීමට දිරිමත් කළහ. එල්ටීටීඊය පාසල්වලදී අවුරුදු 13 ක පමණ ළමයින් සටන්කරුවන් වශයෙන් එක්වීමට පොළඹවා ගැනීමේ අදහසින් ප්‍රචාරාත්මක නාට්‍ය ඇතුළත් සමාජයීය සහ සංස්කෘතික වැඩ සටහන් පවත්වනු ඇත. එවැනි ක්‍රියාකාරකම් දුප්පත් ප්‍රජාව ඉලක්ක කර ගන්නා අතර ළමයින් තුළ ඔවුන්ට පාසල් යෑමටත් ආහාර සහ මුදල් වැනි ප්‍රතිලාභද අත්වන්නේය යන විශ්වාසය ඇති කරවයි.

683. ළමයින් සටනට එකතු වීමට පොළඹවා ගැනීම සඳහා එල්ටීටීඊ කාර්යධරයන් පාසල්වලට යන බවට වාර්තා රැසක් පවතී. නිදසුනක් වශයෙන් 2004 දී විශේෂයෙන් යාපනය, මන්නාරම

[626] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[627] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[628] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[629] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[630] SLMM ප්‍රලේඛන
[631] මූලාශ්‍රය වාර්තාවේ

සහ වවුනියාවේ පාසල්වල සහ වෙනත් ස්ථානවල එල්ටීටීඊ කාර්යධරයෝ සිය ගණනක් එවැනි වැඩ සටහන් පැවැත් වූහ. සමහර විට එවැනි වැඩ සටහනන් අවසන් වූ වහාම ළමයින් දෙමාපියන්ටත් නොදන්වා ගෙන ගොස් ඇත. වෙනත් ළමයින් පැහැර ගෙන ඇත්තේ පාසලට යන විට හෝ පාසලේ සිට ආපසු පැමිණෙන විට මෝටර් සයිකල්වලින් හෝ සුදු වෑන්වලින්[632] පැමිණෙන පුද්ගලයන් විසින් ළමයින්ගේ දෙමාපියන්ටත් දැනුම් දීමක් කරන්නේ නැතිවය. උතුරු පළාතේ 2007 නොවැම්බර් මාසයේ දී වයස අවුරුදු 15 ක ශිෂ්‍යාවක් පාසලේ සිට ආපසු පැමිණෙමින් සිටියදී සාමාන්‍ය ඇඳුමෙන් සැරසි පුද්ගලයන් තිදෙනෙකු ඇය පිටුපස ලුහුබැඳ ඇත. ඇය රැගෙන යෑමට පාසලට පැමිණි ඇගේ පියා ඔවුන්ට බැගෑපත් වුවද ඔවුහු පියාට පහර දුන්හ. ශිෂ්‍යාව ඇගේ පාසල් නිල ඇඳුම සමගම ගෙන යන ලදී. දැරියගේ පියාට ඇය එල්ටීටීඊයත් සමග සටන් බිමේ සිටින බව දක්වා ලිපියක් ලැබිණ. පසුව සටනේ දි මිය ගිය ඇයගේ සිරුර අවසන් කටයුතු සඳහා නිවසට එවා ඇත.[633]මෙවැනි ක්‍රියා මාර්ගය යුනිසෙෆ් සහ SLMM නිරීක්ෂකයන්ට ඔවුන්ගේ සේවා කාලයේ දී නිරන්තරයෙන්ම වාර්තා විය.

684. එල්ටීටීඊයේ බඳවා ගැනීම් සිදු කරන්නෝ ළමයින්ගෙන් හෝ යෞවනයන්ගෙන් එල්ටීටීඊයට බැඳීමට 'ස්වේච්ඡාවෙන්' ඉදිරිපත්වන ලෙස දන්වමින් ගම් හා නගරවල ගෙයින් ගෙට ගොස් දෙමාපියන්ට ලිපි බෙදූහ. එල්ටීටීඊය 2006 දී ගෙයින් ගෙට යෑමේ දී බොහෝ විට වයස අවුරුදු 14 සහ 15 ළමයින් ඔවුන්ගේ මවුවරුන් විලාප නගද්දී පැහැර ගෙන ගිය ආකාරය සාක්ෂිකරුවෝ විස්තර කළහ.[634] ''නිදසුනක් වශයෙන් 2004 දී වාහරෙයි ගමට පැමිණි එල්ටීටීඊ කාර්යධරයන් සිය ගණනක් ගමේ සෑම ගෙදරකටම ගොස් ජනතාවට එක ස්ථානයකට රැස්වන ලෙස දන්වා එහිදී ළමයින් බලහත්කාරයෙන් පැහැර ගත් බවට වාර්තා මෙම කොමිටියට ලැබිණ.[635]''

685. එල්ටීටීඊය තම ශ්‍රේණීන්ට බලහත්කාරයෙන් බඳවා ගැනීම සඳහා මඩකලපුව, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල අනාථාගාර, රෝහල් සහ විශේෂයෙන් උත්සව කාලයේ දී පන්සල්වලට ගොස් ළමයින් පැහැර ගත්තේය. එල්ටීටීඊය 2004 දී මඩකලපුව අසළ පන්සලක උත්සවයක් පැවැත් වෙන විට සටනට බඳවා ගැනීම සඳහා ළමයින් 20 කට වැඩි සංඛ්‍යාවක් පැහැර ගත්තේය. ළමා ආරක්ෂණ ආයතනවල මැදිහත්වීමෙන් මෙම ළමයින් බොහෝ දෙනෙකු අවසානයේ නිදහස් කෙරිණ.[636]2008 දී රෝහලකට ඇතුළු වූ එල්ටීටීඊ පොලීසියේ තිදෙනෙකු බඳවා ගැනීම වැළැක්වීමට[637] ඉදිරිපත් වූ වෛද්‍යවරයාට පහර දී ළමයින් සහ තරුණ වැඩිහිටියන් පැහැර ගත්හ.ළමයින් ඇද ගෙන යනවිට මවුවරුන් එල්ටීටීඊයට සාප කිරීමේ සංකේතයක් වන වැලිවලින් දමා ගැසූ ආකාරය එක ආරංචි මාර්ගයක් විස්තර කෙළේය. [638]

686. ගැටුම් පැවති කාලය පුරාම පවුල් තම දරුවන් බලහත්කාරයෙන් බඳවා ගැනිමෙන් වැළැක්වීමට ඔවුන් නිවෙස් තුළ, ඇත කැලෑවේ රහස් ස්ථානවල',[639] කෝවිල්, පාසල්, පල්ලි හෝ රෝහල්, සහ වෙනත් දිස්ත්‍රික්කවල ඥාති ගෙවල්වල සඟවා තැබීම වැනි විවිධ පියවර ගත්හ. 2007 දී වූ එක සිද්ධියකදී ළමයින් හා තරුණයන් 20 කට පමණ බඳවා ගැනීමෙන් ගැලවීම සඳහා කිලිනොච්චියේ රෝහල් භූමියේ සිටීමට ඉඩ ලැබිණ. මන්නාරම අසළ ගමක එල්ටීටීඊය විසින් පවත්වන ලද බඳවා ගැනීමේ ප්‍රචාරක ව්‍යාපාරයකින් පසුව පවුලකින් එක පුද්ගලයෙක් බැගින් 'ස්වේච්ඡාවෙන්' ඉදිරිපත්වන ලෙස කළ ඉල්ලීම ඔවුන් ප්‍රතික්ෂේප කිරීම නිසා තර්ජනය කිරීම් සහ පැහැර ගැනීම්වලට ලක් වූ අතර එක පවුලක් මඩු පල්ලියේ රැකවරණය ලබා ගත්තේය.[640] සැඟවී සිටි ළමයින් සොයා ගනු ලැබුව හොත් ඔවුන් බඳවා ගෙන එල්ටීටීඊයෙන් දෙමාපියන්ට තදින් පහර දෙනු ඇත.[641]

---

632 මූලාශ්‍රය වාර්තාවේ
633 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
634 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
635 OISL දුටු අන්තර්ජාතික සංවිධානයක අභ්‍යන්තර ලේඛනකින්
636 OISL දුටු අන්තර්ජාතික සංවිධානයක අභ්‍යන්තර ලේඛනකින්
637 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
638 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
639 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
640 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
641 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

687. තම දරුවන් විවාහ වුවහොත් බඳවා ගැනීමෙන් මුදා ගත හැකියැයි සමහර දෙමාපියන් විශ්වාස කළ නිසා අඩු වයසෙන් විවාහ වීමේ රටාවක් ඇති විය.[642]

688. තම දරුවන් එල්ටීටීඊ කඳවුරට ගිය බව හෝ ගෙනගිය බව දුටු අය පැවසුවේයැයි බොහෝවිට යුනිසෙප් හෝ SLMM කාර්යාලවලට පැමිණෙ දෙමාපියෝ කියති. දෙමාපියන් තම දරුවන් ඉල්ලා ගෙන එල්ටීටීඊ කඳවුරුවලටද යනු ඇත. එහිදී ඔවුන්ට සමහර විට එල්ටීටීඊ කාර්යධරයන්ගෙන් බැණුම් ඇසීමටත් පහර කෑමටත් ලක් විය හැකිය.[643]බොහෝ අවස්ථාවල එල්ටිටීඊය සමග ගත කළ මුලු කාලය තුළම ළමයින්ට තම පවුල් සමග කිසි සම්බන්ධතාවයක් පැවැත්වීමට හැකියාවක් තිබුණේ නැත. [644]2004 දී යුනිසෙප් ආයතනය තම දරුවන් පැහැර ගැනීමට ලක් වූ දෙමාපියන් 63 ක් සමග කතා කෙළේය. ඒ කිසිවෙකුට ළමයින් සමග සම්බන්ධතාවයක් පවත්වා ගැනිමට නොහැකිව ඇත.

689. එල්ටීටීඊයට සම්බන්ධ වූ ළමයින් එල්ටීටීඊය හැර යෑමට සූදානම් වුවහොත් ඔවුන් හෝ ඔවුන්ගේ පවුල්වල අය මරා දමන බවට සමහරවිට එල්ටිටීඊය තර්ජනය කර ඇත. ළමයින් ගලවා ගැනීමට සමත් වූ ළමා ආරක්ෂණ ආයතන ඔවුන් නැවත බඳවා ගැනිමෙන් හෝ දඬුවම් දිමෙන් මුදා ගැනීම සඳහා ගැටුම් පැවති ප්‍රදේශවලින් ඈත අය පවා බොහෝවිට ආරක්ෂිත ස්ථානවලට ගෙන යනු ලැබේ. එල්ටීටීඊය විසින් නැවත අල්ලා ගත් ළමයින්ට වධහිංසා පැමිණවීම පිළිබඳ වාර්තා මෙම කොමිටියට ලැබී ඇත.[645]

690. ළමා ආරක්ෂණ ආයතනවලට වාර්තා වූ සුපුරුදු සිද්ධියක් වන්නේ නැවත අල්ලා ගත් 17 හැවිරිදි ගැහැනු ළමයෙකුගේ කතාවයි. ආරක්ෂිත නිවසක සිටි ඇය තම මාමා කෙනෙකුගේ අවමගුලකට සහභාගිවීම සඳහා ආපසු මඩකලපුවට ගියාය. එල්ටීටීඊය විසින් අල්ලා ගත් ඇය දින තුනක් තිස්සේ පොළවට තබා ඇණ ගසා තිබිණ. ඇයට ඉඳ හිට බීමට හෝ වතුර පොදක් ලැබුණේ දින දෙකක් දෑඩි අව්වේ තැවීමෙන් පසුවය. ඉන් පසුව ඇය ට සහනයක් හිමි විය.

691. 2009 දී වයස 14 හෝ ඊට වඩා අඩු ගැහැනු සහ පිරිමි ළමයින් වඩාත් බඳවා ගත් බව ආරංචි මාර්ග ගණනාවකින් සඳහන් කෙරිණ. [646]ළමයින් විලාප නගමින් ආපසු තම දෙමාපියන් වෙත දිව යෑමට තැත් කළ ආකාරය දුටු බව සාක්ෂිකරුවෝ විස්තර කළහ.[647] ( ගැටුමේ මෙම අදියරේ දී ළමයින් බඳවා ගැනිම සිදු වූයේ සටන් සහ ෂෙල් වෙඩි ප්‍රහාර වඩාත් තියුණු වූ පසුබිමක් යටතේ බව සඳහන් කළ යුතුය.) 2009 පෙබරවාරි 17 වැනි දා යුනිසෙප් සංවිධානය ගැටුම් පවතින ප්‍රදේශවල ළමයින්ගේ ආරක්ෂාව ගැන කණස්සල්ල පළ කෙරෙන ප්‍රකාශයක් නිකුත් කෙළේය. එහි මෙසේ ද සඳහන් විය. ''එල්ටීටීඊය සාමාන්‍ය ජනතාව බඳවා ගැනීම වඩාත් වැඩි කර ඇති බවත් අවුරුදු 14 වැනි කුඩා ළමයින් පවා දැන් ඉලක්ක කර ගෙන ඇති බවත් පැහැදිලිව දැක්වෙන තොරතුරු අපට ලැබී ඇත.''

692. 2009 මාර්තු මාසයේ අගදී පවුලක් තම දරුවා සැඟවීමට තැනූ බොරු බිත්තියක් සහිත බංකරයක් සහ තවත් අවස්ථාවක මවක් තම දරුවන් තිදෙනා දිය නැහැවීමට රාත්‍රියේ ගෙන යන ආකාරය දුටු බවත් කුඩා දරුවෙකුගේ මවක් මෙම කොමිටියට විස්තර කළාය. එල්ටීටීඊය ඔවුන්ට වෙඩි තැබූ විට ළමයින් පලා ගිය නමුත් මව වෙඩි වැදී මිය ගොස් ඇතැයි වාර්තාවිය. ඇය එම අවස්ථාවේ දි බඳවා ගැනීමෙන් ගැලවී ඇත්තේ සාමාන්‍ය ඇඳුමෙන් සිටි සන්නද්ධ කණ්ඩායමක් – ඇය විශ්වාස කරන ආකාරයට එල්ටීටීඊ කාර්යධරයන් – ඇය බලහත්කාරයෙන් ට්‍රක් රථයකට නැංවීමට උත්සාහ කිරීමේ දීය. ඇය විරෝධය පෑ විට ඇයට ඔවුන් පහර දුන් නමුත් ඇයගේ දුව ඇයට අඬගසනු ඇසීම නිසා කාර්යධරයන් ඇය අතහැර දමා ඇත.[648]

---

[642] http//www.hrw.org/reports/2004/srilanka1104/srilanka1104.pdf
[643] මූලාශ්‍රය වාර්තාවේ
[644] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[645] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[646] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[647] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
[648] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

693. ගැටුමේ අවසාන මාස කීපයේදී බලහත්කාරයෙන් බඳවා ගැනීම පිළිබඳ වඩාත් බරපතළ සිද්ධීන්ගෙන් එකක් වන්නේ 2009 මාර්තු මස අග භාගයේදී එලිලාන් සහ ඉලම්පරති ගේ නායකත්වයෙන් යුත් එල්ටීටී කාර්යධරයන් පිරිසක් වලයාර්මඩම් පල්ලියේ රැකවරණය ලබා සිටි වැඩිහිටියන් සහ ළමයින් සිය ගණනක් පැහැර ගෙන ගිය බවට ඇති චෝදනාවයි. මෙම සිද්ධිය කලින් පරිච්ඡේදයේ දී විස්තර කර ඇත.[649]

694. ළමයින් බඳවා ගැනීම පිළිබඳ වගකීම පැවරෙන්නේයැයි සඳහන්වන එල්ටීටීඊයේ ඉහළ මට්ටමේ තවත් නායකයෙකු වන්නේ එල්ටීටීඊ ක්‍රීඩා අංශයේ ප්‍රධානි පපාය.[650] වාර්තා වන ආකාරයට ඔහු 2009 අප්‍රේල් මාසයේ දී තවත් එල්ටීටීඊ කාර්යධරයන් සමග සුදු වෑන් රථයකින් වලයාර්මඩම් පල්ලියට පැමිණ ඉන් බැස පාරේ ගමන් කරමින් සිටි තරුණ ගැහැනු ළමයෙක් (වයස අවුරුදු 17 ක් පමණ වන) සහ ඇය ගෙන යෑම වැළැක්වීමට තැත් කළ පුද්ගලයෙකු පැහැර ගෙන ගොස් ඇත. මිනිසුන් මෙම සිද්ධිය දුක ඇති නමුත් මැදිහත්වී නැත්තේ තමන් ද මරා දමනු හෝ බඳවා ගනු ඇතැයි බිය නිසාය.[651]

695. සන්නද්ධ ගැටුමේ අවසාන මාස සහ සති කිපය තුළ එල්ටීටීඊය තම ශ්‍රේණීන් පුරවා ගැනිමට වඩාත් සාහසිකව ක්‍රියා කිරීමත් සමග බලහත්කාරයෙන් බඳවා ගැනීම, වින්දිතයන් විය හැකි වූ අය තුළ බිය සහ වේදනාව වඩාත් වැඩි කරවිය. නිරන්තරයෙන්ම අවතැන්විමත් සමග බඳවා ගැනීමෙන් ගලවා ගැනීමට ළමයින් සැඟවීම වඩාත් අසීරු විය. ළමයින් බංකර්වල සඟවා තිබූ අවස්ථාද වාර්තාවිය. වාර්තා වූ තවත් සිද්ධියක දී බඳවා ගැනීමෙන් මිදීමට බංකරයක සැඟවී සිටි ගැහැනුන් සහ තරුණියන් කණ්ඩායමක් වාර්තාවන ආකාරයට යුද හමුදාව දෙසින් පැමිණි ෂෙල් වෙඩිල්ලක් වැදී මිය ගියහ. [652]

**එල්ටීටීඊය සටන්වලට ළමයින් යොදා ගැනීම**

696. එල්ටීටීඊය ළමයින් මහා සටන්වලදී පෙරමුණේම සටන් කිරීමට යෙදවීම ඇතුළත් විවිධ ආකාරයෙන් යොදවා ගෙන ඇත. එල්ටීටීඊය ඔවුන් පාබල හමුදා භටයන්, ආරක්ෂක සහ බුද්ධි අංශයේ නිලධාරීන් සහ මරාගෙන මැරෙන බෝම්බකරුවන් වශයෙන් පවා යොදා ගෙන ඇත.[653]ගැටුම අවසානයේ දී සාමාන්‍ය ජනතාව ගැටුම් පැවති කලාපයෙන් ඉවත්ව යෑමට තැත් කරන විට ඔවුන් තුවක්කු පෙන්වා වැළැක්වූවන් අතර ළමයින් ද සිටි බවට වාර්තා විමර්ශන කොමිටියට ලැබී ඇත. ඔවුහු පැහැදිලිවම දුක්වේදනාවෙන් පසු වූහ.[654]

697. බඳවා ගත් ළමයින්ට ආයුධ පරිහරණය ඇතුළු කිසියම් සටන් පුහුණුවක් ලබා දී ඇත. සමහරවිට එම පුහුණුව ළමයින් සටනට යැවීමට පෙර දින දෙකක් වැනි කෙටි කාලයකට සීමා විය. ළමයින් සඳහා පුහුණු කඳවුරු පිහිටා තිබුණේ වලිපුනාම් හි පඩතුරප්පලි පාසල, පලෙයි හි එරිමලේයි කඳවුර සහ ආනන්දපුරම් හිය. එවැනි කඳවුරක ළමයින් 3000 ත් 4000 ත් අතර සංඛ්‍යාවක් සිටිය හැකි බවත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු වයස අවුරුදු 15 ට වඩා අඩු අතර සමහරුන් අවුරුදු 9 වැනි කුඩා අය බවත් එක ආරංචි මාර්ගයක් සඳහන් කෙළේය.[655]

698. එක් සාක්ෂිකරුවෙකු මඩකලපුවේ දී බඳවා ගෙන යාපනය අසළ සටන් බිමකට යවන ලද අවුරුදු 13 ක ළමයෙකු සමග 2003 දී සාකච්ඡා කර ඇත. එම සාක්ෂිකරුවාම ''පැහැදිලිවම වයසින් අඩු සටන්කරුවන්'' නැගෙනහිර පළාතේ එල්ටීටීඊ අණ දෙන්නා වූ කරුණාගේ කැලෑවක පිහිටි අණ දීමේ මධ්‍යස්ථානයක රැකවලට යොදා සිටිනු දුක ඇත.[656] වයසින් අඩු ළමයින් හමුදා පුහුණුව[657] ලබන බවද, මුර කපොළුවලට යොදා ඇති බවද, යුධ ටැංකි නාශක

---

[649] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[650] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[651] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[652] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[653] http://www.hrw/org/report/2007/01/23/complicit-crime/state-collusion-abductions-and-child-recruitment-karuna-group

[654] බලන්න එහා මෙහා යෑම පිළිබඳ සීමා පැනවීම XIV පරිච්ඡේදය

[655] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[656] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[657] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

අවි ඇතුළු අවි පරිහරණය කරන බවද SLMM නිරීක්ෂකයන් දක ඇත. [658] බංකර් කැනීමට, ආරක්ෂක සේවයට සහ සටන් බිමේ දී මිය ගිය භටයන්ගේ ආයුධ ගැනීමට ද ළමයින් යොදා ගෙන ඇත.

699. ළමයින් බුද්ධි තොරතුරු රැස්කිරීම, බඳවා ගැනීම සහ දේශපාලන කටයුතු වැනි සටන්වලට සම්බන්ධයක් නැති භූමිකාවලද යොදා ගෙන ඇත. 2003 සිටම ළමයින් එල්ටීටීඊ බුද්ධි අංශයේ වැඩ කරන බවට සැලකිය යුතු තරම් වාර්තා ලැබිණ. නිදසුනක් වශයෙන් 2004 දී පලා ආ පසු ළමා ආරක්ෂණ ආයතනයක සහාය ලබා ගත් ගැහැනු ළමයින් හතර දෙනෙකු කොළඹ ආණ්ඩුවේ ප්‍රධාන ස්ථානවල GPS බණ්ඩාංක සටහන් කිරීම ඇතුළුව, රටේ විවිධ ප්‍රදේශවල යෙදවූ බව වාර්තා කළහ. ගැහැනු ළමයින් සඳහා එල්ටීටීඊයේ සාමාන්‍ය පුරුද්ද වූයේ බඳවා ගැනීමෙන් පසු කොණ්ඩය කොටට කැපීමය. එල්ටීටීඊය එම ගැහැනු ළමයින් ගේ කොණ්ඩය වැඩී සමාජයට එකතුවන තෙක් එම කෙස් තබා ගත්තේය.

700. ළමයින් කොපමණ සටන් පෙරමුණට යැව්වේද, ගැටුම පැවති වසර ගණනාව තුළ ළමයින් කී දෙනෙක් මිය ගියේද යන්න දන ගන්නට නැත. මුල් වසරවලදී මිය ගිය අයගේ සිරුරු සමහර විට පවුල්වලට ආපසු බාර දි ඇත.[659]තම දරුවන් එල්ටීටීඊය විසින් පැහැර ගෙන ගිය බව අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ ජනාධිපති කොමිසමට ඉන් පසුව පැමිණිලි කළ දෙමාපියන් බොහෝ දෙනෙකු තම දරුවන් දන් මියගිය, අතුරුදහන් වූ හෝ සන්නද්ධ ගැටුමේදී අතුරුදහන් වූවන් අතර විය හැකියැයි සිතති. ළමයින් බඳවා ගැනිමේ සම්පූර්ණ වපසරිය සහ තොරතුරක් නැතිව සිටින අයගේ ප්‍රමාණය තීරණය කිරීමට සම්පූර්ණ විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාවය පවතී.

**ළමයින් බඳවා ගැනීම අවසන් කිරීම සහ නිදහස් කිරීම සඳහා වූ එල්ටීටීඊ ක්‍රියාත්මක සැලැස්ම.**

701. ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1460 (2003) අනුව ලැයිස්තු ගත කරන ලද පාර්ශ්වයන් සන්නද්ධ ගැටුම්වලදී ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම අවසන් කිරීමට පැහැදිලි කාල සීමා දක්වන ගිවිසුමකට එළඹීම සඳහා කතිකාවක් ඇරඹිය යුතුය.

702. 2003 දී බර්ලින් නගරයේ පැවති සාම සාකච්ඡාවලික් පසුව එල්ටීටීඊය ළමයින් තම ශ්‍රේණීන් තුළට බඳවා නොගැනීමේ සහ ඔවුන් හා සම්බන්ධව සිටින ළමයින් නිදහස් කිරීමේ පොරොන්දුව ක්‍රියාත්මක කිරීමට පියවර ගැනිම සඳහා යුනිසෙප් සංවිධානය හමුවීමට එකඟ වූයේය.[660] ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර සන්නද්ධ ගැටුමෙන් පීඩාවට පත් ළමයින් සඳහා ක්‍රියාත්මක සැලැස්මකට 2003 ජුනි 16 දින ආණ්ඩුවේ සහ එල්ටීටීඊයේ අනුමැතිය පළවිය. 2003 ඔක්තෝබර් මස කිලිනොච්චියේ දී එල්ටීටීඊයෙන් වෙන් කරන ළමයින් සඳහා සංක්‍රාමීය මධ්‍යස්ථානයක් එල්ටීටීඊ අණ දෙන්නන් ඉදිරියේ විවෘත විය. ළමයින් හතළිස් නමයක් – පිරිමි ළමයින් 27 ක් ගැහැනු ළමයින් 22 ක් වශයෙන් – එල්ටීටීඊයෙන් ඉවත් කෙරිණ. 2003 ජුලි සිට 2005 ජුනි දක්වා වසර දෙකක වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලද්දේ අන්තර්ජාතික පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිවය. පසුව එය 2006 ජුලි දක්වා දීර්ඝ කෙරිණ.[661]

703. ක්‍රියාත්මක සැලැස්මේ කොටසක් ලෙස ළමයින් බඳවා ගැනීම් සියල්ල නතර කිරීමට එල්ටීටීඊය පොරොන්දු වුවද බඳවා ගැනීම් දිගටම සිදු විය. යුනිසෙප් සංවිධානයේ සංඛ්‍යා ලේඛන අනුව ක්‍රියාත්මක සැලැස්ම අත්සන් කිරීමෙන් පසු ගතවූ මාස 12 ඇතුළත එල්ටීටීඊය අඩුම වශයෙන් ළමයින් 1,406 ක් බඳවා ගත් අතර ළමයින් 625 ක් නිදහස් කෙළේය.[662]

---

[658] මූලාශ්‍රය වාර්තාවේ

[659] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[660]http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca200302/20030203child_soldiers_released_unicef_chief.htm

[661] UNSCR 1612 අනුකූලව ශ්‍රී ලංකාවේ ගැටුම් පැවති ප්‍රදේශවල ළමා අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය කිරීම පිළිබඳ වාර්තාව,1 November 2005- 31 October 2006

[662] මාසික වාර්තාවල UNICEF සංඛ්‍යාත. ඒවා SLMM හා ශ්‍රී ලංකාවේ වැඩ කරන වෙනත් අන්තර්ජාතික සංවිංධාන සමග හුවමාරු කර ගන්නා ලදී

එල්ටීටීඊයෙන් නිදහස් කළ ළමයින් සංඛ්‍යාව කෙතරම් පහත වැටුණේ ද යත් ළමයින් නිදහස් කිරීමේ මන්දගාමී භාවය නිසාම 2005 දී කිලිනොච්චිය මධ්‍යස්ථානය වසා දැමීමට සිදු විය.

704. 2009 මැයි මාසයේ දී සන්නද්ධ ගැටුම අවසන් වන තෙක් එල්ටීටීඊයෙන් සන්නද්ධ ගැටුමට ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ න්‍යාය පත්‍රයේ තිබිණ.

**ගැටුම අවසානයේ එල්ටීටීඊය හා සම්බන්ධ වූ ළමයින් නිදහස් කිරීම සහ ප්‍රති සමාජගත කිරීම.**

705. 2006 සැප්තැම්බර් මාසයේ දි ජනාධිපති රාජපක්ෂ ළමයින් ඇතුළුව ගැටුමෙන් ''භාර වූ'' සියල්ලන්ටම අදාලව පුනරුත්ථාපන වගකීම් නිශ්චිතව පැවරුණ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වරයෙකු පත් කෙළේය. එම කොමසාරිස් ජනරාල් දිස්ත්‍රික් බලධාරීන් සහ පළාත් පරිවාස කොමසාරිස්වරුන් සහ ළමා රැකවරණය සහ සේවා සහ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සමග සාකච්ඡා කිරීමෙන් පසු එල්ටීටීඊයට සම්බන්ධව සිටි ළමයින් භාර ගැනීම සඳහා ''ආරක්ෂිත නවාතැන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන'' හැඳින ගත්තේය. එල්ටීටීඊය හා සම්බන්ධව සිටි ළමයින් ගේ ආරක්ෂිත රැකවරණය, පුනරුත්ථාපනය සහ ප්‍රති සමාජගත කිරීම පිළිබඳ ප්‍රතිපත්ති ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ මූලිකත්වයෙන් සකස් කරන ලදී.

706. 2008 දෙසැම්බර් 15 නිකුත් කළ අංක 1580/5 හදිසි නිති රෙගුලාසිවලට පවුල් නැවත එකතු කිරීමේ මහෙස්ත්‍රාත්වරයෙකු තිරණය කළ යුතු හෝ ළමයා ආරක්ෂිත ළමා නවාතැන් මධ්‍යස්ථානයකට යැවීම වැනි විකල්ප ඇතුළත් ළමා ''භාරවූවන්'' සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නිශ්චිත ක්‍රියා පටිපාටි ඇතුළත් වේ.

707. සන්නද්ධ ගැටුම අවසානයේ වන්නියෙන් පිටතට එන ළමයින් මුලදී වැඩිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට ගෙන යනු ලැබුව ද පසුව අවසානයේ දී ළමා ආරක්ෂණ නවාතැන් මධ්‍යස්ථාන තුනකින් එකකට ගෙනයන ලදී. 2010 වනවිට විවෘතව පැවතියේ කොළම රත්මලාන මධ්‍යස්ථානය පමණි. ළමයින් 350 කට අධික සංඛ්‍යාවක් දෙමාපියන්ට භාර දීම හෝ සංක්‍රාමීය කඳවුරුවලට යවා තිබිණ.

708. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා 2009 අප්‍රේල් මාසයේ දී ඕමන්තේ සහ සරණාගත රැඳවුම් කඳවුරුවලදී 'භාරවූවන්'' ලෙසින් හඳුන්වන එල්ටීටීඊය හා සම්බන්ධව සිටි ළමයින් ලියා පදිංචි කිරීම ආරම්භ කෙළේය. 2009 ජුනි වන විට යුද හමුදාව ළමයින් 181 ක් හඳුනාගත් අතර ඉන් සියයට 91 ක් අවුරුදු 16 ත් 18 ත් අතර වන අතර සියයට 9 ක් අවුරුදු 14 ත් 16 ත් අතර වෙති.[663] පරික්ෂා කිරීමේ දී ගැහැනු ළමයින් 200 ක් පමණ ඇතුළුව ළමයින් 556 ක් හඳුනා ගෙන මධ්‍යස්ථානවලට ගෙන යන ලදී. විමර්ශන කොමිටිය ද දුටු රහස්‍ය වාර්තාවක් අනුව ඉන් වැඩි දෙනෙකු එල්ටීටීඊය සමග ගත කොට ඇත්තේ මාස එකේ සිට හයක් වැනි කාලයකි.

709. යුනිසෙෆ් සහ ආරක්ෂක මණ්ඩලයේ ළමයින් සහ සන්නද්ධ ගැටුම් සඳහා වූ විශේෂ නියෝජිත ගේ විශේෂ නියෝජිතයා ළමයින් අලුතින් බඳවා ගැනිම වැළැක්විම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීමට ආණ්ඩුවේ ඇති කැපවීමට ප්‍රශංසා කර ඇත. මෙම කොමිටියද ආණ්ඩුව ළමයින් පුනරුත්ථාපනය කිරීමට යොමු කර ඇති අවධානය විශේෂයෙන් සඳහන් කළ යුතුය. ගැටුම අවසානයේ දී 18 ට අඩු ළමයින්ට සහාය ලබා දෙන අතරම ළමා ආරක්ෂණ ආයතන සහ අනෙකුත් අය ඒ දිනවලම කරුණු ගණනාවක් ගැන සිය කණස්සල්ල ප්‍රකාශ කළහ. නිදසුන් වශයෙන් ළමයින් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ ආරක්ෂක මණ්ඩලයේ විශේෂ නියෝජිතයාගේ විශේෂ නියෝජිත ඔහුගේ දූත මෙහෙය ගැන ඉදිරිපත් කළ වාර්තාවේ මෙම මධ්‍යස්ථාන හමුදා කාර්ය මණ්ඩලයෙන් නොව සිවිල් නිලධාරීන් විසින් පාලනය විය යුතුයැයි ඉල්ලා සිටියේය. ඒ දිනවල එක කඳවුරක ළමයින්ට පවුල් සමග සම්බන්ධවීමට ඇති ප්‍රමාදය ගැනද සමහර කරුණු මතු කර ඇත. වැඩි දුරටත් වයසින් අඩුව සිටියදී බඳවා ගත් නමුත් ගැටුම අවසානයේ දී වැඩිහිටි වයසට පත්ව ඇති අය ගැන ප්‍රතිපාදන නැත.

---

[663] UNICEF අභ්‍යන්තර ලේඛනය, IDP protection WG second Quarterly Update, 2009

**කරුණා කණ්ඩායම/තමිල් මක්කල් විදුතලෙයි පුලිකල් (දෙමළ ජාතික විමුක්ති කොටි හෙවත් TMVP )**

710. එල්ටීටීඊයෙන් බිඳී යන අවස්ථාවේ දි කරුණා කණ්ඩායම කලින් එල්ටීටීඊයේ සිටි ළමයින් විශාල සංඛ්‍යාවක් සම්බන්ධ කර ගත්තේය. පැහැර ගැනීම් සහ ළමයින් බඳවා ගැනීම මෙම කණ්ඩායමේ සමස්ත හමුදා උපාය මාර්ගයට මූලික විය.[664]

**බඳවා ගැනීමේ ක්‍රියාවලිය.**

711. කරුණා කණ්ඩායම (සහ 2007 සිට එහි දේශපාලන පක්ෂය වන TMVP ) විසින් අඩුම වශයෙන් 2008 වන තෙක් ළමයින් බඳවා ගැනීම සිදු කෙළේය. ආණ්ඩුවේ හමුදාවලට සමාන්තරව මඩකලපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල ක්‍රියාත්මක වූ කරුණා කණ්ඩායම ගෙයින් ගෙට ගොස් පැහැර ගැනීමක් විය හැකි තත්වයන් යටතේ ළමයින් හා තරුණ තරුණියන් බඳවා ගත්තේය.

712. කරුණා කණ්ඩායම බඳවා ගන්නා ළමයින්ගේ සාමාන්‍ය වයස අවුරුදු 17 ක් විය හැකියැයි එක්සත් ජාතීන් 2005 දී ගණනය කර තිබිණ.[665] 2009 වන විට වාර්තා වූ සිද්ධීන්වල සාමාන්‍ය වයස 15.9 දක්වා පහත වැටිණ.[666] කෙසේ වුවත් ඉන් පසුව ගණනය කිරීම්වලට පදනම් වූයේ වාර්තා වූ සිද්ධීන් පමණක් නිසා එවා කෙතෙක් දුරට වයස් ව්‍යාප්තිය පූර්ණ වශයෙන් නියෝජනය කෙරෙන්නේ ද යන්න පැහැදිලි නැත.

713. කරුණා කණ්ඩායමේ පිරිස් 2006 ජුනි මාසයේ දී මඩකලපුව කිරාන් හි පන්සලක පැවති ආගමික උත්සවයකදී පැහැර ගත් 18 දෙනා අතර ළමයින් හතර දෙනෙකු- ද වූහ.[667] කරුණා කණ්ඩායම බඳවා ගැනිමට දිරිමත් කිරීමක් වශයෙන් විශේෂයෙන් යහපත් ආර්ථික තත්වයක් නැති පවුල්වලට පුහුණුවෙන් පසු මාසික දීමනාවක ආකාරයෙන් මූල්‍ය දිරිගැන්වීම් ලබා දුන් බවද වාර්තාවේ.[668]

714. කරුණා කණ්ඩායමේ සාමාජිකයෝ 2006 ජුලි මාසයේ මඩකලපුව අසළ කල්ලඩි වාහරේ හි එක පවුලකින් එක් පිරිමි ළමයෙක්, සමහර අවස්ථාවල අවුරුදු 12 වැනි කුඩා ළමයින් පවා ස්වේච්ඡාවෙන් ලබා දෙන ලෙස ඉල්ලමින් සවස් කාලයේ ගෙයින් ගෙට ගොස් ඇත. පිරිමි ළමයෙකු නැතිනම් බඳවා ගන්නෝ ගැහැනු ළමයින් ලබා ගත්හ. එවැනි අවස්ථාවල විලාප නගන දෙමාපියන්ගෙන් ළමයින් බලහත්කාරයෙන් පැහැර ගෙන යනු සාක්ෂිකරුවන් දැක ඇත.[669]

715. කරුණා කණ්ඩායම ළමයින් සහ තරුණයන් පැහැර ගැනීමෙන් පසුව ආසන්නයේම ඇති තම දේශපාලන කාර්යාලයේ තාවකාලිකව රඳවා ගනී. TMVP දේශපාලන නිලධාරීන්ට නිතරම යුද හමුදාවේ සහ පොලීසියේ ආරක්ෂාව ලැබුණ බව ද වාර්තාවේ.

716. විමර්ශන කොමිටියට කරුණා කණ්ඩායම විසින් බඳවා ගන්නා ලද ළමයින්ගේ සංඛ්‍යාව තහවුරු කර ගැනීමට නොහැකි විය. යුනිසෙප් සංවිධානය කරුණා කණ්ඩායම/TMVP 2006 සහ 2009 අතර කාලයේ බඳවා ගන්නා ලද ගැහැනු ළමයින් දෙදෙනෙකු ඇතුළත් ළමයින් 596 ක් ලියා පදිංචි කර ඇත.

---

[664] SLMM ප්‍රලේඛන

[665] S/2006/1006, ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව, 2006 දෙසැම්බර් 20

[666] S/2009/325 සන්නද්ධ ගැටුම්වල ළමයින් පිළිබඳ මහලේකම් ගේ වාර්තාව 2009 ජුනි 25

[667] United Nations, ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳව මහ ලේකම් ගේ වාර්තාව 2006

[668] United Nations ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව 2007 සහ 2009

[669] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

717. මෙම කොමිටිය ලබා ගත් තොරතුරු අනුව කරුණා කණ්ඩායම( සහ පසුව TMVP ) ළමයින් බඳවා ගත් බව ආණ්ඩුවේ හමුදා දැන සිටියේයැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතී. නැගෙනහිර පළාත 2006 සිටම ආණ්ඩුවේ පාලනය යටතේ පැවති අතර බඳවා ගැනීම් සිදු වූයේ පොලීසිය සහ යුද හමුදා කඳවුරු අසළය. අලුතින්ම බඳවා ගත් ළමයින් යුද හමුදා මුර කපොළු තුළින් බාධාවක් නැතිව ගෙන යා හැකි විය.[670] 2007 වන විට කරුණා කණ්ඩායම සම්පූර්ණයෙන්ම සන්නද්ධවී නැගෙනහිර ආරක්ෂක මුර කපොළු හරහා විවෘතවම ගමන් කෙළේය.[671]

718. ළමයින් හා සන්නද්ධ ගැටුම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ උපදේශක ඇලන් රොක් 2006 දී ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව නිකුත් කරන ලද ප්‍රකාශනයේ '' ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවේ සමහර කොටස් කරුණා පාර්ශ්වය විසින් සිදු කරන ළමයින් පැහැර ගෙන යැමට සහ බඳවා ගැනීමට සහයෝගය ලබා දෙන බවට හා සමහරවිට සෘජුවම ඊට සහභාගි වන බවට ප්‍රබල සහ විශ්වාස කටයුතු සාක්ෂි පවතින බව' ඔහු සඳහන් කරයි.[672] ඔහු මඩකලපුව දිස්ත්‍රික්කයේ දී පැහැර ගත් ළමයින්ගේ දෙමාපියන් ගණනාවක්ම හමු වූයේය. මීට සමාන චෝදනා විශ්වාස කටයුතු වෙනත් මානව අයිතිවාසිකම් සංවිධාන කීපයකින්ම ඉදිරිපත් කර ඇත. ආරක්ෂක හමුදා කරුණා කණ්ඩායම සහ TMVP සමග එකතුව බඳවා ගැනීම සඳහා ළමයින් පැහැර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධ සිද්ධීන් ඇතුළත්ව සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීම් SLMM වාර්තා කරයි.[673]

**ළමයින් යොදා ගැනීම.**

719. එල්ටීටීඊයෙන් බිඳී යැමෙන් පසුව කරුණා කණ්ඩායම සමග සම්බන්ධ වූ ළමයින්ට යුද හමුදාවේ පුහුණු කඳවුරක් ආසන්නයේ වැලිකන්ද අසළ කරුණා කණ්ඩායමේ ප්‍රධාන කඳවුරේදී නිදසුනක් වශයෙන් මූලික හමුදා පුහුණුවක් ලබා දී ඇත.[674] විමර්ශන කොමිටිය සාකච්ඡා කළ එක් සාක්ෂිකරුවෙකු 2005 දි වැලිඔය දී යුද හමුදාවේ තනි කොළ පාට නිල ඇඳුම් ඇඳ ගත් ළමයින් දැක ඇත.[675]ත්‍රිකුණාමලයේ දී කරුණා කණ්ඩායමේ අවුරුදු 14 ක බඳවා ගත් අයෙකු අවි ඇතිව යුද හමුදා කඳවුරක් ආසන්නයේ රාජකාරියේ යෙදී සිටිනු දැක ඇත.[676]

720. දේශපාලන පක්ෂයක් ලෙස ලේඛන ගත කර ඇති කරුණා කණ්ඩායම/TMVP සන්නද්ධ ගැටුම් තත්වයන්හිදී ළමයින් යොදා ගන්නා බව සන්නද්ධ ගැටුම් සහ ළමයින් පිළිබඳ මහ ලේකම්ගේ විශේෂ නියෝජිත 2006 සහ 2007 වසරවල ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කළ වාර්තාවල සඳහන් කර ඇත.[677]ළමයින් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායම 2007 වසරේ ඉදිරිපත් කළ වාර්තාවේ ශ්‍රී ලංකාවේ තත්වය මෙසේ සඳහන් කරමින් '' වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය තුළ සහ ක්‍රියාකාරී කණ්ඩායම නිකුත් කළ ප්‍රසිද්ධ ප්‍රකාශන (S/AC 51/2007/11) වුවත්, කරුණා කණ්ඩායම/TMVP ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම දිගටම සිදු කළ අතර එහි ශ්‍රේණිවල සිටින ළමයින් නිදහස් කිරීමට අපොහොසත්ව සහ ළමයින් නිදහස් කිරීම සහ ළමයින් බඳවා ගැනීම තහනම් කරන අභ්‍යන්තර රෙගුලාසි නිකුත් කිරීමට සමහර පියවර ගත් නමුත් අධීක්ෂණය සහ වාර්තා කිරීමට නිශ්චිත කාල සීමා දැක්වෙන ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ කාර්ය සාධක

---

670 OISL දුටු ජාත්‍යන්තර සංවිධානයක ලේඛනයකින්
671 SLMM ප්‍රලේඛන
672ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිලිබඳ විශේෂ උපදේශකගේ ප්‍රකාශයː 2006 නොවැම්බර් 13 කොළඹ.
673 SLMM ප්‍රලේඛන
674 US diplomatic cable කරුණා කණ්ඩායම නැගෙනහිර දී වඩාත් දිරිමත් වේ. 2007 මාර්තු 20 https://www.wikileaks.org/plusd/cables/07COLOMBO460_a/html
675 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
676 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ
677 A/61/529-S/2006/826, AS/2007/757, A/62/609-S/2007/257

බලකාය සමග ඵලදායී සංවාදයකට එකතුවීමට අපොහොසත් වූ'' වීම ගැන බලවත් කණස්සල්ල ප්‍රකාශ කර ඇත.[678]

**TMVP/කරුණා කණ්ඩායමේ ළමයින් නිදහස් කිරිම සඳහා වු ක්‍රියාත්මක සැලැස්ම.**

721. TMVP/ කරුණා කණ්ඩායම ළමයින් බඳවා ගැනිම සහ යොදා ගැනීම නතර කිරීමේ සහ තම ශ්‍රේණිවල සිටින ළමයින් නිදහස් කිරීමේ ක්‍රියාත්මක සැලැස්මකට පොරොන්දුවිමට 2008 දෙසැම්බර් මස ආණ්ඩුව සහ යුනිසෙප් සමග එකඟ වූයේය. ක්‍රියාත්මක සැලැස්ම අත්සන් කිරීමෙන් පසු ළමයින් 122 ක් නිදහස් කළ අතර ඉන්පසුව ගැටුමේ ඉතිරි කාල සීමාව තුළ යුනිසෙප් සංවිධානයට වාර්තා වූයේ ළමයින් 26 දෙනෙකු බඳවා ගැනීමේ සිද්ධීන් පමණි.[679] කරුණා කණ්ඩායම/TMVP ක්‍රියාත්මක සැලැස්ම පිළිපැදීම නිසා මහ ලේකම් 2011 දී ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1612 න් එය ලැස්තුවෙන් ඉවත් කෙළේය.[680] පිල්ලෙයාන් ද ( ඒ වන විට ඔහු කරුණාගෙන් බිඳී ගොස් සිටියේය.) තම ශ්‍රේණීන් තුළ තවමත් සිටින ළමයින් නිදහස් කිරීමට සහ ප්‍රතිසමාජගත කිරීමට හඳුනා ගැනීමේ දී ආණ්ඩුවේ බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කෙළේය.

**ළමයින් බඳවා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ යුක්තිය සහ වගවීම**

722. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා අනුව ළමයින් බඳවා ගැනිම සහ යොදා ගැනීම අපරාධයකි. සන්නද්ධ ගැටුමක දී ළමයින් යොදා ගැනීම සහ ඒ සඳහා ළමයින් බඳවා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් බව දණ්ඩන නීති සංග්‍රහයේ (2006) සඳහන් වේ. ''ළමයෙකු'' යන්න අන්තර්ජාතික නිතියට අනුකූලව නිර්වචනය කර ඇත්තේ වයස අවුරුදු 18 ට අඩු අයෙකු ලෙසිනි.[681]

723. ළමයින් බඳවා ගැනීම ''එල්ටිටීඊය සිදු කරන ලද බරපතළම අපරාධවලින් එකක්'' බව පවසන LLRC නැගෙනහිර අනෙකුත් කණ්ඩායම් විසින් කරන ලද ළමයින් බඳවා ගැනීම් ගැන සිය කණස්සල්ල ප්‍රකාශ කර ඇත. ''සටන්කරුවන් ලෙස ළමයින් බඳවා ගැනිම පිළිබඳව බැලූ බැල්මට සාක්ෂි පවතින්නේ නම් ( prima facie ) කිසියම් එවැනි සිද්ධීන් ගැන විමර්ශනය කර වැරදිකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට'' නිර්දේශ කර ඇත. LLRC එල්ටීටීඊයට හෝ වෙනත් දේශපාලන පක්ෂකට සම්බන්ධිත නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කෙළේයැයි කියන ළමයින් බඳවා ගැනීම පිළිබඳ පැමිණිලි, වැරදිකරුවන් නිතිය ඉදිරියට ගෙන ඒමේ අරමුණෙන් විමර්ශනය කළ යුතුයැයිද නිර්දේශ කරයි.[682]

724. කෙසේ වුවත් ළමයින් බඳවා ගැනිමට එරෙහිව එලිලාන් සහ පපා වැනි එල්ටිටීඊයේ හිටපු සාමාජිකයන්ට හෝ කරුණා කණ්ඩායමට හෝ වෙනත් අතුරු හමුදා නායකයන්ට එරෙහිව අභිචෝදනා ඉදිරිපත් කළ බවක් විමර්ශන කොමිටියට දැන ගන්නට නැත. 2009 මැයි 18 වැනි දා එලිලාන් සහ පපා අවසන් වරට දකින විට ආණ්ඩුවේ අත් අඩංගුවේ සිට ඇත. කරුණා සහ පිල්ලෙයාන් ඉන් පසුව මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ ඇමති තනතුරු දරා ඇත. මෙය වඩාත්ම පැහැදිලි කළ නොහැකි තත්වයක් වන්නේ ළමයින් බඳවා ගැනීම 2006 සිටම අපරාධයක් බව ප්‍රකාශ කර තිබිමත් බඳවා ගැනීම සිදුව ඇත්තේ ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලදීත් සිදුවීමේ හේතුවෙනි.

725. ආණ්ඩුව 2007 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා කොටස් ළමයින් බඳවා ගැනීමට ආධාර අනුබල දුන්නේයැයි නගා ඇති චෝදනා විමර්ශනය කිරීමට ඉහළ මට්ටමේ

[678] S/AC.51/2008/11, ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායමේ ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ නිගමන 2008, ඔක්තෝබර් 21

[679] 2011 එක්සත් ජාතීන්, ශ්‍රී ලංකාවේ ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්තාව.

[680] https://childrenandarmedconflict.un.org/our-work/action-plans/

[681] ශ්‍රී ලංකාවේ දණ්ඩන නීති සංග්‍රහය 2006 358 අ වගන්තිය

[682] LLRC 9 පරිච්ඡේදය මූලික නිරීක්ෂණ සහ නිර්දේශවල සාරාංශය ඡේද 9.79

අන්තර් අමාත්‍ය කොමිටියක් ස්ථාපනය කෙළේය. කෙසේ වුවත් අන්තර් අමාත්‍ය කොමිටිය විසින් කරන ලද කිසියම් කටයුත්තකට අදාලව හෝ එම වැඩවල ප්‍රතිඵලයක් ගැන කිසිදු තොරතුරක් මෙම කොමිටියට ලබා ගත නොහැකි විය.

726. ළමා ආරක්ෂණ අධිකාරිය සහ පොලිසියේ විශේෂ විමර්ශන කණ්ඩායමක් ළමයින් බඳවා ගත්තේයැයි චෝදනා ඉදිරිපත්ව ඇති තවත් කණ්ඩායමක් වන ඉනිය භාරතී කණ්ඩායම විසින් සිදු කෙළේයැයි කියන ළමයින් බඳවා ගැනීම් පිළිබඳව පූර්ව විමර්ශනයක් කළහ. එහෙත් මෙම කොමිටියට එම විමර්ශනයේ ප්‍රතිඵලයක් ගැන දැන ගන්නට ලැබුණේ නැත.[683] මෙම කණ්ඩායම 2012 දී ආරක්ෂක මණ්ඩලයෙන් ලේඛනවලින් ඉවත් කරන ලදී.

727. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් 2012 දි ශ්‍රී ලංකාව ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලයේ වාර්තාවේ II ඇමුණුමෙන් ඉවත් කරන ලදී.[684] එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායම එහි පසුවිපරම් නිගමනවලින් ශ්‍රී ලංකාණ්ඩුවෙන් මෙසේ ඉල්ලා සිටින ලදී: ''සන්නද්ධ ගැටුම පැවති කාල සීමාවේ දී අදාල වන ජාතික සහ ජාත්‍යන්තර නීතිවලට පටහැනි ආකාරයෙන් සියලු පාර්ශ්වයන් ළමයින්ට එරෙහිව සිදු කරන ලද උල්ලංඝනය කිරීම් සහ අපහරණ විමර්ශනය දිගටම සිදු කරන ලෙසත් සන්නද්ධ ගැටුම පැවති කාල සීමාවේ දී සිදු කරන ලද උල්ලංඝනය කිරීම් සහ අපහරණ පිළිබඳව වගකිව යුතු අය තහවුරු කර ගැනීමටත් ඒ පිළිබඳව ඔවුන් වගකියන තත්වයට පත් කරන ලෙසත් ඉල්ලා සිටියේය.[685]

## XIII සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ දී සාමාන්‍ය ජනතාව සහ ඔවුන්ට සේවා සැපයෙන ස්ථානවලට සටන්වලින් ඇති වූ බලපෑම

හැඳින්වීම

728. මෙම පරිච්ඡේදයෙන් ආණ්ඩුවේ වන්නි හමුදා මෙහෙයුමේ අවසාන අදියරේ දී, 2009 ජනවාරි සහ මැයි මාස අතර කාලයේ දී වැඩි වශයෙන්ම සාමාන්‍ය ජනතාවට සහ ඔවුන්ට සේවා සැපයෙන ස්ථානවලට එල්ල කරන ලද ප්‍රහාර පිළිබඳ සිද්ධීන් විභාග කෙරේ. සන්නද්ධ ගැටුමේ කලින් අදියරවලදි ද සාමාන්‍ය ජනතාවට හානි සිදු වුවද කොමිටිය අවසාන මාස කීපය ගැන විමර්ශනය කිරීමට ප්‍රමුඛතාවය දෙන්නේ ගැටුම්වල තීව්‍රතාවය සහ සාමාන්‍ය ජනතාවට සහ ආරක්ෂිත ස්ථානවලට පුළුල් බලපෑමක් ඇති කළ නිසාය.

729. මෙම කොමිටියේ විමර්ශනය යොමු වන්නේ සාමාන්‍ය ජනතාවට සේවා සැපයෙන ස්ථාන, විශේෂයෙන්ම රෝහල් හෝ තුවාලකරුවන්, රෝගීන් සහ සාමාන්‍ය ජනතාවට ආරක්ෂාව සඳහා පිහිටුවන ලද වෙනත් කලාපවල වූයේයැයි කියන සිද්ධීන් කෙරේය. එක්සත් ජාතින්ගේ කේන්ද්‍රස්ථාන සහ මානුෂීය සහන ස්ථාන ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රහාරක ස්ථානවලින් එල්ල වූ ප්‍රහාර වලට නිරන්තරයෙන්ම ලක් වූයේයැයි චෝදනා නැගේ. මෙම සිද්ධීන් ගැටුමේ පාර්ශ්වයන් වෙන් කොට හඳුනාගැනිමේ සහ ප්‍රමාණානුකූල භාවයේ මූලධර්ම පිළිපැදිම සහ සාමාන්‍ය ජනතාවට සහ ඔවුන්ට සේවා සැපයෙන ස්ථානවලට හානි සිදුවීම වැළැක්වීමට හෝ අවම කිරීමට ගතහැකි ආරක්ෂාකාරී පියවර ගැනීමට ඇති වගකීම පැහැදිලි කිරීමට විභාග කරනු ඇත.[686] කෙසේ වුවත් සිදු විය හැකිවූ උල්ලංඝනය කිරීමවලට හේතු වූ සාධක සහ වාතාවරණය සහ වගකීම් හඳුනා ගැනීම තහවුරුකර ගැනීම ස්වාධීන අධිකරණයක කටයුත්තකි.

---

[683] කේ. පුෂ්ප කුමාර් ( ඉනිය බාරති ද නමින් හැඳින්වේ)TMVP හි හිටපු අතුරු හමුදා නායකයා මෙන්ම ශ්‍රීලනිප අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක. ඔහුගේ කණ්ඩායම ළමයි සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම්ගේ වාර්තාවල සහ ඉහතින් සඳහන් කළ 2012 වාර්තාවේ ද සඳහන් කර ඇත

[684] S/AC 51/2012/3 ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් තත්වයන් පිළිබඳ නිගමන

[685] S/AC 51/2012/3 ළමයින් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම ශ්‍රී ලංකාවේළමයින් සහ සන්නද්ධ ගැටුම් තත්වයන් පිළිබඳ නිගමන ඡේද 9ඇ

[686] V පරිච්ඡේදයනෛතික රාමුව බලන්න

730. මෙම පරිච්ඡේදයෙන් විස්තර කෙරන්නේ ආණ්ඩුවෙන් ප්‍රකාශයට පත් කරන ලද 'සටන් මුක්ත කලාප''(NFZ) තුනක් තුළ සාමාන්‍ය ජනතාවට අනතුරු සිදුවූයේයැයි කියන ප්‍රහාර ගැනය. විමර්ශන කොමිටිය මෙම විශේෂ සිද්ධීන් තෝරා ගනු ලැබුයේ අධික සාමාන්‍ය ජනගහණයක් පැවති ප්‍රදේශවල සිදු වූ හානියේ සහ විනාශයේ ප්‍රමාණයත් සිදු වූයේයැයි කියන උල්ලංඝනය කිරීම්වල බරපතළකමත් නිසාය. විභාග කළ සිද්ධීන් බොහොමයක් සිදු වූයේ සටන් මුක්ත කලාප තුළය. ඒ යුද හමුදාව ඉදිරියට එත්ම අවතැන් වූ මානුෂීය පහසුකම් සටන් මුක්ත කලාප තුළට ගෙන ආ නිසාය. කෙසේ වුවත් සාමාන්‍ය ජනතාව සහ ඔවුන්ට සේවා සැපයෙන ස්ථානවලට ෂෙල් වෙඩි එල්ලවීම සමහර නිදර්ශනවලින් ඉස්මතු කර දක්වෙන ආකාරයට සටන් මුක්ත කලාපවලට පමණක් සීමා වූයේ නැත.

731. අන්තර්ජාතික මානුෂීය නිතිය යටතේ විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාවට සහ ඔවුන්ට සේවා සැපයෙන ස්ථානවලට හානිවීමේ අනතුර අවම කිරීමට ගතහැකි සියලු පියවර ගැනීමට එල්ටීටීඊයේ ඇති බැඳීමට අදාලව ඔවුන් යොදා ගත් උපාය මාර්ග ද මෙම විභාගයෙන් විමර්ශනය කෙරේ.[687] එල්ටීටීඊය රෝහල් වැනි ආරක්ෂිත ස්ථාන ආසන්නයේ සිට හෝ එවා තුළ සිට ප්‍රහාර එල්ල කළ බවට ඇති චෝදනා ගැනද විමර්ශන කොමිටියේ අවධානය යොමු වනු ඇත. එල්ටීටීඊයේ පාලනය යටතේ තිබූ ප්‍රදේශවල ජීවත් වූ සාමාන්‍ය ජනතාවගේ එහා මෙහා යෑම කෙරේ ඔවුන් පැන වූ සීමාවල ස්වභාවය සහ පරිමාව XIV පරිච්ඡෙදයේ වෙනම විභාග කෙරෙනු ඇත.

**සටන් කිරීම: ආණ්ඩුවේ හමුදා**

732. මෙම කොමිටිය සටනට අදාල උල්ලංඝනය කිරීම් ඉස්මතු කර දක්වීමට නිශ්චිත සිද්ධීන් කීපයක් තෝරා ගත් නමුත් ඒවා දැකිය යුත්තේ ගැටුම විකාශනයවීමේ පුළුල් සන්දර්භයක් තුළය. 2008 අග භාගයේ දී/ 2009 මුලදී එල්ටීටීඊය සතුව තිබුණ කිලිනොච්චි සහ පුදුකුඩිඉරිප්පු බල ප්‍රදේශවල පාලනය ඔවුන්ට අහිමි විය. එතැන් සිට එල්ටීටීඊයේ යුදමය පරාජය අනිවාර්ය වූ බව විමර්ශන කොමිටිය විමසූ සටන් පිළිබඳ විශ්ලේෂකයන්ගේ අදහස විය. යුද හමුදාවේ ඩිවිෂණ තුන් පැත්තකින් ඊසාන දිග බලා ඇදෙන්නට විය. එල්ටීටීඊය සහ එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිටි සාමාන්‍ය ජනතාව එන්න එන්නම එක්තරා ආකාරයකින් ආණ්ඩුවෙන් ප්‍රකාශයට පත් කරන ලද ඊනියා ආරක්ෂිත කලාප හෝ ''යුද මුක්ත කලාප'' යනුවෙන් කුඩා ප්‍රදේශයකට සීමා කිරීම ආණ්ඩුවේ හමුදාවල උපාය මාර්ගය විය.

**''සාමාන්‍ය ජනතාවට සිදුවන අනතුරු ශූන්‍ය කිරීමේ'' ආණ්ඩුවේ ප්‍රතිපත්තිය.**

733. ගැටුම පැවති සමයේ සහ ඉන් පසුව බොහෝ අවස්ථාවල ආණ්ඩුව සහ ආරක්ෂක හමුදා තමන් ''සාමාන්‍ය ජනතාවට වන අනතුරු ශූන්‍ය කිරීමේ'' ප්‍රතිපත්තියක් වන්නියේ මෙහෙයුම්වලදී පවත්වා ගත් පැවසුවේය. ආණ්ඩුව එය හැඳින් වූයේ එල්ටීටීඊ ග්‍රහණය යටතේ සිටි සාමාන්‍ය ජනතාව මුදා ගැනීමේ මානුෂීය මෙහෙයුමක් ලෙසිනි.[688]

734. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ 2010 දී LLRC ඉදිරියේ කළ සැල කිරීම්වලදී මෙසේ සඳහන් කෙළේය: '' යුද හමුදා මූලස්ථානය, නාවික හමුදා මූලස්ථානය සහ ගුවන් හමුදා මූලස්ථානයෙන් නිකුත් කෙරෙන සියලු සියලු මෙහෙයුම් නියෝගවලදී පළමුවෙන්ම සිවිල් ජනතාවට සිදුවන අනතුරු වැළැක්වීමට ගතහැකි සියලු පියවර ගන්නා 'සිවිල් ජනතාවට සිදුවන අනතුරු ශූන්‍ය කිරීමේ' ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ජනාධිපති සහ ආරක්ෂක මණ්ඩලයේ අපි තිරණය කෙළෙමු. අවධාරණය කළ පණිවුඩය වූයේ මූලස්ථානයේ සිට බැටැලියන් දක්වා සියලු මට්ටම්වල සියලු දෙනා සාමාන්‍ය ජනතාවට සිදුවන අනතුරු වැළැක්වීමට සැලසුම් කිරීම් ඉතාමත් වැදගත් බව ඔවුන් දැන සිටිය යුතුය යන්නයි.''[689]

687 V පරිච්ඡේදයනෛතික රාමුව බලන්න
688 Humanitarian Operation: Factual analysis MOD July 2006 Op cit
689 689ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ 2010 අගෝස්තු 17 LLRC යට කරන ලද නියෝජනය

735. ආණ්ඩුවේ ස්ථාවරය වූයේ පහත සඳහන් පියවර තුළින් සාමාන්‍ය වැසියන්ට සිදුවන හානි වැළැක්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයඃ

- ජනාධිපති නියෝගය වන්නේ ''සාමාන්‍ය ජනතාවට සිදුවන අනතුරු ශූන්‍ය කිරීමේ'' ප්‍රතිපත්තිය සකස් කරන සියලු සැලසුම්වල සහ දෙනු ලබන සියලු නියෝගවලදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කරුණක් බව හා ආරක්ෂක හමුදා සටන් කිරීමේ නියමයන්ගේ පදනම බව සන්නද්ධ හමුදාවල සියලු ශ්‍රේණීන්ට පැහැදිලිව දැනුම් දිය යුතුය යන්නයි.[690]
- සටනේ යෙදී සිටින අණදෙන නිලධාරීන් සහ භට කණ්ඩායම් සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාව සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව සහ සටන් කරන කාලයේ දී සුදුසු සහ දැනුවත් තිරණ ගැනිම සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම ගැන දැනුවත් කිරීමට මානව අයිතිවාසිකම් නිතිය සහ අන්තර්ජාතික මානුෂීය නීතිය පිළිබඳව ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවලට සවිස්තරාත්මක පුහුණුවක් ලබා දීම.[691]
- මූලික වශයෙන් නියමුවන් රහිත ගුවන් යානා (UAV) වලින් ලබා ගත් බුද්ධි තොරතුරුවලින් සටන් කරන ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාව නොසිටින බව තහවුරු කර ගැනීම සඳහා පැහැදිලි තොරතුරු අණදෙන නිලධාරීන්ට ලබා දෙන ලදී.[692] එක් ජනරාල් කෙනෙකු පැවසූ ආකාරයට '' නියමුවන් රහිත ගුවන් යානා අපට සාමාන්‍ය ජනතාවට විය හැකි අනතුරු අවම කිරීමට අතිවිශාල සහායක් වූවා. ඒ මගින් අප හරියටම එල්ටීටීඊ සිටින්නේ කොතැනද යන්නත්, හරියටම එල්ටීටීඊ අතිරේක බල ඇණි ඇත්තේ කොතැනද යන්නත්, හරියටම එල්ටීටීඊය බල සේනා රැස් කරන්නේ කොතැනද යන්නත්, සාමාන්‍ය ජනතාව එකතු වන්නේ කොතැනටද යන්නත් හරියටම අප දැන සිටියා. එමනිසා අපට සාමාන්‍ය ජනතාවට හිරිහැරයක් නොවන ආකාරයට එල්ටිටීඊයට පහර දීමට හැකි වුනා. ඒක හරියට ඇස් ඉදිරිපිටම සිදු වන්නක් වගේ.''[693]
- සාමාන්‍ය ජනතාවට සටන් කලාපවලින් ඉවත්විමට පොදු අවවාද ලබා දෙන ලදී. ප්‍රහාරයට පෙර නිශ්චිත අනතුරු හැඟවීම් කෙරිණ. සටන් කලාපවලින් සාමාන්‍ය ජනතාව පිටව ගොස් ඇති බව තාක්ෂණය භාවිතා කිරීමෙන් තහවුරු කර ගැනිණ.[694]
- ආරක්ෂක හමුදාවට තමන් අරමුණු කරන ඉලක්කවලටම පහර වදින බවට දැඩි පුහුණුවක් ලබා දුන් අතර එය සටන් බිමේ හානි තක්සේරුවකින් වැඩි දියුණු කෙරිණ.[695]
- අනපේක්ෂිතව සිදුවිය හැකි හානි (collateral damage) අවම කිරීමට ගුවන් හමුදාව ශුක්ෂ්ම අවි යොදා ගැනීම.[696] කාලතුවක්කු ප්‍රහාර යොදා ගත්තේ ස්ථානගත කිරීමේ උපකරණ සමගය. එම වෙඩි පතිතවන ස්ථානය රේඩාර් මගින් දැක්විණ.[697]
- සුදුසු ඉලක්කවලට පමණක් පහර දෙන බව තහවුරු කරගැනීමට ඉලක්කය තෝරාගැනීම, ඇගයිම සහ සටන් කිරීම සඳහා සවිස්තරාත්මක තීරණ ගැනිමේ ක්‍රියා පටිපාටි.[698]තිබිණ. ගුවන් හමුදාවේ ආඥාපති මෙසේ කීවේය. '' මම පුද්ගලිකවම ඉලක්ක නැවත පරික්ෂා කරනවා. අනපේක්ෂිත හානියක් සිදුවීමට ඉඩක් ඇත්ද යන්න සොයා බලනවා.[699] යුද හමුදාවෙන් එල්ල කරන ප්‍රහාර සම්බන්ධයෙන් හමුදාපති මෙසේ කීවේය. ''අපි ගුවන් විදුලි සම්බන්ධතාවලින් පරික්ෂා කර බලනවා. අපගේ ප්‍රහාර ගැන

---

[690] LLRC Report paragraph 3.17
[691] Humanitarian Operation Factual Analysis MOD July 2006 Op cit. paragraph 249
[692] Humanitarian Operation: Factual Analysis Op cit paragraph 240
[693] 53 වැනි ඩිවිෂණයේ අණ දෙන නිලධාරි මේජර් ජනරාල් කමල් ගුණරත්න 2010 සැප්තැම්බර් 10 LLRC ටඉදිරිපත් කිරීම
[694] Humanitarian Operation: Factual Analysis Op cit paragraph 168, 228
[695] Humanitarian Operation: Factual Analysis Op cit paragraph 242, 244
[696] Humanitarian Operation: Factual Analysis Op cit paragraph 243
[697] හමුදාපති ජනරාල් ජගත් ජයසූරිය 2010 සැප්තැම්බර් 08 LLRC ට කළ ඉදිරිපත් කිරීම
[698] Humanitarian Operation: Factual Analysis MOD Op cit paragraph paragraph 239
[699] එයාර් වයිස් මාර්ෂල් W D R M J ගුණතිලක 2010 සැප්තැම්බර් 08 LLRC ඉදිරියේ කළ නියෝජනය
Humanitarian Operation: Factual Analysis MOD Op cit paragraph 183

පාලනයක් තිබුණා. ඒ අනුව පරීක්ෂා කිරීමටත් ඒ අනුව ආරක්ෂිත පියවර ගැනීමටත් අපි උපදෙස් දුන්නා.''[700]

736. ආණ්ඩුවේ වාර්තාවක් වන ***මානුෂීය මෙහෙයුම: සත්‍ය විග්‍රහයක්*** හි ***සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියා පටිපාටි හා සාමාන්‍ය ජන ජීවිත ආරක්ෂා කිරීම*** යන කොටසේ හමුදාව සඳහා ඉලක්ක හඳුනා ගැනීම සහ සටන් අභ්‍යාස, සංස්කෘතික දේපොළ ආරක්ෂා කිරීම, කාලතුවක්කු සහ මෝටාර් නිරීක්ෂණය කිරීමේ රේඩාර්, නියමුවන් රහිත ගුවන් යානා (UAV) සහ ඉලක්ක සත්‍ය වශයෙන් හඳුනා ගැනීම සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ඉවහල්වීමට ගිනි අවි පාලකයන් (fire Controllers) පිළිබඳ පුහුණුව ගැන සඳහන් වේ. එහි මෙසේ ද සඳහන් වේ. '' ප්‍රහාරයන්ට පෙර අවශ්‍යවන ආකාරයට විවිධ අනතුරු හැඟවීම් කරන අතර සාමාන්‍ය ජනතාව ඉවත්ව ගිය බව තහවුරු කර ගැනීමට සහ අනපේක්ෂිත හානි අවම කර ගැනීමට උසස්ම තාක්ෂණය යොදා ගන්නා ලදී.''[701]

737. විමර්ශන කොමිටිය ගුවන් හමුදාව අනුගමනය කළ ඉලක්ක තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටි ගැන සඳහන්වන ලේඛන ගණනාවක් දුටු අතර ආණ්ඩුවේ සහ වෙනත් නිලධාරීන්ගේ ප්‍රකාශන සමාලෝචනය කෙළේය. ගුවන් හමුදාව සම්බන්ධයෙන් බලන විට සුදුසු ඉලක්ක පරීක්ෂාකාරීව තෝරා ගත් බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ LLRC ඉදිරියේ කියා සිටියේය. ඔහු මෙසේ ද සඳහන් කෙළේය: ''කිසියම් ගුවන් ප්‍රහාරයක් සිදු කෙළේ ගුවන් හමුදාපතිගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් බව තහවුරු කරන ඉතා පැහැදිලි ක්‍රියාවලියක් අපට තිබුණා.'' ගුවන් හමුදාපති එයාර්චීෆ් මාර්ෂල් ගුණතිලක LLRC ඉදිරියේ කළ ප්‍රකාශයේ මෙසේ සඳහන් විය. '' අප ඉලක්කයකට ප්‍රහාර එල්ල කිරීමට පෙර පරීක්ෂාකාරීවීමට කෙතරම් ක්‍රියා පටිපාටි අනුගමනය කෙළේද,........ අපට දිනකට පැය 24 පුරාම සෝදිසියෙන් සිටින පුද්ගලයන් සිටියා. සතුරා පියවරක් ගන්නා වහාම අපට එය නිරීක්ෂණය කළ හැකියි. ඉන්පසු එයට අප පහර දුන්නා. නැතිනම් හමුදාවට හෝ නාවික හමුදාවට දැන් වූවා.''

738. ඉන්පසු ඔහු එම ක්‍රියා පටිපාටියේ අංග ලක්ෂණ සියුම් ආකාරයට විස්තර කෙළේය. ''මුලින්ම අපට බුද්ධි තොරතුරු රාශියක් ලැබෙනවා.... අපි අපේ ගුවන් නියමුවන් රහිත යානා හෝ බීච්ක්‍රාෆ්ට් යවනවා.... එම ස්ථානයේ සාමාන්‍ය ජනතාව සිටින්නේදැයි සොයා බලනවා. ගුවන් ප්‍රහාරයක් එල්ල කළ හොත් විනාශවිය හැකි කිසිවක් ඇත්දැයි සොයා බලනවා. අප සෑහීමට පත් වු විට එම පින්තූර ප්‍රහාරය කිරීමට නියම වන ප්‍රහාරක කණ්ඩායමට ලබා දෙනවා. ඉලක්කයට ගැලපෙන අවි තෝරා ගන්නවා. අපි නියමුවන් රහිත යානා අහසට නංවා එම කාර්ය නියම වූ කණ්ඩායමට සජීවී පින්තූර ලබා දෙනවා. එමෙන්ම එම ඉලක්කය ගුවන් හමුදා මුලස්ථානයේ දීත් දිගටම නිරීක්ෂණය කරනවා.

739. ඔහු වැඩි දුරටත් මෙසේ කීවේය: ''මෙම ඉලක්ක සූදානම් කරන්නේ ගුවන් හමුදා මෙහෙයුම් අධ්‍යක්ෂක. ...... අනපේක්ෂිත හානියක් සිදුවිය හැකිදැයි මා නැවත වරක් එම ඉලක්කය පුද්ගලිකවම පරීක්ෂා කර බලනවා.'' මෙම ක්‍රියා පටිපාටිය දැඩිව අනුගමනය කළ නිසා ''සෑම අවස්ථාවකම අපි සියයට සියයක්ම නිවැරදිව පහර දුන්නා''යි ඔහු සහතික වූයේය.

740. විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියෙක් විමර්ශන කොමිටියට කළ සැල කිරීමකදී කාර්යක්ෂම අණ සහ පාලනය සඳහා පුහුණුව, සියුම් ලෙස ඉලක්ක තෝරා ගැනීමේ ක්‍රමවේද වර්ධනය කිරීම, ගොඩබිම් හමුදා සමග පෙරමුණු ගුවන් පාලකයන් රැඳවීම, ක්‍රියා පටිපාටිය වැඩි දියුණු කිරීමට සහ ගුවන් නියමුවන්ට පසුවිපරමක් ලබා දීම සඳහා සෑම ගුවන් ප්‍රහාරයකින්ම පසු

---

700 හමුදාපති ජනරාල් ජගත් ජයසූරිය 2010 සැප්තැම්බර් 08 LLRC ට කළ ඉදිරිපත් කිරීම
ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය: එල්ටීටීඊය අවි බිම තබන්නේ නම් ස්වයංක්‍රීයව සටන් විරාමයක්-ඇමති BBC Hardtalk සාකච්ඡාවේ දී කියයි.,
http://www.defence.lk/new.asp?frame=2009036_02

701 Humanitarian Operation: Factual Analysis MOD Opcit paragraph 228

ප්‍රහාරයෙන් සිදු වූ හානිය තක්සේරු කිරීමේ පද්ධතියක් ඇතුළුව සුදුසු ඉලක්ක තෝරා ගැනීමේ සහ ''ප්‍රමාණාත්මක භාවය'' තහවුරු කිරීමේ පියවර තව දුරටත් විස්තර කෙළේය.

741. ඉලක්ක තෝරා ගැනීමේ දි ගුවන් හමුදාවේ ක්‍රියා පටිපාටි ගැන සවිස්තරාත්මක සාක්ෂි ලබා දීමට වෙනස්ව යුද හමුදාවේ කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ විස්තර LLRC ලේඛනාගාරයේ හෝ වෙනත් ලිපි ලේඛනවලින් ලබා ගත නොහැකි විය. ආණ්ඩුවෙන් ඉල්ලීම් කළ නමුත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා යොදා ගත් සටන් කිරීමේ නියමයන් හි (Rules of Engagement ) හෝ සටන් බිමේ හානි තක්සේරු කිරීමේ පිටපත් විමර්ශන කොමිටියට ලබා ගත නොහැකි විය. ගැටුම් සමයේ වන්නනියේ ආරක්ෂක හමුදා මූලස්ථානයේ ආඥාපති සහ පසුව හමුදාපති වූ ජනරාල් ජගත් ජයසූරිය LLRC ඉදිරියේ කළ තම සැලකිරීමේ දී මෙසේ පැවසුවේය:[702]''බර අවි සහ ගිනි බලය යොදා ගැනීමේ දි සීමාවන් ගණනාවක් තිබිණ. යුද ටැංකි කිසිවිටෙක යොදා ගත්තේ නැත.'' කාලතුවක්කු සහ මෝටාර් යොදා ගැනීමේ දී එහි නිරවද්‍යතාවය ගැන ඔහුට හැම විටම සහතිකයක් තිබුණි. ඒ '' අපට ස්ථානගත කිරීමේ උපකරණ තිබුණා. රෑ සහ දවල් වෙඩිල්ලක් පතිත වන ප්‍රදේශය දක්වෙන රේඩාර් අපට තිබුණා. සෑම හමුදා කාණ්ඩයකටම ඔවුන් සිටින ස්ථානයෙන් ඉදිරියට කි.මී.35 ක් දක්වෙන කාලතුවක්කුවලට සවි කරන රේඩාර් (Artillery Fire Radar) ලබා දි තිබුණා.''

742. තමාට සහ තම යටත් අණදෙන නිලධාරීන්ට සටන් බිම ගැන මනා සමස්ත දැක්මක් පවත්වා ගැනීමට හැකි වූයේ යුද බිමේ පවතින තත්වය ගැන දැන ගැනීම සඳහා දිවා කාලයේත් රාත්‍රී කාලයේත් නොකඩවාම නියමුවන් රහිත ගුවන් යානා යොදා ගත් හෙයිනි......... එය සාමාන්‍ය ජනතාවට සිදුවන අනතුරු අවම කිරීමටත්, ශුන්‍ය අනතුරු ප්‍රතිපත්තිය පවත්වා ගැනීමටත් ඉවහල් වීයැයි ඔහු කීවේය. සියලු ගිනි බලය නිසි ආකාරයෙන් කළමනාකරණය කළ බව සඳහන් කරමින් ජනරාල් ජයසූරිය මෙසේද පැවසුවේය. ''අපි අපගේ ගුවන් විදුලි සන්නිවේදනය තුළින් මේවා පරික්ෂා කළා. අපට අපගේ ගිනි බලය ගැන පාලනයක් තිබූ නිසා මේ ගැන පරික්ෂා කිරීමටත් ඒ අනුව අවශ්‍ය ආරක්ෂාව සැලසීමටත් අප උපදෙස් දුන්නා.''

743. මේජර් ජනරාල් කමල් ගුණරත්න[703] LLRC ඉදිරියේ මෙසේ පැවසුවේය. '' අපට තිබූ වාසිය – මා වාසිය යන වචනය පාවිච්චි කරන්න කැමතියි. - තමයි නියමුවන් රහිත යානාවල සහාය ඇතිව මෙහෙයුම් මැදිරිය තුළටම අවපතන සන්ධාන (down-link) පහසුකම් හරහා තත්‍ය කාලීන තොරතුරු ලබා ගත හැකිවීමයි. අපට සහායට සහ සම්බන්ධීකරණයට ගුවන් හමුදාවෙන් දීර්ඝ කාලින පළපුරුදු ගුවන් නියමුවන් ලබා දි තිබුණා.''[704]

744. මෙම ප්‍රකාශනවලින් පෙනි යන්නේ පහත වාර්තා කරන සාමාන්‍ය ජන ජීවිත නැතිවීම සහ සාමාන්‍ය ජනතාවගේ දේපොළවලට හානි සිදුවීම අන්තර්ජාතික මානුෂීය නීතිය කඩකරමින් ආණ්ඩුව සහ හමුදා නායකයන් අපේක්ෂා කළ, දැන සිටි සහ පිළිගත් එකකි යන්නයි.

**ඍජු සහ වක්‍ර ගිනි බලය යොදා ගැනීම**

745. අධික ජනගහණයක් ඇති ප්‍රදේශවලදි පාර්ශ්වයන් සටන් කිරීමේ දි තෝරා ගන්නා අවිවල ආකාරය සහ ඒවා යොදා ගන්නා ආකාරය සැලකිය යුතු ප්‍රමාණයකින් සාමාන්‍ය ජනතාව කෙරේ ඉවක් බවක් නැතිව හෝ ප්‍රමාණය ඉක්මවා බලපෑම් ඇති කිරීමේ අවස්ථා පවතී. වක්‍ර ගිනි බලය

---

702 LLRC ඉදිරියේ පෙනී සිටින විට ජනරාල් ජයසූරිය හමුදාපති තනතුරට උසස් කරන ලදී

703 මුලින්ම 53 ඩිවිෂණයේ ආඥාපති, උතුරු FDL හි යාපනය SFHQ යටතේ තිබිණ. පසුව ඔහුට වන්නියේ සරණාගතයින් භාර ගැනීමේ කාර්ය පැවරිණ. 58 ඩිවිෂණයේ ආඥාපති ෂවේන්ද්‍ර සිල්වා LLRC කළ සැලකිරීම්වලදී නියමුවන් රහිත ගුවන් යානාවල (UAV ) අගය ගැන මෙවැනිම අදහස් පළ කෙලේය.

704 UAV නැවත නැවත භාවිතය බොහෝ සාක්ෂිකරුවන් තහවුරු කළා ඩ්රෝන දැක කෙටි කලකට පසු ෂෙල් වෙඩි ප්රහාර බොහෝ විට එල්ල විය

යනු ආයුධය සහ ඉලක්කය අතර පැහැදිලි දර්ශනයක් නැතිව වෙඩි තැබීමට යොදා ගන්නා ආයුධවලින් නිකුත් කරන උණ්ඩයි. මෙවැනි අවියකින් නිකුත් කරන උණ්ඩයක් චාපයක ආකාරයෙන් ඉහළට ගමන් කොට පහතට වැටේ. මෙවැනි ආයුධ යොදා ගත හැකි වන්නේ ඉලක්කය එතරම් නිවැරදි නොවන විටය. මේ හේතුව නිසා ඉලක්කයට යවන එක උණ්ඩයක් වෙනුවට ෂෙල් වෙඩි ගණනාවක් නිකුත් කෙරේ. ''ප්‍රදේශ අවි'' (Area Weapon) ලෙස යොදා ගන්නා මේවායේ පිපිරුම් බලය විශාල ප්‍රදේශයකට දැනෙනු ඇත. කාලතුවක්කු සහ මෝටාර් ඇතුළු වක්‍ර ගිනි බලයකින් යුත් ආයුධ යොදා ගැනීමෙන් ''සාමාන්‍ය ජනතාව කෙරේ කෙටි කාලීන සහ දීර්ඝ කාලින බලපෑමක් ඇති කරවමින් විශාල ප්‍රදේශයකට හානි සිදු කරයි.[705]

746. සෘජු ගිනි බලය යනුවෙන් අදහස් කරන්නේ ආයුධය සහ අදහස් කරන ඉලක්කය අතර සෘජු දර්ශනයක් පැවතිමය. එවිට ඉලක්කය සාමාන්‍යයෙන් වඩාත් නිවැරදිය. විමර්ශන කොමිටිය උපදේශන ලබා ගත් හමුදා මූලාශ්‍ර අනුව ශ්‍රී ලංකා යුද හමුදාවට සෘජුව යොදා ගන්නා ආයුධ ඇතුළුව පුළුල් පරාශයක විවිධ අවි තිබී ඇත. කෙසේ වුවත් එය යොදා ගෙන ඇත්තේ රොකට් ප්‍රොපෙල් ග්‍රෙනේඩ් (RPG) වැනි මූලික වශයෙන් සෘජු ගිනි බලය සඳහා සැලසුම් කළ ආයුධයේ දුර ප්‍රමාණය වැඩි කරන නමුත් ආයුධයේ නිරවද්‍යතාවය අඩු කරන, එමනිසාම සාමාන්‍ය ජනතාවට හානි සිදුවීමේ අවදානම වැඩි ආයුධයි.[706]

747. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් සිදු කරන ලද ගුවන් සෝදිසිවලින් ඉලක්ක නිවැරදිව හඳුනා ගැනීමට හැකි වන්නට ඇත. ඒ අනුව ඉහළ මට්ටමක නිරවද්‍යතාවයකින් ඉලක්කයට පහර දීමට හැකි ආයුධ යොදා ගැනීමටත් ඉලක්කය අවට ප්‍රදේශයට අනපේක්ෂිතව සිදුවන හානි අවම කර ගැනීමටත් හැකියාව තිබිණ. එසේ වුවත් ශ්‍රී ලංකා යුද හමුදාව කාලතුවක්කු සහ මල්ටිබැරල් රොකට් විදින යන්ත්‍ර (MBRL) යුද මුක්ත කලාප අවට ප්‍රදේශවල ස්ථාන ගත කොට යොදා ගත් අතර එය ගැටුමේ අවසානය වන තෙක්ම සිදු විය.[707]

748. බර අවි යොදා ගැනීම සීමා කළ බවත් සටනේ අවසාන සති කීපය තුළ ඒවා යොදා ගැනීම සම්පූර්ණයෙන්ම නතරකළ බවත් ආණ්ඩුව දිගින් දිගටම කියා සිටියේය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් පවසන ආකාරයට ''අවසාන අදියරවලදී සිවිල් ජනතාව නිසාත් ඉතා කුඩා ප්‍රදේශයකට සීමා වීම නිසාත් කාලතුවක්කු, මෝටාර් සහ ගුවන් ප්‍රහාර වැනි වක්‍ර ගිනි බලය යොදා ගැනීම සීමා කිරීමට ජනාධිපති තීරණය කළ නිසා හමුදාවට සැහැල්ලු අවි පමණක් යොදා ගැනීමට සිදු විය...[708]තම මෙහෙයුම ''ප්‍රාණ ඇපකරුවන් ගලවා ගැනීමේ'' මානුෂීය ප්‍රයත්නයක් ලෙස හැඳින් වූ රජය ''ලැබුණු උපදෙස් අනුව ආරක්ෂක හමුදා සාමාන්‍ය ජනතාවට අනතුරු සිදු විය හැකි බර අවි සහ ප්‍රහාරක ගුවන් යානා සහ ගුවනින් යොදා ගන්නා අවි ( Aerial Weapons) යොදා ගැනීම අවසන් කෙළේයැයි සඳහන් කෙළේය.''[709]

749. ''බර අවි යොදා ගැනීම සඳහා කිසිම සාධාරණ හේතුවක් නොතිබුණේයැ''යි ආපදා කළමනාකරණ සහ මානව අයිතිවාසිකම් ඇමතිවරයා 2009 මාර්තු මාසයේ දී කීවේය. [710] ''සටන් මෙහෙයුම් එහි අවසානය කරා ළඟාවී ඇතැයි ආණ්ඩුව අප්‍රේල් 27 වැනි දා ප්‍රකාශ කෙළේය. ''සාමාන්‍ය ජනතාවට අනතුරු විය හැකි බර අවි, ප්‍රහාරක ගුවන් යානා සහ ගුවනින් යොදා ගන්නා අවි යොදා ගැනීම අවසන් කරන ලෙස අපගේ ආරක්ෂක හමුදාවලට උපදෙස් දෙන ලදී. ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා ගෙන ඇති සාමාන්‍ය ජනතාව ගලවා ගැනීමේ ප්‍රයත්න

---

[705] United Nations November 30,2013. සන්නද්ධ ගැටුම් තුළ සිවිල් ජනතාව ආරක්ෂා කිරීම පිළිබඳව මහ ලේකම්ගේ වාර්තාව ඡේදය 69

[706] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

[707] මහ ලේකම් ගේ ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂඥ මණ්ඩලයට සහාය වනු සඳහා UNOSAT කළ භූ අවකාශ විශ්ලේෂණය Geo-spatial

[708] 2010 අගෝස්තු 17 ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ LLRC ඉදිරියේ කළ නියෝජනය.

[709] Humanitarian Operation: Factual Analysis MOD Op cit paragraph 183

[710] ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශයː එල්ටීටීඊය අවි බිම තබන්නේ නම් ස්වයංක්‍රීයව සටන් විරාමයක්-ඇමති BBC Hardtalk සාකච්ඡාවේ දී කියයි., http://www.defence.lk/new.asp?frame=2009036_02

අපගේ ආරක්ෂක හමුදා දිගටම සිදු කරන අතර ජීවිත ආරක්ෂා කිරීමට ඉහළම ප්‍රමුඛතාවය දෙනු ඇත.''[711]

750. පහත දැක්වෙන ආකාරයට, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සහ රාජ්‍ය තාන්ත්‍රික මූලාශ්‍ර , රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් වාර්තා පරික්ෂා කළ හමුදා විශ්ලේෂකයින් පවසන ආකාරයට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සටන් මුක්ත කලාප තුනට සහ ඒ අවට ප්‍රදේශවලට සන්නද්ධ ගැටුමේ අවසාන අදියර මුළුල්ලේම සාමාන්‍ය ජනතාව යොදා ගන්නා යටිතල පහසුකම්වලට ඉමහත් හානි සිදුවන සහ සාමාන්‍ය ජන ජීවිත අහිමි වන ආකාරයට කාලතුවක්කු සහ MBRL ඇතුළු වක්‍ර ගිනි බලය යොදා ගෙන ඇත. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අනුව අඩුම වශයෙන් වෛද්‍ය පහසුකම් සැපයෙන ස්ථාන හතරකට, PTK , මුලෙයිවයික්කාල්, උදයාර්කාඩු සහ පුදුමාතලන් MBRL වැනි ඉලක්කයක් නිශ්චිත නැති (Unguided weapons) අවි සහ වෙඩි ප්‍රහාර එල්ල කර ඇත. හමුදා විශේෂඥතාවය ඇති සමහරු ඇතුළත් සාක්ෂිකරුවෝ වෙඩි තැබීම දියත් කිරීම ඇසුණු ආකාරයත්, ඒවා ගමන් කළ ආකාරය ගණනය කිරීමට හැකි වූ ආකාරයත් සහ සමහර අවස්ථාවල යොදා ගත් අවි වර්ගය නිශ්චය කිරීමට හැකි වූ ආකාරයත් විස්තර කළහ.[712]අනෙකුත් අයට පිපිරීමෙන් සිදු වූ හානිය සහ එය පැමිණි දිශාව තීරණය කිරීමට හැකි විය.[713]

751. යොදා ගත් පොකුරු බෝම්බ (සමහරුන් එය හැඳින් වූයේ 'කොත්තු කුන්ඩුං යනුවෙනි) උඩු ගුවනේදී කැබලිවලට පුපුරා කුඩා බෝම්බ බිම පතිත වීමත් සමග නැවත පුපුරා යන ආකාරය ගැන බොහෝ සාක්ෂිකරුවෝ විස්තර කළහ. පොකුරු බෝම්බ ඉලක්කයට ළඟාවීමට පෙර කුඩා බෝම්බ ගණනාවකට වෙන්වී විශාල ප්‍රදේශයක පුපුරා යයි. කෙසේ වුවත් වක්‍ර ගිනි අවිවලින් නිකුත් කරන බෝම්බ ඉහළ අහසේ කැබලි වලට වෙන්ව යෑමට හැකි බව සිතිය හැකිය. පොකුරු බෝම්බ යොදා ගත්තේයැයි නිතර නිතර නැගෙන චෝදනා නිසා ඒවා යොදා ගත්තේද නැද්ද යන්න තීරණය කිරීමට වැඩි දුරටත් විමර්ශනය කළ යුතුයැයි විමර්ශන කොමිටිය විශ්වාස කරයි.

752. ඒ ආකාරයටම සුදු පොස්පරස් විශේෂයෙන්ම ගැටුමේ අවසාන සති කීපය තුළ යොදා ගත් බවට චෝදනාද මෙම කොමිටියට ලැබිණ. මෙවැනි බෝම්බ වලින් තියුණු පිළිස්සීම් ඇතිවන අතර සම කළු පැහැ ගැනේ. සුදු පොස්පරස් යොදා ගත්තේද යන්න තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු රැස්කර ගැනීමට විමර්ශන කොමිටියට නොහැකි වූ නිසා මෙම චෝදනා වැඩි දුරටත් විමර්ශනය කළ යුතුයැයි කොමිටිය විශ්වාස කරයි.

**සටන් මුක්ත කලාප පිහිටුවීම**

753. ආණ්ඩුව 2009 ජනවාරි සහ මැයි මස ඇතුළත එහි 'අනතුරු ඇතිවීම ශුන්‍ය කිරීමේ ප්‍රතිපත්තිය'' යටතේ වරින් වර 'යුද මුක්ත කලාප' (NFZ) හෝ 'ආරක්ෂිත ප්‍රදේශ' තුනක් ප්‍රකාශයට පත් කෙළේය. මෙම කොටසෙන් එම කලාප තුන ඇති කිරීම පිළිබඳ සමස්ත දැක්මක් ඉදිරිපත් කෙරේ. එක් එක් සටන් මුක්ත කලාපයට විශේෂිත වූ තොරතුරු පහත උප කොටස්වලින් වෙන් වෙන්ව ඒ එක් එක් කලාපයට එල්ල වූ ප්‍රහාර පිළිබඳව ලේඛන ගත කෙරෙනු ඇත.

754. ආණ්ඩුව සටන් මුක්ත කලාප ප්‍රකාශයට පත් කෙළේ එල්ටීටීඊය සමග එකඟතාවයක් නැතිව ඒක පාක්ෂිකවය. ගැටුමේ පාර්ශවයන් දෙකම ඒවා ආරක්ෂිත, මධ්‍යස්ථ ප්‍රදේශ ලෙස පිළිගත්තේ නැත. නම් කරන ලද ස්ථාන පැවතියේ එල්ටිටීඊ පාලන ප්‍රදේශවල වන අතර ඒ දිනවල ආණ්ඩුවේ හමුදාවට ඒවාට පිවිසීමට හැකියාවක් තිබුණේ නැත.

755. අවතැන් වූ ජනතාව තැනින් තැනට යෑම සහ ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉදිරි ගමනත් සමග පසු බසින එල්ටීටීඊයේ පාලනය යටතේ පැවති භූමි ප්‍රදේශය කුඩා වීමත් සමග එක් එක් සටන් මුක්ත කලාපය ඊට පෙර එකකට වඩා භූමි ප්‍රමාණයෙන් අඩු විය. ඊට අමතරව ආණ්ඩුව රෝහල්

---

711 www.defence.lk/new.asp?name=200904_06

712 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

713 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

සහ මානුෂීය ආයතනවල කාර්යාල ඇතුළත් සියලු ආරක්ෂිත ස්ථාන වටා කිලෝ මීටරයක ප්‍රදේශයක් 'අතිරේක ආරක්ෂිත කලාප' වශයෙන් ප්‍රකාශයට පත් කෙළේය.[714]

756. සටන් විරාම කලාප ප්‍රකාශයට පත් කිරීමට පසුබිම් වූ අදහස බෙහෙවින් ගැටලු සහගතය. ඒවා නම් කළ ප්‍රදේශ එල්ටීටීඊ හමුදා ස්ථාන ඇතුළත වූ අතර සටන් මුක්ත කලාපය නම් කිරීමට පෙර එල්ටීටීඊය ඉන් ඉවත් වූයේ නැත.[715] පළමු කලාපය ප්‍රකාශයට පත් කරන ලද්දේ ශ්‍රී ලංකා යුද හමුදාව ඉදිරියට ගමන් කරමින් සිටි කිලිනොච්චියේ සිට පුදුකුඩිඉරිප්පු (PTK නමින් ද හැඳින්වෙන) සහ මුලතිවු දක්වා ඇති A 35 මහා මාර්ගය අසළය. පුදුකුඩිඉරිප්පු හි තම බල ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට එල්ටීටීඊයට පළමු සටන් මුක්ත කලාපයේ සිට ශ්‍රී ලංකා යුද හමුදාවට පහර දීමට සිදු වන්නට ඇත. සටන් ඇතිවීමට සැලකිය යුතු අවස්ථාවක් පවතින ප්‍රදේශයක සටන් මුක්ත කලාපයක් පිහිටුවීමෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ අරමුණ ගැන ප්‍රශ්න මතු කරයි.

757. LLRC සිය වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත. '' එල්ටීටීඊය විසින් යුද මුක්ත කලාපයේ පාරිශුද්ධ භාවය අපහරණය කළ තත්වයක් යටතේ අදහස් කරන ලද මානුෂීය අරමුණුවලට එල්ටිටීඊයේ අනුකූලතාවය තහවුරු කර ගැනීමට කිසියම් එකඟතාවයක් ඇති කර නොගැනීමත්, ආණ්ඩුව ඒක පාක්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද යුද මුක්ත කලාප පිළිබඳ වැඩ පිළිවෙළට එල්ටිටීඊය අනුකූලතාවයක් දක් වූයේ ද යන්න තහවුරු කර ගැනීමට මාර්ගයක් නොමැතිවීමේ තත්වය නිසාත් සටන් කලාපය තුළ පිහිටි එල්ටීටීඊ යේ අවි ස්ථානගත කළ තැන්වල සිටි වෙඩි ප්‍රහාර එල්ල කිරීමේ දී ආරක්ෂක හමුදා ඊට ප්‍රති ප්‍රහාර එල්ල කිරීමෙන් සාමාන්‍ය ජනතාවට අනතුරු සිදු වන්නට ඇතැයි නිගමනය කිරීම සාධාරණය.''

758. ආරක්ෂක ලේකම් LLRC කොමිසමට කරන ලද සිය ඉදිරිපත් කිරීමේ දී යුද මුක්ත කලාප පිහිටුවන ලද්දේ ජාතික ආරක්ෂක මණ්ඩලය සහ ජනාධිපති අතර පැවති සාකච්ඡා වලින් පසුවය. ''සාමාන්‍ය ජනතාවට පැමිණීම සඳහා යුද මුක්ත කලාප යනුවෙන් ප්‍රදේශ වෙන් කරන ලද්දේ ජනාධිපතිවරයාය. එවිට හමුදාවට අනෙකුත් ප්‍රදේශවල මෙහෙයුම් කටයුතු සිදු කළ හැකිය''[716]ඔහු වැඩි දුරටත් මෙසේ කීවේය. ''අපගේ අදහස වූයේ සාමාන්‍ය ජනතාවට වඩ වඩාත් සමීපවීමය. එවිට ඔවුන්ට ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලට පැමිණිය හැකිය.''

759. යුද මුක්ත කලාප පිහිටුවීම සාමාන්‍ය ජනතාවට දනුම් දී ඔවුන්ට ආරක්ෂාව සැලසෙන එම ප්‍රදේශවලට යන ලෙස ඔවුන් දිරිමත් කළ බවත් මේ තොරතුරු ගැටුම් පැවති ප්‍රදේශවලට ගුවනින් හෙළන ලද පත්‍රිකාවලින් සහ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ජනතාව දැනුවත් කළ බවත් ආණ්ඩුව සඳහන් කෙළේය.[717]ආණ්ඩුව සඳහන් කරන ආකාරයට 2009 ජනවාරි 16 සිට අප්‍රේල් 29 දක්වා කාලය ඇතුළත විවිධ පත්‍රිකා වර්ග 13 ක පිටපත් 127,000 ක් ගුවනින් හෙළා ඇත. මෙම කොමිටිය සාකච්ඡා කළ සාකච්ඡා කල සාක්ෂිකරුවෝ එම පත්‍රිකා දුටු බවත් පසු අවස්ථාවලදී ශ්‍රී ලංකා හමුදාව සාමාන්‍ය ජනතාවට එම ප්‍රදේශවලට පැමිණීම දිරිමත් කළ බවත් පැවසූහ.[718] එවැනි පත්‍රිකා කීපයක් මෙම කොමිටියටද ලැබිණ.

---

[714] 2011 නොවැම්බර් LLRC වාර්තාවේ 47 පාද සටහනේ හමුදාපති 2009 ජනවාරි 19 ICRC මූලස්ථානයට යවන ලද ලිපියකින් යුද මුක්ත කලාප සහ රෝහල් අසළ ආරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම නිවේදනය කෙළේය.

[715] UNOSATsatellite imagery seen by OISL

[716] ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ 2010 අගොස්තු 17 LLRC හමුවේ කළ ඉදිරිපත් කිරීම 2010 සැප්තැම්බර් 8 හමුදාපති ජනරාල් ජගත් ජයසූරිය කළ නියෝජනය බලන්න Humanitarian Operation factual Analysis MOD Op cit paragraph 174

[717] පත්‍රිකාවල පිටපත් විමර්ශන කොමිටිය දුටුවේය.

[718] එම පත්‍රිකාවල ජනතාවට දිවා කාලයේ දි පැමිණෙන ලෙස දන්වා තිබුණ නමුත් එය සිවිල් ජනතාවට උභතෝකෝටිකයක් වූයේ එවිට එල්ටීටීඊයේ පලිගැනීම්වලට ලක් විය හැකි නිසා ඔවුන්ට පලා යෑමට සිදු වූයේ රාත්‍රි කාලයේ දී වීමෙනි.

760. සාමාන්‍ය ජනතාවට යුද මුක්ත කලාප 1 ට පැමිණෙන ලෙස දන්වා තිබු පත්‍රිකාවක මෙසේ සඳහන් වේ. [719] ''අපි ඔබ වැනි අහිංසක ජනතාවට ආරක්ෂාව සහ ඔබට අවශ්‍ය කරන අනෙකුත් පහසුකම් ලබා දිමට බලාපොරොත්තුවෙන් සිටිමු. ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ප්‍රදේශවලට පැමිණෙන ඔබට එම පහසුකම්වලට අමතරව දිනකට රු. 100 බැගින් දීමනාවක්, රූපවාහිනී බැලීමට හා දුර කතන ඇමතුම් ලබා ගැනීමට පහසුකම් ද සැපයෙනු ඇත. කඳවුරු අසළ පුස්තකාල පහසුකම් සහ වෙනත් විනෝදාශ්වාදය ලබා ගැනීමේ අවස්ථාද පවතී. තවත් බලා සිටින්නේ නැතිව කරුණාකර අප වෙත පැමිණෙන්න. ඔබගේ පැමිණීම අපේක්ෂාවෙන් අපි පහත දළ සිතියමේ දැක්වෙන ප්‍රදේශයේ සිටින්නෙමු. ඒ 31 මාර්ගයේ උදයාර්කඩ්ඩු හන්දියේ සිට මුලතිවු හි කහ පාලම දක්වා යුද මුක්ත කලාපයක් වනු ඇත.'' (යුද මුක්ත කලාපයේ එතරම් පැහැදිලි නැති දළ සිතියමක් ද පත්‍රිකාවට අමුණා තිබිණ. එය අත්සන් කර තිබුණේ යුද හමුදාවේ ආඥාපති ලුතිනන් ජනරාල් වශයෙනි.'')

761. ''වන්නියේ මහජනතාවට අපි ආරක්ෂිත ස්ථානයක් නිර්මාණය කෙළෙමු'' යන මාතෘකවෙන් යුත් පත්‍රිකාවක් කොමිටියට දැක ගැනීමට හැකි විය. ඉන් සාමාන්‍ය ජනතාවගෙන් හැකි පමණ ඉක්මණින් ආරක්ෂක කලාපයට ( යුද මුක්ත කලාපයට) යන ලෙස ඉල්ලා සිටී. ''ඊට වන්නියේ පහත සඳහන් ප්‍රදේශ අයත්වනු ඇත. පුදුකුඩිඉරුප්පු, පරන්තන්, ඒ 35 මාර්ගයේ කහ පාලම, උදයාර්කඩ්ඩු හන්දියේ සිට ඉරුද්දුමඩු සහ දේව්පුරම් දක්වා කි.මී. 4 ක දුර ප්‍රමාණයක් ඇතුළත් වනු ඇත. එම නිශ්චිත ප්‍රදේශ අවතැන් වූ ජනතාව වෙනුවෙන් වෙන් කර ඇති නිසා හමුදාවෙන් ගුවන් ප්‍රහාර හෝ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමක් නොවනු ඇත.

762. යුද මුක්ත කලාප ආරක්ෂිතයැයි සහතික වුවද ඒවාට නිරන්තරයෙන්ම ෂෙල් වෙඩි එල්ල විය. බර අවි යොදා ගත් බව ආණ්ඩුව ප්‍රතික්ෂේප කළ නමුත් ගැටුමේ අවසාන අදියරේ දී, 2009 ජනවාරි සිට මැයි දක්වා යුද මුක්ත කලාප තුන ආසන්නයේ වටේටම බර අවි ස්ථාන ගත කෙළේය. එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලයට ලබා දුන් චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය කිරීමෙන් පසුව ''ශ්‍රී ලංකා යුද හමුදාව ගැටුමේ අවසාන මාස පහක කාලය මුළුල්ලේම සරණාගතයින්ගෙන් ජනාකීර්ණ වූ ප්‍රදේශවලට සහ යුද මුක්ත කලාප වශයෙන් වෙන් කරන ලද ප්‍රදේශවලට සැලකිය යුතු ප්‍රමාණයකින් කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමේ හමුදා ක්‍රියාන්විත හැකියාව ස්ථාපනය කිරීම, පවත්වා ගැනිම සහ යාවත්කාලීන සිදු කිරීම සිදු කළ බවට බලවත් සාක්ෂි පවතින්නේයැයි'' නිගමනය කෙළේය.[720]

763. සාමාන්‍ය ජනතාවට අනතුරු සිදුවීම එල්ටීටීඊය ජනාකීර්ණ ප්‍රදේශ, යුද මුක්ත කලාප සහ අනෙකුත් ආරක්ෂිත ස්ථානවල තම ක්‍රියාන්විත සහ අවි ආයුධ සිතා මතාම සැඟවීමේ නිත්‍යානුකූල නොවන උපක්‍රම නින්දා සහගතව තෝරා ගැනීමත් එල්ටීටීඊය යුද මුක්ත කලාප සහ වෛද්‍ය පහසුකම් ලබා දීමේ ස්ථාන ආසන්නයේ සිට කාලතුවක්කු සහ වෙනත් අවි නැවත නැවතත් යොදා ගැනීමේත් ප්‍රතිඵලයක් බව තර්ක කරමින් යුද මුක්ත කලාපවලට සියලු ප්‍රහාර එල්ල කරන ලද්දේ අන්තර්ජාතික මානුෂීය නිතියට අනුකූලව බව ආණ්ඩුව දිගින් දිගටම කියා සිටියේය.[721]

764. පහත සාකච්ඡා කරන ආකාරයට එල්ටීටීඊ ක්‍රියාවන් සමහර අවස්ථාවල තම පාලනය යටතේ සිටින සාමාන්‍ය ජනතාව ප්‍රහාරයෙන් ඇතිවන බලපෑමෙන් ආරක්ෂා කිරීමට ගත හැකි සියලු ආරක්ෂිත පියවර ගැනීමට අන්තර්ජාතික මානුෂීය නිතිය යටතේ ඇති ඔවුන්ගේ බැඳීම කඩ කිරීමකි. ඉන් ශ්‍රී ලංකා යුද හමුදාව සියලු අවස්ථාවන්හි එක් අතකින් සාමාන්‍ය ජනතාව සහ ඔවුන් යොදා ගන්නා ස්ථාන හා අනෙක් අතට නිත්‍යානුකූල ඉලක්ක අතර වෙනස් කොට හඳුනා

---

[719] එම පත්‍රිකා සිංහලෙන් සහ දෙමළෙන් තිබු අතර පරිවර්තනය විමර්ශන කොමිටියේ පරිවර්තක විසින් ලබා දෙන ලදී.

[720] මහ ලේකම් ගේ ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂඥ මණ්ඩලයට සහාය වනු සඳහා UNOSAT කළ භූ අවකාශ විශ්ලේෂණය Geo-spatial

[721] LLRC නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ හමුදා මණ්ඩලයේ සම්පූර්ණ වාර්තාව www.army.lk/docimages/image/LLRC_2013pdfහි ඇත

ගැනීමටත් එමෙන්ම කුමන තත්වයක් යටතේ වුවද සාමාන්‍ය ජන ජීවිතයට අනපේක්ෂිතව සිදුවන හානි, සාමාන්‍ය ජනතාවට සිදුවන තුවාල සහ ඔවුන් යොදා ගන්නා ස්ථානවලට වන හානි වැළැක්වීමට හෝ අවම කිරීමට ගත හැකි සියලු ආරක්ෂිත පියවර ගැනීමේ වගකීමෙන් නිදහස් වන්නේ නැත.

765. සාමාන්‍ය ජනතාව යුද මුක්ත කලාපවලට යෑමට ආණ්ඩුවෙන් කළ ඉල්ලීම පිළිගත් බව ප්‍රකාශ ගණනාවකින් පෙනේ. එහෙත් ප්‍රහාර පිළිබඳ නිදසුන්වලින් දක්වෙන ආකාරයට ආණ්ඩුවෙන් ඇති කළ යුද මුක්ත කලාප සාමාන්‍ය ජනතාවට ආරක්ෂිත ස්ථාන වූයේ නැත. රෝහල් වැනි සාමාන්‍ය ජනතාවට සේවය සැලසෙන ආරක්ෂිත ස්ථාන ඇතුළත් යුද මුක්ත කලාප පිහිටුවීමත් සමග ඒවා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල ප්‍රහාරවලට ලක්විය. එම ස්ථානවල රැකවරණය ලබා සිටි සාමාන්‍ය ජනතාවට යුද මුක්ත කලාපය තුළ හමුදා මෙහෙයුමක් සිදු විය හැකියැයි අනතුරු හැඟවීමක් හෝ දැනුම් දීමක් හෝ ඉවත්ව යෑමට ප්‍රමණවත් කාලයක් ආණ්ඩුව/ යුද හමුදාව ලබා දුන්නේ නැත.

766. සරණාගතයන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතින්ගේ මහ ලේකම්ගේ නියෝජිත 2009 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකාවේ කළ සංචාරයකින් පසුව ''දෙවන යුද මුක්ත කලාපය අවශ්‍යයෙන්ම එල්ටීටීඊය හමුදා ප්‍රහාරවලින් කොන් කරන ලද ගැටුම් කලාපය තුළම පවතී. මෙය ඉතිරිව සිටින සාමාන්‍ය ජනතාවට අතිශය මාරාන්තික තත්වයක් ඇති කරවයි. මෙම කලාපයේ සීමිත ඉඩ ප්‍රමාණය සහ අධික ජන සනත්වය නිසා ඉමහත් ප්‍රවේශමෙන් සහ සාමාන්‍ය ජනතාව සහ සටන්කරුවන් වෙනස් කොට හැඳින් ගැනීමේ මූලධර්මයට ගරු කරමින් කිසියම් හමුදා මෙහෙයුමක් සිදු වුවහොත් එය ස්වභාවයෙන්ම ඉවක් බවක් නැතිව සහ සාමාන්‍ය ජනතාව අතර අප්‍රමාණ වූ අනපේක්ෂිත හානියක් විය හැකියැයි සඳහන් කෙළේය.[722]

**සටන් කිරීම: එල්ටීටීඊ**

767. තම පාලනය යටතේ ඇති ප්‍රදේශවල සිටින සාමාන්‍ය ජනතාවට සහ ඔවුන්ට සේවය සැපයෙන ස්ථාන. ප්‍රහාරවලින් ඇතිවන බලපෑමෙන් ආරක්ෂා කිරීමට ගත හැකි සියලු පියවර ගැනිමට අන්තර්ජාතික මානුෂීය නිතිය යටතේ එල්ටීටීඊයට බැඳිමක් පවතී. හැකිතාක් දුරට අධික ජන සනත්වයකින් යුත් ප්‍රදේශ තුළ හෝ ඒ අසළ හමුදා මෙහෙයුම් ස්ථානගත කිරීම මෙන්ම ගැටුමේ පාර්ශ්වයක පාලනය යටතේ ඇති ප්‍රදේශ ආසන්නයේ ඇති හමුදා ස්ථානවලින් සිවිල් ජනතාව සහ ඔවුන්ට සේවය සැපයෙන ස්ථාන ඉවත් කිරීමට ගත හැකි සියලු පියවර ගැනීමද එම බැඳීමට අයත්ය. [723]

768. අවි ආයුධ සහ අනෙකුත් යුදමය උපකරණ ස්ථානගත කිරීම

769. සාමාන්‍ය ජනතාවට සේවය සැපයෙන ස්ථාන හමුදාමය කටයුතු සඳහා යොදා ගන්නේ නම් එහි ආරක්ෂිත තත්වය නැති වේ.[724]එමනිසා සාමාන්‍ය ජනතාවට සේවය සැපයෙන පහසුකම් විශේෂයෙන්ම රෝහල් තුළ හමුදා උපකරණ ස්ථානගත කිරීමෙන් සහ එම පහසුකම් සතුරාට හානි සිදුවෙන කටයුතු කිරීම සඳහා යොදා ගැනීමෙන් වැළකිමට එල්ටීටීඊය කෙරේ බැඳීමක් පවතී.

770. එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සියලුම රෝහල්වල රෝහල් ඇතුළට ගිනි අවි ගෙන ඒම දැඩිව තහනම් කෙරෙන පැහැදිලි නියමයන් තිබුණ අතර ඒවාට වාර්තාවන ආකාරයට ගරු කළ බව බොහෝ සාක්ෂිකරුවෝ මෙම කොමිටියට දැනුම් දුන්හ.[725]ඇසින් දුටු සාක්සිකරුවන් පවසන

---

[722] එ ජා මහ ලේකම්ගේ සරණාගතයන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ නියෝජිතයාගේ ශ්‍රී ලංකා සංචාරය 2009 අප්‍රේල් 2 - 6

[723] සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂික නිතිය පිළිබඳ ICRC දත්ත බැංකුව නියමයන් 23 – 24

[724] සම්ප්‍රදායික අන්තර්ජාතික මානුෂීය නීතිය පිළිබඳ ICRC දත්ත බැංකුව

[725] සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

ආකාරයට තුවාල වු මිනිසුන් රෝහල්වලට ගෙන ඒමට සහාය වූ එල්ටීටීඊ කාර්යධරයන් සාමාන්‍යයෙන් පැමිණියේ නිරායුධවය.[726]

771. ආණ්ඩුවෙන් පාලනය වූ හෝ වෙනත් රෝහල් සහ ගිලන් රථ එල්ටීටීඊය විසින් හමුදා කටයුතු සඳහා යොදා ගත් බව දක්වෙන තොරතුරු කිසිවක් මෙම කොමිටියට ලැබුණේ නැත. කොමිටිය සාකච්ඡා කළ වෛද්‍ය හෝ මානුෂීය සහන සේවකයන් කිසිවෙක් වෛද්‍ය පහසුකම් හමුදා මෙහෙයුම් සඳහා යොදා ගැනීමට එල්ටීටීඊය කිසිවිටෙක උත්සාහ කළ බවක් වාර්තා කෙළේ නැත. කොමිටියට ලැබුණු තොරතුරු අනුව රෝහල් ඇතුළත එල්ටීටීඊ හමුදා උපකරණ ස්ථානගත කිරීමක් සිදුව නැත.

772. එමනිසා මෙම තොරතුරු පදනම් කර ගෙන ශ්‍රී ලංකා යුද හමුදාව ප්‍රහාර දියත් කළ අවස්ථාවේ රෝහල් ඇතුළත නීත්‍යානුකූල මිලිටරි ඉලක්ක පැවති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු විමර්ශන කොමිටියට තිබුණේ නැත. තුවාල ලත් එල්ටීටීඊ හමුදා කාර්යධරයන් සමහර රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටීම නිසා ඒවායේ ආරක්ෂිත තත්වයේ වෙනසක් සිදු වන්නේ නැත. ඒ එම පුද්ගලයන් එම අවස්ථාවේ ඍජුව සටන්වලට සම්බන්ධ නොවීමයි.

773. කෙසේ වුවත් එල්ටීටීඊය රෝහල් සමීප ස්ථානවල සිට ප්‍රහාර දියත් කළ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බව දක්වෙන තොරතුරු විමර්ශන කොමිටියෙන් රැස් කර ගෙන ඇත. පහත විස්තර කෙරෙන සිද්ධීන්වලින් එල්ටීටීඊය මිලිටරි ආරක්ෂිත ස්ථාන ( වැඩි වශයෙන් පස් වැටි සහ අගල්) පිහිටුවීම සහ රෝහල්වලට සමීපයේ හෝ සමහර විට ඒ ආසන්නයේ සහ සරණාගතයන්ගේ තාවකාලික මඩු සහ කුඩාරම් විශාල සංඛ්‍යාවක් පැවතීමෙන් සනිටුහන් වන බෙහෙවින් ජනාකීර්ණ ප්‍රදේශ වටා කාලතුවක්කු සහ වෙනත් අවි ආයුධ ස්ථානගත කළ බව දක්වේ.[727] එසේ කිරීමෙන් එල්ටීටීඊය සාමාන්‍ය ජනතාව ප්‍රහාරවලින් ආරක්ෂා කිරීමට ගත හැකි සියලු පියවර ගැනීමට ඇති එහි බැඳීම පිළිපැදීමට අපොහොසත් වූයේය.

774. ඊට අමතරව වෛද්‍ය පහසුකම් අසළ හමුදා අවි ආයුධ ස්ථානගත කිරීම් වැළැක්වීමට හෝ පලිගැනීම් වශයෙන් ප්‍රති ප්‍රහාර එල්ල කිරීමේ ඉඩක් පවතින හෙයින් රෝහල් කාර්ය මණ්ඩලයට අවම ආරක්ෂිත පියවර ගැනීමට ඉඩසැලසෙන ආකාරයට රෝහල් අසළ සිටි තම ප්‍රහාර දියත් කිරීමේ අදහසක් පවතින බවට අනතුරු හැඟවීමේ මාර්ගයක් ඇතුළුව සාමාන්‍ය ජනතාවට සිදු විය හැකි අනතුරු වැළැක්වීමට හෝ අවම කිරීමට කල් තබා පියවර ගැනීමට එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ නායකත්වය ක්‍රියාකළ බව දක්වෙන තොරතුරු කිසිවක් මෙම කොමිටියට ලැබුණේ නැත

775. අධික ලෙස ජනාකීර්ණ ප්‍රදේශවල අන්තර්ජාතික මානුෂීය නීතියෙන් ආරක්ෂිත ස්ථාන ආසන්නයේ හෝ සමීප ස්ථානවල හමුදාමය ස්ථාන පිහිටුවීම නිසා ප්‍රතිප්‍රහාර එල්ලවී සාමාන්‍ය ජනතාවට අනතුරු සිදුවිය. එසේ කර ඇත්තේ හමුදාමය ස්ථාන හෝ ප්‍රදේශ ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කර ගැනීමටද නැතිනම් සම්ප්‍රදායික අන්තර්ජාතික නීතිය උල්ලංඝනය කිරීමක් විය හැකි ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රහාර එල්ල කිරීමට පෙළඹවීමේ අදහසින් වුවත් මෙවැනි ක්‍රියා පිටුපස ඇති අරමුණ බරපතළ ප්‍රශ්න මතුකරයි.

776. ශ්‍රී ලංකා යුද හමුදාව එල්ටීටීඊය සහ සිවිල් ජනතාව වඩ වඩාත් කුඩා වන ප්‍රදේශයකට තල්ලු කිරීම නිසා හමුදාමය ස්ථාන වෛද්‍ය පහසුකම් සහ අනෙකුත් ආරක්ෂිත ස්ථානවලින් වෙන් කොට ඉවත් කිරීමේ ඉඩ ප්‍රස්ථා සීමිත වූ බවද සඳහන් කෙරිණ. තත්වයන්ගේ මෙම වෙනස්වීමෙන් ගැටුමේ කිසියම් පාර්ශ්වයක් අන්තර්ජාතික නීතියේ ඇති වෙනස් කොට හැඳින ගැනීම, ප්‍රමාණානුකූල භාවය සහ ප්‍රහාර සහ ඉන් ඇතිවන බලපෑම වැළැක්වීමට ගත හැකි සියලු පියවර ගැනීමේ පිළිබඳ මූලධර්ම යටතේ ඇති බැඳීම්වලින් නිදහස් වන්නේ නැති බව විමර්ශන කොමිටිය අවධාරණය කරයි. එසේ වුවත් මෙම බැඳීම්වලට අනුකූලවීම සඳහා ගැටුමේ පාර්ශ්වයන් සාමාන්‍ය ජනතාව අනතුරට පත්වන ආකාරයෙන් කොටු නොවීමට තම උපක්‍රම යොදා ගත් යුතුය.

---

726 සාක්ෂිකරුගේ ප්‍රකාශය ගොණුවේ

727 UNOSAT, Geo-spatial analysis in support to the Secretary-General’s Panel of Experts on Sri Lanka

777. ආණ්ඩුව ඒක පාක්ෂිකව ප්‍රදේශ ''ආරක්ෂිත කලාප'' ලෙස නම් කිරීමේ දී එල්ටීටීඊයේ එකඟතාවය ලබා නොගත් බව මෙම කොමිටිය සිහිපත් කරයි. කෙසේ වුවත් යුද මුක්ත කලාප පිහිටුවා ඇති ස්ථාන සහ එහි ප්‍රකාශිත අරමුණ වන්නේ සාමාන්‍ය ජනතාව ආරක්ෂා කිරීම බව එල්ටීටීඊය දන සිටින්නට ඇත. එල්ටීටීඊය තම පාලනය යටතේ පවතින ප්‍රදේශවල ජනතාවට එහා මෙහා යෑමට පැනවූ සීමාවන් තුළින් ජනතාව ගැටුම් පැවති ප්‍රදේශයකට සීමා කෙළේය. ඒ තුළින් එහි ජනතාව හමුදා මෙහෙයුම් වලින් අනතුරට පත් වෙන තත්වයක් ඇති කෙරිණ. ගැටුමේ අවසානය වන තෙක් එල්ටීටීඊය එහා මෙහා යෑම පිළිබඳව පැන වූ සීමාවන් පිළිබඳ විස්තර XX පරිච්ඡේදයේ දක්වා ඇත. බලහත්කාරයෙන් බඳවා ගැනීමට වැඩිහිටියන් පැහැර ගැනීම සහ ළමයින් බඳවා ගැනීම සහ සටන්වලට යොදා ගැනීම ද යුද මුක්ත කලාපය තුළ සිදු වූ අතර ඒවා අදාල පරිච්ඡේදවල විස්තර කර ඇත.

## සන්නද්ධ ගැටුමේ අවසන් මාස කාලය තුළ සිවිල් ස්ථාන වෙත එල්ල කෙරුණු ප්‍රහාර පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහය

778. එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල දස දහස් ගණනින් සිවිල් වැසියන් සිටීම අත්‍යවශ්‍ය මානුෂවාදී සහාය හා ජීවිතාරක්ෂණ වෛද්‍ය සත්කාර සැපයීම අවශ්‍ය කළේ ය. ශ්‍රී ලංකා හමුදාවේ මහත් ෂෙල් ප්‍රහාරයන්ගේ ඉලක්කයව තිබූ අනුයාත යුද මුක්ත කලාප තුළට ජනගහණය සංකේන්ද්‍රගත වූ හෙයින් මෙය සම්පූර්ණයෙන්ම වාගේ වඩාත් බරපතල ප්‍රශ්නයක් වූයේ ය. XV වන පරිච්ඡේදය වන්නි ප්‍රදේශයෙහි මානුෂවාදී ප්‍රවේශය හා සහාය පිළිබඳ ප්‍රශ්නය විමර්ශනය කරයි. මෙම කොටස සේවා සපයන ලද පහසුකම්වලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම ද සිවිල් ජනයා මත එහි බලපෑම ද පරීක්ෂාකර බලයි.

779. ආණ්ඩුව තව දුරටත් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කළ නොහැකි බව ප්‍රකාශ කළ නිසා එක්සත් ජාතීන්ගේ විදේශ නියෝජිතායතනවල හා මානුෂවාදී සංවිධානවල කාර්ය මණ්ඩලවලට 2008 සැප්තැම්බර්වල දී වන්නිය හැර යන්නට සිදු වුව ද බොහෝ විට එල්ටීටීඊය විසින් ඉවත්ව යාමට ඉඩ නොදෙන ලද මෙම සංවිධානවල ශ්‍රී ලාංකීය කාර්ය මණ්ඩල වැඩෙන සීමා පැනවීම්, නැවත නැවතත් සිදුවන අවතැන් වීම් හා ඔවුන් මුහුණ දුන් අනතුර නොතකා ඔවුන්ට හැකි උපරිම අන්දමින් සහය සැපයීමට ප්‍රයත්න දැරූහ.[728] ගැටුමේ අවසන් අදියරයන් තුළ දී මානුෂවාදී ක්‍රියාකාරීන් ගණනාවකට ඔවුන්ගේ ජීවිත අහිමි වීමට හෝ බරපතල ලෙස තුවාල වීම්වලට මුහුණ පෑමට සිදු විය. ඒවායින් බොහොමයක් සිදු වූයේ ෂෙල් උණ්ඩ කැබලිවලිනි.[729]

780. බොහෝ අභ්‍යන්තර අවතැන් වූවෝ එක්සත් ජාතීන් හා අනෙකුත් මානුෂවාදී සංවිධාන විසින් පිහිටුවනු ලැබ තිබුණු වෛද්‍ය හා ආහාර බෙදා හැරීමේ පහසුකම් සැපයුම් ස්ථාන ආසන්නයේ වාසස්ථාන ඉදි කර ගත්හ. එසේ කළේ මෙම ස්ථාන අනෙකුත් ප්‍රදේශවලට වඩා ආරක්ෂා සහිත ය යන විශ්වාසයෙනි. එක්සත් ජාතීන්ගේ පහසුකම් සාමාන්‍යයෙන් නිරීක්ෂණ

---

[728] කමිටුව විසින් දක්නා ලද ලියකියවිලිවලට අනුව ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය 2008 සැප්තැම්බර්වල දී ''මුදා නොගත් ප්‍රදේශවල'' (එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට ආණ්ඩුව යොදන පදය) නොහැකි බව මානුෂවාදී සංවිධාන ගණනාවකට දන්වා තිබුණි.

[729] ''ගැටුම් ප්‍රදේශවල තුන්වන ICRC සාමාජිකයා මිය ගියේය,'' ICRC 2009 මැයි 13, මාධ්‍ය නිවේදනය 09/100, ''ගැටුම් ප්‍රදේශවල ICRC සාමාජිකයා මිය ගියේය,'' ICRC 2009 අප්‍රේල් 08, මාධ්‍ය නිවේදනය 73/09, ''ශ්‍රී ලංකාවේ ගැටුමේ දී කෙයාර් ආධාර සේවකයා මිය ගියේය,'' CARE 2009 මාර්තු 18, මාධ්‍ය නිවේදනය WS on file,

මෙහෙයුම් පැවත්වීම සඳහා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් යොදා ගත් නිමුවන් රහිත නිරීක්ෂණ ගුවන් යානාවලට (UAVs) පැහැදිලිව දක්නට ලැබෙන එක්සත් ජාතීන්ගේ ලාංඡනයෙන් හා ධජයෙන් සලකුණු කර තිබුණි. කෙසේ වුව ද ඒවා සහ අනෙකුත් මානුෂවාදී පහසුකම් ස්ථාන ද මානුෂවාදී ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ කටයුතු පමණක් නොව සිවිල් ජනයා ද අවදාමනට හෙළන ලද ෂෙල් ප්‍රහාරවලින් වැළකුණේ නැත.

781. ගැටුම සමය තුළ වෛද්‍ය පහසුකම් තුවාල වූ හා අසනීප වූ සාමාන්‍ය වැසියන් යන දෙපාර්ශවයටම ඉතාම වැදගත් ජීවිත සත්කාර ප්‍රතිකාර සපයයි. එහෙයින් වෛද්‍ය පහසුකම්, වෛද්‍ය කාර්ය මණ්ඩලය හා ප්‍රතිකාර ලබන්නවුන් - ඔවුන් සාමාන්‍ය වැසියන් හෝ තුවාල ලබා හෝ අසනීප වීම නිසා සටන් කළ නොහැකි තත්ත්වයට පත්ව සිටින පුද්ගලයින් (*hors de combat*) වේවා ජාත්‍යන්තර නීතිය යටතේ ඉලක්ක කරනු නොහැකි ය.

782. යුද මුක්ත කලාප ඇතුළු එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ ඇතුළත වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන ගණනාවක්ම වූයේ ය. රෝහල් කාර්ය මණ්ඩල බොහොමයක් සමන්විත වූයේ රජයේ සේවකයින් ගෙනි. ඒවා රතු කුරුස ලාංඡනයෙන් සලකුණු කර තිබිණි. නිදසුන් ලෙස එම ලාංඡන වහලවල හෝ කොඩිවල පැහැදිලිව දැකිය හැකි ලෙස පින්තාරු කර තිබිණි. විමර්ශන කමිටුව (OISL) දැක තිබෙන මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAV) වීඩියෝ පටයක පුදුක්කුඩියිරුප්පු රෝහලේ (PTK Hospital) වහලේ රතු කුරුස ලාංඡනය පැහැදිලිව දක්නට තිබේ. චන්ද්‍රිකා ඡායරූප ද මෙම කොටසේ සඳහන් කරනු ලබන රෝහල් ගොඩනැගිලිවල රතු කුරුස ලාංඡනය පැහැදිලිව සලකුණු කර තිබෙන බව තහවුරු කරයි.

783. ශ්‍රී ලංකා හමුදාවේ ඉදිරිගමන සිදු වන විට වෛද්‍ය පහසුකම් බොහෝ විට පාසල් තුළට යළි ස්ථානගත කෙරී ඇති අතර ගැටුම අවසානය කරා ගමන් කරන විට කුඩාරම් හා වෙනත් තාවකාලික ව්‍යුහයන් වෙත ගෙන ගොස් ඇත. වෛද්‍ය හා අනෙකුත් පහසුකම් යළි ස්ථානගත කළ ස්ථාන ද ලාංඡනය පැහැදිලිව සලකුණු කර තිබියදීත් ෂෙල් වෙඩි ප්‍රහාරවලට ලක්ව ඇත. බරපතල ලෙස රෝගී වූ රෝගීන් ඇතැම් අවස්ථාවල වෛද්‍ය පහසුකම් සඳහා ගෙන යන ලද්දේ ඉතාමත්ම අඩමාන තත්ත්වයන් තුළ ය.[730] ප්‍රහාර ප්‍රතිකාර ලබමින් සිටි රෝගීන් ද ඝාතනයට හා තුවාල කිරීම්වලට බඳුන් කෙරිණ. තත්ත්වයන් වඩාත් නරක අතට හැරෙන විට රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතාව වඩාත් දිග හැරුණි. එහෙත් වෛද්‍ය වෘත්තිකයින් ඔවුන් වෙත මහත් අවදානමක් දරා ගනිමින් ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට අධිෂ්ඨාන කර ගෙන තිබුණි. ෂෙල් ප්‍රහාරවලින් මිය ගිය අය අතර වෛද්‍ය පිරිස් ද වූහ.[731] රෝහල් කරා යන මාවත්වල හා ආසන්නයේ ද ඇතුළුව නොනැවතී එල්ල කෙරුණු ෂෙල් ප්‍රහාර ප්‍රදේශයෙහි වෙනත් ප්‍රහාරයන්ගෙන් තුවාල වූ සාමාන්‍ය වැසියන් රෝහල් වෙත කඩිනම්ව ගෙන යාම බොහෝ විට වළක්වාලී ය.

---

730 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

731 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

784. විමර්ශන කමිටුව (OISL) විසින් දක තිබෙන එක්සත් ජාතීන් හා මානුෂවාදී ක්‍රියාකාරීන් ඇතුළු දුටුවන්ගේ සාක්ෂි හා අනුකූලවන ලිපි පෙන්නුම් කරනුයේ යුද්ධය නිසා නැවත ස්ථානගත කරන ලද ඒවා ඇතුළු බොහෝ රෝහල් හා අනෙකුත් මානුෂවාදී පහසුකම් සේවා ස්ථාන ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීම සහතික කිරීම පිණිස ඒවායේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) ආණ්ඩුවට, වවුනියාවේ ආරක්ෂක හමුදා මූලස්ථානයට හා අනෙකුත් ආරක්ෂක හමුදාවලට මෙන්ම එල්ටීටීඊයට ද සම්ප්‍රේෂණය කර තිබූ බව ය.[732]

785. යටත් පිරිසෙයින් අවස්ථා දෙකක දී සම්බන්ධීකරණය කිරීම් ප්‍රමාද වීමෙන් සුළු කාල පරාසයකට පසු වල්ලිපුනම් හා උදයාර්කාඩු රෝහල්වලට ප්‍රහාර සිදු කෙරී තිබේ.[733] එසේම සාක්ෂිකරුවන් රෝහල් හා මානුෂවාදී ක්‍රියාකාරකයින් රෝහල්වලට ෂෙල් ප්‍රහාර එල්ල කර තිබේය යන කරුණ සම්බන්ධයෙන් හමුදා හා ආණ්ඩුවේ නිලධාරීන් දැනුවත් කර ෂෙල් ප්‍රහාර නතර කරන ලෙස ඉල්ලා සිටි බව විමර්ශන කමිටුවට (OISL) පවසා ඇත. ඇතැම් අවස්ථාවල දී ශ්‍රී ලංකා හමුදාවේ ස්ථානගතවීම්වල සිට දිගටම ෂෙල් ප්‍රහාර එල්ල කෙරී ඇති අතර වෙනත් අවස්ථාවල දී වෙඩි තැබීම වෙනස් කර තිබේ. එයින් පෙන්නුම් කළේ ෂෙල් ප්‍රහාර පාලනය කිරීමට ශ්‍රී ලංකා හමුදාව හැකි වූ බව ය.[734]

786. සාක්ෂිකරුවන්ට අනුව සැඟවී පැවතීමේ හා ප්‍රහාර එල්ලවීමේ ඉඩකඩ අඩුකර ගැනීමේ ප්‍රයත්නයක් වශයෙන් යටත් පිරිසෙයින් එක් තාවකාලික වෛද්‍ය සැපයුම් සේවා ස්ථානයක් (රාජ්‍ය නොවන) රතු කුරුස ලාංඡනය යොදා ගැනීම නවතා ඇත. මෙය ආරම්භ කර ඇත්තේ 2009 ජනවාරිවල උදයාර්කාඩු රෝහලට එල්ල වූ ප්‍රහාරවලින් ටික කලකට පසුව ය.[735] එම පහසුකම් සේවා ස්ථානය ක්‍රියාත්මකව පවතිද්දී ෂෙල් ප්‍රහාර එල්ල නොවූ බව සාක්ෂිකරු පැවසීය.

787. තුවාල ලත් එල්ටීටීඊ සටන්කරුවන්ට ප්‍රතිකාර කරන ලද්දේ එල්ටීටීඊයේම වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන මගිනි. එහෙත් ඇතැම් අවස්ථාවල ආණ්ඩුව විසින් පවත්වා ගෙන ගිය පහසුකම් සේවා ස්ථානයන්හි දී ද ප්‍රතිකාර කර ඇත. ආණ්ඩුව මගින් පවත්වා ගෙන යන ඇතැම් රෝහල්වල එල්ටීටීඊ සටන්කරුවන්ට ප්‍රතිකාර ලබා දී තිබෙන බව ද එසේම නිරායුධ එල්ටීටීඊ ශල්‍ය වෛද්‍යවරුන් මෙම රෝහල්වල වැඩ කළ බව හා තුවාල ලත් එල්ටීටීඊ සටන්කරුවන් හා සාමාන්‍ය වැසියන් යන දෙකොටසටම ප්‍රතිකාර ලබා දී ඇති බව ද සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය දැන සිටියේ ය.[736] වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන ඇතුළත සාමාන්‍ය රෝගීන් සිටින වාට්ටුවල හෝ වෙනම වාට්ටුවල තුවාල වීම නිසා සටනින් ඉවත් වූවන් ලෙස රඳවන ලද එල්ටීටීඊ සටන්කරුවන් සිටීම පහසුකම් සේවා ස්ථානවල හෝ ඒවායේ නේවාසිකව සිටි පුද්ගලයින්ගේ ආරක්ෂිත තත්ත්වය කෙරෙහි බල නොපෑවේ ය.

---

732 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ. කමිටුව විසින් දක්නා ලද ශ්‍රී ලංකා ආණ්ඩුවට හා ශ්‍රී ලංකා හමුදාවට එක්සත් ජාතීන් හා මානුෂවාදී සංවිධාන යවන ලද ලිපි

733 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

734 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

735 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

736 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

788. වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන ඉලක්ක කළ බව හෝ ඇතැම් අවස්ථාවල ඒවා ෂෙල් ප්‍රහාරවලට ලක් වූ බව හෝ ආණ්ඩුව පිළි නොගනී.[737] උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) එහි වාර්තාවේ දී එය ''සියලු තත්ත්වයන් සැලකිල්ලට ගත් විට සැබවින්ම හානි ඇතිකරමින් හා මරණ සිදු කරමින් වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන වෙත ෂෙල්වෙඩි එල්ල වී ඇති බවට සෑහීමට පත් වූ'' බව සඳහන් කර තිබේ. කෙසේ වුව ද ''තාක්ෂණික ස්වභාවයක් ගන්නා මූලික සාක්ෂි ලබා ගත නොහැකිවීම හා එසේම ඒ සඳහා ආධාරකවන සාමාන්‍ය වැසියන්ගේ සාක්ෂි ස්වභාවයෙන් සැක උපදවන සුළු ය යන කරුණ ෂෙල් වෙඩි එල්ල කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ එක පාර්ශවයක් ද නැතහොත් අනෙක් පාර්ශවය ද යන්න පිළිබඳ නිශ්චිත නිගමනයකට එන්නට'' එය සමත්ව නැත.[738]

789. කෙසේ වුව ද එහි විමර්ශන කාර්යයේ දී කමිටුව (OISL) විසින් එක්රැස් කර ගන්නා ලද තොරතුරු දක්වන්නේ මෙම ප්‍රහාර හුදකලා සිද්ධි නොව ශ්‍රී ලංකා හමුදාව ආරක්ෂිත පහසුකම් සේවා ස්ථානවලට ප්‍රහාර එල්ල නොකරන බව සහතික කිරීමේ නිසි පියවර ගැනීමට අසමත්වූ ස්ථානවලදී පමණක් නොව ඇතැම් අවස්ථාවල හිතාමතාම එම පහසුකම් ඉලක්ක කරනු ලැබිය හැකි රටාවක කොටසක් වූ බව ය.

790. විශාල වශයෙන් ජනාකීර්ණ වූ ප්‍රදේශවලට හා ආරක්ෂිත පහසුකම් සේවා ස්ථාන පිහිටා තිබෙන බව ශ්‍රී ලංකා හමුදාව දැන සිටි ප්‍රදේශවලට උචිත නොවන ආකාරයකින් මල්ටි බැරල් රොකට් ලෝන්චර වැනි ඍජු ඉලක්කයකින් තොර ගිනි අවිවල ක්‍රමානුකූල භාවිතය ප්‍රහාරයන් මගින් පිළිබිඹු කරයි. ගුවන් යානා හා නියමුවන් රහිත නිරීක්ෂණ ගුවන් යානා යොදා ගනිමින් අඛණ්ඩ සෝදිසි කරමින් සිටියදීත් ඒවා නොතකා එදිරිවාදිකම් උත්සන්නවන විට මරණ හා යටිතල පහසුකම්වලට හානි ගෙන දෙමින් මෙම ස්ථාන යළි යළිත් එල්ල කරන ලද කාල තුවක්කු හා ගුවන් ප්‍රහාරයන්ට ලක් කෙරී ඇත. ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් අවස්ථාවල බොහෝ වාරයක් කාර්ය මණ්ඩල, රෝගීන් හා උපකරණ යළි ස්ථානගත කිරීමට බල කෙරී ඇත.

791. යුද මුක්ත කලාපවල සීමා මායිම් ඇතුළත නිශ්චිත කෙටි පරාසයන් තුළ කාල තුවක්කුවලින් රෝහල්වලට පහර දීමට එල්ටීටීඊයට හැකිව තිබුණේය යන්න සිතිය නොහැකි ය. කෙසේ වුව ද විටින් විට රෝහල් හා එක්සත් ජාතීන්ගේ පරිශ්‍රයන් ආසන්නයේ එල්ටීටීඊ යුද පිහිටැවුම් ස්ථානගත කිරීම හා ඇතැම් අවස්ථාවල රෝහල් ආසන්නයේ සිට එම ස්ථාන ප්‍රහාර එල්ල කිරීම සඳහා යොද ගැනීම ප්‍රහාරයන්ගේ ප්‍රතිවිපාකයන්ගෙන් සාමාන්‍ය ජනතාව සහ සිවිල් ස්ථාන ආරක්ෂා කිරීමට සියලු සාධ්‍ය පූර්ව ආරක්ෂක පියවර ගන්නා බවට දී ඇති ඔවුන්ගේ පොරොන්දුවලට එල්ටීටීඊය ගරු කළේ ද යන ප්‍රශ්නය මතු කරයි.

792. පහතින් එන කොටස රෝහල් හා තාවකාලික වෛද්‍ය පහසුකම් සේවා ස්ථානවලට, එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථාන හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට එල්ල කළ ප්‍රහාර

---

[737] www.nydailynews.com: Motar shell strike wor zone sole functioning medical facility, article 1.4122744

[738] LLRC වාර්තාව 4.288 හා 4,293 ඡේද

විස්තරාත්මකව දක්වයි. මේවා බොහෝ සෙයින් සිදු වූයේ යුද මුක්ත කලාපවල ය. විමර්ශන කමිටුව (OISL) 2008 ඔක්තෝබර් හා 2009 මැයි අතර වන්නියේ විවිධ වෛද්‍ය පහසුකම් සේවා ස්ථානවලින් නවයකට එල්ල වූ ඇතැම් විට වැඩි වාර ගණනක් වූ ප්‍රහාර විමර්ශනය කළේ ය. එවායින් හතක් එල්ල වූයේ යුද මුක්ත කලාප යයි කියනු ලබන ප්‍රදේශවල ස්ථානගත කර තිබූ ඒවාට ය.

## පළමුවන සටන් මුක්ත කලාපය ප්‍රකාශයට පත් කිරීමට පෙර පහර දෙන ලද රෝහල් හා එක්සත් ජාතීන්ගේ හා අනෙකුත් මානුෂවාදී පහසුකම් සේවා ස්ථාන

### කිලිනොච්චියේ එක්සත් ජාතීන්ගේ හා රාජ්‍ය නොවන සංවිධානවල කාර්යාල[739]

793. වන්නියේ එක්සත් ජාතීන්ගේ කාර්යාල පිහිටුවා තිබුණේ කිලිනොච්චි නගරයෙහි ''කිලිනොච්චි සිටි බොක්ස්'' හෝ ''බොක්ස්'' යනුවෙන් කියනු ලබන ප්‍රදේශයක ය. කිලිනොච්චි නගරය එල්ටීටීඊ බලකොටුවක් වූයේ නමුදු ''බොක්ස්'' ප්‍රදේශය ආණ්ඩුව විසින් පිළිගනු ලැබ තිබුණේ වන්නියෙහි මානුෂවාදී වැඩ සටහන් හා ක්‍රියාකාරකම් ආරක්ෂිතව කර ගෙන යාම සහතික කිරීමට හා පහසුකරණයට නිර්මාණය කර ඇති ''ආරක්ෂිත'' ප්‍රදේශයක් වශයෙනි. මෙලෙස ආණ්ඩුව ප්‍රදේශයේ මානුෂවාදී පහසුකම් සේවා ස්ථාන පිහිටා තිබීම පිළිබඳව දැනුවත්ව සිටියේ ය. ආණ්ඩුව හා එක්සත් ජාතීන් අතර මෙම අවබෝධය තිබියදීත් ''බොක්ස්''හි එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථාන ශ්‍රී ලංකා හමුදාව විසින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරවලට භාජනය විය. එසේම එල්ටීටීඊයට ද කිලිනොච්චි නගරයට ආසන්නව කාල තුවක්කු පිහිටුවුම් ඇතුළු යුද පිහිටුවුම් තිබුණි. කෙසේ වුව ද සාක්ෂි ප්‍රකාශයන්ට අනුව බොක්ස් ප්‍රදේශයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ කාලයෙහි එල්ටීටීඊය බොක්ස්වල සිට ප්‍රහාර එල්ල කර නැත.[740]

794. 2008 ජූලි හා ඔක්තෝබර් අතර ශ්‍රී ලංකා හමුදාවේ 57 වෙනි හා 58 වෙනි බල සේනාංක කිලිනොච්චිය බලා ඉදිරියට එන විට බොක්ස් ප්‍රදේශය හා ඒ අවට ප්‍රදේශය ගුවන් බෝම්බ හා ෂෙල් වෙඩි ප්‍රහාරවලට භාජනය කරනු ලැබිණ. 2008 ජූලිවල එල්ල කරන ලද ගුවන් ප්‍රහාරයක දී රාජ්‍ය නොවන සංවිධානයක අංගනයට සුළු හානි ඇති විය.[741] සැප්තැම්බර් 3 වෙනි දින ශ්‍රී ලංකා හමුදාව කිලිනොච්චියට ෂෙල් ප්‍රහාරයක් එල්ල කළේ ය. එක ෂෙල් බෝම්බයක් බොක්ස් ප්‍රදේශයේ එක්සත් ජාතීන්ගේ ලෝක ආධාර වැඩසටහනේ (WFP) අංගනයට මීටර 300 ක ද රාජ්‍ය නොවන සංවිධානයක අංගනයේ සිට මීටර 100 ක ද දුරින් වැටී ඇත. මෙම ෂෙල් ප්‍රහාරයෙන් පසු සැප්තැම්බර් 4 වෙනි දින කිලිනොච්චිය පාදක කරගෙන සිටි සිය කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමින් එක්සත් ජාතීන් ආණ්ඩුව සමග මෙම කාරණය මතු කළේ ය. ඊට පසු දින ද යළිත් සැප්තැම්බර් 8 වෙනි දින ද ආණ්ඩුව ඒවායේ

739 මෙම කොටස සිවිල් ස්ථානවලට එල්ල කරන ලද ෂෙල් ප්‍රහාරවලට අවධානය යොමු කළ ද අනෙක් මූලාශ්‍ර දක්වන්නේ ෂෙල් ප්‍රහාර කිලිනොච්චියේ අවට ප්‍රදේශවල සිවිල් ජනයාට ද ඒවායින් හානි පැමිණුනු බවයි. නිදසුන් ලෙස දෙසැම්බර් 26 දින වාර්තා වූ ෂෙල් ප්‍රහාරවල ප්‍රතිඵල වශයෙන් නිවාස දෙකක සිටි හත් දෙනෙකු මිය ගොස් ඇත. වාර්තාවූ පරිදි එම ප්‍රදේශයේ එල්ටීටීඊ කඳවුරු නොතිබිණ. සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

740 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

741 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

කාර්ය මණ්ඩලවල හා පරිශ්‍රයන්ගේ සුරක්ෂිතබව හා ආරක්ෂාව සහතික කිරීමට නොහැකි හෙයින් මානුෂවාදී සංවිධාන කිලිනොච්චියෙහි සිය කාර්යාල වසා දැමිය යුතු යයි උපදෙස් දුන්නේ ය. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට හා කැරිටාස් සංවිධානයට පමණක් වන්නියේ රැඳී සිටීමට අවසර දෙනු ලැබිණ.

795. ආණ්ඩුවේ උපදෙස්වලට අනුව එක්සත් ජාතීන් සැප්තැම්බර් 8 වෙනි දින සිට සිය කාර්ය මණ්ඩල ඉවත් කර ගැනීම ආරම්භ කළේ ය.[742] සැප්තැම්බර් 9 වෙනි දින බොක්ස්වල එක්සත් ජාතීන්ගේ බඩු ගබඩාවක් ආසන්නයේ කාලතුවක්කු ෂෙල් වෙඩියක් පුපුරා ගියේ ය.[743] දහස් ගණන් සිවිල් ජනයාට පලා යන්නට සලස්වමින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් ඔවුන්ගේ කිලිනොච්චිය බලා ඉදිරියට යාම දිගටම කර ගෙන යන්නට වූ අතර එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවාවන්ට තවදුරටත් හානි සිදු කෙරිණ.[744] සැප්තැම්බර් 10 වෙනි දින පාන්දර ශ්‍රී ලංකා ගුවන් හමුදාව බොක්ස්වල එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවාවන්ට හානි පමුණුවමින් කිලිනොච්චියට බෝම්බ හෙළී ය. සමහර ෂෙල් වෙඩි කොන්ක්‍රීට් තාප්ප පුපුරුවමින් එක්සත් ජාතීන්ගේ බංකරයකට මීටර 50 ක් පමණ දුරින් වැටුණි.[745] සැප්තැම්බර් 28 වෙනි දින එක්සත් ජාතීන්ගේ අංගනයක් අසල පතිත වූ ෂෙල් වෙඩියකින් සිවිල් වැසියන් පස් දෙනෙකුට තුවාල සිදුවුණි.[746] ඔක්තෝබර් 3 වෙනි දින ආරක්ෂක හමුදා විසින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරයකින් කිලිනොච්චියේ බොක්ස් ප්‍රදේශයේ එක්සත් ජාතීන්ගේ ගොඩනැගිලි තුනකට හානි සිදු විය.[747] සැප්තැම්බර් 16 වන විට සියලුම ජාත්‍යන්තර කාර්ය මණ්ඩල පිටත්ව ගොස් තිබිණ. එල්ටීටීඊය පනවා තිබූ ගමනාගමන සීමාවන් හේතු කොට ගෙන එක්සත් ජාතීන්ගේ දේශීය කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට පිටත්ව යා නොහැකි වූ අතර ඔවුන්ට ද අවසානයේ දී ෂෙල් ප්‍රහාර නිසා පලා යාමට සිදුවන තෙක් මානුෂ ආධාර දිගටම බෙදා හැරීම සඳහා කිලිනොච්චියේ රැඳී සිටීමට සිදු විය.[748]

**කිලිනොච්චි රෝහල**

796. කිලිනොච්චි රෝහල දිගු කාලයක් පුරා ආණ්ඩුව විසින් පවත්වාගෙන යන ලද්දා වූ ද එසේම කිලිනොච්චිය බලා ඉදිරියට ඇදෙන විට ශ්‍රී ලංකා හමුදාවන්ගේ නැවත නැවත සිදු කෙරුණු ෂෙල් වෙඩි ප්‍රහාරයන්ට ලක් වූවා වූ ද වෛද්‍ය පහසුකම් සේවා මධ්‍යස්ථානයක් විය. රෝහල 2008 ඔක්තෝබර් 25, දෙසැම්බර් 24 හා දෙසැම්බර් 30 යන දිනවල ගොඩනැගිලිවලට හානි පමුණුවමින් ෂෙල් වෙඩි ප්‍රහාරයන්ට ලක් විය.[749] සාක්ෂිකරුවන් පැවසුවේ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූයේ කිලිනොච්චියේ දකුණෙහි ස්ථානගත ශ්‍රී ලංකා හමුදා පිහිටුවුම්වල දිසාවේ

---

742 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
743 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
744 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
745 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
746 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
747 කමිටුව විසින් දක්නා ලද 2008 ඔක්තෝබර් 8 වෙනි දින එක්සත් ජාතීන් විසින් විදේශ කටයුතු අමාත්‍යවරයාට යවන ලද ලිපිය
748 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
749 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

සිට බව ය.[750] රෝහලට සමීප ස්ථානගත කරන ලද එල්ටීටීඊ හමුදා පිහිටැවුම් තිබුණේ නැත.[751] දෙසැම්බර් 31 වෙනි දින වෛද්‍ය සේවා වෙනත් ස්ථානයකට ගෙන යනු ලැබිණ.[752]

**මුලතිව් රෝහල**

797. මුලතිව් රෝහල ආණ්ඩුවේ අරමුදල්වලින් පවත්වාගෙන ගිය වන්නියේ පැරණිතම රෝහල්වලින් එකක් වූ අතර එහි පිහිටීම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් මනාව දැන සිටිය යුතුව තිබිණි. එය රතු කුරුස ලාංඡනයෙන් පැහැදිලිව සලකුණු කර තිබුණ අතර එහි නිවැරදි පිහිටීම දක්වන ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) මානුෂවාදී හා වෛද්‍ය කාර්යධරයන් විසින් අවස්ථා ගණනාවක දී ම ආණ්ඩුව වෙත සම්ප්‍රේෂණය කරනු ලැබ තිබිණි.[753] 2008 අගෝස්තු හා 2009 ජනවාරි අතර අවස්ථා ගණනාවක දී ම රෝහල් බිමට හා අවට ප්‍රදේශයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරනු ලැබිණ.[754]

798. 2008 අගෝස්තු 8 වෙනි දින මධ්‍යම රාත්‍රිය හා පෙ. ව. 1 අතර මුලතිව් රෝහල ආසන්නයේම වටාපිටාව තුළ 40 කට ආසන්න ෂෙල් වෙඩි ගණනක් පුපුරා ගියේ ය.[755] වාර්තා වූ අන්දමට ප්‍රහාරය එල්ල කෙරී ඇත්තේ ශ්‍රී ලංකා හමුදාවේ ඉදිරියට එන බල සේනා පාලිත ප්‍රදේශයක මුලතිව් සිට කිලෝ මීටර 10 පමණ දුරක සිට ය.[756] ෂෙල් ප්‍රහාරය එල්ල වෙද්දී රෝහල් ගොඩනැගිලිවලට හානි සිදු වී ඇති නමුදු බරපතල තුවාල සිදු වීම් වාර්තා වී නොමැත. සක්ෂි වාර්තා දක්වනුයේ රෝහලේ සිට මීටර 200 ක් පමණ දුරින් එල්ටීටීඊ පොලිස් ස්ථානයක් පිහිටුවා තිබූ බව හා වාර්තාවන පරිදි ප්‍රහාරයේ දී ඊට හානි සිදුව තිබෙන බව ය.[757] සිද්ධිය පිළිබඳව දැනුම් දුන් විට වාර්තාවන පරිදි ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ වගකීම ශ්‍රී ලංකා හමුදාව ප්‍රතික්ෂේප කර තිබේ. එසේ වුව ද ශ්‍රී ලංකා හමුදාවට දැනුම් දීමෙන් අනතුරුව ෂෙල් ප්‍රහාර එල්ල වීම නැවතී ඇත.[758]

799. 2008 ඔක්තෝබර් හා නොවැම්බර්වල දී මුලතිව්හි දකුණට වෙන්නට වූ ශ්‍රී ලංකා හමුදා පිහිටැවුම්වල සිට මල්ටි බැරල් රොකට් ලෝන්චරවලින් එල්ල කළ ප්‍රහාර ඇතුළු ෂෙල් ප්‍රහාරයන් එල්ල කරන අතරතුර නැවත වරක් රෝහලට ෂෙල් වෙඩි වැදී තිබේ.[759] ඒවායින් රෝහල්

---

750 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
751 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
752 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
753 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
754 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
755 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ OHCHR හි විශේෂ පටිපාටි කොට්ඨාසයේ සන්නිවේදනය, ජිනීවාවල එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ ස්ථිර දූත කණ්ඩායමට නීතියෙන් බැහැර ලඝු හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ නියෝජිතයා විසින් යවන ලද චෝදනා ලිපිය AL/GS0214(33-24)LKA16/2008, 6 ඔක්තෝබර් 2008
756 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
757 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
758 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
759 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ගොඩනැගිලිවලට හානි සිදුවී ඇති අතර පුද්ගලයින් දෙදෙනෙකුට සුළු තුවාල සිදුව ඇත.[760] 2008 දෙසැම්බර් 2009 ජනවාරි රෝහල ආසන්න ප්‍රදේශ ඇතුළු මුලතිව්වල ෂෙල් ප්‍රහාර උත්සන්න වූ විට[761] වෛද්‍ය කාර්ය මණ්ඩලය රෝහල වසා දැමීටත් එය වල්ලිපුනම්වල නැවත පිහිටුවීමටත් තීරණය කළේ ය.[762]

800. 2008 අගෝස්තු, ඔක්තෝබර්, දෙසැම්බර් හා 2009 ජනවාරිවල ප්‍රහාර සිදුවන කාලයේ මුලතිව් රෝහල් ප්‍රදේශය තුළ හෝ ආසන්න වටාපිටාවේ එල්ටීටීඊ යුද පිහිටැවුම් ස්ථානගත කර තිබුණු බව දැක්වෙන තොරතුරු විමර්ශන කමිටුවට (OISL) ලැබී නැත. මේ පදනමින් ගත් කල එහි දැනුවත් යුද ඉලක්කයක් නොතිබූ අතර රෝහල හා අවට ප්‍රදේශවලට ප්‍රහාර එල්ල කිරීමේ සාධාරණ හේතුවක් නොමැත.

801. 2009 ජනවාරි මුල කිලිනොච්චි අල්ලා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවේ 58 වෙනි බල සේනාංකය A35 ප්‍රධාන මාර්ගය ඔස්සේ එල්ටීටීඊ පාලිත නගර වන විශ්වමඩු හා පුදුක්කුඩියිරුප්පු කරා නැගෙනහිර දෙසට එහි ගමන දිගටම කර ගෙන ගියේ ය. ශ්‍රී ලංකා හමුදාව ඉදිරියට යන විට පුදුක්කුඩියිරුප්පු හා අවට ප්‍රදේශ ආණ්ඩුවේ බල සේනා වෙතින් සැලකිය යුතු බෝම්බ ප්‍රහාරයන් අත් දිටීය. රෝහල් ද එක්සත් ජාතීන් හා මානුෂවාදී සංවිධාන විසින් භාවිතා කරන ලද පහසුකම් සේවා ස්ථාන ද ඇතුළු සිවිල් යටිතල ව්‍යුහය වෙඩි ප්‍රහාරයන්ට ලක් විය. ඇතැම් අවස්ථාවල එල්ටීටීඊය ජනතා කේන්ද්‍රස්ථානයන්ට ආසන්න ප්‍රදේශවල සිට ඉදිරියට ඇදෙන හමුදා බල ඇණි සමග සටන්වල නිරතවූ අතර රෝහල් ආසන්නයේ පිහිටුවන ලද යුද පිහිටැවුම්වල සිට වෙඩි ප්‍රහාර එල්ල කිරීම ප්‍රහාරවල ප්‍රතිවිපාකයන්ගෙන් සිවිල් ජනයා හා සිවිල් ස්ථාන ආරක්ෂා කරන බවට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ වූ එහි පොරොන්දු පැහැදිලිව උල්ලංඝනය කිරීමකි.

### සටන් මුක්ත කලාපය තුළ හා පුදුක්කුඩියිරුප්පුවල සිවිල් ජනයාට හා සිවිල් ස්ථානවලට පහර දීම පිළිබඳ උදාහරණ

#### සටන් මුක්ත කලාපය 1 හා පුදුක්කුඩියිරුප්පුවලට එල්ල කළ ප්‍රහාර

802. පළමුවන යුද මුක්ත කලාපය 2009 ජනවාරි 29 වෙනි දින ප්‍රකාශයට පත් කරන ලද්දේ වන්නි ශ්‍රී ලංකා හමුදා ආඥාපති මේජර් ජෙනරාල් ජගත් ජයසූරිය විසිනි.[763] යුද මුක්ත කලාපය A35 ප්‍රධාන මාර්ගයේ උතුර දක්වා උදයාර්කාඩු හන්දිය හා කහ පාලම අතර වර්ග කිලෝමීටර 35.5ක් ආවරණය කළේ ය.[764] සිවිල් ජනයාට එහි කෙළවරවල් කොහේ ද යන්න දැන ගැනීම අසීරු කරමින් සිතියමක සලකුණු කරන ලද අනෙකුත් සීමා මායිම් භූමියෙහි කිසිදු පිළිගත හැකි විශේෂ සලකුණක් මගින් දක්වා නොතිබුණි. යුද මුක්ත කලාපයේ කිසිදු පැහැදිලි සීමාවක්වත්

[760] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[761] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[762] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[763] අත්සන් කරන ලද ප්‍රකාශනය විමර්ශන කමිටුව වෙත ඇති සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[764] අභ්‍යන්තර OCHA සිතියම විමර්ශන කමිටුව වෙත ඇති සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

එය ආවරණය කරන ලද ප්‍රදේශය විස්තර කිරීමක්වත් දක්වන කිසිදු අත් පත්‍රිකාවක් විමර්ශන කමිටුව (OISL) විසින් දැක නොතිබුණි. එල්ටීටීඊ පාලනය යටතේ පැවති උපාය මාර්ගික පුදුක්කුඩියිරුප්පු නගරය පිහිටියේ යුද මුක්ත කලාපයෙන් පිටත අග්නි දිගට වන්නට ය.

803. සටන් මුක්ත කලාපය 1 හි කලින් පැවතුණු එල්ටීටීඊ යුද පහසුකම් ස්ථාන අඩංගු විය.[765] එය පිහිටා තිබුණේ හමුදා ඉදිරි ආරක්ෂක වළලුවලට සමීපව වන අතර සිවිල් ජනයා සඳහා බේරී යාමට සලසා දී තිබුණේ මාර්ග කිහිපයක් පමණි. එසේ වුව ද ජාත්‍යන්තර සංවිධාන සිටීම මගින් යළි සහතික කරනු ලැබීමෙන් හා එය ආරක්ෂා සහිත වූයේ යයි විශ්වාස කරමින් සිවිල් ජනයා යුද මුක්ත කලාපය 1 තුළට පොදි කකා එක් රොක් වූ නමුදු ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වීම හේතු කොට ගෙන සම්පූර්ණයෙන්ම වාගේ එය අත්හැර දමා යන්නට පටන් ගත්හ. පහතින් දැක්වෙන්නේ සටන් මුක්ත කලාපය තුළට හෝ ආසන්නයට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳ උදාහරණ ය.

**වල්ලිපුනම් රෝහල**

804. යුද මුක්ත කලාපය 1 මායිමෙහි A35 ප්‍රධාන මාර්ගයේ වල්ලිපුනම් හා දේවිපුරම් අතර පිහිටි වල්ලිපුනම් රෝහල ගොඩනැගිලි ගණනාවකින් සමන්විතව තිබිණ. රෝහල අවට ප්‍රදේශය ගැටුම මගින් අවතැන් කරන ලදුව තාවකාලික වාසස්ථාන ඉදි කර ගෙන සිටි සිවිල් ජනයාගෙන් ජනාකීර්ණව පැවතියේ ය.[766] 2009 ජනවාරි 18 වෙනි දින හා නැවතත් ජනවාරි 20 වෙනි දින රෝහලේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) හමුදාපති ජෙනරල් ෆොන්සේකාට හා වන්නි ආඥාපති මේජර් ජෙනරාල් ජගත් ජයසූරියට සන්නිවේදනය කරනු ලැබිණ.[767] විමර්ශන කමිටුව (OISL) 57 වෙනි, 58 වෙනි හා 59 වෙනි බල සේනාංක මෙන්ම ශ්‍රී ලංකා හමුදාවේ 2 වෙනි, 3 වෙනි හා 4 වෙනි යන කාර්ය සාධක බලකායන් වෙත වල්ලිපුරම් රෝහලේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) දැනුම් දෙමින් සන්නිවේදනය කරන ලද පෙ. ව. 10.50 ජනවාරි 24 දිනැති හමුදා නිවේදනයක පිටපතක් දැක තිබේ. ඊට පෙර භූමියේ දී එම ඛණ්ඩාංක හමුදාවට සන්නිවේදන කළේ ද යන්න දැන ගැනීමට නැත.

805. යුද මුක්ත කලාපය 1 ප්‍රකාශයට පත් කිරීමට ටික කාලයකට පෙර 2009 ජනවාරි 19 වෙනි දින ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කරන ලද ප්‍රදේශවල සිට එල්ල කරන ලද ෂෙල් වෙඩි වල්ලිපුනම් රෝහලට වැදී ඇත.[768] අතර වෙඩි එල්ටීටීඊ සටන්කරුවන්ට ප්‍රතිකාර කරන ලද තාවකාලික වාට්ටුවක් අසලට වැටී ඇත.[769] සත්‍ය කාරණයක් වනුයේ මෙය මානව හිමිකම් කොමිසමේ විමර්ශන කණ්ඩායමේ (OISL) තොරතුරුවලට අනුව ආණ්ඩුවට දැනුම් දී තිබීම ය.

---

[765] එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
[766] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[767] LLRC ඇමුණුම, ඇමුණුම 3, 94 පිටුව <http://www.llrcaction.gov.lk/assests/downloads/reports/en/Annex-3_en.pdf> මගින් අන්තර් ජාලයෙන් ලබා ගත හැකි ය.
[768] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[769] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

806. යුද මුක්ත කලාපය 1 ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ඉනික්බිතවම ජනවාරි 21 හා 22 අතර ප්‍රධාන ගොඩනැගිල්ලට, වෛද්‍ය යටිතල පහසුකම්වලට, ගිලන් රථයට හා තාවකාලික වෛද්‍ය නිවෙස්නවලට හානි පමුණුවමින් ෂෙල් වෙඩි තුනක් වල්ලිපුනම් රෝහල් අංගනය ඇතුළත පුපුරා ගොස් තිබේ.[770] වාර්තා වූ පරිදි සිද්ධියේ දී යටත් පිරිසෙයින් සිවිල් වැසියන් පස් දෙනෙකු මරණයට පත්ව ඇති අතර තවත් 22 දෙදෙනෙකුට තුවාල සිදුව ඇත. පහරට ලක් වූ එක් ව්‍යුහයක් වූයේ රෝහලේ දී ඒ වන විටත් ප්‍රතිකාර කර තවදුරටත් තුවාලවලින් පීඩා විඳිමින් සිටි රෝගීන් රඳවා සිටි තාවකාලික වාට්ටුවකි.

807. වල්ලිපුනම්හි රෝහල අවට ප්‍රදේශය ද ප්‍රහාරයන්ට ලක් විය. ඔහුගේ කාර්යාලයේ සිටින විට දී මල්ටි බැරල් රොකට් ලොන්චර්වලින් එල්ල කරන ප්‍රහාර ඔහු ශ්‍රවනය කළ අන්දම එක් සාක්ෂිකරුවෙක් විස්තර කළේ ය. අසල වෛද්‍යවරයෙකුගේ නිවසින් ඇසුණු ඇඬීම ඇසීමෙන් එහි දිව ගිය ඔහු දුක ඇත්තේ ගෙය වටේ තිබුණ ගස්වල අතු ෂෙල් ප්‍රහාරවලින් පුපුරා කැඩී ගොස් තිබෙන ආකාරය ය. පිපිරීම්වලින් මැටියෙන් හා ගඩොලින් තැනූ ගෙයි එක් පැත්තක් කඩා වැටී තිබුණි. වෛද්‍යවරයා බිම වැටී සිටි අතර ඔහුගේ උදරයේ කොටස් උණ්ඩ කැබල්ලකින් කැපී ගොස් එළියට එමින් තිබිණ. ඔහුගේ තුවාල නිසා වෛද්‍යවරයා පසුව මිය ගියේ ය.[771] තවත් සාක්ෂිකරුවෙකු 2009 පෙබරවාරි මුල වල්ලිපුනම් රෝහලට ආසන්න ප්‍රදේශයකට ''පොළොවට මීටර 20 සිට 25 දක්වා ඉහළින් මැද අහසේ දී පුපුරාගොස් තවත් කුඩා බෝම්බ 40-45කට බෙදී යන ''පොකුරු බෝම්බ'' ප්‍රහාර එල්ල කරන ලද බව විමර්ශන කමිටුවට (OISL) පැවසීය.[772]

808. විමර්ශන කමිටුව (OISL) විසින් විමර්ශනය කරන ලද වල්ලිපුනම් රෝහලේ චන්ද්‍රිකා ඡායාරූප රෝහල් අංගනයෙහි පුපුරා යාමකින් හටගත් ආවාට දෙකක් හා වෙන් වෙන් ගොඩනැගිලි තුනක පුපුරාගිය මුදුන් වහල හතරක් ද එක් ගොඩනැගිල්ලක කැඩී ගිය කොටසක් හා සම්පූර්ණයෙන් විනාශ වූ තවත් ගොඩනැගිලි අටක් ද පෙන්නුම් කරයි. මේ සියල්ලම සිදුව ඇත්තේ 2009 ජනවාරි 21 හා පෙබරවාරි 18 අතර ය. ආණ්ඩුව විසින් ''අතිරේක ආරක්ෂිත කලාපයක්'' ලෙස නම් කරන ලද ප්‍රදේශයක් වන රෝහලේ සිට එක කිලෝමීටරයක අර්ධ විෂ්කම්බයක් ඇතුළත 50 කට අධික අතිරේක කාලතුවක්කු ගැටුම් බිම් දැකිය හැකි වීම අළුතෙන් ප්‍රකාශයට පත් කරන ලද යුද මුක්ත කලාපය ඇතුළත පිහිටා තිබියදීත් රෝහල හා එහි වටාපිටාව නිරන්තර ෂෙල් ප්‍රහාරවලට විවෘතව තිබූ බව පෙන්නුම් කරයි.

809. විමර්ශන කමිටුව (OISL) විසින් දර්ශනය කරන ලද චන්ද්‍රිකා ඡායාරූප වල්ලිපුනම් රෝහලට ආසන්න වශයෙන් මීටර 650 ක් පමණ අග්නි දිගට වන්නට එල්ටීටීඊයේ පස් බැම්මක් හෝ ආරක්ෂිත පිහිටැවුමක් තිබිය හැකි බව පෙන්නුම් කරයි.[773] කිසියම් සිවිල් ස්ථානයක සිට යම් දුරකින් එවැනි යුද පිහිටැවුමක් තිබීම නීත්‍යානුකූල ඉලක්කයක් ඉදිරිපත් කරන්නේ වුව ද

770 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, LLRC වාර්තාව 4.118 හා 4.120 ඡේද
771 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
772 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
773 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

චන්ද්‍රිකා ඡායාරූප පෙන්නුම් කරන්නේ වල්ලිපුනම් රෝහල් ප්‍රදේශයට ෂෙල් ප්‍රහාර එල්ල කළ සමයේ ඊට පහර දුන් බවට සලකුණු නොමැති බවයි.

810. වල්ලිපුනම් රෝහලට එල්ල කරන ලද ප්‍රහාරයන්ගේ ස්වභාවය පරීක්ෂා කිරීමේ දී රෝහල වෙත ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් සාධාරණ යයි ඒත්තු ගැන්විය හැකි කිසිදු තර්කණයක් පෙනෙන්නට නැත. විමර්ශන කමිටුවට (OISL) රෝහලේ එල්ටීටීඊයට යුද පිහිටැවුම් තිබුණ බව දක්වන තොරතුරු ලැබී නැත. ප්‍රහාරයේ අරමුණ ප්‍රතිකාර ලබමින් සිටි එල්ටීටීඊ සටන්කරුවන් වූයේ නම් ඒවා නීත්‍යානුකූල ඉලක්ක නොවී ය. තව ද සිවිල් වැසියන් විශාල වශයෙන් ජනාකීර්ණව වෙසෙන ප්‍රදේශයක් තුළ වාර්තා වී ඇති කැබලි වී යන වෙඩි උණ්ඩ භාවිතය සිවිල් වැසියන්ට මෙන්ම රෝහල් ඇතුළු ආරක්ෂිත ස්ථානවලට ද වන සැලකිය යුතු අවදානම උපරිම කරනු ඇත. එය තහවුරු වුවහොත් ඒවා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ වන පොරොන්දු සමග අනුකූල වූයේ යයි සිතන්නට නොහැකි ය.

**උදයාර්කාඩු රෝහල, පළමුවන යුද මුක්ත කලාපය ඇතුළත එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානය**

811. උදයාර්කාඩු රෝහල පිහිටා තිබුණේ යුද මුක්ත කලාපය 1 හි නිරිත දිග කෙළවරෙහි A35 ප්‍රධාන මාර්ගයේ උතුරු පැත්තේ ලොකු පාසලක ය. ආසන්න වශයෙන් ස්ථිර ගොඩනැගිලි 11 කින් සමන්විත වූ එය රතු කුරුස ලාංඡනයෙන් පැහැදිලිව සලකුණු කර තිබූ අතර තාවකාලික වාට්ටු වශයෙන් භාවිතයට ගත් තාවකාලික වාසස්ථානවලින් වටවී තිබිණ.[774] වෛද්‍ය කාර්ය මණ්ඩලය හා මානුෂවාදී කාර්යධරයින් පළමුවෙන් ජනවාරි 18 වෙනි දින ද නැවතත් ජනවාරි 20 වෙනි දින ද රෝහල පිහිටි ස්ථානයේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) ආරක්ෂක හමුදාවන් වෙත සම්ප්‍රේෂණය කර තිබුණි.[775]

812. එක්සත් ජාතීන්ගේ මානුෂවාදී පහසුකම් සේවා ස්ථානයක් ජනවාරි 23 වෙනි දින ආසන්න වශයෙන් රෝහලට මීටර 700 ක් පමණ දුරකින් A35 ප්‍රධාන මාර්ගයේ උතුරට වෙන්නට විවෘත භූමියක පිහිටුවනු ලැබිණ.[776] ජනවාරි 23 වෙනි දින හෝ ඉනික්බිතවම එක්සත් ජාතීන්ගේ අළුත් පහසුකම් සේවා ස්ථානය පිළිබඳ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) ආරක්ෂක හමුදාවන්ට සන්නිවේදනය කෙරිණ.[777] ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට අයත් නිරීක්ෂණ ඩ්‍රෝනා යානා ජනවාරි 23 වෙනි දින හිසට ඉහළින් අහසේ දකින්නට ලැබිණ.[778] දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කළමනාකරණය කරන ලද ගබඩා මධ්‍යස්ථානයකින් සමන්විත වූ ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් හා ආසන්න වශයෙන් ප්‍රදේශයක බෙදා හැරීමේ ඒකක

---

[774] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[775] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, LLRC ඇමුණුම්, ඇමුණුම 3, 94 පිටුව
[776] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[777] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[778] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

10 ක් එක්සත් ජාතීන්ගේ මානුෂවාදී පහසුකම් සේවා ස්ථානයට යාබදව පිහිටුවා තිබිණ.[779] එසේම ආසන්නයේ මානුෂවාදී සංවිධාන කිහිපයක කාර්යාල ද පිහිටුවා තිබිණ.[780]

813. මීටර 100 ක පමණ දුරින් උතුරට වෙන්නට කුඩා අවි සහිත කාඩර්වරුන් හතර දෙනෙකුගෙන් යුත් පිහිටැවුමක් එල්ටීටීඊයට තිබුණ අතර ආසන්න වශයෙන් මීටර 100 ක් දකුණට වෙන්නට එල්ටීටීඊ ගුවන් විදුලි ස්ථානයක් ද පිහිටා තිබිණ.[781]

814. එක්සත් ජාතීන්ගේ මානුෂවාදී පහසුකම් සේවා ස්ථානය ස්ථාපනය කරමින් තිබෙන විට ජනවාරි 23 වෙනි දින අපර භාගයේ එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථානය හා රෝහල අවට ප්‍රදේශයට ශ්‍රී ලංකා හමුදාවේ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූයේ ය. වාර්තා වූ පරිදි එක්සත් ජාතීන්ගේ සේවා ස්ථානයේ සිට යන්තම් මීටර 60 ක පමණ දුරින් පිහිටි ඉදි කිරීම් බිමක වැඩ කරමින් සිටි එක්සත් ජාතීන්ගේ සේවකයන් කිට්ටුවම වැටුණු ෂෙල් වෙඩි තුනකින් යටත් පිරිසෙයින් සිවිල් වැසියන් 23 දෙනෙකු මරණයට පත්ව ඇත.[782] දකුණට වෙන්නට ස්ථානගත කර තිබූ ශ්‍රී ලංකා හමුදාවේ පිහිටැවුම් දෙසින් එල්ල වෙමින් තිබුණු ප්‍රහාරවලට මල්ටි බැරල් රොකට් ලෝන්වර ප්‍රහාර හා සුළු ගිනි අවි ප්‍රහාර ද අඩංගු විය.[783] හමුදා නිලධාරීන්ට කතා කළ විට ඔවුහු පහර දෙමින් සිටි බව ප්‍රතික්ෂේප කළහ. කෙසේ වුව ද වාර්තා වූ පරිදි ෂෙල් ප්‍රහාරයෙහි තාවකාලික නැවතීමක් සිදුව තිබුණ ද එය එතරම් කල් පැවතී නැත.[784]

815. රාත්‍රි කාලය තුළ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයට ආසන්නව එල්ල වූ යටත් පිරිසෙයින් 12 කට වැඩි ෂෙල් බෝම්බ මගින් තවත් සිවිල් වැසියන් මරණයට පත්ව තිබේ. එක ෂෙල් බෝම්බයක් වැටී ඇත්තේ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට පහසුකම් සැලසූ බන්කරයක සිට මීටර අටක් දුරිනි.[785] එක්සත් ජාතීන්ගේ කඳවුරට සමීපයේ පිහිටුවා තිබුණ තාවකාලික වාසස්ථාන හරහා වේගයෙන් හඹා ගිය බෝම්බ කැබලි නිසා මරණයට පත් වූ හා තුවාල ලද වින්දිතයින් අතර ළමෝ ද වූහ.[786] ෂෙල් වෙඩි ප්‍රහාරයේ දී වයසක මිනිසෙකුට ඔහුගේ දියණිය හා මුනුපුරු/මිනිපිරියන් දෙදෙනෙකු අහිමි විය. විමර්ශන කමිටුව (OISL) වෙත ඉදිරිපත් කරන ලද ඡායාරූප තොරතුරු එක්සත් ජාතීන්ගේ බන්කරයක් අසල ගසක් උඩට වැටී තිබුණ පුපුරා කැබලි වී ගිය කුඩා දරුවෙකුගේ සිරුරක් ඇතුළු ප්‍රදේශය සිසාරා විසිර ගිය වින්දිතයින්ගේ කැපී වෙන් වූ හිස් හා තැලී පොඩිවී ගිය ශරීර කොටස්වල දර්ශන පෙන්නුම් කරයි.[787]

---

779 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
780 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
781 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
782 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
783 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
784 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
785 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
786 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
787 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, විමර්ශන කමිටුව විසින් දක්නා ලද ඡායාරූප

816. ජනවාරි 24 වෙනි දින පාන්දර නිහැඬියාවකින් පසු ආසන්න වශයෙන් පෙ. ව. 10 පමණ සිට උදයාර්කාඩුවලට දකුණෙන් හා අග්නි දිගින් පිහිටි ශ්‍රී ලංකා හමුදාවේ පිහිටුවුම්වල සිට දැඩි කාලතුවක්කු ප්‍රහාර යළි ආරම්භ විය.[788] ෂෙල් වෙඩි ප්‍රහාර නොතකා දහස් ගණනක් සිවිල් ජනයා බෙදා හැරීමේ ස්ථානවලින් ආහාර සලාක ලබා ගැනීමට පෝලිං ගැසී සිටියහ.[789] එල්ල වෙමින් තිබුණු වෙඩි ප්‍රහාර ළඟින් ඇසෙන්නට වූ විට ජනයා බිම දිගා වූහ.[790] වාර්තා වූ අන්දමට 20 දෙනෙකු මරණයට පත් කරමින් හා බොහෝ දෙනෙකුට තුවාල සිදු කරමින් ආහාර පෝලිං කිට්ටුවම ෂෙල් උණ්ඩ පහක් වැටී ඇත.[791] එක් සාක්ෂිකරුවෙකු දර්ශනය විස්තර කළේ ''සම්පූර්ණ අවුල් ජාලයක්'' හා ''ආහාර ගෙන යාමට පැමිණි ජනයා ගෙන ගියේ මළ සිරුරු ය'' කියා ය.[792]

817. ජනවාරි 24 වෙනි දින ප. ව. 4 ට පමණ එක ෂෙල් උණ්ඩයක් උදයාර්කාඩු රෝහලට වැදුණු අතර තවත් එකක් රෝහල් අංගනයට සමීපව පුපුරා ගියේ ය. විමර්ශන කමිටුවට (OISL) ලැබුණු තොරතුරුවලට අනුව පහත් දහ තුනත් අතර ගණනක් මරණයට පත්ව ඇති අතර 27 දෙනෙකු තවාල ලබා ඇත. මාරක අනතුරුවලට ලක් වූ එක් අයෙකු වූයේ ගොඩනැගිලි දෙක අතරින් ගමන් කරමින් සිටි බෝම්බ කැබල්ලක් වැදුණු හෙදියකි.[793]

818. එක්සත් ජාතීන්ගේ පුහුණුව හා පර්යේෂණය සඳහා වූ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT) විසින් විමර්ශන කමිටුව (OISL) වෙත සපයන ලද චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය රෝහලේ විවෘත මිදුලේ හැරී ගිය ආවාට තුන ද වහල මුදුනේ කඩා ගෙන ගිය විශාල සිදුරු තුන හා විනාශයට පත් අතිරේක ගොඩනැගිලි තුන ද පෙන්නුම් කරයි. හඳුනාගත් හැරී ගිය ආවාට හා හානිය නිරන්තරව සිදු වූ කාලතුවක්කු ප්‍රහාර මගින් ඇති වූ ඒවා ය.

819. ජනවාරි 25 වෙනි දින ශ්‍රී ලංකා ආරක්ෂක මණ්ඩල ප්‍රධානිගේ උපදෙස් අනුව[794] එක්සත් ජාතීන් හා ඇතැම් මානුෂවාදී සංවිධාන සටන් මුක්ත කලාපය අත්හැර ආපසු පුදුක්කුඩියිරුප්පු කරා මාරු විය.[795] එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් A35 ප්‍රධා මාර්ගය දිගේ ගමන් ගන්නා විට විනාශයට පත් සිද්ධීන්ගේ දර්ශන දැක තිබේ. ''අප A35 ප්‍රධාන මාර්ගයට පිවිස පුදුක්කුඩියිරුප්පු දෙසට හැරුණු විට බිහිසුණු දර්ශනයක් අප එන තෙක් බලා සිටියේ ය. පාර

788 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

789 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

790 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

791 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

792 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

793 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, ICRC දූත මණ්ඩල ප්‍රධානි ශ්‍රී ලංකා හමුදාපති ලුතිනන් ජෙනරල් ෆොන්සේකා වෙත යවන ලද ලිඛිත සන්නිවේදනය,2009 ජනවාරි 24, LLRC ඇමුණුම්, ඇමුණුම 3, 94 පිටුව <http://www.llrcaction.gov.lk/assests/downloads/reports/en/Annex-3_en.pdf> මගින් අන්තර් ජාලයෙන් ලබා ගත හැකි ය.

794 එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආරක්ෂක උපදේශක ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි වෙත යවන ලද ලිපිය, 2009 පෙබරවාරි 4 LLRC ඇමුණුම, <http://www.llrcaction.gov.lk/assests/downloads/reports/en/Annex-3_en.pdf> මගින් අන්තර් ජාලයෙන් ලබා ගත හැකි ය.

795 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

මත හා දෙපැත්තෙහි හැම තැනම සිවිල් වැසියන්ගේ සිරුරු විසිරී තිබිණ.''[796] තවත් සාක්ෂිකරුවෙකු විමර්ශන කමිටුවට (OISL) කියා සිටියේ යුද මුක්ත කලාපයෙහි ''සැබවින්ම කිසිවක්ම පාහේ ඉතිරි වී නොතිබුණි'' කියා ය.[797]

820. ෂෙල් ප්‍රහාරවල තීව්‍රතාවය හේතු කොට ගෙන පෙබරවාරි මුල දී උදයාර්කාඩු රෝහල ආරක්ෂිත ප්‍රදේශයකට ගෙන යාමට තීරණය කරනු ලැබීය.[798] එක් වෛද්‍ය සේවකයෙකු විමර්ශන කමිටුවට (OISL) පැවසුවේ උදයාර්කාඩු රෝහලට ප්‍රහාර එල්ල කිරීමෙන් ටික වෙලාවකට පසු ඔහු ආණ්ඩුව මගින් පාලනය කරන රෝහල්වලින් ස්වාධීනව වඩා කුඩා තාවකාලික සායනයක් පිහිටු වන්නට තීරණය කළ බව ය. ඔහු ගොඩනැගිලිවලට රතු කුරුස ලාංඡනය යොදා නොගත් අතර පහසුකම් සේවා ස්ථානයේ පිහිටීම අධිකාරීන්ට දැනුම් දුන්නේ නැත. මෙම සායනයට පහර දුන්නේ නැත.[799]

821. මානුෂවාදී පහසුකම් සේවා ස්ථාන වටාපිටාවේ එල්ටීටීඊයට පිහිටැවුම් තිබිණ. ඒවාට ගුවන් විදුලි විකාශන ස්ථානයක් හා සම්ප්‍රේෂණ යන්ත්‍රයක් සහිත කුඩා පිහිටැවුමක් ද ඇතුළත් විය. වාර්තාවන අන්දමට ෂෙල් ප්‍රහාරවල ප්‍රතිඵල වශයෙන් එය ඉවත් කර ගෙන ඇත.[800] සාක්ෂි වාර්තා ඉදිරිපත් කරනුයේ ජනවාරි 23 වෙනි දින එල්ටීටීඊය එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථානයට ආසන්න වශයෙන් මීටර 300 ක් පමණ දුරින් ස්ථානගත කර තිබූ පිහිටැවුමක සිට කාලතුවක්කු ප්‍රහාර එල්ල කළ බව ය. එහෙත් ජනවාරි 24 වෙනි දින රාත්‍රි කාලයෙහි එල්ටීටීඊ වෙඩි තැබීම් සිදුව නැත.[801]

**පුදුක්කුඩියිරුප්පු රෝහල හා එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය**

822. පුදුක්කුඩියිරුප්පු රෝහල ඉතාමත්ම බෙහෙවින් ප්‍රහාරයන්ට ලක් වූ වෛද්‍ය පහසුකම් සේවා ස්ථානයන්ගෙන් එකකි. එය පිහිටා තිබුණේ පුදුක්කුඩියිරුප්පු හන්දියේ සිට කිලෝමීටරයක් පමණ දුරින් A35 ප්‍රධාන මාර්ගයට පසකින් ය. ආණ්ඩුව මගින් පාලනය කළ රෝහලක් වූ එය ප්‍රධාන ගොඩනැගිලි 10 කින් හා උප ගොඩනැගිලි 20 කට වැඩි ගණනකින් සමන්විත සංකීර්ණයක් විය. ගුවනේ සිට හා චන්ද්‍රිකා ඡායාරූපවලින් පැහැදිලිව දැකිය හැකි පරිදි රෝහල රතු කුරුස ලාංඡනවලින් සලකුණු කර තිබිණ.[802]

823. කිලිනොච්චිය හැර යාමෙන් පසුව එක්සත් ජාතීන් ඇතැම් කාර්යාල හා කාර්ය මණ්ඩල රෝහලේ සිට මීටර 30-- --40 ක් දුරින් පිහිටුවා තිබූ එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථානයක යළි ස්ථාපනය කෙරිණ.[803] එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය ද ඇතුළුව (ඉහත

---

796 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
797 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
798 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
799 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
800 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
801 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
802 එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
803 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

බලන්න) සටන් මුක්ත කලාපය ඇතුළත වූ දැඩි ෂෙල් ප්‍රහාර හේතු කොට ගෙන ජනවාරි 25 වෙනි දින එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් වැඩි ප්‍රමාණයක් පුදුක්කුඩියිරුප්පුවල නැවත ස්ථානගත කෙරිණ. රෝහලේ හා එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථාන යන දෙකෙහිම ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) ආණ්ඩුවට දැන ගැනීමට සලස්වා තිබිණ.[804] සාක්ෂි ප්‍රකාශන දක්වන්නේ මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAVs) යොදා ගනිමින් ආරක්ෂක හමුදා විසින් ප්‍රදේශ නිරන්තරව සෝදිසියට ලක් කරන ලද බව ය.[805] එහෙයින් ශ්‍රී ලංකා හමුදාව පුදුක්කුඩියිරුප්පුවේ රෝහල හා එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථානවල නිවැරදි පිහිටීම දැන සිටිය යුතුම ය.

824. 2009 ජනවාරි 10 හා පෙබරවාරි 6 අතර පුදුක්කුඩියිරුප්පුවේ රෝහල හා එක්සත් ජාතීන්ගේ පහසුකම් සේවා ස්ථාන සැලකිය යුතු බෝම්බ ප්‍රහාරයන්ට ලක් කරනු ලැබිණ. ජනවාරි 13 වෙනි දින පෙ. ව. 10 හා 11 අතර වාර්තා වන පරිදි ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කරන ලද ප්‍රදේශවල සිට ගොඩනැගිලිවලට හානි ඇති කරමින් හා යටත් පිරිසෙයින් රෝගීන් දෙදෙනෙකුට බරපතල තුවාල සිදු කරමින් කෙලින්ම රෝහල වෙත ෂෙල් වෙඩි දෙකක් එල්ල කර ඇත.[806] ප්‍රහාරය ගැන සඳහන් කරමින් එක්සත් ජාතීන්ගෙන් ලැබුණ ලිපියකට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වන්නියේ එහි මෙහෙයුම්වල ''ශූන්‍ය සිවිල් ජන හානි පිළිබඳ ප්‍රතිපත්තිය'' යළි යළිත් පවසා සිටිමින් කියා සිටියේ ''ශ්‍රී ලංකා හමුදාව (මෙම) වාර්තාවී ඇති සිද්ධියට කිසිදු සම්බන්ධයක් ඇතැයි යන්න සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන'' බව ය.[807]

825. සාක්ෂිකරුවන්ට අනුව 2009 ජනවාරි 26 හා පෙබරවාරි 4 අතර පුදුක්කුඩියිරුප්පුවේ රෝහල් ප්‍රදේශය ඇතුළත හා අවට ප්‍රදේශය ශ්‍රී ලංකා හමුදාවේ පිහිටැවුම්වල සිට අළුතෙන් එල්ල කරන ලද කාලතුවක්කු ෂෙල් වෙඩි හා රොකට් වෙඩි ප්‍රහාරවලට ලක් වූයේ ය.[808] ශ්‍රී ලංකා හමුදාව මල්ටි බැරල් රොකට් ලෝන්චර යොදා ගෙන පහර දීමේ හැකියාව ගෙන හැර දක්වමින් සක්ෂිකරුවෝ ඉතා කෙටි කාල පරාසයක් ඇතුළත රෝහලට බොහෝ සෙයින් එක පිට එක උණ්ඩ පතිත වීම විස්තර කළහ.[809] පළමුවන යුද මුක්ත කලාපයට කලින් එල්ල කරන ලද ප්‍රහාරවල දී තුවාල වූවන් මෙන්ම එය අරක්ෂා සහිත ස්ථානයක් යයි විශ්වාස කරමින් රෝහල් අංගනයෙහි වාසස්ථාන කර ගෙන සිටි සිවිල් වැසියන් ද ඇතුළුව 500 ක් පමණ රෝගීහු රෝහල ඇතුළත වූහ.[810] රෝහල රෝගීන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබූ අතර ඇඳන් හිඟය හේතු කොට ගෙන බොහෝ රෝගීන්ට බිම මෙන්ම ශාලාවල හා පිටත බිමෙහි ද සිටීමට සිදුව ඇත.[811] සාක්ෂිකරුවන් විමර්ශකයින්ට පැවසුවේ සිය අන්තශ්ශෛරික ආවිලයින (Intravenous drips) ද

[804] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[805] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[806] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, LLRC වාර්තාව 4.130 ඡේදය
[807] කමිටුව විසින් දක්නා ලද ශ්‍රී ලංකා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංයේ ලිපිය
[808] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[809] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[810] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[811] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

රැගෙන දිව ගිය රෝගීන් කිහිප දෙනෙකු ඇතුළුව ජනයා ෂෙල් වෙඩි වැටෙන විට ආවරණය වීම සඳහා රෝහලෙන් පිටත පිහිටි බන්කර් වෙත දිව ගිය බව ය.[812]

826. වාර්තාගත වන පරිදි 2009 ජනවාරි 26 හා 27 ශ්‍රී ලංකා හමුදා බල සේනා ස්ථානගතව සිටි දකුණේ හා නැගෙනහිර සිට ගිලන් රථවලට හා අනෙකුත් රෝහල් වාහනවලට හානි පමුණුවමින් රෝහල දෙසට ෂෙල් වෙඩි හා රොකට් වෙඩි මුර එල්ල කර ඇත.[813] ජනවාරි 28 හා 29 දිනවල රාත්‍රියෙහි බැර කාලතුවක්කු හා මල්ටි බැරල් රොකට් ලෝන්චර යොදා ගනිමින් නැවත වරක් ප්‍රදේශයට ප්‍රහාර එල්ල කර ඇත.[814] ජනවාරි 29 හෝ 30 රෝහලේ පිරිමි වාට්ටුවට එක ෂෙල් උණ්ඩයක් වැදී ඇති අතර ෂෙල් උණ්ඩ දෙකක් රෝහල් භූමිය මත පතිත වී ඇත.[815]

827. වාර්තාවන පරිදි ඔඩ්ඩුසුඩාන් අවට ශ්‍රී ලංකා හමුදා පිහිටැවුම්වල සිට 2009 පෙබරවාරි 1 වෙනි දින අවස්ථා තුනක දී යටත් පිරිසෙයින් පස් දෙනෙකුට මරු කැඳවමින් හා ළමයෙකු ඇතුළු තවත් ගණනාවකට තුවාල සිදු කරමින් පුදුක්කුඩියිරුප්පු රෝහලට කෙලින්ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරනු ලැබ ඇත.[816] ප. ව. 3 හා 4 අතර ෂෙල් වෙඩි දෙකක් එල්ල කර ඇති අතර දෙවෙනි මරණය, යටත් පිරිසෙයින් එක පුද්ගලයෙකු මරුමුවට පත්ව ඇත.[817] සන්ධ්‍යාවේ අග භාගයේ තුන්වන ප්‍රහාරය ස්ත්‍රීන් හා ළමුන් සිටි වාට්ටුවකට එල්ල වී ඇති අතර යටත් පිරිසෙයින් රෝගීන් හතර දෙනෙකු මිය ගොස් ද 14 දෙනෙකු තුවාල වී ද ඇත.[818] පසු දින සන්ධ්‍යා කාලයේ නැවතත් රෝහලට ප්‍රහාරයක් එල්ල වූ අතර ඉන් ළමා වාට්ටුවට හානි පැමිණ ඇති අතර වාර්තාවන පරිදි එක් වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හා ළදරුවකු ඇතුළු පුද්ගලයින් 7 දෙනෙකු මරුමුවට පත් වී ද 15 දෙනෙකු තුවාල වී ද ඇත.[819] බොහෝ විට පෙබරවාරි 3 වෙනි දින එල්ල වූ කාලතුවක්කු ප්‍රහාරයකින් රෝහලේ ශල්‍යාගාරයට ද හානි සිදු වී තිබේ.[820]

828. 2009 රාත්‍රි මුළුල්ලෙහි දිගටම ප්‍රහාර එල්ල වී ඇති අතර පෙබරවාරි 4 වෙනි දින උදේ කාලයේ තියුණු ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූයේ ය.[821] මරණ හා තුවාල ද රෝහල් ගොඩනැගිලිවලට විශාල හානි ද ඇති කරමින් රෝහල් භූමියට යටත් පිරිසෙයින් ෂෙල් වෙඩි 50

---

812 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

813 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

814 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

815 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

816 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ , ICRC මාධ්‍ය නිවේදනය 29/09, 2009 පෙබරවාරි 4, වන්නි රෝහල ඉවත් කරයි-වෛද්‍ය සේවා හා තුවාල ලද්දවුන් හා රෝගීන් ආරක්ෂා කිරීමට පාර්ශව උපරිම උත්සාහ දරයි.

817 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, 2009, ICRC ශ්‍රී ලංකාවඃ ICRC ෂෙල් වෙඩි ප්‍රහාර එල්ලවූ රෝහල නඩත්තු කරයි, <http://www.icrc.org/eng/resources/documents/inteviews/sri-lanka-interview-020209.htm> මගින් අන්තර් ජාලයෙන් ලබා ගත හැකි ය.

818 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

819 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

820 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

821 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

පමණ පතිත වී ඇත.[822] රෝහලේ ඇතුල් වීමේ දොරටුව අසල ෂෙල් වෙඩි පතිත වූ විට ඒවායින් පුද්ගලයින් පස් දෙනෙකු මරුමුවට පත් වී ඇත.[823]

829. එක් රෝහල් සේවිකාවක් පෙබරවාරි 4 වෙනි දින වන විට රෝහලේ තත්ත්වය විස්තර කළේ එය ඇය ඉන් පෙර කිසිදාක නොදුටු ''මනුෂ්‍ය සංහාරයක්'' බඳු බව ය.[824] නටබුන්ව පැවති වෛද්‍ය යටිතල පහසුකම් සහිතව හා සිදු වෙමින් පැවති ෂෙල් වෙඩි ප්‍රහාර හේතු කොට ගෙන බංකරවල සැඟවෙන්නට බල කෙරුණු රෝහල් කාර්ය පිරිස් සමග වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයෝ නොකඩවා පැමිණෙමින් සිටි සිය ගණන් තුවාල වූ රෝගීන්ට සත්කාරය සැපයීමට අරගල කරමින් සිටියහ.[825]

830. 2009 ජනවාරි 21 සහ පෙබරවාරි 5 අතර යටත් පිරිසෙයින් පුදුක්කුඩියිරුප්පු රෝහලේ ප්‍රධාන ගොඩනැගිලි 10 ක් ද උප ගොඩනැගිලි 20 ක් ද එක්කෝ බරපතල් ලෙස හානියට පත් වී නැතහොත් විනාශයට පත් වී ඇති බව චන්ද්‍රිකා ඡායාරූප පෙන්නුම් කරයි. යටත් පිරිසෙයින් රෝහල් සංකීර්ණය පුරා දිගටම එල්ල කෙරුණු කාලතුවක්කු ප්‍රහාර නිසා වහල මුදුන්වල හැරීගිය විවර 30 ක් හඳුනා ගනු ලැබ තිබේ.[826] ඡායාරූප එතෙකුත් ක්‍රියාත්මක වෙමින් පැවති සැලකිය යුතු බෝම්බ ප්‍රහාරයන්ට මෙම කාල පරිච්ඡේදය අතරතුර පුදුක්කුඩියිරුප්පු රෝහලට පාත්‍ර වන්නට සිදුවූ බවට ස්වාධීන තහවුරු කිරීමක් සපයයි.

831. වාර්තා වන පරිදි ශ්‍රී ලංකා අධිකාරීන් පුදුක්කුඩියිරුප්පු රෝහල වසා දමා රෝගීන් හා වෛද්‍ය කාර්ය මණ්ඩල ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කරන ලද ප්‍රදේශවලට ගෙන යන්නැයි රෝහල් කළමනාකරණයෙන් ඉල්ලා තිබුණි.[827] කෙසේ වුව ද පුදුක්කුඩියිරුප්පු රෝහල වන්නියේ පැවති බොහෝ රෝගීන්ට සේවය කරන ශල්‍යාගාරයක් සහිත එකම ස්ථාවර රෝහල විය.[828]

832. ආණ්ඩුව හා ආරක්ෂක හමුදා රෝහලේ පිහිටීම ද එය ක්‍රියාත්මක වෙමින් පැවති බව ද දැන සිටියේ ය. එක්සත් ජාතීන් හා පුදුක්කුඩියිරුප්පුවේ සිටි අනෙකුත් සංවිධාන රෝහල ප්‍රහාරයන්ට ලක් වෙමින් තිබූ බව බොහෝ අවස්ථාවන්හි දී ආණ්ඩුවට හා ශ්‍රී ලංකා හමුදාවට දැනුම් දී තිබිණ.[829] ආණ්ඩුව ප්‍රකාශයට පත් කරන ලද සටන් මුක්ත කලාපයෙන් පිටත තිබෙන හෙයින් පුදුක්කුඩියිරුප්පු රෝහල නීත්‍යානුකූල ඉලක්කයක් යයි 2009 පෙබරවාරි 2 වෙනි දින ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් ප්‍රකාශ කරන ලද රූපවාහිනී පුවත් සාකච්ඡාවක් විමර්ශන කමිටුව (OISL) විසින් දැක තිබේ.[830] ''යුද මුක්ත කලාපයෙන් ඔබ්බෙහි කිසිවක්

---

822 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
823 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
824 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
825 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
826 එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
827 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
828 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
829 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
830 Sky News, "Packed Sri Lanka Hospital Shelled", 2009 පෙබරවාරි 2, <http://news.sky.com/story/667068/packed-sri-lanka-hospital-shelled> වීඩියෝ පටය http://www.youtube.com/watch?v=pKmM2qg95R0> වලින් ලබා ගත හැකිය.

නොතිබිය යුතු ය'' යි ඔහු සඳහන් කළේ ය. ''ඔබ කියන්නේ එය සටන් මුක්ත කලාපයෙන් පිටත වන්නේ නම් එය නීත්‍යානුකූල ඉලක්කයක් වන්නේ යයි කියා ද''යි ප්‍රශ්න විචාරක ඇසූ විට ඔහු ''ඔව්, කිසිදු රෝහලක් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක නොවිය යුතු ය'' යනුවෙන් සහතික කර කියා සිටිමින් පිළිතුරු දුන්නේ ය.

833. විමර්ශන කමිටුවට (OISL) එල්ටීටීඊය විසින් පුදුක්කුඩියිරුප්පු රෝහල යුද කටයුතු සඳහා යොදා ගනු ලැබූ බවට කිසිදු තොරතුරක් ලැබුණේ නැත.[831] කෙසේ වුව ද රෝහල් පරිශ්‍රයේ සිට යටත් පිරිසෙයින් මීටර 400 ක් පමණ දුරින් පිහිටි බැම්මක් මත පිහිටැවුම් පවත්වා ගත් එල්ටීටීඊයට පුදුක්කුඩියිරුප්පු උපාය මාර්ගික නගරයක් වූයේ ය.[832] බොහෝ විට රෝහලට සමීපව ස්ථානගත කළ ජංගම පිහිටැවුමක සිට එල්ටීටීඊය මෝටාර් ප්‍රහාර එල්ල කළ බව සාක්ෂිකරුවෙකු වාර්තා කළ නමුදු එතෙකුත් ඒ රෝහල් භූමියෙන් පිටත සිට ය.[833] එසේම එල්ටීටීඊ යුද වාහන රෝහල් භූමියේ පැත්තකින් දිවෙන A35 ප්‍රධාන මාර්ගයේ ගමන් කර තිබේ.[834]

834. විමර්ශන කමිටුවට (OISL) එල්ටීටීඊ නායකත්වය පුදුක්කුඩියිරුප්පු රෝහලට සමීපව යුද පිහිටැවුම් ස්ථානගත කිරීමෙන් එහි හමුදා වැළක්වීමේ පියවර ගෙන තිබෙන බව යෝජනා කරන්නට කිසිදු තොරතුරක් නොමැති අතර එය යුද පිහිටැවුම්වලට ආසන්න ප්‍රදේශවලින් ඉවත් වෙන්නට සිවිල් ජනයාට කිසිදු අවවාද කිරීමක් ද කර නොමැත.

*2009 ජනවාරි 21 වෙනි දින ප්‍රකාශයට පත් කරන ලද ආරක්ෂිත කලාපය (මූලාශ්‍රයඃ ආරක්ෂක අමාත්‍යාංශය)*

**සටන් මුක්ත කලාපය 2 තුළ සිවිල් ස්ථානවලට එල්ල කළ ප්‍රහාර**

835. නිල වශයෙන් සිවිල් ජනතා ආරක්ෂිත කලාපය යනුවෙන් සඳහන් කරනු ලබන (CSZ) දෙවන සටන් මුක්ත කලාපය (NFZ2) නිර්මාණය කරන ලද්දේ 2009 පෙබරවාරි 12 වෙනි දින ය.[835] උතුරේ පුදුමාත්තලන්හි සිට දකුණේ වෙල්ලමුලිවෛක්කාල් දක්වා වෙරළ දිගේ පටු තීරුවක පැතුරුණු එයට වලයර්මදම්, අම්බලවන්පොක්කනෙයි හා කරයියාමුල්ලිවෛක්කාල් යන ගම් ඇතුළත් විය. එය වර්ග කිලෝමීටර 14 ක් ආවරණය කළ අතර පළමුවන සටන් මුක්ත කලාපයේ ප්‍රමාණයෙන් සම්පූර්ණයෙන්ම වාගේ තුනෙන් එකක් පමණ වූයේ ය.[836] දෙවන යුද මුක්ත කලාපය නිර්මාණය කිරීම එක්සත් ජාතීන්ට හා අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතනවලට

831 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
832 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
833 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
834 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
835 ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගෙන් මැමය, සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ OISL,
836 OCHA map on file with OISL,

මෙන්ම භූමියෙහි ආරක්ෂක හමුදාවන්ට ද සන්නිවේදනය කළ අතර එය ගුවන් විදුලිය මගින් ද විකාශනය කරනු ලැබී ය.[837]

836. දෙවන යුද මුක්ත කලාපය නිර්මාණය කිරීමට පෙර බොහෝ සිවිල් ජනයා මෙම ප්‍රදේශය වෙතට ගොස් තිබිණ. ''එල්ටීටීඊය සියලුම සිවිල් ජනයා (පළමුවන) යුද මුක්ත කලාපයෙන් වෙනත් ස්ථානයකට ගෙන ගොස් තිබුණ බව අප අවබෝධ කර ගත් විට අපි යුද මුක්ත කලාපය එම ප්‍රදේශයට මාරු කෙළෙමු'' යි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ පැවසීය.[838] කෙසේ වුව ද ලබාගත හැකි තොරතුරු පෙන්නුම් කරනුයේ සිවිල් ජනයාට එල්ටීටීඊ පාලිත ප්‍රදේශයේ කොටස්වලට යනවා විනා වෙනත් කිසි විකල්පයක් නොතිබූ බව හා ඔවුන්ට වුවමනා තිබුණේ වී වුව ද වාර්තාවන අන්දමට ෂෙල් වෙඩි ප්‍රහාරවලින් හෝ එල්ටීටීඊ පිහිටැවුම්වලින් බේරී යාමේ ආරක්ෂක මං පෙත් නොතිබුණ බව ය.

837. පහතින් එන කොටස විමර්ශන කමිටුව (OISL) විසින් ප්‍රලේඛනය කරන ලද දෙවන යුද මුක්ත කලාපයෙහි සිවිල් ස්ථානවලට එල්ල කළ ප්‍රහාරයන්ගෙන් සමහරක් ඒවා විස්තර කරයි. අප්‍රේල් 21 වෙනි දින ගැටුමේ තීව්‍රතාවය මගින් හා ''සිවිල් ජනයා අතර විශාල ජීවිත හානි'' මගින් කඩිනම් කරන ලදුව ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය දෙවන යුද මුක්ත කලාපය තුළ ''තවදුරටත් ලේ වැගිරීම් සිදු වීම අවම කිරීමේ විශේෂ පූර්වාරක්ෂණ පියවර ගන්නැ''යි දෙපාර්ශවයෙන්ම ඉල්ලා සිටිමින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේ ය. එය සිය සටන්කරුවන් හා යුද සම්පත් ''සිවිල් ජනයා සංකේන්ද්‍රණය වී සිටින ස්ථානවලින් සැලකිය යුතු තරම් ඈතට ගෙන ඉවත්ව යාමට අවශ්‍ය සිවිල් ජනයාට ආරක්ෂා සහිතව එසේ යන්නට ඉඩ සලස්වන්නැ''යි එල්ටීටීඊයෙන් ඉල්ලා සිටියේ ය. එසේම එය ආණ්ඩුවෙන් ද ''ඔවුන් ක්‍රියාවට නගන යුද්ධයේ ක්‍රමවේද හා මාධ්‍යයන් එක් අතකින් සිවිල් ජනයා හා සිවිල් ස්ථාන ද අනෙක් අතින් යුද ස්ථාන ද පැහැදිලිව වෙන් කර ගැනීමට හැකි වනසේ සහතික කරන්නැ''යි ද ඉල්ලා සිටියේ ය. මෙම තත්ත්වය යටතේ අපි විශේෂයෙන්ම කාලකුවක්කු වැනි අවි යොදා ගැනීමෙන් සිවිල් ජනයා මත ඇති කළ බලපෑම පිළිබඳව සැලකිලි මත් වෙමු.[839]

**පුදුමාතලන් රෝහල හා එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය**

838. 2009 පෙබරවාරි 5 වෙනි දින එක්සත් ජාතීන්, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, වෛද්‍ය සේවකයින් හා ආණ්ඩුවේ නිලධාරීන් පුදුක්කුඩියිරුප්පු සිට නැගෙනහිර වෙරළේ පිහිටි පුදුමාත්තලන් (ඇතැම්විට මාත්තලන් යයි සඳහන් කෙරේ) හා වලයර්මදම්වල නැවත ස්ථානගත කරනු ලැබිණ.[840] මානුෂවාදී නියෝජිතායතනවලට ඒවා රථ පෙළකින් ගමන් කළ හෙයින් ඉරනෙයිපලෙයිහි දී ෂෙල් ප්‍රහාරයන්ට හා ගුවන් ප්‍රහාරයන්ට මුහුණු දෙන්නට සිදු වූ අතර

---

837 හමුදාපති ජගත් ජයසූරිය විසින් 2010 සැප්තැම්බර් 8 දින LLRC වෙත කරන ලද ඉදිරිපත් කිරීම, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගෙන් මැමය, විමර්ශන කමිටුව වෙත ඇති සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

838 ගෝඨාභය රාජපක්ෂ විසින් 2010 සැප්තැම්බර් 8 දින LLRC වෙත කරන ලද ඉදිරිපත් කිරීම,

839 ICRC මාධ්‍ය නිවේදනය 2009 අප්‍රේල් 21, ICRC ''සටන් මුක්ත කලාපය'' තුළ තවදුර ලේ හැලීම අවම කිරීමේ සුවිශේෂ පූර්වාරක්ෂණ පියවර ගන්නැයි ඉල්ලයි.

840 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ඉදිරියට ඇති පාර දිගේ ගුවන් ප්‍රහාර එල්ල වීම හේතුවෙන් ඒවාට තාවකාලිකව නැවතීමට බල කෙරිණ.[841]

839. පුදුක්කුඩියිරුප්පු රෝහල ඉවත් කිරීමෙන් පසු සෞඛ්‍ය සේවකයෝ පුදුක්කුඩියිරුප්පු කරා යන මාර්ගයට යාබද නන්දි කඩාල් කලපුවේ වෙරළ තීරය ආසන්නයේ පුරවන ලද බිම් පෙදෙසක කලින් පැවති පාසල් ගොඩනැගිල්ලක තාවකාලික රෝහලක් ස්ථාපිත කළහ.[842] එහි වහලේ හා බිත්තිවල රතු කුරුස ලාංඡනය සහිතව රෝහල පැහැදිලිව සටහන් කර තිබුණි.[843] එක්සත් ජාතීන්ගේ සේවකයින් රෝහල් ගොඩනැගිලි හා කලපු වෙරළ අතර රෝහලට යාබදව කුඩා කේන්ද්‍රස්ථානයක් ස්ථාපනය කළ අතර එක්සත් ජාතීන්ගේ කොඩි ඔසවා තිබූ නිසා සහ මෝටර් රියවල හා ට්‍රක් රථවල සංවිධානයේ ලාංඡනය පැහැදිලිව දැකිය හැකි වූ නිසා එය එක්සත් ජාතීන්ගේ ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකිව තිබුණි.[844]

840. රෝහලේ හා එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) කලපුව හරහා ආසන්න වශයෙන් කිලෝමීටරයක් පමණ දුරින් හා රෝහල හා එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රස්ථානය පියවි ඇසින් දැකිය හැකි දුරින් ස්ථානගතව සිටි ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට සන්නිවේදනය කර තිබුණි.[845] එසේම ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවෝ ද ගුවන් නිරීක්ෂණ හරහා රෝහලේ හා එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රස්ථානයේ පිහිටීම හා ක්‍රියාකාරිත්වය දැන සිටියහ.[846] මෙහි සිටි ආරක්ෂක හමුදාවන්ට ශ්‍රී ලංකා හමුදාවේ 53 වෙනි හා 58 වෙනි බල සේනාංක ද 8 වෙනි කාර්ය සාධක බලකාය ද ඇතුළත් විය.[847]

841. ආසන්න වශයෙන් රෝහලට මීටර 350 ක් පමණ දුරින් කලපු වෙරළ තීරයෙහි එල්ටීටීඊය පිහිටැවුම් ස්ථාපිත කර තිබුණි.[848] එහෙත් වෙරළේ අනෙක් පැත්තෙහි රෝහල හා ශ්‍රී ලංකා හමුදාව අතර ඒවා ස්ථාපනය කර තිබුණේ නැත.[849] පුදුක්කුඩියිරුප්පු වැටීමෙන් පසු හා 2009 මාර්තු හා අප්‍රේල්වල පුදුමාත්තලන් ප්‍රදේශයේ සටන් උත්සන්න වූ විට එල්ටීටීඊයේ පිහිටැවුම් ශක්තිමත් කරනු ලැබිණ. රෝහලේ සිට මීටර 100 ඇතුළතට අගල් දිගු කරනු ලැබිණ.[850] තුවාල ලත් එල්ටීටීඊ සටන්කරුවන්ට පුදුමාත්තලන් රෝහලේ දී ප්‍රතිකාර කරනු ලැබුව ද ඔවුන් තබනු ලැබුවේ වෙනම ය. එසේම රෝහලෙහි එල්ටීටීඊයේ සිටීමක් නොවී ය.[851]

---

841 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
842 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
843 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
844 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
845 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
846 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ ,
847 තොරතුරු, විමර්ශන කමිටුව වෙත ඇති ගොනුව
848 එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
849 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
850 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
851 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

842. රෝහල ඇතුළත තත්ත්වය අතිශයින්ම දුෂ්කර විය: රෝගීන්ගේ සංඛ්‍යාව රෝහලේ ධාරිතාව ඉක්ම වී ය. එහෙයින් රෝගීන් තබන ලද්දේ පැදුරු හා ටාපොලින් මත ය. උපකරණ හිඟය හේතු කොට ගෙන නිදසුන් ලෙස අන්තශ්ශෛරික ආවිලයින (Intravenous drips) උපකරණ ගස්වල එල්ලා රෝගීන් ඒවා යටින් තබනු ලැබිණ.[852] රෝහල හා එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය අවට ප්‍රදේශයට බොහෝ සිවිල් වැසියෝ පැමිණි අතර කූඩාරම් ගසා ගෙන ඒවායේ නැවතී සිටියහ. බොහෝ දෙනෙකු ප්‍රහාරවලින් ආරක්ෂා වනු ඇතැ යි විශ්වාසයෙන් යුතුව කූඩාරම්වල සුදු කොඩි ද ඔසවා තිබුණි.[853]

843. 2009 පෙබරවාරි 9 හා අප්‍රේල් 20 අතර පුදුමාත්තලන් රෝහලට හා එක්සත් ජාතීන් මධ්‍යස්ථානයට යාබද ප්‍රදේශයට ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ සිද්ධීන් රැසක් පිළිබඳව විමර්ශන කමිටුව (OISL) වෙත ලැබිණ. පෙබරවාරි 9 දින ෂෙල් ප්‍රහාරවල දී පුදුමාතලන් රෝහලේ රෝගීන් 16 දෙනෙකු මරුමුවට පත්ව ඇති අතර රෝහලේ මායිම් බැම්ම හානියට පත්ව තිබේ.[854] මානුෂවාදී සේවකයෝ පෙබරවාරි 12 වෙනි දින ආණ්ඩුව විසින් රෝහල් ප්‍රදේශය දෙවන සටන් මුක්ත කලාපය තුළට වැටෙන බව ප්‍රකාශයට පත් කරනු ලැබීම ''හොඳ ප්‍රවෘත්තියක්'' ලෙසින් සාදරයෙන් පිළිගත්හ.[855] කෙසේ වුව ද ෂෙල් ප්‍රහාර අඛණ්ඩව සිදු කෙරිණ.

844. යුද මුක්ත කලාපය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු දින, එනම් පෙබරවාරි 13 වෙනි දින ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් එල්ල කරනු ලැබී යයි විශ්වාස කළ කාලතුවක්කු ෂෙල් උණ්ඩයක් ළමුන් දෙදෙනෙකු ඇතුළුව යටත් පිරිසෙයින් තිදෙනෙකුට මරු කැඳවමින් රෝහලේ කුස්සි කූඩාරම තුළට පතිත වී ඇත.[856] පෙබරවාරි 18 වෙනි දින රාත්‍රී කාලයෙහි කාලතුවක්කු ෂෙල් උණ්ඩයක් ශල්‍ය වාට්ටුව අසල පතිත වූ අවස්ථාවේ දී යටත් පිරිසෙයින් රෝහලේ රෝගීන් දෙදෙනෙකු මරුමුවට පත් වූ බව ද රෝහල් මායිමේ කෙළවරේ පිහිටි ඔවුන්ගේ වාසස්ථානය මත ෂෙල් උණ්ඩයක් පතිත වූ අවස්ථාවේ දී එක පවුලක සාමාජික සාමාජිකාවන් හය දෙනෙකු මරුමුවට පත් වූ බව ද සාක්ෂිකරුවෝ වාර්තා කළහ.[857]

845. මාර්තු 16 වෙනි දින සුළු අවි ප්‍රහාරයක් හා ආර්පීජී (රොකට්-ප්‍රචාලිත-බෝම්බ) ප්‍රහාරයක් එල්ල කරන ලද අතර ඒවායින් රෝහලේ වහලට හානි පමුණුවා දෙදෙනෙකු මරුමුවට පත් කර තිබේ.[858] මාර්තු 24 වෙනි දින ශ්‍රී ලංකා හමුදාවේ හමුදා පිහිටැවුම්වල සිට කලපුව හරහා නැවතත් රෝහල වෙත සුළු අවි, කාලතුවක්කු හා ආර්පීජී ප්‍රහාර එල්ල විය. යටත් පිරිසෙයින් මරුමුවට පත් වූ තිදෙනා අතරින් එක් අයෙක් ස්ත්‍රියක් වූවා ය. ඇය මිය ගොස් තිබුණේ ආර්පීජී බෝම්බයක් ඇගේ කකුලට වැදීමෙනි.[859] පසුව එදිනම එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය ආසන්නයේ සිවිල් මගී බසයකට එල්ල වූ ආර්පීජී බෝම්බයකින් අවුරුදු හයක් වයසැති පිරිමි

---

852 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
853 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
854 ICRC, මාධ්‍ය නිවේදනය 34/09, 2006 පෙබරවාරි 10, '' ICRC තුවාලකරුවන් හා රෝගීන් 240 වැඩි සංඛ්‍යාවක් මුහුදු මගින් ඉවත් කර ගනියි. සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
855 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
856 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
857 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
858 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
859 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ළමයෙකු මරුමුවට පත්ව ඇත.[860] පසු දින එනම් මාර්තු 25 වෙනි දින එක්සත් ජාතීන්ගේ කඳවුරට ආර්පීජී ප්‍රහාරයක් එල්ල වූ අවස්ථාවේ දී එක් පුද්ගලයෙකුට තුවාල සිදු විය.[861] මාර්තු 26 වෙනි දින හිමිදිරි පාන්දර පුදුමාතලන් රෝහලට අළුතෙන් ආර්පීජී ප්‍රහාරයක් එල්ලවූ අවස්ථාවේ දී සෞඛ්‍ය සේවකයන් දෙදෙනෙකු තුවාල ලැබීය.[862] අප්‍රේල්වල දී පුදුමාතලන් රෝහලට අඛණ්ඩවම තියුණු ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල විය. අප්‍රේල් 9 වෙනි දින හෝ ඒ ආසන්නයේ රෝහලේ ප්‍රවේශ දොරටුව අසල දී ෂෙල් වෙඩිවලින් පුද්ගලයින් තිදෙනෙකු මරණයට පත්ව තිබේ.[863]

846. අප්‍රේල් මස 20 වෙනි දින ශ්‍රී ලංකා හමුදාවේ 58 වෙනි බල සේනාංකය පුදුමාතලන් වෙත පැමිණියේ ය. 2010 සැප්තැම්බර් 8 වෙනි දින උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම වෙත දෙන ලද ඔහුගේ ප්‍රකාශනයේ දී 58 වෙනි බල සේනාංකයේ ආඥාපති ෂවේන්ද්‍ර සිල්වා එල්ටීටීඊ ආරක්ෂක වළලු කඩා බිඳගෙන ගිය පුදුමාතලන් අල්ලා ගනීමේ මෙහෙයුමට නායකත්වය දීමේ කාර්යය ඉටු කළේ ඔහු බව තහවුරු කළේ ය. ''පුදුමාතලන්හි මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAV) ඡායාරූප විසින් පෙන්වන ලද ලෝකයේ සිවිල් ජනයා ගලවා ගැනීමේ විශාලතම මෙහෙවර ඉටු කිරීම....''ඔහුට පැවරී තිබුණ බව ද ''කොමාන්ඩෝ සෙබළුන් හා විශේෂ බලකායන් සමග මෙම මුළුමහත් මෙහෙයුම මගේ සේනාංකයට පවරා තිබුණා'' යයි ද ඔහු පැවසීය. එසේම ඔහු ඔහුගේ මූලස්ථානයෙහි මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAV) පහසුකම් තිබූ බව ද පැවසීය.

847. රෝහල් ගොඩනැගිලිවලට හානි ඇති කරමින් එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය හා රෝහල අසල එල්ටීටීඊය හා ශ්‍රී ලංකා හමුදාව අතර වෙඩි හුවමාරු හට ගත්තේ ය.[864] බොහෝ දෙනෙක් මරණයට ද තුවාල වීම්වලට ද පාත්‍ර වූහ. එක් සාක්ෂිකරුවෙකුට අනුව ''ෂෙල් ප්‍රහාර නිසා වෛද්‍යවරුන්ට මිය ගිය හා මිය යමින් සිටි අය වෙත යා නොහැකි වූ අතර වෙඩි තැබීම්වල ප්‍රමාණය ඔවුන්ට ඉතා අනතුරුදායක තත්ත්වයක් ඇති කළේ ය.''[865] අප්‍රේල් 21 වෙනි දින කාලතුවක්කු ෂෙල් ප්‍රහාර සමග අතිනත් ගෙන ගුවනින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාර මුහුද අසල වැලි බංකර කරා බේරී යා හැකි වූවන්ට බේරී යාමට සලස්වමින් රෝහලේ රෝගීන් හා ඔවුන්ගේ ඥාතීන් ලැගුම් ගෙන සිටි කුඩාරම්වලට ගිනි ඇවිල වූයේ ය.[866]

848. පුදුමාතලන් රෝහල වටාපිටාව ඇතුළුව සටන් මුක්ත කලාපයෙහි සටන තියුණුව අඛණ්ඩව කෙරී ගෙන ගිය අතර ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය එය විස්තර කළේ ''මහා විපත්තියකට අඩු කිසිවක් නොවේ'' කියා ය. කාලතුවක්කු වැනි අවි යොදා ගැනීම සිවිල් ජනයා මත ඇති කරන බලපෑම පිළිබඳව විශේෂ සැලකිල්ලක් ප්‍රකාශ කළ ජාත්‍යන්තර රතු කුරුස

---

860 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
861 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
862 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
863 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

864 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
865 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
866 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

සංවිධානය සන්දර්භය ''ඉතාමත්ම ජනාකීර්ණ ප්‍රදේශයක සිදුවන අසාමාන්‍ය එකක්''ලෙස විස්තර කරමින් දෙපාර්ශවයෙන්ම සම්පූර්ණ පූර්වාරක්ෂණයන් ගන්නා ලෙස ඉල්ලා සිටියේ ය.[867]

849. පුදුමාතලන් රෝහලට හා එක්සත් ජාතීන්ගේ සේවා ස්ථානවලට ෂෙල් ප්‍රහාර එල්ල කරන ලද බවට විමර්ශන කමිටුව (OISL) විසින් එක්රැස් කරන ලද සාක්ෂිකරු සාක්ෂි චන්ද්‍රිකා ඡායාරූප මගින් තහවුරු කරයි.[868] වෙන වෙනම රෝහල් ගොඩනැගිලි තුනක වහලවල් මත යටත් පිරිසෙයින් ෂෙල් ප්‍රහාරවලින් හැරී ගිය කුහර හයක් හඳුනාගෙන තිබිණ. රෝහල අසල තාවකාලික කුඩා ඉදිකිරීම් ගණනාවක්ම විනාශ වී තිබිණ. එසේම චන්ද්‍රිකා ඡායාරූප ද රෝහල් අංගනයේ මීටර 400 ක් ඇතුළත යටත් පිරිසෙයින් කාලතුවක්කු වෙඩිවලින් හැරුණු 20 කට වැඩි ආවාට ගණනක් පෙන්නුම් කරයි. ඒවායින් සමරහක් එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයට හානි ඇති කළේ ය.

850. සාක්ෂිකරුවෝ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් විසින් පුදුමාතලන් රෝහලට හා එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයට එල්ල කරන ලද ඔවුන්ගේ ප්‍රහාරයන්හි දී පොකුරු වර්ගයේ බෝම්බ ආදිය භාවිතා කළ බවට චෝදනා කළහ.[869] වෛද්‍ය කාර්ය මණ්ඩලය වාර්තා කළේ ''පෙකුරු බෝම්බය''ක ප්‍රතිඵලයක් ලෙස සිදු වූවා යයි කියන තුවාලවලින් පීඩාවට පත්ව සිටි කාන්තාවකගේ කකුල ඔවුන් කපා ඉවත් කළ බව ය.[870] කලින් දක් වූ පරිදි පොකුරු බෝම්බ ආදිය භාවිතා කර තිබුණේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා විමර්ශනයක් කිරීම අවශ්‍ය කරයි. එසේම ශ්‍රී ලංකා හමුදාව විසින් පිහිටැවුම්වල සිට කලපුව හරහා ඒවා වැදුණු තැන්වල සිට ආසන්න වශයෙන් මීටර 800 පමණ දුර සිට ආර්පීජී බෝම්බ ප්‍රහාර ද එල්ල කර තිබේ.[871] මෙම පරාසයේ සිට ආර්පීජීවලින් වෙඩි තැබිය යුත්තේ වක්‍රාකාරව උන්නත පරාවලයකිනි. එය ඉලක්කයේ නිවැරදි භාවය විශාල වශයෙන් අඩු කරන අතර එලෙස එවැනි වෙඩි තැබීම් ඉවක් බවක් නැති වෙඩි තැබීම් වේ.[872]

851. ශ්‍රී ලංකා හමුදාවේ 58 වෙනි බල සේනාංකයේ අඥාපති මේජර් ජෙනරාල් ෂවේන්ද්‍ර සිල්වාට අනුව ආණ්ඩුවේ හමුදා ඔවුන්ගේ පිහිටැවුම්වල සිට කලපුව හරහා ෂෙල් ප්‍රහාර එල්ල කළේ හඳුනාගත් එල්ටීටීඊ ඉලක්කවලට ය.[873] ෂෙල් ප්‍රහාරවල දී එල්ටීටීඊ පිහිටැවුම්වලට ප්‍රහාර එල්ලවී තිබෙන බව චන්ද්‍රිකා ඡායාරූප පෙන්නුම් කරයි.[874]

852. මේජර් ජෙනරාල් ෂවීන්ද්‍ර සිල්වා උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම වෙත කරන ලද ඔහුගේ ප්‍රකාශයේ දී පුදුමාතලන් ප්‍රහාරය ප්‍රතික්ෂේප කළ අතර පහසුකම් යොදා

---

867 ICRC මාධ්‍ය නිවේදනය 09/81, 2009 අප්‍රේල් 21, ICRC ''යුද මුක්ත කලාපය'' තුළ තවදුර ලේ හැලීම අවම කිරීමේ සුවිශේෂ පූර්වාරක්ෂණ පියවර ගන්නැයි ඉල්ලයි.

868 ගොනුවේ තිබෙන එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)

869 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

870 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

871 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

872 කමිටුව කරන ලද යුද උපකරණ විශ්ලේෂණය

873 2010 සැප්තැම්බර් 8 දින ශ්‍රී ලංකා හමුදාවේ 58 වෙනි බල සේනාංකයේ ආඥාපති මේජර් ජෙනරාල් ෂවේන්ද්‍ර සිල්වා විසින් LLRC වෙත කරන ලද ඉදිරිපත් කිරීම.

874 එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)

ගත්තේ එල්ටීටීඊ සටන්කරුවන්ට එරෙහිව බවත් එම ප්‍රදේශවල සිවිල් වැසියන් නොසිටි බවත් තරයේ කියා සිටියේ ය. කෙසේ වුව ද මෙය රෝගී භාවය හෝ තුවාලවීම මගින් සටනින් ඉවත්වූවන් ලෙස තබා සිටි එල්ටීටීඊ සටන්කරුවන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ඉලක්ක කළ නොහැකි බැවින් ආරක්ෂක ස්ථානයක් ලෙස රෝහලේ ස්වභාවය කිසි ලෙසකින් වෙනස් නොකරනු ඇත. කෙසේ වුව ද විමර්ශන කමිටුව (OISL) විසින් එක්රැස් කරන ලද සාක්ෂි සිද්ධීන් පිළිබඳ මෙම විස්තරයට දැඩි සේ පරස්පර වෙයි. පුදුමාතලන් රෝහල යොදා ගත්තේ සිවිල් වැසියන්ට ප්‍රතිකාර කිරීම සඳහා ය. එය නැවත නැවතත් ප්‍රහාරයන්ට ලක් විය.[875]

**වලයාර්මාදම් පල්ලිය හා රෝහල**

853. පුදුක්කුඩියිරුප්පු හැර යාමෙන් පසු බොහෝ වෛද්‍ය සේවකයින් හා එක්සත් ජාතීන් පුදුමාතලන්වල යළි ස්ථානගත වුව ද ඇතැම් මානුෂවාදී සංවිධාන ස්ථානගත වූයේ කිලෝමීටර තුනක් පමණ දකුණට වෙන්නට වූ වලයාර්මාදම්වල ය.[876] මෙම ස්ථානය තාවකාලික පළාත් පාලන මධ්‍යස්ථානයක් ලෙස ද යොදා ගෙන තිබූ එකකි.[877] බොහෝ සිවිල් වැසියෝ එම ස්ථානයෙහිම පල්ලි ගොඩනැගිලි වාසස්ථාන කර ගනිමින් සිටියහ.[878] වලයාර්මාදම් පල්ලියේ සිට ආසන්න වශයෙන් මීටර 150 ක පමණ දුරින් කුඩා රෝහල් පහසුකම් සේවා ස්ථානයක් පිහිටා තිබුණි.[879]

854. පෙබරවාරි 22 වෙනි දින ශ්‍රී ලංකා හමුදාවේ පිහිටැවුම්වල සිට වලයාර්මාදම් දිසාවට මෝටාර් ෂෙල් ප්‍රහාර එල්ල කෙරිණ. ආණ්ඩු සේවකයෙකු මරණයට පත් කරමින් එක ෂෙල් උණ්ඩයක් පළාත් පාලන මධ්‍යස්ථානයට එල්ල විය.[880] මාර්තු මැද නොදන්නා මරණ සංඛ්‍යාවක් සිදු කරමින් වලයාර්මාදම්හි මානුෂවාදී සංවිධානයක කාර්යාල අසල අභ්‍යන්තර අවතැන් වූවන් සිටි ප්‍රදේශයකට ශ්‍රී ලංකා හමුදා පිහිටැවුම්වල සිට එල්ල කරන ලද ෂෙල් බෝම්බ පතිත වී ඇත.[881]

855. 2009 අප්‍රේල් 21-22 යන දිනවල පල්ලි අංගනය හා වෛද්‍ය පහසුකම් සේවා ස්ථාන ඇතුළු වලයාර්මදම් ඇතුළත හා අවට ප්‍රදේශයට එක දිගට වූ ෂෙල් ප්‍රහාර එල්ල කර තිබුණි.[882] සාක්ෂිකරුවන්ට අනුව ඒ වන විට පල්ලිය හා එහි අංගනය ආරක්ෂාව පතා පැමිණ සිටි 1,000 කට අධික අභ්‍යන්තර අවතැන් වූවන්ගෙන් පිරී පැවතිණ.[883] මානුෂවාදී සේවකයෙකු ප්‍රහාරයන්ගේ ප්‍රතිවිපාක විස්තර කළේ මෙසේ යඃ ''එය බිහිසුණු දර්ශනයක් උනා. පුපුරා කැබලි වී ගිය සිරුරු

[875] සිරිත් බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, 28, 35 නීති
[876] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[877] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[878] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[879] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[880] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[881] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[882] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[883] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

කොටස් හැම තැනකම විසිරී තිබුණා. ගස්වල එල්ලෙමින් තිබුණ අත් පවා මං දැක්කා. වාහන පුරාම මිනිස් සිරුරුවල කොටස් මං දැක්කා.''[884]

856. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ එක් වාසස්ථානයට පතිත වූ ෂෙල් උණ්ඩයකින් හෝ බෝම්බ කැබල්ලකින් මරුමුවට පත් වූවන් අතර සිවිල් වැසියෝ පස් දෙනෙක් වූහ. රෝහලේ දී මරුමුවට පත් වූවන් අතර මනෝ සෞඛ්‍ය වෛද්‍යවරයෙකු ද වූයේ ය. ඔහු ක්ෂතියට පත් වූ දුසිම් ගණන් සිවිල් වැසියන්ට විශේෂයෙන්ම ෂෙල් ප්‍රහාර හේතු කොට ගෙන පවුලේ සාමාජිකයින් අහිමි වූවන්ට උපදේශන සේවා සපයමින් සිටි කණ්ඩායමක සාමාජිකයෙකුව සිටියේ ය.[885] තවත් කොපමණ දෙනෙකු මරණයට පත් වී ද හෝ තුවාල වීම්වලට ලක් වූවා ද දන්නේ නැත. එහෙත් එක් වාර්තාවක් සඳහන් කරන්නේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු සියයකට වැඩි දෙනෙකු මිය ගිය බව ය. [886]

857. මෙම සිද්ධීන්වල දී බෝම්බ බිම පතිත වීමට පෙර උඩ දී ''කුඩා බෝම්බ''වලට පුපුරා යන බව සාක්ෂිකරුවෝ ගණනාවක් නැවත විස්තර කළහ. ෂෙල් වෙඩිවලින් තුවාල ලත් එක් සැකකරුවෙක් ඔහුට ''බෝම්බ එල්ල කරන හඬක්, පිපිරීමක ශබ්දය හා අනතුරුව කුඩා පිපිරීම් 40 ක හෝ 50 ක ශබ්දය පුළුල් ප්‍රදේශයක් පුරා ඇසීමට හැකි වූ'' බව පැවසීය.[887] තවත් එවැනි බෝම්බයක් රෝහලේ වහල මත පතිත වී ඇත ද පිපිරී නැත.[888]

858. එල්ටීටීඊය විටින් විට වලයාර්මාදම් පල්ලි බිමෙහි හා අවට සන්නද්ධ පෙනී සිටීමක් කර තිබුණි.[889] සත්තකින්ම මාර්තුවල දී එල්ටීටීඊය පල්ලිය වටලා එල්ටීටීඊය විසින් බඳවා ගනු ලැබීමෙන් ගැලවීම සඳහා හෝ ආරක්ෂාව සඳහා එහි රක්ෂාවරණය පතා සිටි තරුණයින් දුසිම් ගණනක් බලෙන් බඳවා ගෙන තිබුණි (බලහත්කාර බඳවා ගැනීම් පිළිබඳව XI පරිච්ඡේදය බලන්න). කෙසේ වුව ද අප්‍රේල්වල දී ෂෙල් ප්‍රහාර එල්ල කළ අවස්ථාවේ පල්ලි භූමිය තුළ හෝ අවට එල්ටීටීඊ යුද පිහිටැවුම් නොතිබූ බව ද නැතහොත් පල්ලියට ෂෙල් ප්‍රහාර එල්ල කරන විට පල්ලිය හා එහි අවට සිට එල්ටීටීඊය ප්‍රහාර එල්ල නොකළ බව ද සාක්ෂිකරුවෝ පැවසූහ.

### ආහාර බෙදා හැරීමේ පෝලිම්වලට එල්ල කළ ප්‍රහාර

859. දෙවන යුද මුක්ත කලාපයෙහි ආහාර බෙදීමේ කටයුතුවල නිරතව සිටි සාක්ෂිකරුවෝ බොහෝ අවස්ථාවල ආහාර ලබා ගැනීම සඳහා පෝලිම්වල සිටි ජනතාවට ෂෙල් ප්‍රහාර එල්ල කෙරුණේ කෙසේ ද යන්න විස්තර කළහ. ආහාර බෙදා හැරීමෙහි නියුතුව සිටි මානුෂවාදී සංවිධාන ආහාර බෙදා හැරීමේ ස්ථාන පිහිටුවීමට පෙර බෙදා හැරීම් සිදු කරන ස්ථානයේ පිහිටීම ශ්‍රී ලංකා හමුදාවට දැනුම් දී තිබේ.[890]

884 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
885 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
886 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
887 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
888 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
889 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
890 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

860. එක් සාක්ෂකරුවෙක් 2009 මාර්තු 11 වෙනි දින වලයාර්මාදම්වල හාල් හා පරිප්පු බෙදා හරින තෙක් බලා ගෙන සිටි ජනයාගේ පෝලිමකට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වාර්තා කළේ ය.[891] සාක්ෂිකරුවා ශ්‍රී ලංකා හමුදාවේ ෂෙල් ප්‍රහාරවලට කලින් බොහෝ විට ඉහළින් මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානාවක් (UAV) පියාසර කරනු දුටු බව වාර්තා කළේ ය. මිනිත්තු කිහිපයකට පසු සාක්ෂිකරුගේ මව ද ඇතුළුව පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් මරුමුවට පත් කරමින් ෂෙල් උණ්ඩ දුසිම් ගණනක් පතිත වූ බව සාක්ෂිකරු වාර්තා කළේ ය.

861. 2009 මාර්තු 25 හෝ ආසන්නව පෙ. ව. 11 ට පමණ ආසන්නයේ පිහිටි අම්පලවන්පොක්කනෙයිවල බත් බෙදා හරිමින් සිටි මධ්‍යස්ථානයක සිය ගණනක් ජනයාට වාර්තා වී අති පරිදි කප්පපලාවුහි ශ්‍රී ලංකා හමුදා පිහිටැවුම්වල සිට ෂෙල් ප්‍රහාරයක් එල්ල වී ඇත.[892] ෂෙල් ප්‍රහාරය ආසන්න වශයෙන් විනාඩි 15 ක් පමණ පැවතී ඇති අතර මෙම කාලය තුළ ෂෙල් වෙඩි 50 ක් පමණ පතිත වූ බවත්[893] එයින් පුද්ගලයින් ගණනාවක් මරුමුවට පත් වූ බවත්[894] කරමින් එක් සාක්ෂිකරුවෙක් සඳහන් කළේ ය. ආහාර බෙදා හැරීමේ කාලය තුළ ගුවන් නිරීක්ෂණ යානාවක් ප්‍රදේශයට ඉහළින් දක්නට ලැබී ඇත.[895]

862. 2009 අප්‍රේල් 8 වෙනි දින උදේ සටන් මුක්ත කලාපය2 හි පුළුල් ලෙස වාර්තා වූ තවත් සිද්ධියක දී පොක්කනෙයිහි කිරි පිටි බෙදා හරිමින් තිබුණු ප්‍රාථමික සෞඛ්‍ය සායනයක් වෙතට ෂෙල් වෙඩි ප්‍රහාරයක් පතිත වීමයි.[896] [897] දුර්ලභ භාණ්ඩයක් වූ කිරිපිටි දිනකට හෝ දෙකකට පෙර නැවකින් බෙදා දී තිබුණ අතර පසු දින සායනයට ගොස් ඒවා ලබා ගන්නා ලෙස ප්‍රදේශයේ ජනතාව දිරිගන්වා ශබ්ද විකාශන යන්ත්‍ර මගින් නිවේදනය කර තිබුණි.[898] බෙදා හැරීමේ වේලාව සහ ස්ථානය ද මානුෂවාදී ආයතන විසින් ආණ්ඩුවට සන්නිවේදනය කර තිබුණි.[899] අතිරේක වශයෙන් නිරීක්ෂණ ගුවන් යානාවක් ප්‍රදේශයට ඉහළින් පියාසර කරමින් තිබුණ අතර ඊට සිවිල් ජනයාගේ වැඩි වශයෙන්ම ස්ත්‍රීන්ගේ හා ළමුන්ගේ පෝලිම් දැකිය හැකිව තිබුණි.[900] තව ද ශ්‍රී ලංකා හමුදාව ස්ථානගතව සිටියේ මීටර 800 ක පමණ දුරිනි.[901]

863. ළදරුවන් හා තරුණ ළමුන් ඇතුළුව යටත් පිරිසෙයින් 50 දෙනෙකු පමණ ගණනක් මේ ප්‍රහාරයෙන් මරුමුවට පත් වූ බව සක්ෂිකරුවෝ විමර්ශන කමිටුවට (OISL) පැවසූහ.[902] පිපිරීම් ඇති වූ බිමෙහි ඉතා දරුණු ලෙස හානියට පත් සිරුරු ද හැමතැනම විසිරී තිබුණ සිරුරු කොටස් ද දුටු අන්දම ඔවුහු විස්තර කළහ. ආසන්නයේ රෝහලක තුවාල වූවන්ට ප්‍රතිකාර කරමින් තිබුණ ''කම්පාවෙන් ඇළලී ගිය තත්වයක'' දර්ශනයක් දක්නට තිබුණි: ''එහි මරණයට

891 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
892 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
893 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
894 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
895 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
896 අම්පනාර්පොක්කනෙයි යනුවෙන් ද සඳහන් වේ.
897 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
898 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
899 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
900 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
901 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
902 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

පත් වූ හා තුවාල සිදු වූ ස්ත්‍රීහු හා ළමෝ සිටියහ [...] සමහරුන්ගේ හිසට ද සමහරුන්ගේ උදරයට ද තුවාල සිදු වී තිබිණි. ළමුන් ද ඇතුළුව අනෙක් අයගේ අත් හා දෙපා කැලි කැලි වී ගොස් තිබිණි. තුවාල වූ මෙම ජීවිත ගලවා ගැනීමට වෛද්‍යවරු උමතුවෙන් මෙන් උත්සාහ දරමින් සිටියහ.''[903]

864. ආහාර බෙදා හැරීම්වල ආසන්නයේ සිදු වූ ඉහත එක සිද්ධියක්වත් සන්නද්ධ එල්ටීටීඊ ක්‍රියාකාරිත්වයක් බවට කිසිදු තොරතුරක් විමර්ශන කමිටුවට (OISL) ලැබුණේ නැත. ශ්‍රී ලංකා ගුවන් හමුදාව ආහාර බෙදා හැරීම්වල ස්ථානය හා වේලාව ක්‍රමානුකූලව දැනුම් දී තිබෙන බව නිශ්චිත හෙයින් විමර්ශන කමිටුවට (OISL) එම ප්‍රහාර හිතාමතාම එල්ල කරන ලද ඒවා යයි විශ්වාස කරන්නට සාධාරණ පදනම් තිබේ. [904]

**මුල්ලිවෙක්කාල් රෝහල්**

865. නොනැවතී එල්ල කරන ලද ෂෙල් ප්‍රහාරවල ප්‍රතිඵලයක් වශයෙන් වලයාර්මාදම් රෝහල 2009 අප්‍රේල් 29 හෝ ඒ ආසන්නයේ ඉවත් කරන ලද අතර සායනය මුල්ලිවෙක්කාල් වල නැවත පිහිටුවනු ලැබිණ.[905] නැවතීමට ආරක්ෂා සහිත ස්ථානයක් සොයාගැනීමට තිබූ කලබලය නිසා පවුල්වලට ඔවුන්ගේ මරණයට පත් වූ ආදරණීයයන් මිහිදන් කිරීමට වේලාවක් නොතිබුණි.[906] වලයාර්මාදම්වල එක් රෝගියෙක් ඔහුව මුල්ලිවෙක්කාල්වලට ගෙන ගියේ කෙසේ ද යන්න හා තවත් රෝගීන් 50 දෙනෙකු පමණ සංඛ්‍යාවක් සමග කුඩාරමක ඔහු නතර කර සිටියේ කෙසේ ද යන්න විස්තර කළේ ය.[907] මුල්ලිවෙක්කාල්හි සෞඛ්‍ය පහසුකම් සේවා ස්ථාන දෙකක් පිහිටුවී ය. එකක් මුල්ලිවෙක්කාල් ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර පහසුකම් සේවා ස්ථානය ය. අනෙක ඒ කාලයේ සටන් මුක්ත කලාපය2 හි ඉතිරි වී පැවති එකම රෝහල වූ මුල්ලිවෙක්කාල් රෝහල ය.[908]

866. මුල්ලිවෙක්කාල් බටහිර යනුවෙන් ද ප්‍රකට මුල්ලිවෙක්කාල් රෝහල කරයාන්මුල්ලිවෙක්කාල්හි රෝහලක් බවට හරවන ලද පාසල් ගොඩනැගිල්ලක් වූ අතර සුදු කොඩිවලින් හා රතු කුරුස ලංඡනයෙන් පැහැදිලිව සලකුණු කර තිබිණ.[909] වාර්තාවන පරිදි අප්‍රේල් 26 වෙනි දින හෝ ආසන්නයේ රෝහලේ ගෝලීය පිහිටුම් පද්ධති ඛණ්ඩාංක (GPS coordinates) ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට සම්ප්‍රේෂණය කර තිබුණි.[910] ඊට අමතරව ශ්‍රී ලංකා

---

903 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
904 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
905 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
906 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
907 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
908 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
909 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
910 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විශේෂඥ කණ්ඩායමේ වාර්තාව, 2011 මාර්තු 31

ආරක්ෂක හමුදා ප්‍රදේශයේ නිතිපතා කරන ගුවන් නිරීක්ෂණ පවත්වා තිබේ.[911] රෝහල පිහිටා තිබුණේ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර මධ්‍යස්ථානයට යාබදව ය.[912]

867. සටන් මුක්ත කලාපය2 හි තත්ත්වය එන්නට එන්ටම බෙහෙවින් දුෂ්කර තත්ත්වයට පත්වන විට ගොඩනැගිලිවල කඩිමුඩියේ සෞඛ්‍ය සේවා ස්ථාන බවට හරවන ලද තාවකාලික ඒවාට වඩා යන්තම් දෙයක් වූ මෙම ඉතිරිවී පැවති සෞඛ්‍ය සත්කාර පහසුකම් ස්ථාන රෝගීන්ගෙන් පිරී ඉතිරී ගිය, ඖෂධ හා අනෙකුත් සැපයුම්වල අතිශය උග්‍ර හිඟයන්ගෙන් පිරි ඒවා විය. වෛද්‍ය පිරිස් අතිශයින් වෙහෙසට පත්ව තිබුණි.[913] එක් සාක්ෂිකරුවෙකු මෙම තත්ත්වය විස්තර කළේ ''වැඩ කිරීමට ඉතාමත්ම බේදජනක වූ කාලයක්. හැමතැනම පැවතියේ මනුෂ්‍ය සංහාරයකි. ෂෙල්, බෝම්බ හා ආර්පීජී ප්‍රහාරවලින් සහ රයිපල් උණ්ඩවලින් පවා තුවාල වූ දහස් ගණන් ජනයා වූහ.'' කියා ය. මුල්ලිවෛකාල් ශල්‍යාගාරය ගැන කීවේ ''වාසස්ථානයකට'' වැඩි දෙයක් නොවීය කියා ය.[914] මුල්ලිවෛක්කාල්වල දර්ශනය ''විස්තර කළ නොහැකි'' එකක් යයි තවත් සාක්කිකරුවකු පැවසීයඃ ඇඳන් හිඟය හේතු කොට ගෙන රෝගීන් පිටත වැල්ලේ වැතිර සිටි අතර සිරුරු උෂ්ණයෙන් කුණුවෙමින් පැවතිණ.[915]

868. උග්‍ර ෂෙල් ප්‍රහාරවලින් අනතුරුව අප්‍රේල් 20 දින ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊ ආරක්ෂක බාධක කඩා දැමීමෙන් පසු සටන් මුක්ත කලාපය2 කොටස් දෙකකට වෙන් කළේ ය. ප්‍රතිඵලයක් වශයෙන් ලක්ෂයක් පමණ සිවිල් වැසියෝ මෙන්ම ඇතම් එල්ටීටීඊ ක්‍රියාධරයෝ ද අවි බිම තබා එල්ටීටීඊ-පාලිත ප්‍රදේශයෙන් පලා ගොස් ආණ්ඩුව විසින් පාලිත භූමි ප්‍රදේශයට පැමිණියහ. එහිදී ඔවුන් තියුණු පරීක්ෂාවන්ට ලක් කෙරුණු අතර කඳවුරුවල රැඳවීම හෝ සැකකරුවන් ලෙස හමුදා අත්අඩංගුවට ගැනීම හෝ කරනු ලැබිණ. වාර්තාවලට අනුව යුද මුක්ත කලාපය2 පහළ කොටසෙහි 150,000 ක් පමණ දෙනා රැඳී තිබේ.[916]

869. අප්‍රේල් 27 දින ශ්‍රී ලංකා හමුදාවට බර අවි පාවිච්චිය නතර කරන්නට උපදෙස් දී තිබූ බව ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබුණි. කෙසේ වුව ද ෂෙල් ප්‍රහාර නතර නොවූ අතර ඇතැම් මූලාශ්‍රවලට අනුව ඇතැම් විට උත්සන්න කෙරී ඇත.[917] අප්‍රේල් 27 පමණ සිට තවමත් සටන් මුක්ත කලාපය2 තුළ පිහිටි මුල්ලිවෛක්කාල් රෝහල පුදුක්කුඩියිරුප්පු දිසාවේ ශ්‍රී ලංකා හමුදා පිහිටැවුම්වල සිට එක දිගට එල්ල කරන ලද කාලතුවක්කු ෂෙල් ප්‍රහාරයන්ට ලක්ව තිබේ.[918] අප්‍රේල් 28 දින ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ස්ථානය වෙත ෂෙල් වෙඩි පතිත වූ අවස්ථාවේ දී වාර්තාවන පරිදි කාන්තාවක් හා ළමුන් ද ඇතුළුව යටත් පිරිසෙයින් පුද්ගලයින් හය දෙනෙකු මරුමුවට පත්ව ඇත.[919] අප්‍රේල් 29 දින ෂෙල් වෙඩිවලින් රෝහල් වාට්ටුවක වහලට

911 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

912 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, ගොනුවෙහි තිබෙන එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන් (UNOSAT) වාර්තාව

913 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

914 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

915 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

916 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

917 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

918 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

919 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

හානි වී ඇති අතර පුද්ගලයින් නව දෙනෙකු මිය ගොස් 15 දෙනෙකුට වැඩි ගණනක් තුවාල ලද බව වාර්තා විය.[920]

870. සිවිල් ජනයාගේ කටයුතු ඉහළම මට්ටමක පැවතිය දී මැයි 2 වෙනි දින උදේ රෝහල තුළට හා අවට ප්‍රදේශයට එල්ල කළ ෂෙල් ප්‍රහාරය බරපතල ජීවිත හානි ඇති කළේ ය.[921] පිටත දමා තිබූ මළ සිරුරු 30 ක් හෝ 40 ක් පමණ දුටු බව සිහි ගැන් වූ එක් සාක්ෂිකරුවෙක් තුවාලවල බරපතල භාවය නිසා ඒවායින් සමහරක් හඳුනාගත නොහැකි බව පැවසීය.[922] ඊට අමතරව රෝහලේ ආසන්නම වටාපිටාවේ බංකරයකට ෂෙල් උණ්ඩයක් වැදුණ අවස්ථාවේ දී පුද්ගලයින් හත් දෙනෙකු මරුමුවට පත්ව ඇත.[923] එක් සාක්ෂිකරුවෙකු දර්ශනය මෙසේ විස්තර කළේ යඃ ''එහි හැම තැනම මළ සිරුරු බොහොමයක් තිබුණා. ගුවනේ විසිරී තිබෙන ෂෙල් වලින් නිකුත් වූ දුමේ ගන්ධය මට තවමත් ආඝ්‍රානය කළ හැකියි. ලේ ගඳ සහ තුවාලවූවන්ගෙන් නැගුණු කෙඳිරිය අතිශයින්ම බරපතලයි. එහි මිය ගිය බොහෝ ගැහැණුන් හා ළමුන් සිටියා.''[924]

871. විමර්ශන කමිටුව (OISL) විසින් දක්නා ලද චන්ද්‍රිකා ඡායාරූප මුල්ලිවෙක්කාල්වල සෞඛ්‍ය පහසුකම් සේවා ස්ථාන කාලතුවක්කු ප්‍රහාරවලට ලක් වූ බව හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒවාට හානි සිදුව ඇති බව තහවුරු කරයි.[925] මුල්ලිවෛක්කාල් රෝහලේ රෝහල් ගොඩනැගිලි හතරක වහලවල යටත් පිරිසෙයින් වෙන් වෙන්ව හෑරී ගිය කුහර අටක් හඳුනාගෙන තිබිණ. ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර පහසුකම් ස්ථානයට යාබද අංගනයේ යටත් පිරිසෙයින් මෝටාර්වලින් හෑරී ගිය වලවල් දෙකක් හඳුනාගෙන ඇත. මෙම හෑරී ගිය කුහර හා වලවල් මුල්ලිවෛක්කාල් දිස්ත්‍රික්කය හා යුද මුක්ත කලාපය2 මුළුල්ලේ පැතුරුණු විශාල බෝම්බ ප්‍රහාර වැලක කොටසක් බව චන්ද්‍රිකා ඡායාරූප පෙන්නුම් කරයි.

872. III පරිච්ඡේදයෙහි සඳහන් කළ පරිදි ගැටුමේ එම අදියරේ දී එල්ටීටීඊය තවදුරටත් සංවිධානාත්මක, සංගත සටන් බලකායක් වූයේ නැත. මුල්ලිවෛක්කාල්වල එල්ටීටීඊ සෙබළුන්ගේ කණ්ඩායම් සිවිල් ජනයා සමග මිශ්‍රව සිටි අතර එල්ටීටීඊ යටත් පිරිසෙයින් රෝහලේ සිට මීටර 200 ක පමණ දුරින් නන්දි කඩාල් කලපුව ආසන්නයේ කුඩා පිහිටැවුම් කිහිපයක් පිහිටුවා තිබිණ.[926] චන්ද්‍රිකා ඡායාරූප හා සාක්ෂිකරු වාචික සාක්ෂිවලින් ලැබුණ තොරතුරු මත පදනම්ව මුල්ලිවෛක්කාල් හා වලයාර්මාදම් රෝහල් ඇතුළත එල්ටීටීඊ හමුදා පිහිටැවුම් තිබුණා යයි විමර්ශන කමිටුව (OISL) විශ්වාස නොකරයි.

920 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
921 විමර්ශන කමිටුවේ ගොනුවේ අභ්‍යන්තර ලියවිල්ලක්
922 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
923 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
924 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
925 විමර්ශන කමිටුවේ ගොනුවේ එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා නියැලුම් වැඩසටහන (UNOSAT)
926 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

*2009 පෙබරවාරි 12 වෙනි දින ප්‍රකාශයට පත් කරන ලද ආරක්ෂිත කලාපය (මූලාශ්‍රය: ආරක්ෂක අමාත්‍යාංශය)*

**සටන් මුක්ත කලාපය3 වෙත එල්ල කරන ලද ප්‍රහාර හා සන්නද්ධ ගැටුමේ අවසාන දවස්**

873. 2009 මැයි 8 වෙනි දින ආණ්ඩුව තුන්වන හා අවසාන යුද මුක්ත කලාපය ප්‍රකාශයට පත් කළේ ය. ශ්‍රී ලංකා හමුදාවේ අභික්‍රමණයන්ට අනතුරුව එතෙකුත් එල්ටීටීඊය පාලනය යටතේ ඉතිරිව පැවතියා වූ වර්ග කිලෝමීටර දෙකකට නොඅඩු කුඩා ප්‍රදේශයක් ආවරණය කරමින් යුද මුක්ත කලාපය2 හි මැද කොටස නව යුද මුක්ත කලාපය3 ට ඇතුළත් කෙරිණ. සිතියම් ද ඇතුළුව යුද මුක්ත කලාපය3 ප්‍රකාශයට පත් කිරීමේ සන්නිවේදනයන් ජාත්‍යන්තර සංවිධානවලට ඉදිරිපත් කරන ලද අතර ප්‍රදේශය වටකර සිටි ශ්‍රී ලංකා හමුදාවේ 53 වෙනි, 55 වෙනි, 58 වෙනි, හා 59 වෙනි බල සේනාංක ඇතුළු ශ්‍රී ලංකා හමුදාවේ ආඥාපතීන්ට ද යවනු ලැබිණ.[927] වාර්තා වන පරිදි ගුවනින් හෙළන ලද පත්‍රිකා මගින් සටන් මුක්ත කලාපය3 පිළිබඳව සිවිල් ජනයා දැනුවත් කරනු ලැබිණ.[928]

874. දස දහස් ගණන් සිවිල් ජනයා මෙම කුඩා ප්‍රදේශය තුළට අතුරු සිදුරු නොමැතිව එක්රොක් වූවෝ ය. විශාල කලපුවේ එක් පැත්තක ආණ්ඩුවේ හමුදාව සිටි අතර එල්ටීටීඊය අනෙක් පැත්තේ විය. සිවිල් ජනයා සිටියේ එල්ටීටීඊයට පිටුපසින් තරමක් දුරිනි.

875. භූමියේ යුද මෙහෙයුම්වලට නායකත්වය දුන් 58 වෙනි බල සේනාංකයේ ආඥාපති මේජර් ජෙනරාල් ෂවේන්ද්‍ර සිල්වා උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම වෙත ඉදිරිපත් කරන ලද ඔහුගේ ප්‍රකාශයේ පිටපතට අනුව[929] ඔහු මෙසේ සඳහන්කර ඇත: ''මෙහෙයුමේ අවසාන අදියරයන්හි දී අපි නිකම්ම අන්ධ ලෙස නොගියෙමු. හැම දෙයක්ම මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAV) පින්තූර මගින් සැලසුම් කරන ලද අතර සිවිල් ජනයා සිටියේ කොහේ ද, එල්ටීටීඊය සිටියේ කෙහේ ද යන්න අපි නිවැරදිව දැන සිටියෙමු. එසේම එල්ටීටීඊ කාඩර්වරුන්ට බෙහෙවින් සමීපව සිවිල් ජනයා සිටියේ ද නැද්ද යන්න පිළිබඳව ඉතා කුඩා හෝ ව්‍යාකුලතාවක් අපට ඇති වූයේ නම් වෙනත් මාධ්‍යයන්ගේ පිහිට පැතීමට හා පාර්ශව දෙක වෙන් කර ගැනීමට කාලය ගැනීමට අපට සිදුව තිබිණ.''

876. කෙසේ වුව ද අඛණ්ඩව එල්ල කෙරුණු ෂෙල් ප්‍රහාර හා ෂෙල් බිම පතිත වීමෙන් ඇති කළ මහත් විනාශය සාක්ෂිකරුවෝ විස්තර කළහ. එක් මූලාශ්‍රයකට අනුව මැයි 12 වෙනි දින තෙක් එල්ටීටීඊයේ කාලතුවක්කු තිබුණේ සිවිල් ජනයාට ඉදිරියෙන් ඉදිරි ආරක්ෂක වළල්ලේ ය. එහෙත් සිදු වූයේ ශ්‍රී ලංකා හමුදාවෙන් එල්ල වූ වෙඩි ප්‍රහාරයන් එල්ටීටීඊ ඉදිරි ආරක්ෂක වළල්ලට උඩින් ගොස් ''ඒ පිටුපස සිටි සිවිල් ජනයාට වැදීම ය.''[930] හැම දෙනාටම කුඩා බිම්

---

927 LLRC වාර්තාව 4.44 - 4.88 ඡේද

928 LLRC වාර්තාව 4.45 ඡේදය

929 2010 සැප්තැම්බර් 8 දින ශ්‍රී ලංකා හමුදාවේ 58 වෙනි බල සේනාංකයේ ආඥාපති මේජර් ජෙනරාල් ෂවේන්ද්‍ර සිල්වා විසින් LLRC වෙත කරන ලද ඉදිරිපත් කිරීම.

930 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

කැබල්ලක එකට සිරවී ගෙන සිටීමට සිදුව තිබුණ අතර විශේෂයෙන්ම ෂෙල් උණ්ඩයක් වැටෙන හැම අවස්ථාවකම ප්‍රායෝගික වශයෙන් ඔවුන්ට තුවාල ලබන්නට හා මරුමුවට පත්වන්නට සිදුව තිබිණ යනුවෙන් ඔහු පැවසීය. ඔවුන් එක්රැස්ව සිටි ළිඳක් අසල අඹ ගසකට ෂෙල් උණ්ඩයක් වැදුණු අවස්ථාවේ දී පුද්ගලයින් නව දෙනෙකු මරණයට පත් වෙනු තමන් දුටු බව තවත් සාක්ෂිකරුවෙක් පැවසීය. ඇයගේ බංකරයට ෂෙල් උණ්ඩයක් වැදීමෙන් මිය ගිය ස්ත්‍රියක අයෙක් දැක ඇත. ඇයට මහණ මැෂිමක් තිබුණ අතර බංකරය සඳහා වැලි පිරවීමට රෙදි මලු මැසුවා ය. ''නිතරම වගේ පවුල් සාමාජිකයින් මරුමුවට පත්වුණ විට ජනයා පලා යති. ඔවුන්ට ශෝක වීමට හෝ මළවුන් මිහිදන් කිරීමට වේලාවක් නොතිබුණි....'' තවත් සාක්ෂිකරුවෙක් ඔහුගේ බංකරය අසල ළමයින් ද ඇතුළුව මළ සිරුරු 100 කට වැඩි ප්‍රමාණයක් දුටු දර්ශනයක් විස්තර කළේ ය.

877. මුල්ලිවෙක්කාල් නැගෙනහිර යනුවෙන් ද ප්‍රකට වෙල්මුල්ලිවෙක්කාල්හි ප්‍රදේශයේ සියලුම සිවිල් වැසියන්ට තිබුණේ එක සෞඛ්‍ය පහසුකම් සේවා ස්ථානයක් පමණි.[931] එය පිහිටා තිබුණේ කලින් පැවති පැරණි පාසලක ය. එමෙන්ම අතිරේක ටාපොලින්වලින් හා තාවකාලිකව කූඩාරම් රෙදිවලින් ආවරණය කළ ඉදි කිරීම්වල ය. ඒවා සිවිල් ජනයා වෙසෙන බොහෝ වාසස්ථානවලින් වට වී තිබිණ.[932]

878. යුද මුක්ත කලාපය3 ශ්‍රී ලංකා හමුදාවේ කාලතුවක්කු සේනාංකය, ගුවන් හමුදාව හා නාවික හමුදාව විසින් එල්ල කරන ලද දැඩි දෛනික බෝම්බ ප්‍රහාරයන්ට ලක් වූ හෙයින් මැයි 8 හා 12 අතර සෞඛ්‍ය පහසුකම් සේවා ස්ථානවලට අවස්ථා ගණනාවක දී ම ෂෙල් ප්‍රහාර එල්ල විණ.[933] පාර්ශව දෙකම සටනේ නිශ්චිත ආසන්න තත්ත්වයන්හි දී අවදානම් තවදුරටත් වැඩි කරමින් සුළු අවි ප්‍රහාරවල ද නිරත විය.

879. සාක්ෂිකරුවන්ට අනුව මැයි 12 වෙනි දින පෙ. ව. 9 ට පමණ ශ්‍රී ලංකා හමුදාව විසින් එල්ල කරන ලද ෂෙල් උණ්ඩ වෛද්‍ය පහසුකම් සේවා ස්ථානයේ රෝගීන් ඇතුල් කර ගැනීමේ වාට්ටුව ඉදිරියෙහි කෙලින්ම පතිත වී ඇත. එයින් දිස්ත්‍රික් සෞඛ්‍ය පරිපාලකයෙකු, වෛද්‍ය ස්වේච්ඡා සේවකයින්, හෙදියක් හා රෝගීන් බොහෝ දෙනෙකු ඇතුළු යටත් පිරිසෙයින් පුද්ගලයින් 20 දෙනෙකු මරුමුවට පත්ව ඇත.[934] බොහෝ දෙනෙක් එසැනම මළහ. අනෙකුත් අය තුවාලවලින් මිය යමින් සිටියහ. ඇතැමෙක් වෛද්‍ය සත්කාරය හා ඖෂධ නොමැතිව මිය ගියහ.

880. ෂෙල් ප්‍රහාර එල්ල වූයේ කලින් ප්‍රහාරයන්ගෙන් තුවාල ලත් බොහෝ සිවිල් වැසියන් ප්‍රතිකාර ගැනීම සඳහා බලා සිටි දවසේ කාර්ය බහුල අවස්ථාවක දී ය.[935] ''එකිනෙකින් වෙන්ව ගත නොහැකි බොහෝ මළ සිරුරු එහි විය. හැම තැනම සිරුරු කැබලි ද විසිරී තිබිණ...''

---

931 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
932 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
933 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
934 මිය ගියවුන් 20 දෙනෙකුගේ තනි තනි පින්තූර ඇතුළු ලියවිලි, විමර්ශන කමිටුවේ ගොනුව
935 මැයි 9-10 තාවකාලික වාසස්ථානවලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ දී වාර්තා වී ඇති පරිදි බොහෝ ළමුන් ඇතුළුව ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණ සිටි බොහෝ සිවිල් වැසියන් තුවාල වී ද තවත් සිවිල් වැසියන් බොහෝ දෙනෙකු මරණයට පත් වී ද ඇත.

යනුවෙන් එක් සාක්ෂිකරුවෙකු  කමිටුවට (OISL) පැවසීය.[936] ''රෝහල ඇතුළත හැමතැනම මිය ගිය සහ මිය යමින් සිටි මිනිසුන්ගෙන් පිරී බිහිසුණු දර්ශනයකි'' යයි තවත් මූලාශ්‍රයක් පැවසීය.[937] තුන්වන සාක්ෂිකරුවා බොහෝ තුවාල ලත් රෝගීන් සහ බොහෝ මිය ගිය සිරුරු සියල්ලම එකට එකම තැනක සිටියේ හා හැම තැනම මිනිසුන් හඬමින් සිටියේ කෙසේ ද යි විස්තර කළේ ය. වෛද්‍ය සැපයුම් සම්පූර්ණයෙන්ම වාගේ අවසන්ව තිබිණ.[938]

881. එදිනම පසුව එක් හෙදි සහායිකාවක් මරුමුවට පත් කරමින් හා තවත් හය දෙනෙකු බරපතල පිලිස්සීම්වලට භාජනය කරමින් රෝහල් කාර්ය මණ්ඩලය හා ස්වෙච්ඡා සේවකයින්ට පහසුකම් සැපයූ කූඩාරමක් අසල ෂෙල් උණ්ඩයක් පතිත විය.[939] එම අවස්ථාවේ අසාමාන්‍ය පිලිස්සීම්වලින් යුත් රෝගීන් ගෙන එන ලද බව යටත් පිරිසෙයින් සාක්ෂිකරුවන් දෙදෙනෙක් කියා සිටියහ. ඔවුන්ගේ එක් අයෙකු විස්තර කළේ රෝගීන්ගේ ශරීරයේ විවිධ කොටස් කළුපැහැ ගැන්වී තිබුණේ ''කළු අඟුරු'' වගේ සමක් පරිද්දෙන් කියා ය.[940]

882. මැයි 13 වන විට හාත්පස හා ඈතම්විට රෝහල් අංගනයට වැටෙන ෂෙල් උණ්ඩත් සමග දිය හැකිව තිබූ එකම ප්‍රතිකාරය වූයේ මූලික ප්‍රථමාධාර හා බේත්හේත්  කිරීම පමණි.[941] එම කාලය තුළ ජීවිත ගලවා ගැනීමේ ප්‍රතිකාර සඳහා රෝගීන් ගෙන යාමේ එකම හැකියාව වී තිබුණ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නෞකාවට ය. ඊට අඛණ්ඩව එල්ල කරමින් පැවති ෂෙල් හා වෙඩි ප්‍රහාර නිසා වෙරළට ළඟා වීමට නොහැකි වූ[942] අතර අතිශයින් එය අවශ්‍ය කරන ලද ප්‍රතිකාර ප්‍රමාද කළේ ය. ''සිය ජීවිත අනතුරේ වූ  ළමුන් හා වයස්ගත වූවන් ද ඇතුළු තුවාල ලද්දන්ට හා රෝගීන්ට සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හැකිවනු ඇති එකම මාර්ගය වන්නේ ඔවුන් ඉවත් කර ගැනීම ය. ඔවුන් හැකි ඉක්මනින් ඉවත් කර ගත යුතුව තිබිණ.'' ෂෙල් ප්‍රහාර වඩාත් සමීප හා වඩාත් දැඩි වන්නට වූ විට මැයි 14 වන විට ඉතිරි වී තිබුණ තාවකාලික රෝහල ද ක්‍රියාත්මක වීම නතර විය.[943]

883. වෛද්‍ය කාර්ය පිරිස් සුදු කොඩියක් ඔසවමින් සමහර රෝගීන් රක්ෂස්ථානයකට ගෙන යනු දැකිය හැකි විය. අනතුරුව ඔවුන් යන්නට හැකි රෝගීන් සමග දකුණට වෙන්නට වූ වඩ්ඩුවකාල් පාලම දෙසට ඇවිද ගෙන යාම අරඹා ඇත.[944] ඇතැමුන්ගේ තුවාල එහා මෙහා යා නොහැකි තරම් බරපතල වූ හෙයින් රෝගීන් 150 පමණ හැර දමා යන්නට සිදුව ඇති අතර ඔවුන් නැව මගින් ඉවත් කර ගත නොහැකි වී ඇත.[945]

---

936 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
937 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
938 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
939 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
940 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
941 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
942 ICRC මාධ්‍ය නිවේදනය 09/97, ICRC බරපතල ලෙස තුවාල ලද්දවුන් ඉවත්කර ගැනීමට සටන තවදුරටත් බාධා කරයි.
943 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
944 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
945 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

884. මැයි මැද ගැටුමේ අවසන් දිනවල එල්ටීටීඊ සාමාජිකයන් ද ඇතුළුව ඉතිරි වී සිටි දහස් ගණන් සිවිල් ජනයා මෙන්ම අවි බිම තැබූ එල්ටීටීඊ සටන්කරුවෝ හා දන් තුවාල හෝ රෝගී වීම නිසා සටනින් ඉවත් වූවන් බවට පත්ව සිටි (*hors de combat*) එල්ටීටීඊ සටන්කරුවෝ ද පාලම තරණය කර ආණ්ඩුවේ හමුදාවන්ට භාර වූහ.

885. බොහෝ සාක්ෂිකරුවෝ යුද මුක්ත කලාප ඇතුළත ෂෙල් ප්‍රහාර මගින් මරුමුවට පත්ව සී සී කඩව විසිර තිබූ සිය ගණන් දෙනාගේ සිරුරු සහිත විනාශයේ දර්ශන පිළිබඳ විස්තර කළහ.[946] බංකරවල ආරක්ෂාව ලබමින් සිටියවුන් බෝම්බ පතිත වීමෙන් මරුමුවට පත්ව තිබුණේ මුළුමහත් පවුල් පිටින් ය. ඔවුන් ෂෙල් ප්‍රහාර මගින් තවදුරටත් අවතැන් කරනු ලැබූ හෙයින් මිය ගිය පවුලේ සාමාජිකයින් හැර දමා යන්නට සිදු වීම ගැන සාක්ෂිකරුවෝ කතා කළහ. ෂෙල් ප්‍රහාර පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් හා මතකයන් ද ඔවුන් අත්දුටු මහා විනාශය ද මගින් බොහෝ සාක්ෂිකරුවෝ ක්ෂතියට පත්ව සිටියහ.

886. ඔවුන් අවසානයේ දී ආණ්ඩුවේ පාලිත ප්‍රදේශ කරා ගමන් කිරීම ආරම්භ කරන විට සිවිල් ජනයාගේ ශාරීරික තත්ත්වය අඩපණව තිබූ අන්දම සාක්ෂිකරුවෝ විස්තර කළහ. රෝගීහු ඇතුළු ජනයා සා ගින්නෙන් පෙළෙමින් සිටියහ. ළමෝ දෘශ්‍යමාන ලෙස මන්දපෝෂණයට ගොදුරුව සිටියහ. වයසක වූවෝ ඉතාමත්ම දුර්වලව සිටියහ.[947]

887. විමර්ශන කමිටුව (OISL) ශ්‍රී ලංකා හමුදාව ගැටුමේ අවසානයෙන් පසු ගැටුම් කලාපයෙහි වල දමා තිබුණු සිරුරු හාරා ගොඩ ගෙන පුළුස්සා දැමීම ඇතුළු සාක්ෂි විනාශකර තිබිය හැකිය යන බරපතල් චෝදනාවන් මගින් සංවේගයට පත්ව සිටී. රෝහල්වල මිය ගිය වූවන්ට අමතරව බොහෝ සාක්ෂි වළලමින් තිබුණ සිවිල් පවුල් සාමාජිකයන් ගැන හෝ අනෙක් අය කඩිනමින් පලා යාමට පෙර ෂෙල් ප්‍රහාරවල දී මරුමුවට පත් වූවන් වළලනු දැකීම විස්තර කරයි. යුද්ධයේ පටන් මිනී හාරා ගොඩ ගැනීම පිළිබඳ ක්‍රමානුකූල වාර්තා තබා ගැනීමක් තිබී නැත. වළලන ලද හා විමර්ශනවල කොටසක් වශයෙන් එකී සිරුරු පරීක්ෂා කරනු ලැබිය හැකි විස්තීරණ චෝහාරික මානව විද්‍යාත්මක විශේෂඥතාවක් අවශ්‍ය කෙරෙනු ඇත.

*2009 මැයි 8 වෙනි දින ප්‍රකාශයට පත් කරන ලද ආරක්ෂණ කලාපය (මූලාශ්‍රය: ආරක්ෂක අමාත්‍යාංශය)*

*2009 මැයි 13 වෙනි දින වන විට තත්ත්වය (මූලාශ්‍රය: ආරක්ෂක අමාත්‍යාංශය)*

## XIV යාම් ඊම් පිළිබඳ පාලනයන්

### හැඳින්වීම

[946] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[947] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

888. එල්ටීටීඊය විසින් කරන ලද යාම් ඊම් පාලනය මෙම විමර්ශනය විසින් ආවරණය කරනු ලබන කාල පරිච්ඡේදයේ ආරම්භයට පෙර බොහෝ අවුරුදු ගණනකින් ආපස්සට යයි. එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පිටව යන විට අවසර දීම සඳහා පාවිච්චි කරන ලද අවසරපත් ක්‍රමයක් මගින් එය ප්‍රකට ය. අවසරපත් ක්‍රමය දැඩිකමේ විවිධ මට්ටම්වලින් යුතුව ක්‍රියාත්මක කරනු ලැබිණ. කෙසේ වුව ද 2009 ආරම්භයේ සිට සීමා පැනවීම් වඩාත් බරපතල බවට පත් වූ අතර හදිසි වෛද්‍ය ප්‍රශ්න සම්බන්ධ කාරණාවල දී හැර අවසරපත් ක්‍රමය නවතනු ලැබිණ.

889. මෙම කොටස එල්ටීටීඊය විසින් ඔවුන් පාලනය කරන ලද භූමි ප්‍රදේශ තුළ සිවිල් වැසියන්ගේ යාම් ඊම් මත පනවන ලද වැඩි වෙමින් පැවති හිංසාකාරී පාලනයන් හා සීමා පැනවීම්, ඒවායේ දී සිවිල් වැසියන් ප්‍රදේශයෙන් පිටතට යාමෙන් වැළක් වූ ආකාරය හා අදාළ අයථා ක්‍රියාවන් හා අපරාධ පරීක්ෂාකර බලයි. එසේම එය මෙම ක්‍රියාවන් ජාත්‍යන්තර මානුෂවාදී නීතියට අනුකූලව සිවිල් වැසියන් මානව පලිහවල් ලෙස යොදා ගැනීමක් ලෙස ගිනිය හැකි ද යන්න සලකා බලයි. එසේම යාම් ඊම් පිළිබඳ මෙම පාලනයන් සීමාවන් සලකා බැලිය යුත්තේ කලින් කොටසේ එන සිවිල් වැසියන් වෙත එල්ල කළ ප්‍රහාර හා එල්ටීටීඊ යුද සම්පත්වල පිහිටීම සමග සම්බන්ධයෙන් යුතුව ය.

890. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය භූමි ප්‍රදේශයක් ඇතුළත නීත්‍යානුකූලව සිටින සෑම පුද්ගලයෙකුටම යාම් ඊම් නිදහසට හා අයෙකුගේ පදිංචිය තෝරා ගැනීමේ නිදහසට ඇති අයිතිය සහතික කරයි.[948] මෙම අයිතිය ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය හෝ සදාචාරයන් හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය නීතිය මගින් පනවනු ලබන සීමා කිරීම්වලට භාජනය විය හැකි ය. කෙසේ වුව ද යාම් ඊම් අයිතිය සීමා කරන ඕනෑම පියවරක් අවශ්‍යතා මූලධර්මය හා අනෙකුත් සහතික කරන ලද මානව අයිතිවාසිකම් සමග අනුකූලවීමේ අවශ්‍යතාව මගින් පාලනය විය යුතු ය.[949] ඉහතින් දක්වන ලද කොන්දේසි සමග අනුකූල නොවන ඕනෑම සීමා පැනවීමක් යාම් ඊම් නිදහසට ඇති අයිතියට හිතුවක්කාර අත පෙවීමක් හා සමාන වෙයි.

891. සන්නද්ධ ගැටුම් තත්ත්වයක් තුළ සන්නද්ධ ගැටුමට සම්බන්ධ පාර්ශව තනි තනි සිවිල් වැසියන් හෝ සිවිල් ජනතාවම අදාළ සිවිල් ජනයාගේ ආරක්ෂාවේ ප්‍රමාණයට හෝ අනිවාර්ය යුද හේතූන් එසේ ඉල්ලා සිටින තාක් දුරට ඉවත් කරන්නට හෝ වෙනත් තැනකට ගෙන යන්නට පුළුවන.

892. පුද්ගලයින්ගේ හෝ කණ්ඩායම්වල යාම් ඊම් මත හිතුවක්කාර සීමාවන් පැනවීම සුදුසු නිවාස සඳහා අයිතිය, සුදුසු ජීවන තත්ත්වයකට (ආහාර, ජලය, සනීපාරක්ෂාව ආදී) ඇති අයිතිය, අධ්‍යාපනයට ඇති අයිතිය, වධ හිංසනය හෝ අමානුෂීය සැලකීම තහනම් කිරීම,

---

948 ICCPR 12 වගන්තිය, ''යාම් ඊම් නිදහස පුද්ගලයෙකුගේ නිදහස් සංවර්ධනය සඳහා නැතිවම බැරි කොන්දේසියකි. එය රාජ්‍ය පාර්ශවවලින් ලැබන වාර්තා හා පුද්ගලයින්ගෙන් ලැබෙන සන්දේශනයන් සලකා බැලීමේ කමිටුවේ භාවිතය බොහෝ විට පෙන්වා ඇති පරිදි සම්මුතියෙහි ගැබ් කොට ඇති අනෙකුත් අයිතීන් ගණනාවක් සමග අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියා කරයි.'' යාම් ඊම් නිදහස පිළිබඳව, පොදු විවරණය, අංක 27, (12 වගන්තිය), CCPR/C/21/Rev.1/Add9,1999,para 1

949 එම 2 ඡේදය

පුද්ගලයාගේ නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය, ඇතැම් තත්ත්වයන් යටතේ ජීවත් වීමේ අයිතිය පවා වැනි මානව හිමිකම් මාලාවක් ම අයුතු ලෙස උල්ලංඝනය කිරීමක් විය හැකි ය.[950]

893. මෙම හේතුව නිසා වගකීම් දරන්නන් පුද්ගලයින් හෝ කණ්ඩායම් බලහත්කාරයෙන් අවතැන් කිරීමෙන් හෝ ඔවුන්ගේ ගමන් බිමන් හිතුවක්කාරී ලෙස සීමා කිරීමෙන් පමණක් නොව බලහත්කාරයෙන් අවතැන් කරන ලද්දවුන්ගේ හෝ සන්නද්ධ ගැටුමක් හෝ ස්වාභාවික ආපදා හේතු කොට ගෙන ගමන් බිමන් සීමා කරන ලද්දවුන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම අරමුණුකර ගත් පියවර ගැනීම අවශ්‍ය කෙරේ.

894. 2009 පෙර එල්ටීටීඊයේ අවසරපත් ක්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් යාම් ඊම් මත පැනවූ පාලනයන් හා සීමාවන්

895. 1990 ගණන්වල මුල එල්ටීටීඊයේ බුද්ධි අංශයේ ප්‍රධානියා වන පොට්ටු අම්මාන් එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට ඇතුල් වීම හෝ ඒවායින් පිටවීම සීමා කිරීමේ අවසරපත් ක්‍රමයක් ස්ථාපිත කළේ ය. 2002 හා 2006 අතර සටන් විරාම ගිවිසුමෙන් අනතුරුව එල්ටීටීඊ හා ආණ්ඩුව පාලිත ප්‍රදේශවල යාම් ඊම් අඩුවෙන් සීමා කෙරිණ. ඒ කාලයේ එල්ටීටීඊය අවුරුදු දහයෙන් ඉහළ සියලු දෙනාට ගමනාගමන ඇතුල්වීමේ පතක් (Transport Admission Card)[951] නිකුත් කළ අතර පුද්ගලයින්ට හා පවුල්වලට තරමක් දුරට පහසුවෙන් එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පිටවීම හා ඒවාට ඇතුල් වීමට හැකි විය.

896. කෙසේ වුව ද ආණ්ඩුව හා එල්ටීටීඊය-පාලිත භූමි ප්‍රදේශ අතර යාම් ඊම් සඳහා වූ එල්ටීටීඊ සීමාවන් ලිහිල් කිරීම පාලනයන් තොර වීමක් නොවී ය. ප්‍රශ්න කිරීම්, වාහන පරීක්ෂා කිරීම් හා ඇතැම් විට වාර්තා වූ පරිදි හිරිහැර කිරීමට සමාන ක්‍රියා විශේෂයෙන්ම ශ්‍රී ලංකා හමුදාව විසින් කරන ලද ක්‍රියාවන් ඇති කරමින් පාර්ශව දෙකම ඇතුල් වීමේ හා පිටවීමේ මුර පොළවල් පවත්වා ගෙන යාම අඛණ්ඩවම කර ගෙන යනු ලැබීය.

897. කෙසේ වුව ද 2006 දී සටන් විරාම ගිවිසුම බිඳ වැටීමත් සමග එල්ටීටීඊය කලින් ක්‍රියාත්මක කල එහි තනි ඇතුල් වීමේ හා පිටවීමේ ගමන් බලපත්‍ර ක්‍රමය නැවත හඳුන්වා දුන්නේ ය.[952] කලින් අවරුදුවල පරිද්දෙන්ම එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල වාසය කරන ඕනෑම අයෙක් ආණ්ඩුව-පාලිත ප්‍රදේශවලට යාමට අපේක්ෂා කරන්නේ නම් එල්ටීටීඊයෙන් ලිඛිත අවසරය

---

950 සාමාන්‍යයෙන් බලන්න ජී.එෆ්, බයෙෆ්ස්කි හා ෆිට්ස්පැට්‍රික් (සංස්කාරකවරු) මානව හිමිකම් හා බලහත්කාර අතුරුදහන් කිරීම්, තුන්වන සංස්කරණය, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, ඔක්ස්ෆර්ඩ්, 2007 (Brill/Nijhoff,2001,G.S Goodwin-Gill and J.McAdam, The Refugee in Interítioíl Äw, 3rd edn, Oxford University Press, Oxford 2007 )

951 Trapped and Mistreated, LTTE Abuse against Civillians in the Vanni, හියුමන් රයිට්ස් වොච්, 2008 දෙසැම්බර් ,

952 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ලබාගත යුතුව තිබිණ. ගමන් බලපත්‍රය එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පිටත සංචාරය කරන්නාට සිටිය හැකි කාලයේ සීමාව දක්වා තිබුණි.[953]

898. එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල වාසය කරන පුද්ගලයින්ට ගමන් බලපත්‍රයට ස්වයංක්‍රීය අයිතියක් නොතිබුණි. බලපත්‍රය තනි ගමනක් සඳහා වූ අතර එකක් ලබා ගත හැක්කේ කවරකුට ද යන්න පිළිබඳ සීමා තිබිණ. අවසර පත්‍රයක් ලබා ගැනීමේ පූර්ව අවශ්‍යතාවක් වූයේ සංචාරය කරන්නාට සංචාරය කරන්නා ආපසු ඒම සම්බන්ධයෙන් වගකියන ඇපකරුවෙකු වශයෙන් පවුලේ සාමාජිකයෙකු නම් කළ යුතුව තිබීම ය. එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට ගමන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) බලපත්‍ර නිකුත් කරන විට ද ඇතුළුව එල්ටීටීඊය විසින් මේ සීමා කිරීම දැඩි ලෙස ක්‍රියාත්මක කරනු ලැබීය.[954]

899. ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ හා සංචාරය කරන්නා වන්නියට ආපසු පැමිණීමට අසමත් වූ අවස්ථාවක දී නම් කරන ලද පවුල් සාමාජිකයා එල්ටීටීඊය විසින් දඬුවම් කිරීමේ අවදානමට ලක් විය හැකි ය.

900. ගමන් බලපත්‍ර ක්‍රමය ප්‍රතිඵලදායී ලෙස සිවිල් ජනයා එල්ටීටීඊයේ පාලනයට දැඩිව බැඳ දමන ලද අතර එල්ටීටීඊ ප්‍රදේශය හැර යන පුද්ගලයින් ආපසු පැමිණෙනු ඇති බව සහතික කළේ ය. නිදසුන් ලෙස ජනයා වන්නියෙන් පිටත දිගු කාල සීමාවන් රැඳී සිටියහොත් එල්ටීටීඊයේ කටයුතු පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට ඔවුන්ට ආණ්ඩුවේ පීඩනයට පාත්‍ර වීමේ අවදානමට මුහුණ දෙන්නට සිදු වනු ඇතැයි යන විශ්වාසයක් වූයේ ය.[955] තමන් ජනතාව උදෙසා කරනවා යයි කියා සිටින පිළිබඳ විශ්වසනීයභාවය හෝ සුජාතභාවය ජනතාව වන්නිය හැර ගියොත් නැති වෙනු ඇතැයි එල්ටීටීඊ කාඩර්වරුන් නිතරම වාගේ පැවසූ බව සාක්ෂිකරුවෝ ගණනාවක් කියා සිටියහ.[956] සෑම දමිළයෙකුටම එල්ටීටීඊයේ අරගලයට සහය දීමේ සදචාරමය බැඳීමක් තිබුණාය යන්න එල්ටීටීඊයේ මතය විය. එහෙයින් ඔවුන්ට හැර යා නොහැකි ය.[957]

901. එල්ටීටීඊයේ ගමන් බලපත්‍ර ක්‍රමය එක්කෝ යුද කටයුතු සඳහා නැතහොත් එල්ටීටීඊයේ යුද ආරක්ෂක ඉදි කිරීම් (වැඩි වශයෙන්ම පස් බැම් හා අගල්) ඇතුළු බලහත්කාර ශ්‍රමය සඳහා පුද්ගලයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම ඇතුළු එහි බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සමග සමීපව බැඳී තිබුණි.[958] ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කරන විට පවුලේ සාමාජිකයෙකු ඒ වනවිටත් බඳවා ගෙන තිබෙන්නේ යයි සහතික කරන එල්ටීටීඊයේ දේශපාලන අංශය විසින් නිකුත් කරන

---

953 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

954 S.S v Netherlands, Communication No. 191/2001,U.N.Doc.CAT/C/30/D/191/2001 (2003), 1996 පැමිණිලිකරුට ඔහුගේ මියගිය මවට ගෞරවාචාර කිරීම සඳහා ත්‍රිකුණාමලයට වුවමනා විය, එහෙත ඔහුවෙනුවෙන් සහතික කරන්නට කිසිවෙකු නොසිටි නිසා එල්ටීටීඊය විසින් ගමන් අවසර පත්‍රයක් දීම ප්‍රතික්ෂේප කරනු ලැබීය.

955 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

956 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

957 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

958 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ලද සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය කරනු ඇත.[959] එල්ටීටීඊයට බැඳවීමක් ලබා දී නැති පවුල්වලට ගමන් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කෙරිණ.[960]

902. එල්ටීටීඊයට බඳවාගත හැකියවුන්ගේ විශාල සංචිතයක් අවශ්‍යව තිබූ හෙයින් ක්‍රියාකාරී සේවය සඳහා සුදුසු යයි සලකන ලද තරුණ ජනයා විමර්ශන කමිටුව (OISL) විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලද එක් තරුණියකගේ සිද්ධියේ දී මෙන් ඉවත්ව යාමට අවසර නොදීමේ අවදානමට මුහුණ පෑහ. එම තරුණයා 2006 දී ඉවත්ව යාමෙන් වළක්වන ලද අතර පසුව ඇය පලා යාමට සමත් වූවා ය.[961]

903. එක මූලාශ්‍රයකට අනුව එල්ටීටීඊයට ඉඩම් හෝ වෙනත් මූල්‍ය හෝ ද්‍රව්‍යමය හෝ ආධාර සපයන ලද පවුල් ඇතැම් විට පවුල් සාමාජිකයෙකු ''ස්වෙච්ඡාවෙන් බැඳීමෙන්'' නිදහස් කරනු ලැබ ඇති අතර සාමාන්‍යයෙන් එල්ටීටීඊ ප්‍රදේශය හැර යාමේ අවසරය ප්‍රදානය කෙරී ඇත.[962] හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch) වාර්තාවකට අනුව ස්ථිර වශයෙන් ප්‍රදේශය හැර යාමට පවුල් ඉඩම ඇතුළු ඔවුන්ගේ සියලු දේපොළ එල්ටීටීඊයට භාර දිය යුතුව තිබිණ.[963]

904. 2008 දී ගැටුම උත්සන්න වූ විට ගමන් බලපත්‍ර ක්‍රමය වන්නියේ දී ලබා ගත නොහැකි ප්‍රතිකාර සඳහා වෛද්‍යවරයෙකු විසින් යොමු කරනු ලබන හදිසි රෝගියෙකු සඳහා හැර තව දුරටත් නිකුත් නොකෙරුණු මට්ටමට වඩ වඩාත් සීමා කිරීමේ තත්ත්වයක් ඇති විය. විශ්වසනීය මූලාශ්‍රයකට අනුව එල්ටීටීඊය වෛද්‍ය යොමු කිරීම් ක්‍රියාවලිය මත පවා යම් පාලනයක් ක්‍රියාත්මක කර තිබේ.[964] එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පිටත ප්‍රතිකාර සඳහා වෛද්‍යවරුන් විසින් යොමු කරන ලද පුද්ගලයින්ගේ පෞද්ගලික විස්තර හා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ හා සැබෑ බවට සහතික කිරීමේ වගකීම ගමන් බලපත්‍ර එල්ටීටීඊ කාඩර්වරුන්ට පවරා තිබිණ.

905. එමනිසා උතුරේ යුද මෙහෙයුම් උත්සන්න වන්නට පටන් ගත් විට 2008 අවසානය වන විට දී වන්නියේ සිවිල් වැසියෝ ඒ වන විටත් ගමන් බිමන්වල බරපතල පාලනයන් හා සීමා කිරීම් ඉවසා දරා ගනිමින් සිටියෝ ය. ඔවුන්ට උවමනා වුවත් නැතත් එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශවල නැවතී සිටිනවා හැර වෙනත් විකල්පයක් නොතිබුණි.

**යාම් ඊම් සීමා කිරීමේ බලහත්කාර පියවර හඳුන්වා දීම- 2009**

906. 2009 මුල වන විට එල්ටීටීඊයට ක්‍රමක්‍රමයෙන් පදනම අහිමි වෙන්නට වූ විට, ගැටුම උත්සන්න වූ විට හා ශ්‍රී ලංකා හමුදාවේ ඉදිරි ගමන සමග ජනතාව ඉවත්ව යාම වඩ වඩාත් ඉවක් බවක් නැති තත්ත්වයට පත් වූ විට ජනතාව ඉවත්ව යෑමෙන් වැළක් වීමේ පියවර එන්ට

959 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
960 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
961 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
962 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
963 Trapped and Mistreated, LTTE Abuse against Civillians in the Vanni, හියුමන් රයිට්ස් වොච්, 2008 දෙසැම්බර්
964 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

එන්ටම හිංසාකාරී බවට පත් වූයේ ය. විමර්ශන කමිටුවට (OISL) ලැබුණු බොහෝ ප්‍රකාශවලින් 2009 මුල බොහෝ සෙයින් ම ජනවාරිවල සිවිල් ජනයා ඉවත්ව යාමට උත්සාහ කළහොත් ඔවුන් සියලු දෙනාම ඉවත්ව යාමෙන් වැළක්වීමට එල්ටීටීඊ නායකත්වය විසින් ගත් තීරණයක් තිබූ බව පැහැදිලිව මතු විය.[965] ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමට එල්ටීටීඊයේ යුද අංශයට උපදෙස් දී තිබුණි.[966] ඇතැම් මූලාශ්‍ර පැවසුවේ පැනයන්නවුන් ආපසු ඒම ප්‍රතික්ෂේප කරන්නේ නම් බිමට වෙඩි තබන්නට ද ඔවුන් පසුබැසීම තවමත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් අණදෙන්නන්ගෙන් උපදෙස් පතන්නට ද යුද කාඩර්වරුන්ට උපදෙස් දී තිබුණ බව ය.[967]

907. ඉවත්ව යන්නට උත්සාහ දරන්නවුන්ට කෙලින්ම වෙඩි තබන්නට ජ්‍යෙෂ්ඨ නායකත්වය උපදෙස් දී තිබුණා ද යන්න පිළිබඳව විමර්ශන කමිටුවට (OISL) ලැබුණේ පරස්පර විරෝධී තොරතුරු ය. ඔවුන් ඉවත්ව යන්නට උත්සාහ කළහොත් ඔවුන්ට ඔවුන්ට වෙඩි තබන්නැයි ජ්‍යෙෂ්ඨ නායකයෙකු අණ දෙනු ඔවුන්ට ඇසුණු බව යටත් පිරිසෙයින් එක් මූලාශ්‍රයක් පැවසීය. අනෙක් අතට එක් මූලාශ්‍රයක් කියා සිටියේ විමර්ශන කමිටුවට (OISL) මෙය තහවුරු කළ නොහැකි වුව ද එවැනි වෙඩි තැබීමේ සිද්ධයක් ඇති වූ විට ඊට වගකිව යුතු වූ අයට එල්ටීටීඊ නායකයින් විසින් දඬුවම් කර තිබුණ බව ය.[968] එහෙයින් විමර්ශන කමිටුවට (OISL) පහතින් වාර්තා වී තිබෙන ඝාතන එල්ටීටීඊයේ නිල ප්‍රතිපත්තියේ කොටසක් වූයේ ද නැතහොත් තනි තනි කාඩර්වරුන්ගේ ක්‍රියාවන් වූයේ ද යන්න තහවුරු කළ නොහැකි ය.

908. ජාත්‍යන්තර ප්‍රජාව ඔවුන්ව ආරක්ෂා කිරීමට මැදිහත්වනු ඇති හෙයින් ඔවුන්ට ඉවත් විය නොහැකි යයි එල්ටීටීඊය සිවිල් ජනයාට පැවසූ බව සාක්ෂිකරුවෝ සඳහන් කළහ. ඇතැම් මූලාශ්‍ර කියා සිටින්නේ සිවිල් වැසියන්ට ඉවත්ව යාමට ඉඩ නොදීමට හේතුව වූයේ ඇතැම් එල්ටීටීඊ නායකයින් ශ්‍රී ලංකා හමුදාව ඉදිරියට එන විට සිදුවන ඉහළ සිවිල් ජන මරණ ජාත්‍යන්තර ප්‍රජාවේ මැදිහත්වීමට පොළඹවනු ඇතැයි විශ්වාස කිරීම බව ය.[969]

909. ලබා ගත හැකි තොරතුරු යෝජනා කරන්නේ එල්ටීටීඊය මුර පොළවල් හා රැකවල් ස්ථාන පිහිටුවීම ඇතුළු එය පාලනය කරන ලද ප්‍රදේශවලින් ජනතාව ඉවත්ව යාම වැළක්වීමේ ශාරීරිකමය පියවර ක්‍රියාවට නැංවූ බව ය. එල්ටීටීඊයේ ජංගම මුර සංචාරක ඒකක සමග එක්ව මෙම පිහිටැවුම් ආණ්ඩුවේ පාලිත-ප්‍රදේශවලට පැන යාමට උත්සාහ කරන සිවිල් ජනයා වළක්වනු දකින්නට තිබිණ.

910. ඔවුන්ට පසු බැසීමට බල කරමින් ගැටුම් ප්‍රදේශය හැර යාමට උත්සාහ කරන විට එල්ටීටීඊ කාඩර්වරුන් ඔවුන්ගේ මාර්ගය අවහිර කළේ කෙසේ දැ යි සාක්ෂිකරුවෝ විස්තර කළහ. ඇතමුන්ට තර්ජනය කළ බවට හා බිය ගැන්වීමට භාජනය කළ බවට චෝදනා තිබිණ. ඇතම් අවස්ථාවල ජනතාවට පහර දෙනු ලැබිණ. ඉන් අනතුරුව එල්ටීටීඊය විසින් එහි ඉදිරි පෙරමුණු පිහිටැවුම් දිගේ අගල් ඉදි කිරීම වැනි යුද කටයුතුවලට සහභාගි කර ගැනීමට ඇතැම් අය

---

965 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
966 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
967 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
968 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
969 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

බලහත්කාරයෙන් බඳවා ගනු ලැබ තිබිණ.[970] ප්‍රතිහිංසන බිය බොහෝ විට බොහෝ දෙනා ඉවත්ව යාම වැළක්වීමට ප්‍රමාණවත් විය.[971]

911. 2009 පෙබරවාරි 9 වෙනි දින සෙබළුන් ගණනාවක් හා ළමයෙකු ඇතුළුව යටත් පිරිසෙයින් සිවිල් වැසියන් අට දෙනෙකු මරුමුවට පත් කරමින් මරාගෙන මැරෙණ බෝම්බකාරිනියක් මුලතිව් දිස්ත්‍රික්කයේ විශ්වමඩුවල පිහිටුවා තිබුණු අභ්‍යන්තර අවතැන් වූවන් ලියා පදිංචි කරන ස්ථානයකට පැන බෝම්බයක් පුපුරුවා ගෙන මිය ගියා ය. ඒ කාලයේ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශකයා ප්‍රකාශ කළේ ''එක්සත් ජාතීන් අහිංසක සිවිල් වැසියන් විශේෂයෙන්ම සටන නිසා පලා යන්නවුන් මරුමුවට පත් කරන ලද හා අනතුරට පත් කරන ලද ප්‍රහාරය හෙළා දකියි'' කියා ය.

912. ආණ්ඩුව කියා සිටියේ එල්ටීටීඊය සියලුම සිවිල් වැසියන් ''ප්‍රාණ ඇපකරුවන් වශයෙන් තබා ගනු ලැබ'' හෝ ''මිනිස් පලිහවල්'' වශයෙන් යොදා ගනු ලැබ සිටි බවත් තම අරමුණ වූයේ ඔවුන් නිදහස් කර ගැනීම බවත් ය. ඇතැම් සාක්ෂිකරුවන් විමර්ශන කමිටුවට (OISL) කියා සිටියේ ඔවුන් එල්ටීටීඊය සමග ගියේ එල්ටීටීඊය සාර්ථක ලෙස ශ්‍රී ලංකා හමුදාවට මුහුණ දෙනු ඇතැයි හා සටන් විරාමයක් ප්‍රකාශ කරනු ඇතැයි හෝ ජාත්‍යන්තර ප්‍රජාව මැදිහත් වීමක් කරනු ඇතැයි කියා ඔවුන් විශ්වාස කළ නිසා බව ය. එල්ටීටීඊය සටන් කළේ දමිළ ජනතාව වෙනුවෙන් යයි ඔවුන් විශ්වාස කළ නිසා ඔවුන්ව අනුගමනය කිරීමේ සදාචාරමය බැඳීමක් පිළිබඳ හැඟීමක් තිබූ බව ඇතැමෙක් කියා සිටියහ.

913. එසේම ඉදිරි පෙරමුණු පිහිටැවුම් හරහා පනින්නට උත්සාහ කරන අතරතුර දෙපාර්ශවයේ වෙඩි හුවමාරුකර ගැනීම්වලට අසුවේ යයි බිය වූ නිසා ඔවුන් එල්ටීටීඊ ප්‍රදේශවල රැඳී සිටි බව ද සාක්ෂිකරුවෝ ගණනාවක් කියා සිටියහ. ''එල්ටීටීඊය ජනතාව වන්නිය හැර යාම හා සටන් කරන්නන් අතර ඉදිර ආරක්ෂක වළලු පනින්නට උත්සාහ කිරීමේ අන්තරායන් (බොහෝ විට බිම් බෝම්බ) යන දෙකේ එකතුවක් අතර අපි අසරණව හා සිරව සිටියෙමු''යි එක් සාක්ෂිකරුවෙකු පැවසීය.[972] අනෙකුත් අය කියා සිටියේ ඔවුන්ට එල්ටීටීඊය සමග පවුල් සාමාජිකයෙකු හෝ ඥාතියෙකු -බලහත්කාරයෙන් බඳවා ගත් අය ඇතුළුව සිටි හෙයින් ඔවුන්ට එල්ටීටීඊ ප්‍රදේශ හැර දමා යා නොහැකි යයි ඔවුන් සිතූ බව ය. තවත් ඇතැම් කිහිප දෙනෙක් ඔවුන්ට බොහෝ වයස්ගත හෝ අසනීප හෝ තුවාල වූ ඥාතීන් සිටි නිසා ප්‍රදේශය හැර යා නොහැකි වූ බවත් එමනිසා වන්නියේ රැඳී සිටීමට තීරණය කළ බවත් කියා සිටියහ.

914. එසේම බොහෝ දෙනෙක් ඔවුන් අනෙක් පැත්තට ගියහොත් ශ්‍රී ලංකා හමුදාව විසින් කරනු ලබනු ඇති හිරිහැර හා අපයෝජනයන්ට බිය වූහ.[973] ඇතැම් සාක්ෂිකරුවෝ ශ්‍රී ලංකා හමුදාව විසින් කරනු ලබන ලිංගික හිරිහැරයට හා අපයෝජනයට, එල්ටීටීඊ ආධාරකරුවන් යයි බොරුවට චෝදනා කරනු ලැබීමට හෝ තේරුම් ගනු ලැබීමට හෝ ''සුදු වෑන්වලින් පැහැර ගෙන යනු ලැබීමට'' හා අතුරුදහන් කරනු ලැබීමට ද බිය වූහ. ආණ්ඩුව පාලනය කළ

970 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
971 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
972 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
973 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල දී ඔවුන් භාජනය කරනු ඇති සෝදිසි කිරීමේ ක්‍රියාවලියට අදාළව අත්අඩංගුවට ගැනීම හා අනතුරුව නිදහස අහිමි කිරීම පිළිබඳව සමහරු කියා සිටියහ.

915. එසේ වුව ද ලබා ගත හැකි තොරතුරුවලින් ඉදිරිපත් වන්නේ මෙම බිය එසේම වන්නිය අත්හැර යාම වැළක්වීම සඳහා ජනතාව අධෛර්යයට පත් කිරීමේ මාර්ගයක් ලෙස එල්ටීටීඊය විසින් උපක්‍රමිකව ඇති කරන ලද්දක් ද බව ය. එල්ටීටීඊය ශ්‍රී ලංකා හමුදාව විසින් කරගෙන යනු ලබන අපයෝජනයන් පිළිබඳව ජනතාවට අනතුරු හැඟවීමේ රැස්වීම් පැවැත්වීය.[974] වාර්තාවන පරිදි එල්ටීටීඊ නායකයින් 2009 අප්‍රේල්වල පවත්වන ලද රැස්වීමක දී ස්ත්‍රීන් දූෂණය කරනු ලබනවාය යන බිය ජනතාව වන්නිය අත්හැර යාමෙන් වැළක්වීම සාධාරණීය කරනු සඳහා කාරණයක් ලෙස යොදා ගෙන තිබේ.[975]

916. සාක්ෂිකරුවන් ඉවත්වී යාමට ඔවුන් උත්සාහ දැරුවේ නම් එල්ටීටීඊයෙන් ලැබෙන දඬුවම පිළිබඳ බිය විස්තර කළ අතර මෙය ශ්‍රී ලංකා හමුදාව විසින් එල්ල කරනු ලැබූ මුළුමනින්ම නොනවතින ප්‍රහාරයන් යටතේ පැවති ප්‍රදේශයක නැවතී සිටීමට බල කරන ලද ඔවුන්ගේ අනවරත සන්ත්‍රාසීය ස්වභාවය උත්සන්න කළේ ය. කොටුවී සිටින ගමන් කාලතුවක්කු හා වෙඩි ප්‍රහාරවලට නිරාවරණය වීම තුළින් ඔවුන් අඛණ්ඩව පීඩා විඳි මානසික ක්ෂිතික හැඟීම සාක්ෂිකරුවෝ විමර්ශන කමිටුවට (OISL) කියා සිටියහ.[976]

917. විමර්ශන කමිටුවට (OISL) වාර්තා වූ වෙඩි තැබීමේ සිද්ධි බොහොමයක් අහසට හා බිමට වෙඩි තැබීමට සම්බන්ධ වූ ඒවා ය. වාර්තා වූ පරිදි අවස්ථා කිහිපයක දී එල්ටීටීඊයේ යුද කාඩර්වරුන් පැන යාමට උත්සාහ කළ සිවිල් වැසියන්ට කෙලින්ම වෙඩිතබා මරණ සිදු කර තිබේ. මේවායින් සමහර ඒවා වෙනතැන්වල වැදී ආ වෙඩි උණ්ඩවලින් ඇති වූ තුවාල ය (පහතින් බලන්න). විමර්ශන කමිටුවට (OISL) වාර්තා වූ බොහෝ සිදුවීම් සිදු වී තිබෙන්නේ 2009 මාර්තුවල හා ස්වල්පයක් අප්‍රේල්වල ය.

918. ඉහළ සිවිල් වැසි මරණ ඇති කරමින් නොනවත්වාම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙමින් පැවැති ප්‍රදේශයක රැඳී සිටීමට දස දහස් ගණන් සිවිල් වැසියන්ට බල කිරීමේ මේ ප්‍රතිපත්තිය නොසලකා හා තර්ජන හා හිංසාකාරී මාධ්‍ය ඔස්සේ ජනතාව ප්‍රදේශය හැර යාම වැළක්වීමට එල්ටීටීඊය විසින් දරණ ලද උත්සාහයන් නොතකා බොහෝ දෙනෙක් එසේ කිරීමට උත්සාහ කළහ. ගැටුමේ අවසාන සති කිහිපය තුළ තියුණු ෂෙල් ප්‍රහාර හා වෙඩි තැබීම්, බලහත්කාර බඳවා ගැනීම්, ආහාර, ජලය හා සනීපාරක්ෂක පහසුකම් නැතිකමේ හේතුවෙන් බොහෝ සිවිල් වැසියන් මෙන්ම ඇතැම් කාඩර්වරුන් ද පලා යාමට දරුණු ලෙස උත්සුක වූ බව ද වෙඩි හුවමාරුවලට ගොදුරුවීමට හෝ එල්ටීටීඊයේ ප්‍රතිහිංසනයන්ට භාජනය වීමට සූදානම් වූ බව ද සමහර සාක්ෂි ගෙන හැර දක්වයි.

---

974 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
975 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
976 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

919. එසේ කිරීමෙන් ඔවුන් ශ්‍රී ලංකා හමුදාව විසින් වෙඩි තබනු ලැබීමේ අවදානමට මුහුණ පෑවේ වුව ද ජනතාව පලා ගියේ ඔවුන් දැකිය නොහැකි විටක රාත්‍රි යේ දී ය.[977] අනෙකුත් අය ප්‍රදේශයේ ඔවුන් දත් එල්ටීටීඊ කාඩර්වරුන් සමග කතා කර එකඟත්වය ලබා ගනිමින් පලා ගියහ.[978] නිදසුන් ලෙස පෙබරවාරි 4 වෙනි දින කලින් අවසර නොදෙන ලද පවුල් 50 ක පමණ කණ්ඩායමකට ඔවුන් සමහරෙකු දැන සිටි ප්‍රදේශයේ එල්ටීටීඊ අණ දෙන්නකුගෙන් අවසානයේ දී ඉවත්ව යාමේ අවසරය ලබා ගත හැකි විය. දෙපාර්ශවයේම වෙඩි තැබීම් නොතකා කෝටුවක බැඳි සුදු කොඩි ඔසවා ගෙන ඔවුහු කලපුව තරණය කළහ.[979] අප්‍රේල් 20 වෙනි දින ආණ්ඩුවේ හමුදා එල්ටීටීඊයේ ආරක්ෂක වළලු බිඳ දමන විට 100,000 ක් පමණ පලා ගොස් තිබිණ.

920. වාර්තාවලට අනුව මැයි 14 වෙනි දින එල්ටීටීඊ නායක ප්‍රභාකරන් ජනතාවට ඉවත්ව යාමේ නිදහස තිබෙන බවට හා එල්ටීටීඊය විසින් ඔවුන් නවත්වන්නේ නැති බවට නියෝග දුන් අතර ඒවා ජනතාවට දැන ගැනීමට සලස්වනු ලැබිණ.[980] ඉන්පසු දස දහස් ගණන් දෙනා ආණ්ඩුව-පාලිත ප්‍රදේශ වෙත පැමිණියහ.

**වන්නි හැර යාමට උත්සාහ කිරීම පිළිබඳ විශේෂිත ප්‍රතිහිංසන සිද්ධීන්**

921. මූලාශ්‍ර ගණනාවක්ම විමර්ශන කමිටුවට (OISL) පැවසුවේ සිවිල් ජනයා ප්‍රදේශය හැර යාමට උත්සාහ කළ විට ජනතාවට වෙඩි තැබූ බව හෝ වෙඩි තබන බව ඔවුන්ට ඇසුණු බව ය. කමිටුවට (OISL) සිවිල් වැසියන් මරා දමන ලද බව කියන සිද්ධි කිහිපයක් පිළිබඳ චෝදනා ඇතුළු විශේෂිත සිද්ධි ගණනාවක් පිළිබඳ තොරතුරු වෙනත් මාර්ගවලින් ලැබිණ. එක් අවිශේෂ වූ දිනයක මධ්‍යම රාත්‍රියෙහි ඔවුන් 40 හෝ 50 ක් වෙනත් පිරිසක් සමග මානුෂීය සැපයුම් ගෙන එමින් තිබූ නැවකින් යාමට උත්සාහ දරා තිබේ. එහෙත් එල්ටීටීඊය දියෙහි මුර පොළවල් පිහිටුවා තිබුණ අතර ඔවුන් පසු කර යන්නට උත්සාහ කළොත් වෙඩි තබන බවට තර්ජනය කර තිබේ. ඔවුන් වෙනත් මාර්ගයක් ගැනීමට උත්සාහ කළ ද නැවතත් එල්ටීටීඊය විසින් ඔවුන් නවතා ඇත. ඔවුන්ගේ නිල ඇඳුම් නිසා සහ යෞවනයින් මෙන් පෙනුන නිසා ඔවුන් ඔවුන්ව අළුතෙන් බඳවා ගනු ලැබූවන් ලෙස හඳුනා ගෙන තිබේ. විස්තරයට අනුව කණ්ඩායමේ අයෙකු කාඩර්වරුන්ට කෑ ගසමින් ඔවුන්ට යන්නට දෙන්නැයි කී විට එක් කාඩර්වරයෙකු ඔහුගේ පපුවට මාරන්තික වෙඩි පහරක් එල්ල කර ඇත.[981] වාර්තාවන පරිදි පසුව කණ්ඩායම සන්නද්ධ යෞවනයින්ගේ කුඩා කණ්ඩයමක් විසින් වළක්වා ඇති අතර ඔවුන්ගේ කාර්යය සම්බන්ධයෙන් පැහැදිලිව සිත් පීඩාවට පත්ව ඇත. අවසානයේ දී ඔවුන් කණ්ඩායමට ඉදිරියට යන්නට ඉඩ දී තිබේ.

922. පෙබරවාරි 4 වෙනි දින උදයාර්කාදුවල දී ඇති වූ තවත් සිද්ධියක දී ළමයින් ද ඇතුළුව සිය ගණනක් කුඹුරක් හරහා ආණ්ඩුවේ පැත්තට යන්නට උත්සාහ කළ විට සන්නද්ධ එල්ටීටීඊ

[977] සිවිල් වැසියන් බොහෝවිට පැන යාමට උත්සාහ කළේ රාත්‍රිකාලයේ දී වුව ද කමිටුව දැක තිබෙන පත්‍රිකාවල නැවත නැවත් ඔවුන්ගෙන් ඉල්ලා තිබුණේ ඔවුන් දහවල් කාලයේ එසේ කළ යුතු බව ය.

[978] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[979] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[980] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[981] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

යුද කාඩර්වරුන් කණ්ඩායමක් විසින් නවතනු ලැබ තිබේ.[982] ජනයාට ආපසු යන්නැයි කීව ද ඔවුන් ඉදිරියට ගොස් තිබේ. වාර්තා වන පරිදි කාඩර්වරුන් අහසටත් අනතුරුව වැදී සෙනග දෙසට එල්ලවන සේ බිමටත් අනතුරු හැඟවීමේ වෙඩි තබා තිබේ. බිම වැදී ආ උණ්ඩ පුද්ගලයින් ගණනාවකගේ කකුල්වල වැදී තුවාල වූ බව හා ප්‍රතිඵලයක් වශයෙන් එක් පුද්ගලයෙකු මරුමුවට පත් වූ බව වාර්තා වී ඇත.[983] තවත් අවස්ථාවක දී වෙඩි උණ්ඩවලින් දණ හිසෙන් පහත තුවාල සිදුවූ සිද්ධියක් වාර්තා වී ඇත. වාර්තාවන පරිදි එය සිදුව ඇත්තේ අප්‍රේල්වලදී මිනිසුන් දෙදෙනෙක් පැන යන්නට උත්සාහ කළ අවස්ථාවේ ඔවුන්ට වෙඩි තැබීමෙනි. තුවාල සිදු වූයේ කෙලින්ම එල්ල කරන ලද වෙඩි පහරවලින් ද නැතහොත් බිම වැදී ආ වෙඩි උණ්ඩවලින් ද යන්න පැහැදිලි නැත.[984]

923. මාර්තුවල වාර්තා වී ඇති අනෙක් සිද්ධිවලට අවුරුදු 12 ළමයෙකුට වෙඩි තැබීම හා තුවාල කිරීම ඇතුළත් ය. පැන යාම සඳහා කලපුව දෙසට යන විට ඇය සිටියේ ඇගේ දෙමාපියන් හා ඇගේ නැගණිය සමග ය. එල්ටීටීඊ කාඩර්වරුන් පැමිණ ගැහැණු ළමයාගේ කලවයට තුවාල කරමින් හා පවුලට වතුරට වැටෙන්න සලස්වමින් ඔවුන්ට වෙඩි තබා ඇත. පසුව එල්ටීටීඊය විසින් ඔවුන්ව වෙරළට ගෙනවිත් ගැහැණු ළමයාට ප්‍රතිකාර කිරීමට ගෙන ගොස් ඇත.[985] එක කාඩර්වරයෙකු සාක්ෂිකරුට කියා ඇත්තේ ජනතාව පැන යන්න උත්සාහ කරනවා නම් ඔවුන්ට වෙඩි තබන ලෙස තමන්ට නියෝග ලැබී තිබුණ බව යි.

924. මාර්තු 20 වෙනි දින හෝ ආසන්නයේ පමණ ඇති වූ තවත් සිද්ධියක දී වාර්තා වූ පරිදි කලින් රාත්‍රියේ දී පිරිසක් පැන යාමෙන් වැළක්වීමට එල්ටීටීඊය වෙඩි තැබූ විට යටත් පිරිසෙයින් ඉතා කුඩා ළමයෙකු මරුමුවට පත් වීමෙන් පසු දහස් ගණන් දෙනා වෙරළට එක්රැස් වී ඇත. පැන යන්නට උත්සාහ කිරීමේ දී තවත් අය ද මරණයට පත් වූ බව ඇතැම් වාර්තා දක්වයි. විරෝධය පාමින් සිටි ජනතාව මානුෂීය ආධාර බෙදා දීමට හා බලවත් ලෙස රෝගාතුර වූ රෝගීන් ඉවත් කර ගනීමට පැමිණ තිබුණ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නැවකට ඔවුන් රැගෙන යන මෙන් ඉල්ලා ඇත. එල්ටීටීඊය මේ ආකාරයට ජනතාවට සලකන්නේ යයි ඔවුන් කිසිදාක බලාපොරොත්තු නොවූ නිසා මෙම සිද්ධිවලින් පසු ජනතාව මහත් කම්පනයකට හා බලාපොරොත්තු කඩවීමකට පත් වූ බව සාක්ෂිකරුවෝ පැවසූහ.[986] අවසානයේ දී ජනකාය සිය ගණනක් එල්ටීටීඊ කාඩර්වරුන් විසින් විසුරුවා හරිනු ලැබිණ. වාර්තාවන පරිදි වෙරළේ ඇති වූ මෙම සිද්ධියට මැදිහත් වූවන් අතර එවකට එල්ටීටීඊයේ බඳවා ගැනීමේ අංශයේ ප්‍රධානියා වූ ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායක එලිලාන් ද සිට ඇත.

925. මාර්තුවෙහි වාර්තා වූ තවත් තවත් සිද්ධියක දී දාහක් තරම් වූ ජනකායක් කලපුව හරහා පැන යාමට උත්සාහ දරා ඇත. කෙසේ වුව ද එල්ටීටීඊය කලපුව අසල මුර පොළවල් පිහිටුවා තිබුණි. පැන යාමට උත්සාහ කළ සමහරුන්ට පොලුවලින් හා පීවීසී පයිප්ප බටවලින් පහර දී ඇත. වාර්තා වූ පරිදි පිරිමි බංකර ඉදි කිරීමට ගෙන ගොස් තිබේ. ආසන්න වශයෙන් අවුරුදු 14

---

982 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
983 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
984 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
985 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
986 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ක් පමණ වයසැති තරුණ අය ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වල සිත් පීඩා ඇති කරමින් බලහත්කාරයෙන් බඳවා ගනු ලැබ තිබුණි.[987]

926. ශ්‍රී ලංකා හමුදාව පුදුමාතලන් රෝහල අසන්නම වටාපිටාව ඇතුළු ප්‍රදේශවලට තියුණු ෂෙල් ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව අප්‍රේල් 22 වෙනි දින සිවිල් වැසියන් දහස් ගණනක් එල්ටීටීඊ-පාලිත ප්‍රදේශය හැර යාමට උත්සාහ දරූ අවස්ථාවේ ඇති වූ තවත් සිද්ධියක් සාක්ෂිකරුවෝ විස්තර කළහ. එක් සක්ෂිකරුවෙකුගේ සාක්ෂියට අනුව ජනතාවට පසුබසින්නට බල කරන ලද උත්සාහයක දී එල්ටීටීඊය ඔවුන්ට තර්ජනය කර ඔවුන් බිය ගැන්වීමට අහසට වෙඩි තබා ඇත.[988] පසුව එම රාත්‍රියේම ඔවුන් මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ හමුදාවේ පිහිටැවුම්වල සිට එල්ලවූ අඛණ්ඩ ෂෙල් හා වෙඩි ප්‍රහාර නොතකා එල්ටීටීඊ-පාලිත ප්‍රදේශයෙන් පලා යාමට සමත්ව ඇත. සාක්ෂිකරු සාක්ෂියට අනුව සටන් ප්‍රදේශවලින් පලා යාමට ඉවක් බවකින් තොර වූ ජනතාව නන්දිකඩාල් කලපුව දෙසට ඇවිද ගෙන යන්නට පටන් ගත්හ. ඇතැම්හු තුවාල හෝ අධික වෙහෙසට පත්වීම හේතු කොට ගෙන ඇවිද ගන්නට නොහැකි වූ ඔවුන්ගේ මිතුරන් හෝ ඥාතීන් ඔසවා ගෙන ගියහ. එල්ටීටීඊය මේ අවස්ථාවේ ඔවුන් නැවැත්වීමට උත්සාහ දරා නැති අතර ඇතැම් කාඩර්වරු ඔවුන්ට උදව් පවා ද කර ඇත. තහවරු නොකළ වාර්තා කියන්නේ ඒ අවස්ථාවේ එල්ටීටීඊ හමුදාව ස්ථානගත වී තිබුණු ප්‍රදේශය පැත්තේ සිට ප්‍රතිප්‍රහාරයක් එල්ල නොවූ නිසා පැන ඒමට උත්සාහ කළවුන්ගෙන් සමහරුන් ශ්‍රී ලංකා හමුදාව කළ වෙඩි තැබීම්වලින් මිය යන්ට ඇති බව ය.[989]

927. වාර්තා වූ පරිදි වෙනත් සිද්ධිවලදී තනි තනි පුද්ගලයින්ට, මාර්තු 18 වෙනි දින එක පුද්ගලයෙකුට පුද්ගලයින් 200 පමණ පිරිසක් සමග පැන යන්නට උත්සාහ කළ අවස්ථාව වැනි අවස්ථාවන්හි දී එල්ටීටීඊය විසින් පහර දෙන ලද බව වාර්තා විය. අවසානයේ දී කෝපයට පත් ජනතාව පාලනය කරන්නට එල්ටීටීඊය අසමත් වූ විට, ජනතාවට ප්‍රදේශය හැර යාමට හැකි විය. තවත් සාක්ෂිකාරියක් සිහිපත් කළේ ඇය පැන යන්නට තැත් කළ විට එල්ටීටීඊ කාඩර්වරුන් ඇයට පොල්ලකින් පහර දෙනු ලැබීම ය. එසේම ඇය අනෙක් අයට ද පහර දෙනු දැක තිබේ. එසේම සීමා පනින විට ශ්‍රී ලංකා හමුදාව විසින් වෙඩි තබනු ලැබීමේ අවදානමට ඔවුන් මුහුණ දුන්න ද ජනතාව එල්ටීටීඊ ප්‍රදේශ අත් හැර යාමට දක් වූයේ ඉවක් බවක් නැති අනලස් භාවයක් බව සාක්ෂිකරුවෝ පැවසූහ.

928. 2009 මාර්තු 14 දින පමණ පුදුක්කුඩියිරුප්පු අසල එක් සිද්ධියක දී වාර්තා වූ පරිදි එල්ටීටීඊය යුවළකට ඔවුන් ප්‍රදේශය හැර යාම වැළක්වීම සඳහා ශාරීරික වශයෙන් පහර දී ඇත.[990] දින කීපයකට පසු ඔහු පලා යාමට සමත් වුව ද ඇය විශ්වාස කරන්නේ එල්ටීටීඊය විසින් පිරිමියා එල්ටීටීඊයේ ඉදිරි පෙළ ආරක්ෂක පිහිටැවුම් අසල යුද කටයුතු සඳහා බලහත්කාරයෙන් ගෙන යන ලද බව ය.

---

987 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
988 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
989 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
990 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

**එල්ටීටීඊ ප්‍රදේශවල සිට ජාතික මානුෂීය කාර්ය ධරයින්ගේ හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ ගමන් පිළිබඳ සීමා පැනවීම්**

929. එසේම වන්නියේ සිට මානුෂීය වැඩවල නිරතව සිටි එක්සත් ජාතීන්ගේ හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල ජාතික කාර්ය මණ්ඩල ද 2006 ඒවා නැවත හඳුන්වා දුන් තැන් සිට වන්නියෙන් පිටවීමේ දී හා ඇතුල් වීමේ දී ගමන් බලපත්‍ර ලබා ගැනීමට බැඳී සිටියහ.[991] ඉදිරියේ දී දැකිය හැකි පරිදි මෙය ගැටුමේ අවසාන අදියරයන්හි දී ජාතික කාර්ය මණ්ඩලයට ගැටුම් කලාපයෙන් පිටත් වීම අවශ්‍ය වූ විට බොහෝ දෙනෙකුට පිට වීමට අවසර නොදුන් හෙයින් තීරණාත්මක ප්‍රශ්නයක් බවට පත් විය. කිලිනොච්චිය වැටෙන තෙක්ම එල්ටීටීඊ සම්බන්ධීකාරක නිලධාරියෙකු මානුෂීය නියෝජිතායතන සමග වැඩ කරමින් සිටි දේශීයයන්ගේ ගමන් බිමන් සඳහා වූ ගමන් බලපත්‍ර අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රධානියා වූයේ ය.[992] එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල සිට ආණ්ඩුව-පාලිත ප්‍රදේශවලට ජාතික කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් යනු ලබන ඕනෑම ගමනක දී එල්ටීටීඊ ගමන් බලපත්‍රයක් මෙන්ම ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමතියක් යන දෙකම අවශ්‍ය විය.[993]

930. ආණ්ඩුව ආරක්ෂක හේතූන් නිසා ජාත්‍යන්තර මානුෂවාදී නියෝජිතායතනයන්ට වන්නියෙන් ඉවත් වෙන්නැයි උපදෙස් දීමෙන් ටික කලකට පසු 2008 සැප්තැම්බරයේ දී එක්සත් ජාතීන් එහි ජාතික කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට ගමන් බල පත්‍ර ඉල්ලා සිටියේ ය. එල්ටීටීඊ දේශපාලන අංශ නායකයන් සමග කරන ලද ආනුෂංගික මැදිහත් වීමේ දී එක්සත් ජාතීන් ජාත්‍යන්තර නීතිය යටතේ සිවිල් ජනයාගේ යාම් ඊම්වල ආරක්ෂාව හා නිදහස තහවුරු කිරීමට එල්ටීටීඊය දී තිබෙන ප්‍රතිඥාවට අනුකූලව වැඩ කරන්නැයි ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ ය.[994] අවසානයේ දී ජාතික කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම නොව ස්වල්ප දෙනෙකුට ගමන් බලපත්‍ර ලබා දුන්න ද සියලුම යැපෙන්නන්ට ගමන් බලපත්‍ර දීම ප්‍රතික්ෂේප කෙරුණි.[995] [996] ආණ්ඩුව-පාලිත ප්‍රදේශවලට සිවිල් වැසියන්ට ඇතුළු වීමට ඔවුන් ඉඩ දුන්නේ නම් ජනතාව ආරක්ෂා කිරීමේ ඔවුන්ගේ බැඳීම හා වගකීම ඉටු කිරීමට ඔවුන් අසමත් වනු ඇති බව එල්ටීටීඊ නායකත්වය එක්සත් ජාතීන්ට පැවසීය.[997]

931. එක්සත් ජාතීන්ගේ (ප්‍රධාන වශයෙන් ජාතික) කාර්ය මණ්ඩලය හා යැපෙන්නන් කිලිනොච්චියේ සිට පුදුක්කුඩියිරුප්පුවල නැවත ස්ථානගත කිරීමෙන් ටික කලකට පසු 2009 ජනවාරියේ දී ඔවුන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට ඔවුන්ගේ යාම් ඊම්වලට අවසර දෙන ලෙස එල්ටීටීඊ නායකත්වයෙන් ඉල්ලා සිටීමේ උත්සාහයන් නැවත ගනු ලැබිණ. එල්ටීටීඊය නැවතත් ප්‍රතිෂේධාත්මකව ප්‍රතිචාර දැක්වීය. වාර්තා වූ පරිදි එල්ටීටීඊය කිසිදු ගමන් බලපත්‍රක් එක්සත්

---

991 ශ්‍රී ලංකාවේ ළමුන් හා සන්නද්ධ ගැටුම පිළිබඳව මහ කොමසාරිස්වරයාගේ වාර්තාව, S/2007/758, 2007 දෙසැම්බර් 21

992 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

993 වන්නියට යාමට අපේක්ෂා කරන ජාත්‍යන්තර මානුෂවාදී ක්‍රියාකාරකයෙකු එල්ටීටීඊ අවසර පත්‍රය ගැනීම අවශ්‍ය නොවූ අතර කළ යුතුව තිබුණේ එහි පාලන ප්‍රදේශවලට පැමිණීමේ දී හා පිටවීමේ දී ලියා පදිංචි වීම පමණි.

994 එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර සන්නිවේදනය, 2009 ජනවාරි 15, සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ OISL,

995 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

996 එල්ටීටීඊ පොලිස් අංශ ප්‍රධානි බී. නඩේසන් මහතා සමග එක්සත් ජාතීන්ගේ ලිපි හුවමාරුව 2008 අගෝස්තු 21, 2008 සැප්තැම්බර් 15, 2008 සැප්තැම්බර් 17, සැප්තැම්බර් 19, විමර්ශන කමිටුව වෙත තිබෙන ගොනුව

997 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩලයට හෝ ඔවුන්ගේ පවුල්වලට නිකුත් නොකරනු ඇති බව එක්සත් ජාතීන්ට පවසා ඇත.[998]

932. 2009 ජනවාරි 21 වෙනි දින 100 කට වැඩි එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩලික සාමාජිකයින් හා ඔවුන්ගෙන් යැපෙන්නන් පුදුක්කුඩියිරුප්පු සිට එක්සත් ජාතීන්ගේ මානුෂවාදී රථ චාරිකාවේ කොටසක් ලෙස (රථ චාරිකාව 11) වවුනියාව දක්වා ගමන් කරන්නට නියමිතව තිබූ රථ චාරිකාරිකාව පුදුක්කුඩියිරුප්පුවලින් පිටත් වීම එල්ටීටීඊය විසින් වළක්වනු ලැබී ය. සාක්ෂි විස්තරවලට අනුව රථ චාරිකාව ආසන්න වශයෙන් එක්සත් ජාතීන්ගේ ලොරි 50 කින් සමන්විත වූ අතර ඉන් හතක් ජාතික කාර්ය මණ්ඩලය හා ඔවුන්ගෙන් යැපෙන්නන් ගෙන යමින් තිබිණ. එක්සත් ජාතීන්ගේ සැපයුම් සේවා මධ්‍යස්ථානයේ සිට ආසන්න වශයෙන් මීටර 100 ක් පමණ දුරක දී එය පිටත් වූ ගමන්ම වාගේ එල්ටීටීඊ පොලීසිය විසින් රථ චාරිකාව නවතනු ලැබිණ. වාර්තා වූ පරිදි එල්ටීටීඊ පොලිසිය විශාල වශයෙන් ස්වයංක්‍රීය අවිවලින් සන්නද්ධව සිටි අතර ආර්පීජී ගිනි අවිවලින් සන්නද්ධ වූ එල්ටීටීඊ කාඩර්වරුන් පිරිවරා සිටියේ ය.[999]

933. ඇසින් දුටු සාක්ෂ විස්තරයකට[1000] අනුව එල්ටීටීඊ අණ දෙන්නකු මෙන්ම විශාල සංඛ්‍යාවක් කාඩර්වරුන් හා පොලීසිය ද එහි සිට ඇත. ඔවුන්ගෙන් කීප දෙනෙක් බර අවිවලින් හා සුළු අවිවලින් ද අනෙක් අය පොලුවලින් ද සන්නද්ධව සිටියහ.[1001] එල්ටීටීඊ පොලීසිය පොලුවලින් එක්සත් ජාතීන්ගේ වාහනවල පැතිවලට පහර දෙන්නට ද කාර්ය මණ්ඩලය හා ඔවුන්ගෙන් යැපෙන්නන්-ප්‍රධාන වශයෙන් ස්ත්‍රීන් හා ළමුන් අතර භීතිය ඇති කරමින් ඇතුලේ ඉන්නවුන්ට එළියට බසින්නැයි කෑගසන්නට ද පටන් ගත්හ. ඇතැම් එල්ටීටීඊ පොලිස් පිරිස් ඔවුන් වාහනවලින් බලෙන් බැස්සවීමට උත්සාහ කළහ. කාඩර්වරු හා විරෝධකරුවන්ගේ කණ්ඩායමක් වටේ රැස්වී තමන්ගේම පිරිසක් මරා දමා තිබෙන අතරතුර වන්නිය හැර දමා යාමට උත්සාහ කරමින් සිටියවුන් ද්‍රෝහීන් වී ඇතැයි ඔවුන්ට ආක්‍රමණශීලීව චෝදනා කළහ.[1002]

934. එක්සත් ජාතීන් ජාතික කාර්ය මණ්ඩලය සඳහා පිවිසුමක් කතිකා කර ගැනීමට අසමත් වූ අතර රථ චාරිකාවට ආපසු පුදුක්කුඩියිරුප්පු එක්සත් ජාතීන්ගේ කඳවුරට ආපසු යන්නට සිදුව තිබුණි. ඔවුන් ආපසු පැමිණීමේ දී එල්ටීටීඊ කාඩර්වරු හා පොලීසිය එක්සත් ජාතීන්ගේ කඳවුර තුළ වූහ. ඇතැම් කාර්ය මාණ්ඩලිකයන් හා යැපෙන්නන් ඉවත්ව යාමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා බවට තර්ජනය කළ අතර අනෙක් කාඩර්වරු ඔවුන්ව වීඩියෝ ගත කිරීමට පටන් ගත්හ. එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය අවසානයේ දී එල්ටීටීඊය අංගනයෙන් පිටත් කරවීමට සමත් විය. කෙසේ වුව ද එල්ටීටීඊය එක්සත් ජාතීන් විසින් එහි ජාතික කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට වන්නිය හැර යන්නට අවසර දෙන්නැයි කරන ලද ඉල්ලීම් දිගටම ප්‍රතික්ෂේප කළේ ය. අවසානයේ දී ඔවුන්ගෙන් ගණනාවක් ගැටුම අවසාන වීමට පෙර පලා යාමට සමත් වූහ.[1003]

---

998 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
999 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1000 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1001 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1002 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1003 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

## XV. මානුෂීය සහාය ප්‍රතික්ෂේප කිරීම

### හැඳින්වීම

935. භූමි ප්‍රදේශය එල්ටීටීඊය විසින් පාලනය කරනු ලැබුව ද ආණ්ඩුව වසර බොහෝ ගණනක් ආණ්ඩුවේ දිසාපතිවරුන් හරහා එම ප්‍රදේශවල අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි සේවාවන් සැපයීය. එසේම එය යුද්ධයෙන් විපතට පත් අවතැන් වූ හා සුනාමියෙන් විපතට පත් ජනතාවන්ට මානුෂීය සහාය ද සැපයීය. එම සහාය එක්සත් ජාතීන් හා අනෙකුත් ජාත්‍යන්තර මානුෂවාදී සංවිධාන විසින් ද සපයනු ලැබී ය. කෙසේ වුව ද මෙම සංවිධාන විසින් සපයන ලද මානුෂ සහාය ප්‍රතිපාදනය ගැටුමේ අවසාන අදියරට පෙර අවුරුදුවල පවා ඒවායේ ප්‍රවේශය හා ඇතැම් භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ සීමාවන් සමග නිතරම වාගේ අභියෝගාත්මක විය. මානුෂවාදී සේවකයින් එල්ටීටීඊය සමග සම්බන්ධකම් ඇතැයි ආණ්ඩුව විසින් නිතරම වාගේ සැකයට භාජනය කරනු ලැබිණ. නැතහොත් චෝදනා කරනු ලැබිණ.[1004] ප්‍රතිඵල වශයෙන් උල්ලංඝනයන්ගෙන් හා පරිභාසයන්ගෙන් පීඩාවට පත් කෙරිණ.

936. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම එහි අවසාන වාර්තාවේ දී ''එය හමුවේ පැවති තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව කොමිසම ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර ප්‍රජාව විශේෂයෙන්ම ඉහත සඳහන් කරන ලද ආයතන මෙන්ම සිවිල් සමාජ කණ්ඩායම් සමග පැවති සහයෝගය ඇතිව සහයෝගයේ හා සහයෝගිතාවේ ජීව ගුණයකින් යුතුව පවතින අතිමහත් සැපයුම් දුෂ්කරතාවන් නොතකා කොටුවී සිටින සිවිල් වැසියන් සියලු දෙනාටම ආහාර හා වෛද්‍ය සැපයුම් ද අනෙකුත් අත්‍යාවශ්‍ය දේවල් ද ලබා දීමට හැකි සියලු පියවර ගත යුතු ය යන මතය දරයි'' යනුවෙන් නිගමනය කළේ ය (9.19 හා 9.20 ඡේද).

937. කෙසේ වුව ද මෙම පරිච්ඡේදය ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශය තුළට නොනැවතී ඉදිරියට යන විට ගැටුමේ අවසාන මාස කිහිපය තුළ මානුෂීය සහාය සැපයීමෙහි දී මානුෂවාදී සංවිධාන මුහුණ දුන් වැඩි වෙමින් පැවති බාධක විස්තර කරයි. 2008 සැප්තැම්බර්වල දී මානුෂීය ක්‍රියාකාරකයින්ට, ඔවුන්ගෙන් බොහොමයකට මධ්‍යස්ථානයක්ව තිබුණ කිලිනොච්චිය හැර යන්නට බල කරනු ලැබිණ. එතැන් පටන් මානුෂවාදී ආධාර බෙදා හැරීම එන්ට එන්ටම අසීරු බවට පත් වූවා පමණක් නොවේ බෙදා දීම සඳහා බලය දෙන ලද සැපයුම්වල ප්‍රමාණය හා ස්වභාවය සිවිල් ජනතාව සඳහා ප්‍රමාණවත් ආහාර, ජලය, සනීපාරක්ෂාව හා ජීවිතාරක්ෂක සෞඛ්‍ය සත්කාරය පිළිබඳ මූලික අවශ්‍යතා පවා සපුරාලූයේ නැති අතර එය අතිශය හානිකර බලපෑමක් ද ඇති කළේ ය.

938. මානුෂවාදී සහන හා සම්බන්ධ ජාත්‍යන්තර නීතිය අදාළව ගත් කල විමර්ශන කමිටුව (OISL) මානව හිමිකම්, ඒවා අතර යෝග්‍ය ජීවන තත්ත්වයකට (ප්‍රමාණවත් ආහාර, ජලය හා නිවාස වැනි අත්‍යවශ්‍ය යැපුම් අයිතීන් ඇතුළු), අධ්‍යාපනයට හා ශාරීරික හා මානසික සෞඛ්‍යයට ඇති අයිතීන් සන්නද්ධ ගැටුමේ කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු බව සිහිපත් කරයි. මානව හිමිකම් නීතිය යටතේ වගකීම්-උසුලන්නන්ට යටත් පිරිසෙයින් මෙම

---

[1004] රහස්‍ය රාජ්‍ය නොවන සංවිධාන ඉදිරිපත් කිරීමක්

අයිතීන්ගේ අවම අත්‍යවශ්‍ය මට්ටමවත්[1005] එනම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, අත්‍යවශ්‍ය මූලික සෞඛ්‍ය සත්කාරය, මූලික ඉඳුම් හිටුම් හා නිවාස මෙන්ම අධ්‍යාපනයේ ඉතාමත්ම මූලික ආකාරවත්[1006] සැපයීම මගින් සපුරාලීම සහතික කිරීමේ කේන්ද්‍රීය බැඳීමක් තිබේ. තව ද එලෙසම සිවිල් ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරනු ලැබීම සහතික කිරීමේ බැඳීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ද පිළිගනු ලැබේ. ජාත්‍යන්තර නීතිය සහන සැපයුම්වලට හිතාමතාම අවහිර කිරීම ඇතුළු ඔවුන්ගේ පැවැත්ම පිණිස අත්‍යවශ්‍ය දේවල් ඔවුන්ට අහිමි කිරීම මගින් යුද ක්‍රමවේදයක් ලෙස සිවිල් ජනයාව චේතනාන්විතව කුස ගින්නේ තැබීම තහනම් කරයි. එසේම එවැනි කල්ක්‍රියාවක් සිරිත් බැඳි ජාත්‍යන්තර නීතිය යටතේ ද යුද අපරාධයක් ගණයට වැටෙනු ඇත.[1007]

939. කාලය මුළුල්ලේම එය ප්‍රමාණවත් සැපයුම් යවා තිබෙන බවට කෙරෙන ආණ්ඩුවේ සහතික වීම් නොතකා මෙම පරිච්ඡේදයේ දී ඉදිරිපත් කරනු ලබන තොරතුරු වන්නියට ළඟා වූ ආහාර, වෛද්‍ය හා අනෙකුත් සැපයුම් ප්‍රමාණය සීමා කිරීමේ එහි අභිලාෂ පිළිබඳ බරපතල ප්‍රශ්න මතු කරයි. එය ආණ්ඩුව කෙතරම් දුරට මෙසේ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය (IHL) හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය (IHRL) උල්ලංඝනය කර තිබේ ද හා එය එහි යුද මූලෝපායේ යහපත උදෙසා සිවිල් ජනයාගේ අයිතීන් යටත් කළේ ද යන්න විභාග කරයි. එසේම අත්‍යවශ්‍ය ආධාර සැපයීමට එයට නොහැකිව හෝ අකැමතිව සිටි බව පැහැදිලිව තිබෙන විට දී ආණ්ඩුව ගැටුම් ප්‍රදේශයෙන් ජාත්‍යන්තර මානුෂවාදී ක්‍රියාකාරීන් සියල්ල සම්පූර්ණයෙන්ම වාගේ වළක්වා ලූයේ මන් ද යන බරපතල ප්‍රශ්න ද තිබේ.

940. 2009 ජනවාරි 29 වෙනි දින මානව හිමිකම් පිළිබඳ හිටපු මහ කොමසාරිස් නවි පිල්ලෙයි ''යුද්ධයේ මාස බොහෝ ගණනකට පසු සිවිල් ජනයාගේ සෝපද්‍රව තත්ත්වය, බහුවිධ අවතැන්වීම හා තදබල වැසි හා ගංවතුර'' හා ස්වාධීන අධීක්ෂකයින් හා මානුෂවාදී ක්‍රියාකාරකයන් සඳහා ප්‍රවේශය නොමැතිකම පිළිබඳව අවධානය යොමු කළ අතර එය මතු කරන්නේ ''තත්ත්වය අප අවබෝධකර ගන්නවාට වඩා නරක විය හැකිය''යන්න පිළිබඳව අවධානයන් පමණක් යයි ඇය පැවසුවා ය.

941. මාස පහකට පසු 2009 මැයි 14 වෙනි දින ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මාධ්‍ය නිවේදනයකින් ''සිතිය නොහැකි මානුෂීය ව්‍යසනයක්''ලෙසින් විස්තර කරමින් අතිශය දරුණු මානුෂීය තත්ත්වය සම්පිණ්ඩනය කළේ ය.[1008] ''ඉහළ මට්ටමේ සහතිකවීම් නොතකා භූමියේ ආරක්ෂාව නැතිවීම යන්නේ තේරුම අපේ මුහුදින් කෙරෙන මෙහෙයුම් අඛණ්ඩව නතරවීම ය. මෙය අනුමත කළ නොහැක්කකි. කිසිදු මානුෂවාදී සංවිධානයකට වත්මන් තත්ත්වයන් යටතේ ඔවුන්ට (සිවිල් ජනයාට) ආධාර කරන්නට නොහැකි ය. ජනතාව ඔවුන්ගේම ක්‍රම සොයා

---

[1005] රාජ්‍ය පාර්ශවවල බැඳීම්වල ස්වභාවය පිළිබඳ පොදු විවරණය අංක 3 (1990)(සම්මුතියේ 2 (1) වගන්තිය) 10 ඡේදය CESCR

[1006] එම 10 ඡේදය, CESCR පොදු විවරණය අංක 12, ඡේදය 6; ලබාගත හැකි ඉහළම සෞඛ්‍ය ප්‍රමිතිය ලබා ගැනීමේ අයිතිය (වගන්තිය 12) පිළිබඳ පොදු විවරණය අංක 14 (2000) 47 ඡේදය සහ ජලයට ඇති අයිතිය පිළිබඳ පොදු විවරණය අංක 15 (2003) (සම්මුතියේ 11 හා 12 වගන්ති) 40 ඡේදය

[1007] *සිරිත් බැඳි ජාත්‍යන්තර නීතිය* පිළිබඳ ICRC දත්ත ගබඩාව

[1008] මානුෂවාදී ආධාරවලට තව දුරටත් සිවිල් වැසියන් වෙත ළඟා විය නොහැකි ය, 2009 මැයි 14 ICRC මාධ්‍ය නිවේදනය 09/103

ගැනීමට හැර දමා තිබුණි ..... සිය ගණන් ජනයාගේ ජීවිත බේරා ගැනීම පිණිස අපට ආරක්ෂාව හා අබාධිත ප්‍රවේශය අවශ්‍ය ය.'' මාධ්‍ය නිවේදනය ''දුලබ පානීය ජලය හා ආහාර සොයා ගැනීම ඊටත් වඩාත් දුෂ්කර බවට පත් කරමින් බන්කර්වල ආරක්ෂාව පතන්නට සිදුව තිබූ දහස් ගණන් සිවිල් ජනයාගේ තත්ත්වය'' විස්තර කළේ ය.

**ආධාර සැපයීමේ හා සම්බන්ධීකරණයේ ආණ්ඩු යාන්ත්‍රණ**

942. එල්ටීටීඊය යාපනේට ඇතුල්වීමේ/පිටවීමේ ලක්ෂ්‍යය වූ මුහමලේට පහර දීමෙන් පසු අගෝස්තුවල දී ආණ්ඩුව යාපනේ අර්ධද්වීපයේ හා වන්නියේ ''මුදා නොගත් ප්‍රදේශවල'' අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම පිණිස අත්‍යවශ්‍ය සේවා පිළිබඳ මහ කොමසාරිස්වරයෙකු (CGES) පත් කළේ ය.[1009] පසු මාසයෙහි එය ''ගැටුමෙන් විපතට පත් ජනතාවට මධ්‍යගතව සම්බන්ධීකරණය කරන ලද ආකාරයකින් මානුෂීය ආධාර සැපයීම පිණිස'' මානුෂීය ආධාර පිළිබඳ උපදේශන කමිටුව (CCHA) ස්ථාපිත කළේ ය. එය 2006 ඔක්තෝබර්වල සිට අවස්ථා 28 ක දී කැඳවීය.[1010]

943. මානුෂීය ආධාර පිළිබඳ උපදේශන කමිටුවේ මූලාසනය දරන ලද්දේ ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ අමාත්‍යවරයා විසිනි. එයට ජාතිය ගොඩ නැගීම, නැවත පදිංචි කිරීම ආපදා සහන සේවා, සෞඛ්‍ය, අධ්‍යාපන හා විදේශ කටයුතු යන අමාත්‍යාංශවල නියෝජිතයෝ ද සහභාගි වූහ. එක්සත් ජනපද, නෝර්වේ හා ජපන් තානාපතිවරුන් හා (කලින් සාම ක්‍රියාදාමයේ සම සභාපතිවරුන් ලෙස) යුරෝපීය සංගම් සභාපතිගේ නියෝජිතයින්, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල සියලුම ප්‍රධානීන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටු හා යුරෝපීය ප්‍රජාවේ මානුෂීය ආධාර කාර්යාල (ECHO) නියෝජිතයින් සමග ආරක්ෂක ලේකම්, අත්‍යවශ්‍ය සේවා පිළිබඳ මහ කොමසාරිස් හා උතුරු පළාතේ ආණ්ඩුවේ දිසාපතිවරු ද ඊට සහභාගි වූහ.

944. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) වෙත ඉදිරිපත් කළ සිය ප්‍රකාශයේ දී ආරක්ෂක ලේකම්වරයා සඳහන් කළේ මානුෂීය ආධාර පිළිබඳ උපදේශන කමිටුවේ (CCHA) සියලු රැස්වීම් පවත්වන ලද්දේ ආරක්ෂක අමාත්‍යාංශයේ දී බව ය. එහි ''අමාත්‍යවරයා විසින් මුලසුන දැරුව ද මා එහි සිටියේ අදාළ සිද්ධීන්ගෙන් ජනයාට යන්නට ඉඩ දෙනවා ද නැතහොත් අත්‍යවශ්‍ය දේවල් ගෙන යාමට ඉඩ දෙනවා ද වැනි බොහොමයක් ප්‍රශ්න ආරක්ෂක අමාත්‍යාංශය හා සම්බන්ධ නිසා ය'' කියා ය.[1011]

945. මෙම රැස්වීම්වල දී මානුෂවාදී නියෝජිතායතනවලට හා අන්‍යයන්ට අවශ්‍ය උවමනා එපාකම් මතු කිරීමට ද මානුෂීය ආධර පිළිබඳ ප්‍රතිපාදනවලට සම්බන්ධ ඉල්ලීම් සකස් කිරීමට ද අවස්ථාවක් සැලසුණු අතර මානුෂවාදී නිලධාරීහු ජීවිත ගලවා ගැනීමේ අත්‍යවශ්‍ය ආධාර යයි

---

1009 ශ්‍රී ලංකාවේ මානුෂීය ප්‍රයත්නය, උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය හා ආරක්ෂාව සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය 2011, ii, iii පිටු

1010 එම

1011 ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා 2010 අගෝස්තු 17 දින LLRC වෙත කරන ලද ඉදිරිපත් කිරීම

ඔවුන් සැලකූ දේවල් යැවීමට ඔවුන් කළ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථා ගෙනහැර දැක්වූහ.

946. විශාල වශයෙන් ආණ්ඩුවේ දිසාපතිවරුන්ගේ ඉල්ලීම් මත පදනම් වූ මානුෂීය ආධාර ප්‍රවාහනය කිරීම සඳහා එක්සත් ජාතීන් හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් කරන ලද ඉල්ලීම් ගැන සඳහන් කරමින් 2008 නොවැම්බර් 20 වෙනි දින අත්‍යවශ්‍ය සේවා පිළිබඳ කොමසාරිස් ජෙනරාල්වරයා වවුනියා, මුලතිව් හා කිලිනොච්චි දිසාපතිවරුන්ට ආහාර හා ආහාර නොවන දේවල් සඳහා තවත් කිසිදු ඉල්ලීමක් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවලට හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට ඉදිරිපත් කිරීම තහනම් කළ අතර සියලු ඉල්ලීම් ඔහු හරහා කළ යුතුව තිබුණි යයි උපදෙස් දුන්නේ ය.[1012] මෙය වන්නියට යවන ආධාර ප්‍රතිපාදන පිළිබඳ මධ්‍යම ආණ්ඩුවේ පාලනය තවත් දැඩි කළේ ය.

947. උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ''ශ්‍රී ලංකාවේ මානුෂීය ප්‍රයත්නය'' 2011 වාර්තාවේ ගැටුම මුළුල්ලේම ''එල්ටීටීඊ බලපෑම යටතේ පැවති ඒවා ද ඇතුළුව සියලු ප්‍රදේශවලට මානුෂීය ආධාර සැපයීය. එය එහි කැපවීම ක්‍රියාවට නගමින් ආහාර, ඖෂධ හා අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල බාධා විරහිත ප්‍රමාණවත් සැපයුම් මාර්ගයක් පවත්වා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දැරී ය. ගැටුමේ උත්සන්නම කාල පරිච්ඡේදයේ දී සැපයුම් මාර්ග එල්ටීටීඊය විසින් පහර දෙනු ලැබීමට භාජනය වී තිබියදීත් සැපයුම් යවනු ලැබිණ.... ආණ්ඩුව විසින් සිවිල් ජනයා සඳහා යවන ලද සැපයුම්වලින් එල්ටීටීඊයමත් යැපෙන බව ගැන ආණ්ඩුව දැනුවත්ව සිටිය ද සිය කැපවීමෙහිලා ආණ්ඩුව දෙගිඩියාවට පත් වූයේ නැත''යි සඳහන් කළේ ය.[1013]

948. එල්ටීටීඊය සැපයුම් ගත්තා හෝ නොගත්තා වුව එතෙකුත් වන්නියේ සිවිල් ජනතාවට ප්‍රමාණවත් ආහාර හා සැපයුම් සහතික කිරීම ආණ්ඩුවේ බැඳීමක් වී තිබුණි. පහතින් විස්තර කරනු ලබන පරිදි හදිසි ප්‍රතිචාර දැක්වීමෙහිලා ජාත්‍යන්තර හා දේශීය මානුෂවාදී ක්‍රියාකාරකයින්ගේ මැදිහත් වීම වැළක්වීමෙන් හා ගැටුම් කලාපයෙන් කවර හෝ ජාත්‍යන්තර ඉදීමක් ඉවත් කිරීමෙන් ආණ්ඩුවට එහි කොන්දේසි මත මානුෂීය කටයුතු කර ගෙන යාමට ද එහි අතිශයින් වැදගත් ආරක්ෂණ අරමුණුවලට ඉඩ සලසා ගැනීමට ද හැකි විය. 'ආරක්ෂක ප්‍රශ්න' පිළිබඳ පුළුල් විශේෂීය මාක්‍ෂකාව යටතේ ආණ්ඩුව වන්නියට හා හැකි වෛද්‍ය සැපයුම්, ජලය, සනීපාරක්ෂණය හා ආහාර මත දරුණු හා විසමානුපාතික සීමාවන් පැනවීය. එය සිවිල් ජනයා මත ඔවුන් එන්ට එන්ටම දුබල කරන්නා වූ බලපෑමක් ඇති කළේ ය.

### එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට භාණ්ඩ ගෙන යාම පිළිබඳ ආණ්ඩුවේ සීමා පැනවීම්

949. 2002 සටන් විරාම ගිවිසුම එල්ටීටීඊ ප්‍රදේශවලට හා ඒවායින් පිටට (ඒ කාලයේ උතුරු හා නැගෙනහිර පළාත්) ගෙනයන භාණ්ඩ මත ඇතැම් සීමා දිගටම පනවන ලද වගන්ති අඩංගුකර

---

1012 අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් එස්. බී. දිවාරත්නගේ 2008 නොවැම්බර් 20 ලිපිය

1013 එසේම ශ්‍රී ලංකාවේ සියලුම දෙනා හා විශේෂයෙන් අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් වෙනුවෙන් ආණ්ඩුවේ සේවාවන් www.defence.lk/PrintPage.asp?fname=20081206_13 බලන්න

ගත්තේ යඃ තහනම් කරන ලද අයිතම වූයේ මිලිටරි නොවන අවි හා වෙඩි උණ්ඩ, පුපුරණ ද්‍රව්‍ය, දුරස්ථ පාලක උපකරණ, කටු කම්බි, බයිනොකියුලර හා දූර දර්ශක, මාලිමා යන්ත්‍ර හා පෙන්ලයිට් බැටරි ය. ඊට අමතරව එය ඩීසල් හා පෙට්‍රල් ප්‍රවාහනය මත දැඩි සීමා පාලන පැනවූ අතර ඒවා ප්‍රවාහනය කළ යුතු වූයේ ආණ්ඩුවේ නියෝජිතයින් හරහා ය. එසේම සිමෙන්ති හා යකඩ කුරු යන දෙකම ගෙන යාමේ පටිපාටි හා ප්‍රමාණයන් නියම කෙරුණි. දෙවැන්න කලින් තහනම් කර තිබිණ. විශේෂයෙන්ම ඩීසල් හා පෙට්‍රල් වෛද්‍ය පහසුකම් හා ආහාර නිෂ්පාදනය සඳහා තීරණාත්මක විය.[1014] එසේම ඉදි කිරීම් ද්‍රව්‍ය මත සීමා පැනවීම විශේෂයෙන් බරපතල වූයේ එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ ඇතුළත ඉදි කිරීම්වලට බරපතල ලෙස බාධා පමුණුවමින් 2004 සුනාමිවලින් පසුත් ඒවා ක්‍රියාත්මකව පැවති නිසා ය.

950. එදිරිවාදිකම් උත්සන්න වූවිට වඩා බරපතල සීමාවන් නැවත පනවනු ලැබිණ. නැවත වරක් භාණ්ඩ හා නිෂ්පාදිත පරාසයක් වන්නියට ඇතුල්වීම තහනම් කෙරිණ. පිරිසිදු කරන ලද ජලය වැනි ඒවායින් ඇතැම් ඒවා මූලික අවශ්‍යතා ප්‍රතිපාදන සඳහා අත්‍යවශ්‍ය ඒවා විය. එසේම ඉන්ධන හා ඉදි කිරීම් සඳහා සිමෙන්ති හා යකඩ කුරු ප්‍රවාහනය මත පැන වූ තහනම නැවත පනවනු ලැබිණ. ප්‍රවාහනය සඳහා ප්‍රමාණයන්ගෙන් ඉන්ධන ලබා ගැනීමට එක්සත් ජාතීන්ට හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට පමණක් ඉඩ දෙන ලද අතර ඒවා ආණ්ඩුව විසින් අනුමත කළ යුතුව තිබිණ. එයට වන්නියට ගෙන යාමට අවසර දෙන ලද මානුෂීය භාණ්ඩ හා ඉන්ධන සම්බන්ධයෙන් සහන වැඩවලට බලපෑ අඩුපාඩුවලට අවධානය යොමු කරවමින් නිතිපතා ආණ්ඩුව සමග කතිකා කරන්නට එක්සත් ජාතීන්ට සිදුව තිබුණි. [1015]

951. විමර්ශනයට භාජනය වූ කාලය මුළුල්ලේම වන්නියට ඇතුළු වූ කවර හෝ සහන ආධාරයක් සම්බන්ධයෙන්ම අවසාන අධිකාරය තබා ගෙන තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යි. ප්‍රදේශී මට්ටමේ දී ශ්‍රී ලංකා හමුදාවට හා නාවික හමුදාවට භාණ්ඩ ප්‍රවාහනය කිරීම අවලංගු කිරීමේ හෝ අවසර දීම ප්‍රමාද කිරීමේ හැකියාව තිබිණ.[1016]

952. මානුෂවාදී සංවිධාන මත සීමා පැනවීම්

953. එක්සත් ජාතීන්ගේ හා ජාත්‍යන්තර මානුෂවාදී සංවිධානවල කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් ඇතුළු සියලු පුද්ගලයින් ඕමන්තේ පසුකර යන විට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ප්‍රලේඛනය කිරීම අවශ්‍ය කෙරේ. ඔවුන් මුර පොළවල දී පරීක්ෂා කිරීම්වලින් නිදහස් කර නොතිබිණ. ඔවුන්ගේ ලියවිලි හා දේපළ ශ්‍රී ලංකා හමුදාව විසින් අත් අඩංගුවට ගැනීමෙන් ආරක්ෂා කර නොතිබිණ. ඒවායේ ජාතික කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් හිරිහැරයට, අත්අඩංගුවට ගැනීමට හා අනෙකුත් උල්ලංඝනයන්ට පහසුවෙන් භාජනය විය හැකිව තිබිණ.[1017]

---

1014 සටන් විරාම ගිවිසුම, 2002, ඇමුණුම අ.

1015 කමිටුව විසින් දක්නා ලද එක්සත් ජාතීන්ගේ ලිපි හුවමාරුව, 2008 ජූලි 24

1016 http://www.odihpn.org/humanitarian-exchange-maÜzine/issue-05/feedback-jqne-1996-membeß-contribution-banned-restricted-or-seìitive-working-with-the-military-in-sri-lanka

1017 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

954. එසේම එක්සත් ජාතීන්ගේ කාර්ය පිරිස් ඇතුළු ජාතිකයින් එල්ටීටීඊයෙන් ද අනුමතිය ලබා ගත යුතු ව තිබුණ අතර වන්නියෙන් පිටත් වීමට අවසර ලැබුණේ එල්ටීටීඊ ගමන් බලපත්‍ර තිබූ අයට පමණි (බලන්න XIV පරිච්ඡේදය). මෙම සීමාවන් තිබිය දීම එක්සත් ජාතීන් හා මානුෂවාදී සංවිධාන ඒවා නෙරපා හරින තෙක් වන්නියේ රැඳී සිටි අතර වන්නියේ එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල අවශ්‍යතා ඇගයීමට හා ආධාර වැඩසටහන් පවත්වා ගෙන යාමට සමත් විය.

955. 2008 සැප්තැම්බර් 3 වෙනි දින එක්සත් ජාතීන්ගේ සියලුම නියෝජිතායතන හා රාජ්‍ය නොවන මානුෂවාදී සංවිධානවලට සැප්තැම්බර් 29 වෙනි දින වන විට එල්ටීටීඊ-පාලිත ප්‍රදේශයෙන් ඉවත්වන ලෙස නියෝග කළේ ය. ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ''මුදා නොගත් ප්‍රදේශවල මානුෂවාදී කාර්ය මණ්ඩලවල ආරක්ෂාව සහතික කළ නොහැකි බව හා ඕමන්තේවලින් ඔබ්බෙහි සිට වන්නිය තුළට තවදුරටත් ගමනාගමනය සඳහා අවසර ප්‍රදානය නොකරන බව එක්සත් ජාතීන්ට ලිපියක් මගින් දන්වන ලදී.[1018] කලින් විස්තර කරන ලද පරිදි නියෝගය දෙන ලදුව ඉනික්බිතවම වාගේ එක්සත් ජාතීන්ගේ අංගන අවට ෂෙල් ප්‍රහාර එල්ල කෙරිණ. සැප්තැම්බර් 12 වෙනි දින එක්සත් ජාතීන් සිය කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් ආරක්ෂක හේතූන් නිසා වහාම ඉවත්කර ගන්නා බව ප්‍රකාශ කළ අතර එය ජනතාව අතර දින තුනක විරෝධතාවන් අවුලුවාලීය. එක්සත් ජාතීන්ගේ පහසුකම් හා ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් සැප්තැම්බර් 16 වෙනි දින වවුනියාවේ නැවත ස්ථාපනය කරනු ලැබිණ. කෙසේ වුව ද ජාතික කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ පවුල්වලට හා ඇතැම් ජාතික කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට නැවත ස්ථානගතවීම සඳහා අවසර පත්‍ර දීම එල්ටීටීඊය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිණ (බලන්නː XIV පරිච්ඡේදයේ යාම් ඊම් පාලනය).

956. ''සැප්තැම්බර් 29 දින කිලිනොච්චියෙන් පිටත් වීම සම්පූර්ණ කරනු ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ආණ්ඩුව එම ප්‍රදේශවල රැඳී සිටින එක්සත් ජාතීන්ගේ කිසිදු කාර්ය මණ්ඩලයක් පිළිගැනීමේ තත්ත්වයක නොසිටිනු ඇතැ''යි සැප්තැම්බර් 18 වෙනි දින ලිපියකින් විදේශ කටයුතු අතිරේක ලේකම්වරයා එක්සත් ජාතීන්ට දැනුම් දෙනු ලැබීය.[1019]

957. මෙම පියවර හා ආනුෂාංගික ක්‍රියාවන් මගින් ශ්‍රී ලංකා ආණ්ඩුව එල්ටීටීඊය විසින් ඔවුන්ට ඉවත්ව යාමට අවසර දීම ප්‍රතික්ෂේප කර තිබෙන බව දැනුම් දෙනු ලැබ තිබියදීත් එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීමේ එහි බැඳීම පිළිගැනීම ප්‍රතික්ෂේප කර තිබේ.

958. එක්සත් ජාතීන්ගේ හා අනෙකුත් ජාත්‍යන්තර මානුෂවාදී සංවිධානවල බලහත්කාර ප්‍රති ස්ථානගත කිරීම සිවිල් ජනයා මත එහි යුද මෙහෙයුම්වල බලපෑම යුද බිමෙන් හෙළිදරව් වීම පිළිබඳ තොරතුරු ගලා යාම අවම කිරීමෙහිලා ශ්‍රී ලංකා ආණ්ඩුව සමත් වූ විවිධ මාර්ගයන්ගෙන්

---

[1018] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, 2008 සැප්තැම්බර් 4 එක්සත් ජාතීන්ගේ ලිපි හුවමාරුව; http://www.island.lk/2008/09/10/news16.html; ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ මාධ්‍ය නිවේදනය, 2008 ඔක්තෝබර් 3

[1019] විදේශ කටයුතු පිළිබඳ අතිරේක ලේකම් ප්‍රසාද් කාරියවසම් එක්සත් ජාතීන්ට යවන ලද ලිපිය, 2008 සැප්තැම්බර් 18

එකකි.[1020] එක්සත් ජාතීන් හා අනෙකුත් ජාත්‍යන්තර මානුෂවාදී සංවිධාන දිග හැරෙමින් පැවති මානුෂවාදී අර්බුදය ස්වාධීනව නියාමනය කිරීමට හා මානුෂවාදී ආධාර බෙදා හැරීමට සමත් නොවීය. ගැටුම් කලාපයේ සිටීමෙන් තොරව එලෙසම ඒවාට සීඝ්‍රයෙන් වෙනස්වන තත්ත්වයක් තුළ ජනතාවගේ අවශ්‍යතා නිත්‍ය වශයෙන් තක්සේරු කිරීමට හෝ එකී මානුෂවාදී අවශ්‍යතාවන්ට කඩිනම්ව ආමන්ත්‍රණය කිරීමට හෝ සමත් වූයේ නැත. ජාත්‍යන්තර නිරීක්ෂකයින් නොමැතිවීම විශේෂයෙන්ම පහසු ගොදුරුවන ජනතාව එල්ටීටීඊය හා ආණ්ඩුව යන දෙකේම හමුදා විසින් කරන ලද කෲරකම්වලට හැර දැමී ය.

959. 2008 සැප්තැම්බර්වල දී ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රකාශනයක[1021] ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ අමාත්‍යවරයා ''ආණ්ඩුව ජීවන විටත් මෙම ප්‍රදේශවල අවශ්‍යතාවෙන් පෙළෙන පුරවැසියන්ට ප්‍රමාණවත් මානුෂීය හා සහන සේවා සපයන හෙයින් එල්ටීටීඊය අල්ලාගෙන සිටින ප්‍රදේශවලින් රාජ්‍ය නොවන සංවිධානවල හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධනවල ප්‍රතිස්ථාපනය මගින් සහන කටයුතුවල නැවතීමක් සිදු නොවනු ඇතැ''යි සඳහන් කළේ ය. ''වර්තමානයේ දී ආණ්ඩුවේ මාර්ග හරහා වන්නියේ සිවිල් ජනයාට භාණ්ඩ හා සේවාවන්ගේ අඛණ්ඩ ගලා යාමක් සිදුවේ'' යයි සඳහන් කළ ඔහු එළඹෙන දින මුළුල්ලෙහි එය ''ශක්තිමත්වනු'' ඇතැයි පැවසීය. කෙසේ වුව ද ආණ්ඩුවේ ප්‍රකාශයට පටහැනිව සැපයුම් ගලා යාම ක්ෂය වී ගියේ ය.

960. 2008 දෙසැම්බර්වල ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි මුලින්ම දක්නට ලැබුණු ප්‍රකාශයකින් ආණ්ඩුව දිගටම කියා සිටියේ එය අභ්‍යන්තර අවතැන් වූවන්ට ආධාර බෙදා හැරීමේ කටයුතු සම්බන්ධයෙන් හොඳම ස්ථානය වූයේ යයි කියා සිටිමින් ආණ්ඩුව අඛණ්ඩවම එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල ඉන්නවුන් ද ඇතුළුව ගැටුම් කලාපයෙහි ආධාර අවශ්‍ය කරන සියලු දෙනාටම නිදහස් සමාජ සේවා සැපයීම කරන බව ය.[1022]

**වන්නියට මානුෂවාදී ආධාර ප්‍රවාහනය කිරීමට පැවති බාධා**

**පාර මගින් ප්‍රවාහනය**

961. 2009 ජනවාරි අවසානයේ දී මාර්ග ප්‍රවාහනය නතරවන තෙක් මාර්ගය ඔස්සේ වන්නියට ඇතුල්වන භාණ්ඩ පිළිබඳ සීමා ක්‍රියාත්මක කරන ලද්දේ ඕමන්තේ මුර පොළේ හමුදා පරීක්ෂාවන් හා ආණ්ඩුව-පාලිත භූමි ප්‍රදේශය හා එල්ටීටීඊ-පාලිත ප්‍රදේශය අතර දකුණේ සිට ප්‍රධාන මාරුවන ස්ථානය වූ මැදවච්චිය මුර පොළේ හමුදා පරීක්ෂාවන් මගිනි. වන්නියේ එල්ටීටීඊ ප්‍රදේශවලට මාරු වීම පිණිස සියලු පුද්ගලයින්, වාහන හා මානුෂීය ආධාර ඇතුළු භාණ්ඩ ආරක්ෂක අමාත්‍යාංශයෙන් හා ශ්‍රී ලංකා හමුදාවෙන් අනුමත වීම අවශ්‍ය විය.[1023] විශාල

---

[1020] එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වාර්තාවක්, 2009, http://home.wfp.org/stellent/groups/public/documents/communications/wfp225450.pdf

[1021] http://www.defence.lk/new.asp

[1022] ශ්‍රී ලංකාවේ සියලුම දෙනා හා විශේෂයෙන් අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් වෙනුවෙන් ආණ්ඩුවේ සේවාවන් http://www.defence.lk/new.asp?fname=20081206_03

[1023] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ට්‍රක් රථ ඇතුළු සියලුම වාහන හමුදාව මගින් පරීක්ෂා කරනු සඳහා ඒවායින් බිමට බෑ යුතුව තිබිණ. දොර පුවරු ඉවත් කිරීම හා ටයරවල හුළං බැස්සීම ඇතුළුව වාහන තරයේ පරීක්ෂා කෙරිණ.[1024] ගැටුම උත්සන්නවන විට ආරක්ෂක පරීක්ෂා කිරීම් හා සෝදිසි වඩාත් දැඩි විය. දකුණේ සිට යන වාණිජ වාහන ඕමන්තෙයිහි දී ඒවායේ බඩු බෑ යුතු වූ අතර හමුදාව ඒවාට අනුමතිය දීමෙන් අනතුරුව වන්නියට ප්‍රවාහනය සඳහා උතුරේ සිට පැමිණි ට්‍රක් රථවලට ඒවා නැවත පැටවිය යුතුව තිබිණ.

962. බොහෝ විට දවසකට ට්‍රක් රථ 20 කට නොවැඩි ගණන පරීක්ෂා කෙරිණ. මෙම පරීක්ෂාවන් දීර්ඝ ප්‍රමාදයන්ට හා නරක් විය හැකි භාණ්ඩ නරක් වීමට හේතු විය. කොළඹ දී හෝ වවුනියාවේ දී හමුදාව විසින් පරීක්ෂාකර මුද්‍රා තබන ලද එක්සත් ජාතීන්ගේ ට්‍රක් රථ ඕමන්තේ දී ඒවායේ බඩු බා පරීක්ෂා කිරීම අවශ්‍ය නොවී තිබුණ ද වරප්‍රසාද හා මුක්තීන් කඩ කරමින් එක්සත් ජාතීන්ගේ වාහන ද එම සම්පූර්ණ පරීක්ෂාවන්ට භාජනය කෙරුණි. ආහාර රථ කණ්ඩායම් සමග ගිය එක්සත් ජාතීන්ගේ පිරිස්වලට කැමරා හෝ චන්ද්‍රිකා දුරකථන, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක රෙගුලාසිවලට අනුව පසුව කී උපකරණ අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස සැලකුණ ද ගෙන යාමට අවසර නොදුනි.[1025] සාක්ෂිකරුවන්ට අනුව මානුෂීය ආධාර රැගත් වාහන රඳවා ගැනීමේ දීර්ඝ ප්‍රමාදයන් ප්‍රතිකාර සඳහා වන්නියේ සිට වවුනියාව රෝහලට ගෙන ඒම සඳහා රැඳී සිටි බරපතල ලෙස රෝගී වූ හෝ තුවාල වූ රෝගීන්ගේ ජීවිත අනතුරට පත් වීමේ අවදානමට ලක් කළේ ය.[1026]

963. මානුෂීය නියෝජිතායතන කිලිනොච්චියේ සිට වන්නියේ අන් තැනක ස්ථානගත වීමට පෙර 2008 සැප්තැම්බර් 15 දින ලෝක ආහාර වැඩසටහනේ අවසාන ආහාර බෙදා දීමේ දී 156,000 ක් ජනයාට දින හයක ආහාර සලාකයක් සැපයීය. යළි ස්ථානගතවීමෙන් පසු 2008 ඔක්තෝබර් හා 2009 ජනවාරි අතර එක්සත් ජාතීන් රථ කණ්ඩායම් 11 කින් වන්නියට මානුෂීය ආධාර ප්‍රවාහනය කළේ ය. කෙසේ වුව ද ඒවායේ ගමනාන්තයට ළඟා වීමේ දී ඒවාට බාධක රාශියකට මුහුණ දෙන්නට සිදු වූ අතර ප්‍රමාණවත් වාසස්ථාන, ජලය හා සනීපාරක්ෂණය නොමැතිව සිටි දස දහස් ගණන් ජනයාගේ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්විය යුතුව තිබුණි. එසේම මතු වෙමින් පවත්නා ජලයෙන් හට ගන්නා රෝග පැතිරීමේ තර්ජනයට මුහුණ දිය යුතුව තිබිණ.[1027]

964. එක්සත් ජාතීන්ගේ එක් එක් වාහන කණ්ඩායම පිටත් වීමට පෙර එක්සත් ජාතීන්, ශ්‍රී ලංකා හමුදාව හා එල්ටීටීඊය අතර වාහන කණ්ඩායම යා යුතුව තිබෙන මාර්ගය පිළිබඳව ද වාහන කණ්ඩායම්වලට ආරක්ෂිතව ගමන් කිරීම සඳහා තාවකාලික සටන් නැවත් වීමක් පිළිබඳව ද එකඟතාවකට පැමිණ තිබුණි. ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය සඳහා අවසර දෙනු ලැබූ විට කලින් විස්තර කළ පරිදි සියලුම ට්‍රක් රථ වවුනියාවේ හමුදාවේ සමීප පරීක්ෂාව හා අධීක්ෂණය යටතේ බඩු පටවා ගත යුතුව තිබුණ අතර හමුදාව විසින් ට්‍රක් රථ මුද්‍රා ලබනු ලැබිණ. යටත්

1024 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1025 එක්සත් ජාතීන්ගේ ලිපි හුවමාරුව, 2008 දෙසැම්බර් 16

1026 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1027 HRW, 2008 දෙසැම්බර් 23, http://www.hrw.org/news/2008/12/22/sri-lanka-end-detentions-and-aid-restrictions

පිරිසෙයින් අවස්ථා තුනක දී අත්‍යවශ්‍ය වාසස්ථාන හා සනීපාරක්කෂක භාණ්ඩ වැනි ආහාර නොවන මානුෂීය ආධාර පටවා තිබුණ ට්‍රක් රථ හමුදාව අවසර දීම ප්‍රමාද කිරීම නිසා හෝ අවසර නොදීම නිසා රථ කණ්ඩායමෙන් ඉවත්කර ගැනීමට සිදු වුණි.[1028]

965. 2008 දෙසැම්බර් 23 දින අභ්‍යන්තර අවතැන්වූවන් සම්බන්ධ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ වාර්තාකරු වාහන කණ්ඩායම් ගණනාවකට වන්නියට ඇතුළුවීමේ සීමා පැනවීමේ ප්‍රතිඵලයක් වශයෙන් නව අවතැන්වීම් හා දැඩි වර්ෂාව ''බොහෝ සිවිල් වැසියන්ට ප්‍රමාණවත් ආහාර, ජලය, වාසස්ථාන හා සනීපාරක්ෂණය''නොමැතිව සිටීමට සිදුවනු ඇතැයි ඔහුගේ බිය පළ කරමින් ආරක්ෂක ලේකම්වරයාට ලිවීය. ඔහු අධිකාරීන්ගෙන් ''සියලුම සිවිල් වැසියන් කරා ළඟා වීමට මානුෂීය සහනවලට හා මානුෂවාදී ක්‍රියාකාරීන්ට සැලකිය යුතු තරමින් වැඩි ප්‍රවේශයක් සලසන්නැ''යි ඉල්ලා සිටියේ ය.''...සිවිල් ජනතාවගේ වැඩෙන අවශ්‍යතා දැන් ලැබෙන සහන ප්‍රමාණයන් මගින් සපුරාලිය නොහැකි බවට මම ගැඹුරු ලෙස සැලකිලමත් වෙමි'' යි ඔහු පැවසීය. සතිපතා යන වාහන කණ්ඩායමට පමණක් ප්‍රවාහනයට ඉඩ දී තිබෙන බව සඳහන් කරමින් ඔහු ජනතාවගේ අත්‍යවශ්‍ය හා ජීවිත ගලවා ගැනීමේ අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කිරීමට වෛද්‍ය සැපයුම්, හදිසි වාසස්ථාන ද්‍රව්‍ය, ජලය හා සනීපාරක්ෂක උපකරණවලට ප්‍රමාණවත් ප්‍රමාණයකින් අවසර දිය යුතු බව අවධාරණය කළේ ය.

966. වාහන කණ්ඩායම්වලට ආරක්ෂිත ගමනාගමනයට අවසර දීමේ එකඟතාවන් හා ගමන මුළුල්ලේම ඒවා නියම වශයෙන් සිටි ස්ථාන දැන සිටීම නොතකා වාහන කණ්ඩායම්වලට ඉතා ආසන්නයටම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමෙන් අවස්ථා ගණනාවක දී ම ඒවායේ ආරක්ෂාව අවදානමකට ලක් කිරීම හා අත්‍යවශ්‍ය මානුෂීය ආධාර පමා කිරීම හෝ වැළැක්වීම කරනු ලැබිණ.[1029] සාක්ෂිකරුවන්ට අනුව වාර්තා වූ පරිදි ශ්‍රී ලංකා හමුදාව හා එල්ටීටීඊය යන දෙකම ඔවුන්ගේ හමුදා ඉදිරියට ගෙන යාම පිණිස වාහන කණ්ඩයම් ආවරණයක් ලෙස උපයෝගී කර ගෙන ඇත.[1030]

967. වාහන කණ්ඩායම්වලට ගමන් කිරීමට අවසර දීමට පාර්ශව දෙක විසින්ම පැහැදිලි එකඟතාවන්ට පැමිණ තිබීමේන් පසු මානුෂීය ආධාර වාහන කණ්ඩායම් ආසන්න වටාපිටාවට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම හිතාමතාම වාහන කණ්ඩායම් අනතුරට පත් කිරීමේ හෝ වැළැක්වීම හෝ ප්‍රමාද කිරීම අරමුණු කළා ද යන්න ඇතුළුව එහා අභිලාෂය පිළිබඳ ප්‍රශ්න මතු කරයි.

968. වාහන කණ්ඩායම් 11 න් අවසන් කණ්ඩායම 2009 ජනවාරිවල ගැටුම් කලාපය තුළ දී තාවකාලික කොටු වීමකට පත් වූ (XIII පරිච්ඡේදය බලන්න) අතර එක්සත් ජාතීන් එතැන් පටන් තමන්ට ප්‍රමාණවත් ආරක්ෂණ සහතිකයන්ගේ අඩුව හා බෙහෙවින් බිම් බෝම්බ වළලන ලද පාරවල් හේතු කොට ගෙන මානුෂීය ආධාර බෙදීම කළ නොහැකි බව ප්‍රකාශ කළේ ය.[1031]

---

1028 http://www.logcluster.org/sites/default/files/documents/Minutes_logcluster_LKA_Vavunia_081006.pdf

1029 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1030 War on displaced (අවතැන්වූවන් මත යුද්ධය) හියුමන් රයිට්ස් වොච්, 2009 පෙබරවාරි 19; එක්සත් ජාතීන්ගේ ලිපි හුවමාරුව 2008 ඔක්තෝබර් 17.

1031 ශ්‍රී ලංකාවඃ යුද කලාපයේ 250,000 ක් ජනයාට ආහාර අවශ්‍ය ය, ලෝක ආහාර වැඩසටහන, 2009 පෙබරවාරි 6, http://www.wfp.org/stories/sri-lanka-vanni

969. ආණ්ඩුවේ දිසාපතිවරු මානුෂීය ආධාර වාහන කණ්ඩායම් සමගම වන්නියට ආහාර හා ආහාර නොවන මානුෂීය ආධාර ප්‍රවාහනය කරන කුඩා වාහන කණ්ඩායම් ද සූදානම් කර තිබුණ අතර ඒවාට බාධාවකින් තොරව පැමිණිය හැකි විය. නිදසුන් ලෙස 2008 ඔක්තෝබර්වල පළමු සති දෙක තුළ ආණ්ඩුවේ වාහන කණ්ඩායම් මෙට්‍රික් ටොන් 714 ක ආහාර ප්‍රවාහනය කර තිබුණි.[1032] 2008 ජනවාරි 1 දින ආණ්ඩුවේ දිසාපතිගේ වාහන කණ්ඩායමක් ඉන්දියාව විසින් ප්‍රදානය කරන ලද ආහාර හා අනෙකුත් ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 591.7 ක් ප්‍රවාහනය කළේ ය.[1033] 2009 ජනවාරි 29 දින ආණ්ඩුව විසින් අවසාන වාහන කණ්ඩායම වන්නියට ළඟා වීමට සංවිධානය කළ අතර ලෝක ආහාර සංවිධාන වැඩපිළිවෙලේ ආහාර මෙට්‍රික් ටොන් 153 ක් ගෙන ගිය බව ලෝක ආහාර වැඩසටහන සඳහන් කළේ ය.[1034]

**නැව් මගින් ප්‍රවාහනය**

970. සති තුනකට වැඩි ප්‍රමාදයකින් පසු 2009 පෙබරවාරි 10 වෙනි දින පළමුවන ජාත්‍යන්තර රතු කුරුස නෞකාව වන්නියට මානුෂීය ආධාර ප්‍රවාහනය කිරීම ආරම්භ කළේ ය. මාර්ග වාහන ප්‍රවාහන කණ්ඩායම් අත්හිටුවනු ලැබීමෙන් පසු වන්නියට ආහාර ප්‍රවාහනය කිරීමේ එකම මාර්ගය වූයේ මුහුදු මාර්ගය යි. ආණ්ඩුව විසින් අවසර දෙන ලද පමණට වුව ද නැව්වල ප්‍රාථමික කාර්යය වූයේ සිවිල් ජනතාව සඳහා ආහාර හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රමාණයන් ගෙන යාම හා බරපතල රෝගාතුර වූ හෝ තුවාල වූ පුද්ගයින් වන්නියෙන් පිටට ගෙන යාම ය. 2009 වාර්ෂික වාර්තාවට අනුව මැයි 9 වෙනි දින පැමිණි අවසාන නැවෙන් ගෙන එන ලද පිරිසත් සමග සමස්තයක් වශයෙන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව 13,000 කට වඩා රෝගීන් හා සාත්තු සපයන්නන් නැව් මගින් ඉවත් කර ගෙන යනු ලැබී ය.

971. සාක්ෂිකරුවන්ට අනුව ඔවුන් පිටත්ව ගිය ස්ථානයේ සිට ත්‍රිකුණාමලයට මානුෂීය ආධාර ගෙන යමින් සිටි නැව්වලට බඩු පැටවීම සඳහා හමුදාව විසින් ඉතා දැඩි පටිපාටි පනවා තිබිණ. නැව පිටත්වීමට නාවික හමුදාවෙන් පූර්ව අවසරය ලබා තිබිය යුතු වූ අතර හමුදා පටිපාටිවලට අනුව නාවික හමුදාව ආහාර හා ඖෂධ ද ඇතුළුව නැවට පටවන ලද වෛද්‍ය උපකරණ, ගුවන් විදුලි සන්නිවේදන උපකරණ හා අදාළ ලියවිලි ඇතුළු සියලු භාණ්ඩ පරීක්ෂා කර බලා මුළුමහත් නැවටම අවසර දිය යුතුව තිබිණ.[1035] ඇතැම් අධිකාරීන් අවසර දෙනු ලැබූ විට පවා ඇතැම් අවස්ථාවල අවසාන මිනිත්තුවේ දී නැව්වලට භාණ්ඩ පැටවීමට අවසර නොදුනි (පහතින් එන ජලයට හා සනීපාරක්ෂාව වෙත ප්‍රවේශය බලන්න).[1036]

972. යටත් පිරිසෙයින් එක් සිද්ධියක දී අප්‍රේල් 22 වෙනි දින වෙරළේ සිට ශ්‍රී ලංකා හමුදාව රතු කුරුස නැවක් වටේට යුද ටැංකි හා මෝටර් ප්‍රහාර එල්ල කරන ලද බව සාක්ෂිකරුවන්

---

1032 IASC Situation Report#148, 9-16 October 2008, http:/reliefweb.int/report/sri-lanka/sri-lanka-jaffna-kilinochchi-mullaitivu-mannar-vavuniya-trincomalee-and-batticalo-1

1033 IASC Situation Report#,155, http:/reliefweb.int/sites/reliefweb.int/files/resources/B571FB28A4286F049257520001F4754-Full_Report.pdf

1034 ශ්‍රී ලංකාව: යුද කලාපයේ 250,000 ක් ජනයාට ආහාර අවශ්‍ය ය, ලෝක ආහාර වැඩසටහන, 2009 පෙබරවාරි 6, http://www.wfp.org/stories/sri-lanka-vanni

1035 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1036 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

විසින් විමර්ශන කමිටුවට (OISL) වාර්තා කරනු ලැබිණ. ශ්‍රී ලංකා හමුදාව වෙඩි තැබූ පිහිටැවුම කලපුව හරහා පැහැදිලිව දැකිය හැකි වූ බව සාක්ෂිකරුවෝ පැවසූහ. ෂෙල් ප්‍රහාර නතර කරනු ලැබූ විට අවසානයේ දී නැව එය පැමිණ එකතුකර ගෙන යා යුතුව තිබූ රෝගීන් පටවා ගැනීමට අමත්ව ඇත.[1037]

**වන්නියේ ආධාර අවශ්‍ය කෙරී තිබුණ ඇස්තමේන්තුගත සිවිල් වැසියන් ගණන පිළිබඳ ආණ්ඩුවේ ගණන් හැසිරවීම**

973. 2009 මැයි අවසානය වනවිට සිවිල් වැසියන් 284,000 ක් පමණ ගැටුම් කලාපයෙන් පිටතට පැමිණ සිට ඇති බව හා අභ්‍යන්තර අවතැන් කඳවුරුවලට මාරුකර තිබූ බව ආණ්ඩුව තහවුරු කළේ ය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමට (LLRC) හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණයන්ට ආණ්ඩුව ඉදිරිපත් කළ බොහොමයක් ප්‍රකාශනවල දී අභ්‍යන්තර අවතැන් වූවන්ට එය සපයන ලද මානුෂීය ආධාර පිළිබඳව ද ගැටුම කාලය තුළ එය කොපමණ ආධාර ප්‍රමාණයක් සපයා තිබුණේ ද යන්න පිළිබඳව ද අවධාරණය කර තිබේ. එහෙත් වන්නියට යැවීමට තිබෙන ආහාර හා වෛද්‍ය සැපයුම් ප්‍රමාණයන් පිළිබඳව සාකච්ඡා කරන විට කොළඹ ආණ්ඩුවේ නිලධාරීන් නැවත නැවතත් තිර කොට කියා තිබුණේ එහි සිටියේ සිවිල් වැසියන් 70,000 ක් පමණක් බව ය.

974. නිදසුන් ලෙස 2009 පෙබරවාරි 7 වෙනි දින ''වන්නියේ සිර වී සිටින සිවිල් වැසියන්ගේ සැබෑ ගණන 100,000 කට අඩු''[1038] බව ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් මාධ්‍ය වාර්තා කළේ ය. 2009 පෙබරවාරි 18 වෙනි දින නිකුත් කළ ප්‍රකාශයක දී ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍ය මහින්ද සමරසිංහ ආණ්ඩුවේ''මතය යුද මුක්ත කලාපයේ අභ්‍යන්තර අවතැන් වූ ජනහනය වර්තමානයේ දී 100,000 ට අඩුය'' යන්න යළිත් කියා සිටියේ ය.[1039] 2008 ඔක්තෝබර්වල සිට එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට වාහන කණ්ඩායම් ගෙන යන ලද ආහාර බෙදා හැරියා යයි කියන අභ්‍යන්තර අවතැන්වූවන් 230,000 වැඩිකර කියන ගණන් බව තවදුරටත් පැවසූ ඔහු භූමියෙහි ආණ්ඩුවේ දිසාපතිවරයාගේ සංඛ්‍යාවල දෙගුණවීම් ද ද්විත්ව ගණනයන් ද තිබේ යයි ද සඳහන් කළේ ය. එක් අවස්ථාවක දී ආණ්ඩුවේ නිලධාරියෙක් දිසාපතිවරයාගේ සංඛ්‍යා ලේඛන ''හිතුමත හා පදනම් විරහිත'' ඒවා ලෙස විස්තර කළේ ය.[1040] එහෙත් ආණ්ඩුවේ දිසාපතිවරුන් 320,000 කට පමණ වෛද්‍ය හා ආහාර සැපයුම් සඳහා ඔවුන්ගේ ඉල්ලීම්වල කරන සඳහන් කිරීම ආණ්ඩුව කියා සිටින සංඛ්‍යාවන්ට වඩා නිවැරදි බව ඔප්පු වී තිබේ. ආණ්ඩුව 2009 ජනවාරිවල දී ගැටුම් කලාපයෙන් පිටව එන අභ්‍යන්තර අවතැන් වූවන් රඳවා තැබීමේ සඳහා වන එහි සැලසුම් පදනම් කර ගත්තේ 200,000 ක් ජනයා

---

1037 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1038 ''සම්පූර්ණ සත්‍ය කියන්න'' ආරක්ෂක ලේකම් - "Tell the whole Truth", Daily News 2009 පෙබරවාරි 7, http://archives.dailynews.lk/2009/02/07/sec01.asp

1039 ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය, *ආණ්ඩුව මුලතිව් යුද මුක්ත කලාපයේ ජනතාවට ආහාර යවයි* 2009 පෙබරවාරි 18

1040 ජාතික ඉඳි කිරීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.කේ.කේ.කුමාරසිරිගේ ලිපිය, 2009 මාර්තු 18

මත ය (XVI පරිච්ඡේදයේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ සුලමුල පරීක්ෂා කිරීම හා නිදහස අහිමි කිරිම, බලන්න).

975. 2009 පළමුවන කාර්තුවේ දී මානුෂීය ආධාර අවශ්‍යතාවන්ට අදාළව ආණ්ඩුව නැවත නැවතත් දෙන ලද සංඛ්‍යාවන් වූයේ 70,000 ක පමණ සිවිල් වැසියන් ප්‍රමාණයක් බව මානුෂවාදී ක්‍රියාධරයන් ද තහවුරු කර තිබේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) සඳහන් කළේ ''ජාත්‍යන්තර රතු කුරුස කමිටුව හා ලෝක ආහාර වැඩසටහන.... වැනි ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගන්නා ලද ඉතා වෙහෙසකර ප්‍රයත්නයන් සටන් ක්‍රමවේදයක් ලෙස සිවිල් ජනතාව සාගින්නේ තැබීමේ අභිලාෂයෙන් යුද මුක්ත කලාපවල සිවිල් ජනයාගේ සංඛ්‍යාව අඩුවෙන් දක්වීමේ විය හැකි කිසිදු දැනුවත් අභිප්‍රායක් තිබුණේ ය යන අනුමානයකට ඉඩක් නොදෙයි'' යනුවෙනි.

976. ආණ්ඩුවේ මූලයන් තර්ක කරන්නේ අතිරික්තය ඔවුන් වෙනුවෙන් ගත හැකි නිසා එල්ටීටීඊය ජන සංඛ්‍යාව වැඩිකර දක්වා තිබුණ බව ය. එල්ටීටීඊයට විශාල ජනකායකින් ඔවුන්ට සහය තිබෙනවා යයි කියා පෑමට මෙන්ම වන්නියට ගෙන එන මානුෂීය ආධාර අතිරික්තය ඇද ගැනීමට ජන සංඛ්‍යාවන් වැඩියෙන් දක්වීමේ උවමනාවක් තිබුණා විය හැකි ය. කෙසේ වුව ද කමිටුව (OISL) විසින් සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය කළ විශ්වසනීය මූලාශ්‍ර ගණනාවක්ම විසින් එලටීටීඊය ආණ්ඩුවේ නිලධාරීන්ට ජනගහන සංඛ්‍යා වැඩියෙන් දක්වීමට බලපෑම් කළේ ය යන්න ප්‍රතික්ෂේප කරනු ලැබීය.[1041]

977. ආධාර බෙදා දීම එන්ට එන්ටම අසීරු වෙමින් පැවති නිසා ආධාර සැපයුම් එල්ටීටීඊය අතට ගියේ ද, නැතහොත් කොපමණ ප්‍රමාණයකින් ගියා ද යන්න තක්සේරු කිරීමට ස්වාධීන දත්ත ඇත්තේ නැත. එසේ වුව ද ආහාර පෝලිම්වලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ අවදානම තිබියදීත් සිවිල් වැසියන්ට ආධාර බෙදා දීම සිදු වූ බව සාක්ෂිකරුවෝ විස්තර කළහ.

978. ඇතැම් අවස්ථාවල එල්ටීටීඊ වෛද්‍ය සැපයුම් සිවිල් වෛද්‍යවරුන්ට ඒවා අවශ්‍ය වූවිට ඔවුන් සමග හවුලේ පාවිච්චි කළ බවට[1042] ද එල්ටීටීඊයට ආණ්ඩුවේ දිසාපතිගේ සැපයුම්වලින් ස්වාධීන ඊටම වූ සැපයුම් මාර්ග තිබූ බවට ද ස්වාධීනව ගන්නා ලද වාචික සාක්ෂි ගණනාවක් විමර්ශන කමිටුවට (OISL) ලැබුණි.

979. ගැටුමේ වර්ධනය වෙමින් පැවති තීව්‍රතාව නිසා මෙන්ම එල්ටීටීඊ-පාලිත ප්‍රදේශය හා ඉන් පිටත වූ බහුවිධ අවතැන්වීම් මගින් ද වන්නියේ ජනගහනය නිවැරදි ලෙස ගණනය කිරීම සංකීර්ණ වූ බව විමර්ශන කමිටුව (OISL) පිළිගනී. කෙසේ වුව ද ආණ්ඩුව විසින් සපයන ලද සංඛ්‍යා හා අවසන් අදියරයන්හි දී අවසානයේ ගැටුම් ප්‍රදේශයෙන් මතුවුණු සිවිල් ජන සංඛ්‍යාව අතර වන සැලකිය යුතු වෙනස ආණ්ඩුවේ පැත්තෙන් කෙරෙන සාවද්‍ය ඉදිරිපත් කිරීම් මගින් පැහැදිලි කළ නොහැකි ය.

---

1041 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1042 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

980. මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAVs) හෝ ඩ්‍රෝන යානා ගුවන් ඡායාරූප එකතු කරමින් ගැටුම් කලාපයට ඉහළින් නිතිපතා පියාසර කළ බව සාක්ෂිකරුවෝ බොහෝ දෙනෙක් විමර්ශන කමිටුවට (OISL) දැනුම් දුන්හ. මින් ඇතැම් ඒවා ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර තිබූ අතර විමර්ශන කමිටුව (OISL) ද ඒවා දැක තිබේ. නිදසුන් ලෙස 2009 අප්‍රේල් 20 වෙනි දින මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAVs) ඡායාරූප කූඩාරම් හා වෙරළේ ඉන්නා ජනතාව ද ඇතුළුව පුදුමාතලන්හි දී ජනතාව පලා යන දර්ශන ඉතා පැහැදිලිව පෙන්නුම් කරයි.[1043] එය ගැටුම් ප්‍රදේශයට ඉහළින් නිරන්තරව පියාසර කළ මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAVs) බිමේ සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ නිසි කාල පින්තූර ඔවුන්ට සපයනු ලැබුවේ යයි 2014 ඔක්තෝබර්වල දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට පැවසීම ඇතුළුව ආණ්ඩුවම අවස්ථා ගණනාවක දී සඳහන් කර තිබේ.

**සෞඛ්‍යය, ආහාර, ජලය හා සනීපාරක්ෂාවට ඇති අයිතීන් මත ආණ්ඩුවේ ක්‍රියාවන්ගේ බලපෑම**

981. පහතින් දැක්වෙන කොටස් සිවිල් ජනයාට ගැටුමේ අවසන් පස් මාසය තුළ ඔවුන් නැවත නැවතත් අවතැන් වීම නිසා ආහාර, ජලය, සනීපාරක්ෂාව හා ජීවිතාරක්ෂක වෛද්‍ය සත්කාරය සැපයීම මත පනවන ලද සීමාවන් විසින් ඇති කරන ලද බලපෑම විදහා දක්වයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) 2009 අප්‍රේල් 28 වෙනි දින නිකුත් කරන ලද එහි මානුෂවාදී ක්‍රියා යාවත්කාලීනයේ දී (Humanitarian Action Update) ''පානීය ජලය, සනීපාරක්ෂණය නැතිකම, ප්‍රමාණවත් නොවන සෞඛ්‍ය සත්කාරය හා ඖෂධ මෙන්ම ආහාර හිඟය (වයස පහට අඩු ළමුන්ගෙන් හතරට එකකට වඩා මන්ද පෝෂණයෙන් පෙළේ) ඇතුළුව'' ගැටුම් කලාපයෙහි මෑත දී අවතැන් වූ සිවිල් වැසියන්ට දරන්නට සිදු වී තිබුණ ''අන්ත තත්ත්වයන්'' අවධාරණය කර තිබේ.[1044] එසේම එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ''ගැටුම් කලාපයෙන් පිටතට එන සිවිල් වැසියන් අසනීපයෙන්, කුස ගින්නෙන් හා මන්ද පෝෂණයෙන් හා විජලනයෙන් පීඩා විඳිනවාය'' යන කරුණ කෙරෙහි ද අවධානය යොමුකර තිබේ.[1045]

982. සාක්ෂිකරුවන් හා අනෙකුත් ලියකියවිලි ෂෙල් හා වෙඩි ප්‍රහාරවලින් මිය යනවාට අමතරව කුස ගින්නෙන්, අධික වෙහෙසෙන් හෝ වෛද්‍ය සත්කාරය නොමැති වීමෙන් මියයන බොහෝ දෙනා පිළිබඳව සඳහන් කරයි. ආහාර හා වෛද්‍ය සත්කාරයට ප්‍රවේශය නොමැති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිය ගිය බොහෝ ජනයා විශේෂයෙන්ම වයස්ගත වූවන් හා ළමුන් වැනි බෙහෙවින්ම පහසුවෙන් විපත්වලට භාජනය විය හැකි ජනයා මිය ගියේ කෙසේ ද යන්න විමර්ශනය කිරීමට තිබේ.

---

1043 ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය:http://www.defence.lk/main_res.asp?fname=videos_ATRO

1044 ළමුන් සම්බන්ධ අර්බුදය: ගැටුම් කලාපයෙන් 100,000 පලා යති. දස දහස් ගණනක් තවමත් සිරවී සිටිති UNICEF, Humanitarian Action Update, Sri Lanka, 2009 අප්‍රේල් 28

1045 UNHCR, මැයි 20

**ආහාර අයිතියට අහිමි කිරීම**

983. ගැටුමේ අවසාන මාස පහ තුළ වන්නියට ගෙන යාමට අවසර දුන් ආහාර හා වෛද්‍ය සැපයුම් සුළු ප්‍රමාණයන් සාධාරණය කිරීමට අඩුවෙන් දක්වන ලද ජන සංඛ්‍යාවන් උපයෝගීකර ගැනීම (පහතින් බලන්න) වැඩෙමින් පැවති මන්ද පෝෂණයේ හා උග්‍ර මන්ද පෝෂණයේ මට්ටම් සමග ආහාරවලට ප්‍රවේශය අඩු කිරීම මගින් මේ වන විටත් බලපෑමට පත්ව සිටි ජනතාවක් මත බරපතල ප්‍රතිවිපාක ඇති කර තිබුණි. 2003 වන විටත් වන්නියේ ජනතාව අතර මන්ද පෝෂණයේ බහුලත්වය ජාතික මට්ටමට වඩා බෙහෙවින් වැඩි බව සමීක්ෂණයක් මගින් සොයා ගෙන තිබිණ.[1046]සමීක්ෂණය පවත්වන ලද්දේ ප්‍රදේශයට ඇතුළුවන ද්‍රව්‍ය මත පනවන ලද සීමාවන්ගෙන් වසර ගණනාවකට පසුව ය. ආණ්ඩුව සටන් විරාම කාලපරිච්ඡේදය සමයේ ආහාර හා ආහාර නොවන නිෂ්පාදිත වන්නියට ගෙනයාම මත පනවා තිබූ බරපතල සීමා තාවකාලිකව ලිහිල් කළේ වුව ද සමීක්ෂණයේ ප්‍රතිඵල ගැටුමේ සහ ආණ්ඩුව විසින් පූර්ව දශකවල දී වන්නියේ ජනතාව මත පනවන ලද සීමාවන්හි දිගු කාලීන බලපෑම පිළිබිඹු කරයි.

984. 2006 දී එදිරිවාදිකම් උග්‍රවීමත් සමග අභ්‍යන්තර අවතැන්වූවන්ගේ සංඛ්‍යාව නැවතත් වැඩෙන්නට වූ අතර වන්නියට එන භාණ්ඩ මත පැන වූ සීමාවන් වඩාත් බරපතල විය. බරපතල සීමාවන් නැවත පැනවීමෙන් පසු ඉන්ධන හිඟය හේතු කොට ගෙන 2006 ඔක්තෝබර්වල මුලතිව්වල කුඹුරුවලින් වගා කිරීමට හැකි වී ඇත්තේ සියයට 30-40 ත් ප්‍රමාණයක් බව ලෝක ආහාර වැඩසටහන ඇස්තමේන්තු කළේ ය. එසේම ඩීසල් තහනම වී මෝල්වල කටයුතුවලට ද බලපෑවේ ය.[1047] ජනගහනයේ විශාල පරිමාණ අවතැන්වීම ගොවීන්ට ඔවුන්ගේ වගාවන් අත්හැර දැමීමට බල කළේ ය. ගොවීන් ආපසු ඒම වලක්වමින් ශ්‍රී ලංකා හමුදාව විසින් ගොවි බිම් ප්‍රදේශ විශාල ප්‍රමාණයක් හෙළි පෙහෙළි කෙරිණ. එසේම ශ්‍රී ලංකා හමුදාව සමහර ජලාශවල හා වේලිවල පාලනය අත්කර ගත් අතර ගොවි බිම්වලට ජලය ගලා යාම සීමා කළේ ය. 2008 නොවැම්බර්වල මෝසම් සමයේ ගංවතුර සහ නිෂා සුළි සුළඟ ඉතිරිව තිබූ යම් වගාවක් වී නම් එය ද විනාශ කළේ ය.

985. ගැටුම වර්ධනය වී ගිය විට හා ප්‍රජාවන් ඔවුන්ගේ නිවාස අත්හැර දමා පලා ගිය විට ප්‍රතිඵලයක් වශයෙන් වන්නියේ ආහාර නිෂ්පාදනය සැලකිය යුතු අන්දමින් පහත වැටිණ.[1048] මුලතිව්හි ඉඩම්වලින් තවමත් ප්‍රවේශ විය හැක්කේ සියයට පණහකට පමණක් බව 2008 දෙසැම්බරයේ දී වන්නියේ ආණ්ඩුවේ නිලධාරියෙකු එක්සත් ජාතීන්ට දැනුම් දුනි.[1049] යුද්ධය හේතු කොට ගෙන වූ දිගු කාලීන අනාරක්ෂිතභාවය, බිම් බෝම්බ වළලා තිබීම හා මහා පරිමාණ

---

1046 ජර්මන් Agro Action මගින් පවත්වන ලද පෝෂණ පාදක සමීක්ෂණය, 2004 මාර්තු, ගීසන්වල Justus – Liebig සරසවිය http://www.uni-giessen.de/cms/fbz/fb09/institute/ernaehrungswisseìchaft/ag/krawinkel/forschung/nutrition-baseline-report

1047 වන්නියේ හදිසි ආහාර සුරක්ෂිතා ඇගයුම, 2006 ඔක්තෝබර්, ලෝක ආහාර වැඩසටහන, http://documents.wfp/stellent/groups/public/documents/ena/wfp130895.pdf?iframe

1048 Keen, p. 13

1049 අභ්‍යන්තර වාර්තාවක්, එක්සත් ජාතීන්ගේ අන්තර්-නියෝජිතායතන වන්නි ආධාර දූත කණ්ඩායම, කණ්ඩායම 9, 2009 දෙසැම්බර් 29-30

අවතැන් වීම ඉඩම්වලට ප්‍රවේශය අඩු කළ අතර ප්‍රතිඵල වශයෙන් දේශීය වශයෙන් නිෂ්පාදිත හාල් සහ එළවළුවල හිඟයක් හා මූලික ආහාරවල මිල තියුණු ලෙස වැඩිවීමක් සිදු විය. ආහාර හා අනෙකුත් නිෂ්පාදිතවල හිඟය හේතු කොට ගෙන වන්නියේ භාණ්ඩවල මිල සාමාන්‍යයෙන් නිල වෙළෙඳ පොළ මිල මෙන් පස් ගුණයේ සිට 10 ගුණය දක්වා විය.[1050]

986. එක්සත් ජාතීන් හා මානුෂවාදී සංවිධාන කිලිනොච්චියෙන් වෙනත් තැනක ස්ථානගත වීමෙන් පසු ආහාර සහනාධාර බෙදීම වඩාත් අසීරු බවට පත් විය. එක්සත් ජාතීන්ගේ මාර්ග වාහන කණ්ඩායම් ක්‍රියාත්මකව තිබුණු මාස හතරක කාලය (2008 ඔක්තෝබර් හා 2009 ජනවාරි) තුළ විවිධ ආරක්ෂක සිද්ධීන් තිබියදීත් මසකට බෙදා හරින ලද ආහාර තොගය මෙට්‍රික් ටොන් 3,639 ක සාමාන්‍යයක් විය. මෙම ගණනට ආණ්ඩුවේ ආහාර ප්‍රදානයන් මෙන්ම ඉන්දියානු ආණ්ඩුවෙන් හා රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබුණු ප්‍රදානයන් ද ඇතුළත් විය.[1051]

987. කෙසේ වුව ද 2009 ජනවාරි 16 න් පසු වන්නියට ගෙන යාමට අවසර දුන් ආහාර ප්‍රමාණය සීඝ්‍රයෙන් පහත වැටිණ. 2009 මාර්තුවේ දී එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරයාගේ කාර්යාලය 150,000 ත් 200,000 ත් අතර ජනතාවක් සඳහා මසකට යටත් පිරිසෙයින් මෙට්‍රික් ටොන් 3,000 ක් අවශ්‍ය වූ බව දැක්වීය.[1052] 2009 පෙබරවාරි 17 හා-ආහාර යැවීම නැව්වලින් යවන්නට ආරම්භ කළ දින හා නැවෙන් කළ අවසාන බෙදා හැරීමේ දිනය වන මැයි 9 වෙනි දින දක්වා[1053] අවසර ලද හා බෙදා දෙන ලද මුළු ආහාර තොග ප්‍රමාණය ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයට අනුව මුළු කාලයම සඳහා මෙට්‍රික් ටොන් 2,442 ක් පමණි.[1054] 2009 පෙබරවාරි හා මැයි අතර යවන ලද භාණ්ඩ ප්‍රමාණය විස්තර කරමින් අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද වගුවක් පෙන්නුම් කරන්නේ ආහාරවලින් වැඩි ප්‍රමාණයක් සපයනු ලැබ ඇත්තේ ලෝක ආහාර වැඩසටහන විසින් බව ය. ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යවරයා පෙබරවාරි 17 වෙනි දින ආණ්ඩුව ''මුලතිව් යුද මුක්ත කලාපයේ ජනතාවට ආහාර යැවීමට'' සිටි බව කීව ද මුළු පස් මස් කාල පරිච්ඡේදයටම යවා තිබුණේ මෙට්‍රික් ටොන් 105 ක් පමණි. මැයි 7 දාතමින් ජාත්‍යන්තර රතු

1050 වන්නියේ හදිසි ආහාර සුරක්ෂිතා ඇගයුම, 2006 ඔක්තෝබර්, ලෝක ආහාර වැඩසටහන, http://documents.wfp/stellent/groups/public/documents/ena/wfp130895.pdf?iframe; IASC Situation Reports#,158 and #159; දමිළ සහන සංවිධානය, වන්නියේ මානුෂවාදී අර්බුදය, 2008 සැප්තැම්බර්, http://sangam.org/2008/09/TRO_Crisis_Vanni.php?uid=3066; SEDOT, Vanni Situation Report, 2008 සැප්තැම්බර්, http://www.padippakam.com/document/ltte/genaral/v100670.pdf

1051 වන්නියේ අභ්‍යන්තර අවතැන්වූවන්ට ආහාර බෙදාදීම, 2009 මාර්තු, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරයාගේ හා මානුෂවාදී සම්බන්ධීකරකවරයාගේ කාර්යාලය

1052 එම

1053 මාර්තු 14 වෙනි දින ICRC නැවක් ආහාර මෙට්‍රික් ටොන් 25 ක් ගොඩබෑමට හා වෛද්‍ය මගීන් පිරිසක් රැගෙන යාමට උත්සාහයක් දැරුව ද උග්‍ර සටන් හේතුවෙන් ආපසු යාමට සිදු විය. එසේම ලෝක ආහාර සංවිධානයේ ආහාර ආධාර යටතේ මෙට්‍රික් ටොන් 500 ක් ගෙනයමින් තිබූ තවත් නැවකට ද එදිනම වෙරළට ළඟා විය නොහැකි විය. ICRC මාධ්‍ය නිවේදනය 09/103 මානුෂවාදී ආධාරවලට තව දුරටත් සිවිල් වැසියන් වෙත ළඟා විය නොහැකි ය, 2009 මැයි 14

1054 ආහාර හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මුහුදින් මුලතිව්වලට යැවීය, මානව හිමිකම් ඒකකය, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය 2009

කුරුස කමිටුව නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයක[1055] එය මෙම කාලය තුළ ලෝක ආහාර වැඩසටහනේ ආහාර මෙට්‍රික් ටොන් 2,300 බෙදා හැර තිබුණ බව සඳහන් කළේ ය. මෙය ඉහත සඳහන් කරන ලද යවන ලද ආහාර තොග පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ ද ඇතුළත් කර තිබේ.

988. මෙලෙස මෙම තොරතුරුවලට අනුව මාස පහ සඳහා බෙදා හරින ලද මුළු ආහාර ප්‍රමාණයට එක්කර තිබෙන්නේ ඇස්තමේන්තු කරන ලද අවතැන් වූවන්ගේ ගණන මත පදනම්ව ගණනය කරන ලද මසකට අවශ්‍ය මෙට්‍රික් ටොන් 3,000 -එය ප්‍රදේශයේ ආණ්ඩුවේ නිලධාරීන් විසින් දෙන ලද ගණන්වලටත් සැලකිය යුතු තරම් අඩු කොටසක් පමණි.[1056] ආහාර සැපයුම් සීමා සහිත වූවා පමණක් නොවේ, ආහාර බෙදා දීමේ පෝලිම්වලට හා ගබඩාකර තිබූ ස්ථානවලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම තොග තව දුරටත් අඩු කළේ ය. නිමක් නැති සාක්ෂි ප්‍රකාශන ෂෙල් ප්‍රහාර එල්ලවීමේ අවදානම නොතකා ආහාර සඳහා පෝලිම් ගැසී සිටීම හා අවසාන ආහාර සොච්චම ලබා ගැනීමේ ඉවක් බවක් නැති උත්සාහයන් හෝ නොදන්නා පැලැටි කන හා ප්‍රතිඵල වශයෙන් රෝගාතුරවන ජනයා ගැන විස්තර කර තිබේ.[1057]

989. ආහාර හා ආහාර සැපයුම්වල හිඟයේ බලපෑම විශේෂයෙන් පහසුවෙන් විපතට ලක්වන වයස්ගත වූවන් හා ළමුන් සම්බන්ධයෙන් ඉතා ගැඹුරු විය. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ 2009 මානුෂවාදී ක්‍රියා වාර්තාව ශ්‍රී ලංකාවේ ගැටුමෙන් විපතට පත් දිස්ත්‍රික්ක නිදන්ගත හා උග්‍ර මන්දපෝෂණය අදාළ ජාතික සාමාන්‍යයට වඩා ඉහළ සංඛ්‍යා පෙන්නුම් කරන බව සඳහන් කර තිබේ.[1058] ගැටුම් ප්‍රදේශය හැර යන ළමුන් අතර උග්‍ර මන්දපෝෂණයේ වර්ධනයවන මට්ටම් හඳුනා ගනු ලැබිණ. 2009 මැයි වනවිට කමිටුවට දෙන ලද සමීක්ෂණ වාර්තාවකට අනුව උග්‍ර මන්දපෝෂණය මාර්තුවල සියයට 25 සිට 35 දක්වා වැඩී තිබිණ. 2009 මාර්තුවල මාස 6 සිට 60 දක්වා වයසැති ළමුන් 678 ක අහඹු නියැදියක් පාදක කර ගෙන කරන ලද ප්‍රාදේශීය සමීක්ෂණයක් සියයට 69.91 ක් අඩු බරැති බව පෙන්නුම්කර තිබේ.[1059]

990. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන මානුෂීය ආධාර පිළිබඳ උපදේශක කමිටු රැස්වීම් ඇතුළු රැස්වීම්වලදී යවන ආධාර තොගවලට බරපතල් ලෙස මන්දපෝෂිත ළමුන් සඳහා අධි ශක්ති BP-100 ප්‍රතිකාරාත්මක ආහාර ඇතුළත් කරන ඉල්ලා සිටි නමුත් ආණ්ඩුව ''ආරක්ෂක අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලද බරපතල ප්‍රතිෂ්ඨාවන්'' දක්වමින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළේ ය. මිය ගිය එල්ටීටීඊ කාඩර්වරයෙකුගේ ශරීරයෙහි අධි ශක්ති BP-100 ආහාර තිබූ බව ආරක්ෂක අමාත්‍යාංශය වර්තා කර තිබුණ අතර ආණ්ඩුව එය එල්ටීටීඊය විසින් ආහාර තමන් වෙතට හරවා ගෙන තිබෙන බවට සාක්ෂියක් ලෙස යොදා ගත්තේ ය.[1060] ආණ්ඩුව තමන් එවැනි ආහාර යවමින් සිටි බව සඳහන් කළේ ය. කෙසේ වුව ද එය ස්ථිර කර තිබුණේ නැත. ගැටුම

---

1055 ICRC ගැටුම් කලාපයෙන් 495 ඉවත්කර ගනියි, ආහාර මෙට්‍රික් ටොන් 25 ක් බෙදයි, මාධ්‍ය නිවේදනය 09/93, 2009 මැයි 7

1056 අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයාට අනුව මේ කාල පරිච්ඡේදය තුළ මෙට්‍රික් ටොන් 3150 ක් නැව්ගත කර ඇත.

1057 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1058 මානුෂවාදී ක්‍රියා වාර්තාව, 2009 යුනිසෙෆ්, Humanitrian Action Report 2009 http://www.org/har09/files/har09_srilanka_countrychapter.pdf

1059 පෝෂණ සමීක්ෂණය, 2009 මාර්තු 25-31, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1060 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

අවසානයේ දී අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවලට පැමිණි පසු ලියා පදිංචි කරන ලද ළමුන් තුළ වූ උග්‍ර මන්දපෝෂණයේ ඉහළ මට්ටම් ඉදිරිපත් කරනුයේ එවැනි ආහාර සැහෙන පමණ ලබා ගැනීමට නොතිබුණ බවයි.

991. වෛද්‍ය වෘත්තිකාවියක වූ එක් සාක්ෂිකාරියක් ඇගේ පවුලේ ළමයෙකුගේ තත්ත්වයන් විස්තර කළේ මෙසේ යː ''මාස 18 ක් වයසැති ළමයින්ගෙන් එක් අයෙකු බරපතල ශක්ති හීනතාවකින් පෙළුණා. ඇයට නැගිටින්නට ඇවිදින්නට බැහැ. හැම අවස්ථාවේම ඔසවා ගෙන යන්න ඕන. අප ළමුන්ට ආහාර ලබා දුන්න ද ඔවුන්ගේ පාදවල මස් පිඩු ක්ෂයවීමක් පෙන්නුම් කළා. ඔවුන්ගේ උදර ඉදිමී තිබුණා. හම තුළින් ඉල ඇට පෙනෙන්නට උනා. මේ වයසේ ළමයෙකුගේ තියෙන්න ඕන සාමාන්‍ය මේද තට්ටුව නොපෙනී ගොස් තිබුණා.''[1061] තවත් සාක්ෂිකරුවෙකු පැවසුවේ ''හැම දෙනාම හිටියේ හාමතේ. ළමුන් මන්දපෝෂණයට පත්වෙලා ඉන්නවා, වයස්ගත අය බොහොම දුර්වලව ඉන්නවා මට දකින්න හැකි උනා.''යනුවෙනු යි.[1062]

992. වන්නියේ වැඩ කරමින් සිටි පළාතේ පාලන නිලධාරීන් මෙන්ම මානුෂවාදී සංවිධාන මාස ගණනාවක් තිස්සේ අනතුරු හැඟවීම් කර තිබුණ අතර 2009 මාර්තු මුල වාර්තා වයස්ගත පුද්ගලයින් ගණනාවක්ම කුස ගින්නෙන් මිය ගිය බව දක්වා තිබිණ.[1063] 2009 අප්‍රේල්වල වවුනියාව මහේස්ත්‍රාත්වරයා සාගින්න නිසා යයි ඔහු දක්වන ලද මරණ මාලාවක් නිසා වයස්ගත පුද්ගලයින් කඳවුරුවලින් නිදහස් කරන්නට නියෝග කළේ ය ( XVI පරිච්ඡේදයේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සුලමුල පරීක්ෂා කිරීම හා නිදහස අහිමි කිරීම, බලන්න). සාක්ෂිකරුවෝ බොහෝ දෙනෙක් වයස්ගත පුද්ගලයින් ආහාර සපයා ගැනීමේ දී මුහුණ දෙන දුෂ්කරතා ද දිගින් දිගටම සිදුවන අවතැන් වීම් සමග ආහාර හා සත්කාරකයන් නොමැතිව ඔවුන් දුර්වල වී තිබෙන අන්දම ද මතුකර දක් වූහ.

993. ඔවුන් වන්නියෙන් අවතැන් වූ සැනින්ම වාගේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් මුණ ගැසුණ මානුෂීයවාදී ක්‍රියාධරයෙක් ද මන්දපෝෂණයේ සලකුණු ඔවුන්ට දැකිය හැකිව තිබුණ බව තහවුරු කළේ ය.[1064] එක්සත් ජාතීන්ගේ එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ඔවුන් එතෙක් මෙතෙක් දැක තිබුණ නරකම මන්දපෝෂිත පුද්ගලයන් අතර ඔවුන් සිටි බව පැවසීය. මාර්තු මැද දී ඇය ඕමන්තේවල කටු කම්බි ගසා තිබුණ ප්‍රදේශවලට පිටුපසින් කැහැටු වී ගිය ගැහැණුන්, පිරිමින් හා ළමුන් දුටු බවත් එක් වයසක මිනිසෙකු ඇය වැටෙන් එහා පැත්තට වීසි කළ වතුර බෝතලය ඇර ගැනීමට පෙර වැටී මිය යමින් සිටි අයුරු දුටු බවත් කමිටුවට පැවසුවා ය.[1065] සාක්ෂිකරුවන් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද 2009 මාර්තු හා මැයි අතර ගන්නා ලද ඡායාරූප හා වීඩියෝ පට පිටතට නෙරා තිබුණ ඇස්වලින්, හමට යටින් දැකිය හැකි ඉල ඇට කුඩුවලින් හා ඉතා සිහින් අත්පාවලින් යුත් වැහැරී ගිය පැහැදිලි ලක්ෂණ පෙන්නුම් කරමින් සිටි ළමුන් පෙන්නුම් කළේ ය.

---

1061 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1062 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1063 කලාපීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ ලිපි හුවමාරුව, 2009 මාර්තු 2
1064 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1065 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

994. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, මානුෂවාදී සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ආහාර හිඟය පිළිබඳ ප්‍රශ්නය හා ගැටුම් කලාපයේ සිවිල් වැසියන්ගේ තත්ත්වය රහස්‍ය සාකච්ඡාවල දී හා ප්‍රසිද්ධ ප්‍රකාශයන්හි දී නිතිපතා ආණ්ඩුව හමුවේ මතු කළේ ය.[1066] පෙබරවාරි 27 වෙනි දින මානුෂවාදී කටයුතු හා හදිසි සහන සම්බන්ධීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහකාර මහ ලේකම් ජෝන් හෝම්ස් මහතා ආහාර, වෛද්‍ය සැපයුම්, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් හා වාසස්ථානවල අත්‍යන්ත හිඟය අවධාරණය කරමින් හා සැපයුම් බෙදා හැරීම් ''බෙහෙවින් වැඩි කරන්නට'' ඉල්ලා සිටිමින් ආරක්ෂක මණ්ඩලය වෙත ඔහුගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳව කරුණු දැක්වීය[1067] 2009 මැයි 20 වෙනි දින නිකුත් කරන ලද ප්‍රකාශයක සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය ''රෝගාතුර වූවන්, කුස ගින්නෙන් හා උග්‍ර මන්දපෝෂණයෙන් හා විජලනයෙන් පෙළෙන්නවුන්'' ලෙස ගැටුම් කලාපයෙන් පිටතට එමින් සිටි සිවිල් වැසියන් පිළිබඳ විස්තර දැක්වීය.[1068]

995. ආණ්ඩුවේ නිලධාරීන්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හෝ අන්‍යයන් යන කවරෙකු විසින් වුව ආහාර හිඟයන් සම්බන්ධයෙන් එය සමග මතු කරනු ලැබ තිබුණ ඕනෑම ප්‍රතිෂ්ඨාවක් ආණ්ඩුව ආනුෂාංගිකව ප්‍රතික්ෂේප කළේ ය. ''ආණ්ඩුවේ දිසාපතීන් හෝ ආහාර හා සැපයුම් පිළිබඳ අංශ කමිටුව විසින් හෝ එක්සත් ජාතීන් විසින් හෝ අනෙකුත් නියෝජිතායතන විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් අතිරේක අවධානයක් යෙදිය යුතු ප්‍රශ්නයක් වශයෙන් මතු කරන ලද ආහාර හිඟයක් කිසිදු අවස්ථාවක නොවීය.''[1069]

996. ජලයට හා සනීපාරක්ෂණයට ඇති අයිතිය

997. ඒ වන විටත් ආණ්ඩුව විසින් ප්ලාස්ටික් වතුර ටැංකි, වැසිකිලි හා ඉන්ධන සඳහා වන වතුර පොම්ප වැනි ආහාර නොවන භාණ්ඩ වවුනියාවට ප්‍රවාහනය කිරීම පිළිබඳ දිගු කාලීන සීමා පනවනු ලැබ තිබිණ. ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන්ම ගැටුම උත්සන්නවන විට ජල හා සනීපාරක්ෂණ පහසුකම්වල හිඟයන් වැඩි වූ අතර එමගින් ජලයෙන් උපදින රෝග අවදානම වැඩි කළේ ය.

998. නිදසුන් ලෙස 2009 පෙබරවාරියේ දී මානුෂවාදී සංවිධාන අවතැන් වූ සංඛ්‍යාව වැඩිවීමේ තත්ත්වය තුළ හා ප්‍රාදේශීය ළිං බීම, සේදීම හා පිසීම සඳහා ප්‍රමාණවත් තරම් ජලය නොසපයන හෙයින් පානීය ජලයේ හිඟය ප්‍රධාන මානුෂවාදී ප්‍රශ්නයක් වන බව ඒවන විටත් සංඥා කර තිබිණ. එක්සත් ජාතීන් 2009 මාර්තුවේ දී දෙවන යුද මුක්ත කලාපයේ සිරවී සිටින ජනතාවගේ

---

1066 නිදසුන් ලෙස 2009 පෙබරවාරි 6 දින ''ශ්‍රී ලංකාවේ: යුද කලාපයේ 250,000 ක් ජනයාට ආහාර අවශ්‍ය ය'' යන සිරස්තලය යටතේ ලෝක ආහාර වැඩ සටහන මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේ ය. https://www.wfp.org/stories/sri-lanka-vanni

1067 මානුෂවාදී කටයුතු හා හදිසි සහන සම්බන්ධීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහකාර මහ ලේකම් ජෝන් හෝම්ස් මහතා විසින් ශ්‍රී ලංකාවේ මානුෂවාදී තත්ත්වය පිළිබඳව 2009 පෙබරවාරි 27 දින ආරක්ෂක මණ්ඩලයට කරුණු පැහැදිලි කරමින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය. http://www.innercitypress.com/srilholmes022709.pdf

1068 ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර අවතැන් කඳවුරුවල තත්ත්වය පිළිබඳව UNHCR සැලකිල්ල යොමු වේ. 2009 මැයි 20.

1069 ශ්‍රී ලංකාවේ මානුෂවාදී ප්‍රයත්නය, ජනාධිපති කාර්ය සාධක බලකාය, 48 ජේදය, 17 පිටුව

අවශ්‍යතා පසුරාලීමට සැපයෙන ජලය පස් ගුණයක් අවශ්‍ය කෙරී තිබුණ බව සඳහන් කළ අතර සැපයෙන ජලය සේවා සලසන්නේ දිනකට 35,000 කට අඩු ජනතාවකට බව දැක්වීය.[1070]

999. එසේම අනෙකුත් මානුෂවාදී සංවිධාන ද එම මාසයේම ජලය හා නිසි සනීපාරක්ෂණයේ අඩුව හේතු කොට ගෙන ඇතිවන වසංගතවල අවදානම ගෙන එමින් පානීය ජලය දුර්ලභ බවට පත්වෙමින් තිබෙනවාය යන කරුණට අවධානය යොමු කර වූයේ ය. දැඩි සේ අවශ්‍යව තිබුණ ජලය පිරිසිදු කිරීමේ පෙති හා වතුර ටැංකි සැපයීමට අවසරදීම අධිකාරීන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බව එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් කමිටුවට පැවසීය. 2009 මැයිවල එක් අවස්ථාවක ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නැවක භාණ්ඩවලට ක්ලෝරීන් පීප්ප ඇතුළත් කිරීමට එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයකට මූලික අනුමතිය ලැබී තිබුණ ද ඒවා බෝට්ටුවකට පටවන විට එල්ටීටීඊය විසින් ඒවා ආයුධ ලෙස පාවිච්චි කළ හැකිය යන පදනම මත හමුදාව ඒවාට අනුමතිය දීම ප්‍රතික්ෂේප කළේ ය.

1000. ගැටුමේ අවසාන මාසවල විශේෂයෙන්ම දහස් ගණන් ජනයා කුඩා, සිර වූ ඉඩකඩක එකිනෙකා මත ගොඩ ගැසී වාගේ ජීවත් වූ තුන්වන යුද මුක්ත කලාපයේ පැවති බියකරු ජීවන තත්ත්වයන් සාක්ෂිකරුවෝ විස්තර කළහ. ඔවුහු ජලය සඳහා වූ දිගු පෝලිම් හා සියලුම පවුල්වලටම ඇඟ සෝදා ගන්නට මුහුදට යන්නට සිදුව තිබුණේ කෙසේ ද යන්න විස්තර කළහ. ඔවුන්ගේම පවුලේ සාමාජිකයින් හා අනෙකුත් දහස් ගණන් දෙනා ඉදිරියේ ඇතැම්විට ඩ්‍රෝන යානා හිසට ඉහළින් පියාසර කරද්දී වෙරළ දිගේ සිරුර කිස කරන්නට සිදුව තිබීමේ හිරිහැරය හා නිගරුව බොහෝ දෙනෙක් විස්තර කළහ. වෙරළ දිගේ ජලය දූෂිත වී තිබිණ. එහෙත් අවතැන් වූ ජනයා කියා සිටියේ එම මුහුදු ජලයෙන් ඇඟපත හා උයන පිහන උපකරණ සෝදා ගැනීම හැර වෙනත් විකල්පයක් ඔවුන්ට නොතිබුණ බවයි. ධීවරයෝ මෙම දූෂිත ජලයෙන් මාළු අල්ලා කුස ගින්නෙන් පෙළෙන ජනයාට විකුණූහ. එක් සාක්ෂිකරුවෙක් විමර්ශනයේ දී මෙසේ පැවසීය. ''මාළු ඇල්ලුවේ දූෂිත වී තිබුණ ජලයෙන් බව මම දැන සිටියා, නමුත් මට වෙනත් විකල්පයක් තිබුණේ නැහැ. මා මගේ පවුලට කන්න බොන්න දිය යුතුව තිබුණා.''[1071]

**හදිසි වෛද්‍ය සත්කාර වෙත ප්‍රවේශය අහිමි කිරීම**

1001. ජාත්‍යන්තර මානුෂවාදී නීතියට අනුව ගැටුම මැද්දේ පවා සිවිල් වැසියන් හා තවදුරටත් එදිරිවාදිකම්වල නොයෙදී සිටින්නන් යන දෙපාර්ශවයේම රෝගීවූවන්ට හා තුවාලකරුවන්ට ජීවිතාරක්ෂක වෛද්‍ය සේවාවන් සැපයීම අවශ්‍ය කෙරේ. ආණ්ඩුවේ ප්‍රහාරය අතරතුර මාස ඉකුත්ව යන විට වෛද්‍ය සත්කාර සැපයුම් ලැබීම බොහෝ හේතූන් නිසා බරපතල අන්දමින් හීන වී ගියේ ය. එම හේතූන් වූයේ නැවතීමක් නැති ෂෙල් ප්‍රහාර හා වෛද්‍ය සැපයුම් විතැන් වීම, ඔවුන්ගේ තියුණු උත්සාහයන් හා කැපවීම් නොතකා සත්කාර සැපයීමේ වෛද්‍ය සේවකයින්ගේ ධාරිතාව අඩුවීම, විශේෂයෙන්ම දරුණු ෂෙල් ප්‍රහාරවල හේතුවෙන් රෝගීන් ප්‍රමාණයේ වැඩිවීම හා විතැන්වීම නිසා වන අහිමිවීම්, ෂෙල් ප්‍රහාරවලින් විනාශ වීම හා

[1070] එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරයාගේ හා මානුෂවාදී සම්බන්ධීකරකවරයාගේ කාර්යාලය, ජලය, සනීපාරක්ෂණය, සෞඛ්‍යය හා පෝෂණය, 2009 මාර්තු

[1071] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් වන්නියට ඇතුල්වීම මත වූ බරපතල සීමාවන් මගින් ලබාගත හැකි වෛද්‍ය සැපයුම් ප්‍රමාණයන් අඩුවීම යන ඒවා ය.

1002. එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල බොහෝ රෝහල් ආණ්ඩුව විසින් අරමුදල් සපයන ලද ඒවා වූ නිසා ඒවා විශාල වශයෙන් කොළඹ නිල මාර්ග හරහා ලබෙන සැපයුම් මත රඳා පැවතිණ. අවසානයේ ත්‍රිකුණාමලේ දී නාවික හමුදාව විසින් සැපයුම් නැව්වලට පැටවීමට පෙර අනුගමනය කරන ලද ඇණවුම් කිරීමේ, අනුමත කිරීමේ හා පරීක්ෂා කිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය අත්‍යවශ්‍ය සැපයුම්වල බරපතල හිඟයන් ඇති කිරීමට හේතු විය.

1003. සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය විසින් ඖෂධ හා වෛද්‍ය උපකරණ සපයන ලද්දේ ඒ ඒ දිස්ත්‍රික්කයේ කලාපීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා (RDHS) විසින් ආණ්ඩුවේ දිසාපතිවරයාට ඉදිරිපත් කරනු ලැබූ ත්‍රෛමාසික ඉල්ලීම් හා අනතුරුව ඔහු විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබූ එම ඉල්ලීම් මත පදනම්ව බව සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ. ස්ථාපිත පටිපාටියට අනුව වන්නියට සියලුම වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය කිරීමට පෙර ආණ්ඩුවේ දිසාපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශයෙන් පූර්ව අනුමතිය ලබා ගැනීම අවශ්‍ය විය. ආණ්ඩුව ඉල්ලා සිටින ලද සැපයුම්වල ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු කළ බව ද අනුමත කිරීම ප්‍රමාද කළ බව ද ඇතැම් විට බෙදා හැරීම කල්දැමූ බව ද ඒ අතර ඇතැම් අවස්ථාවලදී හමුදාව සමහර වෛද්‍ය සැපයුම් වන්නියට ගෙනයාමට අවසර දීම ප්‍රතික්ෂේප කළ බව ද සාක්ෂිකරුවෝ කමිටුට පැවසූහ.[1072] සැපයුම් කොළඹින් වවුනියාවට ප්‍රවාහනය කිරීමට අවසර දෙනු ලැබුව ද ඒවා හැම විටම වන්නියට ප්‍රවාහනය කර නැත.[1073] අනෙක් අයිතම මෙන්ම වන්නියට පාරෙන් ප්‍රවාහනය කරන ලද සියලුම වෛද්‍ය සැපයුම් ද ඕමන්තේදී වාහනවලින් බානු ලැබ හමුදාව විසින් පරීක්ෂා කරනු ලැබිණ. 2006 ඒ වන විටත් වන්නියේ සෞඛ්‍ය අංශය නරක ලෙසට හානියට පත්ව තිබූ බව ලෝක ආහාර වැඩසටහන වාර්තා කළේ යඃ පාලන වළල්ල හරහා අත්‍යවශ්‍ය කටයුතු සඳහා පාවිච්චි කිරීමට ඉන්ධන හා බෙත්හේත් ගෙන ඒමට සාමාන්‍යයෙන් අවසර දෙනු ලැබිණ. එහෙත් වත්මන් නීති අපැහැදිලි අතර සෞඛ්‍ය පහසුකම් සේවා ස්ථාන ජීවිතාරක්ෂක කටයුතු පවත්වා ගැනීමට පොර බදමින් සිටී.[1074]

1004. 2009 ජනවාරි සිට හමුදාව සෞඛ්‍ය අංශය හා වෛද්‍ය සැපයුම් මත වැඩි පාලනයක් පැනවීය. වෛද්‍ය සැපයුම් නැව්වලින් ප්‍රවාහනය කරනු ලැබූ විට සංකීර්ණ අනුමත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කෙරිණ. ගැටුම් කලාපයේ ආණ්ඩුවේ වෛද්‍ය පිරිස් වෛද්‍ය සැපයුම් සඳහා සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශයට ඉල්ලීමක් යැවීම අවශ්‍ය කෙරුණු අතර එම අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර ලබා ගත යුතු විය. අවසර ලබා ගැනීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශය වෛද්‍ය සැපයුම් ත්‍රිකුණාමලයට ප්‍රවාහනය කර ඒවා නාවික හමුදාවට භාර දිය යුතු විය. ඉක්බිතිව නාවික හමුදාව සැපයුම් පරීක්ෂා කර ආරක්ෂක අමාත්‍යාංශයෙන් තවදුරටත් සහතික කර ගැනීම ලබා ගත යුතුව තිබුණි. අනතුරුව නාවික හමුදාව ආණ්ඩුවේ

---

1072 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1073 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1074 හදිසි ආහාර සුරක්ෂිතතා ඇගයුම, වන්නිය, ශ්‍රී ලංකාව, ලෝක ආහාර වැඩසටහන 2006

වෛද්‍ය සැපයුම් පරීක්ෂා කර වන්නියට ප්‍රවාහනය කිරීම සඳහා නැව්වලට පැටවිය යුතුව තිබුණි.[1075]

1005. ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයට අනුව 2009 පෙබරවාරි 19 දින සිට මැයි 9 වෙනි දින දක්වා අවස්ථා නවයක දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නැව්වලින් ගෙනයන ලද ආණ්ඩුවේ වෛද්‍ය සැපයුම් සීමාසහිත ප්‍රමාණයන් වන්නියේ වෛද්‍ය පිරිස් විසින් ලබා ගනු ලැබ තිබේ.[1076] විශේෂයෙන්ම යුද තුවාලවලින් හා පිරිහෙමින් පැවති ජීවන තත්ත්වයන් විසින් ඇති කරන ලද රෝගවලින් පෙළෙන රෝගීන්ට ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය ජීවිතාරක්ෂක ලේ මළු, කෙටමයින් වැනි නිර්වින්දක හා ශෛල්‍ය බ්ලේඩ් තල සඳහා නැවත නැවතත් කරන ලද ඉල්ලීම් නොතකා ඒවා නැව් ගත කිරීමට අවසර දී නොමැත.[1077] ප්‍රතිජීවක, ලේටෙක්ස් අත්වැසුම්, වේදනා නාශක ඖෂධ හා වෙළුම් පටි වැනි අවසර දෙන ලද වෛද්‍ය සැපයුම් ප්‍රමාණයන් සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය විසින් අඩු කරන ලද බව ඔවුන් විශ්වාස කරන්නේ යයි ඇතැම් සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ.[1078]

1006. නිර්වින්දක සඳහා කරන ලද එක ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් සෞඛ්‍ය හා පෝෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා 2009 මාර්තු 17 දිනැති ලිපිය මගින් මෙසේ පවසයි: ''රෝගීන්ගේ ආරක්ෂාව සලකා බලා නිර්වින්දක යවනු ලබන්නේ ඒවා පාවිච්චි කිරීමට පුහුණු නිර්වින්දක වෛද්‍යවරුන් සිටින හා සැත්කම් කිරීමට ශල්‍ය වෛද්‍යවරුන් සිටින රෝහල්වලට පමණි. ඔබේ රෝහලේ ඔවුන්ගෙන් එක් අයෙකුවත් නොසිටින හෙයින් ඒවා සැපයීමට හැකියාවක් නොමැත.''[1079] යුද තුවාලකරුවන්ට ප්‍රතිකාර කරන වෛද්‍ය පිරිස්වලට ජ්‍යෙෂ්ඨ ශෛල්‍ය වෛද්‍යවරුන් ඇතුළත්ව සිටි බවත් ඔවුන්ගෙන් බොහෝ දෙනා ආණ්ඩුවේ රෝහල්වල සේවයේ යෙදී සිටි බවත් සාක්ෂිකරුවෝ විමර්ශන කමිටුවට කියා සිටියහ.

1007. වාර්තා වී ඇති පරිදි අවසර දෙන ලද භාණ්ඩ සැපයුම් තොගවලට එක් එක් අවස්ථාවල රෝගී වූවන්ගේ හා තුවාල ලැබූවන්ගේ අවශ්‍යතාවලට සුළු සබඳතාවක් පවතින ඖෂධ හා සැපයුම් එක් එක් ප්‍රමාණයන් අඩංගුකර තිබී ඇත. නිදසුන් ලෙස 2009 මාර්තු 3 වෙනි දින අවසර දී ඇත්තේ වෙනස් වෙනස් ප්‍රමාණයන්ගෙන් ඖෂධ වර්ග හතරක් පමණි. කාරණය පැහැදිලි කරමින් ඉල්ලා සිටින ලද ඖෂධ වර්ග 55 න් වර්ග පහක් පමණක් 2009 අප්‍රේල් 1 වෙනි දින නැවෙන් එව්වේ මන් ද යි කොළඹ වෛද්‍ය සැපයුම් කොට්ඨාස අධ්‍යක්ෂවරයාට පැහැදිලි කිරීමේ දී ත්‍රිකුණාමලේ කලාපීය වෛද්‍ය සැපයුම් අංශ (RMSD) ප්‍රධාන නිලධාරියා සඳහන් කළේ නාවික හමුදා නිලධාරීන් ''කාලය හිඟවීම හේතු කොට ගෙන කලාපීය වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබුණ ලැයිස්තුවේ අනෙක් අයිතම ප්‍රවාහනය කරන්නට නොහැකි වූ'' බව දැනුම් දුන්

1075 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1076 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, උතුරු පළාතේ කලාපීය වෛද්‍ය සැපයුම් කොට්ඨාසයේ හදිසි වෛද්‍ය සැපයුම් ලැයිස්තුව. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය, 2009 ජූනි 2, http://www.refworld.org/pdfid/4d89afd815c5.pdf; ආහාර හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මුහුදින් මුලතිව්වලට යැවීය, මානව හිමිකම් ඒකකය, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය 2009

1077 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1078 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1079 කමිටුවේ ලිපිය 2009 මාර්තු 17

බව ය. ප්‍රවාහනය නොකළ වෛද්‍ය සැපයුම්වලට අන්තශ් ශෛරික ප්‍රතිජීවක, අන්තශ් ශෛරික වේදනා සමනක හා වෙළුම් පටි ඇතුළත් විය.[1080]

1008. 2009 අප්‍රේල් 27 වෙනි දින නැවෙන් මාරු කරන ලද අවසර ලත් වෛද්‍ය සැපයුම්වලට අඩංගුව තිබුණේ ඉල්ලන ලද සැපයුම් ලැයිස්තුව තිබිය දී වර්ග 10 ක එන්නත් හා වර්ග දෙකක උපත් පාලන ඖෂධ පමණි.[1081]

1009. ඒ කාලයේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ මාධ්‍ය නිවේදන වෛද්‍ය සැපයුම්වල හිඟය අවධරණය කර දැක්විය. නිදසුන් ලෙස අප්‍රේල් 20 වෙනි දින එය ''හිර වී සිටින ජනයා වෙත කඩිනම්ව අවශ්‍යවී තිබෙන වෛද්‍ය සැපයුම් හා සනීපාරක්ෂක උපකරණ ප්‍රමාණය වැඩි කරන්නට අතිශය දැඩි ලෙස උත්සාහ කරමින්'' සිටි බව සඳහන් කළේ ය.[1082] එසේම එය ඉතාම අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම්වල උග්‍ර හිඟය හා සනීපාරක්ෂණයෙන් තොර තත්ත්වයන් හේතු කොට ගෙන තුවාල ආසාදනයන්ගේ අවදානම වැඩිවී තිබෙන බව අවධාරණයකර දැක්වීය. මැයි 7 වෙනි දින තවත් මාධ්‍ය නිවේදනයකින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ''එහි වෙසෙන ජනතාවගේ මූලික අවශ්‍යතා ආවරණය කරන්නට බෙදා දී ඉතිරිව තිබෙන ආහාර හා වෛද්‍ය සැපයුම් ප්‍රමාණවත් නොවන'' බව සඳහන් කළේ ය.

1010. විදුලි ජනක යන්ත්‍ර, ශීතකරණ හා ගිලන් රථ ක්‍රියාත්මක කරවීම ඉන්ධන අවශ්‍ය වූ බැවින් ඉන්ධන හිඟය මගින් රෝහල්වල වැඩ කිරීමේ ධාරිතාවට ද බාධා පැමිණියේ ය. 2007 අවසානය වන තෙක් කිලිනොච්චියේ රෝහල්වලට අවසර දී තිබුණේ ආණ්ඩුවේ දිසාපතිවරයා හරහා ඉන්ධන ලීටර 6,250 ක් ලබා ගැනීමට පමණක් බව සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ. 2008 ආරම්භයේ දී මෙම ප්‍රමාණය කිසිදු පැහැදිලි කිරීමකින් තොරව ලීටර 2850 දක්වා අඩුකරනු ලැබීය.[1083] එසේම වන්නියේ රෝහල්වලට ඉන්ධන යැවීමේ ප්‍රමාදයක් ද තිබුණි. නිදසුන් ලෙස 2008 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා සෞඛ්‍ය සේවා සඳහා ඉන්ධන සැපයුම් අනුමත කර නොමැති බව වාර්තා කෙරුණු අතර ප්‍රතිඵලයක් වශයෙන් සමහර ගිලන් රථ සේවාවන් නවතා ඇත.[1084] මෙය අදාළ රෝහල්වලදී හදිසි අවස්ථාවන් සඳහා ඉන්ධන ඉතිරි කර ගැනීමට සඳහා කළුවරේ තැබීමේ ක්‍රමයක් හඳුන්වා දීමට මග පෑදී ය.[1085] කමිටුව මගින් ලබා ගන්නා ලද

---

1080 කමිටුවේ ලිපිය 2009 අප්‍රේල් 2

1081 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1082 ශ්‍රී ලංකාව: පෙබරවාරි සිට ගැටුම් කලාපයෙන් 10,000 කට වැඩි පිරිසක් ඉවත්කර තිබේ. ICRC මාධ්‍ය නිවේදනය අංක 09/13, 2009 අප්‍රේල් 20; ICRC ගැටුම් කලාපයෙන් 495 ඉවත්කර ගනියි, ආහාර මෙට්‍රික් ටොන් 25 ක් බෙදයි, මාධ්‍ය නිවේදනය 09/93, 2009 මැයි 7

1083 IASC Situation Report#,140, 2009 අගෝස්තු 14-21 http:/reliefweb.int/sites/reliefweb.int/files/resources/AADCC7F5BCF3CBAC1574B000480D3D-Full_Report.pdf

1084 IASC Situation Report#,145, 2008 සැප්තැම්බර් 18-25 http:/reliefweb.int/sites/reliefweb.int/files/resources/5285B569C0A68021C12574D600427670-Full_Report.pdf

1085 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

තොරතුරුවලට අනුව 2009  වාහන කණ්ඩායම් සැපයුම් නතර කළ විට ගැටුම අවසන් වන තෙක් වන්නියට ඉන්ධන ගෙන යනු ලැබුවේ නැත.

1011. සිදුවෙමින් පැවති ගැටුම හා රෝහල් නිරන්තරව අන්තැන්වලට ගෙන යාමට සිදුවීම මගින් ඇති කළ ඉන්ධන හිඟයන් හේතුවෙන් රෝහල් හා වෛද්‍ය පහසුකම් ස්ථාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විදුලිය සැපයුමට ද බලපෑම් ඇති කළේ ය. එසේම ඉන්ධන හිඟය රෝගීන් ප්‍රවාහනය සඳහා ගිලන් රථ පාවිච්චිය ද සීමා කළේ ය.

1012. ගැටුම ආණ්ඩුවේ රෝහල් පිහිටා තිබුණු ප්‍රදේශ වට කොට සිදු කෙරුණ නිසා වෛද්‍ය පිරිස් රෝගීන්, උපකරණ හා බේත් හේත් ක්‍රමානුකූලව ආරක්ෂිත ප්‍රදේශවලට ගෙන ගියහ. රෝහල් ගෙන ගිය විට රෝහල් වටා වාසස්ථාන ඉදිකර ගෙන සිටි ජනයා ද ඒවා සමග ගියහ.

1013.  ශ්‍රී ලංකා හමුදාව ප්‍රදේශය අල්ලා ගනු ලැබූ විට වෛද්‍ය සැපයුම් ද ක්‍රමක්‍රමයෙන් නැතිවී ගියේ ය. මුල දී වෛද්‍ය පිරිස් වෛද්‍ය සැපයුම් හා උපකරණ විශාල ප්‍රමාණයක් අළුත් ස්ථානවලට ගෙන යාමට සමත් වූ අතර ඒවායින් රෝහල් හොඳට සමන්විතකර ගත හැකි විය.[1086] කෙසේ වුව ද ගැටුම ක්‍රමක්‍රමයෙන්  වර්ධනය වන විට රැස්කර ගෙන සිටි ඒවා ක්ෂය වන්නට විය. ඒ අර්ධ වශයෙන් අළුත් ස්ථානවලට සැපයුම් ගෙන යාම දුෂ්කර වූ නිසා ය. එක් සෞඛ්‍ය සේවකයෙකු කියා සිටියේ 2008 සැප්තැම්බර්වල කිලිනොච්චි රෝහල කිලිනොච්චියෙන් ගෙන යන විට ආරම්භයේ දී විශාල ට්‍රක් රථවලින් සැපයුම් ගෙන යාමට ඔවුන් සමත් වූ බව ය. 2009 මැයි මැද වන විට ඉතිරිව සිටි වෛද්‍ය කාර්ය පිරිස් ටික දෙනාට සැපයුම් රැගෙන යාමට හැකි වූයේ සුළු ප්‍රමාණයකි. ඔවුන් ඒවා රැගෙන ගියේ ෂොපිං බෑගවල ය. 2010 ජනවාරි අවසානයේ දී  කිලිනොච්චි රෝහල උදයාර්කාඩුවලින් ගෙන ගොස් අන්තැනක ස්ථාපනය කරන විට වෛද්‍ය කාර්ය පිරිස්වලට වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය කිරීමට නොහැකි වූ අතර ඒවා මග දෙපස හැර දමා යාමට සිදුව තිබුණි.[1087]

1014. රෝහල් අවට දැඩි ෂෙල් ප්‍රහාර එල්ල වූ විට රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා සපයා ගත හැකි වෛද්‍යවරුන්ගේ හා හෙදහෙදියන්ගේ සංඛ්‍යාව අඩු කෙරෙමින් වෛද්‍ය කාර්ය පිරිස් ද තුවාල ලැබීම හෝ මරණයට පත්වීම සිදු විය. අවස්ථා ගණනාවක දී ම වෛද්‍ය කාර්ය පිරිස්වලට පැය ගණනාවක් ඔවුන්ගේ බන්කර හැර යාමට නොහැකි වී ඇති අතර එක් අවස්ථාවක දී නැවතීමක් නොවූ ෂෙල් ප්‍රහාර නිසා මුළුමහත් දවසක්ම බන්කරවල රැඳී සිටීමට සිදුව ඇත.[1088] (සිවිල් ජනයා හා සිවිල් ස්ථාන කෙරෙහි එදිරිවාදිකම්වල බලපෑම ගැන XIII පරිච්ඡේදය බලන්න).

1015. ගැටුමේ තීව්‍රතාවය සමග වෛද්‍ය කාර්ය පිරිස් කුඩා සංඛ්‍යාවක්  හා සොච්චම් වෛද්‍ය සැපයුම් මත දැවැන්ත පීඩනයක් පටවමින් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය කරන යුද්ධය හා බැඳි තුවාල සහිත රෝගීන්ගේ සංඛ්‍යාව වැඩි විය. අතරින් පතර ලැබෙන  විරාමයන්හි දී වන්නියට වෛද්‍ය සැපයුම් යවනු ලැබූ අතර වැඩි වෙමින් පැවති තුවාල ලත් හා රෝගාතුර වූ රෝගීන් සංඛ්‍යාවට ප්‍රතිකාර කිරීමට වෛද්‍ය සැපයුම් ප්‍රමාණයන් ප්‍රමාණවත් වූයේ නැත. නිදසුන් ලෙස ප්‍රතිජීවක හා

[1086] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, ලිපි ගොනුවේ දිවුරුම් ප්‍රකාශය ඇත
[1087] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
[1088] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

අන්තශ් ශෛරික ආවිලයින උපකරණ හිඟය හේතු කොට ගෙන ළදරුවකුගේ මවක් ඇගේ පාදයේ තුවාලයක් ආසාදනය වී ලේ විෂ වීමෙන් මිය ගිය බව සාක්ෂිකරුවෙකු කමිටුවට පැවසීය.[1089] එමෙන්ම වෛද්‍ය කාර්ය පිරිස්වලට ඔවුන් ප්‍රතිකාර කිරීම පිණිස දුෂ්කර තෝරා ගැනීම් කිරීමට සිදුව තිබිණ. [1090]

1016. රෝහල්වලට ප්‍රමාණවත් ගබඩා පහසුකම් හා ශීතකරණ සඳහා ඉන්ධන නොතිබුණි.[1091] ලේ දන්දෙන්නන්ගේ හා රුධිර බෑගවල හිඟය පාරවිලයනය සඳහා රුධිරය එකතු කිරීම වැළකීය. ගැටුම ඉතාමත්ම තීව්‍ර වූ විට ලේ දන් දෙන්නන්ට රෝහල්වලට පැමිණීම හා වෛද්‍ය කාර්ය පිරිස්වලට රුධිරයේ යෝග්‍යතාව හා රෝග පරීක්ෂා කිරීම දුෂ්කර විය. ප්‍රතිඵලයක් වශයෙන් වෛද්‍ය කාර්ය පිරිස් සමහර විට රෝගියාගේ ශරීර කුහරයේ එක්රැස්වී තිබුණු රුධිරය ජීවානුහරණය කරන ලද පිස්නාවකින් එකතු කර ගෙන ජීවානුහරණය කරන ලද බහාලුවකට මාරුකර පසුව රෝගියාට පාරවිලයනය කරන ක්‍රමයක් වන ස්වයං-පරාවිලයනය කළහ.[1092]

1017. එකතුකර ගන්නා ලද තොරතුරුවලට අනුව නිර්වින්දක හිඟය හේතු කොට ගෙන වෛද්‍ය කාර්ය පිරිස් කිසිදු නිර්වින්දකයක් භාවිතා නොකර මාංශ තුවාලවලින් බෝම්බ කැබලි ඉවත් කිරීම වැනි ඇතැම් සුළු ශල්‍යකර්ම කළහ.[1093] ගැටුම අවසන් වීමට දින කිහිපයකට පෙර කරන්නට තිබුණ සිසේරියානු සැත්කමක දී නිද්‍රාවට පත් කරන නිර්වින්දක සැපයුණු අතර ඒවා යොදා ගත් බව කමිටුව තහවුරුකර ගෙන තිබේ.[1094]

1018. රතු කුරුස කමිටුව  වන්නියෙන් පිටතට පාරෙන් හෝ නැව්වලින් ප්‍රවාහනය කර ජීවිතාරක්ෂාවරණය නොසැලසුවේ නම් හදිසි වෛද්‍ය අවධානය අවශ්‍ය කරන රෝගීන් බොහෝ දෙනෙකු මිය යාමට ඉඩ තිබුණි. 2009 ජනවාරි අවසානයේ ගොඩ බිම හරහා කෙරෙන සියලු ප්‍රවේශයන් අවහිර කරන තෙක් රතු කුරුස කමිටුව නිතිපතා වවුනියාවේ රෝහල්වලට මහ පාරෙන් රෝගීන් මාරු කිරීමේ කටයුතු සංවිධානය කළේ ය. සාක්ෂිකරුවන්ට අනුව සමාන්‍ය භාවිතය වූයේ රෝගීන් හා ඔවුන් සමග යන සාත්තු සේවා සපයන්නන් (බලා ගන්නන් ලෙස ප්‍රකට) සඳහා වෛද්‍යවරයෙකුගෙන් ලිපියක් ලබාගෙන අනතුරුව එය අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා එල්ටීටීඊයට ඉදිරිපත් කිරීම ය. එසේම  පාරෙන් ප්‍රවාහනය කරනු ලබන සියලු රෝගීන් හා බලා ගන්නන්  ඕමන්තේ දී ශ්‍රී ලංකා හමුදාවේ අනුමතිය ලබා ගැනීමේ පටිපාටිය ඔස්සේ ද යා යුතුව තිබිණ. 2008 සැප්තැම්බර් හා 2009 ජනවාරි අතර මානුෂවාදී වාහන කණ්ඩායම්වල කොටසක් වශයෙන් රතු කුරුස කමිටුව රෝගීන් ප්‍රවාහනය කිරීම දිගටම කරගෙන ගියේ ය.

1019. කෙසේ වුව ද ඇතැම් අවස්ථාවල වාහන කණ්ඩායම්වලට අවහිර කිරීම හදිසි වෛද්‍ය අවධානය අවශ්‍ය කෙරුණ රෝගීන් සති ගණනාවක් ප්‍රමාද කෙරිණ. 2009 ජනවාරි 29 වෙනි දින වන්නියට ඇතුළු වූ අවසාන වාහන කණ්ඩායම තුවාල ලත් හා රෝගී වූ රෝගීන් 226 දෙනෙකු

1089 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1090 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ, ICRC මාධ්‍ය නිවේදන
1091 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1092 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1093 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1094 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

වන්නියෙන් වවුනියාව රෝහලට ප්‍රවාහනය කිරීමට සමත් විය.[1095] 2009 පෙබරවාරි 10 වෙනි දින නැවෙන් ඉවත ගෙන යාම ආරම්භ කෙරිණ. රතු කුරුස කමිටුව එහි සෑම ගමනක දී ම රෝගීන් හා කැටුව යන සත්කාරකයින් 500 ක සාමාන්‍යයක් ගෙන යනු ලැබීය. 2009 පෙබරවාරි 10 සහ අප්‍රේල් 30 අතර ඔවුන් අසනීප වූ හා තුවාල ලත් රෝගීන් හා කැටුව යන සත්කාරකයින් 13,000 කට වඩා ඉවත් කර ගෙන ගොස් තිබේ.[1096]

1020. සක්ෂිකරුවන්ගේ සාක්ෂි පෙන්නුම් කරන්නේ වන්නියේ වෛද්‍ය කාර්ය පිරිස් හා ස්වෙච්ඡා සේවකයින් ගැටුම සමයේ තුවාල වූ දහස් ගණනක් සිවිල් වැසියන්ට වෛද්‍යාධාර ලබා දීමට වෙහෙස නොබලා වැඩ කළ බව ය. ඔවුහු බහුත්ව ස්ථාන මාරු කිරීම්, නොවතින ෂෙල් ප්‍රහාර හා ඖෂධ හා වෛද්‍ය සැපයුම්වල දරුණු හිඟයන් සහිත ඇදහිය නොහැකි දුෂ්කර තත්ත්වයන් යටතේ වැඩ කළහ. වෛද්‍ය පහසුකම් ක්ෂය වී ගිය හැම අවස්ථාවකම ඔවුන්ට ඒ තැන්වලින් යාමට සිදු විය. අවසානයේ දී වෛද්‍ය කාර්ය පිරිස් සමත් වූයේ ප්‍රථමාධාර සැපයීමට පමණි.

1021. එහෙත් ගැටුම අවසානයේ දී ඔවුන්ගේ ජීවිත අවදානමට තබා සිය වැසියන්ට වෛද්‍ය සේවා සපයනු ලැබූවන් අධිකාරීන් විසින් රැඳවුම් භාරයේ තබනු ලැබීය.

1022. වන්නියේ උග්‍ර වෙමින් පැවති බරපතල මානුෂ තත්ත්වය හා රෝහල්වලට හා තාවකාලික වෛද්‍ය සේවා ස්ථානවලට එල්ල කළ ෂෙල් ප්‍රහාරයන්ගේ බලපෑම පිළිබඳ දැනුවත්බව තිබියදීත් ආණ්ඩුව හා ආරක්ෂක හමුදා ඇතැම් ජීවිතාරක්ෂණ සැපයුම් ඇතුළුව හදිසි වෛද්‍ය සැපයුම් යැවීමට අවසර දීම ප්‍රතික්ෂේප කළේ ය. එසේම ආණ්ඩුව ෂෙල් ප්‍රහාර මගින් වෛද්‍ය කාර්ය පිරිස්වල හා පහසුකම්වල ආරක්ෂාව සහතික කිරීමට අසමත්ව ඇත.

## XVI ආවෘත කඳවුරුවල අභ්‍යන්තර අවතැන් වූවන් තීව්‍ර පිරික්සුමට භාජනය කිරීම හා නිදහස අහිමි කිරීම

### හැඳින්වීම

1023. එල්ටීටීඊය විසින් පනවන ලද යාම් ඊම් පිළිබඳ සීමා තිබියදීත් 2009 පෙබරවාරිවල සිට එල්ටීටීඊ-පාලිත ප්‍රදේශයේ සිට සිවිල් ජනයාගේ සමූහ නික්මීම ක්‍රමක්‍රමයෙන් වැඩියාම ආරම්භ වී තිබූ නමුත් බුරුතු පිටින් ගලා යන්නට පටන් ගත්තේ ශ්‍රී ලංකා හමුදාව අප්‍රේල් 20 වෙනි දින එල්ටීටීඊ ආරක්ෂක වළල්ල හා පුදුමාතලන්හි දෙවන යුද මුක්ත කලාපය කපා දැමීමෙන් දින කීපයකට පසු ය. එයින් පසු සිය අවි බිම තබා සිටි එලටීටීඊ සටන්කරුවන් ඇතුළු සිවිල් වැසියන් 100,000 කට වැඩි දෙනෙක් ආණ්ඩුවේ පාලිත ප්‍රදේශයට පැමිණියහ. ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව මැයි 15 සහ 20 අතර සමස්ත ජන සංඛ්‍යාව 284,000 පමණ මට්ටමකට ගෙන එමින් තවත් දස දහස් ගණනින් අවසන් සටන් කලාපයේ සිට ආණ්ඩුවේ පාලිත ප්‍රදේශයට පැමිණ ඇත.[1097]

---

1095 ICRC මාධ්‍ය නිවේදනය 09/25, 2009 ජනවාරි 29

1096 ICRC බුලටිනය, 03/2009, ICRC වාර්ෂික වාර්තාව 2009

1097 ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් ප්‍රගතිය, විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය 2010 සැප්තැම්බර්

1024. මැයි 14 වෙනි දින සිට ශ්‍රී ලංකා හමුදා සෙබළුන් මෙගාෆෝනවලින් කළ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙනු ලැබ සිවිල් වැසියෝ දස දහස් ගණනින් ශ්‍රී ලංකා හමුදා පිහිටුවුම් පෙළ ගැසී තිබුණු A 35 මාර්ගය දිගේ සෙමින් සෙමින් ප්‍රධාන මාරුවීම් ස්ථානවලින් එකක් වූ වඩ්ඩුවකාල් පාලම දෙසට ඇවිද ගෙන ගියහ. ගැලවීගත් එල්ටීටීඊ සටන්කරුවන්ගෙන් බොහොමයක් ඔවුන්ගේ නිල ඇඳුම් ඉවත ලා, ආයුධ හා අනෙකුත් යුද ආම්පන්න බිම දමා සිවිල් ඇඳුම් ඇඳ සිටියහ. අනෙක් එල්ටීටීඊ දේශපාලන කාඩර්වරුන් සමග එකට ඔවුහු ඔවුන්ගේ පවුල් සමග සෙනග අතරේ ඇවිද ගෙන ගියහ.[1098]

1025. කලපුවේ පාවෙමින් තිබූ මළ සිරුරු බල බලා පාලම දෙසට පාර දිගේ විසුරුවා තිබුණු සිය ගණන් මළ කඳන් අතරින් ඇවිද යාමට සිදු වූ අයුරු සාක්ෂිකරුවෝ විස්තර කළහ. ඔවුන්ගෙන් බොහෝ දෙනා ගැටුම සමයේ බොහෝ වාරයක් අවතැන්ව සිටියවුන් වූ අතර බොහොමයකට ඔවුන්ගේ පෞද්ගලික සන්තකයන් අහිමිව තිබිණ. බොහෝ දෙනා ප්‍රමාණවත් ආහාර නොමැතිවීමේ ප්‍රතිවිපාකයන්ගෙන් පීඩා විඳිමින් සිටි අතර අභ්‍යන්තර අවතැන්වූවන් අතර සිටි බොහෝ දෙනා ෂෙල් ප්‍රහාර හා සුළු අවි ප්‍රහාරවල ප්‍රතිඵල වශයෙන් තුවාල ලබා සිටියහ. පවුල් සාමාජිකයින් විසින් ඔවුන් ද අතිශයින් දුබලව සිටි නිසා දුබල, වයසක ඥාතීන් අත්හැර දමනු ලැබ ගියේ කෙසේ ද යන්න ඇතැම් සාක්ෂිකරුවෝ විස්තර කළහ. [1099]

1026. රෝගී හෝ තුවාල වූ පුද්ගලයෝ ආධාර ඉල්ලා ආයාචනා කළ අන්දම අන්‍යයෝ විස්තර කළහ. තුවාල වූ හෝ ආබාධිත පුද්ගලයින්ට ගමන යාමේ දී සැලකිය යුතු දුෂ්කරතා තිබුණි. ඇතමුන් පවුල් සාමාජිකයින් විසින් රෝද පුටුවල තබා ගෙන තල්ලුකර ගෙන ගිය අතර අනෙක් අය කිහිලිකරුවල ආධාරයෙන් සෙනග අස්සේ ඇවිද ගෙන යන්නට උත්සාහ කළේ කෙසේදැයි විස්තර කළහ.[1100] ඇතැම් පුද්ගලයෝ ඔවුන් පාරෙන් ඉවතට පැනීමට සිදු වූ විට බිම්බෝම්බ පුපුරා මරණයට පත් වූහ. නැතහොත් තුවාල ලැබූහ.[1101]

1027. වඩ්ඩුවකාල් පාලම තරණය කිරීමෙන් පසු සෙනගට මුලතිව් නගරය අසල කටු කම්බිවලින් වටකොට තිබුණ විශාල ප්‍රදේශයකට ළඟා වීමට පෙර ශ්‍රී ලංකා හමුදාවේ සෙබළුන් විසින් පෙන්වන ලද මාර්ගය දිගේ කිලෝ මීටර දෙකේ සිට තුන දක්වා දුරක් ඇවිදීමට සිදුව තිබිණ.[1102] මෙය අභ්‍යන්තර අවතැන් වූවන් යා යුතුව තිබුණු වැටවල් තුනකින් වට කොට තිබුණු පළමු ප්‍රදේශය හා බහුවිධ ආරක්ෂක, සෝදිසි හා ලියා පදිංචි කිරීමේ ක්‍රියාලීන්ගේ ආරම්භය විය.

1028. ආහාර හා ජලය ප්‍රමාණවත් නොවූ බව හා ඒවා බොහෝ විට ට්‍රක් රථවල පිට පස්සේ සිට ජනයා වෙතට වීසි කිරීම හෝ පහසුවෙන් විපතයට පත් විය හැකි බොහෝ දෙනාට ඒවා ලබා ගැනීමට දුෂ්කර අන්දමින් වෙනත් ගර්හිත ආකාරයන්ගෙන් බෙදා හැරීම කළ බව සක්ෂිකරුවෝ පැවසූහ.[1103] අභ්‍යන්තර අවතැන් වූවන්ට අතපය සෝදා ගනීමේ හෝ වැසිකිලි

---

1098 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1099 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1100 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1101 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1102 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1103 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

පහසුකම්ලට ප්‍රවේශය නොතිබුණි.[1104] දස දහස් ගණන් දෙනාට වාසස්ථාන නොවීය. ඔවුන් බොහෝ දෙනෙකුට දවස් තුනක් එළිමහනේ සිටීමට සිදු විය. කෙසේ වුව ද සාක්ෂිකරුවන්ට අනුව බරපතල ලෙස තුවාල වූවන් හෝ රෝගී වූවන් වෙන් කර වෛද්‍ය පහසුකම් ස්ථානවලට ගෙන ගොස් තිබුණ ද අනතුරුව ඇතැමුන් රැඳවුම් ස්ථානවලට ගෙන ගොස් තිබිණ.[1105]

1029. මෙම කොටස අභ්‍යන්තර අවතැන් වූවන්ට මුහුණ පෑමට සිදු වූ සුළමුල පරීක්ෂා කිරීමේ තීව්‍ර පිරික්සුම් ක්‍රියාවලීන් හා අනතුරුව ආවරණය කරන ලද කඳවුරුවල ඔවුන්ගේ නිදහස අහිමි කිරීම පැහැදිලි කරයි. මාස බොහෝ ගණනකට පසුව ආණ්ඩුව යාම් ඒම් සීමාවන් ලිහිල් කරන්නට හා විශාල සංඛ්‍යාවකට නැවත පදිංචිවීම් සඳහා අවසර ලබා දෙන්නට පටන් ගන්නා තෙක් යථාර්ථයේ දී නීතිමය පදනමකින් තොරව ඔවුන්ගේ නිදහස ඔවුන්ට අහිමිකර තිබේ.

1030. ආණ්ඩුව යාපනයේ, මන්නාරමේ හා වවුනියාවේ විවිධ ස්ථානවල රැඳවුම් කඳවුරු පිහිටු වුව ද විමර්ශන කමිටුවේ විමර්ශනය මූලික වශයෙන් කේන්ද්‍රගත වී තිබෙන්නේ 2009 අප්‍රේල්වල හා 2012 සැප්තැම්බර් අතර අත්‍යන්තයෙන්ම විශාලතම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සංකේන්ද්‍රණය අඩංගුකර ගත් වවුනියාවේ මැනික් ෆාම්වල තත්ත්වය කෙරෙහි ය. අවසානයේ දී එය වසා දමන විට එහි ඉහළම සංඛ්‍යාව වූ 220,000 ක් පමණ රඳවා සිටියේ ය.

1031. මෙම කොටස 2009 මැයි මැද ගැටුම අවසානයේ දී වන්නියෙන් පැමිණයවුන්ගේ හා ගැටුම අවසාන වීමට පෙර එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පලා ආ අනෙකුත් සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි මත විස්තෘත වශයෙන් පදනම් වේ. කමිටුව අතිරේක වශයෙන් මානුෂවාදී ක්‍රියාධරයින් සමග සම්මුඛ සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, ආණ්ඩුවේ හා එක්සත් ජාතීන්ගේ වාර්තා හා අනෙකුත් විවෘත මූලාශ්‍ර සාක්ෂි ලබා ගෙන තිබේ.

**ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ලද පරිපාලනමය රැඳවුම් භාරය**

1032. මානව හිමිකම් නීතිය නිදහස අහිමි කිරීම ඇතුළුව ඔවුන්ගේ නිදහසට නීති විරෝධීව හෝ අත්තනෝමතිකව හෝ අතපෙවීමට එරෙහිව සියලුම පුද්ගලයින් ආරක්ෂා කරයි.[1106] එසේම නිදහස අත්තනෝමතික ලෙස අහිමි කිරීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ද තහනම් කෙරේ. සිවිල් වැසියන්ට හා තුවාල ලබා හෝ අසනීප වීම නිසා සටන් කළ නොහැකි තත්ත්වයට පත්ව සිටින පුද්ගලයින්ට (*hors de combat*) මානුෂීය අන්දමින් සැලකිය යුතුය යන ආවශ්‍යකතාව තුළ එවැනි තහනමක් හඟවනු ලැබේ.[1107] සන්නද්ධ ගැටුම් තත්ත්වයක් තුළ අත්තනෝමතිකව හෝ නීතිවිරෝධීව නිදහස අහිමි කිරීම ලෙස ගණන් ගනුයේ කුමක් ද යන්න තීරණය කරනු ලබනු ඇත්තේ මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යන දෙකටම අදාළව ය.

---

1104 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1105 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1106 9 වගන්තිය, ICCPR, මානව හිමිකම් කමිටුව ''අත්තනෝමතික'' යන්න අර්ථ නිරූපණය කරනු ලබන්නේ ''අයෝග්‍යබව, අයුක්තිය, නීතියේ පූර්වානුමේයතාවයේ හා නිසි ක්‍රියාවලියේ අඩුව''ඇතුළත් පුළුල් අරුතකිනි.

1107 99 නීතිය, සිරිත් බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ICRC දත්ත ගබඩාව

1033. අධිකරණයක් විසින් අපරාධ නඩුවක් සඳහා හෝ දඬුවමකට පසුව හෝ පුද්ගලයෙකු රඳවා තැබීමේ කාර්යය සඳහා රැඳවුම් භාරයේ තැබීමට අමතරව අධිකාරීන්ට අපරාධ චෝදනාවක් පිළිබඳව අභිචෝදනය ගැන සිතා බලන්නේ නැතිව පරිපාලනමය රැඳවුමක් පැනවිය හැකි ය. මේ සම්බන්ධයෙන් ගත් කල මානව හිමිකම් කමිටුව පරිපාලනමය රැඳවුම් භාරය නිදහස අත්තනෝමතිකව අහිමි කිරීමේ බරපතල අවදානම් ඉදිරිපත් කරන බව සහ එය සාධාරණීය කළ හැකි වනු ඇත්තේ පුද්ගලයෙකු ''දෘශ්‍යමාන, ඍජු හා අනිවාර්ය තර්ජනයක්'' ඉදිරිපත් කිරීමෙහිලාවන ඉතාමත්ම සුවිශේෂිත තත්ත්වයන් යටතේ බව අවධානයට ලක් කර ඇත.[1108] එවැනි සිද්ධීන්වල දී පුද්ගලයා එවැනි තර්ජනයක් ඉදිරිපත් කරන්නේ ය හා එම තත්ත්වය විකල්ප පියවර මගින් ප්‍රතිඵලදායී ලෙස ආමන්ත්‍රණය කළ නොහැකි ය යන්න පෙන්වා දීම ඔප්පු කිරීමේ බර වැටෙන්නේ අධිකාරීන් මත ය. රඳවා තැබීමේ දීර්ඝතාව සමග මෙම බර වැඩිවන බව කමිටුව තවදුරටත් අවධාරණය කළේ ය.[1109]

1034. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9 (2) වගන්තිය යටතේ ඔවුන්ගේ නිදහසට අහිමිකර තිබෙන ඕනෑම අයෙකුට ඔවුන් රැඳවුම් භාරයේ තබා ගැනීමේ හේතුව හා ඔවුන්ට ඇති යම් චෝදනා තිබේ නම් ඒවා අප්‍රමාදව දැනුම් දිය යුතු ය යන එහි බැඳීමෙන් ශ්‍රී ලංකාව මග හැර ගොස් තිබෙන අතර මගහැර යාම 9(2) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම සම්පූර්ණයෙන් අත්හිටුවනවා නොව තත්ත්වයන්ගේ අවදානම් මගින් දැඩි සේ අවශ්‍ය කරන තාක් දුරට එවැනි ප්‍රමාදයක් පුද්ගලයින්ට දැනුම් දීම ප්‍රමාද කිරීමක් සඳහා අවකාශ ලබා ගැනීමට ඒවා හැඩ තලා ගන්නවා පමණි.

1035. ඔවුන්ගේ නිදහස අහිමි කිරීම සඳහා වූ හේතු පැවතීම නැවතුණ වහාම ඔවුන්ගේ නිදහසට අහිමි කරනු ලැබ තිබෙන පුද්ගලයින් නිදහස් කළ යුතු ය.[1110]

1036. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් මත පනවන ලද පරිපාලනමය රැඳවුම්භාරයට අදාළ අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මග පෙන්වීමේ මූලධර්ම[1111] ඒකාන්ත වශයෙන් අවශ්‍ය වන විට හා තත්ත්වයන් විසින් ඉල්ලා සිටින කාලයක් සඳහා පමණක් වන සුවිශේෂමය තත්ත්වයන් යටතේ මිස අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් කඳවුරුවල රඳවා තැබීම හෝ සිරකර තැබීම නොකළ යුත්තේ යයි අවධාරණය කරයි.[1112] හුදෙක් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් ලෙස වන ඔවුන්ගේ තත්ත්වය පදනම් කර ගෙන අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට ඔවුන්ගේ නිදහස අහිමි කිරීම අත්තනෝමතික රඳවා තැබීම හා සමානවන අතර එය තහනම් කෙරේ. තව ද අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යාම් ඊම් සඳහා ඇති අයිතිය සහතික කිරීමට එවැනි පුද්ගලයින්ට කඳවුරුවලින් හෝ අනෙකුත් පදංචි ස්ථානවලින් නිදහසේ ඇතුළට හා පිටතට යාම් ඊම් කිරීමේ අයිතිය තිබිය යුතු ය.[1113]

---

1108 බලන්න, පොදු විවරණය 35, ඡේදය 15 උදා. අවසාන නිරීක්ෂණ කොලොම්බියාව 2010 ඡේදය 20; ජෝර්දානය 2010 ඡේදය 11. එදිරිවාදිකම්වල ඍජුව සහභාගිවන පුද්ගලයෙකු විසින් විවාද සම්පන්න ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි එවැනි තර්ජන

1109 පොදු විවරණය 35, ඡේදය 15

1110 පොදු විවරණය 35, සිරිත් බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ICRC දත්ත ගබඩාව, 128 නීතිය

1111 E/CN.4/1998/53/Add.2

1112 12 මූලධර්මය

1113 14 මූලධර්මය

අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට ඔවුන්ගේ අවතැන්වීම සඳහා වූ හේතූන් පැවතීම නතර වූ වහාම ඔවුන්ගේ සුපුරුදු නේවාසික ප්‍රදේශවලට ස්වේඡාවෙන් හා ආරක්ෂිතව ආපසු පැමිණීමේ අයිතියක් තිබේ.[1114]

**මුලතිව් හා ඕමන්තේ දී සුලමුල සෙවීමේ තීව්‍ර පිරික්සුම් ක්‍රියාවලීන්**

1037. ආණ්ඩුවට අභ්‍යන්තර අවතැන් වූ පුද්ගල කඳවුරුවල සිවිල් ජන හා මානුෂවාදී ස්වභාවය පවත්වා ගැනීම හා අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතතාව සහතික කිරීම පිණිස අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ සුලමුල සෙවීමේ බැඳීමක් හා හිටපු එල්ටීටීඊ සටන්කරුවන් වෙන් කිරීමේ බැඳීමක් තිබුණි. එසේම එය ඔවුන්ගේ ක්‍රියාවන්ට වගකිව යුතු ජාතික හා ජාත්‍යන්තර නීති උල්ලංඝනය කර තිබෙන අයවලුන්ව අල්ලා ගැනීමේ අත්‍යවශ්‍ය පළමු පියවරකි. කෙසේ වුව ද සුලමුල පරීක්ෂා කිරීමේ ක්‍රියාවලීන් කර ගෙන යන ලද ආකාරය මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට අපොහොසත් වී ඇති අතර අනිසි සැලකීම හා අපයෝජනය සුසාධ්‍ය කර තිබේ.

1038. සටන්කරුවන් වෙන් කර ගැනීම සම්බන්ධව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ මාර්ගෝපදේශ එම ක්‍රියාවලිය නිර්වචනය කරන්නේ ''පුද්ගලයා සිවිල් ජනතාවන්ගෙන් වෙන්කර රැඳවුම් භාරයේ තැබිය යුතු නම් ඒ බව තහවුරු කර ගැනීම පිණිස පුද්ගලයෙකු සටන්කරුවෙකු විය හැකි බවට දක්වෙන ලබාගත හැකි සියලු සාක්ෂි නිසි අධිකාරියක් විසින් පරීක්ෂා කරනු ලබන ක්‍රියාවලියක්'' යනුවෙනි.[1115] මාර්ගෝපදේශ සටන්කරුවන් හඳුනා ගැනීම සඳහාවන ක්‍රියාවලියට පහත සඳහන් ඒවා ඇතුළත් විය යුතු බව ප්‍රකාශ කරයි:

1039. සටන්කරුවෙකු ලෙස පුද්ගලයෙකු හඳුනා ගැනීමේ තීරණ විමර්ශනය කිරීම පිණිස අනෙක් ඒවා අතර ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ බලය සහිත මණ්ඩලයක් පිහිටුවීම;

1040. පුද්ගලයෙකු සටන්කරුවෙකු ලෙස සැලකීම සඳහාවන පැහැදිලි නිර්නායකයක් ඇතුළු පැහැදිලි මෙහෙයුම් පටිපාටි ස්ථාපිත කිරීම, තීරණ ගැනීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම හා තීරණ විමර්ශනය කිරීමේ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම;

1041. වෙන් කිරීමේ ක්‍රියාවලිය සඳහාවන හේතු, ක්‍රියාත්මක කරන පටිපාටි හා සටන්කරුවන් ලෙස හඳුනා ගනු ලැබූ පුද්ගලයින්ට විය හැකි ප්‍රතිවිපාක පැහැදිලි කිරීමේ පැහැදිලි හා සංක්ෂිප්ත තොරතුරු සැපයීම;

1042. සන්නද්ධ හමුදා හෝ සන්නද්ධ කණ්ඩායම් සමග සම්බන්ධ වී ඇති ළමුන් පිළිබඳ මූලධර්ම හා මාර්ගෝපදේශ (පැරිස් මූලධර්ම වශයෙන් ප්‍රකට) සටන්කරුවන් හෝ සහායක කාර්යයන්හි නියැලෙන යන කුමන තත්ත්වකින් වුව සන්නද්ධ හමුදා හෝ සන්නද්ධ කණ්ඩායම්

---

[1114] සිරිත් බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ICRC දත්ත ගබඩාව, 132 නීතිය

[1115] රක්ෂණස්ථානයේ සිවිල් හා මානුෂීවාදීබව පවත්වා ගැනීම පිළිබඳ UNHCR මාර්ගෝපදේශ, 2006 සැප්තැම්බර්, http://www.refworld.org/pdf452b9ca2.pdf

සමග සම්බන්ධ වී ඇති වයස 18 ට අඩු ළමුන් නිදහස් කිරීම හා සමාජයට යළි එක් කිරීම සඳහාවන විශේෂිත මාර්ගෝපදේශ දක්වා තිබේ. (ළමුන් බඳවා ගැනීම හා උපයෝජනය පිළිබඳ XII පරිච්ඡේදය බලන්න).

1043. එල්ටීටීඊ සමග සටන් විරාම හෝ සාම ගිවිසුමක් නොතිබෙන තත්ත්වයක් තුළ බොහෝ විට ගැටුමක් අවසානයේ දී සිදුවන පරිදි එල්ටීටීඊය සමග සම්බන්ධ වී සිටි සටන්කරුවන් හෝ අනෙකුත් පුද්ගලයින් නිරායුධ කිරීමේ, විසුරුවා හැරීමේ හා සමාජයට යළි එක් කිරීමේ විධිමත්, මනාව නිර්වචනය කරන ලද ක්‍රියාවලියක් තිබුණේ නැත. ඒ වෙනුවට එල්ටීටීඊය සමග කිසියම් ආකාරයක සම්බන්ධතා තිබෙන ඕනෑම අයෙකු හඳුනා ගැනීම පිණිස ආණ්ඩුව කටයුතු ආරම්භ කළේ පාරදෘශ්‍ය නිර්ණායකයන් හෝ පටිපාටි අර්ථ නිරූපණ නොමැති වූ හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට අසමත් වූ සුළුමුල සොයා ගැනීමේ ක්‍රියාවලීන් මත ය. ක්‍රියාවලිය සටන්කරුවන් හා දේශපාලන හෝ පරිපාලන කාර්යධරයන් අතර වෙන් කර ගැනීමේ ක්‍රියාවලියක් නොවීය. එල්ටීටීඊයට කිසියම් හෝ සම්බන්ධයක් තිබූ පුද්ගලයින් ඔවුන් විසින් ම හඳුනා ගනු ලබනු ඇතැයි අපේක්ෂා කෙරිණ. ආණ්ඩුවට ඉදිරිපත් කළ එහි ඉල්ලීම තිබියදීත් සිවිල් වැසියන් හා එල්ටීටීඊ සටන්කරුවන් ලෙස සැක කළ හෝ හඳුනාගත් පුද්ගලයින් වෙන් කිරීමට යොදාගත් නිර්ණායක හා පටිපාටි පිළිබඳ කිසිදු තොරතුරක් කමිටුවට ලැබුණේ නැත.

1044. ගැටුම් කලාපයෙන් පැමිණි සෑම පුද්ගලයෙක්ම ශ්‍රී ලංකා හමුදාවේ ආරක්ෂක පරීක්ෂා කිරීම්, සුළුමුල සෝදිසි කිරීමේ ස්ථාන හා අල්ලාගෙන සිටින ප්‍රදේශ දාමයක් ඔස්සේ පැමිණිය යුතුව තිබිණ. අනතුරුව අභ්‍යන්තර අවතැන් පුද්ගලයින්ගේ කඳවුරු තුළ ද ඒ හා සමාන සුළුමුල සෝදිසි හා පරීක්ෂා කිරීම් කරනු ලැබිණ.

1045. ආණ්ඩුව විසින් ස්ථාපිත කරනු ලැබ හා මුලතිව් හෝ ඕමමන්තේ ප්‍රධාන සෝදිසි ස්ථානවලදී අභ්‍යන්තර අවතැන් වූ පුදගලයින් සෝදිසි කිරීම හා ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා හමුදාව විසින් කර ගෙන යනු ලැබ තිබුණ ක්‍රියාවලිය පිළිබඳ කිසිදු ස්වාධීන අධීක්ෂණ පියවරක් නොවීය. යාවත්කාල ගිවිසුමක් හා නැවත නැවතත් කරන ලද ඉල්ලීම් තිබියදීත් ජාත්‍යන්තර නියෝජිතායතනවලට මෙම සෝදිසි ස්ථානවලට හෝ පසුව මැනික් ෆාම්වලට හෝ සම්පූර්ණ හෝ අඛණ්ඩ ප්‍රවේශය ලබා නොදුනි. නිදසුන් ලෙස සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට ඕමන්තේවලට යම් ප්‍රවේශයක් ලබා දුන්න ද එහි කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අභ්‍යන්තර අවතැන් වූ පුදගලයින් සමග ස්වාධීනව කතා කිරීමට අවසර නොදුනි.[1116] [1117] මෙම සීමාසහිත ප්‍රවේශය පවා 2009 මැයිවල ගැටුමේ අවසන් සති කිහිපය තුළ අහෝසි කෙරිණ.[1118] මෙය ස්වාධීන ජාත්‍යන්තර ආයතනවලට ප්‍රවේශය නොදීමේ වාතාවරණයක් නිර්මාණය කළ අතර එය ප්‍රතිඵල වශයෙන් පුළුල්ව පැතුරුණු දුශ් -සැලකීම් හා මහා පරිමාණයක් මත කෙරුණු අනෙකුත් උල්ලංඝනයන් විශේෂයෙන්ම බලහත් අතුරුදහන් කිරීම්වලට පහසුකම් සලසාලීය.

---

[1116] ශ්‍රී ලංකාවේ උතුරේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තත්ත්වය පිළිබඳ හදිසි යාවත්කාලීන, 2009 මැයි 14-18

[1117] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[1118] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1046. ළමුන් ඇතුළු පුද්ගලයින් හිතුවක්කාරී අන්දමින් එල්ටීටීඊය සමග සම්බන්ධවී යයි හඳුනාගෙන ඔවුන්ගේ පවුල්වලින් වෙන් කර රැඳවුම් මධ්‍යස්ථානවලට රැගෙන යනු ලැබිණ. මුලතිව් හා ඕමන්තේවල සොල්දාදුවන් දිගින් දිගටම ඇතැම් විට ශබ්ද විකාශන යන්ත්‍රවලින් එල්ටීටීඊ සාමාජිකයින්ව සිටියවුන්ට, එක දවසක් හෝ එල්ටීටීඊය වෙනුවෙන් වැඩ කර තිබුණ අයවලුන්ට තමන් විසින්ම ඉදිරිපත් වෙන්නැයි නිවේදනය කළ අන්දම සාක්ෂිකරුවෝ විස්තර කළහ.[1119] අධිකාරීන් සටන්කරුවන් හා සිවිල් වැසියන් අතර වෙන්කොට ගැනීමක් නොකළේ ය යන කරුණ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවලට හෝ රැඳවුම් මධ්‍යස්ථානවලට මාරු කළ යුතුව ඇත්තේ කවුරුන්ද හා කුමන පදනමක් ද යන්න පිළිබඳව අවිනිශ්චිතතාවක් නිර්මාණය කළේ ය. තව ද සැකකරුවන් ලෙස රැගෙන යන ලද බොහෝ දෙනෙකු සැබවින්ම එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් බඳවා ගනු ලැබ තිබුණ පුද්ගලයින් වූ අතර ඒ කරුණ කෙරෙහි කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබිණ. සිවිල් මට්ටමකින් එල්ටීටීඊය සමග වැඩ කර තිබුණු ඇතැම් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් නිදසුන් ලෙස වෛද්‍ය කාර්ය පිරිස් ද රැඳවුම් මධ්‍යස්ථානවලට ගෙන ගොස් තිබිණ.

1047. සෝදිසි කිරීමේ හා ලියාපදිංචි කිරීමේ කාලය තුළ ආරක්ෂක හමුදා ඔවුන්ගේ හෝ ඔවුන්ගේ ඥාතීන්ගේ එල්ටීටීඊය සමග පැවති සම්බන්ධය ඇතුළුව නැවත නැවත් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කර තිබේ. එල්ටීටීඊය සමග ඔවුන්ගේ සම්බන්ධය පිළිනොගතහොත් ඔවුන්ට බරපතල ප්‍රතිවිපාකවලට මුහුණ දෙන්නට සිදු වනු ඇති බවට තරුණයින්ට අනතුරු හඟවනු ලැබිණ.[1120] අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ටවත් එල්ටීටීඊය සමග සම්බන්ධකම් තිබුණා යයි හඳුනාගත් පුද්ගලයින්ටවත් ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු සපයනු නොලැබීය.

1048. තව ද 2005 හදිසි නීති රෙගුලාසි (19.1) මගින් ඥාතියෙකු අත් අඩංගුවට ගැනීම සම්බන්ධව පවුලේ සාමාජිකයෙකුට දැනුම්දීම අවශ්‍ය කෙරී තිබුණ ද ඔවුන්ගේ ඥාතීන් ගෙන ගියේ කොහාට ද යන්න පිළිබඳව පවුල්වලට කිසිදු තොරතුරක් සපයා නොතිබිණ.

1049. මුලතිව්වල පාලම පසු කිරීමෙන් පසු අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පසු කළ යුතුව තිබුණ රැඳවුම් ප්‍රදේශ තුනක් තිබිණ. බොහෝ දෙනෙකු තවත් රැඳවුම් ප්‍රදේශයක් කරා කටු කම්බි ගසා වෙන් කරන ලද පටු පටුමගක් දිගේ රැගෙන යනු ලැබූ අතරතුර දහස් ගණන් අභ්‍යන්තර අවතැන් වූවන් පැය ගණනාවක් හෝ රැයක් මුලතිව්හි පළමුවන රැඳවුම් ප්‍රදේශයෙහි නැවතී සිටිය යුතු විය. මුලතිව්හි දෙවන රැඳවුම් ප්‍රදේශයේ දී එක් එක් පුද්ගලයා ආරක්ෂක පරීක්ෂාවක් යටතේ යාම අවශ්‍ය විය.[1121]

1119 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1120 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1121 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1050. ඇතැම් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් වැලි බෑගවලින් තැනූ මුර පොළවලට[1122] හෝ තල් කොළවලින් තනන ලද කොටුවලට ගෙන යනු ලැබූ අතර අනෙක් අය ඔවුන්ව අනෙක් අයට දැකිය හැකි ප්‍රදේශයක පටු තීරයක රඳවා තිබිණ.[1123] කාන්තා අභ්‍යන්තර අවතැන් වූවන් ගණනාවක්ම පිරිමි සොල්දාදුවන් විසින් ඔවුන් පරීක්ෂා කරනු ලැබූ බව වාර්තා කළහ. ඇතැම් ස්ත්‍රීන් සෙබලියන් විසින් පරීක්ෂා කරනු ලැබුව ද ඔවුන් ඇඳුම් ඉවත් කර පරීක්ෂා කරනවිට කොටුවල මුදුනේ සිට පරීක්ෂාවෙන් සිටි පිරිමි සෙබළුන් ඔවුන්ගේ ජංගම දුරකතනවලින් නිරුවත් හෝ අඩ නිරුවත් පින්තූර ගැනීමේ අවදානම එතෙකුත් තිබිණ.[1124] X පරිච්ඡේදයේ විස්තර කළ පරිදි සොල්දාදුවන් ඔවුන්ගේ රයිෆල් බැරලවලින් ඔවුන්ගේ පියයුරු එබූ අන්දම එක් සාක්ෂිකාරියක් පැවසුවා ය.[1125] තවත් සාක්ෂිකාරියක් පැවසුවේ ඇය නිරුවත්කර පරීක්ෂා කරනු ලැබූ විට ඇයට ''මළ මිනියක් මෙන්'' හැඟුණු බවය.[1126]

1051. මුලතිව්හි රැඳවුම් ප්‍රදේශ තුනේම හා ඕමන්තේහි සිටි අතුරු හමුදා කණ්ඩායම්වල සාමාජිකයෝ හෝ ඔත්තුකරුවන් බවට පත්ව සිටි හිටපු එල්ටීටීඊ සටන්කරුවෝ ඇතැමෙක් ඔවුන්ගේ මුහුණු ආවරණය කර ගෙන හිටපු එල්ටීටීඊ සටන්කරුවන්, එල්ටීටීඊයේ සාමාජිකයින් හා එල්ටීටීඊ සේවකයින් හඳුනා ගැනීමේ දී හමුදා බුද්ධි සේවා නිලධාරීන්ට සහාය වූහ.[1127] යටත්ව සිටි හෝ සැලකිය යුතු කලකට පෙර අත් අඩංගුවට ගනු ලැබ සිටි ඇතැම් හිටපු ඒල්ටීටීඊ සටන්කරුවන් ඔවුන්ගේ පැරණි සගයින් හඳුනා ගැනීම සඳහා හමුදා බුද්ධි අංශ නිලධාරීන් ඔවුන්ව මුලතිව්වලට ගෙන ගිය බව විමර්ශන කමිටුවට තහවුරු කළහ.[1128]

1052. එල්ටීටීඊ සටන්කරුවන්ව සිටි හෝ සිවිල් මට්ටමකින් එල්ටීටීඊය වෙනුවෙන් වැඩකර තිබුණු සමහර සිවිල් වැසියන් තමන්වම හමුදා සෙබළුන්ට හඳුන්වා දී තිබුණ අතර සමහරු එසේ කළේ නැත.[1129] සෙබළුන් විසින් කොට කොණ්ඩ සහිත තරුණියන් එල්ටීටීඊ කාඩර්වරියන් ලෙස පහසුවෙන් හඳුනා ගනු ලැබූ අතර විශේෂයෙන්ම පහසුවෙන් අනතුට ගොදුරු වීමේ හැකියාවෙන් යුක්ත විය. මුලතිව්වල දී තමන් විසින්ම එල්ටීටීඊ යයි හඳුන්වා දෙනු ලැබූවන් හෝ එල්ටීටීඊය සමග සම්බන්ධකම් තිබුණේ යයි සැක කරන ලද්දවුන් පැත්තකින් තබනු ලැබ හමුදා බුද්ධි අංශ නිලධාරීන් විසින් ප්‍රශ්න කරනු ලැබිණ.[1130] ඔවුන් ඔවුන්ගේ පවුල්වලින් වෙන් කරනු ලදුව රැගෙන යාමට පෙර විවෘත ප්‍රදේශයක රඳවා සෙබළුන් විසින් රැකවල් කරනු ලැබිණ.[1131]

---

1122 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1123 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1124 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1125 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1126 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1127 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1128 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1129 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1130 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ
1131 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1053. මුලතිව්වල හා ඕමන්තේවල දී එල්ටීටීඊ යයි තමන් විසින්ම හඳුන්වා දෙන ලද ඇතැමුන්ට සොල්දාදුවන් පහර දෙනු දුටු අන්දම සාක්ෂිකරුවෝ විස්තර කළහ.[1132] 2009 මැයිවල දී සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය වන්නියේ සෝදිසි කිරීමේ ක්‍රියාවලිය තුළ ශාරීරිකව පහරදීමේ වාර්තා පිළිබඳව අවධානයන් මතු කරන ලද අතර එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශනය කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.[1133]

1054. වැඩිදුර ලියාපදිංචි කිරීම, ශාරීරික පරීක්ෂා කිරීම, සුළුමුල සෙවීම හා ප්‍රශ්න කිරීම සිදු කළ ඕමන්තේහි[1134] විවිධ මට්ටම්වලින් එල්ටීටීඊ සාමාජිකයින් ලෙස සේවය කළ පුද්ගලයින් රැස්විය යුතු ප්‍රදේශ තිබුණි. මෙම සෝදිසි කිරීම් ස්ථාන ඕනෑම එකක දී සිවිල් මට්ටමක් තුළ ද ඇතුළුව එල්ටීටීඊයේ කොටසක්ව සිටි බවට හඳුනා ගත් හෝ පිළිගනු ලැබූවන් රැගෙන යනු ලැබිණ.[1135] තුවාල ලත් අභ්‍යන්තර අවතැන් වූවන්ට වෛද්‍ය කාර්ය පිරිස් බැලීමට අවසර දෙන ලද අතර ඇතැම් අය රෝහල්වලට මාරු කෙරිණ.[1136]

1055. විවිධ සෝදිසි ස්ථානවල දී එල්ටීටීඊය සමග සම්බන්ධකම් නොතිබුණ බවට හඳුනාගත්තවුන් ආණ්ඩුව විසින් ''සුබ සාධක ගම්මාන'' ලෙස නම් කරන ලද ආවෘත කඳවුරුවලට ගෙන යනු ලැබිණ. බොහෝ දෙනෙකු මැනික් ෆාම්වලට ගෙන යන ලද අතර එය හැර යාමට ඔවුන්ට අවසර දෙනු නොලැබිණ.

**ආවෘත කඳවුරුවල අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ නිදහස අහිමි කිරීම**

**අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් සඳහා ආවෘත කඳවුරු පිහිටුවීම**

1056. ආණ්ඩුව 2008 මාර්තුවල සිට එල්ටීටීඊ -පාලිත ප්‍රදේශවල සිට පැමිණි යුද හමුදා රැකවල් යෙදූ ආවෘත කඳවුරුවල සිට අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නිදහස අහිමි කිරීම ආරම්භ කළේ ය. එවැනි කඳවුරුවලින් පළමුවැන්න 2008 ජූලිවල දී කලිමොඩ්ඩායිවල පිහිටුවන ලද[1137] අතර දෙවැන්න සිරුකන්දාල්වල පියිටුවනු ලැබිණ.[1138] දෙකම පිහිටියේ මන්නාරම් දිස්ත්‍රික්කයේ ය. කඳවුරු ගැටුමෙන් පලා යන්නන් සඳහා අනුගමනය කළ යුතුව තිබූ පූර්වගාමිකයක් වූයේ ය. කටු කම්බිවලින් වට කරන ලද හා ආරක්ෂක හමුදා විසින් රැකවල්ලන ලද කඳවුරුවල නිදහසේ

---

1132 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1133 ශ්‍රී ලංකාවේ උතුරේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තත්ත්වය පිළිබඳ හදිසි යාවත්කාලීන, 2009 මැයි 14

1134 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1135 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1136 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1137 UNOCHA මානුෂවාදී සංක්ෂිප්තය, ජූනි 20 අනුව කලිමොඩ්ඩායි 2010 මැයිවල වසනු ලැබීය.

1138 2009 ජූනිවල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සමෙහි පෙත්සම්කරුවන් සඳහන් කළ පරිදි ''ඔවුන් නිදහස් කරන්නේ ද කරන්නේ නම් කවදාද යන්න සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ ලබා ගත හැකි කිසිදු තොරතුරකින් තොරව අභ්‍යන්තර අවතැන් වූවන් (700) මාස 15ක කාලයක් දිගටම කලිමොඩ්ඩායි හා සිරුකන්දල් කඳවුරුවල ඔවුන්ගේ නිදහසට අහිමිකර රඳවා තිබේ.'' මූලික අයිතිවාසිකම් පෙත්සම, වි.ප්‍ර.කේ. එදිරිව වගඋත්තරකරුවන් පස් දෙනා, 2009 ජූනි

දිග්ගැස්සුණු අහිමි කිරීම (මාස ගණනාවක්) හා කඳවුරුවලින් පිටතට යාම සම්බන්ධව පනවා තිබූ දැඩි සීමා අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට නැවත පදිංචි වීමට හෝ සත්කාරක පවුල් සමග ඉදුම්හිටුම් ලැබීමට හෝ ඉඩ දෙනු නොලැබිණ.

1057. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ ලේකම්වරයාගේ නියෝජිත වෝල්ටර් කාලින් 2007 දෙසැම්බර්වල දී ඔහුගේ ශ්‍රී ලංකා සංචාරයෙන් පසු සම්පාදනය කරන ලද නිර්දේශ ගොන්නෙහි හා අනතුරුව මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරන ලද ඔහුගේ වාර්තාවෙහි ශ්‍රී ලංකාවේ අවතැන්වීම පිළිබඳ මාර්ගෝපදේශයන්ට ගරු කිරීමේ වැදගත්කම[1139] හා ඔවුන්ගේ රටේ පුරවැසියන් ලෙස අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් ''ජාත්‍යන්තර මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ සියලු සහතිකවීම්වලට හිමිකම් ඇතිව සිටින්නේ ය''යි අවධාරණය කර තිබුණි. එසේම ඔහු ''සැලස්මේ (සිවිල් ජනයාගේ හදිසි අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කිරීමේ) කොටසක් විය හැකි ආරක්ෂාවට ආමන්ත්‍රණය කිරීම අවශ්‍යවන අතර එය ස්වභාවයෙන් මානුෂීය හා සිවිල්මය විය යුතු යයි සිහි ගැන්වීය. විශේෂයෙන්ම අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යාම් ඊම් නිදහසට ගරු කළ යුතු ය. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් කඳවුරකට සිරකර තැබිය නොහැකි ය.[1140]

1058. 2008 සහ 2009 මුල මුළුල්ලෙහි මානුෂවාදී සංවිධාන අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු පිහිටුවීමේ දී ගරුකළ යුතු අවම ප්‍රධාන මූලධර්ම පිළිබඳව ආණ්ඩුව සමග සාකච්ඡාවල නිරතවීම අඛණ්ඩව කර ගෙන යනු ලැබීය. 2008 අගෝස්තුවල සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය උපදේශන ලේඛනයක් (*Aide-Mémoire*) සංවර්ධනය කළේ ය. එය ''එයට අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවලට ආධාර කළ හැක්කේ ඒවායේ ශාරීරික ආරක්ෂාව හා සුරක්ෂිතතාව, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ රැකවරණය හා සුබ සාධනය සහතික කරනු ලැබේ නම් පමණි'' යයි සඳහන් කළේ ය. එය ''අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු ඇතුළත මෙන්ම පිටත ද සම්පූර්ණ හා බාධා විරහිත යාම් ඊම් නිදහස''ඇතුළුව අනාගත අභ්‍යන්තර අවතැන් පුද්ගලයින්ගේ කඳවුරු හඳුනා ගැනීමේ දී හා කඳවුරු කලමනාකරණයේ දී සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ මැදිහත්වීම සඳහා වන කොන්දේසි දැක්වීය. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය හදිසි වාසස්ථාන සඳහා එය වඩා කැමති විකල්පය වූයේ පවුල් සැකසුම සඳහා සත්කාරය සැපයීම ය යන්න වෙනුවෙන් පෙනී සිටියේ ය.[1141]

1059. 2009 ජනවාරියේ දී උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය හා ආරක්ෂාව සඳහාවන ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ ගැටුම් කලාපයෙන් පිටතට පැමිණේවි යයි අපේක්ෂිත අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් 200,000 කට පමණ ''ආරක්ෂාව හා සහනාධාර සැපයීමේ'' ''සුබ සාධක ගම්මාන'' ගොඩ නැගීමේ එහි සැලසුම් කටු

---

1139 E/CN.4/1998/53/Add 2

1140 එජා මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ නියෝජිතයාගේ වාර්තාව 2008 මැයි 21, A/HRC/8/6/Add.4, 5 හා 22 පිටු

1141 UNHCR කොළඹ උපදේශන ලේඛනය (*Aide-Mémoire*) 2008 අගෝස්තු 29, http://www.un.org/press/en/2009/090424_Awad.doc.htm

සටහන් කරන ලද ආණ්ඩුවේ ''වන්නියේ ජනතාව සඳහා හදිසි සහන වැඩ සටහන'' කෙටුම්පත මානුෂවාදී නියෝජිතායතනවලට හා ප්‍රදානකයින්ට ඉදිරිපත් කළේ ය. මෙම යෝජනාව සඳහා හේතුන් ලෙස ආණ්ඩුව ආරක්ෂක ප්‍රතිෂ්ඨාවන් හා බිම් බෝම්බ ඉවත් කිරීම යන දෙකම දක්වා තිබුණි.[1142]

1060. ජාත්‍යන්තර ප්‍රජාවට විශේෂ අවධානයක් තිබූ දෙය වූයේ අභ්‍යන්තර අවතැන් වූවන් රඳවා තැබීම පිණිස වැටවල් ගසා හමුදාවෙන් රැකවල් කරනු ලබන අර්ධ ස්ථාවර ව්‍යුහයන් වසර තුනක් දක්වා පවත්වා ගැනීමේ ආණ්ඩුවේ ප්‍රකාශිත අභිලාෂයන් ය. එසේම ඒ කාලයේ, ආණ්ඩුව 2009 ජනවාරියේ වන්නියට සහන සැපයීමට අදාළව 200,000 ක් පමණ අභ්‍යන්තර අවතැන් වූවන් භාර ගැනීමට එය සූදානම් වෙමින් සිටින බව පැවසීම හා ඒ සමගම එය ඊට සම්පූර්ණයෙන්ම සමගාමීව වාගේ එහි ඉතිරිව සිටියේ සිවිල් වැසියන් 70,000 ක් පමණක් යයි තරයේ කියා සිටීම සටහන් කිරීම අවධානය ඇද ගන්නා සුළු ය.

1061. එම මාසයේම සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ කඳවුරුවලට ආධාර සැපයීමේ ප්‍රධාන මූලධර්ම නැවත නැවතත් ප්‍රකාශ කරමින්, අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ කඳවුරුවල කඳවුරු ආරක්ෂාව, නීතිය හා සාමය පවත්ව ගැනීම හා සිවිල් ජන හා මානුෂවාදී ස්වභාවය සහතික කිරීමේ යාන්ත්‍රණයක් පවත්වා ගැනීම අදාළ සහතිකයන් ඇතුළු ''ජාත්‍යන්තර මානුෂවාදී නීතියට හා අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ මග පෙන්වීමේ මූලධර්මවලට ආණ්ඩුවේ බැඳී සිටීම මත වවුනියාවේ, මන්නාරමේ හා යාපනේ අලුත් කඳවුරුවලට මානුෂවාදී ආධාර ලබා දීම තත්ත්වාරෝපණය කරමින් නව අභ්‍යන්තර අවතැන් කඳවුරුවලට ආධාර කිරීම පිළිබඳ තවදුර මග පෙන්වීමේ ලේඛනයක් සංවර්ධනය කළේ ය.[1143]

1062. 2009 අප්‍රේල් මැද මාර්ගෝපදේශ සටහන පිළිබඳ මධ්‍ය-වාර්ෂික විමර්ශනයක් ආණ්ඩුවේ මුදුන්පත් කිරීම් ගණනාවක් ඉස්මතුකර දක්වන අතරම යාම් ඊම් නිදහස වැනි ප්‍රධාන මූලධර්මවලට ගරු කිරීමට දිගටම අසමත්ව තිබෙන බව පෙන්වා දී ඇති අතර සන්නද්ධ අතුරු හමුදා හා යුද කාර්ය පිරිස් රාත්‍රි කාලයේ ද ඇතුළුව කඳවුරු ඇතුළේ අඛණ්ඩව සිටීම සඳහන්කර තිබේ.[1144] සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය ''අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් ඔවුන්ගේ යාම් ඊම් නිදහස ආපසු ලබා දීමේ හා ඔවුන් කඳවුරුවලින් නිදහස් කිරීමේ කාල රාමු සහිත සැලස්මක්'' සඳහා ද ''කාල නියම සහිත හා පාරදෘශ්‍ය සෝදිසි ක්‍රියාවලියක් සඳහා වන පටිපාටි'' සඳහා ද ඉල්ලා තිබේ. 2009 මැයි 15 වෙනි දින වෝල්ටර් කාලින් ''එවැනි පුද්ගලයින්ගේ නිදහස දීර්ඝව අහිමි කිරීම හිතුවක්කාර රඳවා ගැනීමක් හා සමාන වනවා පමණක් නොවේ, එය අනවශ්‍ය ලෙස මානුෂීය තත්ත්වය තීව්‍ර කිරීමක් ද වේ'' යයි නැවත අනතුරු හැඟවූයේ ය.

---

1142 ශ්‍රී ලංකාවේ මානුෂවාදී ප්‍රයත්නය, උතුරු පළාතේ නැවත පදිංචිය, සංවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය, 2011

1143 ශ්‍රී ලංකාවේ අවතැන් වූවන් පිළිබඳ හදිසි යාවත්කාලීනය (Flash Update), 2009 ජනවාරි 21, UNHCR නියෝජිත කාර්යාලය, කොළඹ

1144 වවුනියාවේ, යාපනයේ හා මන්නාරමේ අභ්‍යන්තර අවතැන් වූවන්ට ආධාර කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහන සම්බන්ධ මැදිවාර විමර්ශනය-ශේෂ පත්‍රයක්, 2009 අප්‍රේල්

1063. ජාත්‍යන්තර ප්‍රජාව විසින් අඛණ්ඩව කරන ලද උපදේශනයන් තිබියදීත් 2009 ජූනි වන විට හමුදාව රැකවල් කරන ලද හා හමුදාව විසින් පවත්වා ගෙන යන ලද 284,000 ක් පමණ අභ්‍යන්තර අවතැන්වූවන් රඳවා සිටි ආවෘත කඳවුරු 30 ක් වවුනියාවේ, මන්නාරමේ හා යාපනේ පිහිටුවා තිබුණි.[1145] මෙලෙස එල්ටීටීඊ-පාලිත ගැටුම් කලාපයේ සිරවී සිටි හා අනතුරුව ආවෘත කඳවුරුවල සිරවී සිටි පවුල්, වයසක අය, ළමුන් හා ආබාධිතයන් ඇතුළු සිවිල් ජනයා ඒවා හැර යාමට හෝ ආපසු ගෙවල් බලා යමාට හෝ හැකි වන්නේ කවදා ද යි පැහැදිලිතාවක් නොමැතිව කඳවුරුවල සිරගතව සිටියහ.

1064. ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මෙන්ම ජාත්‍යන්තර නීතිය යටතේ ද යාම් ඊම් නිදහසට, හිතුවක්කාරව රඳවා නොගනු ලැබීමේ නිදහසට ඇති අයිතීන්ට හා ඔවුන්ගේ නිදහස අහිමි කරනු ලැබූවන් අප්‍රමාදීව විනිශ්චයකාරවරයෙකු හමුවට ගෙන ඒමට ඇති අයිතියට අදාළව බලගතු ආරක්ෂණයන් තිබියදීත්[1146] අවෘත කඳවුරුවල සිටි ජනතාවට හිතුවක්කාර රඳවා ගැනීමට එරෙහිව නීතීඥයින් හමුවීමට හෝ උසාවිය හමුවේ ඊට අභියෝග කිරීමට හෝ අවකාශ නොතිබුණි. එසේ වුව ද යටත් පිරිසෙයින් ශ්‍රී ලාංකීය රාජ්‍ය නොවන සංවිධානයක් වන විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය (CPA) කණ්ඩායමක් වශයෙන් ඔවුන් රඳවා තැබීමට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරනු ලැබීය (පහතින් බලන්න). අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ නිදහස අහිමි කිරීම හා ඔවුන්ගේ නිදහස අහිමි කිරීමේ කාලය තීන්දු කිරීම පාලනය කරන නීතියක් නැත. එය තීන්දු වූයේ යුද අධිකාරීන්ගේ අභිමතය අනුව ය.

1065. බිම් බෝම්බ ඉවත් කිරීම නැවත පදිංචි කිරීමට බාධා කරන ලද ප්‍රතිෂ්ඨාවක් වූ අතර අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් යාම් ඊම් නිදහසින් තොරව ආවෘත කඳවුරුවල දිගු කාලයක් පුරා රඳවා ගෙන සිටීමේ ප්‍රධාන හේතුව වී තිබුණේ එල්ටීටීඊ සැකකරුවන් සොයා ගැනීම පිණිස ඔවුන් සුළුමුල සෙවීම සඳහා බව බොහෝ විස්තරවලින් මෙන්ම ආණ්ඩුවේ ප්‍රකාශනවලින් ද පැහැදිලි ය. නිදසුන් ලෙස උතුරු පළාතේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පිළිබඳ නිසි බලධාරී මේජර් ජෙනරාල් කමල් ගුණරත්න උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම වෙත 2010 සැප්තැම්බර් 8 වෙනි දින කරන ලද ඔහුගේ ප්‍රකාශයේ දී[1147] ''අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යාම් ඊම් මත අපට සමහර සීමාවන් පැනවීමට සිදුවී තිබුණ් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගල ජනයා අතර භයානක අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් සිටි නිසා ය. අප මෙම පුද්ගලයින්ගේ යාම් ඊම්වලට කිසිදු නිදහසක් දෙන්නේ නැතැයි කියමින් හැම කෙනෙක්ම අප දෙසට- ආණ්ඩුව හා ආරක්ෂක හමුදා දෙසට ඇඟිලි දිගු කරයි.... මෙම ජනයා අතර සටන්කරුවන් විශාල සංඛ්‍යාවක් සැඟවී සිටි බව අප දැන සිටි නිසා මාස දෙක තුනක් පමණ[1148]

---

1145 අභ්‍යන්තර අවතැන් වූවන් ආරක්ෂා කිරීමේ වැඩ කණ්ඩායම, ආරක්ෂණ සංවර්ධනයන් පිළිබඳ දෙවන ත්‍රෛමාසික යාවත්කාලීනය (Second Quaterly Update on Protection Developments)

1146 12(3), 13(2) හා 14(1)ඌ වගන්ති

1147 http://reliefweb.int උත්පතනය කර ඇති පරිදි මානුෂීය මෙහෙවර සමයේ දී අවතැන්වූ සිවිල් ජනයා නැවත පදිංචි කිරීම, ශ්‍රී ලංකා ආණ්ඩුව, 2009 නොවැම්බර් 26

1148 කමිටුව විසින් මූලාශ්‍ර පරාසයක් මගින් එක්රැස්කර ගන්නා ලද තොරතුරුවලට අනුව තවත් මාස 2-3 කට වැඩි කාලයක් යාම් ඊම් සීමා පැවතී තිබේ. එසේම මේජර් ජෙනරාල්වරයාගේ ප්‍රකාශයට පටහැනිව සුළුමුල සෙවීමේ පරීක්ෂණ හා ප්‍රශ්න කිරීම් 2010 දක්වා දිගටම කෙරී තිබේ.

ඇතැම් යාම් ඊම් සීමාවන් යටතේ ඔවුන් තබා ගැනීමට හා අපගේ ඔත්තු සේවා ආයතන සියල්ල ඔවුන් හඳුනා ගැනීම සඳහා යෙද වීමට අපට සිදු වුණි.''

1066. කෙසේ වුව ද ආණ්ඩුවලට අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ නිදහස තාවකාලිකව අහිමි කිරීමට හා සටන්කරුවන් වෙන්කර ගැනීමට හිමිකම තිබුණේ වුව ද එය හැකි අඩුම කාලයක් සඳහා විය යුතු ය. තව ද අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් ගේ නිදහස අහිමි කිරීමට ඉඩ දිය හැක්කේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් රාජ්‍යයේ ආරක්ෂාවට බරපතල අගතියක් වනු ඇති බවට විශ්වාස කිරීමට බරපතල හා නීත්‍යානුකූල හේතු තිබේ නම් පමණි. තව ද අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් දිගටම රඳවා ගැනීමට නීත්‍යානුකූල පදනමක් හා එක් එක් පුද්ගලයාට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීම අවශ්‍ය වෙයි.

1067. 2009 ජූනි 11 වෙනි දින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ''පසුව කී වර්ගයේ කඳවුරක (එනම් ''සුබ සාධක'' හෝ ''අවතැන්'' කඳවුරුවල) වලංගු අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවකින් තොරව හා පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට අවසර දෙන කිසිදු නීතියක හෝ රෙගුලාසියක ආධීනතාවකින් තොරව සාමානය සිවිල් වැසියෙකුගේ නිදහස අහිමි කිරීම නීති විරෝධී හා අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමකට සමාන වෙයි.... පසුව කී වර්ගයේ කඳවුරක රඳවා තිබෙන එවැනි සියලු පුද්ගලයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කරනු ලැබ ඇති මූලික අයිතීන් උල්ලංඝනය කරමින් සැබවින්ම නීති විරෝධීව හා අත්තනෝමතිකව අත් අඩංගුවට ගෙන තිබේ යයි සඳහන් කිරීම සාධාරණ ය.'' යනුවෙන් කරුණු දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කළේ ය. මෙම අයිතීන් යාම් ඊම් නිදහස සහතික කරන 14(1) වගන්තියේ අන්තර්ගත වේ. එසේම ජාත්‍යන්තර නීතිය ද පුද්ගලයෙකු ඔවුන්ගේ නිදහසට අහිමි කරනු ලබන්නේ නම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඔහුට/ඇයට අත් අඩංගුවට ගැනීමට හා රඳවා තැබීමට හේතු දැනුම් දිය යුතු බව ඉල්ලා සිටී.

1068. පෙත්සම අනෙක් ඒවා අතර ආවෘත ''සුබ සාධක'' කඳවුරුවල රඳවා සිටින සියලු අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යෑම් ඊම් නිදහස තහවුරු කිරීමේ මෙන්ම නම්කර තිබෙන රාජ්‍ය අධිකාර අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ව්‍යවස්ථාමය අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබෙන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළි ගනු ලැබීමේ නියෝගයක් අපේක්ෂා කරයි. 2009 ජූනි 18 වෙනි දින ශ්‍රේෂ්ඨාධිකරණය අයදුම ඇසූ නමුදු කීප අවස්ථාවක්ම එය කල් දැමී ය. කමිටුවට ලැබුණ තොරතුරුවලට අනුව කාරණය පිළිබඳ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට තිබේ.[1149]

1069. 2009 සැප්තැම්බරයේ දී තවත් සංචාරයකට පසු අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ මානව හිමිකම් පිළිබඳ මහ ලේකම්වරයාගේ නියෝජිත වෝල්ටර් කාලින් ''අවෘත කඳවුරුවල රඳවා තිබෙන 250,000 කට වඩා වැඩි අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යාම් ඊම් නිදහස

[1149] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ආරක්ෂක අමාත්‍යවරයා (SC FR 457/09) http://www.cpalanka.org/the-centre-for-policy-alternatives-vs-minister-of-defence-sc-fr-45709.

ප්‍රතිෂ්ඨාපනය කිරීම... හදිසි කාරණයක් බවට පත්ව තිබෙන... ''[1150] බව සඳහන් කරමින් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පෙරළා යැවීමේ මන්දගාමී වේගය පිළිබඳව ගැඹුරු අවධානය ප්‍රකාශ කළේ ය. ඔහු නැවතත් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට එක්කෝ සත්කාරක පවුල් සමග විසීමට ගෙවල්වලට ආපසු යාමට හෝ නැතිනම් විවෘත මාරුවීමේ කඳවුරුවලට යාමට අවසර දෙන ලෙස ඉල්ලා සිටියේ ය. එසේම ඔහු ''ජාත්‍යන්තර නීතියට අනුව ගැටුමේ උච්චස්ථානය තුළ සිවිල් වැසියන්ගේ නිදහස අහිමි කිරීම නීත්‍යානුකූල හා අනිවාර්ය ආරක්ෂක අවශ්‍යතාවකැයි සාධාරණය කළ හැකි වුව ද මෙම ආරක්ෂක ප්‍රතිෂ්ඨාවන්ට ප්‍රතිචාර දැක්වීමට ඒකාන්ත වශයෙන් අවශ්‍ය වනවාට වඩා දිගු කාලයක් ඒවා නොපැවතිය යුතු බව ද සිහි ගැන්වීය. නිදහස අහිමි කිරීමේ තීරණ වැඩිදුරටත් කණ්ඩායම් පදනමකට වඩා පුද්ගල පදනමක් මත ගනු ලැබිය යුතු ය. නිදහස් නොකරනු ලබන පුද්ගයින්ට පුද්ගල පදනමක් මත හේතු පිළිබඳව දැනුම් දිය යුතු අතර ස්වාධීන මණ්ඩලයක් මගින් මෙම තීරණය විමර්ශනය කිරීමට අව්‍යාජ අවස්ථාවක් ලබා දිය යුතු ය.[1151]

1070. ''අවෘත කඳවුරු හා අඩවිවල කඳවුරු ජනයා අතර සිවිල් ජනයාව අඛණ්ඩව සිරකර තැබීම ඉදිරි සති කීපය තුළ යාම් ඊම් නිදහස ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් සිදු නොවේ නම් එය සාමූහික දඬුවමක ස්වභාවය ගැනීමට පවා හැකි ය''යි වෝල්ටර් කාලින් අනතුරු හැඟවීය.

**වවුනියා දිස්ත්‍රික්කයේ චෙට්ටිකුලම් කොට්ඨාසයේ මැනික් ෆාම් රැඳවුම් කඳවුර**

1071. මැනික් ෆාම් පමණක්ම හෙක්ටයාර 500 ක් පමණ හා කිලෝ මීටර ගණනාවක් විහිදී තිබුණ අතර කලාප හතකින් සමන්විත විය.[1152] සෑම කලාපයක්ම කටු කම්බිවලින් වට කොට තිබූ අතර හමුදා පිරිස් විසින් රැකවල් කරනු ලැබිණ. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පළමුවෙන්ම මැනික් ෆාම්වලට ගෙන ලද්දේ 2009 පෙබරවාරිවල ය. ඔවුන් අතර රතු කුරුස කමිටුවේ නැව්වලින් ඉවත්කර ගෙන එන ලද රෝගීන් සමග පැමිණි සාත්තු සපයන්නෝ ද ප්‍රතිකාරවලින් පසු සුව වූ රෝගීහු ද වූහ.[1153] 2009 මැයි 17 හා ජූලි 9 අතර මුලතිව්වලදී හා ඕමන්තේ දී සෝදිසි කිරීමෙන් පසු අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් 90,000 ක් පමණ මැනික් ෆාම්වලට ගෙනෙනු ලැබිණ. එහි ඉහළම අවස්ථාවේ 284,000 ක් වූ මුළු අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගෙන් 220,000 ක් පමණ මැනික් ෆාම්හි රඳවවනු ලැබ තිබුණි.

---

[1150] Irinews Sri Lanka: අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ වේගය පිළිබඳ වැඩෙන කණස්සල්ල, 2009 සැප්තැම්බර් 30 http://www.irinews.org/report/86371/sri-lanka-concerns-growing-over-pace-of-idp-resettlement

[1151] එජා මාධ්‍ය නිවේදනය, *Freedom of movement for a quarter of a million displaced, UN Representative discusses with Sri Lankan government,*2009 සැප්තැම්බර් 29

[1152] කලාපය 0 (කදිර්ගාමර් ගම), කලාපය 1 (ආනන්ද කුමාරස්වාමි ගම), කලාපය 2 (පොන් රාමනාදන් ගම), කලාපය 2 (අරුණාචලම් ගම), කලාපය 4 (චෙට්ටිකුලම්), කලාපය 5, 6, 7 (මරුතමාඩු සුබ සාධක මධ්‍යස්ථානය)

[1153] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1072. අවසරයකින් තොරව මැනික් ෆාම් හැරයාම අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට තහනම් කරනු ලැබුවා පමණක් නොවේ, එසේම ඔවුන්ට නියමකර තිබුණ කලාපය ද හැර යා නොහැකි විය. එසේම මුල දී ඔවුන්ට එකම කලාපයේ අනෙකුත් අංශවල සිටි ඥාතීන් බැලීමට යාමට ද අවසර නොදුනි. යාම් ඊම් නිදහස නොමැති වීම අනෙක් අංශවල හෝ කලාපවල සිටි ඥාතීන් සොයා යාමෙන් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් වළක්වනු ලැබිණ. ගැටුම කාලය තුළ හෝ පරීක්ෂාවට භාජනය කිරීමේ කාලය තුළ[1154] දෙමාපියෝ ඔවුන්ගේ ළමුන්ගෙන් වෙන් කරනු ලැබ තිබුණ අතර ඔවුන් සොයා ගැනීමෙහිලා ඉවක් බවක් නැතිව සිටියහ. පවුලෙන් වෙන්වීම අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ප්‍රධාන කණස්සල්ලක් වූ අතර ගැටුම් ප්‍රදේශයෙන් පැමිණෙමින් සිටියවුන් ඒ වන විටත් විඳ තිබුණ අත්දැකීමට දෙයට එය තවත් වේදනාකර චිත්ත පීඩාවක් එක් කළේ ය. ඇතැමුන්ට විශේෂයෙන්ම ආරක්ෂක හමුදා විසින් ගෙන ගොස් තිබුණ හා ඔවුන් ඉන්නේ කොහේ දැ යි නොදැන සිටි හෝ රඳවා සිට වෙනත් මධ්‍යස්ථානවලට මාරු කරන ලද අයවලුන්ට මෙය මාස ගණනාවක් අඛණ්ඩව විඳීමට සිදු විය.

1073. බොහෝ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට පවුලේ සාමාජිකයින්ගේ අවමඟුල්වලට සහභාගි වීමට අවසර දීම ප්‍රතික්ෂේප කළ බව සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ.[1155] මැනික් ෆාම්වලින් පිටත රෝහල්වලින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා විශේෂ අවසරයක් ගැනීම අවශ්‍ය වූ අතර ප්‍රතිකාර සම්පූර්ණ වූ විට ආපසු කඳවුරට රැකවල් සහිතව ගෙන එනු ලැබිණ. රැඳවියන්ට ද එපරිදිම ය.[1156] අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් වෙත කඳවුරෙන් පිටතින් කෙරෙන සංචාර ද දැඩිව පාලනය කෙරිණ. ලබා දුන් වෙලාව ඉකුත් වූ වහාම අමුත්තන්ට පිටවන්නැයි සොල්දාදුවෝ අණ කළහ. වෙන් කරන ලද කාලය විනාඩි පහළොවකට වැඩි නොවීය. මෙම තත්ත්වයන් හිරේ ඉන්න අයෙකු බලන්නට යනවා වැනි යයි එක් සාක්ෂිකරුවක් පැවසීය.[1157]

1074. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පිළිබඳ යුදකරණ ස්වභාවය ගත් ආණ්ඩුවේ ප්‍රවේශය 2009 අප්‍රේල්වල උතුරු පළාතේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ප්‍රධාන නිසි බලධරයා ලෙස මේජර් ජෙනරාල් චන්ද්‍රසිරිගේ පත් කිරීම මගින් ඉස්මතුකර දැක්විණ. අනතුරුව අවසාන ප්‍රහාරයට සම්බන්ධවූ ශ්‍රී ලංකා හමුදාවේ 53 වන බල සේනාංකයේ අණ දෙන නිලධාරි මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මගින් ඔහුව ආදේශ කෙරිණ. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ප්‍රශ්න කළමනාකරණයට සිවිල් අධිකාරීන් ද මැදිහත් වූ[1158] නමුත් ප්‍රධාන භූමිකාවන් විශේෂයෙන්ම කලාපවලින් හා කඳවුරුවලින් පිටතට හා ඇතුලට යාම් ඊම් පාලනය කිරීම අදාළ භූමිකාවන් රඟ පාන ලද්දේ ආරක්ෂක අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා හමුදාව විසිනි. මෙය ඔහු උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමට කළ ඉදිරිපත් කිරීමේ දී ''සමස්ත ක්‍රියාවලියම බලා

---

1154 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1155 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1156 සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය 2009 මැයි 11, on file

1157 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1158 නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යවරයා සහාභතිත්වය දැරූ ජාතික මෙහෙයුම් කමිටුවට වෙනත් අමාත්‍යවරු ගණනාවක් ද සම්බන්ධ වූහ. දිස්ත්‍රික් මට්ටමේ දී ආණ්ඩුවේ දිසාපතිවරයා හා අනෙකුත් ආයතන ද සම්බන්ධ වුණි. (ශ්‍රී ලංකාවේ මානුෂීය ප්‍රයත්නය, උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය)

කියා ගත්තේ හමුදාවයි. සත්තකින්ම අනෙකුත් ආණ්ඩුවේ නිලධාරීන්, ආයතන ද එලෙස සම්බන්ධ වූ නමුත් වැඩවලින් බහුතර කොටස (අභ්‍යන්තර අවතැන් කඳවුරු පිහිටුවීම) කරන ලද්දේ හමුදාව විසිනි.''[1159] යයි සඳහන් කරන විට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මෙය තහවුරු කරනු ලැබීය. මැනික් ෆාම් එකේ එක් එක් කලාපය හමුදා ආඥාපතීන් විසින් පාලනය කරන ලද අතර අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ එදිනෙදා ජීවිතය පාලනය කිරීමට හමුදා කාර්ය පිරිස් කඳවුරු මුළුල්ලෙහිම සිටියෝ ය.

1075. සෝදිසි කිරීමේ හා ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලීන්- අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට කඳවුරු හැරයන්නට ඉඩ නොදීම සම්බන්ධ ප්‍රධාන නිල සාධාරණීකරණය - 2009 මුළුල්ලේම හා 2010 තුළ ද කඳවුරු ඇතුළත දිගටම සිදු විය. සිවිල් ඇඳුමින් යුතුව ක්‍රියා කරමින් සිටි හමුදා බුද්ධි නිලධාරීන් හා රහස් පොලිස් නිලධාරීන් ජනයා අතර සිටීම එල්ටීටීඊ කාඩර්වරුන් හා සටන්කරුවන් සෙවීමේ ක්‍රමෝපායේ කොටසක් විය.

1076. ඔත්තුකරුවන් ලෙස වැඩ කළ අතුරු හමුදා කණ්ඩායම්වල සාමාජිකයෝ හා හිටපු එල්ටීටීඊ සටන්කරුවෝ එල්ටීටීඊ සාමාජිකයින් හඳුනා ගැනීමට හමුදා බුද්ධි අංශ නිලධාරීන් සමග නිතිපතා කඳවුරුවලට පැමිණියහ.[1160] ඔවුන් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් සමග ඇවිද පුද්ගලයින් පෙන්වා දිය යුතු වූ අතර පෙන්වා දෙනු ලැබූවන් ප්‍රශ්න කිරීම සඳහා ගෙන යනු ලැබිණ. ඇතැම් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් අල්ලා ගනු ලැබූ විට ඇද ගෙන ගොස් අනෙකුත් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් ඉදිරියේම පහර දෙනු ලැබූ[1161] අතර අනෙක් අය රාත්‍රියේ දී රැගෙන යනු ලැබිණ.[1162]

1077. ඔවුන්ගේ නිදහස අහිමි කර තිබූ කාලයේ බොහෝ විට නොයෙක් අවස්ථාවල සැක කරන ලද එල්ටීටීඊය සමග පැවති ඔවුන්ගේ සබඳතාව හෝ කඳවුරේ සිටින එල්ටීටීඊ සාමාජිකයින් පිළිබඳව තොරතුරු ඔවුන්ට තිබුණේ නම් ඒවා පිළිබඳව ප්‍රශ්න කිරීමට කඳවුරේ ප්‍රශ්න කිරීමේ කාමරයකට රහස් පොලීසිය ඔවුන් කැඳවූයේ කෙසේ ද යන්න සාක්ෂිකරුවෝ විස්තර කළහ.[1163] එසේම වෙනත් මූලාශ්‍ර ද ඇතැම් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගෙන් රහස් පොලිස් ඒජන්තවරුන් විසින් නිතිපතා ප්‍රශ්න කරනු ලැබූ බව හා ඇතැම් අවස්ථාවල හිස් කොලයකට හෝ ඔවුන්ට කියවීම අවසර නොදුන් සිංහලෙන් ලියන ලද කොලයකට අත්සන් ගත් බව දැක්වීය. ඇතැම් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් දිනපතා රහස් පොලීසියට වාර්තා කිරීම අවශ්‍ය විය. සෝදිසි පරීක්ෂාවන් කළ හා රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටි කාලය තුළ ඔවුන්ගේ සැමියන්ගෙන් වෙන් කර සිටි හිටපු එල්ටීටීඊ සාමාජිකයින්ගේ භාර්යාවන්ගෙන් ඔවුන්ගේ සමියන්ගේ කටයුතු පිළිබඳව ප්‍රශ්න කරනු ලැබිණ.

---

1159 LLRC වෙත ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කරන ලද ඉදිරිපත් කිරීම 2010 අගෝස්තු 17

1160 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1161 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1162 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1163 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1078. සෙබළුන් නිතිපතා ජනයාට පහර දෙන හෙයින් හා ඥාතීන් ප්‍රශ්න කිරීමට හෝ රැඳවුම් මධ්‍යස්ථානවලට ගෙන යාමට රැගෙන ගිය හෙයින් නිරන්තර බියෙන් පසු වූ තත්ත්වයක ඔවුන් ජීවත් වූයේ කෙසේ ද යි සාක්ෂිකරුවෝ විස්තර කළහ. අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් සෙබළුන්ගේ දැඩි උපදෙස් පිළිපැද්දේ නැති නම් ඔවුන්ට පහර දෙනු ලැබිණ. වාචිකව බැන වදිනු ලැබිණ.[1164] පැවති නරක තත්ත්වයන් පිළිබඳව හෝ සෙබළුන් හෝ රහස් පොලිසිය විසින් ඔවුන්ට සලකන ආකාරය පිළිබඳව හෝ පැමිණිලි කිරීමට පිහිට පැතීමේ මාර්ගයක් ඔවුන්ට නොතිබිණි.

1079. එසේම හමුදා පිරිස්වල, පොලිස් නිලධාරීන්ගේ හා අතුරු හමුදා කණ්ඩායම්වල සාමාජිකයින්ගේ අඛණ්ඩ රැඳී සිටීම ද අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් සම්බන්ධයෙන් අනාරක්ෂිත තත්ත්වයක් නිර්මාණය කළේ ය. අවසර දෙනු ලැබුයේ නම් මානුෂවාදී ක්‍රියාධරයින් දිවා කාලය තුළ ඇතැම් අවස්ථාවල මැනික් ෆාම්වලට පැමිණි අතර විශේෂයෙන්ම රාත්‍රි කාලයේ ආරක්ෂාවක් හෝ නියාමන යාන්ත්‍රණයන් නොතිබීම අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් විශේෂයෙන් ස්ත්‍රීහු හා ගැහැණු ළමෝ පහසුවෙන් විපතට පත්වන තත්ත්වයක පසු වූහ.

1080. 2009 සැප්තැම්බර්වල දී සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය කඳවුරුවල ආරක්ෂක සිද්ධීන් පිළිබඳ වාර්තා ගැන ගැඹුරු අවධානය ප්‍රකාශ කරමින් ප්‍රකාශයක් නිකුත් කළේ ය. එය සැප්තැම්බර් 26 වෙනි දින මැනික් ෆාම්වල ඇතිවූ සිද්ධියක් වාර්තා කළේ ය. එහි දී අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් කණ්ඩායමක් කලාප දෙකක් අතර ගමන් කිරීමෙන් වැළක්වීමට ආරක්ෂක හමුදා උත්සාහ කළ විට ගැටුමක් ඇති වීම හා හමුදා සෙබළුන් වෙඩි තැබීම පිළිබඳ සිද්ධියකි. ඉවත ගිය උණ්ඩයක් වැදීමෙන් ළමයෙකු අක්‍රියත්වට පත්ව ඇති බව වාර්තා කළ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව හා කායික සුරක්ෂිතතාව සහතික කිරීමේ පියවර ගන්නැයි ද පෙරළා යැවීමේ ක්‍රියාවලිය වේගවත් කරන්නැයි ද එම අවතැන් වූවන්ට යාම් ඊම් නිදහස ප්‍රතිෂ්ඨාපනය කරන්නැයි ද ඉල්ලා සිටියේ ය.[1165]

**කඳවුරු තත්ත්වයන්**

1081. කඳවුරුවල පැවති තත්ත්වයන් විශේෂයෙන්ම 2009 අප්‍රේල් අවසානයේ හා මැයිවල විශාල ගලා ඒම්වලින් පසු තත්ත්වයන් - 2008 දී පටන් ගන්නා ද සැලසුම් හා සාකච්ඡා තිබියදීත් වූ ආණ්ඩුවේ නරක සූදානම තුළ අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ තත්ත්වය උත්සන්න කරනු ලැබීය.

1082. 2009 නොවැම්බර් 26 දින නිකුත් කරන ලද ප්‍රකාශයක දී ''අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කඳවුරුවල ජීවත්වන ජනයා විසින් බුක්ති විඳිනු ලබන සාමාන්‍ය තත්ත්වයක් සහතික කරනු පිණිස කෙටි කාල පරිච්ඡේදයක් ඇතුළත රෝහල්, බැංකු, රජයේ කාර්යාල, පාසල්

1164 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1165 UNHCR, 2009 සැප්තැම්බර් 29 UNHCR ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙයි, reliefweb.int

හා සතොස සාප්පු පිහිටුවීමට එය සමත් විය...''යයි ආණ්ඩුව කියා සිටියේ ය.[1166] 2013 ජනවාරි 31 දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට එය ඉදිරිපත් කරන ලද වාර්තාවේ[1167] දී ආණ්ඩුව ''සෑම සුබ සාධක ගම්මානයක්ම නිවාස කාණ්ඩවලට බෙදනු ලැබිණ. ඒවාට විදුලිය ලබා දී තිබුණ අතර සෑම කාණ්ඩයකටම වෙනම කුස්සි, වැසිකිලි, නාන ස්ථාන හා ළමා හිතකාමී අවකාශ තිබුණි. මධ්‍යස්ථාන ඇතුළත පොදු ස්ථාන හා විනෝදායන කටයුතුවලට විශේෂ ප්‍රමුඛත්වයක් දෙනු ලැබිණ. ජල සලාකය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අනුමත කරන ලද ප්‍රමිතීන් ඉක්මවීය. එසේම සනීපාරක්ෂක පහසුකම් ද ප්‍රමිති තත්ත්වයක පවත්වා ගැනිණ. ආහාර හා පෝෂණය අවධානය යොමු කළ විශේෂ ක්ෂේත්‍රයක් විය.... සුබ සාධක ගම්මානවලට විශේෂ සෞඛ්‍යාරක්ෂණ පහසුකම් හා ප්‍රමාණවත් වෛද්‍ය සැපයුම් සපයනු ලැබිණ...'' යයි සඳහන් කළේ ය.

1083. මැනික් ෆාම් ''සුබ සාධක ගම්මාන'' සැකසුන විවිධ කලාපවල තත්ත්වයන් සැලකිය යුතු අන්දමින් විවිධ වූ අතර කාලයාගේ ඇවෑමෙන් වෙනස් විය. කෙසේ වුව ද කමිටුවට ලැබුණු සාක්ෂිකරු ප්‍රකාශන මෙන්ම එක්සත් ජාතීන්ගේ, මානුෂවාදී සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම හා වෙනත් ඒවා විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ආණ්ඩුව විසින් විස්තර කරන ලද හා සපයන ලද විස්තර පරිදි කඳවුරුවල තත්ත්වයන් අතර පැහැදිලි විෂමතා පෙන්නුම් කරයි.

1084. 2009 අප්‍රේල්වල දී සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කඳවුරුවල අධික සංකේන්ද්‍රණය හා දුක්ඛිත තත්ත්වයන් පිළිබඳව හා ප්‍රමාණවත් සෞඛ්‍යාරක්ෂණයේ අඩුව පිළිබඳව අවධානය මතු කළේ ය. වවුනියාවේ, යාපනයේ හා මන්නාරමේ අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කඳවුරුවලට අදාළව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට බරපතල ආරක්ෂක ප්‍රතිඡ්ඨාවන් ගණනාවක් තිබූ බව නිගමනය කළ විමර්ශනය ආණ්ඩුව විසින් ගත යුතු හදිසි පියවර සම්බන්ධ නිර්දේශන ඉදිරිපත් කාළේ ය.[1168]

1085. 2009 අප්‍රේල්වල දී සෞඛ්‍ය හා පෝෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශය නිකුත් කළ වෙනම වාර්තාවක එහි '' අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ පොදු සෞඛ්‍ය ප්‍රශ්න කළමනාකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ''වලට අනුව වවුනියාවේ අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කඳවුරු පිළිබඳ එහි ඇගයීමේ ප්‍රතිඵල ගෙන හැර දැක්වීය.[1169] වාර්තාව ඒ වන විටත් සිදුව පැවති අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ යෝධ ගලනය ''සම්පත් මත දැවැන්ත පීඩනයක් එල්ලකර අධිකාරීන් වෙත අපමණ ප්‍රශ්න තොගයක්

---

1166 මානුෂීය මෙහෙවර සමයේ අවතැන් වූ සිවිල් ජනයා නැවත පදිංචි කිරීම, ශ්‍රී ලංකා ආණ්ඩුවේ වාර්තාව, 2009 නොවැම්බර් 26, reliefweb.intහි වාර්තා වූ පරිදි ය.

1167 CCPR/C/LKA/5,සම්මුතියේ 40 වන වගන්තිය යටතේ රාජ්‍ය පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සලකා බැලීම, ශ්‍රී ලංකාව, 2013 ජනවාරි 31

1168 UNHCR මධ්‍ය වාර්ෂික විමර්ශනය, 2009 අප්‍රේල් 15

1169 2009 ජනවාරිවල සම්මත කෙරිණ. මාර්ගෝපදේශ ජලයේ හා ආහාරවල සුරක්ෂිතතාව, මලපහ හා අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම, රෝගී ජනයාට ප්‍රතිකාර කිරීම හා කළමනාකරණය, රෝග නිරීක්ෂණය සහතික කිරීම ඇතුළු බෝවන රෝග ව්‍යාප්ත වීම වැළක්වීමේ පියවර නිර්දේශ කරයි.

නිර්මාණය කරන ලද බව පිළිගත් අතර අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කඳවුරුවල ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වූ තත්ත්වයන්ට අදාළ ප්‍රධාන සොයා ගැනීම් විස්තර කළේ ය. වාසස්ථාන තුළ ප්‍රමාණවත් නොවන ඉඩකඩ හා දුර්වල වාතාශ්‍රය; නෑම හා රෙදි සේදීම සඳහා ජලය නැතිකම හා ආරක්ෂිත පානීය ජලය නැතිකම; ප්‍රමාණවත් නොවන වැසිකිලි සංඛ්‍යාව හා ඇතැම් උතුරා යන ඒවා ද ඇතුළුව අසතුටුදායක වැසිකිලි නඩත්තුව හා ආහාර පිළියෙල කිරීමෙහිදී ප්‍රශස්ත සෞඛ්‍යය සහතික කිරීම දුෂ්කර බවට පත් කර තිබෙන පොදු කුස්සිවල තත්ත්වය යන ඒවා ය.[1170]

1086. ඉහත සඳහන් වාර්තා දෙක කමිටුව විසින් සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය කරන ලද සාක්ෂිකරුන්ගෙන් ලැබුණු ප්‍රකාශන හා සමාන විෂමතාවන්: බරපතල තදබදය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක ප්‍රශ්න, වැසිකිලි හිඟය, උතුරා යන වැසිකිලි, 15 දෙනෙකු වන තෙක් තදබදයෙන් පිරුණු කූඩාරම් නිවාස, වියලි කාලයෙහි දරිය නොහැකි උෂ්ණත්වය හා මෝසම් කාලයේ පාවිච්චියට ගත නොහැකි කූඩාරම් ආදිය මතුකර දක්වන අනෙකුත් මූලාශ්‍ර මගින් තහවුරු කරයි. නිදසුන් ලෙස 2009 අගෝස්තුවල දී වාර්තා වූ පරිදි හදිසි ගංවතුර 4 කලාපයේ කූඩාරම් නිවාස 2000 ක් විනාශයට පත්වීම හා 2 කලාපය කුණාටු ජලය සමග වැසිකිලි 95 කින් උතුරා ගිය අප ද්‍රව්‍ය මිශ්‍රිත ජලයෙන් යට වීම රෝග අවදානම වැඩි කළේ ය.[1171]

1087. මැනික් ෆාම් හි 2 වන කලාපයේ තත්ත්වයන් සාක්ෂිකරුවෙකු විස්තර කළේ මෙසේ යː ''මෙම කඳවුරු හැම එකකටම A සිට Z දක්වා ඒකක තිබුණා. මගේ කඳවුරේ සෑම ඒකකයකටම 15 දෙනෙකු සඳහා තිබුණේ මීටර 6 X 6 ඉඩක්. උයන්න තිබුණෙත් ඒකෙ. මේවා තාවකාලික ඉදි කිරීම්, සමහර ඒවාට තිබුණේ ටාපොලින් වහලවල්, සමහර ඒවායේ වහලවල් තුනී තුත්තනාගම් තහඩුවලින් හදලා තිබුණා. A-C අංශවලට තිබුණේ 45 දෙනෙකු පමණ සඳහා එක වැසිකිලිය යි. අපට දිග පෝලිම්වල බලා ඉන්න සිදු උනා. අපට දුන්න ආහාරවලින් පාචනය හැදුනා. බොහෝ දෙනෙකුට වැසිකිලි යන්න උනේ එළියේ. තත්ත්වයන් ඉතාමත්ම පිළිකුල් සහගත උනා.''[1172]

1088. කමිටුවට අනෙකුත් සාක්ෂිකරුවන් කියා සිටියේ 2 වන කලාපයේ තිබුණේ කූඩාරම් හා වැසිකිලි ලෙස පාවිච්චි කරන්නට තිබුණු වටේ ලෑලි ගහපු වලවල් පමණයි. කඳවුරුවල තිබුණු වැසිකිලි වැඩිහරියක් උතුරා යමින් තිබුණා.[1173] ආබාධිත පුද්ගලයින් සඳහා වැසිකිලි හා ඇඟපත සෝදා ගැනීමේ පහසුකම් තිබුණේ නැහැ. ඒක ආබාධිත අයට හා යුද්ධයෙන් තුවාල වී සිටි අයට විශේෂ දුෂ්කරතා හා පීඩාවක් ඇති කළා.[1174] කූඩාරම් සිය ගණනකට ලැබුණේ එක අත්

---

[1170] වවුනියාවේ, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල සනීපාරක්ෂාව, ස්වස්ථතාව හා රෝග නිරීක්ෂණය, සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශයේ වසංගත රෝග අධ්‍යයන අංශය, 2009 අප්‍රේල් 25. http://www.epid.gov.lk/web/attachments/article/150/Vol_36_NO_17_English.pdf

[1171] එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මානුෂවාදී තොරතුරු ඒකකය, ශ්‍රී ලංකාවː මැනික් ෆාම්හි අවතැන් වූවෝ මෝසම් ගංවතුර තර්ජනයට පහසු ගොදුරු වෙති, 2009 අගෝස්තු 21

[1172] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[1173] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

[1174] සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

පොම්පයකින් ලැබුණ වතුර පමණයි. අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට ගඟේ නාන්න තිබුණා. ගැණු අය නාන කොට නිතරම වගේ හමුදා සෙබළුන් බලා සිටියා කියා යි.[1175]

1089. සහන හා පුනරුත්ථාපන ඒකකය හා මැනික් ෆාම්වල මූලික සෞඛ්‍ය සායන හයක් පවත්වා ගෙන ගිය මානුෂවාදී නියෝජිතායතනවල ඒකාබද්ධ එකතුව ''මැනික් කඳවුර හා වවුනියා හා යාපන දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩසටහන'' පිළිබඳ ඔවුන්ගේ අවසාන වාර්තාවෙහි 2009 නොවැම්බර් 2 දක්වා 2 කලාපයේ මූලික සෞඛ්‍ය මධ්‍යස්ථානයට පැමිණි රෝගීන්ගේ ප්‍රමාණය වැඩි වෙමින් පැවති බවත් එයට හේතුව කාලය ඉකුත් වනවිට කඳවුරු මුළුල්ලෙහි රෝග හා අසනීප ව්‍යාප්ත වීමට පටන් ගැනීම බවත්''[1176] සඳහන් කළේ ය. එසේම ඔවුහු හොරි වැනි සමේ රෝග මෙන්ම පාචනය විශේෂයෙන් බහුලව පවතින බව වාර්තා කළහ. ''මෙම කඳවුරුවලට පැමිණියවුන්ට ඇඳගෙන ආ ඇඳුම් හා සරණ ලබා ගත් තාවකාලික ටාපොලින් වාසස්ථාන හැර අන් කිසිවක් නොතිබුණි. ඒ තත්ත්වය විශේෂයෙන්ම පැපොල,[1177] පාචනය, වයිරස් උණ, ඇස් අමාරු හා කැස්ස යන රෝග පැතිරීමේ අවදානම ඇති කළේ ය. යෝග්‍ය ආවරණවලින් තොර විවෘත මලපහ කිරීම පුළුල්ව පැතිර පැවතුනේ වැසිකිළි පහසුකම් නොමැතිකම හේතු කොට ගෙන ය.''වාර්තාව එහි නිගමනයන්හි දී ''සෞඛ්‍යයට හානිකර පරිසරය කඳවුරේ නිවැසියන් (මැනික් ෆාම්) වෙත නිතරම වාගේ රෝග හෝ සාමාන්‍ය අසනීප ව්‍යාප්තවීමක් සහතික කළේ ය''යි සඳහන් කළේ ය.

1090. ක්‍රියාත්මක වෙමින් පැවති වෛද්‍ය පහසුකම් වෙත පැමිණි විට අභ්‍යන්තර අවතැන්වූ රෝගී රෝගී පුද්ගලයින්ට පැය ගණන් පෝලිම්වල සිටින්නට සිදුවීම වැනි දුෂ්කරතා ද මානුෂවාදී ක්‍රියාධරයෝ විස්තර කළහ. රෝගීන්ට වෛද්‍යවරුන් සමග කතා කරන්නට ලැබෙන්නේ නැතිකම ගැන නිතර වාර්තා විය. වෛද්‍යවරුන් බොහොමයක් කතා කළෙ සිංහලෙන් පමණි. රෝහල්වලට මාරුකර යවන රෝගීන් ඇතැම් අවස්ථාවල ප්‍රමාණවත් ලෙස සුව වීමට පෙර ආපසු කඳවුර වෙත එවා ඇත.[1178] තව ද රෝහලට ගෙන යනු ලැබූ පවුලේ සාමාජිකයන් සමග සම්බන්තා පැවැත්වීමට කඳවුර ඇතුලේ සිටින ඥාතීන්ට ඉඩ ලැබී නැත. රැගෙන ගිය රෝගී ඥාතීන් සිටින්නේ කොහේ දැයි දැන ගැනීමට ඔවුන්ට ක්‍රමයක් නොතිබිණ. අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට ප්‍රතිකාර කිරීමට අවසර දී තිබූ වවුනියාව රෝහල ඇතුළත හා පිටත හමුදා රැකවල් විය. ඒ නිසා රෝහලට ඇතුළු වීමට මෙන්ම තොරතුරු ලබා ගැනීම ද සීමා විය. මුල දී රෝහල් අධිකාරීන් ප්‍රතිකාර සඳහා රෝහල්ගතව සිටි අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් බැලීමට ඔවුන්ගේ ඥාතීන්ට අවසර දී නැත. මාස ගණනාවකට පසු අවසර පත් ක්‍රමයක් ඇති කරන ලද අතර රෝහලට ඥාතීන් බැලීමට ඒමට අවශ්‍ය අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් කඳවුරේ ලියා පදිංචි විය යුතු විය. රෝහලට පැමිණීමේ දී ද ඔවුන් හමුදා නිලධාරීන් වෙත ලියා පදිංචි විය යුතුව තිබිණ. ඔවුන් එදිනම ප. ව. 6 වන විට කඳවුරට ආපසු පැමිණිය යුතුව තිබුණි.

---

1175 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1176 මැනික් ෆාම් හා වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල ඒකාබද්ධ සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩ සටහන, සහන හා පුනරුත්ථාපන ඒකකය සහ මානුෂවාදී නියෝජිතායතන එකතුව 2010 මාර්තු

1177 ජූනිවල පැපොල ව්‍යසනයක් රෝගීන් 12,195 ක් වාර්තා කරනු ලැබීමට මග පාදයි, ඉහත වාර්තාවම

1178 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1091. මානුෂවාදී වාර්තා දක්වන්නේ යාම් ඊම් නිදහස සීමා කිරීම් හා ප්‍රවාහනයේ අඩුව හේතු කොට ගෙන අඩ වශයෙන් ඇතිවන වෛද්‍ය සත්කාරය නොමැතිකම, කඳවුරු තත්ත්වයන් හා වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාදය වැලක්විය හැකි මරණවලට හේතු වී ඇති බව ය. ඔවුන් බොහොමයකට සත්කාර කිරීමට ඥාතීන් නොමැති හෙයින් වයසට පත් වූ අය පහසුවෙන් විපතට පත් විය හැකි අය අතර වූහ. අප්‍රේල් 27 වෙනි දින වවුනියා දිස්ත්‍රික් මහේස්ත්‍රාත් අධිකරණය අවුරුදු 60 ට වැඩි රෝගී හා අභ්‍යන්තර අවතැන් පුද්ගල කඳවුරුවල ඥාතීන් නොමැති සියලුම අභ්‍යන්තර අවතැන් පුද්ගලයින් වැඩිහිටි නිවාසවලට මාරු කරන ලෙස නියෝග කළේ ය. තීරණයට පදනම් වූයේ අභ්‍යන්තර අවතැන් පුද්ගල කඳවුරුවල කුස ගින්න හා මන්දපෝෂණය නිසා සෑම දිනකම වයස්ගත පුද්ගලයන් පහකට වඩා මිය යන බවට ඔහු කළ සොයා ගැනීම හා ඉකුත් දින මැනික් ෆාම්වල වයස්ගත පුද්ගලයින් 14 දෙනෙකු මිය ගිය බව වාර්තා වීමත් ය.[1179]

1092. 2009 ජූනිවල වෙනත් කඳවුරුවල දෙකක් ඇතුළුව බිම වැතිරී සිටි වයසක පුද්ගලයින්ගේ සිරුරු ඇතැම් විට තමන් දුටු බව මානුෂවාදී සේවකයෝ වාර්තා කළහ.[1180] බොහෝ වයසක පුද්ගලයින් කඳවුරුවල සිටියේ කාත් කවුරුත් නැතිව ය. සමහර අවස්ථාවන්හි දී පවුල්වලින් වෙන් කර ඇති අතර පවුලේ අනෙක් අය සිට ඇත්තේ වෙනත් කඳවුරුවල ය. ඔවුන්ට නැවත එකතු වීමට ලැබී නැත. එසේම බොහෝ සාක්ෂිකරුවන් වයසක අය විශේෂයෙන් ගැටුම් කලාපයේ පැවති තත්ත්වයන් මගින් දුර්වලවී සිටි බව විස්තර කර තිබුණි. ජූනි මාසයේ සිට ප්‍රමුඛතාවක් ලෙස ගෙන වයසක පුද්ගලයින් නිදහස් කිරීම ඇරඹුණ ද බොහෝ විට ආයතනවලට යටත් පිරිසෙයින් ආරම්භයේ දී ඔවුන් රැක බලා ගැනීමේ ධාරිතාවක් නොතිබුණි (පහතින් එන නිදහස් කිරීම් හා නැවත පදිංචි කිරීම් බලන්න)[1181]

1093. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම එහි අවසාන වාර්තාවෙහි ''ගැටුමෙන් විපතට පත් ප්‍රදේශවල වයස්ගත පුද්ගලයින් මහත් සේ පීඩාවට පත්ව තිබේ'' යයි ද ''ඔවුන් විඳ තිබෙන කායික දුෂ්කරතා, මනෝවිද්‍යාත්මක ක්ෂතිය හා ආර්ථික දුෂ්කරතාවන්ට'' ''වැඩි පිළිගැනීමක් අවශ්‍ය'' යයි ද (9.96 ඡේදය) පිළිගෙන තිබේ. එය ආණ්ඩුවෙන් හා අනෙකුත් පංගු පාර්ශවකරුවන්ගෙන් ''ගැටුම් හා සම්බන්ධිත මානසික පීඩාව ඇතුළු අබලතාව හා අනෙකුත් කාලයක් මුළුල්ලේ නොතකා හැර තිබූ සෞඛ්‍ය ප්‍රශ්න හේතු කොට ගෙන පැන නැගී තිබෙන වයස්ගත වූවන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට අවධානය යොමු කරන්නැ''යි ද ඔවුන්ගේ විස්තෘත පවුල් රැක බලා ගැනීමෙහිලා සහාය වීමේ විධිවිධාන සලසන්නැයි ද ඉල්ලා තිබේ.

1094. ආණ්ඩුවට අනුව කඳවුරුවලට ''පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමතාවෙන් පෙළෙන පුද්ගලයින්ට සහාය වීම ඇතුළුව මනෝ විද්‍යාත්මක සත්කාරය සඳහා විශේෂ පහසුකම් සපයනු

---

1179 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1180 මැනික් ෆාම් හා වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල ඒකාබද්ධ සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩ සටහන, සහන හා පුනරුත්ථාපන ඒකකය සහ මානුෂවාදී නියෝජිතායතන එකතුව 2010 මාර්තු

1181 අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ආරක්ෂණ වැඩ කණ්ඩායම, 2009 ජූනි 31, දෙවන ත්‍රයි මාසික යාවත්කාලීනය; සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

ලැබ තිබේ.'' කෙසේ වුව ද විමර්ශන කමිටුව විසින් එක් රැස්කර ගන්නා ලද තොරතුරුවලට අනුව ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන එවැනි සේවා සැපයීමට ඔවුන් සූදානම් බව දක්වා තිබියදීත් මානසික සෞඛ්‍ය වෘත්තිකයින්ට කඳවුරුවලට ප්‍රවේශය ප්‍රතික්ෂේප කර තිබේ. බොහොමයක් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයෝ යුද්ධය කාලයේ ඔවුන්ට අත්විඳින්ට වූ තුවාල, පවුල් සාමාජිකයින්ගේ මරණ, ඥාතීන් ඉන්නේ කොහේ ද යන්න පිළිබඳව තොරතුරු නැතිකම හා ඔවුන්ගේ අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාව ආදියට මුහුණ දෙන්නට පොර බදමින් සිටියහ. ඇතැම් අය ගැටුම සමයේ ඔවුන්ගේ මුළු පවුලම මරා දමනවා දැක තිබුණි. කඳවුරු ඇතුළත හා පිටත යාම් ඒම් නිදහස නැතිකම, ඔවුන්ට කොතරම් කලක් කඳවුරුවල සිටින්නට සිදුවේ ද යන්න පිළිබඳ අවිනිශ්චිතතාව හා අර්ථවත් ක්‍රියාකාරිත්වයන් නැතිකම අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ ක්ෂතිය උග්‍ර කළේ ය.[1182] වාර්තා වී ඇති පරිදි අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට 2009 සැප්තැම්බර්වල සිටසිවිල් සමාජ සංවිධානවල ආධාරය ඇතිව මූලික මානසික සෞඛ්‍ය සේවා සපයා තිබිණ. එහෙත් ඒවා දැවැන්ත අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවීය.[1183]

1095. 2009 ජූනිවල දී නව අධිකරණ ගොඩනැගිල්ලක් විවෘත කිරීමෙන් පසු මැනික් ෆාම්වල කළ සංචාරයකින් අනතුරුව එවකට අග විනිසුරු සරත් නන්ද සිල්වා මෙසේ කියා ඇත. ''ඔවුන් මුහුණ පා සිටින ඛේදනීය තත්ත්වය මට විස්තර කරන්නට නොහැකි ය. මට ඔවුන් සනසාලිය නොහැකි විය. ඔවුන් ජීවත්ව ඉන්නේ අතිමහත් පීඩාවක් හා මානසික ආතතියක් මැද්දේ ය.... අපි අපේ පැත්තේ යෝධ ගොඩනැගිල්ලක් ඉදි කරමු. එහෙත් මෙම අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් ජීවත් වන්නේ කූඩාරම්-නිවාසවල ය. අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් 10 ක් එක කූඩාරම් නිවසක වාසය කරති. ඔවුන්ට කෙලින් හිට ගත හැක්කේ කූඩාරම් නිවස මැද්දේ පමණි.... අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයන් සොබාදහමෙන් ඇමතුමක් එනතුරු පිළිතුරු සැපයීමේ ඔවුන්ගේ වාරය ගැනීමට යාර 50-100 ක් දිග පෝලිංවල බලා සිටිනු දැකිය හැකි ය. චෙඩ්ඩිකුලම් කඳවුරේ වන්නි අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ ජීවිතය මෙයයි.''[1184] ''ඔවුන් ජීවත් වන්නේ රටේ නීතියේ ආරක්ෂාවෙන් පරිබාහිරව ය.... අපි මෙම ජනතාවට විශාල වැරද්දක් කරමින් සිටිමු.''[1185]

1096. නැවත පදිංචි කිරීම සඳහා වූ ආනුෂංගික නිදහස් කිරීම් සමග කඳවුරුවල තදබදය ලිහිල් වීම (පහතින් බලන්න) හා අතිරේක සේවා සැපයීම සිදු වුව ද විටින් විට වාර්තා වූ පානීය ජලය ලැබීමේ අඩුපාඩු, පිරිහෙමින් පැවති නිවාස, ආහාර සම්බන්ධ සීමිත ප්‍රවේශය, අහිතකර තත්ත්වයන් හේතු කොට ගෙන බෝවිය හැකි රෝග අවදානම් දිගටම පැවතීම නිසා කඳවුරුවල තත්ත්වයන් අවශ්‍යයෙන්ම දියුණු නොවීය.

1097. අවුරුද්කට වැඩි කාලයකට පසු 2010 අගොස්තුවල දී උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ සභාපතිවරයා තවමත් එහි සිටි අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ

---

1182 ජූනිවල පැපොල ව්‍යසනයක් රෝගීන් 12,195 ක් වාර්තා කරනු ලැබීමට මග පාදයි, ඉහත වාර්තාවම

1183 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1184 මැනික් ෆාම් හා වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල ඒකාබද්ධ සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩ සටහන, සහන හා පුනරුත්ථාපන ඒකකය සහ මානුෂවාදී නියෝජිතායතන එකතුව 2010 මාර්තු

1185 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මූලික අයිතිවාසිකම් පෙත්සමේ උපුටා දක්වා ඇත. එහිම 2009 ජූනි

ප්‍රකාශනවලට සවන් දීමට චෙට්ටිකුලම් කඳවුරෙහි (මැනික් ෆාම්) කළ සංචාරය තුළ දී කඳවුරු තුළ තත්ත්වය ''ඉතා නරක'' යයි විස්තර කළ අතර නැවත පදිංචි කිරීම කඩිනම් කරන්නැයි ඔවුන් ආණ්ඩුවට නිර්දේශ කරනු ඇතැයි කියා සිටියේ ය.[1186] අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් කඳවුර තුළ ඔවුන්ගේ දිග්ගැස්සුණු නිදහස අහිමි කිරීම, ඉසිලිය නොහැකි තත්ත්වයන්, හේතු පරාසයක් නිසා ඔවුන් නැවත පදිංචි කිරීමට පාලකයින් අසමත් වීම, ආහාර මිල දී ගැනීමට ආදායම හා ආධාර නැතිකම පිළිබඳව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමට විස්තරකර තිබුණි.

1098. 2011 ''ශ්‍රී ලංකාවේ මානුෂවාදී ප්‍රයත්නය'' යන එහි වාර්තාවෙහි ආණ්ඩුව 2009 ජනවාරියේ දී ජාත්‍යන්තර ප්‍රජාවට එය ඉදිරිපත් කරන ලද සැලස්ම ''එක්සත් ජාතීන් හා ජාත්‍යන්තර නියෝජිතායතන විසින් සම්පූර්ණයෙන් අනුමත නොකරන ලද්දේ'' ''ශ්‍රී ලංකා ආණ්ඩුව දිගු කාලයකට අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් රඳවා ගැනීමට සැලසුම් කරමින් සිටියේ ය යන ඔවුන්ගේ විශ්වාසය'' නිසා බවත් ''සත්තකින්ම මෙම විශ්වාසය බොහෝ නියෝජිතායතන මෙම පහසුකම්වල වඩා ස්ථාවර ව්‍යුහයක මූලයන් තිබුණ බව වටහා ගනු ලැබූ නිසා වඩා හොඳ පහසුකම් ඉදි කිරීමට විරෝධය පෑමට සලස්වන ලද'' බවත් සඳහන් කළේ ය. ප්‍රතිඵලයක් වශයෙන් ''ශ්‍රී ලංකා ආණ්ඩුවට අතරමැද එකඟතාවකට එන්නට හා පරිපූර්ණ සැලසුම්වලට වඩා අඩුවෙන් වැඩ කරන්නට සිදුව තිබුණි''යයි එය කියා සිටියේ ය. ''ඉතා දීර්ඝ කාල පරිච්ඡේදයක් සඳහා අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් රඳවා ගැනීම ආණ්ඩුවේ අභිලාෂය ලෙස ඔවුන් වරදවා දුටු නිසා ආණ්ඩුවේ උත්සාහය වළකාලීමට ඇතැම් නියෝජිතායතනවල තිබූ බව පෙනෙන අධිෂ්ඨානය මගින් ප්‍රශ්න ගණනාවක් ඇති කරනු ලැබීය. මෙය අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට මාස තුනකට වඩා ඔබ්බට සිටීමට සිදුව තිබුණහොත් මෙසේ කරනු ඇතැයි යන පොරොන්දු තිබියදීත් පහසුකම් වැඩි දියුණු කිරීම ප්‍රතික්ෂේප කිරීමකට මග පෑදීය. මෙය කිසි විටෙක මාස තුනකට වඩා පාවිච්චි කිරීමට අපේක්ෂා නොකළ කෙටි ආයු කාලයකින් යුත් කූඩාරම්, ඉදි කිරීමේ ජාතික ප්‍රමිතීන් නොසලකා හැරි පහළ ප්‍රමිතියේ වැසිකිළි සැපයීම සම්බන්ධයෙන් ගත් කල අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට අපහසුතාවක් නිර්මාණය කළ අතර තදබදය අඩුකිරීමට සහය වීම ප්‍රතික්ෂේප කිරීමක් වූයේ ය.'' යනුවෙන් සඳහන් කිරීමට තරම් එය දුර ගියේ ය.[1187]

1099. අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ මූලික අවශතා සැපයීම හා ඔවුන්ට ගරුත්වයෙන් යුතුව සැලකීම ආණණ්ඩුවේ බැඳීමක් වූ බව කමිටුව සඳහන් කරයි. තව ද මානුෂවාදී නියෝජිතායතන කඳවුරු තුළ ආධාර සැපයීමේ දී බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේ ය. මුල දී ඔවුන් පැමිණි හැම අවස්ථාවක දී ම ඔවුන්ට මැනික්ෆාම් කඳවුරට පිවිසීම සඳහා කේවෙල් කිරීමට සිදුව තිබුණ නමුත් 2009 ජූනිවල දී කඳවුරුවලට ඇතුළු වීමට කලින් අවසර දී තිබුණ එක්සත් ජාතීන්ට හා රාජ්‍ය නොවන සංවිධාන කාර්ය මණ්ඩලික සාමාජික සාමාජිකාවන්ට හැඳුනුම්පත් නිකුත් කෙරිණ. කෙසේ වුව ද 2009 දෙසැම්බර් දක්වා වන තෙක්ම මානුෂවාදී

---

1186 චෙට්ටිකුලම් කඳවුරේ දී LLRC කරුණු විභාග කිරීමෙහි පිටපත

1187 ශ්‍රී ලංකාවේ මානුෂවාදී ප්‍රයත්නය, ජනාධිපති කාර්ය සාධක බලකාය 83 පිටුව, 159 ඡේදය

සංවිධාන කඳවුරුවලට ප්‍රවේශය ලබා ගැනීමට ද්විත්ව සති පදනමක් මත හමුදාවෙන් අවසර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම අවශ්‍ය කෙරිණ.

1100. මානුෂවාදී කියාකාරකයන් ප්‍රවේශය ලබා ගත් පසු ඔවුන් මත ඉතා දැඩි කොන්දේසි පනවනු ලැබිණ. කඳවුරුවලට ඇතුළු වීමට අවසර දෙන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හා වාහනවල සීමාවක් විය. කඳවුරු තුළට ජංගම දුරකථන හෝ කැමරා ගෙන යාමට ඔවුන්ට අවසර නොදුනි. කඳවුරු තුළ සියලුම මානුෂවාදී ක්‍රියාධරයින්ගේ යාම් ඒම් සමීපව අධීක්ෂණය කෙරුණු අතර සමහර මානුෂවාදී සංවිධානවලට කඳවුරේ සමහර ප්‍රදේශවලට ඇතුළු වීමට සීමා පැනවිණ. ඔවුන්ට අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ කුඩාරම්වලට ඇතුළුවීමට හෝ ඔවුන් සමග පෞද්ගලිකව කතා කිරීමට අවසර නොදුන් හෙයින් අවශ්‍යතා හා ආරක්ෂාව පිළිබඳ කාරණා තක්සේරු කිරීමට අත්‍යවශ්‍ය වූ දත්ත එක්රැස්කර ගැනීමට ඔවුන්ට හැකි නොවීය.

1101. කඳවුර ඇතුළත හැම තැනම සොල්දාදුවන්ගේ, පොලිස් නිලධාරීන්ගේ හා ඔත්තුකරුවන්ගේ රැඳී සිටීම මානුෂවාදී සංවිධානවලට විස්තීරණ අවශතා ඇගයුම් කිරීම හෝ කඳවුරේ තත්ත්වයන් පිළිබඳව අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගෙන් තොරතුරු ලබා ගැනීම[1188] ද අනතුරුව ප්‍රමාණවත් මානුෂවාදී ආධාර සැපයීම දුෂ්කර කළේ ය.[1189]

1102. යාම් ඒම් මත සීමාවන් ලිහිල් කිරීම

1103. 2009 දෙසැම්බර් 1 වෙනි දින තෙක් කඳවුරු තුළ අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ගේ යාම් ඒම් මත සීමාවන් ලිහිල් කරනු ලැබුවේ නැති අතර නොවැම්බර් 30 වෙනි දින ''මේ දිනයේ සිට ගම් විවෘත වූ ලෙස ප්‍රකාශයට පත් කරනු ඇතැයි ද... ඔවුන් ඔවුන්ගේ පෞද්ගලික විස්තර අදාළ අධිකාරීන්ට දෙනු ලැබූ විටක ඕනෑම සිවිල් වැසියෙකුට ගම් හැර යෑමේ නිදහස ලැබෙන බව ආණ්ඩුව ප්‍රකාශකර ඇතැයි''ද නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍ය රිසාත් බදියුදීන් විසින් දෙන ලද වාර්තා වූ සහතික වීම්[1190] තිබියදීත් ඉන් අනතුරුව පවා කඳවුරු තුළට හා පිටතට යාම් ඒම් දැඩිව පාලනය කෙරිණ.

1104. නැවත පදිංචිය සඳහා මැනික් ෆාම්වලින් මුදා නොහරිනු ලැබූවන්ට පසු මාස පුරාම කඳවුරු හැර යාමට තාවකාලික අවසර පත්‍ර ලබා ගැනීමට සිදුව තිබිණ. ඒවා නිකුත් කරන ලද්දේ නිතරම වාගේ කලාපයෙන් කලාපයට වෙනස්ව හා කාල සීමාවන්ට යටත්ව වෙනස් විය හැකි පටිපාටිවලට අනුව ය. සියලුම අවසර පත්‍රවලට යුද අධිකාරීන්ගේ අවසරය අවශ්‍ය කෙරුණු අතර අලුත් අවසර පත්‍ර ක්‍රමය ඔවුන්ට යාම් ඒම්වල යම් සීමාසහිත නිදහසක් ලබා දුනි. එහෙත් එයින් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට අවසරයක් නොමැතිව කඳවුරු වටේ, කලාප හා කඳවුරු අතර වුව යාම් ඒම් කිරීමට හැකිය යන්න අදහස් කෙරුණේ නැත. ඔවුන්ගේ තාවකාලික

1188 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1189 කොළඹ, එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් නිල කේබල් පණිවිඩයක් 2009 ජූනි 24 https://www.wikileaks.org/plusd/cables/09COLOMBO637_a.html

1190 www.defence.lk/new.asp?fname=20091130_04

අවසරපත්වල කාලය ඉකුත්ව ආපසු කඳවුරට පැමිණෙන අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් සම්පූර්ණ ආරක්ෂක සෝදිසි කිරීමකට භාජනය කෙරුණි.[1191]

1105. සැබවින්ම බොහෝ මාස ගණනකට පසුවත් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් අනෙක් කඳවුරුවල සිටින අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් බැලීමට යාම් මත තවමත් සීමාවන් පැවති බව වාර්තා කෙරෙමින් තිබිණ. ඒවා කලාප අතර විවිධ විය. නිදසුන් ලෙස 2010 මැයිවල 1, 2 හා 3 කලාපවල අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට පෙ. ව. 8.30 සිට ප. ව. 5.30 දක්වා හමුදා මුර පොලෙහි ඔවුන්ගේ හැඳුනුම්පත් තබා පිටතට ගොස් ආපසු පැමිණීමේ දී ඒවා සොයා බලා ආපසු ලබා ගත හැකි ය. අනෙක් කලාපවල අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් පැය 24 කට කලින් තාවකාලික අවසර පත්‍රයක් සඳහා අයදුම් කළ යුතුව තිබිණ. 2010 මැයිවල 2 කලාපයේ පවුලක එක සාමාජිකයෙකුට පමණක් සති කිහිපයක් සඳහා කඳවුර හැර යාමට තාවකාලික අවසර පත්‍රයක් ලබා ගත හැකි විය.

**අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් මුදා හැරීම් හා නැවත පදිංචි කිරීම**

1106. ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක හා විදේශ ලේකම් සහ ජනාධිපති මහින්ද රජපක්ෂ හමුවකින් පසු 2009 මැයි 22 වෙනි දින නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයක ආණ්ඩුව ''හැකිතාක් ඉක්මනින් සුබ සාධක ගම්මාන අහෝසි කිරීම හා අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් සියලු දෙනා ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානවල නැවත පදිංචි කිරීමේ දින 180 සැලස්මක් කියනු ලබන පරිදි කෙටුම්පත් කිරීම ඔවුන්ගේ අභිලාෂය වූ බව දක්වා තිබිණ. [1192]

1107. ආණ්ඩුව විසින් දෙන ලද අනේක විධ පොරොන්දු තිබියදීත් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් කඳවුරුවලින් මුදා හැර ඔවුන්ගේ ගම්වලට ආපසු යැවීම සිදු වන්නේ ඉතා මන්දගාමීව ය. කඳවුරුවලදී අධිකාරීන් විසින් සේවය ලබා ගන්නා ලද ඇතැම් මානුෂවාදී ක්‍රියාධරයින් හා වෛද්‍ය කාර්ය පිරිස් අධිකාරීන් විසින් 2009 මැයි අවසානය වන විට මුදා හැර තිබුණි.[1193] වයස්ගත වූවෝ, දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටි පුද්ගලයෝ පළමුවෙන් මුදා හරින ලද අය අතර වූහ. 2009 සැප්තැම්බර් වන විට 16,490 ක් පමණ සත්කාරක පවුල් වෙත හා වැඩිහිටි නිවාසවලට මුදා හැර තිබිණ. අභ්‍යන්තර අවතැන්වූවෝ තවත් 35,822 ක් ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානවලට ආපසු පැමිණ තිබිණ.[1194] කෙසේ වුව ද එක්සත් ජාතීන්ගේ මානුෂවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයට (OCHA) අනුව අභ්‍යන්තර අවතැන්වූවෝ 238,000 ක් ඒ කාලයේ වවුනියාවේ කඳවුරුවල එතෙකුත් ඉතිරි වී සිටියහ.

---

1191 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1192 http://www.news.lk/ as accessed through reliefweb/web.int/report/sri-lanka/india-and-sri-lanka-agree-idp-timetable-political-solution

1193 මූලාශ්‍රය W-037

1194 එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ මානුෂවාදී යාවත්කාලීනය, වාර්තාව # 11,ඔක්තෝබර් 10-23 Report # 11, 10 – 23 October 2009, http://reliefweb.int/sites/reliefweb.int/files/resources/C14269A7E2A57F27C125765D00357EE3-Full_Report.pdf

1108. අනෙකුත් අය අවසරයකින් තොරව කඳවුරු හැර ගොස් තිබේ. ඔවුන්ගේ මුදාහැරීම පහසුකර තිබෙන්නේ අල්ලස් ගෙවීම හරහා ය. හමුදා පිරිස්වලට විශාල අල්ලස් ගෙවීම මගින් ඔවුන්ගේ මුදා ගැනීම පිළියෙල කර ඇත්තේ පවුලේ සාමාජිකයින් බවත් ඇතැම් අවස්ථාවල මේවා පිළියෙල කර තිබෙන්නේ ඊපීඩීපී අතුරු හමුදාවන්ගේ සහයෙන් බවත් බොහෝ සාක්ෂිකරුවෝ පැවසූහ.[1195] කඳවුරුවල මුල්ම කාලයේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ස්ථාපනය කරන ලද බවත් ඒවා අල්ලස් ගෙවීම් පහසුකරණය කළ බවත් සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ. එල්ටීටීඊ කාඩර්වරුන්ගේ පවුල් කඳවුරුවලින් ඔවුන් මුදා ගැනීම පහසුකරණය සඳහා විශාල මුදල් ගෙවූහ.[1196] ඇතැම් අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් ඔවුන්ගේ පවුල් මුදවා ගැනීමට හමුදා පුද්ගලයින්ට පවුලේ ස්වර්ණාභරණ භාර දී ඇත.[1197]

1109. 2009 සැප්තැම්බර් 9 වෙනි දින වර්ධනය වන ජාත්‍යන්තර බලපෑමෙන් අනතුරුව එය අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට කඳවුරු අත්හැර ඔවුන්ගේ ඥාතීන් සමග ජීවත් වීමට අවසර දෙන බව නිවේදනය කළේ ය.[1198] 2009 ඔක්තෝබර්වල 50, 000ක් පමණ කඳවුරු අත්හැර නැවත පදිංචි වීමට මුදාහළ විට එය මුදා හැරීම් රැල්ලක් බවට හැරුනේ ය.[1199]

1110. කෙසේ වුව ද 2009 දෙසැම්බර් අවසානයේ දී අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්ට ආපසු යාම සඳහා අවසන් දිනයක් නියම කර නොමැති බව ද තවමත් කඳවුරුවල 100,000 කට වඩා ඉතිරිවී සිටින බව ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යවරයා පිළි ගෙන තිබෙන බව ද ආණ්ඩුව උපුටා දක්වමින් මාධ්‍යයෙහි පළ කෙරිණ.[1200]

1111. 2010 ජනවාරි 20 දින ජනාධිපතිවරණයෙන් පසු අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් ආපසු යාම සැලකිය යුතු අන්දමින් වැඩි විය. 2010 මාර්තු වනවිට මැනික් ෆාම් හි 88,198 ක් ඇතුළුව පුද්ගලයින් 92,000 ක් තවමත් කඳවුරුවල සිර වී සිටියේ[1201] අඛණ්ඩව පැවති යාම් ඊම් සීමාවන්ට මුහුණ දෙමිනි.[1202] එසේ වුව ද 2011 පෙබරවාරි අවසානය වන විට මැනික් ෆාම්වල එතෙකුත්

---

1195 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1196 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1197 සාක්ෂිකරු ප්‍රකාශ ගොනුවේ

1198 www.priu.gov.lk/news_update7Current_ Affairs/ca200909/200909govt_to_release_idps_relatives.htm

1199 2009 ඔක්තෝබර් 29 වන විට අභ්‍යන්තර කඳවුරු ස්ථාන හා ධාරිතාව, වවුනියාව, UNOCHA; වන්නි අභ්‍යන්තර අවතැන් කඳවුරු සහ රෝහල් තොරතුරු, 2008 සැප්තැම්බර් 28 දින වන විට යාවත්කාලීන කර තිබූ පරිදි 2008 අප්‍රේල් 1 දින සිට පැමිණීම්; ශ්‍රී ලංකාව සියලු යුද අවතැන් වූවන් නිදහස් කරයිඃ නිලධාරියෙක්, AFP, නොවැම්බර් 21

1200 Daily Mirror, *Government now says no deadline to resettle IDPs*, 2009 දෙසැම්බර් 29, http://www.dailymirror.lk/index.php/news/512-government-now-says-no-deadline-to-resettle-idps.html

1201 UNOCHA 2010 මාර්තු 11 දිනට යාවත්කාලීන කළ පරිදි අභ්‍යන්තර අවතැන් කඳවුරු හා නැවත පදිංචි කිරීමේ තොරතුරු

1202 UNHCR මැනික් ෆාම් වැසීමත් සමග ශ්‍රී ලංකාවේ අවතැන්වීමේ පරිච්ඡේදය නිමා වෙයි. 2009 සැප්තැම්බර් 27, http://www.unhcr.org/506443d89.html; හමුදාව විසින් අත්පත්කර ගෙන තිබූ නිසා අවසන් පවුල් 110 ට ඔවුන්ගේ ඉඩම්වලට ආපසු පැමිණීමට ඉඩ දී නොමැත. ඔවුන් මුලතිව් දිස්ත්‍රික්කයේ කෙකපිලාවුවල රජයේ ඉඩම්වල නැවත පදිංචි කරනු ලැබිණ.

සිටියේ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් 17,701 කි.[1203] 2012 සැප්තැම්බර් 26 වෙනි දින මැනික් ෆාම් නිල වශයෙන් වසන විට ඇතැම් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් වසර තුනකට වඩා වැඩි කාලයක් එහි ගත කර තිබුණි.

1112. ඔවුන් ඔවුන්ගේ ප්‍රජාවන්වලට හෝ නැවත පදිංචියට පැමිණීමෙන් පසු විශේෂයෙන් මානව හිමිකම් කවුන්සිලයට කලින් ඉදිරිපත් කළ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාල වාර්තාවල ලේඛනගත විශාල වශයෙන් හමුදාකරණය වූ නිශ්චිත වාතාවරණයක බොහෝ දෙනෙක් නිරීක්ෂණයේ, තර්ජනයන්ගේ හා ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාව-පාදක හිංසනයන්ගේ අවදානමට මුහුණ දුන්හ. පවුල් සාමාජිකයන් නැති වීම, ගැටුමේ තුවාල කැලල් ඇතුළු බොහෝ දෙනෙකු අත් විඳ තිබූ නිශ්චිත අත්දැකීම් දිගු කාලයක් පුරා පවතිනු ඇත. 2013 ඇගේ ශ්‍රී ලංකා සංචාරය අවසානයේ දී හිටපු මහ කොමසාරිස් නවි පිල්ලයි මෙසේ සඳහන් කළා යː ''සටන අවසන් වී තිබුණ ද පීඩාව අවසන්ව නොතිබුණි. මා සංචාරය කර තිබුණ සියලු ප්‍රදේශවල නැති වූ හා මිය ගියවුන්ගේ ඥාතීන් හා යුද්ධයෙන් දිවි බේරා ගෙන තිබෙන්නවුන් අතර මට දකින්නට ලැබුණු ගැඹුරු මානසික කම්පනය මගින් මෙන්ම නැවත ප්‍රකෘති තත්ත්වයට පැමිණීමට ඇති ඔවුන්ගේ හැකියාව මගින් මම අත්‍යන්තයෙන්ම චිත්තාවේගයට පත්වීමි....'' යි සඳහන් කළා ය.[1204]

**3 කොටස**

## XVII. ශ්‍රී ලංකාව පිළිබඳව මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයේ ප්‍රධාන සොයා ගැනීම් (OISL)

1113. පහතින් එන කොටස කමිටුව (OISL) විසින් එහි විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් හා එහි සන්තකයේ තිබෙන තොරතුරු මත තහවුරුකර ගන්නා ලද ප්‍රධාන සොයා ගැනීම් සම්පිණ්ඩනය කරයි. හුදු චෝදනා ප්‍රමාණය, ඒවායේ බරපතලකම, පුනරාවර්තනය හා ඒවායේ ක්‍රියාකරන විධියේ සමානත්වයන් මෙන්ම ඒවා පෙන්නුම් කරන අනවතර චර්යා රටාව යන සියල්ල යොමු වන්නේ අපරාධ පද්ධතියක් කරා ය. මෙම බරපතල කළ බව කියන උල්ලංඝනයන්ට වගකිව යුත්තන්ගේ අනන්‍යතාව තහවුරුකර ගැනීම හැම විටම කළ නොහැකි වූ අතර මෙම සොයා ගැනීම් විමර්ශනයට භාජනය වූ කාල පරිච්ඡේදය ඇතුළත සියලු පාර්ශව විසින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරනු ලැබ ඇති බවට, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරනු ලැබ ඇති බවට හා ජාත්‍යන්තර අපරාධ සිදු කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබෙන බව පෙන්නුම් කරයි. සත්තකින්ම අධිකරණයක් හමුවේ තහවුරු වුවහොත් මෙම බොහෝ චෝදනාවන් තත්ත්වයන්ට යටත්ව යුද අපරාධ හා/හෝ මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස

---

1203 UNHCR, Shelter/ NFI Sector Meeting Thursday, 3 March 2011, file:///D:/downloads/Shelter%20Meeting%20Minutes%20-%2003.03.2011.pdf

1204 ශ්‍රී ලංකාවේ ඇගේ සංචාරය නිමවීම අවසානයේ දී මහ කොමසාරිස් නවි පිල්ලෙයි විසින් පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාව, 2013 අගෝස්තු 31, කොළඹ

සැලකිය හැකිවනු ඇත. මෙම සිද්ධිවලින්, මෙම ක්‍රියාවලින් බොහොමයක් කරනු ලැබ ඇත්තේ පැහැදිලිවම වෙනස් කොට සැලකීමේ පදනම් මත ය.

1114. මෙම චෝදනා සියල්ල අප්‍රමාදව, සම්පූර්ණයෙන් හා ස්වාධීනව විමර්ශනය කළ යුතු අතර සෘජුව හෝ ආඥාපතීන් හෝ ඉහළම ප්‍රධානීන් ලෙස හෝ වගකිව යුත්තන් යුක්තියට හමුවට ගෙන ආ යුතු ය. වින්දිතයින් විශේෂයෙන් ළමා වින්දිතයින් හා ලිංගික හිංසනයේ වින්දිතයින් ආරක්ෂා කිරීමට විශේෂ පියවර ගත යුතු අතර ඔවුන්ට මනෝ විද්‍යාත්මක සහය ඇතුළුව සම්පූර්ණ ප්‍රකෘතිමත්වීම සඳහා ප්‍රවේශය සහතික කළ යුතු ය. එසේම මෙම සොයා ගැනීම් අදාළ ගැඹුරට මුල්බැසගත් ආයතන ව්‍යුහයන් හා සංස්කෘතීන් ද ඒවා නැවත සිදු නොවීම සහතික කරනු පිණිස ගැඹුරු ආයතනික වෙනස්කම් සඳහා ඒවාට ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව ද ඉස්මතු කරයි.

1115. පහතින් ලැයිස්තුගත කර ඇති සොයා ගැනීම් මූලික වශයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ රාමුව ඇතුළත විශ්ලේෂණය කරනු ලබන අතර සිද්ධිය සන්නද්ධ ගැටුමට සම්බන්ධවන අවස්ථාවන්වල දී ගිවිසුමේ හා සිරිත්බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ අදාළ නීති යොදා ගන්නා බව සඳහන් කිරීම වැදගත් ය. මේවාට විශේෂයෙන් 1949 ජිනීවා සම්මුතීන් හතරට පොදු 3 වගන්තිය හා ඉහත සඳහන් නෛතික රාමුව තුළ විස්තර කරනු ලැබ ඇති එදිරිවාදිකම්වල හැසිරීමට අදාළ සිරිත්බැඳි නීති අඩංගු වේ.

**නීති විරෝධී ඝාතන**

1116. කමිටුව විසින් ලබා ගන්නා ලද තොරතුරුවල පදනම මත ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් හා ඒවා සමග සම්බන්ධ වූ අතුරු හමුදා කණ්ඩායම් කමිටුවේ වාර්තාව මගින් ආවරණය කරනු ලබන කාල පරිච්ඡේදය සමයේ සිවිල් වැසියන්ට හා අනෙකුත් ආරක්ෂිත පුද්ගලයින්ට එරෙහිව පුළුල්ව පැතුරුණු ආකාරයකින් නීති විරෝධී ඝාතන කරගෙන ගිය බවට සාධාරණ පදනම් තිබෙන බව ගම්‍යමාන කෙරී තිබේ. ඇතැම් කාල පරිච්ඡේදවල විශේෂයෙන් දමිළ දේශපාලඥයන්, මානුෂවාදී ක්‍රියාකාරකයින් හා මාධ්‍යවේදීන් ඉලක්කකර තිබුණ ද සාමාන්‍ය සිවිල් වැසියන් ද වින්දිතයින් අතර වේ. ඝාතනවල නිදසුන් ලෙස ආරක්ෂක හමුදා මුර පොළවල් හා හමුදා කඳවුරු වටාපිටාවේ, එසේම හමුදා අත්අඩංගුවේ සිටි පුද්ගලයන්ගේ ඝාතනවල පැහැදිලි රටාවක් තිබූ බව පෙනෙන්නට තිබේ. අධිකරණයක් හමුවේ තහවුරු වුවහොත් මෙම බොහෝ චෝදනාවන් තත්ත්වයන්ට යටත්ව යුද අපරාධ හා/හෝ මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකිවනු ඇත.

1117. සියලු පාර්ශව විසින් කරන ලද මෙම නීති විරෝධී ඝාතන 2004 අප්‍රේල්වල කරුණා කණ්ඩායම එල්ටීටීඊයෙන් කැඩී යාමෙන් පසු තීව්‍ර විය. අතුරු කණ්ඩායම් අතර සහයෝගිතාවේ විශේෂයෙන් කරුණා කණ්ඩායම හා හමුදාවේ විශේෂ මෙහෙයුම් ඒකක, හමුදාවේ බුද්ධි සේවා අංශ හා පොලීසියේ විශේෂ කාර්ය බලකාය ඇතුළු ආරක්ෂක හමුදාවන්ගේ විවිධ ශාඛා අතර සහයෝගිතාවේ ස්වභාවය හා වපසරිය විශාල වැදගත්කමක් ගන්නා අතර තවදුරටත් විමර්ශනය

කළ යුතු ය. ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් විසින් අණ දෙනු ලැබ කරන ලද ඝාතන මෙන්ම අතුරුදහන් කිරීම් පිළිබඳ නොකඩවා කෙරෙන එහෙත් සත්‍යාපනය කර නොමැති චෝදනා විශේෂයෙන් අණදීම් දාමයේ වගකීම්වලට අනුව එම විමර්ශනයේ කොටසක් විය යුතු ය.

1118. එසේම විමර්ශන කමිටුව එල්ටීටීඊය ද එල්ටීටීඊයට පටහැනි අනුග්‍රාහකත්වයන් දරනවා යයි අවබෝධකර ගන්නා දමිළ, මුස්ලිම් හා සිංහල සිවිල් වැසියන් නීති විරෝධීව ඝාතනය කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ලබා දෙන තොරතුරු එක්රැස්කර ගනු ලැබ තිබේ. එල්ටීටීඊය විරුද්ධ දමිළ දේශපාලන පක්ෂ, ඔත්තුකරුවන් යයි සැක කරනු ලබන්නන් හා දේශපාලන චරිත, රාජ්‍ය නිලධාරීන් හා විද්වතුන් මෙන්ම විරුද්ධ අතුරු හමුදා කණ්ඩායම්වල සාමාජිකයින් ඇතුළු විරුද්ධ මත දරණ දමිළයන් ද ඉලක්කකර තිබේ. එල්ටීටීඊයේ ඉවක් බවක් නැති මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර හා ක්ලේමෝ බෝම්බ ප්‍රහාර මගින් මරණයට පත් වූ බොහෝ දෙනා අතර සිවිල් ජනයා ද වූහ.[1205] ඇතැම් අවස්ථාවල දුසිම් ගණන් සිවිල් ජන මරණ සිදු කරමින් සිවිල් වාහන යන එන මාර්ගවල ක්ලේමෝ බෝම්බ පුපුරුවා හැරියහ. වාහන සිවිල් වාහනය, ඒවා ප්‍රවාහනය කරන්නේ සිවිල් ජනයා පමණක්ය යන දැනුම තිබියදීත් මේ බෝම්බ පුපුරුවා හැරිය යුතු ද, එවැනි ප්‍රහාර තත්ත්වයනට යටත්ව සිවිල් ජනයාට හා සිවිල් දේවලට සෘජු ප්‍රහාර එල්ල කිරීමේ තහනම උල්ලංඝනය කිරීමක් වනු ඇත. එසේම ගැටුමේ අවසාන අදියරයන්හි දී එල්ටීටීඊය සමහරක් මරණ ඇති කරමින් හා ජනතාව ඉවත්ව යන්නට උත්සාහ කළොත් දරුණු ප්‍රතිවිපාක විඳින්නට සිදු වනු ඇතැයි යන පුළුල්ව පැතුරුණු බිය අවුලුවාලමින් ගැටුම් කලාපය හැර යාමට උත්සාහ කළ දමිළ සිවිල් ජනයාට වෙඩි තැබීය. අධිකරණයක් විසින් තහවුරු කරනු ලැබුවහොත් මේවා තත්ත්වයන්ට යටත්ව යුද අපරාධ හා/හෝ මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකිවනු ඇත.

1119. කමිටුව එසේම සටනේ අවසානම අවස්ථාවේ හෝ 2009 මැයි 18 ආශ්‍රිතව හඳුනාගත් එල්ටීටීඊ කාඩර්වරුන් හා හඳුනා නොගත් පුද්ගලයින්, ඔවුන්ගෙන් සමහරු හමුදාවට භාර වූ බව ප්‍රකට ය- නීතියෙන් බැහැරව ඝාතනය කළ බවට ඇති චෝදනා විමර්ශනය කළේ ය. සමහර කරුණු තහවුරු කර ගැනීමට තිබුණේ වුව ද වාචික සාක්ෂි මත මෙන්ම ඡායාරූප හා වීඩියෝ පින්තූර මත පදනම්ව ආරක්ෂක හමුදා විසින් ඔවුන් අත් අඩංගුවට ගැනීමෙන් පසු අවස්ථා කිහිපයක දී ඔවුන් මරා දමන ලද බව දැක්වෙන ප්‍රමාණවත් තොරතුරු දක්නට තිබේ. අධිකරණයක් විසින් තහවුරු කරනු ලැබුවහොත් වාර්තාවේ විස්තරකර තිබෙන බොහොමයක් සිද්ධි තත්ත්වයන්ට යටත්ව යුද අපරාධ හා/හෝ මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකිවනු ඇත.

**නිදහස අහිමි කිරීමට අදාළ උල්ලංඝනයන්**

1120. කමිටුව ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් කරන ලද හිතුවක්කාර අත්අඩංගුවට ගැනීමේ හා රඳවා තබා ගැනීමේ දිගු කල් පැවති රටා මෙන්ම ඔවුන්ට සම්බන්ධ අතුරු හමුදා සංවිධාන

---

[1205] එසේම කමිටුව 2007 නොවැම්බර්වල මල්ලාවි අසල ශ්‍රී ලංකා හමුදාව විසින් පුපුරුවා හරින ලදැයි පෙනෙන ක්ලේමෝ බෝම්බයකින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ විශේෂ ආරක්ෂණයක් භුක්ති විඳි ගිලන් රථයක් හානියට පත් එක් සිද්ධියක් වාර්තා කරයි.

විසින් (නැගෙනහිර කරුණා කණ්ඩායම හා උතුරේ ඊපීඩීපී ඇතුළු) කරන ලද පැහැර ගැනීම්, වාර්තාවූ අන්දමට ඒවා බලහත්කාර පැහැර ගැනීම්වලට හා නීතියෙන් බැහැර ඝාතනවලට මග පාදා තිබේ- ලේඛනගත කර තිබේ.

1121. පුද්ගලයන් හිතුවක්කාර අත් අඩංගුවට ගැනීම් හෝ පැහැර ගැනීම් සම්බන්ධ ඊටම විශේෂිත විධි ක්‍රමය ක්‍රියාවට නගන ලද්දේ ඇතැම්විට අතුරු හමුදා කණ්ඩායම්වල සහාය ඇතිව සලකුණු නොමැති ''සුදුවෑන්''මගින් ක්‍රියාත්මක වූ ආරක්ෂක හමුදා පිරිස් විසිනි. වාර්තා වී තිබෙන පරිදි මේවාට ආරක්ෂක මුර පොළවලින් යාමට ද හමුදා කඳවුරුවලට ඇතුල් වීමට ද හැකි විය. මෙම උල්ලංඝනයන් පහසුකරණය කරනු ලැබුවේ හා තවමත් කරනු ලබන්නේ තවමත් ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය වැළක්වීමේ පනතින් (PTA )මෙන්ම 2011 තෙක් ක්‍රියාත්මක කරන ලද හදිසි නීති රෙගුලාසි යටතේ සලසා ඇති අත්අඩංගුවට ගැනීමේ හා රඳවා ගැනීමේ විස්තීරණ බලතල විසින් ය. හදිසි නීති යටතේ හෝ ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ දීර්ඝ කාලයක් පුරා අත් අඩංගුවේ තබා ගෙන සිටින රැඳවියන්ට සාමාන්‍යයෙන් ඔවුන් රඳවා තබා ගෙන ඉඳීමේ විශේෂ හේතු දක්වා නැති අතර කිසිදු චෝදනාවක් ඉදිරිපත්කර නැත. ඔවුන් විනිසකරුවෙකු හමුවට ගෙනවිත් ඔවුන් රඳවා ගැනීමේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ ලේඛනගත නඩු ඉතා ස්වල්පයකට පමණි. ඔවුන්ට නීති උපදේශයෙකු ලබා ගැනීමේ ඉඩ නොතිබූ අතර බොහෝ විට රඳවා ගනු ලැබුවේ පිටත ලෝකයට ප්‍රවේශයෙන් තොරව හුදකලා සිර අඩස්සියේ ය. ඇතැම් අවස්ථාවල දී ත්‍රස්තවාදය වැළක්වීමේ පනතේ හා හදිසි නීති රෙගුලාසි යටතේ වූ සීමිත ආරක්ෂණයන් පවා ද උල්ලංඝනය කරන ලද බව කියැවේ.

1122. එවැනි නීති විරෝධී හා හිතුවක්කාර අත්අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් පැහැදිලිවම ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් උල්ලංඝනය කිරීමකි. එම හිතුවක්කාර ලෙස රඳවාගනු ලැබ සිටින්නවුන්ගේ ඥාතීන්ට ඔවුන්ව සිත් සන්තාපයට පත් කරමින් හා පීඩාවටපත් කරමින් බොහෝ විට ඔවුන්ගේ ඥාතීන් අත් අඩංගුවට ගත් දිනය හා රඳවාගෙන සිටින ස්ථානය දැනුම් දී නොමැත. එය වෙන්ව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් බැඳීම් උල්ලංඝනය කිරීමකි.

1123. ඉහතින් විස්තර කරන ලද පරිදි පැහැර ගන්නා ලද්දවුන් හෝ රඳවා තබන ලද්දවුන් නිතරම වාගේ වධ බන්ධනයට හා/හෝ අනෙකුත් කෲර, අමානුෂික හෝ තුච්ඡ සැලකීමට හෝ දඬුවමට හා/හෝ ලිංගික හිංසනයට භාජනය කරනු ලැබිණ. මෙම උල්ලංඝනයන් හුදෙකලා හෝ කඩින්කඩ නොව වඩාත්ම පුළුල්ව පැතුරුණු ආකාරයකින් කරන ලද ඒවා විය.

**බලහත්කාර අතුරුදහන් කිරීම්**

1124. ශ්‍රී ලංකාව බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ ලෝක පරිමාණව වාර්තා වී තිබෙන ඉහළම අනුපාතයන් තිබෙන රටවලින් එකක් වේ. ඒවායින් බොහොමයක් දශක ගණනාවක ගැටුම් හා කැරලිකාරිත්වයේ මුල් කාල පරිච්ඡේද දක්වා දිවේ. එහි විමර්ශන ක්‍රියාවලිය තුළ දී කමිටුව එහි වරමේ කාල පරිච්ඡේදය ඇතුළත රටේ විවිධ කොටස්වල, විශේෂයෙන් උතුර

හානැගෙනහිර පළාත්වල බහුලව සිදු වූ බලහත්කාර අතුරුදහන් වීම් සිය ගණනක් පිළිබඳව විශ්වසනීය තොරතුරු විමර්ශනය කළේ ය. තව ද එදිරිවාදිකම් අවසන් වීමෙන් පසු සමූහ රඳවා ගැනීමේ ක්‍රමය ද බලහත්කාර අතුරුදහන්වීම්වලට මග පෑදූ අතර ඥාතීහු දිගටම රැඳවියන් සිටින්නේ කොහේ ද යන්න නොදැන සිටියහ.

1125. 1970 ගණන්වල වාර්තාගත වූ පළමුවන බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධියේ සිට අනුයාත ශ්‍රී ලංකා ආණ්ඩු විවිධ වරම් හා විවිධ කාල රාමු සහිතව අනේක විධ විමර්ශන කොමිෂන් හා වෙනත් යාන්ත්‍රණයන් පිහිටුවනු ලැබිණ. මෙම කොමිෂන්වල ඇතැම් ඒවා වන්දි ප්‍රදානය කිරීම හෝ සංයුක්ත නිර්දේශ ඉදිරිපත් කිරීම කරනු ලැබීය. කෙසේ වුව ද ක්‍රියාත්මක කරන ලද්දේ ඉන් ස්වල්පයක් හා වගවීම සහතික කිරීම හෝ එවැනි භාවිතයන් නැවත ඇති වීම වැළැක්වීම සඳහා ගන්නා ලද්දේ පියවර කිහිපයක් පමණි.

1126. බලහත්කාර අතුරුදහන් කිරීම් වින්දිතයින්ගේ ඉරණම හා ඔවුන් සිටින්නේ කොහේ ද යන්න නොදන්වා සිටින තාක් කල් එය විවිධ අයිතිවාසිකම් අඛණ්ඩව උල්ලංඝනය කිරීම නියෝජනය කරන සුවිශේෂ හා ඒකාබද්ධ ක්‍රියා මාලාවක් සංස්ථාපනය කරයි. ශ්‍රී ලංකා නීතිකරණය අනුව මරණ සහතිකයක් නොමැතිව විශ්‍රාමිකයක් හෝ වෙනත් යැපුම් මාර්ගයක් ලබා දීම අසීරු කරන හෙයින් සනාථ කිරීමක් නැතිව ඔවුන්ගේ ආදරණීයයාගේ මරණය ප්‍රතික්ෂේප කරන පවුලේ සාමාජිකයින්ට එලෙසම සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සමාජ සුරක්ෂිතතාවට, ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට හා පවුල් ජීවිතයකට ඇති අයිතිය වැනි ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් ගණනාවක්ම අහිමි කෙරේ.[1206]

1127. ලබා ගත හැකි තොරතුරුවල පදනම මත කමිටුවට ශ්‍රී ලංකා අධිකාරීන් පුළුල්ව පැතුරුණු හා ක්‍රමානුකූල ආකාරයකින් වින්දිතයින් සැලකිය යුතු සංඛ්‍යාවකට ඔවුන්ගේ නිදහස අහිමිකර තිබෙන බව ද අනතුරුව නිදහස අහිමිකර තිබීම පිළිගැනීම ප්‍රතික්ෂේපකර හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම හා ඉන්නා තැන වසංකර තිබෙන බව ද විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ. මෙය ඇත්තටම මෙම පුද්ගලයින් නීතියේ ආරක්ෂාවෙන් ඉවත්කර ඔවුන් බරපතල අවදානමකට පත්කර තිබේ. එසේම සිංහල වේවා, දමිළ වේවා, මුස්ලිම් වේවා අතුරුදහන් වූ පුද්ගලයින්ගේ පවුල් සාමාජිකයින් ද ඔවුන්ගේ තොරතුරු සෙවීමට ප්‍රතිචාරයක් වශයෙන් පලිගැනීම්වලට, හිරිහැරයට හා රඳවා ගැනීම්වලට භාජනය කරනු ලැබ තිබිණ. වින්දිතයින්ට හා ඔවුන්ගේ ඥාතීන්ට සත්‍යයට ඇති අයිතිය උල්ලංඝනය කිරීම ඇතුළු මෙම උල්ලංඝනයන් සම්බන්ධයෙන් කාර්ය සාධනීය පිළියමකට ඇති අයිතිය ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ.

1128. බලහත්කාර අතුරුදහන් කිරීම් නිශ්චිත භූගෝලීය අවකාශයක් හා කාල රාමුවක් තුළ සිවිල් ජනතාවට එරෙහිව පුළුල්ව පැතුරුණු හා ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබ තිබූ බව, ඒ තුළ එම ආරක්ෂක හමුදාම විසින් ඔවුන්ට වරද කරනු ලැබ තිබූ බව හා එය එම ජනතාවම ඉලක්ක කරනු ලැබ තිබූ බව විශ්වාස කිරීමේ සාධාරණ පදනම්

[1206] මෙම සන්දර්භය තුළ අතුරුදහන් කිරීම පිළිබඳ තත්ත්වයන් අවසාන වශයෙන් විසඳන, වින්දිතයාගේ මරණය තහවුරු කරන හා ඉතිරි කායික කොටස් පවුලට ලබා දෙන පාරදෘශ්‍ය හා ස්වාධීන අධිකරණ ක්‍රියාවලියක කොටසක් වන්නේ නම් මිස ආණ්ඩුව විසින් මරණ සහතික නිකුත් කිරීම මගින් සිදුවෙමින් පවත්නා උල්ලංඝනයන් නිම නොවන බව සඳහන් කිරීම වැදගත් ය,

තිබේ. විශේෂයෙන්ම ගැටුම අවසානයේ දී ඔවුන්ව හමුදාවට භාර දීමෙන් පසු අතුරුදහන් වූවන් හිතාමතාම ඉලක්ක කරන ලද්දේ ඔවුන් එල්ටීටීඊ වූ හෝ එල්ටීටීඊ හමුදාවන් සමග සමීපව සම්බන්ධව සිටියේ යයි ප්‍රත්‍යක්ෂකර ගනු ලැබූ නිසා හෝ බව විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ.

**වධ හිංසා හෝ අනෙකුත් ආකාරයේ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්**

1129. වධ හිංසනය සන්නද්ධ ගැටුම හා නිත්‍ය අපරාධ යුක්ති විනිශ්චය ක්‍රමය යන දෙකටම අදාළව ශ්‍රී ලංකාවේ දිගු කාලයක් තිස්සේ බහුලව පවතී. කමිටුව විශේෂයෙන්ම සන්නද්ධ ගැටුමේ නිමාවේ ආසන්නතම ප්‍රතිවිපාකය තුළ හිටපු එල්ටීටීඊ සාමාජිකයින් හා සිවිල් ජනතාව බුරුතු පිටින් රැඳවුම් භාරයේ තබනු ලැබූ විට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් යෙදා ගන්නා ලද වධ හිංසනයේ විශේෂිත මෘග භාවිතය ද හමුදා කඳවුරු, පොලිස් ස්ථාන හා ''පුනරුත්ථාපන''කඳවුරු මෙන්ම රහසිගත, හඳුනා නොගත් ස්ථාන ඇතුළු බහුවිධ ස්ථානවල දී ආරක්ෂක හමුදා පරාසයක් විසින් සමාන රටාවන් අනුගමනය කරමින් පමුණුවන ලද වධ හිංසන භාවිතය ද ප්‍රලේඛනය කළේ ය.

1130. කමිටුව විසින් ලබා ගන්නා ලද තොරතුරුවල පදනම මත මෙම වධ හිංසනය පුළුල්ව පැතුරුණු පරිමාණයකින් ක්‍රියාවට නගා තිබෙන බව විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ. මෙය වධ හිංසනයේ ඒකාන්ත තහනම ද ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගිවිසුම් හා සිරිත් බැඳි බැඳීම් ද උල්ලංඝනය කරයි. මෙම වධ හිංසන ක්‍රියා අධිකරණයක් හමුවේ තහවුරු වුවහොත් තත්ත්වයන්ට යටත්ව ඒවා කරනු ලැබ තිබෙන්නේ පුළුල්ව පැතුරුණු හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් ලෙස වුවහොත් මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස ද සන්නද්ධ ගැටුම හා සම්බන්ධයක් ස්ථාපිත වුවහොත් යුද අපරාධ ලෙස ද  සැලකිය හැකිවනු ඇත.

**ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජ භාව පදනම් ප්‍රචණ්ඩත්වය**

1131. කමිටුව විසින් එක්රැස් කර ගන්නා ලද තොරතුරු ආරක්ෂක හමුදා පිරිස් විසින් විශේෂයෙන් යුද්ධයෙන් පසු තත්ත්වය තුළ පුරුෂ හා ස්ත්‍රී යන දෙපාර්ශවයටම එරෙහිව කරන ලද දූෂණය හා ලිංගික හිංසනය පුළුල්ව පැතුරුණු එකක් වූ බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් සපයයි.  ලිංගික හිංසනයේ රටාවන් පෙන්නුම් කරන්නේ එය තොරතුරු ලබා ගැනීමේ හා එල්ටීටීඊයට යම් සම්බන්ධයක් තිබුණා යයි අනුමාන කරන ලද පුද්ගලයන්ට අවමන් කිරීමේ හා දඬුවම් කිරීමේ හොඳට දැනුවත් හිංසන මාධ්‍යයක් වශයෙන් යොදා ගෙන තිබුණේය යන්නයි. රාජ්‍ය නිලධාරීන් විසින්  ලිංගික හිංසනය ප්‍රතික්ෂේප කරනු ලැබීම, වින්දිතයින්ට අවමන් කිරීම හා ඒවා විමර්ශනය කිරීමට අසමත් වීම පෙන්නුම් කරන්නේ අධිකාරීන් විසින් එවැනි භාවිතයන් ඉවසා සිටිනු ලැබුවා නොවේ නම් අනුමත කරනු ලැබීම ය.[1207]

---

1207 ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කරලීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව ශ්‍රී ලංකාව පිළිබඳ 2011 එහි පස් වෙනි, හය වෙනි, හා හත් වෙනි අවසන් නිරීක්ෂණවල දී ''ගැටුමේ අවසාන අදියරයන්හි දී හා පශ්චාත් ගැටුම් අදියරේ දී ස්ත්‍රීන් හිංසනයට හා වෙනස්කොට සැලකීමට භාජනය නොකෙරුණි යන රාජ්‍ය පාර්ශවයේ පැහැදිලි කිරීම සැලකිල්ලට ගන්නා අතරම කමිටුව දෙපාර්ශවයේම ස්ත්‍රීන්ගේ විශේෂයෙන් දමිළ සුළුතර කණ්ඩායමේ, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ ස්ත්‍රීන්ගේ හා හිටපු ස්ත්‍රී

1132. වාර්තා වූ වින්දිතයන් යයි කියනු ලැබූවන් වරද කරනු ලැබුවා යයි කියනු ලැබූවන්ගේ අත් අඩංගුවේ හෝ පාලනය යටතේ නීති විරෝධීව, හිතුවක්කාරව විශාල වශයෙන් හුදකලා රැඳවුම්භාරයේ සිටි අය ය. වින්දිතයින් භාජනය කරන ලද බවට වාර්තා කෙරුණු ලිංගික අපරාධවලට ලිංගික අවයවයක් ඔවුන්ගේ ශරීරයේ කොටසකට හෝ වින්දිතයාගේ ගුදයට හෝ ප්‍රජනන ඉන්ද්‍රියේ විවරයට යම් දෙයක් හෝ ශරීරයේ කොටසක් කා වැද්දීම නැතහොත් කියන ලද වැරදි කළවුන් සමග ලිංගික ක්‍රියා කරන්නට බල කිරීම ඇතුළත් ය.

1133. ලිංගික අපරාධ බලහත්කාරයෙන් හෝ බලයේ හෝ හිංසනයේ තර්ජනය යටතේ කරන ලද බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබෙන අතර ආරක්ෂක හමුදා විසින් මෙම බරපතල ශාරීරික හා මානසික වේදනාව හා පීඩනය පටවනු ලැබ ඇත්තේ තොරතුරු ලබා ගැනීම හෝ පාපෝච්චාරණයක්, දඬුවමක්, බිය ගැන්වීමක් හෝ බලහත්කාරයක් හෝ ජනවර්ගය හා/හෝ ස්ත්‍රී පුරුෂ භේදය හා/හෝ දේශපාලන සම්බන්ධය මත පදනම් වූ වෙනස්කොට සැලකීම වැනි අරමුණු සඳහා ය.

1134. මෙම විමර්ශනය මුහුණ දුන් බාධක විශේෂයෙන් වින්දිතයන්ගෙන් පලි ගැනීමට ඇති බිය හා අනෙකුත් බාධක හේතු කොට ගෙන කමිටුවට ප්‍රශ්න කිරීමේ වාර හා හිංසන වාර යන වාර දෙකෙහිදීම හා ප්‍රශ්න කිරීමේ වාරවලින් බාහිරව සිදු කෙරුණ දූෂණය හා ලිංගික හිංසනයේ අනකුත් ආකාර ද ඇතුළුව රඳවා ගනු ලැබූවන්ට එරෙහිව යොදා ගන්නා ලද ලිංගික හිංසනයේ පරිමාණය තක්සේරු කරන්නට හැකි වූයේ නැත. ලිංගික හිංසනයට සම්බන්ධ කැලල හා මානසික පීඩනය සමග ගත්විට ලිංගික හිංසනයේ බහුලත්වය කමිටුව විසින් හා අනෙකුත් සංවිධාන විසින් ප්‍රලේඛනය කරනු ලැබුවාට වඩා බෙහෙවින් වැඩි විය හැකි යයි විශ්වාස කෙරේ.

1135. එසේ වුව ද එක්රැස්කර ගන්නා ලද තොරතුරු මත පදනම්ව ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් කරනු ලැබ තිබෙන ලිංගික හිංසනයට අදාළව ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ හා ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ උල්ලංඝනයන් කෙරී ඇති බවට විශ්වාස කරන්නට සාධාරණ පදනම් තිබෙන බව කමිටුව සලකන අතර මේ ක්‍රියාවන්ගෙන් ඇතැම් ඒවා යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකි ය.

**පැහැර ගැනීම් හා බලහත්කාර බඳවා ගැනීම්**

1136. විමර්ශන කමිටුව 2009 දක්වා එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් බඳවා ගනු ලැබීමට මග පෑදූ පැහැර ගැනීම්වල රටාවක් දක්වෙන විශ්වසනීය තොරතුරු එක්රැස්කර ඇත. බලහත්කාරයෙන් බඳවා ගත්තෝ බොහෝ විට ඔවුන්ගේ පවුල් සමග සම්බන්ධතා පැවැත්වීමේ හැකියාවෙන් තොරව යුද හා සහායක යන කාර්ය දෙකම ඉටු කිරීමට බැඳී සිටියහ. පවුල්වලට එල්ටීටීඊය විසින් බලහත්කාරයෙන් බඳවා ගන්නා ලද ඔවුන්ගේ ඥාතීන් ඉන්නා ස්ථානය

සටන්කාරිනියන්ගේ දරුණු මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ වාර්තා ගැන ගැඹුරු අවධානය ඇතිව සිටින බවට ද විශේෂයෙන්ම කමිටුව සන්නද්ධ හමුදා විසින්, පොලිස් හා සන්නද්ධ කණ්ඩායම් විසින් කරන ලද යි කියන ලිංගික හිංසනය පිළිබඳ වාර්තා ගැන සැලකිල්ල යොමු කර සිටින බවට'' ද සැලකිල්ල ප්‍රකාශ කර තිබේ. එය අනෙක් ඒවා අතර ''ලිංගික හිංසන ක්‍රියා සම්බන්ධයෙන් අප්‍රමාදීව විමර්ශනය කර වැරදිකරුවන්ට එරෙහිව යුක්තිය ක්‍රියාත්මක කර දඬුවම් කරන්නැ''යි අධිකාරීන්ගෙන් ඉල්ලා සිටී. "CEDAW/C/LKA/CO/7, 40 හා 41 ඡේද

බොහෝ විට දැනුම් දෙනු නොලැබීය. ගැටුමේ අවසානය කරා එනවිට බලහත්කාර බඳවා ගැනීම් සඳහා මග පාදන පැහැර ගැනීම් වඩාත් බහුල බවට පත් විය. විරෝධයපාන්ට තැත් කළ වින්දිතයින්ට හා පවුල්වලට කායිකව පහර දුන් අතර හිරිහැරයට හා තර්ජනයට ලක් කෙරිණ.

1137. බලහත්කාර බඳවා ගැනීම්වලට හා බලහත්කාර ශ්‍රමයට මග පාදන පැහැර ගැනීම් ජිනීවා සම්මුතිවල පොදු 3 වගන්තිය ද එදිරිවාදිකම්වලට ඍජුව සම්බන්ධ නොවන පුද්ගලයින්ට මෙන්ම රෝගී වීම නිසා හෝ තුවාල වීම නිසා සටනින් ඉවත්ව සිටින පුද්ගලයින්ට (***hors de combat***) මානුෂිකව සැලකීමට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ එල්ටීටීඊයේ බැඳීම ද උල්ලංඝනය කිරීමක් වන බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කරයි.

1138. බලහත්කාරයෙන් බඳවා ගන්නා ලද්දවුන්ගේ යාම් ඊම් බරපතල ලෙස සීමා කරන ලද අවස්ථාවල දී එය නිදහස අහිමි කිරීමක් ලෙස සැලකිය හැකි බව කමිටුව සලකයි. කෙසේ වුව ද මෙය ක්‍රමානුකූල භාවිතයක කොටසක් වූයේ ද යන්න තහවුරු කරන්නට අතිරේක තොරතුරු අවශ්‍ය වෙනු ඇත.

1139. එසේම එල්ටීටීඊය ද වැඩිහිටියන් පැහැර ගැනීම හා ඔවුන් බලහත්කාර ශ්‍රමයට භාජනය කිරීම හා වන්නිය හැර යාමට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ද ඇතුළුව ප්‍රහාරවලට සිවිල් ජනයා අනාවරණය කිරීම මගින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කර ඇති බවට විශ්වාස කිරීමට පදනම් තිබේ. අධිකරණයක් මගින් තහවුරු කරනු ලැබුවහොත් තත්ත්වයන්ට යටත්ව මෙම උල්ලංඝනයන් යුද අපරාධ හා/හෝ මානව වර්ගයාට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකි ය.

**ළමුන් බඳවා ගැනීම හා එදිරිවාදීකම්වල යොදා ගැනීම**

1140. අවුරුදු බොහෝ ගණනක් පුරා එල්ටීටීඊය විසින් සන්නද්ධ ගැටුමේ දී ළමුන් විස්තීරණව බඳවා ගැනීම හා යොදවා ගැනීම කමිටුව ප්‍රලේඛනය කරනු ලැබීය. අවුරුදු 15 ට අඩු ළමයින් සම්බන්ධකර ගැනීම පිළිබඳ වාර්තා වැඩි වීම ඇතුළු ගැටුමේ අන්තිම මාස කිහිපය තුළ එය තීව්‍ර විය. විමර්ශන කමිටුව එසේම එල්ටීටීඊයෙන් කැඩී යාමෙන් පසු කරුණා කණ්ඩායම විසින් හා පසුව ටීඑම්වීපීය මගින් ළමා බඳවා ගැනීම් පිළිබඳව තොරතුරු එකතු කළේ ය. මෙය අවුරුදු 18 අඩු ළමයින් බඳවා ගැනීම හා යොදා ගැනීම මගින් සන්නද්ධ ගැටුමෙහි ළමුන් නිරත කිරීම පිළිබඳ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය හා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වෛකල්පික මූලලේඛය උල්ලංඝනය කිරීමක් විය.

1141. මෙම වාර්තාවෙහි ප්‍රලේඛනය කරනු ලැබ ඇති ළමුන් බඳවා ගැනීමේ සිද්ධි සිදු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් සන්දර්භයක් තුළ හා ඊට සම්බන්ධිතව ය. එල්ටීටීඊය හා ටීවීඑම්පී/කරුණා කණ්ඩායම වයස 15 අඩු ඔවුන් දැන සිටි ළමුන් බඳවා ගෙන එදිරිවාදිකම්වල ක්‍රියාකාරීව සහභාගි කරවා ගනු ලැබීය. අධිකරණයක් තුළ ඔප්පු කරනු ලැබුවහොත් යුද අපරාධ සංස්ථාපනය කළ හැකි සිරිත් බැඳි ජාත්‍යන්තර නීතිය එල්ටීටීඊය හා ටීවීඑම්පී/කරුණා කණ්ඩායම යන දෙකම උල්ලංඝනයන් කර ඇති බව විශ්වාස කිරීමේ සාධාරණ පදනම් විමර්ශන කමිටුවට තිබේ.

1142. කමිටුව විසින් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව ටීවීඑම්පී/කරුණා කණ්ඩායම ඔවන්ගේ පාලනය යටතේ පැවති ප්‍රදේශවල ළමුන් බඳවා ගන්නා ලද බව ආණ්ඩුවේ ආරක්ෂක හමුදා දැන සිටින්නට ඇති බව විශ්වාස කරන්නට සාධාරණ පදනම් තිබේ.[1208] මෙය ආණ්ඩුව ද එය විසින් අපරානුමත කර තිබෙන ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) හා එහි වෛකල්පික මූලලේඛය, විශේෂයෙන් සන්නද්ධ ගැටුමෙන් විපතට පත් ළමුන්ගේ ආරක්ෂාව හා රැකවරණය සහතික කිරීම උල්ලංඝනය කර තිබෙන බව දක්වයි. 18 අඩු වයසේ ළමුන් බඳවා ගැනීම හා යොදවා ගැනීම ද එසේම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ළමා ශ්‍රමයේ නරකම ආකාරයන් පිළිබඳ සම්මුතිය උල්ලංඝනය කිරීමකි.

1143. ළමුන් බඳවා ගැනීම හා යොදවා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් විමර්ශනය හා නීතිය හමුවට ගෙන යා යුතු යයි විමර්ශන කමිටුව විශ්වාස කරයි. 2007 සිට ශ්‍රී ලංකා ව්‍යවස්ථාකරණය ළමුන් බඳවා ගැනීමට වගකිව යුතු වූවන් නීතිය හමුවට ගෙන ඒම සඳහා යොදා ගත හැකි විධිවිධාන අඩංගුකර තිබේ. ළමුන් බඳවා ගැනීමට වගකිව යුතු යයි පුළුල්ව සැක කරනු ලබන පුද්ගලයන් රාජ්‍ය තනතුරුවලට පත් කිරීම මිස මේ සම්බන්ධයෙන් කිසිවක් කර නොතිබීම කණගාටුදායක ය. එසේම කමිටුව ළමුන් හා සන්නද්ධ ගැටුම සම්බන්ධ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාගේ (SRSG) වාර්තා ඇතුළු ඉනියා භාරතී විසින් කරන ලද ළමුන් බඳවා ගැනීම සම්බන්ධ දිගටම කෙරෙන චෝදනා සම්පූර්ණයෙන්ම විමර්ශනය කර නීතියට හමුවට ගෙන යා යුතු බව ද විශ්වාස කරයි.

1144. එසේම කිසියම් සන්නද්ධ කණ්ඩායමක් විසින් බඳවා ගන්නා ලද ළමුන් හා නැති වූ ළමුන් ඉන්නා තැන් තහවුරු කර ගැනීමේ විශේෂ ප්‍රයත්නයන් ද දැරිය යුතු ය.

**සිවිල් ජනතාවට සහ පොදු ස්ථානවලට සටන්වල බලපෑම**

1145. විමර්ශන කමිටුව සන්තකයේ තිබෙන තොරතුරුවල පදනම මත මෙම වාර්තාවේ විමර්ශනය කරනු ලැබ ඇති බොහෝ ප්‍රහාර එදිරිවාදිකම්වල හැසිරීම පිළිබඳ මූලධර්මවලට විශේෂයෙන් වෙනස පිළිබඳ මූලධර්මයට (principle of distinction) අනුකූල නොවූ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබේ.

1146. එදිරිවාදිකම්වල ප්‍රතිවිපාකයන්ගෙන් *''සිවිල් වැසියන්ට උපරිම ආරක්ෂාව'*සැපයීමේ ප්‍රකාශිත අරමුණ සහිතව ආණ්ඩුව විසින් ඒක පාක්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද යුද මුක්ත කලාපවල සිදු වූ සිද්ධීන් බොහොමයක් විමර්ශනය කරනු ලැබිණ. කෙසේ වුව ද මේ යුද මුක්ත කලාප ස්ථාපිත කරන ලද්දේ ඒවන විටත් එල්ටීටීඊ යුද පිහිටැවුම් තිබුණ ප්‍රදේශවල ය. ප්‍රතිඵල වශයෙන් මෙම කලාප තුළ හෝ පිටත ඇති වූ සටන් සැලකිය යුතු සිවිල්ජන මරණ ඇති කිරීමට හේතු වූ අතර මෙම සිවිල් මරණ හා තුවාල සහ සිවිල් දේවලට ඇති කළ හානිය සම්බන්ධව අදාළ වගකීම් සම්බන්ධ ප්‍රශ්න මතු කළේ ය.

1208 2006 සිට මෙපිටට නැගෙනහිර පළාත පැවතියේ ආණ්ඩුවේ පාලනය යටතේ වන අතර බඳවා ගැනීම් සිදු වූයේ පොලිස් ස්ථාන හා හමුදා කඳවුරු ආසන්නයේ ය.

1147. සටන් මුක්ත කලාප තුළ පිහිටි යුද ස්ථාන ඉලක්ක කිරීමට ආරක්ෂක හමුදාවන්ට අවසර දිය හැකිව තිබූ අතර මෙම පහරදීම් ප්‍රතිඵල වශයෙන් සිදුවන සිවිල් ජන ජීවිත අහිමිවීම් හා සිවිල් දේපළවලට හානි වැළැක්වීමට හෝ අවම කිරීමට ගත හැකි සියලු පූර්ව ආරක්ෂණයන් ගැනීම ඇතුළු එදිරිවාදිකම් පිළිබඳ චර්යාව සම්බන්ධ නීතිවලට යටත් විය යුතුව තිබිණ. මෙම වාර්තාවේ විමර්ශනයට භාජනය කරන ලද සිද්ධීන්වල දී බොහෝ ළමුන් ඇතුළුව විශාල සිවිල් ජන සංඛ්‍යාවක් සිටීම, ඔවුන්ගෙන් වැඩිවෙමින් පැවති සංඛ්‍යාවක් ශක්තිමත් ආරක්ෂාවකින් හෝ බන්කරවලට ප්‍රවේශයකින් තොර පහසුවෙන් කැඩෙන බිඳෙන වාසස්ථානවල ජීවත්වීම ප්‍රහාරයක ප්‍රතිඵලයක් වශයෙන් සටන් මුක්ත කලාපය තුළ සිදු විය හැකි සිවිල් ජන ජීවිත සැලකිය යුතු සංඛ්‍යාවක් අහිමිවන හා සිවිල් දේපලවලට හානියක් ගෙන එන පැහැදිලි අවදානමක් මතු කළේ ය.

1148. ජනාකීර්ණ ප්‍රදේශ තුළ හෝ අවට නීත්‍යානුකූල යුද ඉලක්කවලට එරෙහිව හමුදා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දී ඇති නෛසර්ගික සංකීර්ණතා විමර්ශන කමිටුව පිළිගනියි. එසේ වුව ද සිවිල් ජනතාව ප්‍රධාන වශයෙන් සිටින ප්‍රදේශ ඇතුළත සිට කෙලින්ම එදිරිවාදිකම්වලට සහභාගි වෙමින් සිටි එල්ටීටීඊ කාඩර්වරුන් සිටීම ජනගහනයේ ස්වභාවය වෙනස් කළේවත් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ සිවිල් ජනයාට ලබා දී තිබුණ ආරක්ෂාවට බලපෑවේවත් නැත. ගැටුමට සම්බන්ධ පාර්ශව හැම විටම ජාත්‍යන්තර මානුෂවාදී නීතියට අනුකූලව යුද මෙහෙයුම් කර ගෙන යාමේ බැඳීම ඇතිව සිටී. මෙය සටන් මුක්ත කලාප සමස්තයක් ලෙස නීත්‍යානුකූල යුද ඉලක්කයක් වශයෙන් සැලකිය නොහැකි බව හා එල්ටීටීඊ යුද වත්කම්, පිහිටැවුම් හා කෙලින්ම එදිරිවාදිකම්වලට සම්බන්ධවන්නවුන් පමණක් නීත්‍යානුකූලව ඉලක්ක කරනු ලැබිය හැකි බව හඟවයි. ප්‍රහාර කර ගෙන ගිය ආකාරය ඉදිරිපත් කරන්නේ ආරක්ෂක හමුදා සටන් මුක්ත කලාප සියල්ල එක යුද ඉලක්කයක් ලෙස සැලකුවා විය හැකි බවයි.

1149. විමර්ශන කමිටුවේ විමර්ශනය මෙම වාර්තාවෙහි විමර්ශනය කරන ලද එක් එක් සිද්ධියක් සම්බන්ධ සමානුපාතිකතා ඇගයීමක් පිළිබඳ අවසානාත්මක නොවන අතර මෙම කාරණය විමර්ශනය කළ යුතු බව එය විශ්වාස කරයි.

1150. සටන් මුක්ත කලාපවල රෝහල්වලට බලපෑ ප්‍රහාර සම්බන්ධ අනෙක් සිද්ධි වැඩිමනත් විමර්ශනය කළ යුතු ය. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ විශේෂ ආරක්ෂාවක් බුක්ති විඳින රෝහල් හා අනෙකුත් වෛද්‍ය ඒකක හා වෛද්‍ය කාර්ය පිරිස් ද ප්‍රහාරයේ ඉලක්ක බවට පත් කළ නොහැකි ය. ආරක්ෂාවට හිමිකම් ලබන වෛද්‍ය ඒකක හා ප්‍රවාහන ඒවායේ මානුෂවාදී කාර්යෙන් බැහැර එදිරිවාදී ක්‍රියා සඳහා යොදා ගනු ලැබ ඇතොත් මිස ක්‍රියාත්මක වීම නවතින්නේ නැත. කෙසේ වුව ද අනතුරුව පවා ජාත්‍යන්තර මානුෂවාදී නීතියට අනුව සාධාරණ කාල සීමාවක් සහිතව අවවාද දීමක් අවශ්‍ය කරන අතර ප්‍රහාරයක් සිදු කිරීමට පෙර එවැනි අවවාද කිරීමකට කන් නොදී සිටීම සිදුව තිබිය යුතු ය. කමිටුව මෙය සිත්හි දරා ගෙන වන්නියේ රෝහල්වලට නැවත නැවතත් එල්ල කරන ලද ෂෙල් ප්‍රහාර පිළිබඳ ගැඹුරු අවධානය සටහන් කරයි. ආරක්ෂක හමුදා රෝහල් පිහිටි නියම ස්ථාන දැන සිටියේ ය යන කාරණය තිබියදීත් එවැනි ෂෙල් ප්‍රහාර නැවත නැවතත් එල්ල කරනු ලැබීම මෙම ප්‍රහාරයන් අහඹු සිද්ධීන් වූයේ ය යන්න පිළිබඳව බරපතල සැකයන් මතු කරයි.

1151. එසේම සටන් මුක්ත කලාපවල අනෙකුත් සිවිල් ස්ථාන ද විශේෂයෙන් මානුෂවාදී පහසුකම් හා ආහාර බෙදා දෙන ස්ථාන ද හානියට පත් වුණි. සන්නද්ධ හමුදාවන්ට නිතිපතා ඒවා නියම වශයෙන් පිහිටු ස්ථාන දැනුම් දෙනු ලැබිණ. තව ද ඔවුන්ගේම මෙන්ම සාක්ෂිකරුවන්ගේ ද ප්‍රකාශවලට අනුව ඔවුන්ට ඔවුන්ගේ මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානාවලින් (UAVs) ලැබුණ නිසි-කාල පින්තූර තිබිණ. මෙය නැවතත් මෙම ප්‍රහාර අහඹු සිදුවීම් වූයේ ය යන්න පිළිබඳ බරපතල සැක මතු කරයි. කමිටුවට ලැබුණ තොරතුරු දක්වන්නේ විමර්ශනය කරන ලද කිසිදු සිදුවීමක් මෙම පහසුකම් යුද කටයුතු සඳහා යොදා ගෙන තිබුණේ ය යන්න තීරණය කිරීමට ආරක්ෂක හමුදාවන්ට සාධාරණ ලෙස මග පෑදිය හැකි කිසිදු පදනමක් නොතිබුණු බව ය. එමනිසා මෙම පහසුකම් ඒවායේ සිවිල් ස්වභාවය පවත්ව ගනු ලැබූ අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ඒවා ඍජුව ඉලක්ක කළ හැකි නොවීය.

1152. එදිරිවාදිකම්වලට ඍජුව සහභාගි නොවන සිවිල් ස්ථානවලට හා/හෝ සිවිල් ජනයාට ප්‍රහාර එල්ල කිරීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් වන අතර තත්ත්වයන්ට යටත්ව යුද අපරාධයක් ලෙස සැලකිය හැකි ය.

1153. තවත් අවධානය යෙදිය යුතු කාරණයක් වන්නේ ආරක්ෂක හමුදා යොදවා තිබුණ අවි ජනාකීර්ණ ප්‍රදේශවල දී පාවිච්චි කරන විට වගවිභාගයක් නැති ප්‍රතිවිපාක ඇති කළ හැකිව තිබීමයි. මල්ටි බැරල් රොකට් විදින (MBRLs) ඇතුළු එවැනි අවි භාවිතය යුද මුක්ත කලාප වෙත වෙඩි තබන විට අනුගමනය කළ එකට බැඳුණු භාවිතයක්ව තිබූ බව පෙනී යයි. එවැනි ආයුධ ඉලක්ක කළ ඉලක්කයකට පහර දීම සඳහා නොව ක්ෂේත්‍ර ප්‍රහාර සඳහා සැලසුම් කරන ලද ඒවා ය. ඒවා ජනාකීර්ණ ප්‍රදේශවල යුද ඉලක්කවලට නිවැරදිව ප්‍රහාර එල්ල කළ හැකි ඒවා නොවීය.

1154. තව ද ආර්පීජී අවි (RPG's) වැනි ඍජු ප්‍රහාර එල්ල කරන අවිවලින් ඒවායේ උපරිම ඵලදායිතා දුරට ඔබ්බෙන් ඒවායේ දුර පරාසය වැඩි කිරීමට අර්ධ වෘත්තාකාරයෙන්''වක්‍ර ලෙස''වෙඩි තබනු ලැබ තිබේ. ඍජු එල්ලයට වෙඩි තැබීමේ අවි මේ ආකාරයෙන් පාවිච්චි කිරීමෙන් විශේෂිත ඉලක්කයකට පහරදීමේ සම්භාවිතාව විශාල වශයෙන් අඩු කරන තරම් මට්ටමකට අවියේ නිරවද්‍යතාව අඩු වේ. ජාත්‍යන්තර අපරාධ මීමංසාව ඒ හා සමාන තත්ත්වයන්හි දී එවැනි වගවිභාගයක් නැති ප්‍රහාර සිවිල් ජනයාට එරෙහි ඍජු ප්‍රහාර ලෙස සැලකිය හැකි යයි සඳහන් කළේ ය.[1209] මෙම විය හැකි නිගමනය තහවුරු කිරීමේ සාධකවලට මරුමුවට පත් හා තුවාල ලද විශාල සිවිල් ජන සංඛ්‍යාවන්, හානියට හෝ විනාශයට පත් වූ සැලකිය යුතු සිවිල් ස්ථාන, යුද මුක්ත කලාපවල අඛණ්ඩ බෝම්බ ප්‍රහාර හා සිවිල් ජනතාව අතර ඔවුන් ඇති කරන ලද භීෂණය හා බිය අන්තර්ගත වේ.

---

[1209] ICTY (කලින් යුගෝස්ලේවියාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ) අභිචෝදක එරෙහිව ගැලික් අංක IT-98-29-T නඩුවේ 2003 දෙසැම්බර් 5 තීන්දුව. න්‍යෂ්ටික අවි පිළිබඳ නඩුවේ දී ජාත්‍යන්තර අධිකරණය ''රාජ්‍යයන් කිසි විටෙක සිවිල් ජනයා ප්‍රහාරයේ ඉලක්කය නොකරගත යුතු ය, එසේම සිවිල් ජනයා හා යුද ඉලක්ක අතර වෙන්කර ගැනීමක් කිරීමට අසමත් අවි කිසිවිටෙක භාවිත නොකළ යුතු ය'' යනුවෙන් සඳහන් කිරීම මගින් සිවිල් ජනයාට එරෙහි ප්‍රහාර ඉවක් බවක් නැති ප්‍රහාර තහනම් කිරීම හා සම්බන්ධ කළේ ය. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ 8 වෙනි වගන්තියේ 78 ඡේදය සිවිල් ජනයාට හෝ සිවිල් ස්ථානවලට එරෙහිව චේතනාන්විතව එල්ල කරන ප්‍රහාර යුද අපරාධයක් ලෙස ලැයිස්තුගත කරයි.

1155. මෙය ආරක්ෂක හමුදාවන්ට ඔවුන්ගේ නෛතික බැඳීම්වලට, විශේෂයෙන් වෙන්කර ගැනීමේ හා පූර්ව ආරක්ෂණයේ අවශ්‍යතාවන්ට වඩා හොඳට ගරුකිරීම පිණිස වඩා නිවැරදි ආයුධ හා උණ්ඩ භාවිතා කිරීමේ මාර්ග තිබුණේ ය යන කරුණෙන් වඩාත් ශක්තිමත් වේ. ඊට අමතරව ආරක්ෂක හමුදා ඔවුන් සන්තකයේ ඔවුන්ගේ මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා (UAV's) පද්ධතියෙන් සම්ප්‍රේෂණය කරන ලද නිසි-කාල ඡායරූප වැනි ඒවා තිබුණ බවත් ඒවා ඔවුන්ට යුද ඉලක්කවල නිවැරදිව ඉලක්ක කිරීමට ආධාර කරන ලද බවත් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබේ.

1156. තත්ත්වයන් විසින් ඉඩ ලබා නොදුනහොත් මිස ගැටුමකට සම්බන්ධ පාර්ශව ගත යුතු තවත් පූර්වාරක්ෂක පියවරක් වනුයේ ප්‍රහාර එල්ල කරන විට දී ප්‍රහාර ආරම්භ කිරීමට පෙර ඉවත් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් ඒවා සිවිල් ජනයාට බලපෑ හැකි බවට බල සහිත අනතුරු හැඟවීම් නිකුත් කිරීම යි. ක්‍රියාත්මක කරන්නට සිටි හමුදා මෙහෙයුම් පිළිබඳව ඔවුන්ට දැනුම් දෙමින් යුද මුක්ත කලාපවල සිටි ජනතාවට කිසිදු විශේෂිත අනතුරු හැඟවීමක් කළ බවට දක්වෙන කිසිදු තොරතුරක් කමිටුවට ලැබී නැත. මෙය සැලකිල්ලට ගැනීම වඩාත් වැදගත් වන්නේ යුද මුක්ත කලාප තුළ සිටින සිවිල් ජනයාට ඔවුන්ගේ ආරක්ෂාව සඳහා මේ කලාපවලට යන්නැයි ආණ්ඩුව හා ආරක්ෂක හමුදා විසින් ඔවුන්ව දිරි ගන්වන ලද නිසා ය.

1157. විමර්ශන කමිටුවේ විමර්ශනය රෝහල් හා එක්සත් ජාතීන්ගේ පහසුකම් ඇතුළු සිවිල් පහසුකම් එල්ටීටීඊය විසින් යුද කටයුතු සඳහා භාවිතා කර තිබුණ බව සනාථ කරන සාක්ෂි අනාවරණය කර ගත්තේ නැත. කෙසේ වුව ද සටන් මුක්ත කලාපවල ජනාකීර්ණ සිවිල් ප්‍රදේශවල එල්ටීටීඊ යුද පිහිටැවුම් හා කාර්ය පිරිස් සිටීමක් වූ බව කමිටුවේ විමර්ශන පෙන්නුම් කරයි. විශ්වසනීය තොරතුරු පෙන්නුම් කරන්නේ එල්ටීටීඊ සටන්කරුවන් සිවිල් ඇඳුම් ඇඳ ගත්තවුන් ද ඇතුළුව රෝහල් හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථාන ආසන්න වටාපිටාවේ ආයුධ සහිතව දක්නට ලැබුණ බව ය. එසේම මෙම ස්ථානවලට ආසන්නයේ සිට එල්ටීටීඊය ප්‍රහාර දියත් කළ බවට විශ්වාස කළ හැකි සාධාරණ පදනම් තිබේ.

1158. තව ද එල්ටීටීඊය මානුෂවාදී හා වෛද්‍ය පහසුකම් ස්ථාන හා සටන් මුක්ත කලාපවල අභ්‍යන්තර අවතැන් පුද්ගලයින් සංකේන්ද්‍රණය වූ ප්‍රදේශ වටේ ද ඇතුළුව සිවිල් ජනයා වෙසෙන ප්‍රදේශවලට ආසන්නයේ ඇතැම්විට යාබදව නැවත නැවතත් යුද රැකවල් ඉදි කිරීම (විශාල වශයෙන් පස් බැම් හා අගල් ), කාලතුවක්කු හා අනෙකුත් ආයුධ ස්ථානගත කිරීම කරනු ලැබීය.

1159. මෙම ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා හමුදා ප්‍රහාරයන්ගේ වර්ධනය වෙමින් පැවති අවදානමට අභිමුඛ කිරීම ඇතුළු ඔවුන් අවට සිදු වෙමින් පැවති හමුදා මෙහෙයුම්වල අන්තරායට සිවිල් ජනයා අනාවරණය කළේ ය. මේ පදනම මත එල්ටීටීඊයේ ක්‍රියාකාරිත්වය ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ප්‍රහාරයන්ගේ ප්‍රතිවිපාකයන්ට එරෙහිව සිවිල් ජනයා හා සිවිල් ස්ථාන ආරක්ෂා කිරීමට සියලු ශක්‍ය පියවර ගන්නා බවට වූ එහි බැඳීම් උල්ලංඝනය කරන ලද බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ.

1160. අවසාන වශයෙන් ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරු කිරීමේ වගකීම අන්‍යොන්‍යතාවය මත තත්ත්වාරෝපණය නොවන හෙයින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ සන්නද්ධ ගැටුමකට සම්බන්ධ සියලු පාර්ශවවල බැඳීම් විරුද්ධ පාර්ශවයේ ක්‍රියාකාරිත්වය මත පදනම් නොවන බව මතකයට ගෙන ඒම වැදගත් ය. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් ගැටුමේ පාර්ශවවලින් එකකට ආරෝපණය කිරීම විරුද්ධ පාර්ශවයේ පැත්තෙන් ඊට අනුකූල නොවීම සාධාරණීය නොකරයි.

**යාම් ඊම් පාලනය**

1161. කමිටුවේ සොයා ගැනීම් එල්ටීටීඊයට අවුරුදු ගණනාවක් මුළුල්ලේ අවසර පත්‍ර ක්‍රමයක් මගින් වන්නියට ඇතුල් වීමේ හා පිටවීමේ සිවිල් ජනයාගේ යාම් ඊම් පාලනය කිරීමේ හා එමගින් ඔවුන්ගේ යාම් ඊම් නිදහසට නීති විරෝධීව අත පෙවීමේ පැහැදිලි ඉහළ මට්ටමේ ප්‍රතිපත්තියක් තිබුණ බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබූ බව පෙන්නුම් කරයි. එසේම 2009 ජනවාරිවල සිට ප්‍රතිපත්තිය දැඩි කරන ලද බවත් කිසිවෙකුට එල්ටීටීඊ ප්‍රදේශය හැර යාමට අවසර නොදුන් බවත් තොරතුරු  පෙන්නුම් කරයි. එසේ වුව ද විශේෂිත උපදෙස්වලට අනුව එල්ටීටීඊ කාඩර්වරුන් යම් අයෙකු ප්‍රදේශය හැර යාම වැළක්විය යුත්තේ කෙසේ ද යන්න පැහැදිලි කර ගැනීම අවශ්‍ය ය. එක්රැස් කර ගන්නා ලද තොරතුරු පෙන්නුම් කරන්නේ ජනයා ප්‍රදේශය හැර යන්නට උත්සාහ කළ විට එල්ටීටීඊය විසින් ඔවුන්ගේ ජීවිතයට හා කායික ඒකාග්‍රතාවට ඇති අයිතිය උල්ලංඝනය කරමින්  ළමුන් ගණනාවක් ඇතුළු පුද්ගලයින් ගණනාවක් වෙඩි තබා මරා දමා  අනෙකුත් අයට තුවාල කර ද පහර දී ද ඇති බව ය. මෙම ක්‍රියාවන් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කරමින් එදිරිවාදිකම්වලට ඍජුව සහභාගි වී නොමැති ජනයාට ඍජුව පහර දීමක් ලෙස සැලකිය හැකි ය. අධිකරණයක් හමුවේ තහවුරු වුවහොත් එවැනි හැසිරීමක් තත්ත්වයන්ට යටත්ව යුද අපරාධයක් ලෙස සැලකිය හැකි ය.

1162.  එවැනි වෙඩි තැබීම් සිවිල් වැසියන් ප්‍රදේශය හැර යාමෙන් වැළක්වීමේ එල්ටීටීඊයේ නිල ප්‍රතිපත්තියේ කොටසක් වූයේ නම් එය තහවුරු කර ගැනීමට සිවිල් ජනයා පලා යාමට උත්සාහ කළ අවස්ථාවන්හි දී සිවිල් ජනයාට කෙලින්ම වෙඩි තැබූ තැන්වල සිද්ධීන්ගේ ස්වභාවය, පරිමාණය හා වාර සංඛ්‍යාතය තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය කෙරේ. එපරිද්දෙන්ම සම්බන්ධ කාඩර්වරුන් වැළක්වීමට හා/හෝ ඔවුන්ට දඬුවම් කිරීමට එල්ටීටීඊ නායකත්වය විසින් යම් පියවරක් ගෙන තිබුණේ නම් ඒ  පියවර මොනවා ද යන්න තීරණය කිරීමට තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය කෙරේ.

1163. සිවිල් වැසියන්ට ක්‍රියාකාරී එදිරිවාදීකම්වලින් යුත් ප්‍රදේශයක් තුළ රැඳී සිටින්ට බල කිරීම ද ප්‍රදේශය හැර යාම අධෛර්යමත් කිරීමේ ප්‍රයත්නයක දී ඔවුන්ට තර්ජනය කිරීම හා බිය ගැන්වීම ද මගින් එල්ටීටීඊය ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ආරක්ෂක හමුදාවල

ප්‍රහාරයන්ගේ ප්‍රතිවිපාකයන්ට එරෙහිව එය යටතේ සිටින සිවිල් ජනයා ආරක්ෂා කිරීමට සියලු ශක්‍ය පියවර ගන්නා බවට වූ එහි බැඳීම් උල්ලංඝනය කර තිබේ. විමර්ශන කමිටුව විසින් ලබා ගනු ලැබ තිබෙන තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ආරක්ෂක හමුදා එය ඉලක්ක කරනු ඇති බව එල්ටීටීඊය දැන සිටියේ ය නැතහොත් දැන සිටීමට හේතු තිබුණේ ය, එහෙත් මෙම දැනුම නොතකාම එය යුද ස්ථානවල වටාපිටාවෙන් සිවිල් ජනයා ඉවත් කිරීමේ පියවර ගත්තේවත් නැතහොත් එය සිවිල් ජනයාට අනතුරු හැඟ වූයේවත් නැත්තේ ය, ඒ වෙනුවට එය කළේ සැබවින්ම සිවිල් වැසියන්ගේ යාම් ඊම් අවහිර කිරීම මගින් එහි ප්‍රතිවිරුද්ධ දෙය ය යන්න ය. ප්‍රතිඵල වශයෙන් සිවිල් ජනයාට ප්‍රහාරයන්ගේ පහසු ගොදුරු වීමේ හැකියාව වැඩි කළ ප්‍රමාණවත් කායික ආරක්ෂණයක් නැති ව්‍යුහයන්වල ශ්‍රී ලංකා හමුදාව විසින් නිරන්තරවම වාගේ එල්ල කරන ප්‍රහාර යටතේ පැවති ප්‍රදේශයක රැඳී සිටීමට බල කෙරිණ. එහෙයින් මෙම තත්ත්වයන් තුළ එල්ටීටීඊය සිවිල් ජනයාව හමුදා මෙහෙයුම්වලට විශේෂයෙන්ම හමුදාවේ ෂෙල් හා වෙඩි ප්‍රහාරවලට අනාවරණය කළ බවට විශ්වාස කරන්නට සාධාරණ පදනම් තිබෙන බව පෙනී යයි.

1164. කමිටුව එසේම එල්ටීටීඊය විසින් වන්නියේ සිවිල් ජනයාගේ යාම් ඊම් මත පනවන ලද අවහිර ජනතාව අතර බිය ව්‍යාප්ත වීමේ ප්‍රතිවිපාකයක් ඇති කර තිබුණ බව සටහන් කරයි. කාලතුවක්කු ප්‍රහාරවලට හා වෙඩි ප්‍රහාරවලට විවෘත වන අතර ඔවුන්ගේ යාම් ඊම් සීමා කරනු ලැබීමෙන් ඔවුන් දිගටම මනෝවිද්‍යාත්මක පීඩාවන්ගෙන් පෙළෙන්නට සැලස් වූ බව සාක්ෂිකරුවෝ කමිටුවට පැවසූහ.

**මානුෂීය ආධාර අහිමි කිරීම**

1165. සන්නද්ධ ගැටුම මුළුල්ලේම ආණ්ඩුව මානුෂවාදී සහන ඇතුළු වන්නියට එන සියලුම භාණ්ඩ මත දැඩි සීමාවන් පවත්වා ගෙන ගිය බව කමිටුව දුටුවේ ය. එල්ටීටීඊයේ යුද ප්‍රයත්නයන්ට අනුග්‍රාහී විය හැකිව තිබුණ භාණ්ඩ හා ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සීමා කිරීමේ ආරක්ෂක පියවර ගැනීමට ආණ්ඩුවට හිමිකම තිබුණ අතර එයට ආහාර, ආහාර නොවන මානුෂීය ආධාර, ඖෂධ හා වෛද්‍ය සැපයුම් මත බරපතල සීමාවන් පනවනවාට වඩා වෙනස්කොට නොසැලකීමේ ආකාරයකින් සීඝ්‍ර හා බාධා විරහිත ස්වාධීන හා අපක්ෂපාතී මානුෂීය සහන පිවිසුමක් පවත්වාගෙන යාමට ඉඩ දීමේ හා පහසුකරණය කිරීමේ බැඳීමක් තිබුණු බව විමර්ශන කමිටුව සටහන් කරයි.

1166. ශ්‍රී ලංකා ආණ්ඩුව මානුෂවාදී කාර්ය පිරිස්වල යාම් ඊම් නිදහස මත හා වන්නියේ මානුෂවාදී ක්‍රියාකාරකම් මත සැලකිය යුතු සීමාවන් පැනවීය. මෙම සීමාවන් මානුෂවාදී සංවිධානවල හා කාර්ය පිරිස්වල ඔවුන්ගේ කටයුතු ඵලදායීව ක්‍රියාවට නැගීමේ හා පිහිට අවශ්‍ය සිවිල් වැසියන්ට සහන ලබා ගැනීම සහතික කිරීමේ ධාරිතාව කෙරෙහි බලපෑවේ ය. එබඳු සීමාවන් සාධාරණීය කළ හැක්කේ අනිවාර්ය යුද අවශ්‍යතාව මගින් පමණි. කමිටුවට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව ආණ්ඩුව එවැනි සාධාරණීකරණයක් සපයා නොමැති අතර සීමාවන් අපක්ෂපාතී මානුෂවාදී සහනවලට සීඝ්‍ර හා බාධා විරහිත පිවිසුමට ඉඩ දීමේ හා පහසුකරණය සැපයීමේ බැඳීම උල්ලංඝනය කිරීමක් සංස්ථාපනය කරන බව පෙනී යයි.

1167. එසේම එල්ටීටීඊය ද මානුෂවාදී සහන කාර්ය පිරිස්වලට ගරු කිරීමේ හා ඔවුන්ට ආරක්ෂාව සැලසීමේ ද ඔවන්ගේ යාම් ඊම් නිදහස සීමා නොකිරීමේ ද එහි බැඳීම්වලට ගරු කිරීමට අසමත් වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ.

1168. විමර්ශන කමිටුවට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව මානුෂවාදී වාහන කණ්ඩායම් ආසන්නයේ ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ සිද්ධීන්ට අදාළව ගත් කල ශ්‍රී ලංකා හමුදාව හා එල්ටීටීඊය යන දෙකම මානුෂවාදී සහන කාර්ය පිරිස් හා ස්ථානවලට ගරු කිරීමට හා ආරක්ෂා කිරීමට සහ සිවිල් ජන ජීවිතවල ආනුෂංගික අහිමිවීම හෝ සිවිල් ස්ථානවලට හානි ඇතිවීම වැළැක්වීමේ සියලු ශක්‍ය පියවර ගන්නා බවට වූ එහි බැඳීමට ගරු කිරීමට අසමත්ව තිබේ.

1169. ආණ්ඩුවට වන්නි ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ සංඛ්‍යාව සාපේක්ෂ නිරවද්‍යතාවකින් යුතුව තීරණය කිරීමට එනයින් ඔවුන්ගේ මානුෂීය අවශ්‍යතා තීරණය කිරීමට අවකාශ සලසනු ඇති බහුවිධ තොරතුරු මූලාශ්‍රයන්ට හා මෙවලම්වලට ප්‍රවේශය තිබුණි. මේවාට වන්නියේ වැඩ කරමින් සිටි ආණ්ඩුවේ සෞඛ්‍ය වෘත්තිකයින්ගෙන්, මානුෂවාදී සංවිධානවලින් ලැබුණ ඉල්ලීම්, ඩ්‍රෝන පින්තූර හා නිතිපතා ආණ්ඩුවේ පාලිත ප්‍රදේශවලට ළඟාවන පුද්ගලයින්ගේ තත්ත්වයන් ඇතුළත් ය. විමර්ශන කමිටුව 2009 මාර්තු මැයි අතර පෝෂණ මට්ටම්වල අනුරූපී රටාවන් ජාතික සාමාන්‍යයට සැලකිය යුතු තරම් පහළ මට්ටමක පැවතීම හා උග්‍ර මන්දපෝෂණ පිරිහීම් මට්ටම් ද එමෙන්ම සාගින්න හේතු කොට ගෙන සිදුවන මරණ ද සැලකිල්ලට ගනී. ආණ්ඩුව ගැටුම් කලාපයෙහි ආධාර කටයුතු සංවිධානය කරමින් සිටි තමන්ගේම දිසාපතිවරුන්ගෙන් ලැබුණු තොරතුරුද ඇතුළුව අදාළ ප්‍රදේශවල සිවිල් ජනයාගේ සැබෑ මානුෂවාදී අවශ්‍යතා දැන සිටි බවට හෝ දැන සිටින්නට හේතු තිබුණ බවට ද එහෙත් සහනවල පිවිසුම හා මානුෂවාදී කාර්ය පිරිස්වල යාම් ඊම් නිදහස මත බරපතල සීමාවන් පැන වූ බවට ද විශ්වාස කිරීමට කමිටුවට සාධාරණ පදනම් තිබේ. මෙය පැහැදිලිවම වන්නි ප්‍රදේශයේ සිවිල් ජනතාවට ඔවුන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ප්‍රමාණවත් මූලික ආහාර ද්‍රව්‍ය හා වෛද්‍ය සැපයුම් අහිමි කිරීමට හේතු වූ අතර එය මනාව ප්‍රලේඛනය කරනු ලැබ තිබේ. අධිකරණයක් මගින් තහවුරු කරනු ලැබුවහොත් මෙම ක්‍රියා හා පැහැර හැරීම් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් බවට පත්වන අතර තත්ත්වයන්ට යටත්ව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ තහනම් කරනු ලැබ තිබෙන සිවිල් ජනයාගේ සාගින්න යුද ක්‍රමවේදයක් ලෙස යොදා ගැනීමක් යයි සැලකිය හැකි ය.[1210] එවැනි කල්ක්‍රියාවක් අධිකරණයක දී ඔප්පු කරනු ලැබුවහොත් තත්ත්වයන්ට යටත්ව යුද අපරාධයක් සංස්ථාපනය කරනු ඇත.

1170. ඊට අමතරව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ කමිටුව ආණ්ඩු අධිකාරීන් යටත් පිරිසෙයින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, අත්‍යවශ්‍ය මූලික සෞඛ්‍යාරක්ෂවරණය, මූලික නිවහන් හා නිවාස මෙන්ම අධ්‍යාපනයේ ඉතාමත්ම මූලික ආකාර ඇතුළු ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන්ගේ[1211] අත්‍යවශ්‍ය අවම මට්ටමක් හෝ සපුරාලීමේ ප්‍රයත්නයක දී සියලු සම්පත්

---

[1210] සිරිත් බැඳි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ දත්ත ගබඩාව, 53 වන නීතිය

[1211] CESCR, පොදු විවරණය අංක 3 (1990), රාජ්‍ය පාර්ශවවල බැඳීම්වල ස්වභාවය පිළිබඳව, සම්මුතියේ 2(1) වගන්තිය 10 ඡේදය

ඔවුන්ගේම තීරණයන්ට අනුව යොදා ගන්නා බවට වන ඔවුන්ගේ කේන්ද්‍රීය බැඳීම ඉටු කිරීමට අසමත්ව තිබෙන බව සොයා ගෙන ඇත.

1171. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් සපුරාලීමේ බැඳීමට අමතරව රජය මෙම අයිතිවාසිකම්වලට ගරු කිරීමේ හා ඒවා ආරක්ෂා කිරීමේ බැඳීම කෙරෙහි නිෂේධනීය ආකාරයෙන් බලපානු ඇති ඕනෑම ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් වැළකිය යුතු ය. මෙම අසමත්වීම ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ඇති අයිතිය බුක්ති විඳීම කෙරෙහි පමණක් නොව ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICESCR) 11 හා 12 වගන්තිවල සහතික කර තිබෙන කායික හා මානසික සෞඛ්‍යයේ අත්කර ගත හැකි ඉහළම ප්‍රමිතිය බුක්ති විඳීම කෙරෙහි ද බලපෑ හැකි අතර එසේම ඉතාම ආන්තික කාරණාවල දී ජීවත් වීමේ අයිතිය ඇතුළු අනෙකුත් අයිතීන් ගණනාවක් ඉටු කර ගැනීමට බාධාවක් විය හැකි ය.

**තීව්‍ර පිරික්සුම හා අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ගේ නිදහස අහිමි කිරීම**

1172. මැනික් ෆාම් හා අනෙක් ආවෘත කඳවුරුවල රඳවා සිටි අභ්‍යන්තර අවතැන් වූවන්ට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ඉඩ සැලසිය හැකිව තිබුණු කාලයට වඩා බොහෝ සෙයින් ඔබ්බට ගිය කාල පරිච්ඡේදයක් ඔවුන්ගේ නිදහස අහිමිකර තිබූ බව කමිටුව විශ්වාස කරයි. ඔවුන්ගේ අවි බිම තබා තිබූ එල්ටීටීඊ සටන්කරුවන් අනෙක් සිවිල් වැසියන්ගෙන් වෙන්කර ගැනීම සාධාරණීය කළ හැකිව තිබුණ අතර එවැනි යම් ඇගයීමක් කළ යුතුව තිබුණේ පුද්ගල පදනමක් මත ය. ඊට අමතරව ආරක්ෂක පදනම් මත නිදහසේ යම් අහිමි කිරීමක් නීතිය මගින් සැලසිය යුතු ය. එමෙන්ම එය අවසාන පිළියමක් ලෙස විය යුතු අතර රඳවා ගනු ලැබ සිටි එක් එක් පුද්ගලයා ඍජු හා අනිවාර්ය තර්ජනයක් ඉදිරිපත් කරන බවට තනි තනි නීර්ණයක ප්‍රතිඵලයක් විය යුතු ය. එලෙසම මෙම නීර්ණය උසාවියක් හෝ ස්වාධීනත්වයේ හෝ අපක්ෂපාතීභාවයේ සමාන අංග ලක්ෂණ හිමි කර ගන්නා වෙනත් විනිශ්චය සභාවක් මගින් නිත්‍ය වාරික විමර්ශනයකට භාජනය කළ යුතු ය. ආණ්ඩුව විසින් මෙම නිර්ණායකයන්ට හා පටිපාටීන්ට ගරු කරනු ලැබීමට අසමත් වීම හේතු කොට ගෙන ඇති වන්නා වූ ආනුෂාංගික නිදහස අහිමි කිරීම හිතුවක්කාර රඳවා තබා ගැනීමක් ලෙස සැලකිය හැකි ය.

1173. දහස් ගණන් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ යාම් ඊම් නිදහස මත බරපතල සීමාවන්ට අමතරව ඔවුන්ගේ නිදහස අහිමි කිරීම මගින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය වෙන්ව උල්ලංඝනය කිරීමක් අදහස් වෙයි. තව ද මෙම අවෘත අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල ද්‍රව්‍යමය තත්ත්වයන් සෞඛ්‍යයට ඇති අයිතිය හා ආහාර, ජලය, නිවාස හා සනීපාරක්ෂණය ඇතුළු ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකේ. පහසුවෙන් විපතට පත්විය හැකි පුද්ගලයින් සම්බන්ධ කාරණයක දී මෙම උල්ලංඝනයන් වාර්තාවේ ප්‍රලේඛනය කර ඇති පරිදි මරණ අවදානමක් ඉහළ දැමීමකට මග පෑදී ය. එසේම තත්ත්වයන්ට යටත්ව එවැනි තත්ත්වයන් ද ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මගින් නිර්වචනය කර ඇති පරිදි අමානුෂික හා තුච්ඡ සැලකීමක් ලෙස සැලකිය හැකි ය.

1174. විමර්ශන කමිටුව සන්තක තොරතුරුවල පදනම මත අභ්‍යන්තර අවතැන් වූවන්ට සැකකරුවන් ලෙස සලකනු ලැබ ඇත්තේ හා ඔවුන් රඳවා ගනු ලැබ ඇත්තේ ඔවුන්ගේ දමිළ

ජනවාර්ගිකතාව නිසා සහ ඔවුන් පැමිණ ඇත්තේ එල්ටීටීඊ-පාලිත ප්‍රදේශයෙන් නිසා බවට විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ. මෙය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ වෙනස් කොට සැලකීමක් ලෙස සැලකිය හැකි අතර අධිකරණයක් විසින් තහවුරු කරනු ලැබුවහොත් මානව වර්ගයාට එරෙහි හිංසනය පිළිබඳ අපරාධයක් ලෙස සැලකිය හැකි ය.

**XVIII යුක්තිය හා වගවීම**

1175. ශ්‍රී ලංකාවේ දැඩි මානව හිමිකම් උල්ලංඝනයන්, ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ හා ජාත්‍යන්තර අපරාධ නීතියේ බරපතල උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිවයුතු වරදකරුවන් යුක්තිය හමුවට ගෙන ඒමට අසමත් වීම කමිටුවේ වරලත් විමර්ශන කාල පරිච්ඡේදයට පෙර බොහෝ කාලයක් ඈතට දිව යන අතර මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, මානව හිමිකම් කමිටුව හා විශේෂ පටිපාටි වරම-දරන්නන් වැනි එක්සත් ජාතීන්ගේ මණ්ඩල විසින් හා ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් අවුරුදු ගණනාවක් පුරා වාර්තාවල, නිරීක්ෂණවල හා ප්‍රකාශනවල නැවත නැවතත් මතුකර දක්වා තිබේ. එසේම මානව හිමිකම් කවුන්සිල යෝජනා ද ''සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා යුක්තිය, සාධාරණය, වගවීම හා සමගි සන්ධානය සහතික කිරීමේ විශ්වසනීය හා ස්වාධීන පියවර ගැනීම ආරම්භ කිරීමෙහිලාවන එහි නෛතික බැඳීම් හා කැපවීම ඉටු කරන්නැ''යි ආණ්ඩුවෙන් ඉල්ලා තිබේ.[1212]

1176. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමමත් (LLRC) එහි අවසන් වාර්තාවේ දී ''නීතියේ ආධිපත්‍යය පැවත්වීමට අසමත්වීම'' කෙරෙහි අවධානය යොමුකර ඇති අතර''සියලු චෝදනා විමර්ශනය කිරීම ද පරිපාලනය හා යුක්තිය කෙරෙහි ජනතාව අතර විශ්වාසය පුබුදුවනු පිණිස ඔවුන්ගේ දේශපාලන බැඳියාවන් නොතකා වැරදි කරන ලද්දවුන් යුක්තිය හමුවට පමුණුවා දඬුවම් ලබා දීම ද කළ යුතු ය''යි අවධාරණය කර තිබේ. එසේම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් වාර්තාව ''එවැනි පියවරක් නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සහතික කිරීමේ බලගතු සංඥාවක් නිකුත් කිරීමක් හා අනුයාතව සුවපත් කිරීමේ ක්‍රියාවලියට දායක වීමේ නැමියාවක් වන''හෙයින් නීතියෙන් බැහැර ඝාතන සම්බන්ධ වරදකරුවන් පිළිබඳව විමර්ශනවල හා යුක්තිය හමුවට ගෙන ඒම්වල වැදගත්කම ද අවධාරණය කරයි.[1213]

1177. 2011 මාර්තුවල එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලද එහි වාර්තාවෙහි ''ගැටුම අවසන් වීමෙන් පසු අවුරුදු දෙකකට ආසන්න කාලයක එහි ප්‍රයත්නයන් වගවීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගේ මට්ටට ළඟ වීමට බරපතල ලෙස අසමත්ව තිබෙන අතර ශ්‍රී ලංකාවේ නෛතික යුතුකම් සපුරාලීමට ද අසමත්ව තිබෙන'' බව නිගමනය කර තිබේ. එසේම එය ආණ්ඩුව අවංක විමර්ශනයක් පවත්වා නොමැති බව ද ''එසේ කිරීමේ කිසිදු අභිලාෂයක ලකුණක් වත් පෙන්වා නැති'' බව ද වගවීම පිළිබඳ එහි ප්‍රවේශය ''සත්‍යය, යුක්තිය හා වින්දිතයින්ට හානිපූර්ණය'' අවධාරණය කරන මූලික ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුරූපී නොවන''බව ද නිගමනය කර තිබේ.[1214]

---

[1212] A/HRC/22/ .1/Rev.1: ශ්‍රී ලංකාවේ සමගි සන්ධානය හා වගවීම ප්‍රවර්ධනය කිරීම, 2013 මාර්තු 19

[1213] LLRC වාර්තාව 9.120 හා 9.213 ඡේද

[1214] ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එජා මහ ලේකම්වරයාගේ විශේෂඥයින්ගේ කණ්ඩායමේ වාර්තාව, 2011 මාර්තු 31

1178. විමර්ශන කමිටුව විමර්ශන ක්‍රියාවලියේ දී එක්රැස්කර ගන්නා ලද තොරතුරු දණ්ඩන මුක්තිය ශ්‍රී ලංකාවේ ගැඹුරු ලෙස ස්ථාපිතව තිබෙන බව හා දැඩි මානව හිමිකම් උල්ලංඝනයන්, ජාත්‍යන්තර මානුෂවාදී හා අපරාධ නීතිය පිළිබඳ බරපතල උල්ලංඝනයන් වින්දිතයින්ට දීර්ඝ කාලයක් පුරා පිළියම් හා හානිපූර්ණය ලබා ගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කර තිබෙන බව යළිත් වරක් තහවුරු කරයි. ඒ වෙනුවට පොලීසියට හෝ අධිකරණයට පැමිණිලි ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන විට නිතරම වාගේ ඔවුන් තර්ජනවලට, බිය ගැන්වීම්වලට හෝ ශාරීරික වධහිංසනවලට මුහුණ පා තිබේ. දිගටම මුහුණ පාමින් තිබේ. ශ්‍රී ලංකාවට පැමිණි ඔහුගේ දූත ගමනේ දී නීතියෙන් බැහැර ලඝු හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ පිළිබඳ විශේෂ වාර්තාකරු විසින් 2005 දී සඳහන් කරන ලද පරිදි ''ආණ්ඩුව හිංසනය ප්‍රතිඵලදායී අන්දමින් යුක්තිය හමුවට ගෙන ඒමට අසමත්වීම ගැඹුරින් දැනුන ප්‍රශ්නයකි. හමුදා සොල්දාදුවකු හෝ පොලිස් නිලධාරියෙකු වැනි ආණ්ඩුවේ නිලධාරියෙකු දමිළයෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඇති නඩුවල හිඟය එක් නිදසුනකි'' දණ්ඩන මුක්තියේ විනාදන ප්‍රතිවිපාකයේ ප්‍රතිඵලයක් ලෙස ''නීතියේ ආධිපත්‍යය මගින් ඔවුන්ගේ ජීවිත ආරක්ෂා වනු ඇතැයි යන්න බොහෝ ජනයා සැක කරති.''[1215]

1179. කලින් අවුරුදුවල ඒවන විටත් බරපතල අන්දමින් බිඳ වැටී තිබුණ නීතියේ ආධිපත්‍යය විමර්ශනයට ගැනුණු කාල පරිච්ඡේදය තුළ විශේෂයෙන්ම ජනාධිපතිවරයාට හා වැඩිමනත් බලතල ද නිධාරීන්ට දණ්ඩන මුක්තිය ද ප්‍රදානය කිරීමත් සමග වඩාත් බාදනය වන තත්ත්වයට පත් වූයේ ය. නිදසුන් ලෙස හදිසි නීති විධිවිධානවල මෙසේ සඳහන් වේ. ''මෙම විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් විශේෂ වශයෙන් බලය පවරන ලද යම් රජයේ සේවකයෙකුට හෝ වෙනත් යම් පුද්ගලයෙකුට එරෙහිව මෙහි සලසා ඇති පරිදි එම තැනත්තා ක්‍රියාකර ඇත්තේ සද් භාවයෙන් හා ඔහුගේ නිල රාජකාරි ඉටු කිරීම සඳහා වූ විට කිසිදු පියවරක් ගැනීම හෝ නඩු පැවරීමක් නොකළ යුතු ය.''[1216]

1180. ආයතනගත වගවීම ඇති කරන ගැඹුරට ගිය ප්‍රතිසංස්කරණ ගෙන ඒමට ඒකාන්ත ප්‍රමුඛතාවක් දීම අත්‍යවශ්‍ය ය. එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් 10 දෙනා[1217] ආයතනික සැකස්මෙහි මූලික වෙනසක අවශ්‍යතාව 2009 පෙබරවාරි 9 වෙනි දින කළ ප්‍රකාශයක අවධාරණය කළ හ. ඔවුහු මෙසේ සඳහන් කළහ: ''ගැටුම් ප්‍රදේශවල අපයෝජනයන්ගේ බරපතලභාවය කෙසේවතුදු ප්‍රශ්නය වඩාත් ආවේණික එකක් බව අවධාරණය කිරීමට

---

1215 නීතියෙන් බැහැර, ලඝු හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ නියෝජිතයාගේ වාර්තාව, 19-20 පිටු

1216 හදිසි නීති විධිවිධාන පනත (මහජන ආරක්ෂක ආඥා පනත, 40 පරිච්ඡේදය) 2006 දෙසැම්බර් 6

1217 ශ්‍රී ලංකාව: එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් විවේචනය මර්දනය කිරීම හා අඩුවකින් තොර වූ දණ්ඩන මුක්තිය ගැඹුරින් සැලකිල්ලට ගනී, 2009 පෙබරවාරි 9, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ තත්ත්වය පිළිබඳ විශේෂ නියෝජිත, මතයක් දැරීමේ හා පළ කිරීමේ නිදහසට ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ නියෝජිත, බලහත්කාර හෝ අනුච්ඡානුග උතුරුදහන් කිරීම පිළිබඳ වැඩ කණ්ඩායමේ (WGEID) සභාපති, අත්තනෝමතික රැඳවුම්භාර පිළිබඳ වැඩ කණ්ඩායමේ සභාපති, කායික හා මානසික සෞඛ්‍යය පිළිබඳ අත්කර ගත හැකි ඉහළම ප්‍රමිතිය බුක්ති විඳීමට හැම කෙනෙකුටම ඇති අයිතිය පිළිබඳ විශේෂ නියෝජිත, විනිසකරුවන්ගේ හා නීතීඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේස නියෝජිත, ආහාර අයිතිය පිළිබඳ විශේෂ නියෝජිත, නීතියෙන් බැහැර, ලඝු හෝ හිතුවක්කාර ඝාතන පිළිබඳ විශේෂ නියෝජිත, වධ හිංසනය හා අනෙකුත් කෲර, අමානුෂික හෝ පහත් කොට සැලකීම හෝ දඬුවම් පැමිණවීම පිළිබඳ විශේෂ නියෝජිත, යෝග්‍ය නිවාස පිළිබඳ විශේෂ නියෝජිත, වෙනස් කොට නොසැලකීමේ අයිතිය පිළිබඳ විශේස නියෝජිත

විශේෂඥයින් කැමති ය. ගැටුම ශ්‍රී ලංකාව පුරා නොඅඩුව සිදු වෙන්නට හැර තිබෙන දණ්ඩන මුක්තියෙන් අවධානය වෙනතකට හරවයි. ඵලදායී විමර්ශනවල හා නීති කෘත්‍යයන්හි අඩුව සමග වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට එරෙහි පලිගැනීම්වල බිය කඩා දැමිය යුතු දණ්ඩන මුක්ති චක්‍රයකට මග පාදා තිබේ.''තවදුරටත් බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පුනරාවර්තනය වීම වැළක්වීමට පාලනයේ පොදු ක්‍රමයෙහි වෙනස්කම් අවශ්‍ය කරන බව ඔවුහු අවධාරණය කළහ.

1181. පහතින් හඳුනාගෙන තිබෙන බොහෝ බාධකයන්ට ආමන්ත්‍රණය කිරීමට විස්තීරණ සංක්‍රමණීය යුක්ති පසිඳලීමේ වැඩසටහනක් සඳහාවන අවශ්‍යතාව මෙම වාර්තාවේ ප්‍රධාන නිර්දේශවලින් එකක් වේ. මෙයට සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයන්, විමර්ශන, කියනු ලබන වැරදි කළවුන්ට එරෙහි නීති කෘත්‍යයන් හා දඬුවම් කිරීම් හානිපූර්ණ හා හිංසන හා අපයෝජනයන්ගේ රටාවන් නැවත ඇතිවීම වැළක්වීමේ පියවර ඇතුළත් විය යුතු ය.

1182. වගවීම සම්බන්ධ බාධක බොහෝ ය, ඒවා නැවත නැවත ප්‍රලේඛනය කර තිබේඃ දේශපාලන අධිෂ්ඨානයේ අඩුව; අධිකරණ මෙන්ම මානව හිමිකම් කොමිසමේ හා අනෙක් මණ්ඩල පත්වීම්වල  ස්වාධීන පාලනයක අඩුව; විධායකය අධිකරණ කටයුතුවලට අත පෙවීම; ප්‍රගතියකින් තොරව අවුරුදු බොහෝ ගණන් උසාවිවල කාලය කන නඩුවල අනවශ්‍ය ප්‍රමාදය; බොහෝ විට ස්වාධීනත්වයක් නැති, බොහොමයක් වාර්තා කිසිදාක ප්‍රකාශයට නොකරන විමර්ශන කොමිෂන් සභා පත් කිරීම;  ජාතික හා එක්සත් ජාතීන්ගේ මණ්ඩල විසින් වගවීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අසමත්වීම; ආරක්ෂක හමුදා හා ආණ්ඩුවේ නිලධාරීන්ට එරෙහිව පැමිණිලි කරන්නවුන්ට එරෙහි තර්ජන හා පලිගැනීම් හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂණය සඳහා ඵලදායී යාන්ත්‍රණ නොමැතිකම ය. තවත් බාධකයක් වන්නේ ජාත්‍යන්තර අපරාධ අපරාධකරණීය කිරීමට අදාළ නීතිකරණයක  හා ආඥාපතීන්ගේ හෝ ඉහළ ප්‍රධානීන්ගේ වගවීම ඇතුළු වගකීම් මාදිලි සංස්ථාපනය කිරීම්වල අඩුවයි.

**වින්දිතයින්ට, සාක්ෂිකරුවන්ට හා අනෙකුත් අයට එරෙහි පලි ගැනීම්/සාක්ෂිකරු ආරක්ෂණයේ අඩුව**

1183. සත්‍ය සෙවීමේ හා ඒවා කර ගෙන යාමේ අධිකරණමය පටිපාටි ඇතුළු සංක්‍රමණීය යුක්ති පසිඳලීමේ යාන්ත්‍රණයන් ඇති කිරීම පිණිස වින්දිතයින්ට හා අනෙකුත් සාක්ෂිකරුවන්ට බියෙන් තොරව සහභාගි විය හැකි විශ්වාසයේ හා ආරක්ෂාවේ වාතාවරණයක් ස්ථාපිත කිරීම අවශ්‍ය ය. එවැනි වාතාවරණයක් ශ්‍රී ලංකාවේ තවමත් නොපවතින අතර වගවීමේ හා සමගි සන්ධානයේ කිසියම් ප්‍රගතියක් සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස එය නිර්මාණය කළ යුතු ය. 2015 පෙබරවාරිවල ආණ්ඩුව වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීතියක් සම්මත කළ ද අවශ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව සැපයෙන කිසිදු යාන්ත්‍රණයක් තවමත් පිහිටුවා නැත.

1184. එහි විමර්ශන ක්‍රියාවලියේ දී විමර්ශන කමිටුවට හමුදාවෙන් හා/හෝ පොලීසියෙන් විඳින්ට සිදු වූ හිරිහැර හා ඇතැම්විට කායික අපයෝජන පිළිබඳව හා උල්ලංඝනයන් වාර්තා කිරීමට හා විමර්ශනවල දී සාක්ෂි දීමට ඇති ඔවුන්ගේ බිය පිළිබඳව සාක්ෂිකරුවන්ගෙන්

අනේකවිධ හා සංගත වාර්තා ලැබිණි. 2015 ජනවාරි ආණ්ඩුව වෙනස් කිරීමෙන් ඔබ්බට ගිය එවැනි චෝදනා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය වෙත දිගටම ලැබුණි.

1185. ලිඛිතව හා දුරකථනයෙන් ඔවුන්ට මරණ තර්ජන ලැබුණේ, හමුදා හෝ පොලිස් පිරිස් නිරන්තරව ඔවුන්ගේ නිවෙස්වලට පැමිණියේ, මුර පොලවල දී තර්ජනාත්මක හැසිරීම්වලට මුහුණ දුන්නේ, වෙන තැන්වල පදිංචි වීමට ඇතැම් අවස්ථාවල රට හැර යන්නට බල කළේ කෙසේ ද යන්න සාක්ෂිකරුවෝ කමිටුවට විස්තර කළහ. 2008 අප්‍රේල්වල එහි දූත මෙහෙවර නිමා කිරීමේ එහි තීරණය සම්බන්ධ ප්‍රධාන ප්‍රතිෂ්ඨාවන්ගෙන් හා හේතුවලින් එකක් ලෙස ජාත්‍යන්තර විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම (IIGEP) දැක් වූ එක් කරුණක් වූයේ සාක්ෂිකරු ආරක්ෂණ වැඩසටහනක් නොමැති වීමයි.[1218] මානව හිමිකම් කමිටුවේ පැමිණිලි පටිපාටි උසාවි හරහා ඔවුන් යුක්තිය ලබා ගන්නට උත්සාහ කළ විට පැමිණිලිකරුවන්ට නැවත නැවත මුහුණ දීමට සිදු වූ පලිගැනීම් ඇතුළත් තනි තනි සිද්ධි මාලාවක්ම ප්‍රලේඛනය කර තිබේ.

1186. පාර්ලිමේන්තුව 2015 පෙබරවාරිවල දී අපරාධ වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට සහාය වීමේ හා ආරක්ෂාව සැලසීමේ පනත සම්මත කළේ ය. කෙටුම්පත මුලින්ම සකස් කර තිබුණේ වසර අටකටත් වැඩි කලකට පෙර ය. එය ප්‍රතිපත්තියක් වශයෙන් ඉදිරියට තැබූ ධනාත්මක පියවරක් වූ අතර සිවිල් සමාජය හා ජාත්‍යන්තර ක්‍රියාකාරකයන් විසින් කෙටුම්පත්වලට අදාළව ඉදිරිපත් කරනු ලැබ තිබූ ඇතැම් ප්‍රතිෂ්ඨාවන්ට ආමන්ත්‍රණය කර තිබේ. එය තවමත් ක්‍රියාත්මක කරන්නට තිබෙන අතර කාර්ය සාධනීය ආරක්ෂණ යාන්ත්‍රණයක් වීම පිණිස එයට සංශෝධන ගණනාවක් අවශ්‍ය කරයි.

1187. වැඩි දියුණු කිරීම අවශ්‍ය කරන ප්‍රධාන පැතිවලින් එකක් වන්නේ වින්දිතයාට හෝ සාක්ෂිකරුවාට ආරක්ෂාව දිය යුතු ද යන්න තීරණය කරන විට සලකා බැලිය යුතු නිර්ණායකයන් පිළිබඳ පැහැදිලි අර්ථ නිරූපණයකි. දෙවන බාධාව වන්නේ වැඩසටහනේ කොටස් දෙක තනන යාන්ත්‍රණ දෙකේ ස්වාධීනත්වය පිළිබඳ සහතිකයන්ගේ අඩුවයි. අපරාධ වින්දිතයින්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ජාතික අධිකාරියක් පත් කිරීම පනතින් අවශ්‍ය කෙරේ. කෙසේ වුව ද සුවිශේෂවම ප්‍රවීනතාව මත පදනම්ව ස්වාධීන පත්වීම් කිරීමට හානි ගෙන දීමේ අවදානම ඇති කරමින් ජාතික අධිකාරියට පත්කරන ඇතැම් ප්‍රධාන පත් කිරීම් කරනු ලබන්නේ ජනාධිපතිවරයාගේ ඒකාන්ත අභිමතයෙනි. තව ද අධිකාරියේ නිර්දේශ අනුගම්‍ය නොවේ. මෙලෙස පුද්ගලයෙකුට හෝ ආයතනයකට ලැබෙන ආරක්ෂාව හා බැඳුනු නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමට එය බැඳී නොසිටී. සැලකිල්ලට ගන්නවා පමණි.

1188. පනත මගින් ස්ථාපිත කරන දෙවන මණ්ඩලයක් වන්නේ අධිකාරිය විසින් සපයනු ලබන මාර්ගෝපදේශවලට අනුව අපරාධ වින්දිත හා සාක්ෂිකාර වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීමට වරය දෙන අපරාධ වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට ආධාර හා ආරක්ෂාව

---

1218 IIGEP යේ අවසාන ප්‍රසිද්ධ ප්‍රකාශනය, 2008 අප්‍රේල් 15

සැපයීමේ කොට්ඨාසය යි. පොලිස්පතිවරයා විසින් පිහිටුවීමට නියමිත මෙම කොට්ඨාසය ආරක්ෂාව සැපයීම සඳහා වන අතර යම් තර්ජනයක් හෝ පලිගැනීමක් සම්බන්ධ විමර්ශනය කරයි. කෙසේ වුව ද පනත මෙම කොට්ඨාසය ඉතිරි පොලිස් බලකායෙන් ස්වාධීන ස්වායත්ත ඒකකයක් ලෙස නොපිහිටුවයි. මානව හිමිකම් අදාළ අපරාධ සම්බන්ධයෙන් විමර්ශනයට භාජනය කරන්නවුන් අතර පොලිස් පිරිස් සිටීමට ඉඩ ඇති හෙයින් කොට්ඨාසයේ ස්වායත්තතාවේ අඩුව විශේෂයෙන්ම ජාතික අධිකාරිය විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කොට්ඨාසයේ පැත්තෙන් බැඳීමක් නොමැති නිසා ආරක්ෂණ යාන්ත්‍රණයේ කාර්ය සඵලත්වය බරපතල් ලෙස පරදුවට තබන තත්ත්වයක් ඇතිවිය හැකි ය.

1189. ආරක්ෂාව සම්බන්ධ අවස්ථාවක දී අධිකරණයක් හෝ කොමිසමක් මගින් ශ්‍රව්‍ය-දෘශ්‍ය සාක්ෂි ලබා ගැනීමට පනත අවකාශ සලසයි. එහෙත් සාක්ෂියක් දෙනු ලැබිය හැක්කේ විදේශයක සිට දෙනවාට වඩා ශ්‍රී ලංකාව ඇතුළත ''දුරස්ථ ස්ථානයක'' සිට පමණි. එසේම රාජ්‍ය නිලධාරියෙකු ඉදිරියේ ය. තව ද නීතිපතිවරයා එවැනි සාක්ෂියක් ''අයෝග්‍ය''යයි සලකන්නේ නම් උසාවිය හෝ කොමිසම එම මතය මගින් බැඳිය යුතුව තිබේ. ප්‍රධාන සාක්ෂිකරුවන් ගණනාවක්ම විදේශයේ සිට වීඩියෝ සම්බන්ධකයක් මගින් උදලාගම කොමිසම හමුවේ සාක්ෂි සැපයුව ද එම සාක්ෂි 2008 මැයිවල දී කෙලින්ම බැහැර කරන ලද බව කමිටුව සටහන් කරයි.

1190. අවශ්‍ය සංශෝධනවලට අමතරව පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූල්‍ය හා මානව යන දෙඅංශයෙන්ම විස්තීරණ සම්පත් හා අවදානමට ලක්වන්නන්ගේ පලදායී ආරක්ෂණය සඳහා අවශ්‍ය කරන මෙහෙයුම් පටිපාටි ද අවශ්‍ය ය.

1191. එසේම සාක්ෂිකාර ආරක්ෂණ පනත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කෙරුණ ද සාක්ෂි ලබා දීම සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මරණය කිරීම ද අවශ්‍ය ය. ආණ්ඩුව නිමක් නැති වින්දිතයින් හා සාක්ෂිකරුවන් ඉදිරියට ඒම වළක්වනු ලබන පමණක් නොව විමර්ශනය කිරීමේ හා අවකල්ක්‍රියාවන්ගේ වැරදිකරුවන් යුක්තිය හමුවට පැමිණවීමේ ඔවුන්ගේ වෘත්තීය වරම ඉටු කිරීමෙන් උද්යෝගිමත් අධිකරණ හා අනෙක් නිලධාරීන් වළක්වනු ලබන ආවේණික තර්ජන, හිරිහැර හා බිය ගැන්වීම අවසන් කිරීමේ අධිෂ්ඨාන සහගත පියවර ගත යුතු ය.

### ආයතන කෙරෙහි විධායකයේ බලයට මැදිහත්වීම/පාලනය නීතියේ ආධිපත්‍යයට හා වගවීමට යතුර ය

1192. 2001 ඔක්තෝබර්වල සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වෙනි සංශෝධනය අනෙක් ඒවා අතර මැතිවරණ කොමිසම, මානව හිමිකම් කොමිසම, ජාතික පොලිස් කොමිසම හා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිසම ඇතුළු ඇතැම් කොමිෂන් සභාවලට නිර්දේශ කිරීමේ හෝ පත්වීම් අනුමත කිරීමේ බලය තිබුණ බහු පාක්ෂික හා ස්වාධීන සාමාජිකයින්ගෙන් සමන්විත ව්‍යවස්ථා සභාවක් නිර්මාණය කළේ ය. එසේම එයට නීතිපති, පොලිස්පති, අග්‍ර විනිශ්චයකාරවරයා හා අනෙකුත් අභියාචන හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ඇතුළු රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්කිරීම අනුමත කිරීමේ බලය ද

තිබිණ.[1219] ඔවුන්ගේ පත්වීම් අධීක්ෂණය කිරීම මගින් නීතියේ ආධිපත්‍යයට හා වගවීමට යතුර වූ ඇතැම් ආයතනවල හා නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහතික කිරීමේ මාර්ගයක් ලෙස ව්‍යවස්ථා සභාව අපේක්ෂා කරනු ලැබිණ.

1193. කෙසේ වුව ද ව්‍යවස්ථා සභාව 2002 හා 2005 අතර ක්‍රියාත්මක වූ අතර එහි පළමුවන තුන් අවුරුදු කාලය අවසානයේ දී සභාවට අලුත් සාමාජිකයින් පත් කිරීම පිළිබඳව වූ දේශපාලන අවහිරයක් හේතු කොට ගෙන එහි ක්‍රියාකාරිත්වය නැවතිණ. එතැන් පටන් බාහිර පාලනයකින් තොරව (2002 ට පෙර ඒවා කෙරුණ පරිද්දෙන්) නීතියේ ආධිපත්‍යයේ ආයතන විධායකයේ බලයට නතු කිරීමට හා ඒවා දේශපාලනීකරණය කිරීමට දායකත්වය සපයමින් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභා හා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තනතුරුවලට පත් කිරීම් කරනු ලැබීය. මෙම භාවිතය 17 වෙනි සංශෝධනය ශූන්‍ය කර ව්‍යවස්ථා සභාව අහෝසි කරනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වෙනි සංශෝධනය මගින් තවදුරටත් ශක්තිමත් කෙරිණ.

1194. 2010 දී ජනාධිපති ලේකම් කාර්යාලයට නීතිපති දෙපාර්තමේන්තුව මාරු කිරීම මගින් නීතිපතිවරයාගේ ස්වාධීනත්වය කව දුරටත් පරදුවට තැබිණ. 2015 ජනවාරි 18 වෙනි දින එය ආපසු අධිකරණ අමාත්‍යාංශය වෙත ගැසට් නිවේදනයක් මගින් නිල වශයෙන් අනුයුක්ත කරමින් නිවැරදි කරනු ලැබීය.

1195. 2015 අප්‍රේල් 15 වෙනි දින පාර්ලිමේන්තුව විසින් 19 වෙනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම මගින් ව්‍යවස්ථා සභාව යළි ස්ථාපිත කෙරිණ. එය නිසි පරිදි ක්‍රියාත්මක වුවහොත් ප්‍රධාන කොමිෂන් සභාවල හා ආයතනවල ස්වාධීනත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට ආධාර වනු ඇත. මෙය ලියන අවස්ථාවෙහි ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් හත් දෙනෙකු (කතානායක, අගමැති, විපක්ෂනායක, හා අනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීන් හතර දෙනා) ස්ථිර වී තිබිණ. එහෙත් සභාවේ සිවිල් සමාජ නියෝජිතයින් තිදෙනා නම් කිරීම පාර්ලිමේන්තුව විසින් එතෙකුත් අනුමත කළ යුතුව තිබිණ.

**මානව හිමිකම් කොමිසම**

1196. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම ස්ථාපිත කරන ලද්දේ 1996 දී පාර්ලිමේන්තු පනත (1996 අංක 21 දරණ) මගිනි. මූලික අයිතිවාසිකම් පිළිබඳ ''උල්ලංඝනයන් හෝ සිදු වීමට ආසන්න උල්ලංඝනයන්'' සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීමේ එහි නිශ්චිත බලතලවලට අනුව වගවීම සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් එයට තිබිය යුතු විය. මෙම විමර්ශන බලතලවලට පහතින් එන ඒවා ඇතුළත් විය:

1197. -සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම, සාක්ෂි දීම සාක්ෂිකරුවන් කැඳවීම හා විභාග කිරීම හෝ ලියවිලි හෝ අනෙකුත් අයිතම ඉදිරිපත් කිරීම (වග. 18);

1198. -නඩු පැවරීමට හෝ උල්ලංඝනය කළාය කියන තැනත්තාට එරෙහි අනෙකුත් පියවර ආරම්භ කිරීමට නිර්දේශ කිරීම; (15.1 අ)

1199. -කාරණය අදාළ අධිකරණයකට යොමු කිරීම;

[1219] එම කෘතියම 23 පිට

1200. -එවැනි ''උල්ලංඝනයක් වැළක් වීමට හෝ පිළියම් යෙදීමට'' නිසි අධිකාරියකට හෝ අදහසක් ඇති පුද්ගලයින්ට නිර්දේශ කිරීම

1201. 2006 වන තෙක් කොමිසම එහි වරමට අනුකූලව බොහෝ කටයුතු කළේ ය. නිදසුන් ලෙස නීති විරෝධී අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් සම්බන්ධයෙන් මැදිහත්වීම. මානව හිමිකම් කොමිසම සමග සහයෝගයෙන් වැඩ කරන්නැයි 2006 දී ජනාධිපති රාජපක්ෂ නියෝගයක් දී තිබිය දීත් මෙම නියෝග ක්‍රියාත්මක කළ බවට ඉදිරිපත් කළ හැක්කේ සුළු තොරතුරු ප්‍රමාණයකි.

1202. 2006 පෙර මානව හිමිකම් කොමිසම විශේෂ විමර්ශන ද නිදසුන් ලෙස 2003 යාපනේ සිදු වූ අතුරුදහන් වීම් සම්බන්ධ විමර්ශනයක් (බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳ පරිච්ඡේදය බලන්න) දියත් කළේ ය. එසේම මානව හිමිකම් කොමිසම 2006 මාර්තුවල ගැටුම් හා බැඳි මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව විමර්ශනය කිරීමට විශේෂ නියෝජිතයෙකු පත් කළේ ය. ඔහු 2006 ත්‍රිකුණාමලයේ පස් දෙනාගේ සිද්ධිය (පහතින් බලන්න) හා 2005 අක්කරෙයිපත්තු මුස්ලිම් පල්ලියට එල්ල කළ ප්‍රහාරය ඇතුළු ඝාතන සිද්ධි හතරක වරදකරුවන් විය හැකිවුන් හඳුනා ගත් අතර වැඩිදුර විමර්ශන සඳහා නිර්දේශ කළේ ය. වාර්තාව කිසිදාක ප්‍රකාශයට පත් කළේ නැති වුව ද 2014 ජනවාරිවල දී මාධ්‍යයට හෙළි විය. කමිටුවේ දැනුමට අනුව ප්‍රලේඛනය කරන ලද සිද්ධිවල දී අපරාධ විමර්ශන කටයුතු කර ගෙන යාමේ සඵල පියවරක් නොවීය.

1203. කෙසේ වුව ද 2006 දී ජනාධිපතිවරයා ව්‍යවස්ථා සභාවේ පටිපාටියෙන් බැහැරව නව සාමාජිකයින් පත් කළ විට කොමිසමේ ගරුත්වය හා ස්වාධීනත්වය ඉතා බරපතල අන්දමින් පරදුවට තැබිණ. අනුයාත කොමසාරිස්වරුන් මේ පදනම මත යළිත් පත් කළේ ය. 2007 දී ජාතික ආයතනවල ජාත්‍යන්තර පිළිගැනීම අධීක්ෂණය කරන මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරිම සඳහා වූ ජාතික ආයතනවල ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව පාර්ශවීය වශයෙන් එහි ස්වාධීනත්වයට අදාළ ප්‍රතිෂ්ඨාවන් හේතු කොට ගෙන කොමිසම ''B-තත්වයට'' (B-status) පහත හෙළී ය. කොමිසමේ තත්ත්වය පහත හෙළීමට දැක් වූ හේතුන් අතර වූයේ ''කොමිසමේ සැබෑ භාවිතය විශේෂයෙන් 2000 අතුරුදහන්වීම් පිළිබඳ සිද්ධි පසු විපරම 2006 ජූලිවල නැවත් වීමට අදාළව තුලිත, සංයුක්ත හා නිර් දේශපාලනික ද යන්න පැහැදිලි නැතිව පවතින්නේ ය'' යන්න ය.[1220]

1204. මානව හිමිකම් කොමිසමට ජනතාව විසින් පැමිණිලි ඉදිරිපත් කිරීම අඛණ්ඩව කෙරුණු අතර එහි කාර්ය මණ්ඩල සාමාජිකයෝ විශේෂයෙන් දිස්ත්‍රික් මට්ටමේ දිගටම වැඩ කළහ. කෙසේ වුව ද අතුරුදහන් වූවන්ගේ ඥාතීන් ඇතුළු මූලාශ්‍ර පරාසයකින් ලැබුණු තොරතුරු කියන්නේ සුළු පසුවිපරමක් හැරුණු විට උල්ලංඝනයන්ට සම්බන්ධ යයි කියන ආයතනවලට-එම ආයතන ප්‍රතිචාර දැක්වූයේ කලාතුරකිනි- ඒවා යොමුකරනවාට වඩා යමක් කෙරුණේ නැති බව ය. අතුරුදහන්වීම් පිළිබඳ සිද්ධි කිහිපයක දී අන් අය කියන පරිදි මානව හිමිකම් කොමිසම

[1220] මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වන ජාතික ආයතනවල ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව, නිල පිළිගැනීම පිළිබඳ අනු කමිටුවේ වාර්තාව හා නිර්දේශ, ජිනීවා, 2007 ඔක්තෝබර් 22-26; 2006 ජූනි 29 දිනැති සටහනක කොමිසමේ ලේකම්වරයා ''ආණ්ඩුවෙන් විශේෂ නියෝග ලැබුණොත් මිස දනට'' මෙම පැමිණිලි පිළිබඳ විමර්ශනය කිරීම නැවත්වීමට එය තීරණය කර තිබුණ බව පැවසීය.

පැමිණිලි ලියා පදිංචි කිරීම ප්‍රතික්ෂේපකර තිබේ. (බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳ පරිච්ඡේදය බලන්න)

1205. 2013 නොවැම්බරයේ දී ආණ්ඩුව මානව හිමිකම් කොමිසම පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයේ ආධාරය ඇතිව 2009 හා 2013 අතර කරන ලද වධ හිංසා කිරීම් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ජාතික විමර්ශනයක් කරනු ඇති බව නිවේදනය කළේ ය. එහෙත් ස්වල්ප කාලයක් තුළ එය දින නියමියකින් තොරව කල් දැමිණ.[1221]

1206. කොමිසමේ වැඩවලට තවදුර බාධකයක් වූයේ කොමිසම මගින් අධිකරණවලට නඩු යොමු කළ හැකි පටිපාටි ආරම්භ කිරීමට හැකියාව ලබා දෙන නීතිකරණයක් නොමැති වීමයි. කොමිසමේ සාමාජිකයින් යළ යළිත් එවැනි නීතිකරණයක් ඉල්ලා සිටියේ වුව ද ඒවා කිසිදාක කෙටුම්පත් කෙරුණේ නැත. එසේම කොමිසමට එහි නියෝග ක්‍රියාත්මක කිරීමේ බලතල ද නොවීය.

1207. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ එහි වරය, විශේෂයෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ වරය ක්‍රියාත්මක කිරීමේ ස්වාධීන මණ්ඩලයක් ලෙස එහි ප්‍රධාන භූමිකාව ඉටු කිරීමට හැකිවනු පිණිස මානව හිමිකම් කොමිසම අළුත් කිරීම හා ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය ය. 2012 දී ජනාධිපති රාජපක්ෂ විසින් පත් කරන ලද වත්මන් කොමසාරිස්වරුන්ගේ වරම් කාලය 2015 සිට අවසානයකට පත් වේ. ඔවුන් වෙනුවට ආදේශ කරන්නන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යවස්ථා සභාවක් මගින් හා ඔවුන්ගේ ස්වාධීනත්වය සහතික කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කළ යුතු ය.

**විමර්ශන කොමිෂන් සභා (CoI)**

1208. විශාල වශයෙන් කෙරුණු ජාත්‍යන්තර හා ජාතික බලපෑමට ප්‍රතිචාර වශයෙන් අනුයාත ශ්‍රී ලංකා ආණ්ඩු ඉහළ වැදගත්කමක් ගන්නා ප්‍රශ්න හා සිද්ධි විමර්ශනය කිරීමේ විමර්ශන කොමිෂන් සභා (CoI) මාලාවක්ම පිහිටුවා තිබේ. 1948 හා 2011 අතර ප්‍රශ්න පරාසයක් විමර්ශනය කිරීමට විමර්ශන කොමිෂන් සභා 32 පිහිටුවා තිබේ. මුල්කාලීන කොමිෂන් සභා මූල්‍ය, වාණිජ හෝ පරිපාලන ප්‍රශ්න විමර්ශනයට නැමියාවක් දැක්වූ අතර පසුව ආ කොමිෂන් සභා පත් කරන ලද්දේ වඩාත්ම මානව අයිතවාසිකම් හා සම්බන්ධ සිද්ධි විමර්ශනය කිරීමට ය. නිදසුන් ලෙස 1990 ගණන්වල බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීමට කොමිෂන් සභා මාලාවක්ම පත් කරනු ලැබිණ. බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ පරිච්ඡේදය 1991 සිට කොමිෂන් සභා බොහෝ ගණනක් පිහිටුවා තිබියදීත් අතුරුදහන් කරනු ලැබූවන්ගේ ඉරණම අපැහැදිලිව පවතින්නේ හා ඒවාට වගකිව යුත්තන් දිගටම දණ්ඩන මුක්තිය බුක්ති විඳින්නේ කෙසේ ද යන්න පෙන්වා දෙයි.

1209. විමර්ශන කමිටුවේ විමර්ශනය මගින් ආවරණය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ අළුත් කොමිෂන් සභා ගණනාවක් පිහිටුවන ලද අතර ඒවායින් බහුතරයට පැවරුණේ නීතියෙන් බැහැර ඝාතන හා/හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීම යඃ

[1221] A/HRC/25/23, ශ්‍රී ලංකාවේ සමගි සන්ධානය හා වගවීම ප්‍රවර්ධනය කිරීම, 2014 පෙබරවාරි 24

- 2006 අගෝස්තු: මඩකලපුව පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් ඝාතනය;

- 2006 නොවැම්බර්: අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව (මහානාම තිලකරත්න කොමිසම වශයෙන් ප්‍රකට ය): පැහැර ගැනීම්, අතුරුදහන් කිරීම්, හඳුනා නොගත් මළ සිරුරු හා පැහැදිලි නැති ඝාතන පිළිබඳ පරීක්ෂා කිරීම;

- 2006 නොවැම්බර්: 2005 අගොස්තු 1 දින සිට සිදුවෙමින් පැවති බව කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන හා පරීක්ෂණ කිරීමේ විමර්ශන කොමිසම (එය වැඩ කටයුතු ආරම්භ කිරීමෙන් පසු උදලාගම කොමිසම නමින් ප්‍රකට): ඝාතන හා බලහත්කාර අතුරුදහන් කිරීමේ සිද්ධි 16 විමර්ශනය කිරීමේ වරම පැවරිණ.[1222] එහි කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම (IIGEP) පත් කරනු ලැබිණ;

- 2007 මැයි, අතුරුදහන් පිළිබඳ පරීක්ෂා කිරීමට මහානාම තිලකරත්න ගෙන් යුත් දෙවන කොමිසමක් පත් කරනු ලැබිණ.

1210. මෙම කොමිෂන් සභාවල සොයා ගැනීම් පල කරන ලද්දේ කලාතුරකින් වන අතර අපරාධ විමර්ශන ඔස්සේ කර තිබෙන බව පෙනෙන්නේ එලදායී පසුවිපරම් ස්වල්පයකි. එහි විමර්ශන ක්‍රියාවලියේ දී කමිටුව ප්‍රකාශයට පත් නොකළ විමර්ශන කොමිෂන් වාර්තා ගණනාවක් ලබා ගත් අතර ඒවා අදාළ පූර්ව පරිච්ඡේදවල විභාග කරනු ලැබ තිබේ.

---

[1222] 2006 අංක 1471/16 ගැසට් පත්‍රය පහත සඳහන් සිද්ධි විමර්ශනය කිරීම සඳහා 2005 අගෝස්තුවල සිට පැන නගින කියනු ලබන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ විමර්ශනය හා විභාග කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්මාණය කළේ ය:

1. ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය ජනාධිපති නීතිඥ කරු ලක්ෂ්මන් කදිරගාමර්ගේ ඝාතනය
2. 2006 අගෝස්තු මුල ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් වූ ඇක්ෂොන් කොන්ට්‍රි ලේ ෆම් (Action contre La Faim)සංවිධානයේ ආධාර සේවකයින් 17 දෙනාගේ ඝාතන
3. 2006 අගෝස්තු මුල මුත්තූර්හි කරන ලද යි කියන මුස්ලිම් ගම්වැසියන්ගේ ඝාතනය හා වැලිකන්දේ දී මුත්තූර්වල සිට ගිලන් රථවලින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයින් 14 දෙනෙකුගේ ඝාතන
4. 2005 දෙසැම්බර් 25 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසේකරම් මහතාගේ ඝාතනය
5. 2006 ජනවාරි 21 හෝ ආසන්න දිනක ත්‍රිකුණාමලයේ තරුණයන් පස් දෙනාගේ ඝාතනය
6. 2006 අගෝස්තු 12 දින ශ්‍රී ලංකා සාම ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් කේතීෂ් ලෝගනාදන් මහතාගේ ඝාතනය
7. 2006 අගෝතුවල නද්දලාමොට්ටන්කුලම්හි දී (සෙන්චෝලෙයි) පුද්ගයලයින් 51 දෙනාගේ මරණ
8. 2006 අගෝස්තු 28 වෙනි දින අල්ලායිපිඩ්ඩි පිලිප් නේරිස් දේවස්ථානයේ ගරු නිහාල් ජිම් බ්‍රවුන් පියතුමාගේ අතුරුදහන්වීම
9. 2006 ජූනි 17 වෙනි දින පේසාලේ වෙරළේ දී හා පේසාලේ දේවස්ථානයේ දී ධීවරයින් 5 දෙනෙකුගේ හා තවත් පුද්ගලයෙකුගේ ඝාතනය
10. 2006 මැයි 13 වෙනි දින කයිට්ස් පොලිස් ප්‍රදේශයේ දී පුද්ගලයින් 13 දෙනෙකුගේ ඝාතනය
11. 2006 සැප්තැම්බර් 17 වෙනි දින පොතුවිල් රදූල්ලේ දී මුස්ලිම් ගම් වැසියන් 10 දෙනෙකුගේ ඝාතනය
12. 2006 ජූනි 15 වෙනි දින කැබිතිගොල්ලෑවේ දී පුද්ගලයින් 68 දෙනෙකුගේ ඝාතනය
13. 2006 අප්‍රේල් 29 වෙනි දින අවිස්සාවේල්ලේ දී හිස නැති මලකඳන් පහක් සොයා ගැනීමේ සිද්ධිය
14. 2005 මැයි 29 වෙනි දින වැලිකන්දේ පුද්ගලයින් 13 දෙනෙකුගේ ඝාතනය
15. 2006 ඔක්තෝබර් 16 වෙනි දින සීගිරියේ දිගම්පතානේ දී ආක්ෂක හමුදාවන්ගේ සාමාජිකයින් 98 දෙනාගේ ඝාතනය

පසු දිනයක දී 16 වෙනි සිද්ධිය ලෙස 2006 නොවැම්බර් 10 වෙනි දින නඩරාජා රවාරාජ් ඝාතනය එකතු කරනු ලැබිණ.

1211. ඉහතින් දක්වන ලද පරිදි 2006 නොවැම්බර්වල දී ජනාධිපති රාජපක්ෂ උදලාගම කොමිසම හා කොමිසමේ කටයුතු නිරීක්ෂණය කිරීමට ජාත්‍යන්තර විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම (IIGEP) පත් කළේ ය. විමර්ශන කොමිසමට සිද්ධීන් 16 පිළිබඳ විමර්ශන පැවැත්වීමේ  කාර්යය පවරනු ලැබුව ද සම්පූර්ණ කළේ එය කියූ පරිදි එහි සම්පත්වලින් බොහොමයක් උකහා ගත් සාගින්නට එරෙහි ක්‍රියාකාරීත්වයේ (ACF) ක්‍රියාකාරීන් ඝාතන සිද්ධිය හා ත්‍රිකුණාමලයේ 5 දෙනාගේ සිද්ධිය ඇතුළු සිද්ධි හතක් පමණි (කමිටු වාර්තාවේ සවිස්තරව දක්වා ඇත).

1212. විශිෂ්ට පුද්ගලයින්ගේ කණ්ඩායම කොමිෂන් විභාගවල දී නිරීක්ෂණයට සහභාගි වූ අතර විභාගවල අපක්ෂපාතිත්වයේ අඩුව පිළිබඳ නැවත නැවතත් කණස්සල්ල ප්‍රකාශ කළේ ය. කොමිසමට පවරන ලද සිද්ධි පිළිබඳ විශ්වසනීය විමර්ශන කිරීම අසීරු යයි එය සැලකූ නිසා නිසා විශිෂ්ට පුද්ගලයන්ගේ කණ්ඩායම නීතිපතිවරයාගේ භූමිකාවේ පිළිබැඳියා ගැටුම, කාර්ය සාධනීය වින්දිත හා සාක්ෂිකාර ආරක්ෂාවක් නොතිබීම, විභාගවල පාරදෘශ්‍යභාවයේ හා කාලෝචිත භාවයේ අඩුව, රාජ්‍ය ආයතනවල සම්පූර්ණ සහයෝගයේ අඩුව හා කොමිසමේ මූල්‍ය ස්වාධීනත්වයේ අඩුව යන හේතු දක්වමින්  2008 අප්‍රේල්වල දී එහි දූත මෙහෙය නතර කරන්නට තීරණය කළේ ය.

1213. එසේම පොලිස් විමර්ශනවලට උපදෙස් දෙමින් හා රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටින අතරම නීතිපතිවරයා ආරක්ෂක හමුදාවන්ට එරෙහි සිද්ධි පිළිබඳ විමර්ශන කොමිසමේ විභාග මෙහෙය වීමේ දී ප්‍රමුඛ භූමිකාවක් රඟ පෑවේ ය. එසේම අධිකරණයේ දී වැඩි දුර අපරාධ විමර්ශනය සඳහා යොමු කරන්නේ විමර්ශන කොමිසමේ කුමන නඩු ද යන්න තීරණය කළේ ද නීතිපතිවරයා ය. විශිෂ්ට පුද්ගලයින්ගේ කණ්ඩායම විසින් මෙම පිළිබැඳියා ගැටුම ප්‍රධාන ප්‍රතිෂ්ඨාවක් ලෙස මතු කරන ලද අතර  විමර්ශනවල ස්වාධීනත්වය හා අපක්ෂපාතිත්වය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග අනනුකූලවන බව සැලකීය.[1223]

1214. විශිෂ්ට පුද්ගල කණ්ඩායමේ මෙම අත්දැකීම පෙන්නුම් කරන්නේ විමර්ශනමය යාන්ත්‍රණයන්හි ඕනෑම ජාත්‍යන්තර මැදිහත්වීමක දී ම පැහැදිලිව නිර්වචනය කළ හා බලසහිත භූමිකාවක් ලබා දිය යුතු බව හා ඒවායේ ස්වාධීනත්වය හා කාර්ය සඵලත්වය සහතික කරනු පිණිස ඒවා විභාගවලට ඒකාබද්ධ කළ යුතු බව ය.

1215. උදලාගම කොමිසම එහි අවසාන වාර්තාව 2009 මැයිවල දී ජනාධිපතිවරයාට භාර දුන්නේ ය. කෙසේ වුව ද මෙය විමර්ශන කොමිසම නිර්මාණය කරන ලද ජනාධිපති නියෝගයේ දී එහි වාර්තාව නීති කෘත්‍යයන් ආරම්භ කිරීම සඳහා ප්‍රකාශයට පත් කිරීම, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හා නීතිපතිපතිවරයා වෙත ලබා දීම කළ යුතු යයි සඳහන් කර තිබේ යන කරුණ තිබියදීත් කිසිදාක ප්‍රකාශයට පත් කළේ නැත.

---

[1223] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය: ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පත් කරන ලද විමර්ශන කොමිෂන් සභා හා කමිටු ලැයිස්තුවක් (2006 - 2013 නොවැම්බර්); වගවීමෙන් තොර අධිකාරය: ශ්‍රී ලංකාවේ දණ්ඩන මුක්තිය පිළිබඳ අර්බුදය, ICJ 2012 නොවැම්බර්, විමර්ශන කොමිෂන් සභාවල නීතිපතිවරයාගේ භූමිකාව පිළිබඳ 2008 අංක 16 සංශෝධනයට තිබුණ බලපෑම සාකච්ඡා කරයි.

1216. කමිටුවට එය සත්‍ය යයි විශ්වාස කරන ප්‍රකාශයට පත් නොකරන ලද උදලාගම කොමිෂන් වාර්තාවේ පිටපත් ලැබී තිබුණි. වාර්තාවට අනුව සිද්ධීන් 16 විමර්ශනය කිරීමට වසර දෙක හමාරක වරමක් එයට තිබියදීත් කොමිසමට හැකි වී ඇත්තේ සිද්ධි 16 න් 7 ක විමර්ශන අවසන් කිරීමට පමණි.[1224] 'ඉතිරි සිද්ධි නවය සම්බන්ධයෙන් ගත් කල දෙන ලද වරම් කාලය තුළ' එහි කාර්යය නිම කිරීම සම්බන්ධව එහි නොහැකියාවට බලපෑ හේතු අතර සාක්ෂිකරුවන්ගේ නොමැතිවීම හා කාලය ප්‍රමාණවත් නොවීම යන කරුණු දක්වමින් කොමිසම ඒවා පිළිබඳව විමර්ශන පැවැත්වීමට හැකි තත්ත්වයක නොසිටි බව වාර්තාව සඳහන් කළේ ය. එය විශිෂ්ට පුද්ගලයින්ගේ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නීතිපතිවරයාගේ භූමිකාවට අදාළ චෝදනාව ඇතුළු ඇතැම් චෝදනාවන්ට අභියෝග කළේ ය. එහි වාර්තාව සාක්ෂිකාර ආරක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම, අනාගත විභාලවල දී ''විධාන වගකීම්''යොදා ගැනීමේ නීති සංශෝධනය කිරීම හා ''එවැනි ක්‍රියාවන්ට නිවාරකයක් ලෙස බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ ස්ථිර ස්වාධීන කොමිෂන් සභාවක්'' ස්ථාපිත කිරීමේ යෝජනාවක් ඇතුළු නිර්දේශ ගණනාවකින් නිමා කර තිබුණි.

**උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC)**

1217. 2010 දී ජනාධිපති රාජපක්ෂ විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) ස්ථාපනය කරන ලද්දේ විමර්ශන කොමිසමක් ලෙස නොවේ. එහෙත් එයට 2002 සටන් විරාම ගිවිසුම අසාර්ථක වීමට මග පෑදූ කරුණු හා තත්ත්වයන් විමර්ශනය කිරීමේ වරමක් ලැබිණ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම එහි අවසාන වාර්තාව 2011 නොවැම්බර් 15 දින ජනාධිපතිවරයාට භාර දුන් අතර එහි කාලය 2002 සිට 2001 දක්වා විහිදුවා තිබිණ. කොමිසම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහාවන දූරදිග යන නිර්දේශ මෙන්ම සමගි සන්ධානය හා වින්දිතයින්ට හානිපූරණ දක්වා වන නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය.

1218. කොමිසමේ වරම් කාල පරිච්ඡේදය මුළුල්ලෙහි කියනු ලබන නීතියෙන් බැහැර ඝාතන හා අනෙකුත් උල්ලංඝනයන් හා අපයෝජනයන් ඉහළ සංඛ්‍යාවක් තිබියදීත් එය කරන්නේ යුද්ධයේ අවසාන අදියරට පෙර එවැනි ක්‍රියා සම්බන්ධ සීමිත සඳහනක් පමණි. එසේ වුව ද එය ''උදලාගම කොමිසමේ නිර්දේශ විශේෂයෙන් 2006 ජනවාරියේ ත්‍රිකුණාමලයේ සිසුන් පස් දෙනාගේ හා 2006 අගෝස්තුවල සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වයේ (ACF) ආධාර සේවකයින් 17 දෙනාගේ ඝාතන සිද්ධීන්වලට සම්බන්ධ වරදකරුවන් පිළිබඳව තවදුරටත් විමර්ශනය කිරීම හා යුක්තිය හමුවට ගෙන ඒම සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට දැඩි ලෙස නිර්දේශකර තිබේ''(5.163 ඡේදය). උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම එහි අවසාන වාර්තාවේ දී ''නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්'' නිරායුද කිරීමේ එහි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම ගැන කණගාටුවට පත්වෙන අතර ''සන්නද්ධ කණ්ඩායම්වලට එරෙහි චෝදනාවන්ට අදාළව නිසි පරීක්ෂණ පැවැත්විය යුතුය''(9.73 ඡේදය) යන්න නැවතත් කියා තිබේ. ''ඵලදායී පිළියම්කාරක පියවර ගැනීමෙහිලා ප්‍රමාදය නීතිය හා සාමය බිඳවැටීමට හා ආනුෂංගිකව නීතියේ ආධිපත්‍යය

[1224] විමර්ශනය කරන ලද සිද්ධි හත පහත පිළිවෙලට වේ. 5, 2, 12, 15, 11, 7, 3 (විස්තර සඳහා ඉහත විස්තරය බලන්න)

බිඳ වැටීමට ද සමගි සන්ධාන ක්‍රියාවලියේ දී ජනතාවගේ විශ්වාසය බිඳවැටීමට ද පමණක් හේතු විය හැකිය''(8.190 ඡේදය) යි ද එය අනතුරු හඟවා තිබේ.

**සිවිල් මරණ හා සම්බන්ධ යුද අධිකරණ විමර්ශනය**

1219. 2012 ජනවාරි 2 වෙනි දින හමුදාපති ජෙනරාල් ජගත් ජයසූරිය ''01.01.09 සිට 19.05.09 දක්වා කාල පරිච්ඡේදය තුළ සිවිල් ජනයා ජීවත් වූ ප්‍රදේශවල හෝ සටන් මුක්ත කලාප තුළ හිතාමතා හා චේතනාන්විත ආකාරයකින් ඔවුන්ට හානියක් හා/හෝ අලාභ හානියක් කිරීමේ'' අදහසකින් යුතුව සිවිල් ජනයා මත හමුදාව විසින් හා/හෝ එහි සාමාජිකයින් විසින් යම් ප්‍රහාරයක් එල්ල කරනු ලැබුවේ ද යන්න ඇතුළු සිවිල් ජන මරණ හා සම්බන්ධව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් මතු කරනු ලැබ ඇති ප්‍රශ්න පරීක්ෂාකර බැලීම පිණිස විමර්ශන හමුදා අධිකරණයක් පිහිටුවීමේ කැඳවුම් නියෝගයකට අත්සන් තැබීය. හමුදා අධිකරණයේ වරයේ දෙවන කොටස වූයේ චැනල් ෆෝ වාර්තාමය චිත්‍රපටය පරීක්ෂා කිරීම හා පෙන්වනු ලැබ තිබෙන ක්‍රියා කරමින් සිටියවුන් ශ්‍රී ලංකා හමුදාවේ සාමාජිකයන් ලෙස හඳුනා ගත හැකි ද, පෙන්වන ලද ස්ත්‍රී ශරීරයන්හි දූෂණ හෝ ලිංගික හිංසන සාක්ෂි තිබුණේ ද හෝ මිය ගිය ස්ත්‍රීන්ගේ ශරීරවලට නිගරු කොට තිබේ ද යන්න විමර්ශනය කිරීම ය. විමර්ශන හමුදා අධිකරණයේ සම්පූර්ණ සොයා ගැනීම් කිසිදාක ප්‍රකාශයට පත් කර හෝ කමිටුවට ලබා ගැනීමට හැකි වී හෝ නැත.

1220. ආරම්භයේ සිටම විමර්ශන හමුදා අධිකරණයේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීභාවය ප්‍රශ්නයට තුඩු දුන්නේ ය. ජෙනරාල් ජයසූරිය විමර්ශනයට භාජනය වන ගැටුම් කාලය සමයේ වන්නියේ ආරක්ෂක අංශ මූලස්ථානයේ ප්‍රධානියාව සිටියේ ය. එහෙයින් ඔහු භූමියෙහි හමුදා මෙහෙයුම් සම්බන්ධ වගකිව යුතු වේ. විමර්ශනවල පළමුවන කොටසේ සොයා ගැනීම් පිළිබඳ 'හමුදාපතිවරයාගේ මතය'යන මාතෘකාව යටතේ වූ කමිටුව විසින් ලබා ගනු ලැබ තිබෙන ඔහුගේ වාර්තාවේ[1225] ඔහු නිගමනය කර ඇත්තේ ''විමර්ශන අධිකරණය හමුවට ඉදිරිපත් කරන ලද සාක්ෂි සලකා බැලීමේ දී මගේ මතය වන්නේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ වාර්තාවේ සඳහන් කර තිබෙන කියනු ලබන ෂෙල් ප්‍රහාර පිළිබඳ සිද්ධීන් ශ්‍රී ලංකා හමුදාව විසින් කරන ලද ඒවා නොව එල්ටීටීඊය විසින් එක්කෝ සිවිල් වැසියන් පලා යාම වැළැක්වීම පිණිස නිවාරකයක් ලෙස චේතනාන්විතව හෝ නැතහොත් අසතුටුදායක අන්දමින් පුහුණුව ලත් තුවක්කුකරුවන් විසින් නොගැලපෙන හා බාල කාලතුවක්කු උණ්ඩ යොදා ගනිමින් එලටීටීඊයේ බාල කාලතුවක්කුවලින් එල්ල කරන ලද ප්‍රහාර හේතුවෙන් අහඹුව සිදු කරන ලද සිද්ධීන් බව ය.''

1221. ඔහු එහි ''කාලතුවක්කු රෙජිමේන්තු වෙඩි තැබීමේ දිනය/වෙලාව, ඉලක්ක ස්ථානය ආදියට අනුව නිවැරදි තොරතුරු ලබා දෙන ඉතා නිවැරදි ලොග් පොත් පවත්වා ගත්තේ ය. එසේම විමර්ශන හමුදා අධිකරණය හමුවේ ලැබුණ සාක්ෂි ප්‍රහාර ආරම්භ කිරීමට පෙර සිවිල් ජනයා නොසිටි බව සහතික කර ගැනීම සඳහා සියලුම ඉලක්ක නිරනි යානා (UAVs), ගුවන්

---

[1225] මානව හිමිකම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද 2013 ආණ්ඩුවේ වාර්තාවේ ශ්‍රී ලංකා හමුදාව නිදොස් කිරීමේ සොයා ගැනීම්වල කෙටි සාරාංශයක් ද ඇතුළත් කරනු ලැබ තිබුණි.

පූර්වේක්ෂ, දිග දුර පූර්වේක්ෂ මුර සංචාර, මානව බුද්ධි තොරතුරු ආදිය මගින් සම්පූර්ණ වශයෙන් සත්‍යාපනය කර ගනු ලැබූ බව හෙළි කර තිබේ.'' යයි සඳහන් කළේ ය.

1222. ''කාලතුවක්කු හා පාබල සේනාංක ආඥාපතීන්ගේ සාක්ෂිවලින් ඔවුන් එවැනි සටන් මුක්ත කලාපවල යාබද ප්‍රදේශවල සිට එල්ටීටීඊය විසින් දැඩි කාලතුවක්කු ප්‍රහාර එල්ල කරමින් සිටියදීත් සටන් මුක්ත කලාපවලට ප්‍රහාර එල්ල නොකළ බවත් ඇතැම් අවස්ථාවල මෙම තමන්ම පනවා ගත් තාවකාලික තහනම විශාල හමුදා මරණවලට හේතු වූ බවත් පැහැදිලි ය.'' යයි කියන වාර්තාව තවදුරටත් මෙසේ ද කියයි. ''මානුෂික මෙහෙයුමේ සෑම අදියරක දී ම ශ්‍රී ලංකා හමුදාව සිවිල් ජනයාගේ මරණ වැළැක්වීමට ඉතා පැහැදිලි පියවර ගනිමින් ඉතා වෘත්තීයමය ආකාරයකින් ක්‍රියාකර තිබුණි. එසේම ශ්‍රී ලංකා හමුදාව අතට පත් අත් අඩංගුවටගත්/යටත්වූ එල්ටීටීඊ කාඩර්වරුන් ඇතුළු සියලු පුද්ගලයින්ට ජාත්‍යන්තර සම්මුති මගින් පනවා තිබෙන පරිදි මනාව සලකනු ලැබ තිබුණි.''

1223. ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ විශ්වසනීය විමර්ශනයකට අවශ්‍ය කරන ස්වාධීනත්වයේ හා අපක්ෂපාතීභාවයේ අවම ප්‍රමිතීන්වත් සපුරා නොමැති බව පෙනෙන හෙයින් විමර්ශන හමුදා අධිකරණයේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීභාවය කම්ටුව ප්‍රශ්න කරයි. ඒ වෙනුවට එය කියනු ලබන දරුණු මානව හිමිකම් උල්ලංඝනයන්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ බරපතල උල්ලංඝනයන් හා මෙම වාර්තාවේ ප්‍රලේඛනය කර ඇති ජාත්‍යන්තර අපරාධ ආවරණය කිරීමට හා වැරද්ද එල්ටීටීඊය වෙතට මාරු කිරීමට ශ්‍රී ලංකාවේ හමුදාවන් විසින් දරන ප්‍රයත්නයේ කොටසක්ව තිබෙන බව පෙනී යයි.

**අධිකරණ නීති කෘත්‍යයන්**[1226]

1224. 2000 දෙසැම්බර්වල යාපනය අසල මිරුසුවිල්හි දී සිදු කරන ලද පස් වියැති පිරිමි ළමයෙකු ඇතුළු අභ්‍යන්තර අවතැන් වූවන් නව දෙනෙකුගේ සමූහ ඝාතනයක් සම්බන්ධයෙන් 2015 ජූලිවල දී කොළඹ මහාධිකරණය[1227] හමුදා සැරයන්වරයෙකුට මරණ දණ්ඩනය නියම කළේ ය. චූදිත අනෙක් හතර දෙනා නිදහස් කෙරිණ. එය බරපතල මානව හිමිකම් උල්ලංඝනයක් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා සාමාජිකයෙකු වරදකරුවෙකු කරන ලද විරල සිද්ධියක් වූ අතර උසාවිවලට එවැනි විමර්ශන කිරීමට හැකි බව පෙන්නුම් කළේ ය.

1225. දෙවන සිද්ධියක දී 2015 අගෝස්තුවල ආරක්ෂක හමුදාවලට සම්බන්ධ පුද්ගලයින් හතර දෙනෙකු (ශ්‍රී ලංකා හමුදාවේ සැරයන්වරයෙකු හා කරුණා කණ්ඩායමේ කොටසක් විය හැකි යයි සිතන හිටපු එල්ටීටීඊ කාඩර්වරුන් දෙදෙනෙකු) ප්‍රගීත් එක්නැලිගොඩගේ අතුරුදහන්වීමට සම්බන්ධව අත්අඩංගුවට ගනු ලැබිණ. විධානයන් යටතේ වූවන් හෝ ඉහළ වගකීම ඇත්තන්

---

1226 අධිකරණ විමර්ශන පිළිබඳ වැඩි දුර විශ්ලේෂණය සඳහා බලන්නඃ යුක්තිය පසු බසීඃ ශ්‍රී ලංකාවේ නීති වෘත්තියේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍යය පිළිබඳ වාර්තාවක් යන ජාත්‍යන්තර අධිකරණ (ICJ) වාර්තාව; ජාත්‍යන්තර නීතිඥ සංගමයේ මානව හිමිකම් ආයතනය, 2009 මැයි; එසේම වගවීමෙන් තොර අධිකාරයඃ ශ්‍රී ලංකාවේ දණ්ඩන මුක්තිය පිළිබඳ අභියෝගය, ICJ, 2012 නොවැම්බර්; රැවටීමේ වසර දොළහක්ඃ ශ්‍රී ලංකාවේ විමර්ශන කොමිෂන්, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, 2009 ජූනි

1227 ශ්‍රී ලංකා නීතිකරණය යටතේ අග විනිසුරුවරයාට වරදේ ස්වභාවය නිසා යුක්තියේ යහපත සඳහා එය අවශ්‍ය කරන්නේ යයි ඔහු විශ්වාස කරන විට නඩුවක් මහාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙකුගෙන් යුත් ජූරියකින් තොර විශේෂ අධිකරණයකින් විභාග කරන්නට නියම කළ හැකි ය.

ඇතුළු එම අපරාධ සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන යුක්තිය හමුවට ගෙන එනු ලැබීම සහතික කරනු පිණිස මෙම සිද්ධි සම්බන්ධ කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම අවශ්‍ය ය.

1226. මේවා කලින් ගැටුම් කාල පරිච්ඡේදවල සිට එන, අන් බොහොමයක සංකේතමය ඒවා වන, පුරුද්දක් වශයෙන් කල් දමන හා උසාවියකින් උසාවියකට හෝ විනිසකරුවකුගෙන් විනිසකරුවකුට මාරු කරන අධිකරණ පද්ධතිය තුළ කාලය කමින් අඛණ්ඩව පවත්වාගෙන යන ඒවා වේ: ඉහත සමූහ ඝාතන සිද්ධියේ දී එය වසර 15 කි. එක්නැලිගොඩගේ සිද්ධියේ දී වසර පහකි. වත්මන් වාර්තාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාව හිංසනය පිළිබඳ පරිච්ඡේදයෙහි විස්තර කරනු ලබන තවත් සිද්ධියක දී එම සිද්ධිය වී වසර පහකට පසුත් නඩුව විභාගයට ගැනීමට තවමත් බලා සිටී.

1227. විමර්ශන කමිටුවේ දැනීමට අනුව මෙම වාර්තාවේ සඳහන් උල්ලංඝනයන් හා අපයෝජනය පිළිබඳ බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් අධිකරණය මගින් වරදකරුවන්ට දඬුවම් ලබා දී නැත. නිදසුන් ලෙස ඝාතන සිද්ධීන් සම්බන්ධයෙන් ගත් කල මුලින්ම ඒවා පොලීසිය විසින් යොමු කරන්නේ මහේස්ත්‍රාත් අධිකරණයට ය. එහි දී ලඝු නොවන නඩු විභාග ආරම්භ කරනු ලැබේ. මේවායේ අවසානයේ දී මහේස්ත්‍රාත්වරයා නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සාක්ෂි තිබේ යයි සලකන්නේ නම් නඩුව මහාධිකරණයේ විභාග කිරීම සඳහා අධිචෝදනා සකස් කිරීමට නීතිපතිවරයා වෙත යවනු ලැබේ.

1228. එවැනි නඩු මහේස්ත්‍රාත් අධිකරණ මට්ටමේ දී නඩුවක් ආරම්භ කිරීමේ මූලික අදියරයන්ගෙන් හා අපරාධ ස්ථානයක් බලන්නට යාමක්, ඇතැම්විට සාක්ෂි සටහන් කර ගැනීම වැනි සීමිත පොලිස් විමර්ශනවලින් ඔබ්බට යන්නේ කලාතුරකිනි. එසේම මෙම මුල් අදියරයන්හි දී පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම හා වධ හිංසාව හා අනෙකුත් මරණීය නොවන සිද්ධීන් ඇතුළුව අධිකරණ වෛද්‍ය සාක්ෂි ඇගයීම ඇතුළුව අධිකරණ වෛද්‍ය නිලධාරීන් ද මැදිහත් විය හැකි ය. සාක්ෂිකරුවන් පැවසුවේ මහේස්ත්‍රාත්වරුන් ආරක්ෂක හමුදාවන් සම්බන්ධ අපරාධ විමර්ශනය කිරීමට මෙම පියවරවලින් ඔබ්බට යාමට පසුබාන බවත් වැඩිදුරටත් නඩු විභාග කරන්නේ කලාතුරකින් බවත් ය. මුල දී සිද්ධි කිහිපයක දී ආරක්ෂක හමුදා සමාජිකයින් අත්අඩංගුවට ගනු ලැබුවා විය හැකි වුවත් නීතිවිරෝධී ඝාතන පිළිබඳ පරිච්ඡේදයෙහි පෙන්වා දී ඇති පරිදි බොහෝ දෙනෙකු දඬුවම් කිරීමෙන් තොරව නිදහස්කර තිබේ.

1229. එසේම රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ මානව හිමිකම් හා සම්බන්ධ නඩු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට උත්සාහ කරන අධිකරණ හා වෙනත් වෘත්තිකයින්ට එරෙහි පලිගැනීම් එවැනි නඩු ඉදිරියට ගෙන යාමට ඇති බාධාවකි. බ්‍රවුන් පූජකවරයාගේ අතුරුදහන් වූ සිද්ධිය හා වෙනත් සිද්ධීන් විමර්ශනය කිරීමට උත්සාහ කළ මහේස්ත්‍රාත්වරයාගේ සිද්ධිය හා සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වයේ (ACF) සේවකයන් පස් දෙනා ඝාතනය කළ සිද්ධිය විමර්ශනය කළ මහේස්ත්‍රාත්වරයාට තර්ජනය එල්ල කළ සිද්ධිය මෙම රටාව චිත්‍රනය කර දක්වයි.

1230. 1990 ගණන්වල  කලාපීය කොමිෂන් තුන හා සමස්ත ලංකා කොමිසම මගින් හඳුනා ගන්නා ලද කියනු ලැබූ වරදකරුවන් පිළිබඳ නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව තුළ විශේෂයෙන් නිර්මාණය කරන ලද අතුරුදහන් වීම් විමර්ශනය කිරීමේ ඒකකයට හා නැතිවූ පුද්ගලයින් පිළිබඳ ඒකකයට යවා තිබුණ බොහෝ නඩු විභාග කිරීමට උසාවිවල අසමත් වීම බලහත්කාර අතුරුදහන් කිරීම පිළිබඳ පරිච්ඡේදයේ පෙන්නුම් කර තිබේ. හඳුනාගෙන තිබූ බාධකයන්ගෙන් එකක් වූයේ තම සගයින්ට, විශේෂයෙන් සිද්ධීන්වලට සම්බන්ධ විය හැකිව තිබුණු ජ්‍යෙෂ්ඨ පොලිස් හා හමුදා නිලධාරීන්ට එරෙහිව විමර්ශන දිගටම කර ගෙන යාමට විමර්ශනවලට සම්බන්ධ පොලිස් නිලධාරීන් පසුබට වූවා ය යන කරුණයි.

1231. ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කරන ලද විට පවා එක්කෝ නඩු ඇසීමේ නැතහොත් තීන්දු ප්‍රකාශයට පත් කිරීමේ එසේ නැතහොත් දෙකේම නැවත නැවත ඇති වූ ප්‍රමාදයන්ගේ තේරුම එම සිද්ධිවලට සම්බන්ධ ආණ්ඩුවේ හෝ ආරක්ෂක හමුදාවන්ගේ පුද්ගලයින් සම්බිධයෙන් පියවර ගෙන තිබුණේ කලාතුරකින් බව ය. කලින් දක්වා ඇති පරිදි 2009 ජූනිවල අභ්‍යන්තර අවතැන් වූවන් රඳවා සිටීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම සම්බන්ධ තීන්දුව  කිසි දවසක දී නොමැත.

1232. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ශ්‍රී ලංකාවට අදාළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර අවුරුදු හයකට පසු 2006 දී ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන් වධ හිංසනය පැමිණවීමේ සිද්ධිය ඇතුළු පුද්ගල පැමිණිලි පිළිබඳ තීරණ ගණනාවක් නිකුත් කර තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කියනු ලබන වගකීම සම්බන්ධයෙන් පොලිස් කණ්ඩායමක් නම් කරනු ලැබුව ද ඔහුගේ සම්බන්ධය පිළිබඳ බරපතල සාක්ෂි තිබියදීත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු නිදොස් කොට නිදහස් කළේ ය. අධි චෝදනා සකස්කර තිබුණි යයි ආණ්ඩුවේ සහතිකයන් තිබියදීත් අවුරුදු දෙකකට පසුත් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙහි නීති විරෝධී රඳවා ගැනීමේ හා වධ හිංසනයට පැමිණවීමේ අපරාධවලට සම්බන්ධ යයි නම් කරන කරණ ලද පොලිස් කණ්ඩායමට එරෙහිව තවමත් අධිචෝදනා භාර දී නැත.[1228]

1233. සැකකරුවන් ආරක්ෂක හමුදාවන්ට අයත්වන විට අධිකරණ වගවීම ඉටු කිරීමෙහිලා වන අභියෝග උග්‍ර වනු පෙනේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම අධිකරණය හා පොලිස් විමර්ශන දේශපාලනීහරණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළේ ය. කමිටුව විසින් ප්‍රලේඛනය කරන ලද සිද්ධි ගණනාවක දී ම ආරක්ෂක හමුදා සාමාජිකයෝ විමර්ශනවලට බාධා කිරීම හා/හෝ මැදිහත් වීම කළහ. ආරක්ෂක හමුදා වින්දිතයින් ත්‍රස්තවාදීන් බවට පිළි ගනිමින් ලියවිලිවලට අත්සන් කරන්නට ඥාතීන්ට බලකිරීමට හෝ  පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් වගකිව යුතු අධිකරණ වෛද්‍යවරුන් වෙනත් වෛද්‍යවරුන් ආදේශනය කිරීමට අධිකාරීන්ට බලපෑම් කිරීමට උත්සාහ කර තිබේ (පහතින් සැකෙවින් දක්වා ඇති ත්‍රිකුණාමලේ පස් දෙනාගේ සිද්ධිය බලන්න).

[1228] CCPR/C/95/D/1432/2005 : Communication 1432/2005 ; 2009 අප්‍රේල් 23 : (එසේම උසාවි හරහා යුක්තිය සොයා යාමේ දී පුද්ගල පැමිණිලිකරුවෙකු විසින් මුහුණ දෙන ලද බාධක පිළිබඳ සවිස්තර විස්තරයක් සඳහා Communication 1862/2009 බලන්න

1234. විධායකයේ මැදිහත් වීම් මගින් නීති විරෝධී ඝාතන හා බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සිද්ධීන් සම්බන්ධ විමර්ශනවලට බාධා පමුණුවා ඇති අතර එමගින් විමර්ශන වෙනත් අධිකරණ බල සීමාවන්ට හෝ විනිශ්චයකරුවන්ට අදේශ කර තිබේ. ආරක්ෂක හමුදාවන්ට පැවරෙන වගකීමෙන් ඒවා බැහැර කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසිද්ධ ප්‍රකාශන නිකුත් කිරීමේ භාවිතය මගින් අපක්ෂපාතී අපරාධ විමර්ශන වැළක්වීමට උත්සාහ කර තිබේ.[1229]

1235. 2006 ජූලි සිට 2009 මැයි දක්වා මානුෂීය මෙහෙයුමේ පරිසිද්ධිමය විශ්ලේෂණය[1230] යන එහි වාර්තාවෙහි ආරක්ෂක අමාත්‍යාංශය 2005 හා 2010 අතර ශ්‍රී ලංකා හමුදාව විසින් කරන ලද ඝාතන සිද්ධි අටක් අධිකරණය හමුවට ගෙනවිත් තිබේ යයි කියා සිටියේ ය. සිද්ධිවල විස්තර එහි සපයා නොතිබුණි. කෙසේ වුව ද නඩු තුනක දී අධිකරණය මගින් නිදහස් කිරීම් තුනක් වාර්තා වී තිබෙන අතර අනෙක් ඒවා එය ප්‍රකාශයට පත් කරන විට තීන්දුව දීමට නියමිතව තිබිණ. හමුදාව සම්බන්ධයෙන් ගත් කල වාර්තාව එක් අයෙකු නිදහස් කළ බව, අයෙකු ''වෙනත් දඬුමකට''භාජනය කළ බව හා විමර්ශන අධිකරණයක් නඩු හයක සාක්ෂි සටහන් කර ගනිමින් තිබුණ බව සඳහන් කළේ ය. වාර්තාවට අනුව 2005 හා 2007 අතර සිද්ධි අටෙන් හයක් සිදුව ඇත්තේ අවුරුදු ගණනාවකට පෙර ය. 2014 සැප්තැම්බරයේ දී ආණ්ඩුව විසින් මානව හිමිකම් කමිටුවට සපයන ලද තොරතුරු ද ඒ හා සමානවම නොපැහැදිලි අතර ඝාතනයක් සම්බන්ධයෙන් සාර්ථක අන්දමින් වරදකරු කරන ලද එක නඩුවක් ගැන පමණක් සඳහන් කරයි.[1231]

1236. විමර්ශන කමිටුව විමර්ශන කොමිෂන් සභාවලට ඉදිරිපත් කරන ලද බෙහෝ රහස් පොලිස් වාර්තා හා දෙන ලද පොලිස් සාක්ෂි විමර්ශනය කර තිබෙන අතර ඒවායේ අඩංගුවන පොලිස් වාර්තාවල හා ප්‍රධාන සිද්ධි ගණනාවක් තුළ ආරක්ෂක හමුදා විසින් ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශවල සිද්ධීන් පිළිබඳ ගැලපීමක් නැති හා විශ්වාස කළ නොහැකි තොරතුරු සටහන් කර ගෙන තිබේ. අපරාධ සිදුවීම් නිසි ලෙස ලේඛනගත කර ගැනීමෙහි හා සාක්ෂි සටහන් කර ගැනීමෙහිලා පොලීසියේ අසමත්කම අපරාධ විමර්ශන තවදුරටත් යටින් බිඳ දමා තිබේ. විමර්ශන කමිටුව ඉතා වැදගත් සාක්ෂි නැතිවී තිබීමේ හෝ වෙනස් කර තිබීමේ සිද්ධි ප්‍රලේඛනය කර තිබේ. සමහර සිද්ධිවල ප්‍රධාන සාක්ෂි ලබා ගැනීමට උත්සාහ කර නැත. නිදසුන් ලෙස උණ්ඩ හා කොපු එකතු කර නැත. දුර කතන කතා වර්තා ඉල්ලා නැත. විමර්ශන කමිටුව විමර්ශනය කර තිබෙන ප්‍රකාශයට පත් නොකළ 2009 උදලාගම කොමිෂන් වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ''ප්‍රාදේශීය පොලීසිය මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද විසින් පවත්වන ලද විමර්ශන අසම්පූර්ණ හා උඩින් පල්ලෙන් කරන ලද.... ඒවා ය. පොලීසිය මූලික විමර්ශන කර තිබෙන ආකාරය වෘත්තීය භාවයෙන් අඩු ය.''[1232]

1229 නිදසුනක් සඳහා ඇක්ෂොන් කොන්ට් ලේ ෆම් (ACF), ඔවුන්ගේ දේශීය ආධාර සේවකයින් 17 දෙනාගේ මරණයේ දී ඔවුන්ගේ භූමිකාව, 2014 ජූනි, ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරන ලද විශේෂඥයින්ගේ කණ්ඩායම

1230 මානුෂීය මෙහෙයුම පරිසිද්ධිමය විශ්ලේෂණය, ආරක්ෂක අමාත්‍යාංශය, එයම 78 පිටුව

1231 SP Reply to the CCPR LOIs Qs 9 and 11, September 2014.

1232 2005 අගෝස්තු 1 සිට 2009 මැයි දක්වා සිදු කෙරුණ බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ විමර්ශනය හා විභාග කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව

**සිසුන් පස් දෙනාගේ නීති විරෝධී ඝාතනය (ත්‍රිකුණාමලයේ පස් දෙනා)ඃ දණ්ඩන මුක්තිය පිළිබඳ නිදර්ශනයකි**

1237. නීති විරෝධී ඝාතන පිළිබඳ පරිච්ඡේදයේ විස්තර කර තිබෙන 2006 ජනවාරියේ ත්‍රිකුණාමලේ පස් දෙනාගේ සිද්ධිය එවැනි නඩු නීර්ණය කිරීමේ දී අපරාධ යුක්ති ක්‍රමයේ ක්‍රමානුකූල අසමත්කම මතුකර පෙන්වයි. අපරාධ ස්ථානය ආරක්ෂා කර ගැනීමේ හා අදාළ සාක්ෂි එක්රැස් කර ගැනීමේ අසමත්කම මූලික අසමත්කමක් විය. ආරක්ෂක හමුදා සාමාජිකයෝ ගණනාවක්ම පසුව ප්‍රකාශ දීමේ දී සිද්ධිය දුටු බව හෝ කිසිදු වෙඩි හඬක් ඇසුණු බව ප්‍රතික්ෂේප කළෝ ය. ආරක්ෂක හමුදා විසින් භාවිතා කළ ගිනි අවි වහාම අත්අඩංගුවට ගෙන අධිකරණ වෛද්‍ය විමර්ශනයට භාජනය කළේ නැත. සිද්ධිය වූ දිනයේ රාත්‍රියේ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් ආරක්ෂක හමුදා අත් බෝම්බ ප්‍රහාරයක දී ත්‍රස්තවාදීන් පස් දෙනෙකු මරුමුවට පත් වූ බව කියා සිටියේ ය. තත්කාල පොලිස් වාර්තාවකට අනුව සිද්ධිය වූ ස්ථානයේ සිටි මළ සිරුරු රෝහලට ගෙන එන ලද පොලිස් නිලධාරියෙකු වින්දිතයින්ගේ සිරුරුවල වූ තුවාල අත් බෝම්බ පිපිරීම් හේතු කොට ගෙන සිදු වූ ඒවා බව ප්‍රකාශ කර තිබුණි. මෙය සිසුන් පස්දෙනා මිය ගොස් ඇත්තේ වෙඩි තැබීම්වලින් සිදුවූ බහුවිධ තුවාල හේතු කොට ගෙන බව හා ඔවුන්ගෙන් තුන් දෙනෙකට සමීප දුරක සිට හිසට වෙඩි තැබීමෙන් විශාල පිටවුම් තුවාල තුනක් තිබෙන බව ඉතා පැහැදිලිව කියන  විමර්ශන කමිටුව විසින් ද අධ්‍යයනය කර ඇති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවලට සම්පූර්ණයෙන්ම පටහැනි බව පෙන්නුම් කරයි. පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් වගකියන අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා (JMO) මාරු කිරීමට ද අසාර්ථක උත්සාහයක් දරා තිබිණ.

1238. පොලීසිය විසින් රෝහලේ දී ඥාතීන් බිය ගන්වනු ලැබ තිබිණ. මළ සිරුරු මුදා හැරිය හැක්කේ මියගියවුන් එල්ටීටීඊ යයි සඳහන් කරමින් ලියවිල්ලකට අත්සන් කළහොත් පමණක් යයි ඔවුන්ට කී බව ඔවුහු කියා සිටියහ. සියලුම ඥාතීන් එවැනි ලියවිල්ලකට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. සිද්ධිවලින් ටික වෙලාවකට පසු මරා දමන ලද සිසුන්ගේ පවුල්වලට ලිඛිත තර්ජන ඇතුළු තර්ජන එල්ල වීමට පටන් ගෙන ඇත. ඔවුන්ගේ ගෙවල්වලට ගල් ගසා තිබුණි. රාත්‍රි කාලයේ ඔවුන්ගේ ගෙවල්වල විදුලිය කපනු ලැබිණ. මුර පොළවල්වල දී හා ප්‍රසිද්ධ ස්ථානවල දී ආරක්ෂක හමුදා විසින් ඔවුන්ට හිරිහැර කර තිබුණි. මරණ පරීක්ෂණයේ දී සාක්ෂි දෙන ලද්දේ ඇතැම් ඥාතීන් පමණි.  නිහඬව සිටීම ප්‍රතික්ෂේප කළ එක් පවුල් සාමාජිකයෙකුට කතා කළ ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු සිද්ධිය පිළිබඳව  කතා කිරීම නැවත්වුවහොත් ඔහුට මුදල් ත්‍යාගයක් දෙන බව පවසා ඇත. මිය ගිය ළමුන්ගේ පවුල්වලට අන් තැන්වල පදිංචිවීමට බල කෙරුණ අතර අවසානයේ රට හැර ගියහ. විමර්ශන කොමිෂන් සභාව හා විශිෂ්ට පුද්ගලයින්ගේ කණ්ඩායම විදේශවල සිටින ප්‍රධාන සාක්ෂිකරුවන් සමග වීඩියෝ සාක්ෂි විමසීමට කටයුතු සූදානම් කරනු ලැබිණ. කෙසේ වුව ද විශේෂ පුද්ගලයින්ගේ අවසාන වාර්තාවට අනුව සාක්ෂි කිහිපයක් ගැනීමෙන් පසු ජනාධිපතිවරයා වෙනුවෙන් ක්‍රියාකරමින් ජනාධිපති ලේකම්කාර්යාලය මැදිහත් වී නීතිපතිවරයගෙන් උපදෙස් ලබා ගෙන ඔවුන් දෙන ලද සාක්ෂි ඉවත් කර තිබේ.

1239. 2006 දී විශේෂ කාර්ය බලකා සෙබළුන් 13 දෙනෙකු අත් අඩංගුවට ගැනුණ ද කෙටි කලකින් නිදහස් කෙරිණ. 2013 ජූලිවල ඔවුන් නැවත අත්අඩංගුවට ගත් නමුදු 2013 ඔක්තෝබර්වල දී යළිත් (නැවත) නිදහස් කිරීමට පමණි. ඒ කාලයේ විශේෂ කාර්ය බලකායේ ආඥාපති අපරාධ ස්ථානයේ සිටි බව හඳුනා ගනු ලැබිණ. කෙසේ වුව ද අත්අඩංගුවට ගත් විශේෂ කාර්ය බලකා නිලධාරීන් අතර ඔහු නොවීය. ඒ වෙනුවට ඔහු දිගටම ප්‍රදේශයේ රැඳී සිටි අතර උසස් වීමක් ද ලබා දුනි. 2014 දී ආණ්ඩුව විදේශවල සාක්ෂිකරුවන් හඳුනා ගැනීම පිණිස නඩු විභාගය අත්හිටුවා තිබූ බව කියා සිටියේ ය.

1240. එසේම ත්‍රිකුණාමලයේ පස් දෙනාගේ සිද්ධිය ද උදලාගම කොමිසම විසින් විමර්ශනය කරන ලද අතර විශිෂ්ට පුද්ගලයින්ගේ කණ්ඩායම විසින් නිරීක්ෂණය කෙරිණ. 'අපරාධය කිරීමේ දී නිල ඇඳුම් ඇඳගත් පුද්ගලයන්ගේ මැදිහත්වීම අනුමාන කරන්නට බලගතු පදනම් තිබේ' යයි උදලාගම කොමිෂන් වාර්තාව සඳහන් කරයි. 2011 දී උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ද පූර්ව කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කරන්නට විශේෂයෙන් ත්‍රිකුණාමලයේ පස් දෙනාගේ සිද්ධිය විමර්ශනය කර වරදකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතු බවට ඉල්ලා සිටියේ ය (9.120).

**ශ්‍රී ලංකාවේ යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධවලට එරෙහිව නීතිමය පියවර ගැනීම**

1241. මානව අයිතීන් ආරක්ෂා කරමින් හා ප්‍රවර්ධනය කරමින් රට පෙරට ගෙන යාම පිණිස දැඩි මානව හිමිකම් උල්ලංඝනයන්, ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ හා අපරාධ නීතියේ බරපතල උල්ලංඝනයන් විශේෂයෙන්ම පශ්චාත් ගැටුම් තත්ත්වයන් තුළ නීතිය හමුවට ගෙන එන්නේ කෙසේ ද යන්න පිළිබඳ තීරණ වින්දිතයින්ට සත්‍යයට, යුක්තියට හා හානි පූරණයන්ට ඇති අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා තීරණාත්මක වන අතර එය සමගි සන්ධානය හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇති කිරීමේ ප්‍රයත්නයන් සමග එකක් පසු පස එකක් වශයෙන් කර ගෙන යාම අවශ්‍ය ය.

1242. අපරාධවල නිශ්චිත ස්වභාවය හා විශාලත්වය මගින් විමර්ශන කරගෙන යාම හා වගකිව යුත්තන් නීතිය හමුවට ගෙන ඒම කෙරෙහි බොහෝ අභියෝග එල්ල වෙයි. පළමුවැන්න නීතිමය යෝග්‍යතාවන්ට අදාළවෙයි: ජාත්‍යන්තර අපරාධ ගණයට වැටෙන අපරාධ හුදෙක් සාමාන්‍ය අපරාධ පරිද්දෙන් නොව දණ්ඩන මුක්තියට එරෙහිව සටන් කිරීමේ, පිළියමකට හා හානිපූරණයන්ට වින්දිතයින්ට ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීමේ හා නැවත ඇති නොවීම සහතික කිරීමේ අරමුණු ප්‍රමාණවත්ව සපුරා ගැනීම පිණිස වන පරිදි නීතිය හමුවට පැමිණ විය යුතු ය. ''සාමාන්‍ය දණ්ඩ නීති වරදවල් පරිද්දෙන් ජාත්‍යන්තර අපරාධ නීතිය හමුවට ගෙන ඒම ජාත්‍යන්තර අපරාධ පිළිබඳ අර්ථනිරූපණයන් තුළ අවශ්‍යයෙන්ම පවතින පුළුල්ව පැතුරුණු,

ක්‍රමානුකූල හා ව්‍යුහාත්මක මූලයන් නොසලකා හරින'' බව ශ්‍රී ලාංකීය නීතිවේදීන් සඳහන් කර තිබේ.[1233]

1243. ඇතැම් ජාත්‍යන්තර අපරාධ දැනටමත් ශ්‍රී ලංකා නීතිකරණයට අන්තර්ගත කර තිබේ. නිදසුන් ලෙස 1994 වධ හිංසනයට එරෙහි සම්මුති පනත[1234] මගින් දේශීය නීතිකරණය තුළට වධ හිංසනයට එරෙහි සම්මුතිය ඒකාබද්ධ කර තිබේ. එපරිද්දෙන්ම 2006 දී එදිරිවාදිකම්වල දී ළමුන් බඳවා ගැනීම හා ඔවුන් යොදවා ගැනීම අපරාධකෘත කර තිබේ. කෙසේ වුව ද අනෙක් ජාත්‍යන්තර අපරාධ විශෙෂයෙන් යුද අපරාධ, මානව වර්ගයාට එරෙහි අපරාධ හා බලහත්කාර අතුරුදහන් කිරීමේ අපරාධ දේශීය නීතිය යටතේ තවමත් අර්ථ නිරූපණය කළ යුතුව තිබේ. ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් වගවීම ප්‍රවර්ධනය කිරීමට ගැලපෙන නීතිමය රාමුවක් වගකීම් මාදිලි මාලාවක් විශේෂයෙන් විධාන නැතහොත් ඉහළම වගකීම ඇතුළත් කර ගත යුතු ය. විමර්ශන සම්බන්ධයෙන් ගත් කල මහා පරිමාණ අපරාධ සඳහා වන කාර්ය සාධනීය නීති කෘත්‍ය ක්‍රමෝපායන් පහළ ශ්‍රේණිවල හෝ පහළ වගකීමක් ඇත්තවුන්ට වඩා අපරාධ සැලසුම්කරන්නන් හා සංවිධායකයන් මත කේන්ද්‍රගත කළ යුතු ය. ජාත්‍යන්තර අපරාධ යනු සාමාන්‍යයෙන් ගත් කල වරදවල් කිරීමට සංවිධානමය මට්ටමක් අවශ්‍ය කරන පරිමාණයේ ඒවා වේ.

1244. මහා පරිමාණ අපරාධ සඳහා වන කාර්ය සාධනීය නීති කෘත්‍ය ක්‍රමෝපායන් පහළ ශ්‍රේණිවල හෝ පහළ වගකීමක් ඇත්තවුන්ට වඩා එම අපරාධවල ක්‍රමානුකූල ස්වභාවය හා ඒවායේ සැලසුම්කරුවන් හා සංවිධායකයින් ද විධිමත් හා අවිධිමත්/සෙවනැලි විධාන දාමය මත ද කේන්ද්‍රීය අවධානය යොමු කරයි. එවැනි විමර්ශනයන්ට අපරාධ පදනම ප්‍රතිනිර්මාණය කිරිම පමණක් නොව හමුදා හෝ අතුරු හමුදා සංවිධානවල හා ඒවායේ සංවිධාන ව්‍යුහයන් (විධිමත් හා අවිධිමත්); සිද්ධීන්ගේ පොදු සමාජ-ඓතිහාසික සන්දර්භය; දේශීය සන්දර්භය හා හිංසනයේ ගතිකයන්; මහජන හා වර්ගීකරණය කරන ලද සාක්ෂිවල සන්දර්භය හා ගතිකයන් විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය ය. ඒවා ඒවායේ සංඛ්‍යාතය, ස්ථානය හා ස්වභාවය මගින්, අපරාධ ක්‍රියාවට නගන්නවුන්ට ඔබ්බෙන් යම් මට්ටමක සැලසුම් කිරීම හා මධ්‍යගත පාලනයක් හඟවන හා බහුවිධ මට්ටම්වල දී පුද්ගල අපරාධ වගකීම නිර්ණය කිරීමෙහිලා තීරණාත්මක විය හැකි රටාවන් හඳුනා ගැනීමට උත්සාහ කරයි.

1245. සාමාන්‍ය අපරාධ සම්බන්ධයෙන් මනාව ගැලපිය හැකි ශ්‍රී ලංකාවේ වැනි සංකීර්ණ නීති පද්ධතීන්ට පවා ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් කාර්ය සාධනීය ලෙස ආමන්ත්‍රණය කිරීමේ ධාරිතාව අඩු විය හැකි ය. බොහෝ දේශීය විමර්ශකයින් අවශ්‍ය කරන විවිධ නිපුණතා හා විශ්ලේෂණ ක්‍රම යොදා ගැනීමෙහිලා පුහුණුව ලබා නැත. බොහෝ දේශීය උසාවි විකාශනය වී තිබෙන ජාත්‍යන්තර අපරාධ නීති මීමංසාවට හුරුපුරුදු නැත. එසේම ජාත්‍යන්තර නීතිය

---

1233 ''දෙමුහුන් අධිකරණයක්, ශ්‍රී ලංකාව උදෙසා අදහස්''- රධිනා ද අල්විස් හා නිරාන් ඇන්කටෙල්, නීති අධ්‍යයනය සඳහාවන දකුණු ආසියා කේන්ද්‍රය

1234 වධ හිංසනයට එරෙහි කමිටුව (CAT) එකඟත්වයට පැමිණ ඇති ජාත්‍යන්තර අර්ථ නිරූපණය සම්පූර්ණ වශයෙන් සපුරාලීමට පනතේ සලසා ඇති අර්ථ නිරූපණය සංශෝධනය කළ යුතු බව නිර්දේශ කර තිබේ. අර්ථ නිරූපණය සඳහන් කරන්නේ ''බරපතල වේදනාවක් ඇති කරන'' ඕනෑම ක්‍රියාවක් යනුවෙන් පමණි. ''පීඩාව'' යන වචනය ඉවත් කර ඇත. CAT/C/LKA/CO/3-4 2011 දෙසැම්බර් 8.

යටතේ අපරාධ සම්බන්ධ සංකීර්ණ නඩු සම්බන්ධව ක්‍රියා කිරීමේ අත්දැකීම නොමැති විය හැකි ය. මෙම අභියෝගය අපරාධ යුක්ති පසිඳලීමේ ක්‍රමය බලගතු දේශපාලන, ආරක්ෂක හා යුද රංගිකයින් විසින් අත පොවනු ලැබීමට හා බලපෑම් කරනු ලැබීමට පහසුවෙන් පාත්‍ර වීමේ හැකියාව තිබෙන දුර්වල, පශ්චාත්-සන්නද්ධ ගැටුම් පරිසරයක වඩාත් විශාල අභියෝගයක් වේ. අනෙක් රටවල ඉහළින්ම දේශපාලනීකරණය වූ වාතාවරණයක් තුළ සිදුවන නඩු විභාගවල දී පෙන්නුම් කර තිබෙන බාධකයන් පිළිබඳ ඉතාමත්ම පොදු පැමිණිල්ල වී තිබෙන්නේ ඒවා මෙහෙයවනු ලබනුයේ දේශපාලන ප්‍රතිෂ්ඨාවන්, පලි ගැනීම හෝ ජයග්‍රාහකයින්ගේ යුක්තිය මගින් ය යන්න ය. ඔවුන්ගේ ජනවාර්ගිකභාවය, දේශපාලන පක්ෂපාතීභාවය හෝ වෙනත් සම්බන්ධකම් කුමක් වුව ද වින්දිතයින්ට කරන ලද අපරාධ සම්බන්ධ වගවීම සැලස්වීමට උපකාරීවන ධනාත්මක, සියල්ල ඇතුළත් කරගන්නා වූ වාතාවරණයක් හා අපරාධ මගින් වැඩියත්ම විපතට පත් වින්දිතයින් පලදායී අන්දමින් ඇතුළත් කරගන්නා කාලරාමුවක් නිර්මාණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ වගකීම වන බව විමර්ශන කමිටුව විශ්වාස කරයි.

1246. මෙම තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාවේ වගවීම් යාන්ත්‍රණයක් සාර්ථක කර ගැනීම සඳහා දේශීය යාන්ත්‍රණයකට වැඩි යමක් අවශ්‍ය කෙරෙනු ඇතැයි කමිටුව විශ්වාස කරයි. ශ්‍රී ලංකාව විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දේශපාලනීකරණය වූ හා බෙහෙවින් ධ්‍රැවීකරණය වූ වාතාවරණයක ක්‍රියාවලියේ ස්වාධීනත්වය හා අපක්ෂපාතිත්වය තුළ සියලුම ශ්‍රී ලාංකිකයින්ට විශේෂයෙන් වින්දිතයින්ට විශ්වාසය ලබා දීම සඳහා අත්‍යවශ්‍යවනු ඇත්තා වූ ජාත්‍යන්තර විනිසකරුවන්, අභිචෝදකයින්, නීතිඥයින් හා විමර්ශකයින් අනුකලනය කරන දෙමුහුන් විශේෂ අධිකරණ සමගින් සාර්ථක වී තිබෙන අනෙක් රටවල උගත් පාඩම් හා යහ භාවිතයන් උකහා ගත යුතු ය.

1247. ශ්‍රී ලංකාව ඇතුළත වගවීම ආශ්‍රිත විවාදය විශාල වශයෙන් කේන්ද්‍රගත වී තිබෙන්නේ ගැටුම අවසානයේ සිදු කරන ලද අපරාධ විභාග කිරීම සම්බන්ධ අධිකරණ සභා වටේ ය. කෙසේ වුව ද මෙම වාර්තාව පෙන්වා තිබෙන පරිදි විශේෂයෙන්ම බොහොමයක් අපරාධවල සමස්තමය ව්‍යාප්ති ස්වභාවය නිසා කරන ලදුයි කියන අපරාධවල පරිමාණය හා කාලරාමුව ආමන්ත්‍රණය කළ යුතු වඩා පුළුල් කාල පරිච්ඡේදයක් පුරා පැතිරෙයි. නීති කෘත්‍යයන් හෝ අනෙකුත් සංක්‍රමණීය යුක්ති පසිඳලීමේ යන්ත්‍රණයන් කුඩා කාල පරිච්ඡේදයකට සීමා කිරීම, නිදසුන් ලෙස ගැටුමේ අවසානයට හෝ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ වරම විසින් ආවරණය කරන ලද කාල පරිච්ඡේදයට - රටාවන්, වරද කරන ලද්දවුන් හා අපයෝජනයට සම්බන්ධ ආයතන පිළිබඳ අසම්පූර්ණ චිත්‍රයක් ලබා දීමේ අනතුර ඇති කරයි. මෙලෙස එය දණ්ඩන මුක්තියේ රටාවන්ට විස්තීරණ ලෙස ආමන්ත්‍රණය කිරීමට අසමත් වනු ඇති අතර සමගි සන්ධානය කෙරෙහි නිශේධනීය ඇති කරන්නට පුළුවන.

1248. එහෙයින් වින්දිතයින්, වරද කරන ලද්දවුන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධ අපරාධවලට ආමන්ත්‍රණය කිරීම හා ගැඹුරු ක්‍රමානුකූල වෙනසකට මුලපිරීම මගින් දණ්ඩන මුක්ති හිඩැස පිරවීම සඳහා අත්‍යවශ්‍ය වන අපරාධ යුක්තිය සත්‍ය සෙවීම, හානි පූරණ වැඩසටහන් හා ආයතනික ප්‍රතිසංස්කරණ වැනි අනෙකුත් සංක්‍රමණීය යුක්ති පසිඳලීමේ ක්‍රියාවලීන් සමග ඒකාබද්ධ කිරීම අත්‍යවශ්‍ය ය.

**හානිපූර්ණ**

1249. හානිපූර්ණයන් පශ්චාත් ගැටුම් තත්ත්වයක වගවීමේ හා සුවපත් කිරීමේ ක්‍රියාවලියක සංක්‍රමණීය යුක්ති පැකේජවල අවියෝජනීය කොටසක් තනයි. ඒවාට පහතින් එන ඒවා අන්තර්ගත වෙයිඃ

1250. -*ප්‍රතිෂ්ඨාපනය* - ''ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ දැඩි උල්ලංඝනයන් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ බරපතල උල්ලංඝනයන් සිදුවීමට පෙර තත්ත්වයන්ට වින්දිතයින් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ'' පියවර, නිදසුන් ලෙස නිදහස, මානව හිමිකම් භුක්ති විඳීම, අනන්‍යතාව, පවුල් ජීවිතය හා පුරවැසිභාවය, අයෙකු වාසය කළ ස්ථානයට ආපසු පැමිණීම, රැකියාව ප්‍රතිෂ්ඨාපනය කිරීම හා දේපළ ආපසු දීම;

1251. -*වන්දි ගෙවීම*- ''ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ දැඩි උල්ලංඝනයන්ගේ හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ බරපතල උල්ලංඝනයන්ගේ ප්‍රතිඵල වශයෙන් ඇති වූ උල්ලංඝනයේ බරපතලකමට හා එක් එක් කාරණයේ තත්ත්වයන්ට සරිලන හා සමානුපාතික අහිමි වූ අවස්ථා, අහිමි වූ ඉපයුම් හා සදාචාරමය හානිය වැනි ආර්ථික වශයෙන් තක්සේරු කළ හැකි ඕනෑම හානියක් සඳහා;

1252. -*පුනරුත්ථාපනය*- වෛද්‍ය හා මනෝ විද්‍යාත්මක සහාය ඇතුළුව;

1253. මූලික වශයෙන් වන්දිගෙවීමේ ප්‍රශ්නයට ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආණ්ඩු විසින් අවුරුදු ගණනාවක් පුරා විවිධ තත් කාර්ය පියවර ගනු ලැබ තිබේ. එහෙයින් විපතට පත් සියලු ප්‍රජාවන්ගේ හා පුද්ගලයින්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන සම්පූර්ණ පරාසයක පියවර සංවර්ධනය කරනු ලැබීම හා ක්‍රියාත්මක කරනු ලැබීම සහතික කිරීම පිණිස හානිපූර්ණ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය කෙරේ.

1254. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම එහි අවසාන වාර්තාවෙහි ''නැවත පදිංචි කිරීම හා සමගි සන්ධානය පහසුකරණය කිරීමේ වන්දි සහනවල'' භූමිකාව සඳහන් කරන අතර ඒවා සඳහාවන පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරය (REPPIA) වැනි ආයතන ඒවාට වරම් දෙන ලද්දවුන්ගේ-''ත්‍රස්තවාදී හිංසනයේ හා ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවන්ගේ මෙහෙයුම්වල'' ප්‍රතිඵලයක් ලෙස අලාභ හෝ හානිවලින් පීඩාවට පත්වූවන්ගේ වන්දි අවශ්‍යතාවන්ට සම්පූර්ණ වශයෙන් ආමන්ත්‍රණය කිරීමට සමත් වී නොමැති බව කියා සිටී. 1990 ගණන්වල අග කලාපීය හා සමස්ත ලංකා කොමිෂන් සභා නිර්දේශවලින් පසු අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට යම් වන්දියක් ගෙවා ඇති නමුදු එම වන්දි ගෙවීම ක්‍රමානුකූලව කෙරී නැත. තව ද අතුරුදහන් වූවන්ගේ ඇතැම් ඥාතීන්ට ඇතැම් ආර්ථික ප්‍රතිලාභ හා නීතිමය ලියවිලි ලබා ගැනීම පිණිස මරණ සහතික ඉදිරිපත් කිරීමට බල කරනු ලැබ තිබුණි.

1255. ''සිය ජීවිත බරපතල් අන්දමින් අවුලට පත් කරන ලද ගැටුමේ බරට කර ගැසීමට සිදුව තිබුණේ ජනයා අතර ස්ත්‍රීන්, ළමුන් හා වයසක අය යන ප්‍රවර්ගයන්ට බවත් බොහෝ ස්ත්‍රීන්ට එක්කෝ සිය සැමියන් අහිමිව තිබුණ නැතහොත් ඔවුන් සිටින්නේ කොහේ ද යි දැන සිටියේ

නැති බවත් එවැනි මානසික පීඩාවක් හා දුෂ්කරතා තිබියදීත් ඔවුන් තරුණ ළමුන් හා වයස්ගත දෙමාපියන් සහිත සිය පවුල් අඛණ්ඩවම රැක බලාගත් බවත් ''පැහැදිලිව දක්නට තිබුණේ යයි උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම සිය වාර්තාවෙහි (9.85 ඡේදය) පිළිගෙන තිබේ.

1256. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ''ස්ත්‍රීන්ගේ විශේෂයෙන්ම බොහෝ විට තමන්ගේ කුටුම්බවල මූලිකයන් බවට පත්ව සිටින වැන්දඹුවන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලිය යුතු'' බව හා ''මෙම හදිසි අවශ්‍යතාවන්ට ඔවුන් හා ඔවුන්ගේ පවුල් වර්තමානයේ ජීවත්වන දුවැන්ත ආර්ථික දුෂ්කරතා හා දිළිඳුකම අඩු කළ හැකි වන සේ ඔවුන්ට ජීවන මාර්ග සැපයීමේ මාර්ගයක් වශයෙන් ආර්ථික ආධාර ද අනෙකුත් ආදායම් උපයන මාර්ග ද සැලසීම ඇතුළත් විය යුතු'' බව විශේෂයෙන් අවධාරණය කර තිබේ (9.86, 9.87 ඡේද).

1257. ඉඩම් ආපසු ලබා දීම හා නැවත පදිංචි කිරීම ගැටුමේ අවසානයෙන් පසු ඉතාමත් හදිසි, දුවෙන ප්‍රශ්නවලින් එකක් ලෙස උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් විසින් මතු කර දක්වන ලද තවත් ප්‍රශ්නයකි. විශේෂයෙන්ම උතුරු පළාතේ පෞද්ගලික හිමිකම් තිබූ ඉඩම් බොහොමයක හමුදාව පදිංචිව සිටී. එසේම 1990 සිට එල්ටීටීඊය විසින් උතුරු පළාතෙන් පලවා හැර දහස් ගණනින් අවතැන් කරන ලද මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ද ඉඩම් ආපසු ලබා දීම ද වැදගත් ප්‍රශ්නයකි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ''පැරණි හා අළුත්'' යන දෙපාර්ශවයටම ඉඩම් ආපසු ලබා දීම ජාතික ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීමේ ''ද්වි පාර්ශවීය අවබෝධයක්''ඉල්ලා සිටී. 2015 ජනවාරිවල සිට නව ආණ්ඩුව ඉඩම්වලින් සමහරක් ඒවායේ කලින් අයිතිකරුවන්ට ආපසු දීමේ ක්‍රියාවලියක් ආරම්භකර තිබුණ ද හමුදාවේ ඇතැම් අංශවලින් ඊට විරෝධයක් එල්ලවී ඇති බව වාර්තා වී තිබේ.

1258. ප්‍රධාන අවශ්‍යතාවක් වන තවත් ක්ෂේත්‍රයක් වන්නේ වින්දිතයින්ට වෛද්‍ය හා මනෝවිද්‍යාත්මක ආධාර සැපයීම යි. සත්‍යය, යුක්තිය, හානිපූර්ණය හා නැවත ඇති නොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු පැබ්ලෝ ඩි ග්‍රෙයිෆ් 2015 අප්‍රේල්වල ශ්‍රී ලංකාවේ ඔහුගේ පළමුවන සංචාරයෙන් පසුව ඉදිරිපත් කරන ලද ඔහුගේ නිරීක්ෂණවල දී ඉතාමත් හදිසි අවශ්‍යතාවන්ගෙන් එකක් වූයේ ශ්‍රී ලංකාවේ වින්දිතයින්ට මනෝවිද්‍යාත්මක ආධාර ලබා දීම යයි සඳහන් කළේ ය. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධිෂ්ඨාන සහගත හා හදිසි පියවරක් ගන්නැයි ඔහු ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. වාර්තාවෙහි විස්තර කරන ලද පරිදි ගැටුම අවසානයේ දී අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල රඳවා තබන ලද සිවිල් ජනයා විසින් විඳින ලද දුවැන්ත මානසික පීඩාව තිබියදීත් එකල ලබාදී තිබුණේ සුළු මනෝවිද්‍යාත්මක සහායකි. එල්ටීටීඊය විසින් වේවා නැතහොත් ආණ්ඩුවේ හමුදා විසින් වේවා ගැටුම සමයේ ක්‍රියාත්මක කරන ලද හිංසනයෙන් පීඩාවට පත් සියල්ලන්ට එවැනි සහාය ලබා ගැනීමේ අවස්ථා සැලසිය යුතු ය. එසේම කමිටු විමර්ශකයින් දක්වා තිබෙන්නේ ඔවුන් සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය කළ වින්දිතයින්ගෙන් හා දිවි ගලවාගත්වුන්ගෙන් සමහරකට එවැනි ආධාරයක් ලැබී නොතිබුණ බවත් එසේ වුව ද ඔවුන් පැහැදිලි ලෙසම තවමත් ඔවුන්ගේ අත්දැකීම්වලින් ගැඹුරු ලෙස පීඩා විඳිමින් සිටි බවත් ය.

1259. අවසාන වශයෙන්, සුවපත් කිරීමේ හා ප්‍රතිෂ්ඨාපනයේ ක්‍රියාවලියෙන් කොටසක් දෙපාර්ශවය විසින්ම කරන ලද වැරදි පිළිගනු ලැබීම අවශ්‍ය කෙරේ. 2015 පෙබරවාරිවල දී ආණ්ඩුව නිදහස් දිනය වෙනුවෙන් නිකුත් කරන ලද විශේෂ සාම ප්‍රතිඥාවක දී හා ඉදිරි අවුරුදුවල ''සිහි කිරීමේ දිනයක්'' පැවැත්වීමට යෝජනා කරමින් සියලු පාර්ශවවල පීඩාවන් පිළි ගැනීම කරා මූලික යාවත්කාල පියවරක් තබා තිබේ. එහෙත් හමුදාවේ කතන්දරය විශේෂයෙන් ඔවුන් සිවිල් ජනයා ආරක්ෂා කළේ ය හා ගැටුම් කලාපවලින් ගලවා ගත්තේය යන්න දිගින් දිගටම කියා සිටීම වෙනස් වීම අවශ්‍ය ය. ඒ අතරම ශ්‍රී ලංකාව තුළ දමිළ ප්‍රජාවන් හා සංවිධාන සහ විදේශගත දමිළ ප්‍රජාව යන දෙපාර්ශවයම එල්ටීටීඊය විසින් කරන ලද දුෂ්ට ක්‍රියාවන් පිළිගැනීම අවශ්‍ය ය. මෙම පිළිගැනීම්වලින් තොරව සමගි සන්ධානය දුෂ්කරවනු ඇත.

1260. අදාළ නෛතික මණ්ඩල යටතේ සලසා තිබෙන පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරු කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට වින්දිතයින් සඳහා පිළියම් සැපයීමේ කාර්යය ද ඇතුළත් වේ. මෙම බැඳීම්වලට පහතින් එන ඒවා ඇතුළත් වේ:

(අ) උල්ලංඝනයන් වැළැක්වීමට යෝග්‍ය ව්‍යවස්ථාමය හා පරිපාලනමය සහ අනෙකුත් යෝග්‍ය පියවර ගැනීම;

(ආ) උල්ලංඝනයන් කාර්ය සාධනීයව, අප්‍රමාදීව, සම්පූර්ණ වශයෙන් සහ අපක්ෂපාතීව විමර්ශනය කිරීම හා නිසි අවස්ථාවල කියනු ලබන වගකිව යුත්තන්ට එරෙහිව දේශීය හා ජාත්‍යන්තර නීතියට අනුකූලව පියවර ගැනීම;

(ඇ) මානව හිමිකම් හෝ මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීමක වින්දිතයින් යයි කියනු ලබන්නවුන්ට පහතින් දක්වා ඇති පරිදි උල්ලංඝනය සම්බන්ධව අවසානයේ වගකිව යුත්තා විය හැක්කේ කවරෙකු ද යන්න නොසලකා යුක්තිය වෙත සමාන හා කාර්ය සාධනීය ප්‍රවේශය සැලසීම; හා

(ඈ) වින්දිතයින්ට හානි පූර්ණය ඇතුළු කාර්ය සාධනීය පිළියම් සැලසීම[1235]

1261. මෙම පරිච්ඡේදය ඇතුළුව මෙම වාර්තාව මුළුල්ලෙහිම පොදු හුය වී තිබෙන්නේ මෙම බැඳීම් ඉටු කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ අනුයාත ආණ්ඩුවල අඛණ්ඩ අසමත්භාවයන් ය. ඉකුත් අවුරුදු දූක තිබෙන්නේ අතුරු හමුදා කණ්ඩායම් සමග එකතුව ආණ්ඩුවේ හමුදා විසින් ද එල්ටීටීඊය විසින් ද කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා අපයෝජනයන් පිළිබඳ චෝදනා විශ්වසනීය ලෙස විමර්ශනය කිරීමේ, සත්‍යය ස්ථාපිත කර ගැනීමේ, වගකිව යුත්තන් හඳුනා ගැනීමේ, වගවීම සහතික කිරීමේ හා වින්දිතයින්ට පිළියම් සහන සැපයීමේ දේශීය යාන්ත්‍රණයන්වල සම්පූර්ණ අසමත්භාවය යි. ඇතැම් තැන්වල සමහර පියවර ගෙන තිබෙන්නේ බොහෝ විට ඒ තැන්වල වින්දිතයින්ගේ ඉහළ තරාතිරම නිසා ය. වරදකරුවන් යයි කියනු ලැබූ එල්ටීටීඊ කාඩර්වරුන් වූ විට උසාවි හරහා යාමට බොහෝ ඉඩ තිබුණි. ආරක්ෂක හමුදාවලට

[1235] ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ දරුණු හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල උල්ලංඝනයන්ගේ වින්දිතයින් සඳහා පිළියමකට හා හානිපූරණයකට ඇති අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම හා මාර්ගෝපදේශ, මහා මණ්ඩල යෝජනාව 60/147

සම්බන්ධ වරදකරුවන් යයි කියන ලද්දන් අත්අඩංගුවට ගත් විට එක් අයෙකු හෝ වැඩි දෙනෙකු පවා හැම විටම පාහේ නිදහස් කරනු ලැබීමේ වාර්තාගත සිද්ධීන් කොපමණ සංඛ්‍යාවක් වූයේ ද යන්න සැලකිය යුත්තකි.

1262. 2015 ජනවාරි සිට නව ආණ්ඩුව සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන් බලාපොරොත්තු තැබිය හැකි පියවර ගණනාවක් ගෙන තිබුණි. එසේ වුව ද මේ පියවරයන්හි දී අවුරුදු බොහෝ ගණනක් තිස්සේ පැවතීගෙන ආ දණ්ඩන මුක්තිය පිළිබඳ පැලපදියම්ව පැවති උරුමය හා එවැනි සිද්ධීන්ට සම්බන්ධව ශ්‍රී ලංකා අධිකරණ පද්ධතිය පුරා සමස්ත වශයෙන් පැතිරී පැවති ප්‍රශ්න සම්බන්ධයෙන් බරපතල ලෙස විභාග කිරීම ද එසේම පුළුල් බලපෑමක් සහිත ආයතනික හා ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ ද අවශ්‍ය වේ. මෙම වාර්තාවේ ලේඛනගත කර තිබෙන අවුරුදු ගණනක් පුරා ස්ථාපනය කරන ලද බොහෝ යාන්ත්‍රණයන්ගේ අසාර්ථකත්වයන් පෙන්නුම් කරන්නේ ''සමස්ත සමාජයටම ඉදිරියට යාමට ඉඩ දෙනු පිණිස ඉකුත් උල්ලංඝනයන්ට පිළියම් යොදන'' දිගු කාලීන, විස්තීරණ ප්‍රතිපත්තියක් සැලසුම් කිරීමට නිර්භීත, දූර දර්ශී හා සහභාගිත්ව ප්‍රවේශයක් අවශ්‍ය කරන බව ය.[1236]

1263. 2014 මාර්තුවල එහි 25/1 යෝජනාවේ දී මානව හිමිකම් කවුන්සිලය ''අනෙක් ඒවා අතර පුද්ගල නීති කෘත්‍යයන්, හානිපූරණ, සත්‍ය ගවේෂණය, ආයතනික ප්‍රතිසංස්කරණ, රාජ්‍ය සේවකයින් හා නිලධාරීන් සියුම් පරීක්ෂාවට භාජනය කිරීම ඇතුළු අධිකරණමය හා අධිකරණමය නොවන පියවර පූර්ණ පරාසය ඒකාබද්ධ කරන'' සංක්‍රමණීය යුක්තිය කරා වන විස්තීරණ ප්‍රවේශයක වැදගත්කම අවධාරණය කළේ ය.

1264. අවුරුදු බොහෝ ගණනාවක් තිස්සේ යම් නියෝගයක්, ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධ වගකිව යුතු පුද්ගලයින් ඇතුළුව වරද කරන ලද්දවුන් යයි කියනු ලබන්නන් විසින් බුක්තිවිඳින ලද දණ්ඩන මුක්තිය අවසන් කිරීමට අවශ්‍ය යයි එය විශ්වාස කරන්නා වූ ශ්‍රී ලංකා ආණ්ඩුවට හා ජාත්‍යන්තර ප්‍රජාවට ආමන්ත්‍රණය කරන පියවර මාලාවක් පහතින් එන නිර්දේශ මගින් විස්තරකර දක්වයි. ආමන්ත්‍රණය කළ යුතුව තිබෙන අභියෝගයන්ගේ පරිමාණය ධෛර්යය හා දේශපාලන අධිෂ්ඨානය, නෛතික හා ආයතනික ප්‍රතිසංස්කරණ, විස්තෘත මූල්‍ය හා මානව සම්පත් හා ජාත්‍යන්තර ආධාර හා සහායෙන් ප්‍රතිලාභ ලබනු ඇති වින්දිතයින්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහාවන සවිමත් වැඩසටහනක් ඉල්ලා සිටියි.

**නිගමන හා නිර්දේශ**

1265. 2002 හා 2011 අතර සිදු වූ මානව හිමිකම් උල්ලංඝනයන් හා ඒ හා අදාළ අපරාධ සම්බන්ධව විස්තීරණ විමර්ශනයක් කර ගෙන යාමේ කාර්යය විමර්ශන කමිටුවට පවරනු ලැබිණ. එතරම් කෙටි කාලයක් තුළ එම කාර්යය ඉටු කිරීමට උල්ලංඝනයන්ගේ නිශ්චිත වපසරිය, ලබා ගත හැකි තොරතුරුවල ප්‍රමාණය මෙන්ම විමර්ශනයට තිබූ බාධක ද දූවැන්ත අභියෝග එල්ල

---

[1236] සත්‍යය, යුක්තිය, හානිපූරණය හා නැවත ඇති නොවීමේ සහතිකයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ විශේෂ නියෝජිත පැබ්ලෝ ඩි ග්‍රෙයිෆ් මහතා ශ්‍රී ලංකාවේ ඔහුගේ පළමු සංචාරය නිමාවේ දී ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, 2014 අප්‍රේල් 6

කළේ ය. කෙසේ වුව ද මෙම වාර්තාව සන්නද්ධ ගැටුමේ අවසාන අදියරයන්හි දී පමණක් නොව කමිටුවේ වරම මගින් ආවරණ කරන ලද සමස්ත කාල පරිච්ඡේදය තුළ දී සේ ම ඊට පෙර ද සිදුවී තිබෙන ජාත්‍යන්තර මානව හිමිකම් හා මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම්වල අඛණ්ඩතාව, පරිමාණය හා බරපතලභාවය කෙරෙහි වැඩිමනත් ආලෝකයක් හෙළීමට උත්සාහ දරා තිබේ.

1266. වාර්තාව සන්නද්ධ ගැටුමේ අවසාන අදියරයන්හි දී සන්නද්ධ හමුදා විසින් එල්ල කරන ලද තියුණු ෂෙල් ප්‍රහාර වන්නියේ සිවිල් ජනතාව අතර මහත් පීඩාවක් හා ජීවිත අහිමි කිරීමක් කර ඇති බව පෙන්වා තිබේ. සාක්ෂිකරුවෝ සංහාරයේ, ලේ වැගිරීමේ හා බෝම්බ ප්‍රහාරවලින් පවුල් පිටින් මිය ගියවුන්ගේ මනෝවිද්‍යාත්මක පීඩනයේ ඛේදජනක විස්තර කමිටුවට ලබා දුන්හ. ආණ්ඩුව විසින් වන්නියට ඇතුල්වීමට අවසර දෙන ලද සැපයුම්වල දැඩි පාලනයන් නිසා හටගත් ආහාර, ජලය හා වෛද්‍ය ප්‍රතිකාර හිඟය ඔවුන්ගේ සුබ සාධනය මත තව දුරටත් බලපෑම් වැඩි කළ අතර නිසැකවම අමතර මරණ ඇති කළේ ය. වැඩිහිටියන් හා ළමුන්ට ඔවුන්ගේ ශ්‍රේණිවලට බැඳී ඉදිරි පෙරමුණුවල සටන් කරන්නට බල කිරීම මගින් එල්ටීටීඊය තවදුරටත් ඔවුන්ගේ මානසික පීඩනය වැඩි කළේ ය. එල්ටීටීඊය විසින් සිවිල් ජනයාට ගැටුම් ප්‍රදේශය රැඳී සිටින්නට බල කරනු ලැබ තිබුණේ ය හා ඔවුන් හැර යන්නට උත්සාහ කළහොත් පලිගැනීම්වලින් පීඩා විඳින්නට සිදු වූයේ ය යන කරුණ ඔවුන් විඳවමින් ගත කළ මානසික පීඩනය තවත් වැඩි කළේ ය.

1267. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවෙහි විපතට පත් ප්‍රදේශවලට හා ප්‍රජාවන් වෙතට සම්පූර්ණ ප්‍රවේශයකින් තොරව සන්නද්ධ ගැටුමේ විවිධ අවධීන් තුළ සිවිල් ජන මරණවල නියම සංඛ්‍යාව ගණනය කිරීම හෝ තක්සේරු කිරීම අසීරු ය. එහෙත් කමිටුව විසින් ප්‍රහාරවල පුළුල්ව පැතුරුණු පරිමාණය දක්වමින් එක්රැස් කරන ලද තොරතුරුවල පදනම මත දහස් ගණන් බොහෝ විට දස දහස් ගණන් දෙනාට ඔවුන්ගේ ජීවිත අහිමි වූ බවට සැකයක් නොමැත. ප්‍රහාරයන්වල පුළුල්ව පැතුරුණු ලක්ෂණය සමග එකට බැඳුණු දරුණු මානව හිමිකම් උල්ලංඝනයන් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ බරපතල උල්ලංඝනයන් කරන ලද රටාවන්, ඒවායේ ක්‍රමානුකූල ස්වභාවයේ දර්ශක සියල්ලම එල්ල වන්නේ වියහැකි ජාත්‍යන්තර අපරාධ ක්‍රියාකාරිත්වයක් වෙතට ය. මෙම චෝදනා අප්‍රමාදීව, සම්පූර්ණව හා ස්වාධීනව විමර්ශනය කරනු ලැබිය යුතු අතර වගකිව යුත්තන් යුක්තිය හමුවට ගෙන ආ යුතු ය.

1268. ගැටුම 2009 මැයි 18 දින අවසන් වුව ද යුද්ධය අවසන් වූ විට සිවිල් ජනයාගේ තත්ත්වයෙහි වෙනසක් ඇති නොවීය. 250,000 කට අධික පිරිසකට ඔවුන්ගේ නිදහස අහිමි කරන ලදුව මාස ගණන් හමුදාව විසින් පාලනය කරන ලද ආවෘත අභ්‍යන්තර අවතැන් කඳවුරුවල සිටින්නට සිදු වූ අතර ආරක්ෂක හමුදාව හිටපු එල්ටීටීඊ කාඩර්වරුන් සොයා ගැනීමට කඳවුරු තුළ මෙහෙයුම් කර ගෙන යනු ලැබිණ. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ රැඳවුම් කඳවුරුවලින් (ආණ්ඩුව විසින් ''සුබ සාධන ගම්'' නමින් විස්තර කරන ලද) නිදහස් කරනු ලැබූ පසුත් ඔවුන් තව දුරටත් නිරීක්ෂණය, රඳවා ගැනීම, වධ හිංසනයට ලක් කිරීම හා පීඩාකාරී සැලකීම සහ ලිංගික හිංසනය වැනි අපයෝජනයන්ගේ අවදානමට ලක් වුණි. හිටපු එල්ටීටීඊ

කාඩර්වරුන් හා අන්‍යයන් ශ්‍රී ලංකා හමුදාවට භාර දීමෙන් පසුව රහසේ මරා දමන ලද බව විශ්වාස කෙරේ.

1269. සන්නද්ධ ගැටුමේ අවසාන අදියරේ දී මහා පරිමාණයක් මත අදහාගත නොහැකි තරමේ උල්ලංඝනයන් සිදු වී ඇති අතර මෙම වාර්තාව කමිටුවේ වරම මගින් ආවරණය කෙරෙන කාල පරිච්ඡේදය තුළ පමණක් නොව ඉකුත් දශක ගණනාව පුරා දස දහස් ගණන් පුද්ගලයින්ට මෙන්ම සිංහල, දමිළ හා මුස්ලිම් යන සමස්ත ප්‍රජාවන්ටම බලපා තිබෙන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන්ගේ, අපයෝජනයන්ගේ හා අදාළ අපරාධයන්ගේ අඛණ්ඩතාවය ද විස්තර කරනු ලැබ තිබේ. මේවාට අවුරුදු ගණනාවක් තිස්සේ ආණ්ඩුවේ හමුදා විසින් මෙන්ම ඒවාට සම්බන්ධ අතුරු හමුදා සංවිධාන ද විසින් දණ්ඩන මුක්තිය ඇතිව කරන ලද නීතියෙන් බැහැර ඝාතනවල විස්තෘත හා ආවේණික රටාවන්, බලහත්කාර අතුරුදහන් කිරීම්, පැහැර ගැනීම්, නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් හා හිතුවක්කාර රඳවා තැබීම්, වධ හිංසන හා ලිංගික හිංසන ඇතුළත් වේ. එසේම ඒවාට එල්ටීටීඊය විසින් කරන ලද බහුවිධ නීති විරෝධී ඝාතන, බොහෝ සිවිල් වැසියන් මරුමුවට පත් කළ හා දරුණු අංග විකලත්වයට පත් කළ ඉවක් බවක් නැති මරා ගෙන මැරෙන බෝම්බ හා ක්ලේමෝ බෝම්බ ප්‍රහාර හා එල්ටීටීඊය හා අතුරු හමුදා කණ්ඩායම් විසින් කරන ලද ළමුන් බඳවා ගැනීම් හා ඔවුන්ව එදිරිවාදීකම්වල යොදවා ගැනීම් ද ඇතුළත් වේ.

1270. වඩා වැදගත් වනුයේ උල්ලංඝනයන්ට හා අපරාධවලට වගකිව යුතු ව්‍යුහයන් බොහොමයක් ක්‍රියාත්මකව පැවතීම අවශ්‍ය වූ විට යළි ක්‍රියාත්මක වීමට මෙන්ම වගවීමට ආමන්ත්‍රණය කිරීමට අදාළ ප්‍රගතිය වැළක්වීමට සූදානම් ය යන්න ය. සත්තකින්ම ඒවා නැවත ඇතිවීම වැළක්වීමට දශක ගණනාවක් පැවති මර්දනීය හා පීඩාකාරී ආකල්ප, භාවිතයන් හා ව්‍යුහයන් අවසන් කිරීමේ ගැඹුරු ආයතනික වෙනස්කම් කළ යුතු බව කමිටුව විශ්වාස කරයි. මෙහි ඇතැම් ඒවාට කාලයක් ගතවන නමුදු උල්ලංඝනයන් නොඉවසනු ඇති බව දක්වමින් රාජ්‍ය නිලධාරීන්ට හා ආරක්ෂක හමුදාවන්ට දැඩි උපදෙස් නිකුත් කිරීමට ද ආණ්ඩුව වෙනස්කම් ඇති කිරීමට අදිටන් කර ගෙන තිබෙන බවට පණිවිඩයක් යැවීමට ද කඩිනම් පියවර ගත හැකි ය. එසේම වරද කරන ලදැයි කියවෙන්නන් ආරක්ෂක හමුදාවලින් ඉවත් කිරීමට බරපතල් ලෙස පරීක්ෂා කර බැලීම ද ක්‍රියාවලියේ කොටසක් විය යුතු ය. අතුරු හමුදා කණ්ඩායම් නිරායුද කළ යුතු අතර ආණ්ඩුවේ නිලධාරීන් හා ආරක්ෂක හමුදාවල සාමාජිකයින් විසින් මෙම කණ්ඩායම්වලට දෙන ලද සහායේ වපසරිය, ස්වභාවය හා අනන්‍යතාවය ඇතුළුව ඔවුන්ගේ කටයුතු සම්පූර්ණ ලෙස හා ස්වාධීනව විමර්ශනය කරනු ලැබිය යුතු ය.

1271. අධිකරණ අංශයට දේශපාලන අතපෙවීම් අවසන් කිරීම ඇතුළුව නීති පාලන ආයතන ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් අවධාරණය කර දක්වනු ලැබ තිබේ. ව්‍යවස්ථා සභාව ප්‍රතිෂ්ඨාපනය කිරීම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ තනතුරුවලට වඩා ස්වාධීන සාමාජිකයින් පත් කිරීමේ බලාපොරොත්තුව ඇතිකරයි. මේ සම්බන්ධයෙන් ගත් කල නව ආණ්ඩුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ද උසාවියට නඩු යොමු කිරීමේ

එහි බලතල පිළිබඳ නීතිකරණය මගින් එහි වරම ශක්තිමත් කිරීමේ ද හදිසි පියවර ගනු ඇතැයි කමිටුව බලාපොරොත්තු රඳවයි. 2006 සිට කොමිසමේ කාර්ය සාධනීයභාවය බරපතල ලෙස බාදනය වී තිබේ. එහෙත් එය මානව හිමිකම් ආරක්ෂා කිරීම ද වගවීමට දායකත්වය සැපයීම ද පිළිබඳ ප්‍රධාන ආයතනයක් වේ.

1272. සමගි සන්ධානය හා ක්‍රමානුකූල මානව හිමිකම් අපයෝජනයන්ගේ හා පැලපදියම් වූ දණ්ඩන මුක්තියේ මූල හේතුන්ට ආමන්ත්‍රණය කිරීම නව ආණ්ඩුවේ ශ්‍රී ලංකාව සඳහාවන දැක්ම ආරක්ෂා කර ගැනීමෙහිලා තීරණාත්මක වෙයි. සත්‍ය පැවසීමේ, යුක්තියේ හා හානිපූරණයන්ගේ ක්‍රියාවලීන් ඇතුළු වගවීම එම දැක්මේ කොටසක් විය යුතු ය. එය සිවිල් ජනයා ආරක්ෂා කළ බව, ගැටුම් කලාපයට හා අභ්‍යන්තර අවතැන් වූන්ගේ මූලික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මානුෂවාදී ආධාර සැපයූ බව කියන පසු ගිය ආණ්ඩුවේ නොනැමෙන කතාන්තරය මේ සිද්ධීන් මධ්‍යයේ ජීවත් වූ සාක්ෂිකරුවන්ගේ නිමක් නැති සවිස්තර කරුණු දැක්වීම්වලට මුළුමනින්ම පටහැනිව යයි. එහෙයින් එය වෙනස් විය යුතු ය.

1273. ඒ හා සමානවම දමිළ ප්‍රජාව අතර ද නිදසුන් ලෙස එල්ටීටීඊය විසින් සිවිල් ජනයා හා ප්‍රජාවන් මත පටවන ලද විනාශය හා හානිය පිළිගැනීමක් තිබිය යුතු ය. තවදුරටත් එල්ටීටීඊයවත් එය පාලනය කරන ප්‍රදේශයක්වත් පවතින්නේ නැති අතර විශාල හා සම්පූර්ණ දණ්ඩන මුක්තියෙන් යුතුව කරන ලද අවභාවිතයන්ගේ උරුමය ඉතිරිව තිබෙන අතර එයට ආමන්ත්‍රණය කළ යුතු ය. දැන් පවා ශ්‍රී ලංකාවේ ඇතැම් කොටස්වල එල්ටීටීඊය විසින් කරන ලද අවභාවිතයන්ගේ වින්දිතයින් සිදු වූයේ කුමක් ද යන්න ගැන පැරණි එල්ටීටීඊ කාඩර්වරුන් ඉදිරියේ කතා කිරීමට බිය ය.

1274. සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් හෝ අතුරුදහන්වීම් සම්බන්ධ අනාගත යාන්ත්‍රණයක් වැනි ඕනෑම යාන්ත්‍රණයක නිර්මාණ සැලැස්ම අවංක, දැනුවත් හා විශේෂයෙන්ම වින්දිතයින් හා ඔවුන්ගේ පවුල් සමග සහභාගිත්ව උපදේශනයෙන් යුත් ක්‍රියාවලියක් ඔස්සේ සම්පාදනය කළ යුතු ය. එසේම අතීතයට ආමන්ත්‍රණය කිරීමේ හා අනාගත උල්ලංඝනයන් සම්බන්ධ වගවීමට ඉඩ සැලසීමේ ප්‍රගතිය කරාවන වැදගත් මූලික පියවරක් පීඩාවට පත් කරනු ලැබීමේ බියෙන් තොරව වින්දිතයන්ට හා අනෙකුත් සාක්ෂිකරුවන්ට සාක්ෂි දිය හැකි වාතාවරණයක් නිර්මාණය කළ යුතු ය. පළිගැනීම් පිළිබඳ බිය බොහෝ දෙනෙකු සත්‍යය, යුක්තිය හා හානිපූරණ පතා ඉදිරියට ඒමෙන් වළකා තිබේ. කෙසේ වුව ද අතුරුදහන් වූවන්ගේ ඥාතීන් ආණ්ඩු විසින් වගකීම ප්‍රතික්ෂේප කිරීමට හා අවුල්කර දැමීමට බොහෝ හා නැවත නැවත කරන ලද උත්සාහයන් නොතකා ඔවුන්ගේ නැතිවී ඇති ආදරණීයයන් පිළිබඳ සත්‍යය සෙවීමේ වෑයම නිර්භීත ලෙස දිගටම කර ගෙන ගොස් තිබේ.

1275. සාක්ෂි දීමට හා සංවාදයට උපකාරීවන වාතාවරණයක් නිර්මාණය කිරීමට ස්වාධීන, කාර්ය සාධනීය සාක්ෂිකරු ආරක්ෂණ ක්‍රමයක් තිබීම අවශ්‍ය කරයි. 2015 සාක්ෂිකරු ආරක්ෂක පනත ආරම්භයක් සලකුණු කරන අතර එය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා හොඳම භාවිතයන්ට අනුකූල වන සේ සංශෝධනය කිරීම අවශ්‍ය වෙයි. මෙය නව ආණ්ඩුවේ ප්‍රමුඛතාවක් විය යුතු ය.

ඒ අතරම එවැනි වාතාවරණයක් නිර්මාණය කිරීමට වින්දිතයින්ට හෝ ඔවුන්ගේ පවුල්වලට තර්ජනය කිරීමෙන් හා අනිසි බලපෑම් කිරීමෙන් ආරක්ෂක හමුදා හා අන්‍යයන් වැළැක්වීමේ පියවර අවශ්‍ය වෙයි.

1276. කමිටුවේ වාර්තාව බොහෝ තනි තනි නිලධාරීන්ගේ වෘත්තීමයභාවය හා විශේෂඥතාවය තිබියදීත් ශ්‍රී ලංකාවේ ආයතන පුරාම දණ්ඩන මුක්තිය ගැඹුරු අන්දමින් පැලපදියම් වී ඇත්තේ කෙසේ ද යන්න පෙන්වා දී තිබේ. 1994 හා 1998 පිහිටුවන ලද විමර්ශන කොමිෂන් සභා හැරන්නට විමර්ශන කොමිෂන් සභා බොහොමයක් නිර්මාණය කරනු ලැබ තිබෙන්නේ වගවීම සක්‍රීය කිරීමේ කාර්ය සාධනීය යාන්ත්‍රණයන් ලෙසට වඩා ඉහළ අවධානයකට ලක්වූ සිද්ධි සම්බන්ධ විවේචන වෙනතක හැරවීම සඳහා බව පෙනේ. එසේ වුව ද ඒවායේ දෝෂ තිබියදී ම වරද කරන ලද්දවුන් ඇතුළුව බොහෝ සිද්ධි ප්‍රලේඛනය කර තිබේ. එනමුදු වරදකරන ලදැයි කියන්නවුන්ගේ බහුතරය කිසිදාක නීතිය හමුවට ගෙනවිත් නැති අතර ආරක්ෂක හමුදා ඇතුළත ඇතැමුන්ට එතැන් සිට උසස්වීම් ද දෙනු ලැබ තිබේ.

1277. ශ්‍රී ලංකාවේ සිදු කරන ලද යි කියන උල්ලංඝනයන් හා අපරාධ නීතිය හමුවට ගෙන ඒම සඳහා අවශ්‍ය කරන යාන්ත්‍රණයන් පිළිබඳව දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද තියුණු විවාදයක් ඇතිව තිබේ. විවාදයේ වැඩි හරියක් කේන්ද්‍රගතව ඇත්තේ වගවීම මුදුන්පත් කර ගැනීම සඳහා වඩාත්ම උචිත වනු ඇත්තේ කුමන වර්ගයේ යාන්ත්‍රණයන් ද හා ඒවා ගත යුතු ආකාරය පිළිබඳව ය. එසේ නමුත් මානව හිමිකම් කවුන්සිලයේ දායකත්වය තනි තනි නීති කෘත්‍යයන්, හානිපූර්ණ, සත්‍ය සෙවීම, ආයතනික ප්‍රතිසංස්කරණ හා රාජ්‍ය සේවකයින් හා නිලධාරීන් පරීක්ෂාවන්ට භාජනය කිරීම් ඇතුළු අධිකරණමය හා අධිකරණමය නොවන පියවර සම්පූර්ණ පරාසය ඒකාබද්ධ කරන සංක්‍රමණීය යුක්තිය සඳහා වූ විස්තීරණ ප්‍රවේශයක අවශ්‍යතාව අවධාරණය කරන 25/1 යෝජනාවෙන් ලබා දී ඇත.[1237]

1278. විශේෂයෙන්ම ඇතැම් දේශපාලන පක්ෂ ද හමුදාවේ හා සමාජයේ කොටස් ද ගැඹුරින්ම විරුද්ධව සිටින සන්දර්භයක දේශීය ක්‍රියාවලියක් හරහා වගවීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නව ආණ්ඩුව විසින් කරනු ලබන කැපවීම ප්‍රශංසා කටයුතු ය. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රමය මෙම වාර්තාවෙහි අඩංගු චෝදනා සම්බන්ධයෙන් අප්‍රමාදීව ''ස්වාධීන හෝ විශ්වසනීය විමර්ශනය'' කිරීමට හෝ මානව හිමිකම් කවුන්සිලය විසින් ඉල්ලනු ලැබ ඇති පරිදි ''එවැනි උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිව යුත්තන් වගකිව යුතු බවට සලකන්නට තවමත් සූදානම් හෝ සම්පූර්ණ වශයෙන් අවශ්‍ය තත්ත්වයන්ගෙන් සමන්විතව හෝ නැති බව විමර්ශන කමිටුව විශ්වාස කරයි.[1238] මෙම වාර්තාවේ යුක්තිය හා වගවීම පිළිබඳ පරිච්ඡේදය මේ සම්බන්ධ සංකීර්ණ හේතු ද ශ්‍රී ලංකාවේ වගවීම් යාන්ත්‍රණයක් සාර්ථක වීමට දේශීය යාන්ත්‍රණයකට වඩා වැඩි දෙයක් අවශ්‍ය කරන බව මහ කොමසාරිස්වරයා විශ්වාස කරන්නේ මන් ද යන්න ද විස්තර කරයි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විනිසකරුවන්, අභිචෝදකයින්, නීතිඥයින් හා විමර්ශකයින් අනුකලනය කරන දෙමුහුන් විශේෂ අධිකරණ සමගින් සාර්ථක වී තිබෙන අනෙක් රටවල උගත් පාඩම් හා යහ භාවිතයන් උකහා ගත යුතු ය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දේශපාලනීකරණය වූ

[1237] A/HRC/RES/25/1, පූර්විකාව

[1238] එම

හා බෙහෙවින් ධ්‍රැවීකරණය වූ වාතාවරණයක ක්‍රියාවලියේ ස්වාධීනත්වය හා අපක්ෂපාතිත්වය තුළින් සියලුම ශ්‍රී ලාංකිකයින්ට විශේෂයෙන් වින්දිතයින්ට විශ්වාසය ලබා දීම සඳහා එවැනි යාන්ත්‍රණයක් අත්‍යවශ්‍යවනු ඇත. මෙම මුලපිරීම්වලට ජාත්‍යන්තර ප්‍රජාව සහයෝගය දෙන බව ද එසේම සංයුක්ත ප්‍රතිඵල නොමැති නම් අවශ්‍ය විය හැකි ජාත්‍යන්තර මට්ටමේ දී ගත යුතු වැඩිදුර පියවර ගැනීමට ඔවුන් මෙම වර්ධනයන් අඛණ්ඩවම නියාමනය කරන බව ද වැදගත් වනු ඇත.

1279. සිවිල් ජනයාට හා මානුෂවාදී ආධාරවලට එල්ල කරන ලද ප්‍රහාර පිළිබඳව විමර්ශන කමිටුවේ සොයා ගැනීම් ඇතැම් විට එහි වාර්තාවෙහි උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ සොයා ගැනීම්වලින් වෙනස් විය හැකි වුව ද  උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ සොයා ගැනීම් බොහොමයක් හා නිර්දේශ අදට අදාළ බව හා මෙම වාර්තාව, විශේෂයෙන් රඳවා තැබීම හා අතුරුදහන්වීම්, විවිධ ප්‍රජාවන් බොහොමයකගේ දුක්ගැනවිලි හා සමගි සන්ධානය සඳහා වන යෝජනාවලට අදාළ පසු විපරමේ කොටසක් ලෙස සැලකිය යුතු බව විමර්ශන කමිටුව විශ්වාස කරයි. සම්පූර්ණයෙන්ම වාගේ අවුරුදු පහකට පමණ පෙර ඔවුන් ඉදිරිපත් කළ මානව හිමිකම් ආරක්ෂා කිරීමට ආධාර විය හැකි ප්‍රධාන නිර්දේශ බොහොමයක් තවමත් ක්‍රියාත්මක කරන්නට ඉතිරිව තිබීම කණගාටුදායක ය.

1280. ජනවාරියේ දී බලයට පැමිණි ආණ්ඩුව විසින් මානව හිමිකම් වැඩි දියුණු කිරීමට ගන්නා ලද පියවර ද 2015 බලයට පැමිණි නව ආණ්ඩුව  වෙනසක් ඇති කිරීමට කර තිබෙන කැපවීම ද කමිටුව පිළි ගනියි.  උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් අවධාරණය කරනු ලැබ ඇති පරිදි ''අන්තර් රැඳියාවෙන් යුත්, යුක්තිසහගත, සාධාරණ, විවෘත හා විවිධත්වයෙන් යුත් සමාජයක් පිළිබඳ පොදු දැක්මක්'' ප්‍රකාශයට පත් කිරීමට නව ආණ්ඩුව මෙම විශිෂ්ට අවස්ථාව ග්‍රහණය කර ගනු ඇතැයි මහ කොමසාරිස්වරයා අවංකවම අපේක්ෂා කරයි. පවතින තත්ත්වයට අභියෝග කිරීමට හා එහි සියලු පුරවැසියන් සඳහා මානව හිමිකම් පිළිබඳ පූර්ණ ආරක්ෂාව ප්‍රතිෂ්ඨාපනය පිණිස දිගු කල් පවත්නා බොහෝ දුක්ගැනවිලිවලට ආමන්ත්‍රණය කිරීමට ධෛර්යයක් හා දේශපාලන අධිෂ්ඨානයක් අවශ්‍ය වනු ඇත.

1281. මෙම වාර්තාව එම දැක්ම සංවර්ධනය කිරීමට දායකත්වයක් සපයනු ඇතැයි ද ආරක්ෂණ හා එකිනෙකාට දොස් පවරන කතිකාවන් තුළට වැටෙනවාට වඩා සාධනීය ලෙස ඉදිරියට යාමේ මාර්ගයක් වශයෙන් එය වැළඳ ගනු ඇතැයි ද මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය අපේක්ෂා රඳවයි. පහතින් එන්නේ එහි ජනතාවගේ ධනාත්මක සම්පත්වලට හා විවිධත්වයට සම්පූර්ණ යුක්තිය ඉටු කරන වෙනසේ දැක්මක් හා වැඩසටහනක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ක්‍රියාත්මක කළ යුතු යයි එය විශ්වාස කරන නිර්දේශ ගොන්නකි. එසේම ජාත්‍යන්තර ප්‍රජාවට ද වෙනසට ආධාර කිරීමේ හා අතීත උල්ලංඝනයන් හා අපයෝජනයන් සම්බන්ධ වගවීම සහ දිගු කාලීන සමගි සන්ධානය පෙරට ගෙන යාමේ වැදගත් භූමිකාවක් රඟ පාන්නට තිබේ.

**නිර්දේශ**

**පොදු**

1. පසුගිය අවුරුදු 30 මානව හිමිකම් උල්ලංඝනයන්ට ආමන්ත්‍රණය කිරීම හා ඒවා පුනරාවර්තනය වීම වැළක්වීම සඳහා විස්තීරණ සංක්‍රමණීය යුක්ති ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම;

2. සමායෝජිත, කාල නියම සහිත සැලැස්මක් සංවර්ධනය කිරීමට හා මෙම වාර්තාවේ හා මානව හිමිකම් කවුන්සිලයට මහ කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද පූර්ව වාර්තාවල නිර්දේශ මෙන්ම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ හා අතීත විමර්ශන කොමිෂන් සභාවල ක්‍රියාත්මක කිරීමට තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට ඉහළ මට්ටමේ විධායක කණ්ඩායමක් ස්ථාපනය කිරීම;

3. මානව හිමිකම් තත්ත්වය නියාමනය කිරීම, මහ කොමසාරිස්වරයාගේ නිර්දේශ හා මානව හිමිකම් කවුන්සිලයේ සියලු යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් ලබා ගැනීම හා තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා සම්පූර්ණ නේවාසික නියෝජනයක් ස්ථාපනය කිරීමට මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයට ආරාධනා කිරීම;

4. සංක්‍රමණීය යුක්තිය පිළිබඳව විශේෂයෙන් සත්‍ය සෙවීම, හානිපූර්ණ හා සිහිපත්කරණය පිළිබඳව මහජනතාව, වින්දිතයින් හා සාක්ෂිකාර කණ්ඩායම්, සිවිල් සමාජය හා අනෙකුත් පංගු පාර්ශවකරුවන් සමග අවංක උපදෙස් විචාරණයන්ට මුලපිරීම. මේවා ක්‍රියාවලිය තුළ දැනුවත් සහභාගිත්වය සහතික කරන මහජන අධ්‍යාපන වැඩසටහන් සමග එකට යා යුතු ය. සත්‍යය, යුක්තිය, හානිපූර්ණ හා නැවත ඇති නොවීමේ සහතිකයන් පිළිබඳ වාර්තාකරුට මෙම ක්‍රියාවලියේ දී එක්ව කටයුතු කිරීමට හා උපදෙස් දීමට හැකිවන සේ ඔහුගේ අඛණ්ඩ කාර්ය නියුක්තිය සඳහා ආරාධනා කිරීම;

5. මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ පටිපාටි සමග සම්පූර්ණ සහයෝගිතාව සහතික කිරීම. ගැටුම හා සම්බන්ධිත ලිංගික හිංසනය පිළිබඳ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාට, ළමුන් හා සන්නද්ධ ගැටුම පිළිබඳ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාට, නීතියෙන් බැහැර ඝාතන හා වධ හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරුවන්ට, හිතුවක්කාර රඳවා තබා ගැනීම් පිළිබඳ වැඩ කණ්ඩායමට හා අනෙකුත් අදාළ විශේෂ පටිපාටි වරම් දරන්නන්ට කල් ඇතිව රටේ සංචාරයන්හි යෙදෙන්නට ආරධනා කිරීම;

**ආයතනික ප්‍රතිසංස්කරණ**

6. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම වැනි ප්‍රධාන ආයතනවලට උපරිම ස්වාධීනත්වයෙන් හා ගරුත්වයෙන් යුත් සුදුසුකම් ලත් නව සාමාජිකයින් පත් කළ හැකිවන සේ හැකි තාක් ඉක්මනින් ව්‍යවස්ථා සභාව සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීම සහතික කිරීම;

7. මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය හා උසාවිවලට නඩු යොමු කිරීමේ එහි හැකියාව ශක්තිමත් කිරීමට නීතිකරණය විමර්ශනය කිරීම;

8. දේශීය නීතිය තුළ ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම්වල උපයෝජ්‍යභාවය සහතික කරනු පිණිස සිංහරාසා[1239] නඩුවේ එහි තීන්දුව පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ විමර්ශනයක් ඉල්ලා සිටීමට හා පුද්ගල පැමිණිලි සලකා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ ශක්නුතාව නැවත ස්ථාපිත කිරීමට පියවර ගැනීම;

9. වධ හිංසනය, ලිංගික දූෂණය, ලිංගික හිංසනය හා අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයන් තහනම් කරනු ලබන බවට හා එක්කෝ සෘජුව නැතහොත් අණ දෙන්නා ලෙස හෝ ඉහළ නිලධාරියා ලෙස වගකිව යුත්තන් විමර්ශනය කරනු ලබන බවට හා දඬුවම් දෙනු ලබන බවට හමුදාවේ හා ආරක්ෂක හමුදාවල සියලු ශාඛාවන්ට පැහැදිලි, ප්‍රසිද්ධ හා නිසැක උපදෙස් නිකුත් කිරීම. නිසි ක්‍රියාවලියකට යටත්ව එවැනි ක්‍රියාවන්ට සම්බන්ධ බවට සැක කරනු ලබන ඕනෑම අයෙකු කාර්ය සාධනීය විමර්ශනයක් සම්පූර්ණ කරනු ලබන තෙක් වහාම සේවය අත්හිටුවිය යුතු ය. සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට හා මාධ්‍යවේදීන්ට එරෙහි සියලු නිරීක්ෂණ, හිරිහැර හා පලිගැනීම් නැවැත්වීමට නියෝග කළ යුතු ය;

10. නීතිය හා සාමය පිළිබඳ බලකායන්වල සිවිල් ස්වභාවය, ස්වාධීනත්වය හා වෘත්තීයභාවය සහතික කිරීම පිණිස ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය හා අභ්‍යන්තර ආරක්ෂක කටයුතුවල හමුදාවේ භූමිකාව අඩු කිරීම සඳහා සමස්ත සැලස්මක් සකස් කිරීම;

11. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය යන විවිධ බුද්ධි අංශ ඇතුළුව ආරක්ෂක බලකායන්ගේ සියලු ශාඛා සම්බන්ධ භූමිකා හා විධාන දාම පැහැදිලි කළ යුතු ය;

12. ඔවුන් මානව හිමිකම් උල්ලංඝනය කර තිබෙන බවට විශ්වාස කළ හැකි සාධාරණ පදනම් තිබෙන විට හමුදා හා ආරක්ෂක බලකා පිරිස් හා වෙන යම් රාජ්‍ය නිලධාරියෙකු පදවියෙන් ඉවත් කිරීමේ නිසි ක්‍රියාවලියට අදාළ අංග සම්පූර්ණ පරීක්ෂණ ක්‍රියාවලියක් සංවර්ධනය කළ යුතු ය;

13. ශ්‍රී ලංකා හමුදාවන්ගේ කිසිදු සාමාජිකයෙකු අණ දෙන්නන් ද ඇතුළුව කිසිදු ආකාරයකින් මානව හිමිකම් උල්ලංඝනයන්ට හෝ අපරාධ ක්‍රියාවන්ට සම්බන්ධ වී නොමැති බවට තහවුරු කර ගැනීමේ සියුම් පරීක්ෂාවකින් තොරව එක්සත් ජාතීන්ගේ සාම සාධක කාර්යයකට නොයවනු ලබන බව සහතික කළ යුතු ය. සාම සාධක කාර්යයන්වල නියුතුව සිටින අතරතුර ශ්‍රී ලංකා සාම සාධකයින් සම්බන්ධ අපයෝජනයන් පිළිබඳ ඕනෑම චෝදනාවක් අධිකාරීන් විසින් සම්පූර්ණ විමර්ශනයකට භාජනය කරනු ලැබිය යුතු ය;

14. හමුදාව විසින් අත්පත් කර ගනු ලැබ තිබෙන පෞද්ගලික ඉඩම් ආපසු ලබා දීමට හා සිවිල් කටයුතුවලට හමුදා මැදිහත්වීම අවසන් කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු ය;

[1239] Nallaratnam Singarasa v Attorney General, SC Special App. (LA) No.182/99, decided on Sept. 15, 2006

15. දේශපාලන පක්ෂවලට සම්බන්ධ කණ්ඩායම් හඳුනා ගැනීමට හා නිරායුධ කිරීමට ද ආරක්ෂක හමුදා, බුද්ධි සේවා හා අනෙකුත් ආණ්ඩු අධිකාර සමග ඒවයේ ඇති සම්බන්ධකම් කපා හැරීමට ද කඩිනම් පියවර ගත යුතු ය;
16. ඒවා අහෝසි කිරීමේ හා ජාතත්‍යන්තර නීතිය සමග සම්පූර්ණයෙන් අනුකූලවන නව ජාතික ආරක්ෂක රාමුවක් සකස් කිරීමේ දැක්මකින් යුතුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) හා එහි විධිවිධාන ද මහජන ආරක්ෂක පනත ද පිළිබඳව ඉහළ මට්ටමේ විමර්ශනයකට මුල පිරිය යුතු ය;

**යුක්තිය**

17. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනේ ස්වාධීනත්වය හා කාර්ය සාධනීයත්වය සඳහා වඩා හොඳ ආරක්ෂණයන් ඒකාබද්ධ කිරීමේ දැක්මකින් යුතුව වින්දිත හා සාක්ෂිකාර ආරක්ෂණ පනත විමර්ශනය කළ යුතු ය. සාක්ෂිකාර ආරක්ෂණ අධිකාරියට පත් කරන ලද්දන්ගේ ස්වාධීනත්වය හා ගරුත්වය සහතික කළ යුතු අතර මෙම වැඩ සටහනට අනුයුක්ත කරනු ලබන පොලිස් කාර්ය පිරිස් පූර්ණ පරීක්ෂාවට ලක් කරනු ලැබිය යුතු ය. සාක්ෂිකාර ආරක්ෂණ ක්‍රමය සඳහා ජාත්‍යන්තර සහාය ඇතුළුව ප්‍රමාණවත් සම්පත් සහතික කළ යුතු ය. ළමුන් හා ලිංගික හිංසනයේ වින්දිතයින් සඳහා විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණයන් සහතික කළ යුතු ය;
18. ව්‍යවස්ථාමය සීමාවන්ගෙන් තොරව යුද අපරාධ, මානව වර්ගයාට එරෙහි අපරාධ, ජන සංහාරය හා බලහත්කාර අතුරුදහන් කිරීම් සාපරාධීකරණය කිරීමේ නීති පැනවිය යුතු ය. විවිධ අපරාධ වගකීම් මාදිලි, විශේෂයෙන් විධාන හෝ ඉහළතර වගකීමේ මාදිලි පැනවිය යුතු ය;
19. සියලු පුද්ගලයින් බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, ජිනීවා සම්මුතීන්ගේ වෛකල්පික මූල ලේඛ හා ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව අපරානුමත කළ යුතු ය;
20. තමන්ගේම ස්වාධීන විමර්ශන හා අභිචෝදන අවයවයක්, විත්තිවාචක කාර්යාලයක් හා වින්දිතයින් ආරක්ෂණ වැඩසටහනක් සහිතව ලිංගික අපරාධ හා ළමුන්ට එරෙහි අපරාධ ඇතුළුව යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ විභාග කිරීමේ වරමලත් ජාත්‍යන්තර විනිසකරුවන්, අභිචෝදකයින්, නීතිවේදීන් හා විමර්ශකයින් ඒකාබද්ධ කරන තත් කාර්ය දෙමුහුන් (hybrid) විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීමේ විශේෂ නීතියක් සම්මත කළ යුතු ය;
21. නිම කර නොමැති බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා සම්බන්ධ අපරාධ විමර්ශන, හබයාස් කෝපුස්, මූලික අයිතිවාසිකම් පෙත්සම් මෙන්ම සියලුම විමර්ශන කොමිෂන් සභාවල සොයා ගැනීම්වලින් හඳුනා ගෙන තිබෙන විශේෂිත නඩු පිළිබඳ විස්තීරණ සැලස්මක් ක්‍රියාත්මක කළ යුතු අතර මෙම නඩු විශේෂිත උසාවිය පිහිට වූ පසුව ඊට යොමු කළ යුතු ය. නැති වූ පුද්ගලයින් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම වරදකරුවන් හඳුනා ගෙන තිබෙන සිද්ධීන් ඇතුළු බැලූ බැල්මට සාක්ෂි තිබෙන සියලුම සිද්ධීන් සම්බන්ධ නීති කෘත්‍යයන් ආරම්භ කළ යුතු ය;

22. විධාන වගකීම් දාමය ඇතුළුව හඳුනා ගැනීම සඳහා තව දුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය ආනුෂාංගිකව උසාවි මගින් නිදහස් කරන ලද නඩුවල චූදිතයින්ගේ සිද්ධීන් ද ඇතුළුව අතුරුදහන් වූවන් පිළිබඳ විමර්ශන ඒකකයට හා නැති වූ පුද්ගලයින් පිළිබඳ ඒකකයට කලාපීය හා සමස්ත ලංකා කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද සියලු සිද්ධි විමර්ශනය කළ යුතු ය;

23. ලියා පදිංචිකර හා පුනරුත්ථාපනයකර තිබෙන බවට වාර්තාගත කර තිබෙන එල්ටීටීඊයට සම්බන්ධ යයි අවබෝධකර ගත් හෝ දැනගත් 11,000 කට වැඩි පුද්ගලයින්ගේ සියලු සිද්ධි ආනුෂාංගිකව කිසිවකු අතුරුදහන් වී නැතැයි සහතිකකර ගැනීමට ඔවුන් දැන් සිටිනා තැන් ගණනය කර ගැනීමට විමර්ශනය කළ යුතු ය;

24. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින රැඳවුම්කරුන්ගේ සියලු නඩු විමර්ශනය කළ යුතු අතර එක්කෝ ඔවුන් නිදහස් කළ යුතු ය, නැතහොත් වහාම නඩු පැවරිය යුතු ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදකරුවන් කරන ලද හා දීර්ඝ සිර දඬුවම් විඳිමින් සිටින්නවුන්ගේ විශේෂයෙන්ම වධ හිංසාව යටතේ ලබා ගත් පාපෝච්චාරණ මත පදනම්ව වරදකරුවන් බවට පත්කරන ලද්දවුන්ගේ නඩු විමර්ශනය කළ යුතු ය;

**සත්‍යය/දැන ගැනීමට ඇති අයිතිය**

25. නැති වූ පුද්ගලයින් පිළිබඳ වත්මන් ජනාධිපති කොමිසම අහෝසි කර එය හමුවේ ඇති නඩු අතුරුදමන් වූවන්ගේ පවුල් සමග අදහස් විචාරණයෙන් යුතුව සංවර්ධනය කරන ලද විශ්වසනීය හා ස්වාධීන ආයතනයකට මාරු කළ යුතු ය;

26. ස්වාධීන සත්‍යාපනයක් සහිතව ඥාතීන්ට රඳවා සිටින පවුල් සාමාජිකයින් සිටිනා තැන් පිළිබඳ තොරතුරු දැන ගත හැකි සියලු රැඳවියන්ගේ මධ්‍යම දත්ත ගබඩාවක් සංවර්ධනය කළ යුතු ය;

27. සියලුම රැඳවුම් මධ්‍යස්ථානවල ගැසට් කරන ලද ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කළ යුතු අතර තවමත් පවතින නිල නොවන ඒවා වසා දැමිය යුතු ය;

28. මානව හිමිකම් හා සම්බන්ධ බොහෝ විමර්ශන කොමිෂන් සභාවල, නැති වූවන් පිළිබඳ ජනාධිපති කොමිසමේ හා සිවිල් වැසි මරණ පිළිබඳ විමර්ශන හමුදා අධිකරණයේ ප්‍රකාශයට පත් නොකරන ලද සියලු වාර්තා ප්‍රකාශයට පත් කළ යුතු ය;

29. මානව හිමිකම් උල්ලංඝනයන්ට අදාළ පවතින සියලු වාර්තා හා ප්‍රලේඛන ඒවා තබා ගෙන තිබෙන්නේ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන වුව සංරක්ෂණය කිරීම සඳහා විස්තීරණ සැලස්මක්/යාන්ත්‍රණයක් සංවර්ධනය කළ යුතු ය;

**හානි පූරණය**

30. ස්ත්‍රීන් හා ළමුන් ඇතුළුව එක් එක් වින්දිතයාගේ විශේෂිත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් වින්දිතයින් හා ඔවුන්ගේ පවුල් සමග අදහස් විචාරණයෙන් යුතුව රාජ්‍ය අයවැයෙන් අදාළ පරිදි මූල්‍යය ලබා ගන්නා ජාතික හානි පූර්ණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කළ යුතු ය;

31. ගැටුමේ සියලු වින්දිතයින් සඳහා මනෝවිද්‍යාත්මක සහාය වැඩසටහන් සංවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම කළ යුතු ය;

32. නැති වූ පුද්ගලයින් සඳහා මරණ සහතික ලබා ගෙන තිබෙන අයට ඔවුන්ගේ ආදරණීයයන්ට සිදු වූයේ කුමක් ද යන්න නිශ්චය කර ගැනීමේ අධිකරණ නඩු පැවරීමෙන් ඔවුන්ව නොවළක්වනු ලැබීම සහතික කිරීම පිණිස නීති සංශෝධන ගෙන ආ යුතු ය;

33. ඉඩම් නැවත ලබා දීම, නැවත පදිංචි කිරීම හා ජීවනාධාර ඔස්සේ පැරණි හා අළුත් අවතැන් වූ ජනතාවන් සඳහා කල් පවත්නා විසඳුම් සහතික කළ යුතු ය;

**එක්සත් ජාතීන්ගේ පද්ධතියට හා සාමාජික රාජ්‍යයන්ට**

34. සංක්‍රමණීය යුක්ති යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම සඳහා ඒවාට සලසා තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරා ගැනීමට තාක්ෂණික හා මූල්‍ය සහාය සැලසිය යුතු ය. සංක්‍රමණීය යුක්ති ක්‍රියාවලියට ආධාර කිරීමට කේන්ද්‍රිත හා සංකේන්ද්‍රිත ප්‍රයත්නයන් සහතික කිරීමට ශ්‍රී ලංකාවේ ප්‍රදානකයින් අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු ය;

35. සාම සාධක කටයුතු, හමුදාමය හුවමාරු හා පුහුණු වැඩසටහන් සඳහා හඳුනාගෙන තිබෙන ශ්‍රී ලංකා පොලිස් හා හමුදා කාර්ය පිරිස් සඳහා දැඩි පිරික්සුම් පටිපාටි අනුගමනය කළ යුතු ය;

36. හැකි කවර හෝ විටක විශේෂයෙන්ම විශ්වීය අධිකරණ බලය යටතේ වධ හිංසනය, යුද අපරාධ හෝ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වගකිව යුතු යයි කියන්නවුන් විමර්ශනයට හා නීති කෘත්‍යයන්ට භාජනය කළ යුතු ය;

37. ඔවුන් තවදුරටත් අපයෝජනයන්ට විශේෂයෙන් වධ හිංසනයට හා ලිංගික හිංසනයට පාත්‍ර නොවනු ඇති බවට ප්‍රමාණවත් නැවත ඇති නොවීමේ සහතිකයන් ලැබෙන තෙක් වධ හිංසනයෙන් හා වෙනත් මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් පීඩා විඳ තිබෙන දමිළ ජනයා සම්බන්ධයෙන් සිය රටට ආපසු නොයැවීමේ ප්‍රතිපත්තියක් සහතික කළ යුතු ය.

38. සැලකිය යුතු දමිළ ජනගහනයක් සිටින රටවල උල්ලංඝනයන්ගේ වින්දිතයන් බවට පත්ව සිටියවුන් සඳහා මනෝවිද්‍යාත්මක සහාය සම්බන්ධ අවශ්‍යතා හා එවැනි සේවා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන අරමුදල් පිළිබඳ ඇගයීමක් කළ යුතු ය;

39. මානව හිමිකම් කවුන්සිලය හරහා මානව හිමිකම් සංවර්ධනයන් ද වගවීම හා සමගි සන්ධානය කරා වන ප්‍රගතිය ද නියාමනය කිරීම අඛණ්ඩව කරගෙන යා යුතු ය. ප්‍රමාණවත් ප්‍රගතියක් නොමැත්තේ නම් මානව හිමිකම් කවුන්සිලය ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් වගවීම සහතික කිරීමේ වැඩි දුර ජාත්‍යන්තර පියවරක් සලකා බැලිය යුතු ය.

ඇමුණුම්

**ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ විමර්ශනය (OHCHR)**
**විෂය නියමයන්**

## 1. වරම හා වාර්තාකරණ වගකීම්

''ශ්‍රී ලංකාවේ සමගි සන්ධානය, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම'' පිළිබඳව 2014 මාර්තුවල සම්මත කරන ලද A/HRC/25/1 යන එහි යෝජනාවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගෙන් ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) විසින් ආවරණය කරන ලද කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ පාර්ශව දෙක විසින්ම කරන ලදැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා අපයෝජනයන් හා අදාළ අපරාධ සම්බන්ධයෙන් විස්තීරණ විමර්ශනයක් පැවැත්වීමට ද දණ්ඩන මුක්තිය මග හැරීමේ හා වගවීම සහතික කිරීමේ දැක්මකින් යුතුව අදාළ විශේෂඥයින්ගේ හා විශේෂ පටිපාටි වරම් දරන්නන්ගේ සහාය ඇතිව කරන ලදැයි කියන එවැනි උල්ලංඝනයන් හා කරන ලද අපරාධ පිළිබඳ කරුණු හා අවස්ථාවන් තහවුරු කරන ලෙස ද'' ඉල්ලා සිටියේ ය.

කවුන්සිලය එහි විසි හත්වෙනි සැසියේ දී වාචික යාවත්කාලීනයක් ඉදිරිපත් කරන ලෙස ද විසි අටවෙනි සැසියේ දී විමර්ශන පිළිබඳව විස්තීරණ වාර්තාවක් ඉදිරිපත් කරන කරන ලෙස ද මහ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටියේ ය.

මෙම වරමට අනුකූලව එ.ජා. මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා ජිනීවා පාදක කරගත් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන කමිටුව (OISL) ස්ථාපිත කළේ ය.

## 2. කාල රාමුව

විමර්ශනයට භාජනය වන කාල පරිච්ඡේදය ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) විසින් ආවරණය කරන ලද එනම් 2002 පෙබරවාරි 21 සිට එය එහි වාර්තාව ජනාධිපතිවරයාට පිළිගන්වන ලද 2011 නොවැම්බර් 15 දින දක්වා කාලපරිච්ඡේදය යි. එසේම කමිටුව සිද්ධීන් පිළිබඳව වඩා හොඳ අවබෝධයක් සැපයිය හැකි හෝ මානව හිමිකම් උල්ලංඝනයන් අඛණ්ඩව සිදුවීම සම්බන්ධයෙන්

අදාළ විය හැකි මෙම කාල රාමුවෙන් පිටතට වැටිය හැකි යම් සන්දර්භීය හා වෙනත් අදාළ තොරතුරු ද සැලකිල්ලට ගන්නවා ඇත.

## 3. නෛතික රාමුව

කමිටුවේ වරම ගැටුමේ පාර්ශව දෙක විසින්ම කරන ලදැයි කියන මානව හිමිකම් පිළිබඳ බරපතල උල්ලංඝනයන් හා අපයෝජනයන් විමර්ශනය කිරීම අපේක්ෂා කරයි. විමර්ශනය පදනම්වන නෛතික රාමුව ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව භාර ගෙන තිබෙන හා සිරිත් බැඳි ජාත්‍යන්තර නීතිය යටතේ අදාළ කර ගත හැකි සියලු බැඳීම්වලින් සමන්විත වෙයි. රාජ්‍ය නොවන රංගිකයෙකු විධිමත් ලෙස මානව හිමිකම් ගිවිසුම්වල පාර්ශවයක් බවට පත්විය නොහැක්කේ වුව ද රාජ්‍යයක භූමි ප්‍රදේශයක කොටසක තත්ත්වාකාර පාලනය ක්‍රියාවට නංවන රාජ්‍ය නොවන කණ්ඩායම් එම භූමි ප්‍රදේශයේ පුද්ගලයින්ගේ ඇතැම් මානව හිමිකම් බැඳීම්වලට ගරු කළ යුතු යයි දැන් වඩ වඩාත් පිළි ගැනී තිබේ.

විමර්ශනය මගින් ආවරණය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය විශේෂයෙන් ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ ජිනීවා සම්මුතියේ විධිවිධාන ක්‍රියාවට නැගීම අවශ්‍ය කරන ආණ්ඩුව හා රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් යන දෙපාර්ශවයම ගැටුමේ දී හැසිරීම මිනිය යුතු අභ්‍යන්තර ගැටුමක් පැවතිණ. එනයින් නෛතික රාමුව ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) විසින් භාවිතා කරන ලද රාමුවම වේ. එසේම එහි වරම අපරාධ කර තිබේ ද යන්න තීරණය කිරීමේ විමර්ශනය යටතේ කමිටුව සිද්ධීන් හා අවස්ථාවන්ට ජාත්‍යන්තර අපරාධ නීතිය යොදා ගැනීම ද අපේක්ෂා කරයි.

## 4. විශේෂඥයෝ

2014 ජූනිවල දී මහ කොමසාරිස්වරයා විමර්ශනය මුළුල්ලේම ආධාරක හා උපදේශක භූමිකාවක් රඟපෑම සඳහා මෙන්ම ස්වාධීන සත්‍යාපනයක යෙදීම සඳහා විශිෂ්ට විශේෂඥයින් තිදෙනෙකු වන ෆින්ලන්තයේ හිටපු ජනාධිපති මාර්ටි ආටිසරේ මහතා, නවසීලන්තයේ හිටපු මහාධිකරණ විනිසුරු සිල්වියා කාට්රයිට් මෙනෙවිය හා පකිස්ථානයේ හිටපු මානව හිමිකම් කොමසාරිස් අස්මා ජහන්ගීර් මෙනෙවිය පත් කළේ ය.

එසේම කවුන්සිල යෝජනාව අපේක්ෂා කළ පරිදි විමර්ශන කමිටුව නීතියෙන් බැහැර ඝාතන, අතුරුදහන්වීම්, අභ්‍යන්තර අවතැන් වූවන්, හිතුවක්කාර රඳවා තබා ගැනීම්, ස්ත්‍රීන්ට එරෙහි හිංසනය හා වධ හිංසනය ඇතුළු කාරණා පිළිබඳ විශේෂිත විශේෂ පටිපාටි වරම් දරන්නන්ගේ සහාය ද ලබා ගනු ඇත.

## 5. වැඩ කිරීමේ ක්‍රමවේද

පාර්ශව දෙක විසින්ම කරන ලදැ යි කියන උල්ලංඝනයන්, අපයෝජනයන් හා අපරාධ පිළිබඳ කරුණු හා තත්වයන් තහවුරු කර ගනු පිණිස විමර්ශන කමිටුව ආණ්ඩු හා සිවිල් සමාජ වාර්තා ඇතුළු පවතින ලියවිලි හා තොරතුරු පිළිබඳව මේස විමර්ශනයක් පවත්වනු ඇති අතර වින්දිතයින්ගේ සාක්ෂි හා දිවි ගලවා ගත්තවුන්ගේ, සාක්ෂිකරුවන්ගේ හා වරද කරනු ලැබූවන් යයි කියන්නවුන්ගේ විස්තර දැක්වීම් එක් රැස් කිරීම හා ප්‍රලේඛනය කිරීම මෙන්ම චන්ද්‍රිකා පින්තූර, සත්‍ය යයි තහවුරුකරගත් වීඩියෝ හා ඡායාරූපමය සාක්ෂි හා නිල ලේඛන වැනි වෙනත් අදාළ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු සොයා ගැනීම කරනු ඇත. එක් රැස්කර ගන්නා ලද තොරතුරු

විශ්ලේෂණය කිරීමේ දී එකඟ වූ සාක්ෂි පිළිබඳ ප්‍රමිතිය සපුරාලීමට කරුණු හා විස්තර සනාථ කිරීමට අපේක්ෂා කරයි (පහතින් බලන්න).

කවුන්සිලයේ යෝජනාවෙහි දක්වා ඇති පරිදි එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග දිගටම කටයුතු කිරීමට ක්‍රියා කරනු ඇත. මහ කොමසාරිස්වරයා කමිටුවට ලංකාවට පැමිණ ආණ්ඩුවේ නිලධාරීන් හා අනෙක් අය මුණ ගැසීමට ඉඩ ලබා දෙන ලෙස ද එමෙන්ම අදාළ සියලු ලියකියවිලිවලට ප්‍රවේශය ලබා දෙන ලෙස ද දිගටම ඉල්ලා සිටිනු ඇත.

විමර්ශන කමිටුව විශේෂිත නියෝජිතායතන ඇතුළු එක්සත් ජාතීන්ගේ ආයතන, උනන්දුවක් දක්වන ආයතන හා විද්වතුන් හා රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධාන සමග නිත්‍ය සංවාදය හා සහයෝගිතාව සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

ඕනෑම රාජ්‍යයකට, පුද්ගලයෙකුට හෝ සංවිධානයකට කමිටුව වෙත ලිඛිතව තොරතුරු ඉදිරිපත් කළ හැකි ය. කමිටුව වෙත කෙරෙන ඉදිරිපත් කිරීම් oisl submissioins@ohchr.org වෙත ඉදිරිපත් කරන්නට පුළුවන. එහි කටයුතු කර ගෙන යාමේ දී කමිටුව හැම විටම ස්වාධීනත්වයේ, අපක්ෂපාතීභවයේ, විෂයබද්ධතාවයේ, පාරදෘශ්‍යභාවයේ, පූර්ණත්වයේ හා ''කිසිදු හානියක් නොකරනු'' යන ප්‍රතිපත්තියේ මූලධර්ම මගින් මග පෙන්වීම ලබනවා ඇත.

## 6. සාක්ෂිකාර ආරක්ෂාව

විමර්ශන කමිටුව සාක්ෂිකාර හා වින්දිත ආරක්ෂාව පිළිබඳ ප්‍රතිෂ්ඨාවන්ට ආමන්ත්‍රණය කිරීමේ නිසි පියවර ගන්නා අතර එහි වැඩ කටයුතුවල සෑම අදියරයන්හි දී ම එවැනි පුද්ගලයින් ආරක්ෂා කිරීම අරමුණුකර ගත් පටිපාටි හා වැඩ කිරීමේ ක්‍රමවේද යොදා ගනු ලබනවා ඇත.

එසේම ශ්‍රී ලංකා ආණ්ඩුවට ද විමර්ශන කමිටුව සමග සබඳතා පවත්වන වින්දිතයින් හා සාක්ෂිකරුවන් ද අනෙක් අය ද ආරක්ෂා කිරීමේ බැඳීමක් තිබෙන අතර එවැනි සම්බන්ධතාවක ප්‍රතිඵලයක් වශයෙන් එවන් කිසිදු පුද්ගලයෙකු පීඩාවට, හිරිහැරයට, තර්ජනවලට, බිය ගැන්වීමේ ක්‍රියාවන්ට, දූශ්-සැලකීම්වලට හෝ පලිගැනීම්වලට ලක් නොකරන බවට ප්‍රතිඥාවක් දෙන්නැයි ඉල්ලා සිටිනු ලැබේ.

## 7. තොරතුරු පිළිබඳ රහස්‍යභාවය

විමර්ශන කමිටුව යෝග්‍ය පරිදි එහි ප්‍රසිද්ධ වාර්තාවල පුද්ගලයින්ගේ නම් හෙළි නොකිරීම ද ඇතුළුව තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු පියවර හා පූර්වාරක්ෂණයන් ගනු ඇත. එහි වැඩවල අවසානයේ දී කමිටුව දැඩි ලෙස රහස්‍ය ලිපි ලේඛන සඳහා වන එක්සත් ජාතීන්ගේ සම්මත පටිපාටිවලට අනුකූලව සියලු රහස්‍ය ලිපි ලේඛන ලේඛනාගාරගත කරනු ඇත.

## 8. සාක්ෂි පිළිබඳ ප්‍රමිතිය

එක්සත් ජාතීන්ගේ කරුණු සෙවීමේ අනෙකුත් මණ්ඩලවල භාවිතයන්ට අනුකූලව කමිටුව ''විශ්වාස කිරීමේ පදනම් පාදක'' සාක්ෂි පිළිබඳ ප්‍රමිතියක් මත ස්වකීය සොයා ගැනීම් පදනම් කර ගනු ඇත. කමිටුව තොරතුරු ලබා ගෙන තිබෙන්නේ තොරතුරු පිළිබඳ විශ්වසනීය මණ්ඩලයකින් නම්, ඒවා අනෙක් තොරතුරුවලට අනුකූල වන්නේ නම්, ඒවායේ සමගාමිත්වය දක්වන්නේ නම් සිද්ධියක් හෝ උල්ලංඝනයන්ගේ රටාව හෝ සිදු වූ අපරාධ හෝ විශ්වාස කිරීමට සාධාරණ පදනම් තිබේ. සාක්ෂි පිළිබඳ මෙම ප්‍රමිතිය ජාත්‍යන්තර මානුෂවාදී හා මානව හිමිකම් පිළිබඳ නීතිය, ජාත්‍යන්තර අපරාධ පිළිබඳ නීතිය

උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අධිකරණ විමර්ශන පවත්වන්නැයි ඉල්ලා සිටීමට ඉහළින්ම ප්‍රමාණවත් විය හැකි ය.

උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධව තිබෙනවා යයි කියන පුද්ගලයින් හඳුනා ගන්නා තොරතුරු ඇගයීමට ලක් කිරීම සම්බන්ධයෙන් ගත් කල කමිටුව පුද්ගලයෙකු අපරාධයක් සිදු කිරීමේ දී සම්බන්ධවී තිබේ යයි සාධාරණ ලෙස සැක කළ හැකි බව පෙන්නුම් කිරීමට පාදක වන අනෙකුත් සත්‍යාපනය කර ගන්නා ලද තත්ත්වයන්ට අනුකූලවන විශ්වසනීය සාක්ෂි සමස්තයක් අවශ්‍ය කරන්නා වූ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරනු ඇත. කමිටුව සාපරාධී වරදක් සම්බන්ධයෙන් අවසන් තීන්දු නොදෙයි, වැඩිමනත් එය කරනු ඇත්තේ අනාගත අපරාධ විමර්ශනයන්ට මග පෑදිය හැකි විය හැකි සැකකරුවන් පිළිබඳ තක්සේරු කිරීමකි.

## 9. ශ්‍රී ලංකා ආණ්ඩුව සමග සහයෝගිතාවය

කවුන්සිලය එහි යෝජනාවේ දී යෝජනාව ක්‍රියාත්මක කිරීමේ දී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය සමග සහයෝගයෙන් වැඩ කරන්නැයි ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. එම සහයෝගිතාවෙන් භූමිය මුළුල්ලේ යාම් ඊම් නිදහස, සියලු ස්ථානවලට හා ආයතනවලට බාධාවිරහිත ප්‍රවේශය, ජාතික, ප්‍රාදේශීය හා හමුදා අධිකාරීන්ගේ, ප්‍රජා නායකයින්ගේ, රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතනවල නියෝජිතයින් හා එහි වරම ඉටු කිරීම සඳහා අයෙකුගේ සාක්ෂිය අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම් එවැනි ඕනෑම පුද්ගලයෙකු මුණ ගැසීමේ හා සම්මුඛ සාකච්ඡා කිරීමේ ප්‍රවේශය ද අදහස් වෙයි. එසේම කමිටුව ඒවායේ භූමි ප්‍රදේශ තුළ වින්දිතයින්, සාක්ෂිකරුවන් හා මූලාශ්‍ර සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ හැකි හා තොරතුරු එක්රැස් කළ හැකි අනෙකුත් ආණ්ඩුවලට ද එකී කොන්දේසි යටතේම විමර්ශනය සමග සහයෝගී වන්නැයි ආරාධනය කෙරේ.

## 10. වරප්‍රසාද,මුක්තීන් හා පහසුකම්

විමර්ශන කමිටුවේ විශේෂඥයින් 1948 එක්සත් ජාතීන්ගේ වරප්‍රසාද හා මුක්තීන් පිළිබඳ සම්මුතියේ IV වගන්තිය යටතේ දූත මෙහෙවරෙහි යෙදෙන විශේෂඥයින්ට ප්‍රදානය කර තිබෙන වරප්‍රසාද හා මුක්තීන් බුක්ති විඳිය යුතු අතර විමර්ශන කමිටුවේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාල කාර්ය මණ්ඩලිකයින් විමර්ශනය පැවැත් වීමේ දී සම්මුතියේ V හා VII වගන්ති යටතේ නිලධාරීන් පිළිබඳ වරප්‍රසාද හා මුක්තීන් බුක්ති විඳිය යුතු ය.

සියලුම ආණ්ඩුවලට මෙම බැඳීම සිහිපත් කරනු ලබන අතර විමර්ශනය ස්වාධීනව පැවැත්වීම සඳහා අවශ්‍ය කරන පහසුකම් සැලසීම සහතික කරන්නැයි ආරාධනා කර සිටී.

**මානව හිමිකම් කවුන්සිල A/HRC/25/1 යෝජනාවෙන් බලය පවරන ලද**
**ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ විමර්ශනය**
**(OHCHR)**
**ඉදිරිපත් කිරීම් කැඳවීම**
**2004 අගෝස්තු 1**

**පසුබිම**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (HRC) ලොව මුළුල්ලෙහි මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු එක්සත් ජාතීන්ගේ පද්ධතිය ඇතුළත ඉහළම අන්තර්-ආණ්ඩු මණ්ඩලය වේ.

2014 මාර්තුවල දී මානව හිමිකම් කවුන්සිලය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගෙන් ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) විසින් ආවරණය කරන ලද කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ පාර්ශව දෙක විසින්ම කරන ලදැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා අපයෝජනයන් හා අදාළ අපරාධ සම්බන්ධයෙන් විස්තීරණ විමර්ශනයක් පැවැත්වීමට ද දණ්ඩන මුක්තිය මග හැරීමේ හා වගවීම සහතික කිරීමේ දැක්මකින් යුතුව අදාළ විශේෂඥයින්ගේ හා විශේෂ පටිපාටි වරම් දරන්නන්ගේ සහාය ඇතිව කරන ලදැයි කියන එවැනි උල්ලංඝනයන් හා කරන ලද අපරාධ පිළිබඳ කරුණු හා අවස්ථාවන් තහවුරු කිරීමට ද'' ඉල්ලා සිටිමින් A/HRC/25/1 යෝජනාව සම්මත කළා ය. ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ කාර්යාලයේ විමර්ශනයේ වරමට ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම් හා අපයෝජනයන් ද ජාත්‍යන්තර මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් ද එමෙන්ම ඒ හා සම්බන්ධ අපරාධ ද ඇතුළත් වේ.

මෙම යෝජනාවට අනුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ කාර්යාල විමර්ශන කමිටුව (OISL) ස්ථාපිත කළා ය. A/HRC/25/1 යෝජනාවට අනුව මහ කොමසාරිස්වරිය විසින් පත් කරන ලද ස්වාධීන, විශිෂ්ට විශේෂඥයින් තිදෙනාඃ මාර්ටි ආටිසරේ මහතා, සිල්වියා කාට්රයිට් මෙනෙවිය හා අස්මා ජහන්ගීර් මෙනෙවිය විමර්ශනය මුළුල්ලේම කමිටුවට සහාය විම ද උපදෙස් දීම ද කරනු ඇත.

A/HRC/25/1 යෝජනාවට අනුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය විමර්ශනයේ ප්‍රතිඵලය පිළිබඳ විස්තීරණ ලිඛිත වාර්තාවක් 2015 මාර්තුවේ දී මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරනු ඇත.

**කමිටුව (OISL) වෙත ඉදිරිපත් කිරීම්**

2011 පෙබරවාරි 21 සිට 2011 නොවැම්බර් 15 දක්වා ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුමට සම්බන්ධ පාර්ශව දෙකෙන් කුමන එකක් වුව සිදු කරන ලදැයි කියනු ලබන මානව හිමිකම් පිළිබඳ බරපතල උල්ලංඝනයන් හා අපයෝජනයන් ද ඒ හා අදාළ අපරාධ ද පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට හා/හෝ ප්‍රලේඛනය කිරීමට පුද්ගලයින්ට, සංවිධානවලට හා ආණ්ඩුවලට ආරාධනය කරනු ලැබේ.

ඉදිරිපත් කිරීම් **2014 ඔක්තෝබර් 30** දින ජිනීවා වේලාවෙන් මධ්‍යම රාත්‍රිය වනවිට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මෙය විමර්ශන කණ්ඩායමට එහි වාර්තාව කෙටුම්පත් කිරීමට පෙර එකතු කර ගන්නා ලද සියලු තොරතුරු විශ්ලේෂණය කරගැනීමට කාලය ලබා දීම සඳහා ය. මාර්තුවල මානව හිමිකම් කවුන්සිලයට වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීම සඳහා යටත් පිරිසෙයින් මාස දෙකක් අවශ්‍ය වනු ඇත.

**ඉදිරිපත් කිරීම් පිළිබඳ පටිපාටිය**

ඉදිරිපත් කිරීම් ලිඛිත ආකාරයෙන් විය යුතු අතර කතුවරයා/වරියගේ/වරයින්ගේ සම්බන්ධතා විස්තර ඇතුළත් කළ යුතු ය. ඉදිරිපත් කිරීම් හෝ ඒවායේ කොටස් රහස්‍යව සැලකිල්ලට ගත යුතු නම් ඉදිරිපත් කිරීම් කරනු ලබන ආයතන/පුද්ගලයින් ඒවා විශේෂිතව දැක්විය යුතු ය. ඉදිරිපත් කිරීම් ලැබීම අනුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ කාර්යාලය කතුවරවරියන්ගේ හෝ ඉදිරිපත් කිරීම්වල නම්කර ඇති වෙන යම් පුද්ගලයින්ගේ හෝ පෞද්ගලික විස්තර පිළිබඳ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ඇත.

ඉදිරිපත් කිරීම් ඉංග්‍රීසියෙන්, සිංහලෙන් හා දෙමළෙන් විය හැකි ය. ඒවා පිටු 10 නොඉක්ම විය යුතු ය. කමිටුවට අතිරේක තොරතුරු ලබා ගත යුතු නම් එය ඉදිරිපත් කිරීම් කරන ලද කතුවරයා/වරිය/වර/වරියන් හා සම්බන්ධ වනු ඇත.

ඉදිරිපත් කිරීම්වලට අදාළ වීඩියෝ, ඕඩියෝ හෝ ඡායාරූපය සාක්ෂි විද්‍යුත් තැපැල මගින් නොඑවිය යුතු ය. ඒවා විකල්ප මාර්ගවලින් එවීම සූදානම් කරන්නට කමිටුව හා සම්බන්ධ වන්න.

**ඉදිරිපත් කිරීම් සඳහා විද්‍යුත් තැපල් හා තැපල් ලිපින**

විද්‍යුත් තැපැල: oisl_submissioins@ohchr.org

තැපැල: OISL
UNOG-OHCHR
8-14 Rue de la Paix
CH-1211 Geneva 10
Switzerland

මානව හිමිකම් කවුන්සිල (HRC) යෝජනාව, කමිටුවේ ( OISL) සමුද්දේශ කොන්දේසි (Terms of Reference) හා කමිටුව පිළිබඳ වෙනත් තොරතුරු සඳහා: http://www.ohchr.org/EN/HRBodies/HRC/Pages/OISL.aspx

2014 දෙසැම්බර් 10

උතුමාණෙනි,

2015 දෙසැම්බර් 22 දින ඔබතුමා සමග වූ මගේ මුණ ගැසීමට අමතරව තවදුරටත් මා ලියන්නේ මානව හිමිකම් කවුන්සිලයේ 25/1 යෝජනාවෙන් බලය පවරන ලද ශ්‍රී ලංකාව

පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ විමර්ශනයට අදාළ ප්‍රශ්න පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීමට ය.

මෙම මානව හිමිකම් කවුන්සිල වරමට අදාළව ශ්‍රී ලංකා ආණ්ඩුව ගෙන තිබෙන සහයෝගය නොදීමේ ආස්ථානය මම සැලකිල්ලට ගනිමි. එසේ වුව ද විමර්ශන කමිටුවේ වරම් ලද කාලය සමයේ සිදු කෙරුණු බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් හා ඒ හා සම්බන්ධ අපරාධ පිළිබඳ චෝදනාවන්ට අදාළ කරුණු විශ්ලේෂණය කිරීමේ දී සැලකිල්ලට ගත හැකි අදාළ තොරතුරු හා පර්යාවලෝක හුවමාරු කර ගැනීමට අවස්ථාවක් ආණ්ඩුවට නැවත ලබා දීමට මම කැමත්තෙමි.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා භාවිතයන්ට අනුකූලව මෙම චෝදනාවන්ට අදාළව විෂයබද්ධ විස්තරයක් ස්ථාපිත කරගනු පිණිස තොරතුරු තහවුරු කර ගැනීමට මගේ කාර්යාලය අපේක්ෂා කරයි. ආරක්ෂක අමාත්‍යාංශයේ *මානුෂීය මෙහෙයුම පරිසිද්ධිමය විශ්ලේෂණය 2006 ජූලි-2009 මැයි* වාර්තාව ද ආණ්ඩුවේ *මානව හිමිකම් කමිටුව වෙත පස්වෙනි වාරික වාර්තාව* ද ඒවා සමග අදාළ *ප්‍රශ්න ලැයිස්තුවට ශ්‍රී ලංකාවේ පිළිතුරු* ද එමෙන්ම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවේ අඩංගු කරුණු ද ඇතුළු ආණ්ඩුව විසින් නිකුත් කර තිබෙන ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු අපි විමර්ශනය කර ඇත්තෙමු. මෙම ඉල්ලීම ඉදිරිපත් කිරීම මගින් වැඩිමනත් අදාළ තොරතුරු හෝ ලියවිලි සපයන්නැයි ශ්‍රී ලංකා ආණ්ඩුවට කළ මගේ ආරාධනය නැවතත් ඉදිරිපත් කිරීමට මම කැමැත්තෙමි.

ඉල්ලා සිටින ලද තොරතුරු ලැයිස්තුවක් අමුණා ඇත. ඔබේ ආණ්ඩුවේ ධනාත්මක සලකා බැලීම සහ ඉල්ලා සිටින ලද මෙන්ම අනෙකුත් අදාළ තොරතුරු 2005 ජනවාරි 10 වනවිට ලැබීම මම බෙහෙවින්ම අගය කරමි.

උතුමාණෙනි, කරුණාකර මාගේ ඉහළම අවධානයෙන් යුත් සහතිකයන් පිළිගන්න.

සෙයිද් රා අද් අල් හුසේන්
මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්

අතිගරු මහාචාර්ය ජී. එල්. පීරිස්
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1
ශ්‍රී ලංකාව

**_ඇමුණුම_- ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ විමර්ශනය (OISL)**
**තොරතුරු සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත කරන ඉල්ලීම**
**2014 දෙසැම්බර්**

*එල්ටීටීඊය*

1. කරුණාකර විමර්ශනයේ වරම ලද කාල පරිච්ඡේදයට අදාළ *මානුෂීය මෙහෙයුම පරිසිද්ධිමය විශ්ලේෂණය 2006 ජූලි-2009 මැයි* වාර්තාවේ A-E දක්වා ඇමුණුම්වල ලැයිස්තුගත කර තිබෙන එල්ටීටීඊයට ආරෝපණය කර ඇති ඝාතන හා අනෙකුත් අපයෝජනයන් පිළිබඳ සිද්ධීන් එක එක සම්බන්ධ තීන්දුවලට ඒමට පදනම් වූ විමර්ශන හා යම් නීති කෘත්‍යයන් පිළිබඳ තොරතුරු සපයන්න (පහතින් එන පරිදි).

   *ඇමුණුම A:* සිද්ධි 59-82, 114-136, 147-148, 157-160; *ඇමුණුම B:* සිද්ධි 104-137;
   *ඇමුණුම C:* සිද්ධි 102-109; *ඇමුණුම D:* සිද්ධි 20-21; *ඇමුණුම E:* සිද්ධි 34-39

2. කරුණාකර එල්ටීටීඊය විසින් ළමුන් බඳවා ගැනීමේ තනි තනි සිද්ධි හා ළමුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු එල්ටීටීඊය ඇතුළත වූ ව්‍යුහයන් යන දෙකම පිළිබඳව ඔබ ආණ්ඩුව සතුව තිබිය හැකි යම් තොරතුරක් වේ නම් ඒ තොරතුරු, එල්ටීටීඊයෙන් ළමුන් වෙන් කර ගෙන යළි සමාජයට ඒකාබද්ධ කිරීමේ ආණ්ඩුවේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු සපයන්න. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ (LLRC) වාර්තාවේ *''සටන්කරුවන් ලෙස ළමුන් බලෙන් බඳවා ගත් බවට බැලූ බැල්මට සාක්ෂි තිබෙන ඕනෑම සිද්ධියක් විමර්ශනය කර වරද කරන ලද්දවුන් යුක්තිය හමුවට ගෙන ඒම සහතික කළ යුතු ය''* (9.79) යන නිර්දේශයට අනුව හා රාජ්‍ය පාර්ශවයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) හා සන්නද්ධ ගැටුමෙහි ළමුන් නිරතකරවීම පිළිබඳ වෛකල්පික මූල ලේඛය (OPAC) අපරානුමත කිරීම සහ 2006 ජනවාරි 1 දින අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතෙහි සන්නද්ධ ගැටුම සඳහා ළමුන් යොදවා ගැනීම හා බඳවා ගැනීම සාපරාධීකරණය කිරීම සලකා බලා කරුණාකර එලටීටීඊය විසින් මෙන්ම අතුරු හමුදා කණ්ඩායම් ළමුන් බඳවා ගනු ලැබීමට අදාළව පවත්වන ලද අපරාධ විමර්ශන පිළිබඳ තොරතුරු සපයන්න. එසේම කරුණාකර 2002 හා 2009 අතර යුද කටයුතු සඳහා වැඩිහිටි අය බලෙන් බඳවා ගැනීම පිළිබඳව ඔබේ ආණ්ඩුව සතුව තිබිය හැකි සපයාගනු ලැබිය හැකි යම් තොරතුරු සපයන්න.

3. *මානුෂීය මෙහෙයුම පරිසිද්ධිමය විශ්ලේෂණය 2006 ජූලි-2009 මැයි* වාර්තාවේ 191 හා 195 ඡේදවලට අදාළව කරුණාකර එල්ටීටීඊය ඔවුන්ගේ පාලනය යටතේ පැවති ප්‍රදේශ හැර යාමට සිවිල් ජනයා උත්සාහ කළ අවස්ථාවේ දී ඔවුන්ට වෙඩි තැබූ බවට හා සිවිල් වැසියන් ආරක්ෂක පලිහවල් හෝ ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගත් බවට ඇති චෝදනා සම්බන්ධව බුද්ධි සේවා ඇගයුම්, නිරනි යානා පින්තූර, අවහිර කිරීම් හෝ වෙනත් යම් තොරතුරු සපයන්න.

4. කරුණාකර එල්ටීටීඊයේ දේශපාලන හා යුද අංශවල ව්‍යුහය, ඔවුන්ගේ මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය, බර අවි හා මරා ගෙන මැරෙන උපක්‍රම භාවිතයට අදාළ විධාන හා පාලනය විස්තර කරන ඔබේ ආණ්ඩුව සතුව තිබිය හැකි යම් අතිරේක ලියවිලි සපයන්න.

5. කරුණාකර විශේෂයෙන් 2009 ජනවාරි හා මැයි අතර ආරක්ෂිත පහසුකම් තුළ හෝ ආසන්නයේ එල්ටීටීඊයේ ආයුධ ස්ථානගත කිරීම් හා හමුදා පිහිටැවුම් දක්වන මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා ඡායාරූප ඇතුළු ලබා ගත හැකි යම් තොරතුරු සපයන්න.

*ආරක්ෂක හමුදා/එදිරිවාදිකම්වල චර්යාව*

6. *මානුෂීය මෙහෙයුම පරිසිද්ධිමය විශ්ලේෂණය 2006 ජූලි-2009 මැයි* වාර්තාවෙහි ලබා ගත හැකි තොරතුරුවලට අමතරව කරුණාකර සැලසුම් කිරීම, ප්‍රතිපත්තිය, සටනෙහි නියැලීමේ නීති, *නියෝග*, පසු-ක්‍රියා ඇගයුම්, මිනිසුන් රහිත නිරීක්ෂණ ගුවන් යානා තොරතුරු පට ඇතුළුව හමුදා මෙහෙයුම්වලට, අවි භාවිතයට හා සිවිල් ජනයාගේ ආරක්ෂාවට වාර්තාව මගින් ආවරණය කරන කාලපරිච්ඡේදය සඳහා වන යම් වැඩිමනත් තොරතුරු සපයන්න. එසේම කරුණාකර මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ පස් වෙනි වාර්ෂික වාර්තාවේ සඳහන් කර තිබෙන පරිදි ''ආරක්ෂිත ස්ථාන'' පිළිබඳව සිවිල් වැසියන් දැනුවත් කරමින් ''ගුවන් විදුලි නිවේදන මගින් හා ශබ්ද විකාශන මගින් කළ නිවේදනවල'' ස්වභාවය, දින හා නිශ්චිත ස්ථාන පිළිබඳ ලියවිලිවල පිටපත්, ''ගුවනින් හෙළන ලද පත්‍රිකා හා ජාත්‍යන්තර නියෝජිතායතන හරහා යවන ලද ඉල්ලීම්වල පිටපත්'' සපයන්න.

7. කරුණාකර පහත සඳහන් ඒවා ද ඇතුළුව 2002-2011 කාල පරිච්ඡේදය සමයේ ආරක්ෂක අමාත්‍යාංශයේ හා ජාතික ආරක්ෂක මණ්ඩලයේ ද හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ ද මට්ටමින් සංවිධාන හා විධාන සහ පාලන යන ව්‍යුහයන් දෙකම පිළිබඳ තොරතුරු සපයන්නඃ

- 22 වෙනි හා 23 වෙනි බල සේනාංක හා ස්වාධින සේනාංකය ඇතුළුව උප ඒකක
- 53, 55, 56, 57, 58 හා 59 යන බල සේනාංක හා ස්වාධීන සේනාංක ඇතුළු උප ඒකක
- 1, 2, 3 හා 4 කාර්ය සාධක බලකායන් හා ස්වාධීන සේනාංක ඇතුළු උප ඒකක
- කොමාන්ඩෝ බ්‍රිගේඩය
- විශේෂ බලකා බ්‍රිගේඩය
- දිග දුර නිරීක්ෂණ මුර සංචාරක කණ්ඩායම්

8. කරුණාකර අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය හා විශේෂ කාර්ය සාධක බලකාය ඇතුළු පොලිස් බලකායන්වල සංවිධානමය, විධාන ව්‍යුහ දාමය, නියෝග හා මෙහෙයුම් මාර්ගෝපදේශ හා වරයන් පිළිබඳ මෙන්ම ගැටුම් කාලය සමයේ පොලීසිය හා හමුදාව අතර සම්බන්ධතාව පිළිබඳ තොරතුරු සපයන්න.

*රැඳවුම් භාරය*

9. කරුණාකර හදිසි නීති විධිවිධාන යටතේ හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෙන්ම අනෙකුත් නීති යටතේ රඳවා තබා ගැනීම හා ප්‍රශ්න කිරීමේ පටිපාටි යන දෙකම පිළිබඳ තොරතුරු සපයන්න.

එසේම කරුණාකර ගැටුමේ අවසාන සති කිහිපය තුළ හා 2001 දක්වා උතුරෙහි මෙන්ම රැඳවියන් ගෙන ගිය ස්ථානවල සියුම් සෝදිසි කිරීම, වෙන් කිරීම, රඳවා තැබීම හා ප්‍රශ්න කිරීම පිළිබඳ තොරතුරු සපයන්න. එසේම කරුණාකර වධ හිංසා පිළිබඳව කරගෙන ගොස් තිබෙන යම් විමර්ශන ද ඒවායේ ප්‍රතිඵල ද පිළිබඳ තොරතුරු සපයන්න.

10. කරුණාකර 2014 ඔක්තෝබර්වල මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කරන ලද *''ප්‍රශ්න ලැයිස්තුවට ශ්‍රී ලංකාවේ පිළිතුරු''* වාර්තා කළ පරිදි ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ වාර්තාවෙහි සඳහන් කරන ලද ෂෙල් ප්‍රහාර පිළිබඳ සිද්ධි ශ්‍රී ලංකා හමුදාව විසින් සිදු කරන ලද ඒවා නොවන අතර සිවිල් ජන මරණ සිදුවිය හැකිව තිබුණේ එල්ටීටීඊය විසින් කරන ලද නීති විරෝධී ක්‍රිය හේතු කොට ගෙන ය...'' යන්න නිගමනය කිරීමට විමර්ශන හමුදා අධිකරණය විසින් උපයෝගී කර ගන්නා ලද සාක්ෂි පිළිබඳව වැඩිමනත් තොරතුරු සපයන්න.

11. කරුණාකර උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් කරන ලද නිර්දේශවල සන්දර්භය තුළ ද (නිර්දේශ 9.120, 9.9, 9.37අ හා 9.41) ඇතුළුව කමිටුව විසින් විමර්ශනයට භාජනය කරන කාල පරිච්ඡේදය සමයේ සිදු කර තිබෙන බවට වාර්තා වී තිබෙන නීතියෙන් බැහැර ඝාතන, බලහත්කාර අතුරුදහන් කිරීම්, ලිංගික දූෂණ, වධ හිංසා හා අනෙකුත් උල්ලංඝනයන් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් පටන් ගෙන තිබෙන විමර්ශන හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ වෙන යම් තොරතුරු සපයන්න.

12. කරුණාකර ඉහත 11 වන ඡේදයට අදාළ 2005 අගෝස්තු 1 සිට පැන නැගී තිබෙනවා යයි කියනු ලබන මානව හිමිකම් පිළිබඳ බරපතල උල්ලංඝනයන් පිළිබඳ විමර්ශනය හා පරීක්ෂණය කිරීමට පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට අදාළ අවසාන වාර්තාවේ (උදලාගම කොමිෂන් වාර්තාව) හා පසු විපරමේ විස්තර සපයන්න.

13. එසේම කරුණාකර ඉහත 11 වන ඡේදයටම අදාළ මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කරන ලද පස්වෙනි වාරික වාර්තාවට අදාළ *ප්‍රශ්න ලැයිස්තුවට ශ්‍රී ලංකාවේ පිළිතුරු* වාර්තාවේ 46 වන ඡේදයේ සඳහන් කරනු ලබන ආරක්ෂක හමුදා පිරිස් සම්බන්ධ ස්ත්‍රීන්ට එරෙහි හිංසන සිද්ධි 39 පිළිබඳව වැඩිමනත් තොරතුරු සපයන්න.

14. කරුණාකර බලහත්කාර අතුරුදහන් කිරීම්වලට අදාළ ක්‍රමවේදය, යම් මූලික සොයාගනීම්වල විස්තර, විමර්ශනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට භාර දී තිබෙන සිද්ධි, සාක්ෂිකරුවන් සම්බන්ධ ආරක්ෂණ පියවර, මිහිටුවා තිබෙන යම් සහන හා හානි පූර්ණ පියවර ඇතුළු උතුරු හා නැගෙනහිර පළාත්වල නැති වූ පුද්ගලයින් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව පිළිබඳ තොරතුරු සපයන්න. එසේම කරුණාකර උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම විසින් නිර්දේශ කරන ලද පරිදි දේශීය නීතිය යටතේ බලහත්කාර අතුරුදහන් කිරීම සාපරාධී වරදක් ලෙස ස්ථාපිත කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ තොරතුරු සපයන්න.




Map No. 4172 Rev.3 UNITED NATIONS
March 2008

Department of Field Support
Cartographic Section